(l) not to hold a particular meeting, rally or procession; and
(m) not to engage in any specified activity;

Provided however, no directive under paragraphs (k),(l) or (m) shall be issued, without the prior approval obtained from a Magistrate, who shall prior to the issuance of such directive satisfy himself of the necessity for issuing the same and may make an order to issue such directive subject to such condition."

Clause 81(1) and (2) of the Bill read as follows.

"81. (1) *"Notwithstanding anything in any other written law where the Minister has reasonable grounds to believe that any organization is engaged in any act amounting to an offence under this Act, or is acting in a manner prejudicial to the national security of Sri Lanka or any other country, he may by order published in the Gazette, (hereinafter referred to as "Proscription Order") proscribe such organization in terms of the provisions of this Act."*

(2) *"A Proscription Order may be made by the Minister, for giving effect to-*

(a) a recommendation made by the Inspector General of Police or

(b) a request made by the Government of any foreign country to the Government of Sri Lanka."

But it has to be stated here that according Article 15(7) of the Constitution, the exercise of fundamental rights guaranteed by Article 14 of the Constitution shall be subject to restrictions as may be prescribed by law in the interest of national security. Thus, the Parliament can enact legislation placing restrictions in the exercise of fundamental rights guaranteed by Article 14 of the Constitution and enacting such legislation cannot violate the said fundamental rights. This Bill is one such legislation. For the above reasons we reject the above contention of learned counsel for the Petitioner.

According to Clause 72 of the Bill, the Attorney General has the power to suspend and defer the institution of criminal proceedings against a person who is alleged to have committed certain offences under this Bill. The Attorney General does not have this power in respect of certain offences. They are discussed in Clause 72 of the Bill. Learned counsel for the Petitioners therefore contended that the Attorney General encroaches to the judicial power of courts. He therefore contended that this Clause would violate Article 3 and 4 of the Constitution. We now advert to this contention. Although learned counsel contended so, the Attorney General cannot take the above decision on his own. He will have to obtain sanction of the High Court to the imposition of one or more conditions stipulated in Clause 72(3) of the Bill. The decision of the Attorney General to suspend and defer the institution of

criminal proceedings is also subject to the judicial review. This view is supported by Clause 96 of the Bill. The Court of Appeal in the exercise of its writ jurisdiction can quash the decision of the Attorney General. Therefore we are unable to agree with the said contention and reject the same.

According to Clause 77 of the Bill the Attorney General has the power to withdraw indictments filed against an accused person who is alleged to have committed an offence under this Bill. Learned counsel for the Petitioners therefore contended that this power amounts to an encroachment of judicial power of courts. But the withdrawal of indictment has to be done with the permission of the High Court Judge. Under Section 194 (1) of the Code of Criminal Procedure Act No 15 of 1979 (CPC) the Attorney General has the power to withdraw indictments. Under Section 194 (3) of the Code of Criminal Procedure Act No 15 of 1979 (CPC), the prosecuting counsel has the power to withdrawal of indictments with the consent of the Presiding Judge. Thus, the power of the Attorney General to withdraw indictments is a part of the existing law. If this Court declares that the power of the Attorney General to withdraw indictments violates the Constitution, this Court would be indirectly declaring that Section 194 (1) and Section 194 (3) of the CPC would violate the Constitution. But under and in terms of Articles16 and 80(3) of the Constitution, we are of the opinion that this Court has no jurisdiction to inquire into or pronounce upon the validity of an existing written law enacted by the Parliament. Therefore we are unable to agree with the said argument and reject the same as there is no merit in it.

Clause 93(3) of the Bill reads as follows: "For the purpose of this section the expression "law" includes international instruments which recognize human rights and to which Sri Lanka is a signatory."

Article 170 of the Constitution reads as follows: "Law means any Act of Parliament and any law enacted by any legislature at any time prior to the commencement of the Constitution and includes an Order in Council." Therefore international instrument cannot be a part of law defined by our Constitution

When we consider this Article, we are of the opinion that Clause 93(3) of the Bill violates the legislative power of the people discussed in Article 4(a) of the Constitution. Article 3 of the Constitution-

"In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Sovereignty includes the powers of government, fundamental rights and the franchise."

Article 4 of the Constitution reads as follows.

"The Sovereignty of the People shall be exercised and enjoyed in the following manner :–

(a) the legislative power of the People shall be exercised by Parliament, consisting of elected representatives of the People and by the People at a Referendum ;

(b) the executive power of the People, including the defence of Sri Lanka, shall be exercised by the President of the Republic elected by the People ;

(c) the judicial power of the People shall be exercised by Parliament through courts, tribunals and institutions created and established, or recognized, by the Constitution, or created and established by law, except in regard to matters relating to the privileges, immunities and powers of Parliament and of its Members, wherein the judicial power of the People may be exercised directly by Parliament according to law ;

(d) the fundamental rights which are by the Constitution declared and recognized shall be respected, secured and advanced by all the organs of government and shall not be abridged, restricted or denied, save in the manner and to the extent hereinafter provided; and

(e) the franchise shall be exercisable at the election of the President of the Republic and of the Members of Parliament and at every Referendum by every citizen who has attained the age of eighteen years and who, being qualified to be an elector as hereinafter provided, has his name entered in the register of electors."

According to Article 3 of the Constitution, Sovereignty includes the powers of the Government. What are the powers of the Government? They are the legislative power of the People, the Executive Power of the People and the Judicial Power of the People. When we consider Articles 3 and 4 of the Constitution, we feel that the Sovereignty is


1. the legislative power of the People,
2. the executive power of the People,
3. the judicial power of the People and
4. the franchise of the People

Therefore it is correct to say that the legislative power of the People is a part of Sovereignty. Therefore if a Clause of a Bill violates the legislative power of the People it would violate Article 3 and 4 of the Constitution. For the above reasons we hold that Clause 93(3) of the Bill violates Article 3 and 4 of the Constitution.

We have earlier decided that Clause 4(a) and 4(b) and 68(5) of the Bill violate Article 12 (1) of the Constitution and Clause 93(3) violates Article 3 and 4 of the Constitution.

Learned Additional Solicitor General submitted that death sentence is cruel and it would violate Article 11 of the Constitution. In this connection we would like to consider an observation made by Samarakoon CJ, Sharvananda J and RS Wanmasundera J in the Determination delivered on the Poisons, Opium and Dangerous Drugs (Amendment) Bill dated 23.2.1984 wherein it says thus *"One member of the Court is of the opinion that the imposition of the death Sentence for offences under this Act violates Article11 of the Constitution. The majority is of the view that it does not violate Article11 of the Constitution."* Imposition of death sentence is a part of existing law. Vide Section 296 of the Penal Code. Under and in terms of Articles16 and 80(3) of the Constitution, we are of the opinion that this Court has no jurisdiction to inquire into or pronounce upon the validity of an existing written law enacted by the Parliament. Therefore we are unable to agree with the above contention of the learned Additional Solicitor General and hold that imposition of the death Sentence would not violate Article11 of the Constitution. If a Clause of a Bill violates Article 12(1) of the Constitution, such a violation would amount to violation of Article 3 of the Constitution because according to Article 3 of the Constitution, Sovereignty includes fundamental rights of the people. We have earlier decided that Clause 4(a) and 4(b) and 68(5) of the Bill violate Article 12 (1) of the Constitution. Therefore we hold that they violate Article 3 of the Constitution. However violation of Article 3 of the Constitution by Clauses 4(a) and 4(b) of the Bill would cease to operate if same punishment found in Section 296 of the Penal Code is introduced after removing the words 'life imprisonment' in Clauses 4(a) and 4(b) of the Bill. Violation of Article 3 of the Constitution by Clause 68(5) of the Bill would cease to operate if the amendment proposed by the Attorney General to Clause 68(5) of the Bill is introduced.

We have earlier held that Clause 93(3) of the Bill would violate Articles 3 and 4 of the Constitution. Learned Additional Solicitor General submitted that the Attorney General would advise the Minister of Justice to delete Clause 93(3) of the Bill. If Clause 93(3) of the Bill is deleted, the violation of Articles 3 and 4 of the Constitution by the said Clause would cease to operate. We have held that Clauses 4(a) and 4(b), 68(5) and 93(3) of the Bill violate Article 3 of the Constitution. Therefore we are of the opinion that 4(a) and 4(b), 68(5) and 93(3) of the Bill will have to be passed by a two-third majority referred to in Article 83 of the Constitution and approved by the People at a Referendum. We have examined the


Bill and are of the opinion that Clauses other than 4(a) and 4(b), 68(5) and 93(3) of the Bill, can be passed by simple majority of the Parliament.

Sisira J de Abrew
Judge of the Supreme Court.

Vijith K Malalgoda
Judge of the Supreme Court.

Murdu Fernando
Judge of the Supreme Court.

II

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 නොවැම්බර් පළමුවැනි දින ම' විසින්, "මුදල්" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Sumanthiran?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I would like to draw your attention, Hon. Speaker, to Standing Order No. 135 and I am moving that the Standing Orders be suspended for today's Sitting. As you can see, if this is moved by somebody other than a Minister of the Cabinet of Ministers, it shall be decided by a Division in the House. So, as I move that the Standing Orders be suspended for the day, I also move that the Hon. Speaker be pleased to present my Motion for the suspension of Standing Orders for a Division of the House to be voted upon.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - (மாநகரங்கள் மற்றும் மேற்கு அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - (Minister of Megapolis and Western Development and Leader of the House of Parliament)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජිත හේරත් මැතිතුමා කථා කරන්න. [බාධා කිරීම්] - Order, please!

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Hon. Speaker, I second the Hon. Sumanthiran's proposal. -[*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. -[ඝෝෂා කිරීම්]- ගරු සභානායකතුමා. -[ඝෝෂා කිරීම්]- පොඩ්ඩක් ඉන්න. I did not see him. [ඝෝෂා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුවේ සභානායක හැටියට ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව වෙනුවෙනුත්, අපේ මන්ත්‍රී කණ්ඩායම වෙනුවෙනුත් පාර්ලිමේන්තුව -[ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. Order, please! Let him speak. කථා කරන්න අවසථාව දෙන්න, please.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් සභාවේ මන්ත්‍රීවරු අතට පත් කරන ලද න්‍යාය පත්‍රයේ තිබෙන්නේ, අද නිවේදන කියවීමෙන් පසු සභාව කල් තැබීමේ යෝජනාවයි. -[ඝෝෂා කිරීම්] - මම මීළඟ දිනයට පාර්ලිමේන්තුව කල් තැබිය යුතුයැයි යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම මේක සභාවේ,-[බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරුනි, -[ඝෝෂා කිරීම්]- පොඩ්ඩක් ඉන්න. Let me speak, please. අද විශේෂ අවස්ථාවක්. මේ තීරණ මම ගන්නේ නැහැ. මම සභාවේ අනුමැතිය අරගෙන ඒ තීරණය දෙන්නම්. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා කථා කරලා අවසන් ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා වෙනත් ප්‍රකාශයන් කිරීමට මත්තෙන්,- මේ පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවයි පිහිටුවලා තිබෙන්නේ. පාර්ලිමේන්තුව මහජන නියෝජිතයන්ගෙන් සමන්විත - [ඝෝෂා කිරීම්]- පොඩ්ඩක් සවන් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපටත් පුළුවන් කෑ ගහන්න. කෑ ගහන්න ඕනෑ නම් කෑ ගහමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉතා පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව තමයි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පැමිණෙන්නේ. ඒ නිසා ස්ථාවර නියෝගවලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැ. ඔබතුමාටත් බැහැ, කිසිම මන්ත්‍රීවරයෙකුටත් බැහැ, පාර්ලිමේන්තුවටත් බැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා ඉතා පැහැදිලිව අද ජනාධිපතිතුමාගේ ප්‍රකාශනය කියවීමෙන් පසු පාර්ලිමේන්තු සම්ප්‍රදාය, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව න්‍යාය පත්‍රයේ වෙන කිසිදු කටයුත්තක් අද දිනට යොදා නොමැති හෙයින් අපි පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළේ. ඔබතුමාට ඉතාම ගෞරවයෙන් අපි සඳහන් කරන්නට ඕනෑ, වෙන කිසිම කටයුත්තක් සඳහා පාර්ලිමේන්තුවට අවතීර්ණ වෙන්නට කිසිම බලයක් අද දිනයේ නොමැති බව ඔබතුමාට අපි මේ යෝජනාව ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන අතර -

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Divide!

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
-අපි ඉතා ඕනෑකමින් කියන්න ඕනෑ, දැනට කථානායකතුමාට වෙන යෝජනාවක් ලිඛිතව භාර ගත හැකි වන්නේ පාර්ලිමේන්තුව රැස්වීමෙන් පසු ඔබතුමා විසින් කථානායක ලෙස කල් තබන ලද පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ කිරීමෙන් පසුව පමණක් බව. එහෙම නැතිව හදිසියේ ගෙනෙන කිසිම යෝජනාවක් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට පටහැනියි. [ඝෝෂා කිරීම්] හරි, හරි. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒ අනුව පැහැදිලි වෙනවා, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව දැන් නැති බව. [බාධා කිරීමක්] ඔහොම ඉන්න. මේ දැන් තමයි ලිඛිත දෙයක් ඔබතුමාගේ අතට දීලා තිබෙන්නේ. -[ඝෝෂා කිරීම්]- පොඩ්ඩක් ඉන්න ඉතින් කෑ ගහන්නේ නැතිව. එක සැරයක් නොවෙයි වරද්දා ගත්තේ. This is my submission.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Have you finished?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No. Now it is very clear that there is no Resolution that the Hon. Sumanthiran has moved or the Hon. Vijitha Herath or the Hon. Anura Dissanayake has seconded. There is no Motion at the moment. There is no Motion that they have moved. -[*Interruption.*]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I have moved- [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Wait. Let him finish. -[*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, you cannot. Because it is only now - the error of not handing over the Motion was accepted by the Hon. Vijitha Herath. -[*Interruption.*] He accepted that there is no Motion and he walked up to the Chair only now to hand over the Motion. This can only be taken up on another day of Parliamentary Sitting. That is how it is done. - [Uproar.]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාව තමයි ස්ථාවර නියෝග යම් ප්‍රමාණයක් අත්හිටුවීම සඳහා යෝජනාව. අප විසින් පාර්ලිමේන්තුවේ මහලේකම්තුමාට දැන් ලබා දුන් යෝජනාව තමයි, මේ ව්‍යවස්ථා විරෝධී පාලනයට එරෙහිව විශ්වාස භංගයේ යෝජනාව. ඒ, යෝජනා දෙකක්. [බාධා කිරීම] එකක් නොවෙයි, යෝජනා දෙකක්. එම නිසා ස්ථාවර නියෝග අත්හිටුවීම පිළිබඳ යෝජනාවට ඔබතුමා ඉස්සෙල්ලාම ඡන්දය විමසන්න. අනතුරුව ඒ ස්ථාවර නියෝග අත්හිටුවීම මත පදනම්ව විශ්වාස භංග යෝජනාව ඉදිරියට යන්නට පුළුවන්. අපි ඒ පිළිබඳව විවාදය පවත්වමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. මෙම යෝජනාව සම්බන්ධයෙන් දෙපාර්ශ්වයේම අදහස් ප්‍රකාශ කළා. Order, please! මෙම යෝජනාවට අදාළව දැනුම්දීම් පිළිබඳව, ස්ථාවර නියෝග අත්හිටුවීම පිළිබඳ යෝජනාවට සභාව එකඟද? [බාධා කිරීම] සභාව එකඟද? [බාධා කිරීම]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බහුතරයක් එකඟයි. [බාධා කිරීම]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි,- [බාධා කිරීම] ගරු කථානායකතුමනි,- [බාධා කිරීම]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I have given you the Floor once. - [*Interruption*.]

ගරු විමල් වීරවංශ මහතා (නිවාස හා සමාජ සුබසාධන අමාත්‍ය)
மாண்புமிகு விமல் வீரவங்ச (வீடமைப்பு மற்றும் சமூக நலன்புரி அமைச்சர்)
The Hon. Wimal Weerawansa (Minister of Housing and Social Welfare)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමාගේ point of Order එක මොකක්ද? බහුතරයක් එකඟද?

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. [බාධා කිරීම] ගණන් කරන්න, ගණන් කරන්න. [ඝෝෂා කිරීම්] Do you want a Division? [Uproar.]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා, හැමදාම සිද්ධවෙච්ච. යම් කෙනෙකුට විශ්වාස භංග යෝජනාවක් භාර දෙන්න ඕනෑ නම් ඒ යෝජනාව භාර දීලා නියමිත කාලයකට පසුවයි තමුන්නාන්සේ ඒ යෝජනාව න්‍යාය පුස්තකයට ගේන්නට ඕනෑ. න්‍යාය පුස්තකයට ඒ යෝජනාව ගෙනාවාට පසුව තමයි විවාද කරලා ඡන්ද විමසීමක් කරන්නේ. එහෙම නැතිව, විශ්වාස භංග යෝජනාවක් ගෙනාව දවසේම ස්ථාවර නියෝග අත්හිටුවලා විවාදයට අරගෙන ඡන්ද විමසීම කරන ක්‍රමයක් මේ පාර්ලිමේන්තු ඉතිහාසයේම නැහැ. තමුන්නාන්සේ පක්ෂග්‍රාහීව මේ සභාවේ සම්ප්‍රදාය උල්ලංඝනය කරලා, නීතියට පටහැනිවයි අද මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නට උත්සාහ කරන්නේ. රනිල් වික්‍රමසිංහගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-රතු අලි පැටවු ටික- [බාධා කිරීම]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the House decide. I will let the House decide.- [Uproar.] Quorum Bell එක නාද කරන්න. [බාධා කිරීම]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, ඡන්ද ගණන් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගණන් කරනවා. [ඝෝෂා කිරීම්] පළමුවෙනි පේළිය?[ඝෝෂා කිරීම්] Let the House decide. I am taking a Vote. දැන් අපි ඡන්දයක්- [බාධා කිරීම්] මේක ගන්නවාද, නැද්ද කියලා මේ සභාව තීරණය කරන්න; එච්චරයි. මට තීරණයක් දෙන්නට බැහැ, සභාව තීරණය කරන්න. I go by that decision.

[ඝෝෂා කිරීම්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දැන් ඡන්දය ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ ස්ථාවර නියෝග අත්හිටුවනවාද, නැද්ද කියලා ඡන්දයක් ගන්න, වහාම. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. [ඝෝෂා කිරීම්] මේ යෝජනාවට සභාව එකඟද? [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(මාණ්ඩලික උපදේශකයින්)
(Hon. Members)
එහෙම ගන්න බැහැ, එහෙම ගන්න බැහැ. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
කවුද විරුද්ධ? [බාධා කිරීම්] Okay. [බාධා කිරීම්] "Ayes" have it. බහුතරයක් එකඟයි. බහුතරයක් එකඟ නිසා අපි මේ යෝජනාව ගන්නවා. Please go ahead. -[Uproar.] ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා. [ඝෝෂා කිරීම්] වාඩිවෙන්න. [ඝෝෂා කිරීම්]

අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගත්වය

பிரதம அமைச்சர் மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ உட்பட அமைச்சரவை மற்றும் அரசாங்கத்தின் மீது நம்பிக்கையின்மை

NO CONFIDENCE IN PRIME MINISTER HON. MAHINDA RAJAPAKSA, THE CABINET AND THE GOVERNMENT

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අත්හිටුවීම සඳහා සභාව එකඟ බැවින් මම මෙම යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෙම ගරු සභාව,

1. අතිගරු ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ 2018 ඔක්තෝබර් 26 වන දින හා අංක 2094/43, 2094/43 A සහ 2094/44 දරන අතිවිශේෂ ගැසට් නිවේදන සහ එහි සඳහන් නියෝගයන් සහ පත්කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන බවත්, නීතිය ඉදිරියේ ශූන්‍ය සහ බල රහිත බවත්, නීතිය ඉදිරියේ කිසිදු බලයක් හෝ වලංගුභාවයක් නොමැති බවත්,

2. ඉහත සඳහන් හේතු නිසා 2018 ඔක්තෝබර් 26 වන දා හෝ ඉන් පසුව හෝ පත් කළ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා හා කැබිනට් මණ්ඩලය හා එලෙස පත් කරන ලද්දා වූ ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නොමැති බවත් යෝජනා කර සිටී."

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු විජිත හේරත් මහතා
(මාණ්ඩලික විජිත හේරත්)
(The Hon. Vijitha Herath)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
ගරු විජිත හේරත් මැතිතුමා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්ඩලික විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද විශ්වාස භංග යෝජනාව මම ස්ථිර කරනු ලබනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
වාඩිවෙන්න. [ඝෝෂා කිරීම්]වාඩිවෙන්න. [ඝෝෂා කිරීම්]

[මේ අවස්ථාවේදී ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]

[இச்சந்தர்ப்பத்தில் அரசாங்கத் தரப்பு உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்.]

[At this stage, some Members of the Government walked into the Well of the House and created an uproar.]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
සභාව තීරණය කළේ. [ඝෝෂා කිරීම්] සභාව තීරණය කළේ. [ඝෝෂා කිරීම්] ප්‍රජාතන්ත්‍රවාදීව මේ ප්‍රශ්නය විසඳාගන්න අවස්ථාව දෙන්න. සභාවේ බහුතර තීරණයක් අනුවයි මම මේ තීරණය දුන්නේ. මෙය මගේ තීරණයක් නොවෙයි. සභාවේ බහුතරයක් මෙම යෝජනාව අනුමත කළා. [ඝෝෂා කිරීම්] සභාවේ බහුතරයක් මෙය අනුමත කළා. මට එය වෙනස් කරන්න බැහැ. [ඝෝෂා කිරීම්] ස්ථාවර නියෝග අනුව මට බලතල තිබෙනවා. ඒ නිසා අපි මේ ගැන තීරණයක් ගන්න ඕනෑ. [ඝෝෂා කිරීම්] අපි ඡන්දයක් ගන්නවා. [ඝෝෂා කිරීම්] බහුතර මතය, ඒ. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්ඩලික උපදේශකයින් ඉරුවර්)
(An Hon. Member)
යෝජනාවේ කොපියක් දෙන්න පුළුවන්ද? [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
යෝජනාවේ කොපියක් ලබා දෙන්න පුළුවන්. [ඝෝෂා කිරීම්] යෝජනාවේ කොපියක් දෙන්න පුළුවන්. [ඝෝෂා කිරීම්] යෝජනාව කියෙවිවා. [ඝෝෂා කිරීම්] පුළුවන් නම් යෝජනාවේ කොපියක් ලබා දෙන්න. කොපියක් මම දෙන්නම්. [ඝෝෂා කිරීම්] මන්ත්‍රීවරු ගිහිල්ලා වාඩිවෙන්න.

Order, please! කරුණාකරලා ගිහිල්ලා වාඩිවෙන්න. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්ඩලික උපදේශකයින් ඉරුවර්)
(An Hon. Member)
කෝ, සෙංකෝලය? [ඝෝෂා කිරීම්] මේවාට තමයි හෙණ ගහනවා කියලා කියන්නේ. [ඝෝෂා කිරීම්] නිකම් නොවෙයි, මේවාට තමයි හෙණ ගහනවා කියලා කියන්නේ. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Speaker)
මේ යෝජනාවට සභාව එකඟ ද? [ඝෝෂා කිරීම්] මේ යෝජනාවට විරුද්ධ අය ඉන්නවාද? [ඝෝෂා කිරීම්] මේ යෝජනාවට විරුද්ධ අය ඉන්නවාද? [ඝෝෂා කිරීම්] ආසනයට

ගිහිල්ලා කථා කරන්න. [සෝෂා කිරීම්] සෙංකෝලය මෙතැන තිබෙනවා. සෙංකෝලය තිබෙනවා. මට බලය තිබෙනවා. [සෝෂා කිරීම්] මම සෙංකෝලය පිළිගන්නවා. ඒ වාගේම මට බලතල තිබෙනවා. [සෝෂා කිරීම්]

ස්ථාවර නියෝගය 143 යටතේ මට බලතල තිබෙනවා. [සෝෂා කිරීම්] ඒ අනුවයි මම කථා කරන්නේ. මේ යෝජනාව, පිළිගත්තා. සභාව එකඟ ද, නැද්ද, එච්චරයි මම අහන්නේ. We will take a vote. [සෝෂා කිරීම්] We will take a vote. හැබැයි, මට ඡන්දයක් කරන්න දුන්නේ නැත්නම්, I have to make a decision on "Ayes". සභාව,- [සෝෂා කිරීම්] බෙදුම් සීනුව නාද කරන්න. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Divide by name.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
සභාව කල් දමන්න. සෙංකෝලය කෝ?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ලජ්ජයි, ලජ්ජයි. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මේ සභාවේ ඡන්දය ලබාගැනීමේ අවස්ථාව දෙනවාද?

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
සෙංකෝලය තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I recognize the "*Senkolaya*"; සෙංකෝලය තිබෙන බව මම පිළිගන්නවා. [සෝෂා කිරීම්] ඡන්දය ගන්න අවස්ථාවක් දෙනවාද? නැත්නම් මට මන්ත්‍රීවරුන්ගේ හඬ අනුව තීරණයක් දෙන්න වෙනවා. තමුන්නාන්සේලා වාඩි වුණේ නැත්නම් මන්ත්‍රීවරුන්ගේ හඬ අනුව මට තීරණයක් දෙන්න වෙනවා. [සෝෂා කිරීම්] මෙම යෝජනාවට පක්ෂව?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙම යෝජනාවට විපක්ෂව? [සෝෂා කිරීම්]

මන්ත්‍රීවරුන්ගේ "හඬ" අනුව දැනට පත් කර ඇති ආණ්ඩුවට බහුතරයක්,- [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Divide, by name!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, by name ගනිමු. [සෝෂා කිරීම්] ඡන්දය දෙන්න. [සෝෂා කිරීම්] අපි මහජන මතයට කන්දෙන්න ඕනෑ. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි, ලජ්ජයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලජ්ජා වෙන්න දෙයක් නැහැ, මහජන මතයට කන්දෙන්න ඕනෑ. මම නොවෙයි, මහ ජනයා තීරණය කරයි. කරන්න දෙයක් නැහැ, මහජන මතයට -[සෝෂා කිරීම්] ඔබතුමන්ලා කැමැති නම් by name ඡන්දයක් ගන්න, මම ඒක පිළිගන්නවා. [සෝෂා කිරීම්] ඡන්දයක් විමසන්න ඔබතුමන්ලා මට අවස්ථාව දෙන්නේ නැත්නම්, "හඬ" අනුව මට තීරණයක් දෙන්න වෙනවා. ඒකට අවස්ථාව දෙන්න එපා. "හඬ" අනුව තීරණයක් දෙන්න අවස්ථාවක් දෙන්න එපා. වැදගත් මන්ත්‍රීවරු විධියට හැසිරෙන්න. බහුතර මතය අනුවයි මම ක්‍රියා කරන්නේ. [සෝෂා කිරීම්] මම අවසාන වතාවට කියනවා, මේ ඡන්දය "හඬ" අනුව ගන්නවා. [සෝෂා කිරීම්]

ඒ අනුව දැනට පත් කර ඇති ආණ්ඩුවට බහුතරයක් නොමැති බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. There is no majority for them. - [*Uproar.*] The Motion is carried. [*Uproar.*] -

පාර්ලිමේන්තුව රැස්වෙන්නේ 21වැනිදාද, නැත්නම් හෙටද? තීරණය කරන්න. පාර්ලිමේන්තුව නැවත රැස්වෙන්නේ කවදාද? [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හෙට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට උදේ 10.00ට පාර්ලිමේන්තුව රැස්වෙනවා. [සෝෂා කිරීම්]

පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ.භා. 10.26 ට 2018 නොවැම්බර් මස 15 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.


இதன்படி பாராளுமன்றம், மு.ப.10.26 மணிக்கு, 2018 நவம்பர் 15, வியாழக்கிழமை மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 10.26 a.m., until 10.00 a.m. on Thursday, 15th November, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

264 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 264- இல. 2
Volume 264 - No. 2

2018 නොවැම්බර් 15 වන බ්‍රහස්පතින්දා
2018 நவம்பர் 15, வியாழக்கிழமை
Thursday, 15th November, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් 15වන බ්‍රහස්පතින්දා
2018 நவம்பர் 15, வியாழக்கிழமை
Thursday, 15th November, 2018

පූ.භා.10.00ට පාර්ලිමේන්තුව රැස්විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]
මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய)
தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! [ඝෝෂා කිරීම්]බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීවරුන් වශයෙන් හැසිරෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීවරුන් වශයෙන් හැසිරෙන්න.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ එනම්, 2018 නොවැම්බර් මස 14 වැනි දින ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංග යෝජනාව සම්මත වූ හෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසුරුවන බැවින් සහ නව අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලයක් පත් කර නොමැති බැවින් අද දින කිසිම මන්ත්‍රීවරයෙකු, අගමැතිවරයා හෝ අමාත්‍යවරයෙකු හෝ රාජ්‍ය අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හෝ සභානායක හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හෝ පිළිනොගනිමි. [ඝෝෂා කිරීම්]

පාර්ලිමේන්තුවේ කටයුතු පහසුවෙන් කරගෙන යාම සඳහා සියලුම මන්ත්‍රීවරුන් ඊයේ දින අසුන් ගත් ආකාරයට අද දින ද අසුන් ගත යුතු බව මා තීරණය කරමි. එසේම ස්ථාවර නියෝග යටතේ පාර්ලිමේන්තුවේ සියලුම කටයුතු සම්බන්ධයෙන් අවසාන තීරණය කථානායකවරයා සතු වන අතර, එවැනි තීරණයක් අභියෝගයට ලක් කළ හැක්කේ පාර්ලිමේන්තුව තුළ පමණක් බවද අවධාරණය කරමි.

ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, do you want to make a Statement? ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් නිවේදන කියවීමේදී අමතක කරලා තිබෙනවා පළමුවැනියෙන්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා විසින් යවන ලද ලිපියට පිළිතුරු වශයෙන්, ඔබගේ තීරණය, ලිපිය ප්‍රතික්ෂේප කරමින්, ජනාධිපති එවන ලද නිවේදනය පළමුව කියවන්න. [ඝෝෂා කිරීම්] You must read it. Read it! You must read it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට පිළිතුර මම අද ඉදිරිපත් කරනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක පළමුවෙන්ම කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක පළමුවෙන්ම කරන්න ඕනෑ. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීවරුනි, මේ ගරු සභාවේ විනයක් ඇතිව හැසිරෙන්න. [ඝෝෂා කිරීම්] මගේ පිළිතුරත් සමඟ මම ඒක ඉදිරිපත් කරනවා. [ඝෝෂා කිරීම්] මමත් ජනාධිපතිතුමාට පිළිතුරක් යවනවා. [ඝෝෂා කිරීම්] දෙකම ඉදිරිපත් කරනවා. [ඝෝෂා කිරීම්] ඒ අයිතිය මටත් තිබෙනවා. [ඝෝෂා කිරීම්] දැන් එතුමාට කථා කරන්න දෙන්න. [ඝෝෂා කිරීම්] දැන් කථා කරන්න දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මහින්ද රාජපක්ෂ මැතිතුමාට කථා කරන්න දෙන්න. [ඝෝෂා කිරීම්] දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "ගරු කරු ජයසූරිය, කථානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ..."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට මම පිළිතුරු යවනවා. [සෝෂා කිරීම්] ඒක කියන්න බැහැ. [සෝෂා කිරීම්] ඒක මෙතැන කියන්න අවශ්‍යතාවක් නැහැ. මම පිළිතුරු යවන්නම්. I am not allowing that. [සෝෂා කිරීම්] කථා කරන්න දෙන්න. [සෝෂා කිරීම්] ඔබතුමා කථා කරන්න. [සෝෂා කිරීම්] මහින්ද රාජපක්ෂ මැතිතුමාට කථා කරන්න දෙන්න. [සෝෂා කිරීම්] ඒක මම පිළිගන්නේ නැහැ. I am not giving the Floor. I cannot. [සෝෂා කිරීම්] දෙන්නේ නැහැ. I have given the Floor to the Hon. Mahinda Rajapaksa. [සෝෂා කිරීම්] මම දෙන්නේ නැහැ. [සෝෂා කිරීම්] මම තීරණය කරන්නේ. I will decide on that. [සෝෂා කිරීම්] පාර්ලිමේන්තුවේ මම තීරණය කරන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
I rise to a point of Order. - [*Uproar.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No point of Order can be allowed. I have given the Floor to the Hon. Mahinda Rajapaksa. [සෝෂා කිරීම්] කථා කරන්න දෙන්න. [සෝෂා කිරීම්] කථා කරන්න දෙන්න. මොකක්ද මේ? මේක පාර්ලිමේන්තුවක්. අවස්ථාව දෙන්නකෝ. මේකෙන් ලෝකයට දෙන පණිවුඩය මොකක්ද? [සෝෂා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා අවස්ථාව දෙන්න. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. [සෝෂා කිරීම්]

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ගරු කථානායකතුමනි, -[සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මන්ත්‍රීතුමා? අන්න හරි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මැතිතුමා.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
මන්ත්‍රී වුණත්, අගමැති වුණත්, නිකම් මහින්ද රාජපක්ෂ වුණත් මහින්ද රාජපක්ෂ තමයි කථා කරන්නේ. -[සෝෂා කිරීම්] මතක තබා ගන්න ඒක. [සෝෂා කිරීම්] මට මේක ලොකු නැහැ. [සෝෂා කිරීම්] එතුමාට ලොකුයි, මට ලොකු නැහැ. මම මේකේ ඉඳලා තිබෙනවා, ජනාධිපතිකම් කරලා තිබෙනවා, අගමැතිකම් කරලා තිබෙනවා. මේ අගමැතිකම කියන එක ලොකුවක් නොවෙයි, මට. [සෝෂා කිරීම්] ඒක හින්දා හිතන්න එපා, අගමැතිකමට මේ කථා කරනවා කියලා. [සෝෂා කිරීම්] මේක කජ්ජක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවස්ථාව දෙන්න, කථා කරන්න. ඔබතුමා කථා කරන්න. කථා කරන්න ගරු මැතිතුමා.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
පාර්ලිමේන්තුවේ ඉඳලා ඉතිහාසයේ - ඊටත් එහාට ගිහිල්ලා පාසල් යන කාලයේ -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let him speak. Hon. Kiriella, what is your point of Order? - [*Uproar.*] Okay, go ahead. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් මේ රටේ අගමැතිවරයෙක්, කැබිනට් මණ්ඩලයක් නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
My Order had been announced. [බාධා කිරීම්] ඔබතුමා කථා කරන්න.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
මම තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ, ඉතිහාසයේ පාර්ලිමේන්තුවේ - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! කථා කරන්න දෙන්න.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ඊයේ වාගේ අදුරු දවසක් දැක්කේ නැහැ, ඉතිහාසයේම. [බාධා කිරීම්] කුඩා කාලයේ ඉඳලා පාර්ලිමේන්තුවට ගිහිල්ලා -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉස්කෝලේ යන කාලයේ ඉඳන්ද?

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ඔව්. අර උඩ තට්ටුවේ ඉඳගෙන බලාගෙන ඉඳලා, - [බාධා කිරීම්] මතක තියා ගන්නවා, ඉපදිච්ච දවසේ ඉඳලා. [ඝෝෂා කිරීම්] පාර්ලිමේන්තුවට ගිහිල්ලා හිටියා, අපේ මිනිස්සු. [බාධා කිරීම්] ඒ නිසා මේ ඇමතිකම්, අගමැතිකම් නොවෙයි ප්‍රශ්නය. - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! කථා කරන්න අවස්ථාව දෙන්න. මේ සභාව තුළ ඕනෑම කෙනකුට කථා කරන්න අවස්ථාව තිබෙනවා. නියමිත විධියට හැසිරෙන්න.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

පැවති ආණ්ඩුව විසුරුවලා, ඊළඟ මහ මැතිවරණය තෙක් අන්තර්කාලීන ආණ්ඩුවක් පිහිටුවපු හේතු ජනාධිපතිතුමා පැහැදිලි කරලා තිබෙනවා. පසුගිය ඔක්තෝබර් 26 දින වන විට ජනතාව සිටියේ විශාල පීඩනයකින්. [ඝෝෂා කිරීම්] ඉන්ධන මිල සූත්‍රය හා රුපියලේ කඩා වැටීම නිසා දිනෙන් දින වැඩිවන ජීවන වියදම, කිසි දාක අත් නොදුටු ආකාරයේ බදු බර, මහා බැංකු මං කොල්ලය - මහා බැංකු මංකොල්ලය- නිසා දෙගුණයක් වැඩි වුණු පොලී අනුපාතය, රටේ වරායවල්, ගුවන් තොටුපොළවල්, රජයට අයත් ලාභදායී ව්‍යාපෘති ඇතුළු රජයේ සියලු දේපොළ විදේශිකයන්ට විකිණීමට සැරසීම, විදේශිකයන්ට ඉඩම් සින්නක්කරව විකිණීමට නව නීති සැකසීම, විද්වතුන් හා දේශීය ව්‍යාපාරිකයන්ගේ මතය නොසලකා විදෙස් ගිවිසුම්වලට එළඹීම, ආයෝජකයන්ගෙන් මහා පරිමාණයේ අල්ලස් ඉල්ලීම -මහා පරිමාණයේ අල්ලස් ඉල්ලීම; ඇමතිවරු චෝදනා කළේ.- වගේ කාරණා නිසා, පැවති ආණ්ඩුව ගැන රටේ විශාල අප්‍රසාදයක් තිබුණා. [ඝෝෂා කිරීම්] ඒවා එක එක එළියට එයි.

අපි දැක්කා, ජනාධිපතිතුමා -ඔහොම අහගෙන ඉන්න. ජනාධිපතිතුමා ගැන, යාළුවා ගැන කියන්නේ. - පසුගිය කාලයේ එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික කළමනාකරණ කම්ටුව විසුරුවා රටට වෙමින් තිබෙන විනාශය අවම කර ගන්න යම් උත්සාහයක් ගත්තා.

මේ කාරණා ගැන අගමැතිතුමා සමඟ කැබිනට් මණ්ඩලයේ බහින් බස්වීම් ගැනත් අපට අසන්නට ලැබුණා. [ඝෝෂා කිරීම්] ඒ අවස්ථාවේ තමයි, පොලීසියේ පිරිසකුත් හවුල් වෙලා ජනාධිපතිවරයාවත්, හිටපු ආරක්ෂක ලේකම්වරයාවත් ඝාතනය කරන්න එක්සත් ජාතික පක්ෂයේ පිරිසකුත් [ඝෝෂා කිරීම්] - එක්සත් ජාතික පක්ෂයේ පිරිසකුත්- කුමන්ත්‍රණය කළාය කියන ආරංචිය, පටිගත කරපු සාක්ෂි සහිතව අපට අහන්න ලැබෙන්නේ. තත්ත්වය එතැනට ගියාට පස්සේ තමයි එක්සත් ජනතා නිදහස් සන්ධාන පාර්ශ්වය ආණ්ඩුවෙන් ඉවත් කර ගැනීමට ජනාධිපතිවරයා තීන්දු කළේ. එක්සත් ජනතා නිදහස් සන්ධානය ආණ්ඩුවෙන් ඉවත් වෙනවාත් එක්කම, පැවතුණු සභාග ආණ්ඩුව විසිරුණා. ඒ අවස්ථාවේ ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එතුමාට ලැබී ඇති බලතල අනුව අග්‍රාමාත්‍ය ධුරය භාරගෙන ආණ්ඩුවක් පිහිටුවන්න කියලා මට ආරාධනා කළා. එහෙම නේ ආවේ. [ඝෝෂා කිරීම්]

ඒ අවස්ථාවේදී මට තෝරා ගැනීමක් තිබුණා, එක්කෝ එම ආරාධනය පිළිගන්න; නැත්නම් ප්‍රතික්ෂේප කරන්න. මට ඕනෑ නම් කියන්න තිබුණා, "යූඇන්පී එක අවුරුදු හතරකට කිට්ටු කාලයක් හිටපු විධියට ඉතිරි ටිකත් හිටපුදෙන්" කියලා. තව අවුරුද්දයි තිබුණේ. [ඝෝෂා කිරීම්] තව අවුරුද්දයි තිබුණේ. අපි තමයි ප්‍රධාන විපක්ෂ බලවේගය. අපි තමයි විපක්ෂයේ වාඩි වෙලා හිටිය බලවේගය, කථානායකතුමා පිළිගත්තේ නැති වුණාට. අපි තමයි රටේ ලොකුම දේශපාලන පක්ෂය. අපට යුතුකමක් තිබෙනවා, රටේ ජනාධිපතිතුමා, මුළු රටටම වෙන්න ගිය මහා විනාශයක් වළක්වා ගන්න අපට රට භාර දෙනකොට ඒ වගකීම භාර ගන්න. [ඝෝෂා කිරීම්] ඒක අපට තිබුණු, වගකීමක්. ඒ අනුව, මම ඒ වගකීම භාර ගත්තා. ඒ වාගේම මට තිබුණු ප්‍රශ්නය තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තවත් අවුරුද්දක් තිබුණා නම් රටට මොනවායින් මොනවා වෙච්ච කියන එක. [ඝෝෂා කිරීම්] 2015 ජනවාරි ඉඳලා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විදේශ විනිමය ණය චිතරක් ඇමෙරිකානු ඩොලර් බිලියන 21ක් ලබා ගෙන තිබෙනවා. [ඝෝෂා කිරීම්] ඩොලර් බිලියන 21ක්! [ඝෝෂා කිරීම්] "ණය, ණය, ණය" ගානවා. [ඝෝෂා කිරීම්] මේ ඉවක් බවක් නැති ණය ගැනිල්ල තමයි රටට වෙමින් තිබුණු ලොකුම විනාශය. අපි පිහිටෙව්වේ, මහ මැතිවරණයක් පවත්වනතුරු, අන්තර්කාලීන ආණ්ඩුවක් පමණයි. [ඝෝෂා කිරීම්] ඒ නිසා තමයි ඒකාබද්ධ විපක්ෂයේ සුළු පිරිසක් පමණක් ආණ්ඩුවේ ඇමතිකම් භාර ගත්තේ. රට ප්‍රපාතයට යනවාත් එක්කම ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි පසුගිය කාලයේ දිගින් දිගටම මහ මැතිවරණයක් ඉල්ලා සිටියා. නමුත්, පැවති ආණ්ඩුව මැතිවරණ සිතියම අකුළලායි තිබුණේ. 2015 මාර්තු මාසයේ විසිරවනු ලැබූ පළාත් පාලන ආයතනවලට ඡන්දය පවත්වා ගන්න අවුරුදු තුනක් ගියා. පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කරලා, සීමා නිර්ණය ගැටලු තිබෙනවායි කියලා ඡන්දය කල් දැම්මා. උසාවියේ නඩු දාලා, පළාත් පාලන ඡන්දය නොතියන තැනට වැඩ සලස්වන්න හදන කොට, මැතිවරණ කොමිසමේ සභාපතිවරයා, සීමා නිර්ණය ගැටලු නැති පළාත් පාලන ආයතන සඳහා ඡන්දය පවත්වන්න සූදානම් වුණාම තමයි ආණ්ඩුව අවසානයේදී ඒ මැතිවරණයවත් පැවැත්වූවේ. [ඝෝෂා කිරීම්]

අද වනකොට සබරගමුව, උතුරු මැද හා නැඟෙනහිර පළාත් සභා විසුරුවලා අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. උතුරු මැද පළාත් සභාවත් විසුරුවලා, නැඟෙනහිර පළාත් සභාවත් විසුරුවලා. දැන් ලොකුවට ඡන්දය දෙනවා. ඒ පළාත් සභා විසිරිලා දැනට අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. පසුගිය මාසය වන විට උතුරු පළාත් සභාව ඇතුළු තවත් පළාත් සභා තුනක් විසිරිලා ගියා. නමුත්, ඡන්දය නැහැ. ජනාධිපතිතුමාත් තමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හිමි බලතල අනුව පාර්ලිමේන්තුව විසුරුවලා ඡන්දයක් කැඳෙවුවාම, ලංකා ඉතිහාසයේ පළමු වතාවට එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු පක්ෂ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා මැතිවරණයක් පැවත්වීමට විරුද්ධව. [ඝෝෂා කිරීම්]මේ පාර්ශ්වය තමයි ගිය අවුරුද්දේ කිසිම හිරිකිතයක්, ලජ්ජාවක් නැතිව පළාත් පාලන ඡන්දයත්, පළාත් සභා ඡන්දයත් දින නියමයක් නැතිව කල් දමා ගන්න කටයුතු කළේ. වෙනත් කාරණාවලට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබුණු පනත් කෙටුම්පත්වලට කාරක සභා අවස්ථාවේදී පස්ස දොරෙන් සංශෝධන ගෙනැල්ලා ඡන්ද ක්‍රමයත් මුළුමනින්ම අවුල් කරලා, ඒ ඡන්ද කල් දමා ගෙන මේ රටේ ජනතාවගේ ඡන්දය දැමීමේ අයිතිය එදාත් මේ පිරිස විසින්ම පැහැර ගත්තා. අද මම පාර්ලිමේන්තුවට එනකොට පෝස්ටරයක් දැක්කා. "මහ මැතිවරණයකින් මූලික මිනිස් අයිතිවාසිකම් කැඩෙන්නේ කාගේද?" යනුවෙන් එහි සඳහන්ව තිබුණා. මේක වැදගත් ප්‍රශ්නයක්. [බාධා කිරීම්] මහා මැතිවරණයකින් මූලික අයිතිවාසිකම් කැඩෙන්නේ කාගේද? මේක හොඳ ප්‍රශ්නයක්. "යුතුකම" කියලා සංවිධානයක් පෝස්ටරයක් ගහලා තිබෙනවා. මටත් අද අහන්න තිබෙන්නේ, "කාගේද අයිතිවාසිකම් නැති වෙන්නේ" කියලායි. අපේ රටේ 1947, 1951, 1956, 1960 පත්වුණු සියලුම පාර්ලිමේන්තු කලින් විසුරුවලා මහ මැතිවරණ

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

පැවැත්වූයේ ජනතාවට තම පරමාධිපත්‍ය බලය තුළින් තමන්ට කැමති ආණ්ඩුවක් පත් කර ගැනීමට ඉඩ දෙන්නයි.

ඒකෙන් තමයි ඒ කාලයේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය රැකුණේ. පැවැති ආණ්ඩුවට මේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ කියලා අවබෝධ වුණු නිසා තමයි ජනාධිපතිතුමා මට භාර ගන්න කියා කිව්වේ. [සෝෂා කිරීම] මම අගමැති හැටියට දිවුරුම් දුන් ගමන්ම රට පුරාම නව බලාපොරොත්තු සහගත හැඟීමක් පැතිර ගියා. [සෝෂා කිරීම] ඔව්. හොරු ගැන ළඟදීම කියන්නම්. දැන් අපි ළඟට ලැයිස්තු එනවා. අපේ කථානායකතුමා බටහිර තානාපති කාර්යාලත්, තමන්ගේ පක්ෂයත් එක්ක එකතු වෙලා රටේ ව්‍යවස්ථාවටත්, පාර්ලිමේන්තුවටත්, ස්ථාවර නියෝගවලටත් පටහැනිව මට විරුද්ධව ශබ්දය අනුව විශ්වාස භංග යෝජනාවක් සම්මත කර ගත්තාය කියනවා. [සෝෂා කිරීම] ඒක රටට විරුද්ධව. ශබ්දයෙන් බැහැ, යෝජනා සම්මත කර ගන්න.[සෝෂා කිරීම] ඒ වාගේ වැදගත් එකක් ශබ්දයෙන් කරන්නට තිබුණේ නැහැ; ඡන්දය ගන්න තිබුණා. ඔබතුමා ඒක ශබ්දයෙන් කළා. [සෝෂා කිරීම] ඊළඟට කියයි -[සෝෂා කිරීම] කථානායකවරයාගේ ඊනියා විශ්වාසභංගයෙන් පස්සේ හිටපු අගමැතිතුමා නැවතත් අගමැතිවෙලා කියලා, හිටපු අමාත්‍යවරු ඒගොල්ලන්ට කලින් තිබුණු අමාත්‍යාංශවලටත් ගිහින් තිබෙනවා. [සෝෂා කිරීම] රටේ අගමැතිවරයා ඇතුළු ඇමති මණ්ඩලය පත් කරන්නේ ජනාධිපතිතුමා; කථානායකතුමා නොවෙයි. ඔබේ බලය වරදවා තේරුම් ගන්නට එපා කථානායකතුමනි. [සෝෂා කිරීම] පාර්ලිමේන්තුවට හෝ කථානායකවරයාට ඒ බලය ව්‍යවස්ථාවෙන් දීලා නැහැ. ඔබතුමා ඒක හොඳට දන්නවා. දැන දැනයි ඔබතුමා මේක කරන්නේ.

බලයක් නැහැ කියලා දැන දැන මූලාසනයේ වාඩි වෙලා, මූලාසනයේ බලය අයුතු ලෙස පාවිච්චි කරනවා. නමුත්, දැන් පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයක් අතර මත ගැටුමක් තිබෙනවා. මේ ආරවුල පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනා අතරේ විසඳා ගන්නේ නැතුව, මේ රටේ ලක්ෂ 150ක් ඉක්මවන ඡන්දදායක ජනතාවට භාර දෙමු. [සෝෂා කිරීම] අපි භාර දෙමු. මම යෝජනා කරනවා. [සෝෂා කිරීම] ඒකයි පාර්ලිමේන්තු සම්ප්‍රදාය. දේශපාලනඥයන් හැටියට අපි හැමෝම තේරුම් ගන්න ඕනෑ අපේ ව්‍යවස්ථාවට අනුව පරමාධිපත්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට නොවෙයි, ජනතාවටයි කියන එක. වැදගත් වෙන්නේ, මේ රටේ ජනතාවයි. පාර්ලිමේන්තුවට -[සෝෂා කිරීම]

ජනතා විමුක්ති පෙරමුණ ඊයේ කිව්වා, පාර්ලිමේන්තුව විසුරුවා ඡන්දයකට යන්න යෝජනාවක් ආවොත් ඒ ගොල්ලෝ ඒකට පක්ෂ වනවාය කියලා. ඒ ගැන මම සන්තෝෂ වනවා. එක්සත් ජාතික පක්ෂය මොකක්ද කියන්නේ? ඔවුන්ගේ ස්ථාවරය මොකක්ද? එය මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශ කරන්න. ඡන්දයකට යන්න කැමැතිද, නැද්ද? [සෝෂා කිරීම] අකැමැතිද? [සෝෂා කිරීම]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආණ්ඩුව පිහිටුවන්න -[සෝෂා කිරීම]

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
අපි ගේනවා. [සෝෂා කිරීම]

ජනතාවට තමන්ගේ අභිමතය අනුව නව රජයක් තෝරා පත් කර ගන්න සාධාරණ හා යුක්ති සහගත මැතිවරණයක් පවත්වන්න මා සමඟ අත්වැල් බැඳ ගන්න කියා මා ඉල්ලා සිටිනවා. මා මේ මන්ත්‍රීවරු 225දෙනාටම කියන්නේ, කරුණාකරලා අපිත් එක්ක එක්කහු වෙන්න; අපි මැතිවරණයකට යමු.

පෙන්ෂන් ගැන හිතන්න එපා. ඒකට ලොක්කා අද මොනවා හරි කරයි. [සෝෂා කිරීම] We want a General Election. ඒ වාගේම අද ප්‍රශ්න තිබෙනවා. අද වතුකරයේ ජනතාවගේ ප්‍රශ්නයක් තිබෙනවා. රුපියල් 1,000ක් ඉල්ලා ඔවුන් සටන් කරනවා. එය සාධාරණ සටනක්. අනික් පැත්තෙන් දවස ගණනේ වැඩිවන භාණ්ඩ මිල අඩු කරන්න අපට වගකීමක් තිබෙනවා. [සෝෂා කිරීම] ලෝක වෙළෙඳ පොළේ පෙට්‍රල් මිල අඩු වනකොටත් මිල සූත්‍රය අනුව අපේ රටේ ඉන්ධන මිල වැඩි වුණා. ඒක හින්දා මම අද ආපහු ඇමතිවරයාට කියනවා, පෙට්‍රල් මිල තවත් අඩු කරන්න කියලා. ගරු කථානායකතුමනි,- [සෝෂා කිරීම] ඔබතුමන්ලා වැඩි කරපු පෙට්‍රල් මිල අපි අඩු කරනවා.[සෝෂා කිරීම] අද රටත් අඩු කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් අපි බලාපොරොත්තු වන්නේ ස්වාධීන කථානායකවරයෙක්. පක්ෂග්‍රාහී කථානායකවරයෙක් නොවෙයි.

ඔබතුමා පත් කරනකොට සියලුදෙනාම එකතු වුණා; විපක්ෂයේත් ආණ්ඩුවේත් ඔක්කෝම. ඒකෙන් බලාපොරොත්තු වුණේ ඔබතුමා ස්වාධීන වෙයි කියලා. ඔබතුමා අද ඔබතුමාගේ පක්ෂය වෙනුවෙන්, ඔබතුමාගේ බටහිර යාළුවන් වෙනුවෙන් පෙනී සිටීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. [සෝෂා කිරීම]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා. [සෝෂා කිරීම] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order. [සෝෂා කිරීම]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, [සෝෂා කිරීම]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ හා එතුමාගේ කතාව කෙරෙහි විශ්වාසය නොමැති බවට යෝජනාවක් මම ඉදිරිපත් කරනවා. [ඝෝෂා කිරීම්] මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නමින් ඡන්දයක් ගන්න කියලා. Sir, I call for a Division by name. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද, to take a Vote? [ඝෝෂා කිරීම්] Order, please! සභාව එකඟද? [ඝෝෂා කිරීම්] මේක මට තීරණය කරන්න බැහැ. ගරු සභාව තීරණයක් ගන්න. [ඝෝෂා කිරීම්] ගරු සභාව තීරණයක් ගන්න. [ඝෝෂා කිරීම්] Order, please! We are going to take the Vote by name. [ඝෝෂා කිරීම්]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
You cannot -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Go and sit there. - [*Uproar*] Sit there and talk, not here.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
Sir, how can you -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I can. I have the right. - [*Uproar*] No. You go and sit there. - [*Uproar*] Behave yourself. - [*Uproar*] I have the right. We are going to approve. - [*Uproar*] We will look at that. - [*Uproar*] Get back to your seats. - [*Uproar*]

[මෙම අවස්ථාවේදී මන්ත්‍රීවරු පිරිසක් ගරු කථානායකතුමාගේ ආසනය අසලට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]
[இச்சந்தர்ப்பத்தில் பாராளுமன்ற உறுப்பினர்கள் சிலர் அக்கிராசனத்துக்கு அருகே வந்து கோஷமெழுப்பினர்.]
[At this stage, some Members rushed in towards the Speaker's Chair and created an uproar.]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ප්‍රජාතන්තවාදීව කටයුතු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්න දෙන්නේ නැහැනේ. [ඝෝෂා කිරීම්]

කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] බැහැ. I have to proceed. - [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඡන්දයක් ඕනෑ. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ඡන්දය,- [ඝෝෂා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඡන්ද බැහැ, ඡන්ද බැහැ. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද අපි ඡන්දයක් ගන්නවා. ඒකට සහාය දෙන්න. අද පාර්ලිමේන්තුවේ වැඩසටහන් පිළිබඳ තීරණය කරන්නේ මේ ගරු සභාව මඟින්. [ඝෝෂා කිරීම්] පාර්ලිමේන්තුවේ බහුතරය, [ඝෝෂා කිරීම්] පාර්ලිමේන්තුවේ බහුතරය කවුද? [ඝෝෂා කිරීම්] මතක තියා ගන්න. [ඝෝෂා කිරීම්] මම පාර්ලිමේන්තුවේ කථානායක. හරි දේ හරි. කවුරු කිව්වත් කරන්න දෙයක් නැහැ. [ඝෝෂා කිරීම්] මට ඕනෑ පාර්ලිමේන්තුවේ තීරණය ගන්නයි. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
රට වටේම පොල් ගහයි. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, හරි කමක් නැහැ. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන අයිතිය කියන්න. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තර්ජනය කරන්න බැහැ, ඔය ගොල්ලන්ට. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව, - [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි, ලජ්ජයි. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව අවසන් කරන්නට බැහැ. [ඝෝෂා කිරීම්] කල් තැබීම් කරන්න බැහැ. [ඝෝෂා කිරීම්] ඡන්දයක් ගන්න ඕනෑ. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Sir, Party Leaders' meeting එකක් කැඳවන්න. [සෝෂා කිරීම්] සභාව කල් දමලා, Party Leaders' meeting එකක් කැඳවන්න [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Party Leaders' meeting එකක් කැඳෙව්වත් වැඩක් නැහැ නේ. [සෝෂා කිරීම්] - කැඳවන්න ඕනෑ. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බහුතරය පෙන්නුවාම අපි යන්නම්. "චණ්ඩි පාට්" දමන්න එපා. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
By name ගන්න පුළුවන් නේද? [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව කටයුතු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ආරම්භ කරනවා. [සෝෂා කිරීම්] ඡන්දය ගණන් ගන්නවා, වාඩිවෙන්න. -[සෝෂා කිරීම්] By name - [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, ඡන්දයට භය? [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද රාජපක්ෂ මහතාගේ කථාව සම්බන්ධයෙන් අදාළ යෝජනාවට පක්ෂව. [සෝෂා කිරීම්] ඒ යෝජනාවට පක්ෂද? [සෝෂා කිරීම්] අද මහින්ද රාජපක්ෂ මැතිතුමා කළ ඒ කථාව පිළිබඳ- [සෝෂා කිරීම්] යෝජනාවට පක්ෂව,- [සෝෂා කිරීම්]

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
ලජ්ජයි ලජ්ජයි. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Sir, Party Leaders' Meeting එකක් කැඳවන්න. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කැඳවන්නේ කොහොමද? කථා කරන්න දෙන්නේ නැහැ නේ. [සෝෂා කිරීම්]

ඒ අනුව තුන්වන වතාවට, යෝජනාවට පක්ෂව අත ඔසවන්න. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Ayes! - [Uproar.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාවට විපක්ෂව අත ඔසවන්න. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Motion is carried. - [Uproar.]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
By name ගන්න. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
By name ගන්න බැහැ. [සෝෂා කිරීම්] පාර්ලිමේන්තුව හෙටට කල් තබනවා. [සෝෂා කිරීම්]


පාර්ලිමේන්තුව පූ. භා. 10.42ට, 2018 නොවැම්බර් 16 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.

பாராளுமன்றம் மு. ப. 10.42 மணிக்கு, 2018 நவம்பர் 16, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned at 10.42 a.m until 1.30 p.m on Friday, 16th November, 2018.

264 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 264 - இல. 3
Volume 264 - No. 3

2018 නොවැම්බර් 16 වන සිකුරාදා
2018 நவம்பர் 16 ,வெள்ளிக்கிழமை
Friday, 16th November,2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් 16 වන සිකුරාදා
2018 நவம்பர் 16 ,வெள்ளிக்கிழமை
Friday, 16th November,2018

අ.භා 2.10 පාර්ලිමේන්තුව රැස්විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪවිය.
பாராளுமன்றம் பி.ப. 2.10 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 2.10 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

[ඒ වන විටත් ආණ්ඩු පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් මූලාසනය වටා රැස්ව ඝෝෂා කරමින් සිටියහ.]
[அப்போது ஆளுந்தரப்பு உறுப்பினர்கள் சிலர் அக்கிராசனத்தைச் சூழ்ந்துகொண்டு கோஷமிட்டுக்கொண்டிருந்தனர்.]
[At this stage, some Members of the Government gathered around the Chair and were making an uproar.]

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
Order, please! [ඝෝෂා කිරීම්] කථානායකවරයාගේ නිවේදන. පවතින නොසන්සුන්කාරී තත්ත්වය තුළ සභා ගර්භය තුළට පොලීසිය කැඳවීමට මම අවසර දුන් බව සභාවට දන්වා සිටිමි. අද දවසේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා ස්ථාවර නියෝග පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා. [ඝෝෂා කිරීම්] ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා. [ඝෝෂා කිරීම්] ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon.M.A. Sumanthiran)
Sir, I move,

"In terms of Standing Order No. 135 that Standing Order No. 27 be suspended for the day in order to move the No-Confidence Motion. " - [*Uproar.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
එම යෝජනාව ස්ථිර කිරීම. [ඝෝෂා කිරීම්]

ගරුඅජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ස්ථිර කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ අතිගරු ජනාධිපතිතුමා එකඟ වූ පරිදි විශ්වාස භංග යෝජනාවේ පළමු වගන්තිය ඉවත් කර, එම යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම; ස්ථිර කිරීම.[ඝෝෂා කිරීම්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුරදිසානායකමහතා
(மாண்புமிகுඅනුරතිස්නායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු කථානායකවරයා විසින් නිකුත් කරන ලද 2018 නොවැම්බර් මස 15 වන දින දරන නිවේදනය ප්‍රකාරව 2018 නොවැම්බර් මස 14 දින ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවේ අංක 02 දරන යෝජනාව සම්මත වූ හෙයින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලය විසිරුණු බවට වන නිල ප්‍රකාශය මෙම ගරු සභාව පිළිගන්නා අතර;

මෙම ගරු සභාව 2018 ඔක්තෝබර් මස 26 වෙනි දින සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ගරු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නොමැති බව යෝජනා කර සිටියි."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
ස්ථිර කිරීම. [ඝෝෂා කිරීම්]

ගරු විජිතහේරත්මහතා
(மாண்புமிகுවිජිතහේරත්)
(The Hon. VijithaHerath)
ස්ථිර කරනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
මෙම යෝජනාවට පක්ෂව. [ඝෝෂා කිරීම්]

ගරුමන්ත්‍රීවරු
(மாண்புமிகுஉறுப்பினர்கள்)
(Hon. Members)
Aye! - [*Uproar.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)
(The Hon. Speaker)
එම යෝජනාවට විරුද්ධව. [ඝෝෂා කිරීම්] හරි. මේ අවස්ථාවේදී මම කැමැතියි, නම්වලින් ඡන්දය ගන්න. නම්වලින් ඡන්දය ගන්න බැරි නිසා, I am ordering that "Ayes" will have it. - [*Uproar.*] "Ayes" will have it. - [*Uproar.*] The Motion is carried. [*Uproar.*]

සභාව කල්තැබීම, 2018 නොවැම්බර් මස 19 වැනි දා පස් වරු 1.00ට. [ඝෝෂා කිරීම්]


පාර්ලිමේන්තුව අ.භා. 2.17ට 2018 නොවැම්බර් මස 19 වන සඳුදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

பாராளுமன்றம், பி.ப. 2.17 மணிக்கு, 2018 நவம்பர் 19, திங்கட்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned at 2.17 p.m., until 1.00 p.m. on Monday, 19th November, 2018.

264 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 264 - இல. 4
Volume 264 - No. 4

2018 නොවැම්බර් 19වන සඳුදා
2018 நவம்பர் 19, திங்கட்கிழமை
Monday, 19th November, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් 19වන සඳුදා
2018 நவம்பர் 19, திங்கட்கிழமை
Monday, 19th November, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

තේරීම් කාරක සභාව
தெரிவுக்குழு
COMMITTEE OF SELECTION

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අද දින පක්ෂ නායකයන් කථානායකතුමා සමඟ පැවති රැස්වීමේදී එළඹී තීරණය පරිදි තේරීම් කාරක සභාව පත් කිරීමට තීරණය කරන ලද බවත්, ඒ අනුව පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ නියෝජනය වන පරිදි ඒ සඳහා මන්ත්‍රීවරුන්ගේ නම් හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත එවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ඒ අනුව අද දින රැස්වීමේ වැඩ කටයුතු මෙයින් අවසන් කරන අතර, පාර්ලිමේන්තුව නැවත 2018.11.23වන දින, -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order. -[*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.-[*Interruption.*]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මේ මාසයේ 14,15,16 යන දිනවල පාර්ලිමේන්තුව තුළ ඇතිවුණු සිද්ධීන් ගැන පරීක්ෂණයක් කරන්න. එහිදී රාජ්‍ය දේපොළ විනාශ වුණා. රටේ නීතිය අනුව ඔවුන්ට දඬුවම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම ආරම්භ කරන්න කියා මම ඉල්ලීමක් කරනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කථානායකවරයාගේ හැසිරීම ගැනත්, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඒ කාරණය පිළිබඳව ගරු කථානායකතුමා දැනුවත් කිරීමට මම කටයුතු කරනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා සහ ආණ්ඩුව,- [බාධා කිරීම්] ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා සහ රජය පිළිගනිමින්, පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව පත් කරන විට රජයේ එම පිළිගැනීම අනුව එය සිදුවිය යුතු බවත්, පාර්ලිමේන්තුවේ කටයුතු භාරව තිබෙන්නේ රජයට බවත්, ආණ්ඩුව හැටියට එම කටයුතු ගෙන යාමට තේරීම් කාරක සභාවේ බහුතරය ආණ්ඩුවට හිමිවිය යුතු බවත් මම ඔබතුමාට දැනුම් දෙනවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) අනුව්‍යවස්ථාව යටතේ මේ වෙලාවේ ලංකාවේ රජයක් නැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

මෙම කරුණ පිළිබඳව, - [බාධා කිරීම්]

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.බී. දිසානායක මැතිතුමා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම කරුණාවෙන් මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. රජයක් නැත්නම් තේරීම් කාරක සභාවක් පත් කරන්න බැහැ. ඒ නිසා රජයක් තිබෙන බව පිළිගෙන, නීත්‍යානුකූලව අපි තේරීම් කාරක සභාව පත් කරමු.

බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 14වන දා පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් සම්මත වූ බවත්, අග්‍රාමාත්‍යවරයෙක් හෝ ආණ්ඩුවක් නොමැති බවත් පසුගිය 15වන දා ගරු කථානායකතුමා නිශ්චිත වශයෙන් පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබුවා. [බාධා කිරීම්] දැන් පාර්ලිමේන්තු කටයුතු සඳහා අවශ්‍ය වන තේරීම් කාරක සභාව පත් කරන්නේ නම්, පාර්ලිමේන්තුවේ බහුතරය නැතිව ඒ තේරීම් කාරක සභාව ඇතුළේ බහුතරය හදාගන්න එක සාධාරණ නැහැ. [බාධා කිරීම්] පාර්ලිමේන්තුවේ ඒ ඒ පක්ෂ නියෝජනය කරන පිළිවෙළට අනුරූපීව තමයි තේරීම් කාරක සභාවට නියෝජිතයන් පත් විය යුතු වන්නේ. පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති කණ්ඩායමකට තේරීම් කාරක සභාවේ බහුතරයක් ලබාදීම කිසිසේත්ම යුක්ති සහගත නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්]

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට කථා කරන්න මම අවස්ථාවක් දුන්නා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉඳගන්නවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මෙම කරුණු පිළිබඳව අද දින පැවැති පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී සාකච්ඡා කළා. සාකච්ඡා කරලා, මේ පිළිබඳ ගත්ත තීරණය ගැන තමයි මම මේ ඔබතුමන්ලා දැනුවත් කළේ.

ඒ අනුව අද දින රැස්වීමේ කටයුතු මෙයින් අවසන් කරන අතර, පාර්ලිමේන්තුව 2018.11.23වන සිකුරාදා දින පූර්ව භාග 10.30 දක්වා කල් තබනු ලැබේ.


පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 1.05 ට, 2018 නොවැම්බර් මස 23 වන සිකුරාදා පූ.භා. 10.30 වනතෙක් කල් ගියේය.

அதன்படி பாராளுமன்றம், பி.ப. 1.05 மணிக்கு, 2018 நவம்பர் 23, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 1.05 p.m., until 10.30 a.m. on Friday, 23rd November, 2018.

264 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 264 - இல. 5
Volume 264 - No. 5

2018 නොවැම්බර් 23 වන සිකුරාදා
2018 நவம்பர் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd November, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

තේරීම් කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම

කල් තැබීමේ යෝජනාව:

වර්තමාන දේශපාලන අර්බුදය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

தெரிவுக்குழு: உறுப்பினர்கள் நியமனம்

ஒத்திவைப்புப் பிரேரணை:

தற்போதைய அரசியல் நெருக்கடி

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Committee of Selection: Nomination of Members

ADJOURNMENT MOTION:
Current Political Crisis

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් **23**වන සිකුරාදා
2018 நவம்பர் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd November, 2018

ප.භා.10.30ට පාර්ලිමේන්තුව රැස්වීය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

තේරීම් කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
தெரிவுக்குழு : உறுப்பினர்கள் நியமனம்
COMMITTEE OF SELECTION : NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද දින පවත්වන ලද පක්ෂ නායක රැස්වීමේදී තේරීම් කාරක සභාවට නාම යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව එකඟතාවට එළඹීමට නොහැකි විය. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114 යටතේ පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවල නායකයන් හා ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව මාගේ සභාපතිත්වයෙන් 12 දෙනෙකුගෙන් එම කාරක සභාව පත් කළ යුතුය. මා ඉහත සඳහන් කළ ආකාරයට මෙම පත්කිරීම් පිළිබඳව පක්ෂ නායකයන්ගේ පූර්ණ එකඟතාව නොමැති වූ බැවින් ස්ථාවර නියෝග 136 හා 143 යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තේරීම් කාරක සභාව සඳහා පහත නම් සඳහන් සභික මන්ත්‍රීන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා නම් කර සිටිමි.

එක්සත් ජනතා නිදහස් සන්ධානය:

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු එස්.බී. දිසානායක මහතා
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු විමල් වීරවංශ මහතා

එක්සත් ජාතික පක්ෂය:

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා

ඉලංගෙයි තමිල් අරසු කච්චි:

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ජනතා විමුක්ති පෙරමුණ:

ගරු විජිත හේරත් මහතා

මීළඟට, ස්ථාවර නියෝග 19 යටතේ හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අද දින පෙරවරුවේ අපි ඔබ හමුවුණු අවස්ථාවේදී පැහැදිලි කර සිටියා, පාර්ලිමේන්තුවේ මෙතෙක් පැවති සෑම ආණ්ඩුවක් යටතේත්, හැම පාර්ලිමේන්තුවක් යටතේත් පාර්ලිමේන්තුවේ වැඩිම මන්ත්‍රී කණ්ඩායමක් නියෝජනය කරන පක්ෂය වන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයයි කියා.

දෙවැනි කාරණය, අතිගරු ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කර ඇති අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන රජය වන්නේ අපි නියෝජනය කරන මන්ත්‍රී කණ්ඩායමයි. තුන්වන කාරණය, ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා පාර්ලිමේන්තුවේ සභානායක ධුරය, සංවිධායක ධුරය පත් කර තිබෙන බව. මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය ලෙස කටයුතු කරමින්, රටේ එදිනෙදා ජනතා ප්‍රශ්න විසඳමින් ඉදිරියට ගමන් කරන ආණ්ඩුවක් විධියට අපි කටයුතු කරනවා. මෙවැනි ආණ්ඩුවක් පවතින පාර්ලිමේන්තුව තුළ - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්නට අවස්ථාව දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව, අලුත් ආණ්ඩුවක් පත් වුණාම, පාර්ලිමේන්තුව කල්තබා තිබෙනවා නම්, එසේ නැත්නම් අලුත් පාර්ලිමේන්තුවක් තේරී පත් වෙනවා නම්, අග්‍රාමාත්‍යවරයා හා ආණ්ඩුවයි පාර්ලිමේන්තුවේ එම කටයුතු මෙහෙය වන්නේ. තේරීම් කාරක සභාව, කාරක සභා සියල්ල පත් කරන කාරක සභාව වන හෙයින්, ඒ කටයුතු මෙහෙය වන ආණ්ඩුවට හා අග්‍රාමාත්‍යතුමාට බහුතරයක් ලබා දීම දිගටම සුළුතර ආණ්ඩු තිබුණු පාර්ලිමේන්තුවලත්, බහුතර ආණ්ඩු තිබුණු පාර්ලිමේන්තුවලත් සිදු කර තිබෙන පාර්ලිමේන්තු සම්ප්‍රදායක්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්නට අවස්ථාව දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

.එම නිසා, අපි අද පෙරවරුවේ ගරු කථානායකතුමාට සඳහන් කළ පරිදි, ඔබතුමා ප්‍රකාශයට පත් කර තිබෙන වැරදි තීරණය, ශබ්ද නහා සෝෂා කළාය කියා " ආණ්ඩුවක් නැහැ." කියන කාරණය අපි පිළිගන්නේ නැහැ කියන එක ගරු කථානායකතුමාට කියන්න ඕනෑ.

ආණ්ඩුවක් හැටියට අපි වැඩ කරනවා. ඒ නිසා ගරු කථානායකතුමාත්, මහ ලේකම්වරයාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය නොකොට, ඒ අනුව පාර්ලිමේන්තුව මෙහෙය වීමට කටයුතු කිරීමේ වගකීම තිබෙනවාය කියන එක ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේ සඳහන් කරනවා.

12දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සභික මන්ත්‍රී ධුර 7ක් අපි ඉල්ලා සිටියේ, දිගටම බහුතරය ආණ්ඩුවට ලබා දී තිබෙන සම්ප්‍රදාය හා පිළිවෙත අනුවයි. එවැනි පදනමක් තිබියදී -එවැනි තත්ත්වයක් යටතේ- ගරු කථානායකවරයා හැටියට ඔබතුමා පාර්ලිමේන්තුවට හිමි අයිතිය, ආණ්ඩුවට ලබා නොදී ව්‍යවස්ථාවට විරුද්ධව යමින් ආණ්ඩුවේ කටයුතුවලට හානියක් කරන්න හදන ව්‍යවස්ථා විරෝධී කථානායකවරයෙක් හැටියට හැසිරෙන්න දරන උත්සාහය අපි ප්‍රතික්ෂේප කරනවා. රජයට හිමි, ආණ්ඩුවට හිමි, ව්‍යවස්ථානුකූලව අපට හිමි, ස්ථාවර නියෝගවල උල්පත වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අපට හිමි මන්ත්‍රී ධුර සංඛ්‍යාව නොදීම අපි ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා ඔබතුමාගේ නිවේදනයට අපි එකඟ වෙන්නේ නැහැ කියන ටික මම ඉතාම ඕනෑකමින් ප්‍රකාශ කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ කථාව අවසන් නැද්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මගේ මේ කරුණ ඉදිරිපත් කර මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ අනුව කථානායකතුමා පවත්වන්නේ එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු රැස්වීමක්. එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු රැස්වීමේ; එක්සත් ජාතික පක්ෂයට යටත් වෙලා, පාර්ලිමේන්තු ක්‍රමයට පයින් ගහන කථානායකවරයෙකු හැටියටයි තමුන්නාන්සේ හැසිරෙන්නේ. ව්‍යවස්ථාව අනුව හා ස්ථාවර නියෝග අනුව යළිත් වරක් පාර්ලිමේන්තුව රැස් කරන ලෙසත්, අපේ අයිතිවාසිකම් ලබා දෙන්න කියලාත් ඔබට අපි බල කර සිටිනවා. ඔබ මෙසේ හැසිරෙනවා නම්, ඔබගේ තීරණය අපි ප්‍රතික්ෂේප කරන බව සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ඔබතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, "මේ වන විට අගමැතිවරයෙක් නැහැ; සභානායකවරයෙක් නැහැ"යි කියලා. මම යෝජිත ආණ්ඩුවට කියනවා, පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්වන්න, එවිට අපි ඔවුන්ට සහයෝගය දෙනවා කියලා. මොකද, මෙම පාර්ලිමේන්තුව රැස් වෙලා මාසයක් වනවා, තවම ඔවුන් බහුතරය පෙන්වා නැහැ. ඔවුන් බහුතරය පෙන්නුවොත් අපි සියලු බලතල ලබා දෙන බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ ගැන අපි අද පක්ෂ නායක රැස්වීමේදී බොහෝ දුරට කථා කළා. එම නිසා මේ සම්බන්ධයෙන් දීර්ඝ විවාදයක් කරන්න බැහැ. මොකද, අද අපට ස්ථාවර නියෝග යටතේ වැදගත් සාකච්ඡාවක් කරන්න තිබෙනවා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා කථා කරන්න.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் ஆளும் கட்சியில் இருக்கின்றேனா அல்லது எதிர்க் கட்சியில் இருக்கின்றேனா என்பது என்னுடைய அரசியல் முடிவு. ஆனால், நான் ஒரு தனிக் கட்சியாகத்தான் நாடாளுமன்றத்துக்குத் தெரிவாகி

வந்திருக்கின்றேன். ஆகையால், இந்தத் தெரிவுக்குழுவில் எனது கட்சிக்கும் இடம் தரவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමා- [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will let you speak after the Hon. Bandula Gunawardane.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමා 14වන දින විශ්වාස භංග යෝජනාවක් සම්මත කළා කියන එක අප සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන අතර, මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ආණ්ඩුව අපේ රජය ලෙස පිළිගන්නා ලෙස ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්] පාර්ලිමේන්තුවට - රටේ ව්‍යවස්ථාදායකයට- බැහැ, ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තිබෙන බලයට අභියෝග කරන්න. [බාධා කිරීම්] ඔබතුමා විධායකයට අභියෝග කරමින් මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යෑම සම්පූර්ණයෙන්ම නීති විරෝධියි කියන ටික අපි මේ වෙලාවේදී සඳහන් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමා- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම මාරුවෙන් මාරුවට අවස්ථාව දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා අද මේ පාර්ලිමේන්තුවේ ඉදිරි වැඩ කටයුතු සඳහා වැදගත්, අත්‍යවශ්‍ය කමිටුව වන තේරීම් කාරක සභාවට අවශ්‍ය වන නම් සහ සංඛ්‍යා මෙතැන ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, 114වන ස්ථාවර නියෝගයේ ඉතා පැහැදිලිව සඳහන් වී තිබෙනවා, තේරීම් කමිටුවක් පත් කිරීමේදී ආණ්ඩුව හෝ විපක්ෂය ලෙස සැලකිල්ලට භාජන නොකරන බව. ඒ නිසා ඔබතුමා ඒ ස්ථාවර නියෝගවලට අනුරූප වන පරිදි කටයුතු කිරීමට බැඳී සිටිනවා. ඊළඟට ගරු කථානායකතුමනි, ඉතා පැහැදිලිව 14වන දින මේ පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් සම්මත වූ බවත්, ඒ අනුව 15වන දා සිට ආණ්ඩුවක් නොමැති බවත් ඔබතුමා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයට පත් කොට තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට- [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කැලෑ නීතිය.[ඝෝෂා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හඳපානේ ජනාධිපති ඇවිල්ලා, අගමැති ගෙනැල්ලා, "උඹ අගමැති, මම ජනපති" කියලා හඳපානේ ආණ්ඩු හදන ඒවා තමයි කැලෑ නීති. ඒ නිසා ගරු කථානායකතුමනි, මා ඉල්ලා සිටින්නේ මේ තේරීම් කාරක සභාව පිළිබඳව යම් ප්‍රශ්නයක් තිබේ නම්, මේ පාර්ලිමේන්තුවට තමයි ඒ තීන්දුව ලබා ගැනීමේ අයිතිය තිබෙන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව සඳහා ඡන්දයක් ලබා දෙන්න කියා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ අනුව නමින් - by name - ඡන්දයක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

තවත් කාරණාවක් තිබෙනවා. ඔබතුමා ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳව, ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ගෞරවයට හානිවෙන ආකාරයට කටයුතු කරනවා කියා විවිධ තැන්වල චෝදනාවක් තිබෙනවා. [බාධා කිරීම්] එවැනි චෝදනාවක් තිබෙනවා නම්, කථානායකවරයාට එරෙහිවත් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් මේ පාර්ලිමේන්තුවට බලය තිබෙනවා. ඒ නිසා මා එවැනි අයගෙන් ඉල්ලා සිටින්නේ, කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න කියලයි එතුමාගේ ක්‍රියාපටිපාටිය පරීක්ෂාවට භාජන කරලා. ඒකටත් මේ පාර්ලිමේන්තුව මුහුණ දෙන්න සූදානම් කියන එක මම කියන්න කැමැතියි. ඒ නිසා මම නමින් - by name - ඡන්දයක් ඉල්ලනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව. [බාධා කිරීම්]

දැන් කථා කරපු එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ සංවිධායක අනුර දිසානායක මැතිතුමා කියූ කරුණු අනුව තමුන්නාන්සේ කියන්නේ- [බාධා කිරීම්] මේ පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් සම්මත වෙලා නැහැ. විශ්වාස භංග යෝජනාවක් හඬින් සම්මත කරන්න බැහැ. ඒවා සම්මත වෙනවා නම්, සම්මත විය යුතු පිළිවෙතක් තිබෙනවා. ඒ පිළිවෙත ආරක්ෂා කෙරිලා නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! එතුමාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ කාරණයට. මේ වන විට මුදල් පිළිබඳ යෝජනා දෙකක් තමුන්නාන්සේ භාරගෙන තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ගන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඇමති මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඇමතිවරයෙකුට මිසක් මේ පාර්ලිමේන්තුවට මුදල් පිළිබඳ යෝජනා හෝ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්න බලයක් නැහැ. ඒ බලයක් නැති මන්ත්‍රීවරුන්ට ඒ යෝජනා ගෙනෙන්න තමුන්නාන්සේ අවසර දීලා තිබෙනවා. ඒ නිසා අද මේ පාර්ලිමේන්තුව මෙතෙක් ඉතිහාසයේ තිබූ සම්ප්‍රදායට, ස්ථාවර නියෝගයන්ට සහ ව්‍යවස්ථාවන්ට පටහැනි විධියටයි මේ ගමන් කරන්නේ. තනිකරම මේ පාර්ලිමේන්තුව රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාගේත්, ඒ හරහා එකතු වෙච්ච සහචර කල්ලිවලත් කුලී හේවායන්ගෙන් පිරිච්ච තැනක් බවට පත් කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා අගමැති පිළිගන්නේ නැත්නම්, ඔබතුමා සභානායක පිළිගන්නේ නැත්නම්, ඔබතුමා ඇමති මණ්ඩලය පිළිගන්නේ නැත්නම් අපි කථානායක හැටියට ඔබතුමා පිළිගන්නෙත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා කරගෙන යන මේ ක්‍රියා පටිපාටිය නීති විරෝධියි. අපි මේ පාර්ලිමේන්තුව අතහැර යනවා; තමුන්නාන්සේව වර්ජනය කරනවා කියන එකත් අවධාරණය කරනවා.

[මේ අවස්ථාවේදී ආණ්ඩු පාර්ශ්වයේ අසුන් ගෙන සිටි ගරු මන්ත්‍රීවරු සභා ගැබෙන් පිටව ගියහ.]
[இச்சந்தர்ப்பத்தில் அரச தரப்பு ஆசனங்களில் அமர்ந்திருந்த கௌரவ உறுப்பினர்கள் சபாமண்டபத்திலிருந்து வெளிநடப்புச் செய்தார்கள்.]
[At this stage Hon. Members seated on the Government side walked out of the Chamber]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මීළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න. [සෝෂා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මමත් සාමාජිකයෙක් වෙච්ච කමිටුවකින් සකස් කරලා පාර්ලිමේන්තුවේ සම්මත කරගත්ත ස්ථාවර නියෝග අනුවයි පාර්ලිමේන්තුව පාලනය වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එම ස්ථාවර නියෝගවල 114. (2)හි මෙසේ සඳහන් වෙනවා. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. [සෝෂා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 114. (2)හි මෙසේ සඳහන් වෙනවා:

"තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් එක් එක් සභාවාරය ආරම්භයේ දී නම් කළ යුතු සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය."

කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් ඉදිරිපත් කරපු ලැයිස්තුව මේ ස්ථාවර නියෝගයට සම්පූර්ණ එකඟයි. මේ ස්ථාවර නියෝගයේ ආණ්ඩුව, විපක්ෂය කියලා සඳහනක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා ඒක නීත්‍යානුකූලයි. ඔබතුමා නිවැරැදියි. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඡන්දයකට දාන්න කියලා. ඡන්දයකට දාන්න. අපි ඡන්දයක් ඉල්ලා සිටිනවා. Divide, by name!

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, නමින් ඡන්දයක් ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. By name; නමින් ඡන්දයක් ගන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් ගරු සුජීව සේනසිංහ මැතිතුමා, ඉන් පසුව ගරු බිමල් රත්නායක මැතිතුමා. [බාධා කිරීම්] ඔබතුමා ඉන්න, ගරු සුජීව සේනසිංහ මැතිතුමායි ඉස්සෙල්ලා නැඟිට්ටේ. [බාධා කිරීම්] ඉන් පසුව කවුද? [බාධා කිරීම්] හරි, එහෙම නම් කථා කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඡන්දය ගන්න කියලායි ඉල්ලන්නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, අපිට නමින් ඡන්දයක් ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, තව කථා කරන්නට ඕනෑ කිව්වේ කවුද? [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, නමින් ඡන්දයක් ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නමින් ඡන්දයක්?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, take the Vote by name.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We can use the electronic voting system. [බාධා කිරීම්] දැන් බෙදුම් සීනුව නාද කරන්න. [බාධා කිරීම්] අපි electronic ක්‍රමයටයි ඡන්දය ගන්නේ, electronic ක්‍රමයටයි ඡන්දය පාවිච්චි කරන්නේ. [බාධා කිරීම්]

Electronic voting එක try කරමු, ඒක ලෙහෙසියි. The names of Hon. Members are already there on the Electronic Voting System.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු-
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the division bells-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මා යෝජනා කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට පක්ෂද, විපක්ෂද කියන කාරණය දැන ගැනීම සඳහායි දැන් ඡන්දය විමසන්නේ. මෙම ඡන්දය ඉලෙක්ට්‍රෝනික ක්‍රමයට ගැනීම වඩාත් සුදුසුයි කියා මා යෝජනා කරනවා. එම ක්‍රමයට ඡන්දය ප්‍රකාශ කිරීමට යම් කෙනෙකුට අපහසුතාවක් ඇති වුණොත් අපි ඒ සඳහා ක්‍රියා කරනවා. එහෙම නම් දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කරන විද්‍යුත් යන්ත්‍රය වැඩ කරන්නේ නැති මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් ඉන්න, සහායට කවුරු හරි ඒවි. පොඩ්ඩක් ඉන්න. කවුරු හරි එයි. They will come. They will help you. කවුරු හරි ගිහිල්ලා ඒ ගැන බලනවාද? Somebody will help you.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ ඡන්දය ප්‍රකාශ කරන යන්ත්‍රය වැඩ කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. මම සටහන් කර ගන්නම්. වෙන කවුරු හරි ඉන්නවාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මගේත්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. නැත්නම් - we will take the verbal vote.

දැන් ඡන්දය දීමේ කටයුතු අවසන්. දැන් විද්‍යුත් ක්‍රමයට ඡන්දය දීමට බැරි වූ ගරු මන්ත්‍රීතුමන්ලාට ඡන්දය ප්‍රකාශ කරන්න අවස්ථාව දෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, පක්ෂද, විපක්ෂද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ජයවික්‍රම මැතිතුමා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය දෙන්න බැරි වුණු තවත් ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවාද? ඒ පැත්තේ නැහැ.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මගේ නමත් පුවරුවේ සඳහන් වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කබීර් හාෂිම් මැතිතුමා?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් නම් ටික බලන්න. [බාධා කිරීම්] අනෙක් පැත්තේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගෙන් විමසන්න. මේ පැත්ත හරි.

ගරු මොහොමඩ් නසීර් මන්ත්‍රීතුමා. ඔබතුමා පක්ෂද, විපක්ෂද?

ගරු ඒ.එල්.එම්. නසීර් මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවත් කවුරු හරි ඉන්නවාද?

ගරු මන්ත්‍රීතුමන්ලා, ඔබතුමන්ලාගේ හරිද? නම් සඳහන් නොවුණු ගරු මන්ත්‍රීතුමන්ලා තව ඉන්නවා නම් නැඟිටින්න. All cleared.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 117: විරුද්ධව 0: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 117: எதிராக 0: சமூகமின்மை 0.
According to Electronic Voting, Parliament divided: Ayes 117: Noes 0: Abstain 0.

O 001. Mangala Samaraweera	Yes
O 003. John Amaratunga	Yes
O 004. Vijitha Herath	Yes
O 005. Anura Dissanayake	Yes
O 006. Dharmalingam Sithadthan	Yes
O 007. Mavai S. Senathirajah	Yes
O 009. Ranil Wickremesinghe	Yes
O 011. Gayantha Karunatileka	Yes
O 012. A.H.M. Fowzie	Yes
O 013. Rauff Hakeem	Yes
O 014. Rajitha Senaratne	Yes
O 015. Piyasena Gamage	Yes
O 016. Rishad Bathiudeen	Yes
O 017. Kabir Hashim	Yes
O 018. Sajith Premadasa	Yes
O 019. Mano Ganesan	Yes
O 021. Selvam Adaikkalanathan	Yes
O 022. Malik Samarawickrama	Yes
O 023. Nihal Galappaththi	Yes
O 024. Sunil Handunnetti	Yes
O 026. K. Thurairetnasingam	Yes
O 027. Seeniththamby Yoheswaran	Yes
O 028. S. Shritharan	Yes
O 029. Tilak Marapana	Yes
O 030. Wajira Abeywardana	Yes
O 031. Ravi Karunanayake	Yes
O 032. Field Marshal Sarath Fonseka	Yes
O 033. Patali Champika Ranawaka	Yes
O 034. Navin Dissanayake	Yes
O 035. P. Harrison	Yes
O 036. R.M. Ranjith Madduma Bandara	Yes
O 037. Arjuna Ranatunga	Yes

O 038. Palany Thigambaram	Yes
O 039. Chandrani Bandara	Yes
O 040. Thalatha Atukorale	Yes
O 041. Akila Viraj Kariyawasam	Yes
O 042. D.M. Swaminathan	Yes
O 043. Bimal Rathnayake	Yes
O 044. Nalinda Jayathissa	Yes
O 045. E. Saravanapavan	Yes
O 046. M.A. Sumanthiran	Yes
O 047. Kaveendiran Kodeeswaran	Yes
O 048. I. Charles Nirmalanathan	Yes
O 049. Abdul Haleem	Yes
O 050. Sagala Ratnayake	Yes
O 051. Harin Fernando	Yes
O 052. Daya Gamage	Yes
O 053. Ravindra Samaraweera	Yes
O 054. Lucky Jayawardana	Yes
O 055. V.S. Radhakrishnan	Yes
O 056. Palitha Range Bandara	Yes
O 057. Dilip Wedaarachchi	Yes
O 058. Niroshan Perera	Yes
O 059. Ruwan Wijayawardene	Yes
O 060. A.D. Premadasa	Yes
O 061. Sujeewa Senasinghe	Yes
O 062. Wasantha Aluwihare	Yes
O 063. Vijayakala Maheswaran	Yes
O 064. Eran Wickramaratne	Yes
O 065. Gnanamuthu Srineshan	Yes
O 066. Shanthi Sriskandarasa	Yes
O 067. S. Sivamohan	Yes
O 068. Harsha De Silva	Yes
O 069. Ajith P. Perera	Yes
O 070. Ranjith Aluvihare	Yes
O 071. J.C. Alawathuwala	Yes
O 072. Vadivel Suresh	Yes
O 073. Ameer Ali Shihabdeen	Yes
O 075. Faizal Cassim	Yes
O 076. Anoma Gamage	Yes
O 077. Ranjan Ramanayake	Yes
O 078. Ashok Abeysinghe	Yes
O 079. H.M.M. Harees	Yes
O 080. Karunarathna Paranawithana	Yes
O 081. Palitha Kumara Thewarapperuma	Yes
O 082. Manusha Nanayakkara	Yes
O 083. Seyed Ali Zahir Moulana	Yes
O 084. Ajith Mannapperuma	Yes
O 085. Nalin Bandara Jayamaha	Yes
O 086. Buddhika Pathirana	Yes
O 087. M.S. Thowfeek	Yes
O 088. Abdullah Mahrooff	Yes
O 089. Sirinal de Mel	Yes
O 090. Anura Sidney Jayarathne	Yes
O 091. K.K. Piyadasa	Yes
O 092. Lakshman Ananda Wijemanne	Yes
O 093. A. A. Vijethunga	Yes
O 094. Hector Appuhamy	Yes
O 095. Sisira Kumara Abeysekara	Yes
O 096. Thushara Indunil Amarasena	Yes
O 097. A. Aravindh Kumar	Yes
O 098. Velu Kumar	Yes
O 099. Nalaka Prasad Colonne	Yes
O 100. Chandima Gamage	Yes
O 101. Kavinda Heshan Jayawardana	Yes
O 102. Mylvaganam Thilakarajah	Yes
O 103. Mayantha Dissanayake	Yes
O 104. Sujith Sanjaya Perera	Yes
O 105. Hirunika Premachandra	Yes
O 106. Bandula Lal Bandarigoda	Yes
O 107. M. Ibrahim Mohammad Mansoor	Yes
O 108. S.M. Marikkar	Yes
O 109. Imran Maharoof	Yes
O 110. Ashu Marasinghe	Yes
O 111. Ishak Rahuman	Yes
O 112. Mujibur Rahuman	Yes
O 113. Harshana Rajakaruna	Yes
O 114. Jayampathy Wickramaratne	Yes
O 115. Thusitha Wijemanna	Yes
O 116. Rohini Kumari Wijerathna	Yes
G 021. Ananda Kumarasiri	Yes
G 110. Chaminda Wijesiri	Yes
G 111. Hesha Withanage	Yes
G 112. Sandith Samarasinghe	Yes
G 114. Wijepala Hettiarachchi	Yes
G 115. Mohamadu Nazeer	Yes
G 116. S.M. Mohamed Ismail	Yes

Total Voting Results

Yes	117
No	00
Abstain	00

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද යෝජනා කළ තේරීම් කාරක සභාවේ සාමාජිකයන් අනුමත කරමින් විද්‍යුත් ක්‍රමයට ඡන්දය පැවැත්වූවා. එහිදී ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා, ගරු රාජවරෝදයම් සම්පන්දන් මැතිතුමා, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා, ගරු එඩිවඩ් ගුණසේකර මැතිතුමා යන සිව්දෙනාගේ නම් ඩිජිටල් පුවරුවේ සටහන් වෙලා තිබුණේ නැහැ.

එම හතරදෙනාගේ නම්ද ඇතුළත්ව මෙම යෝජනාව සඳහා ඡන්ද 121ක් ලැබී ඇති බව දැනුම් දීමට කැමැතියි. [බාධා කිරීමක්] ඒ අනුව මෙම යෝජනාව ස්ථිර වූ බව සඳහන් කරන්න කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මුළු රටටම බහුතරය පැහැදිලිව පෙන්වීම සඳහා සිටගෙන, නමින් ඡන්දයක් ගන්න කියා මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේ නම් register වෙලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි සියලුදෙනාම සිටගෙන, නමින් ඡන්දයක් ගනිමු, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාවට අවශ්‍ය නම් මට නැවත ඡන්දය විමසන්න පුළුවන්. සභාව එකඟද? මේ අලුත් ක්‍රමයෙන් රටට පෙනෙනවා. මම නම් හිතන්නේ විද්‍යුත් ඡන්ද ක්‍රමයක් තිබෙන නිසා එය අවශ්‍ය වන්නේ නැහැ කියායි. නිකම් කාලය නාස්ති කිරීමක් වෙන්නේ. මේ තත්ත්වය ලෝකයටම පෙනුණා නේ. අපි පාවිච්චි කරන්නේ මේ ක්‍රමය නේ. අපි මේ විධියට කරමු. නැවත ඡන්දය විමසීමක් අවශ්‍ය වන්නේ නැහැ.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 19 යටතේ හදිසි පොදු වැදගත්කමකින් යුත් කාරණාවක් සාකච්ඡා කිරීම සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් වන ඔබතුමාගේ යෝජනාව දැන් ඉදිරිපත් කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. S.M. Marikkar, what is your point of Order?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, විශ්වාස භංගයෙන් ආණ්ඩුව පරාජයට පත් වුණා. ඒ නිසා වර්තමානයේ රජයක් නැහැ කියා ඔබතුමා තීන්දුවක් දීලා තිබෙනවා. නමුත්, පාර්ලිමේන්තු කටයුතු වාර්තා කරන සියලුම ජනමාධ්‍ය මේ මොහොත වනතුරුත් එක්සත් ජනතා නිදහස් සන්ධානය හඳුන්වන්නේ "ආණ්ඩු පක්ෂය" කියායි. ඒක ඔබතුමාගේ තීරණය අබිබවා යෑමක්. මේ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියායි මා ඉල්ලා සිටින්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මැතිතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, as you could see, the last couple of days have brought Parliament to absolute ridicule. With the rule that has been established in the last couple of years, at least we see the Judiciary is functional and Parliament in full session.

Sir, there has been a letter, purported to be written by the Speaker, and sent to the Chief Justice. I am happy that the Secretary General of Parliament has mentioned this to the "Daily News" newspaper and I draw reference to that. I would like to ask from the Speaker, whether there has been any such letter that has been originated and what course of action will be taken for such absurd activities, desperate activities, that have been done and who has done this?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමා, මේ කරුණ සම්බන්ධයෙන් මේ පළමු වන ලියුම නොවෙයි. මෙය සම්පූර්ණයෙන්ම fake ලියුමක් වශයෙන් අපි හොයා ගත්තා. ඒ වාගේම මෙය යම් විධියක සටහනක් සැලසුම් කර යවපු ලිපියක් වශයෙන් තමයි අපි දැක්කේ. මේ පළමු වන ලිපිය නොවෙයි. මට විරුද්ධව ලියපු ලිපි බොහෝ ගණනක් පළ වුණා. අපි පරීක්ෂා කරන්න කියා පොලීසියටත්, CID එකටත් නියම කර තිබෙනවා. දැන් ඒ පරීක්ෂණ ආරම්භ වෙලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ දැනුවත් වීම තුළින් කියන්න, කාගෙන්ද මේක වෙලා තිබෙන්නේ කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පරීක්ෂණ අවසන් වනතුරු මට කියන්න අමාරුයි ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක පාර්ලිමේන්තුවේ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. පාර්ලිමේන්තුවේ නොවෙයි. පාර්ලිමේන්තුවේ සම්බන්ධයක් නැහැ. පාර්ලිමේන්තුව ගැන මගේ සම්පූර්ණ විශ්වාසය තිබෙනවා. පාර්ලිමේන්තුවේ නිලධාරීන් කෙරෙහි මගේ පූර්ණ විශ්වාසය තිබෙනවා. මේක පිටස්තරයෙන් සිදු වුණු දෙයක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපිටත් කථානායකතුමා සම්බන්ධයෙන් සම්පූර්ණ විශ්වාසයක් තිබෙනවා. නමුත්, මේ විශ්වාසය පලුදු කරන්නයි හදන්නේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, කල් තැබීමේ යෝජනාවට ප්‍රථම සභාව කල් තැබිය යුතුයි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව 2018 නොවැම්බර් මස 27 වැනි දින පස් වරු 1.00ටත්, 2018 නොවැම්බර් මස 29 වැනි දින පෙර වරු10.30ටත් රැස් වෙන බව මම දැනුම් දීමට කැමැතියි.

කල් තැබීමේ යෝජනාව, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

වර්තමාන දේශපාලන අර්බුදය
தற்போதைய அரசியல் நெருக்கடி
CURRENT POLITICAL CRISIS

[පූ.භා. 11.07]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, අද දවසට යෝජිත සභාව කල් තැබීමේ යෝජනාව මම පසුගිය 21 වැනි දා ඔබතුමා වෙත භාර දුන්නා. එම යෝජනාව ඉදිරිපත් කරන්නට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එම යෝජනාව මෙසේයි:

"ශ්‍රී ලංකාවේ ඇති වී ඇති වර්තමාන දේශපාලන අර්බුදය හේතුවෙන් රටේ ආර්ථිකය බරපතළ කඩා වැටීමකට ලක් වී ඇත. මේ හේතුවෙන් පොදු ජනතාව මහත් පීඩාකාරී තත්ත්වයකට මුහුණ දෙමින් සිටිති. එබැවින් මෙම දේශපාලන අර්බුදය වහා විසඳීම සඳහා මෙම ගරු සභාව කටයුතු කළ යුතු යයි යෝජනා කර සිටියි".

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.08]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු විජිත හේරත් සහෝදර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කරමින් මම ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, අද අපේ රටේ විශාල අරාජික තත්ත්වයක් මතු වී තිබෙනවා. ඔබතුමා පසුගිය 15 වැනි දා මෙම පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කර තිබෙනවා, ආණ්ඩුවක් නොමැති බව. එම නිසා ඇති වී තිබෙන තත්ත්වය අද අපේ රටේ ආර්ථිකයේ ඉතාමත් වැදගත් මර්මස්ථානවලට විශාල බලපෑමක් ඇතිකොට තිබෙනවා, සංචාරක ව්‍යාපාරයට විශාල බලපෑමක් ඇතිකොට තිබෙනවා. මුළු රාජ්‍ය යන්ත්‍රණයම විශාල කඩා වැටීමකට ලක් වී තිබෙනවා. මේ ඇති වී තිබෙන අස්ථාවරභාවය පිළිබඳව අවධානය යොමු කරමින් මෙම අස්ථාවරභාවය අවසන්කොට රට යථා තත්ත්වයට පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවටත්, මේ රටේ පොදු ජනතාවටත් -අපි හැමදෙනාටම- වගකීමක් තිබෙනවාය කියා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මෙම අස්ථාවරභාවය ඕපපාතිකව නිර්මාණය වූවක් කියා අපි පිළිගන්නේ නැහැ. එක්කෝ එය මහා දැවැන්ත සුනාමියක්. එසේ නැත්නම් දැවැන්ත ගංවතුරක් වැනි තත්ත්වයක් විසින් නිර්මාණය කරන ලද්දක් නොවෙයි. අද අපේ රටේ ඇති වී තිබෙන අස්ථාවරභාවය හා අරාජිකත්වය දේශපාලන කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්, ගරු කථානායකතුමනි.

පසුගිය ඔක්තෝබර් මාසයේ 26 වැනි දා ඉතාමත් පැහැදිලි ලෙස අපේ රටේ දේශපාලන කුමන්ත්‍රණයක් සිද්ධ වුණා. ගරු කථානායකතුමනි, ලංකා ඉතිහාසයේ ආණ්ඩු පෙරළුණු ඉතිහාසයන් අපි දැක තිබෙනවා. අග්‍රාමාත්‍යවරුන් මාරු වුණු ඉතිහාසයන් අපි දැක තිබෙනවා. ගරු කථානායකතුමනි, එක පැත්තකින් මැතිවරණයක් ප්‍රකාශයට පත් කර මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් මැතිවරණයට අවශ්‍ය වන කටයුතු සූදානම් කර, දේශපාලන පක්ෂ මැතිවරණයට තරග වැදිලා ඡන්ද දිනයේදී ජනතාව ඡන්දපොළට ගිහින් ඡන්දය දීලා ඡන්ද ප්‍රතිඵල අනුව පසුගිය දා ආණ්ඩුවක් පිහිටුවුවා. ඒ ආණ්ඩු පිහිටුවීම මොනතරම් ප්‍රජාතන්ත්‍රවාදී ද, නැද්ද කියන එක කෙසේ වුවත්, ඒ ආණ්ඩු පිහිටුවීම මේ රටේ ජනතාව අනුමතකොට තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, තවත් අවශ්‍ය නම් අවස්ථාවක් තිබෙනවා; එක මහ මැතිවරණයක සිට තව මහ මැතිවරණයක් දක්වා කාල පරිච්ඡේදයක් ඇතුළත තිබෙන ආණ්ඩුව පරදවා තව ආණ්ඩුවක් පිහිටුවා ගන්න අවශ්‍ය නම් ඒ සඳහා මේ පාර්ලිමේන්තුවට අවස්ථාවක් තිබෙනවා. එක් මහ මැතිවරණයකදී පාර්ලිමේන්තුවක් තෝරා පත් කර ගත්තාට පසුව ඊළඟ මහ මැතිවරණය දක්වා මේ පාර්ලිමේන්තුවට අවස්ථාවක් තිබෙනවා, බහුතර කැමැත්තෙන් ආණ්ඩුවක් පත් කර ගන්න. එය මිලදී ගැනීම්, පැනීම් හරහා සිදු වුවත් එයත් මේ රටේ සම්ප්‍රදායක් හැටියට අපි පිළිගත යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මහ ජනයා පාරට බැහැලා උද්ඝෝෂණය කරලා, ඉතාම දුර්දාන්ත පාලකයන් පලවා දැමූ අයුරු අපි ඉතිහාසයේ දැක තිබෙනවා. එවැනි පලවා හැරීම් ද දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි පිළිගන්නවා, ගරු කථානායකතුමනි. ඒ නිසා අපේ රටේ ආණ්ඩු පෙරළීම් සඳහා අවශ්‍ය ආකාර, පිළිගත යුතු ආකාර තුනක් තිබෙන බව අපි විශ්වාස කරනවා. එකක්, ඡන්දයක්. අනෙක ඡන්දයක් සහ තව ඡන්දයක් අතර පාර්ලිමේන්තුව හරහා. තව අවස්ථාවක් තමයි ගරු කථානායකතුමනි, තිබෙන දුර්දාන්ත පාලනය පෙරළා හැරීම සඳහා මහජන බලවේගයන් හරහා. හැබැයි, ගරු කථානායකතුමනි පසුගිය 26වැනි දා රාත්‍රියේ සිදු වූයේ මේ පිළිගත් කිසිදු සිද්ධාන්තයකට අදාළ වන ආණ්ඩු පෙරළියක් නොවෙයි. රටේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ මහින්ද රාජපක්ෂ මහත්මා කැඳවා මෙසයේ එක පසෙක මහින්ද රාජපක්ෂ මහත්මයා සිටගෙන, මෛත්‍රීපාල මහත්මයා තව පසෙක සිටගෙන මෛත්‍රීපාල මහත්මයා කියනවා, "නුඹ අගමැති - මම ජනපති" කියලා. එහෙම කියලා ආණ්ඩුවක් හදනවා. ගරු

[ගරු අනුර දිසානායක මහතා]

කථානායකතුමනි, එවැනි කුමන්ත්‍රණකාරී ආණ්ඩු පෙරළීම් අපි පිළිගත යුතුද? ගරු කථානායකතුමනි, එක් ආණ්ඩුවක් පෙරළා දැමිය හැකිව තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්ම සියල්ල උල්ලංඝනය කරමින් තනි පුද්ගලයෙකුගේ, දෙදෙනෙකුගේ හිතුවක්කාරී, තක්කඩි වුවමනාවන් සඳහා ආණ්ඩු පෙරළීම දේශපාලන කුමන්ත්‍රණයක් ලෙස අපි තේරුම්ගත යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි මේ රටේ පොදු ජනයාට ස්තුතිවන්ත වනවා. ලෝකයේ වෙනත් රටක මෙවැනි වර්ගයේ ආණ්ඩු පෙරළීම් සිද්ධ වුණා නම් ඒක ලේ ගංගාවකින් කෙළවර වන එක වළක්වන්න බැහැ. අපේ රටේ සිය මතය අනුව දේශපාලන පක්ෂවලට බෙදිච්ච ජනතාවක් ඉන්න පුළුවන්; දේශපාලන පක්ෂ පිළිබඳව වෙනස් කෝණයෙන් බලන මාධ්‍යවේදීන් ඉන්න පුළුවන්. හැබැයි, අපි හැමදෙනාම පොදු එකඟතාවකට ආ යුතුව තිබෙනවා. මොකද, මෙවැනි පන්නයේ කුමන්ත්‍රණකාරී ආණ්ඩු පෙරළි ලෝක ඉතිහාසයේ කවර ඉරණමක් එම රාජ්‍යයන්ට අත්පත්කොට දී තිබේද? ඒ නිසා ගරු කථානායකතුමනි, මෙවැනි පන්නයේ ආණ්ඩු පෙරළි, දේශපාලන කුමන්ත්‍රණ හරහා ආණ්ඩු පෙරළි, පොදු ජනයාගේ මහා ලේ ගංගාවක් බවට පත්වීම වළක්වන්න බැහැ. දැනටමත් ජීවිත දෙකක් ඝාතනය වී තිබෙනවා; රටේ විශාල අරාජිකත්වයක් නිර්මාණය වී තිබෙනවා. තවමත් ගරු කථානායකතුමනි, අරාජිකත්වය කෙළවර වෙන්නේ කවර දිශාවෙන්ද කියන එක පිළිබඳව කිසිදු මැන බැලීමකට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

මේ අවස්ථාවේදී මේ රටේ ජනතාවත්, අපිත් මේ දේශපාලන කුමන්ත්‍රණය පිළිගන්නවා නම්, නැවත මෙවැනි දේශපාලන කුමන්ත්‍රණයක් සිදු වීමේ ඉඩකඩ තිබෙනවා, ගරු කථානායකතුමනි. එවැනි දේශපාලන කුමන්ත්‍රණයක් මේ නිශ්චිත මොහොතේදී ලේ ගංගාවක් බවට පත් වුණේ නැත්නම්, ඊළඟ අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ලේ ගංගාවක් බවට පත්වනවා, ගරු කථානායකතුමනි. එම නිසා මේ දේශපාලන කුමන්ත්‍රණය සිදු වූ මොහොතේ සිටම ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ දේශපාලන කුමන්ත්‍රණය පරාජයට පත් කළ යුතුයි කියන දැඩි ස්ථාවරයක ඉඳගෙන කටයුතු කරමින් සිටියා. මේ දේශපාලන කුමන්ත්‍රණය හරහා ආණ්ඩුව එහෙට මෙහෙට කුමන්ත්‍රණකාරීව අටවා නතර වුණේ නැහැ. එම නිසා ගරු කථානායකතුමනි, බලයෙන් බලය අරගෙන ඒ බලය හරහා තමුන්ගේ බහුතරය නිර්මාණය කර ගැනීම සඳහා අවස්ථාවක් නිර්මාණය වුණා. මේ රටේ ජනතාවට, මේ රටේ දේශපාලකයෝ කවුද, මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ කවුද, මන්ත්‍රීවරු තේරා එවද්දී එවා තිබෙන මන්ත්‍රීවරු කවුද කියන එක පිළිබඳව ඉතාමත් හොඳ වෙන්දේසි පොළක් ඉදිරිපත් කරනු ලැබුවා. ගරු කථානායකතුමනි, එම නිසා තමන් පාර්ලිමේන්තුවේ කොපමණ කාලයක් හිටියාද, තමන්ට කොපමණ ප්‍රමාණයක් මනාප තිබෙනවාද කියන සංඛ්‍යා දත්ත මත බුරුත කඳන් විකිණෙනවා වාගේ වට අඩි ගණනකට මන්ත්‍රීවරුන්ගේ අළෙවිය තීරණය වන්න පටන් ගත්තා. එම නිසා මන්ත්‍රීවරු වෙන්දේසි පොළට ආවා. මේ රටේ අශිෂ්ටත්වයේ දේශපාලනයේ ඔටුනු පළන් යුගයක් බවට මේ යුගය පත්වෙමින් තිබුණා.

ගරු කථානායකතුමනි, මේ කරුණ මම ඉතාමත් අවධාරණයෙන් කියන්න ඕනෑ. දැන් බොහෝ අය කියනවා එහෙට පනින්න, මෙහෙට පනින්න සල්ලි ගත්තා කියා. ගරු කථානායකතුමනි, මම අවධාරණය කරන්නේ මෙයයි. පනින්න විතරක් නොවෙයි, ඉන්නත් සල්ලි අරගෙන තිබෙනවා. මෙහි තිබෙන්නේ අශිෂ්ට දේශපාලනයක්. එදායින් පස්සේ අපේ රටේ අශිෂ්ට දේශපාලනයක් දියත් වන්න පටන් ගත්තා. අපි මේ රටේ පොදු ජනයාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. මෙවැනි අශිෂ්ටත්වයකට පත් වී තිබෙන දේශපාලනය ශිෂ්ටත්වය කරා ගෙන ඒමේ වග කීමක් අපට නැද්ද? වට අඩි ගණනට මන්ත්‍රීවරු තීන්දු වන, ඔවුන්ගේ මිල වෙන්දේසි පොළේ තීරණය වන සංස්කෘතියක් මේ රටේ ගොඩ නැඟීම මොන තරම් යුක්තිසහගතද? එම නිසා අපේ රටේ මේ අශිෂ්ටත්වයට පත් වී තිබෙන දේශපාලන ක්‍රමය වෙනස් කිරීම සඳහා දිගු අරගළයක් තිබෙනවා. ඒ අරගළය සඳහා දිගු කාලීන ලෙස මැදිහත් වන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම්ය කියන පණිවුඩයත් මේ වෙලාවේ මම දෙනවා.

ගරු කථානායකතුමනි, කුමන්ත්‍රණකාරී වුවමනාවක් වෙනුවෙන්ම තමයි පාර්ලිමේන්තුව කල් දමනු ලැබුවේ. බලහත්කාරයෙන් බලය හදා ගෙන ඒ බලය හරහා අමාත්‍ය ධුර ලබා දෙමින්, නියෝජ්‍ය අමාත්‍ය ධුර ලබා දෙමින්, රාජ්‍ය අමාත්‍ය ධුර ලබා දෙමින්, සමහර විට බිය ගැන්වීම් හරහා, නඩු පෙන්වමින්, files පෙන්වමින්, මුදල් විසි කරමින් මේ අශුද්ධ ක්‍රියාවලිය දියත් වන්න පටන් ගත්තා. හැබැයි ගරු කථානායකතුමනි, මේ අශුද්ධ ක්‍රියාවලිය ජයග්‍රහණය කරන්න ජනාධිපතිවරයාට හැකියාවක් ලැබුණේ නැහැ. එම නිසා ජනාධිපතිවරයා මොකක්ද කළේ? පාර්ලිමේන්තුව කල් තබා, වෙන්දේසිය විවෘත කිරීමේ කාල පරිච්ඡේදය ආරම්භ කළත්, වෙන්දේසිය හරහා තමන්ගේ වුවමනාව ඉටු කර ගන්න බැරි වුණා. අවසානයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමකට ලක් කළා.

ගරු කථානායකතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමේදී අපේ ප්‍රධාන අදිටනක් තිබුණා. අපි පිළිගන්න ඕනෑ, පාර්ලිමේන්තුව තෝරා පත් කර ගෙන තිබෙන්නේ එක ජන වරමකින් බව. ජනාධිපතිවරයාට තිබෙන්නේ තවත් ජන වරමක්. එම නිසා පාර්ලිමේන්තුව එක ජන වරමක් නියෝජනය කරනවා, ජනාධිපතිවරයා තව ජන වරමක් නියෝජනය කරනවා. ජනාධිපතිවරයා තේරෙන්නේත් ජනතාවගේ ඡන්දයෙන්, පාර්ලිමේන්තුව තේරෙන්නේත් ජනතාවගේ ඡන්දයෙන්. ගරු කථානායකතුමනි, එම නිසා දේශපාලන මූල ධර්මයක් හැටියට එක ජන වරමක් විසින් තව ජන වරමක් යටත් නොකළ යුතුයි. ජනාධිපතිවරයාගේ ජන වරම විසින් පාර්ලිමේන්තුවේ ජන වරම යටත් නොකළ යුතුයි. හැබැයි, අපේ ව්‍යවස්ථාව ඇතුළේ ජනාධිපතිවරයාට හැකියාව ලැබී තිබුණා, පාර්ලිමේන්තුවේ ජන වරම ඉවත් කරන්න. ඉතිහාසයේ සිදු වූ මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් අපි අසා තිබෙනවා, ගරු කථානායකතුමනි. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට අවුරුද්දක් ගත වුණාට පසුව විසුරුවා හැරීමේ බලයක් තමන් අත්පත් කර ගත්තා.

මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස් වීමේ ලියුම් තමන්ගේ සාක්කුවට දා ගත්තා. ඒ නිසා බලහත්කාර ලෙස ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයක් නිර්මාණය කළා. ඒ ඒකාධිපතිත්වය කෙළවර වුණේ උතුරේත්, දකුණේත් ජනතාව සිවිල් යුද්ධයකට මුහුණ දීමෙනුයි, ගරු කථානායකතුමනි. දකුණේ සිවිල් යුද්ධයකට මුහුණ දීපු දේශපාලන ව්‍යාපාරයක් වන අපට ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම නිසා අපේ සාමාජික සාමාජිකාවන් 60,000කට ආසන්න සංඛ්‍යාවක් මරණයට පත් වෙච්ච යුගයක අද්දැකීම් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම නිසා මහ විශාල ව්‍යසනයකට මුහුණ දුන් ජනතාවක් උතුරේත් ඉන්නවා. ඒ නිසා උතුරේ ජනතාවටත්, උතුරේ දේශපාලනය නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරයක් වන දෙමළ ජාතික සන්ධානයටත්, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණටත් විශේෂ වගකීමක් තිබෙනවා. මේ වර්ධනය වෙමින් තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය පාලනය කළ යුතුයි. මෙයට එරෙහිව සටන් කළ යුතුයි. ඒ අදිටනින් යුතුව තමයි අප මේ සටනට අවතීර්ණ වී සිටින්නේ, ගරු කථානායකතුමනි. යළි එවැනි

යුගයක් මේ රටේ නිර්මාණය වීම සඳහා ඉඩ කඩ නිර්මාණය කරන ප්‍රජාතන්ත්‍රවාදය කප්පාදු කිරීමේ දිශාව අපි ආපසු හැරවිය යුතුයි. එය හැරවීමේ අධිෂ්ඨානයෙන් අප මේ ප්‍රවේශයට අවතීර්ණ වුණා.

ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයා සතුව තිබෙන අසීමිත බලතල අපේ රටේ විශාල ලෙස ව්‍යසනයන් නිර්මාණය කර තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරන්න, ඇවිදින කැරකෝප්පු බවට රට පරිවර්තනය කරන්න, රාජ්‍ය ආයතන මුළුමනින්ම අඩ පණ කරන්න, මහ ජන නියෝජිතයන්ගේ තිබෙන වටිනාකම් මුළුමනින්ම දිය කර හරින්න, දේශපාලන පක්ෂ බිලිගන්න, අධිකරණය තමන්ගේ අතට ගන්න, පාර්ලිමේන්තුව තමන්ගේ අතට ගන්න ආදි මේ සියල්ලටම හැකියාවක් ලැබුණා, මේ විධායක ජනාධිපති ධුරයට. ඒ නිසා 2015 ජනවාරි මාසයේ 8වන දා මේ රටේ ජනතාව විශාල බලාපොරොත්තුවකින් යුතුව විධායක ජනාධිපති ධුරය කප්පාදු කිරීම සඳහා වූ, අහෝසි කිරීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සඳහා මැතිවරණයක් පැවැත්වුවා. එයට ජන වරමක් ලැබුණා. ඒ ජන වරමේ අරමුණ මුළුමනින්ම ඉටු කර ගන්න දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බැරි වුණත්, ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයා තේරුම් ගත යුතුව තිබෙනවා, දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හරය වී තිබෙන්නේ ජනාධිපතිවරයා සතුව තිබෙන ජන වරමට පාර්ලිමේන්තුවේ ජන වරම යටත් නොකළ යුතුය කියන එක බව. එයයි එහි හරය. කුඹී ඔළුවක තරම් මොළයක් ජනාධිපතිවරයාට තිබෙනවා නම්, දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන හරය, එහි මුඛ්‍ය පරමාර්ථය, ජනාධිපතිවරයා සතුව තිබෙන ජන වරම පාර්ලිමේන්තුවේ ජන වරමට යටත් නොකළ යුතුය කියන එක බව තේරුම් ගත යුතුව තිබෙනවා. හැබැයි ජනාධිපතිවරයා කළේ කුමක්ද, ගරු කථානායකතුමනි? ජනාධිපතිවරයා විසින් කළ දේ තමයි තමන් සතුව තිබෙන විධායක බලය උපයෝගි කරගෙන මේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීම. එය කිසිසේත් ව්‍යවස්ථාවට අනුරූපී ක්‍රියා දාමයක් නොවෙයි. එය විශේෂයෙන්ම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. මේ රටේ මූලික පුරවැසියා රටේ ජනාධිපතිවරයායි. ඔහු බැඳී සිටින්නේ කුමකටද, ගරු කථානායකතුමනි? රටේ ජනාධිපතිවරයාට තමන්ගේ හිතේ ඇති වන, තමන්ගේ ඔළුවට එන සිතිවිලි අනුව රටක් පාලනය කරන්න අයිතියක් නැහැ, ගරු කථානායකතුමනි; තමන්ගේ ඔළුවේ ඇති වන මනස්ගත අනුව රටක් පාලනය කරන්න අයිතියක් නැහැ. ජනාධිපතිවරයාට සීමා මායිම් සලකුණු කර දී තිබෙනවා. ජනාධිපතිවරයාට තමන්ගේ පාලනය පිළිබඳ සටහන් කර තිබෙන සීමා මායිම් තිබෙන්නේ ව්‍යවස්ථාව ඇතුළේයි.

ඒ ව්‍යවස්ථාවට අනුරූපී වන පරිදි තමයි ජනාධිපතිවරයා තීන්දු ගත යුත්තේ; ජනාධිපතිවරයා හැසිරිය යුතු වන්නේ. හැබැයි, ගරු කථානායකතුමනි, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-අවස්ථා ගණනාවකදීම ව්‍යවස්ථාව කඩලා තිබෙනවා. ඒ අනුව ගරු කථානායකතුමනි, දහනව වන සංශෝධනයේ මූලික හරය වන පාර්ලිමේන්තු ජනවරම ජනාධිපතිවරයාට යටත් නොකළ යුතුයි කියන මූලික හරය ප්‍රතික්ෂේප කරමින් මේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවා. එතැනින් නතර වුණේ නැහැ, ගරු කථානායකතුමනි. අපි කල්පනා කළා, මේ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාමාර්ගයට එරෙහිව අධිකරණයට යා යුතුව තිබෙනවා කියා. වෙන පිහිටක් අපට තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, අපි අධිකරණය හමුවට ගියා. සියවස් දෙකකට වැඩි ඉතිහාසයක් අපේ අධිකරණ පද්ධතියට, විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයට, තිබෙනවා. ඒ සියවස් දෙකකට වැඩි දිගු ඉතිහාසය ඇති ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධායකයත්, පාර්ලිමේන්තුවත්, අධිකරණයත් එකට භාජන වන නඩුවක් විභාගයට ලක් කරනු ලැබුවා. එක පැත්තකින් විධායකය උපයෝගි කරගෙන පාර්ලිමේන්තු බලය ශූන්‍ය කර තිබෙනවා, පාර්ලිමේන්තුව නිහඬතාවකට පත් කර තිබෙනවා, අධිකරණය ඒ සඳහා මැදිහත් විය යුතුව තිබෙනවා. ලංකා අධිකරණ ඉතිහාසයේ පාර්ලිමේන්තුවත්, විධායකයත්, අධිකරණයත් එකට ගැට ගැසුණු නඩුවක් දියත් වෙන්න පටන් ගත්තා. ගරු කථානායකතුමනි, පසුගිය 13වන දා ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමා ඇතුළු විනිසුරු මඩුල්ල විසින් ඉතාම ඓතිහාසික තීන්දුවක් ලබා දෙනු ලැබුවා. ජනාධිපතිවරයාගේ අත්තනෝමතික පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය අත්හිටුවීමට භාජන කරනු ලැබුවා. ගරු කථානායකතුමනි, ඒ අත්හිටුවීමට භාජන නොවෙන්න මේ පාර්ලිමේන්තුව විවෘත වෙන්නේ නැහැ. මතක තබා ගන්න. මේ පාර්ලිමේන්තුව විවෘත වෙන්න ප්‍රධාන සාධකය 13වන දා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද අත්හිටුවීමේ නියෝගයයි. මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අත්හිටුවීමේ නියෝගය ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් වහාම පක්ෂයක් හැටියට ගරු කථානායකතුමනි, අපි මේ රටට ප්‍රකාශයක් ලබා දුන්නා. අපි ඔබතුමාවත් මුණ ගැසුණා. මුණගැසී අපි ප්‍රකාශයක් කළා. මේ කුමන්ත්‍රණයේ පළමු පියවර ශ්‍රේෂ්ඨාධිකරණය පරාජයට පත් කරලා තිබෙනවා. මේ කුමන්ත්‍රණයේ දෙවන පියවර සහතික වශයෙන් මේ පාර්ලිමේන්තුවේදී පරාජයට පත් කරන බව මේ රටේ ජනතාවට අපි ප්‍රකාශයට පත් කළා. ඊළඟට ගරු කථානායකතුමනි, විවෘත වුණේ පාර්ලිමේන්තුව. මේ කුමන්ත්‍රණයේ ඊළඟ පියවර පරාජයට පත් කිරීමේ අවස්ථාව තිබුණේ පාර්ලිමේන්තුවට, 14 වැනි දා. අපි ඉතා හොඳින් දන්නවා ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයා 14 වැනි දා පාර්ලිමේන්තුව කැඳවන්නේ ස්වකැමැත්තෙන් නොවෙයි කියලා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ අත්හිටුවීමේ නියෝගයේ හේතුව නිසා ඔහු විසින්ම නිකුත් කර තිබෙන ගැසට් නිවේදනයේ ප්‍රතිඵලයක් අනුව පාර්ලිමේන්තුව කැඳවිය යුතුව තිබුණා. ඔහුට පාර්ලිමේන්තුව යළි කැඳවන්නේ නැතුව සැසිවාරය අවසන් කිරීම සඳහා බලයක් තිබුණේ නැහැ. ඒ නිසා ජනාධිපතිවරයා තමන් විසින්ම නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ ගොදුරක් බවට පත් වුණා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි 14 වැනි දා මෙම පාර්ලිමේන්තුව විවෘත කරනු ලැබුවේ. ගරු කථානායකතුමනි, දේශපාලනය අපි කරන්නේ. මම දැක්කා, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඉතාම හොඳ ප්‍රකාශයක් කළා. මෙවැනි දේශපාලන අර්බුදකාරී තත්ත්වයන් ඇතුළේ නීතිය, ව්‍යවස්ථා යට යමින් දේශපාලනය උඩට එනවා කියා එතුමා කිව්වා. ඒ නිසා අද නීතිය, ව්‍යවස්ථාව ප්‍රශ්නයට වඩා දේශපාලන පක්ෂයක් කරළියට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා නොවැම්බර් 14වැනි දා දිනය ඉතාමත් තීරණාත්මක දිනයක් බවට පරිවර්තනය විය යුතුව තිබුණා. මොකද, අනිවාර්යයෙන්ම 14වැනි දා පාර්ලිමේන්තුවෙන් ඒ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියා මාර්ග ගනු ලැබුවේ නැත්නම්, රාත්‍රී 12.00ට ඊළඟ ගැසට් නිවේදනය අනුව පාර්ලිමේන්තු සැසිවාරය ජනාධිපතිවරයා විසින් අවසන් කරනවා. ඒක අපි දන්නවා.

ගරු කථානායකතුමනි, දේශපාලනය, ව්‍යවස්ථා, මේ සියල්ල මේ කුමන්ත්‍රණය වෙනුවෙන් උපයෝගි කරගෙන තිබෙනවා. ඒ නිසා ඒ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා ධෛර්යය සපයන, කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා පෙනී සිටින අයත් ඒ අවස්ථා උපයෝගි කරගත යුතුව තිබෙනවා, ඒ බරින්ම. කුමන්ත්‍රණකරුවන්ට ව්‍යවස්ථා, නීති, රීති අස්සේ රිංගන්න පුළුවන් නම්, ගරු කථානායකතුමනි, කුමන්ත්‍රණ පරාජයට පත් කරන්න ඉන්න අයගෙන් සදාචාරය බලාපොරොත්තු වෙන්න එපා කියලා මම ඒ ගොල්ලන්ට කියනවා. කුමන්ත්‍රණය අශිෂ්ට නම්, ඒකට එරෙහි සටනේ ශිෂ්ටත්වයේ සීමා මායිම් හොයන්න එපා කියලයි

[ගරු අනුර දිසානායක මහතා]

මම ජනාධිපතිවරයාට කියන්නේ. මේක අහගෙන ඉන්න ඕනෑ ජනාධිපතිවරයා. මේ කුමන්ත්‍රණය අශිෂ්ටයි. මේ කුමන්ත්‍රණය සදාචාර විරෝධියි. මේ කුමන්ත්‍රණය ජන වරමට විරෝධියි. මේ කුමන්ත්‍රණය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට විරුද්ධයි. මේ කුමන්ත්‍රණය ජනාධිපතිවරයා බැඳී තිබෙන ව්‍යවස්ථාවට පටහැනියි. ඒ නිසා ගරු කථානායකතුමනි, එවැනි කුමන්ත්‍රණයක් කරලා ජනාධිපතිවරයා ඊට පස්සේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීමේ ශිෂ්ටත්වයේ හිල් හොයනවා. ජනාධිපතිවරයාට තවදුරටත් අයිතියක් නැහැ, අපේ රටේ ශිෂ්ටත්වයේ හිල් හොයන්න.

ගරු කථානායකතුමනි, ඒ නිසා 14වැනි දා පාර්ලිමේන්තුවේදී මේ කුමන්ත්‍රණය පරාජයට පත් කළ යුතුව තිබුණා. ගරු කථානායකතුමනි, අප විසින් හැම වෙලාවේම ව්‍යවස්ථාව සහ රීතීන් උපයෝගි කරගනු ලැබුවා. මේ පාර්ලිමේන්තුව මෙහෙයවනු ලබනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ මූලික වගකිව යුත්තා. පෞද්ගලිකව ගත්තොත්, මම අවුරුදු 18කට අධික කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් තිබෙනවා. ඉතාමත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු ඉන්නවා, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඉන්නවා. ඔබතුමාත් දීර්ඝ කාලයක් අපේ රටේ දේශපාලනයේ නිරත වන කෙනෙක්. මේ පාර්ලිමේන්තුව රටේ සියලු ජනයාගේ ප්‍රශ්න විසඳන, සියලු ජනතාවගේ සටන් වේදිකාවක් ලෙස අපි පිළිගන්නේ නැහැ. අපි පාර්ලිමේන්තුවට එවැනි උත්තරීතරභාවයක් දෙන්නෙත් නැහැ. එක දේශපාලන ව්‍යාපාරයකට පාර්ලිමේන්තුව තිබිය යුතු තැන, පාර්ලිමේන්තුවට පැවරී තිබෙන වගකීම, පාර්ලිමේන්තුවේ සීමා මායිම් පිළිබඳව හොඳ ඇගයීමක් තිබෙන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා "අපි සියල්ල පාර්ලිමේන්තුවේ විසඳා ගත යුතුයි; සියල්ල උත්තරීතර මෙතැනය" කියන මිථ්‍යා ප්‍රබන්ධවල අපි නැහැ.

ගරු කථානායකතුමනි, එවැනි මිථ්‍යා ප්‍රබන්ධ හදපු අයම තමයි මේ පාර්ලිමේන්තුව කවර වර්ගයේ ස්ථානයක් ද කියන එක පසුගිය දින කීපය තුළ මේ රටේ ජනතාවට ඔප්පු කරමින් තිබෙන්නේ; අපි නොවෙයි. හැබැයි ගරු කථානායකතුමනි, අපි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආපු අවුරුදු 18ක කාල පරිච්ඡේදය තුළ අපි උත්සාහ කරමින් තිබෙනවා, මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන්, මේ පාර්ලිමේන්තුව පාලනයවීම සඳහා තිබෙන ස්ථාවර නියෝග ආරක්ෂා කරගන්න. ඔබතුමා දන්නවා, කථානායක පුටුවේ ඔතැන ඔබතුමා ඉඳගෙන අවුරුදු තුනහමාරක් ඔබතුමා කථානායකවරයා හැටියටත්, අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියටත් කටයුතු කරලා තිබෙන බව. ඔබතුමාගේ හෝ කාර්ය මණ්ඩලයේ කාර්ය භාරයන්ට කිසිදු ලෙස අවහිරතාවක් නොකරපු දේශපාලන ව්‍යාපාරයක් අපි. අපි හැමවිටම මේ පාර්ලිමේන්තුව, මේ පාර්ලිමේන්තුවේ සීමා මායිම්, මේ පාර්ලිමේන්තුවේ වගකීම්, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයේ සීමා මායිම් පිළිබඳ සියලු අවබෝධයන් තිබියදීත්, අපි මේ පාර්ලිමේන්තුවේ පවත්වා ගත යුතු අවම ප්‍රජාතන්ත්‍රවාදී, අවම ශිෂ්ටත්වයේ දේශපාලනයක් පවත්වා ගෙන යෑම සඳහා උත්සාහ කරපු දේශපාලන ව්‍යාපාරයක්.

ගරු කථානායකතුමනි, එම නිසා 14වෙනි දා කිසිසේත්ම ස්ථාවර නියෝගවලට පටහැනි, සම්ප්‍රදායන්ට පටහැනි යෝජනාවක් අපි ගෙනාවේ නැහැ. ඔබතුමාට මතකයි, අපි ස්ථාවර නියෝග සකස් කළා. අවුරුදු දෙකකට වැඩි කාලයක් මේ ස්ථාවර නියෝග පිළිබඳව අපි සාකච්ඡා කළා. මේ ස්ථාවර නියෝග පිළිබඳව දවසක විවාදයක් පැවැත්වුවා ගරු කථානායකතුමනි, අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන හැමදෙනාම. මීට පෙර මේ පාර්ලිමේන්තුව මෙහෙයවුණේ අපි නොමැති කාලයක හදන ලද ස්ථාවර නියෝග අනුවයි. හැබැයි, අප විසින්ම, මේ වර්තමාන පාර්ලිමේන්තුව විසින්ම, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් විසින්ම අනුමත කරන ලද ස්ථාවර නියෝග තමයි අද තිබෙන්නේ. ඒ ස්ථාවර නියෝගවලට තමයි අපි යටත් වන්නේ.

ගරු කථානායකතුමනි, එම නිසා මේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා අප පසුගිය 14වෙනි දා යෝජනාවක් ඉදිරිපත් කළා. අපට ඒ 14 වෙනි දා ඒ කුමන්ත්‍රණය පරාජයට පත් කළ යුතුමයි. එය පරාජයට පත් කිරීම සඳහා ස්ථාවර නියෝගවලට අනුරූපී වන පරිදි අවශ්‍ය වන යෝජනාවක් අපි ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

-දිගටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩලා, හඳපානේ ආණ්ඩු හදලා, කරන්න පුළුවන් විකාර රූපී වැඩ ඔක්කොම කරලා, පාර්ලිමේන්තුවේදී මේ යෝජනාව සම්මත වුණාද, නැද්ද කියලා වග විභාගයට ලක් කරමින් සිටිනවා; ශිෂ්ටත්වය පිළිබඳව ප්‍රශ්න කරනවා. ජනාධිපතිවරයාට ශිෂ්ටත්වය පිළිබඳව ප්‍රශ්න කරන්නවත් අද අයිතියක් නැහැ. අශිෂ්ටම දේශපාලනය, ව්‍යවස්ථාව උල්ලංඝනය කළ දේශපාලනය, නීති කඩපු දේශපාලනය රටට ගෙනැල්ලා, යටි කුමන්ත්‍රණකාරී, "ඩීල්" සහිත දේශපාලනයක් රටට ගෙනැල්ලා අද පාර්ලිමේන්තුව ප්‍රශ්න කරන්නට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

-පෙලඹීලා තිබෙනවා. හැබැයි, එතුමා අහගෙන ඉන්නවා නම් මම එතුමාට ඒ ගැන කියන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, "අද විශ්වාස භංග යෝජනාවක් ගෙන එනවා" කියා අපි 14වෙනි දා උදේම ඔබතුමාට දැනුම් දුන්නා. දැනුම් දුන්නා පමණක් නොවෙයි, එතැනදී අපි ඉතාම පැහැදිලිව පෙන්වා දෙනු ලැබුවා එම යෝජනාව ගෙන එන්නේ කොහොමද කියලා. ගරු කථානායකතුමනි, 135වෙනි ස්ථාවර නියෝගය අනුව ඉතාමත් පැහැදිලිව සඳහන් කොට තිබෙනවා මේ ස්ථාවර නියෝග අත්හිටුවිය හැකියි කියලා. ගරු කථානායකතුමනි, එම නිසා අපි ඉස්සෙල්ලාම මොකද කළේ? අපි ඉස්සෙල්ලාම කළ දේ තමයි, පාර්ලිමේන්තුවේ ඉක්මන් යෝජනාවක් ගෙන ඒමට බාධා කරන ස්ථාවර නියෝග අත්හිටුවීමට කටයුතු කිරීම. ඒ ස්ථාවර නියෝග අත්හිටුවීමකින් තොරව ඉස්සරහට යන්න බැරි බව අපි දැනගෙන හිටියා. ඒ නිසා ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් මේ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. කාට හෝ පුළුවන්කම තිබුණා, ඒ අවස්ථාවේදී ඒ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පරාජයට පත් කරන්නට. හැබැයි, අටවා ගත් ආණ්ඩුවක, සෙල්ලම් ආණ්ඩුවක වැජඹුණු ඒ කිසිවෙකුට කොන්ද පණ තිබුණේ නැහැ, ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පරාජයට පත් කරන්න. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අත් හිටුවීමේ යෝජනාව සහ අත්හිටුවන ලද ස්ථාවර නියෝගය මේ පාර්ලිමේන්තුවේ විධිමත් ලෙස සම්මත වී තිබෙනවා. ඔබතුමා දැන් හැන්සාඩ් වාර්තාව -නිල වාර්තාව- නිකුත් කරලා තිබෙනවා. එම නිසා නිශ්චිත පරිදි ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව සම්මත වුණා. ගරු කථානායකතුමනි, අනතුරුව මේ ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාවට යටත්ව, ඒ ස්ථාවර නියෝගවලට අනුරූපී වන පරිදි මම විසින් විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළා. අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් එය ස්ථීර කරනු ලැබුවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවක සිදු විය හැකි යෝජනා අතර අය වැය ලේඛනයට නිසි බරක් තිබෙනවා වාගේම

විශාල බරක් තිබෙන යෝජනාවක් තමයි විශ්වාස භංග යෝජනාව. ඒක සෙල්ලම් දෙයක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ලබා දී තිබෙන ඉතාම වැදගත් බලය තමයි විශ්වාස භංගයක් හරහා ආණ්ඩුවක් පෙරළිය හැකි වීම; පවතින ආණ්ඩුවක් බිඳවැටීමට හැකි වීම. එම නිසා මේ පාර්ලිමේන්තුව ඇතුලේ විවාදයට ලක් කරනවා නම්, මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරනවා නම් විශ්වාස භංගය තමයි ඉතාමත් වැදගත් යෝජනාව කියලා අපි පිළිගන්නවා, අපි ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. අපි මේ පාර්ලිමේන්තුවේ රෙගුලාසි සම්මත කරනවා; අණපනත් සම්මත කරනවා; රටේ විවිධ ප්‍රශ්න සාකච්ඡා කරනවා. හැබැයි, ඒ ඔක්කෝටමත් වඩා උඩින් තිබෙන බව අපි පිළිගන්නවා, ආණ්ඩුවකට එරෙහිව ගෙන එන ලද විශ්වාස භංග යෝජනාව.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගවලට අනුරූපී වන පරිදි අපි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළා. අපි ඉතාමත් කැමැත්තෙන් හිටියා මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව හොඳ විවාදයක් කරන්නට. ගරු කථානායකතුමනි, විවාදයක් අවශ්‍යයි. මොකද, ආණ්ඩුවක් බලයෙන් නෙරපා හැරීම සඳහා ගෙන එන ලද යෝජනාවට නිකම්ම අත ඔසවනවා වෙනුවට අපි ඉතාමත් කැමැත්තෙන් හිටියා මේ පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාව විවාදයට ලක් කරන්නට.

ඒ මොකද, මා ඉදිරිපිටම තමයි මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා වාඩි වෙලා හිටියේ. ඒ විශ්වාසභංගය ගෙනෙන වෙලාවේදී එතුමා අගමැතිවරයා. එය සම්මත වුණාට පසුව එතුමාට ඒ තනතුර නැතිව යනවා. ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉදිරිපිටම ඔහුගේ ක්‍රියා කලාපයන් සහ ඔහුගේ පාලනය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට මට කාලාන්තරයක් තිස්සේ වුවමනාවක් තිබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිබඳ අපට කථාවක් තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තුවෙන් හිටියා විශ්වාසභංගය දවසේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපිට ඒ කථාව කරන්න.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පසුගිය අවුරුදු තුනහමාරක පාලනය ගැන කථා කරනවා නම්, 2015 ජනවාරි මාසයේ 8වැනි දා එක්සත් ජාතික පක්ෂය ගොඩනැහෙන්නේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේම තිබෙන ශක්‍යතාවක ප්‍රතිඵලයක් හැටියට නොවෙයි. ජනවාරි මාසයේ 8වැනි දා ප්‍රතිඵලය, එක්සත් ජාතික පක්ෂය අත්පත් කරගෙන තිබෙන ශක්‍යතාවයේම ප්‍රතිඵලයක් නොවෙයි. ඒක ඉතා හොඳින් පෙන්නුම් කරනවා, ගරු කථානායකතුමනි. ඊට පෙර තිබුණු පළාත් සභා මැතිවරණ සියල්ලකම ඡන්ද ප්‍රතිඵල එකතු කළත්, ජනාධිපතිවරණයට පෙර තිබුණු සියලු පළාත් සභා මැතිවරණවල ඡන්ද ප්‍රතිඵල එකතු කළත් ලක්ෂ 30 ඉක්මවන්නේ නැහැ. ඒක තමයි එක්සත් ජාතික පක්ෂයේ ශක්‍යතාවය. හැබැයි, ජනාධිපතිවරණයේදී ලක්ෂ 62කට ආසන්න ඡන්ද ප්‍රමාණයක් ලැබෙන්නේ කොහොමද? මොකක්ද ඒක පිටුපස තිබුණේ? ඒක එක්සත් ජාතික පක්ෂයේ වුවමනාව නොවන බව එක්සත් ජාතික පක්ෂය තේරුම් ගත යුතුව තිබුණා. එදා -ජනවාරි මාසයේ 8වැනි දා - හැටදෙලක්ෂයක ජනතාවගේ විශාල ජන වරමක් තිබුණා; ඒ ජන වරමේ අපේක්ෂාවන් තිබුණා. ඒ ජන වරමේ අපේක්ෂාව මුළුමනින්ම කණපිට හරවමින් තමයි කටයුතු කරමින් තිබුණේ. ගරු කථානායකතුමනි, ඒ ජන වරම ලබා දීලා තිබුණේ වංචාවට එරෙහිව. හැබැයි ගරු කථානායකතුමනි, ආණ්ඩුව වංචාවේ යෙදුණා.

ජනවාරි මාසයේ 10වැනි දා ආණ්ඩුව හදනවා. පෙබරවාරි මාසයේ 28වැනි දා තමයි -දින 50කට මත්තෙන් තමයි- ආණ්ඩුව කුප්‍රකට බැඳුම්කර මං කොල්ලය සිද්ධ කළේ. මේ ආණ්ඩුව දින 50ක් යන කොට ජන වරමට පිටුපාන්න පටන් ගත්තා. එතැනින් නතර වුණේ නැහැ, ගරු කථානායකතුමනි. අය වැය ලේඛන, මේ සියල්ලකම යෝජනා කරමින් තිබුණේ මොකක්ද? 1977 දියත් කරන ලද වැරදි ආර්ථික ප්‍රතිපත්තිය තව තවත් ඉදිරියට ගෙන යමින්, විනාශකාරී, කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්ති ගමන් මහ තමයි තමුන්නාන්සේලා තීරණය කරලා තිබුණේ. ඒ ජන වරමට ප්‍රතිපක්ෂව තමයි කටයුතු කරමින් තිබුණේ.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ මාස 18කට වඩා වැඩි කාලයක් වැසීම නිසා දෙමව්පියෝ පාරට ඇවිල්ලා, ආචාර්යවරු පාරට ඇවිල්ලා, ශිෂ්‍යයෝ පාරට ඇවිල්ලා ඉන්න කොට ඒ ප්‍රශ්නය පිළිබඳ මේ ආණ්ඩුව අනුගමනය කළේ කවර ප්‍රතිපත්තියක්ද? රාජීත සේනාරත්නගේ යම් පෞද්ගලික වුවමනාව මත තමයි SAITM ප්‍රශ්නය මෙතරම් කාලයක් ඇදගෙන යමින් තිබුණේ. තමුන්නාන්සේලා ආණ්ඩුවක් ලෙස නොවෙයි කටයුතු කළේ. තම තමන්ගේ පෞද්ගලික වුවමනාවන් මත, මුළුමනින්ම ජන වරමට පටහැනිව තමුන්නාන්සේලා කටයුතු කරන්න පටන් ගත්තා.

තමුන්නාන්සේලා සිංගප්පූරු ගිවිසුම අත්සන් කළේ කොහොමද? සිංගප්පූරු ගිවිසුම අත්සන් කරන කොට කැබිනට් මණ්ඩලයට ලබා දෙන ලද අනුමැතිය තමයි, ඒ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කොට නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමත කිරීම. නමුත්, එවැනි නැවත ඉදිරිපත් කිරීමක් කළේ නැහැ. ජනවාරි මාසයේ පළාත් පාලන මැතිවරණ කාලයේ, ජනතාවගේ අවධානයක් යොමු නොවුණු කාලයේ තමුන්නාන්සේලා හොර රහසේ මේ ගිවිසුම් අත්සන් කළා. මේවා මලික් සමරවික්‍රම හිටපු අමාත්‍යවරයාගේ හෝ හිටපු අග්‍රාමාත්‍යවරයාගේ -රනිල් වික්‍රමසිංහ මහතාගේ- පෞද්ගලික දේපොළක් නොවෙයි. ඔවුන්ගේ දේපොළ පවරා දීම් පිළිබඳ ප්‍රශ්න නම්, ඔවුන්ගේ ව්‍යාපාර පවරා දීම් පිළිබඳ ප්‍රශ්න නම්, අපට ප්‍රශ්නයක් නැහැ; ඒවා හඳපානේ කළත් කමක් නැහැ; රෑ පානේ කළත් කමක් නැහැ.

හැබැයි, මේ රටේ ජනතාවගේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑම සඳහා තිබෙන මාවත් මුළුමනින්ම මං කොල්ල කන විධියට තමයි කටයුතු කරමින් තිබුණේ. හම්බන්තොට වරායේ ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව කැබිනට් මණ්ඩලයේ තීරණය කුමක්ද? හම්බන්තොට වරාය ගිවිසුම අත්සන් කරන්න පෙර පාර්ලිමේන්තුවේ විවාදයක් කරලා, එම විවාදයේදී ඉදිරිපත් වන සාධනීය යෝජනාද ගිවිසුමට ඇතුළත් කරලා අත්සන් කළ යුතුව තිබුණා. සිකුරාදා දිනයක පාර්ලිමේන්තු විවාදය පැවැත්වීමට තීරණය කරලා, ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සෙනසුරාදා දිනයට යොදාගෙන තිබුණා. පාර්ලිමේන්තුව තුළ මොන සාධනීය විවාදද? මොකක්ද කළේ? තක්කඩි, හිතුවක්කාර ලෙස තමයි එදාත් හම්බන්තොට වරාය ගිවිසුම අත්සන් කළේ. තමුන්නාන්සේලා හම්බන්තොට වරාය ගිවිසුම අත්සන් කරලා ඉවර වෙලා තමයි හම්බන්තොට වරාය මිලදී ගන්නා ලද චීන සමාගමට ක්ෂේත්‍ර ගණනාවක් සඳහා අවුරුදු ගණනාවකට -අවුරුදු 35, 40, 28 ආදී වශයෙන්- බදු අහෝසි කිරීමේ ගැසට් නිවේදන මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ. ගරු කථානායකතුමනි, හම්බන්තොට වරායට මිලක් නියම කරලා, විකුණන්න තීරණය කරලා විකුණනවා. වික්කාට පස්සේ ඒ සඳහා බදු සහන දෙනවා. අපි එදාත් ඒ පිළිබඳව ඇහුවා. ඒ බදු සහන තමුන්නාන්සේලා ගෙදරින් ගෙනැල්ලා දෙන ඒවා නොවෙයි. ඒ බදු සහනවල වටිනාකම ගිවිසුමට ඇතුළත් කළාද? ඒ කිසිවක් කළේ නැහැ. එම නිසා තමුන්නාන්සේලාගේ අවුරුදු තුනහමාරක ආණ්ඩුව කටයුතු කරමින් තිබුණේ ජනතාවට මුළුමනින්ම ප්‍රතිපක්ෂ ලෙස සිටගනිමිනුයි.

ගරු කථානායකතුමනි, එදා ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව පිළිබඳව විධිමත් විවාදයක් පැවැත්වුවා නම්, ඉතාමත් අසීරුතාවට පත් වී තිබෙන රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව පිළිබඳවත් එතුමාට ඇහෙන්න අපට ලොකු කථාවක්

[ගරු අනුර දිසානායක මහතා]

කියන්න තිබුණා. අඩුම තරමින් එදාවත් සිහි බුද්ධියෙන් අහයි කියලා අපි හිතුවා. ඊට කලින් තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරු, මේ රටේ ජනතාව, පාර්ලිමේන්තුව කියන කිසි හඬකට ඇහුම් කන් නොදුන් නායකයෝ, -ගරු කථානායකතුමනි, ඒ ගොල්ලෝ ප්‍රජාතන්ත්‍රවාදයේ මුරකරුවෝ නොවෙයි. ඒ ගොල්ලෝ ප්‍රජාතන්ත්‍රවාදයේ හොර මුරකරුවෝ- තමන් අසීරුතාවට පත් වුණාට පස්සේ, තමන්ගේ තනතුර ගහලා ගියාට පස්සේ, තමන් දේශපාලන වශයෙන් විනාශ වුණාට පස්සේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සටන් පෙරට ගන්න එක වැරැදියි. ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ තමන්ගේ කැත, කිලිටි ශරීරය වසා ගැනීම සඳහා තිබෙන කඩ මල්ලක් නොවෙයි. ඒ පිළිබඳවත් එදා අපි විශ්වාස භංග යෝජනාව පිළිබඳව විවාදයේදී කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙන් සිටියා. එම නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා පිළිබඳවත්, මහින්ද රාජපක්ෂ මහත්මයා පිළිබඳවත්, අහගෙන ඉන්නවා නම් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ක්‍රියා කලාපය පිළිබඳවත් පසු ගිය 14වැනිදා මේ පාර්ලිමේන්තුව තුළ අපි විධිමත් විවාදයක් කරන්න බලාපොරොත්තු වුණා. හැබැයි ගරු කථානායකතුමනි, එම විවාදය කරගන්න බැරි වුණා. එම විවාදය කරගන්න බැරි වීම හේතු කොටගෙන තමයි, ඒ වාගේම පාර්ලිමේන්තුවේ සිදු නොවිය යුතු තත්ත්වයක් තුළ තමයි එම විශ්වාස භංග යෝජනාව ඡන්ද විමසීමකට භාජනය කරනු ලැබුවේ. නමින් නමට ඡන්දය විමසන ලෙස අපි ඉල්ලා සිටියා. ගරු කථානායකතුමනි, නමින් නමට ඡන්දය විමසීමට සූදානම් බව ඔබතුමා අවස්ථා තුනකදී කියනවා මම හැන්සාඩ් වාර්තාවේ දැක්කා. ගරු කථානායකතුමනි, හැබැයි කිසිදු අවස්ථාවක එම ඡන්දය මේ පාර්ලිමේන්තුව තුළ නිල වශයෙන් ප්‍රකාශයට පත්වීම වැළැක්වීම තමයි එම කණ්ඩායමට අවශ්‍ය වී තිබුණේ. එසේ ප්‍රකාශයට පත්වීම වැළැක්වීම වෙනුවෙන් ඔවුන් නැවතත් කඩාකප්පල්කාරී ක්‍රියාව අනුගමනය කළා. ඒ කුමන බාධක මධ්‍යයේ හෝ ජනතාව විසින් මේ ව්‍යවස්ථාදායකයට පවරා තිබෙන බලය, ජනතාවගේ පරමාධිපත්‍ය බලය ඉතා වැදගත් කොට පාර්ලිමේන්තුව නියෝජනය කරනවා නම්, ජනතාවගේ එම පරමාධිපත්‍ය බලයේ වැදගත් කොටස ඉටු කර ගැනීම සඳහා 14වැනි දා, 15වැනි දා සහ 16වැනි දා කථානායකවරයා හැටියට ඔබතුමා විසින් ගනු ලැබූ තීන්දු තීරණ නිසා අපට ඔබතුමාව පැසසුමට භාජනය කළ හැකිව තිබෙනවා.

ඒවා ඉතා වැදගත් තීන්දු-තීරණ. ඒ සම්බන්ධ හැන්සාඩ් වාර්තාව නිකුත් වී තිබෙනවා. එහි ඉතාම පැහැදිලි ලෙස විශ්වාස භංග යෝජනාව සම්මත වී තිබෙනවා. ගරු කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පස්සේ, මොකක්ද මෛත්‍රීපාල සිරිසේන මහතාට ඒකේ හිල් හොයන්න තිබෙන අයිතිය? මොකක්ද මෛත්‍රීපාල සිරිසේන මහතාට ඒ ගැන "වංගු ගහන්න" තිබෙන අයිතිය? මොකක්ද මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මේ විශ්වාස භංග යෝජනාව හරියට සම්මත වුණාද, නැද්ද කියලා වග-විභාග කරන්න තිබෙන අයිතිය? මේ පාර්ලිමේන්තුවේ ඡන්දයක් නිසි පරිදි සිදු වුණාද නැද්ද කියලා වග විභාග කිරීමේ ප්‍රධානියා තමයි කථානායකතුමා. කථානායකතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ තීන්දු-තීරණ, වග-විභාග පිළිබඳව ඉන්න ප්‍රධාන වගකිවයුත්තා. මේ පාර්ලිමේන්තුව විධායකයට යටත් කරලා නැහැ; ජනාධිපතිවරයාට යටත් කරලා නැහැ. ඒ නිසා ඉතා පැහැදිලි ලෙස ඔබතුමා 15වැනි දා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරනු ලැබුවා, විශ්වාස භංග යෝජනාව විධිමත් සේ සම්මත වුණු බවත්, ආණ්ඩුවක් නොමැති බවත්. ආණ්ඩුවක් නොමැති බව ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පස්සේ මොකක්ද ජනාධිපතිවරයාට කරන්න තිබෙන්නේ? ජනාධිපතිවරයාට නැවතත් කියන්නේ මේ කාරණයයි. එතුමාගේ ඔළුවේ හැදෙන හිතලුවලට පුළුවන්, පොළොන්නරුවේ කුඹුරක් වගා කරන්න. එතුමාට හිතුණොත් බාස්මතී වගා කරමු කියලා, බාස්මතී වගා කරන්න පුළුවන්. එතුමාට හිතුණොත් සති දෙකෙන් යූරියා ගහන්න ඕනෑ කියලා, යූරියා ගහන්න පුළුවන්. එතුමාට හිතුණොත් රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර දාන්න පුළුවන් කියලා, ඒක කරන්න පුළුවන්. තමන්ගේ කුඹුරක් වගා කරන්න පුළුවන් තමන්ගේ ඔළුවේ හැදෙන හිතලුවලට අනුව. හැබැයි, ජනාධිපතිවරයාට ජනාධිපතිකමේ වග කීම ඉටු කරන්න බැහැ, එතුමාගේ හිතලුවලට අනුව. ජනාධිපතිවරයා යටත් මේ ව්‍යවස්ථාවට. නමුත් ජනාධිපතිතුමා මොකක්ද කරලා තිබෙන්නේ?

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී ආණ්ඩුවක් පෙරළීම සඳහා කටයුතු කළ හැකි අවස්ථා තුනක් පිළිබඳව ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙනවා. පළමුවැනි එක තමයි, පාර්ලිමේන්තුවට ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාව. එතුමා ආවේ නැහැ ඒක ඉදිරිපත් කරන්න කියවන්න. අපි බලාගෙන හිටියා, එතුමා එදා ප්‍රතිපත්ති ප්‍රකාශය කියවන්න එයි කියලා. මොකද ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට එන්න ඕනෑ ඇඳුම් ඇඳගෙන. ඒ නිසා එතුමා ආවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48. (2) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළ හොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළ හොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය."

තව මොනවාද ජනාධිපතිවරයාට කරන්න තිබෙන්නේ? මේ ජනාධිපතිවරයා ඊයේත් කැබිනට් මණ්ඩලය කැඳවනවා. ගරු කථානායකතුමනි, මෙහෙම ආණ්ඩු තියාගෙන යන්න පුළුවන්ද? මේක අලි බාබා සහ හොරු හතළිහ වාගේ නේ. අලි බාබායි හොරු හතළිහයි එකතු වෙනවා. එකතු වෙලා කියනවා, "අද බැංකුවකට ගහමු. අද තව තැනක් හොරකම් කරමු." කියලා. මේ විධියට ආණ්ඩු කරගෙන යන්න පුළුවන්ද? ව්‍යවස්ථාවට අනුව, නිශ්චිත පරිදි පාර්ලිමේන්තුව විශ්වාස භංග යෝජනාවක් සම්මත වූ වහාම කැබිනට් මණ්ඩලය විසුරුවා හැරෙන්නේය කියා තිබෙනවා.

ජනාධිපතිවරයා ඒක කරන්න ඕනෑ. ඊළඟට ජනාධිපතිතුමා කරන්න ඕනෑ මොකක්ද? ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48වැනි ව්‍යවස්ථාවෙහි කියනවා, "ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70වැනි ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසුරුවා හැර නැත්නම් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථාව අනුව අග්‍රාමාත්‍යවරයෙක්ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ද, නියෝජ්‍ය අමාත්‍යවරයන්ද පත් කළ යුත්තේය." කියලා.

දැන් එතුමාට වෙන කරන්න මොකුත් නැහැ. පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාව සම්මත වුණාට පස්සේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරී තිබෙන්නේ නව ආණ්ඩුවක් පිහිටුවීමයි. එතුමාට ඕනෑ නම් රාජපක්ෂ මහත්මයාත් එක්කම හුරතල් වෙන්න, ආයෙත් එතුමාම දිවුරුම් දුන්නාට අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ව්‍යවස්ථාව කියන්නේ ඒක නොවෙයි. පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාවක් සම්මත වූවාට පසුව ජනාධිපතිවරයාට පැවරී තිබෙන බලතල තමයි, විසුරුවා හැරෙන ආණ්ඩුව වෙනුවට නව ආණ්ඩුවක් පත් කිරීම. පසුගිය 18වන දා සිට දැන් සැලකිය යුතු කාලයක් ගත වෙමින් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ කාලය ඇතුළත ජනාධිපතිවරයා විසින්

ආණ්ඩුවක් පත් කරලා නැහැ. දැන් ජනාධිපතිවරයාට මේ රටේ ජනතාව බල කරන්න ඕනෑ, ආණ්ඩුවක් හදන්න. එතුමාට ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන බලතල අනුව විශ්වාසභංග යෝජනාවක් සම්මත වුණාට පසුව එතුමා ආණ්ඩුවක් පිහිටුවන්න ඕනෑ. දැන් දින 10ක් තිස්සේ ආණ්ඩුවක් නැහැ. ඒ නිසා මේ අරාජිකත්වයේ කුමන්ත්‍රණකාරයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒ නිසා දැන් දින 10කට වඩා වැඩි කාලයක් තිස්සේ ආණ්ඩුවක් නැහැ. එතුමා හිතනවා නම්, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සයනයේ සැතපීමම තමයි වඩාත් වැඩි උත්තේජජනක හැඟීම් හදන්නේ කියලා, නැවතත් මහින්ද රාජපක්ෂ මහත්මයාට අගමැති ලෙස දිවුරුම් දෙන්න සලස්වන්න පුළුවන්. නැවත ඒ කැබිනට් මණ්ඩලය පත් කරන්න. නැවත අපි ඒක පාර්ලිමේන්තුවෙන් බලා ගන්නම්. හැබැයි, දැන් ආණ්ඩුවක් නැහැ. ජනාධිපතිවරයා තමන්ට පැවරී තිබෙන කාර්යභාරය දැන් ඉටු කරන්නේ නැහැ. ඒ කාර්යය ඉටු කරන්නේ නැතුව ගරු කථානායකතුමනි, හොර මණ්ඩලයක් රැස් වෙනවා වාගේ, කැලෑ ආණ්ඩුවක් රැස් වෙනවා වාගේ කැබිනට් මණ්ඩලය රැස් වෙනවා; තීන්දු ගන්නවා; තීන්දු ප්‍රකාශයට පත් කරනවා. අපි මේ රටේ සියලු රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ මේකයි. මේ කැබිනට් මණ්ඩලය තවදුරටත් වලංගු කැබිනට් මණ්ඩලයක් නොවෙයි. මේ කැබිනට් මණ්ඩලය විසින් ගනු ලබන කිසිදු තීන්දු තීරණයක් ක්‍රියාත්මක නොකළ යුතුයි කියලා අපි මේ රටේ රාජ්‍ය සේවකයන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ මොකද? මේ රටේ ව්‍යවස්ථාව රකින්න හැම රාජ්‍ය සේවකයාම දිවුරුම් දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, අපේ රටේ ත්‍රිවිධ හමුදාවට, පොලීසියට විශාල කාර්යභාරයක් පැවරෙනවා. මෙවැනි අරාජික තත්ත්වයක් ඇතුළේ හමුදාව, පොලීසිය, ව්‍යවස්ථාවේ ආරක්ෂාවේ ආරක්ෂකයන් වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. මම කියන්නේ ඒකයි. ව්‍යවස්ථාව ආරක්ෂා කරන්නන්ගේ ආරක්ෂාව වෙනුවෙන් තමයි හමුදාව සහ පොලීසිය පෙනී සිටින්න ඕනෑ. හමුදාව සහ පොලීසිය පෙනී සිටිය යුතු වන්නේ, ව්‍යවස්ථාව කඩන අයගේ ආරක්ෂාව වෙනුවෙන් නොවෙයි. ඒක තේරුම් ගත යුතුයි. ඒ නිසා හමුදාව සහ පොලීසිය තවදුරටත් හැසිරිය යුතු වන්නේ, ජනාධිපතිවරයාගේ නියෝග මත නොවෙයි කියලා අපි යෝජනා කරනවා. ඒ ඇයි, ගරු කථානායකතුමනි? හමුදාව, පොලීසිය බැඳී සිටිනවා ව්‍යවස්ථාව රකින්න. ඔවුන් ආරක්ෂා කළ යුත්තේ ව්‍යවස්ථාව රකින අය. ඔවුන් ආරක්ෂා කළ යුතු නැහැ, ව්‍යවස්ථාව කඩන අය. ජනාධිපතිවරයාත්, වර්තමාන ඊනියා කැබිනට් මණ්ඩලයත් ව්‍යවස්ථාව කඩලා තිබෙන්නේ. ඒ නිසා මේ රටේ ආරක්ෂක හමුදාවලට විශාල කාර්යභාරයක් තිබෙනවා. මේ රටේ ව්‍යවස්ථාව කඩන ලද කණ්ඩායමක් ආරක්ෂා නොකළ යුතුයි කියලා අපි විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේදී ඉල්ලා සිටිනවා, මේ රටේ හමුදාවෙන්, පොලීසියෙන් සහ රාජ්‍ය සේවයෙන් ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මේ අරාජිකත්වය නිර්මාණය කිරීමේ ප්‍රධානම කුමන්ත්‍රණකරුවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හැබැයි එතුමා ඒ කුමන්ත්‍රණය විවිධාකාරයෙන් වසා ගැනීම වෙනුවෙන් එක එක පක්ෂ සමඟ සාකච්ඡා, පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරනවා. සර්ව පාක්ෂික සාකච්ඡා තියනවා. අදත් කවුරුහරි මන්ත්‍රීවරයෙක් සමඟ සාකච්ඡා කළා ලු. මම දන්නේ නැහැ මොනවා කරනවාද කියන්න. ගරු කථානායකතුමනි, තවදුරටත් අපට නම් මේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක කිසි සාකච්ඡාවක් ඉතුරු වී නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සාකච්ඡා කළ යුතු වන්නේ, තමන්ගේ හදවත සමඟ; තමන්ගේ හෘදය සාක්ෂිය සමඟ. එතුමා සාකච්ඡා කරන්න ඕනෑ, වග විභාගයට ලක් කරන්න ඕනෑ ව්‍යවස්ථාවට අනුව කටයුතු කළාද, නැද්ද, ජන වරමට අනුව කටයුතු කළාද, නැද්ද කියන එක තමයි. අපි කැඳවලා මොනවාද සාකච්ඡා කරන්නේ? හෘදය සාක්ෂියක් නැති කෙනෙකුට, මේ රට පිළිබඳව, රටේ ජනතාව පිළිබඳව කිසිදු හැඟීමක් නැති කෙනෙකුට ගරු කථානායකතුමනි, සාකච්ඡාවලින් ඇති ඵලය මොකක්ද? ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එකිනෙකාට ගිල්ලවන ලණු ජනතා විමුක්ති පෙරමුණ ගිලින්න සූදානම් නැති බවත් ජනාධිපතිවරයාට මෙතැන සිට මතක් කරන්න මා කැමැතියි.

ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාව උල්ලංඝනය කරන ලද ජනාධිපතිවරයෙකුට එරෙහිව ගත හැකි ව්‍යවස්ථානුකූල ක්‍රියා මාර්ගත් ව්‍යවස්ථාවේම සඳහන් වී ඇති බව මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මම මතක් කර දෙන්න කැමැතියි. ඒක මතක තබා ගන්න. එවැනි කරුණු දෙකක් තිබෙනවා. එක, දැනුවත්වම ව්‍යවස්ථාව උල්ලංඝනය. ඊළඟ එක, මානසික ආබාධ. මේ කරුණු දෙක වෙනුවෙන්ම විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්න පුළුවන්. මම දන්නේ නැහැ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට වලංගු වෙන්නේ ඒ කෝකද කියලා. ඒක මේ රටේ ජනතාව තීරණය කරයි. ව්‍යවස්ථාවේම තිබෙනවා, ව්‍යවස්ථාව කඩනවා නම් ජනාධිපතිවරයාට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග. ඒ කවර ක්‍රියාමාර්ගය ගත හැකිද කියලා අපි ඉදිරියේදී කල්පනා කරලා බලමු. ඒකට අපි සූදානම්. ඒ මොකද ගරු කථානායකතුමනි? අපට මේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑ. ඒ ඇයි?

මේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවීම නිසා විශාල ලෙස පීඩාවට පත් වුණු, බැට කාපු දේශපාලන ව්‍යාපාරයක් අපි. ඒ නිසා මේ නිශ්චිත මොහොතේ අපේ ස්ථාවරය වන්නේ මෙයයි. අපේ රටේ කිසිදු සාමාජිකයකු හෝ අපේ රටේ කිසිදු පුරවැසියකු රාජ්‍ය ත්‍රස්තවාදයේ ගොදුරු බවට පත් නොවිය යුතුයි කියන එක තමයි අපේ පක්ෂයේ ස්ථාවරය වන්නේ ගරු කථානායකතුමනි. අපි හැම පියවරක්ම ගනු ලබන්නේ ඒ සඳහායි. මේ රටේ කවර දේශපාලන ක්‍රියාකාරිකයකු හෝ මේ රටේ මාධ්‍යවේදියකු හෝ මේ රටේ සාමාන්‍ය පුරවැසියකු හෝ රාජ්‍ය ත්‍රස්තවාදයේ ගොදුරක් බවට පත් නොවිය යුතුයි. අන්න ඒ නිසා තමයි මේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීමේ පෙරටුගාමී කාර්ය භාරයක් ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉටු කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙතැනදී කිසිසේත්ම එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කිරීමක් අපි කරන්නේ නැහැ. මම ඒකත් වගකීමෙන් කියනවා. මොකටද, එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරන්නේ? අවුරුදු තුනහමාරක් වන ඔවුන්ගේ කැන, කිලිටි ඉතිහාසය මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන ලෝගුවෙන් වහගන්න ඉඩ නොදිය යුතුයි. ඒකත් මේ රටේ ජනතාවත් එක්ක ඉදිරියේ දී සාකච්ඡාවට බඳුන් කරන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානමින් සිටින බවත් මතක් කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. අවුරුදු තුනහමාරක කැන, කිලිටි ඉතිහාසයක් තිබෙන්නේ. මේ පසුපෙළ මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවොත් ඔවුන්ගේ හෘදය සාක්ෂිය කියයි, ආණ්ඩුව කටයුතු කළේ කොහොමද; ආණ්ඩුව කළේ මොනවාද; කරපු ඒවාට එකඟද, Group එක සාකච්ඡා කරපු ඒවා තීන්දු බවට පත් වුණාද; එම තීන්දු ක්‍රියාත්මක කරන්න මොන ඇමතිවරයාද මැදිහත් වුණේ කියන එක. පොළොන්නරුවේ මන්ත්‍රීවරයා ඇවිල්ලා කියන කොට, "පොළොන්නරුවේ ජනතාව කියන්නේ මේකයි" කියලා, හම්බන්තොට මන්ත්‍රීවරයා ඇවිල්ලා

[ගරු අනුර දිසානායක මහතා]

කියන කොට, "හම්බන්තොට ජනතාව කියන්නේ මේකයි" කියලා, ඒ කිසිවක් සැලකිල්ලට ගන්නේ නැතුව කොල්ලුපිටියේ මොළවලින් තමයි රටක් ගෙනියන්න හැදුවේ. ඒක තේරුම් ගත යුතුව තිබෙනවා. ඒ මොළ අසාර්ථක වීමෙන් තමයි මේ කුමන්ත්‍රණ දියත් කිරීම සඳහා පසුබිමක් නිර්මාණය වුණේ. ඒකත් පාලකයන් විසින් හොඳින් තේරුම් ගත යුතුව තිබෙනවා. ඒවා පිළිබඳව අපි වෙනම කථා කරමු.

ගරු කථානායකතුමනි, දැන් මේ තරම් විශාල අරාජිකත්වයකට පත් කරලා, මේ තරම් විශාල අස්ථාවරත්වයක් නිර්මාණය කරලා, මේ තරම් ව්‍යවස්ථාව කැඩීමේ ක්‍රියාමාර්ගයකට මේ දෙදෙනා ඇතුළු වුණේ ඇයි? ගරු කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ මහත්මයා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. එතුමාගේ කතාවේදී කිව්වා, ළමා කාලයේ මේකේ ඉඳගෙනත් සිටියා කියලා. මම දන්නේ නැහැ, ඇත්තද කියන්න. [බාධා කිරීම] එහෙමත් කිව්වා, ගරු කථානායකතුමනි. එතුමා මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරලා තිබෙනවා; අමාත්‍යවරයකු හැටියට කටයුතු කරලා තිබෙනවා; විපක්ෂ නායකවරයකු හැටියට කටයුතු කරලා තිබෙනවා; අග්‍රාමාත්‍යවරයකු හැටියට කටයුතු කරලා තිබෙනවා; ජනාධිපතිවරයා හැටියට කටයුතු කරලා තිබෙනවා. ආපසු, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරලා තිබෙනවා. ආයෙත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-අගමැති කෙනෙක් හැටියට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුට ලබා ගත හැකි සියල්ල, කථානායක පුටුව හැරුණු කොට අනෙක් සියල්ල එතුමා ලබාගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. එතුමා එහෙම කරලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තු භාවිතාවන් පිළිබඳව එතුමාට යම් අත්දැකීමක් සහ අවබෝධයක් තිබෙනවාය කියලා මා පෞද්ගලිකව විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අඹ ගස්වල අඹ හැදුණාම, ඉදුණු අඹ ලේන්නු කනවා. ලේන්නු කෑවාට පසුව ඉතුරු වෙන කෑල්ලට අපේ ගම්වල කියනවා, "ලේන් කොටේ" කියලා. ගරු කථානායකතුමනි, ගමේ ඉන්නා දරුවෙකුටවත් ලේන් කොටේ කන්න දෙන්නේ නැහැ, ඒකේ විස ඇති කියලා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්මයා මේ "අගමැති කොටේ" ගත්තේ ඇයි? මේ, අගමැති කොටයක් ගත්තේ. කුමාර වෙල්ගම මන්ත්‍රීවරයා කියා තිබුණා මම දැක්කා, "ඉතා හොඳට මල් වට්ටියක් අතේ තිබුණා. මල් වට්ටියක් අතේ තිබුණු මහින්ද රාජපක්ෂ මහත්මයාට අසූචි වට්ටියක් දුන්නා" කියලා. ඇයි, එහෙම වුණේ? ඇයි? ඊළඟ පළාත් සභා මැතිවරණය ඒමට නියමිතව තිබුණා; ඊළඟට ජනාධිපතිවරණයක් ඒමට නියමිතව තිබුණා. ඒ සඳහා අවශ්‍ය අණපනත් මේ පාර්ලිමේන්තුවේ ඇති තරම් සාකච්ඡා කරමින් තිබුණා. නිසි පරිදි මැතිවරණ ක්‍රියාදාමයක් හරහා ඔහුට අවශ්‍ය නම් බලය සඳහා යන්න පාරක් තිබුණා. ඒ පාර එසේ තිබියදී මේ ලේන් කොටයක් වැනි අගමැති කොටය ගන්න පෙලඹුණේ මොකද?

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ දැන් ආණ්ඩුවක් හදා ගෙන තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන ප්‍රධාන කාර්ය භාර දෙකක් තිබෙනවා. එක, නීති සම්පාදනය. දෙක, මූල්‍ය සම්පාදනය. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවට පැවරී තිබෙන ප්‍රධාන කාර්ය භාර දෙක අනුව පළමුව මේ රටේ පොදු ජනයා වෙනුවෙන් නීති හදන්න ඕනෑ. දෙවනුව, මේ මහජනයාගේ ධනය භාණ්ඩාගාරයේ තිබෙනවා. භාණ්ඩාගාරයේ තිබෙන ඒ ධනය බලා ගන්න ඕනෑ, පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් තොරව කිසිදු මුදලක් වියදම් කරන්න ජනාධිපතිවරයාට හෝ මහින්ද රාජපක්ෂ මහත්මයාට බලයක් නැහැ. ගරු කථානායකතුමනි, මේ කාර්යයන් දෙකම මේ පාර්ලිමේන්තුවේ කරගන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ මේ කණ්ඩායමට පුළුවන්ද, නීතියක් සම්පාදනය කරගන්න? මේ පාර්ලිමේන්තුවේ මේ කණ්ඩායමට නීතියක් සම්පාදනය කරගන්න බැහැ. පාර්ලිමේන්තුවේ මේ කණ්ඩායමට අය වැය ලේඛනයක් සම්මත කරගන්න, මුදල් පනතක් සම්මත කරගන්න පුළුවන්ද? කිසිවක් සම්මත කරගන්න බැහැ. ඒ නිසා මේ අටවා ගන්නා ලද ආණ්ඩුව අටවා ගත්තේ පාර්ලිමේන්තුවේ කාර්ය භාරය සඳහා නොවෙයි, ගරු කථානායකතුමනි. පාර්ලිමේන්තුවේ කාර්ය භාරය සඳහා නම්, බහුතරය නැහැ කියන කොටම ගෙදර යන්න ඕනෑ. මේ, පාර්ලිමේන්තුවේ කාර්ය භාරය සඳහා නොවෙයි. පාර්ලිමේන්තුවට පැවරී තිබෙන කිසිදු කාර්ය භාරයක් මේ ආණ්ඩුවට කරගන්න බැහැ.

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායයක් හැටියට තේරීම් කාරක සභාවේ බහුතරය ආණ්ඩුවට තිබෙනවා. හැබැයි, බහුතරයක් නැති ආණ්ඩුවට තේරීම් කාරක සභාවේ බහුතරය හම්බවෙන්නේ නැහැ. මෙහෙමයි වෙලා තිබෙන්නේ. සම්ප්‍රදායක් ලෙස කථානායකවරයා පත් කිරීමේ බලය තිබෙනවා. හැබැයි, එහෙම බලයක් හරහා කථානායකවරයා පත් කරන්න හෝ ඉවත් කරන්න බලයක් නැහැ. ඒ නිසා මේ අබබගාත ආණ්ඩුවක් ගත්තේ ඇයි? මේ කඩා වැටුණු පාලනයකට අත තිබ්බේ ඇයි? මේ ආණ්ඩුවේ කිසිදු අපේක්ෂාවක් නැහැ, මේ පාර්ලිමේන්තු කාර්ය භාරය ගැන. මේකේ අණපනත් සම්මත කරන්න, මේකේ නීති-රෙගුලාසි සම්මත කරන්න, මේකේ මුදල් ලේඛන සම්මත කරන්න කිසි අභිලාෂයක් නැහැ.

එහෙම අභිලාෂයක් නැති බව මේ පාර්ලිමේන්තුව රැස් වුණු හැම දිනයේම පෙන්නුම් කරමින් තිබුණා. මේ පාර්ලිමේන්තුව ඔවුන්ට තමන්ගේ තක්කඩි, කැත, මර්දනකාරී දේශපාලනයේ තවත් එක් මධ්‍යස්ථානයක් විතරයි. පුටු කඩන, කථානායකවරයාගේ පුටුව පෙරළන, මීරිස් කුඩු ගෙනෙන, මෙවැනි කැත පන්නයේ වුවමනාවකට විතරයි මේ පාර්ලිමේන්තුව ඒ ගොල්ලන්ට ඕනෑකර තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට ජනතාව විසින් පවරා තිබෙන නිත්‍ය වූ බලය හරහා මුදල් සම්පාදනයත්, නීති සම්පාදනයත් ඒ ගොල්ලන්ට මේ පාර්ලිමේන්තුවේ කරගන්න බැහැ. එහෙම නම් මේ පාර්ලිමේන්තුවේ වැඩ ගොඩක් කරගන්න බැරිව තිබියදී ආණ්ඩුවක් හදා ගත්තේ ඇයි? එසේ කළේ, පාර්ලිමේන්තු කාර්ය භාරය සඳහා නොවෙයි. ගරු කථානායකතුමනි, ඔවුන්ට එරෙහිව අධිකරණ පද්ධතිය තුළ දියත් වෙමින් පවතින නඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ඉතා වේගයෙන් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඇවන්ට්ගාර්ඩ් හරහා රාජ්‍යයට ලැබිය යුතු රුපියල් කෝටි 1,140ක ගනු දෙනුවක් සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂට එරෙහිව නඩුවක් තිබෙනවා. රුපියල් කෝටි 1,100ක බැදුම්කර ගනු දෙනුවට සමාන එකක්. ඒ සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂටත්, තවත් චූදිතයන් හයදෙනකුටත් එරෙහිව පවරා තිබෙන නඩුව දෙසැම්බර් මාසයේ අධිකරණයේ විභාගයට ගැනෙනවා.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මේ රටේ ඕනෑම පුරවැසියකු තමන්ගේ අම්මාගේ, තාත්තාගේ සොහොන හදන්නේ දුක් විඳ කුලී වැඩක් හෝ කරලා ලබාගත් තමන්ගේ සල්ලිවලිනුයි. නමුත් එවැනිවත් සදාචාරයක් නැති දේශපාලකයන් සිටිනවා. මහජනයාගේ සල්ලි හොරකම් කරලා මැදමුලනේ ගිහිල්ලා

ඇටෙව්වා, කෞතුකාගාරයක් සහිත සොහොන් ස්මාරකයක්. ඒකටත් රාජ්‍ය මුදල් ලක්ෂ 339ක් වියදම් කරලා තිබුණා. ඒ විතරක් නොවෙයි. ඒ මුදල් වියදම් කළ බව පිළිගෙන, නඩුව දැම්මාට පසුව මුදල් ගෙනැල්ලා භාර දුන්නා. එහෙම නම් හොරාත් ඉන්නවා, බඩුත් තිබෙනවා. නමුත්, ඒ නඩුව ඇහුවේ නැහැ. වෙන වෙන ඩීල් දාගෙන හිටියා. ඒවා මම වෙන දවසක කියන්නම්. සාගල රත්නායක මන්ත්‍රීතුමා මොනවාද කළේ? ඒවා ගැන වෙනම කථා කරන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ. මේ ගොල්ලන් කරපුවා අපි කියන්නම්. නිලමෙලා ආරක්ෂා කරපු විධිය; ගාමිණී සෙනරත්ලා ගෙවල්වල හංගාගෙන හිටපු විධිය අපි කියන්නම්. එහෙමයි වංචනිකයින් ආරක්ෂා කළේ. පසුපෙළ මන්ත්‍රීවරුන් මේවා දැනගන්න ඕනෑ. ආණ්ඩු නොවෙයි, මේ ගොල්ලන් කළේ. තමන්ට ආණ්ඩුව එනකොට මේගොල්ලන් හිතුවා, මහා බලයක් ලැබුණායි කියලා. තමන්ට අවුරුදු ගණනාවක් තිස්සේ අත්පත් කර ගන්න බැරි වුණු දේපොළ අත්පත් කර ගැනීම, අවුරුදු ගණනාවක් තිස්සේ සුඛ විහරණය සලසන්න බැරි වුණු ජීවිත සන්තර්පණය කිරීම තමයි ආණ්ඩුවක් හැටියට කළේ. ගෝඨාභය රාජපක්ෂට එරෙහි ඊළඟ නඩුව අහන්න විශේෂ අධිකරණය දින නියම කර තිබෙනවා. ගෝඨාභයට එරෙහිව නඩු දෙකයි; නාමල් රාජපක්ෂට එරෙහිව නඩු දෙකයි; බැසිල් රාජපක්ෂට එරෙහිව නඩු දෙකයි. විමල් වීරවංශට එරෙහිවත් නඩුවක් තිබෙනවා. විමල් වීරවංශගේ බිරිඳට එරෙහිවත් නඩුවක් තිබෙනවා. එතැන නඩු දෙකයි. ඊළඟට, මහින්දානන්දට එරෙහිව නඩුවක් තිබෙනවා, රෝහිත අබේගුණවර්ධනට එරෙහිව නඩුවක් තිබෙනවා. ඊළඟට, ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ නඩුව, ගාමිණී සෙනරත්ගේ නඩුව, ලලිත් වීරතුංගගේ ඇපෑල් නඩුව තිබෙනවා. ඒ ඇපෑල ගිය විධියත් මම දන්නවා. ඒක මම වෙනත් දවසක කියන්නම්.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ පුටුව වටේ වට වෙලා හිටපු කට්ටිය මම දැක්කා. විසිදැලක් දාලා FCID එකට ඔක්කෝම අල්ලා ගන්න තිබුණා. එහෙම තමයි team එක. පෙබරවාරි මාසයට කලින් මේ නඩු ඔක්කොම එනවා. පාර්ලිමේන්තුවේ විධිමත් ලෙස නීති සම්පාදනය කිරීම, විධිමත් ලෙස මුදල් සම්පාදනය කර ගැනීම වෙනුවෙන් නොවෙයි මේ ආණ්ඩුව හැදුවේ. මේ ආණ්ඩුව හැදුවේ අන් කවරක්වත් නිසා නොවෙයි, අධිකරණවල දියත් වෙමින් තිබෙන නඩු අහන්න කටයුතු කරමින් තිබෙන නිසයි. මේ සතියේ විමල් වීරවංශගේ එක නඩුවක් ඇහුවා. ඒක කල් ගියා මැයි මාසයේ හයවැනිදාට. අවුරුද්දට දෙපාරයි නඩුව අහන්නේ. නඩුව 40 වතාවක් ඇහුවොත්, වීරවංශට 70යි. එතකොට නඩු අහයිද? මේක තමයි ඕනෑ වෙලා තිබෙන්නේ. ඒ වුවමනාව තමයි තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ මහත්මයා දැනුවත්ව හෝ නොදැනුවත්ව, කුමන්ත්‍රණකාරී ලෙස හෝ කුමන්ත්‍රණයකට හසු වෙමින් පය තිබ්බේ තමන් වටේ සිටින චූදිතයන්ගේ නඩු බේරා ගැනීම වෙනුවෙනුයි, ගරු කථානායකතුමනි. ඒකේ ප්‍රතිඵලය අපි දැක්කා. පසුගිය ජනාධිපතිවරණයේ දී අපේ රටේ අපරාධ පිළිබඳව විශාල ලෙස පරීක්ෂණ සිදු වෙමින් තිබුණා. ගරු කථානායකතුමනි, ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ පරීක්ෂණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දියත් කරමින් තිබුණා. ඒකේ එක පියවරක් එනවා, හමුදා නිලධාරියකු ළඟට. ඒ පියවර පැන්නාම ඊළඟ පියවර එන්නේ ගෝඨාභය ළඟට. මම ඒක සහතික කරනවා. හැබැයි, ඒ පියවර පනින්න දෙන්නේ නැහැ. ඊළඟට, තාජුඩීන්ගේ ඝාතනය පිළිබඳව ඩිෆෙන්ඩර් රථයක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ සුදු පාට ඩිෆෙන්ඩර් රථය අයිති වෙන කාටවත් නොවෙයි, රතුකුරුස සංවිධානයටයි. රතුකුරුස සංවිධානය විසින් ඒ ඩිෆෙන්ඩර් රථය ත්‍යාගයක් හැටියට "සිරිලිය සවිය" සංවිධානයේ ශිරන්ති රාජපක්ෂ වෙත භාර දෙන ඡායාරූප අපි ළඟ තිබෙනවා. අන්න ඒ ඩිෆෙන්ඩර් රථය තාජුඩීන්ගේ ඝාතනයට සම්බන්ධ වුණා කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොයා ගෙන තිබෙනවා. මේ ක්‍රියාවලිය ඉස්සරහට ගියොත් කාවද හසු වෙන්නේ? ශිරන්ති රාජපක්ෂව. ඒක මතක තබා ගන්න. නමුත්, අත්අඩංගුවට ගන්නේ නැහැ. මොකද, එදා කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා. කැබිනට් මණ්ඩලය කථා කරලා ගත්තු තීරණය මොකක්ද? ශිරන්ති රාජපක්ෂ මහත්මිය එදා රටේ පළමු කාන්තාව. ඒ නිසා "පළමු කාන්තාව අත්අඩංගුවට ගන්න හොඳ නැහැ" කියලා කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ, කැබිනට් මණ්ඩලය -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කැබිනට් එකේ කථා කළා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ජනාධිපති, -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි, හරි. ඔක්කෝම එකට කෑවේ.

දැන් කියන්න එන්න එපා. මා දන්නවා, කථාව. [ඝෝෂා කිරීම්] කැබිනට් මණ්ඩලයේ තීරණ ගත්තේ ඒ විධියටයි. ඒක මතක තබා ගන්න. අත් අඩංගුවට ගන්නේ නැහැය කියා තීරණයක් ගත්තා. චමල් රාජපක්ෂ මහත්මයා තමයි එතකොට කථානායකවරයා වශයෙන් සිටියේ. ගරු කථානායකතුමනි, FCID එකෙන් එන්න කිව්වා, කට්ටත්තරයක් ගන්න. [ඝෝෂා කිරීම්] කට්ටත්තරය ගන්න දවසේ තමයි ඉදිරිපත් කරන්න නියමිතව තිබුණේ. [ඝෝෂා කිරීම්] එදා තමයි ඉදිරිපත් කරන්න තිබුණේ. මහින්ද රාජපක්ෂ මහත්මයා කථා කළා, ඒ වෙලාවේ අගමැති වශයෙන් සිටි රනිල් වික්‍රමසිංහ මහත්මයාට. කථා කරලා ඇහුවා, "ශිරන්ති නෝනා FCID එකට එවන්න ඕනෑමද?" කියා. මොකක්ද කිව්වේ? "FCID එකට යවන්න එපා, නෝනා කියන තැනට මා FCID එක එවන්නම්" කියා කිව්වා. කථානායකතුමාගේ ගෙදරට එහෙමයි යැව්වේ. මේවා බේරා ගත්ත විධිය මතක තබා ගන්න.

ගරු කථානායකතුමනි, ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය පිළිබඳවත්, තාජුඩීන්ගේ ඝාතනය පිළිබඳවත්, ඒ වාගේම කීත් නොයාර්ට පහර දීම පිළිබඳවත්, නාමල් නමැති මාධ්‍යවේදියාට පහර දීම පිළිබඳවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ විශාල ප්‍රමාණයක් සිදු කරමින් තිබුණා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු කළේ දේශපාලන නායකත්වයෙන් අවශ්‍ය වන ආශීර්වාද ලබා ගනිමින් නොවෙයි. දේශපාලන නායකත්වය කටයුතු කළේ පරීක්ෂණවලට බාධා කරන්නයි; පරීක්ෂණ යට ගහන්නයි. හැබැයි ඒ වෙලාවේදීත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කෙළින් සිටියා.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා පොලිස් දෙපාර්තමේන්තුව තමන්ගේ අතට අරගෙන කරපු පළමුවන රාජකාරිය මොකක්ද? එතුමා කළ පළමුවන රාජකාරිය මොකක්ද කියා අපි දැන ගන්න කැමැතියි. මාරු කළ පළමුවන පොලිස් නිලධාරියා කවුද? මාරු කරන්න උත්සාහ කළ පළමුවන පොලිස් නිලධාරියා තමයි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහත්මයා. මේ පරීක්ෂණ සියල්ලම

[ගරු අනුර දිසානායක මහතා]

කරමින් සිටියේ ඔහුයි. ඒක මතක තබා ගන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පළමුවන රාජකාරිය තමයි, අපරාධ පිළිබඳ පරීක්ෂණ කරන ලද නිලධාරියා ඉවත් කිරීම. දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා හිටගෙන ඉන්නේ කාගේ පැත්තේද? 2015 ජනවාරි මාසයේ 08වන දා ඡන්දය ලැබුණේ ඝාතකයන්ට එරෙහිවයි. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

හිටගෙන ඉන්නේ ඝාතකයන්ගේ පැත්තේයි. මේ වුවමනාව වෙනුවෙන් තමයි මේ ආණ්ඩුව ඇටෙව්වේ. වෙන කිසි වුවමනාවක් මේ ආණ්ඩුවට තිබුණේ නැහැ. "අපරාදේ, දිගටම යන්න තිබුණා, අපට හොඳට ආණ්ඩුවක් ගන්න තිබුණා, මේකට කර ගැහුවේ ඇයි?" කියා එතුමාගේම කණ්ඩායම අපට කියනවා. ඒකයි මා මේ කියන්නේ. ඒ අපරාධවලින්, වංචාවලින්, දූෂණවලින් මිදීමේ වුවමනාව තිබුණා.

ගරු කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපති පුටුවේ වාඩි වුණා. එතුමා ජනාධිපති පුටුවේ වාඩිවෙලා, මුල් කාලයේදී -මෙතැන පක්ෂ නායකයන් ඉන්නවා.- විධායක සභාව රැස් වුණා. මමත් ඒ විධායක සභාව නියෝජනය කළා. 2015 අප්‍රේල් මාසයේ 10වන දා ජනාධිපති ලේකම් කාර්යාලයේදී විධායක සභාව රැස් වුණා. අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයාත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත්, රිසාඩ් බදියුදීන් මහත්මයා ඇතුළු පක්ෂ නායකයනුත් එයට සහභාගි වුණා. ඒ වෙලාවේ මා ජනාධිපතිවරයාගේ මුහුණට කිව්වා, "ඔබතුමා මෙතැනට ඇවිත් ඉන්නේ රජයේ වාහනයෙන්, රජයේ රියැදුරු සමඟ, රජයේ තෙල් ගහගෙනයි; අග්‍රාමාත්‍යවරයා මෙතැනට ඇවිත් ඉන්නේ, ආණ්ඩුවේ වාහනයෙන්, ආණ්ඩුවේ රියැදුරු සමඟ, ආණ්ඩුවෙන් තෙල් ගහගෙනයි; මා මෙතැනට ඇවිත් ඉන්නේ පක්ෂයේ වාහනයෙන්, පක්ෂයෙන් වියදම් කරගෙනයි, අපි කිසිවක් ගන්න නොවෙයි ආවේ" කියා. ජනවාරි මාසයේ 08වන දා ලැබුණු ජන වරමට අනුව කටයුතු කරන්න කියලා විනාඩි 20කට වඩා වැඩි කාලයක් තුළ මා එදා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ප්‍රකාශ කළා. "ඔබ ගමන් කරමින් සිටින්නේ ඉතාම වැරදි දිශාවකටයි" කියා මා එතුමාට කිව්වා. එහෙම කිව්වේ ඇතක නොවෙයි. 2015 අප්‍රේල් 10වන දායි; එතුමා පත් වෙලා වෙලා මාස දෙකහමාරකට පසුවයි. ඒ මාස දෙකහමාර ඇතුළත අපි එතුමාගේ ක්‍රියා කලාපය දැක්කා. ගරු කථානායකතුමනි, මේ පක්ෂ නායකයන් එයට සාක්ෂි දරයි. මා කනගාටුවට පත්වෙනවා, එදා මට එය record කර ගන්න බැරි වුණු එක ගැන. නැත්නම් මම එය record කර ගන්නවා, මෙය record කර ගන්න ඕනෑය කියා. ඒක මතක තබා ගන්න. එදා -අප්‍රේල් මාසයේ 10වන දා- මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මා කිව්වා; පෙන්වා දුන්නා, "ඔබ ගමන් කරමින් සිටිනේ මේ දිශාවටයි" කියා. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොකක්ද කළේ? අප්‍රේල් මාසයේ 10වන දායින් පසුව විධායක සභාවක් කැඳවුයේ නැහැ. ඔව්වරයි කළේ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මේ ගමන් මගේ දිගින්-දිගටම, පියවරෙන්-පියවර ගමන් කරමින් තිබුණේ අන් කවර දිශාවකටවත් නොවෙයි. ඒ පුටුවේ නැවත වාඩි වීමේ අභිලාෂය තමන් තුළ තිබුණා. දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ?

ගරු කථානායකතුමනි, එතුමන්ලා අටවා ගන්නා ලද මේ ජාතික ආණ්ඩුව දිහා බලන්න. මේකට ජාතික ආණ්ඩුව කියලා කියන්නේ කවුද? ලෝකයේ ජාතික ආණ්ඩු හැදිලා තිබෙනවා නේ. ඒ ජාතික ආණ්ඩුවලට ජාතික න්‍යාය පත්‍රයක් තිබෙනවා. 2015 සැප්තැම්බර් මාසයේ 02වන දා අටවා ගන්නා ලද මෙම ජාතික ආණ්ඩුවේ ජාතික න්‍යාය පත්‍රය මොකක්ද කියා මා අහන්න කැමැතියි; එය දැන ගන්න කැමැතියි. "මේ අවුරුද්දට මේ වැඩ ටික කරනවා, මේ අවුරුද්දට මේ වැඩ ටික කරනවා" කියා එහෙම ජාතික න්‍යාය පත්‍රයක් එම ජාතික ආණ්ඩුවට තිබුණාද? කිසි ජාතික න්‍යාය පත්‍රයක් තිබුණේ නැහැ. තිබුණු එකම ජාතික න්‍යාය පත්‍රය තමයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ඉන්න පුළුවන් වන්නේ අමාත්‍යවරුන් 30දෙනකුට පමණක් වුණත්, ඒ සංඛ්‍යාව 48දෙනකු දක්වා වැඩි කර ගත් එක. දෙගොල්ලන්ටම තිබුණු ජාතික වුවමනාව තමයි, අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කර ගන්න එක. ඒ අමාත්‍ය ධුර සංඛ්‍යාව 48 දක්වා වැඩි කර ගත්තා. එම නිසා මේ ජාතික ආණ්ඩුව කියන අට මහලය අටවා ගත්තේ රට වෙනුවෙන් නොවෙයි. එය හදා ගත්තේ තමන්ගේ පංගු පේරුව බෙරා ගන්නයි; තමන්ගේ බලය, පංගුව බෙරා ගන්නයි; මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට තමන්ගේ කැබිනට් මණ්ඩලයේ බල පංගුව බෙරා ගන්නයි; රනිල් වික්‍රමසිංහ මහත්මයාට පාර්ලිමේන්තුවේ තමන්ගේ බල පංගුව බෙරා ගන්නයි. බල පංගුවේ පොරයක් විතරයි, මේ ජාතික ආණ්ඩුව. "මේ අවුරුදු 5ට අපි ජාතික ආණ්ඩුවක් හදනවා, මේ අවුරුදු 5 තුළ අපි මේ වැඩ ටික කරනවා" කියා ජාතික ආණ්ඩුවකට ජාතික න්‍යාය පත්‍රයක් තිබෙන්න ඕනෑ, එහෙම න්‍යාය පත්‍රයක් තිබුණාද? එහෙම ඒවාට තමයි, "ජාතික ආණ්ඩු" කියලා කියන්නේ. මේවා ජාතික ආණ්ඩු නොවෙයි; අවජාතක ආණ්ඩුයි. මේවාට ජාතික ආණ්ඩු කියලා කියන්නේ කවුද? ගරු කථානායකතුමනි, බල පොරය එතැනින් දියත් වුණා. බල පොරයේ කෙළවර බවට පත්වෙලා තිබුණේ අන් කවරක්වත් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ජනාධිපති පුටුවේ නැවත වාඩි වීමේ වුවමනාව තිබුණා. ගරු කථානායකතුමනි, මේ නොපෑහෙන මඟුල -නොපෑහෙන විවාහය- සිද්ධ වෙන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

වංචා, දූෂණ, අපරාධ වසා ගැනීමේ වුවමනාවත්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ නැවත සිහසුනේ විරාජමාන වීමේ වුවමනාවත් නිසායි.

මේ වුවමනාව විතරයි, මේ එකතුවට බලපා තිබෙන්නේ. වෙන මොනවාද තිබෙන වුවමනා? ඊට අමතරව මොනවාද තිබෙන්නේ? ජන වරමට එකඟද? මහින්ද මහත්මයාට ඡන්ද ලක්ෂ 58ක් ලැබුණේ, මෛත්‍රීපාල මහත්මයාට එරෙහිවයි. මෛත්‍රීපාල මහත්මයාට ඡන්ද ලක්ෂ 62ක් ලැබුණේ මහින්ද මහත්මයාට එරෙහිවයි. එහෙම නම්, එක්කෝටි විසිලක්ෂයක්ම මේ එකතුවට විරුද්ධයි. මේක ජන වරමට පටහැනියි; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි; නීතිවලට පටහැනියි; සදාචාරයට පටහැනියි. මේ දෙන්නා අතර තිබෙන බැඳීම මොකක්ද? මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඡන්දයෙන් පසුව අවස්ථා ගණනාවකදී කිව්වා, "ජනවාරි මාසයේ 8වන දින ඡන්ද ප්‍රතිඵල ඇහුවේ හැංගිලා" කියා. කොහේද? "දොඩම්ගස්ලන්දේ පොල් වත්තක හැංගිලායි ඡන්ද ප්‍රතිඵල ඇහුවේ" කියා එතුමා කිව්වා. ගරු කථානායකතුමනි, ලෝක ඉතිහාසයේ ජනාධිපතිවරයෙක් පොල් වත්තක හැංගිලා ඡන්ද ප්‍රතිඵල ඇහුවා නම්, ඒ මෛත්‍රීපාල සිරිසේන මහත්මයායි. ඒ, කාට භයේද? බස්සන්ට භයේද? භූතයන්ට භයේද? එතුමා පොල් වත්තේ හැංගුණේ මොකටද? මහින්දට භයේයි. ඒක තේරුම් ගන්න ඕනෑ. ඇයි? මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කළා නම් එතුමා ඝාතනය වන බවත්, එතුමාගේ දරුවන් ඝාතනය වන බවත්, එතුමාගේ බිරින්දෑව ඝාතනය කරන බවත්, මේ පොළොවේ අඩි හයක් වැළලෙන බවත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අවස්ථා ගණනාවකදී කිව්වා. මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කළා නම් එතුමාත්, එතුමාගේ බිරිඳත්, එතුමාගේ දරුවොත් වැළලෙන්නේ මොකක් නිසාද? අකුණු ගහලාද?

ගංවතුරට අහු වෙලාද? නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා ඝාතනය කරනවා කියායි කියන්නේ. ඒක තේරුම් ගන්න ඕනෑ. එහෙම නම් ඝාතනයට භාජන වන්නේ මෛත්‍රීපාල මහත්මයායි. එතුමාගේ වචනවලින් ගත්තොත්, ඝාතකයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මේ මගේ නොවෙයි, එතුමාගේම වචන. එතකොට මේ ඝාතකයායි, ඝාතනය වෙන්න ඉන්න කෙනායි එකතු වෙන්නේ කොහොමද? අපට ඒ සූත්‍රය කියා දෙන්න. ජන වරමට පටහැනි නම්, මේ එකතු වීමේ සූත්‍රය මොකක්ද, ගරු කථානායකතුමනි?

අපි දේශපාලන වේදිකාවේ ඕනෑ තරම් කථා කර තිබෙනවා. හැබැයි, අපි කිසි කෙනෙකුට ඔහුගේ නමේ උච්චාරණය උපයෝගි කර ගන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සතුව තිබෙන්නේ ග්‍රාමීය නමක් නම්, අපි ඔහුගේ නමට අගෞරව කර නැහැ; ඔහුගේ හැසිරීමට අගෞරව කර නැහැ. අපි දන්නවා, අපේ රටේ ප්‍රාදේශීය භාෂා තිබෙන බව. එකිනෙකා තමන්ට අවශ්‍ය පරිදි වචන උච්චාරණය කරනවා. හැබැයි, රාජපක්ෂ කඳවුර මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ප්‍රහාර එල්ල කිරීමට උපයෝගි කර ගත්තේ මොනවාද, ගරු කථානායකතුමනි? "හිටං", "හුටං", "පඹයා" වැනි වචනයි. මොනවාද මේ කියන්නේ? දේශපාලනයෙන් ගත හැකි අවලාදම පන්නයේ දේශපාලනයක් තමයි මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට එරෙහිව අනෙක් කඳවුරේ තිබුණේ. එම කඳවුරත් එක්ක මෛත්‍රීපාල සිරිසේන මහත්මයා යළි විවාහ වෙන සූත්‍රය කුමක්ද? ඒ කාරණයයි අපට දැන ගන්න ඕනෑකම තිබෙන්නේ. එම නිසා ලංකාවේ දේශපාලන ඉතිහාසයේ අද අශිෂ්ටත්වයේ ඔටුනු පළඳාගෙන ඉන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මෙවැනි අශිෂ්ට තැනකට අපේ රටේ දේශපාලනය ගමන් කර තිබෙනවා. එම නිසා මේ ගමනේ වුවමනාව අන් කවරක්වත් නොවෙයි. මේ වුවමනාවේ අදිටන වන්නේ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට නැවත ජනාධිපති පුටුවේ වාඩි වෙන්නත්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

වංචා සහ දූෂණ වළක්වා ගැනීමත් තමයි. එම නිසා, දෙදෙනෙකුගේ පෞද්ගලික වුවමනා වෙනුවෙන් මේ රට විනාශ කළ යුතුද? විනාශ කිරීමට ඉඩ දිය යුතුද? ඉඩ දිය යුතු නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ ප්‍රතිරූපයට වෙලා තිබෙන හානිය බලන්න. බටහිර රාජ්‍යයන්ට, ලෝකය පුරා තිබෙන වෙනත් රාජ්‍යයන්ට තමන්ගේ ආර්ථික, දේශපාලන න්‍යාය පත්‍ර තිබෙන බව අපි පිළිගන්නවා. ඒවා පිළිබඳව හොඳ අවබෝධයක් අපට තිබෙනවා. ඒ වාගේම ලෝකය වෙළෙඳ පොළෙන් ගැට ගැසී තිබෙන බව, රාජ්‍ය තාන්ත්‍රික බැඳීම්වලින් ගැට ගැසී තිබෙන බව, විවිධ ජාත්‍යන්තර සංවිධානවලට ගැට ගැසී තිබෙන බව අපි පිළිගත යුතුව තිබෙනවා. මේ යුගයේ ලෝකයේ කිසිදු රටකට තනි ලෙස; හුදෙකලා ලෙස ජීවත් වෙන්න පුළුවන් කියා කල්පනා කරනවා නම් ඔහුගේ මොළය පරීක්ෂා කර ගත යුතුව තිබෙනවා. එම නිසා ලෝකය හමුවේ ඉතාම නිර්භය, අභිමානවත් ජාතියක් ලෙස පෙනී සිටින්න පුළුවන්කම තිබෙන්නේ කෙසේද? ඒ, අපි අභිමානවත් ලෙස අපේ රට පාලනය කිරීමට සමත් නම් විතරයි. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, මානව හිමිකම් මූලධර්ම, ජනතාවගේ වුවමනා, කුමන්ත්‍රණකාරී නොවන දේශපාලනය, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැනි දේ තුළින් තමයි රට ලෝකය හමුවේ ප්‍රතිරූපය හදන්නේ. මතක තබා ගන්න. හැබැයි, මේ ප්‍රතිරූපය අද මුළුමනින්ම විනාශයට භාජන කොට තිබෙනවා. දෙදෙනෙකුගේ තක්කඩි වුවමනාවට ලෝකය ඉදිරියේ අපේ රට මේ තරම් හැල්ලුවට භාජන විය යුතුද? මේ රටේ ජීවත් වෙන්නේ රාජපක්ෂයි, මෛත්‍රීපාලයි විතරක් නම් අපි අහක බලාගෙන ඉන්නම්. හැබැයි, මේ රටේ අපිත් ජීවත් වෙනවා නේ. අපේ උපන්, නූපන් දරු පරම්පරාවක් අනාගතයේදී මේ රටේ ජීවත් වෙනවා. එම නිසා ලෝකය හමුවේ අපේ රට, "අභිමානවත් රාජ්‍යයක්" කියන කොඩිය ඔසවා තැබීමේ වගකීම අපට තිබෙනවා. තමන්ගේ පෞද්ගලික වුවමනාව මත ඒ කොඩිය උඩ ජරා කරන්න මෛත්‍රීපාලටයි, රාජපක්ෂටයි පුළුවන්කම ලැබුණාට, ලෝකය ඉදිරියේ අභිමානවත් ජාතියක් ලෙස අපට ඇතිවී තිබෙන ප්‍රතිරූපය බිඳ වටිටන්න ඉඩ කඩ ලබා නොදෙන බවට අපි මේ රටේ ජනතාවට සහතික වෙනවා, ගරු කථානායකතුමනි.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මේ ප්‍රශ්නය අපි බරෙන් ගන්න ඕනෑ. කුමන්ත්‍රණකාරී ලෙස ආණ්ඩු හදනවා නම් ඡන්ද මොකටද? ජනවාරි මස 5වන දින ඡන්දයක් පවත්වනවාය කියා එතුමාම ප්‍රකාශයට පත් කර තිබෙනවා. දැන් නම් ඒක කරන්න ලැබෙන්නේ නැහැ. නමුත්, ජනවාරි මාසයේ පස්වන දින ඡන්දයක් පවත්වලා, හයවන දින ආණ්ඩුවක් හදනවා නම්, ජනතාව තීන්දු කරනවා, "බහුතරය තිබෙන කණ්ඩායම ආණ්ඩුව හැදිය යුතුයි" කියා. මෛත්‍රීපාල මහත්මයාට හිතෙනවා, ඒ කණ්ඩායම මට අල්ලන්නේ නැහැ, මම වෙන කණ්ඩායමක් එක්ක ආණ්ඩුව හදනවාය කියා. එතකොට ඡන්දවලින් ඇති ඵලය මොකක්ද? මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති පුටුවේ වාඩි වීම නිසා අමන්දානන්දයට පත් වී සිටින අයගෙනුයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු කථානායකතුමනි, අපට දේශපාලන ප්‍රතිපත්ති තිබෙන්න පුළුවන්. දේශපාලන ව්‍යාපාර අනුව, බලය ලබා ගැනීමේ වුවමනාවන් අපි හැමදෙනාටම තිබෙන්න පුළුවන්. හැබැයි, අපි බලය ලබා ගත යුත්තේ කවර ආකාරයෙන්ද? කවර මූලධර්ම මත පදනම්වද? ගරු කථානායකතුමනි, මේ මූලධර්මය මත පදනම්ව රාජපක්ෂ මහත්මයා බලය ගත්තොත් මොකද වන්නේ? ජනවාරි මාසයේ 5වන දා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඡන්දය පැවැත්වුවා නම්, 6වන දා හැදෙන ආණ්ඩුවේදිත් එතුමාට කියන්න පුළුවන්, "බහුතරය පාර්ලිමේන්තුවේ නිටියාට මට වැඩක් නැහැ, මගේ ඔළුවේ ඇදිලා තිබෙන චිත්‍රය මෙතුමා, එතුමා තමයි අගමැති" කියලා. මේ සෙල්ලම අපි අනුමත කරන්න ඕනෑද? මේ සෙල්ලම මේ රටේ ජනතාව අනුමත කළ යුතුද? ඒ නිසා පසුගිය ඔක්තෝබර් 26වන දා ලබා දී තිබෙන මෙම තීරණය ආපසු හැරෙව්වේ නැත්නම්, තවදුරටත් අපේ රටේ පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීමෙන් ඵලක් වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඡන්ද මොකටද? එහෙම නම් කරන්න තිබෙන්නේ මේකයි. හඳ පායන දවසට මේසය ළඟට ඇවිත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට තීන්දුවක් ගන්න පුළුවන්, "අගමැති කවුද" කියා. එහෙම පත් කරලා දමන්න. ඡන්දවලින් පත්වන ආණ්ඩු පිළිගන්නේ නැත්නම්, මෛත්‍රීපාල මහත්මයා මේ රටේ මැතිවරණ පවත්වන්නේ මොකටද? අපි අහන්නේ එච්චරයි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ මේ තීරණය ගන්න ඉඩ දුන්නොත්, ජනාධිපතිවරයාට ඕනෑම වෙලාවක පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන්; ජනවාරි 5වන දා ආණ්ඩුව හදලා, 6වන දා නැවත පාර්ලිමේන්තුව විසුරුවා හරින්න

[ගරු අනුර දිසානායක මහතා]

පුළුවන්. ඒ බලයත් දෙන්න ඕනෑද? ගරු කථානායකතුමනි, ඒ නිසා අපි තරග වදින්නේ මේ කුමන්ත්‍රණයේ තිබෙන වැදගත්ම කරුණු දෙකක් වෙනුවෙනුයි. ඒ, තමන්ගේ හිතලු අනුව ආණ්ඩු හදන්න බැහැ කියන එක සහ තමන්ගේ හිතලු අනුව පාර්ලිමේන්තුව විසුරුවා හරින්න බැහැ කියන කාරණා දෙකයි. මේ කරුණු දෙක මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ අයිතියක්; ජනාධිපතිවරයාගේ අයිතියක් ලෙස පිළිගත්තොත්, තවදුරටත් මේ රටේ පාර්ලිමේන්තු ඡන්ද පැවැත්වීම වැඩක් නැහැ; පාර්ලිමේන්තුව වැඩක් නැහැ. එහෙම නම් ජනාධිපතිවරයාට කරන්න තිබෙන්නේ, තුණ්ඩු ඇදලා පාර්ලිමේන්තුවක් හදා ගන්නයි; තුණ්ඩු ඇදලා ආණ්ඩුවක් හදා ගන්නයි. අපි පෙනී සිටින්නේ, අද මේ මූලධර්ම දෙක උල්ලංඝනය කර තිබෙන නිසායි. මේ මූලධර්ම දෙක උල්ලංඝනය කිරීම රාජපක්ෂ මහත්මයාට මේ වෙලාවේ සතුට දනවනවා වෙන්න පුළුවන්. හැබැයි, රාජපක්ෂ මහත්මයා මේ කාරණය තේරුම් ගත යුතුව තිබෙනවා. මේ මොහොතේ අමන්දානන්දයට පත් වුණාට, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දියත් කර තිබෙන කඩුව අවසානයේදී ඔබට එසවෙන්නේ නැති එක ගැන තිබෙන සහතිකය මොකක්ද? මේ රටේ පුරවැසියන්ට එසවෙන්නේ නැහැය කියන්න තිබෙන සහතිකය මොකක්ද? එම නිසා ගරු කථානායකතුමනි, ව්‍යවස්ථා විරෝධීව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත්, ව්‍යවස්ථාවට පටහැනිව ආණ්ඩුව ගොඩනැඟීමත් කියන මේ කුමන්ත්‍රණයේ තිබෙන හරයාත්මක කරුණු දෙක මේ රටේ ජනතාව ප්‍රතික්ෂේප කළ යුතුයි; පාර්ලිමේන්තුවෙන් ප්‍රතික්ෂේප කළ යුතුයි; අධිකරණ පද්ධතියෙන් ප්‍රතික්ෂේප කළ යුතුයි; ඒවා නැවත ආදර්ශ බවට පත්වීමට ඉඩකඩ ලබා නොදිය යුතුයි. මේක අපේ රටේ දැවැන්ත ලේ වැගිරීමකට අවශ්‍ය වටපිටාවක් නිර්මාණය කරනවා. මේ විධියට ආණ්ඩු පැහැර ගැනීමක් සිදු වුණොත් මොකද වන්නේ? අද එක්සත් ජාතික පක්ෂයට ඒකට එරෙහිව ශක්තිමත් ප්‍රතිවිරෝධයක් දක්වන්න බැහැ. ඒ, ඔවුන් ජනතාවගෙන් ඈත් වෙලා සිටි නිසායි. ජනතාවත් එක්ක සිටි ආණ්ඩුවක් නම් අද පාර්ලිමේන්තුවේ නොවෙයි මේ කට්ටිය ඉන්න ඕනෑ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ගේ වටේයි. ඒකයි ඇත්ත. මතක තබා ගන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ஒருவர்)
(An Hon. Member)
අපි යනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
යනවා නම් හොඳයි. හැබැයි, ප්‍රමාදයි. අන්න ඒක මතක තබා ගන්න.

අපි කියන්නේ මෙයයි. ජනතාවගේ ආණ්ඩු මෙලෙස කුමන්ත්‍රණකාරී ලෙස වට්ටනවා නම්, ලෝකයේ ඇති වෙන්නේ ලේ වැගිරීම්. ඒ නිසා මේ ආදර්ශය අපේ රටේ නීතිය බවට පත් වෙන්න ඉඩකඩ ලබා නොදිය යුතුයි. මේ ආදර්ශය අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වලංගුතාවට අත්පත් කිරීමට ඉඩකඩ ලබා නොදිය යුතුයි. ගරු කථානායකතුමනි, ඒ වෙනුවෙන් අපට ගත හැකි හැම ක්‍රියා මාර්ගයක්ම අපි ගන්නවා. මේ පාර්ලිමේන්තුවට දැන් සුජාතභාවයක් නැහැ. 2015 අගෝස්තු මාසයේ 17වන දා පවත්වන ලද මැතිවරණයෙන් තෝරා ගන්නා ලද පාර්ලිමේන්තුවේ සංයුතිය අද නැහැ; ඒ ජන වරමේ පිළිබිඹුව අද මේ පාර්ලිමේන්තුවේ නැහැ.

දැන් මේ පාර්ලිමේන්තුව විකෘතියක්. එහෙට මෙහෙට පැනපු විකෘතියක්. එම නිසා පාර්ලිමේන්තුවේ කවුරු 113 හදාගත්තත් ගරු කථානායකතුමනි, ඉස්සරහට ආණ්ඩු කරන්න යුක්ති සහගත අයිතියක් නැහැ. ඒකත් තේරුම් ගන්නට ඕනෑ. එහෙන් සල්ලිවලට අරගෙන, මෙහෙන් සල්ලිවලට අරගෙන, මෙහෙන් පනිනවාට සල්ලි දිලා පනින එක වළක්වා ගෙන, එහෙන් පනිනවාට සල්ලි දිලා වටලාගෙන, මුදල්වලින් 113 හදාගත්තු- 2015 අගෝස්තු මාසයේ ජනවරම පිළිබිඹු වන පාර්ලිමේන්තුවක්. ඒ පාර්ලිමේන්තුවේ කවුරු ආණ්ඩු අටවා ගත්තත් ආණ්ඩු කරන්න අයිතියක් නැහැ. ඒකත් තේරුම් ගන්න ඕනෑ. 113 එහෙන් මෙහෙන් අටවා ගත්තා. දැන් තමයි අපි ආණ්ඩු කරන්නේ කියා අයිතියක් නැහැ. එම නිසා ගරු කථානායකතුමනි, කුමන්ත්‍රණය පරාජයට පත් කිරීමෙන් පසුව අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයකට යා යුතුව තිබෙනවා. ජනතාව හමුවට ගිහිල්ලා නව පාර්ලිමේන්තුවක් පත් කර ගනිමු. ඒකෙන් අපට ලැබෙන පංගුව කුමක්ද ඒ පංගුවේ ප්‍රමාණය කුමක්ද කියන එක අපට වැදගත් නැහැ. හැබැයි, වැදගත් දේ මේකයි. ජනතාවගේ ජනවරම විකෘති වෙච්ච පාර්ලිමේන්තුවකට ආණ්ඩු කරන්නට අයිතියක් නැහැ. ඒ පාර්ශ්වයෙන් ආණ්ඩු කරන්න ගත්තත් මේ පාර්ශ්වයෙන් ආණ්ඩු කරන්න ගත්තත් ආණ්ඩු කරන්න අයිතියක් නැහැ. ආණ්ඩු කරන්න නම් තිබෙන එකම දෙය අලුත් ජනවරමක් ජනතාව ළඟට ගිහින් ගන්න ඕනෑ. එම නිසා ගරු කථානායකතුමනි, මේ කුමන්ත්‍රණයෙන් පසුව ජනතා විමුක්ති පෙරමුණේ අපි යෝජනාවක් ගෙන එන්නට නියමිතව තිබෙනවා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ යෝජනාව. විකෘති පාර්ලිමේන්තුවක් ඉස්සරහට ගෙන යනවා වෙනුවට නැවත ජනතාව ළඟට ගිහින් ජනවරමක් අපි පතමු. නව පාර්ලිමේන්තුවක් හදා ගනිමු. නව ආණ්ඩුවකට අවශ්‍ය දොර විවෘත කරමු. පළමුකොටම මේ කුමන්ත්‍රණය පරාජයට පත් කරමු. ඒ වෙනුවෙන් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි අපේ තීන්දු තීරණ ගන්නා බව ප්‍රකාශයට පත් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු මංගල සමරවීර මැතිතුමා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි] මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කථානායකතුමා තේරීම් කාරක සභාවට සාමාජිකයන් පත් කිරීම පිළිබඳව ඡන්දය තිබ්බායින් පස්සේ එතුමා ප්‍රකාශ කළා සභාව කල්තැබීමේ

යෝජනාව ගෙනෙනවා, සභාව නැවත කැඳවන්නේ නොවැම්බර් 27 වැනිදා ය කියා. අපි දන්නවා, ජාතික රූපවාහිනියත්, Channel Eye නාළිකාවත්, ස්වාධීන රූපවාහිනියත් -ITN එකත් - මහජනතාවගේ බදු මුදලින් නඩත්තු වන ආයතන තුනක් බව. මේ අය මේ රටේ ජනතාව වැරදි පාරක ගෙන ගිහින් "අද පාර්ලිමේන්තුව කල් තිබ්බා. නැවත රැස්වෙන්නේ 27 වැනිදා ය." කියා. පාර්ලිමේන්තුවේ සිට සජීව පෙන්නන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මාධ්‍ය හමුව. හැබැයි, ඒ නාලිකාවල මාධ්‍යවේදීන් ගැලරියේ ඉඳගෙන මේ කල්තැබීමේ විවාදය ආවරණය කරනවා. එම නිසා මේක එක පැත්තකින් මහජනතාවගේ බදු මුදල් මේ සභාපතිවරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය අත්තනෝමතික ලෙස පාවිච්චි කිරීමක්. ඒ එක්කම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ වරප්‍රසාද කඩ වීමක්. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සභාපතිලා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මේකට අණ දුන්, මේ වැරදි මාර්ගය පෙන් වූ ඒ නිලධාරීන්ව වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට කැඳවා දඬුවම් දෙන්නය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්. මීළඟට,ගරු මංගල සමරවීර මැතිතුමා.

[අ.භා. 12.12]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමා අද උදේ ඊනියා රජයේ විරෝධතාවය නොතකා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

සභානායකවරයාගේ විරෝධය නොතකා අපගේ බහුතරය නමින්ම පාර්ලිමේන්තුව තුළ පෙන්වන්නට අවස්ථාවක් ලබා දුන්නා. අපිට 122ක් තිබෙනවාය කියා අපි දිගින් දිගටම කිව්වා. අපි අද 121ක් පෙන්නුවා. අනෙක් එක්කෙනා අපට කියා නීත්‍යානුකූලව ආවේ නැහැ. එම නිසා මම විශ්වාස කරනවා, දැන්වත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නීත්‍යානුකූල රජයක් මේ රට තුළ පත් කරන්නට අද දවසේම කටයුතු කරාවිය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

සභානායකතුමා ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. දිනේෂ් ගුණවර්ධන ඊනියා සභානායකතුමා දැක්කාම මට හරියට කනගාටු හිතෙනවා. මොකද, එතුමාගේ පියා - පිලිප් ගුණවර්ධන මැතිතුමා-කියන්නේ මේ රටේ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක්. ඒ වාගේම එතුමා පැවත එන්නේ ඉතාමත්ම ශ්‍රේෂ්ඨ දේශපාලන පවුලකින්. ඉන්දික ගුණවර්ධන, ප්‍රසන්න ගුණවර්ධන, රොබට් ගුණවර්ධන වැනි අය මගේත් පෞද්ගලික මිත්‍රයන්. බොරලුගොඩ සිංහයා නමින් තමයි තාත්තාව හැඳින්වුයේ. නමුත් දිනේෂ් ගුණවර්ධන අද දිගින් දිගටම පාර්ලිමේන්තුවේ හැසිරෙන ආකාරය දැක්කාම මට මතක් වෙන්නේ බොරලුගොඩ සිංහයෙක් නොවෙයි. බොරලුගොඩ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපගේ රජයේ 2019 වර්ෂයේ අය වැය ඉදිරිපත් කරන්නට නියමිතව තිබුණේ නොවැම්බර් මාසයේ 5 වැනිදා. ඒ දිනයට දින නවයක් -පසුගිය 26 වැනිදා- තිබියදී ක්‍රියාත්මක වුණු සිරිසේන-රාජපක්ෂ කුමන්ත්‍රණය හේතුකොටගෙන අද මුළු රටම මහා ආර්ථික අර්බුදයක අබියසට පැමිණ තිබෙනවා.

එක පුද්ගලයකුගේ කුහකකම නිසා, එක පුද්ගලයකුගේ හීනමානය නිසා අද මිලියන 22කට ආසන්න ජනතාවකගේ අනාගතය ඉතාමත්ම අවිනිශ්චිත භාවයකට පත් වෙලා තිබෙනවා. අපේ මුළු ආර්ථිකයම පසුගිය සති තුන තුළ ඉතාමත්ම භයානක අර්බුදයකට තල්ලු වෙලා තිබෙනවා. දැන් ඩොලරය රුපියල් 180.86 දක්වා වැඩි වෙලා ලු. පසුගිය මාසයේ මමත්, අපේ මුදල් අමාත්‍යාංශයත්, අපේ අගමැතිතුමාත් ඇතුළු අපේ රජය එකතු වෙලා ඩොලරය රුපියල් 173ට ස්ථාවර කරගෙන තිබෙනකොටත් බන්දුල ගුණවර්ධනලා කිව්වා, "අපට දුන්නොත් අපි දන්නවා මේක අඩු කරන්න." කියා. නමුත්, දැන් ඩොලරය රුපියල් 180ටත් වඩා ඉහළ ගිහිල්ලා. එහෙම කියපු අය දැන් කියනවා, "ඩොලරය රුපියල් 200ට ගියත් අපට කරන්න දෙයක් නැහැ." කියා. මේක නොවෙයි ප්‍රශ්නය. මේ අර්බුදයේ ප්‍රධාන සුලමුල එය නොවෙයි. ගරු කථානායකතුමා කියපු ආකාරයට, අනුර දිසානායක මැතිතුමා කියපු ආකාරයට, අද මේ රටේ නීත්‍යානුකූල රජයක් නැහැ; නීත්‍යානුකූල අගමැතිවරයෙක් නැහැ; නීත්‍යානුකූල මුදල් ඇමතිවරයෙක් නැහැ; ඇමති මණ්ඩලයක් නැහැ. විශේෂයෙන්ම 48. (2) ව්‍යවස්ථාව යටතේ දැනට පවතින රජය හා එම අගමැතිවරයා පිළිනොගන්නා බව කථානායක ප්‍රකාශ කරලා, මේ වනකොට ඒ හැන්සාඩ් වාර්තාවත් නිකුත් වෙලා තිබෙනවා. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැන තමයි ලොකු අර්බුදය පටන් ගන්නේ. මොකද, 148 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියනවා, "රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් සම්පූර්ණ පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට" කියා. As per Article 148 of the Constitution, “Parliament shall have full control over public finance.” But in the absence of a legitimate government, a grave situation has now arisen as there is no legal way to meet public expenditure and obligations of the State from 2019.

මේ තත්ත්වය යටතේ 2019 ජනවාරි මාසයේ 01වැනි දා ඉඳලා නීත්‍යානුකූලව මේ රටේ කවදාවත් නොදුටු අර්බුදයකට අපි තල්ලු වෙනවා. මොකද, මේ අවුරුද්ද -2018 වර්ෂය- සඳහා පසුගිය අය වැයෙන් පස්සේ මම මුදල් ඇමතිවරයා හැටියට වරෙන්තු අත්සන් කර දෙසැම්බර් මාසයේ 31වැනි දා දක්වා අවශ්‍ය මුදල් වෙන් කර තිබෙනවා. නමුත්, 31වැනි දායින් පස්සේ වෙන් කරන්න පුළුවන් වන්නේ නීත්‍යානුකූල අය වැයක් තිබුණොත්, නීත්‍යානුකූලව අතුරු සම්මත ගිණුමක් තිබුණොත්. පසුගිය දා අපි දැක්කා අතුරු සම්මත ගිණුමක් Cabinet එකෙන් pass කර ගත්තා කියා බන්දුල ගුණවර්ධන මහත්මයා කියනවා. හොර Cabinet එකෙන් පත් කර ගත්තත් ගරු මන්ත්‍රීවරුනි, අද ඔබතුමන්ලාට පෙනෙනවා පාර්ලිමේන්තුවේදී අතුරු සම්මත ගිණුමක් pass කර ගන්න වෙන්නේ නැහැ. මොකද, බහුතරය ඉන්නේ විරුද්ධ පාර්ශ්වය පැත්තේ; බහුතරය තිබෙන්නේ විරුද්ධ පාර්ශ්වය පැත්තේ. එතකොට මොකක්ද වෙන්නේ? අතුරු සම්මත ගිණුම pass නොවෙනවා කියන්නේ, ජනවාරි මාසයේ 01වැනි දා ඉඳලා රජයේ සේවකයින්ට පඩි ගෙවන්න බැහැ, විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප්

[ගරු මංගල සමරවීර මහතා]

ගෙවන්න බැහැ, සමෘද්ධිලාභීන්ගේ දීමනා ගෙවන්න බැහැ, පොහොර සහනාධාරය දෙන්න බැහැ, ළමයින්ගේ පාසල් uniform එක දෙන්න බැහැ. මේ විධියට විශාල අර්බුදයකට මුළු රටම තල්ලු වෙනවා. ඒ විතරක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150. (3) ව්‍යවස්ථාවේ තිබෙනවා, ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීමේදී ජනාධිපතිවරයාට මැදිහත් වෙන්න පුළුවන් ආකාරයත්. 150. (3) ව්‍යවස්ථාවේ පැහැදිලිවම කියනවා, අතුරු සම්මත ගිණුමක් pass නොකර ජනාධිපතිවරයාට මැදිහත් වෙන්න පුළුවන් වෙන්නේ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වලා ඒ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පස්සේ පාර්ලිමේන්තුව රැස්වෙන පළමුවැනි දවසේ ඉඳලා මාස තුනක් ඉකුත් වන තෙක්ය කියා.

දැන් ඒකත් වලංගු නැහැ. නමුත්, ජනවාරි 17 වැනි දා ජනාධිපතිතුමාගේ අර හොර ගැසට් නිවේදනය අනුව ක්‍රියාත්මක වුණා නම්, 17 වෙනි දා සිට තමයි මේ රටට මාස 3කට සල්ලි වෙන් කරන්න එතුමාට පුළුවන් වන්නේ. ඒ කියන්නේ ජනවාරි මාසයේ 01 වැනි දා ඉඳලා ජනවාරි මාසයේ 17 වැනි දා වන තෙක් විශාල හිඳැසක් -vacuum එකක්- තිබෙනවා, කිසිම කෙනෙකුට සල්ලි වෙන් කරන්න බැහැ. අද තිබෙන තත්ත්වය අනුව මේක ජනවාරි මාසයේ 17 වැනි දා වෙන්නේත් නැහැ. උසාවියෙන් ලැබෙන නියෝගය අනුව ඒ දිනය තීන්දු වේවි. එහෙම නැත්නම් පාර්ලිමේන්තුව හැටියට අපට ඒ දිනය ඉන් පසුව තීන්දු කරන්න පුළුවන්. ඒ අනුව මහ මැතිවරණය කවදාද, ජනාධිපතිවරණය කවදාද, ඒ දෙකම එකට තබනවාද කියන තීන්දුව අපට ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එපමණක් නොවෙයි. A legitimate Government with an adequate majority in Parliament would have had the opportunity to present at least a Vote on Account, which should have covered at least the first three months of the new year enabling payments of pension, salaries, Samurdhi payments and settlement of debts. It is still not too late to reestablish the Government that commands the clear majority in Parliament to present a Budget or a Vote on Account to authorize expenditure from the Consolidated Fund for 2019.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම ජනාධිපතිවරයාට කියනවා, මේ රටේ ජනතාවගෙන් පළි ගන්න එපාය කියලා. එතුමාට අපේ අගමැතිතුමා ගැන තිබෙන හීනමානය නිසා, එතුමාගේ ඔළුවේ තිබෙන මදිපුංචිකම් නිසා මුළු රටක්ම පාවා දෙන්න එපාය කියලා මම කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වා වාගේ අද හෙටම නීත්‍යානුකූලව ආණ්ඩුව පත් කරන්න; නීත්‍යානුකූලව පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන අගමැතිවරයා පත් කරන්න එතුමාට පුළුවන්. නීත්‍යානුකූලව මුදල් ඇමතිවරයා ඇතුළු ඇමති මණ්ඩලය පත් කරන්න අපට තවමත් කල් තිබෙනවා. අපට නීත්‍යානුකූල අය වැයක් ගේන්නත් පුළුවන්. මොකද, අපි අය වැය භදා ගෙන තිබෙන්නේ. ඒක අපට ඉතා ඉක්මනින් ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම නැත්නම්, ඒ කාල සීමාව මදි නම්, ඒ අතුරු සම්මත ගිණුම දෙසැම්බර් මාසයේ 31ට ඉස්සෙල්ලා සම්මත කර ගත්තේ නැත්නම්, අපේ රටට විශාල ප්‍රශ්න ඇතිවනවා.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(2) ව්‍යවස්ථාවට අනුව වැටුප් ගෙවන්න බැරි වීම පමණක් නොවෙයි සිදු වන්නේ. ජනවාරි මාසයේ 10 වෙනි දා ඩොලර් බිලියනයක විදේශ ණය අපි ගෙවන්න තිබෙනවා, . ඇත්ත වශයෙන්ම අපි කියන්න ඕනෑ, පසුගිය අවුරුදු තුනේදී අපි ණය ගෙවීම ශතයකින්වත් පැහැර හැරියේ නැහැ; දවසකින්වත්, විනාඩියකින්වත් කල් දැම්මේත් නැහැ කියලා. එම නිසා අපට හොඳ තත්ත්වයක් තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් මේ තිබෙන තත්ත්වය යටතේ නීත්‍යානුකූල මුදල් ඇමතිවරයෙකු නැතිව ඒ තිබෙන ණය 10 වෙනි දා ගෙවන්නත් බැහැ. මොකද, Consolidated Fund එකෙන් සල්ලි නිකුත් වන්න ඕනෑ. ඒ සල්ලි නිකුත් වන්න පුළුවන් වන්නේ නීත්‍යානුකූල මුදල් ඇමතිවරයෙකුගේ අත්සනින් පමණක්ය කියන එක ජනාධිපතිතුමා දැනගන්න ඕනෑ.

මම මීට වඩා වෙලාව ගන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගෙන් යළි චානාවක් මම ඉල්ලන්නේ මුළු රටෙන්ම පළි ගන්නේ නැතිව, අනාගතයේ ඉපදෙන්න සිටින දරුවන්ගෙන් පළි ගන්නේ නැතිව වහාම නීත්‍යානුකූල රජය පත් කරන්න කටයුතු කරන්න කියලායි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මට කාරණා දෙකකට සභාවේ අනුමැතිය ගන්න අවශ්‍යයි. සභාව දිවා ආහාරය නැතිව දහවල් 12.30න් පසුව කටයුතු කිරීමට අවසරද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි කාරණය සභාවට අද දින මෙම විවාදය සඳහා කොපමණ වෙලාවක් අවශ්‍යද කියන එක මම දැනගන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම හිතන විධියට, කථිකයෝ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ සියලු කථිකයන්ට අවශ්‍ය වෙලාව දෙමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කීය වන තෙක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා හිතන්නේ සවස 6.00 වන තෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳමයි. බොහොම ස්තුතියි. ඊට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition may speak next.

[12.24 p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Mr. Deputy Speaker.

The Hon. Anura Kumara Dissanayake, JVP Leader, made a very comprehensive speech in the course of which he referred to several matters which may well be behind the present state of affairs in the country.

I want to make a very brief speech, Sir, dealing with the main issue that we are concerned with. The simple question is, Sir, whether the purported Prime Minister enjoys the confidence of this House. If he does, he can continue to be the Prime Minister, if he does not, he is not the Prime Minister of this country and there can be no Government that he can head.

This must be done by the purported Prime Minister in a straightforward way as is done in all democracies. The tradition is that. That is the rule in all democracies. When a person is appointed as Prime Minister, he seeks the confidence of the legislature in that country. That is the first thing he does.

Here, we had an Hon. Member of Parliament appointed Prime Minister on the 26th of October and now we are on the 23rd of November, and this Hon. Gentleman has not come to this House and sought the confidence of this House. That I think, Sir, is the only issue that we are confronted with.

Bribery and thuggery, Sir, cannot be a substitute for a straight, genuine and a straightforward approach to seeking the confidence of the House. The power to govern cannot be achieved by manipulations and manoeuvres. We know what happened in this country after the 26th of October. We know what happened in this Parliament on the 16th of November. I think this country was disgraced; people in this country were disgraced; this Legislature was disgraced by the conduct of some Hon. Members of Parliament. The Speaker was not allowed to sit in his Chair. The Speaker's Chair and the Speaker's Table were turned over. Members of Parliament were attacked by other Hon. Members in this House. Was all this done to achieve the confidence of the House to show that the purported PM had a majority in this House? All this was done to undermine this Legislature, to undermine this Parliament and to prevent this Parliament from functioning as it is legitimately entitled to do.

The Constitution of the country must be respected, Sir; the Constitution of this country cannot be violated. And we, the Hon. Members of Parliament, are bound to respect the Constitution, to observe the Constitution and also to ensure that this august Assembly is able to function.

We cannot permit an Hon. Member who does not command the confidence of this House to continue to function as Prime Minister of this country or lead the Government of this country. That is the plain truth that must be faced by everyone and which we all must accept. Thank you, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා. එතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. මීළඟට, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා.12.29]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් වචන කීපයක් කතා කරන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි. හැබැයි, තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් මට කනගාටුයි, දේශපාලන වශයෙන් අද ඇති වී තිබෙන මේ තත්ත්වය ගැන. එය, ඉතාම නරක පූර්වාදර්ශයක්. ඒ වාගේම අප මේ වන කොට අපේ රට දෙසට ලෝකයේ අවධානය යොමු කරවාගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලෝක මාධ්‍ය වාර්තා අනුව උගන්ඩාව ද ඇතුළුව ලෝකයේ වෙනත් රටවල තිබෙන, මේ වාගේ ඉතාම නරක විධියට හැසිරෙන පාර්ලිමේන්තු කීපයක හැසිරීම අපි කලින් දැක තිබෙනවා. ඒ අතරින් ඉහළම තැනට ලංකාව ඔසවා තබන්න මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු කණ්ඩායම -[බාධා කිරීමක්] එතුමාගේ පියා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එතුමා කියපු විධියට එතුමා ඉපදුණේත් පාර්ලිමේන්තුවේ. ඒ වාගේම, කලින් මන්ත්‍රීවරුන් ද කී ආකාරයට මන්ත්‍රීවරයෙකු, ඇමතිවරයෙකු, අගමැතිවරයෙකු, ජනාධිපතිවරයෙකු විධියට එතුමා කටයුතු කළා. කථානායක පුටුව විතරයි එතුමාට හිමි නොවුණේ කියා ඒ මන්ත්‍රීතුමන්ලා කිව්වා. නමුත් එතුමාගේ සහෝදරයා හිටපු කථානායකතුමායි. ඒ සියල්ල එසේ තිබියදීත්, ඒ සියලු තනතුරු දරා තිබියදීත් තමන් පළමුව තබා, රට, ජාතිය ආදි සියල්ල පසෙක තබා එතුමා මෙහි සිටිද්දීම එතුමාගේ මන්ත්‍රීවරුන් හසුරුවා ඉතාම නරක ලකුණක්, නරක සහතිකයක් අපේ ලංකාව සම්බන්ධයෙන්, පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් තැබීමේ අපරාධය රට වෙනුවෙන් කරන්න එතුමාට හැකියාව ලැබුණා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පියාත් මට මේ වෙලාවේදී සිහිපත් වෙනවා. ඒ සියලු දෙනාම අවුරුදු 40කට අධික දේශපාලන ඉතිහාසයක් තිබෙන නායකයන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවා කිසි දෙයක් සැලකිල්ලට නොගෙන ඉතාම නරක විධියට මේ රටේ නම, මේ රටේ ගෞරවය අපකීර්තියට ලක් කරන ආකාරයට පාර්ලිමේන්තුව හසුරුවන්න මෙතුමන්ලා මූලික වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකවරයා බේරා ගැනීම සඳහා ගිහින් තමයි විශේෂයෙන්ම අපේ එක්සත් ජාතික පක්ෂයේ සහ අනෙකුත් පක්ෂවල ගරු මන්ත්‍රීවරුන්ට එම

[ගරු සුජීව සේනසිංහ මහතා]

අර්බුදයට මුහුණ පාන්න සිදු වුණේ. හැබැයි මා ඒ වෙලාවේ එයට සම්බන්ධ වුණේ නැහැ. මොකද, මට තේරුණා, කථානායකවරයා බේරා ගැනීමට වුණත් යම්කිසි ආකාරයකින් සම්බන්ධ වුණොත් එතැනදී අර අනෙක් මන්ත්‍රීවරුන්ට අත් වූ ඉරණම අපටත් අත් වෙන්න පුළුවන් කියා, ඒ නරක නාමය, ඒ කළු පැල්ලම අපටත් ලැබෙන්න පුළුවන් කියා. මම ඒ දේවල් බලාගෙන අමාරුවෙන් ඉවසාගෙන මගේ ආසනයේ ඉඳගෙන සිටියා. ඒ නරක හැසිරීම තමයි මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් අපට පෙන්වා දුන්නේ. මෙය ඉතාම කාලකණ්ණි තත්ත්වයක්. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ පියා හොඳ දේශපාලන ඉතිහාසයක් තිබෙන කෙනෙක්. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් වශයෙන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා මෙහි ඉඳගෙන හිනා වෙවී බලාගෙන සිටියා. මේ පාර්ලිමේන්තුව වෙනුවෙන්, මේ රටේ අනාගතය වෙනුවෙන්, තමන්ගේ දරුවන් වෙනුවෙන්, තමන්ගේ දරුවන්ගේ දරුවන් වෙනුවෙන් යම්කිසි ආදර්ශයක් පාර්ලිමේන්තුවට දෙන්න දේශපාලනයෙන් තොරව එතුමන්ලාට හැකියාව තිබුණා. මා මේ කතා කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් නොවෙයි, පාර්ලිමේන්තුවේ අපක්ෂපාති මන්ත්‍රීවරයකු වශයෙන්. කාගෙන් හෝ වරදක් සිදු වුණා නම්, එය සිදු වුණේ එක්සත් ජාතික පක්ෂයෙන්ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ද, වෙනත් කාගෙන්ද කියන එක නොවෙයි වැදගත් වන්නේ. ඒ පැවැති තත්ත්වය අර්බුදයක් බවට පත් කරපු මන්ත්‍රීවරු මේ රටේ අනාගතය වෙනුවෙන් විශාල කළු පැල්ලමක් ඒ අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඇති කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉතාම හොඳින් පැහැදිලි වුණා බහුතරය තිබෙන්නේ කාටද කියා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා, බහුතරය සම්බන්ධයෙන්. මේ බහුතරයම තමයි දිගින් දිගටම පාර්ලිමේන්තුවේදී අප ප්‍රකාශ කර සිටියේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා නීති විරෝධී අගමැතිවරයා වශයෙන් පත් කිරීම අප පිළි නොගත්තත් පාර්ලිමේන්තු සම්ප්‍රදායට ගරු කරලා ඒ නීති විරෝධී අගමැතිවරයා විශ්වාස භංග යෝජනාවකින් අයින් කිරීමේ යෝජනාව ඉදිරිපත් කරලා මන්ත්‍රීවරුන් 120 දෙනකුට අධික ප්‍රමාණයක් ඡන්දය පාවිච්චි කරන්න බලාපොරොත්තුව සිටි ඒ වෙලාවේදී විශාල කලබලයක් ඇති කරලා, ලේ වගුරලා, ත්‍රස්තවාදය, මර්දනය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඉතාම නරක තැනකට මේ රට ඇද දැම්මා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි භයානකත්වය වෙලා තිබෙන්නේ සම්ප්‍රදායයට, රටේ කීර්ති නාමයට හානි කිරීම පමණක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය ලැබුණේ එංගලන්තයේ සුද්දන්ගෙන්. කලින් පළාත් 16කට වෙන් කරලා තිබූ ලංකාව, 1833 කෝල්බෘක් කැමරන් ව්‍යවස්ථාවෙන් පළාත් 5කට වෙන් කරලා, සිංහල, දෙමළ, බර්ගර් නියෝජිතයන් එක් කෙනෙකු ගණනේ වන පරිදි පත් කරලා, සුදු ජාතික නියෝජිතයන් 3 දෙනකු ද ඇතුළුව නිල නොලත් සාමාජිකයන් 6දෙනකු පත් කරලා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය පටන් ගත්තා.

එලෙස ප්‍රජාතන්ත්‍රවාදය පටන් ගත්තාට පස්සේ, 1920දී මැනිං ප්‍රතිසංස්කරණ තුළින් යම්කිසි ආකාරයකින් ලංකාවේ ඉහළ පන්තියේ පුද්ගලයන් සියයට හතරක වාගේ ප්‍රමාණයකට ඡන්ද බලය ලැබුණා. ඒ අනුව අපිට ඡන්ද බලය යම්කිසි ආකාරයකින් හිමි වීමක් සිදු වුණා. ඊට පස්සේ විශේෂයෙන්ම 1931දී ඩොනමෝර් සංස්කෘතිය -ප්‍රතිසංස්කරණ- ක්‍රියාත්මක වුණා. 1947 වනකොට මේ රටට -අපට- ප්‍රජාතන්ත්‍රවාදය විශාල වශයෙන් ලබා දුන්නා. විශේෂයෙන්ම ඉංග්‍රීසින් විසින් යම්කිසි ක්‍රමවේදයක් ඇති කරලා දුන්නා නම්, ඉංග්‍රීසින් විසින් මේ රටට යම්කිසි හානියක් ඇති කළා නම්, ඒ හානිය අවම කරලා, ප්‍රජාතන්ත්‍රවාදය අපිට හඳුන්වලා දුන්නා. ඒ ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දුන්නාට පස්සේ ලංකා ඉතිහාසයේ විශාලම කළු පැල්ලම ලබා දෙන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට -චමල් රාජපක්ෂ මැතිතුමන්ලා ඇතුළුව- හැකියාව ලැබුණා. හොඳ ඉතිහාසයක් තිබෙන, කථානායක පුටුවේ ඉඳ ගත්ත, කථානායක තනතුර සම්බන්ධයෙන් හොඳ දැනීමක් තිබෙන මන්ත්‍රීවරු පවා මෙම අපරාධයට කර ගැහුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදේශ මාධ්‍ය හතරක, පහක ලංකාව ගැන කථා කරනවා මම දැක්කා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත් යම්කිසි ආකාරයකට තමන්ගේ බලය පාවිච්චි කළා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් විශාල සංවර්ධනයක් රටේ ඇති කළත්, බලයට ඔබ්බෙන් එතුමා සමහර විට බලය පාවිච්චි කළා කියලා සඳහන් කරනවා. හැබැයි, විශාල සංවර්ධනයක් එතුමා රටට ලබා දුන්නා. කෙසේ වෙතත් මේවා සියල්ල අබිබවා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මුල්ලකට දාලා, මර්දනය, චණ්ඩිකම, මේ පාර්ලිමේන්තුවට පළමුවැනි වතාවට ගෙනැල්ලා, විශාලම කළු පැල්ලම ඇති කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු කණ්ඩායමට හැකි වුණා. මේක විශාල කළු පැල්ලමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදේශ මාධ්‍ය ඇතුළු ඒ සියලුම මාධ්‍යවල මේ බව සඳහන් කළා. ආසියාවේ රටවල් අතුරින් වැඩිම ඉතිහාසයක් තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන, ඉතාම ගරු කරන රටක් වශයෙන් තිබුණු ලංකාවට විශාල කළු පැල්ලමක් අත් කර දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භයානකම දේ ඒක නොවෙයි. ආර්ථික වශයෙන් විශාල අගාධයකට මේ වනකොට මේ රට -අපිව- ඇදගෙන ගිහිල්ලා තිබෙනවා. මේ ජනාධිපතිවරයා සහ ව්‍යවස්ථා විරෝධී කාර්ය පටිපාටිය තුළින් අද රටේ ආර්ථිකය, රටේ අනාගතය විශාල ආකාරයෙන් අර්බුදයකට අරගෙන ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මාසය තුළ පමණක් රටට සිදු වුණු විනාශය පිළිබඳව මම ඔබතුමාට කියන්නම්. අපේ අභිංසක ජනතාවට, -පාර්ලිමේන්තුවේ වැඩ කරන අපේ සේවකයන් වෙන්න පුළුවන්- ඔවුන්ට ගන්න පඩියට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඉදිරි අනාගතයේදී ඇති කරනවා. මොවුන්ට අඩුම ගණනේ රස්සාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රස්සාවක් නැති, ආදායමක් නැති පුද්ගලයන් රටේ සියයට 40කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ සියලු පුද්ගලයන්ට මේ ආර්ථිකය, මේ විනාශය ඉදිරි අනාගතයේදී ඉතාම නරක ලෙස බලපානවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔබතුමාට මම කාරණා කිහිපයක් පමණක් සඳහන් කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.85ක ආධාර අපට අහිමි වෙලා තිබෙනවා. ඒවා නවත්වා තිබෙනවා තාවකාලිකව. ඒ වාගේම, ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබීමට තිබුණු ඇමෙරිකානු ඩොලර් මිලියන 490ක් මේ වෙනකොට අත්හිටුවා තිබෙනවා. ජපානයෙන් ලැබීමට තිබුණු ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක් අත්හිටුවා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලැබීමට තිබුණු ඩොලර් බිලියන 1.85ක ආධාර අපට අහිමි වෙලා තිබෙනවා. මේ මුදල රුපියල් බිලියනවලට හරවන්න 180න් වැඩි කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ වෙනකොට අපේ Stock Market එකෙන්, Share Market එකෙන් රුපියල් බිලියන 30ක මුදල් විදේශිකයන් විසින් ඉවත් කරගෙන තිබෙනවා, රටේ තිබෙන අස්ථාවරභාවය නිසා. ඒ වාගේම මේ නිසා රුපියලට වෙන බලපෑම බලන්න. ඇමෙරිකාව ශක්තිමත් වීම තුළින්, ඩොලරය ශක්තිමත්වීම තුළින් රුපියලට විශාල බලපෑමක් ඇති වුණා. ඇමෙරිකන් ඩොලරය රුපියල් 174 - 175 ප්‍රමාණයට ආවා, ලංකාවේ අර්බුදය නිසා. ලංකාවේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇති කරපු අර්බුදය නිසා එහෙම වුණා; තමන් ගැන හිතලා,

තමන්ගේ බලය ගැන හිතලා කටයුතු කරන නිසා. මේ බොහෝ නායකයන් තමන්ගේ බලය ගැන පමණයි සැලකිලිමත් වන්නේ, විශේෂයෙන්ම වයස 65 පැන්නාට පස්සේ. වයස 65 පැන්නාට පස්සේ වයර් මාරු වෙනවාද කියලා අපට අහන්න සිදු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බලය ඉහවහා ගිහිල්ලා. බලය සියල්ලම අබිබවා ගිහිල්ලා. තමන්ගේ රට, තමන්ගේ ජනතාව, තමන්ගේ පක්ෂය කියන ඒ සියල්ල අබිබවා ගිහිල්ලා බලය මූලික වෙනවා. රටට හෙණ ගැහුවත් කමක් නැහැ, තමන් බලයේ ඉන්නේ කොහොමද කියන එක ගැන පමණයි මේ නායකයෝ සැලකිලිමත් වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තත්ත්වය රටට විශාල විපතක්. ජනතාව ඉදිරි අනාගතයේ තීන්දු ගන්නකොට මේ වාගේ පුද්ගලයන් පක්ෂ නායකයන්, රටේ නායකයන් බවට පත් නොකරන්න තීන්දු ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ක්‍රියාකලාපය නිසා මේ මාසය ඇතුළත රුපියලට වෙන බලපෑමෙන් ණය රුපියල් බිලියන 100 ඉක්මවා යනවා. කවුද මේවා ගෙවන්නේ? මේවා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ගෙවන්නෙත් නැහැ; මහින්ද රාජපක්ෂ මහත්තයා ගෙවන්නෙත් නැහැ; දිනේෂ් ගුණවර්ධන මහත්තයා ගෙවන්නෙත් නැහැ; චමල් රාජපක්ෂ මහත්තයා ගෙවන්නෙත් නැහැ. මේවා ගෙවන්නේ මේ රටේ අහිංසක ජනතාව. හිඟා කන, අමාරුවෙන් ජීවත්වෙන දුප්පත් ජනතාවට තමයි මේ මුදල් ගෙවන්න සිද්ධ වන්නේ. තමන්ගේ දරුවන් ඉස්කෝලේ යවන්නේ නැතුව, පාන් කෑල්ලක් කන්නේ නැතුව බඩ ගින්නේ ඉන්න ජනතාවට තමයි මේ මුදල් ප්‍රමාණය ඉදිරි අනාගතයේදී ගෙවන්න සිදු වෙන්නේ. දේශපාලනය කරන පුද්ගලයන් අවුරුදු 20 - 30 යනකොට ව්‍යාපාර නැතුවත් විශාල ධනවතුන් බවට පත්වෙනවා. ඒ සියලුදෙනාම දේශපාලනය පටන්ගත්ත හැටි බලන්න. අද ඔවුන්ට තිබෙන ධනය කොපමණද කියලා පොඩ්ඩක් පරීක්ෂා කරලා බලන්න. අද ඒ අය කොයිතැන්වලද ඉන්නේ, ඒ අයගේ දරුවෝ මොන වාහනවලද යන්නේ, මොන වාගේ ගෙවල්වලද ඉන්නේ කියලා හොයලා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා සහගහන අපරාධ. තමන්ට කර ගත්තාට කමක් නැහැ. නමුත් අඩුම ගණනේ රටේ ජනතාව වෙනුවෙනුත් සිතුවිල්ලක්, අනුකම්පාවක් පපුවේ තියෙන්න ඕනෑ, හෘදය සාක්ෂියට අනුව මේ රටේ දේශපාලනය කරනවා නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ව්‍යාපාරයට මේ වෙනකොට -මේ මාසය ඇතුළත- සිදුවෙලා තිබෙන පාඩුව රුපියල් බිලියන 100යි. මේවා ඔක්කෝම එකතු කළොත් ඩොලර් බිලියන 4කට වැඩි ප්‍රමාණයක පාඩුවක් මේ වෙනකොට අපේ ආර්ථිකයට ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඉතාම නරක තත්ත්වයකට මේ රට මුහුණ පා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තවමත් අපට පැහැදිලි නැහැ, මේ ප්‍රශ්නය කවදා නිරාකරණය කරයිද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ කථානායකතුමා, පාර්ලිමේන්තුව, ව්‍යවස්ථාවට අනුව, රීතිවලට අනුව ගත්ත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තවම ජනාධිපතිතුමා ප්‍රතිචාරයක් දක්වා නැහැ. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමා නීතිවිරෝධී අගමැතිවරයෙක්. එතුමාට අයිතියක් නැහැ අගමැති පුටුවේ ඉඳගන්න. හැබැයි, පාර්ලිමේන්තුවෙන් ඒ ගැන ගත්ත තීන්දුවට ජනාධිපතිවරයා තවම ප්‍රතිචාරයක් දක්වා නැහැ; හොඳ ප්‍රතිචාරයක් දක්වා නැහැ. ඒ නිසා අකැමැත්තෙන් වුණත් නියෝජ්‍ය කථානායකතුමාට, කථානායකතුමාට, ලේකම්තුමාට, නීතිවිරෝධී අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඒ පුටුව දෙන්න සිදුවෙලා තිබෙනවා, අපි පිළිනොගත්තත්. ඒ සම්බන්ධයෙන් අපි විශ්වාසභංගයක් ඉදිරිපත් කළා. එදා බෝම්බ විතරයි මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ නැත්තේ. මිරිස්කුඩු පවා ගෙනාවා. බෝම්බ ගේන්න පුළුවන් නම්, පිස්තෝල ගේන්න පුළුවන් නම් මේ පිරිස තමන්ට පුරුදු ආයුධ අමෝරාගෙනයි මේ පාර්ලිමේන්තුවට එන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට නැවත ඉතා පැහැදිලිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්න තිබුණා. අද අපි ඒ කාර්යභාරය ඉටු නොකළේ කථානායකතුමා නැවතත් අපහසුතාවට පත් කරයි කියලායි. ස්ථාවර නියෝග අත්හිටුවා අද නැවත විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්න අපට අවස්ථාව තිබුණා.

අපි ඒ කාර්යභාරය ඉටු නොකළේ ගරු කථානායකතුමාත්, ඔබතුමා සහ කාර්ය මණ්ඩලයත් අපහසුතාවට පත් වන නිසායි. අනිවාර්යයෙන්ම මේ 120ට වැඩි ඡන්ද ප්‍රමාණයෙන් නීති විරෝධී අග්‍රාමාත්‍යවරයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා විශ්වාස භංග යෝජනාවකින් ඉවත් කරන්න හැකියාව දිගින් දිගටම අපට තිබෙනවාය කියන එක අපි මේ වන විට පැහැදිලිව පෙන්වා තිබෙනවා. ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරලා රට විශාල අගාධයකට, අපරාධයකට ලක් කරලා තිබෙනවා. ජනාධිපතිවරයාට නැවත වරක් අවස්ථාව තිබෙනවා, විධායක බලතල පාවිච්චි කරලා මේ වැරැදුණු තැන නිවැරදි කරන්න. වැරැදි මාර්ගයේ ගිය ඒ ගමන නවත්වලා නිවැරදි වෙන්න අවස්ථාව තිබෙනවා. මේ සිද්ධ වූ සියලු පාඩු ආපසස්ට හරවන්න බැහැ. ඒ නිසා මේ රටේ ජනතාවට ඉදිරි අනාගතයේ ආර්ථික වශයෙනුත්, අනෙකුත් අංශවලිනුත් විශාල පාඩුවකට මුහුණ පාන්න සිදු වෙනවා. දැනුත් පරක්කු වැඩියි. නමුත්, පරක්කු වෙලා හරි ජනාධිපතිතුමා අද මේ පාර්ලිමේන්තුවේ සිදු වුණු ඡන්ද විමසුම ගැන සැලකිලිමත් වෙලා, එතුමාගේ බලතල පාවිච්චි කරලා, නැවත පාර්ලිමේන්තුව ස්ථාපනය කරලා නීත්‍යානුකූල අගමැතිවරයෙක් පත් කරලා නැවත රට හරි මාර්ගයට යොමු කළොත්, අපහාසවලින්, ඉදිරි අනාගතයේදී ජනතාවගෙන් ලැබෙන නරක නම යම්කිසි ආකාරයකින් අවම කරගන්න පුළුවන් කියන පණිවුඩය දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා කථා කරන්න.

ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා. 12.44]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

විශේෂයෙන්ම මේ අවස්ථාවේ මේ රටට උදා වෙලා තිබෙන ව්‍යසනයත් එක්ක ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ගැන වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මූලාසනයට මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය ඔක්තෝබර් 26වැනි දා මම ගත කළේ ජපානයේ ටෝකියෝ නුවර. නිල කටයුත්තකට 26වැනි දා ජපානයට ගිහිල්ලා හිටපු වෙලාවේ, හදිසියේම මහින්ද අමරවීර මන්ත්‍රීවරයා ආණ්ඩුවෙන් ඉවත් වෙන ප්‍රකාශය කරපු බවත්, ඉන් ටික වෙලාවකට පස්සේ අඳුර වැටෙනකොට මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයා අගමැතිවරයා වශයෙන් දිවුරුම් දුන් බවත් අපට දැන ගන්නට ලැබුණා. ඒ පණිවුඩය ලැබිලා එක දවසයි ගත වුණේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 27වැනි දා මම නිල කටයුත්තක් සඳහා යෑමට සූදානම් වෙනකොට මගේ මැතිනියගේ දුරකථනයට ඇමතුමක් ආවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ දුරකථන ඇමතුම ආවේ මේ රටේ ඉන්න ප්‍රධානම පුරවැසියාගෙන්. මේ රටේ ප්‍රධාන පුරවැසියා මට කථා කරලා කිව්වේ, "වහාම ලංකාවට එන්න. කැබිනට් ඇමති ධුරයක් භාර ගැනීම සඳහා සූදානමින් එන්න" කියලායි. මට ආරාධනා කළා අලුතින් බිහි කරන ආණ්ඩුවට සම්බන්ධ වෙලා කැබිනට් ඇමති ධුරයක් ලබා ගන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතැනින් ඔබ්බටත් තව ටිකක් කියන්න තිබෙනවා. ඉන් පස්සේ මම 29වැනි දා ලංකාවට ආවා. "වහාම හමු වෙන්න" කියලා මට පණිවුඩ කීපයක්ම තිබුණා. මම හමු නොවී, කථා නොකර සිටියදී දින 3කට පස්සේ මගේ දුරකථනයට නැවතත් ඇමතුමක් ආවා ජනාධිපති මන්දිරයෙන්. මේ රටේ ප්‍රධානම පුරවැසියා මට කථා කරනවා කියලා, ඒ දුරකථන ක්‍රියාකරු දැනුම් දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ප්‍රධාන පුරවැසියා මට කිව්වේ මොකක්ද? "හම්බ වෙමු; මේ ආණ්ඩුවට සම්බන්ධ වෙන්න එන්න." කියන කාරණයයි එතුමා මට කිව්වේ. මම ඍජුවම මගේ අප්‍රසාදය, අකමැත්ත ඊට ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ව්‍යසනය ඇති කරලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධීව අගමැතිවරයෙක් පත් කිරීමට කටයුතු කරලා, ඇමති මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරලා, ව්‍යවස්ථා විරෝධීව පාර්ලිමේන්තුව විසුරුවා හැරලා, රටේ ප්‍රධානම පුරවැසියා සියලු මාධ්‍ය ඉදිරිපිටදී ජාතිය අමතන්නට කටයුතු කළා. ජාතිය අමතලා සඳහන් කළේ මොකක්ද? "පාර්ලිමේන්තුව රැස් කළා නම්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කීප දෙනෙක්ම මිය යන තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට කටයුතු කළා. ඒ වාගේම, මන්ත්‍රීවරුන්ගේ මිල වැඩිවීමට පටන් අරගෙන තිබෙනවා. මිලියන 100 සිට මිලියන 400, මිලියන 500 දක්වා මන්ත්‍රීවරයාගේ මිල තීරණය කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට කටයුතු කළා." කියලා කිව්වා.

එහෙම නම්, මන්ත්‍රීවරයාගේ මිල තීරණය වන, මන්ත්‍රීවරයා මිලදී ගන්න, මන්ත්‍රීවරයා අළෙවි කරන තත්ත්වයක් මේ සමාජය තුළ, මේ රට තුළ මෑත යුගයේ නිර්මාණය කළේ කවුද කියන කාරණය ඉතාමත්ම පැහැදලිව පේනවා. මෙවැනි තත්ත්වයක් ඇති කළේ මේ රටේ වර්තමාන ජනාධිපතිතුමායි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමා ගත්තු ක්‍රියාමාර්ගයත් එක්ක විවිධ උදවිය මේ ගනුදෙනුවට බැස්සා, මන්ත්‍රීවරුන්ට කථා කළා. ඒ ආරාධනාව ලැබුණු මන්ත්‍රීවරුන් අතර මේ කථා කරන රංගෙ බණ්ඩාරත් ඉන්නවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එදා එස්.බී. නාවින්න මැතිතුමා අපිත් එක්ක ඉඳලා මෙවැනි ගනුදෙනුවක් මත අනෙක් පැත්තට යනවා කියන ආරංචිය මට ලැබුණාම මම ඒ පිළිබඳව මගේ බලධාරීන්ව දැනුවත් කරලා, මමත්, අපේ ජාතික සංවිධායක නවීන් දිසානායක මැතිතුමාත් එස්.බී. නාවින්න මැතිතුමා හමුවන්නට ගියා. එතුමා හමුවන්නට යන්න ඉස්සෙල්ලා දින දෙකක, තුනක ඉඳලා එස්. බී. නාවින්න මැතිතුමා සම්බන්ධව මේ ගනුදෙනුව, මේ කපුකම කළ පුද්ගලයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා මට දිගින් දිගටම කථා කළා, රුපියල් කෝටි 50කට එන්න කියලා. ඒ මුදල රුපියල්වලින් නොවෙයි ඇමෙරිකානු ඩොලර්වලින් මගේ ගෙදරටම ගෙනැල්ලා භාර දෙන්නම්, ඉන් පසුව මට කැබිනට් ඇමති ධුරයක දිවුරුම් දීමට පුළුවන්, ඒකට එන්න කියලා කථා කළා. මේ එක තැනැත්තෙක්. ඒ වාගේම දිලුක්ෂ කියලා තැනැත්තෙක්, යෝෂිත රාජපක්ෂගේ සම්බන්ධීකරණ ලේකම්වරයා කියලා කෙනෙක් මට දිගින් දිගටම කථා කළා. ඒ කථා කළ හඬ පට මා ළඟ තිබෙනවා. එස්.බී. නාවින්න මැතිතුමා සම්බන්ධ ගනුදෙනුව කළ සම්බන්ධීකරණ ලේකම්වරයා කථා කළ හඬ පට මා ළඟ තිබෙනවා. මේ සියල්ලම මා නොවැම්බර් මාසයේ 03වෙනි දා සමස්ත මාධ්‍යයට මුදා හරින්නට කටයුතු කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අනෙක් පැත්තෙන් වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන එස්.බී. දිසානායක මන්ත්‍රීවරයා දිගින් දිගටම කථා කළා. මේ මන්ත්‍රීවරයා මට කැබිනට් ඇමති ධුරයක් ලබා ගන්න කියලා ඇවිටිලි කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අනෙක් පැත්තෙන් එස්.බී. දිසානායක මන්ත්‍රීවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් වන නවීන් කියන තැනැත්තා මේ සම්බන්ධව කථා කළා. යෝෂිත රාජපක්ෂගේ නියෝජිතයා වන දිලුක්ෂ කියන තැනැත්තා කෝටි 50ක මුදලකුත් අරගෙන මහාචාර්ය රන්ජිත් බණ්ඩාර සමඟ මගේ ආනමඩුවේ නිවසට එනවා කිව්වා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ රටේ මතයක් තිබෙනවා, සමාජයේ උගත්, බුද්ධිමත් උදවිය පාර්ලිමේන්තුවට එන්න ඕනෑ කියලා. මහා සංඝරත්නය කියනවා උගත්, බුද්ධිමත් උදවිය මේ සභාවට යන්න ඕනෑ කියලා. පූජකවරුන් කියනවා මේ සභාවට උගත්, බුද්ධිමත් උදවිය එන්න ඕනෑ කියලා. හැබැයි, මේ රටේ උගත් කියලා සම්මත, පිළිගත්ත කට්ටිය තමයි ආචාර්යවරු, මහාචාර්යවරු. මහාචාර්ය රන්ජිත් බණ්ඩාර කියන පුද්ගලයා මගේ දුරකථනයට කථා කරනවා. මේ මහාචාර්ය රන්ජිත් බණ්ඩාර කියන පුද්ගලයා මේ දූෂිත ක්‍රියාවට සම්බන්ධ වෙලා මන්ත්‍රීවරුන් මිලදී ගැනීමේ කටයුත්තේ යෙදෙනවා. එහෙම නම් මේ රටේ උගතුන්, බුද්ධිමතුන්, ප්‍රඥාවන්තයින්, doctorsලා, proctorsලා, -ආචාර්යවරු- professorsලා කියන කට්ටියගේ තත්ත්වය මොකක්ද කියලා අපට හිතන්නට වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ තත්ත්වයට පාර්ලිමේන්තුව හැල්ලු වුණේ, මන්ත්‍රීවරයාගේ මිල ගණන් වැඩි වුණේ, මන්ත්‍රීවරයා අළෙවි කරන තත්ත්වයට සමස්ත වශයෙන් පත් වුණේ වර්තමාන ජනාධිපතිතුමා මේ ගත්ත අමනෝඥ ක්‍රියාවලිය නිසා බව අපි නොපැකිළව කියන්නට අවශ්‍යයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ තොරතුරු මේ මොහොතේ මා සතුව තිබෙනවා. අවශ්‍ය නම් මේ සභාව තුළ ක්‍රියාත්මක කරලා පෙන්වන්න පුළුවන්. ඒ ගරු මන්ත්‍රීතුමන්ලා, නායකතුමන්ලා අපට මුදල් දෙන්නට කථා කළ ඒවා, ආරාධනා කළ ඒවා, කියපු ඒවා ඔබතුමාගේ අවසරය ලැබෙනවා නම් මේ ගරු සභාවේදීම ක්‍රියාත්මක කරලා පෙන්වීමට හැකියාව තිබෙනවා. මම සාක්ෂි ඇතිවයි කථා කරන්නේ කියලා බොහොම පැහැදිලිවම කියන්නට කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
No, no.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය නැත්නම් මම මෙය ක්‍රියාත්මක, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
No, it cannot be allowed.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. ඔබතුමා අනුමත නොකරන නිසා මම එය ඉදිරිපත් කරන්නේ නැහැ. මේ රටේ ප්‍රධානියාගේ ඉඳලා මේ කථා කරපු සෑම කෙනෙක් සම්බන්ධවම තොරතුරු තිබෙන්න පුළුවන්. අවාසනාවක මහිම කියන්නේ, මේවා ගිහිල්ලා කියන්න තැනක් අපට නැහැ. අමු අමුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන ජනාධිපතිවරයෙක් ඉන්න කොට, අමු අමුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාත්මක කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉන්න කොට, මේ රටේ ස්වාධීන කොමිෂන් සභා පිළිබඳව විශ්වාසයක් තියන්නට පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අල්ලස් ගැනීම, අල්ලස් දීම, අල්ලස් ලබා දීමට කථා කිරීම යන මේ සියලු කාරණා නීතියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියන එක අපි දන්නවා. නමුත්, අද අපට විශ්වාසයක් තියලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා මේ සම්බන්ධව පැමිණිලි කරන්නට තරම් වාතාවරණයක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේකයි තත්ත්වය. මේ තත්ත්වයට මේ පාර්ලිමේන්තුව පත් කළේ වර්තමාන ජනාධිපතිතුමා. මෙවැනි තත්ත්වයකට මේ රට පත් කළේ වර්තමාන ජනාධිපතිතුමා කියන එක අපි නොබියව, නිසැකව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "තේරීම් කාරක සභාවක් පත් කිරීමට පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමක් සිදු කරමු" කියන කොට අද මේ ආණ්ඩුවක් යයි කියාගන්නා උදවිය පොත් පත් සහ files ටිකත් අරගෙන පාර්ලිමේන්තුවෙන් පැනලා ගියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, fake අගමැතිවරයෙක්, - හොර අගමැතිවරයෙක්- ඒ වාගේම හොර ඇමති මණ්ඩලයක්, හොර මන්ත්‍රී මණ්ඩලයක් සිටින කණ්ඩායමක්; ඡන්දයකට බයේ පැනලා දුවන කණ්ඩායමක් සිටින කොට, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මම ඉතිහාසය ගැනත් මතක් කරන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සභාව නියෝජනය කළ ගරු ශ්‍රීපති සූරියආරච්චි මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් ඔබතුමාට මතක ඇති. එදා ශ්‍රීපති සූරියආරච්චි මැතිතුමා මේ සභාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරද්දී, මම මේ සභාවේ විපක්ෂයේ ඉඳගෙන මගේ වේලාවේ දී සභාව අමතන කොට මා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට උත්තර දෙන්න ශ්‍රීපති සූරියආරච්චි මැතිතුමා ඉදිරිපත් වුණා. ඒ වෙලාවේ ශ්‍රීපති සූරියආරච්චි මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව කිව්වා, 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණය ජයග්‍රහණය කළේ එල්ටීටීඊ එකට සල්ලි දීලා කියලා. ඒ සඳහා ටිරාන් අලස් ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ වුණා. "RADA ආයතනය" කියලා හොර නමකින් ආයතනයක් හැදුවා. රජය පිහිටවූවාට පසුව ඒ RADA ආයතනය හරහා රජයේ මුදල් ගෙව්වා කියලා ශ්‍රීපති සූරියආරච්චි මන්ත්‍රීතුමා කිව්වා. ඒ ප්‍රකාශය කළාට පසුව ශ්‍රීපති සූරියආරච්චි මන්ත්‍රීතුමාට වැඩි කාලයක් ජීවත් වෙන්න හම්බ වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද මේ ප්‍රකාශය කළාට පස්සේ රංගෙ බණ්ඩාරට ජීවත් වෙන්න දෙයිද කියන එක මම දන්නේ නැහැ. නමුත්, අපි මේවා රටට හෙළි කරන්නට ඕනෑ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. බියගුලුකමට අපි මේවා සඟවා ගෙන ඉන්නවා නම්, එය මේ භූමියේ උපන් ජනතාවට කරන ද්‍රෝහීකමක් වන නිසා තමයි මේ කරුණු රටට හෙළිදරව් කරන්නට මම තීන්දු කළේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම මුදල් දීලා මන්ත්‍රීවරු අරගෙන දූෂිත ආණ්ඩුවක් හදනවා නම්, එවැනි ආණ්ඩුවකින් රටේ ක්‍රියාත්මක වෙන්නේ දූෂිත පාලනයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. යහපත් පාලනයක් ඇති කරන්න පුළුවන් වන්නේ නැහැ.

මාත් සමඟ මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය කළ පුත්තලම දිස්ත්‍රික්කයේ මගේ සහෝදර මන්ත්‍රීවරයෙක් මේ ආණ්ඩුවෙන් එහා පැත්තට පනින්න දවස් දෙකක් තිබියදී ආරක්ෂක නිලධාරීන් සහ තවත් කෙනෙක් යවා මුදල් ගණන් කරන machine එකක් ගෙන්වා ගෙන තිබෙනවා. ඒ machine එක ගෙනැල්ලා තමන්ට ලැබුණු රුපියල් කෝටි 20ක මුදල ගණන් කරලා තියලා තමයි මේ මන්ත්‍රීවරයා එහා පැත්තට පැනලා තිබෙන්නේ කියලා බොහොම සාක්ෂි සහිතව, සාධක සහිතව අපට තොරතුරු ලැබිලා තිබෙනවා. ඒ විධියට මුදලට විකිණෙන දූෂිත පුද්ගලයන් මේ රටට ආදරය කරනවාද? මේ රටට යහපතක් කරන්නද එන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා ශ්‍රීපති සූරියආරච්චි මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට එල්ටීටීඊ සංවිධානයේ මිනීමරු නායකයා වූ ප්‍රභාකරන්ව සල්ලිවලට මිලදී ගන්නට -ප්‍රභාකරන්ට පගාව දෙන්නට- මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා කටයුතු කළා කියන එක සනාථ වෙලා තිබෙනවා. අද ඒ සම්බන්ධව අධිකරණයේ නඩු තිබෙන නිසා මම ඒ ගැන කියන්නේ නැහැ.

අද උදේ මට ජපානයේ සිටින මගේ මිතුයෙක් කථා කළා. මේ සමාජයේ විවිධ පුද්ගලයන් මා සමඟ මේ පිළිබඳව කථා කරනවා. ඒ කථා කරන උදවිය කියන තොරතුරු අනුව, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි, මට තව විනාඩි දෙකක් දෙන්න. මම විනාඩි දෙකකින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මහින්ද රාජපක්ෂ, ප්‍රභාකරන්ව සල්ලිවලට ගත්තා වාගේ මෛත්‍රීපාල සිරිසේනවත් සල්ලිවලට අරගෙන තිබෙනවා. එහෙම

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

සල්ලිවලට අරගෙන, එම විගඩම තමයි මේ නටන්නේ කියලා අද සමාජයේ කථා වෙනවා. එහෙම නම්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් සල්ලිවලට යට වුණාද කියන එක පිළිබඳව මේ සමාජයේ තිබෙන කථා එක්ක අපට සැකයක් මතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නොවැම්බර් 3 වැනිදා මේ දූෂිත ගනුදෙනු පිළිබඳ හඬපටයක් මම ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අල් ජසීරා රූපවාහිනිය, බීබීසී ආයතනය, ටීඑන්එල් ආයතනය, සියත ආයතනය, ස්වර්ණවාහිනී ආයතනය සහ සිරස ආයතනය යන මාධ්‍ය ආයතන පමණයි මේ රටට කරන ව්‍යසනය පිළිබඳව කථා කළේ.

මාධ්‍ය නාළිකා විවිධ උදවියගේ වැරැදි පෙන්වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමාගේත් වැරැදි පෙන්වනවා. හැබැයි, මේ රටට කරන්න ගිය මේ කාලකණ්ණි ව්‍යසනය, මේ කරන කාලකණ්ණි වැඩේ කරුණු සහිතව ඔප්පු කරලා ඉදිරිපත් කළාම, ඒක මාධ්‍ය මඟින් පෙන්නුවේ නැහැ. ඒවා පෙන්නුවේ නැති, විශේෂයෙන් "හිරු" සහ "දෙරණ" කියන නාළිකා සමඟ අපේ අමනාපයක් නැහැ. නමුත් අපි කනගාටු වෙනවා, මේ පිළිබඳව කටක් ඇරලා කථා කරන්න එක තත්පරයක් වැය කළේ නැති එක ගැන. අනෙක් ආයතන මෙය රටට පෙන්වූවා. ඒ අයට අපේ ප්‍රශංසාව පුදු කරනවා. එසේ නොකළ කට්ටිය පිළිබඳව අපේ අමනාපයක් නැහැ. ඒ ගැන අපේ කනගාටුව පළ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්. නොවැම්බර් 5වන දා ගරු ජනාධිපතිතුමා බත්තරමුල්ල රැස්වීමේදී කිව්වේ මොකක්ද? "මම රනිල් වික්‍රමසිංහව ඩෝසර් කරගෙන යන්න පුළුවන් මිනිහෙක් අගමැති කළා" කිව්වා. එහෙම නම්, එතුමා මේ රටට අගමැතිවරයෙක් නොවෙයි පත් කර තිබෙන්නේ, ඩෝසර් ඔපරේටර්වරයෙක්. මේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ යහපත් අගමැතිවරයෙක්; යහපත් නායකත්වයක්. මේ රටට ඩෝසර් ඔපරේටර්ලා ඕනෑ තරම් ඉන්නවා. අපේ වැඩ පොළේත් ඩෝසර් ඔපරේටර්ලා 6දෙනෙක් ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට භයදෙනෙක් දෙන්න පුළුවන්. මේක ඩෝසර් ඔපරේටර්වරු අවශ්‍ය යුගයක් නොවෙයි. බුද්ධිය පාවිච්චි කරලා, සමාජයේ ප්‍රශ්න ටික තේරුම් ගෙන, මේ වැටිලා තිබෙන අගාධයෙන් රට ගොඩ ගන්න පුළුවන් නායකයෙක් මේ රටට අවශ්‍යයි කියන කාරණය මා කියනවා.

එක එක්කෙනාගේ පෞද්ගලික ජීවිතය ගැන ඕපදූප කථා කරන්න මම කැමැති නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් මම මේ කාරණය කියන්න ඕනෑ. රටක නායකයෝ තවත් උදවියට ප්‍රසිද්ධ වේදිකාවල අවලම් කථා නොකිව යුතුයි. සමනල් යුග ගැන එක එක්කෙනාට චෝදනා කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 1970-71 කාලයේ මේ රටේ ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලක් තිබුණු බව ඔබතුමා දන්නවා. ඒ කැරැල්ල තිබුණු අවස්ථාවේ පොළොන්නරුවේ "පාල" කියා කෙනෙක් ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයන්ට තේ පැන් ඇදලා තිබෙනවා; බීඩි ගෙන ගිහින් තිබෙනවා; සිගරට් ගෙන ගිහින් තිබෙනවා. ඒ වාගේ පක්කිලි වැඩ කර තිබෙනවා. පසුකාලීනව ඒ පුද්ගලයා පොලීසිය මඟින් අත් අඩංගුවට අරගෙන මඩකලපුව බන්ධනාගාරයේ රඳවලා තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එදා ඒ බන්ධනාගාරයේ හිටියා, ජ්‍යෙෂ්ඨ සිරකරුවෙක්. ඔහු තමයි, "කීර්තිපාල" කියන තැනැත්තා. ඔහු සිරගත කරලා හිටියේ රාජසිංහ රජ්ජුරුවන්ගේ ඔටුන්න හොරකම් කිරීමේ වරදට වැරදිකරු ලෙසයි. රාජසිංහ රජුගේ ඔටුන්න හොරකම් කිරීමට වැරදිකරු වෙලා, සිරගත වෙලා සිටි කීර්තිපාල තමයි බන්ධනාගාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ මේ සිරකරුවන් සියලුදෙනාම හැන්දෑවට කූඩුවලට දමලා වහන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ජ්‍යෙෂ්ඨ සිරකරුවාට - කීර්තිපාල නැමැත්තාට- අනෙක් සිරකරුවන් බලාගැනීම සඳහා අවකාශය දීලා තිබුණා. ඔහුට බාපනයක් -ඇඟ හරහා දමන පටියක් - පැළඳීමට අවසර දීලා තිබුණා. ජ්‍යෙෂ්ඨත්වය අනුව ඔහුට එහෙම භාර දීලා තිබුණේ ඔහුගේ යහපත් කල් ක්‍රියාව නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ කථාව රටේම ජනතාවට ඉතා රසවත්; වැදගත්. එදා කීර්තිපාල මේ සිරකරුවන් සියලුදෙනා බන්ධනාගාරයේ සිර කූඩුවලට ඇතුළත් කරලා, අවසානයේ ඔහුගේ සිර කූඩුවට යනවා. ඒ යන කොට ඔහු ගියේ, ජනතා විමුක්ති පෙරමුණට උදව් කළාය කියන චෝදනා මත අත් අඩංගුවට අරගෙන සිටි පොළොන්නරුවේ අර, "පාල" කියන එක්කෙනා එක්කරගෙනයි. ඒ "පාල" කියන එක්කෙනා තමයි, අර කීර්තිපාලගේ සමනලයා. එහෙම ඉතිහාසයක් තිබෙන උදවිය තමයි අද මෙහෙම කථා කරන්නේ. "ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට" කියලා අපේ පැරණි කියමනකුත් තිබෙනවා නේ. මුල් යුගයේ; අවිවාහක යුගයේ; තරුණ යුගයේ; ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලට සම්බන්ධ වුණාය කියන යුගයේ එදා මඩකලපුව බන්ධනාගාරයේ ඉඳගෙන කීර්තිපාලගේ සමනලයා වෙලා හිටපු උදවිය තව උදවියට මඩ ගැසීම, අවලාද කීම ඉතාම අවිනීතයි; අශිෂ්ටයි; අප්‍රසන්නයි කියන කාරණය සඳහන් කරමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 1.00]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද මේ පාර්ලිමේන්තුවට විශේෂ දවසක්. මොකද, අපට කියන්න පුළුවන්, අද ප්‍රජාතන්ත්‍රවාදය ජයග්‍රහණය කළ බව. අද කථානායකතුමා තේරීම් කාරක සභාවේ නියෝජිතයන් යෝජනා කළ අවස්ථාවේදී, ඒකට එකතු වෙන්නේ නැතිව, ඒ සඳහා නමින් ඡන්දයක් ගැනීමට යෝජනා කළා. ඒ අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 121දෙනකු කථානායකතුමා ඉදිරිපත් කළ ඒ නම් ලැයිස්තුවට එකඟත්වය පළ කළා. ඇත්තටම අද මේ රටේ හොර ආණ්ඩුවක් තිබෙන්නේ. මොකද, කථානායකතුමා ගිය සතියේදී තීරණය කළා, මේ රටේ ආණ්ඩුවක් නොමැති බව.

නමුත්, ආණ්ඩුවක් මුවාවෙන් වැඩ කරගෙන යන මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කණ්ඩායමට ඒක තවත් විශ්වාස භංග යෝජනාවක් වුණා. අපි ගිය සතියේ -නොවැම්බර් මාසයේ 14වන දා සහ 16වන දා- ඒ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනා

ගෙනැත්, ඒ ආණ්ඩුව පරාජය කළා. ඒ අයට බහුතරයක් නැහැ. නමුත් අපිට අවස්ථාවක් ලැබුණේ නැහැ, නමින් ඡන්දය සඳහන් කරන්න. අපේ නම් සඳහන් කරලා, ඒ අයට විශ්වාසයක් නැති බව පෙන්වන්න අපිට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒක අද අපිට කර ගන්න පුළුවන් වුණා. විශ්වාස භංග යෝජනාවක් හැටියට තමයි අද තිබුණු ඒ ඡන්දයත් අපිට සලකන්න පුළුවන් වන්නේ. හිටපු ජනාධිපති කෙනෙකු; හිටපු අගමැති කෙනෙකු; පරාජිත ජනාධිපති කෙනෙකු; පරාජිත අගමැති කෙනෙකු හොරෙන් අගමැතිකමක් ලබා ගන්නට කරන වෑයම මොකක්ද, ඇයි මෙහෙම දෙයක් සිදු වන්නේ කියා අපිට නම් තේරුම් ගන්නම බැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතරයි. මේ රටේ ජනතාව -සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී වශයෙන් විවිධ ආගම් අදහන, විවිධ සංස්කෘතීන් තිබෙන ජනතාව සියලුදෙනාම- බැඳී සිටින්නේ රටේ ව්‍යවස්ථාව තුළින් පමණයි. ඒ නිසා, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතරයි. ඒ නිසා මේ ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න කථානායකතුමා ගත්ත පියවර පිළිබඳව අපි විශේෂයෙන්ම එතුමාට අපේ ගෞරවය පුද කරන්න ඕනෑ. ජනාධිපතිතුමා පත් කළ රජයට බහුතරයක් නැත්නම්, එතැන රජයක් නොමැති බවට එතුමා නොසැලී තීරණයක් ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42. (4) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

> "ජනාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය."

නමුත්, අගමැතිවරයා ඉවත් කිරීම පිළිබඳව කිසිම ප්‍රතිපාදනයක් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාට නැති බව මම සඳහන් කරන්න ඕනෑ. ජනාධිපතිතුමාට පුළුවන්, අගමැති පත් කරන්න. නමුත් පාර්ලිමේන්තුවටයි අගමැති ඉවත් කරන්න පුළුවන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48. (2) අනුව්‍යවස්ථාවේ ඒ කාරණය මෙසේ සඳහන් වනවා:

> "පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළ හොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළ හොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය."

ඒ අනුව අගමැතිතුමා විතරක් නොවෙයි, මුළු අමාත්‍ය මණ්ඩලයම විසුරුවලා තිබෙන්නේ. මේ රටේ රජයක් නැහැ. බොහොම අසීරු තත්ත්වයක් මේ රටේ පවතින්නේ. ආඥා පිළිපදිනවා නම් ඒවා නීත්‍යානුකූලද, අනීත්‍යානුකූලද කියා ඒ අය හොයා බලන්න ඕනෑ බව මම විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන්ට කියන්න ඕනෑ. සමහර වෙලාවට අද හෙට ඒ අය වැරැදිකරුවන් හැටියට තීරණය නොකරන්න පුළුවන්. නමුත් ලෝක ඉතිහාසය දිහා බැලුවොත්, අපිට ඒ සඳහා උදාහරණ පෙන්වන්න පුළුවන්. මේ වාගේ අනීත්‍යානුකූල ආණ්ඩු තිබෙන කොට දේශපාලනඥයන්ට විතරක් නොවෙයි, රාජ්‍ය සේවකයන්ටත් අසීරු තත්ත්වයකින් - සමහර විට පීඩනය නිසා- අනීත්‍යානුකූල තීරණ පිළිපදින්න සිදු වෙලා තිබෙනවා. ඒක මේ රටේ රාජ්‍ය සේවකයන් නොකළ යුතුයි. ඒ අයගේ මේ අසීරු තත්ත්වය අපිට හැඟෙනවා; තේරෙනවා. ඒ වුණත්, මේ කාරණයත් මම කියන්න ඕනෑ. විලී රටේ පිනෝචේ කියන පුද්ගලයා ජනාධිපතිකම බලෙන් අල්ලා ගෙන සිටි බව ලෝක ඉතිහාසය දෙස බැලුවාම අපට පෙනෙනවා. ඒක අනීත්‍යානුකූල ආණ්ඩුවක්. දශක ගණනාවකට පසුව එතුමා හිරේ ගියා විතරක් නොවෙයි, එතුමාගේ ආණ්ඩුවේ අණ පිළිපැදපු අයත් හිර ගෙවල්වල ළ තැවෙනවා.

මම මේ කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. අනීත්‍යානුකූල, ව්‍යවස්ථාවට පටහැනි දේවල් කිරීමෙන් රාජ්‍ය සේවකයන් ප්‍රවේසම් වෙන්න ඕනෑ. අද හෙට මොනවාවත් නොවෙන්න පුළුවන්. නමුත් අවුරුදු දෙකක් ගියත්, පහක් ගියත්, දහයක් ගියත් අනිවාර්යයෙන්ම රටේ නීතිය ක්‍රියාත්මක කරන්න අපි බැඳී සිටිනවාය කියන කාරණයත් මම සඳහන් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ "මන්ත්‍රීවරු" කියන තනතුර තියාගෙන ඉන්න අය මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන අපේ සේවකයන්ට කළ හිරිහැරය අපි පසුගිය සතිය තුළදී දැක්කා. මේක පාර්ලිමේන්තුවයි. අපිට මේකේ වරප්‍රසාද තිබෙනවා. නමුත්, අනික් අයට හිරිහැර කරන්න වරප්‍රසාද නැහැ. පොලීසියේ නිලධාරීන් මේ පාර්ලිමේන්තුවට ආවා.

ඒ අය ආවේ කථානායකතුමාගේ ඉල්ලීම මතයි. ඔවුන් ආවේ නීතිය ආරක්ෂා කරන්නයි; නීතිය ක්‍රියාත්මක කරන්නයි. ඒ අයට හිරිහැර කළා; අවලාද කළා. ඒ විතරක් නොවෙයි, ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒ සමහර අයට පහර දුන්නා; කම්මුල් පහර දුන්නා. මේක අපි සම්පූර්ණයෙන්ම හෙළා දැකිය යුතුයි. පාර්ලිමේන්තුව ඇතුළේ හිටියත් රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. වරප්‍රසාදවලින් රටේ නීතිය අක්‍රිය වෙන්නේ නැහැ. ඒ නිසා ඒ වෙනුවෙන් පොලීසියත්, ඒ වාගේම රටේ නීතියත් ක්‍රියාත්මක විය යුතුයි. පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකු වුණාය කියා රටේ නීතියට ඉහළින් නොවෙයි අපි ඉන්නේ. අපි හැමෝම රටේ නීතියට යටත් වෙන්න ඕනෑ. ඒ නිසා රටේ නීතිය ක්‍රියාත්මක විය යුතුයි. ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පරීක්ෂණයක් තිබෙනවාය කියා මම දන්නවා. නමුත්, එම මන්ත්‍රීවරු අත් අඩංගුවට ගෙන නීතියට යටත් කරන්න ඕනෑ.

ඒ සිද්ධිය අපේ ඇස්වලින් දැක්කා. මේ රටේ ජනතාව එය රූපවාහිනියෙන් දැක්කා; සමාජ ජාල හරහා දැක්කා. පාර්ලිමේන්තුවේ තිබෙන රාජ්‍ය දේපොළ විනාශ කරන ආකාරය හැමෝම දැක්කා. ඒ වාගේම, මයික්‍රෝෆෝන්, විද්‍යුත් ක්‍රමයට ඡන්දය ගැනීමේදි පාවිච්චි කරන යන්ත්‍ර යනාදී දේවල් විනාශ කරන ආකාරයත් සියලුදෙනාම දැක්කා. සාමාන්‍ය පුද්ගලයෙක් වාහනයක් එළවනකොට ලයිට් කණුවක හැපුනත් එය පොලීසියට දන්වන්න ඕනෑ. ඒ ලයිට් කණුවට වුණු හානිය වෙනුවෙන් ඒ පුරවැසියා -ඒ රියැදුරා- ගිහින් මුදලක් ගෙවන්න ඕනෑ; දඬුවමක් විඳින්න ඕනෑ. ඒ නිසා, පාර්ලිමේන්තුවට ඇවිත්, මහජන දේපළ විනාශ කරන එකටත් දඬුවමක් තිබෙන්න ඕනෑ, ඒකටත් වෙනම විශේෂ නීතියක් තිබෙනවාය කියන එක අපි අපිම මතක් කර ගන්න ඕනෑ. විශේෂ නීතියක් නැහැ. රාජ්‍ය දේපළවලට හානි කළොත්, නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. පොත් පත් ආයුධයක් කරගෙන, පොත් පත්වලින් ගහනවා අපි දැක්කා. පොත් පත් ආයුධයක් කර ගත්තා. ගුරුවරයෙකුගේ, ආචාර්යවරයෙකුගේ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගුරුවරයෙකුගේ, ආචාර්යවරයෙකුගේ, මහාචාර්යවරයෙකුගේ දේශනයක් අහපු නැති සමහර අය මේ පාර්ලිමේන්තුවේ සිටිනවා වෙන්න පුළුවන්; පොතක් පතක් නොකියවපු අය සිටිනවා වෙන්න පුළුවන්. නමුත් අගෞරව කරන්න එපා. ඒ අයගේ දරුවනුත් පොත් පත් කියවනවා. අලුත් පරපුරක් මේ රටේ සිටිනවා. දෙමව්පියන්ට වඩා උගත් පරපුරක් සිටිනවා. ඒ අයත් පොත් පත් කියවනවා. අපි ඒ අයට අනුකම්පා කළ යුතුයි. අනුකම්පා කළත්, නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන එක මතක් කරන්න ඕනෑ. ඇහේ හයියෙන්

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

පාර්ලිමේන්තුවක් ගෙන යන්න බැහැ. මොළේ හයියෙන් තමයි පාර්ලිමේන්තුවක් ගෙන යන්න ඕනෑ. අපි මේ දේ කරන්න ඕනෑ. දඬුවම් දෙන්න ඕනෑ අයට අනිවාර්යයෙන්ම දඬුවම් දිය යුතුයි. රජයක් නැහැ. ඇයි මේ දේ කරන්නේ? රාජපක්ෂවරුන්ට නඩු පවරා තිබෙන නිසා. ඒ කරපු වැරදිවලට, ඝාතනවලට, අතුරුදහන්වීම්වලට සුදු වෑන් එවලා මිනිසුන්ව අරගෙන ගිය ඒවාට, හොරකම් කරපු ඒවාට, මුදල් පරිහරණය පිළිබඳව නඩු පවරා තිබෙනවා. ඒ නඩු ප්‍රමාද වෙලා, ප්‍රමාද වෙලා, දැන් ඒ නඩු විභාග කර, තීරණ දෙන්න අවස්ථාව පැමිණ තිබෙනවා. ඒ වාගේම දූෂණයට විරුද්ධව නඩු පවරන්න පාර්ලිමේන්තුවෙන් අලුත් උසාවි සම්මත කරලා, ඒ උසාවිත් ක්‍රියාත්මක වෙමින් යනවා. ඒ නිසා තමයි මේ ක්‍රියාවේ යෙදුණේ කියන එක සඳහන් කරන්න ඕනෑ. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කරනකොට, එතුමා අපේ ආණ්ඩුවේත් වැරදි, අඩුපාඩු පෙන්වා දුන්නා. අපේ ආණ්ඩුවේත් අඩුපාඩු තිබුණා කියන එක අපි පිළිගන්න ඕනෑ. නමුත් මම මෙතැනදී සඳහන් කරන්න ඕනෑ, රාජපක්ෂ රජයේ වූදිතයන් ආරක්ෂා කළා කියා එතුමා චෝදනාවක් කළා. එහෙම කරලා තිබෙනවා නම්, ඒ අයට විරුද්ධවත් ක්‍රියා කරන්න ඕනෑ. ඒ වාගේම මුදල් හොරකම් කර තිබෙනවා නම්, දූෂණ චෝදනා තිබෙනවා නම්, ඒ අයට විරුද්ධවත් ක්‍රියා කරන්න ඕනෑ. ඒ වාගේම බැඳුම්කරය ගැන හූහක් කථාවක් තිබිලා තිබෙනවා. බැඳුම්කරය හරහාත් වරදක් වෙලා තිබෙනවා නම්, ඒ අයට විරුද්ධවත් ක්‍රියා කරන්න ඕනෑ. මම නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලනවා ඒ නඩු ඉස්සරහට ගෙනෙන්න, ඒ නඩු ඉස්සරහට දමන්න කියා. නැත්නම් රටේ මතයක් ඇති කරනවා, අපි ඒවා යට ගහගෙන සිටිනවා කියා. අපි ඒවා යට ගහන්නේ නැහැ. නඩු පවරන්න කියා නීතිපති දෙපාර්තමේන්තුවෙන් අපි ඉල්ලනවා. අඩුපාඩුවක් තිබෙනවා නම්, ඒ වරද හදාගෙන ඉදිරියට යන්න තමයි අපේ රජය වෑයම් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථාව අවසන් කරනවා. නමුත් මම ආර්ථිකය ගැන ඉක්මනට වචනයක් කියන්න කැමැතියි. මේ වුණු වරද නිසා ආර්ථිකයට විශාල බලපෑමක් වෙලා තිබෙනවා. මම දන්නවා, මංගල සමරවීර ඇමතිතුමා විසර්ජන පනත් කොටුම්පතක් ඉදිරිපත් කළා. මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විසර්ජන පනත් කොටුම්පත තිබෙනවා. ඉක්මනට මේ ප්‍රශ්නය විසඳා ගත්තොත් අපට පුළුවන්,- අද පැහැදිලි වෙයි ජනාධිපතිතුමාට, එතුමා පත් කරපු ඒ රජයට බහුතරයක් නැහැ කියන එක. නමින්ම ඒක පැහැදිලි වෙලා තිබෙනවා. ඒ නිසා දැන් ජනාධිපතිතුමාට පුළුවන් නව අගමැති කෙනෙකුත්, ආණ්ඩුවකුත් පත් කරලා, නැවතත් ඒක ඉස්සරහට ගෙන යන්න. විසර්ජන පනත් කොටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. මේක ඉක්මනට කළොත්, දෙසැම්බර් මාසයේ 10 වනදා වනකොට මංගල සමරවීර මුදල් ඇමතිතුමාට අය වැය කථාව ඉදිරිපත් කරන්න පුළුවන් වනවා. දෙවන වර කියවීමේ සහ කාරක සභා අවස්ථාවේ විවාදයෙන් පසුව ජනවාරි 12 වනදා වනකොට අපට පුළුවන් වනවා, අය වැය සම්මත කර ගන්න. ඒක කළොත් "ආර්ථික අර්බුදය" කියන ප්‍රශ්නය අවම කර ගන්නට අපට පුළුවන්. විසර්ජන පනත් කොටුම්පත දැක්කොත් පෙනේවි, විශේෂයෙන්ම කෘෂිකර්මයට වෙන් කරන ප්‍රතිපාදන සියයට 160කින් වැඩි කර තිබෙනවා; වෙන් කර තිබෙනවා. ඇයි, ඒක කර තිබෙන්නේ? පොහොර සහනාධාරය විතරක් නොවෙයි. තේ, රබර්, පොල්, කුරුඳු සියල්ලටම වෙන් කර තිබෙනවා. ඒ වාගේම මසුන් අල්ලන- මේ රට දූපතක්. මසුන් අල්ලන විශාල ජනගහනයක් සිටිනවා. මේ රට වටේම ඒ අය සිටිනවා. ඒ තාත්තලා, ඒ පරපුර සාමාන්‍යයෙන් ඒක රැකියාවක් හැටියට කළේ; පිටට ගිහිල්ලා මාළු අරගෙන ඇවිල්ලා, රට අවදානමෙන් ඉඳලා ඒක විකුණන එක. නමුත් මේ අය වැය කථාව තුළදී එතුමා ඊළඟ පරම්පරාව ව්‍යාපාරිකයන් ලෙසට පරිවර්තනය කරන්න ක්‍රියා කර තිබෙනවා.

රට පොඩි බෝට්ටුවේ ගිහිල්ලා කුප්පි ලාම්පු එළියෙන් මාළු අල්ලාගෙන එන්න නොවෙයි. රජයේ දායකත්වයෙන් බහුදින යාත්‍රා ලබා දීම එතුමාගේ යෝජනා තුළ තිබෙනවා. රැකියා තිබෙන ව්‍යාපාරිකයන් ඇති කරන්න එතුමා යෝජනා කර තිබෙනවා. මට අධ්‍යාපනය ගැන කථා කරන්න පුළුවන්, සෞඛ්‍යය ගැන කථා කරන්න පුළුවන්. නමුත් මම මගේ කථාව අවසාන කරනවා.

අපි දන්නවා, අද විශේෂයෙන්ම පිට රටවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින ව්‍යාපාරිකයන් ඇවිල්ලා -ඒ අය- ඉදිකිරීම් කරගෙන යන බව. පිට රට සේවකයින් මේ රටට ගෙනෙනවා. අපි තරගකාරීත්වයට විරුද්ධ නැහැ. තරගකාරී වෙන්න ඕනෑ, දේශීය කර්මාන්ත. එහෙම තමයි අපිට ලෝකය ජයග්‍රහණය කරන්න පුළුවන්. නමුත් අසාධාරණ තරගකාරීත්වයට අපි විරුද්ධයි. අපේ රටේ කම්කරුවන්ව ආරක්ෂා කරන්න නීති රීති තිබෙනවා. කම්කරුවන් ආරක්ෂා කරන්න EPF and ETF අනිවාර්යයෙන්ම ගෙවන්න ඕනෑ. නමුත් සමහර රටවල් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ව්‍යාපාර සඳහා සිරකරුවන් ගෙනෙනවා. ඒ වාගේම ඒ අය කම්කරුවන් ආරක්ෂා කරන්නේ නැති නිසා, බොහොම අඩු මට්ටමේ වේතන තමයි ගෙවන්නේ. ඒ අය ඇවිල්ලා කොන්ත්‍රාත්තු ලබා ගන්නවා. අසාධාරණ ලෙස මේ රටේ ටෙන්ඩර් ඉල්ලනවා නම්, ඒක අපි නතර කරනවා. අපි ඒ සඳහා බැඳී සිටිනවා. අපේ දේශීය කර්මාන්ත අපි ආරක්ෂා කරනවා.

අපිට අය වැය කථාව ඉදිරිපත් කරන්න අවස්ථාවක් දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශ්වාස කරනවා ජනාධිපතිතුමා මෙම කටයුතු ඉක්මනට ක්‍රියාත්මක කළොත් අපිට දෙසැම්බර් මාසයේ 10 වැනි දා වෙනකොට අය වැය කථාවත් ඉදිරිපත් කර, රටේ මේ ඇති වුණු විශාල ප්‍රශ්නය විසඳලා මේ රට ඉදිරියට ගෙනියන්න නැවතත් අවස්ථාවක් ලැබෙයි කියා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තූතියි.

මීළඟට, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා.

[අ.භා.1.14]

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ මට කථා කරන්න වැඩිය අවස්ථාවක් ලැබෙන්නේ නැහැ වාගේම මම වැඩිය කථා කරන කෙනෙක් නොවෙයි. නමුත් ඉතාම වැදගත් අවස්ථාවක් වෙනුවෙන් ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව වෙනුවෙන් කථා කිරීමට මට ඉතාම දැඩි අවශ්‍යතාවක් තිබෙන නිසායි, මා පෙනී සිටියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපිට 2015 ජනවාරි 08 වැනි දා මේ රටේ අලුත් ජනාධිපති කෙනෙක් පත් කරන්න සිද්ධ වුණේ, හිටපු ජනාධිපතිතුමාට තව අවුරුදු දෙකක කාලයක් තිබියදීයි. ඒ අවුරුදු දෙකක කාලයේදී රට තුළ කටයුතු කරන්න බැරි බව ඔහු තේරුම් ගත්තා. ඒ නිසා ඔහු අමුතු විධියකට රටේ පෙනී සිටින්නට, කැපී පෙනිලා ඡන්ද අරගෙන එන්නට තමයි සූදානම් වුණේ. ඔහුම දන්නවා, මේ රට තිබුණු තත්ත්වය මොකක්ද කියා. මේ රට ආර්ථික වශයෙන් සහ හැම පැත්තෙන්ම

ඉතාම දුෂිත තත්ත්වයකට පත් වෙලා තමයි තිබුණේ. ඒ නිසා අපි අලුත් ජනාධිපති කෙනෙක් පත් කරගත්තේ, මේ සියලු අභියෝග හමුවේයි. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ අයගෙන් සියයට 90ක්-95ක් පමණ මේකට දායක වෙලා තිබෙනවා. මේ රටේ ඉන්නා අය දේශපාලන පක්ෂ භේදයකින් තොරව තමයි මේ රටට ජනාධිපති කෙනෙක් පත් කර ගත්තේ. එසේ පත් කර ගත්තේ, මේ රටේ දෙකෝටියක් පමණ වන සමස්ත ජනතාවගේ ප්‍රශ්නවලට රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට විසඳුම් ලබා දෙන්නයි. එහෙම නැතුව වෙන් වෙන් වශයෙන් මන්ත්‍රීවරුන්ට වාහන permit ගන්න, හොරකම් කරන්න එහෙම නැත්නම් මේ රටේ ධනය සූරාගෙන කන්න හෝ අල්ලස් ගන්න නොවෙයි මේක කළේ; අපි වාගේ පුංචි මන්ත්‍රීවරුන් මේවාට පත් වුණේ.

අපි 2000දී පත් වුණු මන්ත්‍රීවරුන් විධියට 2010 වනතුරු සිටියා. 2010දී අපි පැරදිලා ආයෙත් 2015දී ආවා. 2011දී මම ප්‍රාදේශීය සභාවට ඉල්ලුවා. 2014දී මම පළාත් සභාවට ඉල්ලලා ආවා. දේශපාලනය වෙනුවෙන්, මිනිසුන් වෙනුවෙන් පොළොවේ පය ගසා ඉන්නා මිනිසුන් හැටියට, මිනිසුන් වෙනුවෙන් දේශපාලනය කරන අය හැටියට අපේ බෙල්ල නොවෙයි, අපේ සමස්ත පරම්පරාව, අපේ දු දරුවෝ පවා මැරුවත් අපි මේ රට බේරා ගන්නවා කියා හිතාගෙනයි, එදා -2015 ජනවාරි 08 වැනි දා- මේ ඡන්දය වෙනුවෙන් ඉදිරිපත් වෙලා අපි අලුත් ජනාධිපති කෙනෙක් පත් කරගත්තේ. හැබැයි, අභියෝග තිබෙන බව අපි දන්නවා. අපේ එක්සත් ජාතික පක්ෂය මෙතෙක් කල් ඉතිහාසයේ මේ රටේ විවිධ අභියෝග දිනුවා වාගේ ඒ අභියෝග පරාජය කරගන්න හැකි බවට අපට දැඩි විශ්වාසයක් තිබුණා. අපේ පක්ෂ නායකතුමා -ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා- සහ අපේ කණ්ඩායම්වලට එකතු වෙලා මේ රට දිනා ගන්න හැකි බවට, මේ රටේ තිබෙන සියලු අභියෝග දිනා ගන්න හැකි බවට අපට විශ්වාසයක් තිබුණා. නමුත් අපිට අවුරුදු තුනක් යනතුරු එසේ කරන්නට ඉඩකඩක් ලැබුණේ නැහැ. රටේ ජනතාව අපව ඇත් කළා, වැඩ කළේ නැහැ කිව්වා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පියවරෙන් පියවර මේ රටේ ආර්ථිකය හදාගෙන ණයතුරුස් ගෙවා ගෙන ඉදිරියට එද්දී -අපි හරියටම මේ රට යම් තැනකට ගෙනෙන්න හදද්දී- තමයි මේ ආණ්ඩුව විසුරුවා මේ අලුත් අගමැති කෙනෙක් පත් කරනවාය කියා ඉතාම පහත් දෙයක් කළේ. මේ රටේ ජනතාවගේ ඡන්දය ගැන කිසිම වගවිභාගයක් නැතුව ජනාධිපතිතුමා මේ කරපු කාර්යය නිසා අද රට අස්ථාවර වෙලා තිබෙනවා. මේ අස්ථාවර වීම තුළ අපට අවුරුදු 50කින්වත්, 100කින්වත් ආයෙත් රට ඉස්සරහට ගන්න බැරි මට්ටමට පත් වුණා. ඒක කවුරුත් දන්නා කාරණයක්.

අපි "ගම්පෙරළිය" නමින් මේ රටේ විවිධ සංවර්ධන ව්‍යාපෘති ගෙන ඒමට කටයුතු කළා. සියලු පාසල්, උසස් අධ්‍යාපන ආයතන දියුණු කරන්න කටයුතු කළා. මම ඉගෙන ගත්ත මිනුවන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය දියුණු කරන්න අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 1,000ක් පාස් කර ගත්තා. ඒ මුදල් අපට ගන්න නොවෙයි, පාස් කර ගත්තේ. ඒ මුදල්වලින් එම පාසල දියුණු කරන්න කටයුතු කළා. මීට පෙර ඒ පාසල දිහා කවුරුවත් බැලුවේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලංකාව වටේම හැම මන්ත්‍රීවරයකුම මේ කටයුත්ත කළා. එහෙම කටයුතු කරගෙන එද්දීයි අපි එදා පත් කරගත්ත ජනාධිපතිවරයා ආණ්ඩුව විසුරුවා හරින්න කටයුතු කළේ. මම කාටවත් ඇඟිල්ල දිගු කර චෝදනා කරන්න, අපහාස, උපහාස කරන්න සූදානම් වන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් බොහොමයක් අපේ මිතුරන්. ඒ අයත් එක්ක අපි හොඳින් ඉන්නවා. නමුත්, අපි මේ පාර්ලිමේන්තුවට පත් වුණු අරමුණ ගැනයි මා මේ කථා කරන්නේ. රටේ ඉන්න දෙකෝටියක් ජනතාවටම මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙන්න බැරි නිසයි 225දෙනකු තෝරා පත්කර එවා තිබෙන්නේ. ඒ 225 දෙනා අතර අඩු වැඩි වශයෙන් වැරදි කරන අය, හොඳ වැඩ කරන අය, වඩාත් හොඳින් සේවය කරන අය, බුද්ධිමත් අය, උගත් අය බොහෝ පිරිසක් ඉන්නවා. නමුත්, අප සියලු දෙනාගේ අරමුණ විය යුත්තේ මේ රට සංවර්ධනය කරන්න; දියුණු කරන්න කටයුතු කිරීමයි. ඒ කාර්යය කිරීම සඳහා, අපි භාර ගත්ත රජය, අපට ලැබුණු රජය, දුෂ්කරතා තිබුණු රජය යම් තත්ත්වයකට ගෙනෙන්න හදද්දී තමයි අද අපට මෙවැනි කඩ ඉමක්, බාධාවක් ඇති වුණේ. මේක එතරම් හොඳ දෙයක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවට මම 2000 වසරේ පත් වෙලා ආවත් 2000 වසර ඉවර වෙද්දිම මට මන්ත්‍රීකම නැතිව ගියා. මොකද, හිටපු ජනාධිපතිවරයා ඒ පැවැති ආණ්ඩුව විසුරුවා හැරියා. ඊට පස්සේ අපි 2001 ආණ්ඩුව අරගෙන අවුරුදු දෙකක්, තුනක් ඉන්න හම්බ වුණේ නැහැ, ආණ්ඩුව විසුරුවා හැරියා. මේ රටේ ජනතාවගෙන් අපි ඡන්දය ඉල්ලුවේ අවුරුදු 5ක් වැඩ කරන්නයි. මම මේ කියන්නේ මට පෞද්ගලිකව සිද්ධ වුණු දෙය. ඒ ඒ ආණ්ඩුවලදී මේ දේ සිදු වුණු තව ගොඩක් අය ඉන්නවා.

ඊළඟට, 2015 අපි ආණ්ඩු බලය ගත්තාම දැන් නැවතත් විවිධ දේවල් කරලා ආණ්ඩුව විසුරුවා හරින්න කටයුතු කිරීම තුළ අපේ ක්‍රියාකාරකම් අඩාළ කර තිබෙනවා. කාටවත් අපට විරුද්ධව ඇඟිල්ල දිගු කරන්න පුළුවන්ද, මන්ත්‍රීවරුන් හැටියට අපි අසවල් වැරැද්ද කළාය, අසවල් චෝදනාව තිබෙනවාය, අසවල් දුෂිත වැඩේ කළාය, අසවල් පගාව ඉල්ලුවාය කියලා? අපට විරුද්ධව ඒ කිසි දෙයක් කියන්න පුළුවන්ද? අපි හැම වෙලාවේම අපේ ගම්වලට ගිහිල්ලා අපට ඡන්දය දුන්නු මිනිසුන්ගේ දුක් ගැනවිලි සොයා බලන්නේ, මළ ගෙදර, මඟුල් ගෙදර ඇතුළු හැම දෙයකටම අපි සහභාගි වෙන්නේ ඒ මිනිසුන්ගේ ඕනෑ එපාකම් පිරිමසා, ඒ මිනිසුන් සතුටින් තියලා, සැනසිල්ලේ ඉන්න පුළුවන් වාතාවරණය හදන්නයි. අපි ඉතාම අස්ථාවර තත්ත්වයක තිබුණු ආණ්ඩුවක් භාරගෙන තිබියදී තමයි වර්තමාන ජනාධිපතිවරයා ආණ්ඩුව විසුරුවා හරින්න කටයුතු කළේ. දැන් අද පෙන්වා දුන්නා, පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන්නේ කාටද කියලා. ඒ නිසා එතුමාට යුතුකමක් තිබෙනවා, මේ අපරාධයට තවත් ඉඩ දෙන්නේ නැතිව, නැවත වතාවක් කැබිනට් එක කැඳවා, අලුත් කැබිනට් එක පත් කරලා අපේ අගමැතිතුමා නැවත වතාවක් ස්ථාවරව පත් කරලා මේ කටයුතු ඉදිරියට අරගෙන යන්න. ඒ කාරණය තමයි අපි විශේෂයෙන්ම මතක් කරන්නේ.

රටක ආණ්ඩුවක් වෙනස් කරන්න ජනාධිපතිතුමාට අවස්ථා කිහිපයයි තිබෙන්නේ. රාජාසන කථාව පැරැද්දුවොත්, විසර්ජන පනත් කෙටුම්පත එහෙම නැත්නම් අය වැය පැරැද්දුණොත්, අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස් වුණොත් එහෙම නැත්නම් විශ්වාස භංගයකින් පැරදුණොත් එවැනි අවස්ථාවලදීයි එසේ කරන්න පුළුවන්. නමුත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, මේ කිසිදු දෙයක් සිදු වුණත්, අවුරුදු හතරහමාරක් යනතුරු ආණ්ඩුව විසුරුවා හරින්න බැහැ. මම නීතිඥයකු නොවෙයි. නමුත්, මේ පාර්ලිමේන්තුවේ ඉදගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මේ නීති පොත් කියවද්දී ඒවායේ සඳහන් වෙලා තිබුණේ එහෙමයි. නමුත්, ඒ කිසිවකටත් හිස නොනමා මේ කළ කටයුත්ත ඉතාම පහත් කටයුත්තක් හැටියට මම දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක පියවරෙන් පියවර ඉස්සරහට එන්නේ මිනිසුන්ගේ දියුණුව, විනයගරුක බව සහ ශිෂ්ට සම්පන්න බවයි. අපි ගෝත්‍රවාදී මිනිසුන් හැටියට නොසිට දිනෙන් දින දියුණු මිනිසුන් හැටියට රටට ගැළපෙන, රට දියුණු කරන, ශිෂ්ට සම්පන්න මිනිසුන් බවට පත් කරන, විනයගරුක මිනිසුන් බවට පත් කරන ක්‍රමවේදයේ එක අංගයක් තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ. අපි ඒ ව්‍යවස්ථාව සම්මත කර ගන්නේ මහජනතාව පත් කර ගත් මහජන නියෝජිතයන්ගෙනුයි. ඒ මහජන නියෝජිතයන් 225 දෙනා එකතු වෙලා සම්මත කරගෙන ගෙනාපු මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට රටේ ප්‍රධානියා ගරු කරන්නේ නැත්නම්, හිස නමන්නේ නැත්නම්

[ගරු එඩ්වඩ් ගුණසේකර මහතා]

එය, අර මා සඳහන් කළ ශිෂ්ට සම්පන්නභාවයට, ඒ විනයගරුක භාවයට හිස නොනැමීමක් හැටියටයි අපි දකින්නේ. එහෙම නම් එතුමා අශිෂ්ට ක්‍රියාවකුයි කරන්නේ. ඒ නිසා අපි අපේ ඡන්දයෙන් පත් කරපු ගරු ජනාධිපතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, එක කාරණයක්. අද අපි පෙන්වා දුන්නා, එතුමාගේ කැමැත්තට අකැමැති, එතුමා කරපු දෙයට අකැමැති, එතුමාගේ කටයුතුවලට අකැමැති අය 121 දෙනකු මේ පාර්ලිමේන්තුවේ ඉන්න බව. ඒ නිසා කරුණාකර, පෙර තිබූ පරිදි-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අස්ථාවර කරපු මේ තත්ත්වය කරුණාකරලා වෙනස් කරලා, අපි ගෙනා සංවර්ධන ක්‍රියාදාමයන් හැම එකක්ම නැවත වතාවක් හරිහැටි ක්‍රියාත්මක කරන්න මනුෂ්‍යත්වයේ නාමයෙන්, දෙවියන්ගේ නාමයෙන් කටයුතු කරන්නය කියා මා ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහෙම නැතුව ඔබතුමා ගැන විවේචනය කරන්නවත්, අනික් පැත්තේ සිටි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ගැන වෝදනා කරන්නවත් අපට අවශ්‍යතාවක් නැහැ. මේ රටේ අහිංසක, දුප්පත් මිනිසුන්ගේ ඡන්දයෙන් මේ පාර්ලිමේන්තුවට පත් වුණු අය කරපු දෙයින් ඒ මිනිස්සු ඉතාම අසරණ තත්ත්වයට පත්වෙලා තිබෙනවා; අද පක්ෂ, පාට භේදයකින් තොරව එයට ශාප කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කටයුත්ත කරපු අයට ඔබතුමා මාර්ගයෙන් මේ කාරණය මා දැනුම් දෙනවා. මෙම තත්ත්වය වෙනස් කරලා, හරිහමන් තැනට ගෙනෙන්න හැකි තැනකට අපි කටයුතු හදා තිබෙනවා. අද ඡන්දය විමසුවා; ඡන්දයෙන් ප්‍රතිඵල පෙන්නුවා. ගරු ජනාධිපතිතුමනි, දැන් ඔබතුමාට තිබෙන්නේ, එදා සෝභිත ස්වාමීන් වහන්සේ ඉදිරිපිට දුන් දිවුරුම අනුව ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු හැටියට කටයුතු කරන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ වෙද්දී මේ රටට සුළුවෙන් හෝ අහිමි වුණු දේවල් කොපමණද කියා බලන්න. IMF funding worth of US Dollars 1.85 billion has been stopped. USA funding worth of US Dollars 490 million and Japanese funding worth of US Dollars 1.4 billion have been stopped. Investment taken out from the Sri Lankan share market is Rs. 30 billion. එතකොට අපට බිලියන 100ක පමණ අඩු වීමක් ඇති වෙමින් යනවා.

ඒ විතරක් නොවෙයි, අපේ tourism industry එක ගැන බලන්න. මා ජීවත්වන මීගමුව ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයෙන් ජීවත් වන්නන්ගේ සියලුම සංචාරක ඇණවුම් අද cancel වෙලා තිබෙනවා. ඩෙංගු උවදුර නිසා පසුගිය අවුරුද්දේ මේ දෙයම සිද්ධ වුණා. ඊට එහා ගිය වසංගතයක් අද නැවත වතාවක් මෙයින් ඇති වුණා. There is a high risk of losing the GSP Plus. Human rights පිළිබඳව අපේ රටට නැවත වතාවක් බලපෑමක් ඇති වෙනවා. මේ අනුව මේ රටේ ජීවත්වන ලාංකිකයන් හැටියට අපට අද දරන්න බැරි විශාල පාඩුවක් ඇතිවෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, එහෙම තත්ත්වයක් ඇති වුණාම, "මේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මිනිසුන්, මේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මිනිසුන්, මේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ මිනිසුන්" කියලා නොවෙයි, සමස්ත රටේ ජනතාවටම පාඩුවක් සිද්ධ වන්නේ කියලා. මෙය ඒ මිනිසුන්ගේ ආර්ථිකයට සිද්ධ වන පාඩුවක්. අධ්‍යාපනික වශයෙන් මෙය විශාල පාඩුවක්. ලබන දෙසැම්බර් මාසයේ දරුවන්ගේ විභාගයක් තිබෙනවා. මේ හැම දෙයකටම මේ රටේ අස්ථාවරභාවය ඉතාම දැඩි ලෙස බලපානවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හරිහමන් නායකයෝ මේවා ගැනයි බලන්න ඕනෑ. රටකට නායකයන් පත් කරන්නේ පෞද්ගලිකව එක් කෙනකුගේ, දෙදෙනකුගේ අවශ්‍යතාව පිරිමහන්න නොවෙයි. මේ රට කරන නායකයන් පත් කළේ විශාල බලාපොරොත්තු ඇතිවයි. මේ නායකයා පත් කළේ මීටත් වඩා එහා ගිහින් තිබුණු මේ රටේ සමස්ත දුෂිත ක්‍රියා නවත්වා මේ රටේ මිනිසුන්ට හැම දෙයක්ම හරියාකාරව, නිසියාකාරව, සාධාරණව ඉෂ්ට කරන්නයි. එය සහමුලින්ම, එහෙමපිටින්ම කඩා දැම්මාම මොන තරම් ශාපයක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මා දිහා බලන්නේ මට වෙන් කර තිබෙන කාලය අවසන්වෙලා තිබෙන නිසා කියලා මට තේරෙනවා. අවසාන වශයෙනුත් මා කියනවා, අද නිල වශයෙන් ඡන්දය විමසීමෙන් පසුව මන්ත්‍රීවරුන් 121දෙනෙක් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් මේ පාර්ලිමේන්තුවේ තත්ත්වය පෙන්වා දුන්නාය කියලා. මීට පෙර කළ ඡන්ද විමසීම ඒ ගොල්ලෝ පිළිගන්නේ නැහැයි කිව්වා. එය නොපිළිගන්න විධියක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත්, මමත් ඇතුළුව මේ හැම කෙනෙක්ම දන්නවා, මේ පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම කරන්නේ "Aye" කියලා, හඬින් ඡන්දය විමසන එකයි කියලා. ඒක පිළිගන්නේ නැති නිසා මේ කරන සියලු දේ වෙනුවෙන් මන්ත්‍රීවරුන් 121දෙනකු පෙනී සිටින බව අද පෙන්වා දුන්නා. අද ඒක හරිහැටි දැකලා, එදා 2015 ජනවාරි 08වන දා මේ රටේ සමස්ත ජනතාව එකතුවෙලා ජනාධිපතිතුමා පත් කර ගැනීමෙන් ඇති කර ගත් ඒ බලාපොරොත්තුව කරුණාකරලා ඉෂ්ට කරන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ කථාව නිමා කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා.

[ප.ප. 1.27]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை சம்பந்தமாக இங்கு பலர்

பல்வேறு கருத்துக்களைச் சொன்னார்கள். கடந்த 15ஆம், 16ஆம் திகதிகளில் இப்பாராளுமன்றத்தில் நடந்த வன்முறை சம்பந்தமாகக் கருத்துத் தெரிவிக்கவேண்டிய கடமை எனக்கு இருக்கிறதென்றபடியால், இந்த ஒத்திவைப்புப் பிரேரணை தொடர்பான விவாதத்தின்போது, அதற்காகக் குறிப்பிட்ட சில நிமிடங்களைப் பயன்படுத்துவதற்கு அனுமதிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

உண்மையிலே இச்சபையானது இந்த நாட்டிலே மிக முக்கியமான ஒரு சபையாகும். இந்த உயரிய சபையிலே சபாநாயகர் எனப்படுபவர், மிக முக்கிய பதவியை வகிக்கின்றார். அதுமாத்திரமன்றி, உயர் தன்மை கொண்ட ஒரு பதவியாகவும் அது இருக்கின்றது. சனாதிபதி, பிரதமர், சபாநாயகர் என்ற ஒழுங்கின் அடிப்படையிலேதான் இந்த நாடு செயற்படுகின்றது. கடந்த 15ஆம் திகதி சபாநாயகரின் தலைமையிலே நாடாளுமன்றம் கூடியபோது, அவரது பாதுகாப்புக்குப் பங்கம் ஏற்படும் வகையில் நாடாளுமன்ற உறுப்பினர்கள் சிலர் செயற்பட்டமையானது உண்மையிலே கண்டிக்கத்தக்கது. இந்த நாட்டிலே சிவில் நிர்வாகமானது பொலிஸாரின் கடமை வழியில் இடம்பெறுகின்ற அதேநேரத்திலே, சபையினுள் சபாநாயகருக்கு உறுப்பினர்களால் ஏற்படுத்தப்பட்ட அபகீர்த்தியும் அவர் மீதான தாக்குதல் முயற்சியும் மிக வன்மையாகக் கண்டிக்கப்படவேண்டியதாகும். அந்த வேளையிலே மிகவும் பாதுகாப்பற்ற ஒரு சூழலிலே சபாநாயகர் இருந்ததை எண்ணி உண்மையிலே நாங்கள் கவலை கொள்ளவேண்டும். அன்று நான் சபாபீடத்திற்கு அருகிலே நின்றிருந்தேன். சில பாராளுமன்ற உறுப்பினர்கள் சபாநாயகருக்கு எதிராக மிக மோசமான வார்த்தைகளைப் பிரயோகித்து அவரைத் தாக்க முனைந்தமை இந்த நாட்டுக்குப் பாரிய அபகீர்த்தியை ஏற்படுத்திக் கொடுத்திருக்கிறதென்பதை இங்கு குறிப்பிட வேண்டும்.

நாடாளுமன்றக் குடும்பத்திலே நீங்களும் நானும் சபாநாயகரும் பாராளுமன்றச் செயலாளர்களும் இருக்கின்றோம். மக்களால் தெரிவு செய்யப்பட்டவர்கள்தான் நாடாளுமன்ற உறுப்பினர்களாக இங்கு வருகின்றார்கள். குறித்த ஒரு நாடாளுமன்ற உறுப்பினரின் நடத்தை சரியில்லை என்று சொன்னால், அந்த மாவட்ட மக்களுக்கும் அது இழுக்காகும். எங்களுக்கு வாக்களித்து, எங்களை நாடாளுமன்றத்துக்குத் தெரிவு செய்து அனுப்பிய மக்களுடைய மரியாதையைக் காப்பாற்றவேண்டியது பாராளுமன்ற உறுப்பினர்களாகிய எங்களது கடமையாகும். ஆனால், இன்று தங்களைத் தெரிவு செய்த மக்களைத் தலைகுனிய வைத்த நிகழ்வு இந்த நாட்டிலே நடைபெற்றிருக்கிறது. அதனை ஒருக்காலும் ஏற்றுக்கொள்ள முடியாது.

சபாநாயகரது கதிரையைச் சேதப்படுத்தியதை, சட்டப் புத்தகங்களால் வீசி எறிந்து தாக்குதல் நடத்தி இன்னும் மோசமான நிலைமையை ஏற்படுத்தியதை 16ஆம் திகதி காணக்கூடியதாக இருந்தது. இன்றைக்கு இவ்விடயம் வெளியிலே பலராலும் மிக மோசமாக விமர்சிக்கப்படுகிறது. "கடைகளிலே மிளகாய்த்தூள் தீர்ந்துபோய் இருக்கிறது; பாராளுமன்றத்திலே மிளகாய்த்தூள் வாங்க முடியுமா?" என்று எங்களிடம் மக்கள் தொலைபேசியினூடாகக் கேட்கிறார்கள். "இந்த நாடாளுமன்ற உறுப்பினர்களை அழைத்து வந்து, அடிதடியிலே இறக்கி எங்களுடைய பிரதேசத்திலே இருக்கின்ற பிரச்சினைகளைத் தீர்த்துத் தரவேண்டும்" என்று அவர்கள் கேட்கின்ற அளவுக்கு ஒரு கேவலமான விமர்சனத்துக்கு இந்தப் பாராளுமன்றம் உள்ளாகி இருக்கிறது. ஆகவே, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சபாநாயகருக்கு இழைக்கப்பட்ட அநீதியானது தட்டிக் கேட்கப்பட வேண்டும்; இந்த உயர் சபையிலே மிக மோசமாக வன்முறையிலே ஈடுபட்டவர்கள் தண்டிக்கப்படவேண்டும். அதைவிட, இந்த நாடாளுமன்றத்திலே உள்ள கட்சிகளுக்கு தலைமை தாங்குகின்ற தலைவர்களுக்குத் தங்களுடைய கட்சிப் பிரதிநிதிகளைக் கட்டுப்படுத்துகின்ற கடமையும் பொறுப்பும் இருக்கின்றது. அவர்கள் பார்வையாளர்களாக இருந்து சம்பந்தப்பட்ட நாடாளுமன்ற உறுப்பினர்களைத் தட்டிக் கொடுக்கின்ற வகையிலே செயற்படக்கூடாது என்பது என்னுடைய கருத்தாகும். பாராளுமன்றச் செயலாளர்கள் மூவரும் கடந்த 14ஆம், 15ஆம் திகதிகளில் மிகவும் நெருக்குதலுக்கு உள்ளான நிலையிலேயே காணப்பட்டார்கள். அவர்களைக் கட்டுப்படுத்திய, நெருக்குதலுக்கு உள்ளாக்கிய சந்தர்ப்பங்கள் இந்த நாடாளுமன்றத்திலே அரங்கேறின. ஆகவே, நான் கூறுவது என்னவென்றால், இந்தச் சபையிலே இனியும் இவ்வாறான சம்பவங்கள் நடைபெறக்கூடாது என்பதாகும்.

இந்த உயர் சபை சட்டங்களை இயற்றுகின்ற ஒரு சபையாகும். ஆனால், இன்று சட்டங்களை இயற்றுகின்ற பொறுப்பினையும் உயர் அந்தஸ்தையும் கொண்ட இந்த நாடாளுமன்றத்தின் பாதுகாப்பு கேள்விக் குறியாகியிருக்கின்றது. சபாநாயகர் அவர்களுக்கும் பாராளுமன்றச் செயலாளர்களுக்கும் சில நாடாளுமன்ற உறுப்பினர்களால் ஆபத்து ஏற்படுகின்றதென்றால், சாதாரண மக்களுடைய பாதுகாப்பு எப்படி இருக்கும் என்பதை நாம் சற்றுச் சிந்தித்துப் பார்க்க வேண்டும். இவ்வாறு நடந்துகொண்ட நாடாளுமன்ற உறுப்பினர்கள் யாராக இருந்தாலும், எந்தக் கட்சியைச் சேர்ந்தவர்களாக இருந்தாலும் - ஐக்கிய தேசிய கட்சியாக இருக்கலாம், ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியாக இருக்கலாம் - அவர்கள் தண்டிக்கப்பட வேண்டும். ஏனென்றால், இங்கு மிக மோசமான வன்முறை இடம்பெற்றிருக்கிறது. சபாநாயகர் அவர்களை நோக்கிப் புத்தகங்கள் எறியப்பட்டன; குப்பைக் கூடைகள் எறியப்பட்டன. எந்த நாட்டிலும் இடம்பெறாத, இந்த நாட்டுக்கு அபகீர்த்தியை கொண்டு வருகின்ற இப்படியான மோசமான செயல்கள் இடம்பெறக்கூடிய சந்தர்ப்பத்தை இனி ஒருக்காலும் உருவாக்கக்கூடாது. ஆகவே, சம்பந்தப்பட்டவர்களுக்கு உரிய தண்டனையை வழங்குகின்றபோதுதான் எதிர்காலத்தில் இவற்றைத் தவிர்க்கக்கூடியதாக இருக்குமென்பதைக் கூறிக் கொள்கின்றேன். உண்மையிலேயே நடந்த சம்பவங்களை நன்றாக விசாரித்து, அதற்கான தண்டனையையும் பெற்றுக்கொடுக்க வேண்டும். கௌரவ சபாநாயகர் அவர்கள் பக்கச்சார்பற்ற முறையில் செயற்பட்டிருக்கிறார்; நிலையியற் கட்டளையினூடாக நீதியை நிலைநாட்டியிருக்கிறார் என்பது என்னுடைய கருத்தாகும். ஆகவே, இந்த உயர் சபையிலே சபாநாயகருக்கும் பாராளுமன்றச் செயலாளர்களுக்கும் இழைக்கப்பட்ட அபகீர்த்திகளைக் கண்டிக்கின்ற வகையிலே, சட்டப் புத்தகங்கள் கிழித் தெறியப்பட்ட சம்பவங்களைக் கண்டிக்கின்ற வகையிலே கௌரவ சபாநாயகர் அவர்கள் விசாரணை மேற்கொள்ள வேண்டுமென்று கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු වසීර අබේවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.35]

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථමයෙන් අපේ ගරු කථානායකතුමාට මම ස්තුතිය පළ කරන්න ඕනෑ. රට ඉතා අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දී තිබෙන වේලාවක, පසුගිය දවස් 27ක කාල සීමාව තුළ දේශබන්දු කරු ජයසූරිය මැතිතුමා සමස්ත ජාතිය වෙනුවෙන් ජාතික මෙහෙවරක් ඉටු කර තිබෙනවා. එම නිසා මගේ අදහස් ප්‍රකාශ කිරීමට පෙර ගරු කථානායකතුමාට ජාතියේ ගෞරවයත්, ස්තුතියත් පුද කිරීමට මම කැමැතියි. 1994 සිට මේ පාර්ලිමේන්තුවේ සිටි මහජන නියෝජිතයෙක් හැටියට මගේ ජීවිතයේ මම දැකපු ඉතාම අවාසනාවන්ත අවස්ථාවක් හැටියට මේ අවස්ථාව හඳුන්වන්න පුළුවන්. මීට පෙර සිටි ගරු කථානායකවරුනුත් මේ සභාවේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා විවිධ අවස්ථාවල පොලිස් නිලධාරීන් මේ සභාවට කැඳවා තිබෙනවා. ඒ කිසිම අවස්ථාවක පොලිස් නිලධාරීන් මුහුණ නොදුන් තත්ත්වයකට තමයි ඔවුන් මෙවර මුහුණ දුන්නේ. එම පොලිස් නිලධාරීන් නිරායුධ පොලිස් නිලධාරීන්. එම නිරායුධ පොලිස් නිලධාරීන් ආරක්ෂක වළල්ලක් සේ සිටින අවස්ථාවක තමයි මහජන නියෝජිතයන් ඔවුන්ට පහර දුන්නේ. එය සමස්ත ජාතියම දැක්කා. ඒ අවස්ථාවේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කළ කැප කිරීම වෙනුවෙන් සමස්ත රාජ්‍ය නිලධාරීන්ටත්, පොලිස් නිලධාරීන්ටත්, සමස්ත සේවක මණ්ඩලයටත් ජාතියේ ගෞරවයත්, ස්තුතියත් පුද කරන්න මම කැමැතියි.

පසුගිය 26වැනි දින ඓතිහාසික වැරැද්දක් සිදු වුණා. අග්‍රාමාත්‍ය ධුරයේ පුරප්පාඩුවක් නොමැති අවස්ථාවක ව්‍යාජ අග්‍රාමාත්‍යවරයෙක් -හොර අගමැතිවරයෙක්- මේ සභාවට පත් වුණා. ව්‍යාජ අගමැතිවරයෙක් -හොර අගමැතිවරයෙක්- පත් වුණාම ඉවත් කරන විධිය මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොහේවත් සඳහන් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

හොරෙන් ආවත්, ව්‍යාජ ලෙස ආවත් එවැනි අගමැතිවරයෙක් ඉවත් කළ යුතුව තිබෙන්නේත් නීත්‍යානුකූල ක්‍රමයකටයි. ව්‍යාජ අගමැතිවරයා ඉවත් කළ යුත්තේත් නීත්‍යානුකූල ක්‍රමවේදයටයි. ඒ නීත්‍යානුකූල ක්‍රමවේදයට ව්‍යාජ අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම අවස්ථා දෙකකදී සිදු කරලා තිබෙනවා. අග්‍රාමාත්‍යවරයාට විරුද්ධව පමණක් විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්න බැහැ. විශ්වාසභංග යෝජනාවක් සමස්ත අමාත්‍ය මණ්ඩලයට විරුද්ධවයි ගෙනෙන්න පුළුවන්. ඒ අනුව අපි අමාත්‍ය මණ්ඩලයට විරුද්ධව විශ්වාසභංග යෝජනා දෙකක් ගෙනැල්ලා සම්මත කළාට පස්සේ, ජනාධිපතිවරයාට නැවත ඒ ගැන වගකීමක් තිබෙනවාය කියලා මම හිතන්නේ නැහැ. පාර්ලිමේන්තුවටයි ඒ වගකීම තිබෙන්නේ. පාර්ලිමේන්තුව විසින් විශ්වාසභංග යෝජනාවකින් ඒ රජය අවසන් කළාට, ඒ අගමැති අහෝසි කළාට -නීත්‍යානුකූලව ඉවත් කළාට- පස්සේ ඒ ව්‍යාජ අගමැතිවරයා නීත්‍යානුකූල අගමැතිවරයෙක් වෙන්නේ නැහැ. ව්‍යාජ අගමැතිවරයා ව්‍යාජ අගමැතිවරයෙක්මයි. ව්‍යාජ අගමැතිවරයා නීත්‍යානුකූලව ඉවත් කිරීමෙන්, නීත්‍යානුකූල අගමැතිවරයෙක් හිටපු බවක් කියැවෙන්නේ නැහැ. ඒ නිසා නීතියේ මොන තර්ක තිබුණත් ඒ අගමැතිවරයා ඉවත් කළාට පසු, සාමාන්‍ය ක්‍රමවේදය අනුව ගිය මාසයේ 26 වෙනි දා තිබුණු තත්ත්වයට මේ පාර්ලිමේන්තුවත්, රටත් පත්විය යුතුව තිබෙනවා. එය නීති තර්කයක් නම්, එය අධිකරණයේ තිබෙන තර්කයක් නම් අපි එය වෙනම විසඳා ගත යුතුව තිබෙනවා. කෙසේ වෙතත්, අග්‍රාමාත්‍ය ධුරයේ පුරප්පාඩුවක් නොමැති අවස්ථාවක ගිය මාසයේ 26 වෙනි දා රාත්‍රියේ හදිසියේ, රහසේ ව්‍යාජ අග්‍රාමාත්‍යවරයෙක් පත් කිරීම ජාතියට වුණු මහා කම්පනයක්; ජාතියට වුණු මහා වැරැද්දක්. ඒ අවස්ථාවේ සිට දිගටම සිදුවන සියලු ක්‍රියා නීති විරෝධී ක්‍රියා හැටියට තමයි ජාතිය හමුවේ තිබෙන්නේ.

අපි මෙවැනි අවස්ථා දැක තිබෙනවා. 1993දී දකුණු පළාත් සභාවේ සිදු වූ මෙවැනි අවස්ථාවක් මා දැක්කා. එක දවසක් උදේ දිවංගත එම්.එස්. අමරසිරි මැතිතුමා මහ ඇමති හැටියට දිවුරුම් දුන්නා. ඊට පහුව දා දොඩම්ගොඩ මැතිතුමා මහ ඇමතිතුමා හැටියට දිවුරුම් දුන්නා. ඊට කලින් දවසේත් ඇමතිවරු කිහිප දෙනෙක් දිවුරුම් දුන්නා. ඒ සමහර ඇමතිවරු කැඳවාගෙන ඇවිල්ලා හංගාගෙන හිටියා. එදා අපි, එක්සත් ජාතික පක්ෂය ෆ්‍රැන්සිස්කු ඇමතිවරයා ගෙනැල්ලා හංගාගෙන හිටියා. අවසානයේ, 1994 වෙනකොට සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයම සමාජය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. ඒ එදා පළාත් සභාවේ ඇති වූ තත්ත්වය. ඒ තත්ත්වය අද පාර්ලිමේන්තුව තුළ ඇති වෙලා තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැති අවස්ථාවක ව්‍යාජ අගමැතිවරයෙක් ඉවත් කිරීම සඳහා අනුගමනය කරන්න තිබෙන්නේත් නීත්‍යානුකූල ක්‍රමවේදයමයි. ඒ නිසා අපි හිතන්න ඕනෑ, අනාගතයේ දී මෙවැනි ව්‍යාජ අගමැතිවරයෙක් ආවොත් හදිසියේම ගන්නා තීරණ මොනවාද කියලා. මේ සිද්ධියෙන් අපි පාඩමක් ඉගෙන ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුතින් ඇතුළත් කළ යුතුව තිබෙනවා, එවැනි අවස්ථාවක ගත යුතු හදිසි පියවර මොනවාද කියලා. මේ නිසා අද මුළු මහත් රාජ්‍ය යාන්ත්‍රණයම අකර්මණ්‍ය වෙලායි තිබෙන්නේ. රාජ්‍ය යාන්ත්‍රණයට වගකියන්න පුළුවන් අගමැතිවරයෙක් ඉන්නවා, ඇමති මණ්ඩලයක් ඉන්නවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52.(1) වෙනි ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට පුළුවන් අමාත්‍යාංශවලට ලේකම්වරු පත් කරන්න. හැබැයි, 52. (2) ව්‍යවස්ථාව අනුව කියැවෙන්නේ, ඒ පත් වෙන ලේකම්වරයා විෂය භාර ඇමතිවරයා විසින් දෙනු ලබන නියෝග සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බැඳී ඇත්තේය කියලායි. එහෙම නම්, දැනට ඇමතිවරු නැති නිසාත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 දෙනෙක් පමණක් ඉන්න නිසාත්, පාර්ලිමේන්තුව නැවත ගිය මාසයේ 26 වෙනි දා තිබුණු තත්ත්වයට පත්වෙලා තිබෙන නිසාත් සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයම කඩා වැටීමක් සිදුවෙලා තිබෙනවාය කියලා මම හිතනවා.

මෙවැනි අවස්ථාවක ජාතියක් විධියට අපට විශේෂ යුතුකම් කිහිපයක් තිබෙනවා. මේ ගැටලුව විසඳා ගැනීම සඳහා සියලු දේශපාලන පක්ෂ එකට පෙළගැහිලා තිබෙනවා. ඇත්තවශයෙන්ම මේ කියන රජයට බහුතරයක් ඉන්නවා නම්, මෙය ජාතික අවශ්‍යතාවක් නම් -ජාත්‍යන්තර වශයෙනුත් දේශීය වශයෙනුත් ලංකාව කඩා වැටෙන තත්ත්වයක් තුළ- ඒ රජයේ යුතුකම තමයි අද රට හරි පාර්ලිමේන්තුව කැඳවලා ඔවුන්ගේ බහුතරය පෙන්වන එක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(2) යටතේ තිබෙනවා, හදිසි කාරණයක් සම්බන්ධයෙන් ස්ථාවර නියෝග සියල්ල අත්හිටුවලා ක්‍රියාත්මක වෙන්න පුළුවන් කියලා.

දැන් එය ක්‍රියාත්මක නොකර පැනලා යනවා; දුවලා යනවා; ගහ ගන්නවා. අවුරුදු විස්සක් තිහක් මේ පාර්ලිමේන්තුවේ හිටපු පළපුරුදු අය ඔබතුමා වාඩි වෙලා ඉන්න පුටුව ඇද ගෙන ගිහින් පහළට දමනවා; පොත් ටික පොළවේ ගහනවා; ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට බලය රැක ගන්න පුළුවන්ද කියලා බලනවා. මේ ඛේදජනක අවස්ථාවේ, මුළු මහත් ජාතියක් විනාශ කර තිබෙන අවස්ථාවේ අපේ යුතුකම තමයි නිවැරදි පාරට රට යොමු කර ගැනීම. ඒ සඳහා පාර්ලිමේන්තුව හැටියට අපි සියලුදෙනාම කැප විය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රජය හැටියට බැලුවා මේ ප්‍රශ්නය ප්‍රජාතන්ත්‍රවාදීව විසඳාගන්න. මේ වැරදි ක්‍රියා පිළිවෙත ගැන අපි සමස්ත ජනතාවම දැනුවත් කරමින් ඉන්නවා. 26 වැනි දා ඒ ක්‍රියාවලියෙන් පස්සේ තවත් වැරදි ගණනාවක් සිදු වුණා. ඊළඟට, පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. නමුත් පාර්ලිමේන්තුව විසුරුවන්නට ජනාධිපතිවරයාට බලයක් නැහැ. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය 2015 ජනවාරි 8 වැනි දා ජනවරම අනුව විය යුතුයි. 2015 ජනවාරි 8 වැනි දා අපි ඉල්ලුවේ "මෛත්‍රී ජනපති - රනිල් අගමැති" කියන ජනවරමයි. සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් - හැම භාෂාවකින්ම- මුද්‍රණය කරලායි අපි ඒ ජනවරම ඉල්ලුවේ. ජනමත විචාරණය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වැනි ව්‍යවස්ථාව භාවිත නොකළත්, "මෛත්‍රී ජනපති- රනිල් අගමැති" කරන්න ජනවරම දෙන්න කියලායි අපි ඉල්ලුවේ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජනාධිපතිවරයාට පුළුවන්කම තිබෙනවා, අග්‍රාමාත්‍යවරයාට ලියුමක් යවා තනතුරෙන් අස් කරන්න. 2015 ජනවාරි 8 වැනි දා අපට බලය ලැබුණාට පස්සේ, 2015 අප්‍රේල් මාසයේ මේ ගරු සභාවේ සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනය අනුව දැන් ජනාධිපතිවරයාට බැහැ අගමැතිවරයාට ලියුමක් යවා අගමැතිවරයාගේ තනතුර අවසාන කරන්න. දැන් අග්‍රාමාත්‍යවරයාගේ තනතුරේ කාලය අවසාන කරන්න නම්, එක්කෝ, අගමැතිතුමා ජනාධිපතිතුමාට ලිපියක් යවන්න ඕනෑ. නැත්නම් එතුමාගේ මන්ත්‍රී ධුරය අහෝසි වෙන්න ඕනෑ. එහෙමත් නැත්නම් විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ධුරය අහෝසි කරන්න ඕනෑ.

ගිය අවුරුද්දේ අපේ රජයට විරුද්ධව ගෙනාවා විශ්වාස භංග යෝජනාවක්. මූලදී කිව්වේ අගමැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේනවා කියලායි. අවසානයේ ඒ විශ්වාස භංග යෝජනාවේ යටින් ලිව්වා, සමස්ත රජයට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගේනවා කියලා. ඒ යෝජනාව ගෙනාවාට පස්සේ අපි රජය හැටියට එයට මුහුණ දුන්නා. ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ 4 වැනි දා රජය හැටියට අපි ඒ විශ්වාස භංග යෝජනාවට මුහුණ දීලා, මගේ මතකයේ හැටියට ඡන්ද 122කට වැඩි ප්‍රමාණයක් ලබා ගෙන ජයග්‍රහණයට කළා. ඒ වෙලාවේ විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාම සමස්ත කැබිනට් මණ්ඩලයටම බලපානවා. දහඅටවන සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ විධියට සඳහන් වෙලා තිබුණා.

" ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ද වන්නේය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිරී ගිය ද ජනාධිපතිවරයා තවදුරටත් තම ධුරය දරන්නේ ය."

නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් වෙනවා,

"42.(2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ පිළිතුරු දීමට බැඳී සිටින්නේය.

(3) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ද වන්නේ ය. "

යනුවෙන්.

හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහඅටවන සංශෝධනයේ 43.(2) යටතේ තිබුණු,

"එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩ ලය විසිර ගිය ද ජනාධිපතිවරයා තවදුරටත් තම ධුරය දරන්නේ ය"

යන කොටස අපි දහනවවන සංශෝධනයෙන් ඉවත් කළා. ඇයි, අපි ඒ කොටස ඉවත් කළේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අපි සඳහන් කළා, වර්තමාන ජනාධිපතිතුමාට දැරිය හැකි අමාත්‍යාංශ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඉතිහාසයේ පළමුවන වතාවටයි -1978න් පස්සේ - ජනාධිපතිවරයාට දරන්න පුළුවන් අමාත්‍යාංශ සංඛ්‍යාව සඳහන් කර තිබෙන්නේ. අපි එහි කියා තිබෙනවා, එතුමාට දරන්නට පුළුවන් අමාත්‍යාංශ මොනවාද කියලා. ඒවා තමයි, රාජ්‍ය ආරක්ෂාව, මහවැලි සංවර්ධනය, පරිසරය යන විෂයයන් 2020 වන තෙක් දැරිය හැක කියලා. අපේ මූලික පරමාර්ථය වුණේ 2015 ජනවාරි 8 වැනි දා ජනාධිපතිවරයාට තිබෙන අසීමිත විධායක බලතල සීමා කිරීමයි. ඒකට තමයි අපි ජනවරම ඉල්ලුවේ. අපි 2015 ජනවාරි 8 වැනි දා ගත් ජනවරම අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලායි ඒ විශ්වාස භංග යෝජනාවට මුහුණ දුන්නේ.

අපි ඒ විශ්වාස භංග යෝජනාවට මුහුණ දීලා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා -එතුමාත්- බේරිලා, අපවත් බේරාගෙන, ජනාධිපතිතුමාවත් බේරලා, ඒ විශ්වාස භංග යෝජනාවෙන් ජයග්‍රහණය කළා. මේ මොහොත වනකොට ආසියාවේ පාර්ලිමේන්තුවක අගමැතිවරයෙක් තමන්ගේ විශ්වාසය තහවුරු කර තිබෙනවා නම්, ඒ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි. ඒක අපි මේ ගරු සභාවේ විශ්වාස භංග යෝජනාවක් ජයග්‍රහණය කරලා තහවුරු කර තිබෙනවා. එහෙම විශ්වාස භංග යෝජනාවක් ජයග්‍රහණය කරපු ආණ්ඩුවක් වෙන කොහේවත් නැහැ. මේ පාර්ලිමේන්තුවේදී වෙන කිසිම අගමැතිවරයෙක් විශ්වාස භංග යෝජනාවකට මුහුණ දීලා, විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කර පෙන්වලා නැහැ. හැබැයි, අපි රජයක් හැටියට ඒ යුතුකමත් ඉෂ්ට කරපු රජයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි පසු බිමක් තිබියදීයි මේ රජය බලහත්කාරයෙන් සහ මංකොල්ලයකින් පවත්වාගෙන යන්නේ කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා එවැනි මංකොල්ලයකට ජාතියේ වගකීම ලැබෙන්නේ නැහැ කියලා මම හිතනවා. ගතවන සෑම පැයකදීම ඒ අයව සමාජයෙන් කොන් කරනවා; සමාජයෙන් ඉවත් කරනවා. සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයෙන් මම ඉල්ලන්න කැමැතියි, වැරදි රාජ්‍ය යාන්ත්‍රණයක් සඳහා දෙන පණිවුඩ කිසිවක් රාජ්‍ය යාන්ත්‍රණය තුළ ක්‍රියාත්මක නොකළ යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කරුණාකරලා අවසාන කරන්න.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
මට විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා එම කාරණා කීපය මතක් කළේ, මහජනතාව දැනුවත් කිරීම සඳහායි.

ඊළඟට, මේ කාරණය ගැනත් මා සඳහන් කරන්න කැමැතියි. ගරු අග්‍රාමාත්‍යතුමා අරලියගහ මන්දිරයේ ඉන්නවා ලු, යන්නේ නැතිව. මම කියන්න කැමැතියි, 1994 මැතිවරණ ප්‍රතිඵල නිකුත් වුණාට පසුව එවකට හිටපු නායකතුමා අරලියගහ මන්දිරයට එන්නත් කලින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අරලියගහ මන්දිරයෙන් පිට වෙලා ගිය බව. ඉන් පසුව එතුමා 2004 අප්‍රේල් 10වැනි දාත් අරලියගහ මන්දිරයෙන් පිටවෙලා ගියා. මේ සිදුවීම වනකොට ඔක්තෝබර් 26වැනි දා එතුමා හිටියේ ගාල්ලේ. ගාල්ලේ ඉඳලා එතුමා සමඟ අපි අරලියගහ මන්දිරයට ආවා. එදා ඉඳලා අද වනතෙක් එතුමා අරලියගහ මන්දිරයේ ඉන්නවා. මම

[ගරු වජිර අබේවර්ධන මහතා]

දන්නා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා පසුගිය අවුරුදු තුනක කාල සීමාව ඇතුළත එක රාත්‍රියක් අරලියගහ මන්දිරයේ ගත කර තිබෙනවාය කියලා මම හිතන්නේ නැහැ. එතුමා තමන්ගේ දෛනික රාජකාරී ඉවර නම්, අරලියගහ මන්දිරයෙන් පිටවෙලා යනවා. හැබැයි, අද එතුමා නොසෙල්වී ඉන්නවා. ඒ ඇයි? ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්. අද නොයෙක් අය අර්ථ කථනය කරනවා, "රනිල් වික්‍රමසිංහ මහත්මයාට අරලියගහ මන්දිරය දාලා යන්න බැරිද?" කියලා. එහෙම නොයා යුතුයි. මොකද, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වගකීම තමයි එය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලස්ථානය බවට පරිවර්තනය කරලා, මේ සටන ජයග්‍රහණය කරනතුරු රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එතුමාගේ මෙහෙයවීම. ඒ නිසා අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ අපේ රවුෆ් හකීම් මැතිතුමා, TNA එකේ නායකතුමා, මනෝ ගනේසන් මැතිතුමා, දිගම්බරම් මැතිතුමා, රිසාඩ් බදියුදීන් මැතිතුමා ඇතුළු අනෙකුත් දේශපාලන පක්ෂවල නායකයන්, එහෙම නැත්නම් මේ සියලු දේශපාලන පක්ෂ එක ජේළියකට පෙළ ගැසී සිටින්නේ, ජාති ද්‍රෝහී ක්‍රියාවක් සිදු වෙච්ච නිසා බව. අද ගැළපෙන හා නොගැළපෙන කණ්ඩායම්වල සියලු දෙනාම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙළ ගැසී සිටිනවා. අරලියගහ මන්දිරය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලස්ථානය හැටියට පවත්වාගෙන අපි මේ සටන අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය අපේ ජාතික යුතුකමයි. ජනාධිපති ධුරය හා අගමැති ධුරය කියන ධුර දෙක තුළින් ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරනවාය කියන එක මම අවසාන වශයෙන් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.1.52]

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ජනතා විමුක්ති පෙරමුණේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් කථා කිරීමට පෙර මේ කාරණය පිළිබඳව මා සඳහන් කළ යුතුයි. මේ පාර්ලිමේන්තුවේ සභාවාරයක් නැවත ආරම්භ කිරීමේ දී විශේෂයෙන්ම කළ යුතු කාර්යයක් හැටියට, තේරීම් කාරක සභාවක් පත් කර ගැනීම පිළිබඳව අද උදේ ගරු කථානායකතුමා නිවේදනයක් නිකුත් කළා.

එතුමා එම නිවේදනය කරමින්, මේ සභා ගර්භය තුළ පසුගිය 14 වැනි දා, 15 වැනි දා, 16 වැනි දා යන දවස් 3කදී අප විටින් විට සම්මත කර ගත් ඒ විශ්වාස භංග යෝජනාව පිළිගනිමින් මේ සභාවේ අගමැතිවරයෙක්, ඒ වාගේම අමාත්‍යවරුන් නැති බව ඉතාම පැහැදිලිව සඳහන් කළා. මේ පාර්ලිමේන්තුවේ බහුතරය හැටියට පක්ෂ කීපයකින් සමන්විත අප කණ්ඩායමේ මන්ත්‍රීවරු 122ක් සිටින බව පිළිගනිමින් අපට එම තේරීම් කාරක සභාවේ බහුතරය ලබා දීම සඳහා කථානායකතුමා ගත් එම නිවැරදි තීරණයට අපි ගරු කරනවා. ඒ පිළිබඳව අපේ ප්‍රශංසාව පළ කර සිටිනවා.

ඒ සමඟම පරාජයට මුහුණ දෙන්න බැරිව, මේ සභාවේ ඡන්දය ගැනීම සිදු කිරීමට ඉඩ නොදී මීට කලින් නිර්ලජ්ජිත ආකාරයට කළ ඒ ගාල ගෝට්ටිය අද දින සිදු නොකර මේ සභාව වර්ජනය කරමින් පිටව ගිය ඊනියා ආණ්ඩු කල්ලිය - ආණ්ඩුව යැයි කියා ගන්නා කල්ලිය - මේ රටේ රාජ්‍ය මාධ්‍ය, ඒ වාගේම සමහර විද්‍යුත් මාධ්‍ය නිර්ලජ්ජිතව පාවිච්චි කරමින් අද දින ජනතාව ඉදිරියේ වැරදි තොරතුරු පතුරුවමින් සිටින අවස්ථාවක තමයි මේ කල් තැබීමේ විවාදය අපි පවත්වා ගෙන යන්නේ. මේ විවාදයේ හරය වන්නේ; මේ විවාදයේ තේමාව වන්නේ මේ අස්ථාවර තත්ත්වය උඩ රටේ ආර්ථිකය අගාධයට ඇද ගෙන යන මේ යුගය පිටු දැකීම සඳහා කටයුතු කිරීමයි. මේ සභාව එය තේරුම් අරගෙන යම් ක්‍රියාදාමයකට බැසිය යුතුයි කියන ඉල්ලීමයි. ඒ දිහා බැලුවාම අපට පැහැදිලිව පෙනෙනවා, දිගින් දිගටම මේ අස්ථාවරත්වය ඇති වුණේ කොහොමද කියන එක. ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා ජනාධිපතිතුමා ගත් ඒ තීරණය ව්‍යවස්ථාවට අනුකූලද, නැද්ද කියන ප්‍රශ්නය පිළිබඳව කථා කරද්දි අපට බොහෝ දේවල් කියන්න පුළුවන්. මම නම් කියන්නේ මේක ඔක්තෝබර් 26 වෙනි දා පටන් ගත් ප්‍රශ්නයක් නොවෙයි කියලායි. මේක පටන් ගත්තේ පෙබරවාරි 10 වෙනි දායි. පෙබරවාරි 10 වෙනි දා පළාත් පාලන මැතිවරණයේ ඡන්ද ප්‍රතිඵල නිකුත් වුණාට පසු, එදා පටන් යම් කුමන්ත්‍රණයක් මේ රටේ ඇති කළාය කියන එක අපට ඉතාම පැහැදිලිව පෙනුණා. එදා පටන් අග්‍රාමාත්‍යතුමන්ව ධුරයෙන් පහ කළ යුතුයි, වෙනත් අග්‍රාමාත්‍යවරයෙකු පත් කර ගත යුතුයි කියන චේතනාවෙන් ගෙන ගිය ව්‍යාපාරය දැන් මේ රටේ ආණ්ඩුවක් නැති තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. පසුගිය දවස් 10ක් තිස්සේ මේ රටේ අග්‍රාමාත්‍යතුමකු නැති තත්ත්වයකට; විශාල අර්බුදකාරී වකවානුවකට අපි ඇද දමා තිබෙනවාය කියන එක අපි කනගාටුවෙන් වුවත් කිව යුතුයි. මේකට වග කිව යුත්තේ කවුද ?

මේ රටේ රාජ්‍ය තන්ත්‍රය පවතින්නේ කුලුනු තුනක් අතරයි. එනම්, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණ පද්ධතියයි. අපි අපේ ශ්‍රේෂ්ඨාධිකරණයට ස්තුතිවන්ත වන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අපට ලබා දුන් ඒ අතුරු වාරණ නියෝගයෙන් තමයි, අපට අද මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ.

දිගින් දිගටම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ගෙන තිබෙන මේ තීරණ පිළිබඳව අද වජිර අබේවර්ධන මැතිතුමා සඳහන් කළා. මුලින්ම අග්‍රාමාත්‍යවරයෙක් හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා දිවුරුම් දීමේ දී ගත් ක්‍රියාමාර්ගය, ඒ දිවුරුම් දීමට පෙර එක්සත් ජනතා නිදහස් සන්ධානය රජයෙන් ඉවත් වුණාය කියන පදනම මත අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුවට බහුතරයක් නැති වුණාය කියන පදනම මත ජනාධිපතිතුමා එතුමාගේ අභිමතය පරිදි වැරදි තීරණයකට එළඹුණාය කියන එක ඉතාමත් පැහැදිලියි. ඒ අනුවත් ව්‍යවස්ථාවට පටහැනි තීන්දුවකට එතුමා එළඹුණා. හවුල්කාර පක්ෂයක් ජාතික ආණ්ඩුවෙන් ඉවත් වුණාම ව්‍යවස්ථාවට අනුව එතුමා අග්‍රාමාත්‍යතුමාගෙන් විමසන්න තිබුණා, දැන් 48ක් සිටින අමාත්‍ය මණ්ඩලය ඔබතුමා 30කට අඩු කරනවාද කියන එක. එතුමාට එම ඉල්ලීම කරන්න තිබුණා.

ඒ වාගේම, අග්‍රාමාත්‍යතුමාට මේ සභාවේ විශ්වාසය තිබෙනවාය කියා අවශ්‍ය වූ විටෙක එම විශ්වාසය පළ කිරීමට අවස්ථාවක් සභාවට ලබා දෙන්න තිබුණා. ඒවා නොකර, එතුමාට බලයක් නැතිව තිබියදීත්, මෙවැනි අවස්ථාවක කිසි විටෙකත් ව්‍යවස්ථානුකූලව අග්‍රාමාත්‍යතුමා අස් කිරීම සඳහා මේ රටේ විධායක ජනාධිපතිතුමාට බලතල නැති බව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉතා පැහැදිලිව කියා තිබියදීත් එතුමා එයට පටහැනිව කටයුතු කළා. ඒක ඉතාම පැහැදිලියි. ඊට පසුව මොකද කළේ? ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාගේ පක්ෂය ආදි පක්ෂ නියෝජනය කළ මන්ත්‍රීවරුන් බිලී බා ගැනීම සඳහා -විශේෂයෙන්ම අපව ඉලක්ක කරගෙන, අනෙකුත් පක්ෂවල මන්ත්‍රීවරුන් ඉලක්ක කරගෙන

තමන්ගේ පැත්තට මන්ත්‍රීවරුන් හරවා ගැනීම සඳහා- පාර්ලිමේන්තුව අත් හිටුවීමට ගත් තීරණය සම්බන්ධයෙන් ගරු කථානායකතුමා නිර්භයව මැදිහත් වී කළ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් හැටියට -හත්වන දා පාර්ලිමේන්තුව කැඳවනවාය කියා පොරොන්දුවක් දී තිබුණත්- 14වන දා පාර්ලිමේන්තුව නැවත කැඳවීමට නිවේදනය කර තිබුණා. ඒ සඳහා වූ ගැසට් පත්‍රය පළ කර තිබුණා. ඒ අතරතුරේ තමයි අපට විශාල අභියෝග කීපයකට මුහුණ දෙන්න සිදු වුණේ. 'අපේ මන්ත්‍රීවරුන් කණ්ඩායම් එකට සිටිමින්, මේ අභියෝගයට මුහුණ දෙන්න ඕනෑ' කියා අපි සිතුවා. විශේෂයෙන්ම අප නියෝජනය කරන ජන කොටස මෙය ඉතාම නින්දිත, අතිශයින්ම පහත් ක්‍රියා දාමයක් හැටියට දකින වකවානුවක් ලෙස අප මේ වකවානුව දැක්කා. අපේ ආත්ම ගෞරවයට කැලැලක් හැටියටයි අප මේ සිදුවීම දැක්කේ. අප බිලී බා ගැනීම සඳහා ගත් ඒ ක්‍රියා දාමය වළක්වා ලීම සඳහා අපට ශුද්ධ වූ මක්කම කරා යෑමට සිදු වුණා. එතැනට ගිහින් අපේ මන්ත්‍රීවරු එකට සිටිමින් නායකත්වයට පොරොන්දුවක් ලබා දුන්නා, "නායකත්වයේ අනුමැතිය නැතිව අපි කිසි විටෙක පක්ෂය දමලා යන්නේ නැහැ" කියා. "තනි තනියෙන් අපව බිලී බා ගැනීමට ඉඩ දෙන්නේ නැහැ" කියන පොරොන්දුව අපි අපට නිර්භයව ලබා දුන්නා. ඒ එක්කම තමයි ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව විසුරුවා ලීම සඳහා තීරණයක් ගන්න සිදු වුණේ. එයත් සම්පූර්ණයෙන්ම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිවයි කළේ. එය ව්‍යවස්ථානුකූලව කළ දෙයක් නොවෙයි කියන එක දෙසැම්බර් 7වන දා, එහෙම නැත්නම් ඉන් එහාට ශ්‍රේෂ්ඨාධිකරණය නියම කරන දවසක අපට දැන ගන්න පුළුවන් වේවි කියා අපි හිතනවා.

එසේ තිබියදී, එතුමා ගත් තීරණය අභියෝගයට ලක් වී තිබෙන මේ වකවානුවේ අපට පාර්ලිමේන්තුව තුළ විවෘත වී තිබුණේ කුඩා කවුළුවක්. 13වන දා සවස 6.00 වන විට ඒ තීන්දුව අපට ලැබුණාම අපට කරන්න ඉතිරි වෙලා තිබුණේ මොකක්ද? ඊළඟ දවසේ පාර්ලිමේන්තුව කැඳවීමේ ප්‍රකාශය ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර තිබූ බැවින්, පාර්ලිමේන්තුව කැඳවා පාර්ලිමේන්තුවේ අපේ බහුතරය ඔප්පු කිරීම සඳහා ඒ විශ්වාස භංග යෝජනාව ගෙන ඒම මඟින් අප ගත් ඒ ක්‍රියා දාමය වළක්වා ලීම සඳහා, "ආණ්ඩුව" යයි කියා ගන්නා මේ ඊනියා කල්ලිය -හොර කල්ලිය- මේ සභා ගර්භය තුළ ගත් ඒ ක්‍රියා දාමය අපි පැහැදිලිව දැක්කා. ඉන් පසුව දවස් දෙකක් තිස්සේ විටින් විට අප කළේ කුමක්ද? අප මුලින් ඉදිරිපත් කළ ඒ විශ්වාස භංග යෝජනාව ජනාධිපතිතුමාගේ ඉල්ලීමක් පරිදි, එතුමාට අගතියක් නොවන සේ සංශෝධනය කර දෙන මෙන් එතුමා අපට කළ ඉල්ලීම උඩ අපි ඒ විශ්වාස භංග යෝජනාව නැවත තහවුරු කර ගත්තා. එය නීත්‍යානුකූලව, මේ සභාවේ ස්ථාවර නියෝගවලට අනුකූලව ජනාධිපතිතුමා ඉල්ලා සිටි පරිදි අප කළත්, එතුමා එය වරින් වර සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා.

ඒ විතරක් නොවෙයි, එතුමා අමාත්‍ය මණ්ඩලය පත් කළේ කොහොමද? අමාත්‍ය මණ්ඩලය පත් කළේත් අදියර හතරකින්, පහකින්. කොටස් කොටස් වශයෙන් අමාත්‍යවරු පත් කරන්න යෙදුණේ වෙන මොකක්වත් නිසා නොවෙයි. "ඈවරයි, දෑවරයි" කියා වෙන්දේසි දමනවා වාගේ අමාත්‍ය මණ්ඩලය පත් කළ ආකාරය ඉතාම නින්දිත ක්‍රියාදාමයක් හැටියටයි අපි දකින්නේ. මේ අමාත්‍ය ධුර ලබාගැනීම සඳහා කෑදරකමින් මන්ත්‍රීවරු එයි, ඔවුන් හරවා ගන්න පුළුවන් වෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි මේ රටේ විධායකය එලෙස කටයුතු කළේ කියන එක ඉතාම පැහැදිලිව අපට පෙනුණා. එවැනි අවධියකදී කෙළින් සිටිමින්, අපට ලැබුණු ජන වරමට පිටු නොපා ගත්ත මේ තීරණයට මගේ මන්ත්‍රී කණ්ඩායමට මගේ ගෞරවය පුද කරනවා. ප්‍රජාතන්ත්‍ර විරෝධී; ප්‍රජාතන්ත්‍ර සම්ප්‍රදායන් සම්පූර්ණයෙන්ම පාගා දමන මේ ක්‍රියාදාමයට විරුද්ධව නැඟී සිටිමින් අපි දිගින් දිගටම කටයුතු කළා.

"ඡන්දයක් ලබාදීම තමයි මේකට දිය හැකි තීන්දුව" කියා සමහර අය කියනවා. "ඡන්දය ලබා දෙනු" කියන සටන් පාඨ ඇතුළත් පෝස්ටර් දැන් රට පුරා අලවා තිබෙනවා. දැන් සම්මන්ත්‍රණ පවත්වනවා. ඡන්දයකට මුහුණ දෙන්න අපි කවදාවත් පැකිළෙන්නේ නැහැ. අපි එයට සූදානම්. නමුත් මෙවැනි නීති විරෝධී ආණ්ඩුවක්; පස්සා දොරෙන් බලය උදුරාගෙන අත්තනෝමතිකව, අරාජිකව මේ රට ගෙන යන මෙවැනි පාලන තන්ත්‍රයක් එක්ක ඡන්දයට මුහුණ දීම පිළිබඳව අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එබැවින් තමයි නීත්‍යානුකූල ආණ්ඩුවක් පත් කරන්න කියා අපි ඉල්ලන්නේ. එය කළ යුතුව තිබෙන කාර්ය භාරයක්. එය ව්‍යවස්ථානුකූලව ජනාධිපතිතුමන් කළ යුතුම දෙයක්. එය නොකිරීම තුළ මේ රටේ අස්ථාවරභාවය ඇතිවුණා. එයට එතුමා හේතුපාදක වීම පිළිබඳව අපි කනගාටු වෙනවා. එය වහාම නිවැරැදි කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. එහෙම නොකර, මේ අස්ථාවරභාවය දිගටම ගෙන යනවා නම්, වජිර අබේවර්ධන මැතිතුමා ඉල්ලා සිටි පරිදි, මේ නීති විරෝධී ආණ්ඩුව තමන්ට දෙන ඕනෑම නියෝගයක් ප්‍රතික්ෂේප කරන්න කියා මේ රටේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන්, රාජ්‍ය නිලධාරීන්ගෙන් අපිත් ඉල්ලා සිටිනවා.

ලබන නොවැම්බර් 29වන දාට පාර්ලිමේන්තුවේදී ගන්න අපි යෝජනාවක් භාරදීලා තිබෙනවා. ඒ වාගේම, 30වන දාට ගන්න අපි තවත් යෝජනාවක් භාරදීලා තිබෙනවා. අපි මුලින් සංකේතයක් හැටියටයි එය පටන් ගත්තේ. අග්‍රාමාත්‍ය ලේකම්තුමාට මුදල් වැය කිරීමට තිබෙන අයිතිය, විශේෂයෙන්ම ඒ ඊනියා අග්‍රාමාත්‍යතුමාගේ එම නිලධාරීන්ට, තමන්ගේ කාර්ය මණ්ඩලයට ගෙවීම් කරන ඒ ක්‍රියාදාමය වළක්වාලීම සඳහා සංකේතයක් හැටියට අපි යෝජනාවක් ගෙනැත් තිබෙනවා. ඊට පසු එය අනික් අමාත්‍යාංශ දක්වා ගෙන යන්න අපි දැන් කටයුතු කරගෙන යනවා. ඒ යෝජනාව සම්මත වුණාට පසුව, කිසි විටෙක මේක නීත්‍යානුකූල වෙන්නේ නැහැ. පසුගිය 14වන දා පටන් මේ රටේ අග්‍රාමාත්‍යවරයෙක් නැහැය කියන එකත්, කැබිනට් මණ්ඩලය සම්පූර්ණයෙන්ම විසිරී ගිය බවටත් කථානායකතුමා අරගෙන තිබෙන මේ තීරණය කාටවත් අභියෝගයට ලක් කරන්න බැහැය කියන කාරණයත් අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. ජනාධිපතිතුමාට විධායක බලතල තිබුණත්, එතුමාටත් එකම විකල්පයයි තිබෙන්නේ. ඊනියා ආණ්ඩුව යැයි කියන මේ පාර්ශ්වය මේ සභා ගර්භයට ඇවිත් කථානායකතුමාගේ ඒ තීරණයට විරුද්ධව යෝජනාවක් ගෙනැවිත්, ඒ තුළින් මේක ආපස්සට හරවා ගැනීම මීසක්, වෙන මාර්ගයකින් එය කළ නොහැකියි කියන එක ඉතාම පැහැදිලිව අපි කියා සිටිනවා. අධිකරණයකින් පවා මේවාට තීන්දුවක් ලබාදිය නොහැකියි. කලින් ලැබුණු තීරණවලින් එය ඉතා පැහැදිලිව සනාථ වෙලා තිබෙනවා.

එබැවින්, මේ අස්ථාවර තත්ත්වය දිගින් දිගටම ඇදගෙන යෑමට ඉඩ නොදී වහාම අතිගරු ජනාධිපතිතුමන් අලුත් අග්‍රාමාත්‍ය තනතුර බහුතරයක් තිබෙන කෙනෙකුට ලබා දීලා, අලුත් අමාත්‍ය මණ්ඩලයක් පත් කිරීම තුළ මේ රටේ ස්ථාවරභාවය ඇති කළ යුතුයි කියා අපි නැවත වාරයක් අවධාරණය කරමින් මගේ කථාව සමාප්ත කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තූතියි. මීළඟට, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 2.08]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව මට ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳවත් එතුමන්ලාට අපේ ස්තුතිය පුද කර සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ නීතිය සහ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අපි සියලු දෙනාටම පොදුයි කියා අපි දන්නවා. අපි මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරන්නට ඕනෑ. ඒ වාගේම, මේ රටේ නීතියට ගරු කරන්නට ඕනෑ. නමුත් මේ අවස්ථාව වන විට කනගාටුවට කරුණක් වෙලා තිබෙන්නේ, මේ රටේ නීතියත්, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් විධායකය කඩ කර තිබීමයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කරන්න අපි රැස්වීම් ගණනාවකටම ගිහිල්ලා කථා කළා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ඒ අවස්ථාවේදී ජනාධිපති හැටියට පත් කරන්න නොවෙයි අපේ අරමුණ වෙලා තිබුණේ. අපේ අරමුණ වෙලා තිබුණේ අපේ ප්‍රතිපත්තීන් මේ රටේ ජයග්‍රහණය කරන්නයි. ඒ වාගේම, මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කරන්නයි. ඒ උදෙසා තමයි අපි සටන් කළේ. නමුත්, ඔහු මේ රටේ විධායක ජනාධිපති ධුරය ලබාගෙන අවුරුදු 3ක් යනකොට එයින් වෙනස් පුද්ගලයෙක් බවට පත් වුණා. ඔක්තෝබර් 26වැනි දා මේ රටේ නීත්‍යානුකූල අග්‍රාමාත්‍යවරයා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා සිටියදී එතුමාව අස් කරන්නේ නැතිව මහින්ද රාජපක්ෂ මැතිතුමාව නීති විරෝධී ලෙස අග්‍රාමාත්‍යතුමා හැටියට පත් කරපු ආකාරය අපි දැක්කා. ඉන් පස්සේ ගරු කථානායකතුමාගේ අවසරයක් නැතිව, මත විමසීමක් නැතිව පාර්ලිමේන්තුව කල් තබනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන් පස්සේ පාර්ලිමේන්තුව කැඳවීමේ දිනයට කලින් නැවත කැඳවා පාර්ලිමේන්තුව විසුරුවනවා. මේ සියල්ලක්ම නීති විරෝධියි. මේ සියල්ලක්ම නීතියට පටහැනියි. ඒ විතරක් නොව මේ හරහා ව්‍යවස්ථාදායකයේත්, විධායකයේත් දැවැන්ත මත ගැටුමත් ඇති කරනවා. ඒත් එක්කම අපට පුළුවන්කම ලැබුණා, දැඩි විශ්වාසයක් තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මැතිවරණ කාලය අත් හිටුවීම සඳහා ලබා දුන්නු නියෝගය නිසා නැවත චානවක් පාර්ලිමේන්තුව රැස් කරන්න. පාර්ලිමේන්තුව රැස් කළාට පස්සේ මොකද වුණේ? පාර්ලිමේන්තුවේදී අපට පෙන්වන්න පුළුවන්කම ලැබුණා, මේ ඊනියා හොර ආණ්ඩුවට වඩා බලයක් අපට තිබෙනවා කියන එක; ඔවුන්ට අපි විරුද්ධයි කියන එක. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය මේ සභා ගර්භයට ඇවිල්ලා, අවුරුදු 80ක් වෙච්ච ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි චානවට ඉතාමත් අමන විධියට, අශීලාචාර විධියට හැසිරෙන්න ගත්තා. පාර්ලිමේන්තුවේ කථානායකතුමාගේ පුටුවට වතුර හැලුවා. පාර්ලිමේන්තුවේ කථානායකතුමා ඉදගෙන ඉද්දී කුණු බාස්කට් එකකින් එතුමාට දමලා ගැහුවා, පොත් පත්වලින් ගැහුවා, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ගැහුවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුව හෑල්ලුවට ලක් කළා. එහෙම නම්, ඔවුන් මේ කරපු කියපු දේවල්වලට වග කියන්න ඕනෑ. මේ රටේ කීර්තිනාමයට එල්ල වෙච්ච මහා අපහාසයට එතුමන්ලා වග කියන්නට ඕනෑ. ඉන් පස්සේ දෙවැනි චානවේත් ඔවුන් මේ ආකාරයෙන්ම හැසිරුණා. නමුත් අපි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට, පාර්ලිමේන්තුවේ ඉන්න පොලීසියේ නිලධාරීන්ට හිස නමා ආචාර කරනවා. මොකද, ඔවුන් සෘජුව රාජකාරිය කරන්න, පාර්ලිමේන්තුව රැකගන්න, කථානායකතුමා රැකගන්න, ඒ වාගේම මේ රටේ ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කරන්න කටයුතු කළා. අපි ඔවුන්ට අපේ ස්තුති ප්‍රණාමය පුද කරනවා.

අපේ කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා ගැන මම පෞද්ගලිකවම ආඩම්බර වෙනවා. එතුමා අපේ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ ශ්‍රේෂ්ඨ නායකයෙක්. මට මතකයි අපි පාසල් යන සමයේදී එතුමා කොළඹ මහ නගර සභාවට තරග වදිද්දී, "ආවොත් කරු - පායයි හිරු" කියලා තමයි පෝස්ටරය ගැහුවේ. එතුමා සර්ව සාධාරණව, එඩිතරව, මොන පීඩන, මොන ගර්ජන මැද වුණත් කෙළින් හිටගෙන මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්නට, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද ආරක්ෂා කරන්නට, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරන්නට කටයුතු කළා. අද මම පසු පෙළ තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාට සිරස නමා ආචාර කරනවා, එතුමාගේ ඒ ධෛර්යත් ක්‍රියාවට. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් එතුමාට ඒ ධෛර්ය ලබාදීලා, ඒ ශක්තිය ලබාදීලා පාර්ලිමේන්තුව රැක ගන්නට කටයුතු කළා. මේ උද්ගත වුණු කාරණා සියල්ලක්ම ලංකා ඉතිහාසයේ රන් අකුරින් හෝ කළු අකුරින් ලියැවේවි.

මට මතකයි එදා මෙතැන Lobby එකේදී ගරු කථානායකතුමාගේ නිලධාරියෙකුට පහර පිට පහර දුන්නා. ඒ නිලධාරියා ආවේ ගරු කථානායකතුමා ආරක්ෂා කර ගන්නයි. මේ ගරු සභාවට ඡන්දයෙන් පත් වෙලා ආව ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමන්ලා, අනෙකුත් මන්ත්‍රීවරුන් එකතුවෙලා එතුමාට ගැහුව බව මම ඇස් දෙකට දැක්කා. අපි කනගාටු වෙනවා අපේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුවට එවපු එතුමන්ලා දෙනෝදාහක් මැද, මාධ්‍ය ඉදිරියේ ඒ ආකාරයට කටයුතු කිරීම ගැන. ඒ වාගේම එදා ගැලරිය පිරෙන්න සෙනඟ හිටියා. ඒ වාගේම, කථානායකතුමාගේ ගැලරියේ තානාපතිවරුන් ඇතුළු විදේශ දූත පිරිස් බලාගෙන සිටියදී එතුමන්ලා හැසිරුණු විධිය කල්පනා කර බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොවුන් ගමට ගිහිල්ලා කොයි ආකාරයෙන් දේශපාලනය කරයිද? ගමේ ඉන්න අපේ පාක්ෂිකයන්ට මොවුන් කොයි තරම් අඩන්තේට්ටම් කරයිද කියන එක පිළිබඳව කල්පනා කර බලන්න. එක්තරා මන්ත්‍රීවරයෙක් මගේ ආසනයට අඩි 10ක් පමණ ඉස්සරහදී පොලීසියේ නිලධාරියෙකුට කම්මුලට ගැහුවා. එහෙමයි ඔවුන් හැසිරුණේ. මොවුන්ට බලයක් නැතිව මෙහෙම හැසිරෙනවා නම් බලයක් තිබෙන විට කොහොම හැසිරෙයිද? පාර්ලිමේන්තුවට බෝම්බ ගෙනැල්ලා තිබෙනවා, පාර්ලිමේන්තුවට පිහි ගෙනැල්ලා තිබෙනවා, පාර්ලිමේන්තුවට වෙනත් ආයුධ ගෙනැල්ලා ඇති. නමුත්, අපි ඇස් දෙකට දැකලා නැහැ. හැබැයි, අපි එදා දැක්කා. අපේ පැත්තෙත් වැරදි ක්‍රියාවල යෙදුණු අය හිටියා, අපි ඒකත් හෙළා දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, මෙවැනි හැසිරීමක් අපි කවදාවත් දැකලා නැහැ. එම නිසා ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. අපි මේ රටේ ඡන්ද දායකයන්ගෙන් කාරුණික ආයාචනයක් කරනවා, ඔබ නියෝජනය කරලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට යමෙක් එවනවාද, ඒ කෙනා ඔබව නියෝජනය කරන්නට සුදුසු පුද්ගලයෙක්ද කියා කල්පනා කර එවන්න කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ආර්ථිකය ගැන බලමු. මේ රටේ ආර්ථිකය දිනෙන් දිනම අගාධයට යනවා. අද රුපියල් නෝට්ටු සියයට 36කට වැඩි ප්‍රමාණයක් අච්චු ගහන්නට පටන් අරගෙන තිබෙනවා. රුපියල් 5,000 නෝට්ටුව තමයි අච්චු ගහන්නේ. මේ වන විට රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. මම නිවැරදි නම් අද ඇමෙරිකානු ඩොලරයට රුපියල් 181ක් ගෙවන්නට වෙලා තිබෙනවා. ඊට වඩා වැඩි වෙලාද දන්නෙත් නැහැ. රුපියල තවත් පහළට වැටිලාද දන්නෙත් නැහැ. එදා නම් මාධ්‍ය ආයතනවලින් ප්‍රවෘත්ති දැනුම්දෙන SMS එකක් තිබුණා. අපි ඒකෙන් තමයි වැඩි හරියක් ප්‍රවෘත්ති දැනගත්තේ, news දැනගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කනගාටු වෙනවා එක මාධ්‍යයකින් හෝ රුපියල අවප්‍රමාණය වීම ගැන ජනතාව දැනුවත් කරන්නේ නැහැ. පසුගිය දවස්වල හැම දාම උදේට කියනවා, "ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට ඩොලරය වැඩිවෙලා, රුපියල අඩුවෙලා. ඩොලරය රුපියල් 140යි, 150යි, 160යි, 170යි." කියා. මේ ඊනියා ආණ්ඩුව ඇති කළා විතරයි ඔවුන් ඩොලරය ගැන කථා කරන එක නතර කළා.

මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු බහුතරයක් ඔප්පු කරලා පෙන්නුවා, මේ සභාව තුළ මහින්ද රාජපක්ෂ මහත්මයා කෙරෙහි විශ්වාසයක් නැහැ කියලා. කාගෙන්වත් SMS පණිවිඩ ආවේ නැහැ. කනගාටුයි! හැබැයි, අපේ නායක රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ දවසේ ඉඳලා ගරු ජනාධිපතිතුමාගේ කාර්යාලය සහ ගේ ඉදිරිපස කැමරා ටික තියාගෙන ඉන්නවා. අපේ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලය -අරලියගහ මන්දිරය- ඉස්සරහා කැමරා ටික තියාගෙන ඉන්නවා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ගේ ඉස්සරහ කැමරා ටික තියාගෙන ඉන්නවා. සැරෙන් සැරේට mike එක අල්ලනවා. එදා පාර්ලිමේන්තුවේ සිදු වූ සියල්ලක්ම, හැම වැඩසටහනක්ම live දුන්නා. එදාත් SMS එක එවන්න ප්‍රමාද වුණා. මොකද, අපි දිනුම් නිසා. මොවුන් මේ විධියේ දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරන්නේ ඇයි කියන එක කල්පනා කර බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රට ලෝකය පිළිගන්නේ නැති රටක් බවට පත් වෙමින් යනවා. ඇමෙරිකාව ඇමෙරිකන් ඩොලර් බිලියන බාගයක - half a billion - grant එකක් හැටියට දුන්නු මුදල්, -ණයට නොවෙයි, පොලියට නොවෙයි, පසුව ගෙවන්න නොවෙයි.- අද නතර කරලා තිබෙනවා, IMF එකෙන් ලැබෙන්න තිබුණු ඩොලර් බිලියන 1.4ක මුදලක් ලැබෙන්නේ නැති වෙලා තිබෙනවා, ජපානයෙන් ලැබෙන්න තිබෙන ආධාර ටික නැති වෙලා තිබෙනවා. ඉන්දියාවෙන් ලැබෙන්න තිබුණු ආධාර ටික දැන් නැති වෙන්නයි යන්නේ. එහෙම කල්පනා කර බැලුවාම, අද ලංකාව මේ ලෝකය නොපිළිගන්නා රටක් බවට පත් වෙන්නයි යන්නේ. මේකට වග කියන්න ඕනෑ මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඔය ලණුව දුන්නු කණ්ඩායමයි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ලණුව දුන්නු කණ්ඩායමයි. මම හිතන විධියට එතුමා තමයි ඔය ඔක්කෝටම ලණුව දුන්නේ. ඒ නිසා මම පැහැදිලිව කියනවා, මේ විධියට මේ රට ඉදිරියට යන්න බැහැ කියලා. මේ රට දිනෙන් දින අගාධයටයි යන්නේ. රුපියල් බිලියන 30කට වැඩි ප්‍රමාණයක විදේශ ආයෝජන නැවත වතාවක් රටෙන් අරගෙන ගිහිල්ලා තිබෙනවා. මෙහෙම කියන්නේ internet එකේ "දෙරණ" ප්‍රචාරය කරන newsවල. රුපියල් බිලියන 30ක්! ඒ කියන්නේ, මේ රටට පැමිණි ආයෝජකයෝ නැවත වතාවක් ඔවුන්ගේ සල්ලි අරගෙන යන්න පටන් ගෙන තිබෙනවා. මේකට වග කියන්න ඕනෑ කවුද? මේ රටේ ආර්ථිකයට මොකද වෙන්නේ? මේ රටේ අභිංසක දුගී දුප්පත් ජනතාව දිනෙන් දින තවත් දුප්පත්භාවයට පත් වන එකට වග කියන්න ඕනෑ කවුද කියන එක පිළිබඳව අපි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ ආණ්ඩුවේත් -අපේත්- වැරදි තිබුණා. අපේ නායකයෝ අපේ මන්ත්‍රීවරු කියන දේ පොඩ්ඩක් අහලා, අපි ගැනත් පොඩ්ඩක් සලකලා මේ යථාර්ථය තේරුම් ගත්තා නම් තත්ත්වය මීට වඩා වෙනස් වෙන බව මම පැහැදිලිව කියනවා. නමුත් අපට හැදෙන්න පුළුවන්. අපට කාලය තිබෙනවා. අපි අපේ පාක්ෂිකයාව ශක්තිමත් කරන්න ඕනෑ; අපේ පාක්ෂිකයා කියන්නේ මොකක්ද කියන එක අහලා බලන්න ඕනෑ; අපේ පාක්ෂිකයාගේ දුක, වේදනාව, කඳුළු තේරුම් ගන්න ඕනෑ. අපේ පාක්ෂිකයා රැකුණොත් තමයි පක්ෂයත්, මේ ආණ්ඩුවත් රැකෙන්නේ කියන එක අපේ නායකයෝත් දැනගන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙනවා.

මේ වෙලාවේ නම් අපි කියන දේ දැන් බොහෝ අය අහනවා. හැබැයි, මීට කලින් අපිත් කරපිංචා තත්ත්වයට පත් වෙලා හිටියේ. ඒ ගැන අපට දුකයි; අපට වේදනාවක් තිබෙනවා. මොකද, අපි එදා යමක් කියද්දී ඒ දේ අහන්න සූදානම් වුණේ නැහැ. අපිව දැක්කාම file මිටිය අරගෙන දුවනවා. නමුත්, දැන් නම් පොඩ්ඩක් හිනා වෙලා, ළඟට ඇවිල්ලා කථා කරනවා. මම මේවා කියන්න හේතුව, අපි වාගේ අය දේශපාලනයට ඇවිල්ලා ඉන්නේ හම්බ කරන්නවත්, හොරකම් කරන්නවත්, මේ ගරු සභාවට ඇවිල්ලා ගහගන්නවත් නොවන නිසායි. හෘදය සාක්ෂියට එකඟව කථා කරලා, මේ මන්ත්‍රීකම ගම්පහ දිස්ත්‍රික්කයට දීලා යන්න පුළුවන් කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තූතියි.

මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.2.22]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මා මිත්‍ර කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමාගෙන් පසුව මට කථා කරන්නට ලැබීම සතුටක්. මට මේ අවස්ථාවේදී එක අතකට විශාල සන්තෝෂයක් ඇති වෙනවා වාගේම, අනෙක් අතට රටේ ඉතා දුක්බර තත්ත්වයක් තිබීම පිළිබඳව කනගාටුවක් ඇති වනවා. අද මේ රට ඉතා තීරණාත්මක සන්ධිස්ථානයකට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දැන් තිබෙන තත්ත්වය දිහා බැලුවාම මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්ද කියලා අපට හිතෙනවා. එහෙමත් නැත්නම් මේ පාර්ලිමේන්තුවත් වහලා, අධිකරණයත් වහලා ඒකාධිපතිවාදයකට යනවාද කියන එක තීන්දු කරන්න පුළුවන් තැනකට දැන් මේ රට පත්වෙලා තිබෙනවා.

ඔබ කවුරුත් දන්නවා, අපි කාගේවත් දැනුමක් නැතුව ඔක්තෝබර් මස 26වැනි දා අලුත් අගමැතිවරයෙක් දිවුරුම් දුන්නා කියලා. නීත්‍යානුකූල නොවන අගමැතිවරයෙක්, නීත්‍යානුකූල නොවන ඇමති මණ්ඩලයක් දිවුරුම් දීලා, අද නොවැම්බර් 23වැනි දා, දැන් මාසයකට ළඟයි. මාසයකට ආසන්න කාලයක් තුළ මේ රට එක තැන පල් වුණා, රට එක තැන විනාශ වෙලා තිබෙනවා. අපට මීට වඩා කාලයක් බලාගෙන ඉන්න බැහැ. විශේෂයෙන්ම මේ ඡන්ද ප්‍රතිඵලයත් සමඟ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

සිරිසේන මැතිතුමා අද දිනයේ තීන්දුවක් ගැනීම සුදුසුයි කියන එක මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම අද සිකුරාදා දිනයක්. සිකුරාදා දවසක් එනකල් මුළු රටම බලාගෙන ඉන්නවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ තීන්දු තීරණ ලැබෙන නිසා. අද සිකුරාදා දිනයක් නිසා මම එතුමාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. එතුමා අතින් වෙච්ච වැරැද්ද නිවැරදි කරගන්න අද හොඳ අවස්ථාවක් තිබෙනවා. මොකද, අද මන්ත්‍රීවරුන් 121දෙනෙකුගේ කැමැත්ත අනුව අපේ ශක්තිය පෙන්වන්න අපට පුළුවන්කම ලැබුණා. අසනීප තත්ත්වය නිසා තවත් එක් මන්ත්‍රීවරයෙකුට එන්න බැරි වුණා. එහෙම නැත්නම් 122ක් සහිත ඉතා පැහැදිලි බහුතරයක් අපට තිබෙනවා. එහෙම නම් මේ පැහැදිලි බහුතරය පිළිබඳව තීන්දුවක් ගන්න ඕනෑ. මේ කටයුත්ත කළේ නැත්නම් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කියන එක විනාශ වෙලා යනවා. අපේ මොන අඩු පාඩු තිබුණත්, පසුගිය ආණ්ඩුවල මොන අඩු පාඩු තිබුණත්, මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් අහිමි වෙයිද කියලා මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. එහෙම වුණා නම්, පාර්ලිමේන්තුවේ කටයුතු සඳහා දිනකට යන වියදම නතර කරලා මේ පාර්ලිමේන්තුව වහලා දාලා, අධිකරණය වහලා දාලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් පුළුවන්, මේ රටේ තීන්දු තීරණ අරගෙන ඒකාධිපති පාලනයක් ගෙනයන්න. හැබැයි, ඒ සඳහා ජනතාව ඉඩ දෙන්නේ නැහැ. ජනතාව දිනෙන් දින, දිනෙන් දින මේ යන ක්‍රමයට විරුද්ධව නැඟී සිටිනවා; මේ යන ක්‍රමය හෙළා දකිනවා; ඉතා කනගාටුවෙන් මේ පිළිබඳව තම විරෝධතා ප්‍රකාශ කරනවා. එහෙම නම් අද අපි සියලුදෙනා එකතු වෙලා මේ රට මුල් තැනට තබාගෙන කටයුතු කරන්න ඕනෑ. අපේ දේශපාලන පක්ෂ තිබෙනවා, දේශපාලන අදහස් හා ප්‍රතිපත්ති තිබෙනවා, එක් එක් පුද්ගල කැමැති තිබෙනවා. නමුත්, අපි සියලුදෙනාම ශ්‍රී ලංකාව මුල් තැනට තබාගෙන කටයුතු කිරීම වැදගත්. එහෙම නම්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා යන තුන්දෙනාම මුලින්ම රට ගැන හිතන්න ඕනෑ. මුලින්ම මේ රට ගැන හිතලා, -ශ්‍රී ලංකාව ගැන හිතලා,- ලංකාවට ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරනවාද, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වළලා දමනවාද කියන එක තීන්දු කරන්න ඕනෑ. එහෙම නම් ඉතා ගෞරවනීයම කටයුත්ත වෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා අද තමන්ගේ අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වීමයි.

එතුමාට ගෞරවයක් තිබෙනවා නම්, එතුමා තමන්ගේ ගෞරවය රැක ගන්න නම් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේ ආණ්ඩුව භාර දීලා එතුමා ඉල්ලා අස්විය යුතුයි; කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්විය යුතුයි. එහෙම නැතුව බලහත්කාරයෙන් මේ ආණ්ඩුවේ අගමැතිකම්, ඇමතිකම් කියලා බොරුවට හදාගෙන ඒවායේ එල්ලීගෙන ඉන්නේ මොකද කියන එක අපි කල්පනා කරලා බලන්න ඕනෑ. ඔබ දන්නවා, විශේෂ අධිකරණවල දැන් නඩු ටික විභාග කරන බව. දැන් ඒ නඩු ටික හැම දාම විභාග කරලා ඒ අයට දඬුවම් දෙන්න කටයුතු කරමින් ඉන්නේ. මේ අගමැතිකම්, ඇමතිකම්වල එල්ලීගෙන ඉන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි. තමන්ට විරුද්ධව එන ඒ නඩු තීන්දුවලට යම් බලපෑමක් මේ තුළින් කරන්න පුළුවන්ද කියන ඒ විශ්වාසය නිසා තමයි මෙහෙම අගමැතිකම්වල, ඇමතිකම්වල එල්ලීගෙන ඉන්නේ. වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි. එතුමන්ලා දන්නවා, මෙහෙම ඉන්න කොට තමන්ගේ ප්‍රසිද්ධිය තවත් අඩු වෙනවා කියන එක. ඒ ගැන නොතකා තමන්ගේ පවුල, තමන්ගේ ඥාතීන්, තමන්ගේ හිතවතුන් ටික ආරක්ෂා කර ගන්න, අධිකරණයෙන් එන තීන්දු ටික නතර කර ගන්න තමයි මේ අය මේ තනතුරුවල ඉන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නොවැම්බර් 5වැනි දා අපි අය වැයක් ඉදිරිපත් කරන්න නියමිතව තිබුණා. අපි අවුරුදු තුනහමාරක් බොහොම අමාරුවෙන් හදා ගත් මේ ආර්ථිකයේ ප්‍රතිලාභ, මහා භාණ්ඩාගාරය හරහා ජනතාවට ලබා දෙන්න කටයුතු කරමින් හිටියේ. නොවැම්බර් 5වැනි දා ඉදිරිපත් කරන්න නියමිතව තිබුණු ඒ අය වැයෙන් සහනාධාර විශාල ප්‍රමාණයක් ලබා දෙන්න නියමිතව තිබුණා. මේ කරපු දේශපාලන කුමන්ත්‍රණයට ඒකත් හේතුවක් වුණා. ඒ විතරක් නොවෙයි. අපි අවුරුදු තුනහමාරක් මෙහෙම ආණ්ඩු කරගෙන ඇවිල්ලා අවසාන අවුරුදු දෙකේදී තමයි අපි කරපු ආණ්ඩුවේ ඒ ප්‍රතිලාභ ටික මේ රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන් වෙන්නේ. අපි මහන්සි වෙලා හදා ගත් දේවල්වල ප්‍රතිඵල ටික ලබා දෙන්න පුළුවන් වන්නේ, ඉදිරි අවුරුදු දෙක තුළයි. එහෙම නම් මේ ආකාරයේ දේශපාලන කුමන්ත්‍රණයක් කරන්න හේතු වෙච්ච අනෙක් කාරණාව හැටියට මම දකිනවා, අවුරුදු දෙකක ප්‍රතිඵල ලැබුණොත්නේ ඒ අයට මැතිවරණවලින් ජයග්‍රහණය කරන්න අපහසුතාවක් ඇති වෙයි කියලා හිතීම.

ඒ අය තමන් කළ හොරකම්, දූෂණ විභාග කිරීම වළක්වන්න අධිකරණයට හැංගිලා, අධිකරණයට යම් බලපෑම් කරන්න උත්සාහ කරනවා. අපේ ආණ්ඩුවේ ප්‍රතිඵල ටික ජනතාවට දකින්න නොලැබෙන කාලවකවානුවක් තුළදී අපෙන් බලහත්කාරයෙන් මේ ආණ්ඩුව උදුරාගෙන තිබෙනවා; දේශපාලන කුමන්ත්‍රණයක් ඇති වෙලා තිබෙනවා. නමුත් එතැනින් තමන්ට පෞද්ගලික වාසියක් ලැබුණාට රටක් හැටියට අපට විශාල අර්බුදකාරී තත්ත්වයක් තිබෙනවා. අද නැවතත් ජාත්‍යන්තර වශයෙන් අපි ප්‍රසිද්ධියට පත් වෙලා තිබෙන්නේ මොන හේතුවක් නිසාද? මාස එකහමාරකට කලින්, "ලෝන්ලි ප්ලැනට්" ආයතනය විසින් විදේශීය සංචාරකයින්ට එන්නට සුදුසු අංක එකේ රට බවට පත් කළේ අපේ ලංකාවයි. අවාසනාවට මේ මාසය ඇතුළත විදේශ රටවල් මේ රටට පැමිණීමට සංචාරකයන්ට තහංචි යොදලා තිබෙනවා. ඒ නිසා අපේ සංචාරක ව්‍යාපාරය විශාල වශයෙන් හානියකට පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපට ආධාර ලබා දෙන රටවල් - ඉන්දියාව, ජපානය, ඇමෙරිකාව, යුරෝපා සංගමයේ රටවල්- අපට අවවාද කරලා තිබෙනවා පමණක් නොවෙයි, මේ වෙන කොට අපට ලැබෙන ආධාර තාවකාලිකව නතර කරලාත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසාන කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉතා පැහැදිලිවම අපට ලබා දෙන ඒ ණය මුදල් ප්‍රමාණය තහනම් කරලා තිබෙනවා.

අපට මේ අවාසනාවන්ත තත්ත්වය උදා කරලා දැන් මාසයක් වනවා. තව තව ඉන්න ඉන්න, මේ වළේ අපි වැටිලා, අපිට එළියට එන්න බැරි තත්ත්වයකට පත් වෙන කාල වකවානුවක් ඉදිරියේදී ඇති වේවි. මෙය ඉතා ඉක්මනින්ම විසඳන්න පුළුවන් වෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටයි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගෙනුත් ඉතා ගෞරවනීය ලෙස අපි ඉල්ලීමක් කරනවා. මේ රටට ආදරය කරන, මේ රට කෙරෙහි විශ්වාසයක් තිබෙන තරුණ මන්ත්‍රීවරයෙකු හැටියට මේ දෙපළගෙන්ම මම ඉතා ආදරයෙන් ඉල්ලීමක් කරනවා, මේ රට තව තවත් විනාශ

කරන්නේ නැතිව ඉදිරියට ගෙනියන්න ඔබතුමන්ලා වැදගත් තීන්දුවක් ලබා දෙන්න කියලා. මේ අවස්ථාවේදී ඒ ඉල්ලීම කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.34]

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගිලෙන නැවෙන් මීයෝ පනිති" කියලා කියනවා වාගේ ඡන්දයකට බය වෙලා, අද පාර්ලිමේන්තුවෙන් පැනලා දුවලා ගිය අපේ විපක්ෂයේ කණ්ඩායම ගැන මම කනගාටු වනවා. අද මේ ගරු සභාව පිරිලා තිබුණා නම් කොච්චර හොඳද? හරියට මහත්වරු වාගේ හැසිරිලා විවාදයේ කටයුතු කරන්න තිබුණා. කනගාටුදායක තත්ත්වයක් වුණත් මට මේ අවස්ථාවේදී කියමනක් සිහිපත් වනවා. "එකක් කඩතොලු වසා ගන්නට ගිහින් මට වුණු කාරියා. දෙකක් කඩතොලු හදා දුන්නැයි ඉඳුරුවේ ආචාරියා" කියන කියමන තමයි අපේ ජනාධිපතිතුමා අද හිරවෙලා ඉන්න තැන ගැන හිතුවාම මට මතක් වෙන්නේ. එක් කඩතොලුවක් නොවෙයි, දැන් හතරක්, පහක් පහු කරගෙන ගිහිල්ලා තිබෙනවා.

අපවත් වී වදාළ සෝභිත මහ හිමිපාණන් වහන්සේගේ ආදාහන කටයුතුවලදී උන් වහන්සේගේ දේහයත් ඉදිරිපිට තියාගෙන ජනාධිපතිතුමා ඒ වෙලාවේදී පොරොන්දුවක් දුන්නා, "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට බැඳිලා සිටිනවා" කියලා. ඒක මේ මුළු රටම අමතක කරලා නැහැ. ඊළඟට සෝභිත හිමිපාණන් වහන්සේගේ ගුණානුස්මරණ දිනයේදී ජනාධිපතිතුමා ගිහිල්ලා කිව්වා, "දින සියය වැඩසටහන මට මතක නැහැ" කියලා. අපිට ඒක අමතක නැහැ. දින සියය තුළ අපි මේ රටේ හොඳ වැඩ ගොඩක් කළා. අපි වසමකට රුපියල් ලක්ෂ 10 බැගින් දාලා, ගම දියුණු කරන්න, සමෘද්ධි සහනාධාරය සියයට 200කින් වැඩි කරන්න, රාජ්‍ය වැටුප් රුපියල් 10,000කින් වැඩි කරන්න, පෞද්ගලික අංශයේ වැටුප් රුපියල් 2,500කින් වැඩි කරන්න, ඖෂධ වර්ගවල මිල අඩු කරන්න, පෝෂණ මල්ල ලබා දෙන්න, සෑම කෙනෙකුටම නිවසක් ලබාදීම වාගේම "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය ආදී වශයෙන් දින සියය තුළ වැඩසටහන් නිර්මාණය කරලා, මේ රටේ ජනතාව වෙනුවෙන් අපි ඒවා ක්‍රියාත්මක කළා. නමුත් ඒවා එතුමාට අමතක වුණා.

ජනතාව ජන වරමකින් ප්‍රතික්ෂේප කරපු මන්ත්‍රීවරුන්ට අද ඇමතිකම් දීලා, ඒ අය හොර ඇමතිකම්වල වාඩිවෙලා ඉන්නවා. ඒ පිළිබඳව අපි කනගාටු වනවා. අඩු තරමින් තමන්ගේ ඡන්ද කොට්ඨාසය දිනලා එන්න බැරි වෙච්ච අය, අවුරුදු 20ක් තමන්ගේ ප්‍රදේශ නියෝජනය කරපු අය, මිනිස්සු එළියට දාපු අයව බලෙන් ගෙනැල්ලා, හොරෙන් ඇමතිකම්වල වාඩි කරවලා තිබෙනවා. එක වරදක් වසා ගන්න වැරදි කීයක් දැන් කරන්න සිදු වෙලා තිබෙනවාද කියන කාරණය ගැන තමයි අපිට දැන් හිතන්න වෙන්නේ. මේ රටේ ඕනෑම පුරවැසියෙකුට, ඕනෑම දරුවෙකුට මේක හොඳටම තේරෙන දෙයක්. මේක අලුතින් කියන්න ඕනෑ දෙයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආරම්භ කරලා කරගෙන යන මේ සටන එක්සත් ජාතික පක්ෂය හෝ එක්සත් ජාතික පෙරමුණ, ආණ්ඩුවේ වාඩි වෙන්න කරන සටනක් නොවෙයි. මේ සටන, අපි නැවත ඇමතිකම් ලබා ගන්න කරන සටනක් නොවෙයි. ආපසු ඡන්දයකට ගිහිල්ලා අපිට ඉන් පරදින්නත් පුළුවන්; දිනන්නත් පුළුවන්; ඇමතිකම් ලැබෙන්නත් පුළුවන්; ඒක වෙන එකක්. වසර 22ක් අපි විපක්ෂයේ වාඩි වෙච්ච අය. ඒ වෙලාවේදී අපි මැද හරියේදී ආණ්ඩුවක් කඩාකප්පල් කළේ නැහැ; පස්ස දොරින් පාර්ලිමේන්තුවට එන්න, පාර්ලිමේන්තුවේ බලය ගන්න උත්සාහ කළේත් නැහැ. අපේ රාජකාරිය අපි ක්‍රියාත්මක කළා.

මෙතැනදී ඊට වඩා ලොකු වගකීමක් තිබෙනවා. ඒ වගකීම මෙයයි. නිදහසින් පසුව වාගේම නිදහසට කලින් මේ රටේ තිබුණු ශිෂ්ටාචාරය, සදාචාරය, මේ ක්‍රමවේදය, අපි නිර්මාණය කරපු ප්‍රජාතන්ත්‍රවාදී සංකේතය ආරක්ෂා කිරීම අපේම යුතුකමක් වනවා. අපේ ප්‍රධානම දේ හැටියට මේ රට පාලනය කරන්න හැමෝම ගරු කරන ව්‍යවස්ථාවක් අපි නිර්මාණය කළා.

අපි ආයතන පද්ධතියක් සකස් කළා. ඒ ආයතන පද්ධතිය රකින්න අපි බැඳී සිටිනවා. ඒ වාගේම, මන්ත්‍රීවරු හැටියට අපි හැසිරෙනවා. අපේ සදාචාරය, අපේ වටිනාකම් -ඒ ඔක්කෝම- වෙනුවෙන් තමයි අද පක්ෂ භේදයෙන් තොරව අපි මෙතැන එකතු වෙලා ඉන්නේ. සමහර විට අපි මතවාදීව ගැටෙන ටීඑන්ඒ සමග, ජනතා විමුක්ති පෙරමුණ සමග අපි එක අරමුණකින් කටයුතු කරන්නේ, ඒ අය එක්ක එකට වැඩ කරන්න නොවෙයි. ඒ අයගේ මතවාදයත් එක්ක අපට එකට ඉන්න බැහැ. නමුත් මෙතැනදී අපට පොදු අරමුණක් තිබෙනවා. ඒ බලය නොවෙයි. ඒ පොදු අරමුණ තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම. ඒක රැක්කාම විතරයි මේ රටේ ඉන්න සියලුදෙනාගේම, මේ පාර්ලිමේන්තුව තුළ, රට තුළ ජීවත් වන සියලුදෙනාගේම අයිතිවාසිකම් රකින්න අපට පුළුවන් වන්නේ. ඒ කරුණ අපට අමතක කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය සතිය තුළ, පාර්ලිමේන්තුව තුළ සිදු වුණු දේවල් දැක්ක මේ රටේ ජීවත්වන ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙක් කියනවා, "ලජ්ජා හිතුණා" කියලා. ලජ්ජාවක් ඇති වෙනවා ඇති. ඔබතුමා නියෝජ්‍ය කථානායකතුමා. ඔබතුමාටත් වගකීමක් තිබෙනවා. සමහර අය මන්ත්‍රීවරු - දේශපාලනඥයන්- කියන ඔක්කෝම එක ගොඩේ දමලා කථා කරනවා. මන්ත්‍රීවරයෙක් නම්, තුට්ටුවකට ගණන් ගන්නේ නැහැ; කිසිම ගෞරවයක් දෙන්නේ නැහැ. මම හිතන්නේ නැහැ, ඒක හරි කියලා. පිරිසක් වැරදි විධියට හැසිරුණා. පිරිසක් තමන්ගේ වටිනාකම් ටික පාවා දුන්නා. නමුත් ඒ සුළු පිරිසක් කියලා මා හිතනවා. මේ සභාව තුළත්, මේ සභාවෙන් පිටත් ඒ අයට ලොකු බලපෑම් ඇති වුණා. නිකම් නොවෙයි, සමහර මන්ත්‍රීවරුන්ට මිල මුදල්වලින්, ලක්ෂ ගණන්වලින් නොවෙයි, කෝටි ගණන්වලින් බලපෑම් කරලා මන්ත්‍රීකම දමලා ඇවිල්ලා ඇමතිකම් ගන්න කියලා බල කළා. ඇමතිකම්, කැබිනට් ඇමතිකම්, තනතුරු දෙනවා කිව්වා. පසු පෙළ මන්ත්‍රීවරුන්ට කැබිනට් ඇමතිකම් දෙනවා කිව්වා, දුරකථනවලින් කථා කරලා. එහෙත් කීපදෙනෙක් එහාට මෙහාට වුණාට, මේ පාර්ලිමේන්තුවේ ඉන්න බහුතරයක් ප්‍රතිපත්තිය වෙනුවෙන්, තමන් විශ්වාස කරන ඒ වටිනාකම් වෙනුවෙන් කෙළින්ම රැඳී සිටියා. අපි ඒකට ගරු කරන්න ඕනෑ. අද ඒ ගැන බොහෝ දෙනෙක් කථා කරන්නේ නැහැ. අද අපේ පසු පෙළ මන්ත්‍රීවරු විශාල පිරිසක් ඉන්නවා, ඇමතිවරු ඉන්නවා දමලා යන්නේ නැතුව තමන් විශ්වාස කරන මතවාදය වෙනුවෙන් පෙනී සිටින. ඒක අපට අමතක කරන්න බැහැ. එතුමන්ලා මුදල්වලට, තනතුරුවලට ඒ වටිනාකම් පාවා දුන්නේ නැහැ; බලපෑම්වලට පාවා දුන්නේ නැහැ; තර්ජනවලට පාවා දුන්නේ නැහැ. ඒක වැදගත්. ඒ විතරක් නොවෙයි. අපි ආදරය කරන අපේ රට, අපේ ව්‍යවස්ථාව, අපේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් තමයි අපි ඒ ප්‍රතිපත්තියේ ඉන්නේ කියන එක බොහෝ දෙනෙක් තේරුම් ගන්නේ නැහැ.

ඒ වාගේම, තවත් චරිත කිහිපයක් තිබෙනවා. ගරු කථානායකතුමා කෙළින් සිටියා. අපි ඒක කිසිම විටෙක අමතක කරන්නේ නැහැ. ගරු කථානායකතුමා වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඔබතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුව අපේ

[ගරු කබීර් හාෂිම් මහතා]

අයිතිවාසිකම් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව පවත්වන්න බියෙන් තොරව වැඩ කටයුතු කළා. ඒක වැදගත්. මේ රටේ පුරවැසියන් හෝ ජාත්‍යන්තරය වුණත් කිසිම දිනයක ඒක අමතක කරන එකක් නැහැ.

ඊළඟට, අපේ අධිකරණය ගැන බලමු. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ, අපේ රටේ ඉන්න ප්‍රධානීන්ට මධ්‍යස්ථව වැඩ කරන්න පුළුවන් පරිසරයක් හදන්නයි. ඒක හරි ගියා. අපි දැක්කා, අපේ අධිකරණය ඉතාම මධ්‍යස්ථව, බය නැතුව, හරි දේ කළ, හරි තීන්දුව ගත්ත ආකාරය. මේ සටනේදී අපට ඇමතිකම් ලැබුණාද, නැද්ද කියන එක වැඩක් නැහැ. නමුත් ඒ වටිනාකම් වටිනවා. ඒවා තමයි අපට ඉතුරු වන්නේ; අපේ ළමයින්ට වුණත් ඉතුරු වන්නේ. ඒක අපට අමතක කරන්න බැහැ.

ඒ වාගේම, විවිධ දේශපාලන මතවාද තිබෙන, විවිධ පාටවලට අයිති සාමාන්‍ය පුරවැසියෝ මේකට විරුද්ධව තමන්ගේ හඬ නඟන්න මහ පාරේ එකතු වුණා. මොකද, ඔවුන් විශ්වාස කළා මේක වැරදියි කියලා. අපේ රටේ ඒ පුරවැසියන් අපට කිසිම දවසක අමතක කරන්න බැහැ. ඒ සිවිල් සමාජය අපට අමතක කරන්න බැහැ. ඒ අයට මේකෙන් ලැබෙන දෙයක් නැහැ. එහෙත් රට වෙනුවෙන් ඒ අය ඉදිරිපත් වුණා. ඒක ඉතා වැදගත්.

ඒ වාගේම අපේ අගමැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලංකාවේ වැඩිම මනාප -මනාප පන්ලක්ෂ ගණනක්- ගත්ත මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයා. ඒ වාගේම විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා පරද්දන්න උත්සාහ කළත් විශ්වාසය දිනා ගත්ත කෙනා; මේ රටේ නීතියෙන් පත් වුණ අගමැතිවරයා, නීති විරෝධී විධියට බලෙන් ඉවත් කළත් අද වනතුරු කිසිම කෙනෙකුට නරක විධියට කථා කරලා නැහැ.

එතුමාගේ ගෞරවය, ඒ තනතුරේ ගෞරවය එතුමා ආරක්ෂා කරලා තිබෙනවා. ඒවා අපට අමතක කරන්න බැරි දේවල්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ඔක්කෝම කරන්නේ ඇයි? මේ ඔක්කෝම කරන්නේ "රට බේරා ගන්න" කියන කථාවෙන්, "දේශප්‍රේමීත්වය" කියන එකෙන්. "දේශප්‍රේමීත්වය කියන්නේ දේශපාලන තක්කඩියාගේ අවසාන තිප්පොළයි" කියලා කියමනක් තිබෙනවා. ඒ දේශප්‍රේමීත්වය කියන කථාව පාවිච්චි කරගෙනයි තමන්ගේ හොරකම, ජඩකම කියන හැම දෙයක්ම වසා ගන්නේ. රට බේරා ගන්නේ මොකෙන්ද? කාගෙන්ද? කාටද දෙන්නේ රට ආරක්ෂා කරන්න?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක දෙයක් මතක් කරන්න කැමැතියි. එක්සත් ජනතා නිදහස් සන්ධානය 1994දී බලයට පත් වෙන්නේ නියෝලිබරල්වාදී ප්‍රතිපත්තිවලට විරුද්ධවයි; විවෘත ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධවයි. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ අනෙක් පැත්ත හරවන්න කියලා බලයට ආපු අය, ජේ.ආර්.ගේ බහුබූත ව්‍යවස්ථාව පැය 24කින් ඉරා දමනවා කියපු අය, ජේ.ආර්.ජයවර්ධන මහතාගේ ඒ ව්‍යවස්ථාව තවත් ශක්තිමත් කරලා, විධායක ජනාධිපති ක්‍රමය තවත් ශක්තිමත් කරලා අවුරුදු 20ක්ම මේ රටේ ඒකාධිපති බලයක් ගෙන ගියා. විවෘත ආර්ථිකය ප්‍රතික්ෂේප කරනවාය කියපු මහින්ද රාජපක්ෂ මහත්මයාලාගේ ආණ්ඩුව එදා -1994- ඉඳලා අනුගමනය කළේ, නියෝලිබරල්වාදී ප්‍රතිපත්තියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ දේපළ විකුණනවා කියලා මේ ආණ්ඩුවට ඇහිල්ල දිගු කරපු අයට මම අද කියනවා, 1995දී ලංකා ගෑස් කොම්පැනිය වික්කේ මහින්ද රාජපක්ෂ මහත්මයායි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයායි දෙදෙනාම හිටපු ආණ්ඩුවෙන් කියන එක. ඊළඟට, 1996දී ලංකා වානේ සංස්ථාව විකුණුවේ ඒ ආණ්ඩුව යටතේයි. ඔරියන්ට් ලංකා සමාගම වික්කේ 1996දී. ශ්‍රී ලංකා ටෙලිකොම් ඇති කළේ, පෞද්ගලීකරණය කළේ, 1997දී. ඒ කාල පරිච්ඡේදය තුළදී විතරක් නොවෙයි, මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වුණාට පසුව ඇඹිලිපිටියේ කඩදාසි සංස්ථාව ඕස්ට්‍රේලියානු සමාගමකට විකුණා දමනවා. එල්ටීටීඊයෙන් -ත්‍රස්තවාදීන්ගෙන්- මුදවා ගත් කිලිනොච්චියේ ගොවිපොළක් සෝලි කැප්ටන්ට මහින්ද රාජපක්ෂ මහත්මයා විකුණා දමනවා. නුවරඑළියේ තිබුණ ආණ්ඩුවේ ගොවිපොළවල් කිහිපයක් සෝලි කැප්ටන්ට විකුණා දමනවා. එදා මේවා ගැන පත්තරවලින් කියන්න ඉඩ තිබුණේ නැහැ. සෝමාවතී චෛත්‍යය වටේට තිබෙන අක්කර 5,000ක් ඇමෙරිකාවේ ඩෝල් සමාගමට ලියා දෙනවා. ඊළඟට, ෂැන්ග්‍රි-ලා හෝටලය, අපේ හමුදා මූලස්ථානය තුට්ටුවට චීන සමාගමකට විකුණා දමනවා. යුද්ධය මෙහෙය වූ මූලස්ථානය ඒක. ඊළඟට, පෝට් සිටි එකේ අක්කර 25ක් සින්නක්කරව ලියා දෙනවා, චීන ආණ්ඩුවට.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අක්කර 50ක්.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
සමාවෙන්න, අක්කර 50ක්. මේවා හරිද? රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇවිල්ලා ආපසු ඒවා නිවැරදි කළා.

ඊළඟට, හම්බන්තොට වරාය චීන සමාගමට -චයිනා හාබර් එකට- ලියා දුන්නේ කොහොමද? අපේ නාවික හමුදාවට ඒ වරාය ඇතුළට යන්න බැහැ කියන තහනමක් දමලායි ඒක කළේ. අපේ ස්වෛරීභාවයට පහරක් ගසා තමයි ඒ දේවල් කරන්නේ. මේ ඔක්කෝම කරන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා සමඟ සිටින දේශප්‍රේමය වෙනුවෙන් මේ ආණ්ඩුව ගන්න ඕනෑය කියන අයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ලොකුම හොරකම් ටික කරන්නේ, මේ රටේ ලොකුම පාවාදීම් ටික කරන්නේ ඒ කාලයේදියි කියන එක මම කියන්න කැමැතියි. මම මේ ගැන අහන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙන්. ජනාධිපතිතුමනි, ඔබතුමා මේවා දැනගෙන මේ අයටම මේ ආණ්ඩුව භාර දෙන්නේ කොහොමද? 2012දී මහින්ද රාජපක්ෂ මහත්මයා මොකක්ද කළේ? නියෝලිබරල්වාදී ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කරනවාය කියපු මහින්ද රාජපක්ෂ මහත්මයා තමයි පළමුවැනි වතාවට නියම නියෝලිබරල්වාදී ප්‍රතිපත්තිය ලංකාවට හඳුන්වා දුන්නේ. අපේ ප්‍රාග්ධන ගිණුම් ටික විවෘත කරන්නේ එතුමාගේ කාලයේදී. 2012දී පළමුවැනි වතාවට ලංකාවේ -අපේ- දේශීය බැංකුවලට විදේශ බැඳුම්කර නිකුත් කරන්න, විදේශ රටවලින් බැඳුම්කර හරහා ඩොලර්වලින් ණය ගන්නට අවසරය දුන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. ලංකා බැංකුව, මහජන බැංකුව ආදී බැංකුවලට බල කරනවා, විදේශ ඩොලර්වලින් ණය ගන්න කියලා. ඒවායේ ප්‍රතිඵලය වුණේ මොකක්ද? 2012දී පළමුවෙන්ම විදේශ ඩොලර් බැඳුම්කර නිකුත් කරලා මුදල් ගන්නවා. 2013 වෙනකොට රුපියලේ අගය වැටුණු නිසා, ඒ තුළින් වුණු පාඩුව රුපියල් බිලියන 22ක්, නැත්නම් කෝටි 220ක්.

ඊළඟට, 2014දී ඒකෙන් වුණු පාඩුව රුපියල් කෝටි 317ක්. 2015දී වුණු පාඩුව රුපියල් කෝටි 171ක්. එසේ Dollar Bonds නිකුත් කිරීම නිසාම අවුරුදු තුනක් ඇතුළත අපට සිදු වුණු සමස්ත

පාඩුව රුපියල් කෝටි 716යි. ඒ පාඩුව ගෙවන්නේ මහ බැංකුව. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලය තුළ. මේක තමයි නියෝලිබරල්වාදය, මේක තමයි ලොකුම පාවාදීම. රුපියල් කෝටි ගණනක විදේශ බැඳුම්කරවල පාඩුව අපට ගෙවන්න සිද්ධ වුණා. අපේ කාලයේ මේවා දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා කියනවා, එහෙම කරන්නේ නැහැ ලු. එතුමා දේශප්‍රේමියෙක් ලු. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කියනවා, රට බේරා ගන්න අලුත් ක්‍රමයක් ඕනෑය කියලා. මේකද, අලුත් ක්‍රමය? අවුරුදු 10ක් තිස්සේ මේ ක්‍රමය වෙනස් කරන්න තිබුණු අවස්ථාවේ දී තම-තමන්ගේ ජාවාරම්කරුවෝ, කොන්ත්‍රාත්කරුවෝ ආරක්ෂා කරන්න ගෙන ගිය ප්‍රතිපත්තිය, "දේශප්‍රේමී" ලේබලයත් එක්ක ආපසු දෙන්නද? අවුරුදු 10ක් තුළ මේ රට හරවන්න බැරි වෙච්ච අයට, ණය කන්දක් ඇති කරලා දීපු අයට ආපසු මේ හොරකම් කරන්න ඉඩ දෙන්නද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012 ඉඳලා 2014 වෙනකම් එම කාල පරිච්ඡේදය තුළදී මේ බැඳුම්කරවලින් වූ පාඩුව විඳින කොට, නිවාඩ කබ්රාල් හිටපු මහ බැංකු අධිපතිවරයා මොකක්ද, කළේ? නිවාඩ කබ්රාල් උපදේශකවරුන් තුන්දෙනෙක් කුලියට ගත්තා, බ්‍රිතාන්‍යයෙන්. එංගලන්තයෙන් ගෙන්වුවා, උපදේශකවරුන් තුන්දෙනෙක්. ඒ ගොල්ලන්ට කැබිනට් අනුමැතිය නැතුව ගෙව්වේ කීයක්ද? රුපියල් බිලියන 1.3ක්. ඒ කියන්නේ එම උපදේශකවරුන්ට රුපියල් කෝටි 139ක් කැබිනට් අනුමැතිය නැතිව ගෙව්වා. ඒකෙන් එක් පුද්ගලයෙකුට -එක උපදේශකවරයෙකුට- එක වසරකට ගෙවපු මුදල රුපියල් කෝටි 46යි. කොහොමද, ගණන්? ඒකද, දැන් ආපසු ගෙනැල්ලා ඇති කරන්න යන වෙනස? දැන් බලන්න, එම සංස්ථාවල තනතුරුවලට පත් කරන්නේ කවුද? පසුගිය කාලයේ මේ රට සූරා කාපු හොරු ටික. මම අහන්නේ, මෙන්න මේ වෙනස ඇති කරන්න දෙන එක සාධාරණද?

ඇමතිකම් කවුරු ගත්තත් කමක් නැහැ; ආණ්ඩු කවුරු කළත් කමක් නැහැ. නමුත් අපි අවුරුදු ගණනාවක් දුක් වින්දා. යුද්ධය අවසන් වෙලා අවුරුදු හයක් විතර ඉඩ දුන්නා, ඒ ගොල්ලන්ට ආණ්ඩු කරන්න. ඒත් ඒ ප්‍රශ්න විසඳුවේ නැහැ. ඒ නිසා අපේ යුතුකම වන්නේ මේ රටේ එම පාවාදීමට ඉඩ නොදී මේකට විරුද්ධව අරගළ කිරීමයි. අපි මේ පාර්ලිමේන්තුව තුළ අරගළ කරනවා. මේ සම්බන්ධව පාර්ලිමේන්තුව තුළ අරගළ කරන්න බැරි වුණත්, වීදියේ අරගළ කරලා හෝ මේ රට ආරක්ෂා කරන එක අපේ විතරක් නොවෙයි, මේ රටේ හැම පුරවැසියෙකුගේම අයිතියක් කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසාන වශයෙන් මේ ගැනත් සඳහන් කරන්න කැමැතියි. අපට අහිමි වුණු දේවල් මොනවාද? ප්‍රජාතන්ත්‍රවාදය සාමාන්‍ය පුංචි මිනිහාට දැනෙන්නේ නැහැ. ඒක අල්ලන්න බැහැ. ඒක තේරෙන්නේ නැහැ. ඒක සීතලද, රස්නෙද කියලා තේරෙන්නේ නැහැ. නමුත් මෙන්න මේ ටික තමයි අපට අහිමි වුණේ. අපි අවුරුදු තුනහමාරක් දුක් විඳලා මේ ආර්ථිකයේ අඩිතාලම දැමුවා. මේ රටේ ජීවත් වෙන සාමාන්‍ය මිනිසුන්ට තමන්ගේ ජීවිතය ගොඩනඟා ගන්නට පුළුවන් ඒ හැකියාව, පරිසරය හදලා දෙන්න පටන් ගත්තා. අපි මේ රටේ හැම කෙනෙකුටම ඉඩම් ඔප්පු ලබා දී තමන්ගේම කියන ඉඩම් කෑල්ලක් ලබා දෙන්න කටයුතු කළා. අපි දකුණේ ඉඩම් ඔප්පු ලබා දෙන එම වැඩ කටයුත්ත ආරම්භ කළා. අපි හැම කෙනෙකුටම නිවසක් ලබා දීමේ වැඩ පිළිවෙළ පසුගිය අවුරුදු තුනහමාර තුළ සජිත් ප්‍රේමදාස මැතිතුමා යටතේ කරගෙන ආවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ කාලයේ -අවුරුදු හයක්ම- හදලා තිබුණේ, ගෙවල් එක්ලක්ෂ දහදාහයි. මේ අවුරුදු දෙකහමාර තුළ සජිත් ප්‍රේමදාස මහතා ගෙවල් දෙලක්ෂ අසූදහසක් හදලා තිබෙනවා. ඒක තමයි වෙනස. ඒ වාගේම අපි හතළිස්පන්ලක්ෂයක් වන පාසල් දරුවන්ට "සුරක්ෂා" කියන රක්ෂණ ක්‍රමය ලබා දීමේ වැඩ කටයුතු පටන් ගත්තා. අපි "ගම්පෙරළිය" වැඩසටහන ආරම්භ කළා, හැම ගමකටම වැඩක් කරන්න. "Enterprise Sri Lanka" වැඩ පිළිවෙළ ආරම්භ කරමින්, ගමේ සිටින කාන්තාවන්ට ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනක් ආරම්භ කළා.

ලබන වසර සඳහා ඉදිරිපත් කරන්න නියමිතව තිබුණු අය වැයෙන් තවත් ලක්ෂ 10කට අලුතින් සමෘද්ධිය ලබාදෙන වැඩසටහනක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වුණා. රැකියා 50,000ක් ලබා දීමේ යෝජනාවක් සම්මත කරගන්න බලාපොරොත්තුවෙන් හිටියා; උපාධිධාරී පත්වීම් 25,000ක් ලබා දෙන්න බලාපොරොත්තුවෙන් හිටියා. ඒ ටික තමයි මේ රටේ ජනතාවට අහිමි වුණේ. ඒ නිසා මේක පුංචි වැඩක් නොවෙයි. අද අපි සටන් කරන්නේ යුක්තිය, නීතිය, ජනතා පරමාධිපත්‍ය වෙනුවෙනුයි. ඒ නිසා මේ අරගළය දිගටම ගෙන යාමට අපි බලාපොරොත්තු වනවා. අවසාන වශයෙන් අපේ නීත්‍යානුකූල ආණ්ඩුව නැවත පත් කරන්නට අවශ්‍ය සියලු කටයුතු මේ ඉදිරි දවස් කිහිපය ඇතුළත කරන්නට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I propose that the Hon. Bimal Rathnayake do now take the Chair.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා.2.53]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මොකද, අද තමයි මාසයක පමණ කාලයකින් පසුව මේ රටේ ජනතාවට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව පවතිනවායි කියා දැනෙන ආකාරයට කටයුතු කරන්න අවස්ථාව ලැබුණේ. අද තමයි රටේ ජනතාවගේ ආත්ම ගෞරවය සහිතව, පාර්ලිමේන්තුවේත් ගරුත්වය සහිතව පාර්ලිමේන්තුව කැඳවපු දවස. ඇත්තටම ගත්තොත් එය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ලැබූ තාවකාලික හෝ ජයග්‍රහණයක් කියලා අප විශ්වාස කරනවා.

විශේෂයෙන් පසුගිය සති කිහිපය තුළ අපේ රට ලෝකය ඉදිරියේ ඉතාම හැල්ලුවට ලක් වුණා. අපි කවුරුත් පිළිගන්න ඕනෑ, අපට මොන දේශපාලන මතිමතාන්තර තිබුණත්, ලෝකය ඉස්සරහා අපහාසයට, අපහසුතාවට, හැල්ලුවට ලක් වෙන කොට එසේ හැල්ලුවට ලක් වෙන්නේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න අපි විතරක් නොවෙයි, මුළු රටේම ජනතාවට ඒ තත්ත්වයට මුහුණ දෙන්න වෙනවාය කියන එක. එහිදී මොන පක්ෂය නියෝජනය කළත්, මොන පක්ෂයට ඡන්දය දුන්නත්, මොන දේශපාලන මතය දැරුවත් අපි රටක් හැටියට හැල්ලුවට ලක් වෙනවා. ගත වුණු කාලය තුළ, ගත වෙමින් තිබෙන මේ මොහොත තුළ අපේ රටේ ආර්ථිකයේ පැවැත්ම ඉතාම බරපතළ විධියට කඩා වැටිලා තිබෙනවා; කඩා වැටෙමින් තිබෙනවා. රටේ පරිපාලන ව්‍යුහය ඉතාම බරපතළ විධියට අවිනිශ්චිතතාවට පත් වෙලා තිබෙනවා. අද මේ රටේ තිබෙන්නේ මොන ආණ්ඩුවක්ද කියන එක ගැන, සිටින්නේ මොන අගමැතිවරයෙක්ද, මොන කැබිනට් මණ්ඩලයක්ද, මොන පරිපාලන නිලධාරියාද, අමාත්‍යාංශ ලේකම්තුමාද කියන එක ගැන, කාගේ නිර්දේශ, නියෝග, චක්‍රලේඛ පිළිගන්නවාද කියන එක ගැන අවිනිශ්චිතතාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවිනිශ්චිතභාවයට රට පත් කළේ වෙන කවුරුවත් නොවෙයි. බලහත්කාරයෙන් බලය හදා ගැනීමේ පවිටු වුවමනාව සඳහා අපේ රටේ දේශපාලන සංස්කෘතිය ඉතාම නිර්ලජ්ජිත විධියට යොදා ගත්ත මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාත්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් විසිනුයි. තමන්ට බලය අහිමිවේ යයි දේශපාලන වශයෙන් තිබෙන ඕන මානය නිසා, මීළඟටත් ජනාධිපතිවරයා වීමේ අවස්ථාව ලබා ගැනීම සඳහා මාවත විවර කර ගැනීම වෙනුවෙන්, ඉතාම පෞද්ගලික අවශ්‍යතා ප්‍රමාණයක් ඉටු කර ගැනීමේ වුවමනාව තමයි මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට තිබෙන්නේ. එතුමාගේ පෞද්ගලික දේවල්, පෞද්ගලිකත්වය මේ රටේ ජනතාවගේ ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, හැටතුන්ලක්ෂයකට ආසන්න ජනතාවගේ ජනවරමට එතුමා පයින් ගහලා, මහින්ද රාජපක්ෂ මහත්මයාට අගමැතිකම භාර දී ඉතාම කැත, නින්දිත ආකාරයේ කැබිනට් මණ්ඩලයක් නිර්මාණය කරන්න උත්සාහ කළා. ඒකෙන් අද ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය මොකක්ද?

විශේෂයෙන් අපට පෙනෙනවා, මේ වනකොටත් තමන් ආණ්ඩුවක් හදා ගත්තා යැයි ප්‍රකාශ කරමින් පසුගිය රාජපක්ෂ රෙජීමය යුගයේ දී මේ රටේ නාස්තියට, දූෂණයට, හොරකමට, වංචාවට උදව් කරපු, ඒවාට මැදිහත් වුණු හොර කල්ලියක් නැවත රාජ්‍ය ආයතන අත්පත් කර ගනිමින් සිටින ආකාරය. නාලක ගොඩහේවා මහත්මයා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ධුරයට පත් කළා යැයි මාධ්‍යවල පළ වෙනවා. ඒ වාගේම කපිල චන්ද්‍රසේන ශ්‍රී ලන්කන් ගුවන් ගමාගමේ සභාපති ධුරයට පත් කළා යැයි මාධ්‍යවල පළ වෙනවා. හුළුගල්ලේ Lanka Hospitals එකේ - ඇපලෝ රෝහලේ- සභාපති ධුරයට පත් කළා යැයි මාධ්‍යවල පළ වෙනවා.

මේවා ඇත්ත නම්, මේවා පිළිගන්නවා නම්, ඒකෙන් තේරෙන්නේ වෙන මොකක්වත් නොවෙයි. අපේ රටේ පරිපාලනය නැවතත් හොර මුළකට බිලිවනවාය කියන එකයි එයින් වැටහෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පෙනෙනවා, අපි දන්නවා, නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි කාලය කියන්නේ, අපේ රටේ ආර්ථිකයට වාසිදායක කාලයක් බව. විශේෂයෙන්ම මුහුදුකරයේ, සංචාරක කර්මාන්තයත් එක්ක ගැටෙන දකුණේ; මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කය, ඒ වාගේම ගාල්ල, හම්බන්තොට දක්වා වූ සංචාරක කලාපය තුළින් අප මේ කාලයේ විශාල ආදායමක් ලබාගන්නවා. නමුත් අද සංචාරකයන් ලංකාවට එන එක ඔවුන් විසින් cancel කර තිබෙනවා. මේවා කියනකොට කවුරුන් හෝ කියයි, "මේ බටහිර වුවමනාවන්" කියලා. නැහැ. අද අපි මේ පාර්ලිමේන්තුවේ අපේ සියැසින් -ඇස් දෙකෙන්- දැක්ක මේ සිදුවීම් වෙනත් රටක -මාලදිවයිනේ, පාකිස්තානයේ, බංග්ලාදේශයේ, ඉන්දියාවේ, අපේ ආසන්න රටක- සිදුවෙනවා රූපවාහිනියෙන් හෝ ජාත්‍යන්තර ප්‍රවෘත්තිවලින් හෝ BBC එකෙන් හෝ දැක්කා නම්, අපි ඒ රටට යනවාද? අපි ඒ රටට සංචාරය කරනවාද? පාරේ ගහගන්නවා නම්, පරිපාලන පද්ධතියක් නැත්නම්, රටේ නීතියක් නැත්නම්, රට පාලනය කරන්නේ කවුද කියා අවිනිශ්චිතභාවයක් තිබෙනවා නම් ඒ රටට යන්නේ මොන ආයෝජකයාද? අපේ රටට කවුරුවත් එන්නේ නැත්තේත් ඒ නිසා තමයි. චණ්ඩි වාගේ කෑ ගහන සමහර උදවිය හිතාගෙන ඉන්නවා, ඒ ගොල්ලන් කෑ ගැහුවාට පස්සේ ජාත්‍යන්තර භය වෙයි කියලා; ජාත්‍යන්තරය භයවෙලා ලෝකයේ රටවල් අප ඉදිරියේ දණ ගහලා, අපේ ඇඟලුම් ටික මිලදී ගනියි කියලා; "ශ්‍රී ලංකාවට අපි දණ ගහනවා, ඒ නිසා අපට ඇඟලුම් ටික දෙන්න, තේ, රබර්, පොල් ටික දෙන්න. මැණික්, ගම්මිරිස්, කුරුඳු ටික දෙන්න" කියා භාර ගනියි කියා. නැහැ. අපට සම්බාධක දමන්න ඕනෑ නැහැ. සම්බාධක දමනවාට අපි කැමැතිත් නැහැ. කවුරුවත් සම්බාධක බලෙන් ගෙන්වා ගන්න ඕනෑත් නැහැ. හැබැයි අද ආයෝජන කඩා වැටිලා තිබෙනවාය, අපේ වෙළෙඳ පොළ අස්ථාවරවෙලා තිබෙනවාය, සංචාරකයන් එන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවාය කියා අපට තේරෙනවා.

බන්දුල ගුණවර්ධන මහත්මයා එක වෙලාවකදී කෑ ගහනවා, "දැන් රුපියල කඩා වැටෙනවා, රුපියල අල්ලන්න විධියක් නැහැ, රුපියල කඩා වැටෙනකොට ආණ්ඩුවට උත්තර නැහැ" කියා. හැබැයි අද ඩොලරයේ වටිනාකම රුපියල් 181යි. අදත් රුපියල කඩා වැටෙනවා. මේ ආණ්ඩුව තිබියදී සිංගප්පූරු ගිවිසුම අත්සන් කරනකොට ආණ්ඩුවට ඉතා පැහැදිලිව කිව්වා, "සිංගප්පූරු ගිවිසුම ක්‍රියාත්මක වන්නේ අවුරුදු 5කින්, හැබැයි ආණ්ඩු කඩා වටිටනවා, ආර්ථිකය බිඳ වැටෙනවා, රට අස්ථාවර කරනවා, මේ ගිවිසුම් ගෙනෙන්න එපා" කියා. එදා කෑ ගහපු බන්දුල ගුණවර්ධන මහත්මයාම දැන් තාවකාලිකව, බලෙන් බලය ගන්න, මොහොතකට ඇමති ධුර ලබාගෙන අහනවා, "සිංගප්පූරු ගිවිසුම නවත්වන්නේ මොන හරකාද?" කියා. බලයක් ගැවෙනකොට, බලයක් පෙනෙනකොට ඒ ගොල්ලෝ වචන මාරු කරනවා. බලයක් පෙනෙනකොට, බලයක් ගැවෙනකොට නාම මාත්‍රිකව හෝ ඒ ගොල්ලන්ට වුවමනා පදය නැවත හදාගන්නවා. මේ බලය අල්ලන්නේ, ආර්ථික ප්‍රතිපත්තියක් මත, දැක්මක් අනුව රට හදන්න, රට ස්ථාවර කරන්න, එහෙම නැත්නම් කඩා වැටෙන ආර්ථිකය හදන්න, රුපියල ස්ථාවර කරන්න, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ගෙනාපු රටට අහිතකර යෝජනා, ගිවිසුම් අවලංගු කරන්න නොවෙයි. ඒ ගොල්ලන් බලය හදාගන්නේ, බලෙන්

බලය හදාගැනීමේ මැතිවරණ කුමන්ත්‍රණයක් වෙනුවෙන්, මැතිවරණ සිතියම වෙනුවෙන්, තමන්ට එල්ලවෙලා තිබෙන නඩුවලින් ගැලවීම වෙනුවෙන් බව හොඳටම පැහැදිලියි. අපි අහන්නේ මෙච්චරයි. මේ දෙකෝටියක ජනතාව, අපේ රටේ අභිංසක දරු පරම්පරාව ඒ වෙනුවෙන් අලගු තියන්න ඕනෑද? මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට තිබෙන බල භීනය වෙනුවෙන්, භීනමානය වෙනුවෙන් අපේ රටේ ජනතාව වන්දි ගෙවන්න ඕනෑද? ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේදී වෙන්න පුළුවන්, මහ පාරේදී වෙන්න පුළුවන්, පාර්ලිමේන්තුවේදී වෙන්න පුළුවන්, මේ කුමන්ත්‍රණය දේශපාලනික වශයෙන් පරාජය කිරීම ජන වරමට වග කියන මහජන නියෝජිතයන් හැටියට අපේ වග කීමක් කියා අපි විශ්වාස කරනවා. ඒ වගකීමේ ජනතා විමුක්ති පෙරමුණේ කොටස අපි ඉෂ්ට කරනවා, ඉෂ්ට කළා. ඒ ගැන අපට සන්තෝෂයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනික වශයෙන්, පරිපාලනමය වශයෙන්, ආර්ථික වශයෙන් දැන් ඇතිවෙලා තිබෙන අස්ථාවරත්වයෙන් මේ රට ගලවා ගන්න ඕනෑය කියා අපි විශ්වාස කරනවා. ඒ සඳහා මේ කුමන්ත්‍රණය පාර්ලිමේන්තුව තුළ දේශපාලනික වශයෙන් පරාජය කරනවා වාගේම, රටේ ස්ථාවරභාවය, ආර්ථිකයේ ස්ථාවරභාවය වෙනුවෙන් අනිවාර්යයෙන් ක්‍රියාමාර්ග අවශ්‍ය වෙලා තිබෙනවා. මේ කුමන්ත්‍රණයේ එක දිගුවක් අද පළමුවන වතාවට එක මොහොතකදී පරාජය වුණු බව අපි දැක්කා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 121දෙනකුගේ ඡන්දයෙන් තේරීම් කාරක සභාව ආරම්භ කළා. පාර්ලිමේන්තු ක්‍රියාවලිය පවතින්නේ මේ chamber එකේ පමණක් නොවෙයි කියා ඔබතුමා දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තුවේ කාරක සභා තිබෙනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අපි විමර්ශනයන් ගණනාවක් කරගෙන ආවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා 5ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. තවත් වාර්තා ඉදිරිපත් කරන්නත් තිබෙනවා. ඒවා පිළිබඳව මිනිසුන්ගේ විශ්වාසයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව වංචා, දූෂණ වෙනුවෙන් හඬක් නහන්න පුළුවන් තැනක්ය, මේ පාර්ලිමේන්තුව යම් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් තැනක්ය කියන විශ්වාසය මහ ජනතාවට තිබුණා. පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට, මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමා දන්නවා, මිනිසුන් මොන තරම් බලාපොරොත්තු ඇතිවද පෙත්සමක් අරගෙන එන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළ පෙත්සමක් විභාග කරන්න සමහර විට මාස ගණනක්, අවුරුද්දක්, දෙකක් ගත වෙනවා. පාර්ලිමේන්තු සැසි වාරය කල්තැබීමත් සමහම ඒ පෙත්සම් සියල්ල නතර වෙනවා. සමහරු නැවත ඒ පෙත්සම ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ පෙත්සම විභාග කරනකොට සමහර විට ඔහුගේ ජීවිත කාලය අවසන් වෙලා තිබෙන්නත් පුළුවන්. පාර්ලිමේන්තුව කියන්නේ මහ ජනතාවගේ ප්‍රශ්න විසඳන තැනක්. එහෙම නැතිව පාර්ලිමේන්තුව කියන්නේ තමන්ගේ බලය සඳහා පොර කන තැනක් නොවෙයි. හැබැයි, පාර්ලිමේන්තුව කියන්නේ තමන්ගේ බල කෑදරකම් වෙනුවෙන් පොර කන ස්ථානයක්ය කියන එකයි අද අපට පෙනෙන්නේ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත්, රාජපක්ෂ කල්ලියත් පාර්ලිමේන්තුව ඒ තත්ත්වයට පත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තේරීම් කාරක සභාව පත් කළ විධියටම ඉතිරි කාරක සභා පත් කරන්න කියන කාරණය කෙරෙහි මම ඔබතුමාගේත්, ගරු කථානායකතුමාගේත්, පාර්ලිමේන්තුවේත් අවධානය යොමු කරවනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ඇතුළු අනෙකුත් ආංශික අධීක්ෂණ කාරක සභා ස්ථාවරව පත් කරලා, පාර්ලිමේන්තුව පිළිබඳව තිබෙන මේ සැකය, අවිශ්වාසය නැති කරලා, පාර්ලිමේන්තුව ගැන ජනතාව තුළ බිඳ වැටුණු මානසිකත්වය නැවත ගොඩ නංවන්න ඕනෑ. ඇත්තටම මේ කල්තැබීමේ විවාදයත් එක්ක පාර්ලිමේන්තුව රටේ ජනතාවට විවෘත වෙන්නේ අදයි. "පාර්ලිමේන්තුවට ලක්ෂ 10ක් විතර වියදම් කරනවා, තේරුමක් නැහැ, පාර්ලිමේන්තුව විනාඩි 5යි පැවැත්වෙන්නේ" කියා රටේ ජනතාව අද කියනවා. පාර්ලිමේන්තුව තිබෙන්නේ මිරිස් කුඩු ගහන්නවත්, කථානායක පුටුවට වතුර වක්කරන්නවත්, එක එක්කෙනෙකාගේ අතේ පයේ හයිය පෙන්වන්නවත් නොවෙයි. අතේ පයේ හයිය පෙන්වන්න ඕනෑ නම් එළියට ගිගින් ගහ ගන්න එකයි කරන්න තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙම කාරක සභා පත් කරලා, පාර්ලිමේන්තුව ස්ථාවර කිරීමේ වගකීම අපි කාටත් තිබෙනවා. අද මුළු ලෝකයටම පෙනුණා, ඔය කියන කල්ලියට බලයක් නැති බව. බලය මෙතැන පෙනෙන එක වහගන්න ඒ ගොල්ලන් ගොඩාක් දැහලුවා. පසුගිය දවස්වල මේ පාර්ලිමේන්තුවේ පුටු පෙරළුවේ, microphone එක කැඩුවේ වෙන මොකටවත් නොවෙයි. ඒ ගොල්ලන්ට බලය නැති බව පෙනෙන එක වහ ගන්නයි. හැබැයි, ඒක හැම දාම වහගන්න බැහැය කියන එක දැන්වත් තේරෙන්න ඕනෑ. ඒ බලය බලෙන් ගන්න බැහැය කියන එක දැන්වත් තේරුම් ගන්න ඕනෑ; පිළිගන්න ඕනෑ.

දෙසැම්බර් 31වන දායින් පසුව රජයේ සේවකයන්ගේ පඩි ගෙවන්න විධියක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ විසර්ජන පනතින් මුදල් වෙන් කරලා තිබෙන්නේ දෙසැම්බර් 31වන දා වනතුරු පමණයි. පාර්ලිමේන්තුවෙන් ඒ කටයුත්ත සිදු වනතුරු ජනතාව බලාගෙන සිටිනවා. දෙසැම්බර් 31වන දාට කලින් පාර්ලිමේන්තුවේ අය වැය සම්මත කරන්න නම්, එම අය වැය පාර්ලිමේන්තුවේ සම්මත කරන්න පුළුවන් ආණ්ඩුවක් හදන්න ඕනෑ. අය වැය පාර්ලිමේන්තුවේ සම්මත වීමේ ආණ්ඩුවක් හැදීමේ වගකීම තිබෙන්නේ මිනිසුන් තවමත් පිළිගන්නා, රටේ විධායක ජනාධිපතිවරයා හැටියට සිටින මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටයි කියා මම විශ්වාස කරනවා. දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා නිවී සැනහිල්ලේ කොහේ හෝ වාඩි වෙලා මේ ගැන කල්පනා කරන්න ඕනෑ. අඩුම තරමේ ඊයේ, පෝය දවසේ රුක්මලේ පන්සලේදී කොටපිටියේ රාහුල හාමුදුරුවෝ මුහුණ ඉස්සරහා තියා ගෙන කියපු බණ ටිකවත් අහලා තමන් පරාදයි කියලා දැන්වත් හිත හදා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනයේදී ඕනෑම කෙනෙකුට ජය පරාජය පිළිගන්න වෙනවා. පරාජයක් වුණාට පසුව නිහතමානීව ඒක භාර ගන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මහත්මයාත් පැරදුණාට පසුව අඩුම තරමේ මැදමුලන ගෙදර ජනේලයේ එල්ලිලා හෝ පරාජය භාරගත්තා නේ. ඉතින් මේකත් ඒ වාගේම කුජීත පරාජයක්. ඒ නිසා ඒ පරාජය භාර ගෙන නිවී සැනසිල්ලේ කල්පනා කරලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතිරි වෙලා ඉන්න මන්ත්‍රීවරු හය හත්දෙනාවත් බේර ගන්න නම්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට කරන්න තිබෙන්නේ ජනතාවට

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අය වැය සම්මත කරන්න පුළුවන් ආණ්ඩුවක් තාවකාලිකව හෝ පාර්ලිමේන්තුවේ පිහිටුවීම සඳහා මැදිහත් වෙන එකයි; ඇමති මණ්ඩලයක් ස්ථාවර කිරීම සඳහා මැදිහත් වෙන එකයි. ඒකයි කරන්න තිබෙන්නේ. එහෙම නොකළොත්, එතුමාට පොළොන්නරුවට ගිහින් කුඹුරු කෙටුවත් බෙරෙන්න ලැබෙන්නේ නැහැ. එතුමාගේ දියණිය ලිව්වාය කියා කවුරුන් හෝ කෙනෙක් ලියපු, "ජනාධිපති තාත්තා" කියන පොතේ තිබුණාය කියන විධියට, එතුමාට කේන්ති ගිහින් කුඹුර ගිනි තිබ්බා වාගේ, දැන් මේ ගිනි තියන්න හැදුවේ මොකක්ද? මේ රටේ ආර්ථිකයයි; මේ රටේ පාර්ලිමේන්තුවයි. මේ රටේ තිබෙන සම්ප්‍රදායනුයි. මේ රටේ තිබෙන නීතිය, ව්‍යවස්ථාව ගිනි තියන්න දෙන්නේ නැහැ කියා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නා ජනතාව ස්ථාවර කර තිබෙනවා. ඒක නිසා අද තහවුරු වුණු දෙයම තමයි, 29වන දාත් මේ පාර්ලිමේන්තුවේ තහවුරු වෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ ජන වරමේ නියෝජනයට පයින් ගැසූ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත්, එතුමාගේ කල්ලියටත් මේ පරාජය භාර ගන්න කියන කාරණය අවධාරණය කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.06]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව සුනාමියකට අහුවෙලා වාගෙයි තිබුණේ. එම නිසා, අද වාගේ වැදගත් දිනයක වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ තත්ත්වය පිළිබඳව අප එක පැත්තකින් කනගාටු වෙනවා, තව පැත්තකින් සතුටු වෙනවා.

අපි කනගාටු වෙන්නේ බලයට තිබෙන කෑදරකම නිසා, බල උන්මාදය නිසා, තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර නිසා, තමන්ගේ පෞද්ගලික නඩු ගනුදෙනු විසඳා ගන්න අවශ්‍ය නිසා රට මේ තත්ත්වයට පත් කිරීමට කටයුතු කරපු දේශපාලනඥයන් මේ රටේ පාලකයෝ විධියට වැඩ කිරීම ගැනයි.

අපි පක්ෂයක් විධියට යම් පිරිහීමකට ලක් වෙලා හිටියා. අපේ පාක්ෂිකයෝ යම් කිසි කලකිරීමකින් හිටියා. අපෙන් ඈත් වෙලා හිටියා. ඒ සියලු පාක්ෂිකයෝ අද අපිත් එක්ක නැවත එකතු වෙලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගත්ත තීන්දු, තීරණ නිසා මේ වෙනස හඳුනා ගැනීමට පාක්ෂිකයන්ට අවස්ථාව ලැබුණා. ඒ වාගේම අපිත් එක්ක ඉඳලා ඇත් වුණු සිවිල් සංවිධාන, ව්‍යාත්තීය සමිති, විද්වතුන්, විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන කල්ලි, කණ්ඩායම්, මේ හොරු රැළ, බලයට කෑදර පිරිස සහ අපි අතර තිබෙන වෙනස අවබෝධ කර ගත්තා. එම නිසා තමයි මම සතුටු වෙන්නේ. මේ ඇති වුණු අර්බුදකාරී තත්ත්වය අපට දුන්නු අවස්ථාවක් එහෙම නැත්නම් වෙස් වලාගත් ආශීර්වාදයක් විධියට මම දකිනවා. මොකද, අපි ආණ්ඩුව කර කර ඉද්දී අපට හැම පැත්තෙන්ම චෝදනා කළා. සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා කිව්වා වාගේ, මේ ගොල්ලන් බලයට පත් වුණොත් ඩොලර් එක අල්ලලා රුපියල් 150ත් පහළට දමන විධියට තමයි කථා කළේ. බන්දුල ගුණවර්ධන මහත්මයා ආර්ථික පර්යේෂණ ඒකකය කියලා පිටුපසින් බෝඩ් එකක් ගහගෙන, ඊළඟ ආණ්ඩුවේ මුදල් ඇමති සිහින මවාගෙන මුදල් ඇමතිවරයෙක් විධියට කටයුතු කරමින් හිටියා; මේ ලෝකයේ ඉන්න මහා ප්‍රාඥයා, උගතා, බුද්ධිමතා විධියට. හැබැයි, එතුමා අද මොකක්ද කියන්නේ? අද කියන්නේ, "මම අතින් අල්ලලා ඩොලර් එක නවත්වන්නද?" කියායි. ඕක තමයි ඇත්ත. අපි යම් විධියකට ඩොලර් එක පාලනය කළා නම්, එම හැකියාවෙන් සියයට 50ක් රාජපක්ෂ ආණ්ඩුවකට කරන්න බැහැ. ඒක මේ රටේ මිනිසුන් තේරුම් ගත්තා. ඒ ගොල්ලන්ට මේක කරන්න බැහැ. ඒ වාගේම අද අපේ රටේ ආයෝජන ආපසු ගලාගෙන යනවා. අපෙන් ඇහුවා, "කෝ ආයෝජන?" කියා. දැන් තිබෙන ආයෝජන ටිකත් ආපහු යන තත්ත්වයට පත් වෙලා. මේ වාගේ පාලකයොත් එක්ක ආයෝජකයන්ට ඉන්න බැහැ කියන එක පෙන්නුවා.

ඒ දවස්වල වැඩියෙන්ම ප්‍රචාරණ නිර්මාණය කරපු කෙනා තමයි පොලිස්පතිතුමා. මම නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කරද්දී, අපිත් යම් මට්ටමකට එතුමා ගැන කථා කළා. හැබැයි, අපි හරි දෙයට හරි කිව්වා, වැරැදි දෙයට වැරැදි කිව්වා. අපි කාටවත් සුදු හුනු ගාන්න ගියේත් නැහැ, කාවවත් ආරක්ෂා කරන්න ගියේත් නැහැ. අපට යම් දේවල් සම්බන්ධව විවේචන තිබුණා. යම් දේවල්වලට හරි කිව්වා. හැබැයි, ඒ දවස්වල මෙතුමන්ලාගේ ප්‍රධාන ඉලක්කය වී තිබුණේ පොලිස්පති අයින් කිරීමයි. මේ වාගේ පොලිස්පති කෙනෙක් එක්ක කොහොමද රටක් කරන්නේ කියා කිව්වා. අද පොලිස්පතිතුමා ඉන්නේ කොහේද? අද පොලිස්පතිතුමා ගැන කථා කරනවාද, එතුමා ගැන කියනවාද? නැහැ. අද ඒ ගැන කථාවක් නැහැ.

ඊට අමතරව මහා ලොකු රංගනයක යෙදුණා. මොකක්ද? මහා කුමන්ත්‍රණයක්. නාමල් කුමාර කියලා හාදයෙක් දමලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිව සහ හිටපු ආරක්ෂක ලේකම්ව ඝාතන කුමන්ත්‍රණයක් ගැන කිව්වා. අපි බොහොම පැහැදිලිව පරීක්ෂණවලට අවස්ථාව දුන්නා. ඒ පරීක්ෂණ නිදහසේ කරන්න CID එකට අවසර දුන්නා. විශේෂයෙන් මගේ ඇමතිවරයා විධියට රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා, අපි බොහොම විනිවිදභාවයෙන් වැඩේ කළා. අද මේ පරීක්ෂණවලට මොකද වෙලා තිබෙන්නේ කියා එක රූපවාහිනී නාලිකාවකවත් පෙන්වනවාද? හොයලා බලනවාද, අහනවාද? නැහැ. ඊයේ පෙරේදා වෙනකොට අපට දැන ගන්න ලැබී තිබෙනවා නාමල් කුමාර කියන හාදයා පොහොට්ටුවෙන් ඡන්දය ඉල්ලනවා කියා. මේ බොරුව තමයි රට වෙලාගෙන හිටියේ. අපව අපකීර්තියට පත් කරන්න මාධ්‍ය ආයතන මේ බොරුව යොදාගෙන තමයි කටයුතු කෙරුවේ.

මේ ගින්න අවුළන්න කටයුතු කළ හිටපු නියෝජ්‍ය කථානායකතුමා -තිලංග සුමතිපාල මහත්මයා- මේ අවුරුදු තුන හමාරට රජය අසාර්ථකයි කියා ඊයේ පෙරේදා කියනවා අපි දැක්කා. රජයේ ප්‍රධානියා, විධායකයේ ප්‍රධානියා ජනාධිපති. ෆයිසර් මුස්තාපා තමයි හිටපු ක්‍රීඩා ඇමති. තිලංග සුමතිපාල මහත්මයා හිටපු නියෝජ්‍ය කථානායක වාගේම ක්‍රිකට් ආයතනයේ සභාපතිතුමා. එතකොට මේ අවුරුදු තුන හමාරට රටේ ක්‍රිකට්වලට මොකද වුණේ? රටේ ක්‍රිකට් ක්‍රීඩාව නැත්තටම නැති වුණා, විනාශ වුණා. අපි ඇෆ්ගනිස්තානයටත් පැරදුණා, බංග්ලාදේශයටත් පැරදුණා. ගහන ගහන මැච් එක පරදිනවා. දමන, දමන ක්‍රීඩකයෝ fail වෙනවා. ඒකට වගකියන්න ඕනෑ රනිල් වික්‍රමසිංහද? මේ ගොල්ලන් ගෙරි හමට තඩි බානවා වාගේ

සේරම වැරදිවලට රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට තඩි බෑවා. හැබැයි, අද තේරිලා තිබෙනවා මේ හාදයෝ මෙලෝ දෙයක් කරන්න බැරි අසාර්ථක පුද්ගලයින් පිරිසක් කියා. ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම ගැන කියනකොට GMOA එකයි, අර සංවිධානයි, මේ සංවිධානයි, බෞද්ධ සංවිධානයි සේරම කිව්වා, "මේක අකුළලා දමන්න ඕනෑ. ලංකාවට කුණු ගෙනෙනවා. අරක ගෙනෙනවා. මේක ගෙනෙනවා." කියා. දැන් මේ හාදයෝ එක්කෙනෙක්වත් කෑගහනවාද? නැහැ. බන්දුල ගුණවර්ධන මහත්මයා මොකක්ද කිව්වේ? බන්දුල ගුණවර්ධන මහත්මයා කිව්වේ, "මේ වාගේ ගිවිසුමක් මොනවාටද අකුළන්නේ, අපි හරක්ද?" කියායි. මේ සති දෙක තුන ඇතුළත මේ රටේ බුද්ධිමත් ජනතාවට හිතන්න අවස්ථාවක් උදා කර දී තිබෙනවා. ඇත්ත සහ බොරුව අතර වෙනස ගැන හිතන්න අවස්ථාවක්.

නමුත් හිතන්න තිබෙන අවස්ථාවේදී බහුතරයක් මේ ගැන සිතුවත්, තවමත් මාධ්‍ය ආයතන තුළ ප්‍රචාරය කරන්නේ, ඉඩ දෙන්නේ වැරදි මතයටයි කියන එක අපට පෙනෙනවා. අද දිනයේ අපි දැක්කා, මෙතැන උත්තරීතර පාර්ලිමේන්තුව රැස්වෙලා සජීව විකාශනය දෙනවා. සභාව ඇතුළත සජීව් විකාශනය දෙන එක පැත්තකට තබා, මේකේ "බහුතරයක් නැහැ." කියා මෙතැනින් පැනලා ගිය හොර ආණ්ඩුවේ මැති ඇමතිවරුන් යයි කියා ගන්නා පිරිස - හොරු රැළ- පාර්ලිමේන්තුවේ කෙළවරක තිබෙන කමිටු කාමරයක ප්‍රවෘත්ති සාකච්ඡා තියනවා. පැය තුන හතරක් ඒක සජීවිව පෙන්වනවා. අන්න! බලන්න තත්ත්වය. ඕකයි තත්ත්වය. එම නිසා අපි පැහැදිලිවම කියනවා, බල උන්මාදය නිසා ඇති වුණු රටේ අස්ථාවර තත්ත්වයට මේ සියලු දෙනාම වග කියන්න ඕනෑ කියා. ඇත්තටම මේකට හේතු වුණු පළමුවන කාරණය තමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

-කටයුතු කළ අත්තනෝමතික ආකාරය. ව්‍යවස්ථා විරෝධී ආකාරයට, ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් එතුමා බරපතළ වැරැද්දක් කර තිබෙනවා. මට මතක විධියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (2) හෝ (3) යටතේ එම ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම හරහා වැරදිකරුවෙක් වෙලා තිබෙනවා. එසේ නම් මේ රටේ පුරවැසියෝ විධියට අපි විශ්වාස කරනවා, රටකට මොනවා නැතත් ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍යයි කියන එක. ප්‍රජාතන්ත්‍රවාදයයි අංක එකට අවශ්‍ය වන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙනකොට තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම තේරෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය තියෙද්දී ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම මිනිසුන්ට දැනුණේ නැහැ. හැබැයි, අද ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම අපිට දැනිලා තිබෙනවා. බල උන්මාදය, බල ලෝභය නැති නායකයෝ අපට අවශ්‍ය වෙලා තිබෙනවා. මුදලට විකිණෙන්නේ නැති නායකයෝ අපට අවශ්‍ය වෙලා තිබෙනවා. දැන් ජන මාධ්‍යවලින් නිතරම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හෑල්ලුවට ලක් කරනවා. පාර්ලිමේන්තුවේ ඉන්නේ පෙන්ෂන් එක බලාගෙන ඉන්න මිනිසුන්ය කියනවා. ඊට එහා ගිය උගත් බුද්ධිමත් විශාල පිරිසක් මෙහි සිටිනවා. එහෙම සුළුතරයක් ඉන්නවාදැයි මම දන්නේ නැහැ. ඊට එහා ගිය පිරිසක් මෙහි සිටිනවා. ඒ වාගේම කියනවා, මුදලට විකිණෙනවාය කියා. මේ වතාවේ මුදලට විකිණෙනවා නම් එක්සත් ජාතික පක්ෂයේ සිඩ්නි ජයරත්න මහත්මයාලාට දුන් offers රුපියල් කෝටි පණහයි, හැටයි. තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමාලාට කෝටි පණහයි හැටයි. අපේ තිලකරාජා මන්ත්‍රීතුමාලාට, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාලාට - [බාධා කිරීමක්] ඔබතුමාට දෙන්න try කළේවත් නැහැ නේද? [බාධා කිරීමක්] කියාලු කිව්වේ. ඒ වාගේ මුදලේ වටිනාකමට එහා ගිය මිල කළ නොහැකි පිරිසක් පාර්ලිමේන්තුවේ සිටිනවාය කියා අපට පෙන්වන්නට අවස්ථාවක් ලැබුණා. මටත් කථා කළා, මටත් යෝජනා කළා. මා ළඟ හඬ පටි තිබෙනවා. මම හඬ පටි එළියට දමන තත්ත්වයට වැටෙන්නේ නැහැ. ඒ තත්ත්වයට පත් වුණා මේ හොර අගමැති ඇතුළු පිරිස. අපට බහුතරයක් පෙන්වන්නට පුළුවන් වුණා. එහෙම මුදලට ගන්න පුළුවන් පිරිස ඉන්නේ සුළු පිරිසයි. එසේ නැත්නම් පෙන්ෂන් එක බලාගෙන ඉන්නේ සුළු පිරිසයි. මාධ්‍ය තුළින් වේවා, රූපවාහිනිය තුළින් වේවා පෙන්වන්නේ, එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ තත්ත්වයයි. ඒ වාගේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැසිරුණු ආකාරය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පාර්ලිමේන්තුවේ හැසිරුණු ආකාරය ඉතා බේදනීය තත්ත්වයකට පත් වුණා. බහුතරයක් ඒ තත්ත්වයට පත් වුණේ නැහැ. වැදගත් මිනිස්සු ඒ පැත්තේ සිටිනවා. මම කියන්නේ නැහැ, ඒ පැත්තේ ඉන්න සියලුම දෙනා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නැත්නම් නූගත් පිරිසක්ය කියා. එතැනත් බොහොම වැදගත් විධියට හැසිරුණු පිරිසක් සිටිනවා. එම නිසා අපි පැහැදිලිවම කියනවා, මේ තත්ත්වය නිර්මාණය කරපු නායකයෝ මේවාට වග කියන්නට ඕනෑය කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊට එහා යමක් කියන්නේ නැහැ. මේ කාරණයත් කියා මගේ කථාව අවසාන කරනවා. අනගාරික ධර්මපාලතුමාගේ කියමනක කොටසක් අවසාන වශයෙන් මම කියනවා. 1926 වාගේ කාලයක එතුමා දැක් වූ අදහසක් මම මතක් කරනවා. "භේද භින්නකම, කුලමල, පක්ෂ භේද, බල තණ්හාව දැන්ම අයින් කර ගත්තේ නැත්නම් නුඹලා ජාතියක් හැටියට අන්ත පරිහානියට වැටෙන දවස වැඩි ඈතක නොවන බව මතක තියා ගනිල්ලා." - අනගාරික ධර්මපාලතුමා 1926දී එහෙම කිව්වා. ඒ වාගේ තමයි විශේෂයෙන් මේ බල තණ්හාව කියන දෙය නිසා තමයි අද අපි රටක් විධියට පරිහානියට ලක් වෙලා තිබෙන්නේ. එම නිසා බල තණ්හාව ඉවත් කර දැන්වත් රටේ නායකයෝ බුද්ධියට, නුවණට ඉඩ දී කටයුතු කළොත් අදින් පස්සේවත් අපට රටක් විධියට ඉස්සරහට යන්නට පුළුවන් වෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ඔබතුමාට. ඊළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් වූ දිනයක, මේ වැදගත් වූ විවාදයේ කරුණු දැක්වීමට අවසර දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා යම් කරුණක් සඳහන් කරපු නිසා විතරක් මා මෙය කියන්න ඕනෑ. හැබැයි, මෙය කිසි සේත්ම නොකියන්නයි මා සිතා සිටියේ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පසුගිය 26වැනි දා මේ රාජද්‍රෝහී කුමන්ත්‍රණය ආරම්භ වුණාට පස්සේ ඊට එරෙහිව ප්‍රතිවිරෝධය දැක්විය යුතුයි; මේ කුමන්ත්‍රණය මේ රටේ ජනතාව වෙනුවෙන් අප පරාජයට පත් කළ යුතුයි, කියන ඒකායන පරමාර්ථය ඇතිව පක්ෂය හැටියත්, රටේ පොදු ජනතාව හැටියටත්, ආත්ම ගරුත්වයක් තිබෙන පුරවැසියෙකු හැටියටත් මේ අරගළයට නායකත්වය දෙද්දී මට නම් ලැබුණේ, අල්ලස්, තනතුරු පිළිබඳ යෝජනා නොවෙයි, "උඹව මරනවා" කියන ඒ සුන්දර වචන පමණයි. 28වැනි දාත්, ඊට සතියකට පස්සේත් ඒ තර්ජනය මට ලැබුණා. ඒ තර්ජනය කරපු අය මීට කලින් මිනී මරපු අය. ඒ තර්ජනය කරපු අය, මිනී මරලා පුරුදු අය. එම තර්ජනයේ යථාර්ථය මට තේරුම් ගියත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කිරීමට කැස කවන ඒ විධායකයේ ප්‍රධානියා ඇතුළු කණ්ඩායමත්, ඔහුගේ අලුත් මිත්‍රයන් බවට පත් වෙලා ඉන්න මහින්ද රාජපක්ෂ ඇතුළු කණ්ඩායමත්, දේශපාලනිකව පරාජයට පත් කරලා, මේ රටේ පුරවැසියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කිරීමේ නියත අරමුණ ඇතිව අපි සටන් කළා. අපි තවමත් සටන් කරනවා. මේ සටන අවසන් නැහැ. මේ හඬ අසා සිටින ලංකාවාසී සියලු දෙනාටම මම කියන්න ඕනෑ, අද පාර්ලිමේන්තුවේ ඡන්ද 121ක් අපි ලබා ගත්තාට, මේ හොර, දූෂිත බලවේග අද මේ නීති විරෝධී තාවකාලික ආණ්ඩුවේ වරප්‍රසාද භුක්ති විඳිමින්, නීති විරෝධීව තමන්ගේ ආයතනවල රැකියා, තාන්න-මාන්න, වාහන යනාදි විවිධාකාර වරප්‍රසාද බෙදා හරිමින් තාවකාලික සතුටක් ලබන බව. මේ කණ්ඩායම බලය අත්හැර යන්නට තවමත් සූදානම් නැහැ. ලජ්ජා - භය තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්ම සලකන, ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්ම ගැන කිසියම් හෝ දැනුවත් කමක් තිබෙන කණ්ඩායමක් නම් 14වැනි දායින් පස්සේ, 15වැනි දායින් පස්සේ, 16වැනි දා මේ මුළු පාර්ලිමේන්තුවම සම්පූර්ණයෙන් අවමානයට ලක් කළායින් පස්සේ, අද පළමුවැනි වතාවට 121දෙනෙක් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඡන්දය දුන්නාට පස්සේ, ඒ තනතුරු අතහැර දාලා ඉවත් විය යුතුව තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තමන්ගේ අලුත් මිතුරා වන මහින්ද රාජපක්ෂට කියන්නට ඕනෑ, "ඔබතුමාට බහුතරයක් හදා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ මතයට මම ගරු කළ යුතුයි. කරුණාකරලා අපි මේ ක්‍රියාදාමය අවසන් කරමු. මට අලුත් අගමැති කෙනෙක් හා අලුත් අමාත්‍ය මණ්ඩලයක් පත් කර ගන්න අවශ්‍යයි" කියලා. මම ප්‍රාර්ථනා කරනවා, "ප්‍රමාද වුණත් මේ මොහොතේ හෝ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඒ නුවණ පහළ වේවා!" කියලා.

මගේ මිත්‍ර මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කියන්න දෙයක් මට තිබෙනවා. අපි ඔබ ජනාධිපති කළා. එහෙම ජනාධිපති කළේ ඔබතුමාත් එක්ක තිබෙන පෞද්ගලික යාළුකමකටවත්, එසේ නොමැති නම් වෙනත් පටු අරමුණකින් නොවෙයි. මේ රටේ එදා තිබුණු ඒකාධිපති, මිනීමරු, දූෂිත පාලනය අවසන් කිරීමේ දේශපාලනික උපාය මාර්ගය හැටියට අපි ඔබතුමාව තෝරා ගත්තා. ඔබතුමා ජනාධිපති ධුරයට පත් වුණාම අපි ඔබතුමා ජනාධිපති ලෙස පිළිගෙන අපේ මිතුරෙක්, ප්‍රජාතන්ත්‍රවාදයේ මිතුරෙක් ලෙස ඔබතුමාව සලකා අපි ඔබතුමාත් එක්ක වැඩ කළා.

හැබැයි, ඔබතුමා අදින් පසුවත් මේ ප්‍රජාතන්ත්‍රවාදයේ විනාශය වෙනුවෙන් පෙනී සිටිනවා නම්, ප්‍රජාතන්ත්‍ර විරෝධී පිලේ තවදුරටත් සිටිනවා නම්, මේ රටේ පක්ෂ පාට නොබලා මේ පාර්ලිමේන්තුව තුළ සහ ඉන් පිටත අපි මෙතෙක් කරපු සාමකාමී වූ, ජනතාවට අල්ප මාත්‍රයක කිසිදු හිංසාවක් නොවන ආකාරයට අවිහිංසාවාදීව කර ගෙන ගිය අරගළය අපි පාරට අරගෙන එනවා. එහෙම කරන්නට ශක්තිය අපට තිබෙනවා. අපි ඒ ශක්තිය මෙතෙක් කළමනාකරණය කර ගෙන සිටි බව පමණක් ජනාධිපතිතුමනි, ඔබතුමාට බොහොම ආදරයෙන් ඔබතුමාගේ හිතවතෙකුව සිටි කෙනෙකු වශයෙන් මම මතක් කරන්න කැමැතියි. ඔබතුමා මේ රටේ පුරවැසියන්ට එරෙහි වනවා නම්, අපි ඔබට දේශපාලනිකව එරෙහි වනවා. ඔබ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු සම්ප්‍රදාය යටපත් කරන්නට වෙර දරනවා නම්, අපි ඔබට එරෙහි වනවා. ඔබ මේ පාර්ලිමේන්තුවේ බහුතරය නොතකා, දූෂිත, පටු පරමාර්ථවලින් යුතුව, තමන්ට එරෙහිව ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චයාධිකරණවල නඩු ඇසෙන එක වළක්වා ගන්න මේ දේශපාලන කුමන්ත්‍රණයට සහභාගි වූ පිරිස සමඟ තවදුරටත් වැඩ කරනවා නම්, අපි වීදියේ සටන් කරලා ජනාධිපතිතුමනි, ඔබට දැනෙන භාෂාවෙන් අපි ඔබව දේශපාලනිකව පරාජයට පත් කරනවා. ඔබ දැනටමත් දේශපාලන වශයෙන් මේ රටේ මිනිසුන්ගේ ලෝකයෙන් ඉවත් වෙලා තිබෙන්නේ. හැබැයි, ඔබට තවමත් විධායකයේ බලතල අනුව ව්‍යවස්ථාව ප්‍රකාරව බලයක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. මහින්ද රාජපක්ෂ හොර අගමැති වුණාට, ඔබතුමා හොර ජනාධිපති කෙනෙකු නොවෙයි. ඔබතුමා නීත්‍යානුකූලව පත් වූ ජනාධිපති. ඔබතුමාට තව වසරක් ධුරය දරන්න පුළුවන්කම තිබෙනවා. අපි ඔබතුමාට සුබ පතනවා, "ඉක්මනින්ම මේ ප්‍රශ්නය විසඳීමට හැකියාව ලැබේවා!" කියා. එසේ නොමැති නම්, මේ සටන, මේ අරගළය අපි ජනතාවගේ විශ්වාසය මත ඉදිරියට ගෙනාවා වාගේම ඔබව දේශපාලනිකව තීරණාත්මකව පරාජයට පත් කරන බව සපථ කරන බව ඔබට කිව යුතුයි. ලක්ෂ ගණනක් වූ, දස ලක්ෂ ගණනක් වූ එක්සත් ජාතික පාක්ෂිකයන් වාගේම පක්ෂයක්, පාටක් නැති, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින ඒ සියලුම බලවේග එකතු කර ගෙන ඔබව මහ පොළොවේ වීදියේ පරාජයට පත් කරනවා. එදා දවසේදී ඔබට හිතෙයි, "මම ප්‍රමාද වුණා වැඩියි" කියලා. ඒ වාගේම මම මේ රටේ පුරවැසියන්ට කියනවා, "හරි, හරි, ඔක්කොම හරි, 121කගේ හඬ තිබුණා" කියලා සන්තෝෂ වන්න එපා කියලා. මෛත්‍රීපාල ජනාධිපතිතුමා විශාල ගැටයකට අහු වෙලා ඉන්නේ. එතුමා මහින්ද මහත්තයාගේ කණ්ඩායමට ගැටයක් ගැහුවා. ඒ කණ්ඩායම මෙතුමාට ගැටයක් ගැහුවා. "අන්තෝ ජටා - බහි ජටා" වාගේ මෙහි සියල්ලෝම ගැට ගැහිලා, හිර වෙලා ඉන්නේ. අපට අදාළ නැහැ, ඒ ගොල්ලන් කවුරු කොහොම මොන ප්‍රමාණයට වරදට සම්බන්ධද කියලා. හැබැයි, බලයක් නැතිව කැබිනට් රැස්වීම් පවත්වන අය, බලයක් නැතිව "මම අගමැති" කියලා පෙනී සිටින අය, බලයක් නැතිව "මම ඇමති" කියලා පෙනී සිටින අය රාජ ද්‍රෝහීත්වයේ වරද කරනවා. නීත්‍යානුකූල රජයක් නොවී රජයක් ලෙස පෙනී සිටීමින්, රාජ්‍ය මුදල් අපහරණය කරමින්, කොන්ද පණ නැති නිලධාරීන්ට නියෝග දෙමින් මේ කරන්නා වූ වැඩ පිළිවෙළ ඔබ සියලුදෙනාම දණ්ඩ නීති සංග්‍රහය ප්‍රකාරව, අපේ රටේ අපරාධ නීතිය ඉදිරියේ ඔබ වෙත සාපරාධී වගකීම් පැවරීමට හේතුවක් වන බව නීතිය දන්නා කෙනෙකු විධියට මම ඔබට මතක් කරන්න කැමැතියි.

මේ රටේ අපරාධකරුවන් වෙනුවෙන් පෙනී සිටී; දූෂණ විරෝධී මහාධිකරණ පිහිටුවීම වැළැක්වීමට කටයුතු කරපු; අවුරුදු තුනක් තිස්සේ දූෂිතයන්ට එරෙහිව විශේෂ අධිකරණ ගොඩ නැඟෙන එක වැළැක් වූ විජයදාස රාජපක්ෂ ජනාධිපති නීතිඥතුමාගෙන් උපදෙස් ගන්න එපා. දැනුම් තේරුම් තිබෙන, ප්‍රායෝගිකව අපරාධ නඩු කරපු, අත් දැකීම් තිබෙන නීතිඥයෙකුගේ උපදෙස් ගන්න. යම් දවසක මේ රටේ යථා තත්ත්වය ඇති වුණාම, මේ ලෝකයේ ඉතිහාසයේ හැම තැනකම සිදු වෙලා තිබෙනවා වාගේ මේ සාපරාධී ක්‍රියාවලිය තුළ ඔබ සාපරාධී වගකීමකට ලක්වනවා. ඒ වාගේම එක පැත්තකින් මේ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයේ කොටස්කරුවන් වනවා. ඔබ මේ යන්නේ එතැනටයි. ඒ වාගේම මම ජනාධිපතිතුමාට තව දෙයක් මතක් කරනවා. ජනාධිපතිවරයාට මුක්තියක් තිබෙනවා, නඩු පැවරීමේදී. හැබැයි, ඒ මුක්තියට සීමාවන් තිබෙනවා. තමන්ගේ ධුරය දරා අවසන් වුණාට පස්සේ ඒ කියන්නේ තව අවුරුද්දකින්

සාමාන්‍ය පුරවැසියෙකු විධියට ඔබද අධිකරණය ඉදිරිපිට අපරාධ සහ සිවිල් වගකීම්වලට ලක් විය යුතුයි.

මගේ මිත්‍ර මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මිත්‍රයකු විධියට මම කියනවා, හරිහමන් නීතිඥයන්ගෙන් උපදෙස් ගන්න කියා. ඔබ කරගෙන යන මේ ක්‍රියා දාමය තුළ ඔබ දන්නේම නැතිව මේ රටේ අපරාධ නීතිය හා සම්බන්ධ බරපතළ වැරැදි කීපයක පංගුකාරයකු, කුමන්ත්‍රණකාරයකු බවට ඔබ පත් වෙලා තිබෙනවා. ඔබ ධුරයෙන් ඉවත් වූ විට මේවා පිළිබඳව අර්ථ විවරණය කරන විට ඔබතුමාට පෞද්ගලිකව වග කියන්න සිදු වන බව මතක් කරන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වෙලාව අවසන්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිර්නීතව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර තිබෙන, මහ ජනතාවගේ ව්‍යවස්ථාදායක අයිතිය ආරක්ෂා කිරීම වෙනුවෙන් කෙළින් වැඩ කරපු, ස්ථාවර නියෝග ආරක්ෂා කරපු කරු ජයසූරිය කථානායකතුමාටත්, නියෝජ්‍ය කථානායකතුමාටත්, මහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුති කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.28]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි. ජනාධිපතිතුමා පසු ගිය දා පාර්ලිමේන්තුව විසුරුවා හැරියාම අප සිතුවේ අපට පාර්ලිමේන්තුවට ඇවිල්ලා කතා කරන්න නැවත අවස්ථාව ලැබෙන්නේ ජනවාරි මාසයේය කියලායි. නමුත් කෙසේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට පින් සිද්ධ වෙන්න, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුව පාර්ලිමේන්තුවට නැවත රැස් වෙන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. පාර්ලිමේන්තුව නැවත රැස් වෙලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ඒ ක්‍රියා කලාපයට විරුද්ධව තීන්දු තීරණ අරගෙන ඉස්සරහට යන්න අපට අවස්ථාව ලබා දී තිබෙනවා. විශේෂයෙන්ම, යහ පාලන ආණ්ඩුව යටතේ පවතින අධිකරණයේ ස්වාධීනත්වය ගැන පසු ගිය කාලයේ මේ සභාව තුළ අපි වාද විවාද කළා; අපි නීතියේ ආධිපත්‍යය ගැන කථා කළා. මා හිතන්නේ අප කතා කරපු ඒවායේ ප්‍රතිඵල තමයි මේ. අධිකරණය ඒ අතුරු නියෝගය ලබා දීම -අධිකරණයේ ඒ තීන්දුව- ව්‍යවස්ථාවට විරුද්ධව කෙරෙන ජනාධිපතිතුමාගේ ක්‍රියා කලාපය නැවැත්වීමට විශාල රුකුලක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පාර්ලිමේන්තුව තුළ දැක්කා, ඒ ඊනියා ආණ්ඩුව පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ ඡන්දවලට මුහුණ දෙන්න බැරිව දිගින් දිගටම පලා යන ආකාරය. ඒ ඊනියා ආණ්ඩුවේ අගමැති හැටියට ක්‍රියා කරන මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාත් අද පාර්ලිමේන්තුවට ආවේ නැහැ. එතුමා අද පාර්ලිමේන්තුවට එන එකෙන් වැළකී සිටියා. එතුමා සභා ගැබට ආවේ නැහැ. මම දන්නේ නැහැ එතුමා පාර්ලිමේන්තුවට ආවාද කියා. එතුමා සබා ගැබ තුළට අවේ නැහැ. එතුමා සබා ගැබ තුළට ආවේ නැත්තේ ඇයි? එතුමා දන්නවා ඡන්ද විමසීමක් කරන කොට එතුමන්ලාට පාර්ලිමේන්තුව තුළ ඡන්ද 113 පෙන්වා ගන්න බැහැ කියා. ඒ නිසා එතුමා අද සබා ගැබට එන එකෙන් වැළකී සිටියා. මා හිතන විධියට ලංකාවේ දේශපාලන ඉතිහාසයේත්, ඒ වාගේම ලෝක දේශපාලන ඉතිහාසයේත් පළමුවන වතාවටයි ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අගමැතිතුමා පාර්ලිමේන්තුවේ ඡන්ද විමසන අවස්ථාවකට නොයා, එය මහ හැර පාර්ලිමේන්තුවෙන් එළියේ ඉඳගෙන ඒ දෙස බලාගෙන සිටියේ. එය ඉතාම කනගාටුදායකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට මහින්ද රාජපක්ෂ මහත්මයාට අද කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ ඔය ඊනියා අගමැතිකමෙන් -හොරාට දීපු අගමැතිකමෙන්- ඉල්ලා අස් වෙලා, එතුමාගේ ඉදිරි දේශපාලන කටයුතුත් මහත්මයකු විධියට කරගෙන, මේ කාලය තුළ එතුමාගේ දේශපාලනය අවසාන කරලා ගිහින් තම ගෙදර දොරේ වැඩක් පලක් කරගෙන ඉන්න එකයි කියා. එතුමා දැන් ඒ කාලයට ඇවිත් ඉන්නවා. තවදුරටත් මෙතැනට ඇවිල්ලා බලය වෙනුවෙන් පොර බදන්නේ නැතිව, මෙහි සිටින මන්ත්‍රීවරුන් බලය වෙනුවෙන් උසි ගන්වන්නේ නැතිව, තමන්ගේ පසු පෙළ මන්ත්‍රීවරුන් උසි ගන්වා කථානායකතුමාගේ පුටුව වට කිරීම, මෙහේ සිටින පොලිස් නිලධාරීන්ට පහර දීම ආදි වශයෙන් පහත් ලෙස හැසිරෙන්නේ නැතිව එතුමාට පුළුවන් ගෞරවාන්විතව දේශපාලනයෙන් අයින් වෙන්න. පාර්ලිමේන්තුව තුළ අද ලබා දුන් ඡන්ද ප්‍රතිඵල අනුව මම විශ්වාස කරනවා, එතුමා තවදුරටත් ඒ නිලයේ රැඳී සිටීම ඒ නිලයේ ගෞරවයටත් හොඳ නැහැ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ දේශපාලන ඉතිහාසයේ ගෞරවනීයභාවයටත් හොඳ නැහැ කියා. අද සිකුරාදා දවසක්. පසු ගිය මාසයේම සිකුරාදා රාත්‍රියේ තමයි මේ රටේ දේශපාලනයේ වෙනස්කම් සිද්ධ වුණේ. අදත් සිකුරාදා දවසක් නිසා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඉල්ලා අස්වීමත් අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපි කියන්න ඕනෑ, 2015 ජනවාරි 08වෙනි දා අපට ලබාදීපු ජයග්‍රහණයත් එක්ක පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අපට මන්ත්‍රීවරු 107ක් ලැබුණා කියන කාරණය. ඒ 107 ලැබුණාම ඊළඟට, පාර්ලිමේන්තුව තුළ අපට 113 හෝ බහුතරය හෝ ලබාගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දහදෙනෙකුට වැඩි පිරිසක් එදා අපිත් එක්ක එකතු වෙන්න හිටියා. නමුත් අපේ නායකතුමා, -අපේ අගමැතිතුමා- කිව්වා, "එහෙම පක්ෂ කඩලා අපි ආණ්ඩු හදන්න ඕනෑ නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක ඒකාබද්ධ ආණ්ඩුවකට ගිහිල්ලා මේ රටේ මූලික ප්‍රශ්න විසඳා ගන්න අපි යමු" කියලා. ඒ නිසා තමයි එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපිත් එක්ක එකතු වෙන්න හිටපු මන්ත්‍රීවරුන්ව අපි ආණ්ඩුවට එකතු කර ගත්තේ නැත්තේ. එසේ එකතු කර ගත්තේ නැත්තේ වෙන මොකක්වත් නිසා නොවෙයි, මේ රටේ අලුත් දේශපාලන සංස්කෘතියක් හදන්න ඕනෑ නිසායි. මහින්ද රාජපක්ෂ මහත්තයා මේ පාර්ලිමේන්තුවේ හිටපු හැම පක්ෂයක්ම කඩලා, හැම පක්ෂයකම මන්ත්‍රීවරුන්ට මුදල් දීලා, වරප්‍රසාද දීලා එදා එතුමා බහුතරය -තුනෙන් දෙකක බලය- හදා ගත්තා. එහෙම දේශපාලන සංස්කෘතියක් 2015ට කලින් තිබුණා. ඒ සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ නිසා තමයි අපි 2015 ජනවාරි 8වෙනි දා ඒ ජයග්‍රහණය ලබලාත්, පාර්ලිමේන්තුවේ අපට මන්ත්‍රීවරු එකසිය හත් දෙනෙක් ඉඳලාත්, අපි ආණ්ඩුව ගන්නේ නැතුව ජාතික

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ආණ්ඩුවකට ගියේ. නමුත් අපි ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ගෙනාපු පුද්ගලයා, සිරිසේන මහත්තයා සම්පූර්ණයෙන්ම ඒ සංස්කෘතිය අරගෙන ගිහිල්ලා අර ගඳ ගහන අශ්වි වළට දැම්මා. ජනාධිපතිතුමාම කිව්වා, මන්ත්‍රීවරු විකිණෙනවා කියලා. ජනාධිපතිතුමා මේ දියවන්නාවට ඇවිල්ලා, මෙතැන තිබෙන වටරවුමට ඇවිල්ලා පාර්ලිමේන්තුවට ඇහෙන්න, අපිට ඇහෙන්න කෑ ගහලා කිව්වා 113 තිබෙනවා; 14වෙනි දාට 113 පෙන්වන්නම් කියලා. එහෙම කියලා දවස් දෙක තුනක් ගියේ නැහැ, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. එහෙමයි වුණේ. ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අපේ මන්ත්‍රීවරුන්ට කථා කළා ඇමතිකම් දෙන්නම් කියලා. එතුමාගේම ඔය ඉන්න උදවිය කෝටි 50, 100 මුදල් දෙන්නම් කියලා කථා කළා. මේ රටේ අලුත් දේශපාලන සංස්කෘතියක් හදන්න ඕනෑ කියලා අපි ගෙනාපු මනුෂ්‍යයාම 2015ට කලින් තිබුණු ඒ සංස්කෘතියට නැවත අපව අරගෙන ගියා. ඒක තමයි කියන්නේ කූඩැල්ලා ගෙනැත් මෙටියේ උඩ තියන්න බැහැයි කියලා. කූඩැල්ලා ගෙනැල්ලා මෙටියේ උඩ තියන්න බැහැ නේ. නැවතත් මඩටම තමයි යන්නේ. ඒ නිසා අපි ගෙනාපු මනුෂ්‍යයා නැවත ඒ දේශපාලන සංස්කෘතියටම යන්න අපව පෙලඹුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අපි මේ දේශපාලන ගමන්මහ හදා ගත්තේ අලුත් ගමනක් යන්න; අලුත් රටක් හදන්න. ලොකු බලාපොරොත්තුත් එක්කයි අපි මේ ගමන ආවේ. අපි මෛත්‍රීපාල සිරිසේනව තෝරා ගත්තේ ඒ ගමන යන්නයි. නමුත් එතුමා ඒ ගමන අමතක කරලා, 2015ට කලින් හිටපු උදවියත් එක්ක හොර ගිවිසුම් ගහගෙන නැවත දේශපාලන බලය ලබා ගන්න අද මේ ඇවිල්ලා තිබෙන ගමන දිහා බැලුවාම අපට ඉතාම කනගාටුයි. ඒ නිසා අපි සිරිසේන මහත්තයාට කියන්න ඕනෑ, ජනාධිපතිතුමනි, තමුන්නාන්සේට ශාප කරන ලක්ෂ හැට දෙකක ජනතාවක් මේ රටේ ඉන්නවා. ඒ නිසා මතක තියා ගන්න ඒ හැට දෙලක්ෂයක ජනතාවගේ ශාපයෙන් තමුන්නාන්සේට බේරෙන්න බැහැයි කියන එක. ඒ ශාපයට තමුන්නාන්සේ ලක් වෙනවා. ඒ ශාපයෙන් තමුන්නාන්සේට හැංගෙන්න බැහැ. තමුන්නාන්සේගේ වටේට STF එක දාගෙන ඉන්න පුළුවන්; හමුදාව දාගෙන ඔය ජනාධිපති මන්දිරය ඇතුළේ ඉන්න පුළුවන්. නමුත් දවස් කීයක් තමුන්නාන්සේ ඒක ඇතුළේ ඉන්නවාද කියලා අපි බලමු. හැට දෙලක්ෂයක ජනතාව නැවත නැගිටලා ඇවිල්ලා තියෙනවා. ඒ නැගිටලා ඇවිල්ලා තියෙන්නේ ඒ 2015 ජයග්‍රහණය නැවත මේ මහපොළොවේ හිටුවන්න කියන එක මතක තියා ගන්න කියලා අපි සිරිසේන ජනාධිපතිතුමාට මතක් කරන්න ඕනෑ. ඒ නිසා ලෙහෙසියෙන් මේ ගනුදෙනුව අවසාන වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනාධිපතිතුමා ගනුදෙනු කරන මේ බලවේග ගැන අපි දන්නවා. මේ බලවේග තමයි පසුගිය කාලයේ මේ රට විනාශ කළේ; මේ රටේ ජාතිවාදය, ආගම් වාදය ඇති කළේ; මේ රටේ දේශපාලන ඝාතන ඇති කළේ; මේ රටේ මාධ්‍ය නිදහස නැති කළේ; මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කළේ. ඒ සියලු දේවල්වලට වග කියන්න ඕනෑ මෙන්න මේ බලවේගත් එක්ක තමයි දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ගනුදෙනු කරන්නේ. එතුමා අද ගනුදෙනු කරන්නේ කාත් එක්කද? එතුමා ගනුදෙනු කරන්නේ සර්පයෝ එක්ක; සර්පයෝ එක්කයි ගනුදෙනු කරන්නේ. ඒ සර්පයාත් එක්ක ගනුදෙනු කරන්න ගිහිල්ලා බණ්ඩාරනායක මහත්තයාට මොකක්ද වුණේ කියලා අපි දන්නවා.

එතුමාගේ පක්ෂයේ නිර්මාතෘ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයාත් මෙන්න මේ වාගේ සර්පයෝ එක්ක ගනුදෙනු කරන්න ගිහිල්ලා අන්තිමට එතුමාගේ ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා. එවැනි මොහොතක තමයි දැන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් මේ වැඩ කරගෙන යන්නේ. ඒ වාගේ කාලයක තමයි, ඒ වාගේ යුගයක තමයි, ඒ වාගේ දේශපාලන වාතාවරණයක් තුළ තමයි අපි බලයට පත් කරපු සිරිසේන මහත්මයා අපට පිටුපාලා, අපි සර්පයෝය කියන මිනිස්සුත් එක්ක නැවත ගනුදෙනු කරන්න පටන් අරගෙන තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ හන්දා මේ ගනුදෙනුව ඉතාම භයානක ගනුදෙනුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගනුදෙනුව ඉතාම භයානක ගනුදෙනුවක්. මේ ගනුදෙනුව භයානක ඒ සර්පයෝ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට දෂ්ට කරන නිසා විතරක් නොවෙයි, සිරිසේන මහත්මයාට පහර ගහන හන්දා විතරක් නොවෙයි, සිරිසේන මහත්මයාට මේ මහ පොළොවේ අඩි 6ක වළක් හාරන හන්දා නොවෙයි. අපි ගොඩ නහා ගත්ත මේ රට, අපි ආරක්ෂා කරපු ප්‍රජාතන්ත්‍රවාදය, අපි ගොඩ නහා ගත්ත සමගිය ආපසු හරවන්න ඒ බලවේග උත්සාහ කරන නිසායි මේ ගනුදෙනුව භයානකයි කියලා අපි කියන්නේ. සිරිසේන මහත්මයාට දෂ්ට කළාට අපට වැඩක් නැහැ. සිරිසේන මහත්මයාට මහ පොළොවේ අඩි 6ක වළක් හැරුවාට අපට ප්‍රශ්නයක් නැහැ. ඒක සිරිසේන මහත්මයායි, මහින්ද මහත්මයායි බලාගත්තදෙන්. ඒ ගැන අපට ගැටලුවක් නැහැ. අපට ගැටලුව තිබෙන්නේ අපි ලබා ගත්ත ජයග්‍රහණ ටික ගැනයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍ය, මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරලා, මේ රටේ ජාතික සමගිය ඇති කරන්න ඕනෑය, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න ඕනෑය කියන මූලික දේශපාලන අංග ටික ආපසු හරවන්න ඒ බලවේගවලට මෛත්‍රීපාල මහත්මයා ඉඩදීලා තිබෙනවා. ඒකයි අපට තිබෙන ගැටලුව. ඒකයි අපට තිබෙන ගනුදෙනුව. අන්න ඒ ගනුදෙනුව බේරා ගන්න තමයි අද වන විට අපි මේ රටේ ජනතාව ඒකරාශී කරලා, වීදිවලට ගෙනැල්ලා සත්‍යාග්‍රහ පවත්වලා, උද්ඝෝෂණ පවත්වන්නේ. හෙට අනිද්දා වන විට අපි ලෑස්ති වෙනවා කොළඹ නගරයට දහස් ගණන් ජනයා ගේන්න. අද මේ පාර්ලිමේන්තුව ලබා දීපු ඒ ඡන්ද ප්‍රතිඵලය සිරිසේන මහත්මයා පිළිගන්නේ නැත්නම්, දහස් ගණන්, ලක්ෂ ගණන් ජනතාව ගෙනැල්ලා සිරිසේන මහත්මයා ඉන්න මන්දිර, එතුමාගේ නිල නිවාස වට කරන්න සිද්ධ වෙනවාය කියන එකත් මතක තියා ගන්න කියලා කියනවා. අපි සිරිසේන මහත්මයාට කියනවා, අද අපි දුන්නු මේ ප්‍රතිඵලය පිළිගන්න; මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්න; මේ රටේ බහුතර ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්න කියලා. එහෙම පිළිගන්නේ නැත්නම් සිරිසේන මහත්මයාට අබ සරණයි කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.40]

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ වර්තමාන තත්ත්වය, රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව විවාද කිරීමට ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කාලීන මාතෘකාවක් ඉදිරිපත් කිරීම ගැන විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය වාඩිවන පැත්තේ හිඳිමින් කථා කරන්න මට අවස්ථාව ලැබීම පිළිබඳවත් මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ සිටින්නේ ආණ්ඩු පක්ෂය පැත්තේයි. අද මේ පැත්තේ හිටපු කණ්ඩායම පසුගිය කාල වකවානුව තුළ සිද්ධ කරපු ඒ කුමන්ත්‍රණයේ පරාජය භාර අරගෙන තිබෙනවා. ඒ නිසා මේ රටේ පාර්ලිමේන්තු සම්ප්‍රදායය රැකගෙන අපි කරගෙන ආපු ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ශක්තිමත්ව ගෙනියන්න කියන පණිවුඩය සරලව, කෙසෙල් කොළේ බත් කන ජනාධිපතිතුමාට දෙන්න මෙය අවස්ථාවක් කර ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුව පත් වෙලා මාස දෙකක් ඇතුළතදී මට ඇති වූ ප්‍රශ්නයක් සාකච්ඡා කරන්න ගිය වෙලාවේ ජනාධිපතිතුමා ඒ ප්‍රශ්නයට දීපු පිළිතුර අනුව මම දැනගත්තා මේ ජනාධිපතිතුමා යන්නේ මොන ගමනක් ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිද්ධ වුණේ මොකකට ද? තමන්ට ලැබිලා තිබුණු බලය තවත් දීර්ඝ කාලයකට රඳවා තබා ගන්නයි එයින් අවස්ථාව සලස්වා ගත්තේ. බලලෝභයට කෑදර වෙච්ච ඒ කණ්ඩායම්වලට පසුගිය ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී මේ රටේ ජනතාව පණිවුඩයක් දුන්නා. ඒ පණිවුඩය මොකක්ද කියලා හොඳාකාරවම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දන්නවා. ඒ දැන දැනත් කුමන්ත්‍රණකාරී ලෙස තමන්ගේ බලය, ධුර කාලය තවත් වර්ධනය කර ගැනීමේ අදහසින් මේ ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ නිසා අද රට කොතැනටද ඇද දාලා තිබෙන්නේ කියන එක බොහොම පැහැදිලිව පෙනෙනවා.

අපේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා එතුමාට ලැබෙන ශාපය පිළිබඳව කිව්වා. දේව ශාපය දෙනවා වාගේම අපි විවිධ ශාප කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු මැරිලා භූමදාන කළාට පස්සේ, ඒ භූමදාන කළ කොටසටත් ශාප කරනවා. එවැනි ශාප ඉල්ලන්නේ නැතිව, රටේ ජනතාව එවැනි ශාප කිරීම් කරන්න කලින් සාධාරණ තීන්දුවක් ගන්න. එතුමාට පුළුවන්, එතුමා කළ වැරදි සියල්ල නිවැරදි කරගෙන නිසි මහට යන්න; බහුතරයට ඉඩ දීලා, ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩ දීලා මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න ශක්තිය දෙන්න. අපි ඊයේ පෙරේදා දැක්කා බලයක් නැති, බලයෙන් එහාට ගිහින් ඒකාධිපති ස්වරූපයෙන් ආණ්ඩුවක් නිර්මාණය කළ කණ්ඩායමක්. ඒ අය මේ රටේ අහිංසක ජනතාවගේ දුක ගැන සොයලා යම් යම් දේවල මිල අඩු කරනවා කියලා කිව්වා.

මේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉන්න ආදායම් උත්පාදනය කරන කණ්ඩායම් බද්දෙන් නිදහස් කරනවාය කියලා නිල නොවන අග්‍රාමාත්‍යවරයා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පළාත කෘෂිකාර්මික පළාතක්. මම දන්නා ආකාරයට ඒ කිසිම ගොවියෙක් ආදායම් බදු ගෙවන තත්ත්වයට ආදායමක් උපයන්නේ නැහැ. හැබැයි, අපි දන්නවා පොළොන්නරුව ප්‍රදේශයේ මහා පරිමාණයෙන් කෘෂිකර්මාන්තයේ නිරත වෙන, මහා ගබඩා තිබෙන, වී අලෙවි කරන කණ්ඩායම් ගැන; විශාල ලෙස ආදායම් උත්පාදනය කරන කණ්ඩායම් ගැන. ඔවුන් මේ රටට ආදායම් බදු ගෙවනවා ඇති. එහෙම නම්, එක පැත්තකින්, ඒ ආදායම් බදු නිදහස් කිරීමේ අරමුණින් මේ ඊනියා ගිවිසුම ගහලා වැරදි ආණ්ඩුවක් නිර්මාණය කළාදෝ කියන සැකය තිබෙනවා. ඒ නිසා සැබැවින්ම- [බාධා කිරීමක්] ඩඩ්ලි සිරිසේන. මට නම අමතක වෙලා තිබුණේ ගරු මන්ත්‍රීතුමනි. එතුමන්ලා තමයි මහා පරිමාණයෙන් කෘෂි නිෂ්පාදන අලෙවි කරන, රටට ආදායම් බදු ගෙවනවා කියලා හොරට ආදායම් බදු ගෙවන කණ්ඩායම. මේ අග්‍රාමාත්‍යවරයා ඒ බදු නිදහස් කරනවා කියලා කියනකොටම මට දැනුනේ, මට හැඟුනේ මෙන්න මේ කාරණය නිසා මේ ආණ්ඩුව ගොඩ නහන්න ඇතියි කියන අදහසයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදාත් එහෙමයි ඔවුන් කටයුතු කළේ. අදත් ඔවුන් කටයුතු කරන්නේ එහෙමයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩඩ්ලි සිරිසේන මහත්මයාගේ උපන් දිනය ඊයේ. උදයංග වීරතුංග, චෝදනාවට ලක්වෙලා ඉන්න හිටපු තානාපතිතුමා, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඥාතියා එතුමාට සුබ පතලා කියනවා, "මහින්ද රාජපක්ෂට අගමැතිකම දෙන්න මූලික වුණේ, ඩඩ්ලි ඔබයි. ඔබට ස්තුතියි. ඔබගේ "අරලිය සහල් මෝලට ජයවේවා" කියලා. ඉන් පසුව දැන්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)

ඒක ස්ථාවර නියෝගයකට අදාළ රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපන්දින තෑග්ගක් වාගේම, දේශපාලන පොරොන්දුවකුත් ඉෂ්ට සිද්ධ කළාය කියන කාරණය මේ රටේම ජනතාව දන්නවා. පසුගිය වකවානුව තුළ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇමතිවරු හිටියා, ඔවුන් එවැනි වැඩ පිළිවෙළක් සඳහා කටයුතු කළේ නැහැ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(*மாண்புமிகு முஜிபுர் ரஹுமான்*)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, වේලාව පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා. ගොඩක් කථිකයන් ඉන්නවා. එම නිසා ඔබතුමාගේ point of Order එක ස්ථාවර නියෝගවලට අනුව මතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(*மாண்புமிகு முஜிபுர் ரஹுமான்*)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව ගෞරවාන්විත සභාවක්. ඊයේ පෙරේදා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් අසභ්‍ය චිත්‍රපටි බලපු බව මාධ්‍යවල පළ වුණා. ඒ වාගේම, අපේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

සභාව තුළත් අසභ්‍ය පොතක් කියවනවා තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාගේ අවධානය එයට යොමු කරවන්න කැමැතියි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටට වැරදි මතයක් යනවා මම මේ සභාවේ කුණුහරුප පොතක් කියවනවා කිව්වොත්. මට ඡන්දය දුන්නු අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට සහ රටට වැරදි මතයක් යනවා. කුණුහරුප පොතක් නොවෙයි, මම කියවන්නේ චතුරිකා සිරිසේන මහත්මිය විසින් ලියන ලද- [බාධා කිරීමක්] -මට පැහැදිලි කරන්න ඉඩ දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.- "ජනාධිපති තාත්තා" කියන පොත. මට මගේ මිත්‍රයෙක් කිව්වා, තමාගේ පියා විසින් දියණිය 41 වාරයක් මේ පොත තුළ දූෂණයට ලක් වෙලා තිබෙනවා කියලා. මම ඒ ගැන තමයි මේ අවස්ථාවේ විපරම් කරමින් ඉන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පසුගිය දිනවල මේ සභාවේ ගරුත්වය විශාල වශයෙන් කෙළෙසුණා, එම නිසා සභාවේ ගරුත්වය ආරක්ෂා කරමින් කටයුතු කරන්න කියලා මා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කථාව කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා කිව්වා වාගේ, ඔබතුමා කිව්වා වාගේ, සැබැවින්ම මේ පාලකයන්ගේ අභ්‍යන්තරයේ සැඟවිලා තිබෙන පාලන යාන්ත්‍රණය කෙසේද කියන කාරණය පසුගිය දින පාර්ලිමේන්තුව තුළදී පෙන්නුම් කළා.

ඔවුන්ට අවශ්‍යතාව තිබෙන්නේ කෙසේ හෝ ඔවුන්ගේ බලය රඳවා ගැනීම කියන කාරණයයි. ප්‍රජාතන්ත්‍රවාදය, රටේ නීතිය, රටේ පවතින ව්‍යවස්ථාව යන කාරණා ඔවුන්ට අදාළ නැහැ. ඔවුන්ට අවශ්‍යතාව තිබෙන්නේ ඔවුන්ගේ පෞද්ගලික සුඛ විහරණය, ඔවුන්ගේ කල්ලිය සහ කල්ලි කණ්ඩායම කොහොමද රැඳෙන්නේ, පවතින්නේ කියන අරමුණ පමණයි. විශේෂයෙන්ම ගරු කථානායකතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට විශාල කැපකිරීමක් කළා; ඒ වෙනුවෙන් පෙනී සිටියා. අපි එය ගරු කොට සලකනවා. යම් පිරිසක් ඔවුන්ගේ බලය රැකගැනීම වෙනුවෙන් පසුගිය දිනවල කටයුතු කළේ කොහොමද කියන කාරණය අපි දැක්කා. ඔවුන් මිලේච්ඡ විධියට ප්‍රජාතන්ත්‍රවාදයට පහර දීමක් කළාය කියන කාරණය අපි පැහැදිලිව කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ අද අපට නිවැරදි තීන්දු-තීරණ ගන්නට අවස්ථාව සැලසුණේ මේ රටේ උත්තරීතර නීතිය, පැහැදිලි තීන්දුවක් ලබා දුන් නිසායි. විශේෂයෙන්ම අපි එයට ගරු කරන්නට ඕනෑ. මේ තීන්දුව, තීරණය ගැනීම පිළිබඳව සලකා බලන්න ඕනෑය කියන කාරණය අධිකරණය පැහැදිලිව කියා සිටියා. ඒ නිසා තමයි අද මේ පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන්නේ කාටද කියන එක, පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ යුතුයි කියන එක මේ රටට පෙන්වා දෙන්න හැකියාව ලැබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි නිවැරදි මඟකට යා යුතුයි, නිවැරදි තැනකට යා යුතුයි කියන කාරණය පසුගිය කාලය තුළ අපි පෙන්වා දුන්නා. එය අපි අදත් කියනවා; හෙටත් කියනවා. ඒ නිසා මේවා සම්බන්ධයෙන් නිවැරදි තීන්දු ගන්න.

කාලයක් අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කළා. ඊට පසුව අපටම ආවේණික විධියට අපේ රට ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක ගොඩනැඟුණා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පස්සේ අවස්ථා ගණනාවකම ව්‍යවස්ථා සංශෝධන ආවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශක්තිමත්ව ගොඩනැඟුණු ආකාරය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මතක ඇති. එතුමාට අද එය අමතක නම්, අද අපේ ගරු මන්ත්‍රීවරුන් ඒ පිළිබඳව කරුණු-කාරණා කිහිපයක් මතක් කර දුන්නා. එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා හැටියට ඉඳලා එළියට බැහැලා ඇවිල්ලා, එදා ඒ පාලනයේ තිබුණු වැරදි වැඩ පිළිවෙළ නිවැරදි කරනවාය කියන කාරණය පැහැදිලි කරලා දුන්නා. නමුත්, අද එතුමා නැවතත් ඒ අය සමඟ අත්වැල් බැඳගෙන එකට දිග කන්න; නැවත ආප්ප කන්න යන්නේ ඒ පරණ අඳුරු යුගය නැවත මේ රටට උදාකර දෙන්නද කියන කාරණය ප්‍රශ්නයක් හැටියට අපි එතුමාගෙන් අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ අනුර කුමාර දිසානායක මැතිතුමා පක්ෂ, විපක්ෂ සියලු දෙනාටම පැහැදිලිව ඇඟිල්ල දිගු කරලා, අපි ගත්ත වැරදි තීන්දු මොනවාද කියන කාරණය පැහැදිලි කර දුන්නා. ඒ නිසා පසු පෙළේ මන්ත්‍රීවරු හැටියට; රටට ආදරය කරන මන්ත්‍රීවරු හැටියට; ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කටයුතු කරන මන්ත්‍රීවරු හැටියට අපි ඉල්ලීමක් කරනවා. අපේ පක්ෂය තුළ සිටින අපේ නායක කාරකාදීන් මේ කියන කාරණාවලින් මුදවලා, තමුන්නාන්සේලා කටයුතු කළේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමටයි. ඒ නිසා අපි තරුණ මන්ත්‍රීවරු හැටියට ඉල්ලීමක් කරනවා, ඒ කියන කාරණය ඉදිරි පාලනය ක්‍රමය තුළ මේ රටට ජනනය කරලා දෙන්න, අපේ අනාගතයට උරුම කර දෙන්න, අපේ දරුවාට උරුම කර දෙන්න කියලා. මොකද, කිසිසේත්ම අපේ ආත්මගරුත්වය, අපේ පක්ෂය, අපේ ජනතා මතය අපි මුදලට පාවා දෙන්න කටයුතු කරන්නේ නැහැ. ඒක අදත්, හෙටත්, ඉදිරියටත් එලෙසමයි කියන කාරණය මේ වෙලාවේ ඉතාමත්ම ගෞරවයෙන් මතක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තවත් කරීකයන් ඉන්නා නිසා දීර්ඝ කථාවක් කරන්න මෙය අවස්ථාවක් කර ගන්නේ නැහැ.

අවසාන වශයෙන් මම කියා සිටිනවා, තීන්දු ගන්න දැන් කාලය හරි කියලා. අබමල් රේණුවක වැරැද්දක් සිද්ධ වෙලා නැහැ කියන කාරණය අද මේ පාර්ලිමේන්තුව තුළ පැහැදිලිව පෙන්වා තිබෙනවා.

ගරු ජනාධිපතිතුමනි, අද රාත්‍රිය වන විට මේ පාර්ලිමේන්තුව තුළ බහුතර බලය තිබෙන රනිල් වික්‍රමසිංහ මැතිතුමාට නැවත අග්‍රාමාත්‍ය ධුරය භාර දෙන්නයි ඔබතුමාට තිබෙන්නේ. ඒ වාගේම, අමාත්‍ය මණ්ඩලය ලබා දෙන්න. වැරැදි තිබෙනවා නම් කථා කරලා තේරුම් අරගෙන වැඩ කරන්න පුළුවන්, නිවැරදි තීරණ ගන්න පුළුවන් ශක්තිය, හැකියාව විධායක ජනාධිපතිතුමා සතුව තිබෙනවාය කියන කාරණය මතක් කරමින්, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු හේෂා විතානගේ මැතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් වෙන්කර තිබෙනවා.

[අ.භා. 3.50]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මේ සම්බන්ධයෙන් අද දිනයේ කරුණු, කාරණා රාශියක් කියවුණා. ඒ වාගේම, අපේ මාතෘ භූමිය ඉතා අනතුරුදායක තත්ත්වයක තිබෙන වෙලාවක කියාත් මම විශ්වාස කරනවා. දැනට අපේ රටේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව මේ රටේ ජනතාව විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් කථා බහට ලක් වෙන වෙලාවක්. "මේ රටට මොකක්ද මේ වුණේ?" කියලා අපේ ජාතියේ සියලු දෙනා; දේශප්‍රේමී සියලු දෙනා කථා කරන වෙලාවක, උත්තරීතර පාර්ලිමේන්තුව තුළ මෙවැනි අවස්ථාවක් නිර්මාණය කර දීමට ජනතා විමුක්ති පෙරමුණ ගත් ප්‍රයත්නය වෙනුවෙන් අපි මුලින්ම ස්තුති කරන්නට ඕනෑ. ඉතිහාසයේ අප කවරදාකවත් දැක නැති, අපේක්ෂා නොකළ තත්ත්වයක් අද මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශ්වකරුවා විධියට ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විශාල චෝදනා රාශියකට ලක් වෙලා තිබෙනවා.

එතුමාට තිබෙන එම චෝදනාවන් පසෙකලා, එතුමාගේ දේශපාලන භාවිතය ගැන පසු පෙළ මන්ත්‍රීවරයකු විධියට මට ලොකු කනගාටුවක් තිබෙනවා. වසර ගණනාවක් මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයකු විධියට එතුමාගේ ඉතිහාසය ගැන සොයා බැලුවාම, එතුමා මේ රටේ ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන තුනේ තිබෙන සම්බන්ධතාව පිළිබඳව, ඒවායේ වගකීම් මොනවාද කියන එක පිළිබඳව, ඒවා ක්‍රියාත්මක වෙන්න ඕනෑ මොන විධියටද කියන එක පිළිබඳව අඹ මල් රේණුවකවත් අවබෝධයක් නැති දේශපාලනඥයෙක් කියන එක අද මේ රටට, ලෝකයට ඔප්පු කරලා තිබෙනවා. වර්තමානයේ අපේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වයට වැඩිය ලොකු විහිලුවක් තවත් නැති තරම්. විධායකයේ සිටින කෙනාට ව්‍යවස්ථාදායකයේ තිබෙන අවස්ථාවන් මොනවාද කියන එක පිළිබඳව අවබෝධයක් නැති වුණාම, ඒ වාගේම අධිකරණයට තිබෙන බලය මොකක්ද කියන එක පිළිබඳව අවබෝධයක් නැති වුණාම, එහෙම නැත්නම් ඒ පිළිබඳව වැටහීමක් නැත්නම්, ඒකට උපදෙස් දෙන්න පුළුවන් සුදුස්සෝ තමන් ළඟ නැත්නම් අද උදේ අනුර දිසානායක මන්ත්‍රීතුමා කියපු කාරණය තමයි රටේ ජනතාවට කියන්න අපට මතක් වෙන්නේ. එක්කෝ එතුමාට පිස්සු. මිලියන 21කට වැඩි ජනතාවක් අගාධයට ඇද දමලා, මේ රටේ සම්පූර්ණ රාජ්‍ය යාන්ත්‍රණය විනාශයට පත්කර තිබෙනවා. අද ඒ යාන්ත්‍රණය නතර වෙලා තිබෙනවා. පෞද්ගලික අංශය විනාශයට පත්වෙලා තිබුණු අවස්ථාවක, ආර්ථිකය අමාරුවෙන් ගැට ගසාගෙන එනකොට ඒක නැවත අන්ත අසරණ තත්ත්වයට බිඳ දමලා, යටට දාලා, පාගලා දාලා දැන් මාසයකට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. අද වෙනකල් එයට උත්තරයක් සොයාගෙන නැහැ. මේ ව්‍යවස්ථාදායකයේ බලය මොකක්ද කියන එක ජනාධිපතිතුමාට තේරෙන්නේ නැහැ වාගේම, හිටපු ජනාධිපතිවරයෙක් විධියට, අද හොර අගමැතිවරයෙක් කියලා ලේබලයක් ගසාගෙන මේ රටට විහිලුවක් වෙලා සිටින මහින්ද රාජපක්ෂ මහත්මයාට ඒක තේරෙන්නේත් නැහැ. එක්කෝ තේරිලා නොතේරෙනවා වගේ ඉන්නවා. සභානායක කියලා සිටින ඊනියා සභානායකතුමා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග කියන්නේ මොනවාද කියලා දන්නේ නැහැ. මේ, මොනවත් නොදන්නාකම නොවෙයි.

මේ රටේ ජනතාව දැනගත යුතු කාරණාවක් තිබෙනවා. එදා එක්සත් ජාතික පක්ෂයේ අභිංසක මිනිසුන්ගේ ඡන්ද ටික අරගෙන සිරිසේන මහත්මයා මේ රටේ ජනතාවට සපථ කළේ මොකක්ද? මේ රටේ ජනාධිපතිවරයා බවට සිරිසේන මහත්මයාව පත් කරන්න ජනතාව එදා ඉස්සරහට ආවේ ඇයි? රාජපක්ෂ ජනාධිපතිවරයා එදා මේ රටට දීලා තිබුණු භීතිය නැති කරන්නයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට දමලා, මේ රටේ රාජ්‍ය යාන්ත්‍රණය තනිකර හිර කරලා, නිලධාරීන්ට තමන්ගේ රැකියාව නිදහසේ කරගන්න බැරි වටපිටාවක් නිර්මාණය කරලා තිබුණා. ඒ පීඩනය තමයි 2015 ජනවාරි 8වැනිදා ජනතාව පිට කරලා සිරිසේන මැතිතුමාට මේ අවස්ථාව අරගෙන දුන්නේ. එතුමා එදා කිව්වා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න, නැවත නැවත මේ රට ආර්ථික වශයෙන් අගාධයට පත් කරන ආණ්ඩු බිහි නොවෙන්න, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කර අධිකරණයට වග කියන ජනාධිපතිවරයෙක් හදන්න කටයුතු කරනවා කියලා. එතුමා කියපු එවැනි කරුණු විශාල ප්‍රමාණයක් නිසා ජනතාව විශාල බලාපොරොත්තු ඇතිකර ගත්තා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේ ව්‍යවස්ථාව ගැන සාමාන්‍ය දැනීමක් තිබෙන කෙනෙකුට වුවත් මේ තත්ත්වය තේරෙනවා. දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඉදගෙන ඉතාම උජාරුවෙන් කිව්වා, මට තිබෙන බලය මම ව්‍යවස්ථාදායකට දුන්නා, මගේ බලය මම අඩු කර ගත්තා කියලා. එතුමාම පසුගිය 9වැනිදා, එහෙම නැත්නම් 8වැනිදා රෑ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම තුළින් මේ ලෝකයට කියා පානවා, දහඅටවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වන තෙක් විධායකයට තිබුණු බලයට වඩා බලයක් එතුමාට ආරෝපණය කරගන්න පුළුවන් කියන කාරණාව. එතුමා ඒක මේ රටට ඔප්පු කරන්න සූදානම් වුණා. මේ රටේ ජනතාවට විශ්වාසයක් තබන්න, මේ රටේ ජනතාවට පිහිටක් වෙන්න තිබුණු එකම අවස්ථාව වන අධිකරණය විසින් ලබා දුන් තීන්දුවට අපි මේ වෙලාවේ හිස නමා ආචාර කරනවා. ඒ තුළ තමයි ජනතාව අද ජීවත් වෙන්නේ. එම නිසා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ මාතෘ භූමියට කරපු වැරැද්ද,- වැරදි කරපු නායකයෝ ඉතිහාසයේ ඕනෑ තරම් හිටියා; මේ රටට වින කරපු නායකයෝ ඉතිහාසයේ ඕනෑ තරම් සිටියා. ඔවුන් මේ රටට කරපු ඒ විනය, වැරැද්දට වඩා මහා විශාල අපරාධයක් මේ වෙනකොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අද මේ රටට කරලා ඉවරයි.

අද මේ රටේ සංචාරක ක්ෂේත්‍රය විනාශ කර දැම්මා. විශාල ආර්ථික ආදායම් මාර්ගයක්; මේ රටට ගොඩ එන්න තිබුණු එක අවස්ථාවක් නැති කර දැම්මා. දැන් ඔබතුමාගේ අරමුණ වෙලා තිබෙන්නේ මොකක්ද කියන එක මේ රටේ ජනතාව දන්නවා. ඔබතුමාට සියලු දේවල් අමතක වුණා. තමන්ගේ ධුර කාලය අවසන් වෙනවාය කියන කාරණය මතක් වෙනකොට, මොන ගොඩින් ගිහිල්ලාද ලබන සැරේ ජනාධිපති වෙන්න පුළුවන් වන්නේ කියා ඔබතුමා බැලුවා. ඔබතුමාගේ එක කාලකණ්ණි හීනයක් නිසා, ඔබතුමාගේ එක පාඩඩ තීන්දුවක් නිසා, මේ රටේ මුළු මහත් ජනතාවම හදවතින් හැම වෙලාවේම දුක් විඳිනවාය කියන එක මම මතක් කර දෙන්න කැමැතියි. මේ රටේ යුද්ධය අවසන් කරන්න නායකත්වය දුන් මහින්ද රාජපක්ෂ කියන හිටපු නායකයාට දේශපාලන භේදයකින් තොරව අපි සියලුදෙනාගේම ලොකු ගෞරවයක් තිබුණා. ඔබතුමාත් මේ කැදැල්ලට එකතු

[ගරු හේෂා විතානගේ මහතා]

වෙලා; මේ කුමන්ත්‍රණයට එකතු වෙලා; මේ කුමන්ත්‍රණයේ කොටස්කාරයෙක් වෙලා මේ රටට ද්‍රෝහී වුණේ ඇයි කියන එක මේ රටේ මිනිසුන් දන්නවා. ඔබතුමාට පසුගිය කාල සීමාව තුළ විශාල චෝදනා තිබුණා; ඔබතුමාගේ කණ්ඩායමට විශාල චෝදනා තිබුණා. අද උදේ වරුවේ මේ ගරු සභාවේදී කියැවුණා වාගේ, නඩු විශාල ප්‍රමාණයකට මුහුණ දෙන්න දින වකවානු වෙන් වෙලා තිබුණා. ඔබතුමාත් බල බලා හිටියේ මේකට ඔළුව රිංගවා ගන්න පුළුවන් වෙන්නේ කොයි වෙලාවේද කියා නේ. ඒ අවස්ථාව උදා වුණා. ඔබ එකතු වෙලා ඒ බලාපොරොත්තු වුණු හීනය සැබෑ කරගන්න උත්සාහ කරමින් හිටියා. රනිල් වික්‍රමසිංහ මහත්මයා බෑග් එක අරගෙන 27වන දා යයි කියා හිතාගෙන හිටියා. මේක සාධාරණ විධියට වුණා නම් එහෙම යනවා; මේ වාගේ කුමන්ත්‍රණයක් නොකළා නම් එහෙම යනවා; ජනතාවගෙන් ප්‍රතික්ෂේප වුණා නම් එහෙම යනවා.

අද අපි සතුටු වෙනවා, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන, මේ රටේ දේශ ප්‍රේමීන් විධියට හිටගන්නා සෑම කඳවුරක්ම එක තැනකට එකතු වෙලා තිබීම ගැන. ඒකට හේතුව තමයි, ඔබතුමන්ලා ගෙනාපු මේ කුමන්ත්‍රණකාරී පාදඩ දේශපාලන තීන්දුව. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ පසුගිය දිනවල මොකද වුණේ? මේ උත්තරීතර පාර්ලිමේන්තුව -ව්‍යවස්ථාදායකය- ආරක්ෂා කරනවාය කියා දිවුරුම් දීලා එන මන්ත්‍රීවරුන් 225දෙනා අතින් එදා මෙතැන මොකක්ද සිදු වුණේ? ඒ මන්ත්‍රීවරුන්ට ව්‍යවස්ථාදායකයේ, එහෙම නැත්නම් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ තමන්ගේ වගකීම මොකක්ද කියන එක අමතක වුණා. කථානායකවරයා තනිකරම ගමේ පොළේ ඉන්න මිනිහෙක් ගණනට දමලා කථා කරන්න පටන් ගත්තා. නියෝජ්‍ය කථානායකවරයාටත් එහෙම කථා කරන්න ගත්තා.

ඔවුන් මේ පාර්ලිමේන්තුවේ හැසිරුණේ සත්තු වාගෙයි. හැබැයි, රටේ ජනතාව මේ ඔක්කෝම බලාගෙනයි ඉන්නේ. මේ සියල්ලටම පිළිතුරු දෙන්න අවස්ථාවක් එනතුරුයි රටේ ජනතාව බලාගෙන ඉන්නේ කියන එක අපි දන්නවා. ඒක නිසා අපි කියනවා, මේ උත්තරීතර ආයතනය නියෝජනය කරන්න ඕනෑ බුද්ධිමත් අය බව. මේ දවස්වල සමාජ වෙබ් අඩවිවල පළ වෙනවා වාගේ, අධ්‍යාපන මට්ටම තිබුණාට වැඩක් නැහැ කියන එකත් එදා අපි දැක්කා. බුද්ධි මට්ටම ඉහළ මිනිසුන් මෙතැනට එන්න ඕනෑ. මේකට ඕනෑ කෙනෙකුට එන්න පුළුවන් වීම නිසා තමයි, අපේ පොලිස් නිලධාරින්ට අර වාගේ අඩන්තේට්ටම් කළේ. කසිප්පුකාරයෝ විධියට හිටපු මිනිසුන්ට, කුඩුකාරයෝ විධියට හිටපු මිනිසුන්ට, එතනෝල් ජාවාරම් කරපු මිනිසුන්ට පසුගිය කාලයේ පොලීසියෙන් දඬුවම් ලැබුණා; හිර කූඩුවේ ඉන්න සිද්ධ වුණා. පොලීසිය දමන "පාට්" එක විඳගන්න වුණු අයට ඒ Police uniform එක හරි allergic. ඒක තමයි Police uniform එකෙන් අල්ලාගෙන ගහන්න ගත්තේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු හේෂා විතානගේ මහතා
(මාණ්පුමිකු හේසා විතානකේ)
(The Hon. Hesha Withanage)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ස්ථානය කසිප්පුකාරයන්ට, කුඩුකාරයන්ට එන්න පුළුවන් තැනක් නොවිය යුතුයි. මේක ශුද්ධ වූ ස්ථානයක්. මේ රටේ ජනතාවට ආදරය කරන, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් නිර්මාණය වෙන පිළිතුරක් හොයා ගන්න පුළුවන් නීති හදන තැන බවට ව්‍යවස්ථාදායකය පත් විය යුතුයි. මේ ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය කියන ඒවා ගැන දන්නේ නැති නායකයකුගේ සරණ යන රටක මේ මොහොතේ ජීවත් වෙන්න ලැබීම අවාසනාවක් කියා අපි හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අවාසනාවන්ත තත්ත්වයෙන් මේ රට ගොඩගන්න තව කල් නොයවා මේ වෙනුවෙන් තීන්දුවක් ගන්න. සිරිසේන ජනාධිපතිවරයාගේ ඇස් ඇරිය යුතුයි කියා අපි කියනවා. මේ රටේ, ජාතියේ අනාගතය වෙනුවෙන්, මේ රටේ සිටින අහිංසක දුවා දරුවන්ගේ අනාගතය වෙනුවෙන් යම් තීරණයක් ගත යුතුයි. සිරිසේන ජනාධිපතිතුමනි, තවදුරටත් මේක ඇද-ඇද ඉඳලා, මේ රට තවදුරටත් මේ තිබෙන තත්ත්වයෙන් පහළට දමන්න උත්සාහ කළොත්, දේශපාලනඥයන් විධියට අපට මීට වඩා තීන්දු-තීරණ ගන්න වෙයි. අන්න ඒ තැනට නොයවා, මේ රටේ මිනිසුන් ඔබතුමාව එළියට දමන තුරු ඉන්නේ නැතිව, මේ රට, ජාතියට අඩුම තරමේ අබමල් රේණුවක හෝ ආදරයක් තිබෙනවා නම් අද මේ මොහොත පාවිච්චි කරලා මේ කළ වැරැද්ද යම් තාක් දුරට නිවැරැදි කර ගන්න කටයුතු කරන්න කියා පසු පෙළ මන්ත්‍රීවරයකු විධියට ආයාචනා කරමින්, මෙවැනි පිරිසක් සමඟ මෙවැනි පාර්ලිමේන්තුවකට නම් අනාගතයේ දිනක එන්න නොලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා. ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. BIMAL RATHNAYAKE left the Chair, and THE HON. HESHA WITHANAGE took the Chair.

[අ.භා.4.02]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ හඬින් ගොරවන, අකුණු වදින, මහා මෙඝ වර්ෂාවක් වාගේ පසුගිය දවස්වල තිබුණු පාර්ලිමේන්තු පරිසරය ඉතාම සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න පුළුවන් විධියට වාගේම, තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය විනාශ නොවී, මේ පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදයේ දෙවහන හැටියට ඉතාම උත්තරීතර තත්ත්වයට අද වනකොට පත් කරන්න -නිර්මාණය කරන්න- ශක්තිය ලබා දුන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක, දේශබන්දු කරු ජයසූරිය මැතිතුමාටත්, නියෝජ්‍ය කථානායකතුමා ප්‍රමුඛ මහ ලේකම්තුමාටත්, විශේෂයෙන්ම ප්‍රධාන වෙත්‍රධාරිතුමා ඇතුළු නිලධාරි මණ්ඩලයේ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ගෞරවය පුද කරනවා.

ජනතා විමුක්ති පෙරමුණේ ගරු විජිත හේරත් මැතිතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ, එයට පිළිතුරු දෙන්න හිටපු ආණ්ඩු පක්ෂය යයි කියා ගන්නා මේ කණ්ඩායම පැළ දොරින් ගිහිල්ලා තිබීම පිළිබඳව මම කනගාටු වනවා. තමන් ආණ්ඩු පක්ෂයේ නොවෙයි කියන කාරණය එයින්ම පැහැදිලිව පෙනෙනවා. ආණ්ඩු පක්ෂයේ ඉන්න අපේ සභානායකතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු අය මේකට උත්තර දෙන්න අද ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා දැන් ජනාධිපතිතුමාගේ හිත පහළ වෙන්න ඕනෑ. දෙවතාවක්, තුන් වතාවක් වැරැද්දක් කළා නම් ඒක නිවැරැදි කර ගන්න අද අවස්ථාව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රකට දාර්ශනිකයකු වාගේම සෝවියට් දේශයේ ඉතාම ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ කතුවරයකු වුණු වී.අයි. ලෙනින් මැතිතුමා "රාජ්‍ය හා විප්ලවය" -The State and Revolution- කියන ග්‍රන්ථය තුළ ඉතාම පැහැදිලි ප්‍රකාශයක් කර තිබෙනවා. ඒ ප්‍රකාශය තමයි, "මිනිසුන් අතින් වැරැදි සිදු වීම සාමාන්‍ය දෙයක්" කියන එක. ඔබතුමා අතිගරු ජනාධිපතිතුමා වුණත් ඔබතුමාගෙන් වැරැදි සිදු වන බව අපි පිළිගන්නවා. අපේ ආගම අනුව අපි පෘථග්ජනයින්; රහත් වුණු අය නොවෙයි. හැබැයි, ඒ වැරැද්ද සිදු වෙලා තිබෙන බව අපි පැහැදිලිව පිළිගන්නවා. ඒ නිසා එම වැරැද්ද නිවැරැදි කර ගන්න අවශ්‍ය කටයුතු කළ යුතු වනවා.

"එකක් කඩතොලු වසා ගන්නට ගිහින් මට වුණු කාරියා - දෙකක් කඩතොලු හදා දුන්නැයි ඉදුරුවේ ආචාරියා" කියලා ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා මට මතකයි. අතිගරු ජනාධිපතිතුමා ඒ වැරැද්ද නිවැරැදි කර ගන්න නොයෙක් විධියේ දේවල් කළ බව අපි දන්නවා. නමුත් ඒ කුමන්ත්‍රණ සියල්ල අද ඉතාම පැහැදිලි ලෙස ව්‍යර්ථ වෙලා තිබෙනවා. චමින්ද විජේසිරි මැතිතුමා ආණ්ඩු පක්ෂය පැත්තේ සිට පළමුවැනි කථාව කළා. හේෂා විතානගේ මැතිතුමා ආණ්ඩු පක්ෂය පැත්තේ සිටිමින් දෙවැනි කථාව කළා. තුන්වැනි කථාව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ පැත්තේ ඉඳගෙන මට කරන්න ලැබීම දෛවෝපගත සිදුවීමක් හැටියට වාගේම, ඉතිහාසගත වන දෙයක් හැටියට මා දකිනවා. අපි පාර්ලිමේන්තුවේ ගැලරියට ගිහින් බලාගෙන ඉඳලා තිබෙනවා. නමුත් ඉතිහාසයේ කවදාවත් මෙහෙම දෙයක් වුණේ නැහැ. අපි මේ සිද්ධිය පිළිබඳව සතුටු වෙන්නේ නැහැ. මොකද, මෙවැනි දෙයක් පසුගිය කාල පරිච්ඡේදය තුළ සිදු වීම නිසා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය නැති වුණා විතරක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට අපිට පාරේ බැහැලා යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. සමහර අය අපිටත් චෝදනා කරනවා. බොහොම අහිංසක පූස් පැටව් වාගේ අපි නීතිගරුකව වාඩිවෙලා හිටියා. සෑම කෙනෙකුම මේ පාර්ලිමේන්තුව තුළ හැසිරීම පිළිබඳව වග බලා ගන්න ඕනෑය කියා අපේ අග්‍රාමාත්‍ය, රනිල් වික්‍රමසිංහ නායකතුමා අපිට පැහැදිලි තීන්දුවක් දීලා තිබුණා. නමුත් පසුගිය දවස්වල මේ පාර්ලිමේන්තුවේදී අපි දැක්කේ මොනවාද? 1970 දශකයේ ළාබාල මන්ත්‍රීවරුන් හැටියට පාර්ලිමේන්තුවේ හිටපු වාසුදේව නානායක්කාර මැතිතුමන්ලා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් හරියට අගය කළා. නමුත් කථානායකවරයාගේ පුටුව අරගෙන පෙරළනකොට, එලෙස හිටපු අය මෙතැන ඉඳගෙන ඉඟිබිඟි පාමින්, තමන්ගේ ගෝල බාලයන්ට උපදෙස් දුන්නා. මහින්ද රාජපක්ෂ මහත්තයෝ, තමුන්නාන්සේලා ආපු ප්‍රජාතන්ත්‍රවාදය, තමුන්නාන්සේලා ආපු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය, නියෝජ්‍ය ඇමති ධුරය, ඇමති ධුරය, විපක්ෂ නායක ධුරය, අගමැති ධුරය සහ ජනාධිපති ධුරය දක්වා යන ගමනට ශක්තියක් දුන් මේ ව්‍යවස්ථාව අද ලජ්ජා නැතිව කඩ කරලා, විනාශ කරලා, ව්‍යවස්ථාව පිළිබඳව තිබුණු විශ්වාසය සම්පූර්ණයෙන්ම නැති කරන්න කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ බුදු දහම පිළිබඳව ලියැවුණු "ත්‍රිපිටකය" වැනි ග්‍රන්ථ තිබෙනවා. අපි ඒවා පණ වාගේ ආරක්ෂා කරනවා. ක්‍රිස්තියානි ධර්මය ගැන ලියැවුණු "බයිබලය" තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් අයගේ "කුරානය" තිබෙනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව ගැන කියනකොට ආගම තිබෙන පොතක් හැටියට සලකන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. මේක තමයි ආගම තිබෙන පොතක් හැටියට පාර්ලිමේන්තුව තුළ අපි සලකන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි සලකන්නේ. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ජනාධිපති දක්වා ඇවිල්ලා, එතුමා දඟනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඒක වෙනස් කළා. අත් හැරීම පිළිබඳව බුදු දහමෙන් ලැබුණු ආභාසය වෙන්න පුළුවන්. අත් හැරීම පිළිබඳව වන්දනීය, පූජනීය වූ මහා සංඝ රත්නයට කථා කළ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාද මේ ඉන්නේ කියා අපට ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය ඔක්තෝබර් 26 වනදා වනකොට මමත්, හේෂා විතානගේ මන්ත්‍රීතුමාත්, ඒ වාගේම (වෛද්‍ය) තුසිතා විජේමාන්න මැතිනියත් ඇතුළු අප කිහිප දෙනෙකුට යන්න තිබුණා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, ඒ වාගේම පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන් පිළිබඳව ඉගෙන ගන්න. ඒ සඳහා ගරු කථානායකතුමා අපට සංචාරයක් දීලා තිබුණා. ඔක්තෝබර් 26 වනදා මධ්‍යම රාත්‍රිය පහු වෙලා අපි යනකොට, ගුවන් යානයේ මා හිටපු ආසනය ළඟට ආපු හේෂා විතානගේ මන්ත්‍රීතුමා -ඒ ගැන මූලාසනයේ සිටින ඔබතුමා සාක්ෂි දරනවා.- කිව්වා, "මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති හැටියට දිවුරුම් දීලා." කියා. මට මහ පොළොව පළාගෙන යන්න හිතුණා. 2015 ජනවාරි 08 වනදා මේ රටේ උත්තරීතර මහා සංඝ රත්නය ඉදිරියේ නිදහස් චතුරස්‍රයේදී දිවුරුම් දෙනකොට මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිව්වේ මොකක්ද? එදා මේ රටේ මුළුමහත් ජනතාවටම විතරක් නොව ලෝකයටම කිව්වා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟව දිවුරලා කිව්වා, "මේ රටේ අපි යහපාලන ආණ්ඩුවක් ගොඩ නඟනවා." කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා ජයග්‍රහණය කර ආවත් මම එතුමාට අගමැතිකම දෙන්නේ නැහැයි කියපු මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මේ කරපු සෙප්පඩිවිජ්ජාව මොකක්ද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා අපි එදා තමුන්නාන්සේ බලයට පත් කළේ, නිදහස් හා සාධාරණ මැතිවරණයක් උදෙසා මැතිවරණ කොමිෂන් සභාව, පොලිස් කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවලා, මේ රටේ නීතිය, සාධාරණත්වය, අධිකරණයේ ස්වාධීනත්වය නහවුරු කර කටයුතු කරන්නයි. එතැන මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන බොහොම කළු ලපයක් - black mark එකක්- තිබුණා. නමුත්, මම හිතනවා, එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ප්‍රකාශ කළේ කුහකකමින්, ද්‍රෝහිකමින්, ක්‍රෝධයෙන් කියා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපති පුටුවේ වාඩි කරන්න ශක්තිය දීපු එක්සත් ජාතික පාක්ෂිකයින්ට විතරක් නොව තමන්ගේ ළඟම මිත්‍රයා හැටියට මේකට උස්සලා තියපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් ද්‍රෝහී වෙලා මේ කරපු පාපය මුළු මහත් රටේම ශාපයක් බවට පත් වෙලා අවසානයි කියා මා හිතනවා. කඩ පිළේ වෙන්න පුළුවන්, බස් නැවතුම්පොළේ වෙන්න පුළුවන්, වත්තේ factory එකේ වෙන්න පුළුවන්, කුඹුරු කොටන තැන වෙන්න පුළුවන් අද කථා කරන්නේ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ මේ වෛරී ක්‍රියාව පිළිබඳව. හෙට අනිද්දා කවුරු හරි පොතක් ලියාවි, "මෛත්‍රීගේ වෛරය" කියා. ඒ පොත ලියන දවස වනකොට ලියන්න බොහෝ දේවල් තිබෙනවා. අර අපේ ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කියපු "ජනාධිපති තාත්තා" පොතෙනුත් කරුණු කාරණා ගෙනෙයි. මම ඉතා පැහැදිලිව කියනවා, අපේ රටට අවශ්‍ය කර තිබෙනවා ප්‍රජාතන්ත්‍රවාදය. මොන විධියේ දේශපාලන පක්ෂ වුණත්, අනාගතය පිළිබඳව මේ රටේ ජනතාවට විශ්වාසයක් ගොඩ නැඟෙන්න ඕනෑ. හැම දේශපාලන පක්ෂයක්ම, අපි හැම කෙනෙක්ම කටයුතු කරන්නේ, අනාගතය වෙනුවෙන්. මේ රටේ ජනතාව ගත්තොත්, ඉපදිලා ඉන්න කිරිසප්පයා වාගේම අනාගතයේ බිහි වන හැම දරුවෙක්ම ශාප නොකරන දේශයක් බවට පත් කරන්න අපට යුතුකමක් තිබෙනවා. හැබැයි, කවදා හෝ දවසක සිංහල වංශ කථාව තුළ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ කවදා හරි ලියැවෙයි, මෛත්‍රීපාල සිරිසේන නම් වූ පාලකයාගේ පාලන තන්ත්‍රය තුළ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට කණ කොකා හඬලා, ප්‍රජාතන්ත්‍රවාදයට විශාල කළු පැල්ලමක් ඇති වුණු යුගයක් තිබුණාය කියා. අපි වාගේ පළමු වතාවට ආපු මන්ත්‍රීවරුන්ට මේකේ අසුන්ගෙන සිටිනවාය කියන එක පිළිබඳවත් කනගාටුයි. මට හිතා ගන්න බැහැ. අවුරුදු හතරයි, මාස හයකින් තමයි පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන් කියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිවම තිබෙන්නේ. ඒක සම්පූර්ණයෙන්ම කඩලා, විනාශ කර, ඒ සියල්ල අපේක්ෂා භංගත්වයට පත් කළා විතරක් නොවෙයි.

එදා 2015 අගෝස්තු මාසයේ 17වැනිදා අපි සියලු දෙනාටම මේ රටේ ලක්ෂ ගණනක් ජනතාව ඡන්දය දුන්නේ -විරුද්ධ හෝ පක්ෂව- අවුරුදු 5කට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කරන්නයි. හැබැයි, ඒ ලක්ෂ ගණනක මිනිසුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කරමින් අවුරුදු තුනයි, මාස තුනකින් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න තරම් එතුමාට හිත පහළ වීම ගැන අපි කනගාටු වෙනවා. මෙවැනි තත්ත්වයකට පත් වුණේ ඇයි? අත්තනෝමතිකව, ඒකාධිපතිවාදය තුළ තමන්ට ඉස්සරහට එන්නයි. දෙවරක් නොවෙයි, තුන්වරක් අවස්ථාව ගන්න හදනකොට අපි මහින්ද රාජපක්ෂ මහත්මයාට "ඒකාධිපතියා" කියා කිව්වා. දැන් බලනකොට ඒකාධිපතිත්වය නැති කරන්න ආපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ලජ්ජා නැතිව, රෙදි ඇදගෙන ද අද මේ රටට ප්‍රකාශ නිකුත් කරන්නේ කියා අපට හිතෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට රටක් හැටියට ඉදිරි කාලය තුළ ඉටු කරන්න බොහෝ දේ තිබුණා. අපි 2019 අය වැයෙන් රටේ ජනතාවට සහන දෙන්න ලැහැස්ති වෙලායි හිටියේ. මේ මාස කිහිපය තුළ මගේ ආසනය තුළ රුපියල් ලක්ෂ දෙදහසක මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඇතුළු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න සූදානම් කර තිබුණා. ඒ විතරක් නොවෙයි. "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වෙතින් ලක්ෂ ගණනකට ණය මුදල් දෙන්න තිබියදී, ඒ වාගේම විශේෂයෙන් මේ අවුරුදු දෙක අවසන් වන විට උදාගම් 2,500ක් නිර්මාණය කරන්න කටයුතු කර තිබියදී, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමන්ලා, අපි එකතු වෙලා ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ ආසනවල දස ලක්ෂයකට ඉඩම් බෙදන්න සැලසුම් කර තිබියදී මේ සියල්ල ව්‍යර්ථ කර කුමන්ත්‍රණකාරී ලෙස පාර්ලිමේන්තුව විසුරුවා හරින්න කටයුතු කළා විතරක් නොව පාර්ලිමේන්තු සම්ප්‍රදායන්වලට ගිනි තියලා ඉතාම අවාසනාවන්ත, අකාරුණික තත්ත්වයකට මේ රට පත් කළා. නමුත්, ඒකෙන් අපි ආපස්සට ගියේ නැහැ, කියන එක අපි මේ රටේ ජනතාවට කියනවා. අජිත් පෙරේරා මැතිතුමා ප්‍රකාශ කළා වාගේ මේ රටේ පාර්ලිමේන්තුව තුළ, ඉන් බැහැරව උපවාසයේ යෙදිලා, වෙනත් දේවල්වල යෙදිලා මේ කටයුත්ත කරන්න බැරි නම්, මේ විධියට තක්කඩි විධියට හොර පාරෙන් මහින්ද රාජපක්ෂ ගෙනැල්ලා අගමැතිකමේ තව දුරටත් තියාගන්න ලැහැස්ති වුණොත්, ජනාධිපතිතුමාට ඉන්නට වෙන්නේ ජනාධිපති මන්දිරයේ එහෙම නැත්නම් නිල නිවසේ. එහෙම නැත්නම් ජනාධිපති ලේකම් කාර්යාලයට කොටු වෙන්න වේවි, උත්සවයකට යන්න බැරි වේවි. ජනතාව කොයි විධියට ප්‍රතිචාර දක්වාවිද දන්නේ නැහැ. පන්සලකට යන්න බැරි වේවි, හාමුදුරුවරුන් කොයි විධියට අනුශාසනා කරාවිද දන්නේ නැහැ. ඊයේ රූපවාහිනියේ ඒ නායක ස්වාමීන් වහන්සේ දේශනා කළ බණ මීට පෙර ගරු මන්ත්‍රීතුමෙකු සඳහන් කළා වාගේ එතුමාට පූර්වාදර්ශයට ගන්න වෙනවා. එහෙම නැති වුණොත් නීති කඩ කරන, අධිකරණයේ නීති කඩ කරන, දඩ මුදල් නොගෙවන, බස් එකේ යනකොට ටිකට් එක නොගන්න ඒ වාගේ විවිධ දේ වෙනවා. අද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කියනවා, ඒ කාලයේ ලැබුණු මුදලින් හතරෙන් එකක්වත් දැන් දවසකට ලැබෙන්නේ නැහැ කියා. අද බදු මුදල් ගෙවන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මොකද, මේ රටේ රාජ්‍ය තන්ත්‍රය සම්පූර්ණයෙන් අකර්මණ්‍ය වෙලා තිබෙනවා. අපි පැහැදිලිව කියනවා, මේ රටේ ජනතාවට ටිකක් ඉවසන්න කියා. ඔබතුමන්ලා අවුරුදු තුනකුත් මාස කිහිපයක් ඉවසුවා. අපේ හත, අට පාස් වුණු අහිංසක කොල්ලන්ට, කෙල්ලන්ට රක්ෂාව ගන්න දුන්නේ නැහැ. උපාධිධාරීන් 20,000කට රක්ෂා දෙන්න රනිල් වික්‍රමසිංහ මහත්මයා අනුමැතිය ඉල්ලද්දී ඒක ආපස්සට දාලා නැවත සම්මුඛ පරීක්ෂණ තියලා ඒක විනාශ කළා. ඒ විතරක් නොවෙයි. ලක්ෂ දෙකකට සමෘද්ධිය දෙන්න හිතා ගෙන හිටියා. ඒ සියල්ල නැති වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කථාව අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

හොඳයි. අද එක්සත් ජාතික පාක්ෂිකයින්ගේ විතරක් නොවෙයි, මේ රටේ නැති බැරි සියලු ජනතාවගේ බලාපොරොත්තු විනාශ කරලා කුමන්ත්‍රණය කරලා, අල්ලස් දූෂිතයන් තියාගෙන, ඔවුන්ට රැකවරණය දෙන්න කරපු කුමන්ත්‍රණය ගැන අද මුළු රටේම මිනිස්සු දන්නවා. ඒ නිසා ඒ කුමන්ත්‍රණය පරදා නැවත වරක් ඉදිරි අවුරුදු එකහමාර තුළ රටක්, රාජ්‍යයක් ජය ගන්න නොවෙයි, මේ රටේ අහිංසක, දුක් විඳින මිනිස්සු වෙනුවෙන් කටයුතු කරන්න අපට ඒ ශක්තිය දෙන්න වහාම හෙට දවසේ කටයුතු කරන්න කියා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි ඒ ඉල්ලීම කරන්නේ තර්ජනාත්මකව නොවෙයි, කාරුණිකව, මෛත්‍රීයෙන් යුතුවයි. අපි ඒ දවස්වල කිව්වේ "මෛත්‍රී වේවා!" කියායි. මම දන්නේ නැහැ, ඒක ආපස්සට හරවා ගන්නේ කොහොමද කියා. "මෛත්‍රී වේවා!" කියා ස්ටිකර් ගෙවල්වල ගහලා තිබුණා, පත්තරවල පළ වුණා, හැම තැනම

තිබුණා. අද ඒවා සේරම ඉරලා, මුහුණ විකෘති කරලා, සමහර තැන්වල මුහුණු කපලා තිබෙනවා. තවම මේ වෙනුවෙන් රටේ මිනිසුන්ගේ විරෝධතාව පටන් ගත්තා විතරයි. ඒ නිසා කරුණාකර, මේ විරෝධතාව නැති කර ගන්න, අර ලෙනින් මැතිතුමාගේ -ඒ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයාණන්ගේ- කියමන මතකයට අරගෙන කටයුතු කිරීම සඳහා හෙට දවසේ එතුමාගේ සිත් පහන් වේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. අවසාන වශයෙන් බුදුන් වහන්සේ දේශනා කළ,

"දෙවො වස්සතු කාලෙන
සස්ස සම්පත්ති හොතු ච
ජීතො භවතු ලොකො ච
රාජා භවතු ධම්මිකො"

කියන ගාථාව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පි.ප. 4.17]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிக முக்கியமான இந்த ஒத்திவைப்புவேளை விவாதத்தின்போது உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். குறிப்பாக, கடந்த மாதம் 26ஆம் திகதி இறுதியாக நடைபெற்ற பாராளுமன்ற அமர்வில் உரையாற்றிவிட்டுச் சென்றதன்பின், இன்று கிட்டத்தட்ட ஒரு மாதம் கழித்து, மீண்டும் இந்த உயரிய சபையிலே உரையாற்றுவதற்கிடையில் பாராளுமன்ற உறுப்பினர்களான நாங்கள் வித்தியாசமான சில அனுபவங்களைப் பெற்றுக்கொண்டுள்ளோம். அன்று, ஆளுங்கட்சி நாடாளுமன்ற உறுப்பினர்களாக நாங்கள் சபையைவிட்டுச் சென்றோம். சபை அமர்வு ஒத்திவைக்கப்பட்ட நாட்களில் அடுத்த கட்டம் என்னவாக இருக்குமென்று எதிர்பார்த்திருந்தபோது ஜனாதிபதி அவர்கள் தன்னுடைய அதிகாரங்களை அடிப்படையாக வைத்துப் பாராளுமன்றத்தைக் கலைத்ததன்பேரில் நாங்கள் முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களானோம். இருந்தபோதும், அது தொடர்பாக நீதிமன்றத்திற்குச் சென்று நீதி கேட்டோம். அதற்கமைய நீதிமன்றம் பாராளுமன்றக் கலைப்பு சம்பந்தமான அந்த வர்த்தமானி அறிவித்தலை இடைக்காலத் தடைக்குட்படுத்தியது. மீண்டும் நாங்கள் பாராளுமன்ற உறுப்பினர்களாக - மக்கள் பிரதிநிதிகளாக இந்தச் சபைக்கு வந்தவேளை, இந்தப் பாராளுமன்றம் புதுமையான அவையாகக் காணப்பட்டது.

இன்று ஆளும் கட்சியெனச் சொல்லிக்கொள்பவர்கள் உரிய எண்ணிக்கையிலான உறுப்பினர்களைக் கொண்டிருக்க வில்லை. இன்று எதிரணியில் அமர்ந்திருக்கக்கூடிய நாங்கள் அன்று ஆளுங்கட்சி உறுப்பினர்களாக இருந்தோம். இன்றைய நிலையில், 'வாக்கெடுப்பு' என்ற உடனேயே பயந்து நடுங்குகின்ற அரசாங்கமாக இப்போதைய அரசாங்கம் இருக்கின்றது என்பதுதான் புதுமையாக இருக்கிறது. தங்களை அரசாங்கத் தரப்பினர் எனச் சொல்லிக்கொள்ளக்கூடியவர்கள் எப்போதும் தேர்தலுக்குத் தயாராகவே இருப்பதாகச் சொல்லிக்கொள்பவர்கள் 'வாக்கெடுப்பு' என்றவுடன் புறமுதுகு காட்டி ஓடுகிறார்கள். அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் வாக்கெடுப்பு நடாத்தப்பட்ட நான்கு நாட்களிலும் குழப்பம் விளைவிப்பவர்களாகக் காணப்பட்டார்கள். தமிழ்த் திரைப்படங்களிலே பொலிஸ் சீருடை அணிந்து, அதேநேரம் பயந்து ஓடும் நகைச்சுவைப் பொலிஸ்காரர்களைப் பார்த்து 'சிரிப்புப் பொலிஸ்' எனச் சொல்லி நாங்கள் சிரிப்பதுண்டு. அத்தகைய ஒரு சிரிப்பு அரசாங்கம்தான் இன்று எங்கள் முன்னே தெரிகிறது.

கடந்தகால வரலாற்றை எடுத்துப்பார்த்தால், அரசாங்கத் தரப்புத்தான் பாராளுமன்றத்தில் பிரேரணைகளை முன்வைக்கும்; சட்டமூலங்களை முன்வைக்கும். எதிரணியினர் அவற்றை எதிர்த்துப் பேசுவார்கள்; நல்ல விடயங்கள் இருந்தால் வரவேற்பார்கள். அவை நிறைவேற்றப்பட்டு நாட்டிலே நடைமுறைக்கு வரும். எங்களுடைய அனுபவங் களிலும் அதை நாங்கள் கண்டிருக்கிறோம். ஆனால், இன்று அரசாங்கத் தரப்பினரென்று சொல்லிக்கொள்பவர்கள் எந்த ஒரு பிரேரணையினை முன்வைப்பவர்களாகவும் இல்லை; சட்டமூலங்களை முன்வைப்பவர்களாகவுமில்லை. எந்தவொரு காரணத்திற்காக இருந்தாலும் வாக்கெடுப்பு நடாத்து வதற்காகச் சபையிலே கோரிக்கை முன்வைத்தால் அவர்கள் சபையை விட்டு விலகியோடுபவர்களாக இருக்கிறார்கள். அதைப் பார்க்கின்றபோது புதுமையாகவிருக்கின்றது.

இந்த நாட்டிலே பாராளுமன்றம்தான் உயரிய சபை. இந்த உயரிய சபையில் விவாதம் நடைபெறுகின்றது. அது எவ்வாறு? நிறைவேற்றதிகாரம் கொண்ட ஜனாதிபதி அவர்களால் சபையமர்வு ஒத்திவைக்கப்பட்டதன் பின்னர், சம்பிரதாயபூர்வமாக அவர் அக்கிராசன உரையினை ஆற்றியிருக்க வேண்டும். ஆனால், அவ்வாறு அக்கிராசன உரை ஆற்றப்படவில்லை. அடுத்த கட்டமாக, நிலையியற் கட்டளைகளைத் தற்காலிகமாக ஒத்திவைத்துச் சபை அமர்வுகளை நடாத்தலாம் என்கின்ற நிலைக்கு வந்து, நாங்கள் சபையை நடாத்த முன்வந்தோம். கடந்த 14, 15, 16 ஆகிய 3 அமர்வு நாட்களிலுமே வாக்களிப்பிலிருந்து தப்பித்துக் கொள்வதற்காக என்ன விதமான கைங்கரியங்களைச் செய்ய முடியுமோ, என்ன விதமான அடாவடித்தனங்களைச் செய்ய முடியுமோ அத்தனையையும் அவர்கள் செய்தார்கள். இந்த அரசாங்கத்திற்கெதிரான நம்பிக்கையில்லாப் பிரேரணையாக இருக்கட்டும், போலிப் பிரதமர் ஆற்றிய உரையின் மீதான நம்பிக்கையின்மையை வெளிப்படுத்திய சந்தர்ப்பமாக இருக்கட்டும், அதையும் தாண்டி, தெரிவுக்குழுவை அமைப்பதற்காகச் சபாநாயகர் அவர்கள் முன்மொழிந்த 12 உறுப்பினர்கள் தொடர்பான உறுதிப்படுத்தலைச் செய்வதற் காக இந்தச் சபை இன்று கூடியபோது இடம்பெற்ற வாக்கெடுப்பாக இருக்கட்டும், அவற்றில் கலந்து கொள்ளாமல் ஓடிச்சென்று, இந்த அரசாங்கம் போலியான அரசாங்கம் என்பதை அவர்கள் ஒத்துக் கொண்டிருக்கிறார்கள். அதேநேரம், எதிர்த்தரப்பில் இருக்கின்ற 121 பாராளுமன்ற உறுப்பினர்கள் இலத்திரனியல் முறையிலே தங்களது வாக்கினை அளித்து இந்த அரசாங்கத்தைவிடப் பெரும்பான்மை கொண்டவர்கள் தாங்களென்பதை இன்று நிரூபித்திருக்கின்றார்கள். ஆகவே, இன்று போலி அரசாங்கத்தில் போலி அமைச்சரவை! போலி அமைச்சரவையில் போலி அமைச்சர்கள்!

இப்பொழுது நான் கடந்த 26ஆம் திகதிய சம்பவத்தை நினைவுபடுத்துகின்றேன். அன்று இந்தப் பாராளுமன்றத்தில் உரையாற்றிய எனக்கு ஒரு தகவல் கிடைத்தது. அதாவது, தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பளம் கிடைக்காதபோது தனது பாராளுமன்ற உறுப்பினர் பதவியை விட்டு விலகுவதாகக் கூறியவர், அன்று நடந்த அந்தச் சூழ்ச்சியின் பின்னணியில் அமைச்சுப் பதவியைப் பெற்றுக் கொண்டிருக்கிறார். அவரை ஒரு நகைச்சுவை அமைச்சராக நான் பார்க்கிறேன். முன்வரிசையைப் பாருங்கள்! அதில்

[ගරු මයිල්වාගනම් කිලකරාජා මහතා]

නාළෙ මුතලාවතාක වන්තු අවර් අමර්න්තිරුප්පාර්! අවර් යාර්? කටන්ත 3 ආණ්ටු කාලමාක පාරාළුමන්ර අමර්වුක්කු වරුකෙ තන්තවර්කළිල් යාර් කටෙසියාක ඉරුක්කිරාරෝ අවර්තාන් අන්තප් පක්කත්තිලේ මුතලාවතු ආළාක උට්කාර්න්තිරුප්පාර්! තාංකළ් අමෙච්සරවෙ අමෙච්සර් අන්තස්තෙප් පෙට්රාල් තෝට්ටත් තොළිලාළර්කළුක්කු ආයිරම් රූපාය් අටිප්පටෙච් සම්පළත්තෙප් පෙට්රුක්කොටුප්පතාක කූරිනාර්කළ්. අන්රු අවර්කළතු පෝලිප් පිරතමර් උරෙයාට්රුම්පෝතු, "තෝට්ටත් තොළිලාළර්කළතු ආයිරම් රූපාය් සම්පළම් නියායමාන කෝරික්කෙ" එන්රු මාත්තිරන්තාන් සොන්නාර්; අතෙප් පෙට්රුක්කොටුප්පතාකච් සොල්ලවිල්ලෙ. නෝර්වූට්ටිලේ ඔන්රුකූටි, තංකළතු පිරතමර් පතවික්කු වන්තවුටන් ආයිරම් රූපාය් සම්පළත්තෙත් තෝට්ටත් තොළිලාළර්කළුක්කුප් පෙට්රුක්කොටුප්පතර්කු උටන්පට්ටුවිට්ටතාකවුම්, උටනටි යාක අතෙත් තීර්ත්තුවෙක්කප් පෝවතාකවුම් කූරියවර්කළාල් ඉන්රුවරෙ අතනෙච් සෙය්යමුටියාමල් ඉරුක්කිරතු. අතේනේරම් පෙරුන්තෝට්ට මුතලාළිමාර් සම්මේළනත්තින් පේච්චාළරාක ඉරුක්කින්ර රොෂාන් ඉරාජතුරෙ එන්පවර් ඔරු පත්තිරිකෙක්කළිත්ත නේර්කාණලිලේ, ආයිරම් රූපාය් කොටුප්පතු ඉයලාත කාරියම් එන්රුම් අරසියල් නලනුක්කාන වාක්කුරුතිකළුක්කුත් තාම් පොරුප්පේර්ක මුටියාතෙනවුම් සොල්ලියිරුක්කිරාර්. එනවේ, ඉන්ත ආයිරම් රූපාය් අටිප්පටෙච් සම්පළත්තෙප් පෙට්රුක්කොටුප්පතු එන්ත විතත්තිලුම් චාත්තියමිල්ලෙ එන්පතෙ ඉවර්කළ් නිරූපිත්තිරුක්කින්රාර්කළ්. ඉව්වාරු නාට්ටිල් ස්තිරමට්ර අරසියල් චූළ්නිලෙයිරුක්කුම් ඉන්තච් චන්තර්ප්පත්තිල්තාන් නාට්ටිල් පොරුළාතාර රීතියාක එර්පටක්කූටිය පාතිප්පුකළ් චම්පන්තමාන ඉන්රෙය ඔත්තිවෙප්පුවේළෙප් පිරේරණෙ මුන්වෙක්කප් පට්ටිරුක්කින්රතු.

කෞරව තලෛමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉවර්කළ් එන්න චූළ්ච්චි චෙය්කිරාර්කළ්? තෝට්ටත් තොළිලාළර්කළින් අටිප්පටෙච් චම්පළත්තෙ 600 රූපායිනෙ විට අරවේ අතිකරික්ක මුටියාතෙනප් පෙරුන්තෝට්ට මුතලාළිමාර් චම්මේනම් චොල්ලි යිරුක්කින්රතු. ඉවර්කළින් අටුත්ත චූළ්ච්චි එන්නවෙන්රාල්, ඉන්නුම් ඔරු 100 රූපාය් අතිකරිප්පතනූටාක 1,000 රූපාය් මොත්තත් තොකෙයෙප් පෙට්රුක්කොටුත්තෝම් එන්කින්ර පෝලික් කතෙයෙ උරුවාක්කුවතාකුම්. තේයිලෙච් චපෙයිල් ඉතුවරෙ කාලමුම් ඔතුක්කමාක චේර්ත්තු වෛක්කප්පට්ට චේමිප්පුත් තොකෙ යිලිරුන්තු ඔරු තොළිලාළික්කු 100 රූපාය් වීතම් කටනාකක් කොටුත්තු, අතනෙක් කම්පනිකළිනූටාකක් කිටෙක්කච් චෙය්තු, පිරකු අන්තප් පණත්තොකෙයෙ තේයිලෙ, ඉරප්පර් තෝට්ට වේලෙකළිල් ඊටුපටුකින්ර නාට්කළිල් තොළිලාළි කළිටමිරුන්තු මීළවුම් අරවිට්ටු, අතාවතු කිලෝ කණක්කිනූටාක අරවිට්ටු තේයිලෙච් චපෙක්කුප් පෙට්රුක්කොටුක්කින්ර ඔරු කෛංකරියත්තෛත්තාන් චෙය්යවිරුක්කිරාර්කළ්. අවර්කළ් 600 රූපායිලිරුන්තු 700 රූපායෛප් පෙරුවතර්කාකච් චෙය්යවිරුක්කින්ර කෛංකරියන්තාන් ඉතු! ඉතනෙ එන්තවිතත්තිලුම් අනුමතික්ක මුටියාතු. පාරාළුමන්රම් එන්කින්ර ඉන්ත උයිරිය චපෙයින් අනුමතියින්රි, තේයිලෙච් චපෙයිලේ අරචාංකත්තින් නිතියාකච් චේර්ක්කප්පට්ටිරුක්කින්ර මක්කළින් පණත්තෛ වළංකුවතර්කු ඉවර්කළුක්කු එන්ත විතත්තිලුම් අනුමති යිල්ලෙ. ආනාල් ඉන්තප් පෝලි අරචාංකමුම් අතිලිරුක්කින්ර පෝලි අමෙච්චර්කළුම් ඉත්තකෙය ඔරු කෛංකරියත්තිල් ඊටුපටත් තයාරාකින්රාර්කළ්. අතනෙ නාංකළ් වන්මෙයාකක් කණ්ටික්කින්රෝම්.

එංකළුටෙය මක්කළ් උළෛත්තු වාළ්පවර්කළ්; අවර්කළ් මුරෙයාක වේලෙචෙය්පවර්කළ්. එනවේ, අවර්කළුක්කුක් කිටෙක්කවේන්ටිය චම්පළමුම් මුරෙයාක වළංකප්පට වේන්ටුම්. ආයිරම් රූපාය් අටිප්පටෙච් චම්පළත්තෙප් පෙට්රුක්කොටුප්පතුතාන් තංකළතු පොරුප්පු; තංකළතු කටමෙ එන්රුම් අව්වාරු ඉල්ලාවිට්ටාල් තාංකළ් පතවි විලකුවතාකත් තිරුම්පත් තිරුම්පක් කූරියවර්කළුක්කු ඉප්පොළුතු ඉරණ්ටු පතවිකළිලිරුන්තුම් විලකවේන්ටි යිරුක්කිරතු. නීංකළ් වාක්කුරුතියළිත්තතුපෝල පාරාළුමන්ර උරුප්පිනර් පතවියිලිරුන්තුම් පෝලි අමෙච්චුප් පතවියි లිරුන්තුම් විලකුංකළ්! එන්රු නාන් අවර්කළිටම් කේට්ටුක් කොළ්කින්රේන්. උංකළතු පෝලි අමෙච්චුප් පතවි මික විරෙවිල් නීක්කප්පටුමෙන්පතෛක් කූරික්කොණ්ටු, ඉන්තප් පෝලි අරචාංකත්තිර්කෙතිරාක එන්තවොරු චන්තර්ප්පත්තිලුම් එංකළතු පෙරුමතියාන වාක්කුකළෛ ඉන්ත උයිරිය චපෙයිලේ පයන්පටුත්තුවතර්කු නාංකළ් තයාරාක ඉරුක්කිරෝම් එන්රු තොරිවිත්තු, වාය්ප්පුක්කු නන්රි කූරි,විටෛපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ස්තුතියි. මීළහට ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.27]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංක)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් අඳුරු දින කිහිපයකට පස්සේ ටිකක්වත් සන්තෝෂ වෙන්න පුළුවන් අවස්ථාවක් පාර්ලිමේන්තුවේ උදාවෙලා තිබෙන මේ මොහොතේ කථා කරන්න ලැබීම ගැන සන්තෝෂයට පත්වෙනවා. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ නින්දිතම කාල පරිච්ඡේදය හැටියට අපි දැක්කේ පසුගිය දින කිහිපයයි. පාර්ලිමේන්තුව රැස් වුණාම මේ පාර්ලිමේන්තුව තුළ හැසිරිය යුතු ආකාරය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරමින්, අපේ චර්යා ධර්මවලට පටහැනිව, දණ්ඩ නීති සංග්‍රහය උල්ලංඝනය කරමින්, වරප්‍රසාද උල්ලංඝනය කරමින්, රජයේ පොදු දේපොළවලට හානි කරමින් මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම පිස්සන් කොටුවක් කරපු මන්ත්‍රීවරු පිරිසක් මේ පාර්ලිමේන්තුවේ සිටියා. ඒ නිසා මා මුලින්ම මේ පාර්ලිමේන්තුවට යෝජනා කරනවා, මින් ඉදිරියට මේ පාර්ලිමේන්තුවේ නීති රීතිවලට අනුව, එහෙම නැත්නම් ආචාර ධර්මවලට අනුව කටයුතු නොකරන මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීමේ යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට අවශ්‍යයි කියලා. ඒ වාගේම රජයේ දේපොළවලට හානි කරලා, වරප්‍රසාද උල්ලංඝනය කරලා පාර්ලිමේන්තුවේ අනික් මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන නිදහස නැති කරනවා නම්, පාර්ලිමේන්තුව ඇතුළේ නිදහසේ ඡන්දය විමසන්න තිබෙන අයිතිය නැති කරනවා නම්, ඒ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරලා, ඒ පිළිබඳව වරදකරුවන් වන මන්ත්‍රීවරුන් වහාම මන්ත්‍රී ධුරයෙන් නෙරපා හැරිය යුතුයි කියන යෝජනාව මා ඉදිරිපත් කරනවා. ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ නීති රීති සම්මත කර ගත යුතුයි. එහෙම නැති වුණොත් මේ පාර්ලිමේන්තුව අපේ ළමයින්ට පෙන්වන්න බැරි, ලෝකයේම අප්‍රසන්න තැනක් බවට පත්වෙනවා. එය වළක්වා ගන්න අප සියලුදෙනාම එක මිටට එකතුවෙලා, මේ පාර්ලිමේන්තුව නිදහස්, සාධාරණ, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයකට පවත්වාගෙන යන පාර්ලිමේන්තුවක් කර ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ මොහොතේ එක කාරණයක් මතක් කරන්න කැමැතියි. තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමාත්, මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් අසභ්‍ය පොතක් ගැන කථා කළා. ඒ පොතේ නම "ජනාධිපති තාත්තා". ඒ පොත ලියා තිබෙන්නේ චතුරිකා සිරිසේන මැතිනියයි. ඒ මන්ත්‍රීතුමන්ලාට මා විරුද්ධයි. ඒ පොත අසභ්‍ය පොතක් නොවෙයි. ඒක වැරැදියි. එතුමන්ලා සම්පූර්ණයෙන් වැරැදි ප්‍රකාශයක් තමයි කළේ. ඒ පොත කියෙව්වාම මට දැනෙන්නේ එය ඉතාම හැඟුම්බර පොතක් කියලායි. ඒ පොත දයාබර දියණියක් තමන්ගේ දයාබර පියාණන් ගැන ලියන ලද දයාබරිත හැඟීම්වලින් යුක්ත පොතක්. ඒ නිසා තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කියපු කථාව මා ප්‍රතික්ෂේප කරනවා. ඒ පොත එතුමන්ලා කියන විධියට අසභ්‍ය පොතක් නොවෙයි. එවැනි දෙයක් කීම චතුරිකා සිරිසේන මැතිනියට කරන බරපතළ අසාධාරණයක්. [බාධා කිරීමක්] චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා නම්, එයට හේතුව මා විග්‍රහ කරන්න කැමැතියි. ඒ පොත පසුගිය දවස්වල මා කියෙව්වා. ඒ පොත කියවා කාරණා කාරණා කිහිපයක්ම මා ලකුණු කර ගත්තා. එයට හේතුව, චතුරිකා සිරිසේන මහත්මිය පිය සෙනෙහසින් ඒ පොත ලියා තිබෙන්නේ තාත්තා ඇත්ත වශයෙන්ම කරපු දේවල් ගැනයි කියලා මා විශ්වාස කරන නිසායි. තාත්තා ඇත්ත වශයෙන්ම කරපු දේවල්, ඒ දියණිය වින්ද වද වේදනා, මානසික ආතතිය ආදී මේ සියලු දේවල් ඉතා ලස්සනට ඒ පොතේ සඳහන් වෙනවා.

මා ඉන් කිහිපයක් උපුටා දක්වන්න කැමතියි. රාජපක්ෂවරුන්ගේ වෛරී දේශපාලන භාවිතාව හේතුවෙන් තමන්ගේ ජීවිත අනතුරේ යනවා කියලා කල්පනා කරපු සිරිසේන සහෝදරවරු ගැන මේ පොතේ තිබෙනවා. ඒ වාගේම මෙන්න මෙහෙම කථාවක් කියනවා. රාජපක්ෂවරුන්ගේ වෛරී දේශපාලන භාවිතාව නිසා සිරිසේන සහෝදරවරුන්ට වුණු තාඩන, පීඩන දරා ගත නොහැකි වුණු තැන ඒ පවුලේ උදවිය බොහොම කනස්සල්ලට පත් වෙලා මෙන්න මෙහෙම කියනවා. "එහි ප්‍රතිඵලය වූයේ පසු දින, එනම් නොවැම්බර් 22වැනි දා සිටම සිදු වූ කැලඹිල්ල දරාගත නොහැකිව වියරු වැටුණු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු කණ්ඩායම මහා ද්වේෂයකින් හා උපහාසයකින් තාත්තාව විවේචනය කිරීමට පටන් ගැනීමයි. එහි කිසිදු නෛතික හා සදාචාරාත්මක සීමාවක් නොවීය." එම කොටස මෙම පොතේ 316වැනි පිටුවේ සඳහන් වෙනවා. ඉතින් බලන්නකෝ, දියණියක් අවංක චේතනාවෙන් ලියන කෘතියක් මේක. ඒත් එක්කම දියණිය කියනවා, "සැබැවින්ම මම එම මොහොතේ තාත්තා වෙනුවෙන් කළ හැකි සෑම දෙයක්ම උපරිමයෙන් සිදු කිරීමට අදිටන් කර ගත්තෙමි. ඒ කිසිදු දේශපාලන පරමාර්ථයකින් හෝ ජනාධිපති දියණියක වීමේ සිහිනයකින් හෝ වෙනයම් අරමුණකින් නොව, ජනවාරි අටවැනිදායින් පසු තාත්තා මරණයට බිලි වීම හෝ සිරගත වීම වැළැක්වීමේ ඒකායන අරමුණ පමණක් පෙරදැරිකොට ගනිමිනි. මන්ද අඳුරු, හිස් තැන් සහිත සරත් ෆොන්සේකා මහතාගේ ඛේදවාචකය අපි කිසිවෙකුටත් අමතක වී තිබුණේ නැත. සැබැවින්ම එය දින ගණනාවක් පුරා මගේ සිත තුළ බිහිසුණු සිහින මවා පෙන්වූ බව කිව යුතුය." මේ වාගේ කාරණා කොහොමද අසභ්‍ය වෙන්නේ? මම ආසයි ඒක දැන ගන්න. අසභ්‍ය කථාද මේ තිබෙන්නේ? නැහැ. දියණියක් විසින් තාත්තා කෙනෙක් ගැන භයෙන් ලියන කාරුණික සිතිවිලි. ඒ වාගේම මේ දියණිය "ධනය, බලය පියෙකු හා දියණියක අතර ඇති බැඳීමකට වඩා වටින්නේ කෙසේද?" යනුවෙන් විමසනවා. එම වාක්‍ය 318වැනි පිටුවේ ඇතුළත් වෙනවා. අනේ මන්දා! මේ පොත දිහා බලාගෙන අපට කරන්න වෙන්නේ මොකක්ද? හූල්ලනවාද, නැත්නම් දියණිය ගැන "අනේ අපොයි" කියනවාද? දියණියට කවදා හරි දවසක කියන්න වෙන්නේ, අවසානයේ කියන්න තිබෙන්නේ, එකම ගැළවීම වන්නේ, "අනේ මම නොවෙයි, මේ පොත ලිව්වේ. මේ පොත මම ලියපු එකක් නොවෙයි. මගේ නම විතරයි තිබෙන්නේ." කියලායි. එහෙම නොවුණොත් මේ දියණියට සදාචාරාත්මකව තමන්ගේ හෘදය සාක්ෂියෙන් වැළපෙන්න වෙනවා, මේ පොතට අනුව. එම නිසා තමයි මම පසුගිය දිනයක කිව්වේ, "ජනාධිපති තාත්තා නිර්දය ලෙස තමාගේ දියණියව දූෂණය කරලා තිබෙන්නේ." කියලා. දූෂණය කරලා තිබෙන්නේ - මේ වචන හරියට, පැහැදිලිව තේරුම් ගන්න. ශාරීරිකව නොවෙයි මම මේ කියන්නේ. අද වන විට මේ ජනාධිපති තාත්තා කරන ක්‍රියාකලාපයන් එක්ක මේ පොත ඇතුළේ 41 වතාවක් දූෂණය වෙනවා. මේ අසරණ, අහිංසක සිතිවිලි සියල්ල ඉතාම නින්දිත, පහත් විධියට මේ පොත හරහා දූෂණය කරනවා. මේ පොතට අනුව මට ඇත්තටම චතුරිකා සිරිසේන මැතිනිය ගැන කනගාටුයි. ඔබතුමියගේ හෘදය සාක්ෂිය කථා කරනවා නම්, මේ පොත අරගෙන තාත්තා ළඟට යන්න, වැළපෙන්න. තාත්තා ළඟට ගිහින්, "තාත්තේ මේ පොත කියවන්න, මේ පොත කියවලා බලන්න, මේ පොතට අනුව තාත්තා ඔය කරන දේවල් හරිද?" කියන ප්‍රශ්නය තමයි චතුරිකා සිරිසේන මහත්මියට අහන්න වෙන්නේ. සිරිසේන මහත්තයෝ, පැහැදිලිව මතක තියා ගන්න, මේ රට මෙවැනි අඳුරු තැනකට ඇඳලා දැම්මේ ඔබතුමා. ප්‍රජාතන්ත්‍රවාදය වළ දැම්මා. ඔබතුමාව අඩි භයක් යට වළලනවා කියාපු රාජපක්ෂවරු එක්ක ඔබතුමා එකතු වුණා. ඔබතුමාට ආදරය කරපු, ඔබතුමාට ඡන්දය දුන් එක්සත් ජාතික පාක්ෂිකයන්ව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරලා ඔබතුමා වෙනත් තැනකට ගියා. මොකක්ද මේ කළේ? මේ රටේ කිසිම කෙනෙක් බලාපොරොත්තු වුණේ නැති නින්දිත, කැත වැඩක් ඔබතුමා කළේ. ඔබතුමා කරන වැඩ අනුව මේ පොතට කියන්න වචන නැති වෙයි.

මම හිතන්නේ අසභ්‍ය කියන දේට වඩා වැඩි දේවල් මේ පොතෙන් හොයන්න වෙයි. මොකද, මේ පොත ඇතුළේ තිබෙන කාරණා ගත්තොත් අපට හිතා ගන්න බැහැ, මේ පොතේ ඉන්න මෛත්‍රීපාල සිරිසේන මහතා කොහේද ඉන්නේ කියලා. මේ පොතේ සඳහන්ව තිබෙනවා එතුමා පාසල් යන කාලයේත් එතුමා සහෝදර ශිෂ්‍යයන් පාවලා දුන්න හැටි. අපි පාසලේ නිවාසාන්තර තරඟාවලියේදී ඒ ඒ නිවාසවලට අවශ්‍ය නිවාස හඳනවා නේ. මේ පොතේ එක තැනක සඳහන් වෙන විධියට, මේ නිවාස හඳනකොට උණ ගස් සොයා ගන්න අවශ්‍ය වෙලා තිබුණා ලු. මේ උණ ගස් හොරෙන් කපන්න යෝජනා කරපු මේ ජනාධිපති තාත්තා තමන්ගේ යාළුවෝ ටික පාවා දීලා පැත්තකට වෙලා හිටියාලු. පොඩි කාලයේ ඉඳන් මේ ජනාධිපති තාත්තා කරලා තිබෙන්නේ පාවාදීම. ඒ විතරක් නොවෙයි. තවත් තැනක සඳහන්ව තිබෙනවා, මේ ජනාධිපති තාත්තා යසරත්න තෙන්නකෝන් මන්ත්‍රීතුමාගේ හවඩිය හංගාගෙන හිටපු හැටි. පරම්පරා ගණනාවකට අයිති යසරත්න තෙන්නකෝන් මන්ත්‍රීතුමාගේ හවඩිය හංගාගෙන හිටපු හැටි. ඒ නිසා එතුමා මාස තුනක් විතර ජනාධිපති තාත්තාත් එක්ක කථා කරලා නැහැ. මෙවැනි කථා මේ පොතේ තිබෙනවා. මේ පොත ඇතුළේම තිබෙනවා මෙතුමාගේ ක්‍රියාකලාපය; මෙතුමා කවුද කියන එක. අපටයි වැරදුණේ. එක්සත් ජාතික පාක්ෂිකයන් හැටියට අපටයි වැරදුණේ. තමන්ට ආධාර-උපකාර කළ ජනතාව අමතක කරන්න පුළුවන්, රටේ ජනතාව පිළිකුල් කරන ජනාධිපතිවරයකු බවට ඔබ පත් වුණා. ජනාධිපතිතුමනි, මේ මොහොතේ මේ රටේ ජනතාව අවදියෙන් ඉන්නේ. මම මේ කියන්නේ පැහැදිලිවයි. මතක තියා ගන්න!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08 වෙනි දා, අප රටේ බලය දිනාගත් දවස මා මේ මොහොතේ සිහිපත් කරනවා. අපේ පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ සාධාරණ සමාජයක් නිර්මාණය කරන්න කැපවුණා. උන්වහන්සේගේ කැපවීම හරහා තමයි අපි 2015 ජනවාරි 08 වෙනි දා ඔබතුමා ජනාධිපති හැටියට පත් කර ගත්තේ. නමුත් අද බලනකොට අපට වැරදිලා. මේ වැරැද්ද නිවැරදි කරන්නත් පුළුවන් අපටමයි. ඔබතුමාට අවශ්‍ය නම් ලබන අවුරුද්දේ -ජනවාරි 08වන දා ට පසුව - ජනාධිපතිවරණය කැඳවන්න පුළුවන්. එන්න

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ජනාධිපතිවරණයකට. ඔබතුමා මේ රටේ ප්‍රතික්ෂේප වෙලාද, ඔබතුමාට ආදරය කරන ජනතාවක් ඉන්නවාද කියලා එදාට ඔබතුමාට බලාගන්න පුළුවන්. රටේ ජනතාව මැතිවරණයක් ඉල්ලනවා නම්, මේ කාල වකවානුව අනුව සුදුසුම මැතිවරණය තමයි, ජනාධිපතිවරණය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව 2020 මාර්තු වෙනතෙක් ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ බලය තිබෙනවා. ඔබතුමාට අවශ්‍ය නම් මෙන්න අභියෝගය! ජනාධිපතිවරණයක් කැඳවන්න. අපි ලෑස්තියි ඒකට මුහුණ දෙන්න. එහෙම නැතිව කොල්ලකාරී විධියට, ඉතාම පහත් විධියට මේ කටයුතු කරන්න බැහැ. ඔබතුමා 2015 ජනවාරි 8 වෙනි දා ලබා ගත්තා වූ, අපි ලබා දුන්නා වූ ඒ ජනාධිපති තනතුරෙන් පස්සේ ඔබතුමා දැන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ලෙසයි හැසිරෙන්නේ. මේ පොතට අනුව, ඔබතුමා ප්‍රතික්ෂේප කළ, ඔබතුමාට වෛර බැන්ද, ඔබතුමා මරන්න හිටිය රාජපක්ෂලත් එක්ක ඉන්න එක ඔබතුමාගේ ඇඟට හොඳද කියලා තමයි අපට අහන්න වෙන්නේ. පසුගිය කාලයේ ඔබතුමා කියපු කරපු දේවල් එක්ක දැන් කල්පනා කරලා බලනවා නම්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මේ රාජපක්ෂ කල්ලියේ ග්‍රහණයට හසු වුණු ඔබතුමාගේ ජීවිතයට අනතුරක් සිදු විය හැකි භයානක තත්ත්වයක් තිබෙනවා. ඒක මතක තියා ගන්න. එවැනි කල්ලියක ඔබ ඉන්නේ.

ඒ නිසා, ඔබතුමාට අවශ්‍ය නම් ආපසු හැරෙන්න පුළුවන්. හැබැයි, කොන්දේසි රාශියක් සමඟ. නැත්නම් මතක තබා ගන්න, මේ රටේ ජනතාව නිහඬව ඉන්නේ නැහැ කියලා. අපේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ රටේ ලක්ෂ ගණනක් ජනතාව ලෑස්තියි ඇවිල්ලා ඔබතුමා වටලන්න. ලෝකයේ වෙනත් රටවල සිද්ධ වුණා වාගේ කඳවුරු බැඳගෙන, ජනාධිපති මන්දිරය, Paget Road එක මේ හැම තැනම වටලා, අරගළ හරහා ඔබතුමා එළියට ඇද දමන්න ලෑස්තියි. ඒ තැනට අපි යනවා. ඒ නිසා පැහැදිලිව අපි කියන්නේ, ව්‍යවස්ථාව හරියට කියවන්න; මේ රටේ ව්‍යවස්ථාවට ගරු කරන්න; පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය රකින්න කියලායි. ඒ හරහා විතරයි ඔබතුමාගේ දියණිය ප්‍රාර්ථනා කරන ඒ හැඟීම් ටිකට සාධාරණත්වය ඉටු කරන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චතුරිකා මහත්මිය එතුමියගේ පොතේ සඳහන් කර ඇති අවසාන වදනින් මම මගේ කථාව අවසන් කරනවා.

"පෙර දින අඳින්නට ඇඳුමක් පමණක් ගමන් මල්ලක බහා පැමිණි ඒ සරල මිනිසා අද මේ රටේ ජනාධිපතිවරයා ය. ඔහු මතු යම් දිනෙක මේ සියලු බලතල අතැර එලෙසින්ම පිරිසුදු දැතින් ධුරයෙන් නික්මෙන බව ස්ථිරය. ඒ අතීතය ද මතුයම් දිනෙක මෙලෙසින්ම අභිමානයෙන්, අභිමානයෙන්, අභිමානයෙන් ලියන්නට හැකිවන්නේ නම් මා ජීවිතයේ ලබන සුවිසල්ම ජයග්‍රහණය එයයි."

සිංහල බෞද්ධ ජනතාව හැටියට අපි බලාපොරොත්තු වනවා, අවසාන මොහොතේ හෝ ඒ අභිමානය ආරක්ෂා කරයි කියලා. එහෙම වුණොත් විතරයි එතුමාගේ දියණියට ඒ අභිමානය නැවත සටහන් කරන්න ලැබෙන්නේ. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.43]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන ඉන්නකොට මට හිතුණා, එතුමා චතුරිකා සිරිසේනගේ පොතට publicity එකක් දෙන්න කොන්ත්‍රාත් එකක් අරගෙනවත්දෝ කියලා. මොකද, රටේ ජනතාවගේ අවධානයට ලක් නොවෙච්ච පොතක් පිළිබඳව එතුමා දීර්ඝ වෙලාවක් කථා කළ නිසා. මම හිතන විධියට දැන් ලංකාවේ බොහෝ අය හොයන පොත බවට ඒ පොත පත් වෙලා ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා ඇති හඳ මෝදු වනකොට බල්ලෝ උඩු බුරනවා, වඩදිය රැලි නැගෙනවා, සමහර අයට පිස්සු තද වෙනවා කියලා. අද සිකුරාදා. සිකුරාදා රාත්‍රී හතට හඳ මෝරනවා නම්, අපේ දේශපාලන ක්ෂේත්‍රය ටිකක් කැලඹිලි සහගත වෙන්න ඉඩකඩ තිබෙනවා. මොකද, ඔක්තෝබර් 26වැනි දා රාත්‍රී හඳ පායපු වේලාවේ සිට -මේ දිගටම- හැම සිකුරාදාවකම රෑ හතට විතර මේ ජනාධිපතිවරයාගේ නියෝගයෙන් නිකුත් වන ගැසට්වලින් තමයි මේ රට මෙතරම් දේශපාලන ආකූල ව්‍යාකූලත්වයකට ඇද වැටුණේ. අදත් ඔක්තෝබර් 26 වන දා වාගේම සිකුරාදා දවසක්. තව ටික වේලාවකින් රාත්‍රී හත, හතහමාර වෙනවා. අදත් එදා වාගේ හඳ මෝදු වනවා. ඒ නිසා මොන ආකාරයේ දේශපාලන සිදු වීමක්, කැලඹිල්ලක් වෙයිද කියා අපට කියන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔක්තෝබර් 26වැනි දා ඉඳලා අද වනකොට මේ සිදුවීමට දවස් 28ක් ගත වෙලා තිබෙනවා. තවමත් මෙහි කෙළවරක් නැහැ. කෙළවර කළ යුත්තා, මේ සිදුවීම් දාමයේ නිර්මාතෘවරයා, නිර්මාපකයා මේ සිදුවීම් දාමය කෙළවර කරන්නට කටයුතු කරනවාය කියලා තවමත් අපට පෙනෙන්නේ නැහැ. මේක අගමැතිවරයෙක් අයින් කරලා තව අගමැතිවරයෙක් පත් කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. එහෙම නම් ජනතා විමුක්ති පෙරමුණටත් තිබුණා, "අගමැති පොරය ඔය ගොල්ලන්ගේ වැඩක්. ඔයාලගෙන් කවුරු අගමැති වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. ඔය ගොල්ලන්ගේ ඡන්ද ගොඩ ඔය ගොල්ලෝ බලා ගන්න." කියලා ස්වාධීනව, නිශ්ශබ්දව, නිහඬව ඉන්න. හැබැයි, මේක අගමැතිවරයෙක් ඉවත් කරලා අගමැතිවරයෙක් පත් කිරීම පමණක් නොවෙයි. ඒක එතැනින් නතර වුණේ නැහැ. ඊළඟට, තමුන්ට බහුතරය හදා ගැනීම සඳහා කෝටි 50ට, 60ට මන්ත්‍රීවරුන්ට ලන්සු තියන්න පටන් ගත්තා.

මන්ත්‍රීවරුන් විවිධ හේතු මත තීන්දු ගන්න පුළුවන්. සමහර කෙනෙක් ආර්ථික දුෂ්කරතා මත, සමහර කෙනෙක් තමන්ට

ලැබෙන ආසන සංවිධායක ධුරය මත, තව කෙනෙක් ඊළඟ වාරයේ පාර්ලිමේන්තුවට එන්න තිබෙන පහසු මාර්ගය විධියට, එවැනි තමන් කල්පනා කරන විවිධ හේතු මත පක්ෂ මාරු කිරීමට තීන්දු ගන්න පුළුවන්. දේශපාලන සදාචාරය අනුව ඒක වැරැදියි. නමුත් මන්ත්‍රීවරු එහෙම සිතන්නට පුළුවන්. නමුත් එහා පාර්ශ්වය සංවිධානාත්මකව, සමහරවිට අතරමැදි පුද්ගලයන් යොදවා කෝටි පණහට, හැටට, සියයට මන්ත්‍රීවරු මිලදී ගන්නකොට; ඇමතිකම්වලට, රාජ්‍ය ඇමතිකම්වලට, නියෝජ්‍ය ඇමතිකම්වලට මන්ත්‍රීවරු ගන්නකොට, එම ක්‍රියාවලිය පිටුපස අර අගමැති පත් කරපු - ඉවත් කරපු කෙනාත් ඉන්නවාය කියන එක සාක්ෂි සහිතව ඔප්පු වෙලා තිබෙනවා. ඊළඟට, එහෙම කරලාත් බහුතරය හදා ගන්න බැරි වෙනකොට පාර්ලිමේන්තුව කල් තබනවා. සාමාන්‍යයෙන් අපේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා, කථානායකතුමාත් එක්ක සාකච්ඡා කරලා තමයි පාර්ලිමේන්තුව කල් තැබීමක් සිද්ධ කරන්නේ. නමුත් ඒ දෙය සිද්ධ කළේත් නැහැ. එහෙමත් බැරි වෙනකොට පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා. ජනතාවගේ ජනවරමින් මේ පාර්ලිමේන්තුවට පත් වුණු මහජන නියෝජිතයන් 225 දෙනෙකුගේ අයිතිය පාගා දමමින් එක පුද්ගලයෙකු විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න තීන්දු ගන්නවා. කෙසේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ ශ්‍රේෂ්ඨත්වය යම් ආකාරයකට පෙන්නුම් කරපු නිසා නොවැම්බර් මාසයේ 14 වැනිදා පාර්ලිමේන්තුව කැඳවන්න අපට පුළුවන්කම ලැබුණා. පාර්ලිමේන්තුව තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයේ ශිෂ්ටත්වය පෙන්නුම් කර නොවැම්බර් 14 වැනිදාත්, නොවැම්බර් 16 වැනිදාත් විශ්වාස භංග යෝජනා දෙකක් සම්මත කළා. ඒවා සම්මත කළාට පස්සේ කියනවා අපි දැක්කා, "විශ්වාස භංග යෝජනා හරියට සම්මත කළේ නැහැ " කියා. අපි ඒ පාර්ශ්වයෙන් අහන්නේ, සම්මත කරන්නට ඕනෑ කොහොමද, පෙන්වන්නට ඕනෑ කොහොමද කියලායි. අපි මේ පාර්ලිමේන්තුවේ දැන් තීරණාත්මකව වාර හතරක් කුමන්ත්‍රණකාරීන් පරාජයට පත් කර තිබෙනවා. හඬ අනුව පරාජයට පත් කර තිබෙනවා; අත්සන් කර ලේඛන දී පරාජයට පත් කර තිබෙනවා. අද මේ electronic system එක අනුව මන්ත්‍රීවරුන් 121ක් ඒ කුමන්ත්‍රණකාරීන් පරාජයට පත් කර තිබෙනවා. අපි ජනාධිපතිවරයාගෙන් අහන්න කැමතියි, තවත් ඔබට ඕනෑ මොනවාද? මේ කුමන්ත්‍රණය පාර්ලිමේන්තුව තුළ පරාජයට පත් කළ බව ඔබට කියන්න තවත් ඕනෑ මොනවාද? හඬෙන් ඔබට තේරුම් ගන්නට බැරි නම්, අපේ අත්සන්වලින් තේරුම් ගන්නටත් බැරි නම්, මේ electronic vote එකෙන් කියපු දෙය තේරුම් ගන්නටත් බැරි නම්, ඔබ අපෙන් ඉල්ලා සිටින්නේ මොකක්ද? තනි පුද්ගලයෙකුගේ තනි කැමැත්තට, පටු වුවමනාවන්ට, පටු බල ලෝභයට අද රටක් විනාශ කරමින් යනවා.

මීට අවුරුදු හතරකට කලින්, 2014 නොවැම්බර් 21වැනිදා එවකට අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන පොදු අපේක්ෂකයා හැටියට එළියට ඇවිත් නව නගර ශාලාවේ ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා කිව්වා, "මම එන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ පොදු අපේක්ෂකයා හැටියටයි" කියලා. විධායකය අහෝසි කිරීමේ පොදු අපේක්ෂකයා හැටියටයි එන්නේ කියලා කිව්වා. ජනාධිපතිවරණය පවත්වා අවසාන වෙනකොට කිව්වා, "මගේ බලාපොරොත්තුව අවුරුදු පහ ඉවර වෙලා පොළොන්නරුවට ගිහින් කුඹුරක් හාගෙන ජීවත් වෙන එකයි "කියලා. අවුරුදු පහ ඉවර වෙලා පොළොන්නරුවට ගිහින් කුඹුරක් හාන්න හිතපු කෙනා, අවුරුදු තුනහමාරක්, හතරක් යනකොට මුළු රටම හානවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොළොන්නරුවේ කුඹුරක් නොවෙයි, දැන් මුළු රටම හානවා.

මේ ලෝකය ඉස්සරහ අපේ රට ඉතාම අශිෂ්ට රටක් බවට මේ අය පත් කර තිබෙනවා. අපේ රට එහෙම වෙන්න ඕනෑ රටක් නොවෙයි. අපට සර්වජන ඡන්ද බලය ලැබුණේ 1931දියි. අපට සර්වජන ඡන්ද බලය දුන් එංගලන්තය සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක කරන්නට පටන් ගත්තේ 1928 වර්ෂයේ දී, එනම් අවුරුදු තුනකට කලින්. 1931 සිට අපේ රට සර්වජන ඡන්දබලය ක්‍රියාත්මක කරමින් අවුරුදු පහෙන් පහට මැතිවරණවලදී ජනතාවගේ ඡන්දවලින් ආණ්ඩු වෙනස් කරපු රටක්. මේ රටේ හමුදා කුමන්ත්‍රණ 1962, 1966 සාර්ථක වුණේ නැහැ. සන්නද්ධ අරගළ සාර්ථක වුණේ නැහැ. හැමදාම ඡන්දවලින් ආණ්ඩු වෙනස් කළා. ජනතාවට ඒ අයිතිය තිබුණා. එම නිසා දකුණු ආසියානු කලාපයේ පමණක් නොවෙයි, ආසියාවේම ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩු මාරු කළ දීර්ඝතම ඉතිහාසයක් තිබෙන රටක් හැටියට අපට ලෝකයේම පිළිගැනීමක් තිබෙනවා. එහෙව් රටක් තමයි අද මෙහෙම අශිෂ්ට සම්පන්න රටක් හැටියට ලේබල් කරමින් යන්නේ. එම නිසා අපි අහන්නේ, ජනාධිපති සිරිසේන මහත්මයා මේ දෙය කරලා බලාපොරොත්තු වෙන්නේ මොනවාද?

ඔබට ඊළඟ වාරයේ ජනාධිපති පුටුවේ වාඩිවෙන්න බැහැයි කියන එක ඉර හඳ වාගේ විශ්වාසයි. එම නිසා ඒ වාගේ අන්ධ විශ්වාස පිටුපස යන්න ඕනෑ නැහැ.

මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් නඩුව දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගයට ගන්නවා. අපි කියන්නේ මේකයි. මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සඳහා යම් හෙයකින් ජනාධිපතිවරයාට අත්තනෝමතික බලයක් පිරිනැමුවොත්, පාර්ලිමේන්තුවක් වුවමනා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය පාවිච්චි කරන්න උත්සාහ කරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33.(2)(ඇ) ව්‍යවස්ථාව කෙරෙහි. මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වනවා:

> 33.(2)(ඇ) පාර්ලිමේන්තුව කැඳවීමට, වාර අවසන් කිරීමට සහ විසුරුවා හැරීමට බලය ඇත්තේ ය;

'විධායකය' කියන මාතෘකාව යටතේ ව්‍යවස්ථාවේ එසේ සඳහන් කර තිබෙන නිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අනෙක් ව්‍යවස්ථාවලට වඩා සුපිරි බලයක් එම ව්‍යවස්ථාවට හිමියි කියලා ඒ ගොල්ලන් අර්ථ කථනය කරන්න උත්සාහ කරනවා. ඒ නිසා ඔවුන් හිතනවා, ජනාධිපතිවරයාට අවුරුදු හතර හමාරකට පස්සේ නොවෙයි, ඕනෑම වෙලාවක පාර්ලිමේන්තුව විසුරුවන්න බලයක් තිබෙනවා කියලා. මේ රටේ අවාසනාවකට යම් හෙයකින් මේ තීන්දුව ක්‍රියාත්මක කරන්න ජනාධිපතිවරයාට ඒ විධියේ අත්තනෝමතික බලයක් ලැබුණොත්, මේ පාර්ලිමේන්තුවෙන් වැඩක් නැහැ. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා උදේ කිව්වා වාගේ ජනාධිපතිවරයාට පුළුවන්, පාර්ලිමේන්තු ඡන්දයක් තබා පහුවදාට පාර්ලිමේන්තුව විසුරුවන්න. විසුරුවා හැරීම විතරක් නොවෙයි, විසුරුවා හැරීමයි, පාර්ලිමේන්තුවේ වාර අවසාන කිරීමයි කියන බලයන් දෙකම තිබෙන්නේ එක වාක්‍යයක. එහෙම නම්, දැන් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව වාර අවසන් කරන්න පුළුවන් උපරිම මාස දෙකයි. මෙකට අවස්ථාවක් ලැබෙනවා නම්, අවුරුදු පහක් පාර්ලිමේන්තුව වාර අවසාන කරලා තබන්න ජනාධිපතිවරයෙකුට බලයක් ලැබෙනවා. අපි අහන්නේ එහෙම නම්, මේ පාර්ලිමේන්තුව මොනවාටද කියලායි. ජනාධිපති වැනි තනි පුද්ගලයෙකුට මෙහෙම අත්තනෝමතික බලයක් ලැබෙනවා නම්, ජනතාවගේ ඡන්දයෙන් පත් වූ ජනතා නියෝජිතයන් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මොකටද? එම නිසා මේක නිකම්ම නිකම් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ජනාධිපති සිහිනය පිළිබඳ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේක තමයි, රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය. තනි පුද්ගලයෙකු අත්තනෝමතික විධායක බලයක් කේන්ද්‍ර කර ගෙන රටේ සියලු ආයතන කුඩුපට්ටම් කරලා යන්න හදන ප්‍රජාතන්ත්‍ර විරෝධී ගමනක; ඒකාධිපති ව්‍යරුවක ලක්ෂණයි අද අපි භුක්ති විඳිමින් ඉන්නේ. මේ රටේ ජනතාවගේ වාසනාවට එක වරක දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහාත්, ඉන්පසුව දහනව

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහාත් යම් ආයතන පද්ධතියක් ස්ථාපිත කරන්න අපට පුළුවන්කම ලැබුණා. අපි ව්‍යවස්ථා සභාව ස්ථාපිත නොකර තිබුණා නම්, අද ඔය ස්වාධීන කොමිෂන් සභා එන්නේ නැහැ. ස්වාධීන කොමිෂන් සභා හදා නොතිබුණා නම්, මේ ගොල්ලන්ට ආණ්ඩුවක් හදා ගැනීමේ මූලික අරමුණක් වුණු වංචා දූෂණ ක්‍රියාවලිය යටපත් කිරීම, වංචා දූෂණ විමර්ශනය කරපු පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා වැනි අයට සාධාරණයක් ඉෂ්ට කිරීම වැනි දේවල් කරන්න හම්බ වන්නේ නැහැ. ස්වාධීන කොමිෂන් සභාවලින් සහ ව්‍යවස්ථා සභාවෙන් සමහර තනතුරුවලට පුද්ගලයන් පත් කිරීම නිසා තමයි අඩු ගණනේ මේ තරමින් හරි ප්‍රජාතන්ත්‍රවාදය හා ශිෂ්ටත්වය ආරක්ෂා වෙලා තිබෙන්නේ. එම නිසා ඔවුන්ගෙන් අපි ශිෂ්ටත්වය බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, ඒ ගොඩට වැටුණාට පස්සේ ඒ ගොල්ලන්ගේ දේශපාලන අත් දැකීම්; ඒ ගොල්ලන්ගේ උගත්කම්; උපාධි; විශේෂඥභාවයන් කිසිවක් අදාළ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය 14, 15, 16 දිනවලදී පාර්ලිමේන්තුවේ ඒ ගොල්ලන් හැසිරුණේ කොහොමද කියලා අපි දැක්කා. අපි බණිනවා, මේ O/Levelවත් pass නැති සමහර අය පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ යකා නටනවා කියලා. ඒ අය ගැන අනුකම්පා කරන්න ඕනෑ. මොකද, මේ ව්‍යවස්ථා, අණ පනත්, කෙටුම්පත් පිළිබඳව විධිමත් සාකච්ඡාවකට සම්බන්ධ වන්න බැරි අය පසුගිය අවුරුදු තුනහමාරේම බලාගෙන සිටියා. මොකද, ඒවාට සම්බන්ධ වන්න ඔවුන්ට හැකියාවක් නැහැ. තමන් දන්නා field එකෙන් අත පය වීසි කර වැඩකට සම්බන්ධ වන්න අවස්ථාවක් හම්බ වුණාට පස්සේ ඒ අය වැඩට බැස්සා. අපි ඒක සමහර අයගෙන් දැක්කා. තමන් දන්නා සියලු ශිල්ප මෙතැන දමා පෙන්වුවා. හැබැයි, අපි කනගාටු වනවා, සමහර විශේෂඥ වෛද්‍යවරියන්, 1970 වර්ෂයේ පමණ සිට මේ පාර්ලිමේන්තුවේ සිටි වාසුදේව නානායක්කාර වැනි අය කථානායක පුටුව කකුල්වලින් උස්සාගෙන ඇදගෙන යන්න සම්බන්ධ වීම පිළිබඳව. මේ විශේෂඥ වෛද්‍යවරියෝ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන අය, ඔවුන් ඒ ගොඩට වැටුණාට පස්සේ සත්තිගුම්බ ජාතකයේ හොරුන්ගේ ආශ්‍රයට වැටුණු ගිරවාට වුණු වැඩය තමයි ඒ අයටත් වන්නේ. එම නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ දේශපාලන සදාචාරය වෙනුවෙන් අපට කරන්නට බොහෝ කටයුතු තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මහින්ද රාජපක්ෂ මහත්මයා තකහණියේ අගමැති පුටුවේ වාඩි කරවන්න දත කන, වලි කන අය දැන් අමුතු කථාවක් කියාගෙන යනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඔය අගමැති පුටුවේ වාඩි වුණේ නැතිනම් රට බෙදෙනවා ලු; කැලි නවයකට කැඩෙනවා ලු. රට කැඩෙනවා ලු! අප කියන්නේ මේකයි. කවර ව්‍යවස්ථාවක් ගෙනාවත් මේ පාර්ලිමේන්තුවේයි සම්මත කරන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සරල බහුතරයෙන් සම්මත කරන්න බැහැ. ඒ සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයක් ඕනෑ. රට කැඩෙන හෝ රටේ ඒකීයභාවය නැතිවන ව්‍යවස්ථා හෝ එවැනි මොන යම් හෝ දෙයක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරගන්න පුළුවන්ද? අප ඒවාට ඉඩ දෙනවාද? ඔය කියන දේශප්‍රේමීන් ඒ අය විතරද? ඒවා කරන්න බැහැ. දැන් මේ අය කියන්නේ, "මහින්ද රාජපක්ෂ මහත්මයා ආවේ නැත්නම් රට කැඩිලා යනවා" කියායි. ඔන්න! මෙවැනි බොරු අවලාද තමයි අද නහන්නේ. අප කියන්න කැමැතියි, කුමන්ත්‍රණකාරින්ට විරුද්ධව වාර හතරක් අප මේ පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්වා තිබෙන බව. මේ කුමන්ත්‍රණයේ නිර්මාතෘවරයා වන ජනාධිපතිවරයා- [බාධා කිරීමක්] මීට කලින් ජනාධිපතිවරයා විටින් විට පාර්ලිමේන්තුවට ඇවිල්ලා සමහර විෂයයන් ගැන කථා කරන්න සම්බන්ධ වෙලා තිබෙනවා. අප කැමැතියි, ඊළඟ දවසේවත් ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිත්, අර අටවන ආසනයේ වාඩි වෙලා, මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උත්තර දෙනවා නම්. එතුමා මෙතැනට එන්න ඕනෑ; ඇවිත් කථා කරන්න ඕනෑ; පාර්ලිමේන්තුව අමතන්න ඕනෑ. එහෙම නැතිව, අර විජයරාම පාරේ ගෙදරට ගිහින් ඇඳ අස්සේ හැංගිලා ඉඳලා හරි යන්නේ නැහැ. මෙතැනට ඇවිල්ලා මේවාට උත්තර දෙන්න ඕනෑ. මේ රට අවුල් කළා නම් ඒ අවුලට වග කිව යුත්තා මේ පාර්ලිමේන්තුවට සම්මුඛ කරවන්න ඕනෑ. අප දැන් මේ පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම පරාජය කරගෙන යන මේ කුමන්ත්‍රණයට නියත පරාජයක් අත් කර දීම සඳහා දායක වූ සියලුදෙනාට අපගේ ස්තුතිය පුද කරමින්, ජයග්‍රහණය කරා යන්නට සියලුදෙනාට ශක්තිය, ධෛර්යය ලැබෙවායි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

එතුමාගේ කථාවට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කරන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

වීසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චමින්ද විජේසිරි මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටතු, මාණ්පුමිකු හේසා විතානකේ අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු සමින්ද විජේසිරි අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. HESHA WITHANAGE *left the Chair, and* THE HON. CHAMINDA WIJESIRI *took the Chair.*

[අ.භා.4.58]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔක්තෝබර් 26වන දා ඇති වූ විප්ලවය ගැන මේ රටේ කථා වෙනවා. ඒ

විප්ලවය ගැන තමයි අද අප කථා කරන්නේ. ඓතිහාසික ඔක්තෝබර් විප්ලවය ගැනත් කියැවෙනවා. විශේෂයෙන්ම මට මතක් වෙනවා, 2014 කාලයේ මේ රටේ නැහුණු ලොකු අඳෝනාවක් ගැන. ඒ තමයි, මේ රටට නිර්පාක්ෂික ජනාධිපතිවරයකු පත් කරගෙන, මේ රටට අහිතකර විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කරගෙන, මේ රටේ තිබිලා නැතිවූ නිදහස යළිත් ඇති වන තත්ත්වයක් උදා කරගන්න ඕනෑය කියන අඳෝනාව. ඒ අඳෝනාව අවසන් කරන්න තමයි, අප මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015 ජනවාරි 8වන දා ජනාධිපති හැටියට පත් කළේ. එසේ පත් කරලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වුණු දෙයක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි බොහොම දුප්පත් තැන්වලින් මේ පාර්ලිමේන්තුවට ආ අයයි. අපට ලොකු අභිමානයක් තිබුණා, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා" කියන තනතුරෙහි ගෞරවය ආරක්ෂා වී තිබීම නිසා. හැබැයි, ඒ ගෞරවය කෙලෙසුනු පසුගිය සතිය වගේ තවත් කාලයක් මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ නොතිබුණු බව අපි පසුගිය කාලයේ දැක්කා. ඒකට මූලිකවම වග කියන්න ඕනෑ අර කී සියලු අසාධාරණයන් පිටු දකින්න අප පත් කළ ජනාධිපතිවරයායි. මන්ත්‍රීවරුන් මිලියන 100ට, 150ට, 200ට, 500ට විකිණුණා කියා පසුගිය දවස් ටිකේ ඒ ජනාධිපතිවරයාගේ කටින්ම කියනවා අපි දැක්කා. ඒ ජනාධිපතිවරයාම අපේ මන්ත්‍රීවරුන්ට දුරකථන ඇමතිතුම් දුන්නා. ඒ ජනාධිපතිවරයාගේ පාර්ශ්වයෙන්ම offers එනවා. එහෙම නම්, කවුද එසේ මන්ත්‍රීවරුන් මිලට ගත්තේ? කවුද, ඒ සංස්කෘතිය ඇති කළේ? ඊට පසුව, උත්තරීතරයි කියන මේ පාර්ලිමේන්තුවට ආ අපි දැක්කා එදා මේ පාර්ලිමේන්තුවේදී සිද්ධ වූ දේවල්. ගරු කථානායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා බොහොම ප්‍රතාපවත් විධියට, සම්භාවනීය විධියට, කථානායක ධුරයේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කළා.

එතුමා ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාට මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එදා සිදුවුණු දේවල් අපි දැක්කා. මම දේශපාලනයට ඇවිත් අවුරුදු 28ක් වෙනවා. මේ කාලය තුළදී මම විවිධ රාජ්‍ය නිලධාරීන් සමඟ ගනුදෙනු කර තිබෙනවා. මෑත කාලයේ මම දැකපු කාරුණිකම, හොඳම නිලධාරීන් ඉන්නවා නම්, ඒ නිලධාරීන් ඉන්න එකම රාජ්‍ය ආයතනය තමයි පාර්ලිමේන්තුව. ඒ හැම නිලධාරියකු තුළම බොහොම සංග්‍රහශීලී කාරුණිකභාවයක් තිබෙනවා. ඒ වාගේම තමයි, මෙහි වැඩ කරන පොලිස් නිලධාරීන් තුළත් කාරුණිකභාවයක් තිබුණා. හැබැයි, ඒ කාරුණිකභාවය තුට්ටු දෙකට දමලා එදා මේ අය අශීලාචාර විධියට හැසිරුණා. කවුද, මෙහෙම හැසිරුණේ?

සමහර අවස්ථාවලදී කියනවා, පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරු සාමාන්‍ය පෙළ විභාගයවත් සමත් නැහැය කියා. නමුත් සාමාන්‍ය පෙළ සමත් නැති අය හොඳට හිටියා. මේ උගත්ය කියා ගන්නා මිනිසුන් තමයි එහෙම හැසිරුණේ. මම හිතන විධියට මීට කලින් කථා කළ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් මේ බව කිව්වා. එදා මූලාසනයේ වාඩි වුණේ කවුද? පසුගිය කාලයේ පුත්තලම දිස්ත්‍රික්කයේ එතනෝල් ගනුදෙනුවලට සම්බන්ධ වුණු පුද්ගලයෙක් තමයි එදා මූලාසනයේ වාඩි වුණේ; මූලාසනය කෙලෙසුවේ. පසුගිය දවස්වල කුරුණෑගල දිස්ත්‍රික්කයේ එතනෝල් ගනුදෙනුවලට සම්බන්ධ වෙලා ඉඳලා, හොරකම්වලට සම්බන්ධ වෙලා ඉඳලා, වැඩිම bars ප්‍රමාණයක් තිබෙන පුද්ගලයා තමයි ඒ පොලිස් නිලධාරීන්ට, පාර්ලිමේන්තු නිලධාරීන්ට පුටුවෙන් පහර දුන්නේ. කැලණිය ප්‍රදේශයේ අරක්කු ජාවාරම් කරලා, පොලිස් නිලධාරීන් සමඟ වෛර ඇති කරගෙන ඒ වෛරය පිරිමහගන්න සිටි පුද්ගලයෙක් තමයි පොලිස් නිලධාරියාගේ කනට ගැහුවේ; මිරිස් කුඩු ගැහුවේ. අපි ඒවා සියැසින් දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අටවන සාමාජිකයා යයි කියා ගන්නා, මේ රටේ පහළ වුණු අගමැතිවරයකුගේ පුතෙක් ඇවිත් ඔතැන තිබුණු wire ටික, microphone ටික කඩපු ආකාරය මම දැක්කා. ඔබතුමා මේ රටේ හිටපු අගමැතිවරයකුගේ පුතෙක් නේද, ඔබතුමාට ලජ්ජාවක් නැද්ද, කරුණාකරලා ඔබතුමා ඔතැනින් ඉවත්වෙන්නය කියා මම එතැනට ගිහින් එතුමාට කිව්වා. එවැනි අය තමයි මේ දේවල් කළේ. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ හිටපු ප්‍රධාන සංවිධායකතුමෙකුගේ බිරිඳ ඇවිත් කථානායකතුමාගේ පුටුව අරගෙන ගියා. එතුමිය විශේෂඥ වෛද්‍යවරියක්. ඊළඟට, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ප්‍රබල ඇමතිවරයෙක්, මහනුවර දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලලා ඡන්ද 28,000ක් අරගෙන පාර්ලිමේන්තුවට එන්න බැරිව ඉඳලා, හොර පාරෙන් ඇමතිවරයෙක් විධියට ඇවිත්, මෙතැනදී තර්ජනය කළා. අපි දැක්කා, මෙතැන සිදුවුණු ඒ අකාරුණික දේවල්. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ ගෞරවය නැති වුණා. මේ පාර්ලිමේන්තුවේ සිදුවුණු දේවල් නිසා අද අපි, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරු" කියලා කියන්න ලජ්ජයි.

මේ රටේ අවුරුදු 40ක දේශපාලන ඉතිහාසයක් තිබුණු නායකයා ඒ දේවල් වෙනකොට බලාගෙන හිටියා. අනාගතයේ රජ කරන; ඔටුනු පළන්දන කුමාරයා ඒ වෙලාවේ තමන් ළඟ තියාගෙනයි හිටියේ. ඔටුනු පළන්දන කුමාරයාට ඒ ආදර්ශය දුන්නා. අපි බලාගෙන හිටියා. හැබැයි, අපේ නායකතුමා අපේ කණ්ඩායම මේ අසුන්වල වාඩිකරවලා බොහොම යහපත් විධියට අපේ කණ්ඩායම මෙහෙයවුවා. මේ ඇති වුණු සිද්ධිය දිහා බලලා අපි අහනවා, එතුමා මොකක්ද කළේ කියලා. ඔක්තෝබර් 26වන දා ඇති කළ විප්ලවය, පාර්ලිමේන්තුවේ 220කට වැඩි ප්‍රමාණයක්; ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයක් ඡන්දය දීලා සම්මත කළ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම කෙලෙසා දැම්මා. "පිස්සෙක් රජ වුණත් එකයි, රජාට පිස්සු හැදුණත් එකයි" කියා අපි කථාවට කියනවා නේ. ඒ වාගේ, ආපහු පිස්සෙක් රජ වුණොත් මොකක්ද වෙන්නේ? ගරු අධිකරණයට අපි හිස නමා ආචාර කරනවා. අපට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය නැති වුණා. නමුත් අපට ප්‍රශ්නයක් නැහැ, ඒක නැති වුණොත් අපි ගෙදරට වෙලා ඉන්නම්. හැබැයි, පාර්ලිමේන්තු ඉතිහාසයේ මේ රටේ නීතිය නොමඟ යවන්න ගෞරවනීය අධිකරණය ඉදිරියට ඉඩ නොදෙයි කියා අපි හිතනවා. අධිකරණය බොහොම විශිෂ්ට තීන්දුවක් දුන්නා; සාධාරණ තීන්දුවක් දුන්නා. ලබන 7වන දාටත් අධිකරණය මේ රටේ ව්‍යවස්ථාව ආරක්ෂා වෙන විධියේ සාධාරණ තීන්දුවක් දෙයි කියා අප හිතනවා.

මේකේ අරමුණ මොකක්ද කියා අපි දන්නවා. මොකක්ද, අරමුණ වුණේ? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඊළඟ වතාවේත් ජනාධිපති වෙන්න ඕනෑ වුණා. එතුමා දැන ගත්තා, එක්සත් ජාතික පක්ෂයට රිදවනකොට තමයි පොහොට්ටුව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ඒ ගොල්ලන්ට කිට්ටු වෙන්නේ කියලා. ඒ නිසා එතුමා ඊළඟ වතාවේත් ජනාධිපති වෙන්න හිතාගෙන මුල ඉඳන්ම; බලය ගත්ත දවසේ ඉඳන්ම එක්සත් ජාතික පාක්ෂිකයන්ට රිදවන එකයි කළේ. එසේ රිදවනකොට එක්සත් ජාතික පාක්ෂිකයෝ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් ඈත් වුණා.

අපට ගම්වල මිනිසුන් දොස් කිව්වා. ඇයි, අපි ගම්වලට ගිහිල්ලා වැඩ කටයුතු කරනකොට, අපේ සංවර්ධනයට විවිධ බාධා ආවා. අපට පොළොන්නරුවේ ඇති වෙච්ච බාධා පිළිබඳව, අපට පොළොන්නරුවේ ඇති වෙච්ච ගැහැට පිළිබඳව මම ආණ්ඩු පක්ෂ කණ්ඩායමේදී නිතරම ඇවිල්ලා කථා කළා. මම මෛත්‍රීපාල සිරිසේන වෙනුවෙන් තුන් වතාවක් බන්ධනාගාරගත වෙච්ච කෙනෙක්. හැබැයි, මම ඒ සියලු දේවල් අයින් කරලා මම අපේ පක්ෂයේ නායකතුමා ඇතුළු පක්ෂය ගත්ත තීන්දුව මත මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරන්න වැඩ කරපු කෙනෙක්. එහෙම කළේ මම එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක් හැටියට මේ පක්ෂයේ නායකතුමාටත්, පක්ෂයටත්

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

ගෞරව කරලායි. අපි එක්සත් ජාතික පක්ෂයේ ඡන්දවලින් පාර්ලිමේන්තුවට ආපු අය. අපි ඒ පාක්ෂිකයන්ගේ වුවමනා එපාකම් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ නිසා අපට ඒකට ඉඩ දෙයි කියලා හිතුවා. අපට ඒ අවස්ථාව නැති වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වේදනාව අපට තිබුණා. හැබැයි, ඒ වේදනාව යටපත් කරගෙන අපි කටයුතු කළා. අපි හිතුවා මේ ජනාධිපතිතුමා අඩි 6ක් පොළොව යට වළලනවා කියලා කියපු ඒ ඉතිහාස කථාව මතක් වෙයි කියා. නමුත්, නැවත එක දවසක්වත් එතුමාට ඒ අතීතය මතක් වුණේ නැහැ. එතුමා මොකක්ද කළේ? දිනෙන් දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය නලවන්න ගියා. අපි ප්‍රපාතයට වැටුණා. අපි අපහසුවට පත් වුණා. එතුමාට ඕනෑ වුණේ ඊළඟ ජනාධිපති වෙන්න. මහින්ද රාජපක්ෂ මහත්මයා වටා මේ රටේ ජාතික සම්පත් හොරකම් කරපු 10ක්, 15ක් සිටිනවා. ඒ අයට ඕනෑ වුණේ විශේෂ අධිකරණවල විභාගයට ගන්න නඩුවලින් ඇත් වෙලා, ඒ නඩුවලින් බේරිලා ඉන්නයි. ඒකයි මේ කුමන්ත්‍රණය කළේ. අන්න, දැන් එක දිගට අහන නඩු කල් යනවා. අන්න, සමහර පුද්ගලයන් නිදහස් වෙනවා. අපි දැක්කා, අපි ආවට පස්සේ කපිල චන්ද්‍රසේන කියන SriLankan Airlines එකේ වැඩ කරපු විධායක නිලධාරියා ඊයේ-පෙරේදා නැවත සේවයේ පිහිටුවපු ආකාරය. නාලක ගොඩහේවා විනිමය කොමිෂන් සභාවේ වංචා කරලා අයින් කළා. ඊයේ-පෙරේදා ඔහු නැවත සේවයේ පිහිටෙව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවතත් මේ රට වනචාරී යුගයකට ගෙනෙන කාලයක් නොවෙයි ද මේ? යහ පාලනය බලාපොරොත්තු වෙච්ච අපට ජනාධිපතිතුමා උදා කරලා දුන්නේ මේකද? එහෙම නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අයත් එක්ක අපි පාරට බහිනවා. ඒ ගැන මෙතැනදී කිව්වා. අපි ඒකට ස්තුතිවන්ත වෙනවා**.** ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථීර කරලා අපට මේ අදහස් ටික දක්වන්න අවස්ථාව සලසා දුන්නා. එතුමා ඇහුවා, "ඇයි වටලන්නේ නැත්තේ?" කියා. අපි දවසක ගිහිල්ලා පැජට් පාරේ තිබෙන ජනාධිපති කාර්යාලය සහ නිල නිවස වටලනවා. අපි තවම ඒක කළේ නැහැ. අපේ නායකතුමා ඇතුළු අපි සියලු දෙනාම මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ විසඳාගන්න තමයි තවමත් උත්සාහ කරන්නේ. මේ රටේ කෙළෙහි ගුණ දන්න, යුක්තිය, අයුක්තිය දන්න ජනතාව අද අපිත් එක්ක සිටිනවා. මේ සිරිසේන ජනාධිපතිවරයා හින්දා අපට බැණ බැණ අපෙන් ඇත් වෙච්ච පාක්ෂිකයන් නැවතත් අපි ළඟට ඇවිල්ලා, අපින් එක්ක පාරේ මැරෙන්න හරි ඒ අය සූදානමින් සිටිනවා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සටන පාර්ලිමේන්තුවේදී දිනා ගන්න බැරි වුණොත්, එළියේදී දිනා ගන්නවා කියමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමාට. මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.5.08]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දිනයේ "ජනාධිපති තාත්තා" කියන පොත මම කියවමින් සිටින විට ඒ පිළිබඳව සාකච්ඡා වෙච්ච නිසා මට ඒ ගැනත් යමක් කියන්න සිතුණා. මේකට අනවශ්‍ය ප්‍රචාරයක් දෙනවා ද දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මටත් මේ පොතෙන්ම කථාව පටන් ගන්න හිතුණා. මේ පොතේ දෙවැනි පිටුවේ චතුරිකා සිරිසේන මහත්මිය කියනවා, එතුමිය කුඩා දියණියක්ව සිටි කාලයේ වෙහෙසකර තාත්තා නිවසට ආවාම තාත්තාගේ මුවින් නිතරම පිටවන නාඩගම් ගීයක් තමයි, "ගල්ලෙන බිඳලා - ලෙන් දොර ඇරලා, සිංහබා.. සිංහබා" කියන එක. සිංහබාහු නාට්‍යයේ නාඩගම් ගීතයට තාත්තා හරිම ප්‍රියයි කියලා එතුමිය කියනවා. මම එතැනින්ම පටන් ගත්තම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට සිද්ධ වුණෙත් ඒ වාගේ දෙයක්. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අඳුරු ගුහාවේ සිරවෙලා හිටපු මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු කණ්ඩායම ගල්ලෙන බිඳලා, ලෙන් දොර ඇරලා තමයි බඩු එළියට ගත්තේ. එහෙම අරගෙන තමයි මේ රටේ ලක්ෂ හැට දෙකක ජනතාවගේ ඡන්දයෙන් එතුමා මේ රටේ නායකයා බවට පත් කළේ.

ඉන් පසුව, අපි මහින්ද රාජපක්ෂගේ කඳවුර පරාජය කරලා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපතිවරයා බවට පත් කළේ. මනමේ නාටකයේ එන ආකාරයට මනමේ කුමාරයා සහ වැදි රජ්ජුරුවෝ මනමේ කුමාරියට පෙම් බඳිනකොට, මනමේ කුමාරිය වැදි රජ්ජුරුවන්ට තමයි කඩුව දුන්නේ, මනමේ කුමාරයාට කොටන්නට. මනමේ කුමාරයාට දුන්නේ කොපුව. ඒ කථාව හරියටම හරි, මේ පොතේ දෙවෙනි පිටුවේ තමයි මේ කොටස තිබෙන්නේ. මනමේ කුමාරයා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු අපි කණ්ඩායම වැදි රජ්ජුරුවෝ පලවා හැරලා ඒ සටන අතට ගනිද්දී මනමේ කුමාරිය වැදි රජ්ජුරුවන්ට කඩුව දුන්නා වාගේ වැඩක් තමයි ගල් ලෙන බිඳලා, ලෙන් දොර හැරලා එළියට අරගෙන ජනාධිපති කරපු මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අපේ ආණ්ඩුවටත් කළේ, එතුමාට ඡන්දය දීපු ලක්ෂ 62ටත් කළේ. එතුමාට ඡන්ද ගන්න කටයුතු කළ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු අපි සියලුම දෙනාටත් කළේ මනමේ කුමාරිය වැදි රජ්ජුරුවන්ට කඩුව දුන්නා වාගේ වැඩක් තමයි.

ලෝකයේ මොනවා හෝ ආගමක්, ධර්මයක්, සදාචාරයක් තිබෙනවා නම් අනිවාර්යයෙන්ම මේවා සහගහන්නට ඕනෑ, පල දෙන්නට ඕනෑ. මේ පොතේ අවසාන පිටුවේ අවසාන වාක්‍ය හැටියට චතුරිකා සිරිසේන මැතිනිය මේ පොත අවසන් කරන්නේ, 2015 ජනවාරි 09වෙනි දා, පසුදින පාන්දර වන විට, එනම් 2015 වසරේ ජනවාරි 09වෙනි දින පාන්දර තාත්තාගේ දුරකථනයට රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඇමතුමක් ලැබුණි. එතුමා තාත්තාට ප්‍රථමයෙන්ම සුභ පතා තිබුණි. කියා. මේ ජනාධිපතිවරයාට ප්‍රථමයෙන්ම සුභ පැතූ පුද්ගලයා තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ප්‍රථමයෙන්ම සුබ පතලා, ජනාධිපති පුටුවේ ඉන්දවලා, අර වැදි රජ්ජුරුවන්ගෙන් බේරාගෙන ආව පුද්ගලයාව තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කනෙන් ඇදලා විසි කරලා, අද මේ ආකාරයට කටයුතු කරගෙන යන්නේ. මම සුභ පතනවා, ඔහොම හොඳ නම් අපට කමක් නැහැ කියා.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගැන අපි කනගාටුවෙන් වුණත් කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. සාමාන්‍යයෙන් යම් යම් අවස්ථාවල පුද්ගලයෙකුට එක් කෙනෙකුට හොඳක් කරන්න

වුණාම තවත් පුද්ගලයකුට ද්‍රෝහී වීමක් කරන්නට වෙනවා. නමුත් අපේ රටේ සියලු ඡන්දදායකයන්ට ද්‍රෝහී වුණු ජනාධිපතිවරයෙක් තමයි මෛත්‍රීපාල සිරිසේන කියන්නේ. ඉස්සෙල්ලාම තමන් මහ ලේකම්කම දරපු තමන්ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, මහින්ද රාජපක්ෂ කියන තමන්ගේ පක්ෂ නායකයාට පිහියෙන් ඇණලා තමයි එතුමා එක්සත් ජාතික පක්ෂයත් සමඟ අතිනත අරගෙන ජනාධිපතිවරණයට තරග කළේ. පළමුව ඔවුන්ට පිහියෙන් ඇන්නා. ඒ ආකාරයට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ලක්ෂ 58ක ජනතාවට පළමුව පිහියෙන් ඇන්නා. ඉන් පසුව, ජනාධිපතිවරයා බවට පත් වෙන්න ඡන්දය දුන්නු ලක්ෂ 62ක ජනතාවට දෙවනුව පිහියෙන් ඇන්නා. අපරාදේ කියන්න බැහැ, අපේ රටේ හිටපු ඒ මැතිවරණයට ඡන්දය භාවිත කළ සියලුම දෙනාට ද්‍රෝහී වුණා. එහෙම ද්‍රෝහී වුණු ජනාධිපතිවරයෙක් අපේ ඉතිහාසයේ පහළ වෙලාත් නැහැ, එහෙම කෙනෙක් අපි දැකලාත් නැහැ. මහා වංශය, රාජාවලිය කියවාගෙන යද්දීවත් අපට එහෙම පාලකයෙකු හම්බ වෙලාත් නැහැ. මම හිතන විධියට, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ඉතිහාසගත වෙනවා ඒ ආකාරයට පත් වුණු ප්‍රථම රාජ්‍ය නායකයා හැටියට. එම නිසා මම අහන්නේ, මේ කරුණු සාධාරණයිද?

අපි දැක්කා පසුගිය පළාත් පාලන මැතිවරණයේදී ඒකාබද්ධ විපක්ෂය ප්‍රමුඛ පොහොට්ටුව යම් මැතිවරණ ජයග්‍රහණයක් ලබා ගත්ත බව. අපට අයිති වෙන්නට තිබුණු ඒ මැතිවරණ ජයග්‍රහණය වැළැක්වුවෙත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා. නියම කාලයට ඡන්දය පැවැත්වුවා නම්, මහ මැතිවරණය අවසන් වුණු සැනින් පළාත් පාලන මැතිවරණය පැවැත්වුවා නම් අපි සියලුම පළාත් පාලන ආයතන දිනනවා. හැබැයි, මෛත්‍රීපාල උන්හැනේ, -ජනාධිපතිවරයා- ඒ පළාත් පාලන මැතිවරණ කල් දාලා, කල් දාලා, කල් දාලා අපිව පැරැද්දුවා. පොහොට්ටුව ජයග්‍රහණය කළා, පොහොට්ටුව පිපීගෙන ආවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලයට කෑදර ආසන නායකයින් අපිත් එක්ක එකතුවෙලා, ආණ්ඩුවට සම්බන්ධවෙලා ඇමතිකම් අරගනිද්දී ආසනවල සිටි ප්‍රාදේශීය නායකයෝ ඒ පොහොට්ටුවට පණ දුන්නා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් ආයෙත් ඒ ගම්වල හිටපු, ආසනවල හිටපු ඒ නායකයින්ට පැත්තකට වෙන්න වෙලා. මහින්ද රාජපක්ෂට පිටුපාලා අපත් එක්ක දිග කාපු, අපිත් එක්ක ආපු අයට දැන් තමන්ගේ භූමිකාව ආපහු දෙන්න වෙලා.

මම දැක්කා, කුමාර වෙල්ගම මහත්මයා කියලා තිබුණා, " මේ පිපීගෙන ආපු පොහොට්ටුව බලයට කෑදර පුද්ගලයන් විසින් හපාගෙන කෑවා" කියලා. ඇත්තටම බලයට තිබෙන කෑදරකම නිසා ඒ පිපීගෙන ආපු, බොහොම හොඳ ගමනක් ආපු, සාර්ථක ගමනක් ආපු ඒ පොහොට්ටුව විනාශ කළා. මම දැක්කා, තවත් කෙනෙක් ඒක විග්‍රහ කරනවා; "මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මහින්ද රාජපක්ෂ මහත්මයාට කළේ, ඔටුන්න ඔළුවට දමලා එතුමාගේ සරම කඩපු එක" කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඔළුවට ඔටුන්න දමලා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොකක්ද කළේ? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සරම කැඩුවා. දැන් ඔටුන්න ඔළුවේ, සරම නැහැ; හෙලුවෙන්. සරම අඳින්න ගියොත් ඔටුන්න ගන්නවා. ඔටුන්න බේරා ගන්න ඕනෑ හින්දා ඔටුන්නත් එක්ක ඔට්ටු වෙනවා. දැන් මහින්ද රාජපක්ෂ මහත්මයා ඔටුන්න දාගෙන හෙලුවැල්ලෙන් ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සිද්ධ වුණේ මේකයි. සරම බේරා ගන්න ගියොත් ඔටුන්න ගන්නවා. ඔටුන්න බේරා ගන්න ඕනෑ නම්, හෙලුවැල්ලෙන් වුණත් කමක් නැහැ, එහෙමම ඉන්න වෙනවා. ඒක තමයි මේ සිද්ධ වුණේ. නමුත්, ඒ අය මේක විග්‍රහ කරන්නේ කොහොමද? මේ රට බේරා ගන්නලු, මේ වැඩේ කළේ. මේ රට තවදුරටත් මේ ආකාරයෙන් අගාධයට, ප්‍රපාතයට මෙහෙම යන්න බැරි නිසා රට බේරා ගන්න අවශ්‍ය නිසාලු, මෙහෙම කළේ. ඒක දන්නෝ දනිති. අද මේ සභාවේදී හැම කෙනෙකුගෙන්ම ඒ බව කියැවුණා. එහෙම කළේ මේ රට බේරා ගන්නද? ඒකාබද්ධ විපක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගම්වල ඉන්න නායකයන්ට මේ අය කවලා තිබෙන ටොපිය ඕක. මෙතැන තිබෙන්නේ රට බේරා ගැනීමේ ඕනෑකමක් නොවෙයි; තමන්ගේ නඩු ටික බේරා ගැනීමේ ඕනෑකමයි. තාජුඩීන් ඝාතනයෙන් පටන් ගත්තාම, ඒ කරපු සියලු කටයුතුවලින් පටන් ගත්තාම, තමන්ගේ නඩු ටික බේරා ගන්න තමයි "රට බේරා ගන්න" කියන බෝඩ් එක ගහගෙන කටයුතු කරන්නේ. "බුදු සරණයි! දෙවි පිහිටයි!" කියලා ලොරියේ බෝඩ් එක ගැහුවාට, ඇතුළේ තිබෙන්නේ හරක් මස්. "රට බේරා ගන්න" කියලා බෝඩ් එක ගහගෙන, තමන්ගේ නඩු ටික බේරා ගන්න තමයි මේ අය කටයුතු කරන්නේ. ඒ එක්කම මම අහනවා, "පෙන්වපු වැඩ කෝ?" කියලා.

පසුගිය කාලයේ බන්දුල ගුණවර්ධන මහත්මයලා උඩ දාගෙන කෑ ගැහුවා, "රුපියල බාල්දු වෙනවා" කියලා. දැන් මොකද වෙන්නේ? දැන් ඩොලරයේ අගය රුපියල් 180ට නැඟලා. දැන් මේවා පාලනය කරගන්න පුළුවන්ද? දැන් මේවාට දෙන උත්තර මොනවාද? දැන් පොලීසිය භාවිත කරන්නේ කොහොමද? ජන මාධ්‍ය භාවිත කරන්නේ කොහොමද? ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණය කරලා. විශේෂයෙන්ම, සිංගප්පූරු ගිවිසුම ගැන දැන් මොනවාද මේ ගොල්ලෝ කියන්නේ? අද මේ පෙන්වන වැඩ මොනවාද කියන එකත් මේ අවස්ථාවේදී විශේෂයෙන් කියන්න ඕනෑ. මොනවාද රටට පෙනෙන්නේ? මේ මුළු පාර්ලිමේන්තු ඉතිහාසය තුළම සිදු නොවූ ආකාරයට පසුගිය දිනවල උත්තරීතර පාර්ලිමේන්තුව කෙලසුවා. මේ සියල්ල සිදු වුණේ ගණන්කාරකම, චණ්ඩිකම නිසා. ඒ වාගේමයි, කථානායක පුටුවට කරපු නිග්‍රහය. මේ සියල්ල අද රටට පෙනෙන ආකාරයට අශීලාචාර යුගයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් සිහිපත් කරනවා. පොහොට්ටුවට ඡන්දේ දුන් අයගෙන් මට දැන් අහන්න තිබෙන්නේ "මේ වෙනස සැපද?" කියන එකයි. බොහොම ස්තුතියි, ඔබතුමාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.5.18]

ගරු සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு சுஜித் சங்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ පවතින අර්බුදකාරී තත්ත්වය සම්බන්ධයෙන් ගෙන ආ කල් තැබීමේ යෝජනාව ගැන කථා කිරීමට අවස්ථාව සලසා දීම ගැන මුලින්ම ඔබතුමාට මගේ ස්තුතිය පිරිනමනවා. ඒ සම්බන්ධව අද මේ විවාදයට සහභාගි වුණු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා දීර්ඝ වශයෙන් අදහස්-උදහස් දැක්වුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව කථා කරනවා නම් මම හිතන විධියට 2015 ජනවාරි 8 වැනි දා පැවති ජනාධිපතිවරණය සම්බන්ධවත් කථා කරන්න වෙනවා. තමුන්නාන්සේලා, අපි, මේ රටේ හැටදෙලක්ෂයක් වූ ජනතාව වෙනසක් බලාපොරොත්තුවෙන් එදා තිබුණු පාලන තන්ත්‍රයට විරුද්ධව, ඒ වාගේම දූෂණයෙන්, වංචාවෙන් තොරව මේ රටේ

[ගරු සුජිත් සංජය පෙරේරා මහතා]

හැම කෙනාටම නිදහසේ ජීවත් වෙන්න පුළුවන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක්, යහ පාලනයක් ඇති කරන්න ඕනෑ කියලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති කරන්න කටයුතු කළ බව අප දන්නවා. තමුන්නාන්සේලා, අපි එදා ඒ තත්ත්වය ඇති කර මාස කිහිපයක් ගියාට පසු පාර්ලිමේන්තු මැතිවරණයත් ආවා. ඒ පාර්ලිමේන්තු මැතිවරණයෙන් එදා ලබා දුන් ජන වරමෙන් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළුව මේ වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු සියලුදෙනාම පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම එතැනදී ගරු අග්‍රාමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන් එදා මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්නත්, ජාත්‍යන්තර වශයෙන් තිබුණු කීර්ති නාමය ආරක්ෂා කරන්නත් ව්‍යවස්ථානුකූලව කටයුතු කළා වාගේම, මේ රටේ යහ පාලනය ඇති කරන්න අවශ්‍ය කරන කොමිෂන් සභා ටික පිහිටුවන්නත්, ඒ වාගේම අනෙකුත් ආයතන ස්ථාපිත කරන්නත් ලොකු වැඩ කොටසක් කළාය කියා ඔබතුමාත්, ඒ වාගේම හැම කෙනාමත් දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වැඩ කටයුතු කරගෙන යන අතරතුර මේ ආණ්ඩුවට නොයෙකුත් ආකාරයේ අභියෝගවලට මුහුණ දෙන්න සිදු වුණාය කියන එක අපි දන්නවා. ඒ අභියෝග අතරින් පළමුවැනි කාරණය තමයි, ගරු ජනාධිපතිතුමාගේ තීරණයක් අනුව එතුමා සභාපතිත්වය දරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකතු වෙලා මේ කටයුත්ත කරන්නට සිදු වීම. විවිධාකාරයේ හැලහැප්පීම් මධ්‍යයේ තමයි මේ වෙනකල් අපි ඒ කටයුතු කරගෙන ආවේ කියලා තමුන්නාන්සේලාත් අපිත් දන්නවා. මේ වන තෙක් බොහෝ අවස්ථාවලදී ගරු ජනාධිපතිතුමා කටයුතු කළේ, එතුමාගේ පැවැත්ම, එහෙම නැත්නම් එතුමාගේ පක්ෂය ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන එක අංක එක හැටියට තබාගෙනයි. එදා හැටදෙලක්ෂයක් ජනතාව බලාපොරොත්තු වුණු සමාජය, එහෙම නැත්නම් ඒ පාලන ක්‍රමය ඇති කරන්න අපට එතුමාගෙන් උදව්වක්, උපකාරයක් ලැබුණේ නැහැයි කියන එක මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි මේ අර්බුදකාරී තත්ත්වයට යන්න අද අපට සිද්ධ වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම එතුමාට මේ වැඩ කටයුතු ටික කරන්න අපේ පක්ෂයෙන් උදව් උපකාර ලැබුණේ නැහැ, ඒ වාගේම මේ රටේ සංවර්ධනය ඇති කරන්න, මේ රටේ ආර්ථික ප්‍රශ්න විසඳන්න අපේ පක්ෂයෙන් උදව් ලැබුණේ නැහැයි කියන එක තමයි නොයෙකුත් අවස්ථාවලදී එතුමා ප්‍රකාශ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අගමැතිතුමාගේත්, ඒ වාගේම අපේ පක්ෂයේත් අප්‍රතිහත ධෛර්ය මත හා කැප වීම නිසා අපේ යහ පාලන ආණ්ඩුව ස්වාධීන කොමිෂන් සභා ටික පිහිටුවලා, විශේෂයෙන්ම ජාත්‍යන්තර වශයෙන් කීර්ති නාමයක් ඇති කරගෙන, විදේශ ආධාර ලබාගෙන, ඒ වාගේම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ලබාගෙන තිබූ විදේශ ණය ටික ගෙවාගෙන ඉතාමත් හොඳින් මේ රට පාලනය කරගෙන ආවාය කියන එක මම කියන්න ඕනෑ.

අද බොහෝ දෙනෙක් අහනවා, "එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කළේ මොනවාද?" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගම් පළාත් දිහා බැලුවොත් පෙනෙනවා, ගම්වල යටිතල පහසුකම් දියුණු කරන්න, ඒ වාගේම එම ප්‍රදේශවල සංවර්ධනය ඇති කරන්න විශාල මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න පසුගිය කාලයේ කටයුතු කර ඇති බව. ඒ විතරක් නොවෙයි, පසුගිය සමයේ අවසන් භාගය වන විට විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල සංවර්ධනය ඇති කරන්න, ග්‍රාමීය යටිතල පහසුකම් දියුණු කරන්න "ගම් පෙරළිය" වැඩ සටහන යටතේ විශාල මුදලක් ලබා දීලා ඒ කටයුතු කරමින් පැවතුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් අතට, "Enterprise Sri Lanka" වැඩසටහන යටතේ මේ රට තුළ ව්‍යවසායකයෝ රාශියක් බිහි කරන්න, ඒ අය ශක්තිමත් කරන්න ලොකු වැඩ කොටසක් කරමින් සිටින අවස්ථාවේ තමයි ආණ්ඩුව වෙනස් කිරීම සඳහා ජනාධිපතිතුමා විසින් ගරු අගමැතිතුමා වෙනස් කරලා පාර්ලිමේන්තුව විසුරුවන්න තීරණය කළේ. එතැනදී අපට පැහැදිලිවම පෙනී යන කාරණය තමයි, ගරු ජනාධිපතිතුමාගේ න්‍යාය පත්‍රය. ඔහුගේ න්‍යාය පත්‍රය මේ යන ආකාරයට ක්‍රියාත්මක කරන්න බැහැ, අවුරුදු 5කට විතරයි තමා මේ රටේ ජනාධිපති වෙලා කටයුතු කරන්නේ කියලා එතුමා කරපු ප්‍රකාශයත් අද අවලංගු වෙලා තිබෙනවා. පසුව එතුමාට හිතුණා, "මම ජනාධිපති ධුරය දිගට අරගෙන යන්න ඕනෑ" කියලා. ජනාධිපති ධුරයට පත්වෙලා ඒ බලයට හුරු වුණාට පස්සේ තමන්ගේ ඒ බලය ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන ප්‍රශ්නය තමයි එතුමාට තිබුණේ. එහෙම නැතුව එතුමා බලාපොරොත්තු වුණු දේවල් අපෙන් කරගන්න බැරි වුණාය, අපේ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු අපේ පක්ෂය එක්ක යහ පාලන අදහස් ඉටු කරගන්න බැරි වුණාය කියන කථාව අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. රට පැත්තක තියලා, මේ රටේ සංවර්ධන වැඩසටහන් පැත්තක තියලා එතුමාගේ ඉදිරි ගමන් මාර්ගය සකස් කර ගැනීම තමයි එතුමාට මූලික වශයෙන් අවශ්‍ය වෙලා තිබුණේ. 2020 වෙනකොට එන ජනාධිපතිවරණයෙන් පස්සේ එතුමාගේ පැවැත්ම හදා ගන්නේ කොහොමද; නැවත වරක් ජනාධිපති වෙන්නේ කොහොමද කියන එක තමයි එතුමාට තිබුණු ලොකුම ප්‍රශ්නය. ඒ හේතුව නිසා තමයි අද මේ රට මේ වගේ අර්බුදකාරී තත්ත්වයකට පත් කර තිබෙන්නේ කියන එක මම මේ අවස්ථාවේ කියන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා, එතුමා එම න්‍යාය පත්‍රයට යන්න හදනකොට මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එතුමාට සම්බන්ධ වුණා. මොකද, මහින්ද රාජපක්ෂ මහත්මයාටත් ලොකු ප්‍රශ්නයක් තිබුණා. අපි දන්නවා, විශේෂයෙන්ම එතුමා බලයේ ඉන්න කාලයේ කරපු වංචා හා දූෂණ පිළිබඳ නඩුවලින්, මිනී මැරුම් පිළිබඳ නඩුවලින්, ඒ වාගේම එතුමාගේ ගෝල බාලයෝ ටික සිදු කළ දූෂණ හා වංචා පිළිබඳ නඩුවලින් නිදහස් වෙන්න තමයි එතුමාටත් අවශ්‍ය වෙලා තිබුණේ කියන කාරණය. ඒ නිසා තමයි ජනාධිපතිතුමා කඩිනමින්ම එතුමාත් එක්ක එකතු වෙලා කුමන්ත්‍රණකාරී ලෙස මේ ආණ්ඩුව වෙනස් කරන්න කටයුතු කරලා, පාර්ලිමේන්තුව විසුරුවන්න තීරණය කළේ කියන එක මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද? අද මේ රට ජාත්‍යන්තර වශයෙන් පිරිහීමට ලක්වෙලා තිබෙනවා. කොයිම කාලයකවත් මේ වගේ අර්බුදයක් ඇති වෙලා නැහැ. කොයිම කාලයකවත් මේ රටේ මෙවැනි ආර්ථික අර්බුදයක් ඇති වෙලා නැහැ. ඒ වගේ තත්ත්වයක් තමයි දැන් තිබෙන්නේ. ඒ වාගේම අද තිබෙන භයානකම තත්ත්වය තමයි, මේ ගැන කවුරුත් කථා නොකිරීම. දේශපාලන වාසි තකා බොහෝ දෙනෙක් අද තිබෙන ව්‍යවස්ථා අර්බුදය ගැන කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්වතුන්, සමාජ ක්‍රියාකාරින්, ඒ හැම කෙනාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම ගැන මීට වඩා හිතන්න ඕනෑය කියන කාරණය සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරන්න ඕනෑ.

ඒකට හේතුව මොකක්ද? මේ රටේ පැවැත්ම තිබෙන්නේ ව්‍යවස්ථාවත් එක්කයි. මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ ව්‍යවස්ථාවත් එක්කයි. මේ රටේ පරිපාලනය, අධිකරණය මේ හැම එකක්ම තිබෙන්නේ ව්‍යවස්ථාවත් එක්කයි කියන එක අපි කවුරුත් දන්නවා. නමුත් මේ ව්‍යවස්ථාව සම්බන්ධව අබමල් රේණුවක තරමකවත් ප්‍රමාණයක් මේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, මහ ලොකු සමාජ ක්‍රියාකාරින්, සමහර විද්වතුන් ඒ

වාගේම ආචාර්යවරු-මහාචාර්යවරු අද කථා කරන්නේ නැහැ; මේකේ භයානක තත්ත්වය ගැන කියන්නේ නැහැ. ඉදිරි කාලයේදී මේක වැරැදි පූර්වාදර්ශයක් විධියට ගන්න පුළුවන්. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ මන්ත්‍රීවරු හැටියට විතරක් නොවෙයි, මේ රටේ පුරවැසියන් හැටියට අපි කාගේත් යුතුකමක් තිබෙනවා, මේ ව්‍යවස්ථාවට අනුකූලව වැඩ කරන්න; ව්‍යවස්ථාවට ගරු කරලා කටයුතු කරන්න. එතකොට තමයි රටේ පැවැත්මක් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ව්‍යවස්ථාවක් කියන එකක් ගැන මේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමා ඇතුළු කණ්ඩායමත් සලකන්නේ නැහැ. අපට පුංචි සහනයක් තිබෙන්නේ අධිකරණයෙන් විතරයි. ව්‍යවස්ථා විරෝධීව පාර්ලිමේන්තුව විසුරුවන්න කටයුතු කෙරුවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)

ඒ අවස්ථාවේ අධිකරණයට ගිය නිසා තමයි අද යම් කිසි සහනයක් අපට ලැබුණේ. අධිකරණය ව්‍යවස්ථාවට ගරු කරලා සාධාරණ තීන්දුවක් ඉදිරි කාලයේදී ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒක තමයි තිබෙන එකම විසඳුම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙකුත් දේශපාලන පක්ෂත් එක්ක එකතු වෙලා අපි වාර කිහිපයකදීම බලය තහවුරු කරලා එහෙම නැත්නම් අපේ බහුතරය පෙන්වන්න කටයුතු කරලා තිබෙනවා. නමුත් ජනාධිපතිවරයා තවදුරටත් ඒක පිළිගන්න සූදානමක් නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත්, මේ රටේ පුරවැසියෙක් හැටියටත් ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ තත්ත්වය ගැන හොඳට අවබෝධ කරගෙන මේ බහුතරය පිළිඅරගෙන පාර්ලිමේන්තුවේ විශ්වාසය තිබෙන කණ්ඩායමකට පාලන බලය ලබා දෙන්න කියලා. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ අර්බුදය ව්‍යවස්ථානුකූලව, පාර්ලිමේන්තුවේ නීති-රීතිවලට අනුව විසඳන්න අපේ කථානායකතුමා ලොකු අරගළයක් කළා. මේ තත්ත්වය ජනාධිපතිතුමාට පැහැදිලි කරලා දෙන්න මහලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ හැම කෙනාම ලොකු අභියෝගයකට මුහුණ දීලා තමයි එදා කටයුතු කෙරුවේ. ඒ සම්බන්ධව අපේ ස්තුතිය ගරු කථානායකතුමාටත්, ඒ කාර්ය මණ්ඩලයටත් මේ අවස්ථාවේ පිරිනමමින් මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. Order, please! ඊට ප්‍රථම, ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු චමින්ද විජේසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சமிந்த விஜேசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு துஷார இந்துனில் அமரசேன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. CHAMINDA WIJESIRI *left the Chair, and* THE HON. THUSHARA INDUNIL AMARASENA *took the Chair.*

[අ.භා.5.28]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අද දවස සමස්ත ලංකාවටම වැදගත් දවසක් වෙනවා. 2015 ජනාධිපතිවරණයෙන් පස්සේ 2015 මැයි මාසයේ මේ පාර්ලිමේන්තුවේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා සම්මත කර ගත්තා. ලංකාවේ අයට විතරක් නොවෙයි, මුළු ලෝකයටම බලාගන්න පුළුවන් විධියට බොහොම පැහැදිලිවම ලියපු ව්‍යවස්ථාවක් තමයි මගේ අතේ දැන් තියාගෙන ඉන්නේ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට මම ආදරෙයි. ඔබතුමාට තවමත් කාලය තිබෙනවා. මේ රටේ හැට දෙලක්ෂයක් ජනතාව ඔබතුමා කෙරෙහි මහා විශාල විශ්වාසයක් තබලා මේ රටේ ජනාධිපති විධියට එදා ඔබතුමාව පත් කෙරුවා. මුළු ලෝකයේම නමක් දිනා ගන්න පුළුවන් විධියට කටයුතු කරපු නෙල්සන් මැන්ඩෙලා, ලී ක්වාන් යූ, මහතීර් මොහොමඩ් වැනි නායකයන්ගෙන් පස්සේ ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ලෝකයේ නායකයන් අතර ඒ ස්ථානය ගන්න පුළුවන් විධියට යහ පාලන ආණ්ඩුව පටන් ගත් දා ඉඳලා ඔක්තෝබර් මාසයේ 26වැනි දා දක්වා සියලුම වැඩ කටයුතු කළා. ඒක අපට දකින්න තිබුණා.

හැබැයි, ලී ක්වාන් යූ කියන නමටත්, නෙල්සල් මැන්ඩෙලා කියන නමටත්, මහතීර් මොහොමඩ් කියන නමටත් පස්සේ මෛත්‍රීපාල සිරිසේන කියන නම ඔක්තෝබර් මාසයේ 26වැනි දායින් පස්සේ පොඩ්ඩක් එහාට ගිය එක ගැන මුළු ලංකාවම දැන් බලාගෙන ඉන්නවා.

ගරු ජනාධිපතිතුමනි, යම්කිසි විධියකින් ඔබතුමාගේ පාලන කාලයේදී ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණොත් නැවත වතාවක් එය හදා ගන්න පුළුවන්. ලෝකයේ නම් දරා තිබෙන නායකයන් හතර දෙනාගෙන් එක් කෙනෙකු බවට ඔබතුමාට පත් වෙන්න පුළුවන්. එහෙම බැරිකමක් නැහැ. ගරු ජනාධිපතිතුමනි, පසු පෙළේ අලුත් මන්ත්‍රීවරයෙකු වශයෙන් මම ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරනවා. ඔබතුමාව මම විවේචනය කරන්නේ නැහැ. ඔබතුමාට මම කාරණයක් කියන්නම්. ඔබතුමා මගේ අතේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වැඩ කටයුතු කළොත් ලෝකයම පිළිගත් විධියට ඒ අවස්ථාව නැවත වතාවක් ඔබතුමාට ලැබෙනවා. කාටවත් ඒක නවත්වන්න බැහැ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ඒ වැඩේ කරයි කියලා මම විශ්වාස කරනවා.

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රට ගැන කථා කළොත් ලංකාව, ලෝකයේම රටවල් අතුරින් පහළටම වැටුණු රටක් බවට පත්වෙලා ඉවරයි. අද ලෝකයේ හැම ආයතනයක්ම ලංකාව දිහා බලන්නේ ඉතියෝපියාව, සෝමාලියාව, ටැන්සානියාව වාගේ රටවල් -ඊටත් එහාට ගිය රටවල්- දිහා බලනවා වාගේයි. වැරැදි කරන නායකයෝ ඉන්න රටක් විධියට අද ලංකාව මුළු ලෝකයේම කොන්වෙලා ඉවරයි.

අද වන විට ඩොලරයේ මිල රුපියල් 180ට වැඩිවෙලා තිබෙනවා. මේ සියලු දේවල් කරන්නේ ලංකාවේ ඉන්න කෝටි දෙක හමාරක ආදරණීය ජනතාව -ඡන්ද දායකයින්- වෙනුවෙන්ද, එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනා වෙනුවෙන්ද? පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාගේ බලලෝභය වෙනුවෙන් තමයි මේ දේවල් කරන්නේ. ලංකාවේ ඉන්න මගේ ආදරණීය ජනතාවනි, ඔබතුමන්ලා වෙනුවෙන් මා ඇතුළු 225 දෙනා අද වනතුරු අඩියක් ඉස්සරහට තැබුවේත් නැහැ; අඩියක් පසු පසට ගත්තේත් නැහැ. ලංකාවේ ඉන්න ආදරණීය ජනතාවනි, රුපියල් 180 දක්වා ඩොලරය වැඩිවීම ඔබතුමන්ලා විශාල දෙයක් ලෙස දකින්න පුළුවන්. මම මේ අවස්ථාවේදී විශාල කනගාටුවකින් තමයි කථා කරන්නේ. පාර්ලිමේන්තුවේ නීතියේ ආධිපත්‍ය රකින්න ඉන්න පොලිස් නිලධාරි මහත්වරුන්ගේ කනට පහර දීපු ආකාරය අපි එදා බලාගෙන හිටියා. අපිට හදිසියකට උදව් කරන දුප්පත්, අහිංසක පාර්ලිමේන්තු සේවක මහත්වරුන්ට පුටුව උස්සලා ගහපු හැටි අපි ඇස් දෙකින්ම බලාගෙන හිටියා.

මගේ පුතා ඉස්කෝලේ යන පොඩි ළමයෙක්. ඔහු පස්වැනි වසරේ ඉගෙනුම ලබන්නේ. එයා සිකුරාදා උදේ කියපු එකක් මම කියන්නම්. "අනේ! තාත්තේ අද බොක්සිං බලන්න පුළුවන්" කියලා පුතා කිව්වා. "පුතේ, අද නම් බොක්සිං බලන්න වෙන්නේ නැහැ. අද උදේ 10.00ට පාර්ලිමේන්තු රැස්වීම් තිබෙන්නේ. ඔයා ඉස්කෝලේ ඉවර වෙලා එන්න" කියලා මම කිව්වා. " බොක්සිං නියමයි තාත්තේ" කියලා පුතා මට කිව්වා. ඔහොම තත්ත්වයකට අද පාර්ලිමේන්තුව පත් වෙලා තිබෙනවා. රටේ ආදරණීය ජනතාවනි, ඔබතුමන්ලාට ලජ්ජාවක් තිබුණා නම් මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට එවනවාද? මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට එවනවාද, නැද්ද කියලා ඔබ තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑ.

සමෘද්ධි කුපන් එක, තවත් පොඩි ලාභ ගැන හිතලා ලංකාව ගොන් තත්ත්වයට පත් කරන්න පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු එවනවාද කියලා තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කනගාටුවෙන් මේකත් කියන්න වෙනවා. මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු තුනයි, මාස තුනක කාලයේදී පාර්ලිමේන්තුවේ පසු පෙළ මන්ත්‍රීවරයකු වශයෙන් හිටියා. අපේ ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරු තවමත් ඒ විධියමයි. හැබැයි, ඇමති වුණාට පස්සේ ඒ අයත් වෙනස් වෙයිද කියලා කනගාටුයි. පළමුවෙන්ම මගේ අනුරාධපුර දිස්ත්‍රික්කය ගැන මම පොඩ්ඩක් කියන්න ඕනෑ. අපිත් එක්ක ඡන්දය ඉල්ලලා, දෙදෙනෙකුට ඇමති ධුර ලැබුණා. මම දෙවැනි තැනට තමයි ඡන්ද ගත්තේ. පාර්ලිමේන්තුවට හතර දෙනෙක් ආවා. ඒ ඇමතිවරු කියපු දෙයක් ගැනයි මට කනගාටුව. මගේම කියලා හතළිස්පන්දහසක් ඡන්දය දීපු අය, එක්සත් ජාතික පක්ෂයේ අලියා ලාංඡනයට ඡන්දය දීපු අය කොන් කෙරුවා, "ඔබලාට මොනවත් කරන්නේ නැහැ ඉෂාක්වාදින්" කියලා. පසු පෙළ මන්ත්‍රීවරයකු විධියට මම ඉන්නවා. මගේ දිස්ත්‍රික්කයේ ආසන අටක් තිබෙනවා. මට දැන් ඒ ආසනවලට යන්න නැහැ. මම හැම මාසයේම දිස්ත්‍රික්කයේ ආසනවල ගම්මාන එකසිය පනහටම ගියා. එදා අගමැතිතුමා අනුරාධපුරයට ආවා. මම පසු පෙළේ හිටියේ. මම හිටියේ මහජනතාව ඉන්න පේළියේ; තුන්වන පේළියේ. "හිරු" නාළිකාවෙන් ඒවා පෙන්නුවා. ඒ ගැන කනගාටුවක් තිබෙන නිසා ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික් ජනතාවනි, ඔබලා සල්ලිවලට පාවා දීලා, ඔබලාගේ ඡන්දය නිලතලවලට පාවා දීලා අපේ දිස්ත්‍රික්කයේ ඇමතිවරු කරපු හිරිහැර නිසාම අපි යන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
හැබැයි මම කල්පනා කළා, එදා මට ඡන්දය දුන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව මුදල්වලටවත්, තනතුරුවලටවත් පාවා දෙන්නේ නැහැ කියලා. හැබැයි මම කියනවා, බය වෙන්න එපා කියලා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව මුදල්වලටත්, තනතුරුවලටත් කවදාවත් පාවා දෙන්නේ නැහැ. මට කෝටි පනහක් දෙන්නම් කිව්වා. ඒ කියපු එක්කෙනාට මම කිව්වා, ඒ කෝටි පනහ ඔයාට ලොකු වෙන්න පුළුවන්, මට nothing. මට මගේ ආදරණීය ඡන්ද දායකයන් තමයි, මගේ අනුරාධපුර ඡන්ද දායකයන් තමයි ලොකු කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කිහිපයක් දෙන්න. මට කථා කරන්න දේවල් තිබෙනවා. අපේ අනුරාධපුර දිස්ත්‍රික් ජනතාව ඡන්දය දුන්නා; අපි පත් කළා. මම පුළුවන් විධියට ඒ අයට වැඩ කළා. අපට කළ අසාධාරණවලට පාඩමක් උගන්වන්න ඕනෑ කියලා අනෙක් පැත්තෙන් මම කල්පනා කළා. මේ සභා ගර්භයේ ඉන්නවා අපේ ගයන්ත කරුණාතිලක මහත්මයා වාගේ ඇමතිවරු. එතුමා වාගේ තව කිහිප දෙනෙක් පසු පෙළ මන්ත්‍රීවරුන්ගේ දුක හොයලා හොයලා, අපට අඩ ගහලා අපට උදව් කළා. හැබැයි, අපේ සමහර ඇමතිවරු ගැරඬියාට ලාම්පුතෙල් දැම්මා වාගේ අපි දකිනකොට දුවනවා. ඒ ඇමතිවරුන් එච්චර busy. දැන් මොකක්වත් නැහැ. දැන් ඒ ඔක්කෝම අපිත් එක්ක හිනා වෙනවා. කරට අතදාලා "මචං" කියනවා. අනේ, මේ වාගේ හිටියා නම්, දෙයියනේ, අද මෙහෙම අපි අඬන්න ඕනෑද? අපේ පසු පෙළ මන්ත්‍රීවරු අඬන්න ඕනෑද? නැහැ. අපේ ගයන්ත කරුණාතිලක මහත්මයාට වාගේම අපේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට අපට ඕනෑ වෙලාවක කථා කරන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක් වැඩිපුරත් ලබා දුන්නා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ඕනෑ වෙලාවක ගිහිල්ලා එතුමා හම්බ වෙන්න පුළුවන්. හැබැයි, ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාට දැන් කියන්නම්, මෙතැනින් පස්සේ ආණ්ඩු හදලා ඇමති ධුර ගත්තාට පස්සේ අපේ ඇමතිවරුන්ට වෙනම පන්තියක් තියලා වෙනම පාඩමක් කියලා දෙන්න, මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සලකන්න පුළුවන් විධියට. එච්චර කනගාටුයි අපට. මා විතරක් නොවෙයි. මගේ ළඟ ඉන්න මෙතුමා හොඳ දක්ෂයෙක්. ආශු මාරසිංහ මහත්මයා. මෙතුමා professor කෙනෙක්. මෙතුමන්ලා වාගේ අයත් මට කිව්වේ, "මචං, අපට ඔච්චරයි බං." කියලා.

මගේ අනෙක් පැත්තේ ඉන්නවා, පියදාස මන්ත්‍රීතුමා. එතුමා නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ආවේ. මම ඇහුවා, "ඔබතුමාට හෝ සතුටක් දැනුණාද?" කියලා. එතුමා කිව්වා, "මල්ලි, මටත් එච්චරයි" කියලා. මූලාසනයේ සිටින මන්ත්‍රීතුමා විශ්වවිද්‍යාලයේ කෙනෙක්. අනේ, එතුමාත් කිව්වා, "මටත් එච්චරයි" කියලා. පොළොන්නරුවේ අපේ සිඩ්නි මන්ත්‍රීතුමාත් ඒකයි කිව්වේ. ඒ හැම කෙනාගේම කටවල්වලින් මෙහෙම අහන්න වුණේ, අපේ ඇමතිවරුන්ගේ වැඩ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිටපු ඇමතිවරුන්ට මම කියනවා, මෙතැනින් පස්සේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් කියලා අපි - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක උදාහරණක් කියන්නම්. මම එක කථාවක් කියන්න ඕනෑ. එතුමන්ලා හැසිරුණේ කොහොමද දන්නවාද? පාසල් යන කාලයේ කෙල්ලෙක් එක්ක යාළු වෙන්න ගියාම ඒ කෙල්ල කැමැති නැත්නම් පැයක්-දෙකක් ඉන්න ඕනෑ වචනයක් අහන්නවත්, ඇය දකින්නවත්. ඒ වාගේ තමයි අපේ ඇමතිවරුන් දකින්න අපි පැයක්-දෙකක් ඉන්න ඕනෑ. ඒ වාගේ යුගයක් තිබුණා, අපේ යහ පාලන ආණ්ඩුවේ. අපට උදවු නොකරන්න පුළුවන්. ඒකට කමක් නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාව අපිත් එක්ක ඉන්නවා. ඒ නිසා මේ ඇමතිවරු උදවු නොකෙරුවයි කියලා අපි ගෙදර යවන්න බැහැ. හෙට අනිද්දා මහ මැතිවරණයක් ආවොත් ඊට පස්සේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් මම මෙතැනට ඇවිල්ලා කථා කරන්නම්. දිස්ත්‍රික්කයෙන් වැඩි ඡන්ද ලබාගෙන ඇවිල්ලා නැවත වතාවක් බයක් නැතුව පාර්ලිමේන්තුවේ කථා කරන්න භයියක් මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව මට දෙයි. ඇයි ඒ? මම ඒ ජනතාව මුදල්වලටවත්, තනතුරුවලටවත් පාවා දීලා ගියේ නැහැ. හෙටත් ඒක තමයි මම කියන්නේ. අපට සල්ලි වැඩක් නැහැ; තනතුරු වැඩක් නැහැ. අපට වටින්නේ ආදරණීය ජනතාව තමයි. ඒ නිසා කවදාවත් ඒ ජනතාව පාවා දෙන්නේ නැහැ කියලා මෙතැනදී කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு துஷார இந்துனில் அமரசேன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON.THUSHARA INDUNIL AMARASENA *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

[අ.භා.5.43]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ජනතා විමුක්ති පෙරමුණේ නායක, ඒ වාගේම පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මැතිතුමා ඉදිරිපත් කළ ඉතාම වටිනා කල්තැබීමේ විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සභාවේ කටයුතු පටන් ගන්නා අවස්ථාවේම "ආණ්ඩුව" යැයි කියා ගන්නා "සිහින ආණ්ඩුවේ" මන්ත්‍රීවරුන්, මැති-ඇමතිවරුන් මේ සභා ගර්භයෙන් පිට වුණා. ඒ අය අද මේ පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා විවිධ මාධ්‍යවලට ප්‍රකාශ නිකුත් කරනවා, "පාර්ලිමේන්තුවේ කටයුතු සාධාරණව ඉටු නොවුණු නිසා, මේ සභා ගැබෙන් එළියට ගියා"ය කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ ඡන්දයකට මුහුණ දීලා බහුතරය පෙන්වන්න තිබෙන නොහැකියාව නිසායි එහෙම ගියේ. සත්‍ය කාරණය එයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයට පක්ෂව අද සභාවේ සිටියේ හැටගණනක්, හැත්තෑගණනක් වාගේ මන්ත්‍රීවරුන් පිරිසක්. අද එතුමන්ලා බහුතරය පෙන්වන්න ඉදිරිපත් වුණා නම්, අද ආණ්ඩුවේ යැයි කියමින් සිහින ආණ්ඩුවේ සිටින සැබෑ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කීයද කියන කාරණය එළියට යනවා, ලෝකයටම දැන ගන්න. ඒක වළක්වන උපක්‍රමයක් හැටියට මේ අය කළේ අද සභාවෙන් බැහැර වෙච්ච එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා පැහැදිලිව සඳහන් කළා වාගේ, අද වනවිට මේ රට දවසින්-දවස අස්ථාවරත්වයකට ගමන් කරමින් තිබෙනවා. මේ කල්තැබීමේ යෝජනාවේ සඳහන් විධියට රටේ ආර්ථිකයට මේ සිදුවීම බලවත් සේ දැනෙමින් පවතිනවා. අද මේ රටේ නිලධාරින්ට තේරුම් බේරුම් කරගන්න බැහැ, කාගේ නියෝගද ක්‍රියාත්මක කරන්නේ, මේ රටේ ආණ්ඩුවක් තිබෙනවාද නැද්ද කියන එක. ඒ වාගේම, ජාත්‍යන්තරය අද විමසිල්ලෙන් ඉන්නවා. මේ රටට ආධාර-උපකාර කරපු ලෝකයේ තිබෙන බොහෝ සංවිධාන අද ඒවා නතර කරන තැනට, ඒවා අත්හිටුවන තැනට පත් වෙලා තිබෙනවා. එක පුද්ගලයෙකුගේ, දෙදෙනෙකුගේ බල කෑදරකම නිසා, බලය සඳහා ඒ අයට තිබෙන නොසංසිඳුණු ආශාව සහ වුවමනාව නිසා අද මුළු රටම බිල්ලට දෙමින් යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද අපට විවිධ විධියේ විවේචන එල්ල කරන්න, පහර ගැසීම් කරන්න පුළුවන්. අවලාද අපවාද නහන්න පුළුවන්. අද සමහර අය කථානායකතුමාගේ පඹයෝ හදලා තුන් මං හන්දිවලට ගිහිල්ලා, නගරවලට ගිහිල්ලා පුච්චනවා. අපි ඒ අයට කියනවා, මේ වාගේ නොපනත්කම්වල යෙදෙන්න එපා කියලා. මේ පාර්ලිමේන්තුවේ කථානායකවරයා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරපු නිසා, ව්‍යවස්ථාවට අනුව කටයුතු කරපු නිසා, ස්ථාවර නියෝගවලට අනුව කටයුතු කරපු නිසා අද මේ පාර්ලිමේන්තුවෙන් පිටතදී එතුමා බලවත් සේ පහර කෑමට ලක් වෙනවා. අපි ඒ අයට කියනවා, කථානායකවරයාට විරෝධයක් පළ කරන්න වුවමනාවක් තිබෙනවා නම්, ඒකටත් මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න පුළුවන්; මේ ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න පුළුවන්; ඒ වාගේම විනය අනුව සංයමයෙන් ඒ සඳහා කටයුතු කරන්න පුළුවන් කියලා. ඒ නිසා නීත්‍යානුකූලව කටයුතු කරලා, පුළුවන් නම් මේ සභාවේ තිබෙන බහුතරය පෙන්වන්න කියලා අපි එතුමන්ලාගෙන් ඉල්ලනවා.

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

අපේ ජනාධිපතිවරයාගෙන් අපි ඉල්ලීමක් කරනවා. අපි තමයි එතුමාව බලයට පත් කළේ; අපි තමයි එතුමා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළේ. එතුමා ජනාධිපතිවරයා හැටියට පත් කරන්න දිවි හිමියෙන් කැපවෙලා කටයුතු කරපු පිරිස අපියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුප්‍රකට සිදුවීමක් තමයි ජනාධිපතිවරණය වෙලාවේ ගාල්ලේ, වඳුරඹ හදපු වේදිකාව එතුමා යන්න පැය කිහිපයකට කලින් උදේ පාන්දර ගිනි තියාපු එක. ඒ වේදිකාව හැදුවේ අපියි. ඒ වේදිකාව අපි පැය කිහිපයකදී නැවත හදලා ජනාධිපතිතුමාට ගොඩ වෙලා කථා කරන්න පුළුවන් තැනක් බවට පත් කළා. වඳුරඹ පොලීසියේ ස්ථානාධිපතිවරයා තැපැල් ඡන්දයට කලින් දවසේ ඉල්ලා අස් වුණා, එතුමාට ආපු බලපෑම් නිසා. නමුත්, අවාසනාවක තරම, වේදිකාව ගිනි තියපු මිනිහා අරගෙන නියෝජ්‍ය ඇමතිකමක් දුන්නා. පොඩි පහේ නියෝජ්‍ය ඇමතිකමක් නොවෙයි දුන්නේ, වරාය හා නාවික කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිකම. ඒ වේදිකාව ගිනි තියපු එක පිළිබඳ නඩුවේ විත්තිකාරයෝ නවදෙනාගෙන් හයදෙනෙක් අද වරායේ ඉතා හොඳ රැකියාවල නිරත වෙනවා. තවම නඩුවට යනවා. වේදිකාව හදපු මිනිස්සු දිහා එක දශමයකින් ආපසු හැරී බලන්න එතුමාට කෘතවේදිත්වයක් තිබුණේ නැහැ. අඩුම තරමේ ඒ මිනිසුන්ට "ස්තුතියි" කියලා කියන්න කෘතවේදිත්වයක් තිබුණේ නැහැ. මා ඒ අවස්ථාවේ දී තමයි දැන ගත්තේ අපි පත් කරපු ජනාධිපතිවරයාගේ කෘතවේදිත්වයේ තරම; ගුණ ධර්මවල තරම. නමුත්, අපේ අගමැතිවරයාගෙන් අපට විවිධ විධියේ තරවටු කිරීම් ලැබුණා, අවවාද උපදෙස් ලැබුණා, ජනාධිපතිතුමාට මොනවත් දෝෂාරෝපණයක් කරන්න එපාය කියලා. අපි දැන ගත්තා, අවුරුද්දක, දෙකක විතර කාල සීමාවේ ආණ්ඩුව ඇතුළේම ආණ්ඩුවට ඉස්සරහට යන්න නොදී කකුලෙන් ඇදීම් සිද්ධ වෙනවාය කියලා; ආණ්ඩුවේ ගමන ආපස්සට අදිනවාය කියලා. අප ගන්නා සමහර තීන්දු, තීරණ ක්‍රියාත්මක කරන්න අවස්ථාව දෙන්නේ නැහැයි කියන එක අපට හොඳට දැනුණා. දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු අයට පත්වීම් දෙන්න යනකොට හතර පස් වතාවක් විවිධ හේතු දමලා ඒක නතර වුණා. සමහර, මේ රටට අවශ්‍යම කරන පත්වීම්, උපාධිධාරී පත්වීම් ආදිය දෙන්න යනකොට විවිධ හේතු ඉදිරිපත් කරලා ඒවා නතර වුණා. ඉතින් මෙවැනි කටයුතුවලින් ආණ්ඩුවේ ගමන ආපස්සට අදිමින් අද විවිධ බොරු හේතු, තර්ක ඉදිරිපත් කළත්, ජනාධිපතිවරයා තමන්ට ඡන්දය දුන් මිනිසුන්ට පශ්චාත් භාගය පෙන්වන හැටි; තමන්ව බලයට පත් කරපු අයට පශ්චාත් භාගය පෙන්වන හැටි අපි දැක්කා. ඒ නිසා මේ රටේ හැටදෙලක්ෂයක් ජනතාවගේ ඡන වරමෙන් පත් වුණු අතිගරු ජනාධිපතිතුමාට නැවත "අතිගරු" කියන වචනය පාවිච්චි කර ගන්න ඕනෑ නම්, අඩුම තරමේ "ගරු ජනාධිපතිතුමා" කියලා ආමන්ත්‍රණය කරන්න යමක් ඉතුරු කර ගන්න අවශ්‍ය නම්, අර වසල සූත්‍රයෙහි සඳහන් වන විධියට, කළ යුතු දේ ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වන්නය කියලා මා කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වසල සූත්‍රයෙහි මෙසේ දැක්වෙනවා:

"න ජච්චා වසලෝ හොති
න ජච්චා හොති බ්‍රාහ්මණෝ
කම්මනා වසලෝ හොති
කම්මනා හොති බ්‍රාහ්මණෝ"

තමන් බ්‍රාහ්මණයකුද, වසලයකුද කියන එක තමන්ගේ ක්‍රියාවෙන් ඔප්පු කරන්න. අද තමන්ට ඡන්දය දුන් පිරිස, තමන් බලයට පත් කරන්න ක්‍රියා කරපු පිරිස විතරක් නොවෙයි, මුළුමහත් රටේම ජනතාව එතුමා මේ රටට කරපු අපරාධය ගැන, අද මේ රට පත් කර තිබෙන අස්ථාවරත්වය පිළිබඳව එතුමාට බරපතළ චෝදනාවක් එල්ල කරමින් තිබෙනවා. ඒ වාගේම සිහින අගමැතිවරයාට, එහෙම නැත්නම් අගමැති යයි කියා ගන්නා මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාට මේ රටේ ජනතාව තුළ යම්කිසි ගරුත්වයක් තිබුණා නම්, ඒ ගරුත්වය දවසින්-දවස අද පිරිහෙමින් යනවා; නැති වෙමින් යනවා. ඒ නිසා අද දවසේ මුළු ලෝකයටම පෙනෙන්න පාර්ලිමේන්තුවේ බහුතරය එතුමාට නැහැයි කියන එක පැහැදිලිවම ඔප්පු වුණු වෙලාවේ, තේරීම් කාරක සභාව පත් කරන යෝජනා එක්ක, ඡන්දය එක්ක ඒ කාරණය පැහැදිලිව පෙනුණු වෙලාවේ තමන් නිවැරැදිව හිතලා, මේ රට ගැන හිතලා, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරලා අවශ්‍ය තීන්දු, තීරණ ගන්න කියලා අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒ, මොකද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප.ව. 6.00ට සභාවේ කටයුතු අවසන් කරන්න ඕනෑ නිසා.

[අ.භා. 5.51]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එක පැත්තකින් විශේෂයෙන්ම සතුටු වෙනවා, එදා 2015 ජනවාරි 08වන දා ජනතාව අපට යහ පාලනයක් නිර්මාණය කරන්නය කියලා ඡන්දය දුන්නු එක ගැන. අපි ඒ ප්‍රතිඥාව දුන්නා වාගේම ඒක අපේ සටන් පාඨය බවටත් පත් වුණා. නමුත්, රටක යහ පාලනයක් ඇති වෙන්න නම් අධිකරණය, විධායකය, ව්‍යවස්ථාදායකය එක වාගේම ශක්තිමත් වෙන්න ඕනෑ. එකකට එකක් නොපරදින විධියට ශක්තිමත් කුලුනු වශයෙන් අධිකරණය, විධායකය, ව්‍යවස්ථාදායකය රටක පැවතුණොත්, රට ප්‍රජාතන්ත්‍රවාදී වෙනවා කියන එක අපි දන්නවා. අන්න ඒ සඳහා අපි කටයුතු කළා.

ඒකේ ප්‍රතිඵල අද අපට භුක්ති විඳින්න ලැබී තිබෙනවා. එදා ජනාධිපතිවරයකු කියන්නේ මොකක්ද, ඒක පාර්ලිමේන්තුවත් කරනවා; අධිකරණයත් කරනවා. ජනාධිපතිතුමාගේ බළල් අතක් විධියට තමයි එදා අධිකරණය පත් වුණේ. ජනාධිපතිවරයාගේ බළල් අතක් විධියට තමයි ව්‍යවස්ථාදායකය පත් වුණේ. ජනාධිපතිවරයාගේ බලය නොතකා යුක්තිය, සාධාරණය ඉෂ්ට කිරීමට, ජනාධිපතිතුමාගේ බලපුළුවන්කාරකම් තඹ දොයිතුවකට මායිම් කරන්නේ නැතුව සාධාරණ විධියට නීතිය ඉෂ්ට කිරීමට අධිකරණය ගන්නා උත්සාහය ගැන මා විශේෂයෙන්ම අධිකරණයට ස්තුතිවන්ත වෙනවා. මේ අවුරුදු තුනහමාරක කාලය තුළ අපි ගත් ප්‍රයත්නය තුළින් අපට විශ්වාස කරන්න පුළුවන්, මේ රටේ ජනතාවට විශ්වාස කරන්න පුළුවන් අධිකරණයක් මේ රටේ පැවතීම ගැන අපි සතුටු වෙනවා.

ඒ විතරක් නොවෙයි. මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ව්‍යවස්ථාදායකයට. අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්. විධායකය අනුව නැටවෙන පාර්ලිමේන්තුවක් නොවෙයි අපට තිබෙන්නේ.

ආදි ආනන්දියකු වශයෙන් ගරු කරු ජයසූරිය මැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට නායකත්වය දීම ගැන, එතුමාගේ චරිත්වය ගැන ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වශයෙන් මා සතුටු වෙනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි ගරු කරු ජයසූරිය මැතිතුමාට, කොන්ද කෙළින් තබා ගෙන, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවාය කියලා, ව්‍යවස්ථාදායකය ශක්තිමත්ය කියලා රටට, ලෝකයට පෙන්වන්න පුළුවන් ශක්තිය, ධෛර්යය තිබීම ගැන ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. පාර්ලිමේන්තුවට එනවාය කියලා අපට රෙද්දක් ඇඳගෙන එන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව කෙළින් වැඩ කරන තැනක්. කාටවත් නැවෙන තැනක් නොවෙයි. සෘජුව තීන්දු, තීරණ ගැනීම ගැන ගරු කරු ජයසූරිය කථානායකතුමාට වාගේම මූලාසනය හොබවන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ප්‍රජාතන්ත්‍රවාදී මහකට රට ගෙන යන්න, ව්‍යවස්ථාදායකත්වයෙන් දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබාදීම ගැන මා විශේෂයෙන්ම සතුටු වෙනවා; ඒ ගැන ආඩම්බර වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රට අරාජිකවෙලා නැහැ. නමුත් අරාජික කරලා තිබෙනවා. අද පාර්ලිමේන්තුවට ඇවිත් කෙළින් හිටගන්න බැරි අගමැති කෙනකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධීව පත් කර තිබෙනවා. පාර්ලිමේන්තුවේ අභියෝගවලට මුහුණ දෙන්න බැරි අගමැතිවරයකු පත් කරලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ ඡන්දයක් විමසනවාය කිව්වාම එක්කෝ කථානායක පුටුව පෙරළනවා; කථානායකතුමාට මිරිස් කුඩු ගහනවා; පොත් පත් එවනවා; පොලිසිය එක්ක ගහගන්න යනවා. ඡන්දයක් කිව්වාම ඡන්දයකට මුහුණ දෙන්න බැරි අගමැති කෙනකු එක්ක සිටින කණ්ඩායමක් බොරු අගමැති ධුරයක් නිර්මාණය කර තිබෙනවා. ඒ සියලු අභියෝගවලට නොසැලී කටයුතු කළ ගරු කථානායකතුමාගේ ක්‍රියාකාරිත්වය ගැන මා ඉතාමත් ආඩම්බර වෙනවා. අපට අද ප්‍රජාතන්ත්‍රවාදය කියා ඉතුරු කරන්න ව්‍යවස්ථාදායකත්වයත්, අධිකරණයත් සමත් වීම ගැන මා ආඩම්බර වෙනවා.

අද ඡන්ද විමසීමේදී මේ පාර්ලිමේන්තුව තිබුණේ කොහොමද කියලා අපි දැක්කා. මේ පාර්ලිමේන්තුව අරාජික කරන්නේ ඇයි? පාර්ලිමේන්තු සම්ප්‍රදාය, පාර්ලිමේන්තු ක්‍රමවේදය, ව්‍යවස්ථාදායකයේ තිබෙන නීති රීති අනුව කටයුතු කළා නම් පාර්ලිමේන්තුව තුළ මෙවැනි තත්ත්වයක් උද්ගත වෙන්නේ නැහැ. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්නේ එක රැයකින් නොවෙයි. ගරු මන්ත්‍රීවරුන් සාකච්ඡා කරලා, සාකච්ඡා කරලා, මාස ගණන්, අවුරුදු ගණන් සාකච්ඡා කරලා තමයි රට කරගෙන යන ඒ ලියවිල්ල අපි නිර්මාණය කළේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපි ප්‍රතිඥා දෙනවා, අපි නිර්මාණය කරපු ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වැඩ කටයුතු කරනවාය කියලා; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟව අපි වැඩ කටයුතු කරනවාය කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අතිගරු ජනාධිපතිතුමා එදා 62,00,000ක ජන වරමක් අරගෙන මේ රටේ ජනාධිපතිවරයා බවට පත්වෙලා අග්‍ර විනිශ්චයකාරතුමා ඉදිරියේ දිවුරුම් දුන්නා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වැඩ කටයුතු කරනවාය කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මා විශේෂයෙන් කියනවා, මේ අපභ්‍රංශ තීන්දුව නිසා අද රට අරාජිකවෙලා තිබෙනවාය කියලා. ඒ නිසා රට ගැන හිතන්න. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාව හැදුවේ අපියි. ඔබතුමා නිර්මාණය කළේ අපියි. ඒ නිසා අපට කැක්කුමක් තිබෙනවා. ඔබතුමා වෙනුවෙන් කටයුතු කරන්න, ඔබතුමා වෙනුවෙන් කථා කරන්න අපට කැක්කුමක් තිබෙනවා; අයිතියක් තිබෙනවා. අර බලලෝභී, බල පෙරේතයා වැසිකිළි දොරෙන් හෝ ඇවිල්ලා බලය ගන්න ඔබතුමාවත් රවටාගෙන කරන මේ ජවනිකාව නවත්වන්න ඔබතුමාගේ බලය යොදවන්න කියලා අපි විශේෂයෙන් කියනවා.

ඒකට තවම ප්‍රමාද නැහැයි කියලා මා කියනවා. පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති නාමික අගමැතිවරයකුට පාර්ලිමේන්තුවක් පවත්වාගෙන යන්න බැහැ. කෙසේ වෙතත් නීති විරෝධීව, සදාචාර විරෝධීව කටයුතු කරන්න බැහැ. ඒ නිසා දැන්වත් ඒ තීන්දුව ගන්න කියා ආයාචනය කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.57]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මට කථා කරන්න විනාඩි පහක හෝ කාලයක් ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. මම ලොකු විග්‍රහයක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, අද අපේ රට මුහුණ පා තිබෙන අභියෝගාත්මක තත්ත්වය ගැන, ඔක්තෝබර් කුමන්ත්‍රණය ගැන අද උදේ සිට අපේ ගරු මන්ත්‍රීවරු කථා කළා. නමුත් මම එක දෙයක් කියන්න කැමැතියි. ඒ මෙන්න මේකයි. ගරු ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ගත් තීරණයට හේතූන් සඳහන් කරමින් ජාතිය ඇමතුවා. එහිදී එතුමා ඒ සඳහා එක් හේතුවක් හැටියට සඳහන් කළා, මන්ත්‍රීවරුන් මුදලට විකිණෙනවාය කියන කාරණය. "කෝටි පණහට මන්ත්‍රීවරු බිලි බා ගන්න උත්සාහ කරනවා" කියා එතුමා කිව්වා. අර, "රංගෙ ද?" කියන දුරකථන ඇමතුම පිළිබඳ විස්තරය මගේ Facebook account එක හරහා ලක්ෂ 10කට වැඩි පිරිසක් බලලා තිබෙනවා. ඒ මොකද?

ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා එතුමාගේ දිස්ත්‍රික්කය වන අනුරාධපුරයේ ජනතාව ගැන කථා කළා. අපි අපේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව ගැන කථා කරනවා. නමුත්, සමහර මන්ත්‍රීවරු මුදල්වලට එක එක පක්ෂවලට යනවාය කියන එක අලුතින් කිව යුතු දෙයක් නොවෙයි. ලෝකයේ බොහෝ රටවල මේ තත්ත්වය තිබෙනවා. වහාම ව්‍යවස්ථා සංශෝධනයක්

[ගරු ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ගෙනැත්, මන්ත්‍රීවරු තමන්ගේ පක්ෂයෙන් වෙනත් පක්ෂවලට යන එක නවත්වන්න ඕනෑය කියා මම කියනවා. 2015 අප්‍රේල් මාසයේ 28වන දා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරනකොට -මේ කාරණය රාත්‍රී දහයයි ගණනකට තමයි සාකච්ඡා වෙලා තිබෙන්නේ.- ආණ්ඩුවෙන් 99. (13) සංශෝධනය ගෙනාවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99. (13) (අ) අනුව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වෙනවා, මන්ත්‍රීවරුන් පිළිබඳ විනය පරීක්ෂණයක්, විනය තීන්දුවක් ගත්තොත්, ඒ පිළිබඳව තීන්දු ගැනීමේ බලය තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයට බව. තීන්දු ගැනීමේදී ඉහළම අධිකරණයට ඒ බලය ලබා දී තිබෙනවා. පසුගිය කාලයේ සමහර පක්ෂ පාලනය කළේ දේශපාලන පක්ෂ නායකයෝ නොවෙයි. සමහර වෙලාවට දිසා අධිකරණයෙන්, එහෙම නැත්නම් මහාධිකරණයෙන් ඒ අය නියෝග ලබාගන්නා ආකාරය අපි දැක්කා. ලංකාවේ සියලු දේශපාලන පක්ෂ අධිකරණ නියෝගවලින් පාලනය කළා. අපට විතරක් නොවෙයි, මේක හැම පක්ෂයකටම බලපාන ප්‍රශ්නයක්. උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුගේ විනය පිළිබඳ කාරණයකදී තීන්දු දීමේ බලය තිබෙන්නේ රටේ ඉහළම අධිකරණයට නම්, ලංකාවේ පහළම අධිකරණයට ඒක ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නේ ඇයි? ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මෙය සලකා බලා, එය වෙනස් කිරීමට කිසිම අවශ්‍යතාවක් නැහැ කියා ශ්‍රේෂ්ඨාධිකරණය මේ වගන්තිය අනුමත කර තිබෙනවා. මෙතැනින් කියන්න හදන්නේ මොකක්ද? දැන් තිබෙන නීතිය තමයි, කවුරු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට විරුද්ධව විනය තීරණයක් ගත්තොත්, මාසයක් ඇතුළත ඔහු එය ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළොත්, ඒ මන්ත්‍රී තනතුර අහෝසි වෙන්නේ නැහැ කියන එක. එම නඩුව මාස දෙකක් ඇතුළත විභාග කර, අවසාන වශයෙන් තීන්දුවක් ලබා දිය යුතුයි කියා තමයි එහි සඳහන් වන්නේ. මෙතැන තිබෙන ඉතාම වැදගත් කාරණය මේකයි. සල්ලිවලට මන්ත්‍රීවරු ඩැහැ ගන්න පුළුවන් කියා ජනාධිපතිවරයාම කියනවා නම්, අද බහුතරය ගන්න ප්‍රශ්නයක් තිබෙන්නේ ඇයි? බහුතරය ගන්න මේ කට්ටියට බැරි වෙන්නේ අපේ මන්ත්‍රීවරු විකිණෙන්නේ නැති නිසායි. නමුත්, සල්ලි දීලා මන්ත්‍රීවරු ගන්න තිබෙන ඒ හැකියාව නැති කරන්න ගත්ත උත්සාහය නැති කළේ කවුද? ඒ හැන්සාඩ් වාර්තාව කියවා බැලුවොත් ඉතා පැහැදිලිව පෙනෙනවා, මෙයට විරුද්ධව කථා කළේ ජී.එල්. පීරිස් මැතිතුමාත්, අදටත් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරන දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් බව.

මේ ප්‍රශ්නය හැමදාම කථා කරන්න සිදුවන ප්‍රශ්නයක් බව අපට තේරෙනවා. මොකද, මේ ප්‍රශ්නය අදින් අවසන් වෙන්නේ නැහැ නේ. මේ පාර්ලිමේන්තුවේ නැවතත් මේ වාගේ ප්‍රශ්නයක් ආවොත්, රංගෙලාද, වෙන කට්ටියද -මොන පැත්තෙන් වුණත්- සමහර වෙලාවට සල්ලි දීලා ගන්න උත්සාහ කරන්න ඉඩ තිබෙනවා. එම නිසා මම මේ අවස්ථාවේ කියන්න බලාපොරොත්තු වුණු එකම දෙය තමයි, ලැබෙන පළමුවැනි අවස්ථාවේදීම මන්ත්‍රීවරු පක්ෂ මාරු කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙනැත්, ඒ දෙය නැති කරන්න ඕනෑය කියන එක. ඉන්දියාව වැනි රටවලත් මේ තත්ත්වය තිබෙනවා. ස්ථාවර ආණ්ඩුවක් හදන්න නම්, සල්ලි දීලා මන්ත්‍රීවරු ගන්න වැඩ පිළිවෙළ නැවැත්වීමට සංශෝධනයක් ගෙන ආ යුතුයි කියන කාරණය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

පාර්ලිමේන්තුව 2018 නොවැම්බර් මස 27වන අඟහරුවාදා අ.භා. 1.00 දක්වා කල් තබනවා.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ.භා. 6.00ට, 2018 නොවැම්බර් මස 27 වන අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් කල් ගියේය.


அதன்படி பாராளுமன்றம், பி.ப. 6.00 மணிக்கு, 2018 நவம்பர் 27, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.00 p.m., until 1.00 p.m. on Tuesday, 27th November, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

264 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 264 - இல. 6
Volume 264 - No. 6

2018 නොවැම්බර් 27 වන අඟහරුවාදා
2018 நவம்பர் 27, செவ்வாய்க்கிழமை
Tuesday, 27th November, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

කල් තැබීමේ යෝජනාව:

සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම

பிரதான உள்ளடக்கம்

ஒத்திவைப்புப் பிரேரணை :

சுற்றுலாத்துறையினை இயல்பு நிலைக்குக் கொண்டுவருதல்

PRINCIPAL CONTENTS

ADJOURNMENT MOTION:
Restoration of Tourism Industry

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් 27 වන අඟහරුවාදා
2018 நவம்பர் 27, செவ்வாய்க்கிழமை
Tuesday, 27th November, 2018

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]
මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய]
தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order please! පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 19.(1) යටතේ හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමා ඉල්ලීමක් කර තිබෙන බැවින්, එම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා සභාවේ අනුමැතිය. සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 19.(1) යටතේ, හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා කල් තැබීමේ විවාදයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව කියවන්න ගරු මන්ත්‍රීතුමනි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, යෝජනාව මෙයයි:

ශ්‍රී ලංකාව ලෝකයේ සංචාරක කර්මාන්තය තුළ ඉහළම ස්ථානයක තිබියදී රටේ සිදු වූ මෙම අවාසනාවන්ත තත්ත්වය හේතුවෙන් මෙරට සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටීමේ අනතුරකට පත්ව ඇති බැවින්ද, ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය පාලනය සහ නීතියේ ආධිපත්‍ය සම්පූර්ණයෙන් කඩා වැටී ඇති බැවින්ද, ශ්‍රී ලංකාව තුළ නීතියේ ආධිපත්‍ය තහවුරු කර සංචාරක කර්මාන්තය වහාම යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව මෙම සභාවට යෝජනා කර සිටී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාලය පස්වරු 6.30 දක්වා යෝජිතයි. ඒ වෙලාවට එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව කල් තැබීම-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ යෝජිත ආණ්ඩුව බලයට පත් වෙලා අදට මාසයක් වෙනවා. මේ මාසය තුළ එකම පනත් කෙටුම්පතක්වත්, එකම නීතියක්වත්, එකම රෙගුලාසියක්වත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉතින්, ආණ්ඩුවක් නැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, යෝජිත ආණ්ඩුව. යෝජිත ආණ්ඩුව.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආණ්ඩුව යැයි කියා ගන්නා අය. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව යැයි කියා ගන්නා අය බලයට පත් වෙලා මාසයක් ගත වෙලාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා යෝජනාවක්, නීතියක්, ඒ වාගේම පනත් කෙටුම්පතක් යන කිසිම දෙයක් ඉදිරිපත් කර නැහැ. ගරු කථානායකතුමනි, ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ආණ්ඩුව -ආණ්ඩුව යැයි කියා ගන්නා අය- පාර්ලිමේන්තුව වර්ජනය කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. සභාව කල් තැබීමේ යෝජනාව - [බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පසුගිය දිනවල මේ ගරු සභාවේ විශාල අලාභ හානි කිරීම සම්බන්ධව ඔබතුමා කටයුතු කරනවා කිව්වා. අපට ඒ ගැන දැන ගන්න පුළුවන්ද? මොකද, අපට තවමත් පෙනෙනවා ඒ කරපු අලාභ හානි ඒ විධියටම තිබෙන බව. ඒවා ප්‍රතිසංස්කරණය කර නැහැ. එසේ අලාභ හානි කරපු අය තවදුරටත් මේ ගරු සභාවට එනවා. ඒ සම්බන්ධව ඔබතුමා කටයුතු කළ ආකාරය සහ එහි ප්‍රගතිය හා තත්ත්වය මොකක්ද කියා අපට දැන ගන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පරීක්ෂා කරමින් යනවා. ඒ වාගේම පොලිසියත් පරීක්ෂා කරගෙන යනවා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
ගරු කථානායකතුමනි, අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියපු කාරණයට මා යමක් එකතු කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, දැන් මේ වනකොට ලංකාවේ ආණ්ඩුවක් නැහැ. අපි මේ ආණ්ඩුව මේ වනකොට මේ ගරු සභාව තුළ තුන් වතාවක් පරාජයට ලක් කරලා ඉවරයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒක පිළිඅරගෙන ඉවරයි. අද ආණ්ඩුවක් නැති නිසා ඒ අය පාර්ලිමේන්තුවට එන්න බැරිව පනත් කෙටුම්පත් සම්මත කර ගන්න බැරිව අද හැංගිලා ඉන්නවා, ගරු කථානායකතුමනි. ඒක රටේ ජනතාව දැන ගන්නට අවශ්‍යයි.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මට විනාඩියක් පමණයි ඕනෑ, ගරු කථානායකතුමනි.

සුළු ජාතීන්ගේ ඡන්ද 54,000කට ආසන්න සංඛ්‍යාවක් අරගෙන පාර්ලිමේන්තුවට ආ මන්ත්‍රීවරයෙකු හැටියට මට පාර්ලිමේන්තුව ඇතුළේත් ආරක්ෂාව නැහැ, මිරිස් කුඩු ගහනවා. ආසනයට ගිහිල්ලා මගේ පක්ෂ බල මණ්ඩලය තියනකොට ඒකට පිට කට්ටිය ඇවිල්ලා ජාතිවාදය අවුස්සා මට පෙට්‍රල් බෝම්බ ගහන්න පවා ලෑස්ති වෙලා සිටියා. ඒ, ගිය ඉරිදා. ඒ සම්බන්ධයෙන් පස්සර පොලිසියටත්, බදුල්ල DIGටත් මම පැමිණිලි කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මගේ වරප්‍රසාද කඩ කර, සුළු ජාතීන් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු වන මා මරන්න හැදුවා. ඒ සම්බන්ධයෙන් complain කරපු එකට අද වනතුරු බදුල්ල හෝ පස්සර පොලීසියෙන් තීන්දුවක් ගන්නේ නැතිව අද උදේ ඒ OIC මහත්තයාව -ඒ OIC මහත්තයා දැනගෙනමයි ඒක වුණේ.- ASP හැටියට promote කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඉන්නේ ඔබතුමා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මගේ වරප්‍රසාද සම්පූර්ණයෙන්ම නැති කරලා තිබෙනවා. මම සුළු ජාතීන් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මට ආරක්ෂාව නැහැ, මට ගෙදර ඉන්න ආරක්ෂාවක් නැහැ, පාර්ලිමේන්තු ආවාම පාර්ලිමේන්තුවේදීත් මට මිරිස් කුඩු ගහනවා, ඒවා ප්‍රශ්න. මගේ ආසනයට ගියාම මගේ ආසනයේ, මගේ පක්ෂයේ බල මණ්ඩලය තියනකොට පිට කට්ටිය ඒකට ඇවිල්ලා ජාතිවාදය කථා කරලා, ඒ වාගේම ඇසිඩ් ගෙනැල්ලා ඇසිඩ් ගහන්න ලෑස්ති කරලා තිබෙනවා. මේක පස්සර පොලීසිය හොඳට දැනගෙන තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම පොලීසියට කථා කළා. මම IGPට කථා

කළා. IGP phone එක answer කළේ නැහැ. තව පාරක් DIGට කථා කළා, DIGත් phone එක answer කළේ නැහැ. ASP කෙනෙකුට, SSP කෙනෙකුට කථා කරලා මම පොලීසියේ entry එකක් දැම්මා. ඒ ඉරිදා දවස. අද වනකොට දවස් තුනක් ගත වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ වනකොටත් කිසි කෙනෙක් අත් අඩංගුවට ගෙන නැහැ. මොකුත් නැහැ. ඒ වෙනුවට ඒ පොලිස් ස්ථානාධිපතිතුමා ASP හැටියට promote කරලා තිබෙනවා. එතකොට අපට ආරක්ෂාව ලැබෙන්නේ කොහොමද? අපි මේ රටේ ජීවත් වන්නේ කොහොමද? ජාතිවාදය ආපහු පටන් ගන්නවාද? ජාතිවාදය පටන් ගෙන මේ කටයුතු යන නිසා අපි ලොකු ප්‍රශ්නයකයි ඉන්නේ. මගේ වතුකරයේ ජනතාව, මගේ ඥාත්තීය සමිති අහනවා, පාරට බහින්නද කියලා. දැනුත් telephone කරලා අහනවා, ඔක්කොම පාරට බහින්නද කියලා. මමත් එතැනට ගිහිල්ලා ඒකට හවුල් වුණා නම්, මොකද වන්නේ? ගරු කථානායකතුමනි, ජාතිවාදය නැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට මටත්, මගේ ජනතාවටත් තිබෙන ආරක්ෂාව මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම අදම පොලිස්පතිතුමා දැනුවත් කරන්නම්, ගරු වඩිවේල් සුරේෂ් මැතිතුමනි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මංගල සමරවීර මැතිතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, අපේ නියම සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා කියපු දේට මමත් වචනයක් එකතු කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අද දවස වෙන කොට සිරිසේන-රාජපක්ෂ කුමන්ත්‍රණය නිසා ඇති වූ නීති විරෝධී ආණ්ඩුවට හරියටම මාසයක් සම්පූර්ණ වෙලායි තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මාසයක් සම්පූර්ණ වුණත් මේ වන විට ලෝකයේ කිසිම රටක් මේ නීත්‍යානුකූල නොවන, හොර ආණ්ඩුව පිළිගෙන නැහැ. නමුත් ඊට වඩා බරපතළ තත්ත්වයක් ලංකාවේ අපට ඉදිරියේදී විඳින්න සිද්ධ වෙනවා, මේ නීත්‍යානුකූල නොවන ආණ්ඩුවට මේ ආකාරයටම තවදුරටත්, දෙසැම්බර් මාසය තුළත් ඉදිරියට යන්න දුන්නොත්. මොකද, ඔබතුමා දන්නවා, හැම අවුරුද්දේම අය වැයෙන් පසුව Consolidated Fund එකේ සල්ලි නිකුත් කරන්න මුදල් ඇමතිවරයා වරෙන්තුවක් නිකුත් කරන්න ඕනෑ බව. මම මුදල් ඇමතිවරයා හැටියට, පසුගිය අය වැයෙන් පසුව, 2018 දෙසැම්බර් මාසයේ 31වන දා දක්වා ඒ වරෙන්තුව නිකුත් කර තිබෙනවා. නමුත් ජනවාරි මාසයේ 01වන දා ඉඳලා මේ රටේ එවැනි වරෙන්තුවක් නිකුත් කරන්න අය වැයක් ගෙනැල්ලා නැහැ; අතුරු සම්මත අය වැයක් ගෙනැල්ලාත් නැහැ. ඒ වාගේම එවැනි වරෙන්තුවක් නිකුත් කරන්න පුළුවන් නීත්‍යානුකූල මුදල් ඇමතිවරයකුත් නැහැ. මෙන්න මේ තත්ත්වය යටතේ මේ සෙනසුරාදා හෙවත් දෙසැම්බර් මාසයේ 01වන දා, ඊළඟ දින 30දි-දින 30කුත් නැහැ, නත්තල් නිවාඩු කාලය එනවා, දෙසැම්බර් 23, 24 වන විට.

ඒ සති දෙක, තුන ඇතුළත නීත්‍යානුකූල රජයක් පත් කරලා, නීත්‍යානුකූල අගමැතිවරයෙක් පත් කරලා, නීත්‍යානුකූල මුදල් ඇමතිවරයෙක්, කැබිනට් මණ්ඩලයක් පත් නොකළොත් ජනවාරි මාසයේ 01 වෙනිදා ඉඳලා මේ රටේ රජයේ සේවකයන්ට පඩි ගෙවන්න බැහැ; විශ්‍රාමිකයන්ට පඩි ගෙවන්න බැහැ; සමෘද්ධිලාභීන්ට දීමනා ගෙවන්න බැහැ; මේ රටේ යන්ත්‍රණය සම්පූර්ණයෙන්ම එතැනම ලොප් වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, ඔබතුමා මැදිහත් වෙලා විශේෂයෙන්ම ජනාධිපතිවරයාට කියන්න, මේ රට පාවා නොදී වහාම නීත්‍යානුකූල රජයක් පත් කරන්න කටයුතු කරන්න කියලා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජෝන් අමරතුංග මැතිතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මම කථා කරන්නේ විශේෂයෙන්ම ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා කරපු පැමිණිල්ල පිළිබඳව. මේ අවජාතක ආණ්ඩුව මන්ත්‍රී නොවන සමහර අයටත් පොලිස් ආරක්ෂාව දීලා තිබෙනවා. මේක මහ භයානක පැමිණිල්ලක්. ඔබතුමාට පුළුවන්, "ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමාට වහාම ආරක්ෂාව දෙන්න" කියලා පොලිස්පතිතුමාට නියෝග කරන්න. ඔබතුමා අපේ ආරක්ෂකයා. පාර්ලිමේන්තුව ඔබතුමා යටතේ තිබෙන්නේ. ඒක නිසා පසුබට වෙන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද මම ඒ ගැන දැනුවත් කරනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපට ඔබතුමා ගැන විශ්වාසයක් තිබෙනවා. ඔබතුමා තමයි අද අපේ ගැලවුම්කාරයා කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, පසුගිය දා ඔබතුමා තීන්දුවක් දුන්නා, "විශ්වාස භංගයෙන් පස්සේ මේ රටේ අගමැතිවරයෙකුත් නැහැ; ආණ්ඩුවකුත් නැහැ" කියලා.

ඒ තීන්දුව දුන්නේ නොවැම්බර් 14වැනි දා. හැබැයි, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ letterhead එකක් යටතේ මහින්ද රාජපක්ෂ මහත්මයා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙන්න මෙවැනි නියෝගයක් ලබාදී තිබෙනවා.

"නඩු අංක : BIA/D/CASE/128/2017
අයදුම්කරුගේ නම : අලි රිසාසද් මෝෆ් මහතා

රේගු ආඥාපනතේ 164 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා, රාජසන්තක කරන ලද ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 53,455ක මුදල ආපසු බාරදීමට නියෝග කරමි."

මේක නීත්‍යානුකූල ද? මෙහෙම කරන්න පුළුවන් ද, ගරු කථානායකතුමනි? මේක සමාජ මාධ්‍ය ජාලයේ සැරිසරනවා. ඕනෑ නම් මට පුළුවන්, මේකේ printout එකක් අරගෙන සභාගත කරන්න පුළුවන්. මම ඒක සභාගත කරන්නම්. රජයක් නැහැයි කියලා පාර්ලිමේන්තුව -ව්‍යවස්ථාදායකය- තීන්දුවක් දීලා තිබියදී, ඇමතිවරු නැහැයි කියලා තීන්දුවක් දීලා තිබියදී, රාජසන්තක කරන ලද ඇමෙරිකානු ඩොලර් 53,400කට අධික මුදලක් නිදහස් කරන්න කියලා නියෝග දීම නීත්‍යානුකූල ද? එහෙම කරන්න පුළුවන් ද කියන එක පිළිබඳව ඔබතුමා සොයා බලා තීන්දුවක් දෙන්න.

දෙවැනි කාරණය මෙයයි. ගරු කථානායකතුමනි, පසුගිය සිකුරාදා ඔබතුමා ඒ වෙලාවේ ගරු සභාවේ හිටියේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයේ හිටියේ. ඒ අවස්ථාවේදී මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව කල් තැබුවාට පස්සේ Adjournment Motion එක සභාවේ ගන්නවා. එතකොට රාජ්‍ය මාධ්‍ය දෙකක් වන ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනිය "පාර්ලිමේන්තුව යළි කල් තිබ්බා" කියා පාර්ලිමේන්තුවේ සිට සජීවීව කියලා, පාර්ලිමේන්තු රැස්වීම මේ සභාව ඇතුළේ පැවැත්වෙද්දී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මාධ්‍ය සාකච්ඡාවක් සජීව දුන්නා.

මේක මහජන මුදල් අවභාවිතාවක්; පාර්ලිමේන්තුවේ ගරුත්වයට නිගරු කිරීමක්. එම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, -මම පසුගිය දා ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් මේ ගැන කිව්වා- මහජන මුදල් අවභාවිතාව පිළිබඳවත්, මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳවත්, පාර්ලිමේන්තුවේ ගෞරවයට හානි කිරීම පිළිබඳවත් මේ ආයතන දෙකේ අදාළ නියෝග දුන්නු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වරප්‍රසාද කමිටුව හමුවට ගෙනැල්ලා, ඔවුන්ට දඬුවම් දෙන්න කියලා. ඔබතුමාට ඕනෑ නම් මම මේ සම්බන්ධව ලිඛිතවත් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ලිඛිතව එවන්න. බොහොම ස්තුතියි. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා. ඉන් පසුව ගරු රවුෆ් හකීම් මැතිතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, අපි ඔබතුමා ගැන ආඩම්බර වෙනවා, කිසිම මැර බලයකට, වෙනයම් රාජ්‍ය බලයකට, වෙනයම් බලයකට යට නොවී මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට කටයුතු කිරීම ගැන. ඒ වාගේම, අද පාර්ලිමේන්තුව තුළ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා කියලා රටේ ජනතාවට පෙන්වන්න ඔබතුමාගේ නායකත්වය යටතේ අපට බොහොම අභිමානයෙන් රැස්වෙන්නට පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වෙද්දී ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන, ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන මන්ත්‍රීවරුන් පිරිස මේ පාර්ලිමේන්තුවට රැස්වෙලා තිබෙනවා. නමුත් ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ, ප්‍රජාතන්ත්‍රවාදයට අකැමැති, තමුන් ආණ්ඩුව යැයි කියා ගන්නා කණ්ඩායම අද ප්‍රජාතන්ත්‍රවාදයට මුහුණ දෙන්නට බැරිව ඉන්නවා. ගමෙන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කැන්ටීන් එකට වෙලා ඒ වරප්‍රසාද භුක්ති විඳිමින් ඉන්නවා මීසක් රටේ ජනතාව බලාපොරොත්තු වෙන වරප්‍රසාද ලබාදෙන්නට, ජනතාව වෙනුවෙන් කළ යුතු දේ කරන්නට, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට කළ යුතු දේ ඉටු කරන්නට අද ඒ අය මැළි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි ඔබතුමාට ආශීර්වාද කරනවා. ඔබතුමා මේ රටට, මේ ලෝකයට පෙන්වලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුව තුළ සිදු වන ඕනෑම දේකට ඔබතුමා භය නැතිව මුහුණ දෙන බව. ඒ නිසා ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට ඔබතුමා ගැන ආඩම්බර වෙන්නට පුළුවන්. කිසිම බලවේගයකට යටත් නොවී ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම සම්බන්ධව අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු රවුෆ් හකීම් මැතිතුමා.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීවරු සඳහන් කළ කාරණාවලට තවත් කාරණාවක් එකතු කරන්නයි මම නැඟී සිටියේ. මේ සභාවේ අපි විශ්වාස භංග යෝජනාවක් සම්මත කරගත්තාට පසුව ඔබතුමාගේ නියෝගය දැනට හැන්සාඩ්ගත වෙලා එය නීත්‍යානුකූල බව මුළු රටම පිළිගත යුතු තත්ත්වයක් තිබියදී, මේ ඊනියා ආණ්ඩුවේ අගමැති සහ අමාත්‍යවරුන් යැයි කියා ගන්නා කල්ලිය, එලෙසම අගමැති ලෙසත්, ඇමතිවරුන් ලෙසත් මේ රටේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මඟින් හැඳින්වීමට කටයුතු කිරීම අපේ වරප්‍රසාද කඩවීමේ ප්‍රධාන කාරණාවක් වෙනවා. මෙය අපේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද, අගමැති, එහෙම නැත්නම් ඇමතිවරු යැයි කියාගන්නා මේ ඊනියා ආණ්ඩුවේ අය එලෙස හඳුන්වා දීම නිසා විශාල ලෙස අපේ වරප්‍රසාද කඩවීමක් වනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. මේ අය මේ තනතුරුවලින් හැඳින්වීම වළක්වාලීම සඳහා විද්‍යුත් මාධ්‍ය ආයතනවලට සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවලට ඔබතුමා නියෝගයක් දිය යුතුයි. මොකද, මෙය නීත්‍යානුකූල නොවන කාර්යයක්. ව්‍යාජ ආණ්ඩුවක්, ආණ්ඩුවක් ලෙස කියමින් යන තත්ත්වය අපට පිළිගත නොහැකියි. ඒක අපේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඒ පිළිබඳව ඔබතුමා කටයුතු කරනු ඇතැයි කියා මම බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. මීළඟට ගරු මලික් සමරවික්‍රම මැතිතුමා. එතුමාගෙන් පසුව ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා. ඉන් අනතුරුව ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

Hon. Speaker, I would like to add to what the Hon. Rauff Hakeem just stated. Sir, you have very clearly stated that you do not recognize the Hon. Mahinda Rajapaksa as the Prime Minister of this country and you have not even recognized any Member as a Cabinet Minister. However, I learnt from the media that a group of MPs meet once a week and take decisions to procure various items. They enter into various agreements not so much with countries, but with international organizations and companies and are trying to bring in various kinds of items to Sri Lanka and various projects are being handed over to them, which is totally illegal. So, I would like to bring this to your kind notice and greatly appreciate if some action is taken to stop this kind of illegal activities.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

මීළඟට ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, ඔබතුමා මහා ශ්‍රේෂ්ඨ කථානායකවරයෙක්. ඔබතුමා ගැන කථා කරනකොට මට මතක් වෙනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු අල්ලාගෙන එන්න කියලා මහා බ්‍රිතාන්‍යයේ දෙවන එඩ්වර්ඩ් රජතුමා තම භටයින් පාර්ලිමේන්තුවට යැව්වාම, කථානායකවරයා කෙළින් සහ එඩිතරව ඉඳපු හැටි. "මේක මාගේ රාජ භූමිය" කියලා ඔවුන් පළවා හැරියා. එහෙම නම් ඔබතුමා ජ්‍යෙෂ්ඨ දේශපාලකයෙක් විධියටයි මම සලකන්නේ. ඔබතුමා ඉතිහාසගත වෙනවා. ඔබතුමා එඩිතරව, හදවතට එකඟව කටයුතු කරනවා. එක්සත් ජාතික පාක්ෂිකයෙක් විධියට නොවෙයි ඔබතුමා ඔය පුටුවේ ක්‍රියා කරන්නේ කියලා මම දන්නවා. කථානායකවරයා විධියටයි ඔබතුමා ක්‍රියා කරන්නේ. ඔබතුමා ක්‍රියා කළ ආකාරය අපි ඉතිහාසය පුරාවටම දැක්කා. ඇමතිවරයෙක් විධියට, තානාපතිවරයෙක් විධියට විතරක් නොවෙයි ඔබතුමා කටයුතු කර තිබෙන්නේ. ඒ නිසා අපි ඔබතුමා අගය කරනවා. ඔබතුමාට කොච්චර මඩ ගහන්න හැදුවත්, ඒවා ඔක්කෝම ඒ අයටමයි වදින්නේ. අවුරුදු 72ක් පමණ වන ආසියාවේ පැරණිම ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුවයි අපේ රටේ තිබෙන්නේ. එදා ඒ සිදු වෙච්ච බේදනීය දේවල් අපි දැක්කා. පාර්ලිමේන්තු ඉතිහාසයේ සිදු නොවුණු දේවල් අපි එදා දැක්කා. මේ පාර්ලිමේන්තුව තුළ සිට ඇඟිල්ල දික් කරලා කථා කරන්න පුළුවන් කෙනෙක් තමයි මම. ඇයි ඒ? රනිල් වික්‍රමසිංහ මැතිතුමා මට කිව්වා, "ජයවික්‍රම, ඔබ ජ්‍යෙෂ්ඨතම සංවිධායකයා" කියලා. මට ඒක අමතක වෙලා තිබුණා. මම ඇහුවා, "ඒ කොහොමද?" කියලා. "1972දී ඩඩ්ලි සේනානායක මැතිතුමායි ඔබ සංවිධායක විධියට පත් කළේ" කියලා එතුමා මට කිව්වා. එතකොට තමයි මට මතක් වුණේ. මම කිව්වා, "හරි" කියලා. 1977 පාර්ලිමේන්තුවට ආපු මම දෙසැරයක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට පත් වුණා. හැබැයි, බලකාමිත්වයෙන්, බලලෝභිත්වයෙන් මම කටයුතු කළේ නැහැ. අද සිදු වෙන දේවල් දැක්කාම හරිම ලජ්ජයි; ඒ වාගේම නින්දිතයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා මා එක්ක නාලන්දා විද්‍යාලයේ හෝස්ටල් එකේ අවුරුද්දක් විතර හිටියා. මට අද හරිම ලජ්ජයි. 1988 දකුණේ කැරැල්ලක් තිබුණු කාලයේ ඇයි මම පාර්ලිමේන්තුවෙන් අයින් වුණේ? ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට මම කිව්වා, "මට වයඹ දියුණු කරන්න ඕනෑ" කියලා. මට ඕනෑ වුණා, Provincial Councils are a must කියලා පෙන්වන්න. මම ඒක කරලා පෙන්වලා තිබෙන කෙනෙක්. මම ප්‍රසිද්ධිය පස්සේ ගිය කෙනෙක් නොවෙයි. එදා 1988දී මම එහෙම වැඩ කරලා පෙන්වූවාට පස්සේ 1998දී රනිල් වික්‍රමසිංහ මැතිතුමායි, ගාමිණී අතුකෝරල මැතිතුමායි මට කිව්වා, පාර්ලිමේන්තුවට එන්න කියලා. ගාමිණී අතුකෝරල කියන්නේ අපේ පක්ෂයේ හිටපු ශ්‍රේෂ්ඨ මහලේකම්වරයෙක්. ගරු කථානායකතුමනි, එදා "සිරිකොතේ" ඔබතුමාත් හිටියා. එදා දයාරත්න මැතිතුමා මට කිව්වා, "වයඹ පළාත් සභාව දිනාගෙන එයින් අයින් වෙලා පාර්ලිමේන්තුවට එන්න" කියලා.

අද ඔබතුමා කැපවෙනවා වාගේ මගේ ජ්‍යෙෂ්ඨත්වයත් නැති කරගෙන මම තීරණයක් ගත්තා. වයඹ පළාත් සභා මැතිවරණයේදී නාවින්න ඇතුළු ඔය කණ්ඩායම නින්දිත, ජඩ විධියට කටයුතු කළා; ගැහුවා. එදා කරපු නින්දිත දේවල් නිසා,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

තමුන්නාන්සේලාගේ කැබිනට් එකේ හිටියා නේ. එයා තරග කළාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
කවුද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නාවින්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

නාවින්න තරග කළා. එතුමා නීති විරෝධීව ගිහිල්ලා පුටුවේ වාඩි වෙලා හිටියා. මම අවුරුදු දෙකක් ගෙදර හිටියා මිස, ඒ ජරා පුටුවට ගියේ නැහැ, ජනතාවගේ ඡන්දය උදුරා ගත්ත නිසා.

ගරු කථානායකතුමනි, එදා මේ නින්දිත සිද්ධිය සිදු වුණා. මට මිරිස් කුඩු ගහපු එක වේදනාවක් වුවත් මම එය වෛරයෙන් සලකන්නේ නැහැ. නමුත්, මගේ ඇහැට සිදු වෙලා තිබෙන හානිය ගැන "විෂන් කෙයාර්" එකෙන් පැය දෙකක ටෙස්ට් එකක් කරන්න ඕනෑ කිව්වා. මේ පාර්ලිමේන්තුව තුළ අපට තිබෙන වරප්‍රසාද, අයිතිය හා ආරක්ෂාව මොකක්ද කියලා මම අහනවා. එදා ඇසිඩ් ගෙනැල්ලා තිබුණාය කියලා මට ආරංචියි. අපේ සහෝදර මන්ත්‍රීවරු ප්‍රතිප්‍රහාරයක් එල්ල කළා නම් එදා අපට ඇසිඩ් ප්‍රහාර එල්ල වෙන්න තිබුණා. ඔබතුමන්ලා මේ වාගේ විනීතව, ලෝකයාට අපේ ආදර්ශය පෙන්වීම සම්බන්ධයෙන් මම ඔබතුමන්ලාට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා. ඔබතුමන්ලාගේ හැසිරීමට මම ගරු කරනවා. ගරු කථානායකතුමනි, මෙවැනි දේවල් කරන්න නින්දිත හොර පාලකයන්ට ලජ්ජා නැද්ද කියලා මම අහනවා.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

අය වැයක් අනුමත නොවීම සම්බන්ධයෙන් මංගල සමරවීර මන්ත්‍රීතුමා කිව්වා. ඇයි පඩිය විතරද නැති වෙන්නේ? අපට බඩු මුට්ටු ගෙනෙන්න හැකිද? රටට සිදු වන විනාශය බලන්න. සංචාරක කර්මාන්තය කඩා වැටීම පිළිබඳව අපි පසුව කථා කරන්නම්.

ගරු කථානායකතුමනි, මගේ ඇහැට සිදු වී තිබෙන හානියට මට ගෙවන වන්දිය මොකක්ද කියලා මම අහනවා. මම හෙට "විෂන් කෙයාර්" එකට ගිහිල්ලා පැය දෙකක් ටෙස්ට් කරනවා.

මම මේ කාරණය කිව්වාට කමක් නැහැ. එඩ්වඩ් ගුණසේකර මගේ ඥාතියා. මොකද, මමත් ඒ ගමේ කෙනෙක්. එතුමාගේ ගෙදරට ඇවිල්ලා, ලක්ෂ 2,000ක් දැන් දෙනවා කිව්වා ලු, advance එකක් හැටියට. තව ලක්ෂ 1,000ක් දෙනවා කිව්වා ලු. සල්ලිත් අරගෙන ගිහිල්ලා තිබෙන්නේ. මේකද, මේ රට-

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවදාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එතුමා ඊයේ ප්‍රකාශ කළා. එඩ්වඩ් ගුණසේකර මැතිතුමා ඉන්නවා; මගේ ඥාතියා; මමත් එහේ.

ඩොලර්වලින් දැන් දෙන්නේ. රුපියල්වලින් නොවෙයි. ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමා කෙළින් ඉන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ඇවිල්ලා තිබෙන්නේ?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒක එතුමාගෙන් අහන්න ඕනෑ. ඒක කියන්න බැරි වුණා. ඒ නිසා මම අහනවා, මට දෙන වන්දිය මොකක්ද කියලා. මේ අයගේ කලිසම් විතරක් නොවෙයි, ඔක්කෝම ගලවලා බලන්න ඕනෑ. මොනවා අරගෙන එයිද දන්නේ නැහැ, මේ සභාව ඇතුළට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජයවික්‍රම පෙරේරා මැතිතුමනි, දැනටමත් ඒ පොලිස් පරීක්ෂණ කරගෙන යනවා. ඊයේත් ඒ සම්බන්ධයෙන් කටයුතු කළා.

ඊළඟට, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු කථානායකතුමනි, පසුගිය දිනවල -මීට සති හතරක්, හයක් අතර කාලයකට ඉහත- ඉරිදා "ටයිම්ස්" පත්තරේ තිබුණා, මේ රටේ ජනාධිපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ group meeting එකේදී ප්‍රකාශ කළා කියලා, මම එතුමා ඝාතනය කරන්න සැලසුම් කරලා තිබෙනවාය කියලා. එතුමාට මේවා පවසන්නේ, නාමල් කුමාර කියන පුද්ගලයෙක්. නාමල් කුමාර කියන පුද්ගලයා තමයි රහස් තොරතුරු සපයන්නෙක්, ඔත්තුකාරයෙක්, Intelligence Officer කෙනෙක් හැටියට ජනාධිපතිතුමාට වැඩ කරන්නේ.

ඊට අමතරව, දැනට දවස් පහකට-හයකට ඉස්සෙල්ලා ජනාධිපතිතුමා විදේශ මාධ්‍යයට ආමන්ත්‍රණය කළා. ආමන්ත්‍රණය කරලා එතැනදී ප්‍රකාශ කළා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාව කෙසේවත් අගමැති කරන්නේත් නැහැ; සරත් ෆොන්සේකා කෙසේවත් අගමැති කරන්නේත් නැහැ කියලා. මට එහෙම හීනයක්වත් කවදාවත් තිබිලාත් නැහැ. මම දන්නේ නැහැ, එතුමා ඒ වාගේ භයානක හීන දකින්නේ ඇයි කියලා. "සරත් ෆොන්සේකා අගමැති කරන්නේත් නැහැ"යි කියලා කියන්නේ මොකක්ද හේතුව කියලා ඒ විදේශ මාධ්‍යවේදීන් ඇහුවාම, මේ රටේ ජනාධිපති ප්‍රකාශ කරලා තිබෙනවා, "සරත් ෆොන්සේකා මාව ඝාතනය කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ නිසා එතුමා අගමැති කරන්න බැහැ"යි කියලා. මම මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රී කෙනෙක් හැටියට සිටින අවස්ථාවක මේ රටේ ජනාධිපති මට ඇඟිල්ල දිගු කරනවා නම් මම එතුමාව ඝාතනය කරන්න සැලසුම් කරනවා කියලා, මේක විශාල ප්‍රශ්නයක්. මෙය වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ, මීට අදාළව වහාම ක්‍රියාත්මක වෙන්න කියලා පොලිස්පතිතුමාට දැනුම් දෙන්න කියලායි. දැනුම් දීලා, ඔබතුමා පැය 48ක් වැනි කාලයක් ඇතුළත පොලිස්පතිතුමාව පාර්ලිමේන්තුවට කැඳවන්න. මොකද, මේක බරපතළ ප්‍රශ්නයක්. එක්කෝ මාව අල්ලාගෙන කූඩුවක දමන්න කියන්න. නැත්නම් මේ පාර්ලිමේන්තුවට උත්තර දෙන්න කියන්න, මේ බරපතළ චෝදනාව ගැන.

මම තව එකක් කියන්නට ඕනෑ. අතීතයේ දී ජනාධිපතිතුමා කිය-කියා සිටියා, මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා බලයට ආවා නම් ජනාධිපතිතුමාව අඩි හයක් පොළොව යට වළලනවා කියලා. තමන්ව අඩි හයක් පොළොව යට වළලන්න හිටියා කියලා ඒ කාලයේ එතුමාට චෝදනා කරලා දැන් එතුමාව අගමැති කරලා තිබෙනවා නම්, ඉතින් මටත් ඇත්තටම ඝාතන සැලැස්මක් තිබුණා නම්, එහෙම නම් මාවත් අගමැති කරන්න බැහැ කියන්න හේතුවකුත් නැහැ නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. එතුමාට වෙන හැන්දකින් බෙදලා, මට තවත් හැන්දකින් බෙදන්නේ ඇයි?

ගරු කථානායකතුමනි, කෙසේ වුවත් මේක බරපතළ ප්‍රශ්නයක්. හාස්‍යජනකයි තමයි. නමුත්, බරපතළ ප්‍රශ්නයක් නිසා ඔබතුමා අනිවාර්යයෙන්ම මට ඝාධාරණය ඉෂ්ට කරන්න. අර නාමල් කුමාර කියන පුද්ගලයා මොන බුද්ධි අංශ ප්‍රධානියාද කියලා මම දන්නේ නැහැ. එයා නිල නොලත් බුද්ධි අංශ ප්‍රධානියෙක් වෙලා තිබෙනවා, ජනාධිපතිතුමාට. ඒ ගැනත් ඔබතුමා පරීක්ෂණයක් පවත්වන්න. අනෙක් කාරණය, බුද්ධි අංශ ප්‍රධානියා වෙලා ජනාධිපතිට ඔත්තු දෙන ගමන් එයාට පොහොට්ටුවෙන් ඡන්දය ඉල්ලන්න නාම යෝජනා ලැබෙන තත්ත්වයකුත් දැනගන්න තිබෙනවා. එතකොට පොහොට්ටුවෙන් ඡන්දය ඉල්ලන්න යන කෙනකුගෙන් තමයි ජනාධිපතිතුමාට ඒ විශ්වාසවන්ත තොරතුරු ලැබෙන්නේ. මේක "අබුද්දස්ස කාලෙට ලබුත් තිත්තයි ලු" කියනවා වාගේ වැඩක්. ඒ නිසා සියලුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඝාධාරණය ඉටු කිරීමක් හැටියට ඔබතුමා කරුණාකර, මේ ගැන පරීක්ෂණයක් කරන්න. අපි ඔක්කෝම එක කණ්ඩායමක් හැටියට මෙහි සිටින නිසා ඝාතකයකු මේ අතරේ හිටියොත් ප්‍රශ්නයක් නේ. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධයෙන් ඝාධාරණයක් ඉෂ්ට කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, මේ රටේ ජන සම්මතවාදය ආරක්ෂා කිරීම සඳහා පසුගිය දිනවල කටයුතු කළ ආකාරය ගැන අපේ ගෞරවය, ස්තුතිය අපි පිරිනමනවා. ඒ වාගේම ගරු සරත් ෆොන්සේකා මැතිතුමා සඳහන් කළා වාගේ පසුගිය දිනවල නාමල් කුමාර කියන පුද්ගලයකු සම්බන්ධ කරගනිමින් ජනාධිපති ඝාතනය කිරීමක් සම්බන්ධව, හිටපු ආරක්ෂක ලේකම් ඝාතනය කිරීමක් සම්බන්ධව කථා කළා. මම නීතිය හා සාමය ඇමතිවරයා විධියට කටයුතු කරද්දී ඒ සම්බන්ධව පරීක්ෂණ කටයුතු කළා. ඒ හඬ පට 123 තුළ කොහේවත් ජනාධිපති ඝාතනය කිරීමක් සම්බන්ධව හෝ හිටපු ආරක්ෂක ලේකම් ඝාතනය කිරීමක් සම්බන්ධව වචනයක්වත් සඳහන් වෙලා නැහැ.

ඒක මා පැහැදිලිව කියනවා. ඒ වාගේම සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා සම්බන්ධව ඒ කිසි තැනක නැහැ. අන්තිමට නාමල් කුමාර ඊයේ පෙරේදා මාධ්‍ය ඉදිරියට පැමිණ රංජිත් මද්දුම බණ්ඩාර ගැනත් සඳහන් කරනවා. මොකක්ද? නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා කළ ප්‍රකාශයක් ඇතුළත් "ටේප්" එකක් ඉදිරිපත් කරනවා. මේ ආකාරයට අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ, මැති ඇමතිවරුන්ගේ තත්ත්වයට විශාල වශයෙන් පහර දෙන විධියට කටයුතු කරනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කරන්න. මා හිතන විධියට මේ නාමල් කුමාර කියන පුද්ගලයාගේ ඔය කථාව -ටේප් එකක් ගැන කථාව- මාස 5කට විතර ඉස්සෙල්ලා තමයි එළියට ආවේ. එහි කොහේවත් සඳහන් වෙලා නැහැ, ඝාතනයක් ගැන. අපේ අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉවත් කිරීමේ කුමන්ත්‍රණයට තමයි මේ නාමල් කුමාරව යොදා ගත්තේ. නාමල් කුමාර කියන්නේ පොලීසියට ඔත්තු දුන් කෙනෙක්. ඔහුට රුපියල් ලක්ෂ 5ක් ගෙවා තිබෙනවා. නාමල් කුමාර අද පොහොට්ටුව පක්ෂයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ අපේක්ෂකයකු විධියට ඉදිරිපත් වෙන්න යනවා. ඔහු ඇවන්ට් ගාර්ඩ් වැනි එක එක තැන්වල වැඩ කරපු කෙනෙක්. මා කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාත්, අපිත් ඉදිරිපත් කරපු කාරණය ගැන කරුණාකරලා පරීක්ෂණයක් කරන්න කියලා.

අනෙක් කාරණය මෙයයි. නීත්‍යානුකූල නොවන, බලෙන් අටවා ගත් ආණ්ඩුවට විරුද්ධව පසුගිය දා විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ බහුතරය ලබාගෙන ඔබතුමා ප්‍රකාශයට පත් කළා, මහින්ද රාජපක්ෂ මේ රටේ අගමැතිත් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පත් කරපු ඒ කැබිනට් මණ්ඩලයත් නීත්‍යානුකූල නැහැයි කියලා.

රටේ මුදල් පිළිබඳ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට බව අපි දන්නවා. එහෙම නම්, අද මේ රටේ වැඩ ක්‍රියාත්මක කරන්න, මුදල් දෙන්න, මුදල් වියදම් කිරීමට නියෝග දෙන්න මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාටවත්, ඔය ඉන්න ඊනියා කැබිනට් මණ්ඩලය කියන කට්ටියටවත් කිසිම අයිතියක් නැහැ. කරුණාකර මේ අය ලබාදෙන උපදෙස් ක්‍රියාත්මක කරන්න එපා, ඉදිරියේදී මේවාට පිළිතුරු දෙන්න වෙයි කියන කාරණය මම රාජ්‍ය නිලධාරීන්ට කියනවා. ඔබතුමා එම නියෝගය ක්‍රියාත්මක කරන්න. මුදල් පිළිබඳ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. නීත්‍යානුකූල නොවන, මේ අගමැති කියන මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාටවත්, අනෙක් අයටවත් මුදල් වියදම් කිරීමට නියෝග දෙන්න අයිතියක් නැහැ. එම නිසා මුදල් ලබාදෙන එක, නියෝග දෙන එක සහ මුදල් වියදම් කිරීම නැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම, වැරැදි නියෝග අනුව කටයුතු කරන්න එපාය කියාත් මම මේ රටේ සියලුම රාජ්‍ය නිලධාරීන්ට ප්‍රකාශ කර සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කරුණාරත්න පරණවිතාන මැතිතුමා.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වන ව්‍යවස්ථාව අනුව, මේ රටේ ජනතාවට තොරතුරු දැන ගැනීමේ අයිතිය හිමි වී තිබෙනවා. මෙතැනදී තොරතුරු කියලා කියන්නේ නිවැරැදි තොරතුරුයි. මේ අවස්ථාව වන විට ජනමාධ්‍ය ඔස්සේත්, විවිධ රාජ්‍ය නිලධාරීන් ඔස්සේත් රට පුරාම විවිධ අසත්‍ය තොරතුරු ප්‍රචාරය වෙමින් තිබෙනවා. මේ ව්‍යාජ ආණ්ඩුව, ඇත්ත ආණ්ඩුවක් ලෙස ඇහවෙන පරිදි ඒ අය තොරතුරු ඉදිරිපත් කරනවා. ගරු මන්ත්‍රීවරු මේ ගැන මීට කලිනුත් සඳහන් කළා. ගරු කථානායකතුමනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ස්ථාපිත කර තිබෙනවා. ඒකත් ස්වාධීන කොමිෂන් සභාවක්.

ගරු කථානායකතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභා සියල්ලම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය මූලික කරගෙනයි පවතින්නේ. එහි ප්‍රධානියා වන්නේ ඔබතුමායි. එම නිසා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඇතුළු සියලුම කොමිෂන් සභාවලට ඔබතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කළ අදහසම -මේ රටේ දැන් ආණ්ඩුවක්, ආණ්ඩු පක්ෂයක්, විපක්ෂයක්, අගමැති කෙනෙක් යනාදී වශයෙන් කවුරුවත් නැහැ කියන කාරණය- නැවත දැනුම් දෙන්නය කියා අපි ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ව්‍යාජ ආණ්ඩුවක් තිබෙනවා. ඒ ව්‍යාජ ආණ්ඩුව තිබෙන බවට විශේෂයෙන් රාජ්‍ය මාධ්‍ය හැමදාම, "අගමැති", "ඇමති" යනාදී වශයෙන් යම් යම් දේ කියමින් මේ රටේ ජනතාව මුළාවේ දමනවා. එය ජනතාවට තිබෙන ඇත්ත තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීමක්. ඒ වාගේම එය මානව හිමිකම් කඩවීමක්. ඕනෑ නම් කාට හෝ පුරවැසියකුට ඒ පිළිබඳව උසාවි යන්න පුළුවන්. එම නිසා අලුත් ආණ්ඩුවක් පාර්ලිමේන්තුවෙන් තෝරා ගන්නා තුරු, ආණ්ඩුවක් නැති බවට ඔබතුමා දුන්, හැන්සාඩ්ගත වුණු නියෝගයම; ඒ අදහසම ඒ සියලු කොමිෂන් සභාවලටත් දැනුම් දෙන්නය කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මම තව කාරණයක් මතක් කරන්න කැමතියි. මම මේ කථා කරන්නේ මුද්‍රිත මාධ්‍ය ගැන නොවෙය, විද්‍යුත් මාධ්‍ය ගැනයි. දැනට රටේ තිබෙන ප්‍රධාන පෙළේ විද්‍යුත් මාධ්‍ය පාවිච්චි කරන්නේ, රාජ්‍ය දේපළක් වන සංඛ්‍යාතයි. රාජ්‍ය දේපළ අවභාවිතයේ යොදවන්න ඒ අයට බැහැ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව රැස්වන විට සමහර නාළිකා සජීවී විකාශන හැටියට පෙන්වන්නේ මේ සභා ගර්භයේ වැඩ නොවෙයි. එළියේ; පාර්ලිමේන්තුවේ Committee Roomsවල එක් එක් දේශපාලන පක්ෂ පවත්වන සාකච්ඡාවලට සජීවී විකාශන ලබා දීමයි ඔවුන් කරන්නේ. එය පාර්ලිමේන්තුවෙන් ජනමාධ්‍ය ආයතනවලට හා ජනමාධ්‍යවේදීන්ට ලබා දෙන පහසුකම් අවභාවිත කිරීමක්.

ඒක තව ආකාරයකින් ගත්තාම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක්. එම නිසා අද ඉඳලා ඉදිරියට පවත්වන රැස්වීම්වාරවලදී ජනමාධ්‍යවලට පාර්ලිමේන්තුවේ පහසුකම් භාවිත කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඒ අදාළ, සුදුසු නියෝග ටිකත් තමුන්නාන්සේ ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවාද?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මහත්මයා රීයේ මාධ්‍ය හමුවක් පවත්වලා තිබෙනවා. "ජම්පර සහතිකයි. කථානායක සාහසික කූට ලේඛනයක් හදයි. හැන්සාඩ් වාර්තාව කූට ලේඛනයක්. සාක්ෂි මෙන්න..." කියලා වීඩියෝවක් දමා පෙන්වා අන්තිමට කියනවා, "There is no majority for that." "for them" ලෙස වෙනස් කරලා, 'යෝජනාව සම්මත විය' යන අර්ථය දෙන "The Motion is carried." යන වගන්තිය අලුතින් එකතු කරලා. දණ්ඩ නීති සංග්‍රහය අනුව කූට ලේඛන සෑදීම කියන්නේ වසර තුනක් දක්වා සිර දඬුවම් ලබා දිය හැකි බරපතළ වරදක්. ඒ විතරක් නොවෙයි. අපේ රටේ ආණ්ඩුවක් ගෙදර යවනවාද නැද්ද කියලා තීරණය කිරීම සඳහා තුන්වන පුරවැසියා හැදුවාම බරපතළභාවය හරිම වැඩියි. ඒ වාගේම අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ යම් පාර්ශ්වයකට අයුතු වාසියක් ලැබෙන අයුරින් තම තනතුර භාවිත කිරීම වසර දහයක් දක්වා සිර දඬුවම් ලැබිය හැකි වරදක්. කරුණාරත්න ජයසූරිය මැතිතුමනි, කුම්බලාවෝ කෑවා නම් විඳවාපන් බළලෝ කිව්ව ලු."

ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ ප්‍රධානියා හැටියට පාර්ලිමේන්තු සභාචාරය පිළිබඳ හැන්සාඩ් වාර්තාව නිල වශයෙන් නිකුත් කරනවා. "ඒක කූට ලේඛන සෑදීමක්, ඒක අල්ලස් ගැනීමක්, ඒ නිසා හිරේ යන්න සිදු වෙනවා" කියලා මේ ගොල්ලන් කියනවා නම්, මම හිතන්නේ ඒ පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කළ යුතු වනවා. ඇත්තටම ඔබතුමා කූට ලේඛනයක් හැදුවාද, නැත්නම් මෙතුමා මඩ ගහනවා ද කියන එක මේ රටේ ජනතාවට දැන ගන්න අවශ්‍යයි. ඒ වාගේම මන්ත්‍රීවරු හැටියට අපටත් දැන ගන්න අවශ්‍යයි. ඒ නිසා මාධ්‍ය හමුවේදී කිව්වා කියා නිකම් අත්හරින්න බැහැ. ඔබතුමා ඇත්තටම කූට ලේඛන හැදුවාද කියා අපිත් දැන ගන්න එපායැ. ඒ නිසා ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මා පළමුවෙන්ම කියන්න ඕනෑ, මම කුම්බලාවෝ කන්නේ නැහැ කියා. ඒ නිසා අන්තිම එක බලපවත්වන්නේ නැහැ. දෙවැනි කරුණ තමයි ශක්තිය, යුක්තිය, සාධාරණය වෙනුවෙන් ජම්පර අඳින්න සිදු වුණොත් මම ඒක අඳින්න ලැහැස්තියි. නමුත් කූට ලේඛන- මම මගේ ජීවිතයට කූට වැඩ කරලා නැහැ. මම ලැහැස්තියි ඕනෑම පරීක්ෂණයකට යටත්වන්න. අද උදෙත් මම මේක දැකලා කිව්වා, අපේ නිලධාරීන්ට. පොලීසියේ නිලධාරීන්ට මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න පුළුවන්. සමහර අය කටට එන ඒවා කියනවා. මම මීට කලින් සඳහන් කළා, කථානායක සුදුසු නැත්නම් හෙටම විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා අයින් කරන්න කියා. මට කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා විදේශිකයන්ගෙන් සල්ලි හොරකම් කර නැහැ නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම නම් එහෙම කර නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඔබතුමා ගැන අප තුළ ඉතාමත් ලොකු ගෞරවයක් තිබෙනවා. ඒ, මේ අවස්ථාවේ ඔබතුමා කටයුතු කළ ආකාරය පිළිබඳව විතරක් නොවෙයි. ඔබතුමාගේ චරිතය ගත්තාම ඔබතුමාගේ ජීවිතේ පුරාවටම ඔබතුමා ආත්මාභිමානයෙන් යුතුව වැඩ කර තිබෙනවා. ඔබතුමාට එවැනි දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. ඒ දීර්ඝ ඉතිහාසය තුළ චරිතවත්ව, අභිමානවත්ව සහ හරි දේ හරි විධියට දැකලා, වැරදි දේ වැරදි විධියට දැකලා නිවැරදිව ඔබතුමා කටයුතු කර තිබෙනවා. එම නිසා ඔබතුමා කෙරෙහි අප තුළත්, මේ මුළු රටේම ජනතාව තුළත් ගෞරවයක් තිබෙනවා. ඒ වාගේම මේ වේලාවේ ඔබතුමා මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කිරීම වෙනුවෙන් කරන ලද කැපවීම ගැන රටම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මම මතු කරන ප්‍රශ්නය වන්නේ මෙයයි. ඔක්තෝබර් මාසයේ 26වැනි දා ඉඳලා අද වනකොට මාසයක් ගත වෙලා තිබෙනවා. මේ මාසය තුළ "නීති විරෝධී කැබිනට් රැස්වීම්" කියන මේ රැස්වීම්වලදී විවිධාකාර යෝජනා අනුමත කර තිබෙනවා. එහිදී අනුමත කර ඇති ඉතා වැදගත් වූ යෝජනාවක් තමයි, කොළඹ වරායේ ඉදිකිරීම් දෙක. එම තීරණය අනුව, කොළඹ වරායේ ඩොලර් මිලියන 100කට වඩා වැඩි වටිනාකමකින් යුතු දැවැන්ත ඉදිකිරීම් දෙකක කොන්ත්‍රාත්තු ටෙන්ඩර් කාර්ය පටිපාටියකින් තොරව -unsolicited- ඉතාම කඩිමුඩියේ චීන සමාගමකට ලබා දුන්නා. මෙවැනි බරපතළ, ඉතාම ඉහළ වටිනාකමකින් යුතු ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් හදිසියේ අනුමත කරන්න කිසිම හේතුවක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ තුළින් අපට පෙන්නුම් කරන්නේ, ඉතාම දැවැන්ත මූල්‍ය වංචාවක් මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව එම චීන සමාගමට ලබා දීම තුළ තිබෙන බවයි. එකක් තමයි, නීත්‍යානුකූල ආණ්ඩුවක් නැති කාලයේ මේ තරම් බරපතළ, ඩොලර් මිලියන 100කටත් වඩා වැඩි වටිනාකමකින් යුත් මේ කොන්ත්‍රාත් ලබා දීම නීති විරෝධියි. දෙවැන්න, මේ තුළ බරපතළ දූෂණයක් තිබෙනවා. ඊට අමතරව, මෙවැනිම කාරණා කීපයක් ගැන දැන් දිගින් දිගට හෙළිදරව් වනවා.

ගරු කථානායකතුමනි, දැන් ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා කිව්ව කාරණය, එකක්. මුදල් ඇමතිකමේ රැඳී ඉන්නට බලයක් නැති මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් රජයට රුපියල් මිලියන ගණනින්, බිලියන ගණනින් මූල්‍යමය වශයෙන් පාඩු සිදු කරන නියෝග නිකුත් කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම රටේ ඉන්න දූෂිත පුද්ගලයෝ, හොරු, තක්කඩි බලහත්කාරයෙන් තනතුරුවල ඉන්න පුද්ගලයන් වටා එකතු වෙලා ඔවුන්ගේ ව්‍යාපාරික අවශ්‍යතා ඉෂ්ට කර ගන්න, ඔවුන්ගේ අපරාධ චෝදනාවලින් මිදෙන්න විවිධාකාර ක්‍රියාකාරකම්වල යෙදෙනවා. ගරු කථානායකතුමනි, මේක ඉතාම බරපතළ තත්ත්වයක්. රටක නීත්‍යානුකූල ආණ්ඩුවක් නැති වුණාම මෙවැනි තත්ත්වයන් මතු වනවා. ඒ නිසා ඉතාම ඉක්මනින් පාර්ලිමේන්තුවේ කාරක සභා පිහිටුවලා, පාර්ලිමේන්තුව සතු මූල්‍ය

පාලන බලය ක්‍රියාත්මක කරලා, මේ හා සම්බන්ධව කටයුතු කළ යුතුයි. ඒ වාගේම විධිමත්, නීත්‍යානුකූල ආණ්ඩුවක් වහාම පිහිටුවීම සඳහා ගරු ජනාධිපතිතුමා වෙත මේ රටම බල කිරීමක් කළ යුතුව තිබෙනවාය කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, ආණ්ඩු බලයක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුව වර්ජනය කරන්නේ නැති බව දැන් අපට පෙනෙනවා. එක ඡන්දයක් හෝ වැඩිපුර තිබෙනවා නම්, කිසිම කණ්ඩායමක් පාර්ලිමේන්තුව වර්ජනය කරන්නේ නැහැ. පාර්ලිමේන්තුව වර්ජනය කරන එකෙන් පෙනෙන්නේ මොකක්ද? මේ කණ්ඩායම අද ඇවිල්ලා කමිටු කාමර අංක 1හි කණ්ඩායම් රැස්වීම පවත්වා, ඒ වාගේම දිවා භෝජනය සහනදායී මිලට පාර්ලිමේන්තුවේ කැන්ටිමෙන් අරගෙන පාර්ලිමේන්තුවේ සැසිවාරයට සහභාගි වන්නේ නැතිව යන්න ගියා. ගරු කථානායකතුමනි, මෙහි තිබෙන හාස්‍යජනක තත්ත්වය මේකයි. ඔබතුමාගේ පාලනයේ තමයි පාර්ලිමේන්තුව තිබෙන්නේ. ඔබතුමාගේ අවසරය මත කමිටු රැස්වීම පවත්වනවා, ඔබතුමාගේ පාලනයේ තිබෙන පාර්ලිමේන්තුවේ කැන්ටිමෙන් සහන මිලට ලැබෙන දිවා ආහාරය ලබා ගන්නවා, ඉතිරි පහසුකම් ගන්නවා, පඩි ගන්නවා. හැබැයි, සැසිවාරයට එන්නේ නැහැ. එහෙම එන්නේ නැත්තේ බහුතරයක් නැතිකම නිසා බව කාටත් පැහැදිලියි, ගරු කථානායකතුමනි. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ නීත්‍යානුකූල රජයක් පැවැත්වීමේ වටිනාකම පිළිබඳව සහ රට පත් වෙලා තිබෙන අවදානම පිළිබඳව ගරු ජනාධිපතිතුමාට දැනුම් දෙන්න කියායි. ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම නිල ඇඳුමක් ඇඳගෙන යම් කාලයක් රට වෙනුවෙන් වැඩ කරපු නිලධාරියෙකු වශයෙන් ඒ නිල ඇඳුමේ ගෞරවයත්, නිර්භීතකමත්, ආඩම්බරත්වයත් ආරක්ෂා කරමින් පසුගිය දින කීපය තුළම ඔබතුමා පාර්ලිමේන්තුවේ කථානායකතුමා විධියට වැඩ කටයුතු කරපු අන්දම පිළිබඳව මගේ ප්‍රශංසාව හා සභාවේ ප්‍රශංසාව ඔබතුමා වෙත මා මුලින්ම පුද කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම පසුගිය දිනවල කථා කළා, නාමල් කුමාර නැමැති තැනැත්තෙකු පිළිබඳවත්, ඒ වාගේම ඉන්දියන් ජාතික තෝමස් නැමැති තැනැත්තෙකු පිළිබඳවත්. ඉන්දියන් ජාතික තෝමස් නැමැති තැනැත්තා පිළිබඳව ඉන්දියානු තානාපති කාර්යාලය මඟින් නිවේදනයක් නිකුත් කරලා තිබුණා, ඔහු මානසික රෝගියෙක් කියලා. නමුත්, මේ හැම එක් කෙනෙකුගේම වෛද්‍ය වාර්තා මේ තානාපති කාර්යාලය තබාගෙන ඉන්නවාද කියලා මේ සභාව නියෝජනය කරන විමල් වීරවංශ මන්ත්‍රීතුමා ඒ පිළිබඳව චෝදනා මුඛයෙන් තමයි සඳහන් කළේ. ගරු කථානායකතුමනි, කෙසේ නමුත් පොලිසිය මඟින් තෝමස් නැමැති මේ ඉන්දියන් ජාතිකයා අත් අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරලා අධිකරණයෙන් ලබා ගන්නා ලද නියෝගයක් මත මොහුව මුල්ලේරියා රෝහලට යොමු කර තිබුණා. මුල්ලේරියා රෝහලේ නේවාසික වෛද්‍ය නිලධාරී මහත්මා තෝමස් නැමැති තැනැත්තාව පරීක්ෂණයට භාජනය කරලා මොහු උන්මත්තකයෙක් එහෙම නැත්නම්, මානසික රෝගියෙක් කියන වාර්තාව මේ වනකොට අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ තැනැත්තාව බීමත් පුද්ගලයින් පරීක්ෂා කරනවා වාගේ හදිසියෙන්ම ඉදිරිපත් කරලා හදිසියෙන්ම ඉවත් කර ගෙන ගිහිල්ලා, ගරු කථානායකතුමනි. සති දෙකකට ආසන්න කාලයක් රෝහලේ නේවාසිකව රඳවා ගෙන තමයි, මොහුව මේ පරීක්ෂණයට භාජනය කර තිබෙන්නේ. බොහොම පැහැදිලිව අපට නිගමනය කරන්න පුළුවන්, අපට විශ්වාස කරන්න පුළුවන්, ඉතාම සාධාරණ වාර්තාවක් ඒ උගත් වෛද්‍ය නිලධාරී මහත්වරුන් ඉදිරිපත් කර තිබෙනවා කියා.

ගරු කථානායකතුමනි, නාමල් කුමාර නැමැති තැනැත්තා විවිධ සිද්ධි සම්බන්ධව පොලීසියට තොරතුරු ලබා දුන් තොරතුරුකරුවෙක්. ඒ පිළිබඳව මට සාක්ෂි ඇතිව කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. මොහු පොලිස් නිලධාරීන්ට තොරතුරු ලබා දීලා පොලිස් ත්‍යාග අරමුදලින් - Police Reward Fund එකෙන්- රුපියල් ලක්ෂ 5ක මුදලක් ත්‍යාග වශයෙන් ලබා ගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. ඉන් අනතුරුව මොහු නැවත රුපියල් ලක්ෂ 5ක මුදලක් ඉල්ලා තිබෙනවා. ඒ රුපියල් ලක්ෂ 5 ලබා නොදීම ගැන උරණ වෙලා තමයි මේ විවිධ ප්‍රකාශ කරමින් පොලීසියටත්, ඒ වාගේම පොලීසිය බාරව -ඒ විෂයය බාරව- සිටි ඇමතිතුමා වන රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාටත් විරුද්ධව විවිධ චෝදනා ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, ඉන්දියාව කියන්නේ ඉතාම වැදගත් රටක්. ඉන්දියාවේ වෙසෙන ජනතාවගෙන් අතිබහුතරයක් අදහන්නේ, ශිව ආගමයි; හින්දු ආගමයි. ඒ හින්දු භක්තිකයෝ ගවයා ශිව දෙවියන් වහන්සේගේ එක් අවතාරයක් යැයි විශ්වාස කරනවා. ගරු කථානායකතුමනි, අනෙක් පැත්තෙන්, ගවයා කියන්නේ ශිව දෙවියන්ගේ වාහනය කියාත් ශිව ආගම අදහන උදවිය විශ්වාස කරනවා. ඒ තත්ත්වය උඩ ඉන්දියන් ජාතිකයන්, හින්දු භක්තිකයන් කිසිසේත් ගව ඝාතනය සිදු කරන්නේ නැහැ. මා දන්නා විධියට ඔවුන් හරක් මරන්න යන්නේ නැහැ. එහෙම නම්, මෙවැනි කුමන්ත්‍රණයක් කරනවා කියන එක අපට කිසිසේත් විශ්වාස කරන්න පුළුවන්කමකුත් නැහැ, ගරු කථානායකතුමනි. ඒ හින්දු ආගම අදහන හින්දු භක්තිකයන් තුළ ගවයාට තිබෙන ආදරය, ගෞරවය කොච්චරද කියන එක මැනවින් පෙනෙන නිසා සාමාන්‍ය අන්දමට ගත්තත්, අපට ඒ ගැන විශ්වාසයක් තියන්න පුළුවන්කමක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ වාගේම, මා මතක් කරන්න ඕනෑ, මේ කෙටි කාලය තුළ වංචා දූෂණ කොච්චර සිද්ධ වනවාද කියා, ගරු කථානායකතුමනි. ක්‍රීඩා අමාත්‍යාංශය රුපියල් මිලියන 7.5ක ක්‍රීඩා භාණ්ඩ අරගෙන, ක්‍රීඩා කරන දරුවන්ට බෙදන්න කටයුතු කර තිබෙනවා. ක්‍රීඩා භාණ්ඩ සඳහා ටෙන්ඩර් පටිපාටිය යටතේ ටෙන්ඩර් කැඳවුවාම අවම ලන්සුව ලැබී තිබෙන්නේ, Eser Marketing කියන ව්‍යාපාරයෙන්. එය මිලියන 6.5යි. නමුත් ඒ සියල්ල පැත්තකට දාලා මේ රටේ කිසිම ක්‍රීඩා භාණ්ඩයක් අළෙවි නොකරන, ඒ සඳහා ලියා පදිංචියක් නොමැති, එවැනි ක්‍රීඩා භාණ්ඩ ප්‍රදර්ශනාගාරයක් නොමැති, ඒජන්තවරයකු නොවන "හැරිසන්" කියන සමාගමකට පෙරේදා හදිසියේම එය ලබා දීමට කටයුතු කර තිබෙනවා. එහි ඉතාම පැහැදිලිවම ඒ වංචනික කටයුතු සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මා මතක් කරනවා, නීත්‍යානුකූල නොවන නියෝග ක්‍රියාත්මක කරන රජයේ නිලධාරීන්ට බොහොම ප්‍රවේශමෙන් වැඩ කටයුතු කරන්න සිදු වන බව. ලංකා ඉතිහාසයේ බොහොම පැහැදිලි නඩු තීන්දු ගණනාවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එකක් තමයි, මොරමුදලිගේ එරෙහිව දයානන්ද ලියනගේ නඩුව. දයානන්ද ලියනගේ කියන පොලිස් නිලධාරියාට ස්ථානාධිපතිවරයා වැරැදි සහගත නියෝගයක් දුන්නා.

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

දයානන්ද කියන නිලධාරියා මේ වැරදිසහගත නියෝගය ක්‍රියාත්මක කළාම අර මොරමුදලිගේ කියන තැනැත්තා දයානන්දට විරුද්ධව නඩු පැවරුවා. අවසානයේදී දයානන්ද අධිකරණයෙන් වැරදිකාරයා බවට පත් වුණා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ 1971 සමයේදී ඉතාම ප්‍රචලිත නඩුවක් තමයි මනම්පේරි ඝාතන නඩුව. මනම්පේරි ඝාතන නඩුවේදී ලුතිනන් විජේසූරිය වැරදි නියෝගයක් කෝප්රල්වරයාට දුන්නා, "මනම්පේරිට වළට වැටෙන්න වෙඩි තියන්න" කියලා. ඊටපස්සේ, මේ කෝප්රල්වරයා මනම්පේරිට වෙඩි තියලා ඝාතනය කළා. අවසානයේදී, අභියාචනාධිකරණයට ගිහිල්ලා මේ කෝප්රල්වරයා තින්දුවට එරෙහිව අභියාචනාධිකරණයේදී හඬා වැළපුණා, "මම ඉහළ නිලධාරීන් දුන් නීත්‍යානුකූල නියෝගයක් ක්‍රියාත්මක කරලායි මට මේකට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ" කියලා. අධිකරණය බොහොම පැහැදිලිව ඒක ප්‍රතික්ෂේප කරලා, නීත්‍යානුකූල නොවන නියෝගයක් ක්‍රියාත්මක කිරීම නිසා කොප්රල්වරයාට දඬුවම් නියම කිරීමට කටයුතු කළා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මට සම්බන්ධ කාරණයකුත් තිබෙනවා. මම පොලිස් ස්ථානාධිපතිවරයෙක් වශයෙන් සිටිනකොට මා මාරුකිරීමේ නියෝගයක් දුන්නා, දේශපාලන අධිකාරිය. පොලිස්පති රාජගුරු මහත්තයා ඒක ක්‍රියාත්මක කළා. ඒ සම්බන්ධව "රංගෙ බණ්ඩාර එදිරිව අනුරුද්ධ රත්වත්තෙ සහ තවත් අය" කියන 3/SLR 360/1997 නඩුව ගොනුකර, - ගරු කථානායකතුමනි, එය ශ්‍රී ලංකා නීති වාර්තාවක්. - ඒ වැරදි නියෝගය ක්‍රියාත්මක කරපු පොලිස්පති රාජගුරු මහත්තයාට සිද්ධ වුණා, ඒ නඩුවේදී පුද්ගලිකව මට වන්දි ගෙවන්න. රජයට සිද්ධ වුණා, පුද්ගලිකව මට වන්දි ගෙවන්න. එහෙම නම්, මේ රටේ ඉතිහාසයේ එවැනි තත්ත්වයන් බොහොම පැහැදිලිව තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ගරු කථානායකතුමනි, නීත්‍යානුකූල රජයක් නැහැ; මිරිස් කුඩු කණ්ඩායමකුත්, මිරිස් කුඩු කණ්ඩායමට නායකත්වය දෙන මිරිස්කුඩු මහින්දගේ කණ්ඩායම පමණයි මේ පාර්ලිමේන්තුව වර්ජනය කරමින් සිටින්නේ කියන කාරණය. එහෙම නම්, මේ මහින්ද කණ්ඩායමට නීත්‍යානුකූල බලයක් නැතුවයි මේ නියෝග දෙන්නේ; මේ වැඩ කරන්නේ. මේ නීත්‍යානුකූල නොවන නියෝග ක්‍රියාත්මක කිරීමෙන් ඉදිරියේදී අපහසුතාවට පත් වෙන්නේ නීත්‍යානුකූලව පත් කරලා ඉන්න අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රජයේ නිලධාරීන්ය කියන කාරණය දැනුවත් කිරීමට පියවර ගත්තොත් හොඳයි කියා ඔබතුමාට යෝජනා කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

තවත් කථිකයෝ හතර දෙනෙකු පමණ ඉන්නවා. ඒ නිසා වේලාව ඉතිරි කිරීම සඳහා මගේ නම සඳහන් නොවුණත් කමක් නැහැ අනික් කරුණු ගැන කථා කරන්න. ඊළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, ඉන්පසු පිළිවෙළින් ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා සහ ගරු නවීන් දිසානායක මැතිතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, දැන් කථා කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මා සඳහන් කරන්නේ ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා සඳහන් කළ කාරණයත්, ඒ වාගේම මේ වන විට මහාමාර්ග අමාත්‍යාංශය විසින් මහාමාර්ග අමාත්‍යාංශයේ ඒ වාගේම මාර්ග සංවර්ධන අධිකාරිය සහ මගනැගුමේ 2015 ජනවාරි 08 වෙනිදාට කලින් කොන්ත්‍රාත්කරුවන්ට භිහ තිබුණු මුදල්, චෙක්පත් මගින් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මේ වන විට වවුචර් ද ලියා තිබෙනවා. මම හිතන විධියට මේක ඉතාමත්ම නීති විරෝධීයි. පාර්ලිමේන්තුවේ මේ අගමැතිවරයා සහ මේ කැබිනට් මණ්ඩලය සම්පූර්ණයෙන්ම වැරදි සහගත, ව්‍යවස්ථානුකූල නොවන, පිළිගත නොහැකි කණ්ඩායමක් හැටියට ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව දන්වා තියෙද්දී, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය මේ වාගේ ඉතාමත් කූට ලෙස කටයුතු කරනවා. මොකද, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට පත් කරපු මේ පුද්ගලයාත් අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභ වෙනත් අපරාධ සම්බන්ධවත්, මූල්‍ය වංචා සඳහාත් කටයුතු කරපු පුද්ගලයෙක් හැටියට සඳහන් වෙනවා. ඔහු තමයි දැන් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට වාඩි වෙලා තිබෙන්නේ. පසුගිය කාලය තුළ නොයෙක් විධියේ කොන්ත්‍රාත් ප්‍රදානයන් කර ඒ කාලේ ගෙවන්න බැරි වුණු අයට -අවුරුදු 6කින් ජනාධිපතිවරණයක් තියන්න තිබුණු එක හදිසියේ අවුරුදු 4කින් තියලා, ඒ කාල පරිච්ඡේදය තුළ ගෙවන්න බැරි වුණු අයට,- මුදල් ගෙවන්න ඔහු විසින් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ කාරණය කාට කියන්න ද කියලා මම දන්නේ නැහැ. තවමත් හරි ආණ්ඩුවක් පවත්වා ගෙන යන්න බැරි වෙලාවක, පාර්ලිමේන්තු බලය තිබෙන ඔබතුමන්ලා, මේ සම්බන්ධයෙන් රජයේ විගණකාධිපතිවරයා සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, - මම හිතනවා, ඔබතුමාට හෙට- අනිද්දා වන විට එය පත් කරන්න පුළුවන් කියලා,- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, ඒ වාගේම, කෝප් කමිටුව මගින් වහාම මේ පිළිබඳ පරීක්ෂණ කරන්නත් ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමා කියනවා, 2015 ජනවාරි 08වැනි දා සිට පසුගිය ඔක්තෝබර් 26වැනි දා දක්වා සිදු වූ සිදුවීම් පිළිබඳව සොයන්න ජනාධිපති කොමිසමක් පත් කරන්න ඕනෑ කියලා. මම එතුමාට කියනවා, පසුගිය ඔක්තෝබර් 26වැනි දා ඉඳලා මේ දක්වා මේ හොර ආණ්ඩුවෙන් වෙච්ච සියලුම කටයුතු පිළිබඳව සොයා බලන්නත් ජනාධිපති කොමිසමක් පත් කරන්න කියලා. ඒ විතරක් නොවෙයි, 2010 අගෝස්තු මාසයේ ඉඳලා වෙච්ච දූෂණ ගැන තමයි එතුමා බොහෝ අවස්ථාවලදී කථා කළේ කියන එකත් එතුමාට දැන් අමතකයි. එදා එතුමා කථා කරපු සමහර දේවල් අදත් අපට නැවත නැවත අහන්නට ලැබෙනවා. ඒ නිසා 2015 ජනවාරි මාසයේ 08වැනි දා ඉඳලා නොවෙයි, 2010 අගෝස්තු මාසයේ පාර්ලිමේන්තුවේ ඉඳලා සිද්ධ වෙච්ච සියලු දූෂණ අක්‍රමිකතා පිළිබඳව මේ කොමිසමට වාර්තා කරලා, ඒ සඳහා අවශ්‍ය පරීක්ෂණ කරන්න කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. යහ පාලනය වෙනුවෙන් පෙනී හිටපු අතිගරු ජනාධිපතිවරයාට මේ වෙලාවේවත් කරුණාව පහළ වේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මා ගෞරවය, ස්තුතිය පුද කරනවා. ඔබතුමා ඉතාමත්ම ශ්‍රේෂ්ඨ කර්තව්‍යයක් කළ කෙනෙක්. ලංකාවට පමණක් නොවෙයි, ලෝක ප්‍රජාවගේ ගෞරවයට, විශේෂයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩල රටවල් අතරින් ඉතාමත් කීර්තිමත් කථානායකවරයෙක් හැටියට ඔබතුමාගේ නමත් ඉතිහාසගත වෙනවා. මේ කූට උපක්‍රමයේදී, මේ වැරදුණු කුරුමානමේදී ඔබතුමා සත්‍යය වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳව ඔබතුමා ඉතිහාසගත වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

ගරු කථානායකතුමනි, දැන් මේ අවස්ථාව වන විට ආණ්ඩු පක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායම මේ පාර්ලිමේන්තු සභා ගැබට නොපැමිණ මේ සභාව මහ හැර ගොස් තිබෙනවා. හැබැයි, පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා විවිධ ප්‍රවෘත්ති සාකච්ඡා තියලා, මහජන රැස්වීම් පවත්වලා, උද්ඝෝෂණ පවත්වලා, විරෝධතා ව්‍යාපාර පවත්වලා, ඔබතුමාගේ රුවට සමාන පඹයින් හදලා ගිනි තියලා රටේ මතයක් හදන්නට හදනවා, "අපි පාර්ලිමේන්තු සභා ගර්භයට නොපැමිණෙන්නේ කථානායකතුමාට විරෝධයක් පළ කිරීමක් හැටියට" කියලා.

ගරු කථානායකතුමනි, උදය ප්‍රභාත් ගම්මන්පිල මහත්මයා ප්‍රකාශ කරන කූට ලේඛනය කෙසේ වුවත්, මේ කාර්යය පිටුපස්සේ, පාර්ලිමේන්තුවට නොපැමිණීම පිටුපස්සේ කූට උපක්‍රමයක් තිබෙනවා. ඒ කූට උපක්‍රමය තමයි ඔවුන් මේ පාර්ලිමේන්තු සභා ගර්භයට පැමිණියහොත් ඔවුන් සමඟ සිටින සැබෑ මන්ත්‍රීන් සංඛ්‍යාව ලෝකයම දැනගන්නවා. ඇත්ත වශයෙන්ම ඒ අය එළියට ගිහිල්ලා, ඒ අයත් එක්ක ඉන්නවා කියලා ප්‍රකාශ කරන මන්ත්‍රීන් ප්‍රමාණය සැබෑ ලෙසම ඒ අයත් එක්ක නැහැ. එම නිසා ඒක වසන් කර ගන්නට ඔබතුමාට පහරදීම උපක්‍රමයක් හැටියට පාවිච්චි කරනවා.

ඔබතුමා වාගේ මේ රටේ ශ්‍රේෂ්ඨ දේශපාලන චරිතයකට එසේ වැරදි අවලාද, අපවාද නැඟීම පාර්ලිමේන්තුවට පළමුවෙනි වතාවට පැමිණි පුද්ගලයෙක් හැටියට මම ඉතාමත්ම කනගාටුවෙන් හෙළා දකිනවා. ඒ වාගේම මම ඔබතුමාට ගෞරව කරනවා. ඔබතුමා අපේ ගෞරවය බලාපොරොත්තු වෙන, ගුණ වැණුම බලාපොරොත්තු වෙන කෙනෙකු නොවෙයි. නමුත්, අපි ඔබතුමාට ගෞරව කරනවා, කිසිදු තර්ජනයකට, ගර්ජනයකට යටත් නොවී ඔබතුමාගේ තනතුරේ රාජකාරි ඉටු කිරීමෙන් අප වැනි තරුණ දේශපාලනඥයන්ට, නවකයන්ට විශාල ආදර්ශයක් දීම ගැන.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්නට කැමැතියි, මේ සියල්ල සිදුවෙමින් පවතින අතරේ අපේ මන්ත්‍රීවරුන්ට විවිධ වරදාන, වරප්‍රසාද දෙන්නට කථා කරන බව. මටත් කථා කරලා තිබෙනවා ගරු කථානායකතුමනි. ඒ නිසායි මම කියන්නේ. මේක බරපතළ ප්‍රශ්නයක්. අපි රැස්වීමක ඉන්න කොට සමහර උදවිය දුරකථනයට කථා කරලා කියනවා, මිනිත්තුවකට කථා කරන්න එළියට එන්න කියලා. ගෙදර ගිහිල්ලා ඉන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. දුරකථනය විසන්ධි කරගෙන ඉන්න වෙන තත්ත්වයක් අපට උදාවෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමා අපේ ආරක්ෂාව ගැන බලන්නට ඕනෑ. මේ සෙල්ලම කරන්නේ, මීල මුදල් දෙන්න කථා කරන්නේ, තනතුරු දෙන්න කථා කරන්නේ රටට ආදරයටද, පැවති ආණ්ඩුව ගෙන ගිය වැඩ පිළිවෙළ රටට අහිතකර නිසා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නට අවශ්‍ය නිසාද, එහෙමත් නැත්නම් මේ උදවිය සම්බන්ධව එක පිට එක විභාග වෙන්නට තිබුණු නඩුවලින් වසන් වෙන්නට යම් යම් වරදාන, වරප්‍රසාද දීලා අප ගන්නට උත්සාහ කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා ගරු කථානායකතුමනි. මේක රටේ ජනතාවට අපි මේ සභාවේදී කියන්නට ඕනෑ.

ඒ නිසා "කරුණාකරලා අපිව තනතුරුවලට, සල්ලිවලට ගන්න උත්සාහ කරන්න එපා. අපේ කණ්ඩායමේ ඉන්න කිසි කෙනෙක් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව, ජන සම්මතවාදයට එරෙහිව ඒ පාවා දීම කරන්න සූදානම් නැහැ" කියා අපි සියලුදෙනා වෙනුවෙන් ඒ අයට මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මට ලබා දුන් අවස්ථාව ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාවෙන් කියැවුණු කරුණු දෙකක් සම්බන්ධයෙන් යමක් කීම මගේ යුතුකමක්ව තිබෙනවා. විශේෂයෙන් කූට ලේඛන ගැන නැවතත් කථා කළා. මම කියන්න කැමැතියි, මේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ප්‍රමුඛ සියලුම නිලධාරීන් කෙරෙහිත්, ඒ වාගේම හැන්සාඩ් සංස්කාරකතුමිය ප්‍රමුඛ සියලුම නිලධාරීන් කෙරෙහිත් මගේ පූර්ණ විශ්වාසය තිබෙන බව. විශේෂයෙන්ම මම ඒ අය ගැන ආඩම්බර වෙනවා. ඒ නිසා යම් කිසි දෙයක් තිබෙනවා නම්, චෝදනා කරන්න අවශ්‍ය නම් නීත්‍යානුකූලව චෝදනා කරන්න පුළුවන්. ඒක අපට බේරා ගන්න පුළුවන්.

දෙවැනි කරුණ, පඹයින් පිච්චීම ගැන ඔබතුමා කථා කළා. පඹයින් පිච්චීම හොඳයි. මම ගමේ ඉඳලා ආ කෙනෙක් වශයෙන් අහලා තිබෙනවා, පඹයින් පිච්චීම වස් දොස් යන්න හුහක් හොඳයි කියලා. ඒ නිසා තවත් පිච්චුවත් මට ප්‍රශ්නයක් නැහැ.

මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Mr. Speaker, today is a day in which we have a very awkward situation, where the purported Government in this country has actually decided not to attend Parliament. It is not unusual for the Oppositions in Parliaments across the world to sometimes boycott Parliaments, because they have disagreements with the majority or the Government of the day. But, you never get a situation in which those claiming to be the Government actually boycott Parliament. So, this is really an unusual situation. It shows that this purported Government is an absolute sham because it is unable to prove through a majority that it is actually a Government.

The history of Parliamentary democracy has shown that the job of a Speaker is a very difficult job. If you take the British Parliamentary history, normally, the Speaker was accompanied on the first day by two people to the Speaker's Chair as it was a job or a responsibility that somebody took up reluctantly. If you again look at the British Parliamentary history, you would see that from the year 1300, many Speakers had finally lost their lives since they had to stand up to the Executive or the King of the day. That tradition still continues in the British Parliament and it continues in our Parliament too in a different way, where two Hon. Members accompany the Speaker to the Chair. It is a job that most Members of Parliament do not envy, because if you look at the history of the Speaker's job, you would see that it entails standing up to the Executive, whichever form of Executive it might be across the world. Parliament is supreme and independent from the Executive and that tradition will always have to be maintained, if there is going to be good governance and democracy in a country.

Sir, you have stood up to the Executive in the recent past. Parliament has been devalued by the appointment of a new Prime Minister and a Government which has been

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

unable for one month to prove its majority. But, on the 14th and again on the 16th of November, on a Motion proposed by the JVP in the Parliament of Sri Lanka, the vast majority of Members of Parliament voted that they had no confidence in the Government that had been appointed. The Standing Orders were suspended in taking that Vote. That was not unusual, because Standing Orders are suspended from time to time. They were suspended by a majority Vote in Parliament; a majority Vote in Parliament was taken by suspending the Standing Orders, given the grave situation that had arisen.

The Standing Orders also provides for taking a Vote and the Vote can be taken as a "Voice Vote". Primarily, it is taken as a Voice Vote. Then, if a Division is called for, in those circumstances, it is possible to take the Vote row by row, by name or by using the electronic voting system, as we do now. But, unfortunately, the Government of the day did not permit a proper Vote and at the Vote, they did not even call for a Division. Therefore, a Voice Vote had to be taken under those very difficult circumstances, which was subsequently proven by the signatures of 122 Members of Parliament to say that they had no confidence in the Government that had been sworn in by the President.

Sir, here, the Parliamentary history is repeating itself. Sir, I know that you will be embarrassed, but we have to say that you have stood up - you came from the private sector and you have had a clean record; there has not been a single financial or other allegation against you - and proved your mettle when you ruled that there was no Government after that Parliamentary Vote.

Sir, it was a sad day where we saw the abuse of public property in this Parliament. It was on television; it was on social media. I join all other Hon. Members of Parliament who have expressed their views that action must be taken against those who have abused public property, particularly Members of Parliament, who should set an example for other citizens of this country.

Sir, it is not only that, but the behaviour of the Members of Parliament is also of concern. We heard today that some Members of Parliament have been offered financial incentives for changing their allegiances. That is unacceptable. But, we have also heard, from time to time, wrong stories about Members of Parliament. This crisis has also shown that there are Members of Parliament who stand up for principle. I want to pay tribute particularly to those Members of Parliament and to the small Parties representing interests of ethnic minorities of this country in Parliament, which have stood up for principle and safeguarded Parliamentary democracy and good governance. We salute them for the stand that they have taken. Sir, you will go down in history for the stand that you have taken.

I would call upon the President to uphold the majority view of Parliament. Sri Lanka cannot continue without a Government, because there are serious repercussions for the ordinary citizens of this country. Finally, I would like to thank the Parliamentary staff too for operating under very difficult circumstances. When they get an Order from the Executive, they wonder how they should act. But, the Parliamentary staff had stood its ground and also upheld the Practices, the Privileges and the Standing Orders of Parliament and I hope that tradition will continue even beyond our generation.

Thank you, Sir, for giving me the time.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

Sir, Abraham Lincoln, a very famous leader of the United States, said “Government of the people, by the people, for the people, shall last forever.” I believe the test of democracy is the institutions and the leadership that these institutions have.

In Sri Lanka, we have had many occasions where democracy had been threatened. In the last one month also, we have seen a huge threat to the democratic and value-based system that Sri Lanka has enjoyed for the last 70 years. I have seen on many occasions how individuals have withstood the pressure and also succumbed to that pressure.

Sir, I know, during the last one month, there was a lot of pressure on you personally; you have been told many things; your name has been maligned and certain remarks have been made about you, which are not objective, but entirely subjective. You have acted for the best interests of the majority of the Parliamentarians in this House - the 122 Members of Parliament - that is very clear. I say thank you. Sir, you have withstood a great deal of pressure and have also stood by the principle of acting in our interest; you have acted in a very bold manner, a very decisive manner and you stood with the MPs of the Opposition.

As you know, Parliament is a temple of democracy and in this temple, a lot of dirty things happened. I was shocked to see all that in my Parliamentary career of 18 years, which is not very long. There are Parliamentarians here with longer careers. The Hon. John Amaratunga, for example, I think is going on his fortieth year in Parliament now and the Hon. Lakshman Kiriella is on his 25th year. So, we are very young to Parliamentary democracy - 18 years is not a long time. But, on that particular day, the temple of democracy was invaded by a group of thugs who came up to the Speaker’s Chair; tried to demolish the Speaker’s Chair; threw water at the Speaker’s Chair and also threw "*miris kudu"* at the police officers. It is indeed a shameful day for democracy in Sri Lanka.

So, what you did that day maybe very unusual. You came with a police escort here and held a Vote. Some people may not agree with that procedure, but certainly the principle of democracy was upheld by you. So, thank you very much for that.

I have seen in my life very bold leaders. For example, my late father, the Hon. Gamini Dissanayake was a very bold leader. He took a lot of risks - sometimes

unnecessary risks. The Hon. Lalith Athulath Mudali, whom I also worked with, was also a very bold leader. But, that day, what I saw in you was much bolder, much more courageous than many of the leaders that I have worked with. You are a very proud and distinctive product of Ananda College and I am sure your school is also saying, "Hon. Speaker, thank you very much for saving democracy in Sri Lanka."

Hon. Speaker, there is another statement which says, "cometh the hour, cometh the man". The particular moment of time was a destruction of democracy in Sri Lanka. I must thank the Judiciary also for acting independently. I must thank you also for acting independently because, for the sake of argument, if the Government had a majority, you would have acted on the best interests of the majority; that is the Government. The fact of the matter is, they have not got a majority. That is why they have not come here. They have abandoned their duties as Parliamentarians, in my opinion, under the guise that you have not followed the proper procedure. But, actually, we know that you did follow the proper procedure. So, it is very important that you as the Speaker communicates well with the people of this country about your actions, because there are a lot of misinterpretations being given about the particular role you had to play. So, I would like to thank you once again for standing with us, as a gentleman of the old school, a man who has stood very firmly on principle, as a man of integrity and honesty - indeed we are very proud to be associated with you.

Also, I would like to say on a personal note, you have lost a great deal in your life. You have lost a daughter two years ago at the age of 40. I am sure wherever she is, she is looking down on you and she is saying, "Thank you, Hon. Speaker."

Thank you very much.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, පසු ගිය අවුරුදු තුනහමාර තුළම ඒකාබද්ධ විපක්ෂයට තමයි ඔබතුමා පාර්ලිමේන්තුවේ වැඩිම කාලයක් වෙන් කළේ. අපි පසු පෙළේ සිටිමින් ඒ සම්බන්ධයෙන් ඔබතුමාට චෝදනා කළා. හැබැයි, අද ඒ කණ්ඩායම ඔබතුමාගේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. නමුත්, පසු ගිය කාල වකවානුව තුළ ඔවුන් කටයුතු කළේ කොහොමද කියලා හෘදය සාක්ෂියට එකඟව කල්පනා කරන්න, එහෙම නැත්නම් හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න කියන කාරණාව මම ඔවුන්ට කියනවා.

පසු ගිය කාල වකවානුව තුළ මාධ්‍ය තුළින් පෙන්නුවේත් පාර්ලිමේන්තුව ආරම්භයේ තිබුණු ඒකාබද්ධ කණ්ඩායමේ ගෝරිය පමණයි. අද ඔවුන් ඔබතුමාගේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට විරෝධය දැක්වූවත් පාර්ලිමේන්තු සම්ප්‍රදායය අනුව සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව ගත යුතු ක්‍රියාමාර්ග මේ දක්වා අරගෙනත් නැහැ. ඔබතුමා කිව්වා වාගේ ඔබතුමාට එරෙහිව ඔවුන් තවමත් විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා නැහැ. එම විශ්වාස භංග යෝජනාව ලභි ලභියේ ගේන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ ඊනියා ආණ්ඩුවේ කණ්ඩායම ආණ්ඩුව ශක්තිමත් කරගන්න කටයුතු කරන්න කණ්ඩායම් කිහිපයක් හදමින් පවතිනවාය කියලා අපි පසු ගිය දිනක පුවත් පත් නිවේදනයක දැක්කා. ඒ පළමුවැනි කණ්ඩායම තමයි පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමේ කණ්ඩායම. ඒ තමයි, අර මිරිස් කුඩු කල්ලිය සහ වතුර ගැසීමේ කල්ලිය. ඒ දෙවැනි කණ්ඩායම තමයි, පාර්ලිමේන්තුවේ සංයුතිය, එහෙම නැත්නම් සංඛ්‍යාව වැඩි කර ගැනීමේ කමිටුව. ගරු කථානායකතුමනි, මේ කියන කමිටුවේ උදවිය තමයි මුදල් සහ වෙනත් වරප්‍රසාද ලබා දෙන්න යෝජනා කරමින් මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ට නිතර කරදර කරන්නේ. මම ඔබතුමාට යෝජනාවක් කරනවා. "පාර්ලිමේන්තුවේ සංයුතිය වැඩි කරන කණ්ඩායම" කියන මෙන්න මේ කණ්ඩායම කවුද කියලා දැන් ලිඛිතව එළියට දාලා තිබෙනවා. ඉතාම ධනවත් අය, පසු ගිය කාලයේ හොඳට මං කොල්ල කාපු උදවිය ඒකේ ඉන්නවා. අල්ලස් දීමෙන් හෝ වෙනත් දේවලින් දීමෙන් මන්ත්‍රීවරු බිලී බා ගැනීමට කටයුතු කිරීම වෙනුවෙන් -අල්ලස් දීම වෙනුවෙන්- ඔවුන් වහාම අත් අඩංගුවට ගන්න කටයුතු කරන්න කියලා මා යෝජනා කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මතක් කළ කාරණය පිළිබඳව මම සන්තෝෂ වෙනවා. මම විපක්ෂයට වැඩි කාලයක් ලබා දෙනවා කියලා මා කථානායක ධුරයෙන් ඉවත් කරන්න කියලා කොළයකට අත්සන් කරපු කාලයකුත් තිබුණා. මට මේ අවස්ථාවේ ඒකත් මතක් වෙනවා.

මීළඟට ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මා සතුටු වෙනවා.

2015 ජනවාරි 8වැනි දා පත් වුණු යහ පාලන රජය, අවුරුදු තුනහමාරක් ගිහිල්ලා, සිරිසේන ජනාධිපතිවරයාගේ කුමන්ත්‍රණකාරී ක්‍රමවේදයක් තුළින් බලය අහිමි වන තෙක් කිසිදු රාජ්‍ය සේවකයකුට බලහත්කාරකම් කරලා, කිසිදු රාජ්‍ය ආයතනයකට බලෙන් පැනලා කිසිදු කඩා කප්පල්කාරී කටයුත්තක් නොකරපු රජයක් විධියට අපි දැක්කා; අපි එසේ විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි.

අපේ රජය යම් තාක් දුරකට හෝ රාජ්‍ය සේවයට සාධාරණයක් ඉටු කරපු රජයක්. මම ඔබතුමාගේ අවධානය මේ කාරණයට යොමු කරනවා. මේ ඊනියා ආණ්ඩුව පත් වෙලා පැය 24ක් යන්න කලින් ජාතික රූපවාහිනියට පැනලා, එහි ඉන්න සේවකයන් බිය වද්දලා, මැර කණ්ඩායම් යොදාගෙන ජාතික රූපවාහිනිය ඇතුළේ යකා නැටුවා.

ඒ වාගේම, මේ වන විට තවත් දැඩි අවදානමක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ ඊනියා ආණ්ඩුවේ විමල් වීරවංශ කියන

[ගරු හේෂා විතානගේ මහතා]

අමාත්‍යවරයා අමාත්‍යාංශයට වෙලා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ හැම ප්‍රදේශයකම ඉන්න ස්ථිර නොවූ අභිංසක සේවකයන් ගෙන්වලා, ඔවුන් බිය ගන්වලා, සේවයෙන් පහ කරන බවට තර්ජනය කරමින් මහා විකාරයක් කරනවා. ජනාධිපතිවරයෙක් රටේ ජනතාව බලාගන්නේ නැති වෙලාවක, මේ රටේ ජනතාව ගැන අවධානයෙන් ඉන්න ආණ්ඩුවක් නැති වෙලාවක, මේ රටේ අභිංසක මිනිසුන්ගේ වගකීම යම්තාක් දුරට ගන්න පුළුවන් නායකයා විධියට, පාර්ලිමේන්තුවේ අපේ ආරක්ෂකයා විධියට කටයුතු කරන ඔබතුමාට මම කියනවා, මේ විමල් වීරවංශ මහත්මයලා කරන මේ කැත වැඩ -අභිංසක රාජ්‍ය සේවකයන් බිය ගන්වලා, ඔවුන් සේවයෙන් නෙරපා හරින්න ගන්න ක්‍රියා මාර්ග- වෙනුවෙන් මැදිහත් වෙන්න කියලා. නීත්‍යානුකූලව මේ රටේ ආණ්ඩුවක් නැහැ කියලා ඔබතුමා ප්‍රකාශයට පත් කරලා තිබෙද්දී මේ සිදුවන ක්‍රියාදාමය නතර කරන්න ක්‍රියා මාර්ග ගන්න කියලා මා ඉල්ලනවා. ඒ වාගේම, මේ දවස්වල මුදල් අවභාවිත කරමින් මේ රටේ රාජ්‍ය සේවකයන් විශාල පිරිසකගේ සේවය ස්ථිර කරලා මැතිවරණයට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමක අමාත්‍යාංශ නිරත වෙලා ඉන්නවා. ඒ නිසා මම නැවත වතාවක් ඉල්ලනවා, මේ රටේ ජනාධිපතිවරයාගේ ඇස් පිය වෙලා තිබෙන වෙලාවේ මේ ගැන අවධානය යොමු කරලා, රටේ අභිංසක මිනිස්සු වෙනුවෙන් ඔබතුමාට ගතහැකි පියවර අරගන්න කියලා. මේ පවතින තත්ත්වය යථා තත්ත්වයට පත් වෙන කල් නිවැරැදි තීන්දු ගන්න තැනට යොමු වෙන්න කියලා ඉල්ලනවා. පළමුවැනි වතාවට පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයකු විධියට මා මේ ඉල්ලීම කරනවා.

පසු ගිය දිනවල මේ පාර්ලිමේන්තුවේ හැසිරිව්ව ඒ ක්‍රියා කලාපය මුළු ලෝකයම දැක්කා. අද වෙනකල් සමාජයට පණිවුඩයක් දෙන්න අපට බැරි වුණා, මේ ක්‍රියාදාමයට හවුල් වෙච්ච උදවිය වෙනුවෙන් අපි මොකක්ද කරන්නේ කියලා. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ තිබෙන උත්තරීතර භාවයට හානි කරමින්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

විධියට හැසිරිව්ව ඒ මන්ත්‍රීවරුන් වෙනුවෙන් ගන්නා ක්‍රියා මාර්ගය රටට හෙළි කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරනවා නම් ඒක වැදගත් වෙයි. ඒ වාගේම, ඒක මේ රටට ආදරය කරන මිනිස්සු බලාපොරොත්තු වෙන ප්‍රකාශයක් කියලාත් මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන පොලිස් පරීක්ෂණ පැවැත් වෙමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මා තුළ නම් ඒ ගැන පෞද්ගලික ක්‍රෝධයක්, තරහක් නැහැ. නමුත්, පොලිස් පරීක්ෂණ අවසන් වුණාට පස්සේ ඒ අවශ්‍ය පියවර ගන්නම්.

ඊළඟට, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)

ස්තුතියි, ගරු කථානායකතුමනි. මෙම පාර්ලිමේන්තුවේ සිටින ලාබාලම මන්ත්‍රීවරිය හැටියට මා ඔබතුමාගේ හැසිරීම සහ ඔබතුමා මෙතෙක් කාලයක් මේ පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිළිබඳව ප්‍රථමයෙන්ම සිරස නමා ආචාර කරනවා. මොකද, ඔබතුමාගේ මේ හැසිරීම දැන් නොවෙයි අපට බලපාන්නේ. තව අවුරුදු කිහිපයකින් අනාගතයටයි එය බලපාන්නේ. දැන් අපට ඒ ක්‍රියාවේ තිබෙන වටිනාකම සමහරවිට නොතේරෙන්නත් පුළුවන්. හැබැයි, තව අවුරුදු ගණනකින් මේ පාර්ලිමේන්තුවට පත් වන ඊළඟ පරම්පරාවට ඔබතුමා ආදර්ශයක් ලබා දුන්නා.

ඊළඟට, මේ කාරණය ගැනත් මා සඳහන් කරන්න කැමැතියි. ඊයේ-පෙරේදා දවසක - ප්‍රභාකරන්ගේ උපන් දිනය දවසේ - "අද දෙරණ" website එකේ news එකක් තිබුණා, "ප්‍රභාකරන්ගේ උපන් දිනය යාපනයේ කොටි ජයටම සමරයි" කියලා. ඊට විනාඩි කිහිපයකට පසුව ඒ news එකම නැවතත් හරිගස්සලා, "යාපනයේ විශ්වවිද්‍යාලයේ උපන් දිනය සමරයි" කියලා දමා තිබුණා.

ඒ කියන්නේ, ඒ news එක මුලින් දැම්මා; කාගෙන් හෝ telephone call එකක් ආවා, බය වුණා; අනෙක් අතට news එක වෙනස් කළා. "දෙරණ" මාධ්‍ය ජාලය ඇතුළු සියලුම පෞද්ගලික මාධ්‍ය ජාලවලටයි මම මේ චෝදනාව එල්ල කරන්නේ. ඇත්තටම අපිත් එක්ක ඉන්න සමාජ මාධ්‍ය ජාල ගැන නොවෙයි මම මේ කියන්නේ. හැබැයි, මේ වෙලාවේ බොරු ආණ්ඩුවට -ඊනියා ආණ්ඩුවට- කඩේ යන රාජ්‍ය මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යවලින් මම අහනවා, "දැන් සනීපයිද?" කියලා. අවුරුදු තුනක් තිස්සේ අපේ ආණ්ඩුව තිබුණා. නමුත් කවදාවත් මේ කිසිම මාධ්‍යයකට බලපෑමක් එල්ල කළේ නැහැ, "අරක දාන්න. මේක දාන්න. අහවල් විධියට දාන්න. මේක වෙනස් කරලා දාන්න" කියලා. එහෙම කියලා telephone calls ආවේ නැහැ. ඇත්තටම ඒ අය මේ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මේ විධියට වහල් භාවයට පත් වීම පිළිබඳව මේ සියලුම මාධ්‍ය ලජ්ජා වෙන්න ඕනෑ. දැනුත් ස්වාධීන රූපවාහිනිය සහ රූපවාහිනියේ විකාශය වන live videos බැලුවොත් එහෙම ඒවායේ විකාශය වන්නේ මේ පාර්ලිමේන්තුව සජීවී විකාශය නොවෙයි. බොරු ආණ්ඩුවේ ඉන්න උදවිය පහළ ඉඳගෙන කථා කරන සජීවී විකාශය තමයි ඒවායේ විකාශය වෙන්නේ. ඇත්තටම මේ විධියට කවදාවත් මේ රට ගොඩ ගන්න බැහැ; මේ රට කවදාවත් හදන්න බැහැ. මේ මාධ්‍ය ඇතුළු රටේ භාගයක් ජනතාව මේ විධියට මහින්ද රාජපක්ෂ - සිරිසේන හවුල් ආණ්ඩුවේ වහල්ලු බවට පත් වෙලා සිටින තෙක් මේ වහල්භාවයෙන් මිදෙන්න බැහැ. ඒ අයගේ ළමයින්ටවත් මේ වහල්භාවයෙන් මිදෙන්න බැහැ. මම මේ මාධ්‍යවලට කියා සිටිනවා, මෙච්චර කාලයක් -අවුරුදු දහයක් තිස්සේ- චප්ප කරලා, කුඩු කරලා තිබුණු ඔබතුමන්ලාගේ කශේරුකාවට අපි යන්තම් ලීයක් තබලා ඇණ ටිකක් ගහලා කොන්ද කෙළින් තියා ගන්න අවස්ථාවක් ලබා දුන්නා. දැන් ලජ්ජා වෙන්න, දැන් ලජ්ජා වෙන්න. ඇණ ටික ගහලා දීපු ලීය අයින් කරලා, නැවතත් අර විධියටම දෙකට තුනට නැමිලා, මේ විධියට කඩේ යන්න සිදු වීම ගැන ඔබතුමන්ලා සියලු දෙනාම ලජ්ජා වෙන්න කියලා මම මේ වෙලාවේදී මාධ්‍යවලට කියනවා. මොකද, ඔබතුමන්ලාගෙන් මේ වාගේ තත්ත්වයක් අපි බලාපොරොත්තු වුණේ නැහැ. 2015 ජනවාරි මාසයේ 08 වැනිදා ඡන්දය දීපු සියලු ජනතාව අද ඔබතුමන්ලාට ඇඟිල්ල දිගු කරලා අහනවා, "මේ හැසිරීම මොකක්ද?" කියලා. ඒ නිසා මාධ්‍ය මීට වඩා ගොඩක් වග කීමෙන් වැඩ කරන්න ඕනෑ. ඔබතුමන්ලාට මේ විධියට කඩේ යන්න, වහල්ලු වෙලා ඉන්න පුළුවන් තව උපරිම මාසයයි.

ඒ ගොල්ලන් කියනවා, "අපි මේ පාර්ලිමේන්තුවට එන්නේ නැත්තේ කථානායකතුමාගේ හැසිරීම" නිසායි කියලා. නමුත් මේ පාර්ලිමේන්තුවට එතුමන්ලා එන්නේ නැත්තේ, ඔවුන්ට බහුතරය නැති නිසායි. දිගටම මේ විධියට එතුමන්ලා පාර්ලිමේන්තුවට එන්නේ නැතිව ඉන්නවා නම් මම නම් ඒකට හරි කැමතියි. මෙච්චර කාලයක් අපි මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

-ටිකක් එක්ක, මිනිස්සු ටිකක් එක්ක නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ අපි මෙච්චර කල් ඉඳලා තිබෙන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

-ටිකක් එක්ක. සාමාන්‍යයෙන් ලෝකයේ වැදගත් පාර්ලිමේන්තු තිබිය යුත්තේ මේ විධියටයි. මේ ගරු සභාවේ අර කට්ටිය ඉඳගෙන හිටියා නම් අද කිසිම කෙනෙකුට මෙහෙම කථා කරන්න පුළුවන් වෙයිද? ඇත්තටම, හැම දාම මෙහෙම තිබෙනවා නම් හොඳයි. මේ විධියට හැම දාම තිබෙනවා නම් අපිට හරි ලස්සනට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්; වැදගත් විධියට ඔබතුමාට මූලාසනයේ ඉඳගෙන ඉන්න පුළුවන්; මේ සේවකයන්ට වැදගත් විධියට ඉඳගෙන ඉන්න පුළුවන්. අද අර කට්ටිය මේ ගරු සභාවේ ඉඳගෙන හිටියා නම් එහෙම වෙත්ධාරිතුමන්ලා දෙදෙනාට සෙංකෝලය තබන ස්ථානය ළඟ හිටගෙන එය ආරක්ෂා කරන්න වනවා.

ඔබතුමා වටේ පොලිසියෙන් ඉන්න ඕනෑ. මොකක්ද මේ? වැදගත් යෝජනාවක් සම්මත කර ගන්න බැහැ; මොකුත් මේක ඇතුළේ කථා කරන්න බැහැ; අර පැත්තෙන් අසභ්‍ය වචන කියනවා; කෑ ගහනවා. ඇත්තටම ඉතින් මේ වෙච්ච දේ හොඳයි. රටේ මිනිසුන්ට පණිවුඩයක් ගියා. මෙච්චර කාලයක් මේ පාර්ලිමේන්තුවේ වැඩ කඩාකප්පල් කරලා, මේ පාර්ලිමේන්තුව සත්තු වත්තක් බවට පත් කළේ, බලාගෙන යනකොට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ මේ සත්තු වත්තේ සත්තු ටික කියන එක ඉතාමත් හොඳට මේ රටේ මිනිසුන්ට දැන් ඔප්පු වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ සිටින ළා බාල මන්ත්‍රීවරියක් විධියට ඔබතුමාට නැවත නැවතත් මා සිරස නමා ආචාර කරනවා. ඔබතුමාගේ මේ හැසිරීම, ඔබතුමාගේ මේ ප්‍රජාතන්ත්‍රවාදය, අනාගතයට, ඇත්තටම අපට දීපු ලොකු අවස්ථාවක්. අනාගතයේ දී අපේ ළමයෙකුට හරි කියන්න පුළුවන්, අහවල් දවසක කරු ජයසූරිය කියලා මේ වාගේ කථානායකවරයෙක් පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා කියලා. රටේ ජනාධිපති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

රටේ බොරු අගමැති කෙනෙක්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

රට පොඩ්ඩක් හරි ස්ථාවරව පවත්වාගෙන යන්න හැකියාව ලැබුණේ, කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරපු කථානායකවරයෙක් නිසා කියලා කවදා හරි දවසක අපේ ළමයෙකුට හරි කියන්න අපට පුළුවන්. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(මාණ්පුමිකු නිසාට් පතියුදීන්)
(The Hon. Rishad Bathiudeen)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව සභානායකර් අවර්කළේ, இன්று நாங்கள் நீதிමන්ත්‍රණයේ මූලම් මීණ්ඩුම් පාරාළුමන්ර උරුප්පිනර් කළාකියිරුක්කින්රෝම්. நீங்கள் இந்தச் சபையில் கடந்த 14ஆம், 15ஆம், 16ஆம் திகதிகளில் உங்களுடைய உயிரைக் கூடப் பொருட்படுத்தாமல் மிக நேர்மையாகவும் தைரிய மாகவும் நடவடிக்கைகளை முன்னெடுத்தீர்கள். அந்தச் செயற்பாட்டை மிகுந்த கௌரவத்துடன் நான் பார்க்கின்றேன். සභානායකර් என்ற வகையில் இந்த உயர் சபையிலே எவ்வாறு செயற்பட வேண்டுமோ, அவ்வாறு நீங்கள் செயற்பட்டீர்கள். அநேக பாராளுமன்ற உறுப்பினர்களின் விருப்பத்துக்கு ஏற்ப மிக நேர்மையாகவும் அச்சமில்லாமலும் தைரியமாகவும் செயற்பட்ட உங்களுக்கு நான் எனது கட்சி சார்பாகவும் எனது வாக்காளர்கள் சார்பாகவும் இந்த இடத்திலே பாராட்டுக் களையும் வாழ்த்துக்களையும் தெரிவிக்கக் கடமைப் பட்டிருக்கின்றேன்.

அன்று இந்தச் சபையிலே எங்களுடைய கண்களுக்கு முன்னாலேயே பொலிஸார்மீது மிளகாய்த் தூள் கலந்த தண்ணீர் வீசப்பட்டது. அதேநேரம், செயலாளர் நாயகம் உட்பட அதிகாரிகள் அசௌகரியத்துக்குள்ளானார்கள். ஒருசில பாராளுமன்ற உறுப்பினர்களின் இவ்வாறான அநாகரிகமான நடத்தையானது மிகவும் வருந்தத்தக்கதாகும். நான் இந்தப் பாராளுமன்றத்தைக் கடந்த 17-18 வருடங்களாகப் பிரதிநிதித் துவப்படுத்துகின்றேன். இக்காலகட்டத்தில் இவ்வாறான ஒரு செயற்பாட்டை நான் என்றுமே பார்த்ததில்லை. ஒருசில கற்ற பாராளுமன்ற உறுப்பினர்கள்கூட அவர்கள் கற்றவர்களா என்று நாங்கள் சிந்திக்கக்கூடிய அளவுக்கு நடந்து கொண்டார்கள். எதிர்காலத்தில் பாராளுமன்றத் தேர்தலில் போட்டியிடுகின்ற வேட்பாளர்கள் ஆகக்குறைந்தது பட்டதாரித் தகைமையையாவது கொண்டிருக்க வேண்டும் என்ற ஒரு சட்ட ஏற்பாட்டை இந்தப் பாராளுமன்றத்தினூடாக எல்லாக் கட்சிகளும் சேர்ந்து மேற்கொள்ள வேண்டும் என்று வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன். அன்று ஒரு சில பாராளுமன்ற உறுப்பினர்கள் நடந்துகொண்ட விதத்தை யாரும் ஏற்றுக்கொள்ள முடியாது. இங்குள்ள அதிகாரிகளைப் பொறுத்தவரையிலே, அவர்கள் அப்பாவிகள்; கட்சி சார்பில்லாமல் செயல்படுகின்றவர்கள். பொலிஸாரும் அதேபோல்தான் செயற்படுகின்றார்கள். சபையினுள் எங்களுக்குக் குடிப்பதற்குத் தண்ணீர் வேண்டுமானால் அதனைக் கொண்டுவந்து தருகின்ற மற்றும் சேவைகளைச் செய்வதற்காக எங்களிடம் ஓடோடி வருகின்ற ஊழியர்களும் அன்று தாக்கப்பட்டமையை இந்த இடத்திலே மனவருத்தத் துடன் தெரிவித்துக்கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, அன்றிலிருந்து இன்றுவரை நீங்கள் உங்களுடைய கடமையை மிக நேர்மையாகச் செய்து கொண்டிருக்கின்றீர்கள். ஆனால், இன்று சிலர் நாடு பூராகவும் உங்களுக்கு அவப்பெயரை ஏற்படுத்துவதற்காகச் செயற்பட்டு வருகின்றார்கள். நீங்கள் அதற்காக அச்சப்படத் தேவையில்லை. என்னுடைய அரசியற் பயணத்தை அகதி முகாமிலிருந்து ஆரம்பித்த நான், நேர்மையாகச் செயற்பட்டு வருகின்றபோதிலும், நான் செய்யாத குற்றங்களை என்மீது சுமத்தி என்னை மிக மோசமாக விமர்சிக்கின்றார்கள். என்றாலும், நான் முன்வைத்த காலைப் பின்வைக்காமல் அத்தனை சவால்களையும் தாண்டி என்னைச் சார்ந்த மக்களுக்காகப் பணியாற்றி வருகின்றேன். ஆகவே, கௌரவ சபாநாயகர் அவர்களே, உங்களை யாரெல்லாம் விமர்சிக்கின்றார்களோ, அவர்கள்தான் நிச்சய மாகத் தோற்றுப் போவார்களே ஒழிய, உண்மை ஒருபோதும் தோற்காது என்பதை இந்த இடத்திலே கூறிக் கொள்கின்றேன்.

இந்தச் சந்தர்ப்பத்திலே அதிமேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களிடத்திலே மிக அன்பாக நான் சில விடயங்களைத் தெரிவிக்க விரும்புகின்றேன். இந்த நாடு

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

ඉර් අළගාන නාටු. இந்த நாட்டிலே எல்லா வளங்களும் நிறைந்து காணப்படுகின்றன. நானும் இந்த நாடு முன்னேற வேண்டுமென்று ஆசைப்படுகின்றவர்களில் ஒருவன். இந்த நாட்டின் பொருளாதார வளர்ச்சிக்காக, இந்த நாட்டின் சுற்றுலா வளர்ச்சிக்காக, இந்த நாட்டில் வறுமை போக்கப்பட வேண்டும் என்பதற்காக நானும் பாடுபட்டிருக்கிறேன். நாட்டிலே நடந்த யுத்தத்தின் கோரம் ஓய்ந்து முஸ்லிம்கள், தமிழர்கள், சிங்களவர்கள், கத்தோலிக்கர்கள் என்ற பேதமில்லாமல் எல்லோரும் ஒன்றாக "இது எமது நாடு" என்ற தோரணையிலே வாழவேண்டுமென்று ஆசைப்பட்டவன் நான். 1990ஆம் ஆண்டு எனக்கு 18 வயதாக இருந்தபோது, நானும் என்னுடைய சமூகத்தைச் சேர்ந்த சுமார் ஓரிலட்சம் மக்களும் எந்தவொரு காரணமும் இல்லாமல் விடுதலைப் புலிகளினால் வடக்கிலிருந்து வெறுங்கையோடு வெளியேற்றப்பட்டோம். அவ்வாறு வெளியேற்றப்பட்டு 19 வருடங்கள் அகதி முகாம்களில் இருந்த பிற்பாடு, எங்களுடைய இராணுவ வீரர்களின் தியாகங்களுக்குப் பிறகு 2009ஆம் ஆண்டு எமது மக்களுக்குச் சொந்த மண்ணிலே போய்க் குடியேறக்கூடிய வாய்ப்பு ஏற்பட்டது. நான் அகதி முகாமிலிருந்தபோதுதான் பாராளுமன்ற உறுப்பினராகத் தெரிவு செய்யப்பட்டேன்.

நாட்டில் சுற்றுலாத்துறை உட்பட நாட்டினுடைய பொருளாதாரம் மற்றும் நமது எதிர்காலம் கடந்த ஒரு மாத காலத்திற்குள் கேள்விக்குறியாகி இருக்கின்றது. நான் இன்று நண்பகல் 12 மணியளவில் ஓர் அரபு நாட்டின் தூதுவரைச் சந்தித்தேன். "எங்களுடைய நாட்டவர் உங்கள் நாட்டில் நிறைய முதலீடுகளைச் செய்ய எண்ணியிருந்தனர். ஆனால், இந்தச் சூழலில் அவ்வாறான முதலீடுகளை வியட்நாமில் மேற்கொள்வது பற்றிச் சிந்திக்கின்றார்கள்" என்று அவர் சொன்னதை இந்த இடத்தில் மிக வேதனையோடு சுட்டிக் காட்டுகின்றேன்.

அதிமேதகு ஜனாதிபதி அவர்களே, இந்தப் பாராளுமன்ற உறுப்பினர்களுக்கு 5 வருடகாலம் பதவிவகிப்பதற்குத்தான் மக்கள் அங்கீகாரம் வழங்கியிருக்கின்றார்கள்; மக்கள் அதற்குத்தான் வாக்களித்திருக்கின்றார்கள். ஆனால், மூன்று அல்லது மூன்றரை வருடங்களிலே இந்தப் பாராளுமன்றத்தைக் கலைத்து இன்னுமொரு தேர்தலைக் கொண்டுவந்துதான் இந்த நாட்டிலே, பாராளுமன்றத்திலே ஜனநாயகத்தைக் கொண்டுவரலாம் என்று ஆளுங்கட்சி என்று சொல்லிக் கொண்டிருப்பவர்கள் கூறுவார்களாக இருந்தால் அல்லது கடந்த ஒக்ரோபர் 26ஆம் திகதி ஏற்பட்டுள்ள பிரச்சினைக்குப் பாராளுமன்றத்திலே தீர்வு காணாமல் மக்களிடம் போய்ப் பொதுத் தேர்தலினூடாகத்தான் தீர்வைப் பெறவேண்டு மென்று சொல்வார்களாக இருந்தால், அதைவிட சிறுபிள்ளைத் தனமான பேச்சு எதுவும் இருக்க முடியாது. எங்களுடைய நாட்டின் அரசியலமைப்பின்கீழ் இயங்குகின்ற நமது பாராளுமன்றத்திலே நமது நாட்டு வாக்காளர்களால் தெரிவு செய்யப்பட்ட 225 உறுப்பினர்கள் இருக்கின்றார்கள். அவர்கள் இங்கு இந்த நாட்டிலே வாழ்கின்ற அத்தனை மக்களையும் பிரதிநிதித்துவப்படுத்துகின்றார்கள். எனவே, இந்த நாட்டின் பிரதமரைப் பாராளுமன்றம்தான் தெரிவு செய்ய வேண்டும். நமது ஜனாதிபதி அவர்கள் சாதாரண ஒரு குடும்பத்திலிருந்து வந்தவர். அத்தகைய ஜனாதிபதி அவர்கள் இன்றைய சூழலிலே நாட்டு மக்களுடைய வேண்டுகோளை, நாட்டு மக்களுடைய எதிர்பார்ப்பை, எதிர்காலச் சந்ததியினருடைய எதிர்பார்ப்பை நியாயப்படுத்துகின்ற ஒருவராகச் செயற்பட்டு, இந்தப் பிரச்சினைக்குத் மிக விரைவில் தீர்வு கண்டு, இந்த நாடு நல்லதொரு பொருளாதார இலக்கை நோக்கிச் சுலபமாகப் பயணிக்க வழிசெய்ய வேண்டுமென்று ஜனாதிபதி அவர்களிடத்திலே மிக அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, அன்று இந்தப் பாராளுமன்றத்திலே மிக மோசமாக நடந்துகொண்ட பாராளுமன்ற உறுப்பினர்கள் நாட்டு மக்களிடத்திலே பகிரங்கமாக மன்னிப்புக் கோர வேண்டும். அது மாத்திர மல்லாமல், இந்தப் பாராளுமன்றத்திலே இனி எந்தவொரு காலத்திலும் எந்தவொரு பாராளுமன்ற உறுப்பினரும் கேவலமான முறையிலே நடக்கக்கூடாது. அவ்வாறான வர்களுக்கு உச்ச தண்டனைகளை வழங்க வேண்டும். அன்று அப்பாவிப் பொலிஸார் உங்களைப் பாதுகாப்பதற்காக, ஜனநாயகத்தைப் பாதுகாப்பதற்காகத் தங்களுடைய கடமைகளை நியாயமாகச் செய்து கொண்டிருந்தபோது, மிளகாய்த்தூளைத் தண்ணீரில் கலந்து அவர்களை நோக்கி வீசியதையும் காயப்படுத்தியதையும் ஒருசில ஊழியர்கள் தாக்கப்பட்டதையும் மன வேதனையோடு சுட்டிக் காட்டுவதோடு, அவ்வாறான செயல்களில் ஈடுபட்டவர்கள் அடையாளம் காணப்பட்டு உரிய தண்டனை வழங்கப்பட வேண்டுமென்றும் இந்த இடத்திலே வேண்டிக் கொள்கின்றேன்.

நாமல் குமார பற்றிய விடயம் இன்று பாரியதொரு பிரச்சினையாக உருவெடுத்திருக்கின்றது. ஜனாதிபதியை, முன்னாள் பாதுகாப்புச் செயலாளரைக் கொலை செய்வதற்காகச் சதி செய்யப்பட்டதாகச் சொல்லப்பட்டது. அதேநேரம் மட்டக்களப்பிலோ அம்பாறையிலோ வைத்து என்னையும் கொலை செய்வதற்குச் சதிசெய்யப்பட்டதாக நாமல் குமார சொல்லியிருந்தார். அவ்வாறான video clip மற்றும் voice clip ஐ இலங்கையிலிருக்கின்ற ஒருசில ஊடகங்கள் ஒளிபரப்பின. ஆயினும், கௌரவ சபாநாயகர் அவர்களே, நான் ஒரு சிறுபான்மையின உறுப்பினர் அல்லது சிறுபான்மைச் சமுதாயத்தைச் சேர்ந்தவன் என்பதற்காகவோ என்னவோ தெரியவில்லை, இன்று அந்த விடயத்தை மறைத்திருக்கின்றார்கள். அண்மைக்காலத்தில் வட மாகாணத்திலே இருந்த ஒரேயோர் அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சர் நான்தான். யுத்த காலத்திலே என்னுடைய அமைச்சினைப் பயன்படுத்தி இந்த நாட்டுக்கு நல்ல பல சேவைகளைச் செய்திருக்கின்றேன். மூன்று இலட்சம் தமிழ்ச் சகோதரர்கள் 'மெனிக் பாம்' முகாமிலே இருந்தபொழுது அவர்களை மீள்குடியேற்றுவதற்கான தலைமைத்துவத்தை வழங்கி, என்னால் முடிந்த அத்தனை பணிகளையும் செய்திருந்தேன். ஆனால், இன்று என்னுடைய பாதுகாப்பு முற்றாக நீக்கப்பட்டு, இரண்டு பொலிஸாரையே தந்திருக்கிறார்கள்.

நாமல் குமார கூறிய அந்தக் கொலைப் பட்டியலில் என்னுடைய பெயரும் இருந்தது என்பதால், இரண்டு வாரங்களுக்கு முன்னர் எங்களுடைய கட்சியின் தவிசாளர் கௌரவ அமீர் அலி உட்பட எங்களுடைய கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள், எங்களுடைய கட்சித் தலைவருக்கு இவ்வாறான ஒரு நிலைமையிருப்பதாக நாமல் குமார சொல்லியும், இதுவரை பொலிஸார் அதைப் பற்றி எதுவும் சொல்லவில்லை என்பது பற்றிப் பொலிஸில் முறைப்பாடு செய்தார்கள். அதன் பிறகு, 3 நாட்களுக்கு முன்னர், Director of CID எனக்கு call பண்ணி, "உங்களிடம் කටුක්‌තරය எடுக்க வேண்டும், 4ஆம் மாடிக்கு வரமுடியுமா?" என்று கேட்டார். எனவே, என்னிடத்திலேயே කටුක්‌තරය எடுக்க வேண்டுமென்று இன்று சொல்கிறார்கள். பொலிஸ் மா அதிபர் உட்பட குறித்த தரப்பினருடைய செயற்பாடு

கேள்விக்குறியாக இருக்கின்றது. எனவே, பாராளுமன்ற உறுப்பினர்களுடைய காவலனாக இருக்கின்ற சபாநாயகர் அவர்கள் இந்த விடயத்திலே பூரணமான, தூய்மையான விசாரணைக்கு ஆவன செய்ய வேண்டும்.

நாமல் குமாரவுடைய வருகை, கடந்த 26ஆம் திகதிக்குப் பிறகு இந்த நாட்டிலே யாருமே எதிர்பார்க்காத மிகவும் மோசமான ஒரு நிலையை ஏற்படுத்தியிருக்கின்றது. ஆகவே, இது தொடர்பாக விசேட விசாரணையொன்றை மேற்கொள்ள வேண்டும். குறித்த விடயத்தில் யார் தவறு செய்திருந்தாலும் அவர் தண்டிக்கப்பட வேண்டும். ஜனாதிபதி, முன்னாள் பாதுகாப்புச் செயலாளர் ஆகியோரோடு சேர்த்து என்னையும் கொலை செய்யச் சதி செய்யப்பட்டதாகச் சொல்லப் பட்டிருந்தாலும், இன்று என்னுடைய முழுப் பாதுகாப்பும் நீக்கப்பட்டுள்ளது. இதனால் நான் எந்தவோர் இடத்திற்கும் செல்லமுடியாத ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. அந்த வகையிலே சபாநாயகர் அவர்கள் எனது பாதுகாப்பை உறுதிப்படுத்த வேண்டுமென்று அன்பாக வேண்டிக் கொள்கின்றேன். நீங்கள் மிகவும் நேர்மையாகவும் தைரியமாகவும் செயற்படுகின்றமைக்காக இந்தச் சந்தர்ப் பத்திலே என்னுடைய கட்சி சார்பிலே மீண்டும் உங்களுக்கு நன்றியைக் கூறுகின்றேன்.

இன்று நாங்கள் ஐக்கிய தேசிய முன்னணியுடன் - ரணில் விக்கிரமசிங்க அவர்களுடன் இருப்பது பற்றி எங்களை ஒரு சிலர் விமர்சிக்கின்கிறார்கள். நாம் பின்பற்றுவது இஸ்லாமிய மார்க்கமாகும். இந்த மார்க்கத்தை எங்களுடைய நபியினூடாகவே இறைவன் எங்களுக்குத் தந்தான். சட்டத்தை மதித்துச் செயற்பட வேண்டுமென்று எங்களுடைய மார்க்கம் அழகாகவும் தெளிவாகவும் சொல்லியிருக்கின்றது. அந்த அடிப்படையில்தான் இந்த நாட்டின் அரசியலமைப்பைப் பாதுகாப்பதற்காக, ஜனநாயகத்தைப் பாதுகாப்பதற்காக இந்த அணியுடன் நின்று நாங்கள் செயற்பட்டுக் கொண்டிருக்கிறோம் என்ற உண்மையைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆனால், இன்று சில ஊடகங்கள் ஊடக தர்மத்தை மீறி மிகவும் பொய்யான செய்திகளை வெளியிடுகின்றன. எனவே, ஊடகங்கள் ஊடக தர்மத்தைப் பாதுகாத்துச் செயற்பட வேண்டுமென்று அன்பாக வேண்டி, விடைபெறுகின்றேன்.

நன்றி.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, මගේ සහෝදර මන්ත්‍රීවරුන් මෙතැනදී ඔබතුමාට සහ ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට පුද කළ ඒ ගෞරවනීය ප්‍රණාමයට මගේ ගෞරවනීය ප්‍රණාමයත් එකතු කරනවා. දැන් කථාවක් පැතිරෙනවා මේ ඊනියා ආණ්ඩුවට මේ පාර්ලිමේන්තුවට එන්න බැරි නිසා, ඔවුන්ට මේකට එන්න හැකියාවක් නැති නිසා ඔවුන් හම්බන්තොට පැත්තේ වෙන පාර්ලිමේන්තුවක් හදාගන්න උත්සාහ කරනවාය කියා. ඒකට බොරුල්ල පැත්තේ මන්ත්‍රී කෙනෙක් කථානායක හැටියට පත් කරලා, ඒ ගොල්ලන් පාර්ලිමේන්තුවක් අරගෙන යන්න ලැහැස්ති වෙනවා කියලා කථාවක් තිබෙනවා. පොඩි හාස්‍යයකුත් මෙතැනට අවශ්‍ය නිසා,- [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, ඒ ගැනත් පොඩ්ඩක් සොයා බලන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මයන්ත දිසානායක මැතිතුමා.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ වැඩිමහල් සහෝදර, ගරු නවින් දිසානායක මැතිතුමා ඉදිරිපත් කළ කරුණුවලට මගේ සම්පූර්ණ එකඟතාව පළ කරන්න කැමැතියි. ඒ වාගේම ඔබතුමාගේ ආරක්ෂාව පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න ඕනෑ. එදා වුණු සිද්ධිය අපි හෙළා දකින අතර, ඔබතුමාට ඇසිඩ් ගැසීමට පවා දැන් වනවිට යම්කිසි, [බාධා කිරීමක්] මාධ්‍ය හරහා වාර්තා වෙලා තිබෙනවා. නීතිය හා ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා වශයෙන් සිටින වර්තමාන ජනාධිපතිතුමාට ඔබතුමාගේ ආරක්ෂාව පිළිබඳව ලියුමක් ලියන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එසේ ලියා, ඔබතුමාගේ ආරක්ෂාව පිළිබඳව සියලුම කටයුතු සිදුකර, ඒ ආරක්ෂාව තහවුරු කරන්නත්, ශක්තිමත් කරන්නත් පියවර ගන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, එදා ඔබතුමාට ලබා දුන් ආරක්ෂාව පිළිබඳව පොලීසියේ නිලධාරීන්ටත් මගේ ස්තුතිය හා ප්‍රණාමය පුද කරන්න කැමැතියි. ඒ වාගේම මගේ කල්‍යාණ මිත්‍ර, ගරු වසන්ත සේනානායක මැතිතුමා ඊයේ දිනයේ ගත් නිර්භීත තීරණය අනුව නැවත වතාවක් එක්සත් ජාතික පක්ෂයට -එතුමාගේ නිජබිමට, එතුමාගේ මහ ගෙදරට- පැමිණ අනාගතයේදී අපිත් එක්ක කටයුතු කිරීමට සම්බන්ධ වීම පිළිබඳවත් මේ අවස්ථාවේදී එතුමාට මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

අපේ ගරු මන්ත්‍රීවරුන් 122ක් අත්සන් කරලා අපට පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙනවායි කියන එක දැන් වනකොට සනාථ කර අවසානයි. "ආණ්ඩු පක්ෂය" යැයි කියා ගන්නා මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ඒ කණ්ඩායමට මා පවසන්න කැමැතියි මේ රටේ අනාගතය වෙනුවෙන්, අනාගත නායකයන් වෙන්න ඉන්න දරුවන් වෙනුවෙන් දැන්වත් කල්පනා කරලා ඇත්තටම රට ගැන ආදරයක් තිබෙනවා නම් කරුණාකර, ඉල්ලා අස් වෙලා 122ක බහුතරයක් තිබෙන පක්ෂයට මේ රටේ ආණ්ඩුව භාර දෙන්නය කියා. ඒ ඉල්ලීම කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මට ලැබී තිබෙන ආරක්ෂාව සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. මම ආරක්ෂාව ඕනෑවට වැඩිය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, මම විශ්වාස කරන විධියට, when the call from the heaven comes you have to go. මම බොහෝ දුරට ඉන්නේ ඒ මතයේයි.

ඊළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා. ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කිව්වා නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන ප්‍රධානම ආයතන වෙන්නේ විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණයයි. විධායකයෙන් යම් වැරැද්දක් සිදු වුණාම ව්‍යවස්ථාදායකය ඒක අනුමත කරන්නේ නැතිව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයකගේ කැමැත්ත මත ඔබතුමා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නායකත්වය අරගෙන ස්වාධීනව, ශ්‍රේෂ්ඨ විධියට මේ රටේ ව්‍යවස්ථාදායකයේ ප්‍රජාතන්ත්‍රවාදය ඔබ ආරක්ෂා කර තිබෙනවා. මම අධිකරණයටත් ස්තුතිවන්ත වෙනවා, වැරදි වැඩක් කළාම අධිකරණය ස්වාධීනව කටයුතු කිරීම ගැන. අපි ඉතිහාසයට ගියොත් ගරු කථානායකතුමනි, අපි ආණ්ඩුවක් වශයෙන් කටයුතු කරද්දී අපි යම් වැරැදි තීන්දු, තීරණ ගත්තාම අපිට විරුද්ධව නඩු තීන්දු දීපු අවස්ථා ඕනෑ තරම් තිබෙන බව පෙනෙනවා. අපි ඒවාට හිස නමා තිබෙනවා. ඒ එකක්වත් අපි අභියෝගයට ලක් කළේ නැහැ. ඒ වාගේම අපි දන්නවා ඉතිහාසයේ පැවැති ආණ්ඩු අධිකරණයට බලපෑම් කළේ කොහොමද කියා. අග්‍ර විනිශ්චයකාරවරියට බොහොම පහත් විධියට සැලකුවා. "තමුන්ට ඕනෑ දේ කළේ නැහැ. තමුන්ගේ රූකඩයක් බවට පත් වුණේ නැහැ." කියා එදා විධායකය දීපු දඬුවම්, කරපු කෙනෙහිලිකම්, අපහාස අපට හොඳට මතක තිබෙනවා. ඒ යුගය නිමා කර, මේ රටේ යහ පාලනයක් ඇති කරන්නයි අපි 2015 ජනවාරි 08 වැනි දා ජනතාවට ප්‍රතිඥා දීලා කටයුතු කළේ. අපි දැක්කා, අතීතයේ රටේ ජනාධිපතිවරයාගේ සහෝදරයා කථානායකවරයා බවට පත් කරගෙන, තමුන්ගේ සහෝදරයා තමුන්ට ඕනෑ විධියට මෙහෙයවාගෙන පාර්ලිමේන්තුව රූකඩ පාර්ලිමේන්තුවක් බවට පත් කරගෙන කටයුතු කළ ආකාරය. ගරු කථානායකතුමනි, අද ඔබතුමා ඊට හාත්පසින්ම වෙනස් විධියට කටයුතු කර තිබෙනවා. ඔබතුමා තනි තීන්දුව මත කටයුතු නොකර, පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්තට හිස නමමින් බොහොම එඩිතරව පාර්ලිමේන්තුව මෙහෙයවනවා. ඒ වාගේම අධිකරණයත් අද එවැනි බලවේගවලට යටත් නොවී කටයුතු කරනවා. විවිධ බලපෑම් එනවා, විවිධ අල්ලස් ක්‍රමවේද එනවා කියා අපට මාධ්‍යජාල හරහා හෙළි වෙනවා.

නමුත්, ඒ කිසි දෙයකට යටත් නොවී අධිකරණය අද ඉතාමත් ස්වාධීනව කටයුතු කරන බව දකිනවා. එදා ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරද්දී ඔබතුමාට විරුද්ධව මැර කණ්ඩායම් ගෙනැවිත්, මෙතැන පුටු පොළොවේ ගහලා, ඔබතුමාගේ කථානායක පුටුවට ඇවිල්ලා අභියෝග කරලා, ඔබතුමාගේ කථානායක පුටුව අරගෙන ගිහින් එයට වතුර හළලා, විවිධ අඩන්තේට්ටම් කරලා, ඔබතුමාව භය කරලා, ඔබතුමාට තර්ජනය කරලා බැලුවා, ප්‍රජාතන්ත්‍රවාදය ආපස්සට හරවන්න පුළුවන්ද කියලා. ඔබතුමා ඒ කිසි දෙයකින් සැලෙන්නේ නැතුව, ඒවාට එඩිතරව මුහුණ දීලා තීන්දු, තීරණ ගත්තා.

අද වනකොට අධිකරණය ගන්න තීන්දුවට බලපෑම් කිරීම සඳහා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ, එහෙම නැත්නම් බොරු අගමැතිවරයාගේ පොහොට්ටුව පක්ෂයේ බලය පවතින ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට නියෝග දීලා තිබෙනවාය කියා දැන ගන්න ලැබී තිබෙනවා. අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවට පටහැනිව මැතිවරණයක් පවත්වන්න ඕනෑය කියලා තීන්දු ගන්න කියා බලපෑම් කරලා තිබෙනවා. මේ රටේ තිබෙන පළාත් පාලන ආයතනවල තමුන්ට බලය තිබෙනවාය කියා අනිසි ලෙස බලය පාවිච්චි කරමින් අධිකරණය හැල්ලු කරන්න කටයුතු කරමින් පවතිනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා ශ්‍රේෂ්ඨ නගරාධිපතිවරයෙක් වශයෙන් කොළඹ නගර සභාව මෙහෙය වූවා. ඔබතුමා දන්නවා, නගර සභාවේ ප්‍රඥප්තියක් තිබෙනවාය කියා. ඒ ප්‍රඥප්තියේ තිබෙනවා කරන්න ඕනෑ වැඩ මොනවාද, කරන්න බැරි වැඩ මොනවාද, කරන්න පුළුවන් වැඩ මොනවාද, සභාවේ කථා කරන්න පුළුවන් දේවල් මොනවාද, සභාවේ කථා කරන්න බැරි දේවල් මොනවාද කියා. මා ගම්පහ නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කළා. ඒ නිසා මා දන්නවා, නගර සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ යෝජනා මොනවාද කියලා. නගර සභා අණ පනත්, ප්‍රඥප්ති යටතේ අපට විෂය පථයක් තිබෙනවා. ඒ විෂය පථයට පරිබාහිර යෝජනා අපට ඉදිරිපත් කරන්න බැහැ. නමුත් අද මේ ඊනියා අගමැතිවරයා මේ රටේ නීතිය උල්ලංඝනය කරමින්, ජනතාවට වග කියන ප්‍රශ්නයක් නැතුව, තමුන්ට බලය තිබෙන පළාත් පාලන ආයතනවලට උපදෙස් දීලා තිබෙනවා, අධිකරණයේ දැන් විභාග වෙමින් පවතින නඩුවට විරුද්ධව තීන්දු, තීරණ ගන්නය කියා. ඒ නිසා මා කියනවා, මේ ඊනියා අගමැතිවරයා අද තමුන්ට තිබෙන ක්‍රමවේද උපරිමය පාවිච්චි කරලා සුපුරුදු විධියට, එදා අධිකරණයට සලකපු විධියටම නැවත වතාවක් අධිකරණයටත් බලපෑම් කිරීම ආරම්භ කරලා තිබෙනවාය කියා. ඒ අයට බලය තිබෙන සියලු පළාත් පාලන ආයතන මඟින් දැන් එය ක්‍රියාත්මක කරවනවා. ඒ නිසා විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය අගයන පිරිසක් වශයෙන්, දේශපාලන කණ්ඩායමක් වශයෙන්, පක්ෂයක් වශයෙන් අපි පාර්ලිමේන්තුව තුළ අපේ විරෝධය ප්‍රකාශ කරනවා. අධිකරණයේ දැනට ක්‍රියාත්මක වන නඩුවක් සම්බන්ධව මේ අය තීන්දු තීරණ ගැනීම සඳහා තමුන්ගේ බලය පාවිච්චි කිරීම ගැන මේ සභාව තුළදී විරෝධය ප්‍රකාශ කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ජේ.සී. අලවතුවල මැතිතුමා.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මට ඉඩ ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. අද නොවැම්බර් මස 27වැනි දින. පසුගිය ඔක්තෝබර් මාසයේ 26වැනි දින සිට අද වන විට මාසයකුත් දවසක් මේ රට අරාජික වී තිබෙනවා. මේ අවස්ථාවේදී ඔබතුමා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ බහුතරයට හිස නමා ඔබතුමා පාර්ලිමේන්තුව තුළ ඉතා නිර්භීතව කටයුතු කළා. එදා ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා බහුතරයට ගරු කරමින් ඔබතුමාගේ ජීවිතය පරදුවට තබා පාර්ලිමේන්තුව තුළ ඉතා ඉහළ මට්ටමින් රාජකාරිය ඉටු කරපු ආකාරය අපි දැක්කා. එම නිසා ඔබතුමා ඉතිහාසගත වෙනවා. අපේ රටට, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අනතුරක් ඇති වුණු වේලාවේ, අපේ රටේ උත්තරීතර ව්‍යවස්ථාව උල්ලංඝනයට, එහෙම නැත්නම් ව්‍යවස්ථාවට විරුද්ධව විධායකය කටයුතු කරන වේලාවේ පාර්ලිමේන්තුවේ බහුතරය ඇවිත් ඒ ගැන ඔබතුමාට මතක් කළාම, ඔබතුමා බහුතරයට ගරු කරලා කටයුතු කළා. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා හැටියට ඒ වෙනුවෙන් ඔබතුමාට ගෞරව පූර්වක ස්තුතිය පිරිනමන්න ඕනෑ. අපේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ඔබතුමා විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. ඒ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ප්‍රමුඛ ලේකම් මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලය, සභා ගර්භය තුළ කටයුතු කරන කාර්ය මණ්ඩලය, පොලිස් නිලධාරීන් ඔබතුමාට එම කටයුතු කරන්න විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ සියලුදෙනාටත් මේ අවස්ථාවේ අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඉතිහාසයේ කවදාවත් පාර්ලිමේන්තුව තුළ නොදැකපු ආකාරයේ හැසිරීමක් තමයි හිටපු ජනාධිපතිතුමා - මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා- මෙම ගරු සභාවේ සිටින වේලාවේ, හිටපු කථානායකතුමා මෙම ගරු සභාවේ සිටින වේලාවේ ඒ අයගේ කණ්ඩායම තුළින් අපි දුටුවේ. ගරු කථානායකතුමනි, ඔබතුමාට එම හැසිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීමට මේ වන විට අදාළ වීඩියෝ පට ලැබී තිබෙනවා. ඒ වාගේම පොලිසියට

පැමිණිලි ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එහෙම අලාභ හානි කරමින්, එලෙස හැසිරෙමින් පොලිස් නිලධාරින්ට ප්‍රහාර එල්ල කළා. පාර්ලිමේන්තුව දීර්ඝ කාලයක් නියෝජනය කරන ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා මැතිතුමා වැනි මැති ඇමතිතුමන්ලාට මිරිස් කුඩු ප්‍රහාර එල්ල කළා. ඒ වාගේම අපි තවත් දේවල් දන්නවා. ඇසිඩ් වැනි දේවල් පාර්ලිමේන්තුවට ගෙනැත් ඔබතුමාට ගහන්න සූදානම් කර තිබුණා කියා අපට ආරංචියක් ලැබී තිබෙනවා. එදා ඔබතුමාට සභා ගර්භයට එන්න දෙන්නේ නැතිව කටයුතු කරපු ආකාරය මුළු ලෝකයම දැක්කා. එසේ හැසිරුණු වේලාවේ බයිබලය, කුරානය වැනි ආගමික පොත්පත්වලින් පහර දුන්නා. මෙන්න මෙවැනි හැසිරීමක් අපි කවුරුවත් අනුමත කරන්නේ නැහැ.

අප පැහැදිලිව කියන්නේ, අපේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්න එවැනි කටයුතු කළ ඒ සියලු දෙනාට නිසි දඬුවම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නවා ඇතැයි කියා මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා; ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපත් බලාපොරොත්තු වෙනවා කියායි.

පාර්ලිමේන්තුවේ මේ කලබලය ආරම්භ කළ පළමු වන දවසේ අපි දැක්කා, මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් ඔබතුමා සමඟ වැඩ කළ තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඇවිල්ල තමයි ඒ කටයුත්ත ආරම්භ කළේ කියන එක. ඒ වෙලාවේයි අපිටත් සිදු වුණේ, ඔබතුමාගේ ආරක්ෂාවට ඒ සහයෝගය ලබා දෙන්න. එම නිසා මේ අය දැන දැනයි මේ වැරදි සියල්ල කරන්නේ. අද අපි දන්නවා, මේ පාර්ලිමේන්තුව වර්ජනය කර තිබෙන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොවන බව. අපි පාර්ලිමේන්තුවේ බහුතරය තුන් වතාවක් පෙන්වා තිබෙනවා. ඒ වාගේම අද මේ වෙනකොට අපේ බහුතරය තවත් වැඩි වෙලා තිබෙනවා; එකසිය විසිදෙක, එකසිය විසි තුනක් වෙලා තිබෙනවා. මේ අය පාර්ලිමේන්තුව වර්ජනය කරන්නේ තමන්ට බහුතරයක් නැති නිසා ලජ්ජාව වසා ගන්නටයි. ඒ අය අද එළියට ගිහින් කියනවා, "කථානායකතුමා ඉන්නතුරු අපි එන්නේ නැහැ" කියා.

ගරු කථානායකතුමනි, ඒ අයට ඔබතුමා අයින් කරන්නට ඕනෑ නම්, විශ්වාස භංග යෝජනාවක් ගේන්නට ඕනෑ බව ඔබතුමා දන්නවා. එම නිසා ඔබතුමාට භය වන්නට දෙයක් නැහැ. එකසිය විසිතුන නොවෙයි, හෙට අනිද්දා වෙනකොට එකසිය තිහ දක්වා එසේ නැත්නම් ඊටත් වඩා මන්ත්‍රීන් සංඛ්‍යාවක් ඔබතුමා වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මේ කටයුතු ක්‍රියාත්මක කරන්න සහයෝගය දෙන්නට ඉන්නවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන් පාර්ලිමේන්තු ඉතිහාසයේ සිට දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන මේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට මේ රටේ තුන්වැනි පුරවැසියා හැටියට ඔබතුමා අනුගමනය කළ නිර්භීත ක්‍රියාව සම්බන්ධයෙන් ඔබතුමාට මේ රටේ ජනතාවගේ ගෞරවය ඉදිරියේදීත් ලැබෙනවාය කියන එක මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන් මේ පත් කර ගත් ඊනියා ආණ්ඩුව මේ වෙනකොට නොයෙකුත් නියෝග ලබා දෙමින්, පසුගිය කාල සීමාව තුළ නීත්‍යානුකූලව අපේ රජය නැත්නම් අපේ අමාත්‍යවරුන් ලබා දුන් පත්වීම්වලට අදාළ නිලධාරින් ගණනාවකගේ රැකියා අද අහිමි කර ගෙන යනවා. විශේෂයෙන් සංස්කෘතික ත්‍රිකෝණය හරහා මාස හයකට පෙර සම්මුඛ පරීක්ෂණ පවත්වා රැකියා ලබා දී තිබෙනවා. අද මේ වෙනකොට ඒ අයට ගෙවල්වලට යන්නටය කියා තිබෙනවා. එසේම නිවාස අධිකාරියේ, මේ වාගේ ආයතන ගණනාවක ඒ රැකියා ලාභීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් නීති විරෝධීව කටයුතු කර ගෙන යනවා. මේ ඊනියා ආණ්ඩුවට, මේ හොර ආණ්ඩුවට, මේවා කරන්න කිසිම අයිතියක් නැහැ. මේවාට සහයෝගය දෙන නිලධාරින්ටත් මෙවැනි කටයුතු ක්‍රියාත්මක කිරීම තුළ ඉදිරි අනාගතයේදී ඒ නිලධාරින්ටත් ඒ ගැන වග කියන්නට වෙනවාය කියන එක මතක් කරමින් ගරු කථානායකතුමනි, ඔබතුමාට නැවතත් අපේ ගෞරවය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
What is your point of Order?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාව වන විට ව්‍යාජ ආණ්ඩුවේ, ව්‍යාජ සභානායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ පාර්ලිමේන්තු කටයුතු ආවරණය කරන සියලුම මාධ්‍යවේදීන්ට ඔබතුමා වෙත යොමු කරන ලද ලිපියක පිටපතක් බෙදා හැර තිබෙනවා, "නොවැම්බර් 14, 15, 16, 19, 21 හා 23 දිනයන්හි සභා රැස්වීම් පිළිබඳ සියලුම හැන්සාඩ් වාර්තා නීති විරෝධී හැටියට සභ ඒවා භාර ගන්න එපා, ඒවා ප්‍රසිද්ධියට පත් කරන්න එපා, ඒවා අවලංගු දේවල් හැටියට සලකන්න" කියලා. මේ අවස්ථාවේදී ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය මම යොමු කරවනවා. ඔබතුමාගේ බලතල ප්‍රකාරව ඒ සඳහා අවශ්‍ය තීරණ ගන්න කියලාත් මම කියා සිටිනවා. ඒ වාගේම ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න ඔබතුමාට හැකියාවක් තිබෙනවා නම් ඒකත් හොඳයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඒ ගැන හොයා බලන්නම් ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු රාශියක් ඔබතුමා මේ තනතුර දරපු ආකාරය පිළිබඳ අදහස් ප්‍රකාශ කළා. ඒ සඳහා විනාඩි දෙක, තුනකින් හෝ අදහස් කිහිපයක් එකතු කිරීම මගේ යුතුකමක් හැටියට මම සලකනවා.

ඔබතුමා වාගේම මමත් 2000 වර්ෂයේ දී පාර්ලිමේන්තුවට ආව කෙනෙක්. දහඅට වසරක් තිස්සේ පාර්ලිමේන්තුව තුළත් ඉන් පරිබාහිරවත් මා දුටු අතිශය සම්භාවනීය චරිතයක් තමයි ඔබතුමා. මා ඔබතුමාව සම්භාවනීය චරිතයක් හැටියට දකිනවා විතරක් නොවෙයි, ඔබතුමා සතුව තිබෙන විනය පිළිබඳවත් මම හැම තිස්සේම අගය කරනවා. අපි ඔබතුමාගෙන් බොහෝ ආදර්ශ ගන්නවා. ඔබතුමා කොළඹ පුරපතිවරයා ලෙස කටයුතු කළ කාලයේදීත්, ඔබතුමා බස්නාහිර පළාත් සභාවට නායකත්වයක් දුන්නු කාලයේදීත්, ඔබතුමා නානාපතිවරයෙක් හැටියට ක්‍රියා කරපු කාලයේදීත්, ඔබතුමා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, බුද්ධ ශාසන වැනි අමාත්‍යාංශ භාරව කටයුතු කළ කාලයේදීත්, ඒ වාගේම ඔබතුමා දේශපාලන පක්ෂයකට නියෝජ්‍ය නායකයා හැටියට

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ක්‍රියා කරපු කාලයේදීත්, එවැනි විවිධ තනතුරු දරපු කාලවලදී ඔබතුමා ක්‍රියා කරපු අකාරය අපි දැක්කා. විශේෂයෙන්ම ඔබතුමාගේ චරිතය තුළින් දැකපු දෙයක් තමයි මනා කළමනාකාරිත්වයක් ප්‍රදර්ශනය වීම. ඒ වාගේම නායකත්ව ගුණාංග රාශියක් ඔබතුමා අපට පෙන්වා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම දැකලා තිබෙනවා, ඔබතුමාට උත්සවයකට 3.00ට එන්න කියා ආරාධනා කළොත්, ඔබතුමා 02.59ට එන්නෙත් නැහැ; 03.01ට එන්නෙත් නැහැ කියන එක. වෙලාවට වැඩ කිරීමේ කලාවක් ප්‍රදර්ශනය කරන්න ඔබතුමාට පුදුම හැකියාවක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා මේ සියලුම ලක්ෂණ පිළිබිඹු කරන අතර, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර පුටුව ශෝභාවත් කරපු කථානායකවරයා හැටියට අපි පසුගිය කාලයේ ඔබතුමාගේ ක්‍රියා කලාපයන් දෙස බලා සිටියා. ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අතීතව පෙනී සිටි කථානායකවරයාය කියන එක ඔබතුමාට ගෞරවයක් හැටියට මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගෙනෙන්න ඔබතුමා තුළ තිබුණු උනන්දුව, අවංක උත්සාහය මම හොඳට දැකලා තිබෙනවා. අවසානයේදී ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට මට මේ උත්තරීතර පාර්ලිමේන්තුවට එම පනත් කෙටුම්පත ගෙනෙන්න හැකියාව ලැබුණා. මට මතකයි, ඒ පනත් කෙටුම්පත ගෙනෙනකොට ඔබතුමා රෝහල්ගත වෙලායි හිටියේ කියලා. එවැනි දේවල් රටට හඳුන්වා දෙන්න ලැබීම ගැන ඔබතුමා අවංකව මොන තරම් සතුටක් ලැබුවාද කියලා මම දැකලා තිබෙනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ඔබතුමා රට තුළ පමණක් නොවෙයි, ජාත්‍යන්තරය තුළත් මොන තරම් පිළිගැනීමට ලක් වෙච්ච පුද්ගලයෙක්ද කියන එක. අවස්ථා කිහිපයකදීම ඔබතුමාත් එක්ක ගිය විදේශ සංචාරවලදී මට එය දැක ගන්නට ලැබුණා. අපි මෑතකදි ඉන්දියාවට ගිය අවස්ථාවේදී ඉන්දියාවේ අගමැතිතුමාගේ ඉඳලා සියලුම ප්‍රධාන දේශපාලනඥයන් ඔබතුමා පිළිගත් හැටි මම දැක්කා. ඒ වාගේම චීනයට අවස්ථා කිහිපයකදීම මම ඔබතුමාත් එක්ක ගියාම දැක්කා, ඒ රටේ මොනතරම් පිළිගැනීමක්ද අපේ ගරු කථානායකතුමාට -ගරු කරු ජයසූරිය කියන නමට- තිබෙන්නේ කියන එක. රීජිජ්තුවට ගියාමත් මම ඒක දැක්කා. රාජ්‍ය තාන්ත්‍රිකයෙක් වශයෙනුත් ඔබතුමා ක්‍රියා කළා. පෞද්ගලික අංශයේ සේවය කරලාත් විශාල කීර්තියක් දිනා ගෙන හිටියා. දේශපාලනඥයෙක් හැටියට ඔබතුමා වෙනට ඇඟිල්ලක් දික් කිරීමට නොහැකි වන පරිදි, දැන පිරිසිදු දේශපාලනඥයෙක් හැටියට ඔබතුමා ක්‍රියා කර තිබෙනවා. එම නිසා ඒ සම්භාවනීය චරිතයට මොන විධියට අවලාද නැගුවත් ඔබතුමා ප්‍රජතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න එඩිතරව, අභීතව ක්‍රියා කරපු හැටි අප හොඳින් දැකලා තිබෙනවා. අද මේ රටේ ජනතාව ඒක දන්නවා. විශේෂයෙන්ම මෙම අර්බුදකාරී අවස්ථාවේදී කථානායක තනතුර මොනතරම් අමාරු තනතුරක්ද කියන එක අපි හොඳට දැක්කා. ඔබතුමා ඒ හැම වෙලාවේම අපක්ෂපාතී වුණා. ඔබතුමා කථානායකවරයා හැටියට විදේශගත වෙන හැම වෙලාවකම හැම කෙනාම සම්බන්ධ කරගත හැකි වන පරිදි හැම දේශපාලන පක්ෂයකටම අවස්ථාව ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ මූලාසන පුටුවේ ඉන්නකොට, අපි කැමැති වුණත්, අකැමැති වුණත් ඔබතුමා හැම කෙනාටම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දුන්නා. ඔබතුමා තුළ තිබෙන ඒ ගතිය මේ වෙලාවේත් ප්‍රදර්ශනය කළා. එදා ඒ අශෝභන හැසිරීම හමුවේ ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අභීතව, එඩිතරව මුහුණ දුන්නා. තමන්ට ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න පුළුවන් කියන එක ඔබතුමා එදා ප්‍රදර්ශනය කළා. ඒ වෙලාවේ ඔබතුමාට සහාය දුන් පාර්ලිමේන්තුවේ ලේකම්තුමන්ලාගේ සිට පහළ ශ්‍රේණි දක්වා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මෙන්ම, ඔබතුමාටත්, ගරු සභාවටත් ආරක්ෂාව සැපයූ පොලිස් නිලධාරීන්ටත් මගේ ගෞරවය පුද කරනවා. ඔබතුමා මේ සම්භාවනීය පුටුව හොබවමින් තවදුරටත් සිටිය යුතුයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා දැනුත් කිව්වා, "මම වරදක් කර තිබෙනවා නම් මට විශ්වාස භංගයක් ගෙනෙන්න" කියලා. ඒ තරම් අවංකභාවයකින් කටයුතු කරන, ඒ තරම් ඍජු ගතිගුණ තිබෙන ඔබතුමාව අපි අගය කරනවා. ප්‍රජාතන්ත්‍රවාදයට පහරක් එල්ල වෙන්න යන මේ වෙලාවේ ඔබතුමා දක්වපු ඒ අභීතභාවය, ඒ ඍජුභාවය, අවංකභාවය සහ කාටත් එකලෙස සලකමින් මේ තනතුර ශෝභාවත් කිරීම ගැන අපේ ගෞරවය ඔබතුමාට පුද කරන බව මම ප්‍රකාශ කළ යුතුයි. ඉදිරියටත් මේ රට වෙනුවෙන්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, පාර්ලිමේන්තුවේ ගෞරවය වෙනුවෙන් ඔබතුමාගේ සේවය එලෙසම ලබා දෙන්න ශක්තිය හා ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඊනියා ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරු අද දවසේ සභාවට පැමිණියේ නැහැ. ඔවුන් ගරු සභාවට පැමිණෙන්නේ නැතුව පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ පුවත් පත් සාකච්ඡාවක් පවත්වමින්, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා දැන් ටිකකට කලින් මාධ්‍යවලට පවසා තිබෙනවා, ඔබතුමා මේ කරන්නේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන වැඩක්; ඒ නිසා ඉදිරියේදී ඔබතුමාට නඩු දාලා, ඔබතුමාව හිරේ යවන්න කටයුතු කරනවා කියලා. මේ පාර්ලිමේන්තු පරිශ්‍රය තුළදීම ඔබතුමාට විරුද්ධව එහෙම ප්‍රකාශ පළ කිරීමට මේ පාර්ලිමේන්තුව භාවිත කිරීම අපට අනුමත කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ ක්‍රියා කලාපය ගැන ගැටලුවක් තිබෙනවා නම්, ඔබතුමා පාර්ලිමේන්තුවේදී ගන්නා ක්‍රියා මාර්ග ගැන ගැටලුවක් තිබෙනවා නම්, එතුමන්ලාට පුළුවන්, පාර්ලිමේන්තු සභා ගර්භයට ඇවිල්ලා ඔබතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනැල්ලා ක්‍රියා කරන්න. ස්ථාවර නියෝග අනුව සහ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් තුළ

ඒ සඳහා ඕනෑ තරම් අවස්ථාවන් තිබෙනවා. ඒ කිසිදු දෙයක් ක්‍රියාත්මක නොකර, ඒ කිසිම ක්‍රියා මාර්ගයකට එන්නේ නැතුව, අඩුම ගානේ පාර්ලිමේන්තුවේ සභා ගැබටවත් එන්නේ නැතුව, සභා ගර්භයෙන් පිටත ඉඳගෙන මාධ්‍යවලට නොයෙකුත් ආකාරයේ එවැනි ප්‍රකාශ කිරීම අපි කාටවත් අනුමත කරන්න බැහැ. ගරු කථානායකතුමනි, අද මේ පවතින තත්ත්වය තුළ ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය, ඒ වාගේම පාර්ලිමේන්තු සම්ප්‍රදායයන්, ස්ථාවර නියෝග යනාදිය රැකීමට ඉදිරියට පැමිණීම ගැන අපි සියලු දෙනාම ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම ජනාධිපතිතුමා මේ ගන්නා වූ ව්‍යවස්ථා විරෝධී ක්‍රියා මාර්ග මත, ජනාධිපතිතුමාගේ බලතලවලට ආවරණය වෙලා, ජනාධිපතිතුමා දීපු හයිය මත එතුමාගේ පිටුපස හැංගිලා මේ කරන ප්‍රකාශ, මේ කරන තර්ජන හා ගර්ජන අපට පිළිගන්න බැහැ. ගරු කථානායකතුමනි, එක පැත්තකින් ජනාධිපතිතුමාත් මේකට වග කියන්න ඕනෑ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග කියන කිසිදු දෙයක් අපේ සිරිසේන ජනාධිපතිතුමාත් පිළිගන්නේ නැති තත්ත්වයක් අද උදා වෙලා තිබෙන බව පැහැදිලියි. අද එතුමාගේ හයිය මත තමයි මේ පාර්ලිමේන්තුව ඇතුළෙත් ඔබතුමාට අභියෝග කරමින්, ඔබතුමාට තර්ජනය කරමින් මේ වාගේ පුවත් පත් සාකච්ඡා එතුමන්ලා පවත්වන්නේ. ඒ නිසා එක පැත්තකින් අපේ ජනාධිපතිතුමා මේවාට සෘජුව වගකීම දරන්න ඕනෑ. හැබැයි ගරු කථානායකතුමනි, අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමට නිර්භීතව කටයුතු කිරීම ගැන. මොකද, පසුගිය දවස් වීකේ අපි දැක්කා, ඔබතුමාට නෙයෙකුත් ආකාරයේ තර්ජන, මඩ ප්‍රහාර එල්ල වෙනවා. එවැනි සමහර දේවල්වලට ජනාධිපතිතුමා සෘජුව මැදිහත් වෙලා, ඔබතුමාව අපහාසයට ලක් කරන්න කියලා කියා තිබෙන බව නොයෙකුත් වෙබ් අඩවිවල පළ වෙලා තිබුණා. එහෙම කොන්ත්‍රාත් ජනාධිපතිතුමා ඒ ගොල්ලන්ගේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා කියලා වෙබ් අඩවිවල පළ වුණා. ඒවා ජනාධිපති මාධ්‍ය අංශය විසින් ප්‍රතික්ෂේප කළේ නැහැ. එවැනි තත්ත්වයක් තුළත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ඔබතුමා නිර්භීතව කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(මාණ්පුමිකු සෙල්වම් අඩෙක්කලනාදන් - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)

கௌரவ சபாநாயகர் அவர்களே, "ஒரு தவறு செய்தால், அதைத் தெரிந்து செய்தால் அவன் தேவன் என்றாலும் விடமாட்டேன்" என்ற பாடல் வரியானது எம்.ஜி.ஆர்.இன் நடிப்புக்கு கவிஞர் வாலியால் எழுதப்பட்டது. தற்போதைய நெருக்கடி நிலைமையில் நீங்கள் இந்தப் பாராளுமன்றத்திலே நடந்துகொண்ட விதம் சம்பந்தமாக இங்கு எல்லோரும் எடுத்துக் கூறினார்கள். இது சம்பந்தமாகக் கூறுவதற்கு எனக்கும் ஒரு கடமை இருக்கின்றது. ஏற்கனவே நான் இது சம்பந்தமாகப் பேசியிருந்தாலும் இந்தச் சந்தர்ப்பத்தையும் அதற்காகப் பயன்படுத்த விரும்புகின்றேன். உண்மையிலேயே உங்களைப் பார்த்து நான் நிறைய விடயங்களைக் கற்றுக் கொண்டேன். உங்களின்கீழ் சேவையாற்றுவதை நான் பெருமையாகக் கருதுகிறேன். நீங்கள் வயதில் முதியவராக இருந்தாலும் குறித்த தினங்களில் இங்கு நீங்கள் முகங்கொடுக்க நேர்ந்த பிரச்சினைகளை மிகத் துணிச்சலோடு ஒரு வீரனைப்போல் எதிர்கொண்டீர்கள். உண்மையிலேயே அந்த நாட்களில் உங்களுடைய ஆளுமையை நான் நேரடியாகப் பார்த்தேன். சில உறுப்பினர்கள் உங்களைச் சுற்றி வளைத்து, உங்களுக்கெதிராக வசைபாடி, குப்பைக்கூடைகளையும் புத்தகங்களையும் எறிந்தபோதும், சளைக்காமல் உங்களுடைய கடமைகளைச் செய்தீர்கள். உங்களுக்குத் தெளிக்கப்படவிருந்த மிளகாய்ப்பொடி கலந்த தண்ணீர் பொலிஸார்மீது தெளிக்கப் பட்டது. அன்று நீங்கள் சபாநாயகர் கதிரையிலே அமர்ந்திருந்தால் மிளகாய்ப்பொடி கலந்த தண்ணீர் உங்கள்மீதுதான் தெளிக்கப்பட்டிருக்கும். உங்களை நோக்கிப் புத்தகங்கள் எறியப்பட்டபோதும் மிகத் துணிச்சலோடு நீங்கள் கருமமாற்றினீர்கள். அப்போது நீங்கள் ஒரு வீரனாகச் செயற்பட்டதை நான் பார்த்தேன்.

அதேநேரம், பாராளுமன்றச் செயலாளர்கள் - பெண் செயலாளர் உட்பட - சுற்றி வளைக்கப்பட்டு, மிகவும் துன்பத்துக்குள்ளாகியிருந்த சூழ்நிலையிலும் அவர்கள் தங்களுடைய கடமையைச் செய்தார்கள். கௌரவ சபாநாயகர் அவர்களே, உங்களுக்குக்கீழ் கடமையாற்றுகின்றவர்களுடைய செயற்பாட்டிலே நீங்கள் நம்பிக்கை வைத்திருப்பதாக இன்று காலை நீங்கள் சொன்னீர்கள். அதையிட்டு நான் பெருமைப் படுகின்றேன். உங்களுக்குக்கீழ்ச் சேவையாற்றுபவர்களைக் காப்பாற்றுகின்ற பொறுப்பை நீங்கள் ஏற்றுக்கொண்டிருக் கின்றீர்கள் என்பதை எண்ணுகின்றபோது, உங்களுக்குகீழ் கடமையாற்றுவதில் உண்மையிலேயே நான் மட்டற்ற மகிழ்ச்சி யடைகின்றேன்; அதனை எனக்குக் கிடைத்த பாக்கியமாகக் கருதுகிறேன்.

கௌரவ சாபாநாயகர் அவர்களே, நான் ஒரு போராளியாகச் செயற்பட்டவன். அந்த ரீதியிலே, ஜனநாயகத்தை நிலைநாட்டுவதற்காக நீங்கள் நடந்துகொண்ட விதம் எனக்குக் கடந்த காலத்தை நினைவூட்டியது. நாங்களும் அடக்குமுறைக்கு எதிராகச் செயற்பட்டோம்; எங்களுடைய ஆயுதங்கள் அடக்குமுறைக்கு எதிராகத்தான் நீட்டப்பட்டன. அதேபோல, ஜனநாயக ரீதியிலான உங்களுடைய நேர்மையான நடவடிக்கைகள் நிமிர்ந்து நின்று செயற்படக் கூடிய ஒரு சந்தர்ப்பத்தை எங்களுக்குத் தந்திருக்கின்றது. உண்மையிலேயே நான் உங்களுடைய அந்தச் செயற்பாட்டைப் பெருமையாகக் கருதுகிறேன். அந்தளவுக்கு உங்களுடைய செயற்பாடு அமைந்திருந்தது. அன்று இங்கு புத்தகங்கள், கதிரை என்பன மிக மோசமான முறையில் எறியப்பட்டன. அவற்றைப் பொலிஸார் தடுத்தாலும் ஒரு புத்தகம் உங்களை நோக்கி வந்தபோதிலும், நீங்கள் அச்சமில்லாமல் உங்கள் கடமையைச் செய்ததானது எங்களைத் தலைநிமிர வைத்திருக்கின்றது; உங்களைப்போல் செயற்படக் கூடிய துணிச்சலை எங்களுக்குத் தந்திருக்கின்றது. ஆகவே, இந்தச் சந்தர்ப்பத்திலே உங்களுக்குப் புகழாரம் சூட்டுவதிலே நான் மட்டற்ற மகிழ்ச்சியடைகிறேன்.

அதேநேரத்திலே எங்களுடைய மாவீரர்கள் தினமாக இருக்கின்ற இன்று அவர்களுக்கும் அஞ்சலி செலுத்துவதுடன், வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු එඩ්වඩ් ගුණසේකර මැතිතුමා.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

(மாண்புமிகு எட்வட் குணசேகர)

(The Hon. Edward Gunasekara)

ගරු කථානායකතුමනි, අද ඔබතුමා පිළිබඳව; පසුගිය අර්බුදකාරී කාල සීමාව තුළ ඔබතුමා ඉටු කරපු සේවය පිළිබඳව;

[ගරු එඩවඩ ගුණසේකර මහතා]

මෙහෙවර පිළිබඳව අපි කවුරුත් කථා කරන මොහොතේදී මටත් කථා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ වැඩිහිටි -ඉතාම ජ්‍යෙෂ්ඨ- දේශපාලනඥයෙක් හැටියට ඉඳලා ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා වාගේ 2000 වර්ෂයේදී පමණ අපි පාර්ලිමේන්තුවට එන අවධියේම ඔබතුමාත් මේ පාර්ලිමේන්තුවට ආ බව අපි දන්නවා. අපි හරි සතුටු වුණා, ඒ ආ කණ්ඩායම් දිහා බලද්දි. එක්තරා විධියක ගුණවත්, යහපත් මිනිසුන් ටිකක් එදා පාර්ලිමේන්තුවට ආවා. ඒකේ නායකත්වය ඔබතුමාට තිබුණා. එතැනින් අපි ආරම්භ කරපු ඒ දේශපාලන ගමන් මහේදි ඔබතුමා පිටුපස ඉඳගෙන අපි බොහෝ දේවල් ඉගෙන ගත්තා. ඒ, මාත් ගම්පහ දිස්ත්‍රික්කයෙන් දේශපාලනය කරන කෙනෙක් නිසායි. අපට යම් කිසි ගැටලුවක් එද්දි ඒ හැම අවස්ථාවකදීම අපි ඔබතුමාගෙන් ඒ පිළිබඳව විමසා දේශපාලන වශයෙන් ගත යුතු තීරණ අපි ගත්තා. පසුගිය අර්බුදකාරී කාල සීමාව තුළදී සෝභිත හාමුදුරුවන්ගේ "සාධාරණ සමාජයක් උදෙසා ජාතික ව්‍යාපාරය" වැඩසටහනේදී ඔබතුමා ඉතාම වුවමනාවෙන් එතැන සැදීපැහැදී හිටපු කෙනෙක්ය කියන එක මම දන්නවා. ඒ පියවර උඩ තමයි අද ඉන්න ජනාධිපතිතුමාට ඒ ස්ථානයට එන්න මඟ පෑදුණේ කියන එක අද රටම දන්නා කාරණයක්. අද ඔබතුමා මූලාසනයේ ඉන්න මොහොතේදී මම ඒ කාරණය මතක් කරනවා. ඒ "සාධාරණ සමාජයක් උදෙසා ජාතික ව්‍යාපාරය" වැඩසටහනට ඔබතුමා නායකත්වය දීම සෝභිත හාමුදුරුවන්ට විශාල හයියක් වුණා.

ඔබතුමා සම්බන්ධයෙන් අපේ නියෝජ්‍ය කාරක සභාපතිතුමා වන අඩෙක්කලනාදන් මහතාත් අදහස් දැක්වුවා. එතුමාගේ අදහස් දැක්වීම කළේ ද්‍රවිඩ භාෂාවෙන්. ඒක සිංහලෙන් ප්‍රචාරය වුණා නම්, හරි වැදගත් වනවා. මොකද, අපි මේ රට හදන්න හැදුවේ ජාතිවාදී, ආගම්වාදී, ගෝත්‍රවාදී තත්ත්වයෙන් මුදවා ගෙනයි. ඔබතුමාගේම මතය අනුව අපි මේ ගමන යන්න හැදුවේ අපි සියලුදෙනාම එකතු වෙලායි. එතුමන්ලා මේ කටයුත්ත දැකපු විධිය ගැන අපේ නියෝජ්‍ය කාරක සභාපතිතුමා වන අඩෙක්කලනාදන් මහතා කිව්වේ බොහොම සංවේදී දෙයක්. ඒක රටේ සියලුදෙනාම දැන ගත යුතු කාරණයක් හැටියට මම මේ මොහොතේදී විශේෂයෙන් මතක් කරනවා. මම දීර්ඝව කථා කරන්නේ නැහැ.

විශේෂයෙන්ම මම, අපේ ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා, ඒ වාගේම අපේ නියෝජ්‍ය කථානායකතුමා ඇතුළු අපි සියලුදෙනාම ගරු කථානායකතුමා නැති වෙලාවේ මූලාසනයේ වැඩ කරද්දි ඔබතුමාගේ ගෞරවය ආරක්ෂා කරන්න තමයි අපි කටයුතු කළේ. පක්ෂග්‍රාහී වන තත්ත්වයකින් අපි කවදාවත් කටයුතු කළේ නැහැ. කාලය ගැන කටයුතු කරද්දින්, අපි හැම වෙලාවේම අනුගමනය කළේ ඔබතුමායි. කිසිම විටක අපි දේශපාලන පක්ෂයක් ගැන බැලුවේ නැහැ. ස්ථාවර නියෝග කියන කාරණාව ඇති කරලා තිබෙන්නේ යම් කිසි ගැටලුවක් වෙද්දි ඒවා පෙරළා බලා ඒවා අනුව කටයුතු කරන්නයි. ඔබතුමා හරියාකාරව ස්ථාවර නියෝග අනුගමනය කළා. හඬින්ද, එහෙම නැත්නම් නමින්ද, කින්ද මන්ද කියන ඔය සියලුම දේවල් හැදිලා තිබෙන්නේ ඔය වාගේ ගැටලුවක් තිබෙන වෙලාවකදී කටයුතු කරන්නයි. අපේ නියෝජ්‍ය කාරක සභාපතිතුමා කිව්වා වාගේ ඔබතුමා නිර්භීතව ඒ අවශ්‍ය වෙලාවේදී ඒ ස්ථාවර නියෝග පාවිච්චි කළා. නැත්නම් සාමාන්‍ය වෙලාවකදී ඒ ස්ථාවර නියෝග පාවිච්චි කරන්න වෙන්නේ නැහැ. ඒක මේ රටේ අය දන්නේ නැහැ. එම නිසා මම ඒ පිළිබඳව මතක් කරනවා. ඒ ස්ථාවර නියෝග අපට ලබා දීලා තිබෙන්නේ ඒ අවශ්‍ය වෙලාවට පාවිච්චි කරන්නයි. ඒ දේවල් හරියාකාරව ඔබතුමා පාවිච්චි කළා. ඔබතුමා ඒ වෙනුවෙන් කරපු කැප කිරීම ඉතා ප්‍රශංසනීයයි. ඔබතුමා වැනි කථානායකතුමෙක් යටතේ මේ පාර්ලිමේන්තුවේ අපට සිටීමට ලැබීම අපට විශාල ගෞරවයක් බව විශේෂයෙන් මතක් කරනවා. මම මීට වඩා කාලය ගන්නේ නැහැ. මම දන්නවා, දැන් කාලය බොහෝ සෙයින් ගත වෙලා තිබෙන බව. ඔබතුමාට මම සුබ පතනවා.

එදා ඒ මන්ත්‍රීවරු අර අහිංසක පොලිස් නිලධාරින්ගේ මුහුණුවලට මිරිස් කුඩු ගහපු හැටි අපි දුටුවා. තමන්ගේ තාත්තාට මේ මිරිස් වතුර ප්‍රහාරය වදින කොට ඔවුන්ගේ දරුවන්ගේ හදවත්වලට, තමන්ගේ සැමියාට මේ මිරිස් වතුර ප්‍රහාරය වදින කොට ඔවුන්ගේ බිරින්දෑවරුන්ගේ හදවත්වලට මොන තරම් වේදනාවක් එන්න ඇද්ද? ඔබතුමා දන්නවා, ඔබතුමාව ආරක්ෂා කරන්නයි ඔවුන් කටයුතු කළේ කියලා. පාර්ලිමේන්තු මහ ලේකම්තුමා, නියෝජ්‍ය මහ ලේකම්තුමා, සහකාර මහ ලේකම්තුමා, සහකාර මහ ලේකම්තුමිය ඇතුළු මේ කාර්ය මණ්ඩලය සහ පහළම නිලධාරියා දක්වා සියලු නිලධාරින් ඒ දේට මුහුණ දුන්නා. ඒ පහර ඔවුන් සියලුදෙනාටම ගහපු පහරක් හැටියට තමයි අපි දකින්නේ. මෙවා රටට පෙන්වන්න පුළුවන් විධියට ඔබතුමා වැනි කෙනෙක් මෙතැන ඒ තත්ත්වය විඳගෙන සිටියා.

පක්ෂ පාට භේදයකින් තොරව, ජාති භේදයකින් හෝ වෙනත් කිසිදු භේදයකින් තොරව, අද මේ රට යන්න ඕනෑ කොතැනටද, අපි මේ රටේ මිනිසුන් මනින්න ඕනෑ කොහොමද කියන එක ඒ තීරණාත්මක මොහොතේ මේ රටේ සිටින ජනතාවට එදා පෙනුණා. මේ රටේ සිටින ජනතාවට එය තීරණය කරන්න කියලා අපි මතක් කරනවා.

ගරු කථානායකතුමනි, ඒ කාරණය මේ රටට විශේෂයෙන්ම මතක් කරන අතර, ඔබතුමාට මේ වෙලාවේ සුබ පතනවා. අපේ ආගමට අනුකූලව, ත්‍රිවිධ රත්නයේ පිහිටෙන්, ඔබතුමාගේ මේ ගමන ශක්තිමත්ව ඉදිරියට යන්න ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය නිමා කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද අපට කල් තැබීමේ යෝජනාවකුත් සාකච්ඡාවට ගන්න තිබෙනවා. ඒ හින්දා තවත් එක කතාවකට අවස්ථාවක් දීලා -ගරු ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමාට - ඒ කල් තැබීමේ යෝජනාව සාකච්ඡා කරමු කියා මම යෝජනා කරනවා.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Speaker, I take this opportunity to speak a few words on the unruly and unwanted acts that have been created in this Parliament. For the last one month, the entire country is at a standstill economically and in all fields due to the unconstitutional behaviour by the administrators of this county, and by the President of the country who secretly removed the then Prime Minister and appointed another as the Prime Minister. It is completely undemocratic, illegal, and unconstitutional for them to have done this.

I think it is time that the President of this country takes note of the democratic principles of this country, the democratic principles of this Parliament, and uphold the truth and constitutional aspect that should be adhered to in this society. Unfortunately, from the date of democracy in this country, we have never come across a

situation or any act that has created this kind of confusion in our social activities.

If you look at the imports sector of this country; if you look at the banking sector; if you look at the rate of the US Dollar; if you look at all fields, economically and otherwise, the people of this country want back normalcy. The people of this country want democratic principles to be upheld. If you speak to any individual here today, whether he is from the United National Party or from any other Party, everyone is saying that the entire country has to have democracy and the democratic principles have to be upheld. It is high time that the President of this country today come to a conclusion and bring this entire deadlock of society, the entire non-progression of this country during last one month and more to an end, and have proper social activities and uphold the democratic principles.

Therefore, Hon. Speaker, I am requesting you, and also the President of this country to uphold the democratic principles and not to act unconstitutionally or illegally, and to bring back normalcy in this country as it was before the dissolution of Parliament. I earnestly request His Excellency the President to uphold again the democratic principles and bring Sri Lanka to the normalcy, which we are all waiting for.

Thank you.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, අපි ප්‍රධාන කටයුතුවලට යමු. ඔබතුමාගේත් කැමැත්ත පිට.

ඊළඟට ඇත්තේ, සභාව කල් තැබීම.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව යළි රැස්වීම, 2018 නොවැම්බර් මස 29වන දින පෙර වරු 10.30ට.

සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තැබීමේ යෝජනාව, (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටතු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම
சுற்றுலாத்துறையினை இயல்பு நிலைக்குக் கொண்டுவருதல்
RESTORATION OF TOURISM INDUSTRY

[අ.භා. 3.13]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 19 (1) යටතේ හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණාවක් සාකච්ඡා කිරීම සඳහා සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලනවා.

මා ඉදිරිපත් කරන කල් තැබීමේ යෝජනාව මෙසේයි:

"ශ්‍රී ලංකාව ලෝකයේ සංචාරක කර්මාන්තය තුළ ඉහළම ස්ථානයක තිබියදී රටේ සිදුවූ මෙම අවාසනාවන්ත තත්ත්වය හේතුවෙන් මෙරට සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටීමේ අනතුරකට පත්ව ඇති බැවින්ද, ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය පාලනය හා නීතියේ ආධිපත්‍යය සම්පූර්ණයෙන් කඩා වැටී ඇති බැවින්ද, ශ්‍රී ලංකාව තුළ නීතියේ ආධිපත්‍යය තහවුරු කර සංචාරක කර්මාන්තය වහාම යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා"

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා දිගටම කතා කරනවාද?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සභාව කල් තැබීමේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන මෙම යෝජනාවේ අඩංගු කාරණා ගැන මා කියන්නම්. අපි දැක්කා පසු ගිය දවස්වල පාර්ලිමේන්තුවේ වෙච්ච සිද්ධි. ඒ වාගේම මතක් කළ යුතු වෙනවා,

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

2018 ඔක්තෝබර් 26වන දා ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ආණ්ඩුව නීතියට පටහැනිව විසුරුවා හරිනු ලැබූ බව. ඊට විරුද්ධව 2018 නොවැම්බර් මස 14වන දින මෙම සභාව විසින් සම්මත කරන ලද ආණ්ඩුවට එරෙහි විශ්වාස භංග යෝජනාව සහ ඉන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල ආණ්ඩුවක් නොමැත කියන කියන කාරණයත් අපි මතු කළා. ඒ කාරණාත් එක්ක තමයි අද ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය පාලනය, නීතියේ ආධිපත්‍යය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබෙන්නේ. මේ හේතුව නිසා අපේ සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටෙන තත්ත්වයකට පත් වෙලා විශාල බලපෑමක් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කෙරෙහි අද ඇතිවී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ සංචාරක කර්මාන්තය දෙස බැලුවොත්, පසු ගිය වසර තුනක කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ශීඝ්‍ර දියුණුවකට ලක් වුණා. එයට හොඳම උදාහරණයක් තමයි, "Lonely Planet" සඟරාව මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2019 වසරේ හොඳම ගමනාන්තය හැටියට ශ්‍රී ලංකාව තෝරාගෙන තිබීම. මේ කාරණයේදී අපි දැකපු දෙයක් තමයි, සංචාරක කර්මාන්තය සඳහා විශේෂයෙන්ම පසු ගිය අවුරුදු තුනක කාලය තුළ දක්වන ලද අපේ දායකත්වය. මේ වසරේ මුල් මාස 10 තුළදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව මිලියන 1.88ක්. ඒ කියන්නේ, ආසන්න වශයෙන් ලක්ෂ 20කට කිට්ටු වන ප්‍රමාණයක්. ලක්ෂ 18කට වැඩි ගණනක්. පසු ගිය වසරට වඩා සියයට 10.6කින් සංචාරකයන්ගේ පැමිණීම ඉහළ ගොස් තිබුණා.

මේ වසරේ මිලියන තුනක්, ඒ කියන්නේ ලක්ෂ 30කට ආසන්න සංචාරකයන් පිරිසක් ආකර්ෂණය කර ගැනීමට ඉලක්කගත කරලා තිබුණා. ශ්‍රී ලංකාව 2018 වසර අවසන් වන විට සංචාරකයන් මිලියන 2.5කගේ සංචාරය අවසන් වනු ඇතැයි අපේක්ෂා කරලා තිබුණා. මිලියන තුනක target එකක් තිබුණා. ඒ අතරින් මිලියන 2.5ක් ඒ කියන්නේ ලක්ෂ 25කගේ සංචාරය අවසන් වනු ඇතැයි බලාපොරොත්තු තබා තිබුණා. 2017 වසරේ සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 21ක් - මිලියන 2.1- දක්වා ඉහළ ගොස් තිබුණා. එය සියයට 3.2ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබුවා. සංචාරක ව්‍යාපාරයේ ආදායම විධියට ගත්තොත් එය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 3.63ක විශාල ආදායමක් දක්වා ඉහළ ගොස් තිබුණා. ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ දත්ත අනුව, 2018 වසරේ පළමු මාස 8 තුළ සංචාරක ඉපැයීම් සියයට 12.5කින්, ඒ කියන්නේ ඩොලර් බිලියන 2.93ක් දක්වා ඉහළ ගොස් තිබුණා. මේ හරහා සංචාරක කර්මාන්තයේ දියුණුව අපි දැක්කා. ඒ වාගේම Lonely Planet වාගේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළිලා සිටින සංචාරක promotersලා කියන විධියටත් අපේ රට ඉහළම ස්ථානයක තිබුණා. අද වන විට මේ රටේ පවතින තත්ත්වය නිසා ඒ අවස්ථාව අහිමිව යාම ගැන තමයි අද අපි මේ සාකච්ඡාවට භාජන කරන්නේ.

සංචාරක කර්මාන්තයේ ප්‍රධාන ඍතුවක් තමයි මේ ශීත ඍතුව. ඒ කියන්නේ නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි කියන කාලසීමාව. ඒ කාලසීමාවේ දී තමයි ලංකාවට වැඩියෙන්ම සංචාරකයෝ එන්නේ. නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි කියන කාලසීමාව තුළ එන සංචාරකයන් නිසා ඒ කාලයේදී සංචාරක ක්ෂේත්‍රයේ නියැළිලා ඉන්න බොහෝ ආයතන තමන්ගේ ආදායමෙන් සියයට 50ත්, 60ත් අතර ප්‍රමාණයක් උපයා ගන්නවා. ඒක තමයි ලෝකයේ ස්වභාවය. නමුත් මේ පවතින දේශපාලන අර්බුදය හේතුවෙන් මේ කර්මාන්තයේ කොටස්කරුවන්ට විශාල බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට කියනවා නම්, වැඩිම අවලංගු කිරීම් සිදුවෙලා තිබෙන්නේ ඉන්දියාවෙන්. ඊළඟට, යුරෝපීය වෙන් කිරීම්වල විශාල පසුබෑමක් ඇති වෙලා තිබෙනවා. Jetwing වාගේ ආයතන; ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින සමාගම් ප්‍රකාශ කරලා තිබෙනවා මේ ශීත ඍතුවේ, ඒ කියන්නේ නොවැම්බර් මාසයේ සංචාරකයන්ගේ පැමිණීමේ සියයට 20ක වැටීමක් පෙන්නුම් කරලා තිබෙනවා කියලා. සැලසුම්ගත සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්වල ඉරණම ගැන කතා කරනවා නම්, එය ප්‍රධාන අභියෝගයක් හැටියටයි තිබෙන්නේ. මොකද, එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන්න නොහැකි තත්ත්වයක් අද වෙනකොට උද්ගත වෙලා තිබෙනවා. දෙසැම්බර් මාසය ගත්තොත්, එය සංචාරක කර්මාන්තයේ වැඩිම වර්ධනයක් තිබෙන මාසය ලෙස සැලකෙනවා. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවට දෙසැම්බර් මාසය තුළ පමණක් දෙලක්ෂ හතළිස්හතර දහසකට අධික සංචාරකයන් පිරිසක් ආකර්ෂණය වෙයි කියා බලාපොරොත්තු වුණා. සාමාන්‍යයෙන් මසකට සංචාරකයන් දෙලක්ෂ තිස්දහසක් පමණ තමයි පැමිණෙන්නේ. නමුත්, මේ වසරේ දෙසැම්බර් මාසයේ ඊට වැඩි පිරිසක් පැමිණෙනැයි කියා බලාපොරොත්තු වුණා. නමුත් මේ සියල්ල අද වන විට අභියෝගයකට ලක්වෙලා තිබෙනවා.

පසුගියදා ලන්ඩනයේ පැවැති ලෝක සංචරණ වෙළෙඳ පොළ, නව ශ්‍රී ලංකාවක් සඳහා වන "So Sri Lanka" වෙළෙඳ නාමය හඳුන්වා දුන්නා. මේ සඳහා campaign කළා. මේ සඳහා ශ්‍රී ලංකාව විශාල මහන්සියක් ගත්තා. නමුත් ඒ ආකර්ෂණීය වැඩසටහන් කර ගන්න බැරි තත්ත්වයක් උඩ, ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ කඩා වැටීම තුළ විශාල බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. අපි දැක්කා, ඊයේ පෙරේදා පැවති මාධ්‍ය හමුවකදී කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායක සංගමයේ සභාපති රොහාන් අබේවික්‍රම මහතා කියා සිටියා, "පසුගිය වසර කිහිපය තුළ සංචාරක ව්‍යාපාරය වර්ධනය වුණත්, මේ දිනවල උද්ගත වී තිබෙන දේශපාලන වාතාවරණය තුළ මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම පහළ වැටිලා තිබෙනවා"යි කියලා. සංචාරකයන්ගේ ශීඝ්‍ර අඩුවීමක් වාගේම මේ ක්ෂේත්‍රයේ රැකියා කරන අයට විශාල බලපෑමක් ඇතිවෙලා තිබෙනවා කියන කාරණය එතුමා සඳහන් කළා.

අපි දන්නවා, විශේෂයෙන්ම විදේශිකයන් වැඩියෙන්ම යන ස්ථානය හැටියට සීගිරිය හඳුන්වන්න පුළුවන් බව. විදේශිකයන් විසින් සීගිරියේ චිතරක් කාමර දහසකට අධික ඇණවුම් ප්‍රමාණයක් අවලංගු කරලා තිබෙනවා, මේ මාස කිහිපයේ. මේ ගැන කියන්නේ සීගිරි සංචාරක නිකේතන හිමිකරුවන්ගේ සංගමයේ සභාපති ලයනල් ගුණසේකර මහත්මයා. එතුමා කියන විධියට සීගිරිය ප්‍රදේශයේ සංචාරකයන්ගේ විශාල අඩුවක් සහ ඒ ප්‍රදේශය ඒ ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය කෙරෙහි මේ තත්ත්වය කෙළින්ම බලපා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් තිබෙන දත්ත එක්ක ගුවන් තොටුපොළ පැත්තේ තත්ත්වය කොහොමද කියලා මම අද හොයලා බැලුවා. දිනක පැමිණීම සියයට 20කින් අඩු වෙලා. විශාල ප්‍රශ්නයක්.

විශේෂයෙන්ම අඩු වෙලා තිබෙන්නේ විදේශිකයන්ගේ පැමිණීමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ලංකාවේ කීර්තිනාමය හදාගෙන ඇවිල්ලා, 2019 ජනවාරි වන විට ලෝකයේ හොඳම ගමනාන්තය, -world's best destination - කරගත්ත ලංකාවට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද වන විට රටවල් 26ක් විතර අපේ රට සංචාරය නොකළ යුතු තැනක් හැටියට නම් කරලා තිබෙනවා. ඒ පිළිබඳව සමහර පුවත් පත් නිවේදනය කරලා තිබෙන ආකාරය මම දැක්කා. මේක ඉතාමත් අපකීර්තිමත් තත්ත්වයක් බව මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම, ලංකාව ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, workshops වැනි

දේවල්වල එක ගමනාන්තයක් වුණා. විශේෂයෙන්ම මේ නොවැම්බර් සිට ජනවාරි දක්වා ශීත ඍතුව තුළ ලංකාවේ පවත්වන්න තිබුණු exhibitions, workshops, conferences ඔක්කෝම මේ වන විට විශාල වශයෙන් ඒ ගොල්ලන් අවලංගු කරලා තිබෙනවා. ඒ හරහා දළ වශයෙන් අපේ රටට ලැබෙන්න තිබුණු ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක පමණ ප්‍රමාණයක් මේ Winter Season එකේ අපට අහිමි වෙලා තිබෙන බව සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන හරහා අපට දැනගන්න ලැබුණා. මේක විශාල ප්‍රශ්නයක්. මම කලින් කිව්වා වාගේ මේ කාලයේ තමයි, සංචාරක කර්මාන්තය මූලික වශයෙන් වැඩිම ආදායම් ප්‍රතිශතයක් ලබා ගන්නේ. සමහර වෙලාවට සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින කොම්පැනිවලට සියයට 50ක, 60ක විතර ආදායම් ප්‍රමාණයක් අද නැතිවෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් දැන් ලංකාවේ තිබෙනවා, විදේශීය ධනවත් සංචාරකයන්; වැඩියෙන් මුදල් වියදම් කරන්න පුළුවන් සංචාරකයන් වෙනුවෙන් තිබෙන hotels. අපි ඒවාට කියනවා, high-end hotels කියලා. අද වන විට රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය නිසා බෙන්තොට Avani Hotel එකට විතරක් ලබන වසරේ ජනවාරි මාසයේ දී ලැබෙන්නට තිබෙන ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 5ක පමණ මුදලක් අහිමි වෙලා තිබෙනවා. ඒ හරහා අද ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ දැනට ක්‍රියාත්මක වන inbound travel and tour operatorsලා, taxi driversලා, ඒ වාගේම hotel chains, සංචාරක ක්ෂේත්‍රයක් එක්ක බද්ධ වෙච්ච විවිධ ක්ෂේත්‍රවල වෙළෙඳ සැල් හිමියන්, විශේෂයෙන්ම සංස්කෘතික කටයුතුවල නියැළිලා ඉන්න කණ්ඩායම්, මේ ක්ෂේත්‍රයට ආවේණික සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නියැළී සිටින අය, උදාහරණයක් හැටියට ඇම්බැක්කේ වැනි පළාත්වල තිබෙන කැටයම් ආශ්‍රිත නිර්මාණ කරන ශිල්පීන් මේ සියලු දෙනාටම මේ නිසා බලපෑම් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය වහාම වළක්වා ගත්තේ නැත්නම්, සංචාරක ක්ෂේත්‍රයේ නියැළී ඉන්න සියලු දෙනාට වාගේම, මේක රටටත් බලපාන ප්‍රධාන ප්‍රශ්නයක් වෙනවා. මොකද, සංචාරක ක්ෂේත්‍රය අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊනියා ආණ්ඩුව කරන මේ විගඩම ඉක්මනටම නැවැත්වුවේ නැත්නම් අපේ රටේ සංචාරක ව්‍යාපාරයට දැඩි බලපෑමක් එල්ල වන්නට පුළුවන්. අපි දැක්කා, මේ විධියට ගියොත් අපට travel ban පනවන්න වෙයි කියලා සමහර රටවල් යෝජනා කරලා තිබුණා. එහෙම වුණොත්, ශ්‍රී ලාංකිකයන් වෙනත් රටවල්වලට යන එකත් නවත්වන්න වෙයි. ඒ වාගේම සමහර සංචාරකයන් සඳහා දෙන උපදෙස් - travel advice - හරහා ශ්‍රී ලංකාව සංචාරකයන් සඳහා යෝග්‍ය නොවන තැනක් හැටියට අර්ථ දක්වන්න පුළුවන්. මෙන්න මේ භයානක තත්ත්වය සංචාරක ක්ෂේත්‍රය තුළ දැඩි ලෙස අද බලපාලා තිබෙනවා. ඒ නිසා මේ හේතූන් ගණනාව පිළිබඳව සාකච්ඡා කොට, රටේ දැන් ඇතිවෙලා තිබෙන අවිනිශ්චිත දේශපාලන තත්ත්වය විසඳීම සඳහා වහාම මැදිහත් විය යුතුව තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද වන විට ඩොලර් බිලියන 4කට වඩා වැඩි ණය බරක් ගෙවන්නට තිබෙන බව අපි දන්නවා. මේ ණය ප්‍රමාණය ගෙවා ගන්න බැරි තැනකට අද අපේ ආර්ථිකය ගිහිල්ලා තිබෙනවා. ඊළඟට, තව සති දෙක තුනක් යනකොට ලංකාවේ ආර්ථිකය මෙහෙයවන්න සතයක්වත් නැති තැනට භාණ්ඩාගාරය පත් වෙනවා. ඒ නිසා ඊනියා ආණ්ඩුවට; මේ හිස් ආණ්ඩුවට අපි කියනවා, පුළුවන් නම් ඉක්මනට ඇවිල්ලා එක පනත් කෙටුම්පතක් හරි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පෙන්වන්න කියලා. "අපේ ආණ්ඩුව ප්‍රබලයි, අපට 113ක් සිටිනවා" කියලා පෙන්වන්න. හරි සරල දෙයක් කරන්න තිබෙන්නේ. එහෙම වුණොත් ජනාධිපතිතුමාට පුළුවන් අපට කියන්න, "මේ ගොල්ලන්ට 113ක් සිටිනවා. ඔයගොල්ලන්ට "sorry" තමයි. ඔයගොල්ලන් යන්න, විපක්ෂයට" කියලා. එවැනි පැහැදිලි, සරල දෙයක් කරන්න තිබෙන්නේ. මේක අංක ගණිතයේ ප්‍රශ්නයක් විධියට ගත්තොත්, 1 වසරේ ළමයෙකුට වුණත් පිළිතුරු දෙන්න පුළුවන් ප්‍රශ්නයක්. කීදෙනෙක් ඉන්නවාද? 123, 113ට වඩා වැඩිද, අඩුද කියලා ඇහුවොත්, 1 වසර ළමයෙකුට වුණත් ඒකට උත්තර දෙන්න තේරෙනවා. ඒ නිසා මෙවැනි දෙයක්වත් තේරුම් ගන්න බැරි ඊනියා ආණ්ඩුවක් සහ - ඊනියා ජනාධිපතිවරයෙක්ද කියන ප්‍රශ්නයත් දැන් පැන නැහෙනවා.

නමුත්, අපේ ජනාධිපතිතුමා, - [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජනාධිපතිතුමා ගණන් fail.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒක තමයි මට තිබෙන ප්‍රශ්නය. ජනාධිපතිතුමා ගණන්, - [බාධා කිරීමක්] "අපේ ජනාධිපතිතුමා" කියන එකෙන් දැන් "අපේ" කියන වචනය අයින් කරන්න වෙනවා. අපේ ජනාධිපතිතුමාට අපි කියන්නේ මේකයි. ඔබතුමා පත් වුණේ අපේ ඡන්දයෙන්. හැබැයි මෙන්න මේ කාරණය මතක තියා ගන්න, ජනාධිපතිතුමනි. පැහැදිලිවම අපි ඡන්දය ඉල්ලුවේ; ඡන්ද ව්‍යාපාරයේදී කිව්වේ, "ජනපති සිරිසේන - අගමැති රනිල්" කියායි. ඒක තමයි අපේ slogan එක වුණේ. අන්න ඒ slogan එකට, අපි කළ ඒ ඉල්ලීම්වලට තමයි හැටදෙලක්ෂයක් ජනතාව ඡන්දය දුන්නේ. එම නිසා, "දැන් මම රනිල්ට කැමති නැහැ, දැන් අයින් කරන්න ඕනෑ, මම ජීවත් වනතාක් කල් රනිල්ට දෙන්නේ නැහැ" කියන්න ඔබතුමාට බැහැ. මේ වාගේ කථා කිව්වාම විදේශිකයෝ මේ රටට එයිද? ඔවුන් මේ රටේ සංචාරය කරන්න කැමැති වෙයිද? ඒක තමයි, ප්‍රධාන ප්‍රශ්නය. මෙතැන හරිම සරල දෙයක් තිබෙන්නේ. මේ ප්‍රශ්නය බුද්ධිමත්ව තේරුම් ගන්න.

අපි දැන් බෝධි පූජා තියනවා; කෝවිල්වලට යනවා. මේ සියලු දේවල් කරලා අප ඉල්ලන්නේ, "ජනාධිපතිතුමාට ඥානය පහළ වේවා" කියායි. ජනාධිපතිතුමාට ඥානය පහළ වෙලා, මේ සරල අංක ගණිත ප්‍රශ්නය අවබෝධ කර ගත්තොත්, මේ රට නැවත තිබූ තැනට ගෙනෙන්න පුළුවන්. අපි ඉල්ලා සිටින්නේ මේ රට ඔක්තෝබර් 26වන දාට කලින් තිබුණු තත්ත්වයට ගේන්න කියායි. අපි අද කථා කරන සංචාරක ක්ෂේත්‍රය විතරක් ගත්තොත්, 2019දී ලෝකයේ හොඳම සංචාරක ගමනාන්තය ශ්‍රී ලංකාව වෙනවා නම්, ඒ හරහා අපට මේ රට ඉහළින්ම ඔසවා තබන්න පුළුවන්. ඒ තැනට යන්න අපිට අවස්ථාව උදා කර දිය යුතුමයි. එහෙම නැති වුණොත්, අපිට එතුමාට කියන්න තිබෙන්නේ එතුමා සම්බන්ධයෙන් ගත යුතු සියලුම පියවර; සමහර වෙලාවට දැඩි පියවර ගන්න සිදුවන බවයි. එතුමා මේ ප්‍රශ්නය විසඳන්නේ නැත්නම් අපිට එහෙම කරන්න වෙනවා.

එතුමා මේ ප්‍රශ්නය විසඳන්නේ නැත්නම් ලංකාවේ අස්සක් මුල්ලක් නෑර සිටින ජනතාව කොළඹට එන්න ලැහැස්තියි. එතුමා මේ ප්‍රශ්නයට විසඳුම් දෙනතුරු ඒ අය කොළඹින් යන්නේ නැතිව ඉන්න ලැහැස්තියි. අන්න ඒක මතක තියා ගන්න. මේ කරන විගඩම වහාම නවත්වන්න කියා ජනාධිපතිතුමාටත්, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ඊනියා අගමැති කියා හඳුන්වා ගන්නා මහින්ද රාජපක්ෂ මහත්මයාටත් අපි කියනවා. එහෙම නොවුණොත් අපි කොළඹ වටලනවා විතරක් නොවෙයි, කරන්න පුළුවන් හැමදේම කරලා මේ රටේ ස්වාධිපත්‍යය සහ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා. ඒ වාගේම සංචාරක

[ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා]

කර්මාන්තයට යහපත් වාතාවරණයක් උදා කර ගන්නවා. සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියාවල නියැළී සිටින සියලුදෙනාගේ ඒ රැකියාවල සුරක්ෂිතභාවය අපි ආරක්ෂා කරනවා. එම කර්මාන්තය නැවත තිබුණු තැනට ගෙනැත්, මේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න අපි බලාපොරොත්තු වන බව සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ජෝන් අමරතුංග මැතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ. භා. 3.29]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ඉදිරිපිට තිබෙන ආසන දිහා බැලුවාම පෙනෙනවා, ආණ්ඩුවය කියන අවජාතක කණ්ඩායම දැන් පාර්ලිමේන්තුවට එන්නේ නැති බව. ඒ කියන්නේ, රජයක් හැටියටවත්, අගමැතිවරයෙක් හැටියටවත්, අමාත්‍ය මණ්ඩලයක් හැටියටවත් වාඩි වෙන්න ඒ ගොල්ලන්ට නිත්ය අයිතියක් නැහැය කියා ඒ අය පිළිගෙන තිබෙනවා.

ඊයේ පෙරේදා සංචාරක ක්ෂේත්‍රයට සිදුවුණු විත්නැහිය දිහා බලන්න. මේ අවජාතක ආණ්ඩුව ඉඳලා-ඉඳලා ඒකට ඇමතිවරයෙක් පත් කළා. සුමාන දෙකක් හිටියේ නැහැ එතුමා ඒක අතහැරලා ආපහු අපේ පැත්තට ආවා. බලන්න, සිද්ධ වුණු විනාශය? මොකක්ද මේ නාඩගම? ඇයි, එතුමා ආවේ? පිස්සන් කොටුවේ ඉන්න බැහැ කියායි එතුමා ආවේ. මේක තමයි අද රටේ පවතින තත්ත්වය. අනේ මම දන්නේ නැහැ, එතුමා ඇවිල්ලා දැන් අපිත් එක්ක වාඩිවෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජයේ සංචාරක විෂයය භාර ඇමතිවරයා විධියට, 2015 වසරේ සිට එම ක්ෂේත්‍රයේ සෑහෙන වර්ධනයක් ඇති කරන්න මට පුළුවන් වුණා. 2015දී තිබුණු තත්ත්වය අනුව, මේ අවුරුද්දේ අවසානය වන විට සංචාරකයන්ගේ පැමිණීම මිලියන 2.5 දක්වා වර්ධනය කරන්න අපි බලාපොරොත්තු වුණා. නමුත්, ඒ ඉලක්කයට යන්න ඉඩ දුන්නේ නැහැ. ඊට අමතරව, අපට ලැබෙන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 4 දක්වා වැඩි කර ගන්න පුළුවන්කමක් තිබෙන බව මට පෙනුණා.

ගිය අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5ක් ලැබුණා. මේ අවුරුද්දේ එය ඇමෙරිකානු ඩොලර් බිලියන 4 දක්වා වැඩි කරගැනීමත්, 2022 වන විට සංචාරකයන් මිලියන හතරක් ගෙන්වා ගැනීමත්, ආදායම වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් මේ රටට ලබා ගැනීමත් තමයි අපේ ඉලක්කය වුණේ. නමුත්, මේ දේවල් ගැන කියන්න කනගාටුයි. අද මේ කණ්ඩායම කරපු වැඩේ බලන්න. ජනාධිපතිතුමා මෙකට වග කියන්න ඕනෑ. එතුමා සිදු කළ ඒ වැරදි ක්‍රියාදාමය ගැන අද මේ සභාවේදී කියැවුණා. එතුමා මේ පාර්ලිමේන්තුට ඇවිත් උත්තර දෙන්න ඕනෑ. වෙනදාට එතුමා ඇවිත් මේ ගරු සභාවේ වාඩි වෙලා ඉන්නවා නේ; අය වැය විවාදය දවස්වලට ඇවිත් වාඩි වෙලා ඉන්නේ. ඇයි, දැන් එතුමා එන්නේ නැත්තේ? එහෙම කටයුතු කරනවා නම්, මෙහෙම චෝදනා කරනවා නම් එතුමා ඇවිත් ඒවාට උත්තර දෙන්න ඕනෑ. නමුත්, එතුමා පැත්ත පළාතේ එන්නේ නැහැ. පාර්ලිමේන්තුව මේ සතියේ බ්‍රහස්පතින්දා රැස් වෙනවා. එදාට යම් යම් යෝජනා තිබෙනවා. මේ සභාව තුළ අපි තවදුරටත් මේ පැත්තේ ඉන්නවාද, ඒ පැත්තේ ඉන්නවාද කියන එක සම්බන්ධයෙන් එදාට යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්න අපට සිද්ධ වෙයි.

මම මේ අදහස් ඉදිරිපත් කරන්නේ මේ ක්ෂේත්‍රය විනාශ වන එක දකින්න අකමැති නිසායි. කවුරු ආණ්ඩු කළත් කමක් නැහැ. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය වන්නේ. මේ රටට එන ආදායම, මේ රටේ ජනතාවට තිබුණු ආදායම නැවත ලබාගන්න, ජීවනෝපාය මාර්ග විනාශ වන එක වළක්වන්න තමයි අපි අද විශේෂයෙන්ම මේ සභාවේ කථා කරන්නේ.

Hon. Deputy Speaker, I would like to speak a few words in English since this message must go to the international community as to what is taking place in Sri Lanka, what is the situation in Sri Lanka, what is the political situation in Sri Lanka and what is the situation that people are facing. Therefore, please permit me to proceed.

The country and the Hon. Mahinda Rajapaksa - I say "honourable" because he was the former President of this country; but today he has become dishonourable because of what he has been doing - should make serious note that no foreign country or Head of State has so far acknowledged Mahinda Rajapaksa as the Prime Minister of Sri Lanka. None of them, not a single country, have sent any congratulatory messages. That is the situation today. That merely proves that the Government is illegal. Countries not resorting to customary diplomatic practice on such new appointments send the silent message that the appointment is not accepted. The Ambassadors and High Commissioners come and whisper to us and say, "What is this? We cannot accept this Government" and that their Governments are not going to acknowledge what has been taking place.

As such Hon. Mahinda Rajapaksa will stand to be dignified if he resigns from this position of Prime Minister. That is the only advise we can give him as he was the President of this country for two sessions. It is best for him to resign from this premiership and give it away to the rightful people.

During the period of Government from 2015 to 2018 October, daily street protests, worker strikes over irrational issues and flimsiest reasons, *satyagrahas* and other public peace disruptive actions were orchestrated to cripple the public life to hold back the country from moving forward by the very same elements who are members of the current illegal regime. This is what they did in the last couple of years. They were trying to prevent the development of tourism in this country and the day-to-day life.

Then Sir, what seems to govern today is the rule of man and not the rule of law. That is why all these arguments took place.

Under the present illegal Government, tourism is on a self-destructive mode. It is quite evident from what was stated by the Mover of this Motion. It is quite a timely Motion. I must say that we have to bring to the notice of the public of this country as well as the international

community that under the present illegal Government tourism is on a self-destructive mode, as I mentioned.

Then, we are reminded how and why the Rajapaksa Government was defeated in 2015. It is important to reflect as to why he failed internationally to be branded a "banana regime" at that time. It was our darkest period in the international and local politics since Independence and he with the same team is now back in action. They have come back once again with their antics.

Political turmoil created by callous and undemocratic decisions related to the governance of this country leading to deplorable happenings by sections of unruly Parliamentarians in the hallowed people's Chamber where you are seated, carried to the world by the worldwide media has created a fearful and negative impact on the image of Sri Lanka as a tourism product in the eyes of the whole world. That is the end result of what they have demonstrated in the last couple of days.

I am reminded as to the damaging image of Sri Lanka for tourism under Hon. Mahinda Rajapaksa during the time prior to his defeat in 2015 when tourists felt unsafe to visit Sri Lanka. At that time, it was like that. You know it, Sir. One major incident was the gang rape of a British lady and killing of her boy friend headed by the Chairman of the Tangalle Pradeshiya Sabha, a close political ally of Hon. Mahinda Rajapaksa, when he was the President of this country. That went all over the world.

There were travel advisories issued not to come to Sri Lanka as Sri Lanka was an unsafe destination. This damage cannot be undone easily in the context of the present situation of the country. The current impasse, if not democratically and justly settled, will cause irreparable damage to all sectors of the economy and lead to very adverse effects on tourism and those whose livelihood depend on it in the country in the forthcoming Winter tourist season. Tourist season is the Winter season of the European countries. Most of them make bookings and come here in millions.

Tourism of the country realistically was on track from 2015 to reach its target of 4 million tourists by the year 2022 - those were the estimates and we were moving towards that -but now it has suddenly been derailed by retarding and damaging political events causing a massive setback for tourism way forward in this country. The estimate that we had was that tourism would be the highest income earner in foreign exchange in the immediate future. We had earlier the foreign employment; we had the textile manufacturing industry. Of course, earlier it was the plantations but they went down and then foreign employment took up the first place for the largest amount of foreign exchange earnings. However, we felt that we had so much of attractions in this country and tourism would be the highest foreign exchange earner and we were moving towards that. By 2022, we may have achieved that, if not for this nonsense.

Tourism is the third highest foreign exchange earner of the country at the moment in the ambitious programme to make it the highest foreign exchange earner in the "Vision 2020". Regretfully, all this will be undone and the country will lose the much-needed foreign exchange in the form of tourism earnings if this situation continues. If this illegal government continues for another couple months, it will be disastrous.

The Government and the Treasury will stand to lose the much-needed revenue to supplement its reserves when the industry takes a dip as we are now trying to expose.

The hotels with their staff and those allied to their services will suffer when the much expected service charges and other benefits are no longer at their disposal. This is a very serious situation. When people see that their service charges are not forthcoming, they will look for employment in some other countries. We will lose the best chefs and the best staff who are now serving. They will go out because the Sri Lankan staff is readily acceptable in any of these foreign hotels**.** Even the Maldives, the Middle East and Singapore are eagerly waiting to take our people.

Many skilled and semi-skilled employees in this industry, which is already facing a shortage, will be compelled to seek foreign employment which will be a major drawback to the industry. With the greatest difficulty, we were getting them back in the last couple of years by making the industry work more lucrative so that they would be able to draw better salaries. Now they will go back once again. How are we going to move forward?

The major partners in the trade, namely the airlines, will cancel the frequencies. At that moment, they were increasing their frequencies in flight to land in Sri Lanka and even many may consider pulling out of Sri Lanka as had happened in the past. This is one area that we were moving forward to attract more frequencies from the existing airlines that were touching down in Sri Lanka and also to invite new airlines which did not come, to come to Sri Lanka so that there will be more tourists coming here.

The local travel agents will face a similar challenge when arrivals to Sri Lanka begin to drop. They too have invested heavily on transport services, for example, on luxury coaches, buses, vans, cars and so many other items with borrowed financial assistance. They too will face a similar predicament. They will not be able to service their loans. Ultimately, their assets would get sold up by the banks.

Now, Sir, the new development that we embarked on was the "homestay". You know it. When we say “homestay” it is similar to cottage industry and meant for the poor villagers. The villagers who have borrowed from the bank may perhaps be forced to even commit suicide when they are unable to pay their debts. Now, homestay was a new industry that was developing where the low-income groups would hire out a couple of rooms in their house to the tourists and get an additional income in order to meet their day-to-day expenses. That was developing and we gave all the encouragement to any region which want to develop the homestay.

[ගරු ජෝන් අමරතුංග මහතා]

The support services including the so-called "Tuk Tuk" and taxi drivers who make their living by transporting tourists, the vegetable, meat, fish, fruits and all other varied suppliers will be at the receiving end due to this impasse and drop in arrivals. Even the king coconut seller will feel the pinch. All these people derived additional expenditure particularly during this season. So much that they were looking forward in order to cushion their income through this period. Those who are earning from food outlets, restaurants, cafes, bars, casinos, wine stores et cetera will be very unhappy when their income is depleted.

Drop in the national earnings from Sigiriya, Dambulla, Polonaruwa and Anuradhapura, archeological sites, wildlife sanctuaries and a host of others will be a major concern to the Government coffers. Income from all these places were coming into the Government coffers, but now that will be drastically reduced and they will find it very difficult to manage their affairs.

Sir, the UK Travellers Association announced, "The best long haul destination for family travel - 2017, 2018" and National Geography Traveller announced," Sri Lanka on the cool list - 2018". These are some of the brandings that we obtained from the foreign agencies. Virtuoso Luxe Report Australia states that Sri Lanka is among the five most popular destinations for Aussi Traveller.

Now, Sir, I have got some feedback from some of the leading hoteliers. For example, Anantara Hotel in Tangalle - you know it - has said their losses confirmed booking for April/May which is the low season to the value of US Dollars 3 million due to a Hollywood movie production being cancelled.

Mind you, we are not talking only of these two months of this year. This is the effort taken for next year's reservations and also there are so many agencies that are helping Sri Lanka. USAID is giving a lot of assistance for training. I do not know whether they will continue under this scenario. There was World Bank aid for infrastructure development. They were giving a large amount of money to develop infrastructure wherever the tourists would visit Sri Lanka. The Australian Government funding for training and development- they were giving a lot of money to train our young boys and girls to be smart in the hotel industry - may also now get suspended on account of this. Then, there was assistance given by the Canadian Government also. These are the repercussions that we will experience due to what has been happening here.

In the Ministry of Tourism Development there are four institutions. One is the Sri Lanka Tourism Development Authority. Second is the Sri Lanka Tourism Promotion Bureau. The third is the Sri Lanka Convention Bureau and the fourth is the Sri Lanka Institute of Tourism and Hotel Management. Today, there are no Chairmen or Managing Directors in any of those institutions. No board meetings are held; nothing is happening. The whole promotional programme of the Ministry of Tourism Development and Christian Religious Affairs has come to a standstill. What I am saying is, whoever may govern, unless those institutions function and go forward with their progressive measures, the country is going to lose valuable foreign exchange. These four institutions received nearly Rs. 4 billion in 2017. From whom? From the tourists. One source of income is the Embarkation Tax, which brings an income of roughly Rs. 2.7 million to the Sri Lanka Tourism Development Authority, the Sri Lanka Tourism Promotion Bureau and the other two institutions. Then, there is another Rs. 1.2 billion that comes from hotel taxes to the State. So, that way, nearly Rs. 4 billion do come to those four institutions for their tourism development and promotional programmes, not from the Treasury. The Treasury gives hardly any money. On the contrary, the Treasury, from time to time, borrows foreign exchange from those institutions when they are short of money to service their loans. We have been giving almost US Dollars 1 billion every year to the Treasury in order to facilitate their requirements. So, all this is now going to get upset.

Many of the people who have been looking forward for a better future will leave. The number of investors who wanted to come to Sri Lanka, maybe, to invest in hotels, in entertainment or in whatever in order to promote tourism will not come now. The travel advisories that are issued by various countries are creating a very serious situation. The Minister of Foreign Affairs has been very strongly recommending to all the Ambassadors to speak to their Governments to take away the travel advisories, but nothing has happened; no one is moving to. All the agencies - the IMF, the World Bank and the ADB - are watching this situation. Whatever loan facilities and assistance that we have been eyeing for or expecting to get in the future will be freezed; we will not get those. As a result, it is the poorer people, the low-income groups, who will get affected the most.

Today, many hoteliers are worried because they are unable to service their loans. They have been building hotels and refurbishing their hotels borrowing money from the banks, expecting an income to come during the height of the tourism season and when that is not there, many of them feel that they cannot go on and fear that the banks will put up their hotels for sale as they will not be able to pay their loans. So, this is a very serious situation.

I do not know why the leaders or these people who are orchestrating all this do not understand that. The other day, many of these travel agents and hoteliers met the Hon. Mahinda Rajapaksa and told him about the disaster they are facing as a result of this situation, the amount of cancellations that are taking place and about the number of investors who are now backing off. This is a very sad situation for the country; this is very unfortunate. We were trying to do our very best in developing tourism. In tourism, Sir, there are no imports. We only market the natural assets and reserves we have. The tourists who come here go around and they are sometimes so taken up because Sri Lanka is such a beautiful country.

There is authenticity; there is the biggest animal in the sea; there is the biggest animal on land; all that is visible

here. Then, the heritage sites declared by the UNESCO are highly respected and popular among the tourists. Unlike the apparel industry where you have to import raw materials, manufacture and then export, in the tourism industry there is nothing like that. All what we market is, all what we have here and whatever we earn is the net income to the country. Whatever we say, this is the most unfortunate situation that we have witnessed. At least now, let these people realize the damage they have done. Without allowing further damages and destroying this country, we will have to do something.

First we must understand, Sir, this country is very unfortunate. We had the JVP uprising in 1971 which destroyed human life, valuable buildings, vehicles et cetera. Again, in 1988, there was another uprising. With that also the tourism industry got affected. Nobody wanted to touch here. See the amount of damage and destruction that took place. Then, came the LTTE. With all this happening, no tourist wanted to come to Sri Lanka. They went to Maldives. They bypassed Sri Lanka. That is how the Maldives developed. They have developed a lot. They have nothing to offer. They have only the sea and sand whereas we have everything. Within a couple of hours, we go to the cool climate; we go to the sea beaches, the wildlife, everything. So, this is very unfortunate. People who are most affected are the poorer people who are much dependent on the livelihood of tourism and today they are all wondering what to do. This is a very sad situation. On one hand, the Government and the country will lose the much required and valued foreign exchange. On the other hand, the lower-end of our society will not be able to meet their ends because tourism was one of the major income earnings for most people on the coastal line and even the central part of the country and on the eastern coast as well. But, today, all that is going to be devastated. The cancellations mentioned by me are now in a region of about 20 per cent and arrivals have gone down by 20 per cent. The important thing is, there will be no bookings for the next year. For the next six months, there will not be any bookings. This industry is going to have a severe beating. All those people who have invested will find it very difficult to service their loans and also to sustain employment.

We have trained about 6,500 young boys and girls every year in the industry. That was one of the programmes for getting employment for the younger generation. Now all that may not take place. Those who got trained will not stay here. They will go abroad. The Middle East is waiting with open arms to take all those trained boys and girls into their hotel industry, so are places like the Maldives, Singapore, Malaysia and so on. So, this is a very serious situation. On the employment side, we are going to lose; on the foreign exchange side, we are going to lose and also the lower income groups will not be able to earn their estimated income. So, this is a very sad situation.

Therefore, at least within the next couple of days, I hope those who are not here today in Parliament would realize that they are not recognized as the Government both by the international community and Sri Lanka and decide to hand over the reign to the Hon. Ranil Wickremesinghe, who was the lawful Prime Minister appointed by the President of this country.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි විස්සක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාවේ සඳහන් පරිදි, මේ ඇති වී තිබෙන දේශපාලන අර්බුදය නිසා සංචාරක කර්මාන්තයේ බිඳ වැටීම ගැන තමයි විවාදය පැවැත්වෙන්නේ. මුලින්ම කියන්න ඕනෑ කාරණයක් තමයි, මීට කලින් කථා කළ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමන්ලා අමාත්‍යාංශ දරද්දීත් කල් තැබීමේ විවාදවලදී පාර්ලිමේන්තුවේ මෙහෙම ස්වභාවයක් තිබුණු බව. සමහරවිට උත්තර දෙන්න ඇමතිවරු හිටියේත් නැහැ. නමුත්, දැන් මාසයක පමණ කාලයක් අපට ඉතා පැහැදිලිව පෙනෙන්න තිබෙනවා, මෛත්‍රීපාල-රාජපක්ෂ නීති විරෝධී ආණ්ඩුවට එරෙහිව ව්‍යවස්ථාදායකයේ බලය පෙන්වීම සඳහා මේ පාර්ලිමේන්තුව රැස් කරන්න සිදු වෙලා තිබෙන බව. නමුත් අනෙක් පැත්තෙන් ගත්තොත්, ජනාධිපතිවරයාත්, මහින්ද රාජපක්ෂ මහතාත් තමන්ගේ බල තණ්හාවට මේ කරන විනාශය කොපමණද කියන එක තේරෙන්නේ නැති එක ඇත්තටම ඉතා විශාල ප්‍රශ්නයක්. අද අපි මේ කල් තැබීමේ විවාද සඳහා ඉදිරිපත් වෙමින් යම් කිසි කරුණක් කියන එක ඇත්ත. නමුත් වැදගත්ම දේ තිබෙන්නේ, පාර්ලිමේන්තුව මෙහෙම රැස් වෙන්නේ,- සමහර අය අහනවා, "පාර්ලිමේන්තුව මෙහෙම රැස් වෙන්නේ ඇයි?" කියලා. එහෙම ගත්තොත් ඒකේ එක පැත්තක් තිබෙනවා. - හිස් පුටුවලට කථා කරන්න නොවෙයි. නමුත් අනෙක් පැත්තට ගත්තොත්, ජන වරම සියයට සියයක් උල්ලංඝනය කරලා හොර කැබිනට් එකක් රැස් වෙනවා. මේ රටේ හිටපු හැම ජනාධිපතිවරයාම, හැම ආණ්ඩුවක්ම සියයට 60කට, 70කට වැඩිය ජන වරම උල්ලංඝනය කර තිබෙනවා. ඒ නිසා තමයි අවුරුදු 70ක පාලනයෙන් පසුගිය අවුරුදු 40ම වාගේ එක්සත් ජාතික පක්ෂයට සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට 1994න් පස්සේ -2010 අර යුද්ධය අවසන් වෙලා ආපු ජන්දය ඇරුණාම- එකම වෙලාවකවත් බහුතර බලයක් එන්නේ නැත්තේ. 113 ආණ්ඩු එන්නේ නැත්තේ ඒක නිසා. නමුත්, ඒ හැම ආණ්ඩුවක්ම සියයට හැටක, හැත්තෑවක, එහෙම නැත්නම් සියයට අසූවක මට්ටමට ජන වරම උල්ලංඝනය කරනවා මිස, සියයට සියයක්ම ජන වරම උල්ලංඝනය කරලා නැහැ. නමුත්, අද මෛත්‍රීපාල සිරිසේන මහතා සියයට සියයක් ජන වරම උල්ලංඝනය කරලා තිබෙනවා. ඊළඟට ගත්තොත්, මේ ජන වරම උල්ලංඝනය කරලා පාර්ලිමේන්තුවේ බහුතර බලය නැතිව,- පාර්ලිමේන්තුවේ 113ක් රාජපක්ෂ-මෛත්‍රීපාල කණ්ඩායමට නැහැ කියන එක ඉතා පැහැදිලි කාරණයක්.

ඒක ඔවුන් පවා දන්නවා. එසේ තිබියදී කිසිදු ලජ්ජාවක් නැතිව, කිසිදු හිරිකිතයක් නැතිව, නීති සියල්ල කඩමින්, හොරු කණ්ඩායමක් වාගේ පාර්ලිමේන්තුවේ බලය අල්ලාගෙන ඉන්නවා. මේ වෙලාවේ මට මතක් වෙන්නේ සමහර Hollywood thriller films. හොරු කණ්ඩායම් බැංකුවලට පැනලා කොටු වුණාම බැංකුව ඇතුළේ තුවක්කු තියාගෙන, බෝම්බ තියාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුවටත් ඒක කරන්න හැදුවා. හොරු කණ්ඩායම

[ගරු බිමල් රත්නායක මහතා]

එළවලා දමන්න පාර්ලිමේන්තුවේ අපි සමත් වුණා. අද ඔවුන් රටේ තනතුරු ටික අල්ලාගෙන, රටේ අමාත්‍යාංශ අල්ලාගෙන, රටේ ආයතන අල්ලාගෙන ඒ කටයුත්ත කරනවා. ඇත්තටම ගත්තොත්, ඒ කුමන්ත්‍රණය පාර්ලිමේන්තුව තුළ පරාජයට පත්වෙලා තිබෙනවා; අධිකරණය තුළ සැලකිය යුතු ප්‍රමාණයකින් පරාජයට පත්වෙලා තිබෙනවා; විදේශ රටවල් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. අධිරාජ්‍යවාදී රටවල් ලෙස නම් දැරූ, ලංකාවට බොහෝ වෙලාවට යම් යම් කරදර කරන රටවල් පැත්තක තියන්නකෝ. අඩු ගණනේ මාලදිවයිනවත් ලංකාවේ දැන් තිබෙන ආණ්ඩුව පිළිඅරගෙන නැහැ නේ. මාලදිවයින කියන්නේ අධිරාජ්‍යවාදී සුදු ජාතිකයන් සිටින රටක් නොවෙයිනේ. මහින්ද රාජපක්ෂත් ගිහිල්ලා ව්‍යාපාර කරපු, මහා වැදගත්කමක් දීපු සීෂෙල්ස් රාජ්‍යවත් මේ ආණ්ඩුව පිළිඅරගෙන නැහැ. ළඟදී මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් තකහනියේ සීෂෙල්ස් රටට ගියා. මම දන්නේ නැහැ, මොකට ගියාද කියලා. අඩු ගණනේ සීෂෙල්ස් රාජ්‍යවත් මේ ආණ්ඩුව පිළිඅරගෙන නැහැනේ. ස්වාසිලන්තයවත් මේ ආණ්ඩුව පිළිඅරගෙන නැහැනේ. ඒවා අධිරාජ්‍යවාදී රටවල් නොවෙයිනේ. එම නිසා අපට පෙනෙන දේ තමයි, ඉතාම දරුණු, ඒ වාගේම ඉතාම නරක පූර්වාදර්ශයක් මුළු රටටම ලබා දෙමින් තිබෙන බව.

මහින්ද රාජපක්ෂ මහතා බලයට පත් කිරීම සම්බන්ධ ප්‍රශ්නයේදී පොහොට්ටුවේ සමහර මන්ත්‍රීවරු අමාරුවෙන් ගොඩනඟාගෙන තිබෙන තර්කයක් තිබෙනවා. ඒ තමයි, 2015 ජනවාරි 9වැනි දා රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධුරයට පත් කරද්දී එතුමාට සිටියේත් මන්ත්‍රීවරු 47දෙනායි, ඒ නිසා මහින්ද රාජපක්ෂ මහත්මයා පත් කළාම මොකද වෙන්නේ කියන තර්කය. අපි හිතමු, ඒ පත් කිරීම වැරැදියි කියලා. අපි දන්නවා, ඒ වෙලාවේ එසේ පත් කිරීම සදාචාර විරෝධියි කියලා. ඒ සඳහා යම් කිසි නීතිමය ඉඩ කඩක් තිබුණා, දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වෙලා තිබුණේ නැති නිසා. නමුත්, දේශපාලනමය වශයෙන් ඒක වැරැද්දක් කියලා අපි දන්නවා. නමුත් අපි දන්නවා, ඒ වෙලාවේ පොහොට්ටුවේ අය, නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායම තමන් කරපු අපරාධවලට අහුවෙයි කියලා පණ හයේ වෙව්ලමින් සිටියේ කියලා. ඒ නිසා එතුමන්ලා මොකක්ද කළේ? ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ඕනෑ හැටියේ විශ්වාස භංග යෝජනාවක් ගේන්න තිබුණා. ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණට සිටියේ මන්ත්‍රීවරු තුන්දෙනායි. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පත් කිරීම සාධාරණද, සදාචාර සම්පන්නද කියන එක අපි ඒ වෙලාවේත් මතු කරලා තිබුණා. මොකද, ජන වරම තිබුණා කියලා නීති විරෝධී දේවල් කරන්න බැහැ. එහෙම නම් ජනවරම තිබෙනවා කියලා ජනවරමට ඕනෑ ඕනෑ දේවල් දමන්න පුළුවන්. නමුත්, මේ රටේ නීති පද්ධතියක් තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන මහතා හිතන විධියට වෙන කවුරු හෝ කෙනෙකුට ජන වරම තිබුණා කියලා හැම දේම කරන්න බැහැ. ජන වරම ක්‍රියාත්මක වෙන්නේ නීතිවලින්. එහෙම නැත්නම්, හැම පාර්ලිමේන්තුවකටම පසුව තිබෙන නීති අහෝසි වෙන්න ඕනෑ. රාජපක්ෂ පවුලට හෝ වික්‍රමසිංහ පවුලට හෝ මේ පාර්ලිමේන්තුව විකුණනවා කියලා ජන වරමක් ගන්න පුළුවන්ද? එහෙම බැහැ. ඡන්දය දුන්නත් කරන්න බැහැ. 2015 ජනවාරි 9වැනි දා රනිල් වික්‍රමසිංහ මහතා අගමැති කරද්දී ඕනෑ හැටියට ඒ යෝජනාව පරද්දන්න තිබුණා. ඒ වෙලාවේ කථානායකවරයා හැටියට සිටියේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේම සහෝදරයා වන චමල් රාජපක්ෂ මහතා. ඒ වෙලාවේ විශ්වාස භංග කිසිවක් ගෙනාවේ නැහැ. ඒ වෙලාවේ ජනාධිපති ධුරය භාර දීලා පණ හයේ ගැහී ගැහී තමයි සිටියේ. ඒ විතරකුත් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකමත් ඇවිල්ලාම භාර දුන්නා. එහෙම තිබියදී දැන් මතු කරනවා, "අර වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහතා අගමැති හැටියට පත් කළා නම්, දැන් මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති හැටියට පත් කළාම මොකද වෙන්නේ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙලාවේ ඒ වැරැදි පූර්වාදර්ශය නතර නොකළ නිසා තමයි, ඒ වෙලාවේ ඒ වැරැද්ද කරද්දී අවශ්‍ය සාකච්ඡාව, අවශ්‍ය සංවාදය, අවශ්‍ය විවේචනය මතු නොවුණු නිසා තමයි අද ඊටත් වඩා වැරැදි කරමින් යන්න හදන්නේ. එම නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා විසින් කරගෙන යන වැරැදි, දේශපාලන වශයෙන් ඉතාම නරක පූර්වාදර්ශ සියල්ල පරාජයට පත් කළ යුත්තේ ඒවා ඉතාම නරක ගණයේ දේශපාලන කුමන්ත්‍රණ බවට පත් වෙන්න පුළුවන්කම තිබෙන නිසායි කියන එකයි අපි කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට සංචාරක කර්මාන්තය සම්බන්ධයෙනුත් මම කෙටි වේලාවක් කථා කරන්න කැමැතියි. නමුත් ලැබී තිබෙන වෙලාව ඇතුළේ මේ මූලික කාරණයත් කියන්න ඕනෑකම තිබෙනවා. ඒ නිසා මේක ඉතාම වැරැදි පූර්වාදර්ශයක්. මේ නීති විරෝධී මෛත්‍රීපාල - රාජපක්ෂ පාලනය අනිවාර්යයෙන් පරද්දන්න ඕනෑ. මේ අනීතික පාලනය ගෙදර යවන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඒ සම්බන්ධව පැහැදිලි ස්ථාවරයක් අරගෙන ඉන්නවා. පක්ෂයක් වශයෙන් අපට තිබෙන ඡන්ද පදනම ලොකු වෙන්න පුළුවන්; පොඩි වෙන්න පුළුවන්. නමුත් අපි කිසිම ප්‍රශ්නයක් හොඳින් අධ්‍යයනය කරන්නේ නැතුව, හොඳින් සාකච්ඡා කරන්නේ නැතුව, එහි ගැඹුර සොයලා බලන්නේ නැතුව කඩා පනින, මැදිහත් වෙන පක්ෂයක් නොවෙයි. ඒක ඉතිහාසයේ සිට අපි උරුම කරගෙන තිබෙන එක්තරා දේශපාලන වටිනාකමක්. ඒ නිසා අපි දකිනවා, මේ තත්ත්වය බරපතළ අනතුරක් කියන එක. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා එතුමාගේ වත්ත කියලා හිතාගෙන ලංකාව පාලනය කරන්න හිතනවා නම්, අපි සිරිසේන මහත්තයාට කියන්න කැමැතියි, extremely sorry කියලා.

අද සිරිසේන මහත්තයාගේ මානසිකත්වය තිබෙන්නේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකුගේ වාගේයි. එතුමා දේශපාලන වශයෙන් නන්නත්තාර වෙලා තිබෙනවා. තනියම විනාශ වෙනවා වෙනුවට එතුමා මොකක්ද කරන්න හදන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා රටත් විනාශ කරගෙන යන්න හදනවා. අපි ඉස්කෝලේදී ඉගෙන ගෙන තිබෙනවා "යන යකා කොරහත් බිඳගෙන යනවා" කියලා. අපි ඒක ලිව්වාට දැකලා තිබුණේ නැහැ. දැන් ලංකාවේ පාසල් දරුවන්ටත්, රටේ ජනතාවටත් යකා කොරහ බිඳගෙන යන්නේ කොහොමද කියලා රහ දක්වන හැටි මේ දවස්වල බලාගන්න පුළුවන්. හැබැයි, ඒ දුර්වල යක්ෂයාට අපි කියන්න කැමැතියි, "ඕනෑම දෙයක් තමුන්නාන්සේ තමුන්නාසේගේ ගෙදරදී කරගන්න, රටට හානි කරන්න එපා." කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නීති විරෝධී, වැරැදි සහගත කටයුත්ත නිසා රටේ සංචාරක ව්‍යාපාරයේ බිඳ වැටීම ගැන විවිධ මන්ත්‍රීවරුන් කිව්වා. ලංකාවට එන විදේශීය සංචාරකයන්ගෙන් ලංකාවට වැඩි ආදායමක් ලැබෙන සංචාරකයන් තවමත් එන්නේ යුරෝපා රටවලින්. චීනයෙන්, ඉන්දියාවෙන් ගොඩක් අය එන බව ඇත්ත. නමුත්, වැඩි මුදලක් ගෙනෙන සංචාරකයන් තවමත් එන්නේ යුරෝපා රටවලින්. එක්සත් රාජධානිය ඒ කියන්නේ බ්‍රිතාන්‍ය, එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජර්මනිය, ප්‍රංශය කියන රටවල් වර්තමානයේ ඇති වී තිබෙන නීති විරෝධී දේශපාලන තත්ත්වය නිසා සංචාරකයන්ට නිකුත් කරන ලද travel warnings සම්බන්ධ ලේඛනය මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

එහෙම කරන්නේ වෙන මොකකටවත් නොවෙයි. මේ රටේ අනීතික පාලනයට විරුද්ධව නැඟිටිය යුතු සමහර සමාජ කණ්ඩායම් ඉන්නවා. මේ ගැන සාකච්ඡා කළ යුතු සමහර සමාජ කණ්ඩායම් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන්ගේ ස්වභාවය තමයි, "රටට මොනවා වුණත් කමක් නැහැ. අපේ බිස්නස් හරි යනවා නම්" කියන එක. එහෙම පිරිස් ඉන්නවා. "අපේ පඩිය හම්බ වෙනවා නම් රටට මොනවා වුණත් කමක් නැහැ" කියන පිරිසක් රටේ ඉන්නවා. නමුත් අද අපි හිතනවා, එහෙම සිතීමෙන් මේ අනීතික දුෂ්ට බලවේගයෙන් අපේ රට බේරාගන්න බැහැ කියලා. ඒක නිසා තමයි අපි ජනතා විමුක්ති පෙරමුණ විධියට දුර දැකලා කටයුතු කරන්නේ.

මෛත්‍රීපාල සිරිසේන මහත්තයා 26වැනි දා හවස මේ ආකාරයෙන් පිස්සුවක් නටයි කියලා අපි දැනගෙන නොසිටියත්, එතුමාගේ සිය දිවි නසා ගන්නා මානසිකත්වය 2018 පෙබරවාරි ඡන්දයෙන් එතුමා ලබපු දැවැන්ත පරාජයෙන් වැඩි වෙන බව දැන ගත්තාට පස්සේ තමයි, අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න කටයුතු කළේ. විධායක ජනාධිපති ධුරයට රටකට කරන්න පුළුවන් හානිය කොපමණද කියලා දන්න නිසා තමයි අපි පක්ෂයක් වශයෙන් ඒක ගෙනාවේ. පාර්ලිමේන්තුවේ කිසිදු බලයක් නැති ජනාධිපතිවරයෙකුට මෙතරම් හානියක් රටකට කරන්න පුළුවන් නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ යම් කිසි බලයක් සහිත ජනාධිපතිවරයෙකුට අනාගතයේදී රටට කරන්න පුළුවන් හානිය කොපමණද කියලා අපට මැන ගන්න පුළුවන්. දැනටමත් අපි ඇති වෙන්න රටට හානි කරගෙන තිබෙනවා, එවැනි ජනාධිපතිවරුන්ගෙන්. ඒ හරහා රටේ ආර්ථිකය සහමුලින්ම විනාශ කරලා දමනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක කර්මාන්තය ගැන සංචාරක කර්මාන්තයේ යෙදෙන අය මටත් විස්තර කිව්වා. ගිය නොවැම්බරයේ ඉඳලා මේ නොවැම්බරය දක්වා සන්සන්දනය කළොත් සාමාන්‍යයෙන් සංචාරකයන් පැමිණීමේ බිඳ වැටීම සියයට 15ක් පමණ වෙලා තිබෙනවා. තවම මේවායේ අවසාන ගණන් හිලව් ලැබිලා නැහැ. ඒ වාගේම, තමයි ඒවායේ වැඩ කරන සේවක - සේවිකාවන්. වෙනත් මන්ත්‍රීවරුත් ඒ ගැන කිව්වා. ඔවුන්ට ලැබෙන service charges අඩු වෙලා තිබෙනවා. ඒක නිසා මේ රටේ තිබෙන තත්ත්වය ආර්ථිකයට පැහැදිලිවම බලපානවා. මොකක් වෙනුවෙන්ද මේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රට බෙදනවා වාගේ අනතුරකදී නම් මේ තත්ත්වය වෙන්නේ, රටට විශාල ආක්‍රමණයක් ඇතිවන අවස්ථාවකදී නම් මේ තත්ත්වය වෙන්නේ අපට ඒක තේරුම් ගන්න පුළුවන්. නමුත් මේ මොකක්ද වෙන්නේ? මෛත්‍රීපාල මහත්තයාට ඊළඟ සැරේ ජනාධිපති වෙන්නත්, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ බලතන්හාව සහ එයාගේ නඩු ටිකෙන් ආරක්ෂා වෙන්නත් තමයි මේ දේවල් වෙන්නේ.

අපි අධිකරණයට නිසි ගෞරවය ඇතිවයි මේ කාරණා කියන්නේ. මීට කලිනුත් අපි මේ නඩු සම්බන්ධව කිව්වා. රාජපක්ෂ පවුලේ නාමල් රාජපක්ෂ මහතාට, ගෝඨාභය රාජපක්ෂ මහතාට, බැසිල් රාජපක්ෂ මහතාට, ශිරන්ති රාජපක්ෂ මහත්මියට, ඊට පස්සේ අද රාජපක්ෂ කල්ලිය සමඟ ඉන්න ඇමතිවරුන්ට, වීරවංශට, මහින්දානන්ද අලුත්ගමගේලාට, -මේ හැම කෙනාටම වාගේ- මේ දිනවල නඩු තිබෙනවා. දැනට ඒ නඩු කීපයක් කැඳෙව්වා. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නඩුව කල් දමා තිබෙනවා, මාස ගණනාවක් එහාට. මට තවම ඒ දිනය දැනගන්න ලැබුණේ නැහැ. බැසිල් රාජපක්ෂ මහතාගේ නඩු කල් ගිහිල්ලා තිබෙනවා. වීරවංශගේ නඩුව මැයි මාසයට කල් ගිහිල්ලා තිබෙනවා. අපි උසාවියට මොකුත් කියන්නේ නැහැ. නමුත් නීතිපති දෙපාර්තමේන්තුවට මොකද වෙන්නේ කියලා අපි දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නඩු හැම එකේදීම නීතිපතිවරයා හිටියේ මේ හොරුන්ට විරුද්ධව, මේ දූෂිතයන්ට විරුද්ධ පැත්තේ. අද නීතිපතිවරයා කාගේ පැත්තේද ඉන්නේ? අද නීතිපතිවරයා ඉන්නේ හොරුන්ගේ පැත්තේ. නීතිපතිවරයා කියන පුද්ගලයා ගැන නොවෙයි මම කියන්නේ. ඒ දෙපාර්තමේන්තුව ගැනයි මම කියන්නේ. ඒක තමයි දැන් කරමින් ඉන්නේ. රාජපක්ෂගේ හොරකම් රැක ගැනීමේ වුවමනාවට, රාජපක්ෂට තිබෙන බල තණ්හාවට සහ මෛත්‍රීපාල මහත්මයාගේ දෙවැනි වර ජනාධිපති වීමේ සිහිනය සැබෑ කර ගැනීමට තමයි, මේ රටේ සංචාරක කර්මාන්තයත්, මේ රටත් මෙහෙම විනාශ කරන්නේ. නැත්නම් මේකෙන් ලැබිච්ච ප්‍රතිඵලය මොකක්ද? මේ ඇති වූ විනාශකාරී තත්ත්වයට දැන් හරියටම මාසයක් ගත වෙලා තිබෙනවා. මේ තත්ත්වය තවත් දිග් ගැස්සෙමින් යන බව තමයි පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "අපි පාර්ලිමේන්තුවට එන්නේ නැහැ" කියලා රාජපක්ෂ කණ්ඩායම කරු ජයසූරිය මහතාට විශාල විවේචනයක් ගොඩ නහනවා. නමුත් ගරු කථානායකතුමා පාර්ලිමේන්තුවේ ගරුත්වයත්, පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමත් වෙනුවෙන් කරන ලද කාර්ය භාරය අපි ඉතාම ඉහළින් අගය කරනවා. මීට කලින් අනුර දිසානායක මන්ත්‍රීතුමාත් මේ කාරණය කිව්වා. ඒ තර්ජනවලට බිය විය යුතු නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒ ස්ථාවරයේ දිගටම හිටියා. ලෝක ඉතිහාසයේ පළමුවැනි වතාවට අද ආණ්ඩු පක්ෂයක් පාර්ලිමේන්තුවෙන් පලා ගිහිල්ලා තිබෙනවා. පාර්ලිමේන්තුවට එන්නේ නැතිව දැන් රට පාලනය කරන්නේ කොහේ ඉඳලාද? මැදමුලනේ ඉඳලාද? පාර්ලිමේන්තුවට එන්නේ නැතිව රට පාලනය කරන්නේ කොහේ ඉඳලාද? පාර්ලිමේන්තුව හදලා තිබෙන්නේ රට පාලනය කරන්නනේ. අනික, අපේ පාර්ලිමේන්තුව ගත්තොත් අපේ ඇමතිවරුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. ඒ නිසා අපේ විධායකය, ව්‍යවස්ථාදායකයටම සම්බන්ධ කරලා තිබෙනවා. එක්සත් ජනපදයේ වාගේ විධායකය සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුවට පිටින් පත් වන එකක් නොවෙයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කෙළින්ම තිබෙනවා, කැබිනට් මණ්ඩලය, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියලා. ඒ වග කියන්නේ මැදමුලනේ ඉඳලාද? ඇත්තටම එක් පැත්තකින් මේක ඉතාම විහිළු සහගත තත්ත්වයක් බව අපිට පෙනෙනවා. අනික් පැත්තෙන් මේක බේදවාචකයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිව කියන්නේ මේකයි. රාජපක්ෂ මහතාට විශ්වාස භංග යෝජනා ගෙනෙන්න එපා කියලානේ දැන් කියන්නේ. ඒ නිසා අපි රාජපක්ෂ මහතාට කියනවා, ඔබතුමාට විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් ගෙනෙන්න කියලා. කරුණාකරලා විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් ගෙනෙන්න කියලා අපි රාජපක්ෂ කල්ලියට අභියෝග කරනවා. අපි බහුතර කැමැත්තෙන් -ඔබතුමාට බහුරතය නැහැනේ- 135 වැනි ස්ථාවර නියෝගය අත්හිටුවලා දෙන්නම්. නමුත් අපි 121දෙනෙක් බහුතර කැමැත්ත දීලා -වසන්ත සේනානායක මන්ත්‍රීතුමා ගැන කියන්න අමාරුයි, එතුමා හෙට උදේ කොහේ ඉඳිවිද කියලා- 135 වැනි ස්ථාවර නියෝගය අත්හිටුවලා දෙන්නම්. රාජපක්ෂ මැතිතුමාට විශ්වාසය පළ කිරීමේ යෝජනාව අනිද්දාම විවාදයට ගන්න. විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් ගෙනෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය ගැන ලොකු දේවල් දන්නේ නැති ඕනෑම කෙනෙකු දන්නා දේ තමයි, රටක් පාලනය වන්නේ බහුතර ආණ්ඩුවකින් කියන එක. එහෙම බලයට පත් වන ආණ්ඩුව හොරකම් කරන එක, අපරාධ කරන එක රටේ මිනිසුන්ගේ ප්‍රශ්න. එක්සත් ජාතික පක්ෂය කරන ලද සෑම දේශපාලන, ආර්ථික අපරාධයක්ම ඒකට වග කියන්න ඕනෑ. පසු ගිය කාලයේ පැවතුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ නායකයෝත් මේවාට වග

[ගරු බිමල් රත්නායක මහතා]

කියන්න ඕනෑ. ඔවුන් ඒ වැරැද්ද කරන බව දැන දැනම ඡන්දය දුන්නේ ජනතාවයි. නමුත්, ජනතාව ඡන්දය දුන්නාට පස්සේ -අපි ඒ ජනවරම පිළිගත්තාට පස්සේ- ඒ ජනවරම මේ ආකාරයට ඉවත් කරන්න මෛත්‍රීපාල සිරිසේනට දීපු බලයක් නැහැ. ඒ නිසා කරුණාකරලා ඔබතුමන්ලාට විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් ගෙනෙන්න කියලා අපි පැහැදිලිවම කියනවා. අපි 135 වැනි ස්ථාවර නියෝගය අත්හිටුවලා දෙන්නම්; ඒක දිනා ගන්න. ඒක දිනා ගත්තොත් මෙතැන ප්‍රශ්නයක් නැහැ. දැන් ඒක කරන්න බැරි නිසා හොරෙන් හොරෙන්, තැන් තැන්වල තමන්ට තිබෙන කළු මාධ්‍ය බලය පාවිච්චි කරනවා. තනිකරම අද රාජපක්ෂ - මෛත්‍රීපාල හොර ආණ්ඩුව යන්නේ මොකක් මතින්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

කළු මාධ්‍ය බලය පාවිච්චි කිරීමෙන්. පසුගිය අවුරුදු 20-30 ඇතුළේ හැදිච්ච කළු මාධ්‍ය වළල්ලක් අද ලංකාවේ තිබෙනවා. ඒ කළු මාධ්‍ය වළල්ලේ මැදිහත්වීමෙන් තමයි අද මේ ආණ්ඩුව පවත්වා ගෙන යන්නේ. මම සරලව අහන දේ මේකයි. මම අහනවා, මේකට මිනිස්සු කැමැතිද කියලා. මම අහනවා මෙන්න මේ දේ. කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා රාජපක්ෂ මහතාගේ හිතෛෂියෙක්; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයෙක්. මේ රටේ පොදු ජනතාවගේ හෘදය සාක්ෂිය මේ කරන ලද කුමන්ත්‍රණය සම්බන්ධව ඉන්නේ කුමාර වෙල්ගම මහතාගේ හෘදය සාක්ෂියට වඩා පස්සෙන්ද, ඉස්සරහින්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? කුමාර වෙල්ගම මැතිතුමා මේක එක සැරයක් ප්‍රතික්ෂේප කරනවා නම්, මේ රටේ සාධාරණ, සාමාන්‍ය මිනිසුන් මේක දෙපාරක් ප්‍රතික්ෂේප කරනවා. පක්ෂගත මිනිසුන් අයින් කරන්න. UNP අය, JVP අය, TNA අය අයින් කරන්න. සාධාරණ, සාමාන්‍ය මිනිසුන් ඉන්නවා. ඒ අයගේ හෘදය සාක්ෂිය තිබෙන්නේ කොතැනද? කුමාර වෙල්ගම මහතාටත් වඩා ඉස්සරහින් තිබෙන්නේ ඒක. ඒක රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන පිළිගන්න ඕනෑ. ඒ නිසා අපි වග කීමෙන් කියන්නේ මෙයයි. මේ අනීතික පාලනය අධිකරණය පිළිගෙන නැහැ; පාර්ලිමේන්තුව පිළිගෙන නැහැ. අඩු ගණනේ මාලදිවයින වාගේ රටවල් පිළිගෙනත් නැහැ. ඒ විතරක් නොවෙයි, මේ රටේ බහුතර ජනතාව පිළිගෙනත් නැහැ. ඒ නිසා අපට ඉතාම පැහැදිලියි, එහෙම නම් කොහොමද මේ බලය අල්ලාගෙන යන්නේ කියන එක. කොහොමද, මේ අහවල් ඇමති, මේ ඇමති, අර ඇමති කියලා එන්නේ? කළු මාධ්‍ය වළල්ලේ බලපෑමෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආකාරයට රාජපක්ෂ මහතා බලයට පත් වීම නැවත දුෂණය බලයට පත්වීමක් කියලා කියන්න පුළුවන්, ඡන්දයෙන් ආවා නම්. නමුත් එතුමා ඡන්දයෙන් ආවා නම් එතුමාට ජනවරමක් තිබෙන බව එතුමා දන්නවා. එතුමාට එතකොට යම්කිසි විධියකට හිතේ බයක් නැතුව නිදාගන්න පුළුවන්, උසාවියත් සාක්කුවේ දමා ගත්තොත්. නමුත් නීති විරෝධීව මේ ආකාරයෙන් බලයට පත්වෙන රාජපක්ෂ අනිවාර්යයෙන්ම බයෙන් ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම පත්වෙන පාලකයෝ හැම කෙනාම දෙගුණයක් බයෙන් ඉන්නේ. ඒ නිසා අනිවාර්යයෙන්ම රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවට මොකක්ද වෙන්නේ? මේක දිගට ගියොත් මොකක්ද, වෙන්නේ? 2010 ඉඳලා 2015 දක්වා පැවැති, ඡන්දයෙන් දිනා ආපු එතුමාගේ ආණ්ඩුවට වඩා හීලෑ වෙච්ච මාධ්‍යයක්, හීලෑ වෙච්ච රාජ්‍ය නිලධාරි පද්ධතියක් සහ හීලෑ වෙච්ච විපක්ෂයක් එතුමාට අවශ්‍ය වෙනවා.

ඔබතුමාත් දන්නවා ඇති, රාජපක්ෂ මහතාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ හිටපු නිලධාරියෙකුට තමයි "සියත" මාධ්‍ය ජාලය අයිති වෙලා තිබුණේ කියලා. "සියත" මාධ්‍ය ජාලයට බෝම්බ ගැහුවා. සියත මාධ්‍ය ජාලය තිබෙන්නේ අරලියගහ මන්දිරය පිටුපස්සේ, අධි ආරක්ෂිත කලාපයේ. ඒකට බෝම්බ ගැහුවා. තවම වගඋත්තරකරුවෝ හෙළිදරව් වෙලා නැහැ. අපි දන්නවා, ඒක රාජපක්ෂලා කෙරෙව්වේ කියන එක. ඒ කියන්නේ "සියත" රාජපක්ෂගේ හිතවතෙක් වෙලා සිටියදී, ඒක චුට්ටක් වෙනස් වුණා කියලා බෝම්බ ගැහුවා. ඊළඟට, "සිරස" මාධ්‍ය ජාලය. 2005 හෝ 2010දී රාජපක්ෂ මහත්මයා බලයට පත් වුණාට පසුව, හැම පෝයටම "සිරස" මාධ්‍ය ජාලයෙන් රාජපක්ෂ මහත්මයා බණ කියෙව්වා. ඔය සාමාන්‍යයෙන් වැඩිපුර ආගම කරේ තබාගෙන ඉන්නා අය, - මම වග කීමෙන් කියනවා, වැඩිපුරම ආගම කරේ තබාගෙන ලොකු මිනිසුන් යැයි කියාගෙන ඉන්නා අය ගත්තොත්, ඔක්කෝම තක්කඩි. මොන ආගම ගත්තත්, ඔක්කෝම තක්කඩි. ඒ ගැන මට නමින් නමට කියන්න පුළුවන්, වේලාවක් තිබෙනවා නම්. "සිරස" මාධ්‍ය ජාලයෙන් බණ කියවපු රාජපක්ෂ, ඊට පසුව සිරස මාධ්‍ය ජාලයට කළේ මොකක්ද? සිරස මාධ්‍ය ජාලයට බෝම්බ ගැහුවා. අදත් අපිට සිරස ආයතනයට ගියාම, රාජපක්ෂලා ගහපු බෝම්බවල කොටස් සහ ඒවායෙන් විනාශ වුණු ඒවා දකින්න පුළුවන්. ඒවා සිරස ආයතනයේ ප්‍රදර්ශනය කරලා තිබෙනවා. තවම වගඋත්තරකරුවෝ හිරේ දමලා නැහැ. ඒ, රාජපක්ෂ මැතිතුමා ඡන්දයෙන් උඩින් දිනලා ඇවිල්ලා තමන්ට පොඩ්ඩක් අකීකරු වෙච්ච මාධ්‍යවලට සලකපු විධිය.

අපි මේ මාධ්‍ය හිමිකරුවන්ට දෙයක් කියන්න කැමැතියි. ඔවුන් විශාල මුදලක් ආයෝජනය කරලා තිබෙනවා වෙන්න පුළුවන්, මාධ්‍ය ආයතනවලට. හැබැයි, මේ නීතිවිරෝධී, මේ තක්කඩි පාලනය අද ඉල්ලා සිටින්නේ 2010-2015 කාලයටත් වඩා දෙතුන් ගුණයක් හීලෑ වෙච්ච මාධ්‍යයක්. වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා ළඟදී කියපු දෙයක් අපි දැක්කා. ඒ, මොකක්ද? එතුමා මුද්‍රිත මාධ්‍ය සම්බන්ධව කථා කළේ. ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය ගැන ප්‍රශ්නයක් නැහැ. ඒවා දැන් සාක්කුවේ. එතුමා කියනවා, මුද්‍රිත මාධ්‍ය චුට්ටක් තිබෙනවා ලු, මේකට විරුද්ධව ලියන. විරුද්ධව ලියන්න එපා ලු. ඒ කියන්නේ, හොරෙන් බලයට ආපු හැම පාලකයාම ඉන්නේ බයෙන් කියන එකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හිට්ලර් මැරුණේ බංකරයක් අස්සේ. ගඩාෆි මැරුණේ බෝක්කුවක් අස්සේ. ගඩාෆි මරපු විධිය ගැන අපේ එකඟතාවක් නැහැ. නමුත් හැම ඒකාධිපතියෙකුම බයෙන් ඉන්නේ. 1982දී ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා ඡන්දය මංකොල්ල කාලා, ජනමත විචාරණය මංකොල්ල කාලා, ඡන්දය කල් දමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාවගේ ප්‍රජා අයිතිය අහෝසි කරලා පටන් ගත්ත ඒ ගමන, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා plan කරපු ගමනක් කියලා අපි හිතන්නේ නැහැ.

එතුමා බලයේ ඉන්න ඕනෑ නිසා එක නීති විරෝධී දෙයක් කළා. ඊළඟට, ඒක තහවුරු කරන්න දෙවැනි එක කළා. ඊට පස්සේ තුන්වැනි එක කළා. ජෝන් අමරතුංග මැතිතුමා 1971 කාලවකවානුව ගැන කිව්වා, 1987 - 1989 කාලවකවානුව ගැනත් කිව්වා, ඒක හොඳයි. හැබැයි, එතුමා 1983 කාලවකවානුව ගැන කිව්වේ නැහැ. ඇයි ඒ? ඒ ගැන එතුමාට කියන්න බැහැ. මම හිතන්නේ නැහැ, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා born racist කෙනෙකුය කියලා. හැබැයි, එතුමා එක නීති විරෝධී වැඩක් කළාට පස්සේ ඒක sustain කරන්න, ඒකේ ඉන්න දෙක, තුන, හතර, පහ ඉබේම එනවා, අකමැති වුණත්. ඒ නිසා රාජපක්ෂලා, මෛත්‍රීපාලලා මේ පටන් ගත් ගමන ඉවර වෙන්නේ බොහොම නරක තැනකින් වෙන්න පුළුවන්. අපි සතුටු වෙනවා, දැනටත් මේ කුමන්ත්‍රණය පරාජයට පත් කර තිබීම ගැන. ඉතිරි ටිකත් පරාජයට පත් කරනවා. හොරෙන් බලයට ආපු රාජපක්ෂට අවශ්‍ය කරන තත්ත්වය ගත්තොත්, 2010 - 2015 තිබුණු තත්ත්වයට වඩා දරුණු වෙනවා. ඒ නිසා අපි එතුමාට ඉතාම පැහැදිලිව කියනවා, රටේ ආර්ථිකය විනාශ කරන්න එපා කියලා. රටේ ජන ජීවිතය විනාශ

කරන්න එපා; අපේ මාතෘ භූමියේ නම කැත කරන්න එපා; අපේ රටේ ප්‍රතිරූපය විනාශ කරන්න එපා කියලා අපි කියනවා. සංචාරකයින් තුළ වුණත් ලංකාව පිළිබඳව මේ වෙලාවේ ඇති වන negative අදහස අයින් කරන්න අපට තව අවුරුදු හතරක්, පහක්, දහයක් විතර ගතවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ලංකාව නිතර ලෝකෙට පෙනෙන රටක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පුංචි කාරණාව කියලා මගේ කථාව අවසන් කරන්නම්. මම හිතන විධියට ඔබතුමා මගේ කාලය අවසන් කියලා කියන්නයි සූදානම් වෙන්නේ. ඔබතුමාත් දන්නවා, පලස්තීනය කියලා රටක් තිබෙන බව. මමත් ඒ රටට එක වතාවක් ගිහිල්ලා තිබෙනවා. පලස්තීනය කිව්වාම අපේ රටේ මිනිසුන්ට මතක් වෙන්නේ මොකක්ද? අපේ රටේ ගොඩක් අයට මතක් වෙන්නේ යුද්ධය ගැනයි. හැබැයි පලස්තීනයේත් මල් පිපෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගැහැනු ළමයින්, පිරිමි ළමයින් ආදරය කරනවා; දරුවන් ඉස්කෝලේ යනවා; මිනිස්සු කර්මාන්ත කරනවා. අපි ඒ මොනවත් දන්නවාද? පලස්තීනයේත් ලස්සන තැන් තිබෙන බව අපි දන්නවාද? නැහැ. පලස්තීනය ලෝකයේ තිබෙන පුංචි රටක් කියලා අපි දන්නවා. අපි ඒ රට ගැන දන්නේ විදේශ මාධ්‍යවලින් පෙන්වන කුඩා ප්‍රමාණය විතරයි. ඒකම තමයි ලංකාවේ තත්ත්වයත්. ඇමෙරිකාව, එංගලන්තය දිහා බලාගෙන ඉන්නවා වාගේ ලංකාව දිහා ලෝකයේ මිනිස්සු හැම වෙලාවේම බලාගෙන ඉන්නේ නැහැ. පසුගිය මාසයක් තිස්සේ ලංකාව සම්බන්ධව ජාත්‍යන්තර මාධ්‍යවල ඉතාම විශේෂ තොරතුරු පළවුණා. වනචර, නුගත් මට්ටමේ රටක් කියලා අපේ රට සම්බන්ධව අන්තර්ජාතික මාධ්‍යවල පළ වෙලා තිබෙන ඒ විවේචන නැවත ඇදගන්න නම්, ඒ නරක අයින් කර ගන්න නම් ලෝකයේ තිබෙන සෑම ජන මාධ්‍යයකින්ම අවුරුද්දක් තිස්සේ ලංකාව ගැන හොඳ කියන්න වේවි. ඒ නිසා මේ වෙච්ච damage එක ඉතාම දරුණුයි. එය බලපාන්නේ සංචාරක කර්මාන්තයට පමණක් නොවෙයි. අනාගතයේ ලංකාවට ශිෂ්‍යත්ව ලබා ගන්න ගියත්, තනතුරක් ලබා ගන්න ගියත් ඒක බලපානවා. ළඟදී මට ලංකාවේ තානාපති නිලධාරියකු කිව්වා, පිට රටක තිබුණු ජාතික උත්සවයකදී එක විදේශ තානාපති නිලධාරියකු විහිළුවට කිව්වා කියලා, "ඔයා අපේ ළඟට එන්න එපා. ඔයාගේ සාක්කුවේ මිරිස් කුඩු තිබෙනවාද කියලා බලන්න ඕනෑ" කියලා. ඔහු කියනවා, එහෙම කියපු එම නිලධාරියාට වඩා දෙතුන් ගුණයක් අධ්‍යාපන සුදුසුකම්, diplomatic service එකේ සුසුදුකම් තිබෙන අයයි අපි යවා තිබෙන්නේ කියලා. නමුත්, ඒ අය මේ රටේ අපට කෝවොක් කරන තත්ත්වයට මෛත්‍රීපාල මේ රට පත් කරලා තිබෙනවා.

මා අවසාන වශයෙන් කියන්න කැමැතියි, මේ දුර්දාන්ත තත්ත්වය රටේ සංචාරක කර්මාන්තයට පමණක් නොවෙයි, අපේ රටේ මතු අනාගතයටම හොඳ නැහැ කියන එක. ඒ නිසා මේ තත්ත්වයෙන් රට වෙනස් කර ගන්න, මේ නීති විරෝධී ආණ්ඩුව පළවා හැරිය යුතුයි. පළවා හැර කෙටි කාලයකදී සාධාරණ තත්ත්වයක් ඇති කර, ඊට පසු මහ මැතිවරණයට ගිහිල්ලා මහ ජනතාව අතරට යා යුතුයි කියන එක නැවත සඳහන් කරනවා. මෛත්‍රීපාල සිරිසේන මහතාට අපි කියන දේ අහන්න බැරි නම් අඩු තරමින් ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්, ඩිව් ගුණසේකර මහතා කියන එකවත් අහන්න. ඩිව් ගුණසේකර මහතා "මව්බිම" පුවත් පතට කියා තිබෙන කාරණය පිළිබඳවත් සඳහන් කර මගේ කථාව අවසන් කරන්නම්. ඔහු කියා තිබෙනවා, "මේ අර්බුද දෙකට හේතුව ජනාධිපති ගත් තීරණ තුන" කියලා. අඩු ගණනේ අපි කියන එක අහන්න බැරි නම්, තමන් එක්ක සිටින ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්වරයා කියන එක හෝ අහලා මේ පිස්සුව නතර කරන්න කියලා අපි මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා එය නතර නොකළත් අපි නියත වශයෙන්ම එතුමාගේ මේ දේශපාලන කුමන්ත්‍රණය පරාජය කරනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තූතියි. මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 4.27]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොර ආණ්ඩුවේ අයට අද ශාපය වැදිලයි තිබෙන්නේ. ඇයි, මම එහෙම කියන්නේ? අපි හැම ආගමකටම ගරු කරනවා. අපේ රටේ තිබෙනවා, උතුම් ආගම් කිහිපයක්. බෞද්ධාගම, හින්දු ආගම, කතෝලික ආගම හා ඉස්ලාම් ආගම.

කථානායකතුමාගේ පුටුව ළඟ ඉඳලා ලෝකයේ කතෝලික බැතිමතුන්ගේ උත්තම පූජනීය බයිබලයෙන්; ආගමික වශයෙන් උතුම් පොතෙන් හිටපු මුදල් ඇමති -හිටපු නොවෙයි, ඉන්නවා කියලා අපි කියන- මංගල සමරවීර මහත්මයාට ගැහුවා. මා සිටියේ මෙතැනයි. මට වැදුණේ ලෝකයේ මුස්ලිම් බැතිමතුන් බොහොම ගෞරවයෙන් වන්දනාමාන කරන කුරානයෙන්. ඒ පොත මගේ බඩටයි වැදුණේ. මට වැදුණාට කමක් නැහැ, මට රිදුණේ නැහැය කියා ඒ වෙලාවේ මා කිව්වා. ඒකේ ශාපය නිසා දැන් ඒ අයට පිස්සු හැදීගෙන එනවා. පව් කරන්නාට පිස්සු හැදෙනවාය කියා කියනවා නේ. ඒ වාගේ, පිස්සුව හැදිලා දැන් ශාපකාරී තත්ත්වයකට පත්වෙගෙන එනවා. ශාපකාරී තත්ත්වයට පත්වෙලා එන්නේ ඇයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ශාපකාරී කියන්නේ මේකයි. මා අද ඔබතුමාට කියනවා, ඉදිරි මාස කිහිපය තුළ මේ පාර්ලිමේන්තුවේ ඒ අය වාඩිවන පුටු රත්වෙනවාය කියා. ඒ අයට ඉන්න බැහැ. ඒ රත්වීම තුළ දේව ශාපයෙන් ඒ අයට ඉදිරි කාලයේදී හැදෙන පිස්සුව නිසාත්, පාර්ලිමේන්තුවේ බහුතරයක් නැතිකම නිසාත් අය වැයක් අනුමත කර ගන්න බැරිවෙනවා. මේ රටේ ජනතාවට මම මෙන්න මේ කාරණය කියනවා. ඉදිරි මාස දෙක යද්දී අපේ ජනාධිපතිතුමා බුද්ධිමත්ව තීරණයක් ගත්තේ නැත්නම්, මේ හොර ආණ්ඩුව, හොරකම් කරලා පුරුදු අය, බලය ගන්න බැරි නිසා කූඩැල්ලෝ වාගේ ඉන්න හදනවා නම්, අය වැයක් අනුමත කරන්න බැරි වන එක සුළු දෙයක් කියලා හිතන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශිකයෝ මේ රටේ තැන්පත් කළ ස්ථාවර මුදල් ඔක්කොම ගෙන යනවා. මා ඉන්නේ කටුගම්පොලයි. එතැන ඉඳලා කෙළින් බැලුවාම Airport එක පෙනෙනවා. ඉස්සර රෑට අහස් යානා 15ක්, 20ක් විතර යනවා ඇහෙනවා. ඔබතුමන්ලා විශ්වාස කරන්න, දැන් ඇහෙන්නේ එක plane එකක් යන හඬ විතරයි. සංචාරකයන්ගේ පැමිණීමේ අඩුවීම කොහොමද කියා බලන්න. එවැනි රටක අපේ අය වැයක් අනුමත කරන්න බැරි වුණොත්, මොකක්ද වෙන්නේ? මෙතැනදී වෙන්නේ, අපේ රජයේ සේවකයන්ට පඩි නඩි ගෙවන්න විතරක් නොවෙයි, ඉදිරියේදී බඩු මුට්ටු ගෙනෙන්නත් සල්ලි නැතිවන එකයි කියන එක මතක තබා ගන්න. විදේශ වත්කම් බහිනවා. දැන් මට මතක් වෙන්නේ මොකක්ද? මා භය නැතුව අද ප්‍රකාශ කරනවා, 1970 - 1977 යුගය වැනි යුගයක් එන බව. ඒ යුගය මොකක්ද? එතකොට සංචාරකයෝ මේ රටට එන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ කෙසෙල් බඩ කෑවා ඔබතුමාට මතක ඇති. ඔබතුමාගේ පියා දේශපාලනය කරන කාලයේ, ඔබතුමා තරුණ කාලයේ මිනිසුන් කෙසෙල් බඩ කෑවා මතක ඇති. වන්නියේ විතරක් නොවෙයි, මොනරාගල විතරක් නොවෙයි, කොහෙත් කෙසෙල් බඩ කෑවා. හාල් සේරු දෙකක් පාරේ ගෙන යන එක තහනම් කළ ආකාරය ඔබතුමාට මතක ඇති. ඒ, ඔබතුමා

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

පාසල් යන කාලයේ. එදා මිරිස් පොලු තිබුණා, හාල් පොලු තිබුණා. නමුත් ඒ කාලයේ ජනතාවට ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඇයි? ගෙවල්වලට විදුලිය තිබුණේ නැහැ. මා හිතන හැටියට ඒ කාලයේ ආසනයකට මෝටර් සයිකල් 4ක්, 5ක් තිබෙන්න ඇති. ඒ කාලයේ උළු සෙවිලි කළ ගෙවල් තිබුණේ නැහැ. පොල් අතු සෙවිලි කළ මැටි ගෙවල් තමයි තිබුණේ. ඒ යුගයේ ඒ ජනතාව, ඒ පරපුර කෙසෙල් බඩ හෝ වෙන මොනවා හෝ යන්තම් කාලා ජීවත් වෙන්න පුරුදු වෙලා සිටියා. නමුත් ඒ යුගය අපි 1977දී වෙනස් කළා නේ. නිදහස් ආර්ථිකය නිසා මේ රට ලෝකයට ගෙන යෑම තුළින් අපි ඒ යුගය වෙනස් කළා. අද හැම ගෙදරකම මෝටර් සයිකල් තිබෙනවා. එක පවුලකට මෝටර් සයිකල් කීයක් තිබෙනවාද? එක පවුලකට මෝටර් සයිකල් දෙකක්, තුනක් තිබෙනවා; "Landmaster" එකක් තිබෙනවා; ට්‍රැක්ටරයක් තිබෙනවා. දැන් ගෙවල්වලට විදුලිය තිබෙනවා; TV තිබෙනවා. දැන් ජැන්ඩියට ඇඳලා යනවා. ළමයින්ට හොඳ අධ්‍යාපනයක් දෙනවා. මේ යුග දෙකක් කියන එක මතක තබා ගන්න. අද මේ රජයට මේ ශාපය කරන්නේ අපි නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ඉන්නේ දෙවියන්ගේ රටේ; කතරගම දෙවියන්ගේ අඩවියේයි.

මේ රටේ පවතින උතුම් බුද්ධ ධර්මය අවුරුදු 5,000ක් ආරක්ෂා කරන්නේ මනුෂ්‍යයෝ නොවෙයි. උඩ ඉන්න, නොපෙනෙන දෙවියෝ තමයි එය ආරක්ෂා කරන්නේ. නක්ෂත්‍රකරුවන් කියන දේවල් නොවෙයි මම මේ කියන්නේ. මේ ගත වෙන්නේ පවිකාරයෝ විනාශ වෙන යුගයක්. මම මේ කියන දෙය වැරැදි කරන පැවිදි අයටත් අදාළ වෙන්න පුළුවන්. දේශපාලකයෝ විනාශ වෙනවා; පුරවැසියෝ විනාශ වෙනවා. දේශගුණයෙන්, ස්වභාව ධර්මයෙන් පිස්සු හදවනවා. භයංකාර දේවල් සිදු වෙනවා. අග භිහකම් ඇති වෙනවා; මීනී මැරුම් සිදු වෙනවා; මංකොල්ල කෑම් සිදු වෙනවා. ඇයි? දැන් 1970-1977 කාලය වාගේ නොවෙයි නේ. මම අද කරන මේ කථාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනවා නේ. අද මම කියන දේ වරදින්නේ නැහැ. මේ දේවල් සිදු වෙලා ඔක්කොම ශුද්ධ වෙනවා. 1970-1977 යුගය නැති කරලා, 1977දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ආවා වාගේ යුගයකට අපි නැවත එනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සිදු වෙමින් පවතින්නේ ඒකට ආරම්භයක් තමයි. මේ කියන පවිකාරයෝ ඔක්කොම විනාශ වෙනවා. මම පාර්ලිමේන්තුවේදී දිගටම මේ ගැන කිව්වා; කැබිනට් මණ්ඩලයේදී කිව්වා. අපේ පක්ෂයේ වෙන්න පුළුවන්; මෛත්‍රී කල්ලියේ වෙන්න පුළුවන්; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්; ජේවීපී එකේ වෙන්න පුළුවන්; "ථිඑන්ඒ" එකේ වෙන්න පුළුවන්; පොහොට්ටුවේ වෙන්න පුළුවන්; මේ ඔක්කොම ශුද්ධ වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව කියන්නේ උත්තරීතර, උතුම් පුණ්‍ය භූමියක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊළඟ මැතිවරණයේදී මේ භූමිය ශුද්ධ පුණ්‍ය භූමියක් වෙනවා. බලන්න, ඒක වෙනවා. මම දේශපාලනයෙන් අයින් වෙන්නේ එදාටයි. මම දැන් ඒක පාර්ලිමේන්තුවේ කියනවා. මෙච්චර කල් මම ඒක කිව්වේ නැහැ.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරන්න අපේ පාක්ෂිකයෝ; අපේ ජනතාව -දෙමළ, මුස්ලිම්, සිංහල ජනතාව- ලක්ෂ 62ක ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නා. වංචා, දූෂණ නැති කරන්න කියලා තමයි ඔවුන් ඒ ඡන්දය දුන්නේ. රාජපක්ෂ යුගය නැති කෙරුවේ එහෙමයි. ඡන්දය වෙලාවේ අපි කිව්වේ, "දූෂණ, වංචා නැති කරලා ලංකාව ලෝකයේ උතුම් රටක් කරනවා" කියායි. උතුම් කියන රටේ වංචා අල්ලන්න කියලා අපි අලුත් පාලනයක් ගෙනාවා. අපේ පැත්තේ වුණත් වැරැදි කරපු අය ඉන්නවා නම් ඒ අය හරිය කියා මම කියන්නේ නැහැ. මහ බැංකුවේ හෝ වෙනත් ඕනෑම තැනක වැරැදි කළ අය ඔක්කොම නීතිය ඉදිරියට ගෙනෙන්න ඕනෑ. භය නැතිව මම ඒක කියනවා. වැරැදි තිබෙනවා නම් ඒවා අධිකරණයෙන් ඔප්පු කරන්න ඕනෑ. එහෙම නැතිව, පුවත් පත් හරහා මඩ ගැහීම නොවෙයි කළ යුත්තේ. මේ දේවල් අධිකරණයෙන් ඔප්පු කරන තෙක් අපි අවුරුදු දෙකහමාරක් බලා හිටියා.

සරත් අමුණුගම හිටපු ඇමතිතුමා අපේ ආණ්ඩුවේ සිටියදී පෙත්සමකට අපෙන් අත්සන් ගත්තා. ඒ මොකටද? ජනාධිපතිතුමාට දෙන්නයි. මමත් ඒකට අත්සන් කළා, දුෂිතයෝ, ඒ රජයේ සිටි චංචාකාරයෝ ඔක්කොම ගැන පරීක්ෂණ කරන විශේෂ අධිකරණයක් කෙළින්ම ඇති කරන්න. ඒ ගැන අප නීතිපතිතුමාගෙන් විමසුවා. "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ විශේෂ අධිකරණයක් දමන්න බැහැ, කළ හැකි එකම දෙය වර්තමාන අධිකරණ තුළ දෛනිකව නඩු අහන විනිශ්චය මණ්ඩල පත් කර ඒ කටයුතු කිරීමයි" කියා එතුමා කිව්වා. මේ කාරණය දිගටම ගිහින් අවසානයේ කැබිනට් මණ්ඩලයට ආවා. මේ සිද්ධිය ඔබතුමාටත් මතක ඇති, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කැබිනට් රැස්වීමේදී එවකට අධිකරණ ඇමති වශයෙන් කටයුතු කළ විජයදාස රාජපක්ෂ මැතිතුමාගෙන් නැවත මේ ගැන විමසුවා. එතැනදී විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වේ මොකක්ද? මේවා ගැන රට දැන ගන්න ඕනෑ. "ජනාධිපතිතුමනි, මට AG's Department එකේ සිවිල් නඩු 18,500ක් තිබෙනවා, සිවිල් නඩු 18,500ක් තිබියදී, වෙනම අධිකරණ ඇති කරලා මේ නඩු අහන්න කියලාද මට කියන්නේ?" කියා එතුමා ඇහුවා. ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයේ සිටි සියලුදෙනා එදා නිශ්ශබ්ද වුණා. ඊළඟ සතියේ මේ ගැන කථා කරනවා කියලා මම තීරණය කළා. විජයදාස රාජපක්ෂ මැතිතුමා මගේ මිත්‍රයා. නමුත් ඒ මිත්‍රත්වයයි, දේශපාලනයයි දෙකක්. මම කවදාවත් ඒ දෙක එකට ගාවා ගන්නේ නැහැ. මට මගේ පුතාත් එකයි, අනික් අයත් එකයි. නීතිය, නීතිය විධියට තිබෙන්න ඕනෑ. අපි සාමාන්‍යයෙන් කැබිනට් මණ්ඩලයේ රැස්වීම අවසන් වෙලා තමයි න්‍යාය පත්‍රයේ තිබෙන අනෙක් ප්‍රශ්න ගැන කථා කරන්නේ. ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩල රැස්වීම අවසන් වෙලා නැඟිටින්න හදද්දී මම එතුමාට කිව්වා, පොඩ්ඩක් ආපහු වාඩි වෙන්නය කියා. එතුමා කවදාවත් මට බාධා කරන්නේ නැහැ. මට කියන්න තිබෙන දේ මම කෙළින්ම කියනවා. "ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට මේ රටේ ලක්ෂ 62ක ජනතාවක් ඡන්ද ලබාදුන්නේ යහ පාලනය අනුව කටයුතු කරාවි කියලායි, අද වන විට අවුරුදු තුනකට කිට්ටු වෙලා තිබෙනවා, එදා සරත් අමුණුගම මැතිතුමා ඉදිරිපත් කළ පෙත්සමකට අපි අත්සන් කළා, නමුත්, 'එය කරන්න බැහැ, විශේෂ අධිකරණ පත් කරන්න බැහැ, අධිකරණවල දෛනිකව නඩු අහන විනිශ්චය මණ්ඩලවලටම ඒක කරන්න පුළුවන්' කියා නීතිපතිතුමා කියා තිබෙනවා, 'සිවිල් නඩු 18,500ක් තිබේද්දී නීතිපති දෙපාර්තමේන්තුවේ පොඩි නඩු අහන්නද කියන්නේ, මට ඒක කරන්න බැහැ' කියා විජයදාස රාජපක්ෂ මැතිතුමා කියනවා, ඔබතුමාටත් කැබිනට් මණ්ඩලයේදී මේ ගැන කථා කරන්න බැරි නම් මම කැබිනට් මණ්ඩලයෙන් අයින් වෙනවා" කියා ඒ වෙලාවේ මම ජනාධිපතිතුමාට කිව්වා.

මම එහෙම කිව්වාම ඔක්කොම තුෂ්ණීම්භූතව නිශ්ශබ්දව අහගෙන හිටියා. ජනාධිපතිතුමාගේ මුහුණ මම දැක්කා. ටිකක් වෙලා බිම බලාගෙන ඉඳලා කිව්වා, "හරි, මට තේරුණා. මම තීරණය කළා. දැන් හරි." කියා. එහෙම කියා නැඟිට්ටා. අන්න එදා සවස අරලියගහ මැදුරේ පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමේදී විජයදාස රාජපක්ෂ මැතිතුමා පෙත්සමක් අත්සන් කළා, හම්බන්තොට පවරා ගැනීම - සමාගමට දීම අනුමත කරලා. එතුමා පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළා, ඒක කවදා හෝ ආපසු පවරා ගන්නවාය කියා. අන්න එතැනදී දෙකම එකට ආවා. ආරංචි වුණා, අධිකරණයත් ප්‍රකාශ කළා. එතැන අත්සන් කරද්දී අගමැතිතුමා කිව්වා," නැහැ, මට සතියක් දෙන්න. මේවා රට දැන

ගන්න ඕනෑ. මම විජයදාස මැතිතුමාත් සමග කථා කරලා තීරණයක් දෙනවා." කියා. එතුමා ආවේ නැහැ. එතැනදී ජනාධිපති නිල නිවසේදී තලතා මැතිනිය අධිකරණ ඇමතිතුමිය විධියට දිවුරුම් දීලා අත්සන් කළා. මම බුද්ධ ශාසන අමාත්‍ය හා වන ජීවී. එතකොට අවුරුදු තුනහමාරක් ගිහිල්ලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ නම් මම මෙතැනදී කියන්නේ, පාර්ලිමේන්තුව පිරිසිදු ස්ථානයක් කරන්න අපි කැප වෙන්නට ඕනෑ කියා. ඔබතුමා අවංක කෙනෙක්. මම දන්නවා. හොඳ බුද්ධිමත් පියෙකුගේ පුතෙක්. ඒ අවංකත්වයත් දන්නවා. ඡන්ද දායක දායිකාවෝත් වරදක් කරනවා.

එදා නින්දිත විධියට, ඇසිඩ් ගෙනල්ලා ගහන්නයි හිටියේ. සමහර වෙලාවට මහලේකම්තුමන්ලාට, ඔබතුමාටත් ඒවා වදින්නට තිබුණා, අපේ මන්ත්‍රීතුමන්ලා ඇවිස්සිලා ගියා නම්. එහෙම ඇවිස්සිලා ගියේ නැහැ. මතක තියා ගන්න, ඇසිඩ් ගෙනල්ලා තියෙනවා. අවුරුදු 72ක ඉතිහාසයේ මෙවැනි දේවල් වෙනකොට මේ රටට සංචාරකයෝ එයිද? ලෝකය ගත්තාම උත්තරීතර ථෙරවාදී බුදු දහම තිබෙන රටක් ලංකාව. මම දිවුරුම් දුන් වෙලාවේ ජනාධිපතිතුමා, අගමැතිතුමා ඉන්න තැන කිව්වේ මොකක්ද? ථෙරවාදී බුදු දහම ලෝකයට පතුරුවන්නට ඕනෑය කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙය කියන්නේ නිකම් නොවෙයි. එන වර්ෂයේ - ගෞතම බුදුරජාණන් වහන්සේ කැලණි විහාරයට වැඩලා අවුරුදු 2600ක් වෙන්නේ හරියට වෙසක් දවසේයි. මා බුද්ධශාසන ඇමති විධියට කැලණියේ නායක හාමුදුරුවෝ මට කිව්වා, කැලණියේ විතරක් නොවෙයි, ශ්‍රී පාදස්ථානයේ, මහියංගනයේ, නාගදීපයේ උත්සව පවත්වන්නට ඕනෑය කියා. මම කිව්වා, "හාමුදුරුවනේ, සමාවෙන්න. උත්සව නොවෙයි, අපි හැම නිකායකින්ම 2600 දෙනෙකු පැවිදි කරවමුය." කියා. ලෝක බෞද්ධ බැංකුවක් ඇති කරන්නය කියා ගිය අවුරුද්දේ ලංකාවේ පැවැති සමුළුවේදී කිව්වා. විජයදාස රාජපක්ෂ මැතිතුමාට ඒක කරන්න බැරිවුණා. මම ඒ ගැන සාකච්ඡා කරලා පැරිසියේ ඉන්න නායක ස්වාමීන් වහන්සේලාගේත් සහයෝගය ලබා ගත්තා. ලොස් ඇන්ජලීස් නායක හාමුදුරුවෝත් එක්ක මෙහෙන් බැංකුවල බුද්ධි මණ්ඩලයක් එක්ක, බැංකුවල විශාරදයෝ එක්ක ලෝකයේ රටවල් ඔක්කොම එකතු වෙලා ලෝක බෞද්ධ බැංකුවක් ඇති කරන්න කටයුතු කර ගෙන ආවා. භික්ෂූන් වහන්සේලාට රක්ෂණ ක්‍රමයක් ගෙනාවා. මේ ඔක්කොම ඇණ හිටියා. ලංකාවේ අපි ලෝකයට දෙන්නට තිබෙන්නේ ලස්සන පරාදීසයක්. අපට දෙන්නට තිබෙන්නේ බුද්ධ ධර්මය. බටහිර රටවල් හැම එකක්ම වාගේ දහම් පිපාසයෙන් ඉන්නවා. එසේ නම් අපි කොහොමද මේ විධියට වැඩ කරන්නේ? මේ රටේ අහිංසක ජනතාව අපිව පත් කරලා මෙතැනට එවලා තිබෙන්නේ. මුල අමතක වෙලා. තරුණ මන්ත්‍රීවරයෙක් මට පෙරේදා පළමුදා බැංකුවේදී හමුවුණාය කියමු කෝ. මම නම කියන්නේ නැහැ. මම ගියේ overdraft එකෙන් මට ලක්ෂ දෙකක් ගන්න. මම මෙච්චර ජ්‍යෙෂ්ඨයෙක්. අපේ අක්කර පන්සිය පණහක් හයසියයක් ආණ්ඩුවට දුන්නා 1971 land ceiling නීති යටතේ. එතැනට ගිය වෙලාවේ තරුණ මන්ත්‍රීවරයෙක් ආවා. අනේ මම දන්නේ නැහැ, එතුමා අපට පිරිතුත් කියා වැඩ කරපු කෙනා. එතැන ඇතුළේදී මම කිව්වා, "මල්ලියේ අර මැෂින් එකේ ගණන් කරපු ඒවායින්-සල්ලි නෝට්ටුවලින් ටිකක් දෙන්න බැරිද" කියා. හිනා වෙනවා.

අහිංසක ජනතාවක් ජීවත් වන මේ ලංකාව තරම් වාසනාවන්ත, පින්වත් රටක් ලෝකයේ වෙන නැහැ. ජනතාව බඩගින්නේ මැරෙන්නේ නැහැ. පොල් ගෙඩියක් තිබෙනවා නම්, මොනවා හරි හදාගෙන කාලා ජීවත් වෙන්න පුළුවන් රටක්, මේ රට. අපි ඉස්සෙල්ලා මෙතැන හදමු. මම කථා කරන්නේ, මේ රටේ ජනතාවට. මම විශ්‍රාම යන්න ඉස්සෙල්ලා පතන දෙයක් තමයි, මේ ස්ථානය පුණ්‍ය භූමියක් කරන්න ඕනෑ. ඒක කරන්න බැරි නම් මේ රටේ ලස්සන ගොඩනැඟිලි තිබුණත්, මේ රට මොන තරම් සංවර්ධනය වුණත්, මේ රටට සංචාරකයෝ මොන තරම් ආවත් අපට වැඩක් නැහැ. එහෙම නේද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? පරිසරය විනාශ වෙනවා. පරිසරය විනාශයි. අන්න දැන් ඇමෙරිකාව කියනවා, භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව. ස්වභාව ධර්මයෙන් එන විපත්තිවලට ඇමෙරිකාවට බිලියන ට්‍රිලියන ගණන් ගිහිල්ලා. දැන් රජය කල්පනා කරනවා, ඉදිරියේදී ආදායමට වඩා විපත්වලට වියදම් කරන්න සිදු වන බව. ධන කුවේරයෝ, ධනපතියෝ, කෝටිපතියෝ ඉන්න ලෝකයේ පාරාදීසයේ නගරය වූ ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් ගන්න. නගරය ඉවරයි. ගිනි අරගෙන කාන්තාරයක් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා අද මේ ලංකාවේ තිබෙන ශාපයත් එක්ක වැඩිකල් යන්න ඉස්සෙල්ලා අපේ ජනතාව අර මම කියපු තණ කොළ කන යුගයට එනවා.

ඊළඟට, මම කියන්න ඕනෑ CITES සමුළුව ගැන. CITES සමුළුව කියන්නේ මොකක්ද? මම තිරසර සංවර්ධන හා වනජීවී ඇමති විධියට කටයුතු කරද්දී 2012 මැයි මාසයේ Customs එකෙන් ඇල්ලුවා රුපියල් මිලියන 360ක් පමණ වටිනා අප්‍රිකාවේ මරපු රතු ලේ තැවරුණු ඇත් දළ - blood ivory - තොගයක්. මේ CITES සම්මුතිය කියන්නේ මොකක්ද කියලා අපි මතක තබා ගන්න ඕනෑ. ජීනීවා නුවර තිබෙනවා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම. අද කවුරුත් දන්නවා එතැන මිනිස් අයිතිවාසිකම් ගැන තර්ක කරන තැනක් බව. ඒ වාගේම, ස්වභාව ධර්මය හා පරිසරය විනාශ කරන එකට විරුද්ධව ක්‍රියා කර, තිරසර සමාජයක් හා ලෝකයක් සෑදීමේ අරමුණින් සාදගත් සම්මුතියක් තිබෙනවා, CITES කියලා. මේ CITES සමුළුව ලෝකයේ ප්‍රබල වෙලා ඉන්නවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 192න් 183ක්ම අද මේ CITES සමුළුවේ සාමාජිකයෝ වෙලා ඉන්නවා. CITES සම්මුතිය කියන්නේ මොකක්ද? නීති විරෝධී වෙළෙඳාම් කරන, වද වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇති සත්ව සහ වෘක්ෂ ලතා සම්බන්ධයෙන් ක්‍රියා කරන අන්තර්ජාතික සංවිධානයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඇත් දළ ටික විනාශ කරන්න මට කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය දුන්නා. අනුමැතිය දීලා, එදිනට ජනාධිපතිතුමාත් එනවා කිව්වා. එදා Galle Face එකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමාත් ආවා. ඒ වාගේම නානාපතිවරු ඔක්කෝම ආවා. BBC එක ඇතුළු ජාත්‍යන්තර මාධ්‍ය ජාලයම එතැනට ඇවිල්ලා හිටියා. ඒ ඇයි? කවදාවත් නොවුණු දෙයක් බලන්න; අප්‍රිකාවේදී පණ පිටින් මරා ගත් ඇතුන්ගේ දළ මේ කුඩා දූපතේදී විනාශ කරලා, කුඩු කරලා මුහුදට දමනවා බලන්න. ඒ කටයුත්තට දින යොදා තිබියදී, ඊට දවස් දෙකකට පෙර පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී එස්.බී. දිසානායක ඇමතිවරයාගෙන් සහ කැබිනට් මණ්ඩලයෙන් මට බලපෑමක් ආවා, "මේ ඇත් දළ ටික විනාශ කරන්නේ නැතුව පන්සලට දෙන්න." කියලා. මම නැඟිටලා ඇහුවා, පණ පිටින් දහලනකොට කියත්වලින් - power sawsවලින්- අමු අමුවේ දළ කපද්දී මැරිච්ච ඒ ඇතුන්ගේ ඇත් දළ, බුද්ධ ධර්මයට අනුව පන්සලක තියන්න පුළුවන්ද කියලා. එම උත්සවයට ජනාධිපතිතුමාගේ ඒමත් වැළැක්කුවා. අගමැතිතුමාත් ඒ උත්සවයට ආවේ නැහැ. නානාපතිවරු ඔක්කෝම ආවා. උත්සවයෙන් පසුවදාට, පසුවදා එස්.බී. දිසානායක මැතිතුමා කථා කරලා මට කියනවා, "ජයේ ඔයා කරපු වැඩෙන් BBC එක ඇතුළු ලෝක මාධ්‍ය හරහා ලංකාවට පුදුම ගෞරවයක් ඇති වෙලා තිබෙනවා" කියලා. අපට GSP Plus සහනය පවා ලැබුණේ ඒවා නිසායි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

CITES සමුළුව අවුරුදු තුනකට වතාවක් තිබෙන්නේ. එහි 17වැනි සමුළුව තිබුණේ, දකුණු අප්‍රිකාවේ ජොහැන්ස්බර්ග් නගරයේ. මම කැබිනට් මණ්ඩලයට යෝජනා කළා, ඊළඟ සමුළුව ලංකාවේ තියන්න. ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේදී මගෙන් ඇහුවා, "ඔබතුමා මොකක්ද අපෙන් ඉල්ලන්නේ?" කියලා. මම කිව්වා, මේකට අනුමැතිය දෙන්න, රටවල් 183න් ඒකච්ඡන්දයෙන් ලංකාවට මෙම අවස්ථාව ගෙනෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මම තව විනාඩි කීපයක් ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට අතිරේකව විනාඩි පහක් දීලා තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එතැන චීනය, රුසියාව, ඇමෙරිකාව ඇතුළු සාමාජික රටවල් 183ක් හිටියා. ඒකච්ඡන්දයෙන් එම අවස්ථාව අපට ලැබුණා. එදා ලංකාව වෙනුවෙන් ඡන්දයට ගියේ මම. අපේ තානාපතිතුමා සිටියා. එන අවුරුද්දේ වෙසක් ඉවර වෙලා, මැයි 22 ඉඳලා ජූනි 03 දක්වා සති දෙකක් සාමාජික රටල් 183ක විදේශ නායකයෝ, නායිකාවෝ 4,000ක් ලංකාවට එන ලොකුම උළෙල තිබෙනවා. දැන් එය කඩාකප්පල් වන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා.

ඒ උළෙල ලංකාවේ පවත්වයිද කියලා මට සැකයි. අපි ලබන අවුරුද්දේ පැවැත්වෙන වෙසක් උත්සවයට චීනයේ දළදා වහන්සේ ලංකාවට වැඩමවන්න සැලසුම් කළා. බුදුරජාණන් වහන්සේ වැඩම කළ පුණ්‍ය භූමියක් වූ කැලණියේ ඒ උත්සවය පවත්වන්නයි සැලසුම් කළේ. නමුත් කනගාටුයි, අද ලංකාව පත්වෙලා තිබෙන තත්ත්වය ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යනවාද, අද ස්ථාවරභාවයක් නැති මේ ආණ්ඩුව, රට ලජ්ජා වෙන විධියට මෙම කටයුතු කරයිද?

2016 වර්ෂයේදී ජනාධිපතිතුමාත්, මමත් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සමුළුවට ගියා. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සමුළුවේ නිලධාරීන් සමඟ මම කෑම ගනිද්දී ඔවුන් මෙහෙම කිව්වා:

> "Do you know, your President is a marvelous man?". I asked, "why?" They said, "When your President visited the United Nations Organization, President Obama and the Presidents of other leading countries surrounded him. When the former President came to the United Nations, no one cared for him". I asked the reason. They said, "That shows how the two leading parties are working together".

මම මගේ ප්‍රතිපත්තියක් වශයෙන් ඒ කාලයේ ඉඳලාම ජනාධිපතිතුමාට බොහොම ගරු කරනවා. ඔබතුමාගේ නම, ඒ ගෞරවය නැති කර ගන්න එපා. මහජනතාවගේ ශාපකාරයෙක් වෙන්න එපා. තවමත් ප්‍රමාද නැහැ. මම මේ ආයාචනයක් කරන්නේ. ඔබතුමා බුද්ධිමත් වෙන්න. ඔබතුමා මේ හොර ආණ්ඩුව, මේ හොර පාලකයන් ආරක්ෂා කරන්න යනවා නම් ඔබතුමාට මුළු ලංකාවේම ශාපය එනවා. මම කිව්වා කියලා අද ලියලා තියා ගන්න.

මේ රටට නිදහස ලැබුවාට පසුව මේ රටේ බිහි වුණු ආශීර්වාදයක් වූ පක්ෂ දෙකක් තිබෙනවා. -මම මේ කථා කරන්නේ දේශපාලනය නොවෙයි.- ඉන් එකක් එක්සත් ජාතික පක්ෂය, අනෙක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. මේ පක්ෂ දෙක ප්‍රජාතන්ත්‍රවාදී ශක්තිමත් ප්‍රතිමූර්ති දෙකක් ලෙස තිබෙන්න ඕනෑ. 1990 ගණන්වල මුල් කාලයේ දී එක්සත් ජාතික පක්ෂයත් දෙකඩ කරමින් තවත් බලවේගයක් ඇති වුණා, රාජාලියාගේ සලකුණෙන්. මොකද වුණේ? ශාපයක් වාගේ ඒ අය සියල්ලෝම නැති වුණා.

ජනාධිපතිතුමනි, මම ඔබතුමාට බොහොම ආදරයෙනුයි මේ කියන්නේ. මම ජනාධිපතිතුමාටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්ටත්, ගමේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ටත් තමයි මේ කථා කරන්නේ. අද මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිය කරලා වඳ කරන්න යන විධියේ වැඩ පිළිවෙළක් කරන්නයි යන්නේ, මොකක්ද මේ පොහොට්ටුවක් කියන එකක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා ලියලා තියා ගන්න; ඒවා හැන්සාඩ්ගතත් වෙනවා.

ඒ ශාපය, එදා අපේ පක්ෂය විනාශ කරන්න ගිය අයට සිදු වුණා වාගේ සිදුවෙයි. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයිනි, ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඔබ ඔබේ පක්ෂය ආරක්ෂා කර ගන්න. මේ අයට ඒ ශාපය වදිනවා. මම කිව්ව විධියට ඒක නොපෙනන දේව ශාපයක්. සමහර විට අපි ගරු කරන එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය උඩ ඉඳලා බලාගෙන ඇති. ඒ ශාපයෙන් මේ පවුකාරයන් සියල්ලන්ම පිස්සු හැදිලා විනාශ වෙලා යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හිටපු වනජීවී හා තිරසර සංවර්ධන ඇමති විධියට දන්නවා, බුද්ධ ධර්මය ප්‍රචාරය වෙනුවෙන් ලෝකයේ විශාල ඉල්ලුමක් තිබුණු බව.

චීනයේ ජනාධිපතිතුමාට දෙන්න ලියුමක් මට දුන්නා, එය මම ගත්තේ පසුගිය 24 වෙනිදා.

මම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට බොහොම ගරු කරනවා. 1961 දී එතුමිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නොබැඳි සමුළුවේ සාමාජික වෙලා, චීනයෙන් වැඩම කරවූ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා නිදහස් චතුරස්‍රයේ සතියක් ප්‍රදර්ශනය කළා. මම චීනයට ගිය වෙලාවේ දැක්කා, ඒ ධාතූන් වහන්සේ බොහොම ආරක්ෂාකාරීව වැඩ සිටින බව. අපේ රටේ මහනුවර දළදා මාලිගාවට ගියාම දළදා කරඬුව සියලු දෙනාටම පෙන්වනවා. ඒ රටේ එහෙම නැහැ. චීන රජය අනුමත කරන අයට විතරයි දළදා කරඬුව පෙන්වන්නේ. චෛත්‍යයක් වාගේ තිබෙනවා. ඒ ඇතුළෙන් පඩිපෙළක් තිබෙනවා. චීන රජයෙන් අනුමත වුණු අයට, ප්‍රභූන්ට පමණයි දළදා කරඬුව පෙන්වන්නේ. අනෙක් අය චෛත්‍ය වාගේ තිබෙන එක වටේට ගිහිල්ලා දළදා කරඬුවට වැඳලා යනවා.

චීනයේ පැවැත්වෙන ලෝක බෞද්ධ සමුළුවලට සහභාගිවීමට මම ජනාධිපතිතුමාගේ ලියුම අරගෙන ගියා. මම ලියුම ගනිද්දී මට මේ ගැන හැඟෙවුවේවත් නැහැ. ඒ ලියුම අරගෙන මම 25 වෙනිදා ගියා. 26 වෙනිදා රජය වෙනස් කළා, රාජපක්ෂ නීතිවිරෝධීව දිවුරුම් දුන්නා කියලා දැන ගත්තා.

ඒ රාත්‍රියේදී මම හිටියේ ඒ සමුළුවේ. ලෝක බෞද්ධ සමුළුව තිබුණේ චීනයේ. ඒ සමුළුවට රටවල් හතළිස් ගණනක් සහභාගි වුණා. අපේ මහා නායක හාමුදුරුවන් වහන්සේලා ඇතුළු නියෝජිතයන් හැත්තෑ ගණනක් ඒ සමුළුවට අපේ රටෙන් ගිහිල්ලා සිටියා. ඒකේ ඉඳලා මම ආපහු ආවා. ජනාධිපතිතුමනි, ඔබතුමා, රනිල් වික්‍රමසිංහ ඇතුළු අපේ පක්ෂ සියල්ලම ඒකාබද්ධව අපේ ශක්තිය පෙන්වා තිබෙනවා. ඔබතුමා බුද්ධිමත්ව කටයුතු කරන්න. වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැහැ. ඔබතුමාට මම මතක් කරන්නේ එයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කරුණ කියා මගේ කථාව අවසන් කරනවා. ජපානය හවායි දූපතට බෝම්බ දාලා, අපටත් බෝම්බ දාලා, ජර්මනිය එක්ක එක පැත්තකින් ගහමින් මේ රටවල් සියල්ලම අරගත්තා. නමුත්, යුද්ධයෙන් පැරදුණු වෙලාවේ රුසියාව, චීනය ඇතුළු බලවත් රටවල් සියල්ලම කිව්වා, ජපානයට නිදහස දෙන්න එපා කියලා. 1952 දී සැන් ෆ්‍රැන්සිස්කෝහි පැවැති එක්සත් ජාතීන්ගේ සමුළුවට ඩී.එස්. සේනානායක මැතිතුමා විසින් අපේ තරුණ මුදල් ඇමතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා යැව්වා. එහිදී එතුමා කිව්වේ මොකක්ද? "නහි වේරේන වේරානි" කියන ඒ ගාථාව කියලා, වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැති බව පවසමින්, ජපානයට අපි අනුකම්පා කරමු; ඔවුන්ට නැතිවින්න අත දෙමු කියලා එදා එතුමා කිව්වා. එය පිළිගත් නිසා තමයි, ජපානයේ තිබෙන එකම විදේශ නායකයෙකුගේ පිළිරුව විධියට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පිළිරුව අදටත් තිබෙන්නේ කියන එක මතක තබා ගන්න. ඒ පිළිරුවට ඔවුන් දේවත්වයෙන් සලකනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමනි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් එදා බුදු දහම අනුගමනය කළා. මේ ලෝකයේ අඩුවක් නැති මිනිහෙක් නැහැ. අපි කවුරුත් ළඟ අඩු පාඩු තිබෙනවා; මගේත් තිබෙනවා. ඒ තිබෙන අඩු පාඩු ගැන අපි කථා කරමු. ඒකට අපේ කණ්ඩායම එන්න ලෑස්තියි. සියලුම පක්ෂ සමඟ අපි කථා කරමු. ඔබතුමා බුද්ධිමත්ව වැඩ කරන්නේ නැත්නම්, ඔබතුමා ශාපයට ලක්වනවාය කියන එක මම ප්‍රකාශ කරනවා.

සංචාරක අංශය ගැන බලන්න කලින් ඉදිරි මාස ටිකේ රටේ තත්ත්වය බලන්න. මම කලිනුත් කිව්වා, ඉදිරියේදී කන්නවත් හම්බ වන්නේ නැහැයි කියන එක. 1976-1977 කාලයේ, ඔබතුමන්ලා කුඩා කාලයේ, මෝටර්බයිසිකල් එතරම් තිබුණේ නැහැ. Pushbike එකට ටයර් එකක් ගන්න ගිය විධිය මතකද? ඒකටත් මෙහෙන් ගෙනියන්න ඕනෑ ලියුම් කෑල්ලක්. තිබුණ ටයර් එකේ හැම තැනම පැච් දාලා. කාර් එකටත් එහෙමයි. ඒ යුගයේ නොවෙයි අද ඉන්නේ. අද භයානකයි; ලේ වැගිරෙනවා; විනාශය එනවා. නමුත්, ඉදිරියේදී නව යුගයක් එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5යි තිබෙන්නේ. කරුණාකර මතක තබා ගන්න, කථික ලැයිස්තුවේ තවත් කථිකයින් විසි ගණනක් ඉන්නා බව.

[අ.භා. 4.55]

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ව්‍යාපාරයේ අර්බුදය සම්බන්ධයෙන් අද වනකොට ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ගෙනා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට මූලික හේතුව මොකක්ද? මේක අද ලංකාව තුළ අහම්බෙන් ඇති වූ සිද්ධියක් නොවෙයි. දේශපාලන බලලෝභීකමට කෑදරකමින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ වාගේම තමන්ගේ පවුලේ උදව්යට සහ තමන්ගේ සහචරයන්ට නඩු හබ ටික අවසන් කරන්නත්, ඉදිරියේදී ඒවාට මුහුණ දෙන්න තිබෙන බිය නිසාත්, මහින්ද රාජපක්ෂත් එක්ක එකතු වෙලා කළ මේ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය, මේ හොර ආණ්ඩුව නිසා තමයි සංචාරක ව්‍යාපාරයට අද මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම පසුගිය කාල සීමාව තුළ සංචාරක ව්‍යාපාරයේ විශාල දියුණුවක් අපි ලබා ගත්තා. අපි ලබා ගත් ඒ දියුණුව තුළ ලෝකයම අපි පිළිගත්තා. ලෝකයේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් තිබෙන සඟරාවක් වන "Lonely Planet" සඟරාව සංචාරක ව්‍යාපාරයෙන් ලෝකයේ හොඳම රට හැටියට, පළවෙනි ස්ථානය හැටියට අපේ රට නම් කරලා සතියයි ගියේ, සිරිසේන ජනාධිපතිතුමා මේ දේශපාලන අස්ථාවරභාවය මේ රටේ ඇති කළා. අද අපි පැහැදිලිව කියන්න ඕනෑ, 'ආණ්ඩුව' යැයි කියා ගන්නා මේ ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී, සදාචාර විරෝධී ඊනියා ආණ්ඩුව නිසා අද මේ රටේ සංචාරක ව්‍යාපාරය එහෙම පිටින්ම කඩා වැටිලා තිබෙන බව.

අද අපි දැක්කා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නිවේදනයක් ඉදිරිපත් කර තිබෙනවා, සංචාරක ව්‍යාපාරයට මේ තත්ත්වයෙන් කිසිම හානියක් නැහැයි කියලා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කොහේද දන්නේ නැහැ ඉන්නේ! මම පැහැදිලිව දෙයක් කියන්න ඕනෑ. ඊයේ පත්තරයක තිබුණා, "දේශපාලන අර්බුදය සංචාරක ව්‍යාපාරයට මරු පහරක් වෙලා" කියලා. මේක කියන්නේ කවුද? ඒ, ශ්‍රී ලංකා කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායක සංගමය.

ඒ ව්‍යවසායක සංගමය හොඳින් පැහැදිලි කරනවා, පසු ගිය කාල සීමාව තුළ සංචාරක ව්‍යාපාරය සඳහා සංගමයක් හැටියට - රජයට අමතරව- විශාල වෙහෙසක් අරගෙන, විදේශ රටවලට ගිහින්, දිරිගැන්වීම් කරලා, ප්‍රචාරක කටයුතු - promotions - ක්‍රියාත්මක කරලා තමයි මේ තත්ත්වය උදා කර ගත්තේ කියා. ලෝකයේ රටවල් අතුරින් සංචාරකයන් යන්න ඕනෑ හොඳම රට හැටියට "ලෝන්ලි ප්ලැනට්" සඟරාව අපේ රට හඳුන්වා දෙන්න පටන් ගත්තේ, අප ඒ තත්ත්වය ඇති කරගත්තාට පසුවයි. මම පැහැදිලිව කියන්න ඕනෑ, සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් අපේ රජය විශාල කාර්ය භාරයක් කළ බව. අපේ රටට හම්බ වෙන ආදායමෙන් විශාල පංගුවක් සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙනවා. එය විදේශ රැකියාවලින් ලැබෙන ආදායමට පසුව ඊළඟ තැනට ඇවිත් තිබුණා. අපි බලාපොරොත්තු වුණා ලබන අවුරුද්ද වන කොට එය පළමුවන ස්ථානයට ගෙන එන්න. සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් කතා කරන කොට පෙනෙනවා, එහෙම තිබුණු තත්ත්වය තමයි අද විනාශ කර දාලා තිබෙන්නේ කියා. අද සංචාරක ව්‍යාපාරය විතරක් නොවෙයි විනාශ වෙලා තිබෙන්නේ. අපට විශාල අනතුරු ඇඟවීමක් තිබෙනවා. රාජපක්ෂ යුගයේදී නවත්වා තිබූ, අප ඉතාම අමාරුවෙන් ලබා ගත් GSP Plus බදු සහනය සම්බන්ධයෙන් යුරෝපා සංගමය දැන් සාකච්ඡා කරනවා. මේ අස්ථාවර, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලිය නිසා ඒ සහන නවත්වනවාද, නැද්ද කියන සාකච්ඡාව අද පැවැත්වෙනවා. ඒ සම්බන්ධයෙන් අපට විශාල අනතුරක් තිබෙනවා. ඒ වාගේම තමයි, අපේ මත්ස්‍ය සම්පත සඳහා යුරෝපා සංගමයෙන් අපට ලබා දී තිබෙන බදු සහනය. අද ඒවා අවදානමට ලක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට වැඩියෙන්ම සංචාරකයන් එන ලෝකයේ රටවල් 26ක් තමන්ගේ රටේ ජනතාවට අනතුරු අඟවා තිබෙනවා, ශ්‍රී ලංකාවේ දේශපාලන අස්ථාවරභාවය නිසා, ප්‍රජාතන්ත්‍ර විරෝධිව අද ගෙන යන මේ වැඩ පිළිවෙළ නිසා අපේ රටේ සංචාරය කිරීමෙන් වැළකී සිටින්න කියා.

[ගරු ජේ. සී. අලවතුවල මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ ප්‍රදේශය ගත්තත්, හික්කඩුව, ගාල්ල ආදි ප්‍රදේශ ගත්තත්, මේ පැත්තෙන් දඹුල්ල, සීගිරිය ගත්තත්, ඒ හැම ප්‍රදේශයකම සංචාරක හෝටල්වල කාමර වෙන් කරවා ගැනීම් - bookings - මේ වන විට cancel කර තිබෙනවා. එහෙම නම්, රටක් හැටියට ගත් විට අද විශාල පාඩුවක් සිදුවී තිබෙනවා කියා මා හිතනවා. මේ මාසය තුළ, එනම් පසු ගිය මාසයේ 26වන දා සිට -අද 27වන දායි- මේ මාසයේ 26වන දා දක්වා විශාල මුදලක් -කෝටි 10,000කට වැඩි මුදලක්- සංචාරක ව්‍යාපාරයෙන් විතරක් අපට පාඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ආර්ථික විශේෂඥයන්ගේ ගණන් අනුව, සංඛ්‍යා ලේඛන අනුව, ඇති වී තිබෙන පාඩුව ගැන අද අප මතක් කරන්න ඕනෑ. ක්‍රියාත්මක කරපු මේ වැඩ පිළිවෙළ නිසා, මේ අස්ථාවරභාවය නිසා තමන්ට තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න ඕනෑ නිසා, මේ ගෙන ගිය නීති විරෝධී ආණ්ඩුව නිසා අපේ රටට රුපියල් බිලියන 800ක විතර පාඩුවක් මේ මාසය තුළ ඇති වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න. මා ඔබතුමාගේ අවධානයට තවත් කාරණයක් යොමු කරවන්න කැමැතියි. අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට පැහැදිලිව කියන්න ඕනෑ, මේ අස්ථාවර භාවය ඇති කර තිබෙන්නේ ඔබතුමා සහ මහින්ද රාජපක්ෂ කියන දෙපොළ එකතු වෙලාය කියන එක. ඒ තුළින් මේ රටේ විශාල පිරිසකට රැකියා අහිමි වන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය විතරක් නොවෙයි, ආර්ථික වශයෙන් තවත් අවස්ථා ගණනාවක් අපේ රටට අහිමි වේගෙන යනවා. අර මහින්ද රාජපක්ෂ යුගයේ වාගේ අපේ රට ලෝකයෙන් නැවත වතාවක් කොන් වන තැනට පත් වේගෙන යනවා. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට අපි පැහැදිලිව කියනවා, 'අද පාර්ලිමේන්තුව තුළ අපි බහුතරය පෙන්වා තිබෙනවා. 22ක් පෙන්නුවා. අද වන කොට 23ක් තිබෙනවා. 28වන දා, 29වන දා වන කොට 30ක විතර බහුතරයක් පෙන්වන්න අපට පුළුවන් වේවි.' කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අස්ථාවරභාවය නිම කරන්න ඕනෑ. මම පැහැදිලිව කියනවා, එදිනෙදාත්, මධ්‍ය කාලීනවත්, දීර්ඝ කාලීනවත් එය මේ රටේ ආර්ථිකයට, ජන ජීවිතයට විශාල වශයෙන් බලපා තිබෙනවා කියා. එහෙම නම් අපි ජනාධිපතිතුමාට කියනවා, ඔබතුමාගේ මේ පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍රවලට අනුව මේ විධියට මේ රට අස්ථාවරභාවයට පත් කරන්න එපා කියා. මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් අපි කියනවා, මේ රටට සුළුවෙන් හෝ ආදරයක් තිබෙනවා නම් මේ තත්ත්වයෙන් අයින් වෙලා බහුතරය තිබෙන පැත්තට, එහෙම නැතිනම් නැවත 26වන දාට පෙර පැවැති තත්ත්වයට අපේ රට පත් කරන්න කියා. ඒ අවස්ථාව බහුතරයට ලබා දීලා රට ස්ථාවර කළාම තමයි මේ තත්ත්වය මහ හරවන්න අපට පුළුවන් වන්නේ කියා මතක් කරමින්, මට අවස්ථාව දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඊට පෙර කරුණාකර මූලාසනයට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

[අ.භා. 5.02]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොමත්ම ස්තුතියි.

මට මතකයි, මීට මාස එකහමාරකට විතර කලින්, - ඔක්තෝබර් 26වෙනි දා මේ රටේ අවාසනාවන්ත දිනය උදාවෙන්න සතියකට දෙකකට කලින්- අපේ සංචාරක සංවර්ධන අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමාත්, මමත්, අමාත්‍යාංශයේ සියලු දෙනාත් "Lonely Planet" ආයතනයේ නිලධාරීන් එක්ක එකතු වෙලා සහරාවක් මඟින් මේ රට දැනුවත් කළා, 2019 වර්ෂයේ සංචාරකයන් සඳහා අංක 01 රට බවට අපේ රට පත් කරලා තිබෙනවා කියලා. මේ තියෙන්නේ "Best in Travel 2019" සහරාව. මේ සහරාවේ, සංචාරකයන් සඳහා අංක 01 ස්ථානයට පත්වෙලා තිබෙන අපේ ලංකාව ගැන ආකර්ෂණීය ලියවිල්ලක් තිබෙනවා. හැබැයි, ඊට සතියකට දෙකකට පස්සේ මේ රටේ අවාසනාවන්ත තත්ත්වයක් ඇති වුණා. ප්‍රජාතන්ත්‍ර විරෝධී, ව්‍යවස්ථා විරෝධී වැඩ කටයුත්ත සිද්ධ වෙලා ඊයේ දිනයට මාසයක් ගතවෙලා තිබෙනවා. මේ මාසය ඇතුළත ප්‍රධානතම වශයෙන් අපේ සංචාරක ව්‍යාපාරයට විශාල හානියක් සිදුවෙලා තිබෙනවා. Airport එක සංචාරකයන් ප්‍රමාණය ගණනය කිරීමේදී සියයට 20කින් පමණ අඩුවෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරයේ සෑම අංශයකටම එය බලපා තිබෙනවා. අපේ ටැක්සි රියදුරු මහත්වරුන් ගත්තාම, ඒ අය කියනවා, සංචාරකයන්ගේ අඩුවීම නිසා ඒගොල්ලන්ට ගමන් පහසුකම් ලබා දීමේ කටයුත්ත අඩු වෙලා කියලා. එතැනින් එහාට හෝටල් ක්ෂේත්‍රය ගත්තාම හෝටල්වල තිබෙන කාමරවලට තිබෙන occupancy එක අඩු වෙලා තිබෙනවා; හෝටල්වලට භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන්ගේ වෙළඳාම අඩුවෙලා තිබෙනවා. මේ ආකාරයෙන් හැම පැත්තක් දිහාම බලනකොට සංචාරක ව්‍යාපාරයත් එක්ක සෘජුව සහ වක්‍රව ගනුදෙනු කරන සියලු දෙනා මේ කාලසීමාවේදී විශාල අපහසුතාවකට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මට ඉතා කනගාටුයි කියන්න, අවුරුදු තුනහමාරක පමණ කාලයක ඉඳලා අපේ රජය විසින් සංචාරක ව්‍යාපාරයට ලබා දුන් ඒ ශක්තිය මේ මාසය ඇතුළත,-

අපේ සංචාරක අමාත්‍යාංශයේ ආයතන හතරක් තිබෙනවා. ඒ තමයි, Sri Lanka Tourism Development Authority - SLTDA, Sri Lanka Tourism Promotion Bureau - SLTPB, Sri Lanka Institute of Tourism and Hotel Management සහ Sri Lanka

Convention Bureau එක. දැන් මාස හතරක සිට මේ ආයතන හතරේ සභාපතිවරු නැහැ; අධ්‍යක්ෂ මණ්ඩලයක් නැහැ. ඒ ආයතනවලින් කෙරෙන වැඩසටහන් සියල්ලම නතර වෙලා. මෙන්න මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් තමයි ඇතිවෙලා තිබෙන්නේ. අද ඇමතිවරයෙක් නැහැ. අද ආනන්ද අලුත්ගමගේ රාජ්‍ය ඇමතිතුමා තමයි ඉන්නේ. එතුමා ගැන මම වැඩිය කතා කරන්නේ නැහැ, සංචාරක ව්‍යාපාරයේ ඉතුරු ටිකත් නැති වෙනවා. මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, අද සංචාරක සංවර්ධන අමාත්‍යාංශයට අදාළව තිබෙන ඒ ආයතන හතරම අකර්මණ්‍ය වෙලා සංචාරක ව්‍යාපාරය කඩාකප්පල් වෙලා තිබෙනවා කියන කාරණය. මෙන්න මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් අද ඇතිවෙලා තිබෙනවා. එදා "Lonely Planet" ආයතනය අපේ රට අංක එකේ රට බවට පත් කළා. නමුත් සති කිහිපයක් යනකොට ලෝකයේ රටවල් අපේ රටට සංචාරකයන් පැමිණෙනකොට ඒ අයට අනතුරු ඇඟවීම් කරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
හොඳයි.

මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් තමයි ඇතිවෙලා තිබෙන්නේ. හැබැයි, මේවා ගැන කථා කරනකොට, විවාද කරන්න යෝජනා කරනකොට අර ඊනියා ආණ්ඩුවේ එක්කෙනෙක්වත් අද මේ ගරු සභාවේ නැහැ, මේවාට පිළිතුරු දෙන්න. සාමාන්‍යයෙන් අපි දකින්නේ, විපක්ෂය තමයි පාර්ලිමේන්තුවේ වැඩකටයුතු කඩාකප්පල් කරන්න උත්සාහ කරන්නේ; පාර්ලිමේන්තුවෙන් නැගිටලා යන්නේ.

අද ලක්ෂ ගණනක් වියදම් කරලා මේ පාර්ලිමේන්තුව රැස්වුණත්, මේ මාසය ඇතුළත පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න ඒ අයට බැරි වෙලා තිබෙනවා. එක යෝජනාවක්වත් සම්මත කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ වුණාට ඒ අය පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ කාමරවල මාධ්‍ය සන්දර්ශන දක්වලා, රටේ මුදල් වැය කරලා, කැන්ටීමට ගිහිල්ලා කෑම කාලා, තේ බීලාත් යනවා. නමුත්, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරම තැන වන පාර්ලිමේන්තු සභාගර්භයට පැමිණිලා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඒ අයට හැකියාවක් නැහැ. අද එවැනි අවාසනාවන්ත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමනි, අපි දෙතුන් වතාවක්ම අපේ බහුතරය පෙන්නුවා. අපි ලබන 29වැනි දා නැවතත් ඒ බහුතරය පෙන්වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
කරුණාකරලා එදාටවත් අපි පත් කරපු ජනාධිපතිතුමා හැටියට ඔබතුමා මේ රටේ ජනතාව වෙනුවෙන් සාධාරණය ඉටු කරන්න. නැවතත් මේ රට යථා තත්ත්වයට පත් කරන්න, ස්ථාවරත්වයක් ඇති කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙන්නේ.

[අ.භා. 5.08]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉතාම කාලෝචිත යෝජනාවක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ මාතෘකාවට අදාළව කථා කරන්න පෙර, මට කියන්න වචන කීපයක් තිබෙනවා. මා හිතන විධියට ලෝක ඉතිහාසයේ කිසිම පාර්ලිමේන්තුවක මෙවැනි තත්ත්වයක් උද්ගත වෙලා නැතිව ඇති. ආණ්ඩු පක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායමක් පාර්ලිමේන්තුව වර්ජනය කිරීම කිසිම රටක සිදු වෙලා නැතිව ඇති. සාමාන්‍යයෙන් ලෝකයේ අනෙක් රටවල විපක්ෂය තමයි පාර්ලිමේන්තුවෙන් එළියට යන්නේ. විපක්ෂය තමයි පාර්ලිමේන්තුවේ කලබල ඇති කරන්නේ. නමුත්, මේ අවස්ථාවේදී ආණ්ඩුව යැයි කියා ගන්නා ඒ කණ්ඩායම මේ පාර්ලිමේන්තුව වර්ජනය කරලා තිබෙනවා; පාර්ලිමේන්තුවට පැමිණෙන්නේ නැතිව සිටිනවා; පාර්ලිමේන්තුවේ කලබල ඇති කරනවා. මුළු ලංකාවම දන්නවා, ඒ සියල්ලටම හේතුව ඔවුන්ට බහුතරයක් නොමැතිකම බව. පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙනවා නම්, කවදාවත් ආණ්ඩු පක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායමක් මේ විධියට පාර්ලිමේන්තුව වර්ජනය කිරීම කරන්නේ නැහැ. ඒ නිසා එම කණ්ඩායම පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා. කෙසේ වෙතත්, අපි දැන් කීප වතාවක්ම අපේ බහුතරය පෙන්වූවා. අපි ඉදිරියටත් අතිගරු ජනාධිපතිතුමාට අපේ බහුතරය පෙන්වන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ගෙනාපු මේ කල් තැබීමේ යෝජනාව ඉතාම කාලෝචිතයි කියලා මා කිව්වේ කාරණා කීපයක් නිසායි. අපි 2015 වසරේදී තමයි බලයට පැමිණියේ. 2014 වසරේදී ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණියේ 1,527,000යි. අපේ ඉලක්කය තිබුණේ 2025දී සංචාරකයන් 2,500,000ක් මේ රටට ගෙන්වා ගැනීමයි. 2017 - පසුගිය වසරේ- 2,150,000කට ආසන්න සංචාරකයන් ප්‍රමාණයක් අපේ රටට පැමිණියා. ඒ කියන්නේ, වසර තුනක් තුළ 600,000කට අධික සංචාරකයන් ප්‍රමාණයක් වැඩි වෙලා තිබුණා, අපේ රජයේ තිබූ ප්‍රතිපත්ති නිසා. අපේ ඉලක්කය සම්පූර්ණ කර ගැනීමට හැකි වන තත්ත්වයක් තමයි තිබුණේ. ලෝකයේ සංචාරය කරන්න සුදුසුම රටවල් අතරින් හොඳම ගමනාන්තය ලෙස පසුගිය දිනවල ලංකාව තේරිලා තිබුණා. නමුත්, මේ වන විට ඒ තත්ත්වය රටවල් 25කටත් එහා ගිහිල්ලා තිබෙනවා. සමහර රටවල්වල ඉන්න කීප දෙනෙක්ම මට ඒ සම්බන්ධයෙන් කථා කරලා කිව්වා. සමහර අය කිව්වා, ඕස්ට්‍රේලියාව වැනි රටවල්වල දුම්රිය ස්ථානවල, ගුවන් තොටුපොළවල දාලා තිබෙනවා කියලා, "ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමෙන් වළකින්න." කියලා. මේ තත්ත්වය තුළ ඒ රටවල්වල ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ඉතාම අපහසුතාවට පත් වෙලා තිබෙනවා. අපට විදේශ විනිමය අවශ්‍ය අවස්ථාවක, විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්න ඇතිවෙලා තිබෙන අවස්ථාවක, ඩොලරය රුපියල් 180ටත් එහා ගිහිල්ලා තිබෙන අවස්ථාවක මෙවැනි තත්ත්වයක් ඇතිවීම පිළිබඳව අපි ඉතා කනගාටු වෙන්න ඕනෑ. මේකට සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ එම කණ්ඩායමයි කියන එකත් අපි කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට මේ රටේ සංචාරක හෝටල්වල කාමර 23,500ක් පමණ තමයි තිබෙන්නේ. අපි

[ගරු අශෝක් අබේසිංහ මහතා]

බලාපොරොත්තු වෙලා තිබුණා, එම කාමර ප්‍රමාණය 50,000 දක්වා වැඩි කරන්න. ඒ කාමරවල ඇඳන් 48,550ක් පමණ තිබුණා. අපි කාමර 50,000 දක්වාත්, ඇඳන් ප්‍රමාණය 100,000 දක්වාත් වැඩි කරන්න අපේ පසුගිය අය වැයෙන් තීන්දු කරලා, වැඩසටහන් සකස් කරලා තිබුණා. ඒ වාගේම, සුළු පරිමාණ ව්‍යාපාරිකයන් දිරිගැන්වීම් සඳහා අපේ අය වැයෙන් homestay වැනි වැඩසටහන් අපි ආරම්භ කරලා තිබුණා. ඒ සියල්ලම මේ තත්ත්වය තුළ නැති වෙලා තිබෙනවා. අද වෙද්දී මේ රටේ අය වැයක් නැති තත්ත්වයක් තිබෙනවා. අපි විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබුණා. ඒ අය වැය නොවැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා විවාද කරලා සම්මත කරන තත්ත්වයක් තමයි තිබුණේ.

නමුත් පසුගිය දින අපි දැක්කා, ආණ්ඩු පක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායම රැස්වෙන කැබිනට් මණ්ඩලයේ රැස්වීමට මහ බැංකුවේ අධිපතිවරයා සහ ආර්ථික සභාවේ සභාපතිවරයා කැඳවලා ලබන වසරේදී අපි ගෙවන්න තිබෙන ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5, ඒ කියන්නේ රුපියල් කෝටි 30,000කට ආසන්න ණය ප්‍රමාණය ගෙවන්න පුළුවන් කියලා පෙන්වන්නට විශාල උත්සාහයක් දැරූ බව. මා හිතන හැටියට 2012දී මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් ගත්ත තීන්දුව නැවත ක්‍රියාත්මක කරන්න තමයි මේ යන්නේ. ඒ අනුව ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇමෙරිකානු ඩොලර් බිලියනයකට වැඩි ප්‍රමාණයක් ණයට ගන්න හදනවා. පසුගිය කාලයේදී, 2012දී මෙවැනි තත්ත්වයක් ඇතිවෙලා, ඩොලර් හිඟයක් ඇතිවෙලා අපේ සංචිත අඩු වුණා. සංචිතවල දැනට තිබෙනවාය කිව්වේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7.2යි. මාස හතරහමාරක පමණ ආනයන සඳහා තමයි ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 7.2 ප්‍රමාණවත් වන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ ලංකා බැංකුවට, මහජන බැංකුවට සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ඩොලර් ණයට අරගෙන මහ බැංකුවේ ආයෝජනය කරන්න අවස්ථාව සලසා දුන්නොත් 2012දී ඇති වුණු තත්ත්වයම නැවත ඇති වෙනවා. 2012දී ගත්ත ඒ තීන්දුව නිසා ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට මහ බැංකුව රුපියල් බිලියන 71.6ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 7,160ක පාඩුවක් ලැබුවා. ඒක ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවටයි වුණේ. 2013 වසරේ කෝටි 2,224කුත්, 2014 වසරේ කෝටි 3,158කුත්, 2015 වසරේ කෝටි 1,781කුත් මහ බැංකුව පාඩු ලැබුවා. මේ වරත් ඔවුන් කරන්න හදන්නේ කෝටි 7,160ක පාඩුවක් ලැබූ මහ බැංකුව පාඩු ලබන තත්ත්වයට පත් කරන්නයි. ඒ වාගේම, ඔවුන් කියලා තිබුණා, මේ ණය ගෙවන්න පුළුවන්, හම්බන්තොට වරායේ මුදල් ඩොලර් මිලියන 650ක් ඉතිරිවෙලා තිබෙනවා කියලා.

අපේ සංචිත යොදවා ගැනීම සහ ඩොලර් ණයට ගැනීම තුළින් තව තවත් අපේ ආර්ථිකය අපහසුතාවට පත්වෙන බව විශේෂයෙන්ම කියන්නට ඕනෑ.

මම අවසාන වශයෙන් කියනවා, නැවත වරක් මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ මේ කණ්ඩායම උත්සාහ කරන්නේ 2012දී වැටුණු වළට දාලා මහ බැංකුවට නැවත පාඩු කරන්නයි කියලා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා. ඔබතුමාටත් විනාඩි 5ක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා. 5.14]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බොහෝදෙනා සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීම ගැන කථා කළා. නමුත්, මම කියන්න කැමැතියි, මාස කීපයක් තිස්සේම ජාත්‍යන්තරය තුළ අපේ මුදල් ඒකකය මුහුණ දීලා තිබුණු අභියෝග ජය ගන්න අපි උත්සාහ කරද්දී දැක්ක දෙයක්. ලංකාවේ රුපියල විතරක් නොවෙයි, ඉන්දියාවේ රුපියල, ඉන්දුනීසියාව, පාකිස්ථානය, පිලිපීනය සහ තුර්කිය කියන මේ සියලු රටවල මූල්‍ය ඒකකවලට ඇමෙරිකානු ඩොලරයේ අභියෝගය තිබුණා. මා හිතන විධියට මේ රටේ බොහෝදෙනා දන්නවා ඒ සියලු මූල්‍ය ඒකක ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණ වුණු බව. ලංකාවේ රුපියල 2018 ජනවාරි මාසයේ 154 සිට ඔක්තෝබර් මාසයේ මේ කුමන්ත්‍රණය දියත් වන දවස වන විට 172කට අවප්‍රමාණ වෙලා තිබුණා.

ඒත් එක්කම, අපි අනෙක් රටවල් දිහාත් බලමු. මම කිව්වා වාගේ ජනවාරි 01වෙනි දා ඉඳලා ඔක්තෝබර් මාසය වන විට ලංකාවේ රුපියල සියයට දොළහහමාරකිනුත්, ඉන්දියානු රුපියල සියයට 14.75කිනුත්, පාකිස්ථානු රුපියල සියයට 21කිනුත්, ඉන්දුනීසියානු රුපියා සියයට 12කිනුත්, පිලිපීනයේ පෙසෝ සියයට 7, 1/2කිනුත්, තුර්කියේ ලීරා සියයට 48කිනුත් අවප්‍රමාණ වෙලා තිබුණා. නමුත් මේ ලෝකයේ බොහෝ රටවලට ඒ තිබුණු ජාත්‍යන්තර අභියෝගය, ඇමෙරිකානු ඩොලරය ශක්තිමත් වීමේ ගැටලුව බොහෝ දුරට අඩු වුණා. නමුත්, ඔක්තෝබර් මාසයේ 26වෙනි දා ඉඳලා ඊයේ වෙනතුරු ආජන්ටිනාවේ පෙසෝ සියයට 1කිනුත්, තුර්කියේ ලීරා සියයට 6, 1/2කිනුත්, පිලිපීන පෙසෝ සියයට 2, 1/2කිනුත්, ඉන්දුනීසියානු රුපියා සියයට 5කිනුත්, ඉන්දියානු රුපියල සියයට 4කිනුත් අධිප්‍රමාණ වුණා.

මම මේ කියන්න උත්සාහ කරන්නේ, ඒ අභ්‍යන්තර ගැටලුව ගැන නොවෙයි. අපේ රුපියල අවප්‍රමාණය වීම ගැනයි. අප මුහුණ දෙන්න සිටි එම අභියෝගය ක්‍රම ක්‍රමයෙන් නැති වෙලා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙකුත් රටවල මූල්‍ය අගය අධිප්‍රමාණ වෙද්දී, ඒ සියලුම මූල්‍ය ඒකකවලින් ශ්‍රී ලංකාවේ රුපියල විතරයි මේ ලෝකයේ emerging marketsවල අවප්‍රමාණ වුණේ. ඒ කියන්නේ, ඔක්තෝබර් මාසයේ 26වැනි දා ඉඳලා ඊයේ වෙන කොට ඩොලරයට සාපේක්ෂව අපේ රුපියල 172 ඉඳලා 181 දක්වා, සියයට හතරහමාරකට කිට්ටු ප්‍රමාණයකට අවප්‍රමාණ වෙලා තිබෙනවා. කවුරු හරි කියන්න උත්සාහ කරනවා නම්, "මේක ලංකාවේ අභ්‍යන්තර දේශපාලන ප්‍රශ්නය නිසා සිදුවුණු දෙයක් නොවෙයි" කියලා, එහෙම නම් ඒ ගොල්ලෝ කියන්නේ බොරු කථාවක්. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා වෙන්න පුළුවන්; මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයා වෙන්න පුළුවන්; වෙන කවුරු හරි නිලධාරියෙක් වෙන්න පුළුවන්, යථාර්ථය පිළිගෙන කථා කරනවා නම්, ඒ අයට පිළිගන්න සිද්ධ වෙනවා එදා තිබුණු තත්ත්වය බොහෝදුරට දැන් වෙනස් වෙලා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක තෙල් මිල සියයට 26කින් පහළ වැටී තිබෙන බව ඔබතුමා දන්නවාද? රුපියලට ජාත්‍යන්තරයේ තිබෙන අභියෝගය බොහෝදුරට අඩු වෙලා තිබෙනවා. අනෙක් රටවල මූල්‍ය ඒකක පසුගිය මාසයේ අධිප්‍රමාණ වෙලා ලංකාවේ මූල්‍ය ඒකකය පමණක් අවප්‍රමාණ වෙනවා නම්, එහෙම නම් මහින්ද රාජපක්ෂ කියන ඊනියා මුදල් ඇමතිවරයාගේ සහ ඔහුගේ ඊනියා ආණ්ඩුවේ තිබෙන ප්‍රතිපත්තිමය සහ මිනිසුන්ගේ විශ්වාසය නැති ප්‍රශ්නයක් තිබෙන්නේ කියන එක අපට පිළිගන්න සිද්ධ වෙනවා. ආණ්ඩුව යැයි කියා ගන්නා

කණ්ඩායම ලෝකයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවෙන් පැනලා ගිහිල්ලා. හයේ එන්නේ නැතිව එළියේ lobby එකේ ඉන්නවා, canteen එකේ ඉන්නවා. මේ සභාවට ගෙනැල්ලා කිසිම පනත් කෙටුම්පතක් pass කරගන්න ඔවුන්ට හැකියාවක් නැහැ; මුල්‍ය පනත් කෙටුම්පතක් pass කර ගන්න හැකියාවක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි. මුදල් අමාත්‍යාංශය හරහා මේ රුපියල රැක ගැනීමට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. කිසිම වැඩ පිළිවෙළක් නැහැ. බන්දුල ගුණවර්ධන මැතිතුමා කියනවා, "ඩොලරය රුපියල් 200ට යන කොට ඒක අපට අතින් අල්ලලා නවත්වන්න බැහැ නේ" කියලා. දැන් ඩොලරය රුපියල් 200ට නොවෙයි, ඊටත් එහාට යන ආකාරයට මේ ප්‍රශ්නය බැරෑරුම් වෙනවා.

මට වේලාව නැති නිසා මේ කාරණයත් කියලා මම අවසන් කරන්නම්. මේ සංචාරකයන්ගේ season එක. නොවැම්බර් මාසයේ පටන් ගත්තාම මාර්තු මාසය දක්වා මේ season එක තිබෙනවා. මේ කාලයේ තමයි අපි සංචාරකයන්ගෙන් වැඩිපුරම ඩොලර් උපයා ගන්නේ. සාමාන්‍යයෙන් අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියන 4,000ක පමණ ප්‍රමාණයක් අපි සංචාරකයන්ගෙන් උපයා ගන්නවා. සංචාරක season එකේ උච්චතම අවස්ථාව ඇවිල්ලා තිබෙන වෙලාවේ තමයි මේ කුමන්ත්‍රණය සිදු කරලා, රුපියලට මේ මහා විනිනැහිය කරලා තිබෙන්නේ. මම නැවතත් ඔබතුමාට කියන්න කැමැතියි, තවදුරටත් මෙය බාහිර අභියෝගයක් ලෙස අර්ථකථනය කරන්න, හුවා දක්වන්න ඔවුන්ට හැකියාවක් නැහැ. ඔව්, එහෙම ප්‍රශ්නයක් තිබුණා. නමුත් ඒ ප්‍රශ්නය, ඒ බාහිර අභියෝගය වෙනස් වෙලා. ඉන්දියාව ඇතුළු අනෙක් සියලුම රටවල මුල්‍ය ඒකක අධිප්‍රමාණ වෙද්දී ලංකාවේ මුල්‍ය ඒකකය වන රුපියල පමණයි අවප්‍රමාණ වෙන්නේ කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.20]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රට "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" කියලා නම් කරපු රටක්. ඒ වාගේම, විදේශිකයන්ගේ ආකර්ෂණය තිබෙන රටක්. විදේශිකයන්ගේ ආකර්ෂණය නිසාම මේ රට යටත් කරගන්න, මේ රටේ සම්පත් උදුරා ගන්න, මේ රටේ ආකර්ෂණය බලෙන් ගන්න විවිධ රටවල් පොරකාලා, රණ්ඩු වුණා. එහෙම ඉතිහාසයක් අපට තිබෙන්නේ. මේ හැම දේකින්ම කියන්නේ, අපේ රටේ තිබෙන විදේශීය ආකර්ෂණය ගැනයි. එහෙම තිබුණු රටකට අද මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? පසුගිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ණය ගැනීම් නිසා අපේ රට ඉතාමත්ම බේදනීය තත්ත්වයකට පත් වුණා. ඒක අපේ රටේ පමණක් කියන කථාවක් නොවෙයි. ණය අරගෙන වෙච්ච සිද්ධීන් පිළිබඳව "The New York Times" සහරාවේත්, ඒ වාගේම වෙනත් රටවල සහරාවලත් පළවෙන්න පටන් ගත්තා. ලංකාව වැටුණු ණය උගුල ගැන. නමුත්, කවුරු ණය ගත්තත් අපේ අනාගත පරම්පරාවට, වර්තමාන පරම්පරාවට තමයි මේ ණය ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ ණය ගෙවන්න සිදුවෙලා තිබෙන්නේ රුපියල්, සතවලින් නොවෙයි; මේ රටේ තිබෙන සම්පත්වලින් නොවෙයි. අපි විදේශ විනිමය එකතු කරගෙන තමයි මේ ණය ගෙවන්න ඕනෑ.

අපේ රටට විදේශ විනිමය එකතු කරගන්න කොට සංචාරක කර්මාන්තය වැදගත් වෙනවා. ඒ වාගේම විදේශ ආයෝජන, අපනයන, විදේශ රැකියා, ඒවා ඉතාම වැදගත් වෙනවා. අපට ලෝකයේ ඉහළම තැනකට යන්න පුළුවන් අවස්ථාවක් තමයි සංචාරක ක්ෂේත්‍රය. ඒ නිසා තමයි ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව පිළිබඳව මා සතුටින් කථා කරන්නේ. මේ කාලය අපේ රටට විශාල මුදලක්; විශාල ඩොලර් ප්‍රමාණයක්; විශාල විදේශ විනිමයක් එකතු කරගන්න පුළුවන් කාලයක්. නමුත් දැන් අරගෙන තිබෙන වැරැදි තීන්දු නිසා ඒ කාලය මහ හැරීගෙන යනවා අපට පෙනෙනවා. ඇත්තටම මේ රට සුන්දර රටක් වුණාට, මේ රට විදේශීය සංචාරකයන්ගේ වැඩි ආකර්ෂණයකට ලක් වූ රටක් වුණාට, මේ රටේ සිටින දේශපාලකයන් ගත් තීන්දු තීරණ නිසා මේ සුන්දර රට අපිරිසිදු කරලා තිබෙනවා. එම නිසා මේ රටට ආදරය කරනවා නම්, මේ වගේ බහුබූත වැඩ කරන්නේ නැතුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින් වැඩ කරන්න කියලා විශේෂයෙන් අපි කියනවා.

පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුව යයි කියා ගන්නා, බලහත්කාරයෙන් වගකීම් භාරගන්න මන්ත්‍රීවරු එක්කෙනෙක්වත් අද මෙතැන නැහැ. කාටද අපි කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් දැන් canteen එකට ගිහිල්ලා බැලුවොත්, ඒ මන්ත්‍රීවරු ටික එතැන ඉන්නවා. එතකොට ඡන්දයක් තියලා බහුතරය පෙන්වන්න වුණොත්, පාර්ලිමේන්තුව තුළ බහුතරය පෙන්වන්න බැරි වුණාට ඒ ගොල්ලන්ට canteen එක ඇතුළේ දී නම් බහුතරය පෙන්වන්න පුළුවන්. මොකද, අපේ මන්ත්‍රීවරු ටික පාර්ලිමේන්තු සභාවේ ඉන්නවා. ආණ්ඩුව කියා ගන්නා ඊනියා කණ්ඩායම canteen එකට වෙලා ඉන්නවා. ඒ නිසා මේ රටත් එක්ක සෙල්ලම් කරන්න එපා කියලා මම කියනවා. වර්තමාන සමාජය එක්ක විතරක් නොවෙයි, නූපන් දරුවනුත් එක්කයි මේ සෙල්ලම් කරන්නේ.

අපේ රට දිහා බැලුවොත්, 2014දී සංචාරකයින් ඇවිල්ලා තිබෙන්නේ 178,000යි. ඒ වාගේම 2015දී ඇවිල්ලා තිබෙනවා 191,000ක්. 2016දී සංචාරකයන් 220,000ක් ඇවිල්ලා තිබෙනවා. 2017 දී ඇවිල්ලා තිබෙන සංචාරකයන් ප්‍රමාණය 210,000යි. එන්න එන්නම මේ රටට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය වැඩි වුණා. අනෙක් කාරණය තමයි, සංචාරකයන් මෙරටට ගෙන්වීම සඳහා අපි විවිධ ක්‍රමවේද අනුගමනය කළා. මේක අපට දිනන්න පුළුවන් විෂයක්. 2019දී -ලබන අවුරුද්දේ- තමයි අපට ලොකුම ණය ප්‍රමාණය ගෙවන්න තිබෙන්නේ. එහිදී අපි සංචාරක ව්‍යාපාරය තුළින් විශාල මුදලක් බලාපොරොත්තු වුණා. නමුත් මේ වල් බූරු තීන්දු අරගෙන, වල් බූරු විධියට රටේ බලය අතට ගන්න දඟලපු නරි ටිකක් නිසා මේ රට යන ගමන අඩාල වෙලා තිබෙනවා. එහි වන්දිය ගෙවන්න වෙන්නේ ඒ කපටි නරි රැළට නොවෙයි. ඒ වන්දිය ගෙවන්න වෙන්නේ මේ රටේ අහිංසක ජනතාවටයි. අහිංසක ජනතාව ණය බරින් මුදවලා, මේ රට ආසියාවේ විශිෂ්ට රටක් බවට පත් කරලා, මේ රට විදේශීය සංචාරකයන්ට ආකර්ෂණීය රටක් කරන්න ගිය ගමන තමයි මේ කඩාකප්පල් වුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි. අපි එදාත් මේක දැක්කා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදාත් මේක සිද්ධ වුණා. මොකද, ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී නායකයෝ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම් බෑන් කී මූන්, ඒ වාගේම නවනීදන් පිල්ලේ වැනි ලෝකය පිළිගත් කාන්තාවන් මේ රටට එනකොට මේ රටේ හිටපු ඇමතිවරු කටයුතු කළේ කොහොමද කියලා අපි දැක්කා. බෑන් කී මූන් කියන ලෝකය පිළිගත් නායකයා; ඒ රාජ්‍ය තාන්ත්‍රිකයා ලංකාවට එනකොට ඇමතිවරයා ගිහිල්ලා පාරේ බුදියගන්නවා. ඒ නිසා සංචාරකයන්ගේ පැමිණීම අඩු වුණා. ඒ වාගේම නවනීදන් පිල්ලේ වැනි නෝනලා; ලෝකය පිළිගත් කාන්තාවන් මේ රටට එනකොට අපේ ඇමතිලා ගිහිල්ලා කසාද බඳින්න ඇහුවා. ඒ වාගේම සංචාරය සඳහා මේ රටට පැමිණි විදේශීය යුවලකගේ පෙම්වතා මරලා එම පෙම්වතිය දූෂණය කරන්න තරම් ප්‍රාදේශීය සභා සභාපතිවරු බලය අතට ගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය දැන් අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අන්න එහෙම කටයුතු කරලා, විදේශිකයන්ට මේ රට ගෝත්‍රික රටක්, සංචාරය සඳහා නුසුදුසු රටක් බවට පත් කර තිබියදීත්, පසු ගිය අවුරුදු තුනහමාර තුළ ටිකෙන් ටික, ටිකෙන් ටික ගොඩනඟලා ලෝක ආකර්ෂණය නැවතත් ලබා ගන්න අපට පුළුවන් වුණා. නමුත්, එසේ ලබාගත් ආකර්ෂණය තුළ අද "කිරි හැළියට ගොම බින්දුවක් එකතු කළා වාගේ" මේ ඇති වෙලා තිබෙන තත්ත්වය හරිම කනගාටුදායකයි. අද ආණ්ඩු පක්ෂය යැයි කියා ගන්නා අයට පාර්ලිමේන්තුවට පැමිණෙන්නවත් බැරිවෙලා තිබෙනවා. කොහොමද රටක් පාලනය කරන්නේ? අඩු ගණනේ මේ රටට සංචාරක ඇමතිවරයෙක් පත් කරගන්න තරම් කොන්දක් අද ඔවුන්ට නැහැ. පත් කළ සංචාරක ඇමතිවරයාත් දැන් ඇමතිකම පැත්තකට දමලා අපේ පැත්තට ඇවිල්ලා ඉන්නවා. එහෙම නම්, සංචාරකයන් එන මේ කාල වකවානුවේ - මේ season එකේ - මේ රටට සංචාරකයන්ගෙන් ආදායම් ලැබෙන්න තිබෙන වකවානුව තුළ අද සංචාරක ඇමතිවරයෙක්වත් නැති රටක් බවට මේ රට පත්වෙලා තිබෙනවා. බොරු අගමැති කෙනෙක් සිටියත්, අඩුම ගණනේ බොරු සංචාරක ඇමතිවරයෙක්වත් නැහැයි කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කළේ ඔබතුමායි. ඒ අවස්ථාවේ ඔබතුමා කථා නොකළ නිසා දැන් ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලබා දෙනවා.

[අ.භා.5.27]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

එදා -2015ට පෙර- පැවති ආණ්ඩුවේ බලධාරීන් මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න කටයුතු කළේ කොහොමද කියා අපි දැක්කා. එදා අනුගමනය කළ ඒ ක්‍රමවේද නිසා, ඒ අක්‍රමිකතා නිසා සංචාරක ව්‍යාපාරය හොඳටම කඩා වැටිලායි තිබුණේ. ඊට පසුව, 2015දී ඇති වුණු ඒ සැබෑ වෙනසත් එක්ක මේ රටේ නැවතත් ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම තුළින් රට තුළ දේශපාලන නිදහස, ආර්ථික නිදහස හා සමාජ නිදහස ස්ථාපිත වුණා. ශ්‍රී ලංකාව අනෙකුත් රටවලින් ඈත් වෙලා සිටි අවස්ථාවක, ඒ රටවලට කථා කරලා, නැවතත් ඒ හොඳ හිත දිනාගෙන, අපේ මේ සංචාරක ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න කටයුතු කරන්න අපට හැකි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දේවල් කරන අතරේ, ජාත්‍යන්තර වශයෙන් අපි කළ පළමු දෙය තමයි, 2015 වසරේ සැප්තැම්බර් 23වන දා ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 193ක් එකතු වෙලා එක්සත් ජාතීන්ගේ සම්මේලනයේදී 2030දී තිරසර සංවර්ධන අරමුණු කරා යෑම සඳහා වන ඒ සම්මුතියට අත්සන් කිරීම. එහි අරමුණු 17ක් තිබෙනවා. අප අත්සන් කළ ඒ අරමුණු 17හි වැදගත්ම අරමුණ එහි 16වැනි එකයි. ඒ අරමුණ තමයි, සාමය සහ ශක්තිමත් ආයතන ඇති කිරීම. එවැනි ශක්තිමත් ආයතනයක් තමයි නීතිය ක්‍රියාත්මක කරන ආයතන. අන්න ඒ වාගේ ශක්තිමත් ආයතන හරියාකාරව ක්‍රියාත්මක වෙන කොට තමයි අනෙකුත් අරමුණු ඉටු වන්නේ. ඒ ශක්තිමත් ආයතන රටේ ඇති වුණු නිසා අපට විනිවිදභාවයකින් යුතුව කටයුතු කරන්න හැකියාව ලැබුණා.

අපේ ගරු කථානායකතුමා මන්ත්‍රීවරයෙක් ලෙස සිටි කාලයේ පටන් ගෙනෙන්න උත්සාහ කළ පනත් කෙටුම්පතක් මේ පාර්ලිමේන්තුවට ගෙනැත් සම්මත කර ගන්න අපට එදා පුළුවන් වුණා. ඒක තමයි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත. ඒ පනත තුළින්, මේ රට තුළ විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමේ හැකියාව ඇති කරන්න අපට පුළුවන් වුණා. මේ රටේ යම්කිසි ස්ථාවරභාවයක්, විනිවිදභාවයක් තිබෙනවාය කියා ඒ තුළින් අපට ජාත්‍යන්තරයට පෙන්වන්න පුළුවන් වුණා. ඒ හරහා සංචාරක ව්‍යාපාරය ඉතාම ශීඝ්‍රයෙන් දියුණු වුණා. සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනකොට අපට වන අලි ගැන කථා කරන්නම වෙනවා. අලි පැටවුන් හොරකම් කළ ආකාරය පසුගිය වකවානුවේ අපි දැක්කා. සමහර මන්ත්‍රීවරුන්ගේ ළඟ, එහෙම නැත්නම් බලධාරීන් ළඟ ඒ අලි පැටව් තියාගෙන හිටියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙනවා.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ දේවල්වලට හිත තබලා, නීතිය හරියට ඉදිරියට ගෙන ගිය නිසා තමයි සංචාරක ව්‍යාපාරය ඒ විධියට දියුණු වෙලා, අපට ඉදිරියට යන්න පුළුවන් වුණේ. සංචාරක ව්‍යාපාරයෙන් විශාල

ආදායමක් මේ රටට එන්න තිබුණා. හැබැයි, පසුගිය ඔක්තෝබර් 26වන දා ජනාධිපතිවරයාගේ වුවමනාවන් ඉටු කර ගන්න කළ ඒ අක්‍රමිකතාව නිසා අද අපේ රටේ ආර්ථිකයත්, සංචාරක ව්‍යාපාරයත් විශාල පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. අපේ ආර්ථිකයට ලැබෙන්න තිබුණු විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඒ නිසා අද අහිමි වෙලා තිබෙනවා. මේ තුළින් සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින පිරිස්වලට මෙන්ම මේ රටේ සමස්ත ජනතාවටම බලපෑමක් වෙලා තිබෙනවා. මේ නොවැම්බර් මාසයේ සිට ජනවාරි, අප්‍රේල් මාසය දක්වා වූ කාල සීමාව තුළ මේ රටට සංචාරකයන් විශාල වශයෙන් එනවා. මේ අර්බුදය නිසා අද ඒ සංචාරක ව්‍යාපාරයට ලොකු හානියක් වෙලා තිබෙනවා. මාතර පැත්තේ, එහෙම නැත්නම් දකුණු පළාතේ තමයි සංචාරක ව්‍යාපාරය විශාල වශයෙන් තිබෙන්නේ. නමුත් ඒ පැත්තේ අද සංචාරකයන් නැහැ. අපට මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නම්, තම තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රවලට අනුව කටයුතු කරන්නේ නැතිව, රට ගැන හිතලා, රටේ ජනතාව ගැන හිතලා කටයුතු කරන්න කියා මේ අයගෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.33]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ tourismවලට ඇතිවෙලා තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න මටත් අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වනවා. Tourism විතරක් නොවෙයි, සමස්ත ලංකාවේම ආර්ථිකය විනාශ වන තත්ත්වයක් මේ වනකොට ඇතිවෙලා තිබෙනවා. අපේ ලංකාව දැන් කිසිම ආදායමක් නැති රටක් බවට පත්වෙලා තිබෙනවා. අපි ලෝකයේ රටවල් අරගෙන බලමු. ඇමෙරිකාවට අලුතින් පත් වුණු ජනාධිපතිතුමා ඒ රට පාලනය කළාට පස්සේ, ඩොලර්වල ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණා. එහෙත් එවැනි ප්‍රශ්න ඇති වුණු රටවල් -ඩොලරයේ අගය අනුව තම මුදල් ඒකකය බොහොම පහතට ගිය රටවල්- එම තත්ත්වය ආපසු අනික් පැත්තට හරවාගෙන තිබෙනවා. ඒ අතින් ලංකාවේ ජනතාව කනගාටු වෙන්න ඕනෑ. ඒ ඇයි? අපි ඩොලරයකට ගෙවන මිල එන්න එන්නම වැඩි වෙනවා. අද රුපියල අන්තිම තුට්ටුවටම බැහැලා යනවා. අද ඩොලරයේ අගය රුපියල් 182 දක්වා වැඩි වෙලා තිබෙනවා.

Tourism මේ වාගේ පහතට යනකොට ලංකාවේ ආර්ථිකයට කිසිම ආදායමක් ලබා ගන්න බැරි ආකාරය අපිට මේ මාසය තුළදී දකින්න ලැබෙනවා. එහෙනම් මේ දේවල් හදා ගන්නේ කොහොමද කියා අපි පුනපුනා කථා කළ යුතුයි. නමුත් මේ පාර්ලිමේන්තුවේදී අපිට යම් දෙයක් කර ගන්න බැරිවෙලා තිබෙනවා. ලංකාවේ ආදරණීය ජනතාව, මා ඇතුළු පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනා සෙල්ලම් කරන්න පාර්ලිමේන්තුවට එවපු විධිය තමයි අපිට දැන් බලන්න පුළුවන් වන්නේ. දැන් හරියටම මාසයක් ගතවෙලා ඉවරයි. මේ පාර්ලිමේන්තුවේදී අපි දෙවතාවක් බහුතරය පෙන්නුවා. මේ මාසයේ 29වන දාත් අපි බහුතරය පෙන්වනවා.

ගරු ජනාධිපතිතුමනි, මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා ලෝකයේ විශිෂ්ට නායකයකු කිරීමට ලංකාවේ සියලුම ජනතාව ඡන්දය දීලා, ඔබතුමාව පත් කරලා, ඒ අය දැන් බලාගෙන ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ බහුතර බලය තිබෙන්නේ කොයි පැත්තටද කියා ඔබතුමා දන්නවා. ඒ නිසා ඔබතුමා ඉන්න ස්ථාවරයේම ඉන්නේ නැතිව, එක අඩියක් පස්සට අරගෙන වැඩි බහුතරයක් තිබෙන කණ්ඩායමට නැවත වතාවක් ආණ්ඩුව හදලා දෙන්න. ඒ වාගේම ඩොලරයකට ගෙවන රුපියලේ අගය වැඩිවීම අඩු කරන්නත්, Tourism, කෘෂිකර්මය, කර්මාන්ත, අධ්‍යාපන, සෞඛ්‍ය ආදී හැම අංශයකම වැඩිදියුණුවක් ඇති කරන්නත් ඔබතුමාට තව අවුරුද්දක කාලයක් තිබෙනවා.

ගරු ජනාධිපතිතුමනි, පැහැදිලිවම ඔබතුමා ඒ කටයුත්ත කරයි කියා අපි බලාපොරොත්තු වනවා. එහෙම නැති වුණොත්, අපිට නම් ගමට යන්න බැහැ. ගමට යනකොට, "අනේ! මිරිස් කුඩුකාරයා එනවා" කියා අපිට කියනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාටම තමයි මම මේ කථා කරන්නේ. මා ඇතුළු පාර්ලිමේන්තුවේ ඉන්න හැම කෙනාටම "හොරෙක්" කියලා එහේ ඉඳගෙන කියනවා. මෙහේ ඉඳලා අපි කියනවා, "හොරු" කියා. නමුත් ඔක්කොම "හොරු" වෙලා ඉවරයි.

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට මම මේ කාරණයත් කියනවා. පසුගිය අවුරුදු තුනේ අපේ ආණ්ඩුව තුළ උසාවිය භාරව ඇමතිතුමෙක් හිටියා. හැබැයි, ඒ ඇමතිතුමාට හොරුන්ට දඬුවම් ලබා දෙන්න බැරි වුණා. ඒ අවුරුදු තුනේම හොරු එළියේ හිටියා. ගරු ජනාධිපතිතුමනි, හොරු ඉන්නවාය කියලා ඔබතුමා කියනවා. මේ ආණ්ඩුවේත් හොරු ඉන්නවා කියනවා; ඒ ආණ්ඩුවේත් හොරු ඉන්නවාය කියනවා. ඇයි, බලාගෙන ඉන්නේ? අපිටත් ලජ්ජයි. ගමට යන්න බැහැ. අපේ දරුවන්ට පාසල් යන්න බැහැ. ඒ ඇයි? හොරු හිටියා නම් ඒ පරණ ආණ්ඩුවේ හිටපු හොරුන්ට නියම දඬුවම් ලබා දෙන්න. ඒ වාගේම අපේ යහ පාලන ආණ්ඩුවේ හොරු හිටියා නම් ඒ අයටත් දඬුවම් ලබා දෙන්න. දෙපැත්තටම ජම්පර අන්දවන්න. එහෙම නොකර කවදාවත් ගම්වලට ගිහින් ඡන්ද නම් ඉල්ලන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගමේ ඉන්න අපේ ජනතාව අපිට ගහලා තමයි එළවන්නේ.

අපිට අපේ මේ ආදරණීය ජනතාවට මොනවාද, කියන්න පුළුවන්? අපිට කියන්න කථාවක් නැහැ. ඒ නිසා අපි පාර්ලිමේන්තුවේ තිබෙන උත්තරීතර බව රැක ගන්න ඕනෑ. මේ උත්තරීතර බව අද විනාශ වෙලා තිබෙනවා. මේ විනාශය නැති කරන්න ඕනෑ, මේ විනාශය හදන්න ඕනෑ. 1948දී අපේ ලංකාවට නිදහස ලැබුණා. එදා ඉඳලා මුළු ලෝකය ගත්තාම ලංකාව කියන මේ පුංචි රට, බොහොම සුන්දර විධියට තිබුණු රට මේ මාසය තුළදී විනාශ වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි. තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න අමාරුයි, ගරු මන්ත්‍රීතුමනි. තව කරීකයින් විශාල පිරිසක් සිටිනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තුවේ වැඩ කරන අපේ නිලධාරී මහත්වරු බෙල්ලේ මහ විශාල බෝඩ් එකක් එල්ලා ගෙන ඉන්නවා. අපිට බලන්න කනගාටුයි. ඒක වෙනස් කරන්න. ඒ අය බෝඩ් එක එල්ලා ගෙන යන්නද, අපට උදව් කරන්නද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ මහ විශාල බෝඩ් එක අයින් කරලා ඒ අයට හරියාකාරව වැඩ කටයුතු කරන්න පුළුවන් විධියට ඒ අයව නම් කරලා, ඒ අයව හඳුනා ගන්න පුළුවන් විධියට identity card එකක් දෙන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ඒ අයගේ බෙල්ලේ මහ විශාල බෝඩ් එකක් එල්ලා ගෙන ඉන්නවා. ඒක එල්ලා ගෙන එහාට යනවා, මෙහාට යනවා. අනේ, පව්! ඒක නිවැරදි කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මට වැඩිපුර කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි පහක පමණ කාලයක් ලබා දී තිබෙනවා.

[பி.ப. 5.40]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உல்லாசப் பிரயாணத்துறை சம்பந்தமான இந்த விவாதத்திலே அது தொடர்பான விடயங்களுக்கு அப்பால், மலையக மக்களுடைய பிரதிநிதி என்ற வகையிலே ஒருசில முக்கிய விடயங்களைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். மலையகப் பெருந்தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமான கூட்டு ஒப்பந்தம் காலாவதியாகி கிட்டத்தட்ட ஒன்றரை மாதகாலமாகப் போகின்றது. இந்த ஒன்றரை மாத காலகட்டத்திலே, தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாகத் தேசிய ரீதியிலும் சர்வதேச ரீதியிலும் பலதரப்பட்ட போராட்டங்கள் நடைபெற்றன. மலையக இளைஞர்கள், புத்திஜீவிகள், வர்த்தகப் பிரமுகர்கள், தொழிற்சங்க அரசியல்வாதிகள், பெருந்தோட்டத் தொழிலாளர்கள் எனப் பலதரப்பட்ட அணியினரும் ஒன்று சேர்ந்து அந்தப் போராட்டத்தை நடத்தியிருக்கிறார்கள். ஆயினும், இன்று வரையிலும் 1,000 ரூபாய் சம்பள உயர்வு தொடர்பில் அரசியல் தலைவர்களாலோ ஜனாதிபதி அவர்களாலோ பிரதம மந்திரியாலோ எந்தவிதமான ஒரு முடிவும் முன்வைக்கப்படவில்லை. தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு சம்பந்தமாகப் பேசப்படுகின்றபோது, இன்று முதலாளிமார் சம்மேளனம் தான்தோன்றித்தனமாகச் செயற்பட்டுக் கொண்டிருக்கிறது.

இந்த நாட்டினுடைய மலையகத்தைச் சார்ந்த உல்லாசப் பிரயாணத்துறையுடன் சம்பந்தப்பட்ட ஹோட்டல்களிலே சேவையாற்றுகின்ற உத்தியோகத்தர்கள் மற்றும் அங்கு சேவையாற்றுகின்ற பணியாளர்கள் பொருளாதார ரீதியிலே மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஹோட்டலில் வேலை செய்யும் ஒரு சாதாரண உத்தியோகத்தரின் வருமானம் 50 சதவீத சம்பளத்துடன் 50 சதவீத service charge உம் சேர்ந்ததாகத்தான் அமைகின்றது. அந்த வருமானத்தைக் கொண்டுதான் உல்லாசப்பிரயாணத்துறை சார்ந்த அந்த ஹோட்டல்களிலே சேவையாற்றுகின்றவர்கள் தங்கள் குடும்பங்களை நடாத்திச் செல்கின்றார்கள். இந்த நாட்டிற்கு வருகின்ற உல்லாசப் பிரயாணிகளின் எண்ணிக்கையில் இன்று ஒட்டுமொத்தமாக ஏற்பட்டிருக்கும் வீழ்ச்சியின் காரணமாக அந்த உத்தியோகத்தர்கள் முழுமையாகப் பாதிக்கப்பட்டிருக் கின்றார்கள். மலையகத்திலே ஆங்காங்கே இருக்கின்ற அழகிய நிலங்கள், பிரதேசங்கள் மற்றும் தேயிலைத் தொழிற்சாலைகள் ஆகியவற்றுக்கு இன்று உல்லாசப் பிரயாணிகளின் வருகையின்மையினால் உல்லாசப் பயணத்துறை ஸ்தம்பிதமடைந்திருக்கின்றது.

தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாகப் பல முயற்சிகள் எடுக்கப்பட்டிருந்தாலும் முதலாளிமார் சம்மேளனம் தொடர்ந்து அடாவடித்தனமாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. ஆகவே, பிரதம மந்திரி அவர்களும் ஜனாதிபதி அவர்களும் அவர்களுக்கு அழுத்தம் கொடுத்து உரிய நடவடிக்கை எடுக்கவேண்டும். சம்பள உயர்வு இன்று என்கின்றார்கள், நாளை என்கின்றார்கள், நாளை மறுதினம் என்கின்றார்கள். 'இலவுகாத்த கிளிபோல' பெருந்தோட்டத் தொழிலாளர்கள் அந்தச் சம்பள உயர்வைப் பார்த்துக்கொண்டிருக்கிறார்கள். அது சம்பந்தமாகத் தோட்டத் தொழிலாளர்கள் ஒன்று சேர்ந்து வீதிகளிலே இறங்கிப் போராட்டம் செய்யும்போது, இந்த நாட்டிலே உள்ள அரசாங்கமும் ஆட்சியாளர்களும் எங்களுடைய மக்களின் கோரிக்கைகளைச் சரியான முறையிலே செவிமடுத்து ஒரு தீர்மானத்தை எடுக்கின்றார்களா? என்பது சந்தேகமாக இருக்கின்றது.

தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பளம் வழங்க வேண்டுமென்று பெருந்தோட்டக் கம்பனி உரிமையாளர்களுக்கு அரசாங்கம் - ஆட்சியாளர்களும் மற்றும் பாராளுமன்றமும் - உத்தரவிட வேண்டும். பொருளாதாரம் சம்பந்தமாகப் பலவிதமாகப் பேசிக்கொண்டிருப்பவர்கள் ஏன் இந்தத் தோட்டத் தொழிலாளர்களுடைய பொருளாதாரம் சம்பந்தமாகக் கவனம் செலுத்துவதில்லை? ஆகவே, அவர்களுடைய சம்பள உயர்வு பற்றிய கோரிக்கை முழுமையாகச் செயற்படுத்தப்பட வேண்டும். இதற்காகத்தான் இன்னோரன்ன செயற்பாடுகளில் நாங்கள் ஈடுபட்டுக் கொண்டிருக்கின்றோம். இன்று எம்மீதும் சில விமர்சனங்கள் வந்துகொண்டிருக்கின்றன. தங்களுடைய முகத்தைக் காண்பிக்காமல் முகநூலினூடாக சிலர் விமர்சனங்களைச் செய்துகொண்டிருக்கிறார்கள். சம்பந்தப்பட்டவர்களால் சில விடயங்களை ஜீரணிக்க முடியவில்லை. அவர்கள் திறமையற்றவர்களாக இருக்கின்றார்கள். திறமையிருந்தால் பாராளுமன்றத்திலே வந்து பேசலாம்; திறமையிருந்தால் போராட்டத்தில் இறங்கலாம்; திறமையிருந்தால் தொழிற்சங்கப் போராட்டம் நடாத்தலாம். ஆனால், அவர்கள் அவை

ඉන්නෑයුම් ඉන්නෑයුම් ඉන්නෑයුම්

[ගරු සුජිත් සංජය පෙරේරා මහතා]

විශේෂයෙන්ම මෙම විවාදය සිදු කරන අවස්ථාවේදී ආණ්ඩු පක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායම මේ අවස්ථාවට සම්බන්ධ වෙලා සිටියා නම්, මේ පාර්ලිමේන්තුව ඉතාම අර්ථවත් වෙනවා කියා මා හිතනවා. අපි දන්නවා, පසුගිය මාස කිහිපය තුළදීම පාර්ලිමේන්තුව වාර ගණනක් රැස්වෙච්ච අවස්ථාවේදී පාර්ලිමේන්තු කටයුතු නිසියාකාරව පවත්වාගෙන යන්නට අපට අවකාශයක්, එහෙම නැත්නම් ඉඩක් ලබා දුන්නේ නැති බව.

අපේ ආණ්ඩුව තිබුණා නම්, අපි බලයේ සිටියා නම් මේ දවස්වල ඉදිරි වර්ෂය සඳහා වූ අය වැය ලේඛනය ඉදිරිපත් කර, එහි විවාදය පැවැත්වෙනවා. නමුත්, ඉදිරි වර්ෂයේ වියදම් සඳහා අය වැයක් හෝ අඩුම තරමින් අතුරු සම්මත ගිණුමක්වත් පාර්ලිමේන්තුවට ගෙනෙන්න මේ "අපේ ආණ්ඩුව" යැයි කියා ගන්නා පුද්ගලයන්ට අද වනතුරු ධෛර්යයක් ලැබී නැහැයි කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය පිහිටුවාගත් පසුගිය මාසයේ 26වැනි දා සිට අද දක්වා මාසයක කාලය තුළ, කිසිම කෙනෙකු මේ ඊනියා රජය පිළිගන්නා තත්ත්වයට පත් වෙලා නැහැ. ඒ නිසා අද මේ රට විශාල අර්බුදයකට ලක් කර තිබෙනවා. ආර්ථිකය අතින් ගත්තොත්, අද ආර්ථිකය කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ දවස්වල ඩොලරයේ අගය ඉහළ යාම සම්බන්ධයෙන් විශාල වශයෙන් කථා කළ උදවිය අද මුණිවත රකිනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ සංවර්ධනය සඳහා විශාල මුදලක් එන්න තිබුණා. ඒ සියල්ලම අද නතර වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේකේ ඉහළම බලපෑම එල්ල වෙලා තිබෙන්නේ සංචාරක ව්‍යාපාරයටයි. මොකද, සංචාරක අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කළ මම දැනගෙන හිටියා, පසුගිය කාලවකවානුව තුළ සංචාරක ව්‍යාපාරය කොච්චර ඉදිරියට ගියාද කියන එක. යුද්ධය තිබුණු කාලයේ කඩාකප්පල් වෙලා ඉතාම පසුබෑමකට ලක් වෙලා තිබුණු සංචාරක ව්‍යාපාරය 2012න් පස්සේ ඉදිරියට යාවි කියලා අපේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. නමුත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලසීමාව තුළ හිටපු ප්‍රාදේශීය සභා සභාපතිවරයකු බ්‍රිතාන්‍ය ජාතික තරුණියක් දූෂණය කර මරා දමන්න කටයුතු කිරීමත් එක්ක අවුරුදු දෙකක් වැනි කාලයක් තුළ සංචාරක ව්‍යාපාරය ඉතාමත් පසුබෑමට ලක් වුණා. ඊට පසු අපි, අපේ රජයේ ගරු අගමැතිතුමාගේත් උපදෙස් පරිදි, ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේත් මැදිහත් වීමෙන් විශාල වැඩසටහන් කිහිපයක් කළා. විශේෂයෙන් ප්‍රචාර වැඩසටහන් රාශියක් කරලා එතුමා පෞද්ගලිකව ඒකට මැදිහත් වුණු නිසා තමයි පසුගිය වසර දෙක තුළදී සංචාරක ව්‍යාපාරය ඉහළ නැනකට ආවේ. 2017 වසර ගත්තොත්, සංචාරකයින් විසිලක්ෂයකට ශ්‍රී ලංකාව තුළ සංචාරය කරන්න අවශ්‍ය කටයුතු සිදු කර තිබුණා. ඊළඟට, 2018 වසර තමයි ඉතිහාසයේ වැඩිම සංචාරකයින් පිරිසක් එන්න තිබුණු වසර. නමුත්, අද වන විට ගෙන තිබෙන මේ අනුවණ ක්‍රියා මාර්ගය නිසා සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබෙනවා. නැත්නම් අපේ ඉලක්කය වෙලා තිබුණේ විසිපන්ලක්ෂයක සංචාරකයන් මේ වසර අවසානය වනවිට ගෙන්වා ගන්නයි.

අද හෝටල් ඇතුළු සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වෙලා ඉන්න සියලුම ආයතන ඉතාම අපහසුතාවට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන් සංචාරක කර්මාන්තය පැත්තෙන් යුරෝපය, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව වැනි වැදගත් රටවලින් එන්න තිබුණු සියලුම ඇණවුම්, වැඩසටහන්වලින් සියයට 60ක් අවලංගු කරන්න කටයුතු කර තිබෙනවා. මේ තුළින් අපේ ආර්ථිකයට වන බලපෑම ගැන අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. මේ තත්ත්වය නිවැරදි කරන්න හැකි වෙන්නේ නීත්‍යානුකූල රජයක් බිහි කර, ජාත්‍යන්තර විශ්වාසය දිනා ගත්තාට පස්සේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ව්‍යාපාරය ගැන කථා කරන අතරතුර තවත් වැදගත් කරුණු දෙකක් සම්බන්ධව කථා කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඉන් එකක් තමයි තේ කර්මාන්තය. සංචාරක ව්‍යාපාරය ගැන කථා කරද්දී අපට ඒ ගැනත් කථා කරන්න වෙනවා. මොකද, බොහෝ වෙලාවට සංචාරකයන් ආවාම අපේ තේ වතු, තේ කර්මාන්තශාලා නරඹනවා. ගරු වඩිවෙල් සුරේෂ් මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අද දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා, මේ තේ කර්මාන්තයට සම්බන්ධ වෙලා ඉන්න වතු කම්කරුවන්ගේ වැටුප් සම්බන්ධව. මේ මොහොතේ පවතින ආණ්ඩුව පත් වෙන කොටම වතු කම්කරු නායකයින් ඇමතිකම් ගත්තා. ඒ අය ඇමතිකම් අරගෙන කිව්වේ මොකක්ද? "මම ඇමතිකම් ගත්තේ වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන්න" ය කිව්වා. නමුත්, අදට මාසයක් වෙනවා, පත්කර ගත්තා වූ රජයටත්, ඒ ඇමතිවරුන්ටවත් මේ වතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් ලැබී නැහැ. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, අපට රජය ලබා දෙන්න කියලා. අපි අඩු ගානේ වතු කම්කරු සමාගම් එක්ක සාකච්ඡා කරලා මේ රුපියල් 1,000 මිථ්‍යාවෙන් එහාට ගිහිල්ලා සාධාරණ තැනකට ඇවිල්ලා ඒ වැටුප් වැඩි වීම ලබා දෙන්න කටයුතු කරන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு சுஜித் சங்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක් දෙන්න.

මේ රජය කළ තවත් අකටයුත්තක් තිබෙනවා. අපේ රජය පැවැති කාලයේ නීත්‍යානුකූල ක්‍රමයට සේවකයෝ ගණනාවක් බඳවා ගන්න කටයුතු කළා. විශේෂයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බඳවා ගත්ත සේවකයන්, නිවාස සංවර්ධන අධිකාරියට බඳවා ගත්ත සේවකයන් සියලු දෙනාම අද අත්තනෝමතික ලෙස ඉවත් කරන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධවත් පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා මේ නීතිවිරෝධී කටයුත්ත ගැන අදාළ ආයතනවලට දැනුම් දීලා ඒ සේවකයන්ට වෙච්ච අසාධාරණය සම්බන්ධවත් යම්කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි කියන එක මම ඔබතුමාගේ අවධානයට යොමු කරමින් මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඊළඟට ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා.5.52]

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඇති වී තිබෙන අර්බුදය හමුවේ සංචාරක ව්‍යාපාරය කඩා වැටීම නිසා අපේ රටට බලපාන කාරණා පිළිබඳවයි අද දින සභාව කල් තබන අවස්ථාවේ

ඉදිරිපත් කළ යෝජනාව තුළින් විවාදයට ගනු ලැබුවේ. මා ජීවත් වන්නේ මීගමුව ප්‍රදේශයේයි. විශේෂයෙන්ම කටුනායක ගුවන් තොටුපොළ ආසන්නව ජීවත්වන, මීගමුව සංචාරක පාරාදීසය හැටියට අපි දකින ප්‍රදේශයේ ජීවත් වන්නෙකු හැටියට මා ඇසුරු කරන බොහෝදෙනකුගේ එකම ආදායම් මාර්ගය බවට කෙමෙන්-කෙමෙන් පත් කරගෙන තිබුණේ සංචාරක ව්‍යාපාරයයි. මේ සම්බන්ධයෙන් අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා පැහැදිලි කළා. රට හැටියට ගත්තාමත්, විදේශීය රැකියාවලට යන අපේ ගෘහ සේවිකාවන්ගෙන් අපට ලැබෙන ආදායමට පසු, අපට වැඩි ආදායමක් ලබා ගන්න තිබෙන්නේ සංචාරක ව්‍යාපාරයෙනුයි. පසුගිය කාලයේ පැවති රජයත්, 2015න් පස්සේ අපේ රජයත් කටයුතු කළේ මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නයි. විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකය ගොඩ ගැනීම සඳහා විදේශීය මුදල් අපේ රටට ගෙන්වා ගන්න ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. ඒ සඳහා සදාචාර සම්පන්න ලෙස, ගැළපෙන විධියට, සුදුසු විධියට කරන්න තිබෙන ඉතාම උසස් ක්‍රමයක් තමයි සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම. අපේ රට පිහිටා තිබෙන්නේ ඉතාම ලස්සන ස්ථානයකයි. අපේ රට ඒ ආකාරයෙන් පිහිටා තිබීම නිසා සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන්. මේ රටට සිදු වුණු විවිධ බාහිර බලපෑම් නිසා හැම වෙලාවේම සංචාරක ව්‍යාපාරය කඩා වැටුණා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඒ පිළිබඳව කථා කළ නිසාත්, මට වෙන් කර තිබෙන කාලය අඩු නිසාත් මා ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ.

ගිය අවුරුද්දේ ඇති වුණු ඩෙංගු වසංගතය නිසා සංචාරක ව්‍යාපාරය අඩාළ වුණා. දැන් ඒ හා සමානම දෙයක් අපේ සංචාරක ව්‍යාපාරයට සිද්ධවෙලා තිබෙනවා. Season එක කාලයේදී බස් රථ, කාර් රථ, රියැදුරන් guidesලා සහ Hotel, restaurant, homestay යන ස්ථාන අන්තර්ජාලය මඟින් book කරලා තිබියදී තමයි මේ රට මේ අර්බුදයට පත් වුණේ. මේ අර්බුදය දැවැන්ත අර්බුදයක්. අද උදේත්, ඊයේත් අපි මේ සම්බන්ධයෙන් කථා කළා. මේ අර්බුදය අද අපේ රටට විශාල වශයෙන් බලපා තිබෙනවා. මේ රට පාලනය කරන අපේ රටේ නායකයා වන ජනාධිපතිතුමාට මේ අර්බුදය සම්බන්ධයෙන් හිතන්න වෙනවා. මේ පිළිබඳව එතුමාට තීරණයක් ගන්න වෙනවා. මොකද, මේ රටේ සංචාරක ව්‍යාපාරය කඩා වැටීම නිසා මේ අවුරුද්දේ මේ රටට ලැබෙන ඩොලර් ප්‍රමාණය අඩුවෙනවා වාගේම මේ රට ලෝකයෙන් ඈත් වන එක මේ රටේ මිනිසුන් හැටියට අපට දරාගන්න බැහැ. මේ රට ඒ තරමට ලෝකයෙන් ඈත්වන තත්ත්වයකට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය රජය කාලයේ සංචාරක ව්‍යාපාරයට සිදු වුණු හානිය පිළිබඳව මට පෙර කථා කළ අපේ සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා මතක් කළා. මේ රටේ ප්‍රාදේශීය සභාවක හිටපු සභාපති කෙනෙක් සංචාරය සඳහා පැමිණි එංගලන්තයේ කාන්තාවක් දූෂණය කරලා මැරුවා. තවත් එවැනි දේවල් බොහොමයක් සිද්ධ වුණා. ඒ නිසා සංචාරකයන් මේ රටට පැමිණෙන්න භය හිතෙන තත්ත්වයක් ඇති වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට එක කාරණයක් කියන්න ඕනෑ. මේ රජය වෙනස් කිරීමට ජනාධිපතිතුමා ගත්ත තීරණයෙන් පස්සේ සංචාරක ව්‍යාපාරයට වැඩි වශයෙන් සම්බන්ධ ජෙට්වින්ග් කියන සමාගම ගුවන් තොටුපොළේ promotion වැඩසටහනක් පැවැත්වූවා. එදාම තමයි අලුතින් ඇමතිවරයෙක් පත් කළේ. හැබැයි ගුවන් තොටුපොළ භාරව නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාම තමයි පත් වුණේ. Promotion වැඩසටහන අවසන් වුණු අවස්ථාවේදී ගුවන් යානාවක් පිරිලා ආපු සංචාරකයන් එළියට එද්දී මේ රජය අලුත් රජයක් නිසා බෝම්බ පිපිරෙන මට්ටමින් රතිඤ්ඤා විශාල ප්‍රමාණයක් පත්තු කළා. ඒ අවස්ථාවේදී ඒ ආපු සංචාරකයෝ හිස හැරුණු අතේ දුවන්න පටන් ගත්තා. ඔවුන් භය වුණා, ලංකාවේ නැවත යුද්ධයක් ඇතිවෙලාය කියලා. ඇත්තටම ඒ කාරණාව සිදු වෙද්දී මමත් ඒ ගුවන් තොටුපොළ හරහා එමින් තමයි සිටියේ. පසුව ඒ වැඩසටහන කළ අය අපේ නිවසට ආවා. මන්ත්‍රීවරයකු හැටියට ඒ ආසන්නයේ ඉන්නේ මමයි. ඒ අය කිව්වා, "බලන්න සර් වෙච්ච දේ. අද අපි වැඩසටහනක් කළා. මේ මෝඩ රැළ ඒක එහෙමපිටින්ම විනාශ කළා"යි කියලා. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරනවා නම්, සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් ඒ සමාගම ඉදිරිපත් කළ ඒ promotion වැඩසටහනින් බලාපොරොත්තු වුණේ, සංචාරක ව්‍යාපාරය තවත් දියුණු කරන්නයි. ඒක කාලා දැම්මා.

මා මේ කියන්නේ එක කාරණාවක්. අද ඒ ප්‍රදේශයේ තැඹිලි ගෙඩිය විකුණන, අන්නාසි ගෙඩිය විකුණන, කෙසෙල් කැන විකුණන, බයිසිකලයක් කුලියට දෙන, මෝටර් සයිකලයක් කුලියට දෙන හැම කෙනකුගේම ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. මා කියන්නේ, සල්ලි ගැන නොවෙයි; ඩොලර් ගැන නොවෙයි. මේ සිදු වීමෙන් අපේ රට ලෝකයෙන් ඈත් වෙනවා. කාලයක් මේ රට ලෝකයෙන් ඈත් වුණා.

ලෝකය පිළිගත්තේ නැහැ. අපේ පක්ෂය ජාතික ආණ්ඩුවකට එකඟ වෙලා මේ ආණ්ඩුව හැදුවේ මේ රට නැවත ලෝකය පිළිගන්න මට්ටමකට ගෙන යන්නයි. විපක්ෂ නායක හැටියට ආර්. සම්පන්දන් මැතිතුමා පත් වුණා. මේ රට ලෝකය පිළිගන්න මට්ටමට පත් වුණා. ජාතිවාදය නැති, ආගම්වාදය නැති, ගෝත්‍රවාදය නැති රටක් බවට අපේ රට පත් වුණාම සංචාරකයින් පැමිණෙන, ඔවුන්ගේ ඇල්ම-බැල්ම තිබෙන තත්ත්වයක් අපේ රටේ ඇති වුණා. බාලි නගරයට, මාල දිවයිනට, බැංකොක්වලට යන සංචාරකයින් නැවත මේ ලස්සන රටට එන්න සූදානම් වුණා. දැන් නැවතත් මේ රට විනාශ වෙන තත්ත්වයට පත් වුණාම, ඔවුන් ඒ සියල්ල නැවැත්තුවා. එම නිසා මේ රටට එන මුදල් නැතිව ගියා පමණක් නොවෙයි, මේ රට ලෝකයෙන් ඈත් වුණා. යුරෝපා සංවිධානය සංචාරකයන්ට දැන් මේ රටට එන්න එපා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට කරවන නායකයන් මේ පිළිබඳ හිතා බැලිය යුතුයි. දෙතුන්දෙනෙකුගේ තීන්දු, තීරණ නිසා මේ රට එවැනි තත්ත්වයකට පත් කරන්න එපා. මේ කථා කරන මට වඩා හෙට ඉපදීමට සිටින දරුවන් වෙනුවෙන් මේ පිළිබඳ තීරණයක් අරගෙන මේ රට හරි තැනට ගෙනයන්න කියන ඉල්ලීම මේ රටේ නායකයන්ට කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.58]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எமது தேசம் - எமது நாடு அரசியல் ரீதியாக அநாதையாக்கப்பட்ட நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றது. கடந்த ஒரு மாத காலமாக எமது நாட்டினுள் ஓர் அரசாங்கம் இல்லாத நிலைமை எங்களுடைய நாட்டின் தலைமையால் அல்லது எங்களுடைய நாட்டின் ஜனாதிபதியினால் உருவாக்கப்பட்டிருக்கின்றது. இந்தத் துர்ப்பாக்கியமான நிலைமைக்கு மத்தியிலேயே இன்று நாங்கள் இங்கு உரையாற்ற வேண்டியிருக்கின்றது. குறிப்பாக இந்த நிலைமையினால் இன்று எமது நாட்டினது மொத்தப்

[ගරු වේලු කුමාර් මහතා]

பொருளாதாரமும் வீழ்ச்சியடைந்து, சீரழிந்த நிலைக்குத் தள்ளப் பட்டிருக்கின்றது என்பதை நான் ஞாபகப்படுத்துகின்றேன். அதிலே மிக முக்கியமான ஒரு துறையாக இருக்கின்ற உல்லாசப் பிரயாணத்துறைக்கு ஏற்பட்டிருக்கின்ற பாதிப்புக்கள் தொடர்பில் இப்போது இங்கே விபரிக்கப் படுகின்றது. இந்த அரசியல் சூழ்ச்சியின் காரணமாக - இந்த மாற்றம் காரணமாக அதாவது அரசு ஒன்று இல்லாத நிலைமை காரணமாக உல்லாசப் பிரயாணத் துறையின் பாதிப்புக்குச் சமனாக மிகப் பெருமளவிலே பாதிப்படைந்த இன்னுமொரு துறையாகப் பெருந்தோட்டத்துறை இருக்கின்றது. அதாவது அந்தப் பெருந்தோட்டத்துறையிலே இருக்கின்ற தொழிலாளர்கள் மிகப் பெரிய பாதிப்பை எதிர்நோக் கியிருக்கின்றார்கள். இரண்டாண்டுக்கு ஒரு தடவை அவர்களுடைய சம்பளத்தைத் தீர்மானிக்கின்ற கூட்டு ஒப்பந்தம் சம்பந்தப்பட்ட பேச்சுவார்த்தை உச்சக்கட்ட நிலையில் இருந்தபோது இந்தச் சூழ்ச்சியானது இடம்பெற் றிருக்கின்றது.

இந்த ஒப்பந்தத்திலே பேரம் பேசலில் ஈடுபடுகின்ற, அதிலே கைச்சாத்திடுகின்ற, அதற்குத் தலைமைத்துவம் அளிக்கின்ற தரப்பினர்கள் இந்தச் சூழ்ச்சியினால் வந்த அரசாங்கத்திடம் ஓடோடிச் சென்று ஓர் அமைச்சைப் பெற்றுக் கொண்டார்கள். "நாங்கள் மஹிந்த ராஜபக்ஷவுக்குக் கொடுத்த ஆதரவை மறுபரிசீலனை செய்யப் போகின்றோம்" என்று ஒரு மாத காலத்தின் பின் அவர்கள் மீண்டும் குறிப்பிடுகின்றார்கள். அதனை இப்போது மறுபரிசீலனை செய்ய வேண்டிய தேவையில்லை; இப்பொழுது அந்த அரசும் இல்லை; தங்களுடைய அமைச்சுமில்லை என்பதனை நான் சொல்லி வைக்க விரும்புகின்றேன். ஆனால், நீங்கள் ஓடோடிப் போய் அமைச்சுப் பதவியை எடுக்க முன்னர், இந்த அரசாங்கம் உருவாக்கப்பட்டபோது இதை நீங்கள் சொல்லியிருக்க வேண்டும். அப்போது நீங்கள் எமது மக்களுக்கு 1000 ரூபாய் அடிப்படைச் சம்பளத்தை பெற்றுத்தந்தால் உங்களுடைய அரசுக்கு நாங்கள் ஆதரவு தருகின்றோம். அதன் பிறகு வந்து நாங்கள் அமைச்சை எடுத்துக் கொள்கின்றோம் எனக் கூறியிருந்தால் எமது சமூகம் சார்பாக இந்தச் சபையிலே நாங்கள் உங்களுக்குப் பெருமை சேர்த்திருப்போம்.

இந்தத் தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினையை வைத்து கடந்த 30 - 40 ஆண்டுகளாக நீங்கள் அரசியல் செய்திருக்கின்றீர்கள். இன்று அரசியலுக்கு அப்பால் சென்று எமது மொத்தச் சமூகமும் வீதியிலே இறங்கிப் போராடுகின்றது. தோட்டத் தொழிலாளர்களது ஒரு நாள் அடிப்படைச் சம்பளம் 1,000 ரூபாய் ஆகவேண்டும் என்பதிலே எமது சமூகம் திடமாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. ஆகவே, நீங்கள் இதனை வைத்து அரசியல் செய்யப் பார்க்காதீர்கள் என்பதை நாங்கள் உங்களுக்குக் கூற விரும்புகின்றோம். எங்களுக்கு இதனை வைத்து அரசியல் செய்யவேண்டிய தேவையில்லை. இந்த 1,000 ரூபாய் என்ற அடிப்படைச் சம்பளத்திலிருந்து நாங்கள் பின்வாங்க முடியாது. நீங்கள் உங்களுடைய அமைச்சை வைத்துக்கொள்ளுங்கள்! உங்களுடைய பாராளுமன்ற உறுப்புரிமையை வைத்துக் கொள்ளுங்கள்! ஆனால், மக்களது தேவையை நிறைவு செய்வதற்காகவே அவர்கள் இந்த ஆணையைத் தந்திருக்கிறார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

எனவே, இன்று அமைச்சுப் பதவியைத் துறப்பதாக, உறுப்பினர் பதவியைத் துறப்பதாக வீணாக நாடகம் ஆடவேண்டிய அவசியம் இல்லை. அந்தப் பலம் அனைத்தையும் வைத்துக்கொண்டு மக்களுக்குச் சேவையைப் பெற்றுக்கொடுப்பதற்குச் செயற்படுங்கள்! அப்போது அரசியலுக்கு அப்பாற்பட்டு உங்கள் பின் நின்று உங்களுடன் ஒத்துழைக்க நாங்கள் தயாராக இருக்கின்றோம் என்பதனை இந்த இடத்திலே கூறிவைக்க விரும்புகின்றேன். முன்னாள் அமைச்சர் ஜோன் அமரதுங்க அவர்கள் பேசுகின்றபோது, இந்த நாடு பல காலகட்டங்களில் பல பிரச்சினைகளை எதிர்கொண்டதாகக் குறிப்பிட்டார். கடந்த காலத்திலே இந்த நாடு மிகக் கொடூரமான யுத்தத்தை எதிர்நோக்கியது. அதன் விளைவாக நாட்டிலுள்ள சகல சமூகங்களும் பாதிப்படைந்திருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, thank you very much.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

அப்படிப் பாதிப்படைந்த சமூகங்கள் அந்த யுத்தத்திலே பாதிப்படைந்த, தியாகம் செய்த, உயிரிழந்த மக்களை நினைவுகூர்கின்ற, அவர்களுக்கு அஞ்சலி செலுத்துகின்ற நாளாக இன்றைய நாளைப் பயன்படுத்துகின்றார்கள். ஆகவே, அவர்களுடைய உணர்வுகளை நாங்கள் மதிக்க வேண்டும். அவ்வாறு மதித்தால்தான் இந்த நாட்டிலே நல்லிணக்கத்தை ஏற்படுத்த முடியும். குறுகிய அரசியல் தேவைகளுக்காக அதனை நாங்கள் முடக்கக்கூடாது. அந்த வகையில், யுத்தத்தால் பாதிக்கப்பட்டு உயிரிழந்தவர்களுக்கு நாங்களும் எங்களுடைய அஞ்சலிகளை உணர்வுபூர்வமாக இந்தச் சபையிலே தெரிவித்துக் கொள்கின்றோம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Hector Appuhamy. You have only five minutes.

[අ.භා.6.03]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විනාඩි පහක කාලයක් හෝ මට ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ කාලය, පාර්ලිමේන්තුවේ පමණක් නොව දේශපාලනය කරන සහ නොකරන සමස්ත ශ්‍රී ලාංකික ජනතාව බොහොම අසතුටට පත් වී සිටින කාලයක්. මේ කාල සීමාව තුළ ඇති වූ සිදුවීම නිසා රටේ ආර්ථිකය ඉතා පහත්

තත්ත්වයකට ඇද වැටී තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන්නේ සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ කල්තැබීමේ යෝජනාවක්. ඉන්දියන් සාගරයේ මුතු ඇටය හැටියට නම් කර තිබූ ශ්‍රී ලංකාවේ දේශගුණය, පිහිටීම, පරිසරය යන මේ සියල්ලට ලෝකයේ රටවල් ඉතා ආදරය කළා. එසේ ආදරය කළ නිසා ලෝකයේම සංචාරකයින් මේ රටට ඇදී ආවා. සංචාරකයකුට තමන්ගේ නිවාඩු කාලය ගත කිරීමට හොඳම රට ශ්‍රී ලංකාව හැටියට මීට මාසයකට පෙර ලෝකය තීන්දු කළා. එසේ නම් කළ පසුව ශ්‍රී ලාංකිකයෝ හැටියට අපි සියලුදෙනා ඒ පිළිබඳ සතුටු වුණා. අපි මේ රට වෙනස් කළා කියන පණිවිඩය ලෝකයට ලබා දුන්නා කියා ආණ්ඩු පක්ෂ කණ්ඩායම හැටියට අපි විශේෂයෙන් සතුටු වුණා. ඒ පණිවිඩයත් එක්ක සංචාරක ව්‍යාපාරයෙන් මේ රටට විශාල ආදායමක් ඉදිරි කාලය තුළ ගලාගෙන එයි කියා අපි ඇස්තමේන්තු කළා.

සංචාරක ව්‍යාපාරයත් සමඟ බැඳුණු වෙනත් කරුණු කාරණා ගොඩක් තිබෙනවා. ඉන් එකක් තමයි විදේශ ආයෝජකයන් මේ රටට පැමිණීම. ඒ හා සමානව විදේශ රටවල සේවය කරන, මුදල් තිබෙන, මේ රටේ ආයෝජනය කිරීමට කැමති ශ්‍රී ලාංකිකයන් එම සංචාරකයන් සමඟ එකට එකතු වෙලා -බද්ධ වෙලා- මේ රට දියුණු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළට දායක වෙන්න බලාපොරොත්තුවෙන් සිටියා. අපේ එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ මීගමුව ප්‍රදේශයත්, පුත්තලම දිස්ත්‍රික්කයත් ජාත්‍යන්තර ගුවන් තොටුපලට ඉතා ආසන්නව පිහිටා තිබෙන නිසා සංචාරක ව්‍යාපාරයට නැඹුරු වුණු, ඒ වාගේම සංචාරක ව්‍යාපාරයෙන් ආර්ථික වශයෙන් ශක්තිමත් වී කටයුතු කරන ව්‍යාපාරිකයන් රාශියක් එම ප්‍රදේශයේ සිටින බව පුත්තලම දිස්ත්‍රික්කයේ කෙනෙක් හැටියට මම දන්නවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධව කටයුතු කරන කම්කරුවන් රාශියක් එම ප්‍රදේශයේ ඉන්නවා. ත්‍රිකුණාමලය-මඩකලපුව වෙරළ තීරය හා සමාන සුන්දරම වෙරළ තීරයක් තමයි අපේ වෙරළ තීරය. මේ සියල්ල එකට එකතු වෙනකොට, සංචාරක ව්‍යාපාරයට ලංකාව හොඳම රට හැටියට පත් වෙනකොට අපි දිස්ත්‍රික්කයක් හැටියට සැලසුම් රාශියක් හැදුවා. අද ඒ සියල්ල කඩාකප්පල් වී, බිඳ වැටී තිබෙනවා. අපේ දිස්ත්‍රික්කය පමණක් නොවෙයි, සමස්ත රටම අගාධයකට ගිහින් අද සියලුදෙනා දුකින් තමයි කාලය ගෙවන්නේ.

මන්ත්‍රීවරුන් හැටියට මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පත් වූ අපගේ වගකීම වන්නේ අප පත් කර එවූ ජනතාවට යහපතක් සැලසීමයි; රට දියුණු කරන්න සහ ආර්ථිකය නඟා සිටුවන්නයි; මේ රට භාර ගන්න සිටින දරු පරපුරට ලස්සන, යහපත් රටක් නිර්මාණය කරන්න අවශ්‍ය කරන කටයුතු කරන්නයි. ඒ වාගේම, මුදලින් පිරුණු රටක් නිර්මාණය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරන්නයි. මේ පාර්ලිමේන්තුවට පත් වී ආවාට පස්සේ මේ අවුරුදු තුන තුළ අපි සියලුදෙනාම එකතු වෙලා සිද්ධ කළේ ඒ වැඩ පිළිවෙළයි. ඒ වැඩ පිළිවෙළ කෙමෙන් කෙමෙන් බොහොම සෙමින් තමයි ඉදිරියට ආවේ. අද ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම විනාශ කරලා ඉවරයි. ඒකට වග කිවයුත්තෝ අද ආපසු හැරිලා රට දිහා බලන්න ඕනෑ. අපි සියලුදෙනාම මතක තියාගන්න ඕනෑ, පළමුව රට, දෙවනුව දේශපාලනය, තෙවනුව අපේ බඩගෝස්තරය කියන කාරණය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයයි තිබෙන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

බඩ ගෝස්තරය ඉස්සරහට දාලා, තමන්ගේ දේශපාලන ඉස්සරහට දාලා, තමන්ගේ පක්ෂය ඉස්සරහට දාලා, ඉදිරි අනාගතයේ බලයට පත් වෙලා නැවත වරප්‍රසාද භුක්ති විඳිනවාය කියන කාරණය ඉස්සරහට දාලා රට පාවා දෙනවා නම්, ඒක තමයි මේ රටට කරන ලොකුම පාපය.

රජ යුගයේ සිට ආ ගමන් මගේදී මේ රට දියුණු කරපු, මේ රට ගොඩ ගත්ත, අපට ජීවත් වෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදපු උතුම් මිනිස්සු පිරිසක් මේ රටේ හිටියා. පළමුවන වතාවට මේ පාර්ලිමේන්තුවට ආ මන්ත්‍රීවරු හැටියට අපි පැහැදිලිවම කනගාටු වෙනවා, අපටත් මේ කාලකණ්ණි කාලයට සම්බන්ධ වෙන්න සිදු වුණා නේද කියලා. හැබැයි, මේ රටේ මේ තත්ත්වය ඇති කළ අපේ රටේ නායකයෝ -අතිගරු ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ඒ කල්ලිය- කළ විනාශයෙන් නැවත මේ රට ගොඩ ගන්න ලේසි පහසු වෙන්නේ නැහැ. ඒක ඉතාම අමාරු කාර්යයක්. හැබැයි, අපි කණ්ඩායම සූදානමින් ඉන්නවා, 29 වැනි දාට පස්සේ නැවත මේ රට හරියට භාර අරගෙන, මේ සියලු දේවල් යථා තත්ත්වයට පත් කරලා මේ රට නැවත ගොඩ අරගෙන අපේ දරුවන්ට යහපත්, සමෘද්ධිමත්, ආර්ථික වශයෙන් ශක්තිමත් වෙච්ච රටක් හදන්න. ඒ වාගේම, ගුණ ගරුක සමාජයකට අවශ්‍ය ගති පැවතුම් අපේ දරුවන්ට උගන්වලා මේ රට හොඳ රටක් හැටියට නිර්මාණය කරන්න. ඒ වගකීම අපි සියලුදෙනා එක්ව භාර ගන්නවාය කියා ප්‍රකාශ කරමින් මට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Seyed Ali Zahir Moulana. You have seven minutes.

[6.10p.m.]

ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

Bismillahir Rahmanir Raheem.

Thank you, Hon. Presiding Member. As very correctly mentioned by my good Friend, the Hon. Hector Appuhamy, in early October, the popular travel magazine "Lonely Planet" named Sri Lanka, our resplendent island nation, as the best travel destination in the world for 2019. This was a promising turn for our country, of which tourism is a significant economic contributor amounting to 11 per cent of our GDP.

But then, on October 26th, President Maithripala Sirisena's backdoor move, which now with hindsight can be clearly summarized being meted not in the best interests of the country at heart, but due to petty personal and fundamental differences with the Hon. Ranil Wickremesinghe, the leader of the UNP, has now led us to this crisis. Almost immediately after President Sirisena's unbefitting move, travel advisories were issued by the United States, the United Kingdom, Australia and Canada with many more expected to follow if this crisis continues.

About a week later, Sri Lanka Tourism Promotion Bureau launched in London a new brand and tagline of Sri Lanka tourism titled "So Sri Lanka". Hon. Presiding Member, it is frankly disappointing to note to this House

[ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා]

that the irony of the tagline could not be more distinct taking into account the happenings in the last month.

As is being widely reported in the media and through personal accounts of our citizens, the aftereffects of October 26th are beginning to appear. One very noticeable aftereffect is the obvious drop in the arrival of tourists and the sheer lack of occupancy in hotels around our country. I need not remind this House that December is the peak season for Sri Lanka tourism and the effect that October 26th is having on this industry, which relies on 11 per cent of our GDP, is nothing short of catastrophic.

Sir, there are numerous reports of hotels reporting cancellation up to 30-35 per cent of reservations, and to put this into perspective, the "Times of India" reported recently that one-third of travellers, that is, 2,000 of the 6,000 average tourists from Tamil Nadu, have cancelled their trips to Sri Lanka stating, "Panic-stricken tourists are cancelling their trips to Sri Lanka due to the ongoing political crisis, and tour operators are reporting the spurt of cancellations has been the highest since the end of the civil war".

Further, there are additional concerns about future bookings which are extremely slow for the winter season, where tourists from the Northern Hemisphere flock to our equatorial paradise to enjoy their hiatus. "So Sri Lanka"!, Hon. Presiding Member.

However, this false complacency cannot last longer. The IMF has delayed the release of the 250-million-dollar tranche of a US Dollar 1.5 billion IMF extended loan facility due to "pending political clarity".

There is a looming danger of the suspension of GSP Plus trade concessions. The agreement on a US Dollars 460 million grant by the Millennium Challenge Corporation, which was to be signed in December is likely to be delayed. Further, last week, international credit rating agency, Moody's, downgraded Sri Lanka's sovereign debt from B1 to B2 stating, "The decision is driven by the view that ongoing tightening in external and domestic financing conditions and low reserve adequacy, exacerbated by a political crisis which seems likely to have a lasting impact on policy even if ostensibly resolved quickly". This statement by Moody's is very important, as they say that even if this crisis is resolved over the next few weeks, it will still leave a lasting impact on our economy for a very long time. This is due to the fact that this completely unnecessary crisis has worsened Sri Lanka's ability to raise new funds to meet its prevailing debt service obligations.

Further, probably most importantly, due to this crisis, there is little or no possibility for a government to present an Appropriation Bill for 2019, something that this House would have concluded by now had this crisis not erupted. This has far-reaching effects, as in essence without a Budget passed in this Parliament, all Government services will be effectively shutdown from January 1st 2019.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Okay. This includes the Consolidated Fund of the Treasury. This is, of course, taking into account that the UPFA shall not continue to act in shameful violation of the Constitution, and continue to appropriate, borrow and tax illegally even in 2019.

Therefore, Hon. Presiding Member, it is the duty of this House to urge and plead His Excellency the President Maithripala Sirisena to have the best interests of the country at heart, and that of its citizens, and put aside all petty and irrelevant issues which should not come in the way of governance, and resolve this conflict at the very earliest for the sake of our Motherland, Sri Lanka.

Thank you, Sir.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much. The next speaker is the Hon. Ranjith Aluwihare. You have six minutes.

ඊට ප්‍රථම, මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. WIJEPALA HETTIARACHCHI *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රංජිත් අලුවිහාරේ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.17]

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන්ම අපේ ගරු ජෝන් අමරතුංග මැතිතුමාට ස්තුති කරන්නට කැමැතියි. මොකද, සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා වැටුණු අවස්ථාවක තමයි එතුමාට සංචාරක සංවර්ධන අමාත්‍ය ධුරය ලැබුණේ. එතුමා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළු රටටම බලපාන සැලැස්මක් හදා ගත්තා. ඒ සැලැස්ම ක්‍රියාත්මක කරන්නට එතුමාට අවුරුදු පහක බලයක් ලැබුණත්, අද මේ අමාත්‍යාංශ වෙනස් කිරීම මුළු රටටම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, එතුමාගේ සැලැස්ම, ඒ වාගේම ආණ්ඩුවේ සැලසුම් ක්‍රියාත්මක කරන්නට බැරිවෙලා තිබෙනවා.

මගේ අදහස් දැක්වීමට පෙර තවත් ගරු මන්ත්‍රීවරුන් ඒ අයගේ අදහස් දැක්වූවා. අපට අද කථා කරන්න තිබෙන්නේ රටට සිද්ධ වුණු දේ පිළිබඳවයි. සංචාරක ව්‍යාපාරය පිළිබඳව ප්‍රචාරය සඳහා අපි සාමාන්‍යයෙන් අවුරුද්දකට රුපියල් මිලියන 600ක් වියදම් කරනවා. ඒ රුපියල් මිලියන 600 වියදම් කර තිබෙන්නේ විදේශ රටවල අපේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රචාරක කටයුතුවලට පමණයි. දැනට අපි අවුරුදු 4ක් සඳහා රුපියල් මිලියන 2,400ක් වියදම් කරලා තිබෙනවා. මේ සියල්ලක්ම කළේ අපේ රට සම්පූර්ණයෙන් විනාශ වුණු රටක් වෙලා තිබුණු නිසායි. 2015ට කලින් සංචාරකයන් අපේ රටට ආවාම, සමහර අවස්ථාවල එම සංචාරකයන්ට නිදහසේ ජීවත් වෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ අය මුහුදුකරයට ගිය අවස්ථාවලදී, හෝටල්වල ගත කළ අවස්ථාවලදී ඝාතනය කළ සිද්ධීන් පිළිබඳව දැනගන්නට තිබෙනවා. ඒ සියල්ල වළක්වා, මෙහි පැමිණෙන සංචාරකයන් තුළ යම් කිසි විශ්වාසයක් ඇති කළේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවයි. සංචාරකයන් මෙන්ම පිට රට සිටින වෙනත් විවිධ ක්ෂේත්‍රවල අය පවා මුළු ලෝකයටම ආදර්ශයක් දීපු රටක් විධියට ශ්‍රී ලංකාව කෙරෙහි විශ්වාසයක් තැබුවා. මොකද, රටේ ප්‍රධාන පක්ෂ දෙක එකට එකතු වෙලා කටයුතු කළා. ජනාධිපති, අගමැති දෙදෙනා රටේ ප්‍රධාන පක්ෂ දෙකෙන් පත් වුණු නිසා ඒ අය රට ගැන යම් විශ්වාසයක් තැබුවා. ඒ විශ්වාසය නිසා තමයි යම් කිසි විධියක වෙනසක් සිදු වුණේ. නමුත් කනගාටුයි කියන්න, අද ඒ තත්ත්වය නැවතත් වෙනස් වෙලා තිබෙනවා. එදා යුද්ධය නිසා ඇති වූ විනාශයට වඩා වැඩි විනාශයක් තමයි ඉදිරියේ දී සිදුවන්නට යන්නේ. මොකද, අපේ ලංකාවේ සිටින සියලුම හෝටල් හිමියන්, ඒ වාගේම tour guidesලා, ඒ වාගේම හෝටල් ක්ෂේත්‍රයට අලුතෙන් ඇතුළත් වූ දරුවන් යනාදී ඒ සියලු දෙනාම අද අනාථයි. බැංකු ණය අරගෙන තිබෙනවා. ඒ බැංකු ණය ගෙවා ගන්න විධියක් නැහැ. හෝටල් ක්ෂේත්‍රයේ යෙදී සිටින හෝටල් හිමියන් ලංකාවට ඇවිල්ලා මෙහි හෝටල් හදන්න වෙනම සැලසුම් සකස් කර වැඩ පටන් ගත්තත්, අද ඒවා දාලා යන්න ගිහිල්ලා තිබෙනවා. ජපානයෙන්, චීනයෙන්, ඇමෙරිකාවෙන්, ඕස්ට්‍රේලියාවෙන්, මැද පෙරදිග රටවලින් හෝටල් හදන්න ආපු අය නැවත මේ රටින් ගිහිල්ලා තිබෙනවා. තාවකාලිකව හෝ ඒ කටයුතු නවත්වා තිබෙනවා. ඒ නිසා අපේ කම්කරුවන්ට රැකියා නැති වෙලා තිබෙනවා. ඒ වාගේම විශ්වාසය නැති වෙලා තිබෙනවා. අපට අද හෙට එය වෙනස් කර ගන්න බැහැ. අපට මේ සියල්ලෙහි විශ්වාසය ගන්න අඩුම වශයෙන් තව අවුරුද්දක්, එකහමාරක් පමණ කාලයක් ගත වනවා.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ අවස්ථාවේ දී යම් කිසි තීරණයක් ගත යුතුයි කියලා මම හිතනවා. මොකද, අපේ රටේ මෙවැනි තත්ත්වයක් ඇති වුණා නම් ඒ සියල්ලේම වගකීම තිබෙන්නේ ජනාධිපතිතුමාටයි. අද මේ තත්ත්වය ඇති වුණේ ජනාධිපතිතුමා යම් කිසි වැරදි තීරණයක් ගත් නිසායි. ඒ නිසා තමයි අද මුළු රටම අනාථ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරියේ දී සංචාරක ක්ෂේත්‍රයේ හෝටල් සංකීර්ණ, වාහන පහසුකම් ආදිය සම්බන්ධයෙන් කටයුතු කරන ඒ සියලු දෙනාටම යම් කිසි සහනයක් ලබා දෙන්න අප බලාපොරොත්තු වනවා. ලබන 29 වෙනිදායින් පසුව අපට එම කටයුත්ත භාර ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා. මොකද, සැලසුම් හැදුවේ අපි; විශ්වාසයක් ලබා දුන්නේ අපි. සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජකයන් මේ රටට ආවේ අප කෙරෙහි තැබූ විශ්වාසය මතයි. ඒ නිසා ලබන 29 වෙනිදා අපි පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්වා දුන්නාට පසුව නැවත අගමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් පත්වෙලා යම් කිසි වෙනසක් කරන්න අපට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. අද මේ පාර්ලිමේන්තුවේ උත්තර දෙන්න කිසි කෙනෙක් නැහැ. ඇමති කෙනෙක් සිටිනවා කිව්වාට, ඒ ඇමතිතුමා සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඇමතිතුමා, ඇමතිකම භාර ගත්තා. එක්සත් ජාතික පක්ෂයේ හිටපු එතුමාව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කැඳවලා ඇමතිකම ලබා දුන්නා. නමුත් එතුමාට වැඩ කරන්න බැරි වුණා. මොකද, එතුමා බලාපොරොත්තු වුණේ සංචාරක ක්ෂේත්‍රයට මෙතරම් බලපෑමක් සිදු වන එකක් නැහැ කියලායි. නමුත්, එතැනට ගියාට පසුව එතුමාට තේරුණා, අද සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් විතරක් නොවෙයි පිටරටටත් උත්තර දෙන්න එතුමාට සිදුවෙලා තිබෙන බව. මම හිතන විධියට එතුමා නැවත තීරණයක් ගත්තා, ආණ්ඩුවට විරුද්ධව විපක්ෂයේ ගිහිල්ලා වාඩි වෙන්න. මොකද, උත්තරයක් දෙන්න බැරි නම්, ඒ වියදම් කරපු මුදල් නැවත වෙනත් අංශවලට ගෙවන්න තිබෙනවා නම්, ඒ සියල්ලකම වගකීම තිබෙන්නේ අමාත්‍යාංශයට. අද යම් කිසි වෙනසක් සිදු වෙලා තිබෙනවා. උත්තර දෙන්න ඒ අය කිසි කෙනෙක් මේ ගරු සභාවේ නැහැ. අපි හදපු සැලසුම් ක්‍රියාත්මක කරන්න සිදුවෙලා තිබෙන්නේ අපටමයි.

මම හිතන විධියට ඒ වගකීම් සියල්ල නැවත භාර වන්නේ අපටයි. ඒ නිසා අපි ඉදිරියේ දී බලාපොරොත්තු වනවා, සංචාරකයන් තුළ යම්කිසි විශ්වාසයක් ඇති කරලා, හෝටල් සංකීර්ණ ඇති කිරීම වාගේම, මෙම ක්ෂේත්‍රයේ සියලුම අංශවල දියුණුව සඳහා වෙනසක් ඇති කිරීමට. පවතින තත්ත්වය අනුව අපි බලාපොරොත්තු වන ආකාරයට දැන් වැඩ කරන්න බැරි වී තිබෙනවා. නමුත්, නැවත මේ අමාත්‍යාංශය ලැබුණාට පස්සේ හිටපු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමා මේ අවුරුද්දට වෙන් කරපු මුදල්, ඒ වාගේම එන අය වැයේදී ලබන අවුරුද්ද සඳහාත් සෑහෙන මුදලක් වෙන් කරගෙන මෙම ක්ෂේත්‍රය දියුණු කරන්න බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ක්ෂේත්‍රයෙන් අපට හොඳ අදායමක් ලැබිලා තිබෙනවා. 2015 සිට බැලුවොත් සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙලා තිබෙනවා. 2018 වර්ෂයේ මේ වනකොට ලක්ෂ 18කට ආසන්න සංචාරකයන් ප්‍රමාණයක් අපේ රටට ඇවිල්ලා තිබෙනවා. එම ප්‍රමාණය ලක්ෂ 25 දක්වා වැඩි කර ගන්න අපි දැනට බලාපොරොත්තු වනවා. අද රටේ පවතින තත්ත්වය අනුව එම ලක්ෂ 25 ඉලක්කයට අපට යන්න බැරි වනවා. 2020 වනකොට ලක්ෂ 40ක සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට එයි කියලා අපි බලාපොරොත්තු වුණා. ඒ බලාපොරොත්තුව උඩ තමයි අපි සියලුම සැලසුම් හැදුවේ. ඒ සැලසුම් මතයි අපි ඉදිරි වැඩ කටයුතු කළේ. අද මෙම අමාත්‍යාංශයට අදාළ ඒ අංශ හතරේම වැඩ කටයුතු කෙරෙන්නේ නැහැ. සභාපති නැහැ; අධ්‍යක්ෂ මණ්ඩලය නැහැ. ඒ කිසිම අංශයක වැඩ කෙරන්නේ නැහැ. මෙම අමාත්‍යාංශයේ කිසි වැඩක් අද කරන්න විධියක් නැහැ. මොකද, අනුමත වෙච්ච මුදල් වියදම් කරන්න, ඒ වාගේම vouchersවලට ගෙවීම් පවා කරන්න ක්‍රමයක් නැහැ. එම නිසා ඉදිරියේදී යම්කිසි වෙනසක් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වෙනස ලබන 29වැනි දායින් පස්සේ අපි කරන්නයි බලාපොරොත්තු වන්නේ. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තූතියි. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 6.24]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තූතිවන්ත වනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

බහුභූත ආණ්ඩුවක් පවතින මේ රටේ, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නොමැතිව හිස්ව තිබෙන වෙලාවක මේ වාගේ කථා කරන්න ලැබීම එක්තරා අතකින් බෙදවාචකයක් හැටියට මම දකිනවා. මොකද, පසුගිය ඔක්තෝබර් මාසයේ 26වැනි දා හොර පාරෙන් අගමැතිවරයෙකු පත් කරලා, කැබිනට් මණ්ඩලයක් පත් කර ගත්තා. එහිදී අපි අභියෝග කරපු හැම අවස්ථාවකම තමන්ගේ බහුතරය පෙන්වා ගැනීමට නොහැකිව, අන්ද මන්දව කර කියා ගන්න කිසිම දෙයක් නැති තත්ත්වයට පත් වුණා. අද ප්‍රථම වතාවට ආණ්ඩු පක්ෂයක් පාර්ලිමේන්තුව වර්ජනය කරලා, පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා, තැන් තැන්වල ගිහිල්ලා ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වනවා. එවන් වෙලාවක තමයි ඔබතුමා මට මේ අවස්ථාව දුන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඇත්ත වශයෙන්ම ගෙවී ගිය වසර තුනයි මාස තුන තුළ තමයි අපි මන්ත්‍රීවරු හැටියට කටයුතු කළේ. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පාලන කාලය දැන් අවුරුදු හතරකට ආසන්න වෙමින් තිබෙනවා. ගරු ජනාධිපතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් සුසංයෝගය තුළින් තමයි මේ යහ පාලන ආණ්ඩුව ඇති වුණේ. මේ යහ පාලන ආණ්ඩුවේ නිර්මාතෘවරුන් එතුමන්ලායි. නමුත්, වෙච්ච හැම වැරැද්දක්ම, හැම අඩු පාඩුවක්ම එතුමා අද අනෙක් පැත්තට දාලා, ඒ වෙච්ච සියලු වැරදි හා අඩු පාඩු නිවැරදි කළ යුතු කැබිනට් එකේ මූලාසනයේ හිටපු නායකයා බව පසෙකලා දැන් හඬා වැළපෙනවා, දැන් ශෝකාකූල වෙලා තිබෙනවා, මේ සියල්ල වුණේ රනිල් වික්‍රමසිංහ නිසා කියලා.

මම ඉතාමත් පැහැදිලිව කියනවා, අපට මේ රට ගොඩ නහන්න තිබෙන එකම ක්ෂේත්‍රය සංචාරක ක්ෂේත්‍රය බව. තේ, රබර් හා පොල් කියන අපනයන භෝගවල ආර්ථික ශක්තිය දැන් අපට හීන වෙලා ගිහින් තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට පින් සිදු වන්න විශේෂයෙන්ම එදා ඇති කරපු නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය නිසා මේ රටේ ලක්ෂ ගණනක් විදෙස් රටවල්වල ගිහින් රැකියා කරලා විදේශ විනිමය ඉපැයූ බව අපි දන්නවා. ඒ නිසා අද ලංකාවේ අංක එකේ ආදායම් මාර්ගය බවට එය පත් වෙලා තිබෙනවා. ඊළඟට, දිවංගත ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා විසින් එදා ඇඟලුම් කර්මාන්තය මේ රටේ ස්ථාපිත කරලා, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ඇඟලුම් කම්හලක් බැගින් ඉදි කරන්න කටයුතු කළ බව අපි දන්නවා. ඒ නිසා අද ආර්ථිකයේ දෙවැනි ස්ථානය බවට ඇඟලුම් කර්මාන්තය පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව අවුරුදු 10ක කාලයක් කටයුතු කරපු කෙනෙක්. ලංකා හෝටල් පාසලේ උපාධිධරයෙක් හැටියට මම දන්නවා එදා එක්සත් ජාතික පක්ෂ රජය යටතේ තමයි සංචාරක ව්‍යාපාරය ඉතාමත් පැහැදිලිව මේ රටේ ස්ථාපිත වුණේ කියලා. එදා අපි දැක්කා මේ රටට ජර්මනිය, පින්ලන්තය, නෝර්වේ වාගේ යුරෝපා රටවලින් ආයෝජකයෝ පැමිණි බව. එදා ෂෙරටන්, හොටෙල් ජ්ලෑන්, හොටෙල් කූනි වාගේ ඉතාමත් හොඳ සංචාරක සමාගම් මේ රටේ ආයෝජනය කළා. ජෙට්වින්ග් වාගේ සමාගම් ගෙනැල්ලා මේ රටේ සංචාරකය ව්‍යාපාරය දියුණු කරන්න කටයුතු කළා. මම භය නැතිව කියනවා ගෙවී ගිය වසර තුනක කාලය තුළ අපේ හිටපු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමාත්, ගරු රංජිත් අලුවිහාරේ රාජ්‍ය අමාත්‍යතුමාත් එක්ක යම්කිසි සැලැස්මක් හදලා තිබුණ බව.

තරු පහේ හෝටල් තුනක් ගාල්ල නගරයේ ඉදිවෙලා තිබෙන්නේ ඉතිහාසයේ පළමුවැනි වතාවටයි. සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් කරලා තිබෙන්නේ මොනවාද කියා අහනවා. අද උනවටුන වැනි ප්‍රදේශවලට ගිහින් බලන්න. ඒ අය කියන දේවල් ගැන මම කනගාටු වනවා. ගරු ජනාධිපතිතුමාගේ සහෝදරයකු වන ඩඩ්ලි සිරිසේන මැතිතුමාත් අද වනකොට උනවටුනේ තරු පහේ හෝටලයක් හදනවා. සමහර නීති-රීති උල්ලංඝනය වෙලා තිබෙනවා. නමුත් අපි සතුටු වෙනවා, එතුමාගේ සහෝදරයාටත් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉදිරියට යන්න පුළුවන් වුණේ මේ ආණ්ඩුව; රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිසාය කියන එක මම පැහැදිලිව කියනවා. මොකද, රනිල් වික්‍රමසිංහ මැතිතුමා තුළ තිබුණු ජාත්‍යන්තර ප්‍රතිපත්තියත් එක්ක විශේෂයෙන්ම යුරෝපා රටවල වාගේම අනෙකුත් රටවල සංචාරකයන් අපේ රටට ආවා. එම නිසා අපේ රට සංචාරකයන් ආකර්ෂණය වූ රටක් බවට පත් වී තිබෙනවා.

ගාල්ල නගරය සම්බන්ධයෙන් එතුමා සැලසුමක් සකස් කළා. මම දන්නා නිසා ගාල්ල නගරය ගැන කෙටියෙන් කියන්නම්. ඓතිහාසික වැදගත්කමක් තිබෙන ගාල්ල කොටුව ඉතාම දර්ශනීය විධියට නිර්මාණය කළා. ඒ තුළින් සංචාරක ව්‍යාපාරය වර්ධනය කරන්න අවශ්‍ය මූලික කටයුතු සකස් කළා. කොටුවේ තිබුණු සියලුම රාජ්‍ය ආයතන එම ස්ථානයෙන් එළියට අරගෙන, ගාල්ල නගරය ඉතාම දියුණු තත්ත්වයකට පත් කළා. බෙන්තොට දෙද්දූව ප්‍රදේශයේ අක්කර 500කට වැඩි භූමි ප්‍රමාණයක හෝටල් කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය කටයුතු සකස් කර තිබුණා. විශේෂයෙන්ම හික්කඩුව ප්‍රදේශය දියුණු කරන්න සැලසුම් කර තිබුණා. ඒ සඳහා අවශ්‍ය ඉඩම් සියල්ල අත් පත් කර ගෙනයි තිබුණේ. ඒ සියල්ල අත් පත් වන කොටම ආයෝජකයන් ඇවිත් ඒවායේ ආයෝජනය කරන්න පටන් ගත්තා. විශේෂයෙන් ඒ ප්‍රදේශවල හෝටල් කර්මාන්තය දියුණු කරන්න කටයුතු කරමින් තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර ගණනාවක් තිස්සේ මොන ආණ්ඩුවකටවත් කළ නොහැකි වූ දෙයක් තිබුණා. විශේෂයෙන්ම 1960 ගණන්වල හික්කඩුව නගරය සංචාරක පුරවරයක් වශයෙන් ගැසට් කර තිබුණා. මේ ගැසට් පත්‍රය පණ ගන්වා, හික්කඩුව නගරය සංචාරක කලාපයක් බවට පත් කිරීමේ කටයුත්ත කිසිම ආණ්ඩුවකට කරන්න පුළුවන් වෙලා නැහැ. නමුත්, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් උපදෙස් ලබාගෙන, අපේ ගරු ජෝන් අමරතුංග මැතිතුමා මේ වන විට එම ප්‍රදේශය සංචාරක කලාපයක් -tourist zone එකක්- බවට පත් කර තිබෙනවා. විශේෂයෙන්ම ගාල්ල - කොළඹ මාර්ගය පවා වෙනස් කරලා, ඒකට වෙනත් පරිබාහිර මාර්ගයක් හදලා, ඒ තුළින් හික්කඩුව නගරයේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න කටයුතු කරමින් තිබුණා. ඒ ගැන අපි සතුටු වෙනවා. නමුත්, අද ඒ සියල්ල බොඳ වී ගිය සිහිනයක් බවට පත් වී තිබෙනවා. ඒ ඇයි? ඉතාම අවාසනාවන්ත විධියට හොර පාරෙන් ආණ්ඩුවක් හදන්න කටයුතු කිරීම නිසායි අද ඒ සියල්ල සිහින බවට පත් වී තිබෙන්නේ. ජනාධිපතිතුමනි, මේ කටයුත්ත නිසා ඔබතුමාගේ සහෝදරයාට පවා ඔහුගේ ව්‍යාපාර සම්පූර්ණයෙන්ම නැති කර ගන්න සිද්ධ වුණා. එහෙම වුණේ, මෙවැනි ඉතාම අකාරුණික දෙයක් සිද්ධ වීම නිසායි.

මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කුමන්ත්‍රණකාරී ලෙස විනාශ කරන්න කාටවත් පුළුවන්කමක් නැහැ. ඉතිහාසය තුළ මෙවැනි පූර්වාදර්ශ තිබෙනවාය කියා කවුරු හෝ හිතනවා නම් ඒක වැරැදියි. මේ ඉතිහාසය තුළ ලෝකයේ කිසිම රටක මෙවැනි පූර්වාදර්ශයක් තිබුණේ නැහැ. අපි අධිකරණයට ගියාම; ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම නීතිඥයෝ කථා කළා. ලෝකයේ නොයෙක් රටවල, විශේෂයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල - Commonwealth රටවල- පාර්ලිමේන්තුවල යම් යම් දේවල් අපි බැලුවා. නමුත්, ඒ කිසිම රටක මේ වාගේ තත්ත්වයක් තිබුණේ

නැහැ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කඩා දමා මේක ගිනි තියන්න උත්සාහ කළ මේ ව්‍යාපාරය පිළිබඳව ලෝකය දැනුවත් වන්නේ ලංකාවේ මේ අධිකරණ තීන්දුවෙන් තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් පස්සා දොරෙන් පැනලා යනකොට විපක්ෂය හැටියට හෝ රටක් වෙනුවෙන් යමක් හඬ නහන්නට, මේ විධියට හෝ කථා කරන්න අද අපට අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. ඔබතුමා සමඟත්, ගරු කථානායකතුමා සමඟත් එකතු වෙලා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය දිවි හිමියෙන් ආරක්ෂා කරන්න අප ලැහැස්තියි කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. හෙට දවසේදී අලුත් අගමැතිවරයා; අපේ අගමැතිවරයා නැවත පත් වෙලා, සංචාරක ඇමතිවරයා පත් වෙලා මේ රටේ සංචාරක ව්‍යාපාරයේ ඒ සැලසුම් ක්‍රියාත්මක කරනකොට මා සාකච්ඡා කළ මේ කාරණාත් වැදගත් වෙයි කියා මතක් කරමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

පාර්ලිමේන්තුව, 2018 නොවැම්බර් මස 29වන බ්‍රහස්පතින්දා පෙර වරු 10.30ට නැවත රැස් වෙනවා.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භ. 6.30ට, 2018 නොවැම්බර් 29 වන බ්‍රහස්පතින්දා පූ.භ. 10.30 වනතෙක් කල් ගියේය.


அதன்படி பாராளுமன்றம், பி.ப. 6.30 மணிக்கு, 2018 நவம்பர் 29, வியாழக்கிழமை மு.ப. 10.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.30 p.m., until 10.30 a.m. on Thursday, 29th November, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

264 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 264 - இல. 7
Volume 264 - No. 7

2018 නොවැම්බර් 29වන බ්‍රහස්පතින්දා
2018 நவம்பர் 29, வியாழக்கிழமை
Thursday, 29th November, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන

2018 නොවැම්බර් 14,15 සහ 16 දිනයන්හි පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඇති වූ සිද්ධි සම්බන්ධ විමර්ශන

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලීසිය කැඳවීම

ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

2018 நவம்பர் 14, 15 மற்றும் 16ஆந் திகதிகளில் பாராளுமன்றச் சபாமண்டபத்தில் இடம்பெற்ற சம்பவங்கள் பற்றிய விசாரணைகள்

பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதி செய்வதற்குப் பொலிஸாரை அழைத்தமை

குடியரசின் நிதியிலிருந்து எந்தவொரு செலவினத்தையும் மேற்கொள்வதற்கான அங்கீகாரத்தை வழங்குவதற்கு பிரதம அமைச்சரின் செயலாளருக்கு அதிகாரமின்மை

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Investigations into Incidents Taken Place in the House on 14th, 15th and 16th of November, 2018

Summoning of Police to Ensure Security of Members of Parliament

SECRETARY TO THE PRIME MINISTER HAS NO AUTHORITY TO APPROVE ANY EXPENDITURE DRAWN FROM THE FUND OF THE REPUBLIC

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් 29වන බ්‍රහස්පතින්දා
2018 நவம்பர் 29, வியாழக்கிழமை
Thursday, 29th November, 2018

පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස්වීය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

2018 නොවැම්බර් 14, 15 සහ 16 දිනයන්හි පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඇති වූ සිද්ධීන් සම්බන්ධ විමර්ශන
2018 நவம்பர் 14, 15 மற்றும் 16ஆந் திகதிகளில் பாராளுமன்றச் சபாமண்டபத்தில் இடம்பெற்ற சம்பவங்கள் பற்றிய விசாரணைகள்
INVESTIGATIONS INTO INCIDENTS TAKEN PLACE IN THE HOUSE ON 14TH, 15TH AND 16TH OF NOVEMBER, 2018

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2018 නොවැම්බර් මස 14 වන බදාදා, 15 වන බ්‍රහස්පතින්දා සහ 16 වන සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලැබූ අවස්ථාවලදී සභා ගර්භය තුළ ඇති වූ සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු පොලිසිය විසින් දැනටමත් සිදු කරමින් සිටින බවත්, ඊට අමතරව එම සිද්ධීන් පිළිබඳව අභ්‍යන්තර පුළුල් විමර්ශනයක් පැවැත්වීමට හැකි වන පරිදි පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතාගේ සභාපතිත්වයෙන්, හිටපු කථානායක ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා, ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා, ගරු බිමල් රත්නායක මහතා සහ ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා යන මහත්වරුන්ගෙන් සමන්විත කමිටුවක් මා විසින් පත් කරන ලද බවත්, එම කමිටුවේ වාර්තාව හැකි ඉක්මනින් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවත් කාරුණිකව දැනුම් දීමට කැමැත්තෙමි.

II

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලිසිය කැඳවීම
பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதி செய்வதற்குப் பொலிஸாரை அழைத்தமை
SUMMONING OF POLICE TO ENSURE SECURITY OF MEMBERS OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පසුගිය 2018 නොවැම්බර් මස 14 වන බදාදා, 15 වන බ්‍රහස්පතින්දා සහ 16 වන සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වුණු අවස්ථාවලදී සභා ගර්භය තුළ ඇති වූ බරපතළ නොසන්සුන්කාරී තත්ත්වයන් නිසා අකමැත්තෙන් වුවද සියලුම මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලිසිය කැඳවීමට මට සිදු වූ බව දන්වනු කැමැත්තෙමි.

තවද, පාර්ලිමේන්තුවේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ හෝ පාර්ලිමේන්තු සභා ගර්භ ආලින්දයන් තුළ ආරක්ෂාව පිළිබඳ තහවුරුවක් මා හට ලබා දෙන්නේ නම්, ඉතාමත් ඉක්මනින් සභා ගර්භයේ කටයුතු සම්බන්ධයෙන් අතිරේක ලෙස පොලිසියේ සහාය ලබා ගැනීම වහාම නැවැත්වීමට මා පියවර ගන්නා බවද මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව මෙම සභාව විසින් තීරණය කරනු ලැබිය යුතුය. එම නිසා කාලය කොපමණ අවශ්‍යද කියන එක පිළිබඳව මා දැනුවත් කරන ලෙස මා මේ අවස්ථාවේදී ආරාධනා කරනවා. How long do you want to continue?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වැඩ කටයුතු හමාර වන තෙක්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

II

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින පූර්ව භාග 9.00ට මාගේ නිල කාමරයේදී පැවැති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි, 2018 නොවැම්බර් මස 30වන සිකුරාදා පූර්ව භාග 10.30ට පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වීමට මෙම සභාව තීරණය කරනු ලැබීය. සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Then, this morning, I had a delegation led by the Hon. Dinesh Gunawardena who raised an issue about this matter, the Motion being *sub judice*. So, I have already explained my position on the matter, that especially the matter before the House today is not with regard to any Minister, State Minister or Deputy Minister, but with regard to the Secretary to the Prime Minister.

This House has already adopted Motions of No-confidence against the Government, and the adoption of such Resolution or Motion of No-confidence cannot be challenged or disputed in any other forum. The Motion before the House today is a matter which arises consequent to the adoption of the No-confidence Motion. What is sought to be debated today is not the matter under consideration by the Court of Appeal. As such, there is no impediment to this Motion being debated in the House.

In any event, the proceedings in the Court of Appeal are not in the nature of a trial before an original court and I am of the view that no real and substantial danger or prejudice would be caused to the outcome of those proceedings by this House debating this Motion.

In any case, there is no case pending relating to payment of expenses in the Prime Minister's Office. Therefore, I am also convinced, having consulted expert constitutional lawyers in the country, that this matter does not fall within the purview of Article 152 of the Constitution. Therefore, as such, I permit this Motion to be debated in the House today.

අද දින පූර්ව භාග 9.00ට මාගේ නිල කාමරයේදී පැවති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි 2018 නොවැම්බර් මස 21 වන බදාදා නිකුත් කරන ලද පත්‍රිකාවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ (2) දරන න්‍යාය පුස්තක පරිපූරකයේ පළ කරන ලද පා.2/'18 දරන නියමයක් නොමැති යෝජනාව 2018 නොවැම්බර් මස 30වෙනි සිකුරාදා සභාවේදී ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි එදින න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01. ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව සම්බන්ධයෙන් වූ යෝජනාව ඉදිරිපත් කිරීම.

ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව

குடியரசின் நிதியிலிருந்து எந்தவொரு செலவினத்தையும் மேற்கொள்வதற்கான அங்கீகாரத்தை வழங்குவதற்கு பிரதம அமைச்சரின் செயலாளருக்கு அதிகாரமின்மை

SECRETARY TO THE PRIME MINISTER HAS NO AUTHORITY TO APPROVE ANY EXPENDITURE DRAWN FROM THE FUND OF THE REPUBLIC

[පූ.භා.10.35]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ඔබතුමාට අපි ස්තුතිය පුද කරනවා. ඒ වාගේම, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම තුළින් ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කළා විතරක් නොව රටටත්, ජාත්‍යන්තර ලෝකයටත් ඔබතුමා මේ පෙන්නුම් කරලා තිබෙන දේ අපි සම්පූර්ණයෙන්ම අගය කරනවා. මේ කථා කරන මොහොතේ අපේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ අය නැවත මෙතැන යම් විධියක වර්ජනයක් කරනවා. මේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර, කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා නොවැම්බර් මාසයේ 10වෙනිදා කියපු දෙයක් පිළිබඳ පුවත් වාර්තාවක් මා උපුටා ගන්නවා - "UPFA doesn't have majority, admits Keheliya".

ඒ වාගේම, දවස් හතරකට ඉස්සෙල්ලා එස්.බී. දිසානායක "දිවයින" පත්තරයට මෙසේ කියනවා:

"113 තව දවස් හතරකින්..."

අදට දවස් පහක් වර්ජනය කිරීමෙන් ජේනවා, බහුතරය කොතැනද තිබෙන්නේ කියලා ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු නවින් දිසානායක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු චතුර සංදීප සේනාරත්න මහතා-

2018 නොවැම්බර් 14 වැනි දින සම්මත කර ගන්නා ලද ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාවේ 2 වැනි ඡේදයට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති බවට කථානායකවරයා

විසින් 2018 නොවැම්බර් 15 වැනි දින කරන ලද නිල ප්‍රකාශය මෙම සභාව 2018 නොවැම්බර් 16 වැනි දින පිළිගත් හෙයින් ද, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාවේ අරමුණු කොට ඇති පරිදි 2018 ඔක්තෝබර් 26 වැනි දින සිට ගරු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බවට මෙම සභාව තවදුරටත් යෝජනා සම්මත කරගත් හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන් බලය පැවරී ඇති පරිදි රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු හෙයින් ද;

ඊට අනුකූලව, 2018 නොවැම්බර් 15 වැනි දින සිට ජනරජයේ අරමුදල් වෙතින් කිසිදු වියදමක් අනුමත කිරීමට අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බවටත්, මෙම යෝජනා සම්මතය උල්ලංඝනය කරමින් කවර හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා කවර හෝ තැනැත්තෙකුට එරෙහිව නීතිමය පියවර ගනු ලබනු ඇති බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවේ සඳහන් වෙන්නේ මෙසේයි:

"රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේ ය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලය නොමැත්තේ ය."

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ අවස්ථාව උපයෝගි කරගෙන, පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන අපි මේ පාර්ලිමේන්තුවේ අපට දී තිබෙන වරප්‍රසාදය උපුටා ගන්නවා. මේ අවස්ථාවේදී අපට පෙනෙනවා, අවජාතක, ව්‍යංගයෙන් ආණ්ඩුවක් වශයෙන් කටයුතු කරන අය වියදම් නොතකා, අද මේ කියන මොහොත වන විට -මේ දවස් 21 තුළ,-හෙලිකොප්ටර්වලට රුපියල් ලක්ෂ 840ක් වියදම් කර තිබෙන බව. මෙන්න මේවා තමයි අපි මේ අවස්ථාවේදී නවත්වන්න හදන්නේ. ඒ සඳහා සම්පූර්ණ බලය අපට තිබෙනවා. වහාම මේවා අත් හිටුවා කටයුතු කරන්න ඕනෑ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සියලුදෙනාම වග කියන්න ඕනෑ. ආණ්ඩුවක් පත් වෙනවා, අපේ මුදල් ඇමති මංගල සමරවීර 2018 වර්ෂයට අය වැයක් ඉදිරිපත් කරනවා, ඒක සම්මත වෙනවා, ඊට පසුව නීත්‍යානුකූල ආණ්ඩුව ගෙදර යවනවා. බහුතරයක් නැති සුළුතරයක් තිබෙන ආණ්ඩුවක්, අවජාතක ආණ්ඩුවක්, ඒ සම්මත කළ වූ මුදල පාවිච්චි කරන්න හදනවා. ඒ නිසා තමයි අප මෙවැනි අවස්ථාවක, මේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එකතු වෙලා මෙය නවත්වන්න හදන්නේ.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, අප රජයේ සේවකයන්ට කියන්නේ නීතිය පිළිපදින්න කියායි. ඒ, බහුතරය නැති අවජාතක ආණ්ඩුවක්. ඇහුම් කන් දෙන්න අවශ්‍ය වන්නේ බහුතරයක් තිබෙන ආණ්ඩුවකටයි.

හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහත්මයා සම්බන්ධයෙනුත් මම මේ වෙලාවේ මතක් කරන්න අවශ්‍යයි. එතුමා ඉතාමත් අවංක සේවයක් කළ, කීර්තිමත්, දක්ෂ නිලධාරියෙක්. එහෙත් එතුමාට මොනවාද වුණේ? කිසිම වැරැද්දක් නොකර, දේශපාලනඥයන් කියූ දේ කරන්න ගිහිල්ලා මීට මාස ගණනාවකට පෙර, උසාවියෙන් එතුමාට ලැබුණු දඬුවම අපට පෙනුණා. නිවැරදි දේ පිළිපදින්න කියා රජයේ සේවකයන්ට කියන්න අපට අවශ්‍ය වන්නේ මෙන්න මේ කාරණය නිසායි. අප මේ අවස්ථාවේ කරන්නේ නිවැරැදි කිරීමක්. පැහැර ගත්, කිසිසේත්ම බලයක් නැති මෙවැනි ආණ්ඩුවකට අප මේ කරුණු කියනවා. මේ අවස්ථාව උපයෝගි කරගෙන පාර්ලිමේන්තුවේ මේ සම්මත කරන යෝජනාව අනුව, මේ මොහොතේ සිට සම්පූර්ණ මුදල් කපා හැරලා, අලුත් ආණ්ඩුවකින්, බහුතරයක් ඇති කරන ආණ්ඩුවකින් එය නැවත යථා තත්ත්වයට පත්කරන තාක් කල් මේ වියදම නවත්වන්න ඕනෑ කියන කාරණාව මේ පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

මම හිතන විධියට මට මීට වැඩිය කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මට තව එක් කාරණයක් පමණයි මතක් කරන්න අවශ්‍ය වෙන්නේ. මේ සම්බන්ධයෙන් අපි උසාවියට ගිහිල්ලා තාවකාලික ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවා. වැඩි කල් යන්න ඉස්සෙල්ලා අනිවාර්යයෙන්ම ඒක සම්මත වෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව තුළ කාටද බහුතරයක් තිබෙන්නේ කියන එක අපි නොවැම්බර් 14වැනි දා, 15වැනි දා, 16වැනි දා සහ 23වැනි දා පෙන්වලා තිබෙනවා. ඒ වාගේම තමයි තාවකාලිකව අප විපක්ෂයට එවා තිබෙන මේ අවස්ථාව උපයෝගි කරගෙන, ජනතාව උසි ගන්වන්නේ නැතිව, අපි ඉවසිල්ලෙන්, ශීලාචාරව කටයුතු කරමින්, වර්තමානයේ ව්‍යාජ වශයෙන් පත් කර තිබෙන ආණ්ඩුවට කියනවා, "කරුණාකර ඉල්ලා අස්වෙන්න" කියලා. මෙතැනදී අපට ප්‍රශ්න ඇති කරන්න අවශ්‍යතාවක් නැහැ. අපි ජනාධිපතිතුමාට කියන්නේ, කරුණාකර මේක දැක බලා හරියාකාරව කටයුතු කරන්න කියන එකයි. අපි ජනතාව වෙනුවෙන් කටයුතු කරමු; මේ රටේ වැටිලා තිබෙන ආර්ථිකය අපි හදාගනිමු; අපට අවශ්‍ය සමඟිතාව ඇති කරමු; තරුණ තරුණියන්ගේ රැකියා සඳහා අවශ්‍ය මාර්ගය ඇති කරමු. එම නිසා මේ යෝජනාව සම්මත කළ පසු අපි ඉවසීමෙන් හා එකමුතුව මේ රට ගැන හිතලා කථා කරන්න අවශ්‍යයි කියන එක කාරුණිකව මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, මෙහි සිටින සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නවින් දිසානායක මැතිතුමා.

[ප.භා. 10.43]

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

විශේෂයෙන්ම මාගේ උගත් මිත්‍ර රවි කරුණානායක මැතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව පැහැදිලිව ප්‍රකාශ කළා. එම වගන්තිය අනුව පාර්ලිමේන්තුවට තමයි මේ රටේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ බලය හිමිවෙලා තිබෙන්නේ.

රජයේ තිබෙන සියලුම මුදල් වැය කිරීමේ බලය ලබා දෙන්නේ පාර්ලිමේන්තුවෙන්. සමහර කට්ටිය අද අපේ යෝජනාව සම්බන්ධයෙන් වැරැදි චිත්‍රයක් මවමින්, වැරැදි අර්ථ නිරූපණයක් කරන්න හදනවා. ගරු කථානායකතුමනි, Standing Order No. 133හි මෙහෙම සඳහන් වෙනවා:

"ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනයම් අරමුදල් වලින් හෝ ගෙවිය යුතු මුදල් වියදම් කිරීමට හෝ ගෙවිය යුතු යැයි වියදම් නියම කිරීමට, නැතහොත් කිසියම් බද්දක් පැනවීමට හෝ

[ගරු නවින් දිසානායක මහතා]

පනවා එවකට වලංගුව තිබෙන බද්දක් අවලංගු කිරීමට හෝ වැඩි හෝ අඩු කිරීමට බලය පවරන යෝජනාවක්, පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට කරන සංශෝධනයක්

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස,.. "

නමුත් ගරු කථානායකතුමනි, අපි මේ යෝජනාව ගෙනෙන්නේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් වියදම් කිරීමක් ගැන නොවෙයි. අපි පැහැදිලිව ප්‍රකාශ කරනවා, අපි මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ වැය ශීර්ෂයකට - Vote එකකට - කියලා. අගමැතිතුමාගේ ලේකම්ගේ වැය ශීර්ෂයට තමයි අපි මේ යෝජනාව ගෙනෙන්නේ. ඒ නිසා ඔබතුමා සඳහන් කළ පරිදි මෙය සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූලයි. මෙය කිරීමට අපට බලයක් තිබෙනවා. ඒ වාගේම අපි පැහැදිලිව ප්‍රකාශ කරනවා; ඔබතුමාත් පැහැදිලිව සක්සුදක් සේ ඔප්පු කරලා තිබෙනවා, අද මේ ආණ්ඩුවට බහුතරයක් නැති බව. බහුතරයක් නැති ආණ්ඩුවකට රටක් ඉදිරියට ගෙන යන්න බැහැ. එම නිසා අපි ඉල්ලනවා, සදාචාරාත්මක ලෙස මේ ආණ්ඩුවට ඉල්ලා අස්වෙන්න කියලා. අද දිනෙන් පසු ඒක තවත් ඔප්පු වෙයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා ගන්නා මේ ස්ථාවරය විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න සියලු දෙනාම අගය කරනවා. ඔබතුමා මේ ගන්නා ප්‍රයත්නයට අද නොයෙකුත් අය ඔබතුමාට මඩ ගහනවා. ඔබතුමාගේ කීර්ති නාමයට හානි වෙන පරිදි නොයෙකුත් චෝදනා එල්ල කරනවා. අපි ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

අද දිනත් අපට පැහැදිලි බහුතරයක් තිබෙන බව අපි ඔබතුමාට කියන්න කැමැතියි. නැවතත් ඔබතුමාට අපගේ ස්තුතිය ප්‍රකාශ කරමින්, මෙම යෝජනාව මා නැවතත් ස්ථිර කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, අදහස් දැක්වීමේ අවස්ථාව. ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට වේලාව ලබා දෙන්න පුළුවන්.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා.

[පූ.භා.10.45]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මෙම අවස්ථාවේ මෙම ගරු පාර්ලිමේන්තුවට මාගේ අදහස් කීපයක් ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමා අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

අද අපේ රටේ පවතින දේශපාලන අස්ථාවරය හේතුවෙන් මේ රටේ අතිමහත් බහුතර ජනතාව ඉතාම වික්ෂිප්තභාවයකට පත් වෙලා සිටින මොහොතක්, මේ. මෙය ඉබේ ඇති වුණු දෙයක් නොවෙයි. මේකට බලපෑ කරුණු-කාරණා ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳව මම ඉතා කෙටියෙන් අදහස් දැක්වීමක් පමණක් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රට මීට අවුරුදු 70කට විතර කලින් නිදහස ලබා ගත්තාට පස්සේ, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍ය, අධිකරණයේ ස්වාධීනත්වය, රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින්, ඒ වාගේම ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුන විධියට සලකන එම ආයතනවලට අන්‍යෝන්‍ය වශයෙන් ඇති ස්වාධීන අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගෙන යෑමේ වගකීම මූලිකම වශයෙන් පැවරිලා තිබෙන්නේ, මෙම පාර්ලිමේන්තුව වෙතටයි.

නමුත්, අතීතයේ සිදු වුණු යම් යම් හේතු කාරණා නිසාත්, වර්තමානයේ දේශපාලනඥයන් වග කිව යුතු නොවන, එහෙත් එදා දේශපාලනඥයන් විසින් වග කිව යුතු යම් යම් පැහැර හැරීම්, වැරදි තීරණ, අදූරදර්ශී ක්‍රියා හේතුවෙනුත් අපේ රට අවුරුදු 30ක ඉතා දරුණු යුද්ධයකට සම්බන්ධ වෙලා මේ රටේ ජනතාව ජාති, ආගම් භේදයකින් තොරව පීඩාවට පත් වෙලා සිටි මොහොතකයි 2015දී අපේ රටේ සියලු ජනතාවට නව බලාපොරොත්තු ලබා දෙමින් ජාතික ආණ්ඩුවක් නිර්මාණය කරන්නට අපි සියලු දෙනා එකට එකතු වෙලා කටයුතු කළේ.

එදා ඒ පැවැති යුද්ධය නිසා මේ රටේ ත්‍රිවිධ හමුදාවේ රණ විරුවන්, පොලීසියේ නිලධාරීන් විසිහත්දහසක් විතර ජීවිත පූජා කර තිබෙනවා. ශ්‍රී ලාංකික පුරවැසියන් හැටදහසකගේ පමණ ජීවිත බිලි ගත්ත එවැනි අවාසනාවන්ත තත්ත්වයක් නැවතත් මේ රටේ ඇති නොවීමට වග බලා ගැනීම මේ ආණ්ඩුව නිර්මාණය කිරීමේදී අපි සියලු දෙනා රටේ ජනතාවට දුන් එක් පොරොන්දුවක්. අවුරුදු 30ක යුද්ධය නිමා වීමෙන් පස්සේ 2009 වසරේ පටන් අපේ රටේ සාමකාමී පරිසරයක් පවතින කාලවකවානුව තුළ, මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම, ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, අධිකරණයේ ස්වාධීනත්වය යනාදී බොහෝ දේවල් අපි බලාපොරොත්තු වුණාට ඒ දේවල් ඒ ආකාරයට ඉෂ්ට නොවුණු නිසාත්, ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජන එල්ල වී තිබුණු නිසාත් මේ රටේ ඉතිහාසයේ මෙතෙක් නොවූ ආකාරයේ වෙනස් ස්වරූපයේ විප්ලවයක් කිරීමට මේ රටේ ජනතාව ආශීර්වාදය ලබා දුන්නා.

ඒ අනුව තමයි එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා වන ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රධාන කොටගෙන එදා ආණ්ඩු බලය පැවති එක්සත් ජනතා සන්ධානයේ මූලික ප්‍රධාන කොටස්කරු වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් තනතුර හෙබ වූ අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා වශයෙන් පත් කරගෙන, විශේෂයෙන්ම එක්සත් ජාතික පාක්ෂිකයන් විසින් විශාල කැප කිරීමක් කරමින් එතුමා මේ රටේ ජනාධිපතිවරයා විධියට පත් කර ගනු ලැබුවේ. එතුමාගේ ජයග්‍රහණය තුළ මේ රට නව දිශානතියකට ගමන් කරාවි කියන ශුභවාදී බලාපොරොත්තු පොදි බැඳගෙන තමයි එදා රටේ ජනතාව එතුමාට ඡන්දය ලබා දුන්නේ. ඒ අනුව එක්සත් ජාතික පක්ෂයට ආසන හතළිස් ගණනක් පමණක් මේ පාර්ලිමේන්තුවේ තිබියදී වුණත්, 2/3කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් ආරම්භය ඉතාම සාර්ථක ආණ්ඩුවක් විධියට මේ රටේ ජනතාව දශක ගණනාවක් තිස්සේ ඉල්ලා සිටි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපට සම්මත කර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ සඳහා එක්සත් ජාතික පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා

නායකත්වය දුන්නා වාගේම, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, මීට පෙර සිටි බොහොම ජනාධිපතිවරුන් පොරොන්දු දුන්නු නමුත් ඉටු නොකළ පොරොන්දු ඉටු කිරීමට එකඟතාව දැක්වූ බව මේ අවස්ථාවේදී අපි සිහිපත් කරනවා.

විධායක ජනාධිපති ධුරයේ බලතලවලින් විශාල ප්‍රමාණයක්, ජනමත විචාරණයකින් තොරව ඉවත් කළ හැකි බලතල ප්‍රමාණයක් එම ධුරයෙන් ඉවත් කර අමාත්‍ය මණ්ඩලයටත්, ව්‍යවස්ථාදායක සභාවටත්, ස්වාධීන කොමිෂන් සභාවලටත් බෙදා හැරීමට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී අපට හැකියාව ලැබුණා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉතා නිවැරදි සංශෝධනයක් කියා මම කියන්නේ නැහැ. ලෝකයේ අංග සම්පූර්ණ වූ, නිවැරදි වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට කවදාවත් දකින්න ලැබෙන්නේ නැහැ. කුමන ආකාරයේ ව්‍යවස්ථා හැදුවත් කාලීනව සිදු වන වෙනස්කම් අනුව නීතියේ වෙනස්කම් සිදු කිරීමට රජයකට සිදු වෙනවා.

2015 වර්ෂයේ අගෝස්තු 17වැනි දින අපි පාර්ලිමේන්තු මැතිවරණයකට මුහුණ දුන්නා. අපි මැතිවරණයට පෙර පටන් ජනතාවට ප්‍රකාශ කළේ එක්සත් ජාතික පක්ෂය විධියට බහුතර ආසන සංඛ්‍යාවක් අරගෙන ආණ්ඩුවක් නිර්මාණය කිරීමට හැකි වුණත්, 113කට වැඩි බහුතර මන්ත්‍රී ආසන ගණනක් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළත් අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නායකත්වය දෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එතුමාට සහයෝගය දක්වන කණ්ඩායමත් සමඟ එකතු වෙලා මේ පාර්ලිමේන්තුව තුළ ජාතික ආණ්ඩුවක් නිර්මාණය කරනවා කියලායි.

කෙසේ නමුත්, අවාසනාවකට මෙන් සරල බහුතර මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් එම මැතිවරණයෙන් දිනා ගැනීමට නොහැකි වුණත් අපි ජනතාවට පොරොන්දු වූ පරිදි අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම, ගරු අග්‍රාමාත්‍යතුමාත් එක්ව ජාතික ආණ්ඩුවක් පිහිටුවා 48දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලයක් හදලා, මේ රටේ පැන නැඟී තිබුණු දේශපාලනික, ආර්ථික, සමාජයීය, සංස්කෘතික ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් ඉතා යුහුසුළුව ඒවා යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා වසර තුනක කාලයක් තිස්සේ ඉතාම කැපවීමෙන් කටයුතු කළා.

ඒ කාල සීමාව තුළ ප්‍රශ්න ඇති නොවුණා නොවෙයි. ඒ කාල සීමාව තුළ අපට චෝදනා ඉදිරිපත් නොවුණා නොවෙයි. නමුත් ඒ සෑම කාරණයකටම මුහුණ දෙමින් හැල හැප්පීම් අස්සේ සමහර අවස්ථාවලදී පාක්ෂිකයන් දැඩි කලකිරීමට පත්වන ස්වභාවයක් ඇති වෙද්දීත් අපි උපරිම වශයෙන් ජනතාවගේ ඒ අරමුණු, අභිලාෂ ඉෂ්ට කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කරනු ලැබුවා. නමුත් අවසානයකට මෙන් කාලයාගේ ඇවෑමෙන් අපේ ආණ්ඩුවට නායකත්වය ලබා දුන්න, රටේ නායකයා විධියට කටයුතු කරන, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා විධියට කටයුතු කරන අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පාර්ශ්වයත් ඒ වාගේම, ගරු අග්‍රාමාත්‍යතුමාගේ පාර්ශ්වයත් එකිනෙකාට එරෙහිව, අපේ රටේ ඊට පෙර තිබුණු පැරණි අවලාද දේශපාලනයට ක්‍රමානුකූලව ගමන් කළ බව අපි දැක්කා.

ඒ අවස්ථාවලදී අපි කොතෙකුත් උත්සාහ කළේ, ජනතාව බලය ලබා දුන් වසර 5ක සම්පූර්ණ කාලය තුළ ජාතික ආණ්ඩුවක් විධියට ජනතාව අතර දේශපාලන විරසකභාවය, වෛරී, අවලාද දේශපාලනයෙන් ඉවත් වෙලා අලුත් ආදර්ශවත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවක් ස්ථාපිත කර ගෙන යන්නයි. නමුත්, ඒ කණ්ඩායම් දෙකට නායකත්වය ලබා දුන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් තම තමන්ගේ කණ්ඩායම් දෙක සංයමයකින් යුතුව හසුරුවා ගැනීමේ කටයුත්ත කිරීමටත් නොහැකි වුණා. එම කාරණය සම්බන්ධයෙන් ඒ දෙපොළම අසමත් වුණාය කියන කාරණය මතක් කළ යුතුව තිබෙනවා. ඒ අතීත වැරදිවලින් පාඩම් ඉගෙන ගනිමින් සිටින අවස්ථාවක දී තමයි අප අතර පැවති අන්‍යෝන්‍ය විශ්වාසය ක්‍රමානුකූලව දෙපාර්ශ්වයෙන්ම ගිලිහෙමින් පැවැතුණේ. එවැනි අවස්ථාවක හිටි හැටියේම 2018 ඔක්තෝබර් මාසයේ 26 වන දින පූර්ව දැනුම් දීමකින් තොරව එවකට අග්‍රාමාත්‍ය ධුරය දරමින් සිටි ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉවත් කර, හිටපු අතිගරු ජනාධිපතිතුමා - මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරය දරපු ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා- අග්‍රාමාත්‍ය ධුරයේ දිවුරුම් දීමත්, නව අමාත්‍ය මණ්ඩයක් දිවුරුම් දීමත් සිදු වුණා. එම ක්‍රියාදාමයෙන් අනතුරුව පාර්ලිමේන්තුව වාර අවසන් කර කල් තැබීමත්, ඒ වාගේම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නියෝගයක් ලබා දී එය ගැසට් පත්‍රයේ පළ කිරීමත් සිදු වුණා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නියෝගයට එරෙහි කාරණය මේ වන විට අධිකරණයේ විභාගයට ලක් වෙමින් පවතින කාරණයක්.

කරුණු එසේ තිබියදී, නොවැම්බර් මාසයේ 14, 15 හා 16 යන දිනවල පාර්ලිමේන්තු සභා වාර පැවතියදී මේ සභා ගර්භය තුළ ගරු මන්ත්‍රීතුමන්ලා දැඩි වෛරකාරී, කලහකාරී ස්වභාවයෙන් හැසිරෙන අයුරු අපි දැක්කා. ඒ නිසා මේ රටේ ජනතාව මහජන නියෝජිතයන් පිළිබඳව, සමස්ත පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳවම දැඩි කලකිරීමකින් සහ පිළිකුල් ස්වභාවයකින් කථා කරන තත්ත්වයට අද රට පත් වෙලා තිබෙනවා. මේ වන විට මේ රටේ පාලනය ප්‍රායෝගික වශයෙන් අකර්මණ්‍ය තත්ත්වයට පත් වී, මේ රටේ සිදු වන්නේ කුමක්ද යන්න පිළිබඳව ජනතාව කිසිදු අවබෝධයකින් තොරව අපේක්ෂා භංගත්වයට පත් වෙච්ච තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ එකිනෙක පාර්ශ්වයන් අන් පාර්ශ්වයන්ට චෝදනා කිරීම, අපහාස කිරීම හා අවලාද කිරීම යන සිදුවීම් දිගින් දිගටම සිදු වුණත්, ඒ කිසිවකින් මේ රටේ ජනතාවට සුගතියක් සිදු වන්නේ නැති බව මෙම ගරු සභාවේ සියලුදෙනා පිළිගන්නා කාරණයක් කියා මා විශ්වාස කරනවා.

අගමැති විය යුත්තේ කවුද, අමාත්‍ය මණ්ඩලය සකස් විය යුත්තේ කුමන පුද්ගලයන්ගෙන්ද, පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුත්තේ හෝ විසුරුවා හැර ඇති ලෙස සැලකිය යුත්තේ කුමන දිනකදීද යනාදී කාරණා විධායකයේ ප්‍රධානියා සහ ව්‍යවස්ථාදායක විසින් නිශ්චය කරගත යුතු කාරණා විනා, අධිකරණය විසින් විභාගකොට තීරණය කළ යුතු කාරණා වශයෙන් මා පිළිගන්නේ නැහැ.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටේ ව්‍යවස්ථාදායක බලය සහ අධිකරණ බලය පැවරී තිබෙන්නේ උත්තරීතර පාර්ලිමේන්තුව වශයෙන් සලකන මෙම සභාවටයි. මේ සභාව වෙත පැවරී තිබෙන එම උත්තරීතර බලය මෙම පාර්ලිමේන්තුව විසින් සකස් කරනු ලබන; සම්පාදනය කරනු ලබන නීති ක්‍රමවේදය තුළ විසඳීම සඳහා පාර්ලිමේන්තුවට බලය පවරා දෙන්නේත් මේ පාර්ලිමේන්තුව විසින්මයි. එවැනි තත්ත්වයක් යටතේ මේ පාර්ලිමේන්තුව තුළ මතුවන කාරණා; විධායකය සහ පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - අතර ඇතිවන මතභේද හා ගැටුම්කාරී දේවල් මේ පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතවරුන් 225දෙනාට සාකච්ඡා මාර්ගයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළින් විසඳා ගැනීමට හැකියාවක් නැහැයි කියලා රටට ඔප්පු වන අවස්ථාවක ජනතාව අපෙන් ප්‍රශ්න කළොත්, "ජනතාවගේ ප්‍රශ්න විසඳන්න මේ පාර්ලිමේන්තුවට පුළුවන්ද?" කියලා, අපි සියලුදෙනාටම නිරුත්තර වන්න සිද්ධවනවා, ඒ ප්‍රශ්නය ඉදිරියේදී. ඒක නිසා මෙවැනි ප්‍රශ්න අධිකරණයට විසඳීමට, තීන්දු තීරණ ගැනීමට ලබා දීම තුළින්

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

සිදුවන්නේ මේ පාර්ලිමේන්තුව හෑල්ලුවට ලක්වීමක් මිසක්, රටේ ප්‍රශ්න විසඳීමක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ - ව්‍යවස්ථාදායකයේ- නායකයා, විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා සමඟ සම්බන්ධීකරණය කරමින් මේ මතු වෙලා තිබෙන ව්‍යවස්ථාදායක, විධායක ගැටුම නිරාකරණය කර ගැනීම සඳහා මේ රටේ ජනාධිපතිවරයාට සහ ගරු කථානායකතුමා වන ඔබතුමාට විශාල වග කීමක් පැවරී තිබෙනවා.

අද රටේ මතු වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? විධායකය විසින් නිකුත් කරනු ලබන විධානයන් ව්‍යවස්ථාදායකය පිළිනොගන්නා තත්ත්වයට පත් වීම තුළත්, ව්‍යවස්ථාදායකය විසින් සම්මත කර ගනු ලබන යම් යම් යෝජනා විධායකය පිළිනොගන්නා තත්ත්වයට පත් වීම තුළත්, ප්‍රජාතන්ත්‍රවාදය ඒ ස්ථානයේම ඇනහිටපු තත්ත්වයක්, ව්‍යවස්ථාදායක හිරවීමක් - Constitutional deadlock -මේ රටේ සිදු වෙලා තිබෙන ආකාරය අපි දකිනවා. මෙවැනි අවස්ථාවක මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාගේම වගකීම වන්නේ, දේශපාලන අවස්ථාවාදය පිළිබඳව කල්පනා කිරීම නොවෙයි. මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන ප්‍රශ්නවලට නිසි පරිදි, සාර්ථකව පිළිතුරු දීලා මේ රට ස්ථාවර කර ගැනීමයි ඒ සියලුදෙනාගේම වගකීම වන්නේ. මේ දේශපාලන අස්ථාවරත්වය තුළ මේ රටේ ජයග්‍රහණය ලබන දේශපාලන නායකයෙක් නැහැ; ජයග්‍රහණය ලබන දේශපාලන පක්ෂයක් නැහැ. අපි එකිනෙකාට අවලාද කර ගනිමින්, මේ දේශපාලන සංස්කෘතිය මේ රටේ තවදුරටත් දිගින් දිගටම පවත්වාගෙන යාමෙන් අනාගතය පිළිබඳව අදුරු සේයා පතිත වෙමින් තිබෙනවාය කියන කාරණය අපි අමතක කරන්න හොඳ නැහැ. විශේෂයෙන්ම අද මේ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුව තුළ සිදු වන දෑ පිළිබඳව අපේ රටේ තරුණ පරම්පරාව දක්වන අදහස්; ඒ උදව්ය කථා කරන දේවල් අහලා බැලුවාම, මේ ක්‍රමය ප්‍රතික්ෂේප වන දිනය අත ළඟයි කියා අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශ්වාසය නැවතත් මේ රටේ ජනතාව තුළ ඇති කිරීම පිණිස- අතීතයට ශාප කිරීමෙන් අපට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ.- අනාගතය දෙස සුබවාදීව බලලා කටයුතු කරන්න අපට සිදු වෙනවා.

පසුගිය කාල සීමාව තුළ සිද්ධ වුණු දේවල්වල හරි වැරදි සොයමින්, පශ්චාත් මරණ පරීක්ෂණ කිරීම තුළ නොවෙයි අපට මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න හැකියාව ලැබෙන්නේ. එම හැකියාව ලැබෙන්නේ, අපි සුබවාදී ලෙස එකිනෙකා පිළිබඳව අන්‍යොන්‍ය අවබෝධයක්, විශ්වාසයක් ඇති කර ගනිමින්, නැවතත් මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ, මේ රටේ මේ පාර්ලිමේන්තුව තුළ බහුතරයක් මෙහෙයවන්න පුළුවන් කණ්ඩායමකට -කුමන කණ්ඩායම වුණත් ඒ කණ්ඩායමට- ආණ්ඩුවක් පිහිටුවීම සඳහා අවස්ථාව ලබා දීම තුළින්ය කියන කාරණය මා මතක් කරනවා. ඒ වෙනුවෙන් මන්ත්‍රීවරයකු විධියට ඕනෑම කැප කිරීමක් කරන්න මා සූදානම් වාගේම, අනෙක් සියලුදෙනාත් සූදානම් බව මා දන්නවා.

ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී මේ අදහස් දැක්වීම සිදු කිරීමට විශේෂයෙන්ම තීරණය කළේ, මේ කාරණයේදී ප්‍රධාන වගකීම දරමින්, මේ ප්‍රශ්නය නිරාකරණය කිරීමේ කර්තව්‍යයේදී වැඩිම වගකීමක් දරමින්, එය සාර්ථකව ඉෂ්ට කරන්න පුළුවන් ඔබතුමාට පමණක්ය කියන කාරණය ඔබතුමාට අවධාරණය කරන්න, සිහිපත් කරන්න ඕනෑ නිසායි. අපි විශ්වාස කරනවා, අතීතයේ අප කාගේ අතිනුත් යම් යම් වැරැදි අඩු පාඩුකම් සිද්ධ වුණත්, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් විශාල කැප කිරීමක් කරලා, විශාල විප්ලවයක් කරලා, එදා අපේ පක්ෂයත් එක්ක එකට එකතු වෙලා මේ රටේ ලක්ෂ 62ක් වූ ජනතාව එතුමාට ලබා දුන් විශ්වාසය ආරක්ෂා කර ගනිමින්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මත් ආරක්ෂා කර ගැනීමට එතුමා කටයුතු කරාවි කියා. ඒ විශ්වාසය අපට තවදුරටත් තිබෙනවා. ඉදිරි කෙටි කාල පරිච්ඡේදය තුළ යම් සම්මුතියකට ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂ නායකයන් සමඟත්, අතිගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කිරීම තුළින් ඔබතුමාට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ය කියන විශ්වාසය මේ අවස්ථාවේදී පළ කරමින්, මා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ තවත් නොයෙකුත් වැඩ කටයුතු ඇති. හැබැයි ඒ සියල්ල තාවකාලිකව හෝ අත් හිටුවා ඔබතුමා මේ වෙනුවෙන් මැදිහත් වෙන්න, අතිගරු ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා, මේ ප්‍රශ්නය දිනයක් හෝ දෙකක් ඇතුළත විසඳා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින් බහුතර ආණ්ඩුවක් ගෙන යා හැකි කණ්ඩායමකට බලය ලබා දීලා, මේ රටේ දේශපාලන ස්ථාවරය නැවත ඇති කරන්න කියායි මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ. මම ඒ ඉල්ලීම අතිගරු ජනාධිපතිතුමාගෙන් කර තිබෙනවා. එතුමාගේ පැත්තෙන් ඒ පිළිබඳව දැඩි කැමැත්තක් තිබෙන බවක් පෙනෙන්න තිබෙනවා. නමුත් ඒ පිළිබඳව නිල වශයෙන් කටයුතු කිරීමේ ශක්තිය, නීතිමය බලය ව්‍යවස්ථානුකූලව ඔබතුමාට ඇති නිසා ඒ සඳහා මැදිහත් වන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කළ කරුණු ගැන මම පූර්ණ අවධානය යොමු කරනවා. ඒ වාගේම මේ ගරු සභාවට සඳහන් කරන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාත් මාත් අතර කථා කිරීමේ අපහසුතාවක් නැති බව. අපට සාකච්ඡා කරන්න පුළුවන්. අන්‍යෝන්‍ය විශ්වාසය තිබෙනවා. මම මේ කාර්යයේදී ඉදිරිපත් වුණේ විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නයි. ඒ වාගේම අපගේ යුතුකමක් තිබෙනවා ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට, විශේෂයෙන්ම නූපන් පරපුරට ආරක්ෂා කර දීමට. අද මේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්න විසඳීමට, ඔබතුමා යෝජනා කළ පරිදි මා හැකි සෑම උත්සාහයක්ම දරනවා. අවංක උත්සාහයක් දරනවා, ඉතාම ඉක්මනින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා මාර්ගයෙන් විසඳා මහජන මතය අනුව, ඒ වාගේම පාර්ලිමේන්තුවේ බහුතර මතය අනුව රට යථා ස්ථාවරභාවයට පත් කිරීමට. බොහොම ස්තුතියි. ඊළඟට, ගරු,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Rauff Hakeem will speak.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ඉල්ලීමක් කළා, first. Hon. Hakeem may speak after him.

[පූ.භා. 11.07]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව පිළිබඳව කරුණු කිහිපයක් දක්වන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මේ යෝජනාවට පෙර ඔබතුමා ඉදිරිපත් කරපු අදහස් සහ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරපු අදහස් පිළිබඳවත් යමක් කිවයුතුයි කියා මා කල්පනා කරනවා. ගරු කථානායකතුමනි, අපි කවුරුත් ඇති වෙන අර්බුදයක් සාමකාමීව විසඳා ගැනීම වෙනුවෙන්, සාකච්ඡාමය ලෙස විසඳා ගැනීම වෙනුවෙන් සුබවාදී අපේක්ෂාවන් සහ බලාපොරොත්තු තබා තිබෙනවා. ඇති වෙන අර්බුදයක් තව තව දිග්ගැස්සෙන අර්බුද බවට පත් කර ගනිමින් විසඳා ගැනීමේ මාවත කවුරුත් කල්පනා කරන්නේ නැහැ. ඒ නිසා අපි ඔක්කෝම සාමකාමීව විසඳා ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතුයි. හැබැයි, ගරු කථානායකතුමනි, ප්‍රශ්න තේරුම්ගත යුතුව තිබෙන්නේ ඕපපාතිකව නිර්මාණය වූ ප්‍රශ්න විධියට නොවෙයි. ස්වාභාවික ව්‍යසනයකදී අපි අතර පොදු සම්මුතියක් ආ හැකිව තිබෙනවා. ස්වාභාවිකව සිද්ධ වෙන ගැටලුවකදී අපි අතර පොදු සම්මුතීන් ආ හැකිව තිබෙනවා. හැබැයි, ගරු කථානායකතුමනි, හිතාමතා කුමන්ත්‍රණකාරී ලෙස කරන ලද අර්බුදයන්ට පොදු සම්මුතීන් හොයා ගන්නේ කොතැනද? මම ඒක මේ ගරු සභාවෙන් දැන ගන්න කැමැතියි. මේ ස්වාභාවික ව්‍යසනයක් හෝ ඕපපාතිකව නිර්මාණය කරන ලද්දක් නොවෙයි. මෙය සැලසුම්කොට දියත් කරන ලද කුමන්ත්‍රණයක අර්බුදයක්. එවැනි කුමන්ත්‍රණයක අර්බුදයක් සාකච්ඡා මෙස තුළ, සාමකාමී මෙස තුළ, සහජීවනයේ මෙස තුළ විසඳාගත හැකි වේවි කියන විශ්වාසයක් නම් ජනතා විමුක්ති පෙරමුණේ අපට නොමැති බව මේ ගරු සභාවට කියන්න කැමැතියි, ගරු කථානායකතුමනි. එය විසඳා ගැනීමේ රාමුව කුමක්ද? ගරු කථානායකතුමනි, අපි කැමැති වුණත්, අකැමැති වුණත් අපේ රටේ හැම කෙනාම යටත් වෙන නීතියක් තිබෙනවා. ඒ තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩ නහන දවසේ සිටම එහි තිබෙන අනිටු ප්‍රතිවිපාක පිළිබඳව මේ රටත් එක්ක පුළුල් දේශපාලන සංවාදයක් කරපු ව්‍යාපාරයක්; මෙහි තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී ගති ලක්ෂණ සමාජයට කවර ආකාරයේ විනාශයක් කළ හැකිද කියලා විශාල සංවාදයක් කරපු දේශපාලන ව්‍යාපාරයක්. ඒ වාගේම මේ ව්‍යවස්ථාවට ගෙනෙන ලද ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණ දෙකක් වන දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් -විශේෂයෙන්ම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේදී- සුවිශේෂී පුරෝගාමී කාර්ය භාරයක් අප විසින් ඉටු කරනු ලැබුවා.

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදීත් යම් සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කළා යැයි කියන විශ්වාසයක් අපට තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අපි පිළිගන්නා කරුණු මෙන්ම අපි නොපිළිගන්නා කරුණු තිබෙනවා. අපි එකඟ වෙන වාගේම එකඟ නොවෙන කරුණු තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය අපි එකඟ වීම හා එකඟ නොවීම නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අද අපි කවුරුත් යටත්. ජනාධිපතිවරයාගේ සිට සාමාන්‍ය සිවිල් පුරවැසියා දක්වා සෑම දෙනාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්කම තිබෙනවා, යටත් වී තිබෙනවා. එම නිසා මේ ප්‍රශ්න විසඳා ගැනීමේ මාර්ගෝපදේශකයා බවට පත් වෙන්නේ මේ එකතු වී තිබෙන සාකච්ඡා පමණක් නොවෙයි. මේ මාර්ගෝපදේශකත්වය, මහ පෙන්වීම කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එම නිසා ජනාධිපතිවරයා කටයුතු කළ යුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව. දැන් පැන නැඟී ඇති ප්‍රශ්නය එතැනයි තිබෙන්නේ. ජනාධිපතිවරයාගේ සිට සෑම පුරවැසියකුටම තමන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සීමා මායිම් හඳුන්වා දී තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබියදී ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කිසිසේත්ම සැලකිල්ලට භාජනය නොකොට, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව කිසිසේත්ම අවධානයට ලක් නොකොට තමන්ගේ හිතුවක්කාරී, තක්කඩි චුවමනාවන් වෙනුවෙන් කටයුතු කිරීම තමයි මේ අර්බුදය පතුලේ තිබෙන හරය.

ගරු කථානායකතුමනි, එම නිසා අපි කියන්නේ, ජනාධිපතිතුමා සමඟ ඔබතුමා සාකච්ඡා කළාට අපට කමක් නැහැ, තව අය සාකච්ඡා කළත් කමක් නැහැ, සාකච්ඡාවට අතරමැදියන් සම්බන්ධ වුණත් අපට ප්‍රශ්නයක් නැහැ; හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ අපි නම් කිසිවක් ඔහු සමඟ සාකච්ඡා කරන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. ගරු කථානායකතුමනි, සාකච්ඡාවලදී ලැබෙන ප්‍රතිඵලයන් තිබෙනවා. අපි දන්නවා ඒක. එකිනෙකා අතර තිබෙන අනවබෝධය සාකච්ඡා හරහා විසඳා ගන්නට පුළුවන්. එකිනෙකා අතර තිබෙන ප්‍රශ්නයක දුර, ඒ ප්‍රශ්නයේ ගැඹුර සාකච්ඡා හරහා විසඳා ගන්නට පුළුවන්. එම නිසා සාකච්ඡා මේසයෙන් විසඳා ගත හැකි ප්‍රශ්න තිබෙන බව අපි පිළිගන්නවා. හැබැයි, මේ ප්‍රශ්නය අනවබෝධයේ ප්‍රශ්නයක්වත්, එකිනෙකා අතර සීමා මායිම් නොතිබීම පිළිබඳ ප්‍රශ්නයක්වත් නොවෙයි, කුමන්ත්‍රණයක්. කුමන්ත්‍රණය සාකච්ඡා මේසය තුළ විසඳා ගන්නට පුළුවන් නම් හරිම සතුටු වෙනවා. ඒක අලුත් අත් දැකීමක්.

ගරු කථානායකතුමනි, අපි ජනාධිපතිවරයාගේ සාකච්ඡා ගණනාවකට සහභාගි වී තිබෙනවා. ඔහු ඒ සාකච්ඡාවලදී දෙන එකඟතාවන් සහ ඒ සාකච්ඡාවලදී අපි හමුවේ දෙන ලද ප්‍රකාශයන්, සහතික වීම් කිසිවක් නිසි පරිදි ඉටු නොකරන ලද නායකයෙක්. ඒක ඇත්ත. මම දන්නේ නැහැ අනෙක් අය ඒක විශ්වාස කරයිද කියා. ඔවුන්ට ඒ සාකච්ඡා කිරීමේ නිදහස, කථා කිරීමේ නිදහස සියල්ල තිබුණත් අපි ඒ කථා කිරීම පිළිබඳව නම් අඹ මල් රොනකවත් විශ්වාස තබන්නේ නැහැ. අපේ මැදිහත් වීම සහ අපේ පෙලඹවීම තිබෙන්නේ ජනාධිපතිවරයා බැඳී තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එතුමා යටත් කිරීමයි. ඒකයි අපේ අරගළය. එහෙම නැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එළියට කැඳවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එළියේ කෙරෙන සාකච්ඡා නොවෙයි. අපේ අරගළයේ මුඛ්‍ය පරමාර්ථය බවට පත් වී තිබෙන්නේ ජනාධිපතිවරයා ආරක්ෂා කිරීමට බැඳී සිටින, වග කීමට බැඳී තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේ ජනාධිපතිවරයා යටත් කළ යුතුයි කියන එකයි. ඒක තමයි ඔහුගේ දිවුරුම. ඒක තමයි ඔහුට ජන වරමේ තිබෙන බලය. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ ඔහුට පවරා දී තිබෙන සීමා මායිම. ඒ නිසා මේ අරගළයන් කවරක්වත් නොව වර්තමාන ජනාධිපතිවරයා අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කිරීමය. මේක තමයි අපේ අපේක්ෂාව. ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කිරීම වෙනුවෙන් ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාදායකය ලෙස අපට පැවරී තිබෙන කාර්ය භාරයන් විශාල ප්‍රමාණයක් අප විසින් ඉටු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, 14වැනි දා පාර්ලිමේන්තුවේදී නිසි පරිදි විශ්වාස භංග යෝජනාවක් සම්මත වී තිබෙනවා. අපේ රටේ ආණ්ඩුවක් ඡන්දවලදී වටිටන්න පුළුවන්. හැබැයි, ඡන්දයක සිට තවත් ඡන්දයක් දක්වා ආණ්ඩුවක් වැටිටවීම සඳහා පාර්ලිමේන්තුවට අවස්ථා තුනක් තිබෙනවා. ඡන්දයක සිට තවත් ඡන්දයක් දක්වා ගොඩනඟන ලද පාර්ලිමේන්තුවක් ඇතුළේ ආණ්ඩුවක් වැටිටවිය හැකි අවස්ථා තුනක් තිබෙනවා. පළමුවැන්න, ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පරාජයට පත් කිරීම හරහා ආණ්ඩුව වැටිටවිය හැකියි. දෙවැන්න, අය වැය ලේඛනය පරාජයට පත් කිරීම හරහා ආණ්ඩුව වැටිටවිය හැකියි. තුන්වැන්න, ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් සම්මත කිරීම හරහා ආණ්ඩුව වැටිටවිය හැකියි. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පරාජයට පත්කළ හැකිව තිබුණා. නමුත් ඔහු ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළේ නැහැ. අය වැය ලේඛනය පරාජයට පත් කළ හැකිව තිබුණා. හැබැයි, අය වැය ලේඛනය දක්වා පාර්ලිමේන්තුව ගෙන යන්න ඔහු ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, නිශ්චිත වශයෙන් කුමන්ත්‍රණකාරී ලෙස අටවා ගන්නා ලද ආණ්ඩුව පරාජයට පත් කිරීමේ නිශ්චිත අවස්ථාව තිබුණේ විශ්වාස භංග යෝජනාවක් හරහා පරාජයට පත් කිරීම.

[ගරු අනුර දිසානායක මහතා]

එය තමයි පසුගිය 14වැනි දා සිදු වුණේ. 14වැනි දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුරූපී වන පරිදි, පාර්ලිමේන්තු රීතීන්වලට අනුරූපී වන පරිදි ඉතාමත් වැදගත් ලෙස විශ්වාස භංග යෝජනාවක් සම්මතකොට, තිබුණු ආණ්ඩුව විසුරුවා හැරීමට භාජනකොට තිබෙනවා. එය පාර්ලිමේන්තුවේ කටයුත්තක්. පාර්ලිමේන්තුවේ ප්‍රධානියා හැටියට ඔබතුමා, පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාව ඡන්ද විමසීමට ලක්කොට තිබෙනවා. 15වැනි දා ආණ්ඩුවක් නොමැති බව පාර්ලිමේන්තුවට ප්‍රකාශයට පත්කොට තිබෙනවා. කථානායකවරයා හැටියට ඔබතුමාට පැවරී තිබෙන බල සීමාවන් ඇතුළේ තමන්ගේ නියෝග ලබා දෙනවා වාගේම, ජනාධිපතිවරයා තේරුම් ගත යුතුව තිබෙනවා, තමන්ට පැවරී තිබෙන බල සීමාව ඇතුළේ තමයි තමන් කටයුතු කළ යුතු වන්නේ කියා. විශ්වාස භංග යෝජනාවක දිග පළල, විශ්වාස භංග යෝජනාවක අඩංගුව, විශ්වාස භංග යෝජනාව සම්මත වීමේ ආකාරය පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් කරන්න ජනාධිපතිවරයාට අයිතියක් නැහැ. ඒක ජනාධිපතිවරයා තේරුම් ගත යුතුයි. විශ්වාස භංගය ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරයක්. ඒක විධායකයේ කාර්ය භාරයක් නොවෙයි. ඒ නිසා විශ්වාස භංගය ගැන සාකච්ඡාව සහ සම්මතවීම පිළිබඳව තිබෙන්නේ ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරයක්. ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරය නිසි පරිදි ඉටු වූ බවට සහතික කරන්නේ ගරු කථානායකතුමා. ගරු කථානායකතුමා 15 වැනි දා පාර්ලිමේන්තුව නිශ්චිත පරිදි ව්‍යවස්ථාදායකය ඇතුළේ ආණ්ඩුව පරාජයට පත් වූ බව, කැබිනට් මණ්ඩලය විසුරුවා හැරිය බව ප්‍රකාශයට පත්කොට තිබෙනවා.

දැන් ජනාධිපතිවරයාට තිබෙන්නේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට. ජනාධිපතිවරයා බැඳී සිටින්නේ ව්‍යවස්ථාවට. එහෙම නැතුව අපේ මුහුණ බලලා හිනා වෙන්න හෝ, අපේ කරට අත දමාගන්න හෝ, සාකච්ඡාවකදී හෝ එකට කෑම වේලක් කමු කියන්න හෝ නොවෙයි. ඒවා අපට යාළු මිත්‍රකම්වලට කරගන්න පුළුවන්. හැබැයි, රටේ ප්‍රශ්නවලදී ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බැඳී ඉන්නවා. එම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් කළ යුතු වන්නේ, පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාවක් සම්මත වූ වහාම ඔහුට පැවරී තිබෙන කාර්ය භාරය වන්නේ නව ආණ්ඩුවක් පත් කිරීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමා බැඳී සිටින පංගුව වන යළි ආණ්ඩුවක් පිහිටුවීමේ කටයුත්ත පසුගිය 14වැනි දා සිට, එහෙම නැත්නම් 15වැනි දා සිට මේ දක්වා ජනාධිපතිවරයා අත් හරිමින් තිබෙනවා. ඒ, යළිත් මහින්ද රාජපක්ෂ මහත්මයාම පත් කිරීම නම්, ඒත් කමක් නැහැ. අපට ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, හැබැයි අද අස්ථාවරත්වයක්, එහෙම නැත්නම් ආණ්ඩුවක් නැති තත්ත්වයක් නිර්මාණය වී තිබෙන්නේ අන් කවරක් නිසාවත් නොවෙයි, විශ්වාස භංග යෝජනාවක් සම්මත වුණාට පසුව ව්‍යවස්ථානුකූලව ජනාධිපතිවරයාට පැවරී තිබෙන කාර්ය භාරය ඉටු නොකිරීම නිසායි. මේ පිළිබඳව ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡා කරනවා නම්, කුමන කරුණුද සාකච්ඡා කරන්න තිබෙන්නේ? පාර්ලිමේන්තුව තුළ විශ්වාස භංග යෝජනාවක් සම්මත වුණාට පසු ඉදිරි ක්‍රියාමාර්ගවලට යා යුතුව තිබෙනවා. ඔහු තක්කඩි සහ හිතුවක්කාර ලෙස මේ රටත්, අපේ ජනතාවත් විශාල අස්ථාවරභාවයකට පත් කරමින්, හිතුවක්කාර ලෙස හැසිරෙමින් ඉන්නවා. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි, නැවත 16වැනි දාත් විශ්වාස භංග යෝජනාවක් සම්මත කරලා දැන්වත් ක්‍රියාත්මක වීම සඳහා ජනාධිපතිවරයාගේ ඇස් අරවන්න උත්සාහ කරමින් ඉන්නේ. අද යෝජනාවේ අරමුණත් ඒකයි ගරු කථානායකතුමනි. මේ යෝජනාවේ අරමුණ අන් කවරක්වත් නොවෙයි, ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කිරීමයි. ජනාධිපතිවරයා යටත් වන්නේ තමන්ගේ මනසේ හැඳෙන සිතුවිලිවලට නොවෙයි; තමන්ගේ මනසේ ඕපපාතිකව නිර්මාණය වන අදහස්වලට නොවෙයි. ජනාධිපතිවරයාට රිසි සේ හැසිරීම සඳහා බලයක් ලබා දීලා නැහැ ගරු කථානායකතුමනි. ඔහුගේ සීමා මායිම්, සීමා රාමු මොනවාද කියන එක නිශ්චිත ලෙස සඳහන් කොට තිබෙනවා. ඒ සීමා මායිම්, සීමා රාමු තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. එම නිසා ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කළ යුතුයි. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයෙක් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ නොවී කටයුතු කර තිබෙනවා නම්, සාමාන්‍ය පුරවැසියන්ට අපි කියන්නේ කොහොමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට යටත් වෙන්න කියලා? ගරු කථානායකතුමනි, මේ රටේ පුරවැසියන් හෙට සිවිල් නීති කැඩීමේ ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වුණොත්, ජනාධිපතිවරයාට මොකක්ද, තිබෙන අයිතිය සිවිල් නීති කඩන්න එපා කියලා කියන්න? ජනාධිපතිවරයා රටේ මූලික නීතිය කඩනවා නම්, මේ රටේ අනෙක් පුරවැසියන් නීතිය ආරක්ෂා කළ යුත්තේ කුමක් වෙනුවෙන්ද? ජනාධිපතිවරයා රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩනවා නම්, මේ රටේ රාජ්‍ය සේවකයන් නීතිය ආරක්ෂා කරන්නේ කුමක් වෙනුවෙන්ද? ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩනවා නම්, මේ රටේ පුරවැසියන් නීතියට යටත් වෙන්නේ කුමන වුවමනාව වෙනුවෙන්ද? එම නිසා ජනාධිපතිවරයා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රධාන බලධාරියා සහ ප්‍රධාන ආදර්ශකයා විය යුතු වන්නේ. හැබැයි, ප්‍රධාන බලධාරියා සහ ප්‍රධාන ආදර්ශකයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම කඩමින්, උල්ලංඝනය කරමින් කටයුතු කරනවා නම්, ව්‍යවස්ථාදායකයට පැවරී තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි ගරු කථානායකතුමනි, නැවත නැවතත් ජනාධිපතිවරයාගේ හිතුවක්කාරී, තක්කඩි ක්‍රියාමාර්ගය පෙන්වා දීමයි. ඒ සඳහා තමයි අද මෙම යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව ගෙන ඒම ඉතාම පැහැදිලිව ව්‍යවස්ථාදායකයට පැවරී තිබෙන කාර්ය භාරයක්. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට අවස්ථාව තිබෙන බව ඔබතුමා අද දැනුම් දුන්නා. ඒකට ස්තුතිවන්ත වෙනවා. ඒක එහෙම තමයි. මේ පාර්ලිමේන්තුවට තමයි රාජ්‍ය මූල්‍ය බලය පැවරී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මම දැක්කා, විශාල සංවාදයක් යනවා, මේ යෝජනාව අමාත්‍යාවරයෙකු ඉදිරිපත් කළ යුතුයි කියලා. හැබැයි, අපි කාරක සභා අවස්ථාවේදී අය වැය විවාදය පටන් ගන්නේ කොහොමද? කාරක සභා අවස්ථාවේදී විවාදය පටන් ගන්නේ, "යම් වැය ශීර්ෂයක මුදල් කපා හැරිය යුතුය" කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් යෝජනා කිරීමෙන්. ගරු කථානායකතුමනි, ඒ යෝජනාව අන්තිමට පරාදෙ වෙන එක වෙනම දෙයක්. හැබැයි, ගරු කථානායකතුමනි, අය වැය ලේඛනයෙන් යෝජනා කරලා තිබෙන අමාත්‍යාංශයක වැය ශීර්ෂයක යම් මුදලක් කපා හැරීම පිළිබඳව යෝජනාව ගෙනෙන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. කැබිනට් ඇමතිවරයෙක් මුදල් පිළිබඳ යෝජනා ගෙනෙන්න ඕනෑ කියලා තර්කයක් අද විතරක් මොකටද, ගෙනෙන්නේ?

අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ විවාදය පටන් ගන්න කොටම, "වැය ශීර්ෂයකින් රුපියල් 10ක් කපා හැරිය යුතුය" කියන යෝජනාව සම්ප්‍රදායයක් ලෙස ඉදිරිපත් කරන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඒක නිසා ඕනෑම මන්ත්‍රීවරයෙකුට අවස්ථාවක් තිබෙනවා, යම් වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න. අන්න ඒ ආදර්ශය අනුව යමින් තමයි අද අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ, අග්‍රාමාත්‍යවරයාගේ වැය ශීර්ෂය අත් නිටුවීමේ යෝජනාව. ඇයි, ඒ යෝජනාව ගෙනෙන්නේ, ගරු කථානායකතුමනි? අපේ රටේ අග්‍රාමාත්‍යවරයෙක් නැහැ. හැබැයි, අග්‍රාමාත්‍යවරයෙක් නැති වුණාට අග්‍රාමාත්‍යවරයාට ලැබී තිබෙන වරප්‍රසාද සහ අනෙකුත් හිමිකම් සියල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් භුක්ති විඳිනවා. ගරු කථානායකතුමනි, ඒක යුක්ති සහගතද?

මහින්ද රාජපක්ෂ මහත්තයාටත් හිමි විය යුතු වන්නේ මේ පාර්ලිමේන්තුවේ තවත් මන්ත්‍රීවරයෙකුට හිමි වෙන වරප්‍රසාද සහ

අයිනින් පමණයි. හිටපු ජනාධිපතිවරයා හැටියට ඔහුට යම් වරප්‍රසාද තිබෙනවා නම්, ඒවා වෙනම. හැබැයි, අග්‍රාමාත්‍යවරයෙක් ලෙස ඔහුට කිසිදු වරප්‍රසාදයක් සහ අයිතියක් හිමි නැහැ, ගරු කථානායකතුමනි. ඒක නිසා දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවට පත් වී තිබෙන මහින්ද රාජපක්ෂ මැතිතුමා, ඔහු විසින්ම ආවේශ වෙලා, ඔහු විසින්ම ලෝගුවක් කරේ දාගෙන, ඔහු විසින්ම චරිතයට පණ පොවලා, අග්‍රාමාත්‍ය තනතුරකට පණ පොවනවා. ගරු කථානායකතුමනි, අපට කමක් නැහැ, ඕනෑ නම් කඩුව ඉනේ ගහගෙන, ඔටුන්නක් ඔළුවේ දාගෙන සෙල්ලම් ගෙදරක අගමැති වුණාට. අපට ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගරු කථානායකතුමනි, රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට මේ කටයුතු කරන්නේ. වියදම් කරන්නේ මහා භාණ්ඩාගාරයේ සල්ලි; මේ රටේ මහජනයාගේ බදු සල්ලි. අග්‍රාමාත්‍යවරයෙකු නොවෙන කෙනෙක් අග්‍රාමාත්‍යවරයෙකුට පැවරී තිබෙන වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් මහජනයාගේ භාණ්ඩාගාරයෙන් වියදම් කරමින් තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුවට යුක්ති සහගත අයිතියක් තිබෙනවා, එම වැය ශීර්ෂය කප්පාදු කරන්න; ඒ වැය ශීර්ෂය නතර කරන්න. අන්න, ඒ වෙනුවෙන් තමයි මේ යෝජනාව ගෙනැත් තිබෙන්නේ.

මේ යෝජනාවෙන් නැවතත් අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට පෙන්වා දී තිබෙන්නේ මොකක්ද? ඔබතුමා විසින් මේ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන එකෙන් තව තවත් අර්බුදය දිග් ගස්සනවා. කරුණාකරලා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ව්‍යවස්ථාවට යටත් විය යුතුව තිබෙනවා. හැබැයි, ඒ වාගේම මම එක කාරණයක් මතක් කරන්න ඕනෑ. දැන් මේ අටවා ගන්නා ලද අග්‍රාමාත්‍යවරයාට ඒ බලතල සහ වරප්‍රසාද හිමි වෙන්නේ නැතුවා වාගේම හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්තයාට ඒ බලතල සහ වරප්‍රසාද අහිමි බවත් තේරුම් ගත යුතුව තිබෙනවා. -ඒකට නම් අත්පුඩිය නැහැ වාගේයි.- ඒක තේරුම් ගන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මොකද, ඒ වියදම් කොහොමද, කෙරෙන්නේ? මම දැක්කා, අරලියගහ මන්දිරයේ ඊයේ -[ඝෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාවක් තිබෙනවා. එම ප්‍රධාන ශාලාවේ- එක්සත් ජාතික පක්ෂ පළාත් පාලන මන්ත්‍රීවරුන් කැඳවලා තිබෙනවා. එතකොට ඒක දේශපාලන රැස්වීමක්. අපේත් පළාත් පාලන මන්ත්‍රීවරුන් කැඳවනවා. අපි කැඳවන්නේ අපේ පක්ෂ කාර්යාලයේ. ඔබතුමන්ලා සිරිකොතේ මන්ත්‍රීවරුන් කැඳෙව්වා නම්, අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඔබතුමන්ලා කැඳවන්නේ අරලියගහ මන්දිරයේ. එතකොට electricity bill කොහෙන්ද, ඒ ශාලා ගාස්තු කොහෙන්ද? ඒ කෑම-බීම? මම දන්නේ නැහැ, කෑම-බීම කොහොමද, දෙන්නේ කියලා. ඒවාට නම් අනුග්‍රාහකයෝ ඇති කියලා මම හිතනවා. [බාධා කිරීම්]

කෙසේ වුවත්, ගරු කථානායකතුමනි, දැන් රාජ්‍ය දේපොළ තැන් දෙකක පාවිච්චි වෙනවා. ගරු කථානායකතුමනි, දැන් මේ රටේ ජනතාවට වෙලා තිබෙන්නේ මේ රාජ්‍ය යන්ත්‍රණයත්, මේ දේශපාලන යන්ත්‍රණයත් නඩත්තු කරන්නයි. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාව ඒ සඳහා විශාල වැය බරක් දරනවා. ඒක අප විසින් දිගින් දිගටම පෙන්වා දෙනු ලැබුවා. මේ රටේ ජනතාව මේ ආණ්ඩුවක් නඩත්තු කරන්න මේ තරම් වැය බරක් දැරිය යුතු නැහැ. ඒක යුක්තිසහගත නැහැ. අපි එය අනුමත කරනවාද? මේ වාගේ කුඩා රාජ්‍යයක, මේ වාගේ කුඩා ආර්ථිකයක් තිබෙන රටක, මේ වාගේ ආර්ථික අර්බුදයක් තිබෙන රටක ආණ්ඩුවක් නඩත්තු කිරීම වෙනුවෙන් මේ රටේ ජනතාවගේ බදු මුදල් කොච්චර ප්‍රමාණයක් අපි වියදම් කළ යුතුද? ඒ නිසා අද අපට, මේ රටේ ජනතාවට, සිදු වී තිබෙනවා, ජනතාවගේ සහන, ජනතාවගේ ආර්ථිකය කෙසේ වෙතත්, ආණ්ඩුවක් නඩත්තු කරන්න; ආණ්ඩුවක් වෙනුවෙන් බදු ගෙවන්න. ආණ්ඩුවක බර කර ගහගන්න වෙලා තිබෙනවා, මේ රටේ ජනතාවට.

ගරු කථානායකතුමනි, එක ආණ්ඩුවක බර කර ගහන ජනතාවට, අගමැතිවරුන් දෙදෙනෙකුගේ බර කර ගහගන්න වුණොත්, ඇමතිවරුන් කණ්ඩායම් දෙකක බර කර ගහගන්න වුණොත්, මේ තත්ත්වය තවත් තීව්‍ර වෙනවා. එක අග්‍රාමාත්‍යවරයෙකුගේ බර කර ගහගත්තු රටේ ජනතාවට අද අගමැතිවරුන් දෙදෙනෙකුගේ බර කර ගහගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, එය කිසිසේත්ම යුක්තිසහගත නැහැ. මෙම යෝජනාවේ සදාචාර සම්පන්නභාවය එක්සත් ජාතික පක්ෂය අපේක්ෂා කරනවා නම්, මෙම යෝජනාව සම්මත වූ වහාම අරලියගහ මන්දිරයේ දේශපාලන වැඩ කටයුතු අනෙකුත් කටයුතු අත්හරින්න ඕනෑ. ඒක තමයි ශුද්ධභාවය. අගමැති නොවන මහින්ද රාජපක්ෂ මහත්මයාගේ වැය ශීර්ෂය කපනවා නම්, කපන්නවත් වැය ශීර්ෂයක් නැති හිටපු අග්‍රාමාත්‍යවරයාගේ නඩත්තුවීමත් අපි දැරිය යුතුද? ඒ නිසා මේ යෝජනාව සද්භාවයෙන් නම්, රාජ්‍ය මුදල් පිළිබඳව නම්, මහජනයාගේ බදු මුදල් අනිසි ලෙස වියදම් කිරීමට එරෙහිව සද්භාවයෙන් ගෙනෙන යෝජනාවක් නම්, යෝජනාව සම්මත වූ වහාම අරලියගහ මන්දිරයෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයාද ඉවත්ව යා යුතුයි කියලා අපි යෝජනා කරනවා. දැනට මුදල් කපන්නේ මේ කාරණය සම්බන්ධවයි. ඒ නිසා ඒ පිළිබඳව යෝජනා කරමින් ගරු කථානායකතුමනි, මුදල් පිළිබඳ සද්භාවයටත් - [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දෙකම වෙන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ දෙකම එකට. දෙකම එකට!

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පළමු කරුණ ඉස්සරවෙලා එන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කමක් නැහැ. ගරු කථානායකතුමනි, එක මොකක්ද, දෙක මොකක්ද කියන එකට වඩා මට වැදගත් මෙයයි. මේ මහජනයාගේ බදු සල්ලිවලින්, දෙපැත්තකින් -මූලස්ථාන දෙකකින්, ස්ථාන දෙකකින්- නඩත්තු වෙන එක නොකළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි මෙතැන ආණ්ඩුවට ව්‍යවස්ථානුකූලව යම් ප්‍රහාරයක් එල්ල කරනවා වාගේම, ජනාධිපතිවරයාට ව්‍යවස්ථාවට නැවත යටත් වෙන්න කියලා බලපෑමක් කරනවා වාගේම, රාජ්‍ය මුදල් භාවිත කරන්නේ කොහොමද කියන ආදර්ශයත් අපි ලබා දිය යුතු වෙනවා. ඒ කාරණාවත් සම්පූර්ණ වීම අපේක්ෂා කරමිනුයි මේ යෝජනාව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ සහාය ලබා දෙන්නේ. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවේ සඳහන් වුණා, අරලියගහ මන්දිරයේ වියදම් සම්බන්ධව. විශේෂයෙන් ඊයේ දින රැස්වීම ගැන. ඒ වියදම් අපියි දරන්නේ. ලයිට් බිල් වියදමත් අපියි දරන්නේ. හැකි තරම් අපේ පෞද්ගලික ආධාරකරුවන්ගේ මුදල්වලින් අපි ඒ වියදම් දරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අපි වාදයකට යන්නේ නැතිව-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ලොකු විවාදයකට යන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එහෙම නම් මම එතුමාගෙන් දැන ගන්න කැමැතියි, අරලියගහ මන්දිරය ඕනෑම කෙනකුට කුලියට ලබා දෙන හෝටලයක් වාගේ තැනක්ද කියලා. එපමණයි, මට දැන ගන්න ඕනෑ. එහෙම දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණට අවශ්‍ය නම් අපි ඒ අයටත් ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු රවුෆ් හකීම් මැතිතුමා.

[11.26 a.m.]

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Speaker, we listened to my Friend, the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, the learned President's Counsel and a controversial Minister in this illegal Government. I must put certain things in the correct perspective, though I am not at cross-purposes with the purpose with which he made that speech. But, certain matters have to be put in the correct perspective to clear the doubts that may arise in the minds of the general public of this country.

Firstly, Sir, he being a leading lawyer in the country and a long-time Legislator in this House knows the concept of separation of powers and that the three important institutions of the State, namely the Executive, the Parliament and the Judiciary, have their own competencies. The need to have a careful balance between the competencies of all these three institutions is the paramount objective of all law-abiding citizens. The office bearers of these institutions, those who hold office, have to be mindful of the fact that each do not trespass on the competency of the other. If that does not happen, none of these problems could have arisen. So, this happened little realizing that the Nineteenth Amendment was meant to curtail the powers of the Executive President in a certain manner.

I also, in the meantime, put in the matter that arose out of the Hon. Anura Dissanayake's contention of the Hon. Ranil Wickremesinghe occupying the Temple Trees. We say the decision by the President to remove the Hon. Ranil Wickremesinghe is *void ab initio* and that matter is now before the Supreme Court through another petition that has been filed and is to be supported soon. Therefore, we cannot come to the conclusion that the Hon. Ranil Wickremesinghe is illegally occupying the Temple Trees. He has been one who had always respected the verdict of the people and very honourably left the Temple Trees when the verdict of the people was otherwise. Here, when the Executive President has unlawfully and unconstitutionally removed the Prime Minister, it is the Hon. Ranil Wickremesinghe's contention and our contention too that he can remain there as the legal occupant unless the court holds otherwise. And I would dare say that we would even be willing to replenish all the damages or whatever the cost that might incur out of wrongful occupation of the Temple Trees, if the court holds otherwise.

So, Sir, on the issue of one institution of the State trespassing the competency of the other, we are in a very grave situation today. This has to be rectified. I fully understand the purpose underlying the statement by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe. We appreciate that. It is up to you, Sir, whether to consider such a reconciliation and bring to conclusion this unnecessary confrontation. You are not the first Speaker who has had to face such a difficulty; several of your predecessors had to face similar problems. Particularly after the enactment of the 1978 Constitution, we have had several instances where this House and the Executive were at each other's throat not knowing whose competency they were trampling upon.

Therefore, we can always reconcile these differences. But, the facts as to whether who unconstitutionally abused the powers that were sought to be conferred on them is a matter that we have to seek clarification from

the Judiciary. There is no other place than the Supreme Court of this country for us to go to seek interpretation of the Constitution. So, we have had to seek the intervention of the Supreme Court since, in the long list of constitutional violations, His Excellency the President sought to dissolve Parliament and since we consider that dissolution once again *void ab initio,* we have challenged it in court and we had no other alternative. Therefore, that is not a matter for judicial purview of the House. Of course, courts exercise judicial power through Parliament. But, that does not mean that we can just fold our arms and wait when the Executive takes a decision to dissolve Parliament totally unlawfully and unconstitutionally. Therefore, our resort to judicial remedy was totally justified in those circumstances.

Quite apart from that, if there is a move to reconcile the differences, we can always try and sort them out. Since you are the custodian of our rights, Sir, you are fully within your rights to negotiate and bring this to an acceptable solution since it has a severe impact on the economy. There has been no Government for the last 30 days in this country. There has been an illegal Government put in place and the purported Government does not have the guts to face the people and in the pretext of boycotting this House, they are turning their backs on the people of this country. I consider the Hon. Mahinda Rajapaksa also as a great democrat and he himself knows through his own conscience what he is doing is wrong. These two people, the Hon. Ranil Wickremesignhe and the Hon. Mahinda Rajapaksa, had been longstanding Hon. Members of this august Assembly since the '70s. Who came first and who came last is not the issue. But the fact is, both of them have had sufficient experience within the House to know the basic tenets of the law and the basic positions enunciated by the Constitution.

Therefore, Sir, putting those matters in the right perspective, I urge you to act according to your conscience in resolving this unnecessary confrontation that has arisen because of the illegal, unconstitutional actions that had been taken by certain bearers of constitutional office.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු බිමල් රත්නායක මැතිතුමා.

[ප.භා.11.36]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අනුව මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍ය තනතුරට නිමි රාජ්‍ය මුදල් දැන දැන අවභාවිත කිරීමක් සිදු කර තිබෙනවා. ඔහු මේ රටේ හිටපු ජනාධිපතිවරයෙක්; හිටපු අගමැතිවරයෙක්. එතුමා මේ ගරු සභාවේදීම කිව්වා, එතුමා කුඩා කල සිටම පාර්ලිමේන්තුවේ හිටියා කියලා. ඒ නිසා එතුමා හොඳින්ම දන්නවා එතුමා මේ කරන්නේ නීති විරෝධී දෙයක් කියලා. ඒ නිසා එතුමා රාජ්‍ය මුදල් දැන දැන අවභාවිත කිරීමක් කර තිබෙනවා ඔක්තෝබර් 26 සිට අද දක්වා. ඒ නිසා මේ යෝජනාවට අනුව අදින් පටන් ගත්තාට පස්සේ මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාගේත්, ඒ නීති විරෝධී, අනීතික ආණ්ඩුවේ "ඇමතිවරුන්" කියලා හඳුන්වා ගන්නා අනෙකුත් මන්ත්‍රීවරුන්ගේත් මුදල් කප්පාදු කිරීමට ජනතා විමුක්ති පෙරමුණේ අපි සහයෝගය ලබා දෙනවා; ඒකට ඉදිරිපත් වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මුදල්වලට වඩා මේවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ පොදුජන පෙරමුණේ තනතුරු නොවෙයි. මේවා මේ රටේ තනතුරු. මේ රටේ තනතුරු තමයි අද මේ වන විට යම් මන්ත්‍රී කණ්ඩායමක් බලහත්කාරයෙන්, වැරැදි බව දැන-දැන පාවිච්චි කරන්නේ. ගරු කථානායකතුමනි, නොදැන කරන වැරැදිවලට වඩා දැන-දැන කරන වැරැදි බලවත්. මේ මුදල් කප්පාදු කිරීම අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසායි. මා නැවත කියනවා, අද මේ දූෂිත, තක්කඩි ආණ්ඩුව බලයේ ඉන්නේ, තවමත් බලය අල්ලාගෙන ඉන්නේ කිසි බලයකින් නොවෙයි කියලා. මෙය සිද්ධ වුණු දවසේම ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි කිව්වා, "මේක අපි පරද්දනවා"යි කියලා. මොකද, පක්ෂයක් වශයෙන් අපි යම් දෙයක් පිළිබඳව නිකම් විසඳුම්, තීරණවලට එන්නේ නැහැ. අපි ගැඹුරින් සාකච්ඡා කරලා, එහි අනාගතය දැකලා තමයි මැදිහත් වෙන්නේ. අපි කිව්වා, "මේක වැරැදියි" කියලා. අපි කිව්වා, "මේක පරද්දනවා"යි කියලා. දැනට මේ ක්‍රියාව අධිකරණයේදී අර්ධ වශයෙන් පැරදිලා තිබෙනවා, ව්‍යවස්ථාදායකයේ දිගටම පරදිනවා, පරද්දලා තිබෙනවා, ජනතාව අතර පැරදිලා තිබෙනවා, ඒ වාගේම ලෝකයේ රටවල් අතර පැරදිලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.

දැන් කියනවා නේ, බටහිර රටවල්වලින් තමයි මේ ක්‍රියාවට විරුද්ධවෙලා තිබෙන්නේ කියලා. බටහිර රටවල් සම්බන්ධ ප්‍රශ්නය අපි වෙනම සාකච්ඡා කරමුකෝ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඉතා මිත්‍රශීලී රටක් තමයි ස්වාසිලන්තය. දැන් ස්වාසිලන්තය මෙය පිළිගෙන තිබෙනවාද? මාලදිවයින මෙය පිළිගෙන තිබෙනවාද? මේ කුමන්ත්‍රණයට දවස් 5කට කලින් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සීෂෙල්ස් රටට ගියා. ඒ රට මෙය පිළිගෙන තිබෙනවාද? දකුණු ආසියාවේ එක රටක් හෝ පිළිගෙන තිබෙනවාද? පිළිගෙන නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, මෙය අධිකරණය තුළ, ව්‍යවස්ථාදායකය තුළ, ජාත්‍යන්තරය තුළ විතරක් නොවෙයි, ජනතාව තුළත් පැරදිලායි තිබෙන්නේ. මා කියන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේදී මේ රටේ ජනතාවගේ හෘදය සාක්ෂිය කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාගේ හෘදය සාක්ෂියට වඩා අඩු ගණනේ එක අඩියක් හෝ ඉස්සරහින් තිබෙනවා. මොකද, සමහර අය කියනවා නේ, "ජන මතය තිබෙනවා, රාජපක්ෂට මිනිස්සු කැමැතියි" කියලා. නමුත් අපි පැහැදිලිව කියන්න කැමැතියි, රටේ ජනතාව කුමාර වෙල්ගම මහත්මයාට වඩා අඩුම ගණනේ අඩියක් ඉස්සරහින් ඉන්නේ කියලා. මේ ක්‍රියාව ජනතාව තුළත් පැරදිලායි තිබෙන්නේ. එහෙම නම් අද බලයේ ඉන්නේ කොහොමද? අද මේ ඇමති ධුර දරන්නේ කොහොමද? අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑකම තිබෙනවා, මේ ඇමති ධුර දරන්නේ "කළු මාධ්‍ය ජාලයක" බලයෙන් කියලා. රාජපක්ෂලා හදපු, ඒ මත යැපෙන මෛත්‍රීපාල සිරිසේන එක්ක බිස්නස් කරන කළු මාධ්‍ය ජාලයක බලයෙන් තමයි අද මේවා කරන්නේ.

දැනුත් SMS alert එන්නේ කොහොමද? දැනුත් alert එන්නේ කොහොමද? "අමාත්‍ය" කියලා. දැනුත් alert එන්නේ එහෙමයි. ගරු කථානායකතුමනි, මේ රටේ දූෂිත, තක්කඩි, නීති විරෝධී පාලනය වුවන්නේ ඔය එහාට මෙහාට පනින සහ පනින්න

[ගරු බිමල් රත්නායක මහතා]

ඉන්න කට්ටිය මත නොවෙයි කියන එක අද අපට හරි පැහැදිලියි. ඒ පාලනය දුවන්නේ තනිකරම කළු මාධ්‍ය ජාලයක බලයෙන්. ජනාධිපතිවරයා මේ වැඩසටහන පටන් ගත්තේ කුමක් වෙනුවෙන්ද? ගරු කථානායකතුමනි, අපේ රටට මේ කුමන්ත්‍රණයෙන් ලැබී තිබෙන ප්‍රතිඵලය මොකක්ද?

රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව මේ පාර්ලිමේන්තුවට පොරොන්දු වෙලා තිබෙනවා, හම්බන්තොට වරාය විකුණන්න කලින් ඒ බදු ගිවිසුම පිළිබඳ සාකච්ඡා කරනවා කියලා. ඒ පොරොන්දුව කඩන වේලාවේවත් "මම හම්බන්තොට වරාය විකිණීම නතර කිරීමට තමයි මේක කළේ" කියලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිව්වා නම් අඩු ගණනේ අපට ටිකක් පිළිගන්න පුළුවන්, හිතන්න තිබුණා විකුණා ගන්න පුළුවන් බොරුවක් කියනවා කියලා. එතුමා විධායක බලතල කිසිවක් රට වෙනුවෙන් පාවිච්චි කළේ නැහැ. එතුමාගේ විධායක බලතල රට වෙනුවෙන් වැදගත් දෙයකට පාවිච්චි වුණේ නැහැ. ගරු කථානායකතුමනි, එතුමා විධායක බලතල පාවිච්චි කළේ මොකටද? SriLankan Airlines එකේ කජු නරක් වුණාම, ඒ කජු සැපයුම්කරුවා එළවන්න පාවිච්චි කළා. මේ පාර්ලිමේන්තුවේ හිටපු වැදගත් මහ ලේකම්වරියක් -මම හිතන විධියට ලංකාවේ පාර්ලිමේන්තුවේ පළමුවැනි මහ ලේකම්වරිය- වන ප්‍රියානි විජේසේකර මැතිනිය- ඔස්ට්‍රියාවේ තානාපති වශයෙන් පත් කළා. ජනාධිපති ඔස්ට්‍රියාවේ තානාපති කාර්යාලයට ටෙලිෆෝන් කරද්දී, එතුමිය සහ ඒ කාර්ය මණ්ඩලය ටෙලිෆෝන් එකට කථා කළේ නැහැ කියලා ඒ තානාපතිවරිය පමණක් නොවෙයි, ඒ ඩ්‍රයිවර්ස්ලාත් ලංකාවට ගෙන්නුවා. ඔන්න ජනාධිපති විධායක බලතල පාවිච්චි කරපු දෙවැනි අවස්ථාව. ඊට පස්සේ එතුමා තව මොනවාටද විධායක බලතල පාවිච්චි කළේ? 'සිංහරාජයේ අලි දෙදෙනෙක් ඉන්නවා, ඒ අය එතැනට ප්‍රශ්නයක්' කියලා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියද්දී, එම අලි දෙදෙනා සිංහරාජයේම තියන්න විධායක බලතල පාවිච්චි කළා. වෙන මොනවාටද ගරු කථානායකතුමනි, එතුමා විධියක බලතල පාවිච්චි කළේ? රටේ ආරක්ෂාව වෙනුවෙන්, ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම නතර කරන්න, හම්බන්තොට වරාය බදු දීම නතර කරන්න -ඒ එකකටවත් - ඒ බලතල පාවිච්චි කළේ නැහැ. තව දෙයකට විධායක බලතල පාවිච්චි කළා. ඒ තමයි, හොරු රකින්න. එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඉවත් කළේ මොකටද?

දරුවන් එකොළොස්දෙනෙක් පැහැරගෙන ගිහිල්ලා කප්පම් ඉල්ලපු අය ඉන්නවා. මෙය යුද්ධයට සම්බන්ධ කථාවක් නොවෙයි. යුද්ධය වෙනුවෙන් වුණත් එහෙම කරන එක වැරදියි. කප්පම් ගන්න ඒ දරුවන් පැහැර ගන්න කටයුතු කරපු අය ආරක්ෂා කිරීමට තමයි විධායක බලතල පාවිච්චි කළේ. මොකක්ද ඒ වෙලාවේ කළේ? සැකකරු අත්අඩංගුවට ගන්න කියලා උසාවි නියෝගයක් ලබාදී තිබියදී -අධිකරණයේ ඒ විනිශ්චයකාරතුමන්ලාට කොන්දක් තිබීම ගැන අපි සතුටු වෙනවා- ජනාධිපතිගේ විශේෂ නියෝජිතයා වශයෙන් ඔහු මෙක්සිකෝවට යැව්වා, මීට මාසයකට කලින්. එහෙමයි ගරු කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තමන්ගේ විධායක බලතල පාවිච්චි කළේ.

දැන් අපට පෙනෙනවා 'ඩීල්' එකක් පටන් ගෙන තිබෙන බව. ගරු කථානායකතුමනි, මීට සතියකට දෙකකට කලින් අපි දැක්කා, පිළිකාවක් වාගේ මන්ත්‍රී කණ්ඩායමක් මෙහි ඉන්න බව. මේ පාර්ලිමේන්තුව අධම තත්ත්වයට පත් වෙලා. උදයට පනින, සවසට පනින, රෑට පනින අමු තක්කඩි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක වුණේත්, මන්ත්‍රීවරුන්ට පක්ෂ මාරු කළ නොහැකියි කියන සංශෝධනය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවස්ථාවේ ගෙන ඒමට නොහැකි වූ නිසා. එය ඒ සංශෝධනවල තිබුණා. දෙගොල්ලෝ කථා කරලා එය ඉවත් කර ගත්තා. අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නැවත ඒක ගෙනාවා. මේ අය උදේට පනිනවා, හවසට පනිනවා. අද සමහර අයට කියනවා එයාගේ සීයා ඒ කියන "ජාතියේ" එක්කෙනාගේ නොවෙයි "අශ්වයාගේ" කියලා. එහෙම කියනවා. අද රටේ මිනිස්සු තමයි එහෙම කියන්නේ; මන්ත්‍රීවරු නොවෙයි. දැන් ඊට වඩා කෙනෙක් පනින්න ලෑස්ති වෙලා ඉන්න බව පෙනෙනවා. ඒ ගොල්ලන්ගේ සීයලා කැන්ගරුද කියලා සොයාගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපි මිනිසුන්ට ගරු කරනවා. මිනිසුන්ගේ දේශපාලන ප්‍රතිපත්ති සම්බන්ධ අපේ විවේචන තිබෙන්න පුළුවන්. නමුත් අපි මිනිසුන්ගේ පෞරුෂයට, පෞද්ගලිකත්වයට ගරු කරනවා. ඔවුන් දරන දේශපාලන අදහස් කුමක් වුවත් අපි ගරු කරනවා. නමුත් මේ මොකක්ද? මේ පිළිකාවක්නේ. ගරු කථානායකතුමනි, අපට ප්‍රශ්නයක් නැහැ ආණ්ඩුවක් කඩා ගන්න පනින එක ගැන. නමුත් මේ කඩලා තිබෙන්නේ මේ මාතෘ භූමියේ ප්‍රතිරූපය. දැන් එහාට මෙහාට පැනලා තමන්ගේ වැරදි නිවැරදි කරගන්න කථා කරන උදවියත්, තව එන්න ඉන්න කට්ටියත් -දෙපැත්තටම- මාස දෙකක් තිස්සේ මේ රටට කරපු damage එකට, විනාශයට ගෙවන්නේ කොහොමද? තමන් පනින්න ගත්ත සල්ලිවලින් මේ වෙච්ච විනාශය වෙනස් කරන්න පුළුවන්ද? ගරු කථානායකතුමනි, අපට තිබෙන ප්‍රශ්නය ඒකයි. අපි ඒකයි කියන්නේ සහමුලින්ම මෛත්‍රීපාල සිරිසේන මහතා එතුමාගේ වැරැද්ද නිවැරදි කර ගත යුතුයි කියලා. එතුමා ජාතියෙන් සමාව ගත යුතුයි. මම මේ කියන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව එළවපු එක ගැන නොවෙයි. ඒක කොහොමත් එළවන්නට තිබ්බ ආණ්ඩුවක්, ඡන්දයකදී. නමුත් ජනාධිපතිවරයා දෙවැනි වතාවේත් ජනාධිපති ධුරයට පත් වීම සඳහා කරපු කුමන්ත්‍රණය හේතුවෙන් මේ රටේ ආර්ථිකයට, ප්‍රතිරූපයට, ලෝකය ඉදිරියේ අපට වෙච්ච හානියට, වෙච්ච අලාභයට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ගෙවනවාද? එහේට මෙහේට පැනිලිවලින් ඒ හානිකර තත්ත්වය වෙනස් වෙනවාද? ඒ තත්ත්වය වෙනස් වෙන්නේ නැහැ ගරු කථානායකතුමනි. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් යම් කිසි ගරුත්වයක් ඇති වුණා, මේ පාර්ලිමේන්තුවේ වැඩි මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඒ විකිණෙන බිස්නස් එකට ගියේ නැති නිසා.

මම දන්නේ නැහැ, ඉන්න සල්ලි ගත්තාද නැද්ද කියලා. නමුත්, විකිණුණා කියලා අපට පෙනුණු ප්‍රමාණය විකිණුණු ප්‍රමාණයට වඩා අඩුයි. ඒ වාගේම ඔබතුමාගේ ක්‍රියාමාර්ගයත් අපි අගය කරනවා. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. නමුත්, ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ගය අපි අගය කළා. ඔබතුමා මේ ගරු සභාවට පොලිස් ආරක්ෂාව මැද්දේ ඇවිල්ලා පාර්ලිමේන්තුවේ උත්තරිතරභාව රකිනකොට, අද මේ පනින්න ඉන්න පුද්ගලයෝ හිටියේ කොතැනද? ඒ ත්‍රස්තවාදී අමු කැත වැඩේට දායකත්වය දක්වමින් ගරු කථානායකතුමනි. එක්සත් ජාතික පක්ෂයට ඒ අයව එකතු කරගෙන රෙදි ඇඳගෙන - රෙදි නැතිවද මම දන්නේ නැහැ- ආණ්ඩු හදා ගන්න පුළුවන් නම්, ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. මම කියන්නේ එක්සත් ජාතික පක්ෂයට දැන් කුමාර වෙල්ගම කෙනෙක් ඕනෑ. අපිට නම් රෙදි ඇඳගෙන ඒ වාගේ අයත් එක්ක ආණ්ඩු කරන්න බැහැ. ඔබතුමාට ආණ්ඩුවක් හදා ගන්න තිබෙන අයිතිය ගැන නොවෙයි අපි මේ ප්‍රශ්න කරන්නේ. කුමාර වෙල්ගම කෙනෙක් එක්සත් ජාතික පක්ෂයේ නැද්ද, කියන්න.

ගරු කථානායකතුමනි, අපි කියන්නේ ඒ නිසා වහාම මේ පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් හරි විශේෂ කාරක

සභාවක් හරි පත් කරන්න ඕනෑ කියලායි. මේකේ balance එක රකින්න අවශ්‍යතාවක් නැහැ, තක්කඩියොත් එක්ක. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙය සහමුලින්ම ජනාධිපතිතුමා විසින් කරන ලද ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී, රාජ්‍ය විරෝධී ක්‍රමන්ත්‍රණයක්. මම ජනාධිපති නීතීඥයෙක් නොවෙයි. මම නීතීඥයෙක්වත් නොවෙයි. නමුත්, මේ කුමන්ත්‍රණයේ මුල් කාලයේ දී මේ ගැන අර්ථ දක්වද්දි, සාමාන්‍ය තරුණ ළමයි Facebook එකේ දාලා තිබෙන අදහසක් මා දැක්කා. දෙපැත්තේ නීතීඥයන් ව්‍යවස්ථාව අර්ථ දක්වන විධියට හිතෙනවා කියලා, හිරේ ඉන්න අයගෙන් සියයට 90ක්ම හිරේ ඉන්නේ වැරදියට කියලා. ගරු කථානායකතුමනි, මම අහලා තිබෙනවා උසාවියේ කටයුතුවලදී සාමාන්‍යයෙන් ජනාධිපති නීතීඥයන්ට කියන්නේ PC කියලා. එතකොට සාමාන්‍යයෙන් බලවත් පුද්ගලයන් වෙනුවෙන් PC කෙනෙක් ඉදිරිපත් වෙනවා. දුප්පත් පුද්ගලයන් වෙනුවෙනුත් PC කෙනෙක් ඉදිරිපත් වෙනවා, ඒ තමයි පොලිස් කොස්තාපල්. අනෙක් පැත්තෙන් ඉදිරිපත් වෙන්නේ President's Counsel. හැබැයි, දැන් මට හිතෙනවා, President's Counsel කියන එකේ; PC කියන එකේ ඇත්ත තේරුම ඒකත් නොවෙයි කියලා. එහි ඇත්ත තේරුම "පනින කවුන්සල්" කියලා මට හිතෙනවා. ගරු කථානායකතුමනි, අපි නීතීඥයන් නොවෙයි. අපට තේරෙන්නේ සාමාන්‍ය හොඳ නරක විතරයි. ඒක අපේ අම්මලා, තාත්තලාගෙන්, අපේ පක්ෂයෙන්, අපේ පාසල්වලින්, අපේ රටේ සාමාන්‍ය පුංචි මිනිසුන්ගේ හෘද සාක්ෂියෙන් අපි ඉගෙන ගත් දේවල්. අපට විකිණෙන්නේ නැතිව කොන්දක් තියාගෙන කෙළින් කථා කරන පෞරුෂය ලැබිලා තිබෙන්නේ ඒ අයගෙන්.

මේ ව්‍යවස්ථා විරෝධී කුමන්ත්‍රණය අද සමාජගත වෙලා තිබෙන්නේ කොහොමද?

අද ජනමාධ්‍යයෙන් -කළු මාධ්‍ය වළල්ලෙන්- මේ කරපු වැරැද්ද තමයි සාධාරණීකරණය වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මාසයක විතර කාලයක් හෝ වෙන් කරලා, රටේ උගතුන් පාර්ලිමේන්තුවට කැඳවා සාකච්ඡා කරන්න. හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් කැඳවන්න. දැන් ඉන්න ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් ගෙන්වන්න බැරි නිසා. අර මෛත්‍රීපාල මහත්මයාට වඩා නිවැරදි නීති උපදෙස් ලබා දුන් කෙනා වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] එයා ගැන තමයි මම කිව්වේ. මේ රටේ දැවැන්ත සාකච්ඡාවක් පාර්ලිමේන්තුව මැදිහත් වෙලා ඇති කරන්න ඕනෑ. පාර්ලිමේන්තු කාරක සභා ඇති කරලා, රටේ උගතුන් කැඳවා එවැනි සාකච්ඡාවක් කරන්න ඕනෑ. අපට නොවෙයි. මේ රටේ විශිෂ්ට උගතුන්ට අවස්ථාවක් දෙන්න ඕනෑ, මේ කුමන්ත්‍රණය ව්‍යවස්ථානුකූලව කොතරම් වැරදිද කියලා සාකච්ඡා කරන්න. අපේ රටේ නීති විද්‍යාලයේ උගන්වන්න පටන් ගන්න ඕනෑ කියලා අපි යෝජනා කරනවා, මේ කුමන්ත්‍රණය ව්‍යවස්ථානුකූලව කොතරම් වැරැදිද කියලා. අපි කියන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන මහතා සමඟ අපට නම් මේ ප්‍රශ්නය සම්බන්ධව කථා කරන්න දෙයක් නැහැ. මේ පූර්වාදර්ශය සදහටම, සදහටම delete කරන්න ඕනෑ. සදහටම මේක බිංදුවට ගෙනෙන්න ඕනෑ. මේක හරියට හිට්ලර්ගෙන් පස්සේ ජර්මනියේ පටන් ගත්ත "denazification" කියන overall campaign එක වාගෙයි. එම denazification campaign එක නීතියට ගෙනාවා; පොලීසියට ගෙනාවා; පාසලට ගෙනාවා; විශ්වවිද්‍යාලයට ගෙනාවා. ගරු කථානායකතුමනි, ඔබතුමා මට වඩා හොඳින් ඒ ගැන දන්නවා. මොකද, ඔබතුමා ජර්මනියේ හිටපු තානාපතිවරයෙක්. ඒ වැරැද්ද සහමුලින්ම ජනගත කළා. දරුවන්ගේ ඥානවලට ඇතුළු කළා. ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. අපට හඳුන්වා දුන් මේ පූර්වාදර්ශය, මේ කුමන්ත්‍රණය කළේ කවුද? පාර්ලිමේන්තුවේ බලය නැති කුලියට ජනාධිපතිකම කරන ජනාධිපති කෙනෙක්. කුලියට කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ ඡන්දවලින් සහ සියයට 50ක් තමන්ට අයිති නොවන ඡන්දවලින් ජනාධිපති වෙච්ච කෙනෙක් මේ. ඒ කියන්නේ, මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති ධුරයට පත් වුණා වාගේ හෝ චන්ද්‍රිකා මැතිනිය පත් වුණා වාගේ නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනාධිපති ධුරය. එතුමා ඒක කළේ, කුලියට. ඒක, එතුමාගේ හයියෙන් ගත්ත එකක් නොවෙයි. අඩු ගණනේ සියය 90ක්? එහෙම ජනාධිපති කෙනෙකුට විධායක බලතල පාවිච්චි කරලා රටට මෙහෙම හානියක් කරන්න පුළුවන් නම්, දැනට ලබා දී තිබෙන මේ පූර්වාදර්ශය ජනතාවගේ මනසින් -අපේ මනසින් පවා- සහමුලින්ම ඉවත් කළේ නැත්නම් මොකද වෙන්නේ? මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපති ධුරයේ විධායක බලතල අහෝසි කරන්න අපට බැරි වුණොත්, ඊළඟට ජනාධිපතිවරයෙක් ආවොත් ඔහු පාර්ලිමේන්තුවේ බලයත් එක්ක කුමන දේ නොකරයිද? කුමන දේ නොකරයිද?

ගරු කථානායකතුමනි, මොවුන් පාවිච්චි කරන්නේ මොකක්ද කියලා ඔබතුමා දන්නවා. 2015 ජනවාරි 09වැනි දා රනිල් වික්‍රමසිංහ මහත්මයාට අගමැතිකම දුන්නු ආකාරය. දේශපාලන සදාචාරයට අනුව ඒක වැරදි බව අපි දන්නවා. ඒ වෙලාවේ නීතියට අනුව එකඟ වෙන්න පුළුවන්. නමුත්, ඒක තමයි මොවුන් පාවිච්චි කරන්නේ. ඒ වෙලාවේ වුණත් ඒකට නිසි ලෙස විරෝධයක් පළ වුණා නම්, ඒක වෙන විධියකට කර ගන්න තිබුණා; පාර්ලිමේන්තුවේ අනුමැතියෙන් කර ගන්න තිබුණා. රාජපක්ෂලා ඒ වෙලාවේ මැදමුලන ඉල්ලුවත් දෙනවා. ඒ නිසා රාජපක්ෂලා විරුද්ධ වුණේ නැහැ.

නමුත් අපි කියන්නේ, ප්‍රධාන වශයෙන් මේ පූර්වාදර්ශය සහමුලින් අතුගා දමන්න ඕනෑ කියලායි. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස. මේ dust එක settle වුණාම, මේ නීති විරෝධී තත්ත්වය සමනය වුණාට පසුව, පාර්ලිමේන්තුවේ යම් කිසි සංයමයක් ඇති වුණාට පසුව ඔබතුමා විශේෂ තේරීම් කාරක සභාවක් පත් කරලා, මේ රටේ නීතිය විනාශ වුණේ කොහොමද, ව්‍යවස්ථාව විනාශ වුණේ, පාර්ලිමේන්තු සම්ප්‍රදාය විනාශ වුණේ කොහොමද කියන එක පිළිබඳව හොඳ අධ්‍යාපනයක් රටට ලබා දිය යුතුයි.

දෙවනුව, රටට වුණු අලාභය. ගරු කථානායකතුමනි, රටට වුණු අලාභය දැන් ගෙවන්නේ කොහොමද? අරලියගහ මන්දිරයේ කරන අලාභය පමණක් නොවෙයි. ලෝකය ඉස්සරහ අපේ මාතෘ භූමියට තිබුණු ජාත්‍යන්තර ප්‍රතිරූපය අද අහිමි වීමේ අලාභය අපි ගෙවන්නේ කොහොමද ? අපි කියන්නේ, මුදල්මය සහ දේශපාලන වශයෙන් එය තක්සේරු කළ යුතුයි කියලායි. තක්සේරු කරලා, මේ කුමන්ත්‍රණයට දායක වුණු මෛත්‍රීපාල සිරිසේනගේ සිට, උපදෙස් දුන් අයගේ සිට, අද හෙට මෙහාට පනින්න හදන කට්ටියගෙන් පවා ඒ මුදල් අය කර ගත යුතුයි, ගරු කථානායකතුමනි. දැන් මේ අහෝසි වුණු සංචාරකයන්ගේ පැමිණීම, මාතෘ භූමියේ නම කැත වීම, ඒවා අපි නැවත උපයා ගන්නේ කොහොමද? ඒ නිසා, අන්න ඒ වෙනුවෙන් කාරක සභා දෙකක් පත් කරලා, පැහැදිලිවම මේ පූර්වාදර්ශය සහමුලින් අහෝසි කරන්න, ජනතාව දැනුවත් කරන්න කටයුතු කරන්න කියලා අපි යෝජනා කරනවා. ඊළඟට, මේ සිදු වුණු අලාභය මේ නීති විරෝධී කටයුත්ත කරපු පුද්ගලයන්ගෙන් අය කර ගන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ සටනේ දී අපි වැදගත්ම දෙය විධියට දකින්නේ මෙයයි. මේ රටේ නීතියට සහ ව්‍යවස්ථාවට අනුකූලව මෙය විසඳෙන්න ඕනෑ බව අපි කියන්න කැමැතියි. අපට පෙනෙනවා, දැන් එක්සත් ජාතික පක්ෂය - එළියේ යම් යම්

[ගරු බිමල් රත්නායක මහතා]

සාකච්ඡා කරන එක ගැන නොවෙයි මම කියන්නේ. එක්සත් ජාතික පක්ෂය දැන් මේ වැරැද්ද ජනගත කරන්න නොදී අතරමඟ, පිටස්තර ක්‍රියාමාර්ග හරහා, වෙන වෙන deal හරහා බේරා ගන්න හදන බව අපට පෙනෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ක්‍රමය ඒක වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දකින්න ඇති මේ රටේ අති විශිෂ්ට කලාකාරිනියන් පිරිසක්, උගත් කලාකාරිනියන් පිරිසක් ඊයේ තෙමේ තෙමේ ජනාධිපති ලේකම් කාර්යාලයට ගියා. ඒ, කාන්තාවන් පිරිස - මේ රටේ අම්මලා - තෙමේ තෙමේ ජනාධිපති ලේකම් කාර්යාලයට ගිහිල්ලා මොකක්ද කිව්වේ? UNP එකට ආණ්ඩුවක් හදලා දෙන්න කියලා නොවෙයි, ඒ අය කිව්වේ. මේ මාතෘ භූමියේ නම කෙළෙසන්න එපා කියලායි කිව්වේ. ගරු කථානායකතුමනි, ඔබතුමා පොලිස් ආරක්ෂාව මැද මෙතැනට ඇවිල්ලා මොකක්ද කළේ? මම විශ්වාස කරනවා, එක්සත් ජාතික පක්ෂයේ ඉන්න වෙනත් කිසිම මන්ත්‍රීවරයෙක් ඔය පුටුවේ හිටියා නම් ඒක කරන්නේ නැහැ කියලා. අගමැති වෙන්න හිතන් ඉන්න කෙනෙක්වත් ඔබතුමාගේ පුටුවේ හිටියා නම් ඕක කරන්නේ නැහැ. දැන් අගමැති වෙන්න එක්සත් ජාතික පක්ෂයේ පොරයක් තිබෙනවා නේ. [බාධා කිරීමක්] නැත්නම් ප්‍රශ්නයක් නැහැ. අපට කමක් නැහැ, කවුරු කර ගත්තත්. ඔබතුමා එහෙම කළේ ඇයි? මේ රටේ අම්මලා, මේ රටේ ජනතාව, මොකටද මේ මහන්සි වෙන්නේ? මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක කෑම මේසයේ සාකච්ඡාවක් කරලා මේ ප්‍රශ්නය ගොඩින් බේරා ගන්නද? නැහැ. මේක සහමුලින්- එතුමා නීත්‍යානුකූල ජනාධිපති. ඒක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපි කියන්නේ, මේ වැරැද්දට එතුමා ගෙවන්න ඕනෑ කියලායි. මේ වැරැද්ද එතුමා පිළිගන්න ඕනෑ. එතුමා ජාතියෙන් සමාව ගන්න ඕනෑ. රටට කරපු හානියට අනිවාර්යයෙන්ම මුදලින් ගෙවන්න ඕනෑ, මෛත්‍රීපාල සිරිසේනගේ සිට රාජපක්ෂ ඇතුළු සියලු දෙනාම. අන්න ඒ කටයුත්ත අපි අවධාරණය කරමින්, මේ යෝජනාව නැවත වතාවක් ස්ථිර කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු බිමල් රත්නායක මැතිතුමනි.

මීළඟට, ගෞරවනීය අතුරලියේ රතන නාහිමිපාණන් වහන්සේ.

[පූ.භා. 11.55]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේත් රටේත් විශාල ව්‍යාකූලත්වයක් තිබෙන මොහොතක සුළු වෙලාවක් හෝ මට කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම මම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. දෙවනුව, මේ වර්තමාන පාර්ලිමේන්තුව ගොඩ නැඟීමේදී එවකට පැවැති රජය පරාජය කොට අලුත් රජයක් ස්ථාපිත කිරීම සඳහා මා දරපු ප්‍රයත්නය පිළිබඳව සියලු දෙනා තුළම ගරුත්වයක් ඇතැයි කියා මා විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි. ඒ වෙලාවේ, මේ අද කථා කරන සමහරු කථා නොකරන තත්ත්වයක් තුළ එදා විශාල අභියෝගයක් භාර අරගෙන එක්සත් ජාතික පක්ෂය සමඟ අප සියලුදෙනාම එකතු වෙලා අලුත් ජනාධිපතිවරයෙක් පත් කර ගැනීම සඳහා විශාල කැප කිරීමක් කළා. මා හිතන විධියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා වීමට ප්‍රථම අමාත්‍යවරයෙක් හැටියට එතුමාටත් හඬක් තිබුණා. ඒ වාගේම අපට තිබුණු සමාජ මතය, පිළිගැනීම, පක්ෂයක් විධියට; ජාතික හෙළ උරුමය විධියට, භික්ෂූන්වහන්සේ නමක් හැටියට ඒ සියල්ලම පරිත්‍යාග කරලා තමයි මේ වර්තමාන ජනාධිපතිවරයා බලයට පත් කර ගැනීම සඳහා අපි පියවර ගත්තේ.

පසුගිය ආණ්ඩුව කාලයේ මුළු කොළඹ නගරයම කැසිනෝ කලාපයක් බවට පත් කරන්න ගැසට් පත්‍රයක් නිකුත් කළා. ඒ වෙලාවේ, ඒකට විරුද්ධව එදා ආණ්ඩුවේ ඉඳගෙන නිර්භීතව ඡන්දය දුන්නේ මම පමණයි. මම ඒකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා; ඒකට විරුද්ධව කථා කළා. ඒ වාගේම ගිය ආණ්ඩුව කාලයේ තිබුණු යම් යම් ව්‍යාපෘති ගැනත්, ජාවාරම්කාර සමාගම්වලට ඉඩම් දීමට විරුද්ධවත් ආණ්ඩුව තුළ ඉඳගෙන මගේ ස්ථාවරය ඉතාම නිර්භයව මම ප්‍රකාශ කළා, ගරු කථානායකතුමනි. මගේ හෘදය සාක්ෂියට අනුව රට වෙනුවෙන් අදත් මගේ අදහස මම ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මේ ඇතිවෙලා තිබෙන ව්‍යාකූලත්වය ඉදිරියේ ජනාධිපතිතුමාට බැණ වැදීමෙන් හෝ වෙනත් විධියකින් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්කමක් නැහැ. ව්‍යවස්ථාදායකය, අධිකරණය හා විධායකය අතර සමමිතිකත්වයක් නැති තැන, විසංවාදයක් ඇති වූ තැන විශාල දේශපාලන විපර්යාසයක් නිර්මාණය කරනවා. අපේ ව්‍යවස්ථාව ගෙන යන්න නම් විශේෂයෙන්ම ව්‍යවස්ථාදායකය හා අධිකරණය තුළ ඒකමතිකත්වයක් තිබිය යුතුයි.

ගරු කථානායකතුමනි, 2002දී පත් වුණු ආණ්ඩුව; 2004 දක්වා ගිය ආණ්ඩුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විසුරුවා හැරිය බව ඔබතුමා දන්නවා. එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70වන ව්‍යවස්ථාව පාවිච්චි කරලා, "ජනතා පරමාධිපත්‍යය" නමින් ජනාධිපතිවරයා සතුව තිබුණු බලතල පාවිච්චි කරලා තමයි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඒ තීන්දුව ගත්තේ. ඒ තීන්දුව ගැනීමට ප්‍රථම, හිටපු අග්‍රාමාත්‍යතුමා අධිකරණයට විශේෂ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. එය තමයි, විධායක ජනාධිපතිවරයාට තිබෙන පාර්ලිමේන්තුව විසුරුවීමේ බලය අහෝසි කරන්න ඕනෑය කියන පනත් කෙටුම්පත. එදා ජයම්පති වික්‍රමරත්න මැතිතුමා ජනාධිපති නීතිඥවරයකු හැටියට ඒ ගැසට් පත්‍රිකාවට විරුද්ධව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය වෙනුවෙන් පෙනී සිටියා. ජනතා පරමාධිපත්‍යය සතු බලය, එනම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අයින් කරන්න නම් ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා එදා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් තීන්දුවක් ලබා දුන්නා. 1978 ව්‍යවස්ථාවේ යම් යම් පරස්පරතා, විසංවාදයන් තිබෙනවා. විශේෂයෙන්ම එහි තිබෙන බරපතළම අවුල; ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර ඇති වන අවුල තමයි, මේ ඡන්ද ක්‍රමය පිළිබඳ ගැටලුව. ප්‍රේමදාස මහත්මයා බලයට එන්න කලින් තිබුණේ, සියයට 12ක් ගත්ත අයට අනුපාත ක්‍රමයට පාර්ලිමේන්තු නියෝජනයක් ලැබෙන විධියටයි. පසුව ඒක වෙනස් වුණා. දැන් පවතින මේ ඡන්ද ක්‍රමය යටතේ ප්‍රසිද්ධ මිනිසුන්, ඇමතිකම් දරපු මිනිසුන් කවදාවත් පාර්ලිමේන්තුවෙන් අයින් කරන්න බැහැ. පරාජය වන මිනිසුන් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එනවා. ඒ නිසා, අපි සියලුදෙනාගේම සම්මුතියෙන් සම්මත කළ හැකි එක දෙයක් හැටියට අපි දැක්කේ මේ ඡන්ද ක්‍රමය වෙනස් කර ගැනීමේ අවශ්‍යතාවයි. අද මේ ව්‍යාකූලත්වයට හේතුවත් මේ ඡන්ද ක්‍රමය පිළිබඳව තිබෙන ප්‍රශ්නයයි.

2004දී අපි පාර්ලිමේන්තුවට එනකොට මේ රට ත්‍රස්තවාදයෙන් වෙළී ගිය රටක්. අපි පාර්ලිමේන්තු ආසන නවයක් ලබා ගත්තා, ගරු කථානායකතුමනි. ඒ වෙලාවේදී ආණ්ඩුවට

බහුතර බලයක් ලබා ගන්න බැරි වුණා. එදා අපි දිවුරුම් දෙනකොට අද පාර්ලිමේන්තුවේ ඇති වනවා වාගේම විශාල කාල ගෝට්ටියක් ඇති වුණා. අපේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න ඇති වුණා; ගුටි කන්න සිදු වුණා. එදාත් ඒ ආණ්ඩුවට බහුතර බලයක් තිබුණේ නැහැ. එදා අපි අවුරුද්දකට වැඩි කාලයක් විපක්ෂයේ ඉඳගෙන, පාර්ලිමේන්තු කණ්ඩායමේ නවදෙනාගේ කණ්ඩායම් නායකයා හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, ත්‍රස්තවාදය පරාජය කිරීමට විශාල බලයක් හැදුවා. විශාල බලයක් හදලා, ඒ ආණ්ඩුවට සම්පූර්ණයෙන්ම අපේ සහාය ලබා දුන්නා. අපි අලුත් ව්‍යාපාරයක් විධියට ඇවිල්ලා ත්‍රස්තවාදය පරාජය කිරීමට කටයුතු කළා. එදා එහෙම මතවාදයක් තිබුණේ නැහැ. "සාකච්ඡාවෙන් විතරක් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්" කියා එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය කිව්වා. ඔය ජාතිය ගැන කථා කරන අය ෆෙඩරල් යෝජනාවක් ගෙනැල්ලා, 1999දී ෆෙඩරල් ව්‍යවස්ථාවක් අත්සන් කළා. ඒ සියල්ලම වෙනස් කරලා, රටේ ඒකීයභාවය තහවුරු කරලා, අපි ත්‍රස්තවාදය පරාජය කළා. එදා අපි ලබා ගත්ත ආසන නවය ඓතිහාසික ආසන නවයක් බවට පත් වුණා. ඒක කෙළවර වුණේ මුළු ශ්‍රී ලංකාවම පෙළන ලද ත්‍රස්තවාදය අවසන් වීමෙන්.

ගරු කථානායකතුමනි, මේ ව්‍යාකූලත්වය මත දැන් ප්‍රශ්න ගණනාවක් මතුවෙලා තිබෙනවා. මේ ආණ්ඩුව පිළිබඳව මගේ හෘදය සාක්ෂිය කියන දෙය, මගේ ව්‍යාකූලත්වය කිව යුතුයි කියා මා කල්පනා කරනවා. අපි සිංගප්පූරුව සමඟ ගිවිසුමක් අත්සන් කළා. එම සිංගප්පූරු ගිවිසුම අත්සන් කරද්දි විනිවිදභාවයකින් යුක්තව, වෙළඳ සංගම් එක්ක කථා කළ යුතුව තිබුණා. දේශීය නිෂ්පාදකයන්ගේ සංගම් සියල්ලම වාගේ මේ සිංගප්පූරු වෙළෙඳ ගිවිසුමට විරුද්ධ වුණා. සියලුදෙනාම මධ්‍යස්ථයි කියලා කිව්වා. මමත්, අගමැතිතුමා මුණ ගැහිලා කිව්වා, "අපි මුලින්ම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කරමු" කියලා. ගරු කථානායකතුමනි, ඒක අන්තර්ජාතිකව පිළිගත් තත්ත්වයක්. ඕනෑම රටක් වෙළෙඳ ගිවිසුම් අත්සන් කරන්න කලින්, රටේ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කළ යුතුයි.

අපි විධිමත් සාකච්ඡාවකින් එවැනි වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කළේ නැහැ. සිංගප්පූරුවේ කුණු ටික පවා, ඒ කියන්නේ ඉස්පිරිතාලවල අපද්‍රව්‍ය, වෙනත් විවිධ අපද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය පවා ගෙනැල්ලා ලංකාවේ ප්‍රතිචක්‍රීකරණය කරන වැඩසටහනක් සඳහා තීන්දු ගත්තා. චීනය මේ තීන්දුව ගත්තාට පසුව, 1996දී චීනයේ,- [බාධා කිරීමක්]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අසත්‍ය දේවල් කියන්න එපා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මගේ කථාවට ඇහුම් කන් දීලා ඔබතුමා උත්තර දෙන්න කෝ. ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථා කරන්න අවස්ථාව දෙන්න. Do not disturb.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
චීනයේත් මේ වාගේම තීරණයක් ගත්තා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඒ තීරණය ගත්තාට පසුව චීනයේ මොකක්ද වුණේ? ඔවුන් විශාල අද්දැකීමක් ලබාගෙන, ඒ තීන්දුවට විරුද්ධව, විදේශීය රටවල කුණු බැහැර කිරීම සම්පූර්ණයෙන්ම නතර කිරීමේ ප්‍රතිපත්තියකට ආවා. ගරු කථානායකතුමනි, ලෝකයේ quarantine law කියා එකක් තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? ජීවමය දේවල් තැනින් තැනට ගෙන යෑමේදී ඇති වන ප්‍රශ්න ගැන ලෝකයේ පරිසර විද්‍යාඥයන් අතර ඉතාම බරපතළ විධියේ නීති සම්මත වන තත්ත්වයකුයි අද පවතින්නේ. ඒවා සම්බන්ධයෙන් අපේ පාරිසරික නීතිය අපි තවම හරියට ශක්තිමත් කර නැහැ. මේ වනවිටත් ඒ පරිසර නීතියෙන් බැහැරට ගිහින් විවිධ පළාත්වල විවිධ දේවල් සිද්ධ වනවා. ඒ නිසා අපි අපේ රටේ පරිසර නීතිය අලුත් ලෝකයේ අලුත් පරිසර නීතින් එක්ක සම්මත කළ යුතුව තිබුණා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, රජයේ ඉඩම් පිළිබඳව ප්‍රතිපත්තියක් තිබුණේත් නැහැ. අද වතු කම්කරුවන්ගේ තත්ත්වය ඉතාම බරපතළ තැනකයි තිබෙන්නේ. [බාධා කිරීම්] ඔවුන් අදත් ඉන්නේ වහල් සේවයේයි. [බාධා කිරීම්] එය වෙනස් කළ යුතුය කියා අපි කල්පනා කරනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අද මධ්‍යම කඳුකරයේ ඇට තේ -ඒ කියන්නේ, බ්‍රිතාන්‍ය යුගයේ තේ- වගා කළ අක්කර එක්ලක්ෂ විසිදාහක් තිබෙනවා. ඒ තේ ඉඩම් සඳහා වැඩ පිළිවෙළක් හදන්න, ඒ ඉඩම් විකුණන්න එපාය කියා මම රජයට ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. ඒකත් ජයග්‍රහණය කරවන්න බැරි වුණා. ගරු බිමල් රත්නායක මැතිතුමා කියපු එක අදහසක් මම පිළිගන්නවා. ඒ තමයි, විධායක ජනාධිපතිතුමා විධායක ජනාධිපතිවරයා හැටියට ඔහුගේ බලය පාවිච්චි කළේ නැහැය කියන එක. මගේ විවේචනයක් හැටියට ජනාධිපතිතුමාට මම පෞද්ගලිකවත් ඒ විවේචනය කර තිබෙනවා. මේ සභාවේදීත් මට එය කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, හම්බන්තොට වරාය පිළිබඳව අපිත් කථා කළා; විවිධ කණ්ඩායම් කථා කළා. ඒ අයට සියයට 85ක් සහ අපට සියයට 15ක අයිතිවාසිකමක් ලෙස දුන් අපේ රටේ හම්බන්තොට වරාය 99 අවුරුද්දකට අපට අහිමි වුණා. හම්බන්තොට ඉඩම් දීම පිළිබඳ ප්‍රතිපත්ති විශාල විවාදයකට තුඩු දුන්නා. ගරු කථානායකතුමනි, ඒ හින්දා අපට අවශ්‍ය කළේ මේ තත්ත්වය වහාම නතර කර ගැනීමටයි.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය යටතේ මම යෝජනාවක් කරන්න කැමැතියි. මෙහිදී යම් කටයුත්තක් කරන්න අප සියලුදෙනා එකතු විය යුතුයි කියා මම හිතනවා; මා එසේ කල්පනා කරනවා. කුමකටද ඒ එකතුව? අගමැතිකමේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉන්නවාද, එහෙම නැතිනම් වෙනත් කෙනකු ඉන්නවාද කියන එක නොවෙයි ප්‍රශ්නය. පළමුවෙන්ම, අප කෙටි කාලයකට, කළ යුතු දේ සහ නොකළ යුතු දේ පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතුයි. දෙපාර්ශ්වයේම එකඟතාවෙන් මාස තුනත් හයත් අතර කාලයකට අප සම්මුතියකට එන්න ඕනෑය කියා මම හිතනවා. [බාධා කිරීම්] ආණ්ඩු බලය තියාගෙන එක පාර්ශ්වයක් ඡන්දයට යනවා වෙනුවට දෙපාර්ශ්වයටම බලය ලැබෙන විධියට ප්‍රතිපත්තියක් සම්මත කළ යුතුය කියා මම කල්පනා කරනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, ඒ අනුව මම විශ්වාස කරනවා, පාර්ලිමේන්තුවේ බහුතර බලය තිබෙන- [බාධා කිරීම්] එක්සත්

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

ජාතික පක්ෂයේ හෝ වෙනත් පක්ෂයක හෝ යම් පුද්ගලයකුට පාර්ලිමේන්තුවේ බහුතර බලයක් තිබෙනවා නම් ජනාධිපතිවරයාට එය දරාගෙන ඉන්න බැහැය කියන එක මා පිළිගන්නවා. එය කලිනුත් ඉදිරිපත් කළා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අප පෙනී ඉන්නවා නම්, යම්කිසි පාර්ශ්වයකට පාර්ලිමේන්තුවේ විශ්වාසය නැතිව ඒ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැහැ කියා මා කල්පනා කරනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අග්‍රාමාත්‍යතුමා දන්නවා,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අග්‍රාමාත්‍යතුමා දන්නවා,- [බාධා කිරීම්] ඔබතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ආ මෙහොතේදී මා ඔබතුමා සමඟ සාකච්ඡා කළා. [බාධා කිරීම්] මොකක්ද මම ඔබතුමා සමඟ සාකච්ඡා කළේ? [බාධා කිරීම්] විශ්වාස භංගය පරදීද, නැද්ද කියා හැම පාර්ශ්වයම සලිතභාවයෙන් සිටියා. ඒ අවස්ථාවේදී අප කිව්වේ මාස 6ක් ඇතුළත දෙපාර්ශ්වයෙන්ම එකඟ වන සම්මුතියකට ඇවිල්ලා මැතිවරණයකට යමු කියායි. [බාධා කිරීම්] අද අපි දකින ප්‍රධානම දේ තමයි, මේ වියවුලෙන්- [බාධා කිරීම්] පසුගිය කාලයේ පළාත් පාලන මැතිවරණයක් පවත්වා තිබෙනවා. අද පළාත් සභා මැතිවරණ කල් දමා තිබෙනවා. අපි පළාත් සභා මැතිවරණ කල් දැමීමේ ඡන්ද ක්‍රමය වෙනස් කරන්නයි. ඡන්ද ක්‍රමය වෙනස් කළාද නැද්ද, සීමා නිර්ණය කළාද නැද්ද කියන ප්‍රශ්නය අද තිබෙනවා. අප කවුරුත් එකඟතාවෙන් මෙන්න මේ සම්මුතිවලට ඇවිල්ලා, ඉතාම ඉක්මනින් මැතිවරණයකට ගිහින්, ඉදිරි මැතිවරණයකදී ජනතාවගේ ජන මතය උරගා බැලිය යුතුය කියා මා කල්පනා කරනවා. ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු හිමිපාණන් වහන්ස. Next, the Hon. (Dr.) Rajitha Senaratne, please.

[අ.භා. 12.07]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, ඇත්තටම මම අද සභා වාරයට ආවේ කථාවක් කරන්න නොවෙයි. මේ යෝජනාව නීතියට එරෙහි අග්‍රාමාත්‍යවරයෙකුගේ වැය ශීර්ෂය කපා හැරීමට සහයෝගය දීම සඳහා පමණයි. නමුත් අපේ ජනාධිපති නීතිඥ ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාවට පස්සේ මට හිතුණා, යම් අදහසක් ප්‍රකාශ කරන්න. අපි මේ රටේ විශාලම අරගළකාරී මොහොතක අද ඉන්නේ. අද මේ රටේ රාජ්‍ය තන්ත්‍රය කොහේවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. විශාලම අරගළය ඒක. එතකොට අරගළයක් තිබෙන මොහොතක අපේ නෙත් ඒ අරගළයේ ඉදිරියෙන්. අරගළය කොහේද? ඒක සාධාරණත්වය සඳහා අරගළය. අපි ඒ අරගළය සඳහා කැපවීමෙන් ක්‍රියා කරනවා, ගරු කථානායකතුමනි. ඒ අනුව, පාර්ලිමේන්තුවේ අයිතිය ආරක්ෂා කර ගැනීම සඳහා, මේ ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය ආරක්ෂා කර ගැනීම සඳහා හැමදාම සටන් කළා වාගේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අපි සටන් කළා. මේ හැම අරගළයක් තුළම සාමය ගොඩනගා ගත හැකියි. අපි ඉගෙන ගෙන තිබෙනවා, පරණ වමේ පොත්වල අරගළය තුළ සාමය ගොඩනඟන්නේ කොහොමද කියලා. ඒක ඉතාම අමාරු දෙයක්. ඒක ඉතාම ජනප්‍රිය දේකුත් නොවෙයි. ඒක ඉතාම කයෝර දෙයක්. එය අරගළය තුළින් ගොඩ නගා ගන්නේ කොහොමද? එතුමා ඉදිරිපත් කරපු අදහස, "පුද්ගලයෝ කවුද කියන කාරණය මට වැඩක් නැහැ. මේ වෙලාවේ අපි හිතන්නට ඕනෑ, කවුද හරි, කවුද වැරදි කියන එක නොව කුමක්ද හරි, කුමක්ද වැරදි." කියන එකයි. අපි "කුමක්ද, හරි" කියන ස්ථාවරයේ තමයි දිගටම හිටියේ. අද අපේ අරගළය ජයග්‍රහණයෙන් ජයග්‍රහණයට ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. තව ඉදිරි කාලයේ කොච්චර දවසක් හිටියත් ඒක ජයග්‍රහණයේ දවස් ගණනාවක් මිසක් වෙන දවස් ගණනාවක් නොවෙයි. ඒක අපේ හතුරා පරාජයෙන් පරාජයට යන හැම දවසක්ම බවට පත්වෙනවා. ඒකත් ජන කථාවක් නොවෙයි. නමුත් අපි දිනනවා. ඒ ගොල්ලෝ පරදිනවා. ඒ වාගේම රට පරදිනවා. රටේ ජනතාව පරදිනවා. තව ටික දවසක් යනකොට පිළිකා රෝගීන්ට පිළිකා ඖෂධ ටික නැති වෙනවා. පිළිකා ඖෂධ නැතිවෙලා ඒ මිනිහා මියගියාට පස්සේ අපි දිනුවත් ජීවිතය ආපසු ගන්න බැහැ. හෘද රෝගියාට stent එකක් දෙන්න සල්ලි නැතිවෙලා ඒ මනුෂ්‍යයා මැරුණාට පස්සේ අපි දිනුවයි කියලා ඒ මනුෂ්‍යයාගේ පවුලට ඒකෙන් ඇති වැඩක් නැහැ. ඒ නිසා අද මේ සම්පූර්ණ අරගළය තුළ යමෙක් සාමයට සුදු ධජයක් ඔසවන්නේ නම්, මා ඒ සුදු ධජය කෙරෙහි ඉතාම උනන්දුවෙන් ඒ දෙස බලාගෙන ඉන්නවා. ඒක කවුරු නො ඔසවන්නේද කියන එක මට ප්‍රශ්නයක් නොවෙයි.

තමුන්නාන්සේලා දන්නවා, මේ ලෝකයේ යුග පෙරළියක් ඇති කරපු ඓතිහාසික දකුණු අප්‍රිකානු අරගළය ගැන. දකුණු අප්‍රිකානු අරගළයට ශ්‍රේෂ්ඨ නායකත්වය දුන් නෙල්සන් මැන්ඩෙලා ඒ වෙනුවෙන් අවුරුදු 27ක් සිරබත් කෑවා. ඊට නොදෙවෙනි නායකයා ඊබ්‍රාහිම්. එතුමා අවුරුදු 27ක් සිරබත් කෑවා, ගරිල්ලා භටයන් විධියට සටන් කරමින්. ඒ අරගළය අවසන් වුණේ කෙසේද? ඒ විප්ලවීය අරගළය අවසන් වුණේ ජයග්‍රහණය තුළින්ද? නැහැ. එක්තරා අවස්ථාවක ඩික් ක්ලාක් කියන මධ්‍යස්ථ මතවාදී සුදු පාලකයා ආවා. අවසානයේදී ඔහු කල්පනා කළා, "මේක දිනන්න බැරි වැඩක්. මම කොහොම හරි මේක අවසන් කරන්නට ඕනෑ." කියා. එළියේ ඉන්න අප්‍රිකානු ජාතික කොංග්‍රසයේ කළු ජාතිකවාදීන් එක්ක කථා කරන්නට ගියොත් ඒක ප්‍රශ්නයක් වන නිසා ඔහු කල්පනා කරලා පළවෙනි තීන්දුව ගත්තා, හිරේ ඉන්න නායකයෙක් එක්ක කථා කරන්න. ඔහු හොඳට අධ්‍යයනය කරලා කරලා, තීන්දු කර ගත්තා, "හිරේ ඉන්න කට්ටියගෙන් මම කථා කළ යුත්තේ නෙල්සන් මැන්ඩෙලා එක්ක." කියලා. මහ රාත්‍රී 11.30ට එතුමාගේ සියලුම කාර්යාල වහපු වෙලාවේ ඉතාම රහසිගත විධියට නෙල්සන් මැන්ඩෙලාව අග්‍රාමාත්‍ය කාර්යාලයට එතුමා ගෙන්නා ගත්තා. ඒ වාගේ රාත්‍රීන් ගණනාවක් ගියා, තර්ක විතර්ක තුළ. සුද්දන්ට මේක විකුණන්නේ කොහොමද, කල්ලන්ට මේක විකුණන්නේ කොහොමද කියා තමයි මේ දෙදෙනා කථා කළේ. ඒක තමයි අර අරගළයටත් වඩා අමාරු දෙය වුණේ.

අරගළය ගැන කථා කරලා, සාකච්ඡා මේසයට ගිහිල්ලා අවසානයේදී ආපහු කඩාගෙන වැටුණා, ආපහු යුද්ධය ඇවිළුණා, දුම්රිය පිටින්ම ගිනි තිබ්බා. මේ ඔක්කොමත් කරලා, එදා ඒ සාකච්ඡා මේසය අවසාන කරලා නෙල්සන් මැන්ඩෙලා කිව්වා, "වහාම නැවත ගරිල්ලා ව්‍යාපාරය ආරම්භ කරන්න." කියලා. නමුත්, ඒ සුදු ජාතිකවාදීන්ගේ සාම සාකච්ඡාවට සහභාගි වුණු ප්‍රධානියා රොල්ෆ් මේයර්- පසු කලෙක එතුමා විදේශ අමාත්‍යවරයා වුණා. වරෙක එතුමා ලංකාවට ආවාම මම අග්‍රාමාත්‍යතුමා සමඟ එතුමාව හමු වුණා- සහ ඒ සාකච්ඡාවට නායකයා වුණු රාමපෝසා කියන කළු ජාතික නායකයා කියන ඒ දෙදෙනාගේ පවුල් අතර මේ සාකච්ඡා මේසයේදී මිත්‍රත්වයක් ඇතිවෙලා තිබුණා. එදා රාත්‍රී 10.00ට රොල්ෆ් මේයර්ගෙන් දුරකථන පණිවුඩයක් ආවා රාමපෝසාට. රාමපෝසා ඇහුවා, අපි ආයේ හම්බ වෙන්නේ කොයි වෙලාවේද කියලා. ඔවුන් දෙදෙනා හමු වුණා, ඔවුන් දෙදෙනා මේ සාකච්ඡාව දිගටම ගෙනිච්චා. ඒ අතරේ කල්ලන් සහ සුද්දන් යුද වැදිලා, යුද්ධය ඉදිරියට යනවා. ඒ සාකච්ඡාවේ අවසාන ප්‍රතිඵලය තමයි දකුණු අප්‍රිකානු අරගළය නිමාවෙලා මුළු රටටම විමුක්තිය ලැබීම.

ගරු කථානායකතුමනි, එම නිසා අපි මේ අරගළයට සහභාගි වෙනවා, අරගළයේ ඉදිරියෙන්ම ඉන්නවා. ඒ අතරේ යම් සාමයක් ඇති වෙනවා නම් ඒ සාමය සඳහා අපි ඉදිරියෙන්ම ඉන්නවා. මම ගරු විජයදාස රාජපක්ෂ මහත්මයාගේ කථාව ඉතාමත් වුවමනාවෙන් අහගෙන හිටියා. එතුමා අවසානයේ ඉදිරිපත් කරන විසඳුම මොකක්ද? සාම සාකච්ඡාවක් පමණක් නොව එතුමාගේ කථාවේ අවසාන කොටස තමයි මම ඉතාමත් වැදගත් ලෙස සලකන්නේ. ඒ මොකක්ද? එතුමා කියනවා, මේ පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන පුද්ගලයාට අග්‍රාමාත්‍ය ධුරය දීලා, ඒ පුද්ගලයා පත් කරන කැබිනට් මණ්ඩලයට කැබිනට් එක ලබා දීලා මේ ප්‍රශ්න විසඳීම සඳහා ගරු කථානායකතුමාට මැදිහත් වන්නට කියා. එතකොට කවුද මේකට විරුද්ධ? මේක තමයි අපේ අරගළය. මේකට තමයි අපි දිගටම ලංකාව පුරා සටන් වදින්නේ. මේක තමයි මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ. මේක තමයි බහුතර මතය. මේක තමයි ජාත්‍යන්තර මතය. මේක තමයි ලෝක මතය. කවුරුන් හෝ ඒක යෝජනා කරනවා නම්, ඒකට මැදිහත් වෙනවා නම් ඇයි අපි ඒකට විරුද්ධ වෙන්නේ? ඔහු මේ සභාවට තනියම ඇවිල්ලා - තනිපංගලමේ - අනෙක් සියලුදෙනාම පාර්ලිමේන්තුව වර්ජනය කරන විට ඒ හීන්දූ, තීරණවලට විරුද්ධව මිනිහෙක් තනියම ඇවිල්ලා- කියනවා නම්, "මම ලැහැස්තියි මේකට අතපොවලා ඔබලාගේ සාධාරණ අයිතිය ආරක්ෂා කරන්න." කියලා, මම කියනවා, "මම එකඟයි ඒ අදහසට." කියා.

ගරු කථානායකතුමනි, එම නිසා මේ යෝජනාව මේ පැත්තෙන් සම්මත වෙනවා. ඒ වාගේම, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඔබතුමා පාර්ලිමේන්තුවට උත්තරීතර සේවයක් කළා. බ්‍රිතාන්‍යයේ කථානායකවරු හතර දෙනෙකු එදා තමන්ගේ ගෙල සිඳ ගත්තා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, විධායකයට එරෙහිව. හතර දෙනෙකු ජීවිත පූජා කළා. ඔබතුමා මේ ගරු සභාවට ආවේ ජීවිතය පූජා කරන්නට තමයි, ඉතා සුළු දෙයකින් තමයි ඒක එහාට මෙහාට වුණේ. මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කෙරෙන්නේ නම් එහිදී අනිවාර්යයෙන්ම රත්තරන් අකුරින් ඔබතුමාගේ නම ලියැවෙනවා, මේ රටේ එක යුගයක පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගලවා දුන් ඉෂ්ට දේවතාවා කියා. ඒක අපට අමතක කරන්නට බැහැ. ඉතිහාසය ලියැවෙන විට ඉතාමත් අවංකවයි ලියැවෙන්නේ. අපි කවුරුවත් ආස කරන විධියට නොවෙයි ඉතිහාසය ලියැවෙන්නේ. එම නිසා ඔබතුමා අද මේ පාර්ලිමේන්තුව ආරක්ෂා කළා. ඔබතුමාට ඒ ආත්ම ශක්තිය, කශේරුකාව තිබෙනවා. ඔබතුමා සාමකාමී බව ප්‍රදර්ශනය කළා.

මගේ මිත්‍ර ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඒ පැත්තේ ඉඳලා ඉදිරිපත් කළ දේ, -එතුමායි, මමයි හුඟාක් වෙලාවට මතවාදීව හිටියේ කඳවුරු දෙකක. නමුත්, ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ, කවුද මේවා යෝජනා කරන්නේ කියලා.- ඒ කාර්ය භාරය හරි නම් ගරු කථානායකතුමනි, එතුමා ඉල්ලන ඒ ඉල්ලීම ගැන ඔබතුමා වහාම ජනාධිපතිවරයා සමඟ කථා කරන්න. ජනාධිපතිවරයා ලැහැස්ති නම් ඒක සාමයෙන් විසඳා ගැනීමට, අපි ලැහැස්තියි. හැබැයි, ජනාධිපතිවරයා ලැහැස්ති නැත්නම් අවසානය වනතුරු, මේ අරගළය ජයග්‍රහණයෙන් කෙළවර වනතුරු මේ අග්‍රාමාත්‍යවරයා සමඟ සිටින්නට අපි සියලු දෙනාටම ආත්ම ශක්තියක් තිබෙන බව ප්‍රකාශ කරමින්, මම නිශ්ශබ්ද වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Motion is now before the House. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
So, we will go for Electronic Voting. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the division bells -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! දැන් ඡන්දය ලබා දීමේ අවස්ථාව; this is voting time. කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ස්ථානවල වාඩිවෙන්න. ඡන්දය ලබා දීමට අපහසුතාවක් තිබෙනවා නම් කරුණාකර අත ඔසවන්න.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය දීමට අපහසු ගරු මන්ත්‍රීවරු කරුණාකර අත් ඔසවන්න. [බාධා කිරීමක්] ඡන්දය දී අවසාන වන තෙක් ඉන්න.

කරුණාකර ඡන්දය ප්‍රකාශ කිරීමට බැරි වුණු ගරු මන්ත්‍රීතුමන්ලා නැඟිටින්න. Hon. Sampanthan, are you for or against?

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
I am supporting, Sir. ஆம்

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Fowzie?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
I am supporting, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Kabir Hashim?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Eran Wickramaratne?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Sivamohan?

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
ஆம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Mrs.) Sriskandarasa?

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
ஆம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Srineshan?

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
ஆம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is there anybody else?

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 116: විරුද්ධව 0 වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 116; எதிராக 0; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 116: Noes 0: Abstain 0.

O 001. Mangala Samaraweera	Yes
O 002. Gamini Jayawickrama Perera	Yes
O 003. John Amaratunga	Yes
O 004. Vijitha Herath	Yes
O 005. Anura Dissanayake	Yes
O 006. Dharmalingam Sithadthan	Yes
O 007. Mavai S. Senathirajah	Yes
O 009. Ranil Wickremesinghe	Yes
O 010. Lakshman Kiriella	Yes
O 011. Gayantha Karunatileka	Yes
O 013. Rauff Hakeem	Yes
O 014. Rajitha Senaratne	Yes
O 015. Piyasena Gamage	Yes
O 016. Rishad Bathiudeen	Yes
O 018. Sajith Premadasa	Yes
O 019. Mano Ganesan	Yes
O 021. Selvam Adaikkalanathan	Yes
O 022. Malik Samarawickrama	Yes
O 023. Nihal Galappaththi	Yes
O 024. Sunil Handunnetti	Yes
O 026. K. Thurairetnasingam	Yes
O 027. Seeniththamby Yoheswaran	Yes
O 028. S. Shritharan	Yes
O 029. Tilak Marapana	Yes
O 030. Wajira Abeywardana	Yes
O 031. Ravi Karunanayake	Yes
O 032. Field Marshal Sarath Fonseka	Yes
O 033. Patali Champika Ranawaka	Yes
O 034. Navin Dissanayake	Yes
O 035. P. Harrison	Yes
O 036. R.M. Ranjith Madduma Bandara	Yes
O 037. Arjuna Ranatunga	Yes
O 038. Palany Thigambaram	Yes
O 039. Chandrani Bandara	Yes
O 040. Thalatha Atukorale	Yes
O 041. Akila Viraj Kariyawasam	Yes
O 042. D.M. Swaminathan	Yes
O 043. Bimal Rathnayake	Yes
O 044. Nalinda Jayathissa	Yes
O 045. E. Saravanapavan	Yes
O 046. M.A. Sumanthiran	Yes
O 047. Kaveendiran Kodeeswaran	Yes
O 048. I. Charles Nirmalanathan	Yes
O 049. Abdul Haleem	Yes
O 050. Sagala Ratnayake	Yes
O 051. Harin Fernando	Yes
O 052. Daya Gamage	Yes

O 053. Ravindra Samaraweera	Yes
O 054. Vasantha Senanayake	Yes
O 055. Lucky Jayawardana	Yes
O 056. V.S. Radhakrishnan	Yes
O 057. Palitha Range Bandara	Yes
O 058. Dilip Wedaarachchi	Yes
O 059. Niroshan Perera	Yes
O 060. Ruwan Wijayawardene	Yes
O 061. A.D. Premadasa	Yes
O 062. Sujeewa Senasinghe	Yes
O 063. Wasantha Aluwihare	Yes
O 064. Vijayakala Maheswaran	Yes
O 069. Harsha De Silva	Yes
O 070. Ajith P. Perera	Yes
O 071. Ranjith Aluvihare	Yes
O 072. J.C. Alawathuwala	Yes
O 073. Vadivel Suresh	Yes
O 074. Ameer Ali Shihabdeen	Yes
O 075. Edward Gunasekara	Yes
O 076. Faizal Cassim	Yes
O 077. Anoma Gamage	Yes
O 078. Ranjan Ramanayake	Yes
O 079. Ashok Abeysinghe	Yes
O 080. H.M.M. Harees	Yes
O 081. Karunarathna Paranawithana	Yes
O 082. Palitha Kumara Thewarapperuma	Yes
O 083. Manusha Nanayakkara	Yes
O 084. Seyed Ali Zahir Moulana	Yes
O 085. Ajith Mannapperuma	Yes
O 086. Nalin Bandara Jayamaha	Yes
O 087. Buddhika Pathirana	Yes
O 088. M.S. Thowfeek	Yes
O 089. Abdullah Mahrooff	Yes
O 090. Sirinal de Mel	Yes
O 091. Anura Sidney Jayarathne	Yes
O 092. K.K. Piyadasa	Yes
O 093. Lakshman Ananda Wijemanne	Yes
O 094. A. A. Vijethunga	Yes
O 095. Hector Appuhamy	Yes
O 096. Sisira Kumara Abeysekara	Yes
O 097. Thushara Indunil Amarasena	Yes
O 098. A. Aravindh Kumar	Yes
O 099. Velu Kumar	Yes
O 100. Nalaka Prasad Colonne	Yes
O 101. Chandima Gamage	Yes
O 102. Kavinda Heshan Jayawardana	Yes
O 103. Mylvaganam Thilakarajah	Yes
O 104. Mayantha Dissanayake	Yes
O 105. Sujith Sanjaya Perera	Yes
O 106. Hirunika Premachandra	Yes
O 107. Bandula Lal Bandarigoda	Yes
O 108. M. Ibrahim Mohammad Mansoor	Yes
O 109. S.M. Marikkar	Yes
O 110. Imran Maharoof	Yes
O 111. Ashu Marasinghe	Yes
O 112. Ishak Rahuman	Yes
O 113. Mujibur Rahuman	Yes
O 114. Harshana Rajakaruna	Yes
O 115. Jayampathy Wickramaratne	Yes
O 116. Thusitha Wijemanna	Yes
G 021. Ananda Kumarasiri	Yes
G 109. Rohini Kumari Wijerathna	Yes
G 110. Chaminda Wijesiri	Yes
G 111. Hesha Withanage	Yes
G 112. Sandith Samarasinghe	Yes
G 113. Chathura Sandeepa Senaratne	Yes
G 114. Wijepala Hettiarachchi	Yes
G 115. Mohamadu Nazeer	Yes
G 116. S.M. Mohamed Ismail	Yes

Total Voting Results

Yes	116
No	00
Abstain	00

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද දින න්‍යාය පත්‍රයේ සඳහන්, "ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව" නම් වූ යෝජනාව, විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 116ක්ද, නැඟී සිට පක්ෂව ඡන්ද 7ක්ද වශයෙන් ඡන්ද 123කින් සම්මත වූ බව සඳහන් කරන්න කැමැතියි. ඊට විරුද්ධව ඡන්ද කිසිවක් නැත. Abstained මන්ත්‍රීවරුන් නැත. ඒ අනුව යෝජනාව සම්මතයි.

අද දින සභාව එකඟ වූ පරිදි මෙම පාර්ලිමේන්තුව 2018 නොවැම්බර් මස 30වන සිකුරාදා පූ.භා.10.30 තෙක් කල් තබනු ලැබේ.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 12.30 ට, 2018 නොවැම්බර් මස 30 වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් තියේය.


அதன்படி பாராளுமன்றம், பி.ப. 12.30 மணிக்கு, 2018 நவம்பர் 30, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 12.30 p.m., until 10.30 a.m. on Friday, 30th November, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

264 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 264 - இல. 8
Volume 264 - No. 8

2018 නොවැම්බර් 30වන සිකුරාදා
2018 நவம்பர் 30, வெள்ளிக்கிழமை
Friday, 30th November, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනරජයේ අරමුදල්වලින් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බව

பிரதான உள்ளடக்கம்

குடியரசின் நிதியிலிருந்து அமைச்சர்கள், இராஜாங்க அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் மற்றும் அவர்களது தனிப்பட்ட பணியாட்டொகுதியினருக்கான எந்தவொரு செலவினையும் அங்கீகரிப்பதற்கு ஏதேனும் மற்றும் அனைத்து அமைச்சுக்களின் செயலாளர்களுக்கும் எவ்வித அதிகாரமுமின்மை

PRINCIPAL CONTENTS

SECRETARIES TO ANY AND ALL MINISTRIES HAVE NO ANY AUTHORITY TO APPROVE ANY PAYMENT OF MONIES DRAWN FROM THE FUNDS OF THE REPUBLIC FOR MINISTERS, STATE MINISTERS, DEPUTY MINISTERS AND THEIR PERSONAL STAFF

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 නොවැම්බර් 30වන සිකුරාදා
2018 நவம்பர் 30, வெள்ளிக்கிழமை
Friday, 30th November, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස්වීය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්විය යුතු කාල වේලාව මෙම සභාව විසින් තීරණය කරනු ලැබිය යුතුය. එම නිසා කාලය කොපමණ අවශ්‍යද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වැඩ කටයුතු හමාර වන තෙක්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ දින පූර්ව භාග 9.00ට මාගේ නිල කාමරයේදී පැවැති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි, 2018 දෙසැම්බර් මස 05වන බදාදා පූර්ව භාග 10.30ට පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වීමට මෙම සභාව තීරණය කරනු ලැබීය. සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ දින පූර්ව භාග 9.00ට මාගේ නිල කාමරයේදී පැවති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි, 2018 නොවැම්බර් මස 27 වන අඟහරුවාදා නිකුත් කරන ලද පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ (3) දරන න්‍යාය පුස්තක පරිපූරකයේ පළ කරන ලද පා.3/'18 දරන දින නියමයක් නොමැති යෝජනාව 2018 දෙසැම්බර් මස 05 වෙනි බදාදා සභාවේදී ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි එදින න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01. ජනරජයේ අරමුදල්වලින් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බව සම්බන්ධයෙන් වූ යෝජනාව ඉදිරිපත් කිරීම.

ජනරජයේ අරමුදල්වලින් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බව
குடியரசின் நிதியிலிருந்து அமைச்சர்கள், இராஜாங்க அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் மற்றும் அவர்களது தனிப்பட்ட பணியாட்டொகுதியினருக்கான எந்தவொரு செலவினையும் அங்கீகரிப்பதற்கு ஏதேனும் மற்றும் அனைத்து அமைச்சுக்களின் செயலாளர்களுக்கும் எவ்வித அதிகாரமுமின்மை
SECRETARIES TO ANY AND ALL MINISTRIES HAVE NO ANY AUTHORITY TO APPROVE ANY PAYMENT OF MONIES DRAWN FROM THE FUNDS OF THE REPUBLIC FOR MINISTERS, STATE MINISTERS, DEPUTY MINISTERS AND THEIR PERSONAL STAFF

[පූ.භා. 10.34]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

2018 නොවැම්බර් 14 වැනි දින සම්මත කර ගන්නා ලද ආණ්ඩුවට එරෙහි විශ්වාස භංග යෝජනාවේ 2 වැනි ඡේදයට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

48 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති බවට කථානායකවරයා විසින් 2018 නොවැම්බර් 15 වැනි දින කරන ලද නිල ප්‍රකාශය මෙම සභාව 2018 නොවැම්බර් 16 වැනි දින පිළිගත් හෙයින් ද, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාවේ අරමුණු කොට ඇති පරිදි 2018 ඔක්තෝබර් 26 වැනි දින සිට ගරු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බවට මෙම සභාව තවදුරටත් යෝජනා සම්මත කරගත් හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන් බලය පැවරී ඇති පරිදි රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු හෙයින් ද;

2018 නොවැම්බර් 15 වැනි දින සිට අමාත්‍යවරුන්ගේ, රාජ්‍ය අමාත්‍යවරුන්ගේ, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා වැටුප් හා අනෙකුත් පාරිශ්‍රමිකයන් ගෙවීම පිණිස ජනරජයේ අරමුදල් වෙතින් කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බවටත්, ඉහත කී අමාත්‍යවරුන් වෙනුවෙන් විදේශ සංචාර, හෙලිකොප්ටර් යානා භාවිතය ඇතුළු අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා ඇති වූ වියදම් පියවීම ද තහනම් වන අතර මෙම යෝජනා සම්මතය උල්ලංඝනය කරමින් කවර හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා කවර හෝ තැනැත්තෙකුට එරෙහිව නීතිමය පියවර ගත යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි. "

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම යෝජනාව ස්ථිර කරනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, පාඨලී චම්පික රණවක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

විශේෂයෙන්ම මේ රටේ අද තිබෙන්නේ නීත්‍යානුකූල නොවන ආණ්ඩුවක්, ඒ වාගේම පාර්ලිමේන්තුව විසින් විශ්වාස භංගයෙන් පරද්දපු නීත්‍යානුකූල නොවන අගමැතිවරයෙක් සහ ඇමතිවරු. අපි කියන්නේ මේ රටේ මූල්‍ය පාලන බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ අනුව අමාත්‍යවරුන්ගේ, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ ඒ වාගේම රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ඒ අයගේ කාර්ය මණ්ඩලවල වැටුප් ඇතුළු සියලු දීමනා ගෙවන්න එපා කියා. ඒ වාගේම ගමන් සහ අනෙක් කටයුතුවලට මුදල් වැය කරන්න එපා කියා ලේකම්වරුන්ට මේ සම්බන්ධව දන්වන්න කියා මේ යෝජනා ස්ථිරත්වය සිදු කරන ගමන්, අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චම්පික රණවක මැතිතුමා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරන්න ඕනෑ, අපේ රටේ ව්‍යවස්ථාවට අනුකූලව පාර්ලිමේන්තුව සතුව විශේෂ බලතල දෙකක් සටහන් කරලා තිබෙන බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 වැනි ව්‍යවස්ථාව අනුව රටේ ව්‍යවස්ථා සම්පාදනය, ඒ වාගේම නීති සම්පාදනය පිළිබඳ එකම උත්තර ආයතනය හැටියට පාර්ලිමේන්තුව හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවේ සිට 150 ව්‍යවස්ථාව දක්වා ව්‍යවස්ථාවලින් රාජ්‍යයේ මූල්‍ය පාලනය පිළිබඳ බලතල පාර්ලිමේන්තුව සතු කරලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි ප්‍රකාශ කරන්න ඕනෑ, ආණ්ඩුවක් නොමැති තත්ත්වය තුළ පසුගිය 14 වැනි දා නීත්‍යානුකූලව සම්මත වූ ඒ විශ්වාස භංග යෝජනාවෙන් දැන් රාජ්‍ය මූල්‍ය පාලනය කිරීමේ සෘජු බලතල පාර්ලිමේන්තුවට හිමි වෙලා තිබෙන බව. ඒ වාගේම විශේෂයෙන්ම මම ඔබතුමාගේත්, මේ ගරු සභාවේත්, මේ රටේ ජනතාවගේත් අවධානයට යොමු කරනවා, මුදල් අමාත්‍යවරයා හැටියට කටයුතු කිරීමට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට කිසිම බලයක් අද නොමැති බව.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150.(2) ව්‍යවස්ථාව යටතේ මෙසේ සඳහන් වෙනවා:

"යම්කිසි මුදලක් ඒකාබද්ධ අරමුදලෙන් ඉවත් කර ගැනීමේ දී ඒ මුදල ඒකාබද්ධ අරමුදලෙන් ඉවත් කර ගන්නා වූ මුදල් වර්ෂය තුළ දී ම රජයේ නියමිත සේවාවක් සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයකින් හෝ වෙනත් යම්කිසි නීතියකින් හෝ ඒ මුදල වෙන් කොට දී ඇත්නම් මිස, එසේ නැත්නම් වෙනත් ආකාරයකින් ඒ මුදල නීත්‍යානුකූල පරිදි ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබුවහොත් මිස ඉහත කී බලපත්‍රය නිකුත් නොකළ යුත්තේ ය."

කවර බලපත්‍රයද? මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රයයි. දැන් මුදල් විෂය භාර අමාත්‍යවරයෙක් නැති තත්ත්වය යටතේ මුදල් විෂය භාර අමාත්‍යවරයාට මුදල් අමාත්‍යාංශයේ අදාළ අය වැය දෙපාර්තමේන්තුවට ඒ බලපත්‍රය, එහෙම නැත්නම් ඒ warrant එක දීමේ කිසිම නීත්‍යානුකූල හැකියාවක් අද වනකොට නැහැ, ගරු කථානායකතුමනි. ඒ අනුව එවැනි ක්‍රියාදාමයක ඔහු නිරත වන්නේ නම්, ඔහු ඉතා පැහැදිලිව මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුවත්, ජනතාවගේ පරමාධිපත්‍යයත් හෑල්ලු කරන ක්‍රියාදාමයක නියැලිලා තිබෙනවාය කියන එක අපි බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මුල සිටම මේ සිද්ධිදාමයට මැදිහත් වූ පුද්ගලයකු හැටියට ඔබතුමා ගැනත් මා යමක් කියන්න ඕනෑ. මොකද, "කථානායකතුමා පක්ෂපාතීයි; පක්ෂයකට ලැදියි. එතුමා අපක්ෂපාතීව ක්‍රියා නොකරපු නිසා තමයි මේ අර්බුදය ඇති වුණේ" කියලා අද නොයෙක් දෙනා නොයෙක් ආකාරයේ චෝදනා නඟමින් සිටිනවා. අපි හැමදෙනාම දන්නවා, පසුගිය ඔක්තෝබර් මාසයේ 26වන දා රාත්‍රියේ ජනාධිපතිවරයා විසින් ගැසට් නිවේදන තුනක් නිකුත් කරලා, අග්‍රාමාත්‍යවරයකු ඉවත් කරලා, ඒ වාගේම අලුත් අග්‍රාමාත්‍යවරයකු පත් කරලා, ඊට පස්සේ ගැසට් නිවේදනයකින් අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරිය බව.

එසේ කළ වහාම අපි ඔබතුමා හමු වෙලා කිව්වා, "ඒ ක්‍රියාදාමයට මේ පාර්ලිමේන්තුවේ බහුතරය නැහැ. ඒ විතරක් නොවෙයි, ජනාධිපතිවරයා විසින් ගත්ත ක්‍රියාමාර්ගයත් නීති විරෝධියි" කියා. නමුත්, ඔබතුමා අපට ඒ අවස්ථාවේ ඒ තිබුණු තත්ත්වය බොහොම හොඳින් පැහැදිලි කර දුන්නා. මේ ගැසට් නිවේදන අනුව, ඔබතුමාගේ මහලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩල වැඩ කළා. ඒ අනුව, මේ පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා හැටියට මහින්ද රාජපක්ෂ මහතා පිළිගන්න ඔබතුමා කටයුතු කළා. එතුමාට අසුන් පැනවුවා; කාර්යාල පහසුකම් සැපයුවා. ඊට පසු දිනක අග්‍රාමාත්‍ය පදවිය දරමින් මහින්ද රාජපක්ෂ මහතා, සභානායකවරයා හැටියට දිනේෂ් ගුණවර්ධන

මහතා නම් කරපු වෙලාවේ, ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලෙස එස්.බී. දිසානායක මහතා පත් කරපු වෙලාවේ, ඒ අයට පහසුකම් දෙන්නත් ඔබතුමා ක්‍රියා කළා. ඒ, අපේ විරෝධය මැද. අපි ඒකට විරුද්ධ වුණා. අපි ඔබතුමාට නිරන්තරයෙන්ම කිව්වා, "මේ කටයුත්ත ව්‍යවස්ථා විරෝධියි, මේ කටයුත්ත කරන්න එපා" කියලා. නමුත්, ඔබතුමා නිල මතයක සිටිමින්, මේ ගැසට් නිවේදන නීත්‍යානුකූල ද, නැද්ද කියන එක පිළිබඳව අධිකරණ තීරණයක් හෝ පාර්ලිමේන්තුවේ තීරණයක් ගන්නාතුරු රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට මහින්ද රාජපක්ෂ මහතා පිළිගන්නා බවත්, ඒ කාරණා කටයුතු කරගෙන යන බවත් පවසා, අපේ විරෝධතාව මත ඔබතුමා කටයුතු කළා. අපි ඔබතුමාගේ ඔය අසුනට වතුර චක්කරන්න හෝ වතුර බෝතල්වලින් ගහන්න හෝ මිරිස් කුඩු ප්‍රජාතන්ත්‍රවාදය දක්වන්න ඉදිරිපත් වුණේ නැහැ ගරු කථානායකතුමනි. මොකද, අපි ශිෂ්ටසම්පන්න නිසා; ශීලාචාර නිසා. මහින්ද රාජපක්ෂ කරන ක්‍රියාව නීතිවිරෝධී, ව්‍යවස්ථා විරෝධී හා සදාචාරවිරෝධී බව හොඳින්ම දැනගෙනත් අපි ඔබතුමාට ඒ බලපෑම් කරන්න ආවේ නැහැ. මහලේකම්තුමාට ඒ පිළිබඳ බලපෑම් කරන්න ආවේත් නැහැ. ඔබතුමා මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව නොපිළිගත්තේ, නීත්‍යානුකූල ක්‍රමයට, ස්ථාවර නියෝගවලට අනුකූලව මේ පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙනවායි කියන කාරණය පසුගිය 14වැනි දා විශ්වාස භංග යෝජනාවකින් පරාජය කළ පසුවයි.

ඒ නිසා, "ඔබතුමා පක්ෂපාතියි" කියලා, "එක පක්ෂයක වුවමනාවට වැඩ කරනවා" කියලා, "ඔබතුමා මේ අර්බුදයේ මූලිකයා" කියලා කාටවත් චෝදනා කරන්න බැහැ. අග්‍රාමාත්‍යවරයා නම් කරපු වේලාවේ ඔබතුමා අපේ මතයට විරුද්ධව, එතුමාට ආසන පනවපු වේලාවේ අපි ක්‍රියා කරපු සදාචාරාත්මක, ශීලාචාර ක්‍රමයට මේ ප්‍රතිපක්ෂයේ රාජපක්ෂවාදීන්ට ක්‍රියා කරන්න බැරි වුණා. ඉතාම අශීලාචාර ක්‍රමයට, ඉතාම අශිෂ්ට ක්‍රමයට, මැරවර ක්‍රමයට ඔවුන් ක්‍රියාත්මක වුණා. ඒක තමයි මෙතැන තිබෙන ගැටලුව. අන්න ඒ තත්ත්වය මත තමයි ශිෂ්ට සම්පන්න ජනතාව, ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව යුක්තිය වෙනුවෙන් මේ මැර බලයට එරෙහිව ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ ව්‍යවස්ථාව අනුව ජනාධිපතිට තමන්ගේ මතය අනුව අග්‍රාමාත්‍යවරයා පත් කරන්න පුළුවන් කියලා අද නොයෙක්දෙනා විවරණ දෙනවා. 42.(4) ව්‍යවස්ථාව ගැන තමයි ඔවුන් කියන්නේ. එහි මෙසේ කියා තිබෙනවා:

> "ජනාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය."

මෙය පාවිච්චි කරලායි නොයෙක් තර්ක විතර්ක ඉදිරිපත් කරන්නේ. මේ මතය ජනාධිපතිගේ අභිමතය හැටියට පළ කරගෙනයි මේ කටයුත්ත කරන්නේ. ඒක ජනාධිපතිතුමා පෞද්ගලිකව ගන්නා තීරණයක් නොවෙයි. අපි ජනාධිපති ලේකම් කාර්යාලයේදී, පක්ෂ නායක රැස්වීම්වලදී 'මතය' කියන්නේ ජනාධිපතිගේ පුද්ගලික අභිමතය නොවන බව එතුමාට පෙන්වා දුන්නා ඔබතුමාට මතක ඇති.

කෙසේ වෙතත් මේ ව්‍යවස්ථාවේ එක පැත්තකින් ජනාධිපතිගේ උපරිම විශ්වාසය සහිත මන්ත්‍රීවරයාව තෝරා ගන්නා ආකාරය පිළිබඳව නිශ්චිත ව්‍යවස්ථානුකූල විවරණයක් නොමැති වුණත්, ඒ සම්බන්ධයෙන් පළාත් සභා ක්ෂේත්‍රයේදී නම් යම් යම් නඩු තීන්දු ලබා දුන්නා. විශේෂයෙන්ම හිටපු වයඹ මහ ඇමතිවරයෙක් වූ ප්‍රේමචන්ද්‍ර මහතාගේ නඩු තීන්දුව මඟින් ඒ අවස්ථාවේදී යම් යම් විවරණ ලබා දුන්නා, පළාත් සභාවේ වැඩිම විශ්වාසය තිබෙන අයට මහ ඇමතිවරයෙක් පත් කර ගන්න, දිවුරුම් ප්‍රකාශවලින් පුළුවන්ය කියා. හැබැයි මේ ව්‍යවස්ථාවේ ඒ නඩු තීන්දු බලපානවාද නැද්ද කියන එක ගැන සැලකිල්ලකින් තොරව, තමාගේ මතය අනුව මේ පත් කිරීම කර තිබෙනවා. නමුත් ආණ්ඩුව විසිරවීම පිළිබඳව, අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව මෙසේ ප්‍රකාශ කර තිබෙනවා:

> "48.(2) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළ හොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළ හොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය".

පත් කිරීම පිළිබඳව මතය කොහොමද කියන එක පිළිබඳව විස්තරාත්මකව යමක් මේ ව්‍යවස්ථාවේ සඳහන් නොවුණත් ඉවත් කිරීම පිළිබඳව ඉතාම පැහැදිලි ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මෙතැනදී මට මතක් වෙනවා, අපි විශ්ව විද්‍යාලයේ ඉන්න කාලයේ, විද්‍යාව පිළිබඳ පාඩම් මාත් ඉංජිනේරු ශිෂ්‍යයින්ට උගන්වා තිබෙනවා. විද්‍යාත්මක ක්‍රමවේදය - scientific outlook- කියන්නේ මොකක්ද කියා කියනකොට ආපු ප්‍රවාදයක් මේක. අපි හැමදෙනාම දන්නවා, නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ නියමය. එතුමාගේ හිසට ඇපල් ගෙඩියක් වැටුණාම එතුමා තීරණය කළා, "ගුරුත්ව බලයක් තිබෙනවා, ඒකයි මේ ඇපල් බිමට වැටෙන්නේ; ග්‍රහලෝක කැරකැවෙන්නේ" කියා. හැබැයි වසර තුන්සියයක් යන තුරු මේ නිව්ටන්ගේ නියමය පරීක්ෂණයකින් ඔප්පු වෙන විධියේ සාධක කිසිවක් ගෙනාවේ නැහැ. වසර තුන්සියයකට පස්සේ ඉතාම පැහැදිලි ප්‍රතිසාක්ෂියක් ආවා, එවැනි ගුරුත්වාකර්ෂණ බලයක් නොමැති බවට. එම නිසා ඒ අවස්ථාවේ හිටපු ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙක් වුණු කාල් පොපර් විසින් කිව්වා, "විද්‍යාවේ ප්‍රධාන මූලධර්ම ඉදිරියට යන්නේ ඒ ඒ සිද්ධාන්ත සත්‍යාපනය වීමෙන් නොවෙයි; ඒ ඒ සිද්ධාන්ත අසත්‍යකරණය වීමෙන්" කියා; falsification මඟින්.

මම ව්‍යවස්ථා විශාරදයෙක්, නීති වේදියෙක් නොවුණත් මට හිතෙනවා, මේ ව්‍යවස්ථාවේ පත් කිරීම කොහොම වෙතත් අසත්‍යකරණය, භංගවීම ඉතා පැහැදිලිව ලියලා තිබෙනවා කියා. ඒ අනුව ඒක පොපර්වාදීන් විසින් ලියපු ව්‍යවස්ථාවක්ද කියලාත් හිතෙනවා. මොකද, අසත්‍යකරණයේ පැත්ත හරියට කරලා තිබෙන නිසා. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය, සූර්යයා අසලින් යන ග්‍රහලෝකයක සුළු හැසිරීමක ප්‍රතිඵලයක් හැටියට අවුරුදු 300ක් තිබුණු ප්‍රවාදය, එක සරල උදාහරණයකට අයින් කරන්න පුළුවන් වුණා නම්, හතර පාරක් විශ්වාසය භංග වෙච්ච පුද්ගලයා ගෙදර නොයන්නේ මොකද කියන එක තමයි අද අපට තිබෙන ප්‍රශ්නය ගරු කථානායකතුමනි.

ඊළඟට මම මතක් කරන්න ඕනෑ, මේ නිසා ඇති වෙලා තිබෙන ආර්ථික බලපෑම්. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ජීවත් වෙච්ච කෙනෙක් හැටියට ඔබතුමාට රහසක් නොවෙයි, මසකට අධික කාලයක් ඇදි ඇදී යන මේ ගැටලුව නිසා අපේ රටට ඇති වෙලා තිබෙන ආර්ථිකමය, මූල්‍යමය ගැටලුව. විශේෂයෙන්ම අද ලෝකයේ ආර්ථිකය ඉදිරියට යාමේ ප්‍රධාන සාධකය ස්ථාවරත්වය හා විශ්වාසයයි. ප්‍රාග්ධන චක්‍රය ක්‍රියාත්මකවීමට, ආයෝජන චක්‍රය ක්‍රියාත්මකවීමට, වර්ධනය ඇති කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකය තමයි ස්ථාවරත්වය සහ විශ්වසනීයත්වය. මොකක්ද අද මේ ආර්ථිකයට ඇති වෙලා තිබෙන බලපෑම? 2019ට ඇති වෙන්න යන බලපෑම මොකක්ද? ගරු කථානායකතුමනි, දැනටමත් රජයේ සුරැකුම්පත්වල - Government Securitiesවල - තිබෙන ධනය ශීඝ්‍රයෙන් එළියට ඇද ගෙන යනවා. මේ යන ආකාරයටම ගියොත් පුරෝකථනය කළොත් 2019 වර්ෂයේදී රුපියල් බිලියන 209කට ආසන්න ප්‍රමාණයක් රටේ සුරැකුම්පත්වලින් එළියට යනවා.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ඒ වාගේම සංචාරක ව්‍යාපාරයට බලගතු හානියක් වෙලා තිබෙනවා. මේ කාලයේ සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම සියයට 20කින් අහිමි වුණොත්, රටට තවත් රුපියල් බිලියන 150ක් අහිමි වනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ආදී ආයතන අපේ ආර්ථික රැකවරණයෙන් අයින් වීම නිසා අපේ පොලී අනුපාත දැන් ශීඝ්‍රයෙන් ඉහළ ගිහින් තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහතා විසින් වාණිජ ණයක් හැටියට ගත්ත ඩොලර් මිලියන 1,000ක ණය නැවත ලබා ගැනීමට ගියාම, මේ ජනවාරි 14වැනි දාට ඒ පොලී අනුපාතය තිබෙන ප්‍රමාණයට වඩා සියයට 4.5කට අධික ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. විදේශ ණය නැවත පිරවීමේ ඒ පොලී අනුපාතය සියයට 3කින් ඉහළ ගියොත්, ලබන වසර තුළ පමණක් ඩොලර් මිලියන 5,600ක් අපි විසින් උපයාගත යුතුයි, මේ අපේ ණය පියවීමට සහ අලුතෙන් ණය ගැනීමට. සියයට 3කින් පොලී අනුපාතය වැඩි වුණා කියලා හිතුවොත් ලබන අවුරුද්දට විතරක් මේ තිබෙන විනිමය අනුපාතයත් එක්ක මේ සඳහා රුපියල් බිලියන 32ක් අමුතුවෙන් හොයන්න වනවා. මේ සිද්ධියේ බලපෑම නිසා මේ ඇති වෙච්ච තත්ත්වය තුළ ගරු කථානායකතුමනි, වසර 10කට රුපියල් බිලියන 324ක් අපට හොයන්න වනවා. ඒක මේ රටේ සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සමෘද්ධියට ඇතුළු සියලුම දේවලට කරන වසරක ප්‍රාග්ධන ආයෝජනයෙන් හරියටම භාගයක්. ඒ, මේ මාසයේ කුමන්ත්‍රණයේ ප්‍රතිවිපාක.

ඊළඟට, මේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාදාමය නිසා ඇති වෙච්ච බලපෑම මත යම් හෙයකින් යුරෝපයේ GSP Plus සහනය අපට අහිමි වුණොත්, ලබන වසරේ ඒ අහිමි වීමේ තර්ජනයෙන් ඇති වන බලපෑම රුපියල් බිලියන 76ක්. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මහත්තයා මේ කුමන්ත්‍රණය ජනතාව අතර ස්ථාවර කර ගැනීම සඳහා කලබලයෙන් මේ අවස්ථාවේ ගෙනාපු ඊනියා සහන මල්ලේ බර රුපියල් බිලියන 150ක්. අද නම් එතුමාට ඒක බරක් නොවෙයි. මොකද, තෙල් මිල අඩු කරලා, බඩු මිල අඩු කරලා මේ වසරට ගියේ රුපියල් බිලියන 30යි. හැබැයි, "ගම්පෙරළිය" වැඩ පිළිවෙළ නවත්වලා, "සුබිත පුරවර" වැඩ පිළිවෙළ නවත්වලා, Tab වැඩ පිළිවෙළ නවත්වලා, සංවර්ධනය කප්පාදු කරලා, සෞඛ්‍ය හා අධ්‍යාපනය කියන ඒ සියලු දේවලින් රුපියල් බිලියන 150ක් ඉතුරු කර ගත්තා.

රුපියල් බිලියන 30ක් සහන විධියට දීලා, බිලියන 150ක් ඉතුරු කරගත්තා. ඒක තමයි පසුගිය කාලයේ කරපු දේ. එම නිසා ලබන වසරේ මේ සියල්ලේ එකතුව රුපියල් බිලියන 617ක් වෙනවා, ගරු කථානායකතුමනි. 2014ට සාපේක්ෂව අපේ දළ දේශීය නිෂ්පාදනය සියයට 4.6ක්. දේශපාලන කුමන්ත්‍රණය වෙලා මාසයක් තුළ මේ රටේ ආර්ථිකයට මෙවැනි බලපෑමක් වෙලා තිබෙනවා. අපේ ආර්ථිකය දැන් සියයට 4.5, සියයට 4, සියයට 3.5 අතර වේගයකින් තමයි වර්ධනය වෙන්නේ කියලා අපි හැමෝම දන්නවා. රටේ සම්පූර්ණ ආර්ථික වර්ධන වේගය අඩ පණ කරලා, රටේ ආර්ථිකය ඍණ දිශාවට ගෙනයන කුමන්ත්‍රණයක් තමයි රාජපක්ෂලා අද ජනාධිපතිවරයාත් එක්ක එකතු වෙලා කරපු මේ ක්‍රියාවලිය.

ඒ වාගේම, මේ රටට එන්න තිබුණු ආයෝජන නතර වුණා. අපේ අමාත්‍යාංශය ජපන් රජයත් සමඟ එකතු වෙලා කඩුවෙල සිට කොළඹ දක්වා ඉදි කිරීමට නියමිතව තිබුණු සැහැල්ලු දුම්රිය මාර්ගය සඳහා වසර 40කින් ගෙවෙන ලෙස ලබා ගැනීමට නියමිතව තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,400ක ණය මුදල අද අත් හිටුවීමේ තර්ජනය දක්වා ඇවිල්ලා තිබෙනවා. ඒ ණය මුදල ගත්තේ සියයට 0.1 පොලියට. සියයට 5, සියයට 6 පොලියට නොවෙයි. ඒ වාගේම, ඇමෙරිකා එක්සත් ජනපදයේ MCC - Millennium Challenge Corporation - ආයතනය විසින් අපේ ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කරන්න, බස් සේවාව ශක්තිමත් කරන්න, පළාත් අතර මාර්ග පද්ධතිය ශක්තිමත් කරන්න, රටේ ඉඩම් ටික මැනලා විධිමත් ඔප්පු හදන්න අපට නොමිලයේ - ප්‍රදානයක් හැටියට- ලබා දීමට නියමිතව තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 480 දැන් අපට නැති වෙලා තිබෙනවා. දෙසැම්බර් මාසයේ තමයි ඒ පිළිබඳ ගිවිසුම අත්සන් කරන්න හිටියේ. ජපන් ආධාරය පිළිබඳ ගිවිසුම අත්සන් කරන්න නියමිතව තිබුණේ නොවැම්බර් 22වන දා. අද අපට ඒකත් අහිමි වීමේ තර්ජනයකට ඇවිල්ලා තිබෙනවා.

අද ඇමෙරිකානු ඩොලර් මිලියන 1,700ක ලෝක බැංකු ව්‍යාපෘති ක්‍රියාත්මකයි. අද ඒ හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම තර්ජනයක් ඇතිවෙලා තිබෙනවා. ජල සැපයුම් ක්ෂේත්‍රය, නගර සැලසුම් ක්ෂේත්‍රය, ගංවතුර පාලන ක්ෂේත්‍රය, වාගේ අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර ගණනාවක් සඳහාම ලැබීමට නියමිතව තිබූ විදේශ ආයෝජන ඇණ හිටුවීමේ තර්ජනයක් මාසයක බලලෝභී කුමන්ත්‍රණය නිසා සිද්ධ වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

ඒ වාගේම මා අවධාරණය කරන්න කැමැතියි, ප්‍රජාතන්ත්‍රවාදය ගමන් කරන්න ඕනෑ ව්‍යවස්ථාවේ, නීති පොතේ ආකාරයට විතරක් නොවෙයි කියන එක. නීති පොතත් එක්ක, ශිෂ්ටත්වය, ශීලාචාරකම දේශපාලනයේදී තිබෙන්න ඕනෑ. ඕනෑම කෙනෙකුට පුළුවන් අල්ලපු වැටේ ඉඩම අල්ලා ගන්න ඕනෑ වුණාම, තණ්හාව ආවාම, වැටේ තිබෙන හිල් හොයාගෙන ඒ හිල්වලින් පැනලා එහා පැත්ත අල්ලා ගන්න. දේශපාලන ශිෂ්ටත්වය කියන්නේ ඒක නොවෙයි. දේශපාලනයට ව්‍යවස්ථාවෙන් ලබා දීලා තිබෙන්නේ මාර්ගෝපදේශයක් පමණයි. ඒ මාර්ගෝපදේශයට අනුකූලව ශිෂ්ටත්වය, ශීලාචාරකම තිබුණොත් පමණයි, අපට දේශපාලනය ඉදිරියට ගෙන යන්න පුළුවන්. අද සිදු වෙලා තිබෙන ක්‍රියාදාමය මොකක්ද? අර වැටේ හිල් හොයාගෙන පනිනවා වාගේ, ගෙදර පිටුපස ජනේලය ඇරගෙන පනිනවා වාගේ ව්‍යවස්ථාවේ ඇතැම් ව්‍යවස්ථා තමන්ට ඕනෑ විධියට විවරණය කරලා, මේ ක්‍රියාදාමය අවුල් කිරීම තමයි අද කරලා තිබෙන්නේ. ඒක ශිෂ්ටත්වයට සම්පූර්ණ පටහැනි ක්‍රියාවලියක්. ඒ නිසා අපි ප්‍රධාන වශයෙන්ම කියන්න ඕනෑ, මේ අවස්ථාවේදී තිබෙන්නේ ශිෂ්ටත්වයයි, අශිෂ්ටත්වයයි අතර සටනක්, යුක්තියයි, අයුක්තියයි අතර සටනක්, සහ මේ රටේ මෙතෙක් කල් තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තිබෙනවාද, නැද්ද කියන එක පිළිබඳව සටනක් බව ගරු කථානායකතුමනි. එදා 1933 වසරේ ඇඩොල්ෆ් හිට්ලර් ජර්මනියේ Chancellor හැටියට පස්ස දොරෙන්, Reichstagහි තමන්ට සියයට 33ක බලය තිබෙද්දී ඇතුළු වුණා. ඔහුට පාර්ලිමේන්තුවේ බලය අහිමි වුණා. ඔහු මොකද කළේ? ඔහු පාර්ලිමේන්තුව ගිනි තැබුවා. ගිනි තියලා මැතිවරණය කැඳෙව්වා. අද රාජපක්ෂ ජුන්ටාව අනුගමනය කරන්නේත් ඒකයි. රෑට පාර්ලිමේන්තුවට ගිනි තියන්න බැරි නිසා දවල්ට ඇවිල්ලා මිරිස් කුඩු ප්‍රජාතන්ත්‍රවාදයෙන් ඔබතුමාට පහර දීලා, අපට පහර දීලා මේ පාර්ලිමේන්තුවේ කටයුතු අඩපණ කරන්න හදනවා. ඒ වාගේම, ඒ අය අතේ මේ බල යන්ත්‍රය තියාගෙන, වල්ලෙන් හෝ පොල්ලෙන් ඡන්ද දිනා ගැනීම සඳහා ජනතා පරමාධිපත්‍යය පිළිබඳ ඡන්ද කථා පවත්වනවා.

මෙතැන සිටින අපි කවුරුවත් ඡන්දවලට විරුද්ධ නැහැ. නීත්‍යානුකූල ආණ්ඩුවක් යටතේ, ස්වාධීන මැතිවරණ කොමිසම යටතේ ඕනෑම ඡන්දයකට අප සූදානම් බව අපි ප්‍රකාශ කරනවා. පළමුවෙන්ම තියන්න ඕනෑ ජනාධිපති ඡන්දයයි. මොකද, අප ජනාධිපතිතුමා වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් ඉදිරිපත් වුණේ, හැටදෙලක්ෂයක ඡන්ද වරම මේ රටේ ජනතාව එතුමාට ලබා දුන්නේ මේ ආකාරයට අශිෂ්ට ලෙස ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ක්‍රියා කරන්න නොවෙයි. ඒ නිසා එතුමා ගත් ක්‍රියාමාර්ග සාධාරණීකරණය කරන්න නම් ඉදිරිපත් වෙන්න ඕනෑ

ජනාධිපතිවරණයකටයි. ඒ ජනාධිපතිවරණයේදීත්, ඒ වාගේම අනාගතයේ පවත්වන ඕනෑම මැතිවරණයකදීත් මේ රටේ සටන් පාඨය වෙන්න ඕනෑ මොකක්ද? ඒ වෙනත් කිසිවක් නොව, අයුක්තියත්, අශිෂ්ටත්වයත්, අශීලාචාරභාවයත්, පාදඩකරණයත් පරාජය කිරීමේ සටන් පාඨය බව මම අවධාරණය කරනවා.

ගරු කථානායකතුමනි, අපට මතකයි ඉරාක යුද්ධය. ඉරාක යුද්ධය ඇති වූ වකවානුවේදී -ඒ කාලයේ- ලෝකයේ සිටි බලගතු මනෝ විශ්ලේෂකයන් පිරිසක් ඇමෙරිකා එක්සත් ජනපදයේත්, එංගලන්තයේත් රාජ්‍ය නායකයන්ගේ හැසිරීම පිළිබඳව මනෝ විද්‍යාත්මක ලෙස සමීක්ෂණයක් කළා. ඒ සමීක්ෂණයට දායක වුණේ ඕවන් හා ඩේවිඩ්සන්. ඒ සමීක්ෂණයෙන් අදහස් කළේ බල දේශපාලනයේ නිරත දේශපාලකයන්ට වැලඳෙන ව්‍යාධියක් ගැනයි. ඒ තමයි, "Hubris Syndrome" - එහෙම නැතිනම් බල උන්මාදි ව්‍යාධිය. අවුරුදු 100ක කාලයක් තුළ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරුන් සහ එංගලන්තයේ අගමැතිවරුන් තුළ පැවැති මේ බල උන්මාදි ව්‍යාධිය ගැන ඕවන් හා ඩේවිඩ්සන් සඳහන් කළා. එහිදී බල උන්මාදි ව්‍යාධියේ ලක්ෂණ කීපයක් හඳුනාගෙන තිබෙනවා. පළමුවන එක තමයි, "using power for self-glorification" කියන එක. ඒක හොඳට ගැළපෙනවා, අපේ රාජපක්ෂ මහත්මයාට. හොඳටම ගැළපෙනවා. "මහ රජාණෝ" කියාගෙන හැම තැනකම self-glorification කරගෙන යනවා. ඊළඟට, "an almost obsessive focus on personal image"; ඒකත් හොඳටම ගැළපෙනවා. පාරට බැස්සාම අඩියක් අඩියක් ගණනේ cut-outs, posters ගහගෙන, මේ ව්‍යාධියේ අංග ලක්ෂණ තමයි පෙන්නුම් කරන්නේ. මේවා ඩියුක් සරසවියේ සොයා ගැනීම්. ඊළඟට, "excessive self-confidence accompanied by contempt for advice or criticism of others"; තනිකරම කිසි කෙනෙකුගේ අවවාද අනුශාසනා පිළිගන්නේ නැතුව "මම ම වේදැයි" කියා ගෙන, "මම ම තමයි" කියාගෙන කටයුතු කිරීම.

අපි දන්නවා, පසුගිය කාලයේ මේ රටේ මිත්‍යාවක් ඇති කරලා තිබුණා, මහින්ද මහත්මයා ආවාම රටේ ආර්ථිකය ඇලඩින්ගේ පුදුම පහන වාගේ, මැජික් පොල්ලෙන් වගේ ඉස්සරහට යයි කියලා. පිල් මාරු කිරිල්ල පිළිබඳ ඔස්තාර් තමයි බැසිල් රාජපක්ෂ. රටේ නීතිය හා සාමය ඇතුළු දේශප්‍රේමය කරගෙන යන්නේ නන්දසේන ගෝඨාභය රාජපක්ෂ. මේ ඔක්කෝම අද මිත්‍යාවන්, පල් බොරු බවට පත් වෙලා තිබෙනවා. මොකද, මේ ගොල්ලන්ගේ මේ ව්‍යාධිය නිසා මේ ගොල්ලන්ට මේවා ටික පෙනෙනවා. ඊළඟට, "loss of contact with reality"; අන්න ඒක තමයි යථාර්ථය පිළිබඳව කිසිම හැඟීමක් නැහැ, මේ පාර්ලිමේන්තු දේශපාලනයේ යථාර්ථයවත්, රටේ දේශපාලන යථාර්ථය ගැනවත්. ඊළඟට, "speaking as a messiah"; ගලවා ගන්නෙක් හැටියට, ජාතියේ ගැලවුම්කාරයා හැටියට පෙනී ඉන්න ලෙඩෙක්. ඊළඟ එක, "reckless and impulsive actions"; අර ඔබතුමාගේ පුටුවට වතුර ගහපු, මෙතැන ඉන්න පොලිස් නිලධාරින්ට මිරිස් කුඩු ප්‍රහාර දීපු අන්න ඒවා තමයි මේ impulsive actions කියන්නේ. මේ විධියේ කරුණු කිහිපයක් තිබෙනවා; කරුණු 14ක් තිබෙනවා. මම සියලු මන්ත්‍රීවරුන්ට කියනවා, කරුණාකර ඔවන් සහ ඩේවිඩ්සන් කියන මේ ලෙඩේ ගැන, Hubris Syndrome එක ගැන -බලකාමී උන්මාදය ගැන- ඉගෙන ගන්න කියලා. මේ බලකාමී උන්මාදය දැන් වැළඳී තිබෙන්නේ අපේ රාජපක්ෂ මහත්මයාට.

අවුරුදු 10ක් විතර බලයේ ඉන්න කොට හිතෙනවා තමන්ගේ තමයි රට, මේකෙ තමන්ට ඕනෑ විධියට හැසිරෙන්නට ඕනෑ; තමන්ගේ පවුල තමයි පවුල, අනෙක් හැමදෙනාම ඊට අනුව කටයුතු කරන්නට ඕනෑයි කියලා. ඒ ව්‍යාධියේ අංග ලක්ෂණ තමයි අද අපට මෙතැනින් පෙනෙන්නට තිබෙන්නේ. අපි මේ ව්‍යාධිය මෙතැනින් සුව කරන්නට ඕනෑ. මේ රටේ වෙනත් අයටත් මේ ව්‍යාධිය වැලඳෙන්නට ඉඩ තිබෙනවා. ඒක වැළැක්වීමට කටයුතු කිරීම තමයි අද ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කාරණය වෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් සඳහන් කරන්නම්. අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා, එතුමාගේ පුත්‍ර රත්නය ඇතුළු පිරිස් මුහුණු පොතේ - facebook එකේ - wall post දාගෙන තිබෙනවා, "අප්පච්චි තමයි රජා, මහරජාණෝ; කරන්න බැරි වැඩක් නැහැ, දැන් ආර්ථිකය ශීඝ්‍රයෙන් වර්ධනය වෙනවා" කියලා. දැන් අපට පෙනෙනවා රුපියල කඩා වැටෙන බව. කිව්වේ කොහොමද? හම්බන්තොට ජනසතු කරනවා කිව්වා.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, 2011දී පී.බී. ජයසුන්දර මහත්මයා චීනයට ගියා. ඒ චීනයට ගියේ, අපේ ආණ්ඩුවෙන් ගෙනාපු යෝජනාවක් සම්බන්ධයෙනුයි. චීනයේ වුවමනාවට නොවෙයි. හම්බන්තොට වරාය, දකුණු කොළඹ වරාය, පුත්තලම බලාගාරය සහ මත්තල ගුවන් තොටුපොළ චීනයට ලබා දෙන්නට, චීනයේ ඉල්ලීමක් හැටියට නොවෙයි අපේ ඉල්ලීමක් හැටියට. අද ඊයේ නොවෙයි, 2011දී. පුත්තලම බලාගාරය දෙනවාට මම විරුද්ධ වුණු නිසා තමයි එදා ඉඳන් අපට ඉතාම බරපතළ, අශිෂ්ට හිරිහැර කිරීම් ගණනාවක් කළේ. අන්තිමට මම ඒ ඇමතිකම එතුමාටම කර ගන්න භාරදීලා අයින් වෙලා ආවා. ඒ විතරක් නොවෙයි. 2014දීත් පී.බී. ජයසුන්දර ඉන්දියාවට ගිහිල්ලා, තෙල් ටැංකි ටික ඉන්දියාවට ලබා දෙන්නට බලගතු යෝජනාවක් ඉදිරිපත් කරලා ආවා. මේගොල්ලන්ම තමයි අද මේ ජාතික සම්පත් ගැන කථා කරන්නේ. අද පෙන්වලා තිබෙනවා, මේ ගොල්ලන්ට රුපියල පාලනය කරන්නට බැරි බව. ඒ වාගේම ආර්ථිකය කළමනාකරණය කරන්නට මේගොල්ලන් අසමත් බව සහ අඩුම ගණනේ මේ පාර්ලිමේන්තුවේ බල තුලනය වෙනස් කිරීමටවත් රාජපක්ෂලාට බැරි බව.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා අත් අඩංගුවට ගන්න යනවාය, රණ විරුවෝ දඩයම් කරන්න යනවාය කියා මරහඬ දුන් අයම අද ඒ කටයුත්ත කර තිබෙන බව අවධාරණය කරන අතර, මේ එන්නේ ගෝඨාභයගේ පාලනය යටතේ කියන එකත් අවධාරණය කරන්න ඕනෑ. ඒ නිසා මුහුණු පොතේ "රාජපක්ෂ වීරාභිවාදනය" කරන අයට; ඒ ව්‍යාධිය වැලඳුණු අයට මම යෝජනා කරනවා, "දැන් නම් අපේ අප්පච්චිට බැහැ" කියලා උඩින්ම දමා ගන්න කියලා. එසේ කියමින් මා නිහඬ වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ගරු චම්පික රණවක මැතිතුමනි, මේ කාරණය පිළිබඳව සඳහන් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඔබතුමා මගේ ක්‍රියාදාමය ගැනත් සඳහන් කළා. මා විශ්වාසයෙන් යුතුව, ගෞරවයෙන් මේ සභාවට කියන්න කැමැතියි, ඔක්තෝබර් 27 වැනිදා උදේ සිට අද වනතුරු මම ක්‍රියා කළේ පූර්ණ වශයෙන්ම නීතිරීති අනුව බව. විශේෂයෙන්ම අන්තර්ජාතික පාර්ලිමේන්තු සංගමයේ උපදෙස් අනුවයි ක්‍රියා කළේ. පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ ක්‍රියාදාමය, නීතිරීති, ඒ වාගේම පවතින පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුවයි මා ක්‍රියා කළේ. ඒ නිසා මගේ හෘදය සාක්ෂිය අනුව මට කියන්න පුළුවන්, මම කිසිම විටෙක පක්ෂග්‍රාහී වුණේ නැහැ කියන එක. ඒ වාගේම, පිළිගත් පක්ෂ 6ක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ පක්ෂ හයෙන් පක්ෂ හතරක් මේ 123 දෙනා නියෝජනය කරනවා. මම ක්‍රියා කළේ බහුතර මතය අනුවයි.

ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, ගැසට් නිවේදනය අනුව ක්‍රියා කළ බව. ඒක සත්තකින්ම "ඔව්". මොකද, පාර්ලිමේන්තුවේ නිලධාරින් ඒ ගැසට් නිවේදනයට පිටින් ක්‍රියා කර ඒ අය අපහසුතාවට පත් වීමක් සිදු කරන්න කිසිම විටෙක මට අවශ්‍ය

[ගරු කථානායකතුමා]

වුණේ නැහැ. ගැසට් නිවේදනයක් කියන්නේ යම් කිසි වටිනාකමක් තිබෙන දෙයක්. ඒ අනුවයි අවශ්‍ය පහසුකම් ලබා දෙන්න මම උපදෙස් දුන්නේ.

නමුත්, කථානායකවරයා වශයෙන් මම මේ ක්‍රියාදාමයට එකඟ වෙන්නේ නැහැය, ඒ නිසා පාර්ලිමේන්තුවේ බහුතරයක් -මම හිතන විධියට ඒ අවස්ථාව වන විට 118ක් පමණ- සිටින අයට මෙයට විරුද්ධ බව සඳහන් කරන්න වහාම අවස්ථාවක් ලබා දෙන්නය කියා එදාම ජනාධිපතිතුමා හමු වෙලා මම කිව්වා. 5වන දා පාර්ලිමේන්තුව නැවතත් විවෘත කරලා, 7වන දා මේ සම්බන්ධයෙන් ඡන්දයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙනවාය කියා ඒ අවස්ථාවේදී එතුමා මට සඳහන් කළා. නමුත්, විවිධ හේතූන් මත එය කරන්න බැරි වුණා. "Comply and Complain" කියා සිද්ධාන්තයක් තිබෙනවා නේ. මම ක්‍රියා කළේ ඒ අනුවයි. විශ්වාස භංග යෝජනාවෙන් පස්සේ, නියම වශයෙන්ම ඒ ආණ්ඩුවට ස්ථාවරභාවයක් නැති බව; බහුතරයක් නැති බව තේරුම් ගියාට පසුවයි, මම කීප විටක්ම කෙළින්ම කිව්වේ, "මේ ආණ්ඩුව මම පිළිගන්නේ නැහැ" කියලා. ඒ නිසා, එය ඉදිරිපත් කිරීම සහ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ අටවන පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා පිළිබඳව සඳහන් වන්නේ මෙහෙමයි.

"2015 සැප්තැම්බර් 01වන දා සිට මේ දක්වා -2018 ඔක්තෝබර් 26 දක්වා- ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, කොළඹ දිස්ත්‍රික්කය."

ඊළඟට, "ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, කුරුණෑගල දිස්ත්‍රික්කය, 2018 ඔක්තෝබර් 26 දින සිට මේ දක්වා."

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවෙන් එතුමා පරාජයට පත් කරලා හැන්සාඩ්ගත වෙලා තිබෙනවා, නොවැම්බර් 15වන දා සිට එතුමා අගමැති නොවෙයි කියා. නමුත් පාර්ලිමේන්තු වෙබ් අඩවියේ තිබෙන්නේ, මේ දක්වා එතුමා අගමැතිවරයා කියායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම ඒ ගැන අවධානය යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව රැස්වන අවස්ථාවල ජාතික රූපවාහිනිය සහ SLBC ඔස්සේ පාර්ලිමේන්තුවේ ඒ සැසිය සජීවීව ආවරණය කරනවා. නමුත් මේ දවස් ටිකේ 107.3 සහ 107.5 ඔස්සේ ජාතික ගුවන්විදුලියෙනුත්, ජාතික රූපවාහිනියෙනුත් ඒ ආවරණය දෙන්නේ නැහැ. මා දන්නා විධියට, පාර්ලිමේන්තු සැසි තිබෙන දවස්වලට පාර්ලිමේන්තුවේ මොකක්ද වෙන්නේ කියන එක මේ රටේ ජනතාවට සජීවීව දැනගැනීම සඳහා; ඒ live coverage එක ලබා දීම සඳහා පාර්ලිමේන්තුව ජාතික ගුවන්විදුලියට මුදලුත් ගෙවා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම බොහොම කනගාටුවෙන් මේ කාරණය කියන්නේ. මේ දවස් ටිකේ SLBC එක ඒ ආවරණය දෙන්නේ නැහැ. පාර්ලිමේන්තු සැසියට live coverage එකක් දෙන එක ජාතික ගුවන්විදුලිය නිතුමතයට නතර කර තිබෙනවා. ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පාර්ලිමේන්තුවෙන් ඒ සඳහා මුදල් ගෙවා තිබෙනවා නම්, කරුණාකර ඒ බලධාරීන්ට කථා කරන්න. මේ දවස් ටිකේ පාර්ලිමේන්තුව රැස්වන අවස්ථාවල, මේ රටේ ජනතාවට ගුවන්විදුලිය ඔස්සේ දෙන ඒ live coverage එක ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කර, ඒ පිළිබඳව ඔවුන් සමඟ කථා කරන්න.

පාර්ලිමේන්තු සැසිවාරය පිළිබඳ coverage එක ලබා දීම සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී, "ටීඑන්එල්" රේඩියෝ ආයතනයටත්, "සිරස" ආයතනයටත්, අනික් පෞද්ගලික මාධ්‍යවලටත් මම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් මම පැහැදිලි කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගුවන්විදුලිය මෙතැනදී පක්ෂග්‍රාහීව ක්‍රියා කර තිබෙන බව අපිට ආරංචි වුණා. ඊයේත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළා; අද උදේත් අවධානය යොමු කළා. එහි සභාපතිවරයා එහෙම පිටින්ම පක්ෂග්‍රාහීව ක්‍රියා කරන බව ඒ අවස්ථාවේදී මට තේරුණා. මම අද උදේම ඒ කාරණය සම්බන්ධයෙන් ලේකම්තුමාව දැනුවත් කළා. පාර්ලිමේන්තුවට අපහාස කිරීම වාගේ තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මොකද, අපි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට මුදල් ගෙවනවා. අවුරුදු 3ක්, 4ක් තිස්සේ අපි මේ වැඩ කටයුත්ත කරගෙන යනවා. ඒ නිසා එතුමා එලෙස ක්‍රියා කිරීම සම්බන්ධව මම වහාම පියවරක් ගන්නවා. නමුත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ දැනට අපිට එහෙම agreement එකක් නැහැ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඊයේ සහ අද ගත් තීරණ ඒ අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ට යවන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම ඒ සඳහා කටයුතු කරන්නම්.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජෝන් අමරතුංග මැතිතුමනි, ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මේ වටිනා යෝජනාවට අදාළවයි මම වවන ස්වල්පයක් කථා කරන්න කල්පනා කළේ. ඒ ගැන කියන්න ප්‍රථම, විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. තමුන්නාන්සේගේ මේ ක්‍රියාදාමය ජාතික වශයෙන් පමණක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් අගය කරනවා.

අද ගෙනෙන මේ යෝජනාව වැදගත් වෙන්නේ මෙන්න මේ නිසායි, ගරු කථානායකතුමනි. අපේ අමාත්‍යාංශයේ; සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ සහ අධිකාරියේ ඩොලර් බිලියන ගණනාවක මුදල් තැන්පත් කර තිබෙනවා. සංචාරක ප්‍රවර්ධන වැඩවලටත්, සංචාරකයන් දේශීය වශයෙන් එන ස්ථාන වැඩිදියුණු කරන්නත් තමයි ඒවා පාවිච්චි කරන්නේ. භාණ්ඩාගාරය; මුදල් අමාත්‍යාංශය මේ සල්ලි ටික අදින්න හදනවාය කියා මට අද ආරංචියක් ලැබුණා. මේක මහා භයානක වැඩක්. අද මේ යෝජනාවෙන් පසුව ඒ සියල්ලම නතර වෙන්න ඕනෑය කියා මම හිතනවා. මම කියන්නේ මේකයි. ඒ මුදල් නිදහස් කළොත්, ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ සහ අධිකාරියේ සභාපතිතුමන්ලාත්, ගණකාධිකාරිවරුත් ඒවාට වග කියන්න ඕනෑ. මේ මංකොල්ලය අපි නවත්වන්න ඕනෑ. මේවාට ඉඩ දෙන්න බැහැ. මේ අවජාතක ආණ්ඩුව, අවජාතක කැබිනට් මණ්ඩලය මේ සල්ලි ගන්නේ කොහොමද? මේවා අරගෙන හෙලිකොප්ටර්වල යන්නද හදන්නේ? ඒ නිසා මේ පණිවුඩය ඒ නිලධාරින්ට යැවිය යුතුයි. ඒ අය එහෙම කළොත්, ඒ අයගේ පෞද්ගලික ධනයෙන් මේ මුදල් අය කර ගන්න සිදු වෙයි. ඒ ඇරෙන්න, මුදල් රෙගුලාසි අවභාවිත කිරීම සම්බන්ධයෙන් ඔවුන්ව හිර දඬුවමට යටත් කරන්නත් පුළුවන් වෙයි. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා. ඊට පසුව ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මට අදහස් දක්වන්න ඉඩ ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ සිදුවීමක් වෙලා තිබෙනවා. මුරපොළකදී ටී56 ගිනි අවියකින් වෙඩි තැබීම නිසා මඩකලපුව ප්‍රදේශයේ සේවයේ නියුතු පොලිස් නිලධාරින් දෙදෙනෙකු ඝාතනය වෙලා තිබෙනවා. මේක බරපතළ තත්ත්වයක්. මම හිතන විධියට මෙච්චර කාලයක් -2015න් පසුව- මෙහෙම දෙයක් සිදු වුණේ නැහැ. මේ ගැන අපිට සැක සංකා කිහිපයක් මතු වෙනවා.

විශේෂයෙන්ම ඊයේ-පෙරේදා විනයාගමූර්ති මුරලිදරන් මැතිතුමා Twitter පණිවුඩයක් නිකුත් කරලා තිබුණා. එතුමා එහි සඳහන් කරලා තිබුණා, "I think some UNP people try to scare me. Many people message me and call me. Please remember I am Karuna Amman from Batti. Maybe you ask other people who Karuna Amman before 2004." කියලා. මෙම පණිවුඩයත් -මේ තර්ජනයත්-, ඊයේ සිදුවීමත් අතර සම්බන්ධයක් තිබෙනවාද කියා අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මොකද, රට අස්ථාවර කරන්න 2004ට කලින් හිටපු කරුණා අම්මාන් ආයෙත් නැඟිටිනවාද, ආයෙත් ආයුධ අතට ගන්නවාද කියන කාරණයත් - ඒ වාගේම ඊයේ TNA එක එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ සන්ධානයට සහයෝගය පළ කරන්න ප්‍රකාශයක් කරලා, අත්සන් කරලා ජනාධිපතිතුමාට දීලා තිබෙනවා. මේ සංඝිඳියාව, රට තුළ ජාතීන් අතර ඇතිවෙන සමඟිය නැති කරන්න කරුණා අම්මාන් වාගේ ත්‍රස්තවාදියෙක් යොදා ගෙන මහින්ද රාජපක්ෂ කල්ලිය, මේ හොර ආණ්ඩුව කටයුතු කරනවාද කියා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

මම හිතන විධියට මේ අවස්ථාවේ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය ජනාධිපතිතුමා ළඟ තිබෙන්නේ. අපේ අමාත්‍යාංශය විධියට අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමන්ලා සිටියදී, කවදාවත් -අවුරුදු තුනහමාරක් සිටියා- මෙහෙම සිදුවීමක් රට තුළ ඇති වුණේ නැහැ. හැබැයි, ඒ පැත්තේ "ආවා" කල්ලිය රතිඤ්ඤයක් පත්තු කරද්දීත්, මෙහේ ඉන්නා දේශප්‍රේමීන්, වීරවංශලා, ගම්මන්පිලලා ලංකාව ගිනි තියන්න -රට ගිනි තියන්න - හැදුවා, "මෙන්න කොටි සංවිධානය නැඟිටලා." කියා. දැන් මේ වේලාවේ එක්කෙනෙක් කථා කරන්නේ නැහැ. වීරවංශලා, ගම්මන්පිලලා කථා කරන්නේ නැහැ. ඒ නිසා පැහැදිලිවම අපට මේ අයගේ ප්‍රකාශයක් අවශ්‍යයි. ඒ වාගේම ජනාධිපතිතුමාගේ මැදිහත්වීම අවශ්‍යයි. මේක බරපතළ තත්ත්වයක්. කරුණා අම්මාන් මේකට මැදිහත් වෙලා ඉන්නවාද කියා බරපතළ සැකයක් තිබෙනවා, මේ Twitter පණිවුඩය හරහා. දැන් පොලිස්පතිතුමෙක් ඉන්නවාද, නැද්ද අපි දන්නේ නැහැ. පොලිස්පතිතුමා අයින් කළාද අපි දන්නේ නැහැ. ඒ නිසා ජනාධිපතිතුමා වහාම මේ තත්ත්වයට මැදිහත් වෙලා රට ස්ථාවර කරන්න, රටේ නැවත ගිනි ඇවිළෙන එක නතර කරන්න කටයුතු කරන්න.

හැබැයි, පැහැදිලිව අපි දකුණ ගිනි තියන්නේ නැහැ. අපි ජාතිවාදීන් නොවෙයි. ඊයේ-පෙරේදා මහවිරු සැමරුම් තිස් ගණනක්ද, හතළිස් ගණනක්ද තිබුණා. හැබැයි, අපි කියන්නේ නැහැ, "අන්න කොටි ඇවිල්ලා." කියා. අපි ඒ වාගේ ජාතිවාදීන් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ වෙලාවේ අපි සතුටු වෙනවා, මේ මාසය ඇතුළත මහවිරු සැමරුම ආපු එක ගැන. මොකද, අපේ ආණ්ඩුවක් තිබෙන වේලාවේ මේ මහවිරු සැමරුම ආවා නම්, මෙලහකට දකුණ ගිනි තියලා. අද ගම්මන්පිලලා, වීරවංශලා -ඔය ඉන්නා නඩය- මෙලහකට දකුණ ගිනි තියලා, "අන්න කොටි උතුරේ සමරනවා." කියා. හැබැයි, අපේ එක මන්ත්‍රීවරයෙක් - අපි වගකීමෙන් කටයුතු කළා. අපි ආණ්ඩු

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

පක්ෂයේද, විපක්ෂයේද, කොහේ සිටියාද කියා නැහැ. අපි ජාතිවාදී ගිනි දළු මේ රටේ කවදාවත් දල්වා නැහැ. ඒ නිසා මේ තත්ත්වය අපි රටට පැහැදිලි කරන්න ඕනෑ, මොකද, පොලිස් නිලධාරීන් දෙදෙනෙක් තමයි 56 ගිනි අවියකින් මරා තිබෙන්නේ.

මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපතිවරයා විධියට තවමත් කටයුතු කරන කරුණා අම්මාන්, මහින්ද පිලේද මෛත්‍රී පිලේද කියලා මම දන්නේ නැහැ, මොන පිලේ හිටියත්, "මම මඩකලපුවේ කරුණා අම්මාන්" කියමිනුයි තර්ජනය කර තිබෙන්නේ. ඒ නිසා 2004ට කලින් හිටපු කරුණා අම්මාන් මාසයක කාලයක් ඇතුළත නැවත නැඟිටින්න හදනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ජාතිවාදී ගිනි දැල් අවුළපු වීරවංශලාට, ගම්මන්පිලලාට අපි කියනවා, පුළුවන් නම් ඇවිල්ලා ප්‍රකාශයක් කරන්න කියා. පසුගිය දවස්වල පොඩ්ඩක් ඇත්නම් ස්වාමීන් වහන්සේලාත් එක්ක බුරුතු පිටින් ඇවිල්ලා මේවා ගැන කථා කළා. අද කථා කරන්න එක්කෙනෙකුවත් නැහැ. අද කථා කරන්න GMOA එක නැහැ. මේ අය අද හැංගිලායි එන්නේ. එක පැත්තකින් මාසයක කාලයක් ඇතුළත අපේ රටේ මිනිසුන්ගේ බුද්ධියට කථා කරලා ඇත්ත තත්ත්වය අවබෝධ කරගන්න අවස්ථාව දුන්නු මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, අවුරුදු තුනහමාරක් අපට විරුද්ධව ගොඩ නැඟුණු බලවේගවලට, මේ මාසයක කාලයක් තුළදී අපි කොතැනද ඉන්නේ කියන එක, කවුද සත්‍ය කථා කරන්නේ කියන එක, කවුද සත්‍ය වෙනුවෙන් පෙනී සිටින්නේ කියන එක, කවුද හරි කියන එක අවබෝධ කර දෙන්න අවස්ථාව දුන්නා. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ස්තුතිවන්ත වෙනවා, මේ වාගේ තත්ත්වයක් රට තුළ ඇති කරලා අපේ සත්‍ය මුහුණුවර, අපේ සැබෑව, අපේ සැබෑ ස්ථාවරය රටට අවබෝධ කර දෙන්න අවස්ථාව උදා කරදීම සම්බන්ධව. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. මම මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාවත් දැනුවත් කරන්නම්. ඒ වාගේම ආරක්ෂක ලේකම්වරයාටත් කියන්නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න කියලා.

මීළඟට ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා.

[11.13a.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Mr. Speaker for the opportunity given to speak a few words at this time.

I would like to second the proposal made by the Hon. Nalin Bandara Jayamaha just now with regard to the situation that has arisen since the 26th of October. Karuna Amman came in from the cold as it were and started speaking just after the 26th of October. There were many statements that he made and unfortunately, this incident happened at early hours this morning. Four policemen were shot at; two have succumbed to their injuries and we also, from the information that we ourselves have, have serious suspicions over these persons who were rejuvenated after the events of the 26th of October last month.

Similarly, another person also seems emboldened now. The EPDP cadres have suddenly come out of the woodwork in Jaffna. There was an attack last week - not on our Party, but on another Party members of a Paredeshiya Sabha - by the EPDP cadres and somebody who calls himself a “minister” is now going round saying, “I have returned, I have returned.” Using a famous screen dialogue from a cinema in Tamil, he goes round saying, “I have returned.” That is to terrorize the people. So, I would urge the Hon. Speaker to take appropriate action in this regard.

With regard to the Motion before the House, this is an occasion when, I think, perhaps for the very first time, Parliament is actually exercising the total control that it is supposed to have over the public finances of the country. It has always been there and we have spoken about it. But, this is, perhaps, the first time that that is being put into action. We have seen this happening in other countries when a Budget is stalled, governments shut down et cetera; this is somewhat similar.

When the Constitution says that Parliament has total control over public finance, it must be something tangible; it must be something of a power that the Parliament must be able to exercise. Yesterday’s and today’s Motions before the House are exercising a little of those powers bringing to the notice of those responsible and to the country of what the Parliament can do and if they do not heed what the Parliament is doing as a token of a reminder, then the Parliament can actually shut down government. I want to urge the persons responsible, particularly His Excellency the President and others who still claim illegally to be Prime Minister, Ministers, State Ministers and Deputy Ministers et cetera, that they must stop that, that they must give that up. They are people who have repeatedly, in this House, talked about the supremacy of Parliament. Many of them have ad nauseam talked about this and here is a test. This House has very clearly, not once, not twice, not three times, now almost on a daily basis, demonstrated that there is no Government.

I would also urge you, Mr. Speaker, to take appropriate steps with regard to how the media is treating this. Even after your pronouncement from the Chair on the 15th of November that due to the passage of the Motion the previous day that there is no Prime Minister and that there are no Ministers and the Cabinet, still the newspapers and other media are describing various people as "the Prime Minister", "Ministers" et cetera. I am glad the Hon. Member here raised the issue that the Parliament website still to date identifies the Hon. Mahinda Rajapaksa as the Prime Minister. I mean, if the Parliament does not respect what the Parliament has done, then it is impossible to call others to account. So, I urge you, Sir, to take immediate steps with regard to putting the Parliament website right and also instruct those responsible for various private media, even the State media, because this is a breach of the privilege of Parliament. Whether a Vote of No-Confidence is adopted or not is decided in the Parliament and nowhere else.

About 10 or 12 days ago, when we met with His Excellency the President, I said this even to him, that it is the Hon. Speaker who has to be satisfied as to whether a particular Motion was carried in Parliament or not, not the President. A No-Confidence Motion is passed in Parliament, not in the Presidential Secretariat. It is in Parliament. The Constitution has given different powers to different organs of Government and it has appointed certain other organs to be a check and balance of the powers exercised by the other organs. Certainly the Parliament has the power to be a check and balance on the powers exercised by the Executive and to that extent, where it is clearly stated that when a Vote of No-Confidence is passed on the Government the Cabinet stands dissolved. That is what the supreme law of the country says. That happens by operation of law. No one else needs to be satisfied that the Motion has been carried or not and whether it is a voice vote or an electronic vote or a vote by name. That is an act and deed of the Parliament and the moment that happens by operation of law, "the Cabinet stands dissolved" - those are the words that are used and this must be given effect.

We cannot allow various people in this country to willy-nilly violate the Constitution in this way. They are violating the Constitution, the Constitution that they have sworn to uphold and defend. So the Motion that was carried in this House yesterday and the Motion now before the House are the follow-up steps of what the Parliament can do. What the Parliament has done is well within the powers. The powers that have been given to it have been exercised and if it is not being recognized by others, then the Parliament can follow up with these Resolutions.

I also wish to say a few worlds, Sir, in Tamil with regard to the TNA's position that was explained to the country yesterday by means of a letter to His Excellency the President.

நேற்றைய தினம் அதிமேதகு ஜனாதிபதி அவர்களுக்கு தமிழ்த் தேசியக் கூட்டமைப்பினராகிய நாங்கள் ஒரு கடிதமொன்றை எழுதி அனுப்பியிருக்கிறோம். அது பகிரங்கப் படுத்தப்பட்டிருக்கின்றது. தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த 14 பாராளுமன்ற உறுப்பினர்களும் சேர்ந்து கையொப்பமிட்டு அந்தக் கடிதத்தை அனுப்பியிருக்கிறோம். ஒக்ரோபர் மாதம் 26ஆம் திகதி ஜனாதிபதி அவர்கள் எடுத்த சில நடவடிக்கைகள் சம்பந்தமாக ஏற்கனவே தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த நாங்கள் எங்களுடைய கொள்கை நிலைப்பாட்டைத் தெளிவுபடுத்தியிருக்கிறோம்; அது நடந்த சில நாட்களுக்குள்ளே தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய உறுப்புக் கட்சிகளின் தலைவர்களும் பாராளுமன்றக் குழுவினரும் சேர்ந்து உரையாடிய பிறகு ஓர் அறிக்கையாக அதனை நாங்கள் வெளியிட்டிருந்தோம். ஜனாதிபதியினால் ஒக்ரோபர் 26ஆம் திகதி எடுக்கப்பட்ட நடவடிக்கைகள் அரசியலமைப்புச் சட்டத்திற்கு விரோதமானதென்றும் சட்ட விரோதமானவையென்றும் நாங்கள் அதிலே தெட்டத் தெளிவாகச் சொல்லியிருக்கின்றோம். எமது அந்த நிலைப்பாடு பகிரங்கமாக அறிவிக்கப்பட்டிருக்கின்றது. அந்த நிலைப் பாட்டிலிருந்து நாங்கள் மாறவில்லை.

அதைத் தொடர்ந்து பாராளுமன்ற அமர்வுகளைத் தடுக்கும்வகையில் ஜனாதிபதி நடவடிக்கையெடுத்திருந்தார். மேலும், நவம்பர் மாதம் 14ஆம் திகதி பாராளுமன்றத்தைத் திரும்பக் கூடுமாறு அழைத்துவிட்டு, அதற்கிடையில் நவம்பர் 9ஆம் திகதி பாராளுமன்றத்தைக் கலைக்க உத்தரவிட் டிருந்தார். அதற்கெதிராக நாங்கள் நீதிமன்றத்திற்குப் போனோம். முதலாவது மனுவாக எதிர்க்கட்சித் தலைவருடைய மனுதான் நீதிமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டது. மற்றைய கட்சிகளும் நீதிமன்றத்தை நாடின. அரசியலமைப்புச் சட்டத்திலே ஜனாதிபதி அவர்களுக்கு இல்லாத ஓர் அதிகாரத்தை உபயோகித்து அவர் விதித்த அந்தக் கட்டளையை உயர் நீதிமன்றம் தற்போது தற்காலிகமாக இடைநிறுத்தியிருக்கின்றது. நாங்கள் எடுத்த அந்த நடவடிக்கையின் காரணமாகத்தான் 14ஆம் திகதி பாராளு மன்றம் கூட முடிந்தது; 15ஆம் திகதி கூட முடிந்தது; 16ஆம் திகதி கூட முடிந்தது. 19ஆம் திகதியும் பாராளுமன்றம் கூடியது. உயர்நீதிமன்றத்திலே மனுக்களைச் சமர்ப்பித்து, வாதாடி அந்த இடைக்கால உத்தரவைப் பெற்றதன் காரணமாகத்தான் இன்றைக்குப் பாராளுமன்றப் பிரதிநிதித்துவ ஜனநாயகம் - representative democracy - நாட்டிலே இருக்கிறது. அதற்கான நடவடிக்கைகளை நாங்கள் எடுத்திருந்தோம்.

அரசியலமைப்பு மீறப்படுவதென்பது மிகவும் பாரதூரமான ஒரு விடயமாகும். தமிழ் மக்கள் மத்தியிலே அரசியல் செய்கின்ற சில நபர்கள் இது சம்பந்தமாகத் தவறான கருத்துக்கள் பலவற்றை இன்றைக்குப் பரப்பிவருகிறார்கள். ஆகையினாலே இந்த விளக்கத்தைக் கொடுக்க வேண்டிய ஓர் அவசியம் ஏற்பட்டிருக்கின்றது. நீண்ட காலத் தமிழ்த் தேசியப் பிரச்சினைக்குத் தீர்வாக நாங்கள் நோக்குவது ஒரு புதிய அரசியலமைப்மைத்தான். அரசியலமைப்பின் ஊடாக எட்டப் படுகின்ற இணக்கப்பாடுகளின்மூலமாகத்தான் தமிழ்த் தேசியப் பிரச்சினைக்கு ஒரு நிரந்தரத் தீர்வு ஏற்பட முடியும் என்று நாங்கள் பணியாற்றுகின்றோம். அப்படியாக ஓர் அரசியலமைப்பின்மூலமாக ஒரு தீர்வு ஏற்படுவதாக இருந்தால், அந்த அரசியலமைப்பிலே சொல்லப்பட்டவை கடைப்பிடிக்கப் பட வேண்டும்; அவை மீறப்படக்கூடாது. ஒரு நாட்டினுடைய அரசியலமைப்பை விரும்பியவாறு எவரும் மீறிக்கொண்டே இருக்கலாமென்று சொன்னால், நாங்கள் எதிர்பார்க்கின்ற அரசியல் தீர்விலேயும் எந்தவிதமான அர்த்தமும் இல்லாமல் போய்விடும். இது முழு நாட்டுக்கும் பொருந்துவதாக இருந்தாலும் முழு நாட்டுக்கும் நன்மையானதை நாங்கள் இன்றைக்குச் செய்து கொண்டிருந்தாலும் விசேடமாக தமிழ் மக்கள் அவதானிக்க வேண்டிய ஒரு பகுதி இதிலே இருக்கின்றது. அரசியலமைப்பு மீறப்படுவதை நாங்கள் அனுமதித்துக்கொண்டிருந்தால் எங்களுடைய நீண்டகால அரசியல் தீர்வுக்கும் அது பங்கம் விளைவிக்கும். இது எங்களுக்குத் தெளிவாகத் தெரிந்திருக்க வேண்டும். அரசியலமைப்பு மீறப்படக்கூடாதென்பதற்காக மற்றைய கட்சிகளோடு இணைந்து நாங்கள் நடவடிக்கை எடுத்திருக்கிறோம்.

நாங்கள் நேற்று ஜனாதிபதிக்கு அனுப்பி வைத்த கடிதத்திலே ஒக்டோபர் 26ஆந் திகதிக்கு முன்னதான நிலைக்கு ஆட்சி மாற்றப்பட வேண்டும் என்ற நிலைப்பாட்டைத் தெளிவாகச் சொல்லியிருக்கிறோம். இது நேற்று எடுத்த தீர்மானம் அல்ல. இது, இந்தச் சம்பங்கள் நடந்த உடனேயே நாங்கள் எடுத்த தீர்மானமாகும். ஒக்டோபர் 26ஆந் திகதிய ஜனாதிபதியின் நடவடிக்கைகள் சட்டவிரோதமானவை; அரசியலமைப்புச் சட்டத்திற்கு முரண்பாடானவை என்ற தீர்மானத்தை நாங்கள் ஏற்கனவே எடுத்திருக்கின்றோம். அது அப்படியாக இருக்குமாக இருந்தால், அதற்கு முன்னதான நிலைக்கு ஆட்சி மாற்றப்பட வேண்டும் என்று நாங்கள் சொல்லியிருக்கின்றோம். பாராளுமன்றத்திலே இரண்டு

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

තඩවෛකළ් නම්පික්කෙයිල්ලාප් පිරේරණෛ නිරෛවේට්රප් පට්ටිරුක්කින්ර කාරණත්තිනාලේ ඉන්රෛක්කු නාට්ටිලේ පිරතම මන්ත්රිරි ඉල්ලෛ; අමෛච්චරවෛ එන්ර ඔන්රු ඉල්ලෛ; ඕර් අරචාංකමිල්ලෛ. ඔරු මාත කාලමාක ජනාතිපති පිරතමරාක නියමිත්ත ඔරුවර් ඉන්ත චපෛක්කුළ්ළේ වන්තු තන්නුටෛය පෙරුම්පාන්මෛයෛ නිරූපික්ක මුටියාමලිරුක්කින්රාර්. අතනාලේ අවර් චපෛක්කු වරාමලේ ඉරුක්කින්රාර්. අප්පටියාන සූල්නිලෛයිලේ, නාට්ටිනුටෛය පෙරු නන්මෛයෛක් කරුති, ඉනිමේලුම් නාංකළ් පේචාමලිරුක්කක් කූටාතු එන්රු අන්තක් කටිතත්තිලේ චොල්ලියිරුක්කිරෝම්. "පිරතම මන්තිරියාක නියමික්කප්පට්ටවරුක්කු ඔරු මාත කාලත්තිර්කු මේල් පෙරුම්පාන්මෛයෛ නිරූපික්ක මුටියාමලිරුක්කින්ර කාරණත්තිනාලුම් අන්ත අරසුක්කෙතිරාක නම්පික්කෛයිල්ලාප් පිරේරණෛකළ් නිරෛවේට්රප් පට්ටිරුක්කින්ර කාරණත්තිනාලුම් අතන් අටිප්පටෛයිල් නාට්ටිලේ පිරතම මන්තිරි, අමෛච්චරවෛ මට්රුම් අරචාංක මොන්රු ඉල්ලාමලිරුක්කින්ර කාරණත්තිනාලුම් ඇන්ත නිලෛමෛ නීටික්කක්කූටාතෙන්ර කාරණත්තිනාලුම් ඔක්රෝපර් 26ආම් තිකතික්කු මුන්නතාන නිලෛක්කු මාට්රප්පටවේණ්ටුම්" එන නාංකළ් අන්තක් කටිතත්තෛ එළුතියිරුක්කිරෝම්.

අතර්කු මුන්නතාක ඉරුන්ත නිලෛප්පාටු එන්න? ඉක්කිය තේචිය මුන්නණි තලෛමෛයිලාන ඕර් අරචාංකම් ඉරුන්තතු. අන්ත නිලෛක්කු මාට්රප්පට වේණ්ටුම් අල්ලතු ඉක්කිය තේචිය මුන්නණි පිරතමරාක ඔරුවරෛ මුන්මොළින්තාල්, අවර් පාරාළුමන්රත්තිනුටෛය පෙරුම්පාන්මෛයිනරින් නම්පික්කෛයෛප් පෙරක්කූටියවරාක ඉරුන්තාල්, අවරෛප් පිරතමරාක නියමික්ක වේණ්ටුම්. ඉවර්රුක්කු එංකළුටෛය ආතරවෛක් කොටුප්පෝම් එන්රු චොල්ලියිරුක්කිරෝම්. අව්වාරු චොන්නතර්කු, අප්පටියාන ඕර් ඉක්කිය තේචිය මුන්නණි අරචාංකත්තිලේ නාංකළ් චේරුකින්රෝම් එන්පතු අර්ත්තම් අල්ල. අප්පටියාන ඕර් අරචාංකත්තෛ අමෛප්පතර්කාන ආතරවු එන්රු කූටච් චොල්ල මුටියාතු. චිල ඉටංකළිලේ තවරාන ඔරු පිරච්චාරම් චෙය්යප්පටුකිරතු. තර්පෝතු ඉරුක්කින්ර චූල්නිලෛයිලේ, ජනාතිපතියාලේ නියමික්කප්පට්ටවර් තන්නාලේ පෙරුම්පාන්මෛයෛ නිරූපික්ක මුටියාමල් ඉරුක්කින්ර තරුණත්තිලේ, අවරුක්කු එතිරාකප් පාරාළුමන්රත්තිලේ ඔන්රුක්කු ඉරණ්ටු තඩවෛකළ් නම්පික්කෛයිල්ලාප් පිරේරණෛකළ් නිරෛවේට්රියිරුක්කින්ර තරුණත්තිලේ නාට්ටිනුටෛය නන්මෛ කරුති අතර්කු මුන්නතාක ඉරුන්තවාරාන නිලෛයිලේ ඉක්කිය තේචිය මුන්නණි අරචාංකම් ඔන්රෛ අමෛයුංකළ්! පාරාළුමන්රත්තිලේ පෙරුම්පාන්මෛප් පලත්තෛක් කාට්ටක්කූටිය ඔරුවරෛ, ඉක්කිය තේචිය මුන්නණියිනාල් නියමික්කප්පටුකින්ර ඔරුවරෛ නියමියුංකළ්! අන්තච් චෙයර්පාට්টුක්කු නාංකළ් ආතරවළිප්පෝම් එන්රු චොල්ලියිරුක්කින්රෝම්. නාට්ටිලේ ස්තිරත් තන්මෛයෛ ඒර්පටුත්තවුම් නාට්ටිලේ ඉරුක්කින්ර කුලුප්පනිලෛ මාරවේණ්ටුම් එන්පතර්කාකවුම් පොරුප්පාන පිරතාන එතිර්ක් කට්චියාක නාංකළ් එටුත්තිරුක්කින්ර නටවටික්කෛ ඉතු! ඉතෛ එන්න විතමාකප් පලර් විමර්චිත්තාලුම් ඉතුතාන් එංකළුටෛය නිලෛප්පාටු! අන්ත නිලෛප්පාට්ටෛ ඉන්තච් චපෛයිලේ පතිවු චෙය්යවේණ්ටියතු අවචියමාක ඉරුක්කින්රතු. එන්නුටෛය නණ්පර්කළ් චිලර් කේට්ටුක්කොණ්ටතන් කාරණමාක ඉතු පට්රිය කරුත්තුක්කළ් චිලවට්රෛ මට්টුම් මිකච් චුරුක්කමාකච් චිංකළ මොළියිලුම් නාන් චොල්ලත් තලෛප්පටුකිරේන්.

ර්යේ දිනයේදී අපි ජනාධිපතිතුමාට ලියුමක් යැව්වා. ඔක්තෝබර් 26වන දාට පෙර තිබුණු තත්ත්වයේ ආණ්ඩුවක් තිබෙන්න ඕනෑය කියන අපේ මතය ද්‍රවිඩ ජාතික සන්ධානය ඒ ලියුමෙන් හෙළිදරවු කරලායි තිබෙන්නේ. ඊට හේතුව තමයි, ඔක්තෝබර් 26වන දා අතිගරු ජනාධිපතිතුමා විසින් කරපු ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නීති විරෝධියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා අපි දැනටමත් අපේ ස්ථාවරය හෙළිදරවු කරලා තිබීම. UNF nominee කෙනෙක් අග්‍රාමාත්‍ය ධුරයට පත් කරන්න කියලාත්, ඒ ක්‍රියාවලියට අපේ සහාය දෙනවාය කියලාත් අපි ඒ ලියුමේ සඳහන් කරලා තිබෙනවා. ඒකෙන් අදහස් වන්නේ UNF එකට අපි එකතු වෙනවාය කියන එක නොවෙයි; අපිත් එකතුවෙලා ඒ ආණ්ඩුව හදනවාය කියන එක නොවෙයි. දැන් රටේ තිබෙන මේ අස්ථාවර තත්ත්වය ජනාධිපතිතුමා රට වෙනුවෙන් වෙනස් කරන්නට ඕනෑය, ඒ ක්‍රියාවලියට අපි සහාය දෙනවාය කියලායි අපි කියලා තිබෙන්නේ. මේ අස්ථාවර තත්ත්වයට හේතුව එතුමා ඔක්තෝබර් 26වන දා ගත්ත පියවරයි. ඒ නිසා ඒ දිනයට ඉස්සෙල්ලා තිබුණු තත්ත්වයට නැවත මාරු කරන්න කියලා තමයි අපි කියලා තිබෙන්නේ. මේ තීරණය අපි රට වෙනුවෙන් ගත්ත තීරණයක්. මේ ගැන හරියාකාරව කවුරුත් දැන ගන්න ඕනෑ. ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊළඟට ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා.

[පූ.භා. 11.32]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, වවුනතිවුවල සිදු වුණු සිද්ධිය ගැන කෙටියෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. ඊයේ රෑ 1.00 - 6.00ත් අතර වවුනතිවු පොලිසියට කිලෝමීටරයක් ඇතුළත තමයි මේ roadblock එක තිබිලා තිබෙන්නේ. රෑ 1.00 වන කල් මේ පොලිස් නිලධාරීන් ඉඳලා තිබෙනවා.

එක පොලිස් නිලධාරියෙක් කල්මුණේ පදිංචි ද්‍රවිඩ ජාතිකයෙක්. අනෙක් කෙනා ගාල්ලේ උඩුගම පදිංචි සිංහල නිලධාරියෙක්. මේ දෙදෙනාට T 56 ගිනි අවියකින් වෙඩි තියලා මරලා, මේ දෙදෙනා ළඟ තිබුණු රිවෝල්වර දෙකම එම කණ්ඩායම ගෙන ගොස් තිබෙනවා. ඒ චිතරක් නොවෙයි. එක පොලිස් නිලධාරියෙකුගේ අතකුත් කපලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය අවුරුදු තුන හමාරක කාලය තුළ මේ රටේ උතුරේවත්, නැහෙනහිරවත්, කොහේවත් මේ වාගේ දෙයකට පොලිස් නිලධාරියෙක් මරලා නැහැ. පසුගිය කාලය පුරාම ප්‍රතිපක්ෂයේ රාජපක්ෂ කණ්ඩායම "ආවා කල්ලිය" ගැන අපට චෝදනා කළා. අපි වගකීමෙන් කියනවා, පසුගිය අවුරුදු තුන හමාර තුළ උතුරේ තිබෙන ආවා කල්ලියෙන් මේ රටේ කොහේවත් මේ වාගේ අපරාධයක් සිදු වෙලා නැහැ. මේ රටේ සමහර උදවිය, ගෞරවනීය මහා සංඝරත්නය නොවෙයි, දේශපාලනය කරන සංඝරත්නය කිව්වා මේ රට ආරක්ෂා කරන්න රාජපක්ෂ බලයට ගෙනෙන්න කියලා.

දැන් රණ විරුවන් හිරේ දමනවා. මේ රටේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා වන රවීන්ද්‍ර විජේගුණරත්නව රිමාන්ඩ් කළේ -හිරේ දැම්මේ- සිරිසේන-රාජපක්ෂ කියන හොර ආණ්ඩුවෙන් කියලා මම කියනවා. 2009 වසරේ ළමයි එකොළොස්දෙනෙක් අතුරුදහන් වීමේ සිද්ධිය සම්බන්ධව එදා හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ තමයි ප්‍රථම පැමිණිල්ල කර තිබෙන්නේ. මේ ළමයි එකොළොස්දෙනා කොළඹ, කොටහේනේ හිටපු ළමයි. මේ ළමයි එල්ටීටීඊ එකට සම්බන්ධ ළමයි නොවෙයි. මේ

පරීක්ෂණ අනුව මීට දවස් දෙකකට කලින් මේ රටේ ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානියා සිරිසේන-රාජපක්ෂ කල්ලිය, සිරිසේන-රාජපක්ෂ පාලනය මහින් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. රාජපක්ෂලා බලයට ගෙනෙන්න මේ රටේ බොහොම අය කැගැහුවා. අපි මහවිරු උත්සව තියන්න දුන්නේ නැහැ. පසුගිය කාලයේ මහවිරු උත්සව තිබ්බා. පසුගිය වසරේ මහවිරු උත්සව තිබුණේ 24යි. මේ අවුරුද්දේ පසුගිය 27වැනි දින ස්ථාන 38ක මහවිරු උත්සව පවත්වා තිබෙනවා. අපි කියන්නේ රාජපක්ෂලා, මේ රටේ දේශපාලනය කරන ස්වාමීන් වහන්සේලා, නොයෙක්-නොයෙක් කණ්ඩායම් මේකට උත්තර දෙන්න ඕනෑ කියලායි. පසුගිය අවුරුදු ගණනාව අරගෙන බැලුවොත්, මේ රටේ ස්වාමීන් වහන්සේලා සන්දේශයක් බාර දෙන්න ආවාම වතුර ගහලා එළෙව්වේ මේ මාසය ඇතුළතයි. මේවා ගැන කථා කරන උදවියට අපි කියනවා, දැන් නැඟී සිටින්න කියලා.

ගරු කථානායකතුමනි, ඒ එක්කම, අද අපේ මේ යෝජනාව ගැනත් කියන්න ඕනෑ. අමාත්‍යාංශයක මුදල් පාලනය, මුදල් පාලනය පිළිබඳ වගකීම තිබෙන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට. එසේ නම් අද නීත්‍යානුකූල නොවන අග්‍රාමාත්‍යවරයෙකුට, කැබිනට් මණ්ඩලයට, නියෝජ්‍ය ඇමතිවරුන්ට, ඇමතිවරුන්ට, ඒ කාර්ය මණ්ඩලවලට ගෙවන මුදල් ගැන වගකීම තිබෙන්නේ මේ රටේ මුදල් රෙගුලාසි අනුව, මේ රටේ ආයතන සංග්‍රහය අනුව අමාත්‍යාංශවල ලේකම්වරුන්ට. අපි ඒ ලේකම්වරුන්ට කියනවා, කරුණාකර මේවා ගැන වගකීම ගන්න එපා කියලා. ඒ අයට නියෝග දෙන්න අද අමාත්‍යවරු මේ රටේ නැහැ. ඒ අමාත්‍යාංශවල ඇමතිවරු නැහැ. ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, අපි අමාත්‍යාංශ ලේකම්වරුන්ට කියනවා, මේ පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවකින් පරාජය කරලා, ඒ විශ්වාස භංග යෝජනාව සම්මත වූ බව පිළිගෙන ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශවල නිලධාරි මණ්ඩලයේ වාහන ටික වහාම ගෙන්වා ගන්න කියලා අපි අමාත්‍යාංශවල ලේකම්වරුන්ට දන්වනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපි මෙයින් කිසිසේත්ම අදහස් කරන්නේ නැහැ, රජයේ සේවකයන්ගේ වැටුප් ගෙවන්න එපා කියලා. රජයේ සේවකයන් පහළොස් ලක්ෂයකට වැටුප් ගෙවන්න අපේ ආණ්ඩුව මුදල් අනුමත කර තිබෙනවා. වැඩිහිටියන්ට ගෙවන දීමනා, සහනාධාර, ගැබිණි මව්වරුන්ට දෙන දීමනා, සමෘද්ධි ආදී මේ සියල්ල ගෙවන්න කියලා අපි කියනවා.

ගරු කථානායකතුමනි, මේ නීත්‍යානුකූල නොවන මුදල් ඇමතිවරයා චක්‍රලේඛයක් එවා තිබෙනවා, "ගම්පෙරළිය" වැඩ නවත්වන්න කියලා. ඒ චක්‍රලේඛය සම්පූර්ණයෙන්ම නීතිවිරෝධී චක්‍රලේඛයක්. ඒ නිසා අපි දිසාපතිවරුන්ට, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරුන්ට, නිලධාරීන්ට කියනවා, "ගම් පෙරළිය" වැඩ සටහනේ නවත්වපු වැඩ පටන් ගන්න කියලා.

ගරු කථානායකතුමනි, දැන් මේ කාරණයත් කථා කළා. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට මේ පාර්ලිමේන්තුවෙන් ගෙවනවා, මේ පාර්ලිමේන්තුවේ කටයුතු සජීවී විකාශනය කරන්න. ඒක නැවැත්වීම සාපරාධී විශ්වාසය කඩකිරීම යටතේ දඬුවම් දෙන්න පුළුවන් වරදක්. එහෙම නම් ගුවන් විදුලි සංස්ථාවේ සභාපති ඇතුළු නිලධාරීන්ට අපි කියනවා, සාපරාධී විශ්වාසය කඩකිරීමේ නීතිය යටතේ අපි කටයුතු කරනවා කියලා. කරුණාකර මේවා විකාශනය කරන්න කියලා ඉල්ලා සිටින අතර, මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස අමාත්‍යාංශවල ලේකම්වරුන්ට දන්වා යවන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කරුණාරත්න පරණවිතාන මහතා.

[පූ.භා. 11.39]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මම ඉතාම කෙටියෙන් අදහස් දැක්වීම කරන්නේ ජනමාධ්‍ය සම්බන්ධයෙන් පමණයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණයකින් මහ රෑ අටවපු මේ කුමන්ත්‍රණකාරී ආණ්ඩුව අපි හැඳින්වූයේ "ජුන්ටා ආණ්ඩුවක්" හැටියටයි. ඒ ආණ්ඩුවේ අගමැතිවරයා මේ පාර්ලිමේන්තුවට ආවාට පස්සේ, අපි ඒ ආණ්ඩුව විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා පරාද කළා. තමුන්නාන්සේ සඳහන් කළා එතැනින් පස්සේ ආණ්ඩුවක් නැහැ කියලා. නමුත්, ජනමාධ්‍ය විසින් තවමත් "ආණ්ඩු පක්ෂය, ආණ්ඩුවේ අගමැති" කියලා නම් කරන නිසා මේ කාරණය මතක් කරන්න ඕනෑ. නමුත් ඒ හැම ජනමාධ්‍යයක්ම නොවෙයි. ගරු කථානායකතුමනි, මේ වන විට සමහර ජාතික පුවත් පත් මේක නීති විරෝධී ආණ්ඩුවක් හැටියට නම් කරන්න පටන් ගෙන තිබෙනවා. අපට ඒ ගැන ආඩම්බරයි. ඉරිදාට නිකුත් වෙන "අනිද්දා" පත්තරය කෙළින්ම කියනවා, මේක නීති විරෝධී ආණ්ඩුවක් කියලා. මේ ජුන්ටා ආණ්ඩුවට පක්ෂව ඒ අසත්‍ය පුවත් පතුරුවා හැරීමට විරුද්ධව මේ වන විට නිර්භීත ජනමාධ්‍යවේදීන් අද සංගම් හදාගෙන උද්ඝෝෂණ ව්‍යාපාරවලට ඇවිල්ලා තිබෙනවා. මේ වන විටත් එවැනි උද්ඝෝෂණයක් පැවැත්වෙමින් තිබෙනවා.

ඒ වාගේම, කියන්න ඕනෑ අද ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කිසිම වැඩක් කරන්න දෙන්නේ නැතිව, ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැත්තකට දමලා තමයි මේ නීති විරෝධී ක්‍රියාදාමය කරගෙන යන්නේ කියලා. ඒ නිසා තමුන්නාන්සේ මේ පත් වෙලා සිටින හොර සභාපතිවරයා ඇතුළු සියලුදෙනාටම කියන්න ඕනෑ, වරප්‍රසාද කඩ කරලා තිබෙනවා, නීතිය හමුවට ගෙනියනවා කියලා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, ජාතික රූපවාහිනියටත් ඒ වගකීමෙන් ගැලවෙන්න බැහැ. ජාතික රූපවාහිනිය පාර්ලිමේන්තුවත් සමඟ ගිවිසුමක් නොතිබුණත්, මේ රටේ හැම ජාතික කටයුත්තකදීම -හැම තැනකදීම- විකාශන කටයුතු කරනවා නම්, මේ පාර්ලිමේන්තුවේ සිද්ධ වෙන්නා වූ රටට වැදගත් දේවලට ප්‍රචාරයක් නොදී රූපවාහිනිය වහලා දාන්න බැහැ. ජාතික රූපවාහිනියට පත්වෙලා සිටින සභාපතිතුමා නීත්‍යානුකූල නොවන ආණ්ඩුවක සභාපතිවරයකු වුණත්, ඔහු මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු කෙනෙක්. සරත් කෝන්ගහගේ මහතා මන්ත්‍රීවරයකු හැටියට මේ ගරු සභාවේ හිටියා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන එතුමාට අපි කියනවා, ජාතික රූපවාහිනියේ සමාජ වගකීම ඉෂ්ට කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ සිද්ධවෙන දේවල් සම්බන්ධ සජීවී විකාශනය ආපහු ආරම්භ කරන්න කියලා. ගරු කථානායකතුමනි, ඒකත් දැනුම් දෙන්න කියලා අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. අපි නැවතත් කියනවා, මේ ජුන්ටා ආණ්ඩුවට එරෙහිව අද ජනමාධ්‍ය විරෝධයක් සංවිධාන වෙමින් තිබෙනවා කියලා. ඒවාට එකතුවෙන සකලවිධ ජනමාධ්‍යවේදීන්ට, නිර්භීත ජනමාධ්‍යවේදීන්ට මේ සභාවේ උපරිම ගෞරවය ප්‍රකාශ කරනවාය කියලාත් මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, රිසාඩ් බදියුදීන් මැතිතුමා.

මුස්ලිම් මන්ත්‍රීතුමන්ලාට පල්ලියට යන්න අවශ්‍ය නිසා ඔබතුමා කථා කරලා අවසන් කරන්න.

[மு.ப. 11.43]

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அதிக நேரத்தை எடுக்க விரும்பவில்லை. குறிப்பாக ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது, அமைச்சரவையின் அனுமதியின் பிறகு, நீண்டகாலமாக இடம்பெயர்ந்து இருக்கின்ற மக்களுக்காகக் கடந்த வரவு செலவுத் திட்டத்திலே நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, அதற்கான முழு வேலைத் திட்டங்களையும் செய்வதற்கு policy planning அமைச்சினுடைய அனுமதியையும் பெற்ற பிறகு, கடந்த ஓகஸ்ட் மாதம் அரசாங்க அதிபர்கள் அதேபோல் திட்டப் பணிப்பாளர்கள் ஊடாக நேரடியாகச் செலவழிக்கப்படுவதற்காக அந்த நிதி ஒதுக்கீடு செய்யப்பட்ட பின்னர், இந்த ஒரு மாத காலத்திற்குள்ளே ஒரு சதியினூடாக குறித்த 250 மில்லியன் ரூபாய் பெறுமதியான வேலைகள் நிறுத்தப்பட்டு, நேற்று மன்னார், வவுனியா, முல்லைத்தீவு அரசாங்க அதிபர்களுக்குப் புதிய வேலைத் திட்டங்களைச் செய்யுமாறும், ஒரு மாத காலத்துக்குள் அவ்வளவு நிதியையும் செலவழிக்குமாறும் கூறப்பட்டுள்ளது. அதாவது, கடந்த வரவு செலவுத்திட்டத்திலே ஒதுக்கீடு செய்யப்பட்ட குறித்த நிதிக்கான உரிய வேலைத்திட்டங்கள் எல்லாம் ஏற்கெனவே அமைச்சரவையின் அங்கீகாரத்தோடு, திட்டமிடப்பட்டுக் கடந்த ஓகஸ்ட் மாதத்திலே அதற்கான வேலைத்திட்டங்கள் எல்லாம் ஆரம்பிக்கப்பட்ட பிறகும், அந்த வேலைத்திட்டங்களிலே சுமார் 250 மில்லியன் ரூபாய் பெறுமதியான வேலைத்திட்டங்களை நிறுத்திவிட்டு, புதிய வேலைத் திட்டங்களைச் செய்யுமாறு செயலாளர் அவர்கள் Project Director அவர்களை வலியுறுத்தி அவருக்குக் கடிதம் அனுப்பியதாக நான் இன்று கேள்விப்பட்டேன். அவ்வாறு செய்வதற்கு எந்தவொரு அதிகாரமும் செயலாளருக்குக் கிடையாது. ஏனெனில், இன்று ஒரு சட்டரீதியற்ற அரசாங்கம் இருந்து கொண்டிருக்கிறது. அந்த வகையிலே, கடந்த 14ஆம் திகதியிலிருந்து இன்றுவரை இந்த உயர் சபையில் நாங்கள் நிறைவேற்றிய தீர்மானங்களுக்கு ஏற்ப, நம்பிக்கையில்லாப் பிரேரணைகளுக்கு ஏற்ப, கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரின் செயலாருக்கு இவ்வாறான சட்டவிரோதச் செயற்பாட்டைச் செய்ய வேண்டாம் என்று எழுத்துமூலமாக அறிவிக்குமாறு நான் உங்களிடம் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්ද? මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ පහසුව සඳහා අපි අද එතුමන්ලාට කලින් කථා කිරීමට අවස්ථාව ලබා දුන්නා. ඔබතුමා සඳහන් කරන කාරණය මොකක්ද?

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මම ඉතාම කෙටියෙන් අදහස් දැක්වීමක් කරන්නේ.

ඊයේ රූපවාහිනී ප්‍රවෘත්තිවලදී ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කළ බරපතළ ප්‍රකාශයක් විකාශනය වුණා, පිට රටවල තානාපතිවරු මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ට බලපෑම් කරනවා කියලා, පිට රටවල සිටින ඒ අයගේ ළමයින් අයින් කරනවා ආදී දේ කියලා. මේක බරපතළ ප්‍රකාශයක්. එතුමාට ඒ සම්බන්ධ තොරතුරු තිබෙනවා නම්, ඒ තොරතුරු විමසලා බලන්න. මෙවැනි ප්‍රකාශයක් කිරීම තුළින් අධිකරණ අපහාසයට ලක් කරනවා. ඒ වාගේම එතුමාට එම තොරතුරු ලැබුණේ කොහොමද කියලා හොයලා බලන්න කියා මා ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ශ්‍රේෂ්ඨාධිකරණය ගැන කියපු නිසාම මා මේ කාරණය මතක් කළ යුතුයි.

පසුගිය මාසයේ, ඔක්තෝබර් 25වැනි දා ඔබතුමාගේ මූලිකත්වයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වුණා. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණයට නව විනිසුරුවරු දෙදෙනෙක් පත් කරනු ලැබුවා. නමුත්, ජනාධිපතිවරයා විසින් තවම නියමානුකූලව ඒ පත්වීම් සිදු කර නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය දෙස දැන් මුළු රටම බලාගෙන ඉන්න මොහොතක්. ගාමිණී අමරසේකර මහතා සහ එස්.තුරෙයිරාජා මහතා පත් කරලා දැන් මාසයකුත් දවස් පහක් ගත වෙලා තිබෙනවා. එම පත්වීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අනුමත කළා. නමුත්, එම පත්වීම් තවම දීලා නැහැ. වහාම ඒ පත්වීම් ලබා දෙන්න කියා ඔබතුමාගේ පැත්තෙන් මැදිහත් වීමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන ගරු ජනාධිපතිතුමා දැනුවත් කර තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, මට දැන් දැන ගන්න ලැබුණා අද මේ මොහොතේදී සුගතදාස ක්‍රීඩාංගණයේදී විමල් වීරවංශ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා 7,000කට සමෘද්ධි සංවර්ධන නිලධාරී පත්වීම් ලබා දෙන උත්සවයක් තිබෙනවා කියලා. විශේෂයෙන්ම දැන් පාර්ලිමේන්තුවේ අගමැතිවරයෙක් හෝ ඇමති මණ්ඩලයක් නොමැති මොහොතක මෙවැනි පත්වීම් දෙන්නේ කොහොමද කියන එක ගැන මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

අද දිනට නියමිත ප්‍රධාන වැඩකටයුතු.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක එක.

"ජනරජයේ අරමුදල්වලින් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බව"

එම යෝජනාවට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වාගේම අපි එකඟත්වයක් දීලා තිබෙනවා මේ සම්බන්ධයෙන් electronic ක්‍රමයටත් ඡන්දයක් පවත්වන්න කියා. Now, I order for an Electronic Voting.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the division bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට අපහසු ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර අත් ඔසවන්න. [බාධා කිරීමක්] One by one. ගරු ආර්. සම්පන්දන් මැතිතුමා, are you for or against the Motion?

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
I am supporting, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Kabir Hashim?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Eran Wickramaratne?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Dr,) S. Sivamohan?

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Mrs.) Shanthi Sriskandarasa?

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Gnanamuthu Srineshan?

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is there anyone else? ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තව කවුරුන් හෝ මන්ත්‍රීවරු ඉන්නවාද?

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද ව්‍යවස්ථාව අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 116: විරුද්ධව 0: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 116; எதிராக 0; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 116: Noes 0: Abstain 0.

O 001. Mangala Samaraweera	Yes
O 002. Gamini Jayawickrama Perera	Yes
O 003. John Amaratunga	Yes
O 004. Vijitha Herath	Yes
O 005. Anura Dissanayake	Yes
O 006. Dharmalingam Sithadthan	Yes
O 007. Mavai S. Senathirajah	Yes
O 009. Ranil Wickremesinghe	Yes
O 010. Lakshman Kiriella	Yes
O 011. Gayantha Karunatileka	Yes
O 012. A.H.M. Fowzie	Yes
O 013. Rauff Hakeem	Yes

O 014. Rajitha Senaratne	Yes
O 015. Piyasena Gamage	Yes
O 016. Rishad Bathiudeen	Yes
O 018. Sajith Premadasa	Yes
O 019. Mano Ganesan	Yes
O 021. Selvam Adaikkalanathan	Yes
O 022. Malik Samarawickrama	Yes
O 023. Nihal Galappaththi	Yes
O 024. Sunil Handunnetti	Yes
O 026. K. Thurairetnasingam	Yes
O 027. Seenithamby Yoheswaran	Yes
O 028. S. Shritharan	Yes
O 029. Tilak Marapana	Yes
O 030. Wajira Abeywardana	Yes
O 031. Ravi Karunanayake	Yes
O 032. Field Marshal Sarath Fonseka	Yes
O 033. Patali Champika Ranawaka	Yes
O 034. Navin Dissanayake	Yes
O 035. P. Harrison	Yes
O 036. R.M. Ranjith Madduma Bandara	Yes
O 037. Arjuna Ranatunga	Yes
O 038. Palany Thigambaram	Yes
O 039. Chandrani Bandara	Yes
O 040. Thalatha Atukorale	Yes
O 041. Akila Viraj Kariyawasam	Yes
O 042. D.M. Swaminathan	Yes
O 043. Bimal Rathnayake	Yes
O 044. Nalinda Jayathissa	Yes
O 045. E. Saravanapavan	Yes
O 046. M.A. Sumanthiran	Yes
O 047. Kaveendiran Kodeeswaran	Yes
O 048. I. Charles Nirmalanathan	Yes
O 049. Abdul Haleem	Yes
O 050. Sagala Ratnayake	Yes
O 051. Harin Fernando	Yes
O 052. Daya Gamage	Yes
O 053. Ravindra Samaraweera	Yes
O 054. Vasantha Senanayake	Yes
O 055. Lucky Jayawardana	Yes
O 056. V.S. Radhakrishnan	Yes
O 057. Palitha Range Bandara	Yes
O 058. Dilip Wedaarachchi	Yes
O 059. Niroshan Perera	Yes
O 060. Ruwan Wijayawardene	Yes
O 061. A.D. Premadasa	Yes
O 063. Wasantha Aluwihare	Yes
O 064. Vijayakala Maheswaran	Yes
O 069. Harsha De Silva	Yes
O 070. Ajith P. Perera	Yes
O 071. Ranjith Aluvihare	Yes
O 072. J.C. Alawathuwala	Yes
O 073. Vadivel Suresh	Yes
O 074. Ameer Ali Shihabdeen	Yes
O 075. Edward Gunasekara	Yes
O 076. Faizal Cassim	Yes
O 077. Anoma Gamage	Yes
O 078. Ranjan Ramanayake	Yes
O 079. Ashok Abeysinghe	Yes
O 080. H.M.M. Harees	Yes
O 081. Karunarathna Paranawithana	Yes
O 082. Palitha Kumara Thewarapperuma	Yes
O 083. Manusha Nanayakkara	Yes
O 084. Seyed Ali Zahir Moulana	Yes
O 085. Ajith Mannapperuma	Yes
O 086. Nalin Bandara Jayamaha	Yes
O 087. Buddhika Pathirana	Yes
O 088. M.S. Thowfeek	Yes
O 089. Abdullah Mahrooff	Yes
O 090. Sirinal de Mel	Yes
O 091. Anura Sidney Jayarathne	Yes
O 092. K.K. Piyadasa	Yes
O 093. Lakshman Ananda Wijemanne	Yes
O 094. A. A. Vijethunga	Yes
O 095. Hector Appuhamy	Yes
O 096. Sisira Kumara Abeysekara	Yes
O 097. Thushara Indunil Amarasena	Yes
O 098. A. Aravindh Kumar	Yes
O 099. Velu Kumar	Yes
O 100. Nalaka Prasad Colonne	Yes
O 101. Chandima Gamage	Yes
O 102. Kavinda Heshan Jayawardana	Yes
O 103. Mylvaganam Thilakarajah	Yes
O 104. Mayantha Dissanayake	Yes
O 105. Sujith Sanjaya Perera	Yes
O 106. Hirunika Premachandra	Yes
O 107. Bandula Lal Bandarigoda	Yes
O 108. M. Ibrahim Mohammad Mansoor	Yes
O 109. S.M. Marikkar	Yes
O 110. Imran Maharoof	Yes
O 111. Ashu Marasinghe	Yes
O 112. Ishak Rahuman	Yes
O 113. Mujibur Rahuman	Yes
O 114. Harshana Rajakaruna	Yes
O 115. Jayampathy Wickramaratne	Yes
O 116. Thusitha Wijemanna	Yes
G 021. Ananda Kumarasiri	Yes
G 109. Rohini Kumari Wijerathna	Yes
G 110. Chaminda Wijesiri	Yes
G 111. Hesha Withanage	Yes
G 112. Sandith Samarasinghe	Yes
G 113. Chathura Sandeepa Senaratne	Yes
G 114. Wijepala Hettiarachchi	Yes
G 115. Mohamadu Nazeer	Yes
G 116. S.M. Mohamed Ismail	Yes

Total Voting Results

Yes	116
No	00
Abstain	00

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, "ජනරජයේ අරමුදල්වලින් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බව" සම්බන්ධයෙන් වූ යෝජනාව ඡන්ද 122කින්, ඉලෙක්ට්‍රොනික ක්‍රමයට පැවැති ඡන්ද විමසීමේදී සම්මත වූ බව සඳහන් කරන්න කැමැතියි. The Motion is carried.

අද දින සභාව එකඟ වූ පරිදි, මෙම පාර්ලිමේන්තුව 2018 දෙසැම්බර් මස 05වන බදාදා පූ.භා. 10.30 වන තෙක් කල් තබනු ලැබේ.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව මධ්‍යාහ්න 12.00ට, 2018 දෙසැම්බර් 05වන බදාදා පූ.භා. 10.30 වන තෙක් කල් තියේය.


அதன்படி பாராளுமன்றம், நண்பகல் 12.00 மணிக்கு 2018 டிசம்பர் 05, புதன்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப் பட்டது.

Parliament adjourned accordingly at 12 noon until 10.30 a.m. on Wednesday, 05th December, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

264 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 264 - இல. 9
Volume 264 - No. 9

2018 දෙසැම්බර් 05වන බදාදා
2018 டிசம்பர் 05, புதன்கிழமை
Wednesday,05th December, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

කල් තැබීමේ යෝජනාව:

රටේ අස්ථාවරත්වය නිමා කිරීමට පාර්ලිමේන්තුවේ මැදිහත්වීම

பிரதான உள்ளடக்கம்

ஒத்திவைப்புப் பிரேரணை :

நாட்டில் ஸ்திரமின்மையை முடிவுக்குக் கொண்டுவருவதில் பாராளுமன்றத்தின் தலையீடு

PRINCIPAL CONTENTS

ADJOURNMENT MOTION:

Intervention by Parliament to End Instability in the Country

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 දෙසැම්බර් 05වන බදාදා
2018 டிசம்பர் 05, புதன்கிழமை
Wednesday,05th December, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස්විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ සඳහන් විෂය අංක 01 ඉදිරිපත් කිරීම. ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කිරීමට නිබුණු යෝජනාව ඔබතුමාගේ අවසරය පරිදි මේ අවස්ථාවේදී තාවකාලිකව ඉවත් කරගෙන, වෙනත් දිනයක ඉදිරිපත් කරන බව මම දන්වා සිටිනවා. එම නිසා මෙම යෝජනාව අද ඉදිරිපත් කරන්නේ නැහැ. ඔබතුමාගේ අනුමැතිය පරිදි, වෙනත් දවසක එය ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය කුමක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීමට ඔබතුමාගේ අවසර පතනවා. පසුගිය දිනත් මේ පිළිබඳව මෙම ගරු සභාවේදී අවධානය යොමු වුණා. මේ ගැන ඔබතුමාත් කථා කළා, ගරු කථානායකතුමනි. ඒ මෙන්න මේ කාරණයයි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මෙම සභාවේ සිදුවන කටයුතු විකාශනය කිරීම සඳහා ගිවිසුම්ගතව, මුදල් ලබාගෙන ඒ කටයුතු කරනවා. නමුත්, මෙම සභාවේ කටයුතු විකාශනය කිරීම දැන් දින ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් නතර කර තිබෙනවා. ඒ වාගේම එකඟතා කඩ කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මෙම ගරු පාර්ලිමේන්තුව විසින් කරන ලද දැනුම්දීම් පවා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා නොතකා හැර තිබෙනවාය කියා අපට දැන ගන්න ලැබී තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම කාරණා සම්බන්ධව කටයුතු කිරීම ඉතා වැදගත් වෙනවා. පළමුවෙන්ම, තොරතුරු දැන ගැනීමට පුරවැසියන්ට තිබෙන අයිතිය තහවුරු කළ යුතුයි. විශේෂයෙන්ම මෙම සභාවේ සිදුවන කටයුතු ආවරණය කිරීමට රජයේ මාධ්‍ය ආයතනයක් හැටියට ඔවුන්ට වගකීමක් තිබෙනවා. රජයේ මුදල් ගෙවලා, ඔවුන්ට ඒ වගකීම පවරා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ දැන්වීම පරිදි, මේ කටයුතු පිළිබඳ සහයෝගිතාව දැක්වීමට සාකච්ඡා කිරීමට නොපැමිණීම බරපතළ කාරණයක්. ගරු කථානායකතුමනි, මේ තත්ත්වය ගැන සලකා බලා, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කමිටුව වෙත කැඳවන්න. ඊට අමතරව, වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට හැකි නම් ඒ ක්‍රියාමාර්ගත් අරගෙන, රටේ පුරවැසියන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීමට කටයුතු කරන්න කියා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම එහි සභාපතිවරයා ඉතාම හිතුවක්කාර අන්දමට ක්‍රියා කරන ආකාරය මම දුටුවා. මෙය තුන්වැනි අවස්ථාවයි. අපේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාත්, ඉන් පසුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාත් මේ සම්බන්ධයෙන් එතුමාගේ අවධානය යොමු කෙරෙව්වා. අවුරුදු ගණනක් තිස්සේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මේ විකාශනය කිරීම කරනවා. ඒ සඳහා අප ඒ අයට මුදල් ගෙවනවා. එම නිසා, තේරුම් ගත හැකි හේතුවක් නොමැතිව මෙසේ කිරීම සම්බන්ධයෙන් වහාම පියවර ගන්නා බව මේ ගරු සභාවට දැනුම් දෙන්න මා කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම නැඟී සිටියේ ඔබතුමාට අපේ ශුභාශිංසන පිරිනමන්නයි. ව්‍යාජ අගමැතිවරයාට බහුතරය පෙන්වන්න බැරි අවස්ථාවකදී ඔබතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, "අගමැතිවරයෙක් නැහැ; කැබිනට් මණ්ඩලයක් නැහැ" කියා. ඒක අද අධිකරණය පිළිගැනීම සම්බන්ධව පාර්ලිමේන්තුව හැටියට අපි සතුටු වෙන්න ඕනෑ. මොකද, ඔබතුමා නීති විරෝධී

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

විධියට වැඩ කටයුතු කළාය කියා චෝදනා ආවා. නමුත් අධිකරණය ඔබතුමා කළ ක්‍රියාව සනාථ කර තිබෙනවා. දැන් දිනපතා අපේ රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අත්හිටුවා තිබෙනවා. ව්‍යාජ අගමැතිවරයායි, කැබිනට් මණ්ඩලයයි ක්‍රියාත්මක වීම අද අත්හිටුවා තිබෙනවා. "පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාම කිව්වත් මම අහන්නේ නැහැ" කියා ඊයේ විධායකය ප්‍රකාශයක් කළා.

මේක පාර්ලිමේන්තුවට කළ නිග්‍රහයක්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, විධායකය පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑ. එතුමා පාර්ලිමේන්තුව කියන දේ ගණන් ගන්නේ නැහැ; ඔබතුමා කියන දේ ගණන් ගන්නේ නැහැ; අධිකරණය කියන දේ ගණන් ගන්නේ නැහැ. මේ විධියට බැලුවාම, අපේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට අපේ රට අග්‍රාමාත්‍යවරයකු නැතිව, කැබිනට් මණ්ඩලයක් නැතිව වැඩ කටයුතු කරගෙන යන ආකාරය තමයි අපට දකින්න ලැබෙන්නේ. මේක අවාසනාවන්ත තත්ත්වයක්. මේ අවස්ථාවේදී නායකත්වය අරගෙන, අපේ රට ස්ථාවර කිරීමට ගන්නා පියවර ගැන මම ඔබතුමාට ප්‍රණාමය පුද කරනවා, ගරු කථානායකතුමනි.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, කෙටියෙන් කාරණයක් කියන්න අවසර දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කියන්න ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමනි.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, මෙය අජිත් පී. පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ කාරණය හා සම්බන්ධයි. මමත් මේ පාර්ලිමේන්තුව තුළ එදා ඒ කාරණය මතු කළා. "රූපවාහිනිය ඒක පාර්ශ්විකව, මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ නැහැ" කියා රූපවාහිනී සංස්ථාවේ සභාපති, සරත් කෝන්ගහගේ මැතිතුමා එදා රාත්‍රියේ කිව්වා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව ඒක පාර්ශ්වික ආයතනයක් නොවෙයි. ඒ නිසා අජිත් පී. පෙරේරා මැතිතුමා ප්‍රකාශ කළ පරිදි, ඔබතුමා ඒ සභාපතිවරුන් පාර්ලිමේන්තුවට කැඳවා ඒ පිළිබඳව ක්‍රියා මාර්ගයක් ගන්න කියන ඉල්ලීම තමයි මා කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ක්‍රියා මාර්ගයක් ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, "අගමැති මහින්ද රාජපක්ෂ" කියා මේ පාර්ලිමේන්තුවේ Website එකේ තවමත් සඳහන් වෙලා තිබෙනවාය කියා ගරු මන්ත්‍රීවරයෙක් එදා ඔබතුමාව දැනුවත් කළා. පාර්ලිමේන්තුවේ Website එකේ තිබෙන එම කාරණය නිවැරැදි කරනවාය කියා ඔබතුමා කිව්වා.

Let me read the Parliament Website, It states,

"Eighth Parliament of D.S.R. of Sri Lanka - 1st of September, 2015 to-date; 24th August 2015 - 26th October 2018 Hon. Ranil Wickremesinghe. 26th October 2018, Hon. Mahinda Rajapaksa."

It further states:

"(Subsequent to the UPFA's withdrawal from the National Government, Mr. Wickremasinghe was removed from Office and Mr. Rajapaksa was appointed Prime Minister by the President) ...."

මේක පුදුම කථාවක් නේ. මොකක්ද, මේ? කවුද, මේවා කරන්නේ?අගමැතිවරයෙක් නැහැ කියන එක ව්‍යවස්ථාදායකයේත් -පාර්ලිමේන්තුවේත්- අධිකරණයේත් කියන දෙකේම කියා තිබෙනවා. ඉතින් කොහොමද මේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන හොයලා බලන්න ඕනෑ. ඇත්තටම ඒකට instructions දීලා තිබුණේ, ඉවත් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ. Sir, it is still there. I will show it to you. It is right here.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will check on that definitely. I know that the Secretary-General was also informed. He will change it. I will take action.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, කැඳවලා අහන්න. කවුද, මේ වාගේ කඩාකප්පල්කාරී වැඩ කරන්නේ කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will do that.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, දැන් වැඩ තහනමට ලක් වෙච්ච හිටපු අගමැති -පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මැතිතුමා- පාර්ලිමේන්තු මැතිවරණයක් ඉල්ලා හැම තැනම විවිධාකාරයෙන් රැස්වීම් සංවිධානය කරනවා. ඒ වාගේම ඊයේ නිදහස් චතුරස්‍රයේ අධිෂ්ඨාන පූජාවක් සංවිධානය කර තිබුණා. එතකොට රජයේ මාධ්‍ය ආයතනයක් වන ITN නාළිකාව prime time එකේ 6.30 ඉඳලා 7.00 වෙනතුරු එය live දෙනවා. ඇත්තවශයෙන්ම ඒ ගොල්ලන් නිෂ්පාදන වියදම් නැහැ කියා පෙන්වන්න live stream එකක් දමනවා, camera production දමන්නේ නැතුව. හැබැයි, ගුවන් කාලය විනාඩි 30ක්. තත්පර 30 ඒවා 60ක්. තත්පර 30ක් prime time එකක සාමාන්‍යයෙන් ලක්ෂ එකහමාරක් විතර වෙනවා. එතකොට වෙනත් වෙළඳ දැන්වීම් නැතුව, වෙනත් වැඩසටහන් නැතුව මෙය විකාශය කරනවා. මේක රාජ්‍ය දේපළ අවභාවිතාවක් වනවා. මේ මොහොත වන විටත් ITN එකේ MCR - Master Control Room - එකේ log book එකේ තිබෙනවා, මේක ඉහළින් ලැබිච්ච උපදෙස් නිසා විකාශය කළා කියා. ඇත්තවශයෙන්ම අපි පසුගිය දවස්වලත් ඔබතුමාගේ අවධානයට යොමු කළා, පාර්ලිමේන්තු සභා ගැබේ පාර්ලිමේන්තුව පවත්වන විට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රවෘත්ති සාකච්ඡා live දෙන බව, "පාර්ලිමේන්තුවේ සිට" කියා. මේවා රාජ්‍ය මුදල් අවභාවිතාවක්. එම නිසා මේ උපදෙස් ලබා දුන්නු අය කවුද කියන එක සොයන්න ඕනෑ. මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න ඕනෑ. ඒ එක්කම පාඩු වුණු මුදල් ටික නැවත අය කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට යම්කිසි මැදිහත් වීමක් කරන්න කියාත් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මම දෙවෙනි කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මීට පෙර අවස්ථාවකදීත් මම ඔබතුමාට කිව්වා විශ්වාස භංගය 14වෙනි දා සම්මත වුණා කියා ඔබතුමා තීන්දුවක් දුන්නාට පසුවත්, මාධ්‍ය ආයතනවල news alert දමන විට ඒ අයව "ආණ්ඩු පක්ෂය" කියා හඳුන්වන බව. මුද්‍රිත මාධ්‍යයක් වන "දිවයින" පුවත් පත නැවත වතාවක්, "අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ" කියා නම් කර තිබෙනවා. උසාවියෙනුත් අතුරු තහනම් නියෝගයක් දීලා තිබෙනවා එතුමාට අගමැතිකම නැහැයි කියා. ඒ එක්කම පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් සම්මත කර එතුමාගේ අගමැතිකම අයින් කරලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ වැඩ තහනමට ලක් වුණාට පසුව,- අපි දන්නවා සමාගමක කවුරුන් හෝ වැඩ තහනමට ලක් වුණාම පරීක්ෂණ අවසන් වනතුරු ඔහුට ඒ තනතුර වලංගු නැහැ කියා. එම නිසා වැඩ තහනමට ලක් වුණු කෙනෙක්ව වැඩ තහනමට ලක් නොවූවා යැයි හඳුන්වා දෙන්න මාධ්‍ය ආයතනයකට කිසිම අයිතියක් නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා පාර්ලිමේන්තුව හරහා මේ පිළිබඳව මැදිහත් වීමක් කරලා මේක නිවැරදි කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු ජෝන් අමරතුංග මැතිතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේදී කියැවුණු කරුණු කාරණා අනුව සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. විශේෂයෙන්ම මීට කලිනුත් මේ වාගේ අවස්ථාවලදී නිලධාරීන් සභා ගර්භයට කැඳවලා තිබෙනවා. මීට ඉහත පාර්ලිමේන්තුවලදී නිලධාරීන් කැඳවා ප්‍රශ්න කරලා, අවවාද කරලා තිබෙනවා. එම නිසා මම ඉල්ලීමක් කරනවා, ඊළඟ පාර්ලිමේන්තු රැස්වීමට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ගෙන්වලා මේ පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරවලා, වහාම පියවර ගන්න කියා අණ කරන ලෙස. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යනතුරු ඉන්න වෙලාවක් නැහැ. ඒක තමයි මට ප්‍රකාශ කරන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට මේ කරුණ යොමු කරන්න කැමැතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52. (2) ව්‍යවස්ථාව අනුව, අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද මෙහෙයවිය යුත්තේ සිය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්වය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42. (1) ව්‍යවස්ථාව අනුව, ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර ඇමති මණ්ඩලයක් සිටිය යුතුය. නමුත්, පසුගිය නොවැම්බර් 14 වැනි දින සහ ඊටපසුව පාර්ලිමේන්තුවේ සම්මත කර ගත් විශ්වාස භංග යෝජනා හා 2018 දෙසැම්බර් 03 වන දින ගරු අධිකරණය ලබා දුන් අතුරු තහනම් නියෝග අනුව වර්තමානයේ අමාත්‍ය මණ්ඩලයක් ක්‍රියාත්මක වන්නේ නැත. එසේ හෙයින් අමාත්‍යාංශ ලේකම්වරුන්ට නියෝග හා විධාන දිය හැකි අධිකාරියක් දැනට ක්‍රියාත්මක නොවේ. ජනාධිපතිවරයාට ව්‍යවස්ථානුකූලව නියෝග හා විධාන ලබා දිය හැක්කේ තමන් යටතේ ඇති අමාත්‍යාංශවලට පමණයි. නමුත් ගරු කථානායකතුමනි, ඊයේ ජනාධිපතිතුමා අනිකුත් ලේකම්වරු ගෙනැල්ලා නියෝග දීලා තිබෙනවා. විශේෂයෙන්ම මෙය පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කිරීමක්.

ඒ වාගේම, පාර්ලිමේන්තුවේදී සම්මත වූ වැය ශීර්ෂයන් කපා හැරීමේ යෝජනා සැලකිල්ලට ගනිමින්, මුදල් රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට ලේකම්වරුන් බැඳී ඉන්නවා. ඒ නිසා, පසුගිය 14 වැනිදා සිට මේ දක්වා පාර්ලිමේන්තුවේ ගත් ක්‍රියා මාර්ගවලට විරුද්ධව අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කර තිබෙනවා නම් ඒ පිළිබඳවත් සොයා බැලීමට අවශ්‍ය බව අපි පැහැදිලිව කියන්නට ඕනෑ. මේ අවස්ථාවේදී ජනාධිපතිතුමාට බලයක් තිබෙනවා, එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරුන්ට පමණක් උපදෙස් ලබා දෙන්න. ඒ නිසා ඊයේ දින එතුමා ක්‍රියාත්මක කර තිබෙන එකත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධියි. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මැතිතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, රජයේ මාධ්‍ය සම්බන්ධයෙන්, නිලධාරීන් කරන අත්තනෝමතික ක්‍රියා සම්බන්ධයෙන් අප

[ගරු රවි කරුණානායක මහතා]

මන්ත්‍රීවරු නවදෙනෙක් ඔබතුමාට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒක පුළුවන් තරම් ඉක්මනට අරගෙන, ඒ අය පාර්ලිමේන්තුවට කැඳවලා, මේ කරන ක්‍රියාව කොයි ආකාරයෙන්ද ඉදිරියට ගෙන යන්න තිබෙන්නේ කියන එක ගැන දැනුවත් කරන්න කියලා මා මේ අවස්ථාවේදී කාරුණිකව ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(මාණ්පුමිකු පන්තුල ලාල් පණ්ඩාරිකොඩ)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු කථානායකතුමනි, මේ වන විට අපේ සංවර්ධන ව්‍යාපෘති සියල්ලක්ම ඇනහිට තිබෙනවා. "ගම්පෙරළිය" වැඩසටහන නතර කරන්න කියලා චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මන්ත්‍රීවරු හැටියට අපට වෙන් වුණු විමධ්‍යගත ප්‍රතිපාදනවලට පවා මුදල් නිදහස් කරලා නැහැ. ඒ නිසා ගම්වල සංවර්ධන කටයුතු විශාල වශයෙන් ඇනහිට තිබෙනවා. ජනතාව ඒ නිසා විශාල පීඩාවකට පත් වෙනවා. දැන් මේ වන විට පාසල් නිල ඇඳුම් දෙන්නේ නැහැ; ඉඩම් බෙදන වැඩසටහන් නතර කරලා තිබෙනවා; නිවාස යෝජනා ක්‍රම සහ නිවාස ණය දෙන වැඩසටහන් නතර කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අගමැති කෙනෙක් නැති, ඇමතිවරු නැති රටක මේ ප්‍රශ්න කියන්න අපට ඉතුරු වෙලා තිබෙන්නේ ඔබතුමා විතරයි. ඒ නිසා කරුණාකරලා මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. අපේ රජය මේ වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස දෙකේ වියදම් කරන්න විශාල මුදලක් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දීලා තිබෙනවා. නමුත් ඒ මුදල වියදම් කරන්න එපා කියලා නියෝග දීලා, දැන් ඒ සංවර්ධන කටයුතු ඇනහිට තිබෙනවා. මේ කටයුතු වහාම ක්‍රියාත්මක කරන්න කියලා ඒ අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. අඩුම තරමේ අපේ මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා මුදල් නිදහස් කරන්න කියලා කාරුණිකව ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, රජයේ මාධ්‍ය ගැන අපි කලිනුත් කථා කළා. මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, දැන් රජයක් නොපවතින බව අධිකරණයෙනුත් පිළිගෙන තිබෙන නිසා, රජයේ මාධ්‍යවල හැසිරීම පාලනය කරන්න ඒ ආයතනවල සභාපතිවරුන්ට බලයක් නැති බව. ඒ නිසා අපි ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනවා. අපි ඊයේත් ගිහිල්ලා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා හමු වුණා.

විශේෂයෙන් පාර්ලිමේන්තුවේ සභා වාරය ගැන කථා කරන කොට, රජයේ ජනමාධ්‍ය හැසිරෙන ආකාරය ඉතාම නින්දිතයි. ඒ නිසා මේ ගැන සොයා බලන්න. විශේෂයෙන් ගරු කථානායකතුමනි, ඔබතුමා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාව පාර්ලිමේන්තුවට කැඳවා හෝ මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා රජයේ මාධ්‍යවල හැසිරීම පාලනය කළ යුතුයි කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මැතිනිය.

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (ඩාක්ටර්) ((திருமதி) அனோமா கமகே)
(The Hon. (Dr) (Mrs.) Anoma Gamage)
ගරු කථානායකතුමනි, ඔක්තෝබර් 26 වැනිදා මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා විසින් ප්‍රජාතන්ත්‍ර විරෝධීව ආණ්ඩුව පිහිටුවූ ගමන්ම ගරු අගමැතිතුමාගේත්, අපේ සියලුම ඇමතිවරුන්ගේත් ආරක්ෂාව අයින් කළා. නමුත්, ඒ ගොල්ලන්ගේ ආණ්ඩුව පත්කර ගත් ඇමති තනතුරු සහ අගමැතිකම තහනම් කරලා දැන් උසාවියෙන් තීන්දුවක් දීලා තිබෙනවා. නමුත්, පොලිස්පතිතුමා කිසිම ක්‍රියා මාර්ගයක් මේ වනතුරු අරගෙන නැහැ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපි හැමෝටම එකම නීතිය ක්‍රියාත්මක කරන්න කියලා පොලිස්පතිතුමාට දන්වන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු කථානායකතුමනි, පසුගිය සතියේ පාර්ලිමේන්තුව රැස් වූ අවසන් දිනයේදී මම ප්‍රකාශ කළා, මට විරුද්ධව ජනාධිපති අතන මෙතැන චෝදනා කරන එක ගැන. ඔබතුමා කිව්වා, ඒ කරුණ ලිඛිතව ඉදිරිපත් කරන්න කියලා. මම එය ලිඛිතව ඉදිරිපත් කළා. මා හිතනවා, අදාළ පියවර ඔබතුමා විසින් ගෞරවයෙන් ක්‍රියාත්මක කරනු ඇති කියා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මම දැනටම පියවර ගෙන තිබෙනවා, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමනි.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු කථානායකතුමනි, ඊට අමතරව, තව කාරණයක් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාට මාව මතක් නොකර මෙලෝ දෙයක් කරන්න බැහැ. පෙරේදා රාත්‍රියේ පක්ෂ නායකයින් සමඟ තිබුණු සාකච්ඡාවේදී නැවත ජනාධිපතිතුමා කියා තිබෙනවා, 2010 ජනාධිපතිවරණයෙන් මම දිනුවා නම් පක්ෂ නායකයින්ට ඒ වාගේ ජනාධිපති හම්බ වෙවී සාකච්ඡා කරන්න හම්බ වෙන්නේ නැහැ කියලා.

මා ළඟ ලිපි දෙකක් තිබෙනවා, මම වේගයෙන් එම ලිපි දෙක ඔබතුමාට කියවන්නම්. ඒ, 2010 ජනාධිපතිවරණයේදී අදාළ තේරීම් භාර නිලධාරි සහ දයානන්ද දිසානායක වන එවකට මැතිවරණ කොමසාරිස්තුමා නිකුත් කරපු ලියුම් දෙකක්. මේ ලියුම් දෙකම නිකුත් කරලා තිබෙන්නේ 27 වෙනි දා පාන්දර. තමුන්නාන්සේලා අහගෙන ඉන්න, මේ ලියුම් දෙක කියෙව්වාම තේරේවි, 2010 ජනාධිපතිවරණයේදී මොනවාද සිද්ධ වුණේ කියලා. මම දිනුවා නම් නොවෙයි. මම දිනුවාද, පැරදුණාද කියලා මේ ලියුම් අනුව අවබෝධයක් ලැබේවි.

තේරීම් භාර නිලධාරි, අනුරාධපුර දිස්ත්‍රික්කය, එච්.එම්.කේ. හේරත්. ඔහු ලියලා තිබෙනවා, උතුරු මැද පළාත නියෝජ්‍ය පොලිස්පතිට ලියුමක්. ඒක 27 වෙනි දා පාන්දර 2.02ට fax කරලා තිබෙන්නේ. Fax numbers සියල්ල තිබෙනවා.

ඒ ලිපියේ මෙසේ සඳහන් වනවා:

"ජනාධිපතිවරණය 2010.01.26

අංක 17, අනුරාධපුර දිස්ත්‍රික්කය

2010.01.26 දින පවත්වන ලද උක්ත ඡන්ද විමසීමේ ඡන්ද ගණන් කිරීමේ කටයුතු අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේදී සිදු කෙරෙමින් පවතී. එසේ මෙම කාර්යය සිදු කෙරෙමින් පවතින අතර තුර මධ්‍ය විද්‍යාලයේ ප්‍රධාන පිවිසුම් දොරටුව ඉදිරිපිට මහාමාර්ගයේ කලබලකාරී සිදුවීමක් වාර්තා විය. මේ සම්බන්ධයෙන් මවිසින් ස්ථානයට ගොස් සොයා බැලීමේදී නිරීක්ෂණය කරන ලද කරුණු පහත සඳහන් කරමි. ඡන්ද පෙට්ටි භාර දී භාර ගැනීම් මධ්‍යස්ථානයෙන් පිටත්ව ගිය නිලධාරියෙකුට මහාමාර්ගයේදී මැර පිරිසක් විසින් පහර දී ඇති අතර, මෙම පුද්ගලයාගේ දතක් කැඩී ප්‍රථමාධාර ලබා දීමෙන් අනතුරුව රෝහල්ගත කොට ඇත.

දැනට එම පුද්ගලයා අනුරාධපුර මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් පසුවේ. එම පහර දීමේ අවස්ථාවේදී සිද්ධිය වැළැක්වීම සඳහා මැදිහත් වූ පොලිස් නිලධාරීන් හටද එම මැර පිරිස විසින් බැණ වැදී,

ඉන් නොනැවතී පහර දී ඇති අතර තත්ත්වය පාලනය කිරීම සඳහා අවම බලය යොදා ඇත. මෙම සිදුවීම වැළැක්වීමට හා තත්ත්වය පාලනය කිරීමට මැදිහත් වූ පොලිස් නිලධාරීන් පිරිස මේ වනවිට ප්‍රධාන ප්‍රවේශ දොරටුවේ රාජකාරිවලින් ඉවත් කිරීම උසස් පොලිස් නිලධාරීන් ක්‍රියා කර ඇති බව වාර්තා වී ඇත.

තවද මේ වන විටත් එම මැර පිරිස මාර්ගයේ ගමන්ගන්නා වාහනවලට ගල්මුල්වලින් පහර දීම සහ පුද්ගලයන්ට පහර දීම සිදුකරනු ලබන බව වාර්තා වේ. මේ සඳහා ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේද සෘජු ආශීර්වාදය හා මැදිහත්වීම නොඅඩුව ලැබෙන බව වාර්තා වේ. මේ සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා පැමිණ ඇති බලයලත් නියෝජිතයන් ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇත.

ඉහත තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ඉතා මන්දගාමීව සිදුවන අතර මෙම තත්ත්වය පාලනය නොකළහොත් ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාවලියට බාධා විය හැකි යැයි මාගේ මතයයි. එහෙයින් ඉහත පහර දීමේ සිද්ධියට අදාළ සියලුම පුද්ගලයන් අත්අඩංගුවට ගෙන පෙ.ව. 3.00ට පෙර මා වෙත වාර්තා කරන ලෙසත්, එසේ නොවුණහොත් ගණන් කිරීමේ හා ප්‍රතිඵල සකස් කිරීමේ කටයුතු අදාළ පුද්ගලයින් අත් අඩංගුවට ගන්නා තෙක් අත්හිටුවන බවත් දන්වා සිටිමි."

මේ ෆැක්ස් එක ගහලා තිබෙන්නේ 27වැනි දා පාන්දර 2.05ට. ඊට පස්සේ 27වැනි දා පාන්දර 3.44ට මැතිවරණ කොමසාරිස්තුමා -දයානන්ද දිශානායක, මැතිවරණ කොමසාරිස්- ෆැක්ස් එකක් ගහලා තිබෙනවා.

පොලිස්පති, පොලිස් මූලස්ථානයට තමයි මේ ෆැක්ස් එක ගහලා තිබෙන්නේ. මේ ෆැක්ස් එකේ මෙසේ සඳහන් වනවා:

"ජනාධිපතිවරණය - 2010

වහාම පොලිස් ආරක්ෂාව තර කරන ලෙස දැනුම් දීම

අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්කවල ගණන් කිරීමේ මධ්‍යස්ථාන භූමියට මැර පිරිස් බලහත්කාරයෙන් ඇතුල් වී නිලධාරීන්ට සහ නියෝජිතයින්ට පහර දීමේ තත්ත්වයක් ඇතිවී ඇති බව මා වෙත වාර්තා වී ඇත. මේ සිද්ධියෙන් කිහිපදෙනෙකු තුවාල ලබා රෝහල්ගත කර ඇත.

02. තවදුරටත් මේ සිද්ධිය සමථයකට පත් කිරීමට ඔබ අසමත් වුවහොත් පැය භාගයක් ඇතුළත ගණන් කිරීමේ සියලු කටයුතු අත්හිටුවා ඒ බව මාධ්‍ය මඟින් ප්‍රචාරයක් දීමට කටයුතු කරන බව ද දන්වමි.

03. එබැවින් වහාම අවශ්‍ය පියවර ගෙන මැරයින් ගණන් කිරීමේ ශාලා භූමියෙන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් දන්වමි."

මේ ලිපිය යවා තිබෙන්නේ මැතිවරණ කොමසාරිස්.

ගරු කථානායකතුමනි, අනුරාධපුරයේ, මාතලේ ප්‍රතිඵල ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට පහර දීම ගැන ඒ වෙලාවේ ඔබතුමා මැතිවරණ කොමසාරිස්ට කථා කළ බව මටත් මතකයි. මම හිටියා, ඔබතුමා දුරකථනයෙන් කථා කරනකොට.

වර්තමාන ජනාධිපතිට මම මතක් කරනවා, ඒ ඡන්දය දිනුවා නම්, -පැරදුණා නම් නොවෙයි- දිනුවේ කවුද කියන එක මේ ලිපි ලේඛන අනුව ඉතාම පැහැදිලි වෙන බව. මහින්ද රාජපක්ෂ දිනුවාද, මැරයින් යොදවලා ඡන්දය ගණන් කිරීම නැවැත්වුවාද, ඒ නිසා ඡන්දය ගණන් කිරීම භාරව හිටපු මැතිවරණ කොමසාරිස්ට ආතතිය හැදුණාද, නැද්ද කියන එක දැන් මේවායෙන් ඔප්පු වෙනවා.

ඊළඟට, මම තව කරුණු කිහිපයක් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මම ඒ ඡන්දය දිනුවා නම්, මම අද මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කරනවා වාගේ තුට්ටු දෙකේ, දෙකයිපනහේ වැඩ කරන්නේ නැහැ; එහෙම කරලා ව්‍යවස්ථාව කඩ කරන්නේ නැහැ; ජනතා පරමාධිපත්‍ය පාගා දමන්නේ නැහැ; පිස්සු හැදිලා වාගේ පාර්ලිමේන්තුව මේ තත්ත්වයට පත් කරන්නේ නැහැ. ඊළඟට, යූඑන්පී එකෙන් දිනලා, යූඑන්පී එකට විරුද්ධව තිබෙන ප්‍රධාන පක්ෂයට ගිහිල්ලා ඒකේ නායකත්වය භාර අරගෙන, යූඑන්පී එකට එළව-එළවා ගහන්නත්, යූඑන්පී නායකයාගේ කකුලෙන් අදින්නත් මම ක්‍රියා කරන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය මාව දිනෙව්වා නම්, මම අනිවාර්යයෙන්ම එක්සත් ජාතික පක්ෂයත් එක්ක තමයි ඊට පසුව රට ඉදිරියට ගෙනියන්නේ. පැරදිලා ගිහින් මැදමුලනේ ජනේලයේ එල්ලිලා අඬපු මිනිහා ගෙනැත් නැවත අගමැති කරන්නේත් නැහැ. මම දිනපු පැත්තේ අගමැති ආරක්ෂා කරනවා හැර, ඒ වාගේ නිර්ලජ්ජිත වැඩ කරන්නේ නැහැ. මම සුමාන දෙකකට වතාවක් හැම දාම පිටරට යන්නේත් නැහැ. මොකද, මම ඇමති කෙනෙක් වෙලා අවුරුදු දෙක හමාරයි. තවම රජයේ වියදමින් එක වතාවක්වත් පිටරට ගිහින් නැහැ. මම ඇමති කෙනෙක් වෙලා මාස දහයක්ම පාවිච්චි කළේ මගේ පෞද්ගලික වාහන. මම එක වතාවක්වත් පිටරට ගිහින් නැහැ. මම ඉතුරු අවුරුදු එක හමාර ඇමතිවරයෙක් වෙලා හිටියත්, රජයේ වියදමින් පිටරට යන්නේ නැහැ. මම පෞද්ගලික මුදල්වලින් එක වතාවක් පිටරට ගියා. මට ඉන්දියානු රජයෙන් දේශනයකට ලැබුණු ආරාධනයක් මත, ඉන්දියානු රජයෙන් මුදල් ගෙවලා එක වතාවක් පිට රට ගියා.

ඊළඟට, අනෙක් දිස්ත්‍රික්කවලට රුපියල් මිලියන 100ක්වත් වෙන් වෙන්නේ නැතිවන කොට, මම උපන්න දිස්ත්‍රික්කය වෙනුවෙන් රුපියල් බිලියන 12ක් වෙන් කරලා එම දිස්ත්‍රික්කයේ නගරය පොළොවට සමතලා කරන්නේ නැහැ. නගරය සමතලා කරලා අඩි 100ක පාරක් හදනවා; එම දිස්ත්‍රික්කයේ තිබෙන කුඹුරු යායෙන් අක්කර 3000ක් විතර ඉවර කරලා තව අඩි 100ක පාරක් හදනවා; එහෙම කරලා මම උපන් දිස්ත්‍රික්කයට ද්‍රෝහී වෙන්නේ නැහැ. උදේට එකක් කියලා-රෑට වෙන එකක් කියලා, කටින් කථා කරලා-අනෙක් පැත්තෙන් කථා කරලා දවල් මිගෙල්-රෑ දනියෙල් කෙනෙක් වෙන්නේත් නැහැ. තමුන්නාන්සේලා දන්නවා මේ දවස්වල මොකද වෙන්නේ කියලා. සාකච්ඡා තියනවා; එකක් කියනවා; රෑට වෙන එකක් කරනවා; උදේට වෙන ලියුමක් ගහනවා. ඒ වාගේ තත්ත්වයකට මේ රට පත් කරන්නේ නැහැ, මම කවදාවත්.

ඒ වාගේම, කවුරු හෝ කෙනෙක් අල්ලාගෙන මා ගැනම පොතක් ලියවාගෙන, "ජනාධිපති තාත්තා" කියන නම දාලා,

[ගරු මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

මගේ දුගේ නමින් ඒ පොත ප්‍රකාශ කරන්නේ නැහැ. ඒවා කරන්න තරම් පහත් තත්ත්වයකට මම වැටෙන්නේ නැහැ. ඒක ලියපු මිනිහාගේ නම දැම්මා නම් කමකුත් නැහැ. ඒක ලියපු මිනිහාගේ තාත්තා කවුද කියන්න මම දන්නේ නැහැ. නමුත් "ජනාධිපති තාත්තා " කියලා ඒ පොතට නම දමා ගන්නේ නැහැ.

ඒ වාගේම, දිනපතා යන යන තැන, කථා කරන කරන තැන, පණ හයේ, "අරයා මාව මරයි. මෙයා මාව මරයි" කිය කියා ඔය කොහේ හෝ ඉන්න කෙනෙක් අල්ලා ගෙන, එයාගෙන් statements අරගෙන එක එක මිනිසුන් කොටු කරන්න මම උත්සාහ කරන්නේ නැහැ. මම පණ හයේ ජීවත් වෙන්නේ නැහැ. ඒක මානසික ලෙඩක්. ඒ තත්ත්වයට මම පත් වෙන්නේ නැහැ.

ඊළඟට "රංගේ" කියමින් දුරකථන ඇමතුම් දිදී, මන්ත්‍රීවරුන්ට සල්ලි දිදී බා ගන්න හදන්නේත් නැහැ. මම ජනාධිපති කෙනෙක් වුණා නම් ඒ වාගේ ලජ්ජා නැති තත්ත්වයට කවදාවත් වැටෙන්නේ නැහැ. ඒක මහා ලජ්ජා නැති තත්ත්වයක්. ඒක ජනාධිපති කෙනෙක් තබා මන්ත්‍රීවරයෙකුවත් නොකළ යුතු දෙයක්.

ඊළඟට අවසාන වශයෙන් මේකත් කියන්න ඕනෑ. අර මොරගහකන්ද වාගේ ලස්සන තැන්වලට ගිහින් sunglasses එහෙම දා ගෙන photo shoots කරන්නේත් නැහැ. මගේ ආර්යාවත් ළඟින් නියාගෙන නළුවෙක් වෙන්න උත්සාහ කරන්නේ නැහැ. මොකද, නළුවෙක් වෙන කාලය දැන් පැනලා ඉවරයි. මම ඒ වාගේ වැඩවලට යන්නේත් නැහැ.

ඊළඟට මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ. ඇමෙරිකාවේ ජනාධිපති අවුරුද්දකට වරක් සුමාන දෙකක් මානසික රෝගීන් පරීක්ෂා කරන රෝහලක නවත්වනවා. ඒ රෝහලක admit වෙලා එයා අවුරුද්දකට වරක් මොළේ පරීක්ෂා කර ගන්න ඕනෑ. හමුදාපතිවරුන් වාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඔක්කොම අයත් පරීක්ෂා කරගන්න ඕනෑ. මොකද, පරමාණු බෝම්බ වැනි දේවල් ක්‍රියාත්මක කිරීමේ බොත්තම්වල යතුරු එහෙම තිබෙන්නේ ඒ අය ළඟ. දැන් වැරදිලාවත් මෙතැන එහෙම එකක් තිබුණා නම්, මගේ පැත්තට හරවලා අනිවාර්යයෙන්ම පුපුරවනවා. ඒ නිසා අපි මේ සියලුදෙනාගෙන්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපේ ව්‍යවස්ථාව වෙනස් කර හෝ, පනත් කෙටුම්පතක් ගෙනැවිත් හෝ පුළුවන් විධියකට ඒ වාගේ නීතියක් අපි ඇතුළත් කරමු කියලා. එතකොට කවුරු හෝ රට පලනය කරන කෙනෙක් පිස්සු නටන්න ගත්තොත්, අද තිබෙන තත්ත්වයට රට දානවා නම් අපට හැකියාව තිබෙනවා මානසික වෛද්‍යවරයෙක් ළඟට යවන්න. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් නම් නායකත්වය දීලා ඒ වැඩේ කරන්න කියලා. මේ අවස්ථාවේදී රට වෙනුවෙන් කරන්න පුළුවන් හොඳම දේ ඒ වාගේ පරීක්ෂාවක් කර ගන්න එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (වෛද්ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
ගරු කථානායකතුමනි, මගේ මිත්‍ර මයන්ත දිසානායක මැතිතුමා කියපු කාරණයට තවත් යමක් එකතු කරන්න කැමතියි. සරත් කෝන්ගහගේ, රූපවාහිනියේ සභාපතිවරයා ජනාධිපතිවරයාගේ උපදේශකයකු හැටියටත් කටයුතු කරනවා. ඉතින්, ඒ නිසා ඒක පාර්ශ්වික වැඩසටහනක් යනවා කියන එක පැහැදිලියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියපු කාරණය ගැනත් යම් අදහසක් දක්වන්න කැමතියි, ගරු කථානායකතුමනි. ඔබතුමා මේ දක්වා පාර්ලිමේන්තුවේදී ගත්ත සියලු ක්‍රියාමාර්ග අපි සියලුදෙනාම අනුමත කරනවා. ඒ වාගේම, ඔබතුමා ගැන අපට දැඩි විශ්වාසයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ බහුතරයකට ඔබතුමා කෙරෙහි දැඩි විශ්වාසයක් තිබෙනවා.

ඒ වාගේම මේ වන විට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය නිර්පාක්ෂිකව කටයුතු කරනවා. අපට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳ ලොකු ගෞරවයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ වන විට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයක් නැහැ. මේ වන විට ආණ්ඩු පක්ෂයේ ආසන හිස්ව තිබෙන්නේ. ඒකට හේතුව තමයි, ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව වර්ජනය කරලා තිබීම. ඒක අපට ප්‍රශ්නයක් නැහැ; රටට ප්‍රශ්නයකුත් නැහැ. මොකද, පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ඉතාම කාර්යක්ෂමව අපට කරගෙන යන්න පුළුවන් පරිසරය නිර්මාණය වෙලා තිබෙන නිසා. ගරු කථානායකතුමනි, එතුමන්ලා මේ සභාගර්භයට ඇවිල්ලා ඔබතුමාගේ පුටුවට වතුර හළපු විධිය අපට මතකයි. මෙතැන හිටපු නිලාධාරීන්ට ගහපු විධිය අපට මතකයි. මෙතැන හිටපු පොලිස් නිලධාරීන්ට ගහපු විධිය අපට මතකයි. ගරු කථානායකතුමනි, මේ නිලධාරීන්ටත් අපට තිබෙන අත පයම තමයි තිබෙන්නේ. ඒ ගොල්ලන්ටත් දෙකක් දෙන්න තිබුණා, ඒ මන්ත්‍රීවරුන්ට.

එම නිලධාරීන් එහෙම නොකළේ, ඒ මන්ත්‍රීවරු මේ රටේ ජනතාවගේ ඡන්දයෙන් පත් වූ බැවින් ඒ ජනතාවට කරන ගෞරවය නිසායි. හැබැයි, දැන් ඒ මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවට එන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අපි විශ්වාස කරනවා, ඔබතුමාගේ දකුණු අත පැත්තේ ඉන්නේ ආණ්ඩු පක්ෂය කියලා මේ ගරු පාර්ලිමේන්තුව තවදුරටත් සලකන්නේ නැති වෙයි කියලා. ඔබතුමාගේ වම් අත පැත්තේ ආසනවල වාඩිවෙන අපි විපක්ෂයේත් නොවෙයි. එතුමන්ලා ඔබතුමාගේ දකුණු අත පැත්තේ වාඩි වුණත් ආණ්ඩු පක්ෂයේ නොවෙයි කියන එකත් මේ අවස්ථාවේදී මතක් කර දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේ වාගේ අවස්ථාවක මට කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් රටේ මුදල් පිළිබඳ වගකීම තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට තමයි. හැබැයි, මේ පාර්ලිමේන්තුවෙන් ප්‍රතික්ෂේප වූ අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය, ඒ වාගේම, අධිකරණයෙන් ප්‍රතික්ෂේප වූ අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය තවදුරටත් මේ රජයේ මුදල් අවභාවිත කරනවාය කියන සැකය අපට තිබෙනවා. අපි ජාතික විගණන පනත සම්මත කර තිබෙනවා. ඒ නිසා ඔබතුමාට පුළුවන්

විගණකාධිපතිතුමා දැනුවත් කරන්න, මේ වාගේ වේලාවක කටයුතු කරන්න ඕනෑ කොහොමද කියලා. මේ පිළිබඳව සොයා බලන්න කියලා එතුමා දැනුවත් කරන්න ඔබතුමාට පුළුවන්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මට කියන්න තිබෙන අනෙක් කාරණය මෙයයි. එදා 26වැනි දා ඊනියා අගමැතිවරයා පත් කරපු ගමන් පොලිස්පතිවරයා ගිහින් එතුමාට salute කරලා, ඔහුගේ ආරක්ෂාව අගමැතිවරයාගේ ආරක්ෂාව විධියට සලකා, අගමැති ආරක්ෂක අංශයේ තිබෙන සියලු වරප්‍රසාද දීලා එතුමාට ඒ ආරක්ෂාව සැපයුවා. ඊට අමතරව ඔහු අනෙක් මැති ඇමතිවරුන්ටත් ආරක්ෂාව සැපයුවා. අපේ මැති ඇමතිවරුන්ගේ ආරක්ෂාව අඩු කළා. අපේ අගමැතිවරයාගේ ආරක්ෂාව පොලිස් නිලධාරීන් 10දෙනෙකුට අඩු කළා. හැබැයි, දැන් මේ වන විට පොලිස්පතිවරයා ඒ වාගේ කඩිනම් පියවරක් අනුගමනය කරන බවක් අපි දකින්නේ නැහැ.

අපට පෙනෙන්නේ ඉතාම මන්දගාමී, එහෙම නැත්නම් සැහවුණු තත්ත්වයක්. අපි එතුමාව කාලෙකින් දැක්කෙත් නැහැ. අගමැතිවරයෙක් නැතිකොට මහින්ද රාජපක්ෂ මහත්මයාට අගමැති ආරක්ෂ අංශයක් අවශ්‍ය නැහැයි කියන කාරණය පිළිබඳව එතුමාව දැනුවත් කරන්න වෙනවා. අපි කියන්නේ නැහැ, එතුමාගේ ආරක්ෂාව අඩු කරන්න කියලා. හිටපු ජනාධිපතිවරයෙක් විධියට එතුමාට ලබා දිය යුතු ආරක්ෂාව දිය යුතුයි. මොකද, අපි ඒ ගොල්ලෝ වගේ මෝඩයෝ විධියට වැඩ කරන්නේ නැහැ. එම නිසා එතුමාට අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න කියන එක අපි කියනවා. හැබැයි, අද එතුමා අගමැතිවරයා නොවෙයි. ඒ වාගේම අනෙක් ඇමතිවරුන්ගේ තත්ත්වයත් ඒ වාගේම තමයි.

ගරු කථානායකතුමනි, ඊයේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සම්මේලනයක් කියලා එකක් පවත්වනවා අපි දැක්කා. ගමරාළ කියලා පුද්ගලයෙක් එම සම්මේලනයේ දී ඉතාම අසභ්‍ය අයුරින් කථා කරනවා මම දැක්කා. මේ රටේ ජනාධිපතිවරයා විධියට පෙනී සිටීමින්, ජනාධිපතිවරයා තමන්ය කියා ගනිමින් එතුමා අපේ අගමැතිතුමාට -රනිල් වික්‍රමසිංහ මැතිතුමාට- බැන්නා, එතුමා මේ රට විනාශ කළාය කිව්වා, එතුමා එක්සත් ජාතික පක්ෂය විනාශ කළාය කියා මහා හැල්ලක් දෙඩෙව්වා. එම නිසා අපට වහාම සොයා බලන්න වෙනවා, ජනාධිපතිවරයා විධියට පෙනී සිටින ගමරාළ කියන පුද්ගලයා කවුද කියලා. ඒ කාරණය කෙරෙහිත් අපි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට, ගරු සුජීව සේනසිංහ මැතිතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. දැන් තිබෙන තත්ත්වය අනුව - උසාවි නියෝග අනුව- මේ රටේ බලවත්ම දෙවැනි පුද්ගලයා වෙන්නේ ඔබතුමායි. ගරු කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉවත් කළාය කියා කිසිම තැනක සඳහන් කරලා නැහැ. එහෙම කරන්න ජනාධිපතිතුමාට නීතිමය බලතලත් නැහැ. එතකොට දැන් තිබෙන තත්ත්වය අනුව මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති ලෙස ක්‍රියා කිරීම නවත්වා අතුරු තහනම් නියෝගයක් නිකුත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද ගොඩක් මන්ත්‍රීවරු සඳහන් කළේ, ජාතික රූපවාහිනීය, ITN වගේ සියලුම ස්ථානවල සභාපතිවරු ඇතුළු නිලධාරීන් පත් කර තිබෙන්නේ නීති විරෝධී අන්දමට කියන එකයි.

ගරු කථානායකතුමනි, මේ වෙනකොට එම පත් කිරීම් නීති විරෝධී බවට තාවකාලිකව අතුරු තහනම් නියෝගයක් නිකුත් කර තිබෙනවා. එතකොට එතුමා පත් කරපු සියලුම සභාපතිවරු සහ නිලධාරීන්ගේ පත් කිරීම් පවා අවලංගු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධවත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. එවැනි තත්ත්වයක් තුළ පාර්ලිමේන්තුවේ අගමැති පුටුව ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට බාර දෙන්න තිබෙන නීතිමය ගැටලුව මොකක්ද කියන ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහනවා. ඒ වාගේම, මේ තිබෙන තත්ත්වය අනුව ඒ තිබුණු ආණ්ඩුව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යනවා කියන කාරණය උසාවි නියෝග දෙකකින්ම ස්ථාපිත කරලා තිබෙනවා. එතකොට අපේ අමාත්‍ය ධුරවල අසුන් අපට ලබා දීමටත්, අග්‍රාමාත්‍යතුමාට එම අසුන ලබා දීමටත් ඔබතුමාට නොහැකි වන්නේ ඇයි? ඒ නොහැකියාව සම්බන්ධයෙන් අවධාරණය කරන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, මහින්ද රාජපක්ෂ මැතිතුමා නීති විරෝධී අගමැතිවරයා වශයෙන් නීති විරෝධී ලෙස පත් කරපු සභාපතිවරුන්, නිලධාරීන් සම්බන්ධව ක්‍රියා කිරීමට ඔබතුමාට පුළුවන්. මොකද, ඔබතුමා මේ රටේ දෙවැනි නායකයා.

රනිල් වික්‍රමසිංහ මැතිතුමාව නීතිමය වශයෙන් ඉවත් කර නැති නිසා, ජනාධිපතිවරයාට පසුව ඊළඟ නායකයා මේ රටේ අගමැතිවරයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා විය යුතුයි කියලයි අපි විශ්වාස කරන්නේ. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැතිවරයා විධියට පත් කළේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍යවරයා ලෙස සිටියදීමයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාව අගමැතිවරයා විධියට පත් කළේ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා එයින් ඉවත් කරලා නොවෙයි. එතකොට මහින්ද රාජපක්ෂ මහත්මයා අග්‍රාමාත්‍යවරයා නොවෙයි කියනවා නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍යවරයා වශයෙන් අප සියලු දෙනාටම ආපසු පිළිගන්න සිද්ධ වෙනවා. මම ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. ඒ නීතිමය නොවන තත්ත්වය මත පත් කරපු සියලුම සභාපතිවරුන්, නිලධාරිවරුන් එම නිලවල කටයුතු කිරීම තාවකාලිකව නවත්වන්න කියලා නියෝගයක් දෙන්න පාර්ලිමේන්තුවේ කථානායකතුමා විධියට ඔබතුමාට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ඔබතුමා කියපු සමහර කරුණු සම්බන්ධයෙන් නීතිමය පැත්තක් තිබෙනවා. මම ඒ ගැන අවධානය යොමු කරන්නම්. මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, දීර්ඝ වේලාවක් බලාගෙන ඉඳලා කොහොම හරි ඉතාමත් වැදගත් කාරණාවක් පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය 16වැනි දා මේ පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ සිදු වෙච්ච සිදුවීම නිසා රටට ඉතාමත්ම නරක පූර්වාදර්ශයක් දීලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් ගණනාවක් හැසිරුණු ආකාරය පිළිබඳව, ඒ රූපරාමු තුළින් ඉතාමත් පැහැදිලි තොරතුරු මේ වනවිට ලබාගෙන තිබෙනවා. මම හිතන විධියට

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

පාර්ලිමේන්තුවේ සියලු නිලධාරීන් ඒ පිළිබඳව සාක්ෂි දරනවා ඇති. ඒ වාගේම, පොලීසියට පහරදීම් වාගේ දේවල් එදා සිද්ධ වුණා. පාරකදී සාමාන්‍ය කෙනෙකුගෙන් පොලිස් නිලධාරියෙකුට යම් පහර දීමක් සිද්ධ වුණොත්, රාජකාරියට බාධා කළා කියලා දින 14ක් රිමාන්ඩ් කරනවා. මේ වන විට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය භාරව සිටින්නේ අතිගරු ජනාධිපතිතුමායි. එතුමා කියා තිබෙනවා, "මේ ඇමතිකම මට පැය දෙකකට තිබුණොත්, මම මේ රටේම නීතිය හා සාමය හරියට ආරක්ෂා කරනවා" කියලා.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් කෙරෙන පරීක්ෂණ යටපත් වෙන්න ඉඩදෙන්න බැහැ. අල්ලස් ගත්, දූෂණ, වංචා සිදුකළ හොරුන්ට නඩු පැවරුවේ නැහැ කියා පසුගිය කාලයේත් නොයෙක් චෝදනා තිබුණා. මේ පාර්ලිමේන්තුව තුළ කටයුතු කළ; අපි ඇස් පනා පිට දැකපු හොරුන්ටත් නීතිය ක්‍රියාත්මක වීම පමා වෙනවා නම්, රටේ අනෙක් තැන්වල මොන වාගේ තත්ත්වයක් ඇතිවෙයිද කියා අප දන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල මඩකලපුවේදී පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි තබා මරා දමා තිබුණා. ඉන් එක් අයෙක් ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම ප්‍රදේශයේයි. ගයන්ත කරුණාතිලක මැතිතුමා, වජිර අබේවර්ධන මැතිතුමා, බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඇතුළු අපි කවුරුවත් මේ ගැන දන්නවා. ගරු කථානායකතුමනි, නිරෝෂන් ඉන්දික කියන ඒ තරුණ පොලිස් නිලධාරියා වෙඩි තියලා, කපලා කොටලා තමයි මරලා තිබුණේ. මම හිතන විධියට ගොඩක් අය සමාජ ජාලා වෙබ් අඩවිවලින් එය දකින්න ඇති. මේ සිදුවීමට දින කිහිපයකට කලින් කරුණා අම්මාන් ප්‍රකාශ කර තිබුණා, "බලාගෙනයි, මම කරුණා අම්මාන්" කියා. ඒ වාගේ දෙයක් කියලා ටික දවසකින් මෙවැනි සිද්ධියක් වුණා. නමුත්, එල්ටීටීඊ එක සම්බන්ධයෙන් නොයෙක් දේවල් කියලා කෑ ගහපු උදය ගම්මන්පිල, විමල් වීරවංශ වැනි මන්ත්‍රීවරු අද නිශ්ශබ්දයි. ගරු කථානායකතුමනි, වහාම මේ ගැන පරීක්ෂණ පවත්වන්න ඕනෑ; කරුණා අම්මාන්ත් අත්අඩංගුවට ගන්න ඕනෑ.

ජය ශ්‍රී මහා බෝධිය ළඟදි වෙඩි තියලා මිනිසුන් මරා දැමූ, දළදා මාලිගාවට බෝම්බ ගැසූ, අරන්තලාවේදි හාමුදුරුවන් පෝලිමේ තියලා මරා දැමූ කරුණා අම්මාන් මට්ටු කරන්නේ නැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපතිකම දුන්නා. ඒ විතරක් නොවෙයි, පිල්ලෙයාන් වාගේ අයට මහ ඇමතිකම් දෙන්න කටයුතු කළා. ඒ අයට දඬුවම් කළේ නැහැ. අද දඬුවම් ගැන කථා කරනවා. මේවා මේ රටේ, ලෝකයේ සිටින හැම කෙනෙක්ම දන්නා දේවල්. දැනුත් තර්ජනය කරනවා. මේ තර්ජනයේ ප්‍රතිඵලයක් හැටියට අද පොලිස් නිලධාරීන් දෙදෙනෙක් මිය ගිහින් තිබෙනවා. ඒ ගැන වහාම පරීක්ෂණ කරන්න කියා අපි කියනවා. මේ වාගේ තර්ජන කරලා නැවතත් මේ රටේ එල්ටීටීඊ ත්‍රස්තවාදය ඇති කරන්න කටයුතු කරන මේ අයට විරුද්ධව ජාති භේතෛෂී මිනිහෙක් හැටියට ඔබතුමා මොනවාද කරන්නේ කියා නීතිය හා සාමය ගැන කථා කරන ජනාධිපතිවරයාගෙන් අපි මේ අවස්ථාවේදී අහනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාට මගේ ගෞරවය පුද කරනවා. ඔබතුමා කියූ කාරණය අධිකරණය අද සනාථ කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, අද සභාපතිවරු හැසිරෙන ආකාරය පිළිබඳව මෙතැනදී මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක්ම කිව්වා. මම උදාහරණයක් කියන්නම්. පසුගිය දවසක නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට "හූ" කියලා, ත්‍රී-වීල් එකක දමලා ඔහු එළවා දමා තිබුණා. ඔහු අභිංසක තරුණ තරුණියන් තුන්දාහක් ගෙදර යැව්වා. විමල් වීරවංශ කියා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඇමතිවරයෙකු සභාපතිවරයෙක් පත් කර තිබෙනවා. ඔහුගේ පත්වීම නීත්‍යානුකූල නැහැ. "මේවා නීත්‍යානුකූල නැහැ; හොර අගමැති කෙනෙක් සහ කැබිනට් එකක්" කියා අද අධිකරණය පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එහෙම තිබෙද්දී, මේ ඇමතිවරු ලබාදුන් පත්වීම්, ඒ වාගේම ඔවුන් කරන ලද නොයෙකුත් කටයුතු පිළිබඳව පරීක්ෂා කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපට මේ දේවල් කියන්න ඉන්නේ ඔබතුමා විතරයි.

ඊළඟට, සංස්ථාවල සභාපතිවරු පත්කිරීම ගැනත් මම කියන්න ඕනෑ. ඔවුන්ගේ පත්වීම් නීත්‍යානුකූල නැහැ. කරුණාකර ලේකම්වරුන් ගෙන්වා, ඒ අය වහාම එතැනින් එළවන්න ඕනෑ. අගමැතිවරයකු, කැබිනට් එකක් නැති මේ වෙලාවේ, ඒ අය පත් කළ කිසිම කෙනකු- [බාධා කිරීමක්] ජනාධිපතිවරයා ලේකම්වරුන් පත් කළ නිසා ඒ පත් වීම් හරි. හැබැයි සමහර තැන්වල සභාපතිවරුන් පත් කර තිබෙන්නේ ඇමතිවරයාගේ නිර්දේශය අනුවයි. එහෙම නම්, ඒ කටයුතු පිළිබඳවත් අපට ඉක්මනින් වාර්තාවක් ඕනෑ. පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ, ඔබතුමා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් ගෙන්වා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරාවි කියා මම හිතනවා**.** මුදල් සම්බන්ධ කටයුතු සහ නොයෙක් විධියේ අයථා සිදුවීම් මේ කාලය තුළ ඒ අමාත්‍යාංශවල සිදු වී තිබෙනවාය කියා අපට ආරංචියි. ඒ නිසා කරුණාකර ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා -ඒ අය නැති වුණත් කමක් නැහැ.- මේ පාර්ලිමේන්තුවට; මේ ගරු සභාවට - වාර්තාවක් ලබා දෙන්න. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් තමයි මට ඔබතුමා වෙත යොමු කරන්න තිබෙන්නේ. මේ කාරණා මම ඉදිරිපත් කරන්නේ, අපේ බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාගේ කාරණාවට -අපේ මන්ත්‍රී ප්‍රතිපාදන පිළිබඳ කාරණාවට- වැඩි යමක් වශයෙනුයි. මාසයකට කලින් අප යවා ඇති සමහර සංශෝධන අනුමත වීමක්වත්, අනුමත වෙලා නැවත එවීමක්වත් තවම සිදුව නැහැ. ඒ පිළිබඳව ක්‍රියාත්මක වන්න වග කිව යුතු අමාත්‍යාංශයක් නැහැ කියා තමයි පවසන්නේ. මේ රටේ යම් යම් අමාත්‍යාංශවල කඩිනමින් පත්වීම් දීම් සිදු වෙනවා; සේවකයන් එළියට දැමීම් සිද්ධ වෙනවා. පසුගිය දින කීපය තුළ බොහොම උනන්දුවෙන්, වේගයෙන් විවිධ කටයුතු සිද්ධ වුණා. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට වසරකට ලබා දෙන රුපියල් ලක්ෂ 100 පිළිබඳව වග කියන්න කෙනකු නැහැ. මේ, 2018 අවුරුද්දේ අවසානයයි; දෙසැම්බර් මාසයයි. සිද්ධ නොවුණු හැම කටයුත්තක්ම හැම තැනකදීම උනන්දු වෙලා කරන අවසාන මාසය මේ මාසයයි. අවුරුද්දේ අවසාන මාසයට ඇවිල්ලාත් තවම මේ පිළිබඳව නිසි වගකීමක් ඇතිව කටයුතු කරන්නේ නැත්නම්, නිසි අධීක්ෂණයක්, නිසි කටයුත්තක් කෙරෙන්නේ නැත්නම් එය අපට කරන විශාල අසාධාරණයක්ය කියන කාරණය අපි මේ අවස්ථාවේදී කියනවා.

ගරු කථානායකතුමනි, මේක මේ අවුරුද්දේ අවසාන මාසයයි. විශේෂයෙන් නත්තල් මාසයයි. නව වසර එමින් තිබෙන අවස්ථාවයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපට මුද්දර ලබා දී තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපට ලබා දී තිබෙන ඒ මුද්දර මන්ත්‍රීවරුන්ට භාවිත කිරීම තහනම් කියා තැපැල්

කාර්යාලවලින් ලිපියක් එවා දැනුම් දී තිබෙනවා ලු. දැන් අපි මන්ත්‍රීවරුන් නොවෙයිද? අඩුම තරමින් අපට තැපැල් පහසුකමවත් නැද්ද? මේක මේ වර්ෂයේ අවසානයයි. අපට නව අවුරුද්ද වෙනුවෙන් සුබ පතන්න තිබෙනවා; අපේ ජනතාවට පණිවුඩ යවන්න තිබෙනවා. මේක මන්ත්‍රීවරුන් වෙනුවෙන් ලබා දුන් මුද්දර ටිකත් අත් හිටුවා තිබෙන අවස්ථාවක්. ඒ ගැනත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු කථානායකතුමනි, දැන් රට ගිනි තියලා ඉවරයි. අපේ පොලිස් භටයන් මැරෙනවා; රුපියල දවස ගණනේ අවප්‍රමාණය වෙනවා; සංචාරක කර්මාන්තය දවස ගණනේ කඩා වැටෙනවා. රටේ සියලු ප්‍රශ්න මෙහෙම තියෙද්දී, අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දිය ඇල්ලක් ළඟ ඉඳගෙන, ලස්සන, පාට shirt එකක් ඇඳගෙන, sunglasses දමාගෙන ප්‍රේමණීය කුරුල්ලෙක් වාගේ රටට විහිළු සපයනවා. කරුණාකර මේ ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුද්දර සම්බන්ධ ප්‍රශ්නය ගැන මහ ලේකම්තුමාට දැන් මම උපදෙස් දෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ඊට පෙර, විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් තිබෙන නිසා කරුණාකර ඒ කාරණයට අදාළව කථා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මීට පෙර මම ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මේ හා සම්බන්ධව -මේ සඳහා තිබෙන බලය පිළිබඳව- මීට කලින් තිබෙන උදාහරණයක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට මා කැමැතියි. "එහෙම බලයක් තිබෙනවාද?" කියා කිහිපදෙනෙක්ම ප්‍රශ්න කළා. ගරු කථානායකතුමනි, මට මතක හැටියට මේ දිනය 1978 ජනවාරි 31වන දා නොවෙයි නම්, පෙබරවාරි 2වන දායි. එවකට ලේක් හවුස් ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ රණපාල බෝධිනාගොඩ මැතිතුමාත්, ඒ වාගේම "ඩේලි නිවුස්" පුවත් පතේ කර්තෘ ලෙස කටයුතු කළ හැරල්ඩ් පීරිස් මැතිතුමාත් මේ සභාව ඉදිරියට කැඳෙව්වා. ඒ අය එසේ කැඳෙව්වේ "ඩේලි නිවුස්" පුවත් පතේ අපහාසාත්මක ඡායාරූපයක් පළ කිරීම සම්බන්ධයෙනුයි. ඒ අය සභාවට ගෙන්වලා, වරද පිළිගැනීම මත දඬුවම් කළා. දඬුවම් කිරීම පිළිබඳ ඒ අදාළ නීති අද වෙනස් වෙලා තිබෙන බව ඇත්තයි, ගරු කථානායකතුමනි. නමුත් ඒ අය සභාවට කැඳවා ඔවුන්ගෙන් ප්‍රශ්න කරන්න, ඔවුන්ට චෝදනා ඉදිරිපත් කරන්න කිසිම තහනමක් නැහැ. මොකද, අද -තවම- වරප්‍රසාද පිළිබඳ කාරක සභාවක් නැහැ. "වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට" කියා මා මුලින් සඳහන් කළා. නමුත් වරප්‍රසාද පිළිබඳ කාරක සභාවක් අපි පිහිටුවා නැති නිසාත්, සමස්ත බලය තවමත් පාර්ලිමේන්තුවට තිබෙන නිසාත්, පාර්ලිමේන්තුව ඉදිරියට කැඳවලා ඔවුන්ගෙන් ප්‍රශ්න කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. ජාතික රූපවාහිනියේත්, ගුවන්විදුලි සංස්ථාවේත් පමණක් නොවෙයි, ස්වාධීන රූපවාහිනිය සහ ලේක් හවුස් ආයතනය තුළත් මේ තත්ත්වයම තිබෙනවා, ගරු කථානායකතුමනි. ඔවුන් මේ සභාවේ තීරණ පිළිගන්නේ නැහැ; එකඟතා පිළිගන්නේ නැහැ. ඒ වාගේම අපහාසාත්මක ලෙස, එකඟතා කඩ කරමින් ඔවුන් කටයුතු කරනවා. එම නිසා, මේ නීතිමය තත්ත්වය සලකා බලන්නය කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මීට කලින් මෙවැනි අය මේ සභාවට කැඳවා තිබෙනවා; ඔවුන්ට දඬුවම් කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අය කැඳවන්න දැනටමත් පියවර අරගෙන තිබෙනවා.

මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය සම්බන්ධවයි මමත් අදහස් දක්වන්නේ. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු ප්‍රචාරය කිරීම සම්බන්ධව ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තුව සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවයි.

ගිවිසුම අනුව වැඩ කටයුතු කිරීම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වගකීමක් වෙනවා. ඒ ගිවිසුම කඩ කරනවා නම් ඒක අපරාධමය ගණයට වැටෙන වරදක් වෙනවා ගරු කථානායකතුමනි. දණ්ඩ නීති සංග්‍රහයේ 388වෙනි වගන්තියට අනුව සාපරාධී විශ්වාසය කඩ කිරීමක් වෙනවා. එහෙම නම් මේ සාපරාධී විශ්වාසය කඩ කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයාට එරෙහිව අපරාධමය චෝදනාවක් නැඟීමට ඕනෑ තරම් ඉඩ කඩ තිබෙනවා. ඒ කටයුත්ත කිරීම සඳහා ඔබතුමා පාර්ලිමේන්තුව මඟින් පොලිස්පතිවරයාටත්, නීතිපතිවරයාටත් යොමු කරලා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා ඇතුළු වග කිව යුතු උදවියට එරෙහිව අපරාධමය චෝදනා යටතේ අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කිරීම අත්‍යවශ්‍ය වෙනවා ගරු කථානායකතුමනි. මම යෝජනා කරනවා මේ කටයුත්ත ඔබතුමාගේ මූලිකත්වයෙන් සිදු කරන්නය කියන කාරණය.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ එක පාර්ශ්වයක් වැඩ කරනවාද, පාර්ශ්ව ගණනාවක් වැඩ කරනවාද කියන කාරණය ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයාට අදාළ වෙන්නේ නැහැ. මොකද, එක පාර්ශ්වයක් වැඩ කරන වේලාවට විකාශනය නොකර ඉන්නත්, තවත් පාර්ශ්ව වැඩ කරන වේලාවට විකාශනය කරන්නත් කියලා මේ ගිවිසුමට ඇතුළත් වෙන්නට විධියක් නැහැ. ඒ සම්බන්ධ විනිශ්චය කිරීම සඳහා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා විමර්ශන නිලධාරියෙක්, විනිශ්චය මණ්ඩලයක සභාපතිවරයෙක් හෝ විනිශ්චයකාරවරයෙක් නොවෙයි. එම නිසා ඔහුට එවැනි තීන්දුවක් ගැනීමට බලයක් නිර්මාණය වෙන්නේ

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

නැහැ, ගරු කථානායකතුමනි. එක පැත්තකින්, කඩිනමින් පොලිස්පතිට සහ අනෙක් පැත්තෙන් නීතිපතිවරයාට යොමු කරලා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ වග කිව යුත්තන් සම්බන්ධව නීතිමය පියවර ගන්නා ලෙස මම යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. ගරු කථානායකතුමනි, මම ඔබතුමා හැල්ලුවට ලක් කරනවා නොවෙයි. ජනාධිපති ලේකම් කාර්යාලය තිබෙන පරණ ගොඩනැඟිල්ල 1977දී අපේ පර්ලිමේන්තුව. මට මතකයි එදා එහි මහා ගාම්භීරත්වයක්, වැදගත්කමක්, අර්ථවත්බවක්, උත්තරීතරකමක් තිබුණ බව. කටුබැද්ද විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පී.ඒ.ඩී. සිල්වා මහත්මයා මගේ හොඳ මිත්‍රයා. එතුමා හරි කෙළින් කටයුතු කරන කෙනෙක්, කියන කෙනෙක්, කරන කෙනෙක්. එතුමා ඒ අවස්ථාවේ හිටපු මුදල් ඇමති එම්.ඩී.එච්. ජයවර්ධන මැතිතුමාට යම් ප්‍රශ්නයකදී -අමාත්‍යාංශයේ වෙන්න ඇති.- ලොකු දෝෂාරෝපණයක් කරලා තිබුණා. මේ මත මුදල් ඇමති එම්.ඩී.එච්. ජයවර්ධන මැතිතුමා ඒ වෙලාවේ අගමැති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට පැමිණිලි කළා.

එතුමා කිව්වේ, "මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න පාර්ලිමේන්තුවට බලය තිබෙනවා. පාර්ලිමේන්තුවේ කථානායකතුමාට පැමිණිල්ල කරන්න." කියා. පාර්ලිමේන්තුවට පැමිණිල්ල කළා. මුළුමහත් ආණ්ඩුව හා විපක්ෂය සිටි පාර්ලිමේන්තුව අධිකරණයක් බවට පත් කරලා එදා මහාචාර්ය පී.ඒ.ඩී. සිල්වා මහත්මයාව පාර්ලිමේන්තුවට කැඳෙව්වා. එතුමා එදා චිත්තිකරුවෙක්. මුළු පාර්ලිමේන්තුව ජූරි සභාවක් විධියට කටයුතු කළා. ඒ වෙලාවේ කථානායකතුමා ඇහුවා, "ඔබ මෙවැනි ප්‍රකාශයක්, අපහාසයක් ගරු මුදල් ඇමතිතුමාට කළාද?" කියා. එතුමා කිව්වා, "ඔව්, මම කළා." කියා. "ඇයි එහෙම කළේ?" කියා ඇහුවා. බලන්න, එතුමාගේ අවංකත්වය හා එඩිතරකම, රාජ්‍ය සේවයට, ස්වාධීනත්වයට තිබුණු ගරුත්වය කොතරම්ද කියන එක. මෙතුමා කිව්වේ මොකක්ද? "මම වරදක් නොවෙයි කළේ. ඇත්ත කිව්වේ. එතුමා කළ වරදක් නිසායි මම ඒ විධියට දෝෂාරෝපණය කළේ." කිව්වා. "නමුත්, ඔබට එවැනි අපහාසයක් කිරීමේ අයිතියක් නැහැ." කියා ගරු කථානායකතුමා කිව්වා. "ඔබට මේ අවස්ථාවේ මේ ගරු සභාව රුපියල් 2,500ක දඩ නියම කරනවා." කිව්වා. එහෙම නැත්නම් සිරදඬුවමක්. මෙතුමා කෙළින්ම කිව්වේ, "මට සල්ලි නැහැ ගෙවන්න. මාව හිරේ යවන්න." කියා. එතුමාට පැය දෙකක් දුන්නා. එතුමා පාර්ලිමේන්තුවේ පහළ කාමරයේ නිලධාරි මහත්තයෙක් ළඟට ගියා. මහාචාර්ය පී.ඒ.ඩී. සිල්වා මහත්මයා මා සමඟ බොහොම සම්බන්ධව සිටි කෙනෙක්. ඒ නිසා මම බලාගෙන හිටියා. එතුමාට අපි කියන්නේ "පෑඩ් සිල්වා" කියා. මම ගිහිල්ලා කිව්වා, "ඔයා මොකද දඩය ගෙවන්නේ නැත්තේ. මේක ගෙවලා බේරෙන්නකෝ." කියා. "නැහැ, මම ගෙවන්නේ නැහැ." කිව්වා. ඒ කියපු විධියටමයි කියන්නේ. "මම ගෙවන්නේ නැහැ. මම වරදක් කර නැහැ. මම හිරේ යනවා." කියා එතුමා කිව්වා. ගරු කථානායකතුමනි, ඒ වෙලාවේ එතුමාටත් නොකියා ඒ රුපියල් 2,500 මම බැන්දා. එහෙම බැඳලා එතුමා නිදහස් කළා. එවැනි උත්තරීතර බලයක් පාර්ලිමේන්තුවට තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, එදා මට පාර්ලිමේන්තුවේදී මිරිස් කුඩු ගැසීම ගැන පොලිස් මූලස්ථානයට ගිහිල්ලා පැමිණිල්ලක් කළා. එතැනින් එහාට මොනවාද වෙන්නේ කියා මම දන්නේ නැහැ. මම ඊයේත් ගිහිල්ලා Dr. Wariyapolaගෙන් ඇස්වලට බෙහෙත් ගත්තා. ඒක නොවෙයි කිව යුතු කාරණය.

මට ඕනෑ පාර්ලිමේන්තුවේ උත්තරීතරකම ආරක්ෂා කිරීමට සහ අහිංසක ජනතාවගේ -ඡන්දදායක, දායිකාවන්ගේ- ඡන්දයෙන් පැමිණෙන උත්තරීතර මන්ත්‍රීවරුන් සිටින තැනක් බවට පාර්ලිමේන්තුව පත් කරන්නයි. මෙවැනි විහිළුකාරයින්ට ආත්මයක් නැහැ, මේ ගරු සභාවට ඇවිල්ලා වාඩි වෙන්න. පුවත්පත්වලට කථා කරනවා විතරයි.

දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ තාත්තා මහා වීරයෙක්. නමුත්, මෙතැනට ඇවිල්ලා කථා කරලා, උත්තර දෙන්න බැරි මෙවැනි අයට ආත්මයක් නැහැ. ඔබතුමා තිබෙන බලය අපි දන්නවා. ඔබතුමාට අපි ගරු කරනවා. අද ඔබතුමා ලෝක ප්‍රකට කෙනෙක් වෙලා. මම කියනවා, ඔබතුමා නොබෙල් තෑග්ග සඳහා අපි යෝජනා කළ යුතුයි කියා. ඉදිරියේදී මතු වෙන්න පුළුවන් සත්‍යය හරහා එක්සත් ජාතීන්ගේ මහ ලේකම් තනතුර සඳහා ඔබතුමා සුදුසුයි කියා මා හිතනවා. මේ කරුණු දෙක මම අවධානයට යොමු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව හතරදෙනෙක් විතර සිටිනවා. අපි ඒ අයට අවස්ථාව දෙමු. නැත්නම් සාධාරණ නැහැ නේ. කෙටියෙන් කථා කරන්න. ඊට පසුව අපි-

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
විශේෂයෙන්ම, වරප්‍රසාද ප්‍රශ්නයක් ගැන තමයි කථා කරන්නේ. අපේ පසුගිය රජය කටයුතු කරද්දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ මැදිහත්වීම තුළ හැම ගමකටම රුපියල් ලක්ෂ 2,000 බැගින් අපි ලබා දුන්නා, "ගම්පෙරළිය" වැඩසටහන කරන්න. ඒකෙන් දුප්පත් පවුල්වල ගෙවල් හැදෙනවා, වහල හැදෙනවා, toilets හැදෙනවා වාගේම විදුලිය ලබා දෙනවා, පාරවල් හැදෙනවා, මං මාවත්, බෝක්කු හැදෙනවා. ඒ ඔක්කෝම

හදන වැඩ පිළිවෙළක් දීලා, සල්ලි ලක්ෂ 2,000 ගානේ හැම ගමකටම -මැතිවරණ කොට්ඨාස 160කට- අපි ලබා දීලා තිබෙනවා. අපට මොන කෙනෙහිලිකම් කළත්, අපි කිසිම කුහකකමක් නැතුව මේ මුදල් ප්‍රතිලාභයක් විධියට ගමට යන්න දීලා තිබෙනවා. නමුත් මාස 10කට ඉස්සර වෙලා මහින්ද රාජපක්ෂ අගමැති කරවා ගන්නවා කියා ඡන්දය ලබාගෙන, බොරුවට ජනතාව රවටලා ආපු පළාත් පාලන ආයතන අද වන විට මේ මුදල් අවභාවිතා කරමින් පවතිනවා. ජනතාවට ලැබෙන සෙතක්, සේවයක් කියා හිතාගෙන අපි ජනතාවට ඒ මුදල් ටික ලබා දුන්නත්, ඒක අවභාවිතා කරමින් එදා මහින්ද රාජපක්ෂ පාලන කාලයේ තිබුණු පරණ කොන්ත්‍රාත්, යටිමඩි ගහන සෙල්ලම නැවත ගම් මට්ටමෙන් පටන් අරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ මුදල් පිළිබඳ වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවට. 2015 ජනවාරි 8 වනදා අපි අලුත් ආණ්ඩුවක් පත් කර ගත්තේ, මෙහෙම මුදල් අවභාවිතා නොවෙනවා කියන පොරොන්දුව දීලා. අද වන විට එදා තිබුණු තත්ත්වයටම පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. නැවත වතාවක් ඔබතුමාට ශුභාශිංසනය කරනවා. අද අපට ලෝකයට ගිහිල්ලා කියන්න පුළුවන්, ඉතාමත්ම උත්තරීතර පාර්ලිමේන්තුවක් අපට තිබෙනවා කියා. ඔබතුමාගේ නායකත්වය යටතේ අද ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීම ගැන ඔබතුමාට නැවත නැවතත් ප්‍රශංසා කරමින්, මා නිහඬ වනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අද දිනට නියමිත විවාදයක් තිබුණා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට පැහැදිලි කර එය ඉල්ලා අස් කර ගත්තා. ඊළඟට, නියමිතව තිබෙන්නේ පාර්ලිමේන්තුව කල් තැබීමයි. සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කිරීමට අපි යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, දැන් හැම කෙනාම නැඟිට, නැඟිට පාර්ලිමේන්තුව කල් තබන්න දෙන්නේ නැතිව අදාළ ප්‍රශ්නයි, අදාළ නොවන දේවලුයි කථා කර කර සිටිනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා මෙහෙම සභාවක් මෙහෙය විය යුතු නැහැ. නියමිත පරිදි, විෂයක් තිබුණා. විෂය විවාදයට ගත්තේ නැහැ. එහෙනම් සභාව කල් තබන්න ඕනෑ. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාදයට ගන්න ඕනෑ. නමුත්, දැන් පැය ගණනාවක් තිස්සේ එක් එක්කෙනා තම තමන්ගේ හිතට දැනෙන ප්‍රමාණයට, තම තමන්ගේ හිත් රිදිලා තිබෙන ප්‍රමාණයට නැඟිට නැඟිට කථා කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ මෙවැනි තත්ත්වයකට පාර්ලිමේන්තුව පත් කරන්න එපාය කියන එකයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. තව මන්ත්‍රීවරුන් තුන් දෙනෙකු සිටිනවා අදහස් ඉදිරිපත් කරන්න. ඒ අයටත් මිනිත්තු 05 බැගින් දීලා අපි ඉවර කරමු නේද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
එහෙම නම් අපි සභාවේ කටයුතු අවසන් කරමු. සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් අවශ්‍ය නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නම් දැන් සභාව කල් තබන අවස්ථාවේ විවාදයට යමුද? *එයට සභාව එකඟයි ද?*

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 19.(1) යටතේ හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කර තිබෙන බැවින්, එම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා මේ ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට කලින් දැනුම් දුන් පරිදි, "2018 ඔක්තෝබර් 26 රාත්‍රියේ සිට ගත වූ සති 05 කට වැඩි කාලය තුළ රට තුළ පැන නැඟුණු දේශපාලන සිදුවීම්දාමය නිසා රටේ ආර්ථිකයට, සමාජ ජීවිතයට සහ රාජතාන්ත්‍රික පිළිගැනීමට සිදුව ඇති බලපෑම පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළ යුතුව ඇතැයිද පවතින අරාජිකත්වය සහ අස්ථාවරත්වය නිමාකොට රට ස්ථාවර කිරීම සඳහා මෙම පාර්ලිමේන්තුව උපරිම වශයෙන් මැදිහත් විය යුතු යැයි ද යෝජනා කර සිටිමි." යනුවෙන් මා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා සභාවේ අවසරය බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
සභාව එකඟයි ද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, කාල වේලාව තීරණය කිරීම.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, සියලු කථිකයින් කථා කර අවසන් වනතුරු - till they all speak - කාලය ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථිකයෝ බොහෝ ගණනක් සිටිනවා. ඒ නිසා වේලාවක් සඳහන් කරමු. Can you suggest a time, whether it should be 5.30 p.m., 6.00 p.m. or 6.30 p.m.?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Till 5.30 p.m., Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟයි ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින පූර්ව භාග 9.30ට මාගේ නිල කාමරයේදී පැවැති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි, 2018 දෙසැම්බර් මස 12වැනි බදාදා අපර භාග 1.00ට පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වීමට මෙම සභාව තීරණය කරනු ලැබීම. සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින පූර්ව භාග 9.30ට මාගේ නිල කාමරයේදී පැවැති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි 2018 දෙසැම්බර් මස 04 වන අඟහරුවාදා නිකුත් කරන ලද පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පත්‍රය හා සම්බන්ධ (3) දරන න්‍යාය පුස්තක පරිපූරකයේ පළ කරන ලද පා.4/'18 දරන දින නියමයක් නොමැති යෝජනාව 2018 දෙසැම්බර් මස 12 වෙනි බදාදා සභාවේදී ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි එදින න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තැබීම, 2018 දෙසැම්බර් මස 12 වන බදාදා අපර භාග 1.00 වන තෙක්.

සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

දිවා භෝජනයටත් නවත්වන්නේ නැතිව සභාවේ කටයුතු කර ගෙන යන්න සභාවේ එකඟත්වයක් ලබා ගන්න පුළුවන්ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද කථිකයෝ බොහෝ ගණනක් ඉන්නවා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

රටේ අස්ථාවරත්වය නිමා කිරීමට පාර්ලිමේන්තුවේ මැදිහත්වීම
நாட்டில் ஸ்திரமின்மையை முடிவுக்குக் கொண்டு வருவதில் பாராளுமன்றத்தின் தலையீடு
INTERVENTION BY PARLIAMENT TO END INSTABILITY IN THE COUNTRY

[පූ.භා. 11.28]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව.

"2018 ඔක්තෝබර් 26 රාත්‍රියේ සිට ගත වූ සති 05කට වැඩි කාලය තුළ රට තුළ පැන නැඟුණු දේශපාලන සිදුවීම්දාමය නිසා රටේ ආර්ථිකයට, සමාජ ජීවිතයට සහ රාජතාන්ත්‍රික පිළිගැනීමට සිදුව ඇති බලපෑම පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළ යුතුව ඇතැයිද, පවතින අරාජිකත්වය සහ අස්ථාවරත්වය නිමා කොට රට ස්ථාවර කිරීම සඳහා මෙම පාර්ලිමේන්තුව උපරිම වශයෙන් මැදිහත් විය යුතුව ඇතැයි ද යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, සති හයකට ආසන්න කාලයක් තුළ රට තුළ බලවත් දේශපාලන අස්ථාවරත්වයක්, අරාජිකත්වයක් නිර්මාණය කරලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව නොවැම්බර් 14 වෙනි දා උදෑසන සම්මත කර ගන්නා ලද විශ්වාස භංග යෝජනාව නැවත වතාවක් දෙසැම්බර් 03 වෙනි දා අභියාචනාධිකරණයේදී තහවුරු කරනු ලැබුවා. ඒ විශ්වාස භංග යෝජනාව අනුව ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී තිබෙන බලතල අනුව ජනාධිපතිවරයා කටයුතු කළා නම්, මේ අර්බුදය යම්

තැනකදි විසඳා ගත හැකිව තිබුණා. නමුත් ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැත්තකට දමා ව්‍යවස්ථා විරෝධීව, අනීතිකව, සදාචාර විරෝධීව හැසිරෙන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

රාජ්‍ය නායකයා හැටියට තබා ගෙන අද අපි යන මේ ගමන නිසා අපේ රට, ලෝකය ඉස්සරහ අපකීර්තියට පත් වෙලා තිබෙනවා. වසර 70ක කාලයක් තුළ මැතිවරණවලින් ආණ්ඩු පෙරළපු, ආණ්ඩු හදපු රටක් බවටත්, ප්‍රජාතාන්ත්‍රිකව මැතිවරණ ක්‍රියාදාමය ඔස්සේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරපු රටක් බවටත් ලෝකය ඉස්සරහ අපට පිළිගැනීමක් තිබුණා. පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවලට විතරක් නොවෙයි, ලෝකයේ හැම රටකටම ඒ සම්බන්ධයෙන් පූර්වාදර්ශ සපයන රටක් බවට අපි පත්ව සිටියා. ඒ ක්‍රියාදාමයට බාධා වන සිදුවීම් නොවුණාම නොවෙයි.

ඒ මොහොතේ හිටපු පාලකයන්ගේ සිතැඟියාවන් ඉෂ්ට සිද්ධ කිරීම සඳහා 1982 ජනමත විචාරණය වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී යම් ක්‍රියාමාර්ගයන් ගන්නා අතරේ, සමස්තයක් හැටියට ලෝකයේ එහෙම පිළිගැනීමක් උපයා ගත්ත රටක් බවට අපි පත්වෙලා තිබුණා. ඒ කීර්තිය තමයි අද විනාශ කරමින් යන්නේ. සති හයක් තුළ සිදු වෙච්ච ඒ අපකීර්තිය නිවැරැදි කිරීම සඳහා ඊට වඩා වැඩි කාලයක් ගත වේවි කියලා මම හිතනවා.

අනික් පැත්තෙන් ආර්ථික ක්ෂේත්‍රයේ බරපතළ අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව බරපතළ අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා. මේ වනවිට පැමිණීමට නියමිත සංචාරකයන්ගෙන් විශාල ප්‍රමාණයක් තමන්ගේ පැමිණීම cancel කරලා තිබෙනවා. "SriLankan Airlines එකේ ආදායම් සැලකිය යුතු මට්ටමකින් මේ නිසා අඩු වෙලා තිබෙනවා" කියලා එහි ප්‍රධාන විධායක නිලධාරියෙක් කර තිබෙන ප්‍රකාශය අද සමහර පුවත් පත් වාර්තා කරලා තිබෙනවා මම දැක්කා. ඒ නිසා මේ රටේ ආර්ථිකයට සිද්ධ වන, මේ රටේ රාජ්‍ය තාන්ත්‍රිකභාවයට සිදු වන කිසිවක් නොසලකා ජනාධිපතිවරයාට මෙහෙම වැඩ කරන්න අයිතියක් නැහැ.

ගරු කථානායකතුමනි, මෙතැන සිදු වෙලා තිබෙන්නේ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක්; රාජ්‍ය බලය පැහැර ගැනීමක්. මීට අවුරුදු 2,300කට විතර කලින් ක්‍රිස්තු පූර්ව 237දී අපේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට රාජ්‍ය බලය පැහැර ගැනීමේ කුමන්ත්‍රණයක් සිදු වුණා. එදා අපි ඉතිහාසය ගැන කියවන කොට කල්පනා කළා, අශ්ව වෙළෙන්දන් දෙදෙනෙකුට ඇවිල්ලා රාජ්‍යයක් පැහැර ගන්න පුළුවන්ද කියලා. අපේ රටේ ඉස්සෙල්ලාම එවැනි රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් කරලා බලය පැහැර ගත්තේ ක්‍රිස්තු පූර්ව 237දී සේන සහ ගුත්තික විසිනුයි. දකුණු ඉන්දියාවෙන් ආපු අශ්ව වෙළෙන්දෝ දෙන්නෙක් රාජ්‍ය බලය පැහැර ගන්නේ කොහොමද කියලා ඉතිහාසය කියවන කොට කවුරුත් කල්පනා කරනවා. එතකොටත් ලංකාවට බුදු දහම ලැබිලා අවුරුදු 60ක්, 70ක් වෙලා තිබුණේ; භික්ෂු ශාසනය පිහිටුවලා තිබුණේ. එවැනි තත්ත්වයක් තුළ මෙහෙම රාජ්‍ය බලය පැහැර ගැනීමක් කරන්න පුළුවන්ද කියලා කවුරුත් කල්පනා කරනවා. හැබැයි, එදා සේන සහ ගුත්තික කරපු දේ අද වෙන දෙන්නෙකු කරලා තිබෙන බව අපට පෙනෙනවා, ගරු කථානායකතුමනි. එදා සේන වෙනුවට අද සිරිසේන ඒක කරලා තිබෙනවා; එදා ගුත්තික වෙනුවට අද මහින්ද ඒක කරලා තිබෙනවා. ඉතිහාසය පුනරාවර්තනය වෙලා, නැවත වරක් ඒ සිදුවීම් අපට අහන්න දකින්න ලැබෙන්න සලස්වලා තිබෙනවා. එදා පැවති ඒ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ වාගේම කුමන්ත්‍රණයක් මේකේ මේ සිදුවෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයට හවුල් කිසිවෙකුට යට dealsවලින් තමන්ගේ වරද වහ ගන්න දෙන්න බැහැ.

සරත් ෆොන්සේකා මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී අද කළ ප්‍රකාශය වාගේ ප්‍රකාශ එක්සත් ජාතික පක්ෂයේ ඉදිරි පෙළ නායකයන් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් මීට පසුව සිදු කරාවි කියලා අපි බලාපොරොත්තු වනවා. මේ ව්‍යවස්ථා විරෝධීව කටයුතු කරන ජනාධිපතිවරයා සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන පෙළේ නායකයෝ එහෙම කථා කරන්න ඕනෑ. හැබැයි, ෆොන්සේකා මැතිතුමාට තිබුණු හයිය වෙන කාගෙන්වත් අපි දැක්කේ නැහැ.

ගරු කථානායකතුමනි, අද මේ වෙලා තිබෙන්නේ මොකක්ද? 2014 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට බැහැලා ඇවිල්ලා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නම්; විධායක ජනාධිපතිගේ විධායක බලය අහෝසි කරන්නම්; පාර්ලිමේන්තුවට බලය පවරන්නම් කියලා ආපු මේ ජනාධිපතිවරයා අවුරුදු හතරක් ගතවන්නට මත්තෙන් මේ හැසිරෙන විධිය ගත්තොත් එහෙම, ඒ ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහත්මයා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරපු අයට විතරක් නොවෙයි, එතුමාට ඡන්දය නොදීපු අයටත් ලජ්ජා හිතෙන හැසිරීමක් තිබෙන්නේ. ඡන්දය නොදීපු අයටත් ලජ්ජා හිතෙනවා. මේ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා බලමු.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඇති, 'පංචතන්ත්‍රය' කියලා එතිහාසික පොතක් ඉන්දියාවේ තිබෙන බව. ඒක ලිව්වේ විෂ්ණු ෂර්මා. ඒ පංචතන්ත්‍රයේ එක්තරා කථාවක් තිබෙනවා, නිල් සායම් භාජනයට වැටිච්ච නරියෙක් ගැන. ඒ වෙලාවේ විෂ්ණු ෂර්මා ඒක ලියන්න ඇත්තේ මනඃකල්පිතව හිතා බලලා. එවැනි සිදුවීමක් ලෝකයේ සිදු වෙලා නැහැ. ඔහු එය කථාවක් හැටියට ගෙතුවා. ඒ කථාවට අනුව වනාන්තරයේ හිටපු නරියෙක් කෑම හොයාගෙන යනකොට, ගමකට ගියා. ගමේ රජක ගෙදරක තිබුණු නිල් සායම් භාජනයකට නරියා වැටුණා. නරියා ආයෙත් වනාන්තරයට ආවාට පසුව වනයේ හිටපු සතුන් බැලුවා, අමුතු සතෙක් ඇවිල්ලා ඉන්නවා කියලා. මේ සතා ඊට කලින් දැකලා නැහැ. "දෙවියන් වහන්සේවත් එව්වාද දන්නේ නැහැ" කියලා ඒ සතුන් වික්ෂිප්ත වෙලා ඉන්නකොට මේ නිල්පාට සායම් තැවරුණු නරියා කියනවා, "මාව දෙවියන් වහන්සේ එව්වේ, ඔබගේ ගලවා ගැනීම සඳහා; ඔබව පාලනය කිරීම සඳහා. මම මේක හරියට පාලනය කරන්නම්. මට පුද සත්කාර කරන්න" කියලා. ඉතින් අර හිටපු කොටි, වලස්සු, සිංහයෝ, ව්‍යාඝ්‍රයෝ සියලු දෙනා අර සතාට වැඳ වැටෙනවා; ඒ නිල්පාට තැවරිච්ච නරියාව සිංහාසනයේ තියා ගන්නවා; ඔටුන්න පළඳවනවා; ඔටුන්න පළඳවා ඔහුට රාජ්‍ය විචාරන්න අවස්ථාව දෙනවා. එතකොට ඒ නරියාත් මොකද, කරන්නේ? සිංහයාව පත් කරනවා, මහාදිකාරම ධුරයට. ඇතාව පත් කරනවා, දොරටුපාල ධුරයට. ව්‍යාඝ්‍රයා පත් කරනවා, සළු වඩන ඇමති ධුරයට. මේ ආදී විධියට අමාත්‍ය මණ්ඩලයක් පත් කරගෙන කාලයක් රාජ්‍ය විචාරය කරගෙන යනවා.

ඒ නිල්පාට තැවරිච්ච නරියා තමන් ගැන දන්නා නිසා, ඔහු මොකද කරන්නේ? තමන්ගේ රැළේ අය එළවනවා, කැලයෙන් පිටට. අවුරුදු ගණනක් ගියාට පසුව එක සැරයක් ඔය අමාත්‍ය මණ්ඩලය රැස් කරගෙන ඉන්නා වෙලාවක ඒ රජ පුටුවේ වාඩිවෙලා ඉන්නා නිල්පාට තැවරිච්ච නරියාට ඇහෙනවා, වනාන්තරයේ කෙළවරකින් තමන්ගේ සතුහරයේ අය කෑ ගහනවා; නරියෝ "හූ" කියනවා. එතකොට මේ රජ පුටුවේ ඉන්නා නිල්පාට තැවරිච්ච නරියාටත් එහෙම ඉන්න බැරි වෙනවා. රෝම කෙළින් වෙනවා; ඇහේ ලේ උණු වෙනවා. ප්‍රීතියෙන් පිනා ගිහිල්ලා ඒකාත් "හූ" කියන්න පටන් ගන්නවා. එතකොට තමයි දැන ගන්නේ ඇත්තටම මේ දෙවියන් වහන්සේ එව්වාය කියලා, පාලනයට සුදුසුයි කියලා වාඩි කරලා තිබෙන්නේ නිල්පාට තැවරිච්ච නරියෙක්ම තමයි කියලා. ඒ නිසා දැන් මේ සිද්ධ වෙලා තිබෙන්නේත් මොකක්ද?

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගරු කථානායකතුමනි, එදා විෂ්ණු ෂර්මා ලිව්වේ නිල්පාට සායම් බාල්දියක වැටිච්ච නරියෙක් ගැන. 2014දී යහ පාලන සායම් බාල්දියටයි නරියෙක් වැටුණේ. ඒ යහ පාලන සායම් බාල්දියට වැටුණු නරියාගේ හැටි දැන ගන්න අවුරුදු හතරකට යම්තම් අඩු කාලයක් ඉන්න සිද්ධ වුණා.

කැලෙන් පිටට, ටිකක් දුරට එළවපු නරි ටික කෑ ගහනකොට නරියාට ඔටුන්න හරියට තියාගෙන සිංහාසනයේ ඉන්න බැරිවුණා. ඒක තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. අවුරුදු දහස් ගණනකට පෙර කියපු මනඃකල්පිත කථාවක් අද ඇත්ත කථාවක් බවට පත් වෙලා තිබෙනවා.

ව්‍යවස්ථාව පැත්තකට දමලා, ජනවරමට ගරු කරන්නේ නැතිව, සදාචාරය තුට්ටුවකට සලකන්නේ නැතිව වැඩ කරන නායකයෙක් එක්ක රටකට ඉදිරියට යන්න පුළුවන්ද? තමන්ට ආණ්ඩුවක් හදා ගන්න ඕනෑය කියලා, තමන්ට යළි අගමැතිකම, ඇමතිකම් ලැබෙනවා නම් මොන තරම් ව්‍යවස්ථා විරෝධී වුණත්, සදාචාර විරෝධී වුණත්, අනීතික වුණත් ඔහුත් එක්ක යටින් ඕල් දමලා වැඩ කරන්නට කාටවත් අවසර දිය යුතු නැහැ. මොකද, මේ කුමන්ත්‍රණය තීරණාත්මකව පරාජය කළ යුතුයි. මේ පාර්ලිමේන්තුව මැදිහත් වෙන්නේ ඒ වෙනුවෙන්. කථානායකතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු පසුගිය සති පහකට ආසන්න කාලයක් තිස්සේ මැදිහත් වුණේ මේ කුමන්ත්‍රණය තීරණාත්මකව පරාජය කිරීම සඳහායි. අපේ පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ අදහස අභියාචනාධිකරණයේදී, ශ්‍රේෂ්ඨාධිකරණයේදී සාක්ෂාත් කරගෙන තිබෙනවා; තහවුරු වෙලා තිබෙනවා. දැන් මේ රටේ බහුතර ජනතාව මේ කුමන්ත්‍රණයේ ආදීනව තේරුම් අරගෙන, ඒ කුමන්ත්‍රණයට එරෙහිව පෙළ ගැහෙමින් ඉන්නවා.

ගරු කථානායකතුමනි, ඒ අතර සමහර මාධ්‍යවල හැසිරීම ගැන අපි කනගාටු වෙනවා. ඔබතුමා සහ මහින්ද රාජපක්ෂ මහත්මයා පසුගිය සතියේ පැවැති උත්සවයකදී හමුවුණු අවස්ථාවේ ලබා ගත් ඡායාරූපයක් සමහර පුවත් පත්වල පළ කර තිබෙනවා මම දැක්කා. එම පින්තූරය දමලා මහින්ද රාජපක්ෂ මහත්මයාට 'හිටපු ජනාධිපති' කියලා හඳුන්වන්න 'දිනමිණ' පුවත් පතට පුළුවන් නම්, එම ඡායාරූපයම පළ කළ සමහර පෞද්ගලික පුවත් පත්වලට මහින්ද රාජපක්ෂ මහත්මයාව 'හිටපු ජනාධිපති' කියලා හඳුන්වන්න බැරි ඇයි? 'දිනමිණ' පුවත් පතේ 'හිටපු ජනාධිපති' කියලා ඒ පින්තූරය දමන කොට සමහර පුවත් පත්වලට තවමත් ඔහු අගමැති. ඔවුන්ගේ මුද්‍රණ යන්ත්‍ර අයිති ඔවුන්ට වුණාට, ඔවුන්ගේ පාඨකයන් මේ රටේ ජනතාව කියලා මාධ්‍යය දැන ගන්න වුවමනාව තිබෙනවා. මාධ්‍ය යන්ත්‍ර අයිති ඔවුන්ට වුණාට, මේ වායුගෝලයේ සැරිසරන සංඛ්‍යාත අයිති ජනතාවට කියලා විද්‍යුත් මාධ්‍යය දැන ගන්න වුවමනාව තිබෙනවා. එම නිසා ඒවාට සදාචාරයක් තිබෙන්න ඕනෑ. කුමන්ත්‍රණයේ පැත්ත ගන්න කාටවත් අයිතියක් නැහැ. රටක් මේ විධියට අගාධයට හෙළපු, ආර්ථිකමය, දේශපාලනමය වශයෙන් පහළට ඇදලා දමපු මේ කුමන්ත්‍රණය පරාජය කිරීම සඳහා පාර්ලිමේන්තුවත්, අධිකරණයත් ගන්නා උත්සාහයට තව තවත් ධෛර්යය ප්‍රාර්ථනා කරමින්, කෙසේ හෝ අපි හැමදෙනාම එකතු වී මේ කුමන්ත්‍රණය තීරණාත්මකව පරාජය කරලා, මෙය ඉතිහාස පොතෙන් මකා දමමු කියන ඉල්ලීම කරමින් මම නතර වෙන්නම්. ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කිරීම, ගරු විජිත හේරත් මැතිතුමා.

[පූ.භා. 11.39]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, ඒ පිළිබඳ අදහස් කිහිපයක් දක්වන්න මම කැමතියි. ගරු කථානායකතුමනි,14වැනි දින සම්මත වූ විශ්වාස භංග යෝජනාව අභියාචනාධිකරණය මඟින් නැවත තහවුරු කරනු ලැබූ බව අපි කවුරුත් දන්නවා.

එය නීත්‍යානුකූල නොවේය කියා වැරදි මතයක් ප්‍රචාරය කරමින් තිබුණා. නමුත් එහි නීත්‍යානුකූලභාවය තවත් වටයකින් මේ රටේ ඉහළම අධිකරණයක් වන අභියාචනාධිකරණයක් විසින් ලබා දුන් තීන්දුවෙන් ඉතා පැහැදිලිව පෙනෙනවා.

ඇත්තටම ගත්තොත්, එදා ඔක්තෝබර් 26වැනි දා ගත් තීරණයත් එක්ක අද මුළු රටම ආර්ථික වශයෙන් අරාජික වෙලා තිබෙනවා; දේශපාලන වශයෙන් අස්ථාවර වෙලා තිබෙනවා. මේ අරාජිකත්වය, අස්ථාවරත්වය නිර්මාණය කිරීමේ වග උත්තරකරුවා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයායි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා මේ පිළිබඳව ඊයේ ඔවුන්ගේ පක්ෂයේ සමුළුවේදී කිව්වේ, මේ සියලුම තීන්දු ගත්තේ දූෂණයට, වංචාවට එරෙහිව කියායි. දූෂණයට, වංචාවට එරෙහිව තීන්දු ගන්නවා නම්, එතුමා මේ තීන්දුව පළමුවෙන්ම ගත යුතුව තිබුණේ එදා 2015 පෙබරවාරි 27වැනි දා කුප්‍රකට මහ බැංකු බැඳුම්කර වංචාව සිද්ධ වෙච්ච ගමන්. එතුමා දූෂණයට විරුද්ධ නම් සතියක් ඇතුළත ඒ පිළිබඳ කොමිෂමක් පත් කරන්නට තිබුණා; ඒ කොමිෂම ක්‍රියාත්මක කර, එහි වාර්තාවක් අරගෙන ඒ පිළිබඳව දඬුවම් දෙන්න තිබුණා. නමුත් ගරු කථානායකතුමනි, අද වනතුරු ඒ බැඳුම්කර වංචාවට අදාළ වාර්තාවේ පරිදි ඒ කිසිවෙකුට දඬුවම් දීලා නැහැ. ඇත්තටම මේ කොමිසම පත් කළේත් කෝප් කමිටුවෙන් වාර්තාවක් ඉදිරිපත් කළ පසුයි. මේ පාර්ලිමේන්තුවේ ඔබතුමාගේ මූලිකත්වයෙන් පත් කළ කෝප් කමිටුවෙන් වාර්තාවක් ඉදිරිපත් කළා, 2016 අගෝස්තු මාසයේ 28වැනි දා. 2016 අගෝස්තු මාසයේ 28වැනි දා වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ තමයි ජනාධිපතිතුමා, ජනාධිපතිතුමාගේ විශේෂ කොමිසම පත් කරනු ලැබුවේ. එයින් පැහැදිලිව පේනවා, දූෂණයට විරුද්ධව කටයුතු කරන්නට ජනාධිපතිවරයාට අවංක වුවමනාවක් නොතිබුණු බව.

ඊළඟට ජනාධිපතිවරයා පත් කළා, මූල්‍ය වංචා පිළිබඳ විශේෂ කොමිසමක්. ඒ කොමිසමේ වාර්තාවක් එතුමාට භාර දීලාත් තිබෙනවා. චූදිතයෝ කවුද කියා ඒ වාර්තාවේ පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. එහි චූදිතයන්ගෙන් අංක 1ට ඉන්නේ කවුද? මහින්ද රාජපක්ෂ. ඊළඟට ඉන්නේ කවුද? නැහෙගෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාර රෝහිත බෝගොල්ලාගම. ඊළඟට ඉන්නේ කවුද? විමල් වීරවංශ; පද්ම උදයශාන්ත; පියසිරි විජේනායක; ජයන්ත සමරවීර. ඒ විතරක් නොවෙයි. උතුරු මැද පළාතේ හිටපු මහ ඇමති චන්ද්‍රසේන. ඒ ඔක්කොම ඉන්නවා මේ වාර්තාවේ වැරදිකරුවන් විධියට. ඒ කිසිවෙකුට දඬුවම් දීලා නැහැ. එතුමාගේ උපෙද්ශක ධුරයට පත් කරපු ජගත් පුෂ්පකුමාර මේ කොමිෂන් සභා වාර්තාවේ වැරදිකරුවකු විධියට පැහැදිලිව නම් කර තිබෙනවා. ඒ කිසිවෙකුට දඬුවම් දුන්නේ නැහැ. එම නිසා ඉතා පැහැදිලියි, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දූෂිතයන්ට දඬුවම් දුන්නේ නැති බව. එතුමා දූෂිතයන්ට දුන්නේ ඇමතිකම්; අගමැතිකම්.

ඒ දූෂණ චෝදනාවලට ලක් වුණු අය 300ක් විතර මේ වන විට උසාවියේ ඇප පිට එළියේ ඉන්නවා. ඒ 300 දෙනාගෙන්

බහුතරයක් ඉන්නේ ආණ්ඩුවේ ඇමතිකම්වල. ඉතුරු අය දැන් සංස්ථාවන්වල සභාපතිවරු ලෙස පත් කරලා ඉන්නවා. එදා ඔබතුමාගේ ආසනය වටකරගෙන හිටපු අයගෙන් සියයට 90ක්ම චෝදනා සහිතව ඇප පිට ඉන්නා අය. වැලිකඩ බන්ධනාගාරයේ ඉන්න ඕනෑ අය තමයි එදා ඔබතුමාගේ මූලාසනය ආක්‍රමණය කරලා, මිරිස් කුඩු ප්‍රහාර දියත් කළේ. ජනාධිපතිවරයා ඒ දූෂණවලට විරුද්ධ නම්, බැදුම්කර වංචාවට අදාළ චර්තාවට අනුව ක්‍රියාත්මක වෙන්න තිබුණා. නමුත් ක්‍රියාත්මක වුණේ නැහැ. එතුමාම පත් කරපු බරපතළ වංචා දූෂණ පිළිබඳ කොමිසමෙන් ඒ වූදිතයන්ට දඬුවම් දෙන්න තිබුණා. නමුත් අද වනතුරු දඬුවම් දුන්නේ නැහැ. ඒ සියලු දෙනාටම දීලා තිබෙන්නේ ඇමතිකම්, අගමැතිකම්, වරදාන, වරප්‍රසාද.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. ඊයේ එතුමාගේ කථාවේදී කිව්වේ මොකක්ද? එතුමා ගැසට් නිවේදන පහක් ගැහුවා ලු. ඒ ගැසට් නිවේදන පහම ගැහුවේ රට වෙනුවෙන් ලු. ගරු කථානායකතුමනි, ගැසට් නිවේදන පහෙන් හතරක්ම නීතිවිරෝධියි; ව්‍යවස්ථා විරෝධියි. පළමුවෙනි ගැසට් එක, අගමැතිවරයා ඉවත් කිරීම. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අගමැතිවරයා ඉවත් කරන්න බැහැ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට අගමැතිවරයා ඉවත් කරන්න බැහැ. ඒ බව ඉතා පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙනවා. එහෙම නීතිවිරෝධීව ඉවත් කරලා තවත් අගමැතිවරයෙක් පත් කරන්න ගැසට් එකක් ගහන්න බැහැ. ඒ දෙකම ව්‍යවස්ථා විරෝධියි. ඒ නිසා ජනාධිපතිවරයා එදා නිකුත් කරපු ගැසට් නිවේදන පහෙන් මුල් ගැසට් නිවේදන දෙකම නීතිවිරෝධියි. ඊළඟට, 27වෙනි දා පාර්ලිමේන්තුව වාර අවසාන කළා. ඒක නීත්‍යානුකූල වෙන්න පුළුවන්. හැබැයි, ප්‍රජාතන්ත්‍ර විරෝධියි. එතුමා මහින්ද රාජපක්ෂව අගමැති ධුරයට පත් කරලා, තමන්ට බහුතරය තිබෙනවා නම් ඊළඟ සඳුදා පාර්ලිමේන්තුව කැඳවලා, මේ පාර්ලිමේන්තුවට බහුතරය පෙන්වලා තමන්ගේ කණ්ඩායමට බහුතරය තිබෙනවා කියලා මුළු රටටම, ලෝකයටම පෙන්වන්න තිබුණා. හැබැයි, එතුමාට ඒක කර ගන්න බැහැ. ඒ බැරිකම නිසා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට ඊළඟ ගැසට් එක ගැහුවේ පාර්ලිමේන්තුව වාර අවසාන කරන්නයි. නොවැම්බර් 16වෙනි දා දක්වා පාර්ලිමේන්තුව කල් තිබ්බා. ඒක සාධාරණයිද? ඒක නිවැරදියි කියන්නේ කොහොමද? ඒ නිසා, ඒ ගැසට් නිවේදනයත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරමින් නිකුත් කළ එකක්. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව නිකුත් කරපු ගැසට් නිවේදනයක්. ඊළඟට එතුමා තවත් ගැසට් නිවේදන දෙකක් ගැන කිව්වා. මොකටද? පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, අවුරුදු හතරහමාරක් යනතෙක් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න එතුමාට ගැසට් නිවේදනයක් නිකුත් කරන්න බැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, දැනටමත් එතුමා අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා ඉවරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළ පළමුවතාව, දෙවැනිවතාව නොවෙයි.

ඊළඟට නියෝජ්‍ය ඇමතිවරු පත් කළා. එදා නියෝජ්‍ය ඇමතිවරු දෙන්නෙක්, තුන්දෙනෙක් පත් කළා. ඒ පත්වීම් කරනකොට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ඉතා පැහැදිලිව සඳහන් වනවා, අගමැතිවරයාගෙන් විමසලා තමයි පත් කරන්න ඕනෑ; අගමැතිවරයාගේ සාකච්ඡාවෙන් තමයි එහෙම කරන්න ඕනෑ කියලා. නමුත් එහෙම කළේ නැහැ. ඒ නිසා, එතැනදීත් එතුමා ව්‍යවස්ථාව උල්ලංඝනය කළා. එතුමා නිකුත් කළ මේ ගැසට් නිවේදන පහෙන්, හතරක්ම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලායි තිබෙන්නේ.

අනෙක් අවස්ථාව මේකයි, ගරු කථානායකතුමනි. පසුගිය ඔක්තෝබර් 25වැනි දා මේ පාර්ලිමේන්තු සංකීර්ණයේදී ඔබතුමාගේ නිල කාමරයේ ඔබතුමාගේ මූලිකත්වයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වුණා. ඒ ව්‍යවස්ථා සභාවේදී තීන්දුවක් ගත්තා; ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරු දෙදෙනෙක් පත් කළා. දැන් සති හයක් වනවා, අද වනතෙක් නිල වශයෙන් ඒ දෙදෙනා පත් කර නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එතුමා බැඳී සිටිනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අනුමත කරන පුද්ගලයන් ඒ තනතුරුවලට පත් කිරීමට. ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරු දෙදෙනෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අනුමත කළා නම්, ඒ අය පත් කිරීමේ බලධාරියා වන්නේ ජනාධිපතිවරයා. එතුමා ඒක කළ යුතුයි. ඒක පැහැර හරින්න බැහැ. නමුත්, එතුමා තවමත් ඒ පත් කිරීම් කරලා නැහැ. ඒ නිසා එතුමා දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මහ හැර, පැහැර හැර තිබෙනවා. එවැනි චෝදනාවක් දැන් එතුමාට සෘජුවම තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අද ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්නේ විනිසුරුවරු නව දෙනයි. ඒ නව දෙනාගෙන් හත්දෙනෙක්ම අද විභාග වන ඒ නඩු කටයුත්තට සම්බන්ධ වෙලා තිබෙන්නේ. එතකොට ඉතුරු වෙලා ඉන්නේ දෙදෙනයි. ඒ දෙදෙනාගෙන් ඊවා වනසුන්දර විනිසුරුවරිය කියනවා, එතුමිය ළඟදී විශ්‍රාම යන නිසා නඩු භාර ගන්නේ නැහැ කියලා. එතකොට, ඊයේ මහින්ද රාජපක්ෂලාම ගිහින් ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් භාර දුන්නා. ඒ පැමිණිල්ල විභාග කරන්න දැන් විනිශ්චයකාරවරු නැහැ. ඇයි ඒ? විනිශ්චයකාරවරු නවදෙනාගෙන් හත්දෙනෙක්ම දැන් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ නඩු විභාගයේ වාඩි වෙලායි ඉන්නේ. ඉතුරු වෙලා ඉන්නේ තව දෙදෙනයි. ඒ දෙදෙනාගෙන් එක් කෙනෙක් හෙට-අනිද්දා විශ්‍රාම යන නිසා නඩු භාර ගන්නේ නැහැ. ඒ අනුව ඉතුරු වෙලා ඉන්නේ එක්කෙනයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් නම් කළ විනිසුරුවරු දෙදෙනා මේ වන විට පත් කර තිබුණා නම්, වෙනම උසාවියක, වෙනම Bench එකකදී, ඒ නඩුව විභාග කරන්න තිබුණා. නමුත්, ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයාට ඕනෑකම තිබුණේ ඒ නම් කළ විනිසුරුවරු දෙදෙනා පත් කරන්න නොවෙයි. එතුමාගේ වුවමනාව ඉෂ්ට වුණේ නැහැ. ඒ නිසා එතුමා තවමත් ඒ පත් කිරීම් පැහැර හරිමින් සිටිනවා. ඒ නිසා ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින්, ව්‍යවස්ථාව පැහැර හරිමින් අදත් ශ්‍රේෂ්ඨාධිකරණයට පත් වෙන්න ඕනෑ විනිශ්චයකාරවරුන් පත් නොකර ඉන්නවා. ඒ නිසා ජනාධිපතිවරයා ඒ චෝදනාවටත් වරදකාරයෙක් වෙලා ඉවරයි.

ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අපි බලාපොරොත්තු වනවා, මේ රටේ ජනතාවගේ යුක්තිය සඳහා හොඳ තීන්දුවක් ලැබෙයි කියලා. "පාර්ලිමේන්තුව විසුරුවා හැරීම වැරදියි" කියන තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබුණොත් ජනාධිපතිවරයා අනිවාර්යයෙන්ම ව්‍යවස්ථාව කැඩුවාය කියන එක ශ්‍රේෂ්ඨාධිකරණය මහින්ම තහවුරු වනවා.

ගරු කථානායකතුමනි, එතුමා පිළිගන්න බැහැ කියපු විශ්වාස භංග යෝජනාව දැන් අභියාචනාධිකරණයෙන් තහවුරු වෙලා තිබෙනවා. එතුමා, 14වැනි දා අනුමත වූ විශ්වාස භංග යෝජනාව ප්‍රතික්ෂේප කර එව්වා. ඊළඟට, 16වැනි දා අනුමත වූ විශ්වාස භංග යෝජනාව ප්‍රතික්ෂේප කර එව්වා. නමුත්, අභියාචනාධිකරණය අද පිළිගෙන තිබෙනවා, ඒ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවේ නියමානුකූලව අනුමත වුණා කියලා. ඒ නිසා ජනාධිපතිවරයාට බැහැ අධිකරණ තීන්දුව අභිභවා යන්න.

දැන් අධිකරණය තීන්දුවක් දීලා තිබෙනවා. එම විශ්වාස භංග යෝජනාව පිළිගෙන තමයි ඒ වාරණ නියෝගය නිකුත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එම නිසා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ චෝදනාවට ලක්වෙලා ඉවරයි.

[ගරු විජිත හේරත් මහතා]

ඒ විතරක් නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම පැහැර හැරීමේ චෝදනාවටත් ලක්වෙලා ඉවරයි. ඇමතිවරු පත් කිරීමේදී, ගැසට් නිවේදන නිකුත් කිරීමේදී, විශ්වාස භංග යෝජනාව නොපිළිගැනීමේදී එතුමා මේ වැරදිවලට හසුවෙලා ඉවරයි. නීති විරෝධී විධියට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ වරදටත් හසු වුණොත්, එතුමා සියලු චෝදනාවලට වරදකරු වෙනවා. එම නිසා එතුමාට තව දුරටත් මේ රටේ ජනාධිපති පුටුවේ වාඩිවෙලා ඒ කටයුතු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මේ රටේ ජනතා අධිකරණය ඉදිරියේ තිබෙනවා. අපි බලමු, ඉදිරියේදී මොකක්ද වෙන්න ඕනෑ කියලා.

ගරු කථානායකතුමනි, එතුමා කියනවා, පසුගිය අවුරුදු තුනහමාර තුළ එතුමා දූෂණයට විරුද්ධව වැඩ කළාලු. ඒ වාගේම, එතුමා විනාශ කළා කියලා කිව්වා. එතුමා විතරක් නොවෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා රට විනාශ කළා, ආණ්ඩුව විනාශ කළා, එතුමාගේම පක්ෂය විනාශ කළා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් විනාශ කළා කියමින් තමයි එතුමා පටන් ගත්තේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට "මෛත්‍රීලා" දෙදෙනා මාරු වුණාද කියලා මම දන්නේ නැහැ. ඒ විනාශ කිරීම් ගැන මොකක්ද එතුමා කියන්නේ? ඒ දෙදෙනා අතර තිබෙන විනාශ කිරීම් ප්‍රශ්නයක් රටේ ප්‍රශ්නයක් කරගන්න ඕනෑද? මේ රටත්, දෙකෝටි දසලක්ෂයක් වන ජනතාවත් මේ වාගේ අගාධයකට තල්ලු කරලා තිබෙන්නේ ඒ දෙදෙනා අතර තිබෙන ප්‍රශ්නයකටද? ගරු කථානායකතුමනි, ඒක සදාචාරසම්පන්න වෙන්නේ කොහොමද? ඒක යුක්ති සහගත වෙන්නේ කොහොමද? ස්වාමියායි, බිරිඳයි අතර ප්‍රශ්නයක් මතු වුණා කියලා, දෙදෙනා අතර අඩ දබරයක් ඇති වුණා කියලා මුළු රටක් විනාශ කරනවාද? පසුගිය දවස්වල කැබිනට් මණ්ඩලයේදී කිව්වාය කියලා අපට ආරංචි වුණා, "මම රටම ගිනි තියාගෙන යන්නේ" කියලා. අද ඒක තමයි මේ කරලා තිබෙන්නේ. මුළු රටම ගිනි තියලා තිබෙන්නේ. අද මුළු රටම ගිනි තියලා නීරෝ වාගේ වීනා වයමින් ඉන්නවා. ගරු කථානායකතුමනි, එම නිසා මේ තත්ත්වය තවත් ඉදිරියට ගෙන යන්න ඉඩ දෙන්න බැහැ. අපි ඉතා පැහැදිලිව කිව්වා, එතුමාත් එක්ක සාකච්ඡා කරන්න දෙයක් නැහැ, එතුමාත් එක්ක සාකච්ඡා කරන එකේ කිසි තේරුමක් නැහැ කියලා. ඒ වාගේම අපි එදා පැහැදිලිව කිව්වා, ඒ සාකච්ඡා වාගේම තමයි එතුමාගේ යටිකුටිටු වැඩත් කියලා. එදා රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව ගෙනෙනකොට ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කිව්වා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ වෙන කවුරුවත් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන කියලා. ඒක ඔබට මතක ඇති, රටේ ජනතාවට මතක ඇති. ඒ යෝජනාව ඉදිරිපත් කළේ මහින්ද රාජපක්ෂ කණ්ඩායමෙන් වුණාට ඒ යෝජනාවේ නිර්මාතෘ වුණේ, -ඒක හැදුවේ- වෙන කවුරුවත් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පාර්ශ්වය. ඒක තමයි එදා සිදු වුණු ඇත්ත කථාව.

ගරු කථානායකතුමනි, අපි මේ පාර්ලිමේන්තුව තුළ විශ්වාස භංග යෝජනාවක් සම්මත කළා. වරක් නොවෙයි, දෙවරක් සම්මත කළා. තුන්වැනි වතාවට අද නැවත මෙවැනි යෝජනාවක් ගෙනෙන්න කටයුතු කළා. මේ යෝජනාව හැදුවේත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පාර්ශ්වයයි. ගරු කථානායකතුමනි, පක්ෂ නායකයන්ට සහ ඔබතුමාට එන්න කියලා තියපු සාකච්ඡාවේදී මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොකක්ද කිව්වේ? ඒක ඔබතුමාට මතක ඇති. එදා ගෙනාපු විශ්වාස භංග යෝජනාව ගැන එතුමා කිව්වා, "මේ විශ්වාස භංග යෝජනාව ගැන මට කිසි ප්‍රශ්නයක් නැහැ. මේ යෝජනාවේ පළමුවැනි කොටස අයින් කරන්න, දෙවැනි කොටස ගෙනෙන්න" කියලා. පළමුවැනි කොටසේ තිබුණේ මොකක්ද? පළමුවැනි කොටසේ තිබුණේ, "අගමැතිවරයා ඉවත් කිරීමේ ගැසට් එක නීති විරෝධීයි. ඒ මත නව අගමැතිවරයෙක් පත් කරපු ගැසට් නිවේදනයත් වැරදියි." කියලායි. එතුමා කියනවා, "ඒ නීති විරෝධී වැඩේ කරපු මා නිදහස් කරන්න; මා බේරන්න. මහින්ද රාජපක්ෂ අයින් කළාට මට ප්‍රශ්නයක් නැහැ." කියලා. ඒ යෝජනාවේ දෙවැනි කොටසේ තිබුණේ මොකක්ද? දෙවැනි කොටසේ තිබුණේ, "මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කර සිටිමු." කියලායි. මෛත්‍රීපාල මහත්මයා කිව්වේ මොකක්ද? එතුමා එදා කිව්වා, "පළමුවැනි චෝදනාව ඍජුව මටයි එල්ල වෙන්නේ. ඒක අයින් කරන්න. දෙවැනි යෝජනාව ගෙනෙන්න. මහින්දට මොනවා වුණත් මට ප්‍රශ්නයක් නැහැ. මා බේරන්න." කියලා. අනාගතයේ දෝෂාභියෝගයක් ආවොත් එතුමාට එරෙහිව ඒ කොටස පාවිච්චි වෙනවා. දෝෂාභියෝගයක් විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, අනාගතයේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්නත් පුළුවන්. එතුමාගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්නත් මේ කරුණ පාවිච්චි කරන්න පුළුවන්. එතුමා දැනට මේ වරදට හසු වෙලා ඉවරයි. ඒක තමයි මෙච්චර භය. ඇයි මේ භය? භය නිසා තමයි එතුමා දිගින් දිගටම, දිගින් දිගටම කිව්වේ, "මේ විශ්වාස භංග යෝජනාවේ පළමුවැනි කොටස අයින් කරන්න." කියලා.

ගරු කථානායකතුමනි, අපට කනගාටුයි, අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ජනාධිපතිතුමාගේ ඒ කථාව විශ්වාස කරලා, මේ දේ සද්භාවයෙන් කරගන්න ඕනෑ කියලා හිතලා,- ඒ චේතනාව අවංක වෙන්න පුළුවන්- මෛත්‍රීපාල සිරිසේන කෙරෙහි තවත් විශ්වාසය තියලා, එතුමාගේ ඉල්ලීම පරිදි අද මේ යෝජනාව ගෙනාවේ. අද ඉදිරිපත් කරන්න තිබුණු යෝජනාවේ සඳහන් වෙන්නේ, "ඒ අනුව 2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර ඇති හෙයින් ද;" කියලායි.

මේ යෝජනාව එහෙම වෙනස් වුණේ කොහොමද? ඒ විශ්වාශ භංග යෝජනාවේ "පළමුවැනි ඡේදය ඉවත් කර ඇති හෙයින් ද;" කියන වාක්‍ය ආවේ කොහොමද? ඒක ආවේ "ඩීල්" එකෙන්. පැහැදිලි "ඩීල්" එකකින්. මෛත්‍රීපාල මහත්මයාගේ ඉල්ලීමට එක්සත් ජාතික පක්ෂයේ මෙතුමන්ලා එකඟ වුණා. ඒ නිසා එතුමන්ලා ඒ කොටස අයින් කළා. අයින් කරලා අද ගෙනෙන්න හැදුවා. අපි කියනවා, "නැහැ, එහෙම කරන්න ඕනෑ නැහැ." කියලා. ඇයි? අභියාචනාධිකරණයෙන් දැන් තීන්දු වෙලා ඉවරයි, ඒ විශ්වාස භංග යෝජනාව නීත්‍යානුකූලයි කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒ බව ප්‍රකාශ කරලා ඉවරයි. නැවත ඒ යෝජනාව reverse කරන්න ඕනෑ නැහැ. ඒ නිසා දැන් හැප්පිලා බලමු. ඒ ගැන උසාවියේ තීරණය තිබෙනවා; පාර්ලිමේන්තුවේ තීරණය තිබෙනවා. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-වැඩවලට අපි අහු වෙන්න ඕනෑ නැහැ. එතුමා චෝදනාවලට අහු වෙලා ඉවරයි. එතුමා වැරදිකාරයා වෙලා ඉවරයි. දැන් ඒකෙන් බේරෙන්න එක එක මන්ත්‍රීවරුත් එක්ක ඩීල් දමාගෙන, ඒ කීප දෙනෙක් එක්ක සාකච්ඡා කරලා, ඒ එකඟතාව මත තමයි අද මේ අලුත් යෝජනාව ගෙනාවේ.

එහෙම ගත්තාම එදා රනිල් වික්‍රමසිංහට එරෙහි විශ්වාස භංග යෝජනාව ගෙනාවේත් මෛත්‍රී. අද මහින්ද රාජපක්ෂට විරුද්ධව විශ්වාස භංගය ගේන්නේත් මෛත්‍රී. හරියට බලන්න. මේ යෝජනා දෙකම ගෙනෙන්නේ මෛත්‍රීපාල සිරිසේන. එදා යටිකුටිටුවෙන් මහින්ද රාජපක්ෂලා හරහා විශ්වාස භංග යෝජනාවක්

රනිල් වික්‍රමසිංහ මහත්මයාට එරෙහිව ගෙනාවා; ගෙනැල්ලා පැරැදුණා. ඒක වෙනම කථාවක්. ඒ පැරැදුණෙත් එතුමාගේ කණ්ඩායම ඡන්දය නොදී හිටපු නිසායි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය එදා ඒකට පක්ෂව ඡන්දය දුන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ අපි එදා වික්‍රමසිංහ මහත්මයා අගමැති ධුරය දරද්දී, එතුමා කෙරෙහි විශ්වාසය නැහැ කියලා එතුමාට විරුද්ධව ඡන්දය දුන්නා. හැබැයි ජනාධිපතිතුමාගේ පක්ෂයේ, එතුමා සභාපතිත්වය දරන පක්ෂයේ අය ඡන්දය දෙන්න එකතු කරගන්න බැරි වුණා. එහෙම කරපු මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එක්සත් ජාතික පක්ෂය හරහා මහින්ද රාජපක්ෂට විරුද්ධව අද නැවත එවැනි යෝජනාවක් ගෙන්වනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා දැන්වත් මේවා තේරුම් ගත යුතුයි. එදා ළඟ ඉඳගෙන එකට ආජප කාලා, තේ බීලා ඒ ද්‍රෝහීකම කළා වාගේම, අද අගමැතිකම දීලා අමාරුවේ වටිටලා මහින්ද රාජපක්ෂ කුජීත කරලා තිබෙනවා. මොකක් හරි කරලා පොහොට්ටුවක් අටවාගෙන යන්තම් හරි ඔළුව උස්සලා එන්න හදපු මහින්ද රාජපක්ෂ නැති කරලා, විනාශ කරලා, පොහොට්ටුව කුණු කරලා දැම්මා, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්මයා. අද එතුමා නිදොස් කොටගෙන, එතුමා වැරැදිකාරයා වෙන කොටස ඉවත් කරගෙන එක්සත් ජාතික පක්ෂය හරහා හොර පාරෙන් මේ යෝජනාව ගෙනෙනවා. ලජ්ජයි! මේ තත්ත්වයට පත් වෙන්න ඕනෑද රටේ ජනාධිපති? මේ තත්ත්වයට පත් වෙන්න ඕනෑ ද රටේ මුල් පුරවැසියා. අද සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි, ගරු කථානායකතුමනි. එහෙම කරලා, "මේ මල් වටිටියට අත ගහන්න එන්න." කියලා එතුමා කියනවා. මොකක්ද මේ මල් වටිටිය? මේක මල් වටිටියක් නොවෙයි, ගොම හටිටියක්. රටක් විනාශ කරලා, ආර්ථිකය නැති හංගස්ථාන කරලා, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, දේශපාලන සදාචාරය කෙළෙසලා, ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ කරලා දැන් කියනවා, "මල් වටිටියට අත ගහන්න එන්න." කියලා. මේ ගොම හටිටියට අත ගහන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෝ යන්නෙත් නැහැ. ඒ නිසා තමයි අද කුමාර වෙල්ගම මන්ත්‍රීවරයා පැහැදිලිව කියන්නේ "මේ කරපු වැඩේ වැරැදියි; අපරාදේ නැති හංගස්ථාන වුණා; හත්පොළේ ගා ගත්තා" කියලා. අපි දන්නවා, අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ ගෙවල්වලට පාක්ෂිකයෝ ඇවිල්ලා මේ ගැන අහන බව. අද පාක්ෂිකයෝ අහන්නේ මොකක්ද? "ඇයි, මන්ත්‍රීතුමා මේ වාගේ වැඩක් කර ගත්තේ? අපරාදේ නේද? හොඳට හිටපු මහින්ද රාජපක්ෂ සහ කටිටිය හතර ගානෙන් වැටුණා නේද? ඇයි, මෙහෙම අපරාධයක් කර ගත්තේ? " කියලා අහනවා. පාක්ෂිකයෝ අද එතුමන්ලාගේ ගෙවල්වලට ඇවිල්ලා අහන්නේ ඒක. ඒ නිසා අපි විතරක් නොවෙයි, එතුමාගේ පාක්ෂිකයෝම අද මේ තත්ත්වය ප්‍රතික්ෂේප කර කලකිරීමෙන් සිටිනවා,

ගරු කථානායකතුමනි. අද මහින්ද රාජපක්ෂට බහුතරයක් නැහැ කියලා පැහැදිලිව තහවුරු වෙලා ඉවරයි. මේ පාර්ලිමේන්තුවේ තවදුරටත් ඒක ඔප්පු කරන්න දෙයක් නැහැ. දැන් එතුමාට විරුද්ධව 122, 123යි. එතකොට එතුමාට පක්ෂව කීයක් ඉන්නවාද? තවම හරියට ගණන් කියලා නැහැ නේ. අනෙක් පැත්තේ 123ක් ඉන්නවා නම්, එතුමාට පක්ෂව 101ක් ඉන්න එපා යැ. 101ක් කොහේද පෙන්වලා තිබෙන්නේ? 101ක් නැහැ. ඒක පෙන්වා ගන්න බැරි නිසා තමයි මේ පාර්ලිමේන්තුව වර්ජනය කරන්නේ, ගරු කථානායකතුමනි. ඒකට ඔබතුමාව චූදිතයා කරලා තිබෙනවා. වෙන මොකක්වත් නොවෙයි, පාර්ලිමේන්තුවට එන්නේ නැති එක ගැන බොරු හේතුවක් දක්වන්න ඕනෑ. ඒකට ඔබතුමාව හේතුවක් විධියට අරගෙන ඔබතුමාගේ ක්‍රියාකලාපය වැරැදියි, ඒ නිසා අපි එන්නේ නැහැ කියලා ඔබතුමාට බොරු චෝදනාවක් නඟලා තිබෙනවා. ඔබතුමා ඉතා පැහැදිලිව මේ සභාව මෙහෙය වූයේ බහුතරයේ කැමැත්ත මත; බහුතරයේ එකඟත්වය මත. ඒක තමයි ඕනෑම සමිතියක් පවත්වාගෙන යන ක්‍රමය. ගමේ මරණාධාර සමිතිය කැඳවද්දී මරණාධාර සමිතියේ සභාපතිවරයා ඇවිල්ලා, න්‍යාය පත්‍රය මේකයි කියලා කිව්වාට පස්සේ සභාවේ බහුතරයට කියන්න පුළුවන් "නැහැ, සභාපතිතුමාගේ න්‍යාය පත්‍රය ඕක වෙන්න පුළුවන්; හැබැයි, අඟවල් සිරිසේනගේ මළ ගෙදර වුණා; එතැන පෙට්ටිය ගන්න සල්ලි දීලා නැහැ. ඒ නිසා අද සභාවේ බහුතරය මත ඒ ප්‍රශ්නය අපි කථා කරන්න ඕනෑ" කියලා. මේක මළගෙයක් තමයි. මරණාධාර සමිතියක තත්ත්වයට පත් වුණා. එතකොට සභාපතිවරයාට පුළුවන්ද, එයා හදා ගත්ත න්‍යාය පත්‍රයම ක්‍රියාත්මක කරන්න. නැහැ. මරණාධාර සමිතියේ සාමාජිකයන්ගේ ඉල්ලීමට අනුමකන් දෙන්න වෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා ඔබතුමා මේ සභාව මෙහෙය වූයේ මේ සභාවේ තිබෙන රීතින්වලට අනුව; ස්ථාවර නියෝගවලට අනුව. ඒක නීත්‍යානුකූලයි. මේ චෝදනාව නඟන්නේ ඔවුන්ට බහුතරය නැති නිසා. ඔවුන්ගේ බැරිකම, නොහැකියාව පෙනෙන නිසා ඒක වහගන්න තමයි ඔබතුමාට අභූත චෝදනා නඟන්නේ. ඒ නිසා, මුළු රටම දැන් ඒ තත්ත්වය තේරුම් අරගෙන තිබෙනවා; තේරුම් ගනිමින් තිබෙනවා කියන එක අපි දන්නවා.

ගරු කථානායකතුමනි, පසුගිය දවසේ මේ සභාවේ දීම විජයදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා ඇවිල්ලා, දූත භූමිකාවක් රඟ දැක්වුවා අපට මතකයි. එතුමා මේ සභාවේ වාඩිවුණා. එතකොට එතුමා අර සෙල්ලම් ආණ්ඩුවේ ඇමතිවරයෙක්. ඒ ගොල්ලන් මහ ලොකුවට කියනවා, "අපි පාර්ලිමේන්තුව වර්ජනය කරනවා" කියලා. හැබැයි, වර්ජනය කරන එක බිඳලා ඉවරයි. මොකද, විජයදාස රාජපක්ෂ මහත්තයා ඇවිල්ලා වාඩි වුණා. එතකොට වර්ජනය අසාර්ථකයි. ඒක පාවා දීලා ඉවරයි. එසේ වාඩි වුණු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා අවසානයේ යෝජනා කළා, ඔබතුමා මැදිහත් වෙලා නැවත සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසඳන්න කියලා. ඔබතුමා සද්භාවයෙන් ඒක භාරගත්තා. එදිනම හැන්දෑවේ ජනාධිපතිවරයා මුණ ගැහුණා. හැබැයි, මොකක්ද ප්‍රතිඵලය? ප්‍රතිඵලයක් නැහැ. එතුමා සුපුරුදු පරිදි කිව්වා, "විශ්වාස භංගය ආපසු ගේන්න; ඒ ක්‍රමවේදයට අරගෙන එන්න" කියලා. එතකොට එතුමා දිගින් දිගටම කිව්වේ මොකක්ද? විශ්වාස භංගයේ පළමු කොටස අයින් කරලා ආපසු ගේන්න කියලා. ඒකට එකඟ වෙලා තමයි මේ විශ්වාස භංග යෝජනාව දැම්මේ. ඔබතුමා නොවෙයි. ඊට පහුවෙනිදා තිබිව්ව සාකච්ඡාවේ දී පක්ෂ නියෝජිතයන් ගිහිල්ලා එකඟ වුණාට පස්සේ එකඟතාවකට ආවා, නැවත විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා අද සම්මත කරන්න. හැබැයි, එහෙම කියපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ඊයේ කිව්වේ මොකක්ද? එතුමා දන්නවා, අද එම විශ්වාස භංග යෝජනාව මේ සභාවේ ගන්නවා කියලා. එතකොට අද ඒක සම්මත වෙනවා. එතකොට අද එතුමාට ඔබතුමාගේ නිවේදනය නිකුත් වෙනවා. ඒ අනුව එතුමාට හෙටම පුළුවන් ඕනෑ නම් නැවත තීන්දුවක් ගන්න, උසාවි තීරණය පැත්තකින් තිබ්බත්. හැබැයි, ඒක දැනගෙන ඊයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිව්වේ මොකක්ද? ඊයේ කියනවා, "තව සතියකින් මම මේ ප්‍රශ්නය විසඳනවා" කියලා. තව සතියකින්. ඒ කියන්නේ අද විශ්වාස භංග යෝජනාව මෙතැන නැවත සම්මත වුණත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක තමයි ඒ කථාවේ හරය. ඊයේ එතුමා කිව්වා, තව සතියකින් මේ ප්‍රශ්නය විසඳනවා කියලා. ඒ කියන්නේ, අද අපි මේක නැවත සම්මත කරලා පෙන්නුවත් එතුමා ඒ තීන්දුව පිළිගන්නේ නැහැ. ඒ නිසා හරි පැහැදිලියි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඉන්නේ කොතැනද කියන එක.

[ගරු විජිත හේරත් මහතා]

පසුගිය බ්‍රහස්පතින්දා මේ අර්බුදය උත්සන්න වුණාට පසුව, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 123ක් යෝජනා සම්මත කරලා අගමැතිවරයාගේ, ඇමතිවරුන්ගේ මුදල් කප්පාදු කිරීමට ඡන්දය පෙන්නුවාට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු ගිහිල්ලා එතුමාව හම්බ වුණා. මේ අර්බුදය ගැන කිව්වා. කිව්වාට පස්සේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොකක්ද, කිව්වේ? "එහෙම නම් කට්ටියම ගිහිල්ලා මහින්ද රාජපක්ෂව හම්බවෙලා, 'දැන් ඉතින් වෙන කරන්න දෙයක් නැහැ, මේකට තිබෙන එකම උත්තරය ඔබතුමා ඉල්ලා අස්වීම පමණයි' කියන එක මහින්ද රාජපක්ෂට කියන්න" කියලා.

නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා එළියට ඇවිල්ලා කසුකුසු ගෑවා, "අපි කොහොමද කියන්නේ ඒක. එයාම තමයි පත් කළේ. එයා පත් කරන කොට අපිට කිව්වේ නැහැ" කියලා. අපි දන්නවා; අපිට ආරංචියි. නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා ගෙදර ගියාට පසුව රූපවාහිනියෙන් තමයි දැනගත්තේ මහින්ද අගමැති කළා කියලා. ඇත්ත කථාව ඒක. ගෙදර ගිහින් ටී.වී. එක බලද්දී තමයි දන්නේ මහින්ද රාජපක්ෂව අගමැති කළා කියලා. පහුවදා දවසම නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා හිටියේ ගෙදර. ගෙදරින් එළියට ගියේ නැහැ. එතුමා බලන්න ගියේ ලංගම සභාපති රමල් සිරිවර්ධන මහත්මයා විතරයි. කලකිරිලා හිටියේ; එපාවෙලා හිටියේ, මොකක්ද මේ වුණේ කියලා. එතුමාව පත් කරපු මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මේ මොකක්වත් දැනගෙන නොහිටපු නිමල් සිරිපාල ද සිල්වා මහත්මයාට දැන් කියනවා, ගිහින් මහින්දට කියන්න කියලා ඉල්ලා අස්වෙන්න කියලා. මහින්ද රාජපක්ෂට කියන්නලු, "ඉල්ලා අස්වෙන්න" කියලා. නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීවරයා එළියට ඇවිල්ලා කසුකුසු ගෑවා, "අපි කොහොමද එහෙම කියන්නේ, එතුමා නේ පත් කළේ. අපි පත් කළා යැ. ඒක නිසා මට නම් බැහැ ඔක කියන්න" කියලා. ඒ නිසා එතුමා ගියේ නැහැ. එතුමා නිකම් ගියා. කට ඇරියේ නැහැ; කථා කළේ නැහැ. දොළොස් දෙනෙකු ගිහිල්ලා තිබුණා, පසුගිය බ්‍රහස්පතින්දා පෙ.ව. 11.00ට. ගිහින් මහින්ද රාජපක්ෂ මහත්මයාව හමු වුණා. හම්බවෙලා කිව්වා, "මේ අර්බුදය තවත් ඉස්සරහාට යනවා, ජනාධිපතිතුමාටත් කරන්න දෙයක් නැහැ; උපරිම සීමාවට ඇවිල්ලා තිබෙන්නේ; බිත්තියටම හේත්තුවෙලා තිබෙන්නේ. වෙන කරන්නට දෙයක් නැහැ, දැන් මේකට තිබෙන උත්තරය ඔබතුමා ඉල්ලා අස්වෙන එක" කියලා. මහලොකු චණ්ඩි පාටි දාන මහින්ද සමරසිංහ මන්ත්‍රීවරයා ඇතුළු කට්ටිය තමයි ගිහින් කිව්වේ, "ඉල්ලා අස්වෙන්න" කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා මොකක්ද කියලා තිබෙන්නේ? "නැහැ. මම ඉල්ලා අස්වෙන්නේ නැහැ. පුළුවන් නම් කියන්න එයාට මාව අස් කරන්න" කියලා. ඔන්න මෛත්‍රීපාල මහත්මයා හිරවෙච්ච ඊළඟ තැන. "පුළුවන් නම් එයාට කියන්න මාව අයින් කරන්න කියලා, මම අයින් වෙන්නේ නැහැ" කිව්වා. එතුමා දීපු උත්තරය ඒක. අපි කවුරුත් දන්නවා, ඒ මන්ත්‍රීවරුත් හිරවෙලා, කර කියා ගන්න දෙයක් නැතිව ආපසු ආවා කියලා.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි? කලින් කිව්වා වාගේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා පස් වතාවක් හෝ හය වතාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළා. ගැසට් නිවේදන පහට පස් වතාවයි, ඇමතිවරු පත් කිරීමේ එකත් එක්ක හයයි. විනිසුරුවරුන් පත් කිරීම පැහැර හැරීම සමඟ හත් වතාවයි. චෝදනා හතයි. ඊළඟ එක එනවා, මහින්ද රාජපක්ෂව ඉවත් කරන්න ගියාම. දැන් මහින්ද රාජපක්ෂ කියන්නේ ඒක නේ. "පුළුවන් නම් අයින් කරන්න, මම අයින් වෙන්නේ නැහැ" කියලා කියනවා. එතකොට මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට නැවත සිදුවෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩලා එයා පත් කළ අගමැතිවරයා ඉවත් කරන්න. චෝදනා එක පිට එක එකතු වෙනවා. චෝදනා අටයි. දැන් කරන්නේ ඒක තමයි. දැන් ඉස්සරහාට ඇවිල්ලා තිබෙන්නේ ඒක. දැන් මේ අර්බුදය ඒ තරමටම උත්සන්නවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ තත්ත්වය තුළ අපට පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, මේ රට ඉස්සරහාට යන්න බැහැයි කියන එක. මේ බහුතරය පිළිගන්නේ නැතිව කොච්චර වලි කැවත් මේක ඉස්සරහාට යන්න බැහැ. ඒ නිසා දැන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ පරාජය භාරගත යුතුයි; මහින්ද රාජපක්ෂලා මේ පරාජය භාරගත යුතුයි. දැන් මේ චෝදනාවලට ලක්වෙලා ඉවරයි; දැන් මේ පරාජය සිද්ධවෙලා ඉවරයි. එම නිසා දැන්වත් බොරු කයිවාරු ගහන්නේ නැතිව නිහතමානී වෙලා, පරාජය භාර අරගෙන මේ පාර්ලිමේන්තුවේ බහුතරයට ඉඩ හදලා දෙන්න. එහෙම නොකොළොත් බරපතළ අර්බුදවලට යනවා.

දැනටමත් ජනවාරි 01වෙනිදා ඉඳලා රාජ්‍ය සේවකයන් කිසිවකුට පඩි ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. මුදල් වෙන් කිරීමක් කරලා නැහැ. අය වැය සම්මතවෙලා නැහැ. අතුරු සම්මත ගිණුමක් කැබිනට් එකේ සම්මත වුණා කිව්වා. අර බොරු කැබිනට් එකේ. ඒක වලංගු නැහැ. එතකොට මේ පාර්ලිමේන්තුවෙන් සම්මත වෙලා නැහැ.

ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීවරයා කියනවා මම දැක්කා, "පාර්ලිමේන්තුවෙන් අනුමත වෙන්නට ඕනෑ නැහැ, ජනාධිපතිවරයාට මාස තුනකට මුදල් වෙන් කරන්නට පුළුවන්" කියලා. පට්ටපල් බොරුවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන අඹ මල් රේනුවක තරම්වත් දන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තියා ගණන් හදාගන්නවත් දන්නේ නැති විමල් වීරවංශ. දෙක දෙකෙන් බෙදුවාම බින්දුවයි කිව්ව හාදයා නේ. ඉතින් කොහොමද ඔක කියා ගන්නේ. එම වීරවංශ කියනවා, ජනාධිපතිවරයාට පුළුවන් ලු මාස තුනක් යනකම් සල්ලි වෙන් කරන්න. කොහේද මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එහෙම තිබෙන්නේ? එහෙම කරන්නට පුළුවන් අය වැය සම්මත වෙලා නැති අවස්ථාවකදී, පාර්ලිමේන්තුව විසුරුවා හැරලා තිබෙන අවස්ථාවකදී. පාර්ලිමේන්තුව විසුරුවා හැරලා අය වැය සම්මත කරලා නැති අවස්ථාවකදී ජනාධිපතිවරයාට බලය ලැබෙනවා එහෙම කාලයකට මුදල් වෙන් කරන්න. එහෙම කරන්න පුළුවන්, අර විසුරුවා හැරීම නීත්‍යානුකූලයි කියලා පැහැදිලි වුණා නම්. දැන් එහෙම එකක් නැහැ. එම නිසා ලබන මාර්තු මාසය, අප්‍රේල් මාසය දක්වා මුදල් තිබෙනවා කියන එක පට්ටපල් බොරුවක්. එහෙම එකක් නැහැ. එම නිසා අනිවාර්යයෙන්ම මේ පාර්ලිමේන්තුවේ අය වැය සම්මත වෙන්නට ඕනෑ; මුදල් සම්මත වෙන්නට ඕනෑ. එහෙම නැත්නම් රජයේ සේවකයන්ට පඩි ගෙවා ගන්නට බැහැ; වියදම් කරන්නට බැහැ.

අද මේ අභියාචනාධිකරණ තීන්දුවත් එක්ක මහ බැංකුවට ණයක් ගන්නත් බැහැ.

බැඳුම්කර නිකුත් කරලා ණයක් ගන්නවා නම්, මුදල් ඇමතිවරයා අත්සන් කරන්න ඕනෑ. මුදල් ඇමතිවරයා අත්සන් කරන්නේ නැතිව ඒක කරන්න බැහැ. ඒ නිසා රට ලොකු අර්බුදයකයි තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බෙහෙත් පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ආවොත්, වක්‍රලේඛයක් ආවොත්, ටෙන්ඩරයක් ආවොත් ඇමතිවරයා අත්සන් කරන්න ඕනෑ. නමුත් දැන් ඒවාට අත්සන් කරන්න බැහැ. මොකද, සෞඛ්‍ය ඇමති කෙනෙක් නැහැ. එතකොට දහස් ගණනක් රෝගීන් -අපේ ජනතාව- මියැදෙනවා; විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වෙනවා. ඒකට උත්තරයක් නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා මේ දේවල් ශත පහකට මායිම් කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එතුමා ඊයේ කථාවේදී

කියපු කාරණය ගැන අපට හරිම කනගාටුයි. මේ පාර්ලිමේන්තුවේ හැසිරීම ගැන කියමින් එතුමා කියනවා, "ඒක ඉතින් ලෝකයේ හැම රටකම වෙනවා නේ, එහෙම වෙන්නේ අපේ රටේ විතරක් නොවෙයි නේ" කියා. ලෝකයේ එවැනි ගොඩක් රටවලට උදාහරණත් කිව්වා. "ඒ රටවලත් එහෙම වෙනවා, ඒ නිසා මෙහේ එහෙම වෙන එක අමුතු දෙයක් නොවෙයි" කියා එතුමා කියනවා. ඒ කියන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? මේ පාර්ලිමේන්තුවේ අප දැකපු ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-රටේ මුල් පුරවැසියා වන ජනාධිපතිවරයා අනුමත කරනවා කියන එකයි ඒකෙන් කියන්නේ. එහෙම ජනාධිපති කෙනකුට රටේ නායකයා විධියට තවදුරටත් කටයුතු කරන්න ඉඩ දෙන්නේ කොහොමද? එහෙම ඉඩ දෙන්න අපට පුළුවන්ද? ඒකට අයිතියක් තිබෙනවාද? මේ රටේ ජනතාව ඒකට කැමැතිද? නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා, මේ ගෙවුණු කෙටි කාලය -මේ මාස එකහමාර- තුළ හදාගත් සෙල්ලම් ආණ්ඩුව කරපු දේවල් මොනවාද කියා අද පැහැදිලි වෙලා තිබෙනවා.

සිංගප්පූරු ගිවිසුම අහෝසි කරනවාය කියා එදා මේ අය විරුද්ධ පක්ෂය පැත්තේ ඉඳගෙන කෑ ගැහුවා. ආණ්ඩු පක්ෂය පැත්තට ගියා විතරයි, "නැහැ, එහෙම අහෝසි කරන්න බැහැ, එහෙම ආවාට ගියාට ජාත්‍යන්තර ගිවිසුම් අහෝසි කරන්න බැහැ" කියා බන්දුල ගුණවර්ධන කියනවා. එය අහෝසි කරනවාය කියා එදා විරුද්ධ පක්ෂය පැත්තේ ඉඳගෙන එතුමන්ලා කියිවාරු ගැහුවා. රූපියල කඩාගෙන වැටෙන කොට බන්දුල ගුණවර්ධන මහා ලොකුවට කියිවාරු ගැහුවා, "මේක නවත්වන්න පුළුවන්, අපට ආණ්ඩුව දෙන්න" කියා. එතුමන්ලා ආණ්ඩුව ගත්තා. මොකක්ද වුණේ? "ඒක අතින් අල්ලා නවත්වන්න බැහැ" කියා දැන් කියනවා; "මම කොහොමද ඒක නවත්වන්නේ, අතින් අල්ලා නවත්වන්නද කියන්නේ?" කියා අහනවා. ඒ කඩා වැටීම ඔවුන්ට නවත්වා ගන්න බැහැ.

ගරු කථානායකතුමනි, "කොටි නිදහස් කරනවා", "කොටින්ට සල්ලි දෙනවා", "ගෙවල් දෙනවා" කියා එදා කෑ ගැහුවා. ඇත්තටම එදා මේ ගරු සභාවේදී පනතක් සම්මත වුණා. එය, යුද්ධයෙන් පීඩාවට පත්වූ සියලු පාර්ශ්වයන්ට වන්දි ලබා දීම සම්බන්ධයෙන් වූ පනතක්. එමඟින් වෙන්නේ කොටින්ට ගෙවල් දීම හෝ කොටින්ට සල්ලි දීම හෝ නොවෙයි. නමුත් ඒවා වැරදි විධියට අර්ථ කථනය කරලා මහා ලොකු බොරු, කියිවාරු ගහලා බොරු දේශ ප්‍රේමයක් මැව්වා. අද වාසුදේව නානායක්කාර මහත්මයා මොකක්ද කියන්නේ? එල්ටීටීඊ සාමාජිකයන් වර්ගීකරණය කරනවා ලු; පිරිසක් නිදහස් කරනවා ලු; පිරිසක් පුනරුත්ථාපනය කරනවා ලු. ඒක හොඳයි. හැබැයි එදා එතුමන්ලා කිව්වේ මොකක්ද? "සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කරන්න" කියා අපි එදා කිව්වා. එහෙම කියනකොට ඔවුන් විරුද්ධ වුණා; බොරු දේශප්‍රේමය දැම්මා; ජාතිවාදය ඇවිස්සුවා. "නැහැ, අපි පිරිසක් නිදහස් කරනවා, පිරිසක් පුනරුත්ථාපනය කරනවා" කියා අද කියනවා. ඩග්ලස් දේවානන්දා මොකද කියන්නේ? "ඒ එල්ටීටීඊ සාමාජිකයන් සියලුදෙනාටම අපි සල්ලි දෙනවා" කියා ඩග්ලස් දේවානන්දා කියනවා. එදා මහා ලොකුවට කියිවාරු ගැහුවේ, "මේවා ජාතිවාදියි, එල්ටීටීඊ එකට උල්පන්දම් දෙනවා" කියලා නේ. හැබැයි එහෙම කියපු අයම අද එහෙම කරන එකයි ප්‍රශ්නය. අපි ඒකට විරුද්ධ නැහැ. අප කියන්නේ, ඒ යුද්ධයෙන් පීඩාවට පත් වූ සියලු පාර්ශ්වයන්ට වන්දි ලබා දෙන්න කියායි. එවැනි තවත් අය හිරේ ඉන්නවා නම් -ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ- ඒක වැරදියි. ඒ නිසා එක්කෝ ඔවුන්ට නඩු දමන්න, නැතිනම් නිදහස් කරන්න. ඒක යුක්තිසහගත ඕනෑම ආණ්ඩුවකට තිබෙන වගකීමක්. නමුත් ඒක ඉටු කරන්නේ නැහැ. එදා කියපු කථාවත්, අද කියන කථාවත් එකිනෙකට පරස්පරයි.

එදා මහ විරු සැමරුම් කරනවාය කියා මහා ලොකුවට චෝදනා කළා. හැබැයි අද මේ බොරු සෙල්ලම් ආණ්ඩුව වගකීම ගත්තා විතරයි, මහ විරු සැමරුම් ගොඩයි. ඒවා වළක්වන්න පුළුවන් වුණාද? වැළැක්වූවේ නැහැ. ඊයේ පෙරේදා අපේ පොලීසියේ නිලධාරීන් දෙදෙනෙක් මැරුණා. "පසුගිය ආණ්ඩුව හමුදා කඳවුරු ඉවත් කළා, එසේ ඉවත් කළ හින්දා තමයි ඔවුන් දෙදෙනාට වෙඩි තබා තිබෙන්නේ" කියා ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීවරයා කියනවා මම අසාගෙන සිටියා. ගරු කථානායකතුමනි, මා වගකීමෙනුයි කියන්නේ. ඒ සිද්ධිය වූ තැන -ඒ පොලිස් නිලධාරීන් දෙදෙනා මරා දැමූ තැන- ඉඳලා මීටර් 200ක් එහා පැත්තේයි ගුවන් හමුදා කඳවුර තිබෙන්නේ. අදත්, ඕනෑම කෙනකුට එය බලන්න පුළුවන්. ගුවන් හමුදා කඳවුර තිබෙන්නේ එතැනට මීටර් 200ක් එහායිනුයි. පොලීසිය තිබෙන්නේත් එතැනට එහා පැත්තේ; ඒ ළඟමයි. පොලීසිය ළඟම තිබෙනවා; ගුවන් හමුදා කඳවුර මීටර් 200ක් එහායින් තිබෙනවා. එවන් වටපිටාවක් තියෙද්දි තමයි, ඒ පොලිස් නිලධාරීන් දෙදෙනාට වෙඩි තබා මැරුවේ.

ගරු කථානායකතුමනි, මේ මාස එකහමාර ඇතුළේ මේ අය පෙන්නුවා, තමන්ගේ බැරිකම. "රණවිරු දඩයම්! රණවිරු දඩයම්!!" කියා කිව්වා. අන්තිමට, මේ රීනියා ආණ්ඩුව බලය ගත්තා විතරයි, ත්‍රිවිධ හමුදාවේම ප්‍රධානියා -යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව කියන ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානියා- වන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී රවීන්ද්‍ර විජේගුණරත්න මහත්මයාව අත් අඩංගුවට ගත්තා. මේවා කළේ, "රණවිරු දඩයම්! රණවිරු දඩයම්!!" කියා චෝදනා නඟපු අයයි. මේ මාසය ඇතුළත -දැන්- ඒවා ඔක්කෝම කරන්නේ මේ අයයි. "එය වළක්වනවා, එහෙම කරන්න දෙන්නේ නැහැ" කියා ජනාධිපතිවරයා කිව්වා. හැබැයි මේ සෙල්ලම් ආණ්ඩුව හදා ගත්තා විතරයි, ඒ අය මේ කියපු වැරදි ටික ඔක්කෝම කළා.

මේ මාස එකහමාරක කාලය තුළ මේ ගොල්ලන්ගේ කෙරුවාව මොකක්ද කියා රටේ ජනතාවට දැන් පැහැදිලියි. ඒ නිසා, වැරදිසහගතව; නීති විරෝධීව, "ආණ්ඩුව" යයි කියාගන්නා මේ කණ්ඩායමට තවදුරටත් මේක කරන්න දෙන්න බැහැ. අපි ඒක වහාම අනෙක් පැත්ත හරවන්න ඕනෑ.

තනි පුද්ගලයකුට බලය පැවරුණාම, ඒ ඒකාධිපති බලය පාවිච්චි කරලා ඕනෑම කෙනෙක් මේ වාගේ පිස්සු වැඩ කරන තත්ත්වයට පත්වන බව දැන් අප කාටත් පැහැදිලියි. "විධායක ජනාධිපති තනතුරට හොඳ කෙනෙක් ගියාම ඒක හරි ෂෝක්, නරක කෙනෙක් ගියාම තමයි ඒක අප්සෙට්" කියා සමහරු කියනවා. මෛත්‍රීපාල මහත්මයා ඒ පුටුවේ වාඩි වෙලා අවුරුදු තුනහමාරක කාලයක් ගත වෙනකොට, "පතෝල වාගේ" කිව්වා; "පතෝල", "හිටං", "හුටං" කිව්වා. අවසානයේ මොකක්ද වුණේ? මේ විධායක බලය පාවිච්චි කරලා "හුටං", "හිටං" වුණා; "පතෝල හිටං" වුණා. මෛත්‍රීපාල මහත්මයා විතරක් නොවෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔය පුටුවේ වාඩි වුණත් ඕක තමයි ඇත්ත කථාව. රනිල් වික්‍රමසිංහ මහත්මයා විධායක ජනාධිපති වුණත් මේ විධායක බලය පාවිච්චි කරනවා. මීට වඩා දේවල් අපට බලන්න වෙයි. ඒ නිසා පුද්ගලයා නොවෙයි, විධායක බලයේයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. මේ විධායක බලය කියන්නේ අත්තනෝමතික බලයක්. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාම කියපු විධියට, මේ විධායක ජනාධිපති ක්‍රමයෙන් ගැහැනියක් මිනිහෙක් කරන්න සහ මිනිහෙක් ගැහැනියක් කරන්න විතරයි නොහැකි වන්නේ. ඒ තුළින් වෙන ඕනෑම දෙයක් කරන්න පුළුවන්. දැන් මෛත්‍රීපාල

[ගරු විජිත හේරත් මහතා]

මහත්මයා ඒ සියල්ලම කරමින් තමයි සිටින්නේ. ඒ නිසා මෙතැන තිබෙන්නේ පුටුවේ ප්‍රශ්නයක් මිස, පුද්ගලයාගේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදෙනවා නම් හොඳයි. නමුත් එය හැදෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අප ඉතා පැහැදිලිව කියන්නේ, මේ විධායක ජනාධිපතිවරයාගේ බලය නැති කරන එක ගැනයි. පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමේ බලය මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි නැතිකර තිබෙනවා. එය සම්මත වෙලා තිබුණා නම්, එදා -ඔක්තෝබර් 26වන දා- මෛත්‍රීපාල මහත්මයාට පාර්ලිමේන්තුව වාරාවසාන කරන්න බැහැ. මොකද, අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එම කාරණය ඇතුළත් කරලායි තිබෙන්නේ. ඒ අනුව එතුමාට ඕනෑ විධියට පාර්ලිමේන්තුව වාරාවසාන කරන්න බැහැ; විසුරුවා හරින්න බැහැ. ඒ බලය අඩු කරලායි තිබෙන්නේ. විධායක ජනාධිපති කෙනෙකුට තිබෙන බලය අඩු කරන ඒ සංශෝධනය තමයි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අප ගෙනැත් තිබෙන්නේ. රවුල් හකීම් මන්ත්‍රීතුමන්ලා, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමන්ලා එදා ඒකට වැඩි එකඟතාවක් පළ කළේ නැහැ. හැබැයි අද එතුමන්ලාටත් පෙනෙනවා ඇති; වඩා හොඳින් තහවුරු වෙනවා ඇති, මේ බලය කොයි තරම්ද කියන එක. ඒ බලය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අතට ගියත්, වෙන කාගේ අතට ගියත් එකයි. එය තිබෙන තාක් කල් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වෙන්නේ නැහැ. ඒ නිසා දැන් හෝ අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරන්න මැදිහත් වෙමු. මේ පාර්ලිමේන්තුවට දැන් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න වැඩි අවස්ථාවක් තිබෙනවා. ඒක මේ රටේ අනාගතය වෙනුවෙන් කරන්න ඕනෑ දෙයක්. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි සම්මත කර ගත්තොත්, කවදා හෝ දවසක මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ජනාධිපති වෙන එක වළක්වන්න පුළුවන්. "මේ විධායක ජනාධිපති ධුරයට පත් වුණොත් මොකද වෙන්නේ?" කියා ඇන්.ඇම්. පෙරේරා මහත්මයා 1978දී ඇහුවා. අවුරුදු හතළිස් ගණනකට කලින් එතුමා කියපු දෙය අද අපේ ඇස් පනාපිටම ඔප්පු වෙලා තිබෙනවා. ඒ නිසා අපි දැන් හෝ මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමු.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු පක්ෂ මාරු කළොත්, ඔවුන්ගේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීමේ යෝජනාවක් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරන වෙලාවේ අපි මැදිහත් වෙලා එයට ඇතුළත් කළා. මන්ත්‍රීවරයෙක් තමන්ට ඡන්දය දීපු ඡන්ද දායකයන්ට එරෙහිව, තමන්ගේ පක්ෂය මාරු කරලා වෙන පක්ෂයකට ගියොත්, වහාම ඔහුගේ මන්ත්‍රී ධුරය අහෝසි කරන්න කියන යෝජනාව තමයි අප ඉදිරිපත් කළේ. ඒ යෝජනාව එදා දිනයේ අවසානය දක්වා එකඟතාවෙන් ඇවිත්, මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. නමුත් අවසාන තත්පරයේදී දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයා ඒකට විරුද්ධ වුණා. ආණ්ඩුව පැත්තේ ඉඳලා, අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ මැතිතුමා ඒක භාර ගත්තා; ඒ අනුව එය අයින් කළා. ඒක එහෙම නොවුණා නම් අද මේ සන්තෑසිය වෙන්නේ නැහැ. එය සම්මත වුණා නම් මන්ත්‍රීවරු මේ විධියට වෙනත් පක්ෂවලට යන, ඔවුන් රුපියල් කෝටි ගණන්වලට විකිණෙන, පාදඩ සංස්කෘතියක් අපේ රටේ බිහි වන්නේ නැහැ.

ඒක එතැනින් කරගන්න බැරි වුණාට අපි ඒ අදහස අත හැරියේ නැහැ, ගරු කථානායකතුමනි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි එම යෝජනාව නැවත ඇතුළත් කර තිබෙනවා. මන්ත්‍රීවරුන්ට පක්ෂ මාරුකරන්න බැරි වන විධියට, ඉතා පැහැදිලිව, වෙනස් ආකාරයකින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අප ඒ වගන්ති ඇතුළත් කර තිබෙනවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වුණේ මේ රටේ ඒකාධිපති බලය නැති කරලා, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමයි. අපි ඉදිරියේදී ඒක ක්‍රියාත්මක කරමු. මේ පාර්ලිමේන්තුවේ අපි කවුරුත් එයට මැදිහත් වෙමු.

පසුගිය ඔක්තෝබර් 26වන දා සිට මේ තාක් රටේ අපරාධ සිදු වී තිබෙනවා. රාජ්‍ය දේපොළ විනාශ වුණා; පාර්ලිමේන්තුවේ දේපොළ විනාශ වුණා; රටේ දේපොළ විනාශ වුණා; බලය අයථා විධියට පාවිච්චි කළා. මේ විධියට මහා විනාශයක්, අපරාධයක් සිද්ධ වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒවා ගැන සොයා බලන්න ඔබතුමාගේ මූලිකත්වයෙන් මේ පාර්ලිමේන්තුවේ විශේෂ කොමිසමක් පත් කරන්න කියා අපි ඔබතුමාට යෝජනා කරනවා. ඒක පාර්ලිමේන්තුවේ සම්මත වන පනතක් විධියට අපි ගෙනෙමු. ඔක්තෝබර් 26වන දා සිට රටේ සිද්ධ වුණු මේ සියලු වැරදි- රාජ්‍ය දේපොළ අයථා විධියට පාවිච්චි කිරීම, රජයේ නිලධාරීන් බලපෑම් කිරීම, මාධ්‍ය ආයතන වැරදි විධියට පාවිච්චි කිරීම ආදී සියල්ල- පිළිබඳව මේ කොමිසමෙන් පරීක්ෂණයක් කරන්න. ජනාධිපතිතුමා පත් කරන විශේෂ කොමිෂන් සභා ගැන සත පහක හෝ විශ්වාසයක් අප තුළ නැහැ.

අපි පාර්ලිමේන්තුවෙන් පත් කරමු. පාර්ලිමේන්තුවේ පනතක් විධියට ගෙනෙමු. අපි සූදානම් එය පත් කරන්න. අපි එවැනි කොමිසමක් පත් කර, ඒ පිළිබඳ පරීක්ෂණ කර, ඊට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගනිමු. ඒ වාගේම ගරු කථානායකතුමනි, අපි තවත් යෝජනාවක් කරනවා. පාර්ලිමේන්තුවේ අද මාධ්‍ය පිළිබඳව කථා වුණා. මාධ්‍ය පක්ෂග්‍රාහීව කටයුතු කරනවා කියා කථා වුණා. ගරු කථානායකතුමනි, ලෝකයේ බොහෝ පාර්ලිමේන්තුවල පාර්ලිමේන්තුවටම වෙන් වුණු මාධ්‍ය ආයතනයක් තිබෙනවා, රූපවාහිනී නාළිකාවක් තිබෙනවා වාගේම ගුවන් විදුලි විකාශයක් පවත්වාගෙන යනවා. බ්‍රිතාන්‍යය ගත්තත් එහෙමයි. යුරෝපයේ රටවල් බොහෝ ගණනක ඒක තිබෙනවා. අපි කෝටි ගණන් මුදල් වියදම් කරනවා. කෝටි ගණන් මුදල් අපි නාස්ති කරනවා. ගරු කථානායකතුමනි, අපි යෝජනා කරනවා, ඊළඟ වර්ෂයේදී, ඊළඟ අය වැයේදී මුදල් වෙන් කර, මුදල් ඇමතිවරයා විධියට කවුරු ඒ සඳහා මුදල් වෙන් කරලා -විශේෂ වෙන් කිරීමක් හරහා- පාර්ලිමේන්තුවට වෙනම මාධ්‍ය ඒකකයක් පිහිටුවන්න කියා. ඒ මාධ්‍ය ඒකකය පිහිටුවලා, පාර්ලිමේන්තුවේ සිදු වන සියලු දේවල් අපක්ෂපාතීව, විනිවිද පෙනෙන ආකාරයට මේ රටේ ජනතාවට දැන ගන්න සලස්වන්න. එතකොට ඔය එක එක මාධ්‍යවලට තමන්ගේ න්‍යාය පත්‍රවලට ඕනෑ විධියට මේවා පළ කරන්න බැහැ, තමන්ට ඕනෑ විධියට ඒවා වළක්වන්න බැහැ. ජාතික රූපවාහිනියට හෝ, ITN එකට හෝ, ගුවන් විදුලි සංස්ථාවට හෝ බලය තිබෙන විධියට ඒවා පාලනය කරන්න බැහැ. එතකොට කථානායකවරයා විධියට ඔබතුමාට හෝ ඊළඟට පත් වන කවර හෝ කථානායකවරයෙකුට පුළුවන්, අනාගතයේදී -චිරාත් කාලයක් සඳහා- පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න. පාර්ලිමේන්තුවේ කමිටුවලින් -COPE එකේ, PAC

එකේ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ- සියලුම දේවල් පිළිබඳව ජනතාව දැනුවත් කරන්න තමයි අපි ස්ථාවර නියෝග සම්මත කර තිබෙන්නේ. එම නිසා ස්ථාවර නියෝග අනුව ඒවා ගැන ජනතාව දැනුවත් කරන්න අපට දැන් බලය තිබෙනවා. ඒක කරන්න නම්, මාධ්‍ය ආයතනයක්, රූපවාහිනී ආයතනයක් පාර්ලිමේන්තුව සතුව තිබිය යුතුයි. එවැනි දෙයක් ස්ථාපිත කරන්න කියා ඔබතුමාට යෝජනා කරනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ කුමන්ත්‍රණය පරදලා, මේ සිදු වුණු අපරාධය අනෙක් පැත්තට හැරෙව්වාට පස්සේ මේ රටේ ජනතාවට, මේ රටට ගැළපෙන නව ආණ්ඩුවක් පිහිටුවා ගන්න, විකෘති නොවුණු ස්ථාවරත්වයක් සහිත ආණ්ඩුවක් පිහිටුවා ගන්න අපි අවස්ථාව දිය යුතුව තිබෙනවා. අන්න ඒ සඳහා මැතිවරණයක් කැඳවලා, අවශ්‍ය මොහොතේදී නීත්‍යානුකූලව පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කර, තුනෙන් දෙකේ සම්මතයකින් යුක්තව පාර්ලිමේන්තුවේ අපි කවුරුත් එකඟ වෙලා පාර්ලිමේන්තු මැතිවරණයකට යමු. ඒ පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතාවට අවස්ථාවක් තිබෙනවා, අලුත් ආණ්ඩුවක් පිහිටුවා ගන්න. ඒ අවස්ථාව අපි හදා ගනිමු, ඒකට ඉඩ සලසමු. එහෙම කරලා, මේ ඇති වෙලා තිබෙන අරාජිකත්වය, මේ ඇති වෙලා තිබෙන අස්ථාවරත්වය වෙනස් කරන්න අපි පියවර ගනිමු. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ අපි සූදානම්. අපට ඔය එක එක ලේබල් ගැහුවාට අපි බය නැහැ. අපට එක්සත් ජාතික පක්ෂයේ ලේබල් ගහනවා, යූඑන්පී එකට කඩේ යනවා කියනවා.

ගරු කථානායකතුමනි, 1982 වසරේ ඊනියා ජනමත විචාරණය තියන්න හදපු වෙලාවේ ඒ ජනමත විචාරණය නීති විරෝධී නිසා ඒකට එරෙහිව අපි උසාවි ගියා, ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේ, අප මර්දනය කරපු, එදා 1971 වසරේදී "අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව" ගෙනැල්ලා, ඒ අණ පනත්, නීති ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ අප මර්දනය කරන්න මැදිහත් වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා සමඟ. ඒ නීතිඥවරයා සමඟ තමයි අපි යූඑන්පී එක ගෙනාපු ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී ජනමත විචාරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේ. අපි ඒකෙදී කිසිසේත්ම සැලුණේ නැහැ. අපි ඒවාට බය නැහැ. අදත් අපි කරන්නේ, මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මෙහෙවරක්. ඒක කාටවත් කඩේ යාමක් නොවෙයි. ඒක කාටවත් පක්ෂග්‍රාහී වීමක් නොවෙයි.

පාර්ලිමේන්තුවේ බහුතරය මත අගමැතිවරයෙක් පත් කිරීම තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නේ. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ඒකට අනුකූලව කටයුතු කිරීම තමයි ජනාධිපතිවරයාගේ වගකීම වන්නේ. ඒ නිසා ජනාධිපතිවරයාට කියන්න බැහැ, 225ම අත්සන් කළත් මම කවුරුවත් පත් කරන්නේ නැහැ කියා. කොහොමද, එහෙම කියන්නේ? ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නවවන වතාවට උල්ලංඝනය කිරීමක්. පාර්ලිමේන්තුවේ 225ම කැමති වුණාම නැවත කවුරුවත් ඉතුරු වෙන්නේ නැහැ. ඔබතුමාත් ඇතුළත්ව තමයි 225 වෙන්නේ. ඊට පස්සේ දෙන්න කෙනෙක් නැහැ. 225ම කියනවා නම් අහවල් එක්කෙනාට දෙන්න කියා, ඊට පස්සේ එයාට දෙන්න එපා කියන්නේ කවුද? ඊට පිටින් ඉන්නේ කවුද? ඊට පිටින් ඉන්නේ මෛත්‍රීපාල මහත්මයා. ඊට පිටින් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා හිටියා කියා එතුමාට අයිතියක් නැහැ අගමැතිකමයි, ජනාධිපතිකමයි දෙකම තියා ගන්න. අද නම් ජනාධිපතිකමයි, අගමැතිකමයි, ඇමති මණ්ඩලයයි ඔක්කෝම තනියෙන් තියාගෙන සිටිනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ඒක කරන්න බැහැ, ඇමති මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ බලතල පවරා ගන්න බැහැ. ඒ නිසා එතුමාට දැන් මුදල් ඇමතිකම හෝ සෞඛ්‍ය ඇමතිකම හෝ වෙනත් අමාත්‍ය ධුරයක් පවරා ගන්න බැහැ, ඒ ඉස්සර. ඒ නිසා එතුමාට එහෙම හැකියාවකුත් නැහැ. ඒ නිසා 225ම කැමැති වුණත් මම පත් කරන්නේ නැහැ කියන්න මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට බැහැ. ඒක ව්‍යවස්ථා විරෝධියි. එහෙම කටයුතු කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙනවා නම්, ඒ බහුතරය තිබෙන පුද්ගලයා පත් කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නේ මොකක්ද ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයකගේ විශ්වාසය ඇති පුද්ගලයා ජනාධිපතිවරයාගේ මතය අනුව පත් කළ යුතුය." කියායි.

ජනාධිපතිවරයාගේ හැඟීම අනුව නොවෙයි, මතය අනුව පත් කළ යුතුය කියායි තිබෙන්නේ. මෙතැනදී මතය ප්‍රකාශ වෙනවා, බහුතරය පෙන්වනවා නම්. ඒ නිසා බහුතරය තිබෙන කෙනා පත් කළ යුත්තේය කියායි සඳහන් වෙන්නේ. "පත් කළ හැක්කේය." නොවෙයි, "පත් කළ යුත්තේය." කියායි සඳහන් වෙන්නේ. අනිවාර්යයෙන්ම ඒක කරන්න ඕනෑය කියන එකයි කියන්නේ. ඒ නිසා මෛත්‍රීපාල මහත්තයෝ, නැවතත් ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඊළඟ ප්‍රජා අයිතිය අහෝසි වන චෝදනාවත් එකතු කර ගන්න එපාය කියා අපි කියනවා. ඒ තත්ත්වයට පත් වුණොත් තත්ත්වය තවත් භයානකයි, දරුණුයි. ඒ නිසා ඒ තත්ත්වයට යන්න එපායි කියන එකත් අවධාරණය කරමින් මේ ඇති වෙලා තිබෙන තත්ත්වය වහාම විසඳන්න, මේ අරාජිකත්වය, අස්ථාවරත්වය, රටේ ආර්ථික වශයෙන් ඇති වෙලා තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳන්න වහාම පියවර ගත යුතුයි කියන කාරණය මතක් කරනවා. ඒ පියවර ගැනීමේ ප්‍රධාන වගඋත්තරකාරයා වෙන කවුරුවත් නොව මෛත්‍රීපාල සිරිසේන මහත්තයායි. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට තමයි අභියාචනාධිකරණය දීපු තීන්දුව පිළිගෙන නව අගමැතිවරයෙක්, අමාත්‍ය මණ්ඩලයක් පිහිටුවීමේ හැකියාව තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව වෙන කාටවත් ඒක කරන්න බැහැනේ. ඒ නිසා තවත් කල් මරන්නේ නැතිව, සති ගණන් කල් ගන්නේ නැතිව, බොරු සාකච්ඡා නැතිව, හොර පාරෙන් යූඑන්පී එක හරහා වෙනත් විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා තමන්ට එරෙහි චෝදනා ඉවත් කර ගන්න යටිකුට්ටු වැඩ කරන්නේ නැතිව දැන් කෙළින් මුහුණ දෙන්න, පරාජය භාර ගන්න නිහතමානී වෙන්න, නිහතමානී වෙලා රට වෙනුවෙන්, රටේ ජනතාව වෙනුවෙන් තමන්ගේ වගකීම ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා. එහෙම ඉටු කරන්නේ නැත්නම් දෙවැනි, තුන්වැනි සහ ඊළඟ පියවර පාර්ලිමේන්තුවේ ගන්න අපි සූදානම් කියමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. විශේෂයෙන්ම නිදහස්, ස්වාධීන මාධ්‍යයක් වෙනුවෙන් ඔබතුමා ඉදිරිපත් කළ අදහස් අපට සාකච්ඡා කරන්න පුළුවන්. අද උදේම අපි දැක්කා, ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා කොහොමද හැසිරුණේ කියා. ඒ සඳහා පාර්ලිමේන්තුවේ අවධානය යොමු විය යුතුයි.

තවත් කථිකයෝ 25 දෙනෙකු පමණ සිටින නිසා කාල වේලාව ගැන අවධානය යොමු කරන්නය කියන එක මා සියලු දෙනාගේම අවධානයට යොමු කරන්න කැමැතියි. ඒ වාගේම අද දින දිවා භෝජනය සඳහා විවේකය ලබා දෙන්නේ නැහැ. ඒ වාගේම මේ විවාදය ප.ව. 5.30 වනතුරු පවත්වාගෙන යා යුතුයි කියායි යෝජනා කරන්නේ. ඊළඟට, 12වැනි දා රැස්වීම ආරම්භ කරන්නේ අපර භාග 1.00ටයි.

මීළඟට, ගරු ජෝන් අමරතුංග මැතිතුමා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු සෙල්වම් අටෙක්කලනාතන්] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා. 12.23]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා අතිශයින්ම යෝග්‍ය කථාවක් කළා. එතුමා සඳහන් කළ සෑම කාරණාවක්ම අපේ එක්සත් ජාතික පක්ෂය අනුමත කරනවා කියා මා හිතනවා.

මේ අවස්ථාවේ ගරු කථානායකතුමා මූලාසනයේ නැති වුණත් මම ප්‍රකාශ කරන්න කැමැතියි, ගරු කථානායකතුමා පාර්ලිමේන්තුවේ අභිමානය ආරක්ෂා කළා පමණක් නොව එතුමාගේ කටයුතු පිළිබඳව අද ජාත්‍යන්තරය තුළත් ප්‍රසාදයට ලක් වෙලා තිබෙනවායි කියන කාරණය. අපි තානාපතිවරුන්, කොමසාරිස්වරුන් සමඟ කථා බහ කරනකොට අපට දැන ගන්න ලැබුණා, මේ සම්බන්ධයෙන් ඒ රටවල ආකල්පය මොකක්ද කියන එක. ඒ නිසා ගරු කථානායකතුමාට අපේ ප්‍රසාදය පුද කරන්න කැමැතියි.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අගමැතිවරයකු නැති වුණාම ඊළඟ බලධාරියා වන්නේ ගරු කථානායකතුමායි. තුන්වනුව ඉන්නේ එතුමායි. එතුමාට අසීමිත බලතල තිබෙනවා. මේ ගරු සභාවේ කියැවුණා, ඇතැම් රජයේ ජනමාධ්‍ය ආයතනවල හැසිරීම් ගැන. මගේ ඉල්ලීම අද සවස 5.00ට ප්‍රථමයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ ගරු සභාවට ගෙන්වන්න කියන එකයි. ගෙන්වා මීට කලින් කටයුතු කළා වාගේ ඒ අයගෙන් ප්‍රශ්න කර සුදුසු දඬුවමක් දෙන්න පියවර ගන්න කියන එකයි අපේ ඉල්ලීම වන්නේ. කලින් ඒ නීති රීතිවල පොඩි වෙනසක් ඇති වුණා. ඒ වුණත් මේ වාගේ අවස්ථාවකදී වැරදි මතයක් රටට දෙනවා නම් ඒක මහා භයානක දෙයක් කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඊළඟට කියන්න ඕනෑ, මේ යෝජනාවේ වැදගත් කරුණු කිහිපයක් තිබෙන බව. ඒ තමයි, ආර්ථිකය, සමාජ ජීවිතය, රාජතාන්ත්‍රික පිළිගැනීමට සිදුවී ඇති බලපෑම්. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, -විජිත හේරත් මැතිතුමාත් මේ ගැන බොහෝ කරුණු සඳහන් කළා.- අද වෙලා තිබෙන දේ. අද අපට සැකයක් පවතිනවා, නැවත වරක් එල්ටීටීඊ එක ඔළුව උස්සන්න හදනවාද කියන එක සම්බන්ධයෙන්. ඊළඟ කාරණය, දකුණු පළාත ඇතුළු අනෙක් පළාත්වල හොර මැරකම්, මිනීමැරුම්, උද්ඝෝෂණ කෙළවරක් නැහැ. කිසිම පාලනයක් නැති රටක් හැටියටයි පරිවර්තනය වෙලා තිබෙන්නේ.

ඒ සියල්ලම එහෙම තියෙද්දි දැන් කසුකුසුවක් යනවා; සාකච්ඡා යනවා; 07 වෙනිදාට මහාධිකරණය වටලන්න, එහෙම නැත්නම් සුප්‍රීම් උසාවිය වටලන්න. මේක මහා භයානක වැඩක්! මම මේ සභාවේ අවධානය යොමු කරන්නේ මේ වාගේ කටයුතු සඳහා මේ අය සූදානම් වනවා නම්, ඒවා වළක්වන්න වහාම පියවර ගත යුතුය කියලායි. එදා කථානායකතුමාට එන්න නොදී කලබල කරලා පොත්වලින් ගහලා ජරමර කෙරුවා නම්, ඕක කරන එක වැඩක් නොවෙයි. මේවා කරන්න ඉඩ දෙන්න එපා. කවුරු මොනවා කිව්වත් මේ වාගේ අවස්ථාවලදී සුප්‍රීම් උසාවිය ආරක්ෂා කරන්න ඕනෑය කියලා ත්‍රිවිධ හමුදාවෙන් සහ පොලීසියෙන් අපි විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ස්වාධීනව කටයුතු කිරීම පිළිබඳව අද ජාත්‍යන්තරයේ ප්‍රසාදයට ලක් වී තිබෙනවා. අද මේ ජුණ්ටාව උත්සාහ කරනවා, අධිකරණවල සිටින අපේ විනිශ්චයකාරවරුන්ව භයගන්වන්න. එදා ඔය නඩුව අහන්න පටන් ගන්න කොට මහින්ද රාජපක්ෂගේ ලොකු පින්තූරයකුයි, ගෝඨාභයගේ ලොකු පින්තූරයකුයි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට ගහලා තිබුණා. ඒ තුළින් දුන් සංඥාව මොකක්ද? "නුඹලා වැරදි තීන්දුවක් දුන්නොත් බලාගෙනයි" කියන සංඥාවයි ඒකෙන් දුන්නේ.

මම මේ වෙලාවේ වැඩිය කිසිවක් කථා කරන්න යන්නේ නැහැ. කථානායකතුමාගෙන් මම මේ ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම විනිශ්චයකාරවරුන් ආරක්ෂා කරන්න දිය යුතු සෑම ආරක්ෂාවක්ම අපි ලබා දිය යුතුයි. ඒක තමයි අපේ ඉල්ලීම. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අපි ආඩම්බර වන්න ඕනෑ. එම නිසා ඒ ස්වාධීනත්වය නැති කරන්න උත්සාහ කරන පිරිසක් ඉන්නවා නම්, ඒ අයට විරුද්ධව පියවර ගන්නත්, එවැනි දෙයක් නොවෙන්න වග බලා ගන්නය කියන එකත් මතක් කරමින් මම නිහඬවනවා. ස්තුතියි.

[පි.ප. 12.28]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய நாட்டின் நிலைமை தொடர்பாக கௌரவ பாராளுமன்ற உறுப்பினர் நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை தொடர்பில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன். ஜனாதிபதியினுடைய திடீர் முடிவுகளின் காரணமாக இன்று எமது நாடு ஓர் அசாதாரண சூழ்நிலைக்கு உட்பட்டிருக்கிறது. அந்தத் திடீர் முடிவுகளின் காரணமாக ஒக்டோபர் 26ஆம் திகதி இந்த நாட்டில் குழப்பம் ஏற்பட்டது. அதன் பின்பு - ஒரு மாத காலம் கடந்த பின்பு நாட்டினுடைய நிலைமைகளைக் கருத்திற்கொண்டு, எங்களுடைய வடக்கு, கிழக்கிலிருக்கின்ற மக்களுடைய கருத்துக்களை அடிப்படையாகக் கொண்டு, மஹிந்த ராஜபக்ஷ அரசாங்கத்தை அல்லது அவருடைய செயற்பாடுகளை மற்றும் அரசியல் யாப்பை மீறுகின்ற செயற்பாட்டை எதிர்க்க வேண்டும் என்ற ஒரு நோக்கத்திற்காகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு ஐக்கிய தேசிய முன்னணிக்கு ஆதரவளிப்பதாக ஒரு தீர்மானம் ஒன்று எடுக்கப்பட்டது. அப்படித் தீர்மானம் எடுக்கப்பட்டதன் பின்பு, மட்டக்களப்பு, வவுணதீவில் ஓர் அரசியல் சூழ்ச்சி காரணமாக 2 பொலிஸ் உத்தியோகஸ்தர்கள் கொலை செய்யப்பட்டார்கள். அந்த அரசியல் சூழ்ச்சியின் பின்னணியில் இருந்தவர்கள் யாரென்பது தற்போது பொலிஸ் மா அதிபருக்கும் தெரியும்;

පුලනාය්වු සෙය්කින්ර අදිකාරි කලුක්කුම් දෙරියුම්. ආනාල්, වටක්කු, කිළක්කිල් ඉරුක්කින්ර මුන්නාළ් පෝරාළිකළෙ අච්චුරුත්තුකින්ර වකෙයිල් අල්ලදු අවර්කළුටෙය සාදාරණ නටවටික්කෙ කළෙක් කණ්කාණික්කින්ර වකෙයිල් තර්පොළුදු වටක්කු, කිළක්කිල් ඉරුක්කින්ර පුලනාය්වුප් පිරිවිනර්කළ් සෙයර්පට්ටුක් කොණ්ටිරුක්කින්රාර්කළ්. උණ්මෙයිල්, වවුණදීවුක් කොලෙ කණ්ටික්කප්පට වේණ්ටුම්; කුර්රම් ඉළෛත්තවර්කළ් යාර් එන්පදෙ නාට්ටු මක්කළුක්කුච් චොල්ල වේණ්ටුම්. තමිළ්ත් තේසියක් කූට්ටමෛප්පු ඉක්කිය තේසිය මුන්නණික්කු ආතරවු තෙරිවිත්තදන් පින්පු නාට්ටිල් ඔරු කුළුප්පත්තෙ එර්පටුත්තු වර්කාක අවසර, අවසරමාක නටන්ත ඔරු කොලෙයාකත්තාන් නාන් ඉන්තක් කොලෙච් චම්පවත්තෙප් පාර්ක්කින්රේන්.

කෙළරව කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, ඉන්තක් කොලෙ තොටර්පාක කෛතු සෙය්යප්පට්ට මුන්නාළ් පෝරාළිකළ් මාවීරර් තිනත්තිල් මාවීරර්කළුටෙය පෙට්රෝර්කළුක්කු ආතරවාක සෙයර්පාට්ටාර්කළේ ඔළිය, අවර්කළුක්කුම් අන්තච් කොලෙච් චම්පවංකළුක්කුම් එන්තවිතමාන චම්පන්තමුම් ඉරුප්පතාක නාන් කරුතවිල්ලෙ. අවර්කළ් මාවීරර්කළුටෙය පෙට්රෝර්කළුක්කු ආතරවාක අන්රු අන්තක් කාවල්තුරෙයිනරුටන් ඔරුසිල වාර්ත්තෛප් පිරයෝකංකළිල් ඈටුප්පට්ටිරුක්කලාම්. ආනාල්, අන්ත වවුණදීවුක් කොලෙ එන්පදු ඉන්ත නාට්ටිල් සූළ්ච්චි මූලම් අරචාංකත්තෙ ආට්චික්කුක් කොණ්ටුවර නිනෛත්තවර්කළින් ඔරු සූළ්ච්චි නටවටික්කෙ එන්පදෙ ඉන්ත නාට්ටු මක්කළ් අරිවාර්කළ්. ඉන්ත විටයම් තොටර්පිල් නාන් නේර්රු අවසරමාක ඉන්ත නාට්ටිනුටෙය ජනාතිපතික්කුක් කටිතම් එළුතියිරුන්තේන්. වටක්කු, කිළක්කිල් ඉරුක්කින්ර මුන්නාළ් පෝරාළිකළෙ අච්චුරුත්තුවතෙයෝ තුන්පුරුත්තුවතෙයෝ එංකළාල් ඒර්රුක්කොළ්ළ මුටියාතෙන්රු අතිල් කුරිප්පිට්ටිරුන්තේන්. ආකවේ, කෙළරව කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, ඉන්ත විටයම් තොටර්පාක පොලිස් මා අතිපරුක්කු අරිවික්ක වේණ්ටුම්; උණ්මෙයාන කුර්ර වාළියෛක් කණ්ටුපිටිත්තු නාට්ටු මක්කළුක්කුත් තෙරියප්පටුත්ත වේණ්ටුම්; ඉන්තක් කොලෙයින් පින්නණියිල් ඉරුක්කින්ර සූළ්ච්චික්කාරර්කළ් යාර් එන්පතෛත් තෙළිවුපටුත්ත වේණ්ටුම් එන්රු නාන් කේට්ටුක් කොළ්කින්රේන්. තර්පොළුදු නාට්ටිල් අරචාංකම් ඉල්ලෛ. අතේනේරම් නාට්ටිනුටෙය ජනාතිපතිතාන් පොලිස් තිණෛක්කළත්තිනුටෙය තලෛවරාක ඉරුක්කින්රාර්. ආනාල්, මුන්නාළ් පෝරාළිකළෙ අච්චුරුත්තු වතෛයෝ අවර්කළුටෙය සාදාරණ නටවටික්කෛකළුක්කුප් පංකම් විළෛවිප්පතෛයෝ එංකළාල් ඒර්රුක් කොළ්ළ මුටියාදු. අප්පටියාන ඔරු සූළ්නිලෛයෙ විටුත්තු, පුලනාය්වු මූලම් උණ්මෙයාන කුර්රවාළිකළෛක් කණ්ටුපිටික්ක වේණ්ටුම්; එංකළුටෙය මුන්නාළ් පෝරාළිකළුක්කු එන්තවිතමාන අච්චුරුත්තල් විටුප්පතෛයුම් නාංකළ් ඒර්රුක් කොළ්ළ මුටියාදු එන්පතෛ ඉන්තච් චපෛක්කුක් කූර විරුම්පුකින්රේන්. නන්රි.

[අ.භා. 12.33]

ගරු චජීර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අපේවර්තන)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම අවාසනාවන්ත තැනක රට තිබෙන අවස්ථාවක අපේ කථානායකතුමා ජාතික වශයෙන් ඉතා වැදගත් තීරණයක් පසුගිය කාලය තුළදී ගත්තා කියා මම හිතනවා. ඒ නිසා ගරු කථානායකතුමාට ජාතියේ ගෞරවය හිමි විය යුතුව තිබෙනවා. මේ සභා ගර්භය තුළදී පැනක්, පැන්සලක් හෝ නොමැතිව හිටපු පොලිස් නිලධාරීන්ට ඉතාම අශෝභන විධියට පහර දීම් සිදු කරපු අවස්ථාවත් මුළු රටම දැක බලා ගත්තා. එවැනි වෙලාවක අපේ කථානායකතුමා ගත් තීරණ සම්බන්ධයෙන් එතුමාට විවිධ චෝදනා මාධ්‍ය හරහා එල්ල වෙමින් පවතිනවා. ඒ නිසා වැදගත් කාරණයක් සටහන් කරන්න මම හිතුවා. ඇත්ත වශයෙන්ම, අභියාචනාධිකරණය විසින් 2018 දෙසැම්බර් මස 03 වැනි දින දෙනු ලැබූ අතුරු තහනම් නියෝගය - මෙය මගේ මතයක් නොවෙයි.- සියලු දෙනාගේ දැනගැනීම සඳහා මම කියවන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහි මෙසේ සඳහන් වනවා:

"මෙම අභියාචනාධිකරණය හමුවේ ඇති නඩුවට අනුව මන්ත්‍රීවරුන් 225කින් සමන්විත පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 122ක බහුතරයක් විසින් වර්තමාන ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංගයක් සම්මත කර ගත් බවට නඩුවක් ගොනු කර ඇත. එම පෙත්සමේ සඳහන් කර ඇත්තේ අග්‍රාමාත්‍ය ධුරය, කැබිනට් අමාත්‍යවරුන්ගේ ධුර සහ අනිකුත් අමාත්‍ය ධුර ව්‍යවස්ථානුකූල නොවන බවයි. මෙම අධිකරණය මඟින් මෙම අතුරු තහනම් නියෝගය නිකුත් කිරීම මඟින් රටේ අග්‍රාමාත්‍යවරයෙකු, කැබිනට් අමාත්‍යවරුන් සහ වෙනත් අමාත්‍යවරුන් නොමැති තත්ත්වයක් උද්ගත වන බව සැලකිල්ලට භාජනය කර ඇත. එමෙන්ම මෙම අධිකරණය විසින්, මෙම පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තර්කයන්ට අනුව මෙම නඩුවෙහි විත්තිකාර පාර්ශ්වය නීතිමය ප්‍රතිපාදනයන්ට අනුව අදාළ තනතුරු දරමින් රාජ්‍ය ආයතන එලෙස පවත්වා ගෙන යන්නේ නම් විශාල හානියක් සම්මතයක් වශයෙන් රටට විය හැකි බව සැලකිල්ලට භාජනය කර ඇත.

මෙම අධිකරණය මඟින් රටෙහි පාලනය පවත්වා ගෙන යෑමට අග්‍රාමාත්‍ය ඇතුළු කැබිනට් අමාත්‍යවරුන්ට සහ අනිකුත් අමාත්‍යවරුන්ට විශාල බලයක් ව්‍යවස්ථානුකූලව සහ වෙනත් නීතිමය රාමුවලට අනුව ලබා දී ඇති බව සැලකිල්ලට ගෙන ඇත. එමෙන්ම එම තනතුරු දරන ඕනෑම කෙනෙකු හට ඉතාමත් වැදගත් සහ වග කිව යුතු තීරණ ගැනීමට හැකියාවක් ඇති අතර, එමඟින් රටෙහි අභ්‍යන්තර කටයුතු සහ ජාත්‍යන්තර වශයෙන් විශාල බලපෑම් ඇති විය හැක. එම වැදගත් සහ වග කිව යුතු තීරණ නැවත ආපස්සට හැරවිය නොහැකි බව අධිකරණය විසින් සැලකිල්ලට භාජනය කර ඇත.

එමෙන්ම මෙම අධිකරණය මෙම අතුරු තහනම් නියෝගය මඟින් ඇති වන තත්ත්වය මත විත්තිකරුවන්ට තමන්ට අදාළ රාජ්‍ය ආයතනවල රාජකාරි කිරීම තහනම් කිරීමෙන් ඇති වන බලපෑම සහ හානිය වාගේම මෙම පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම ප්‍රතික්ෂේප කිරීමෙන් ඇති වන බලපෑම සහ හානියද සැලකිල්ලට භාජනය කර ඇත. තවද, පෙත්සමට අදාළව ඉදිරිපත් කර ඇති අතුරු තහනම් නියෝගයට අනුව අග්‍රාමාත්‍ය ධුරය සහ කැබිනට් මණ්ඩලය සහ අනිකුත් අමාත්‍ය ධුර පවත්වාගෙන යෑම වාගේම එම රාජ්‍ය ආයතනවල ඔවුන් රාජකාරි කිරීම තහනම් කිරීම ද සිදු විය යුතුය. එම නිසා අධිකරණය විසින් මෙම අතුරු තහනම් නියෝගය මඟින් අදාළ විත්තිකරුවන් අදාළ රාජ්‍ය ආයතනවලින් රාජකාරි කිරීම බැහැර කරලීම සැලකිල්ලට භාජනය කර ඇත. එමෙන්ම අදාළ අතුරු තහනම් නියෝගය මඟින් පුරප්පාඩු වන ධුරයන්හි රාජකාරි කිරීමට අදාළ රාජ්‍ය ආයතනවල රාජකාරි කිරීමට පත් කළ යුත්තේ කවුරුන්ද යන්න මෙම අධිකරණයට අදාළ නොවන අතර, එම වගකීම් පැවරී ඇත්තේ ව්‍යවස්ථාවට අනුකූලව තනතුරු පත් කිරීමට බලය ඇති බලධාරියාටය. තවදුරටත් මෙම පෙත්සම්කරුවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 122 දෙනා ඉදිරිපත් කර ඇති මෙම පෙත්සම නිවැරදි නම් රටෙහි වර්තමාන තත්ත්වය වන්නේ නීත්‍යානුකූල අග්‍රාමාත්‍යවරයෙකු, කැබිනට් මණ්ඩලයක් සහ වෙනත් අමාත්‍යවරුන් නැති රටක් නිර්මාණය වීමයි.

[ගරු වජිර අබේවර්ධන මහතා]

එවැනි තත්ත්වයක් තුළ අතුරු තහනම් නියෝගය නිකුත් කිරීමෙන් ඇතිවන තත්ත්වයට වඩා පෙර තත්ත්වය භයානක සහ අවදානම් බව සඳහන් කරමු. එම නිසා මෙම නඩුවට අනුව පෙත්සම්කරුවන් එකසියවිසිදෙදෙනා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම නීතියට අනුකූල බව සඳහන් කරමි. මෙම තත්ත්වය මඟින් පැන නඟින තවත් ප්‍රශ්නයක් වන්නේ, විත්තිකරුවන් අදාළ රාජ්‍ය ආයතනවල රාජකාරි කිරීම තහනම් කිරීමෙන් විසඳිය නොහැකි ගැටලු සහ ව්‍යාකූලත්වයක් පැන නැඟිය හැකිද යන්නයි. මේ සම්බන්ධයෙන් අධිකරණය සුබවාදීව ප්‍රශ්නය සලකා බැලීම කර ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණයේ මතය වන්නේ නීත්‍යානුකූල නොවන පිරිසක් විසින් අග්‍රාමාත්‍ය ධුරය, කැබිනට් අමාත්‍ය ධුර සහ වෙනත් අමාත්‍ය ධුර දරමින් සිදුවන ගැටලු සහ ව්‍යාකූලසහගත තත්ත්වය අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීමෙන් ඇතිවන තත්ත්වයට වඩා බරපතළ බවයි. සමස්තයක් වශයෙන් එම තත්ත්වය දීර්ඝ කාලීන ලෙස සමස්ත රටට බලපාන සාධකයකි. එවැනි අවස්ථාවක අවසන් තීන්දුව දීම අත්‍යවශ්‍යම වේ. ඉහත හේතුව දක්වා ඇති කරුණුවලට අනුව මෙම අධිකරණය පහත සඳහන් තීරණ ඉදිරිපත් කර ඇත.

1. මෙහි සඳහන් පළමුවෙනි විත්තිකරු අග්‍රාමාත්‍ය ධුරය දැරීම සහ කැබිනට් අමාත්‍ය ධුර දැරීම අවසාන තීරණය ලබා දෙන තෙක් සහ පෙත්සම් තහවුරු වන තෙක් තහනම් කිරීම.
2. මෙහි සඳහන් දෙවැනි විත්තිකරුගේ සිට විසිනව වන විත්තිකරු දක්වා පුද්ගලයන් කැබිනට් අමාත්‍ය ධුර සහ වෙනත් අමාත්‍ය ධුර දැරීම වළකාලමින් අවසාන තීරණය ලබා දෙන තෙක් සහ පෙත්සම තහවුරු වන තෙක් තහනම් කිරීම.
3. මෙහි සඳහන් තිස්නවයේ සිට හතළිස් එක දක්වා විත්තිකරුවන් අමාත්‍ය ධුර දැරීම අවසාන තීරණයක් ලබා දෙන තෙක් සහ පෙත්සම තහවුරු වන තෙක් තහනම් කිරීම.
4. මෙහි සඳහන් හතළිස් දෙකේ සිට හතළිස් නවය දක්වා විත්තිකරුවන් නියෝජ්‍ය අමාත්‍ය ධුර දැරීම අවසාන තීරණය ලබා දෙන තෙක් සහ පෙත්සම තහවුරු වන තෙක් තහනම් කිරීම.

මෙම අධිකරණය විසින් නියමිත කාල වකවානු ඇතුළත මෙම නඩුව අවසන් කර නඩු තීන්දුවක් ලබා දීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට කටයුතු කරනු ඇත.

සභාපති,
අභියාචනාධිකරණය
අර්ජුන ඔබේසේකර
මම එකඟ වෙමි. - අභියාචනාධිකරණ විනිසුරු."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන් මෙම තීරණය සඳහන් කළේ, වර්තමාන අපේ කථානායකතුමා කළ කාර්ය භාරය සම්බන්ධව මාධ්‍ය ආයතන විවිධ විධියට විවේචනය කරමින්, පහර දෙමින් ක්‍රියා කරපු නිසායි. මම හිතන විධියට සමස්ත මාධ්‍යයට, රටවැසියන්ට -සමස්ත ජනතාවට- දැන් තේරෙන්නට ඕනෑ, පාර්ලිමේන්තුවේ කථානායකතුමා ඇතුළු මන්ත්‍රීවරුන් එකසියවිසිදෙදෙනා කළ කාර්ය භාරය හරි බව අධිකරණයට හැඟී ගිය නිසා තමයි මේ අතුරු තහනම් නියෝගය පනවා තිබෙන්නේ කියන කාරණය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විවිධ මාධ්‍ය හරහා විවිධ වැරදි ප්‍රචාර කරනවා. මාධ්‍යයත්, මාධ්‍ය ආයතන අයිතිකරුවනුත් - ඇත්තවශයෙන්ම මාධ්‍යකරුවන් හැටියට මාධ්‍යකරුවන්ගෙන් සිදුවන ක්‍රියාවලියක් නොවෙයි- අද වහල්භාවයට පත් වෙලා තිබෙනවා. වහල්භාවයට පත් වුණාට පසුව සමස්ත මාධ්‍යවේදීන්ගේ යුතුකමක් තමයි, හරිනම් දින දෙකක් විතර මෙවැනි මාධ්‍ය පණිවුඩ නිකුත් නොකර සිටීම. ඇත්තවශයෙන් මාධ්‍යකරුවන් දින දෙකක් තමන්ගේ යුතුකම ඉටු කළොත්, දින දෙකක් මාධ්‍යයේ වැඩ නොකර හිටියොත්, පුවත් පත්වල ලියන්නේ නැතුව හිටියොත්, news කියන්නේ නැතුව හිටියොත්, electronic media වැඩ නොකර හිටියොත්, මාධ්‍ය අයිතිකරුවන්ට අවශ්‍ය දේ රටට කළ නොහැකි තත්ත්වයක් උදා කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ සමස්ත මාධ්‍ය දින දෙකක් මේ රටේ වැඩ වර්ජනයක් කළොත්, මාධ්‍ය අයිතිකරුවන්ට තේරෙනවා, ඔවුන් නැතුව මාධ්‍ය ගෙනියන්න පුළුවන්කමක් නැති බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතන විධියට මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාම බෙදජනක අවස්ථාවක් තමයි මේ අවස්ථාව. දින කිහිපයකට උඩදී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ව්‍යවස්ථාව ගැන සඳහන් කරනවා මම දැක්කා.

එතුමා ව්‍යවස්ථාව ගැන සඳහන් කරමින් තර්කයක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමක් කළ හැක්කේ කෙසේද කියන එක ගැන මම එතුමාට මතක් කරන්න කැමතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33.(2) අනු ව්‍යවස්ථාව අනුව මීස වෙන ආකාරයකට ඒක කරන්න පුළුවන්කමක් නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා කරන ලද ප්‍රකාශයට කෙටි පිළිතුරක් සපයන්න මම කැමතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 33. (2) අනු ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ ප්‍රකාශිතවම ජනාධිපතිවරයා වෙත පවරා හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව, ජනාධිපතිවරයාට - "

'අමතරව' කියන වචනය තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා පාවිච්චි කළ වචනය. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33.(2) (ඇ)හි සඳහන් වන්නේ "පාර්ලිමේන්තුව කැඳවීමට, වාර අවසන් කිරීමට සහ විසුරුවා හැරීමට බලය ඇත්තේ ය;" යනුවෙනුයි. ඉහත අනු ව්‍යවස්ථාවේ 'අමතර' යන පදය, 'ව්‍යවස්ථාවේ අන් තැනක කුමක් සඳහන් වුවත්' යනුවෙන් අර්ථ නිරූපණය කළ නොහැක. එම නිසා ජනාධිපතිවරයාට ඉහත අනු ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ වෙනත් ව්‍යවස්ථාවක් හෝ අනු ව්‍යවස්ථාවක් නොසලකා හැරීම සඳහා අමතර හෝ විශේෂ බලයක් නොදේ. මෙම අවස්ථාවේදී 'අමතර' යන වචනයේ නියම අරුත වනුයේ 'සහ' යන්නයි. එම නිසා ජනාධිපතිවරයා තම බලය පාවිච්චි කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම විෂය සම්බන්ධයෙන් එනම්, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ ඇති සියලු ව්‍යවස්ථා සැලකිල්ලට ගත යුතුය.

ඇත්ත වශයෙන් මේ අවස්ථාව වෙනකොට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් අවස්ථා ගණනාවකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය සිදු කර තිබෙනවා. පළමුවැනි අවස්ථාව තමයි පසුගිය ඔක්තෝබර් මස 26වැනි දින අග්‍රාමාත්‍ය ධුරයේ පුරප්පාඩුවක් නොමැති අවස්ථාවක, අග්‍රාමාත්‍යවරයෙක් පත් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයක් පත් කිරීම. ඒ මඟින් නීත්‍යානුකූල නොවන තැනකට රට තල්ලු කරපු නිසා අද මුළු රටම මහා බෙදවාචකයක් බවට පරිවර්තනය වී තිබෙනවා.

වර්ෂයක අවසාන මාස කිහිපය කියන්නේ සංචාරක ව්‍යාපාරයෙන් අපේ රටේ ව්‍යාපාරිකයන් ඇතුළු සංචාරක

ව්‍යාපාරයට සම්බන්ධ සියලුදෙනා යම් ආදායමක් ලබා ගන්නා කාලයක්. ලංකාවට සංචාරකයන් ලක්ෂ 10ක් ආවොත්, තැඹිලි ගෙඩි ලක්ෂ 10ක් විකුණා ගත්තොත් කීයක් ලැබෙනවාද? අද උතුරෙත්, නැහෙනහිරත්, දකුණෙත් -මුළු මහත් රටේම-තැඹිලි විකුණන සාමාන්‍ය පුරවැසියාගේ සිට සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ සියලු පුද්ගලයන් සහ සියලු ආයතන මහා දැවැන්ත කඩා වැටීමකට ලක් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක වාක්‍යයක් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. අපි ඔබතුමන්ලාගේ ද්‍රවිඩ දේශපාලන පක්ෂ සමඟ ක්‍රියා කරනවා කියලා අපේ පක්ෂයට බොහෝ වේලාවට චෝදනා කරනවා මම දැක්කා. 1977 වසරෙන් පසුව, දේවනායගම් මැතිතුමා ස්වදේශ කටයුතු ඇමතිතුමා වෙලා කැබිනට් මණ්ඩලයේ වාඩි වී සිටියාට පසුව, ද්‍රවිඩ ජනතාව සහ සිංහල ජනතාව අතර තිබුණු දුරස්ථභාවය ඇත්වෙලා අද වෙනකොට United National Front එක තුළ ද්‍රවිඩ, සිංහල, මුස්ලිම් සියලුදෙනා එකට වැඩ කරනවා නම් ඒක ජාතියේ විශාල වාසනාවන්ත අවස්ථාවක් හැටියටයි අපි දකින්නේ. ඇත්ත වශයෙන් මේ නඩු තීන්දුවේ මම කියවූයේ අධිකරණයේ තිබෙන ලියවිල්ල පමණයි. මේ ලියවිල්ල කවදා හෝ සියලුදෙනාට වැදගත් වෙයි කියා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.47]

ගරු ගාම්ණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉස්සෙල්ලාම ගරු ජෝන් අමරතුංග මැතිතුමා කළ ප්‍රකාශයක් ගැන කියන්නම්. ශ්‍රේෂ්ඨාධිකරණ භූමියට හෙංචයියෝ එවලා ගරු විනිශ්චයකාරතුමන්ලා භය ගන්වන්න යනවාය කියලා අපට ආරංචියක් ලැබී තිබෙනවා. එහෙම යුගයක් තිබුණා. අපි දන්නවා, රාජපක්ෂ යුගයේ ශිරානි බණ්ඩාරනායක හිටපු අග්‍රවිනිශ්චයකාරතුමියට සිදුවූ දේ. ශිරානි බණ්ඩාරනායක මැතිනියට බලපෑම් කරපු අවස්ථා තිබුණු බව මට මතකයි. එතුමියගේ තීන්දුවලට, නොයෙකුත් දේවල්වලට බලපෑම් ඇති කළා.

නීතිඥ සංගමයේ මහා සමුළුවක් හෝටලයක තිබුණ වෙලාවේ, ඒ නීතිඥයන් කළ ප්‍රකාශ අනුව, අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් නොබියව මුහුණ දෙන්නට ඕනෑය කියන දැඩි තීරණයට එන්න වුණා. එතුමිය ඒ අවස්ථාවේදී ප්‍රකාශයක් කළා, යම් යම් අයගේ අවශ්‍යතාවන් අනුව අධිකරණය හැල්ලුවට පත් කිරීම වරදක් බව පිළිගන්නවා, එවැනි වැරැදි නොවන විධියට ක්‍රියා කරනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු ඇමති බැසිල් රාජපක්ෂ මහතා දිවි නැහුම පනත ගෙනාවා. බලවත් පනතක් විධියට ඒ පනත ගෙනාවේ තමන්ට ඕනෑ විධියට, තමන්ගේ පවුලට ඕනෑ විධියට ගමේ ඡන්ද හරවන්නයි. එදා අග්‍රවිනිශ්චයකාරතුමිය ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පනත ප්‍රතික්ෂේප කළා, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි කියලා. එයින් වියරු වැටුණ අය බොරු චෝදනා දමලා අග්‍රවිනිශ්චයකාර ශිරානි බණ්ඩාරනායක මැතිනිය එම තනතුරෙන් ඉවත් කිරීමට ක්‍රියා කළා. එදා පහළ කම්ටු කාමරයක එළිවෙනතුරු පැය ගණනක් ඒ චෝදනා විභාග කරලා, අපේ මන්ත්‍රීවරු සල්ලිවලට අරගෙන තුනෙන් දෙකක බලයකින් එතුමිය තනතුරින් ඉවත් කළා. ඒ වියරු වැටිච්ච ක්‍රම නිසා තමයි අද අධිකරණයේ ස්වාධීනත්වය ඇති වුණේ. අද අධිකරණයේ ස්වාධීනත්වය ඇති වී තිබෙන්නේ, 2015 වර්ෂයේ පත් වුණු අපේ රජය ඇති කළ ස්වාධීන කොමිෂන් සභා නිසා. එදා අපි කිව්වා, අධිකරණ, පොලිස් වාගේ සෑම අංශයකටම ස්වාධීන කොමිෂන් සභා ඇති කරනවා කියලා. අධිකරණයේ ස්වාධීනත්වයට පින් සිදු වෙන්න තමයි ජනාධිපතිටත් ඇඟිලි ගහන්නට බැරි විධියට, පාර්ලිමේන්තුවටත් ඇඟිලි ගහන්නට බැරි විධියට අද මේ කටයුතු සිදු වී තිබෙන්නේ. අපේ කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් අද අධිකරණයට කැඳවා තිබෙනවා. ව්‍යවස්ථානුකූලව ස්වාධීන තීරණ දීලා තිබෙනවා. ව්‍යවස්ථානුකූලව පාර්ලිමේන්තුවට තිබෙන බලය අනුව අනුමත කළ ඒ යෝජනා ගැන පිස්සු හැදිලා මේ හෙංචයියලා ලෑස්තිවෙන්නේ වට කරලා භය ගන්වන්නයි. අගවිනිසුරුතුමන් ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුතුමන්ලා ව්‍යවස්ථානුකූලව ස්වාධීනව ක්‍රියා කරයි කියලා මා හිතනවා. හිස නමා අපේ ගෞරවය එතුමන්ලාට පුදු කරනවා.

මගේ මිත්‍ර චමල් රාජපක්ෂ මැතිතුමා එදා 2009 සැප්තැම්බර් 09 වැනි දින "ලක්බිම" ඉරිදා සංග්‍රහයට ප්‍රකාශ කර තිබෙනවා,

"රාජපක්ෂ දර්ශනය තව අවුරුදු 75ක් ගෙන යෑම අපේ පවුලේ ඉලක්කයක්" කියලා. මම මේ ලියවිල්ල **සභාගත*** කරනවා.

මේ වියරු වැටීම තමයි අද ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අපේ රටේ ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ත්‍රිත්වය තුළ කටයුතු කිරීමේදී ගරු ජනාධිපතිතුමා මීට වඩා කල්පනාකාරී නොවුණහොත් ප්‍රශ්න ඇති වෙනවා. ගරු විජිත හේරත් මැතිතුමා පළ කළ බරපතළ, අර්ථවත් අදහස් ගැන එතුමා හොඳින් කල්පනා කර බලා තීරණ ගනියි කියලා මා හිතනවා. එක්සත් ජාතික පක්ෂය සතු නීත්‍යානුකූල ජනතා බලය, බලෙන් ගත්තා. මේ බලය ගත්තාට අද මොකද වෙන්නේ? මම රටේ ජනතාවටයි කියන්නේ. අද අය වැය ලේඛනයක් අනුමත කරන්නට බැරි වෙලා තිබෙනවා. නත්තල එනවා දෙසැම්බර් මාසයේ. අද දිනය කීයද? නත්තලට තව දවස් කීයද තිබෙන්නේ? 2019 වර්ෂය ලබන්න තව සති තුනයි තිබෙන්නේ. අය වැයක් අනුමත කරන්න බැරි නම්, ඔබ නත්තල් කන්න යන්නේ කොයි විධියටද කියලා මම අහනවා. 70-77 කාලයේ වාගේ කෙහෙල්බඩ කාපු යුගයකට එන්නද හදන්නේ? අය වැය අනුමත කරන්නේ නැතිව, තෙල් ටික ගෙනෙන්න බැරි නම්, කෑම ගෙනෙන්න බැරි නම්, මේ රටේ රජයේ සේවකයන්ට පඩි ගෙවන්නට බැරි නම් මහා ව්‍යාකූල තත්ත්වයක් ඇති වෙනවා. ජනාධිපතිතුමනි, ඔබතුමා මෙහි ප්‍රධාන වැරදිකරුවෙකු වෙන්න එපා. වහාම එඩිතර තීරණයක් අරගෙන "දෙසිය විසිපස්දෙනාම" කියන කථා, "රනිල් වික්‍රමසිංහ නැතිව වෙන කෙනෙක්" කියන කථා අයින් කරන්න. ඒක පාර්ලිමේන්තුවේ වැඩක්. පාර්ලිමේන්තුවේ බහුතරයක් කථා කරගෙන තිබෙන විධියට ඒ තීරණ ගැනීමට අවස්ථාව දෙන්න ඕනෑ.

මේ කාරණා තුළ අධිකරණයේ තිබෙන ස්වාධීනත්වය ගැන අද කථා කරද්දී ඉදිරියේදී අපි මීට වඩා බුද්ධිමත් වන්නට ඕනෑ දේශපාලකයන් හැටියට.

දේශ සේවකයෝ අපි; පාලකයෝ නොවෙයි. මම කථා කරන්නේ, ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු විධියටයි. අම්බෙඩ්කාර් මැතිතුමා ඉන්දියාවේ කුල වශයෙන් කොන් කරපු, විශාල ජන

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

සංඛ්‍යාවක් සිටි ප්‍රාන්තයේ භාරලක්ෂ ගණනක පිරිසක් බෞද්ධාගමට හැරෙව්වා. ජවහර්ලාල් නේරුතුමා අධිකරණ ඇමති විධියට පත් කළේ කවුද? අම්බෙක්කාර් මැතිතුමායි. ඒ ශ්‍රේෂ්ඨ උත්තමයා ගැන විස්තරයක් ඇතුළත් ලේඛනයක් මා හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා..

එතුමා අධිකරණ ඇමති කාලයේ හදපු ඒ ව්‍යවස්ථාව තමයි අදත් ඉන්දියානු පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වෙන්නේ. අද අපේ ව්‍යවස්ථාව දහනව වතාවක් සංශෝධනය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "Lonely Planet" කියන සඟරාවෙන් සංචාරය කරන්න හොඳම රටවල් 10න් හොඳම රට විධියට අපේ රට නම් කළා. ඒ තොරතුරත් ඇතුළත් ලේඛනයක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

Sri Lanka, the island of paradise, which is today known as "lonely Sri Lanka" is heading for disaster. අද අපි ලෝකයේ කොන්වෙන, විනාශ වෙන අනතුරක සිටිනවා. අපට අවුරුදු 72ක පාර්ලිමේන්තු ඉතිහාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිකරණ නියෝගය උඩ පොහොට්ටුවේ අයට අද ආණ්ඩු පක්ෂයේ වාඩි වෙන්නත් බැහැ; විපක්ෂයේ වාඩි වෙන්නත් බැහැ. දැන් කොහේද වාඩි වෙන්නේ? ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලනවා, ගැලරියේවත් ඒ අයට ඉඩ දෙන්න කියලා. ආත්මයක් නැතිවෙන විධියට රට විනාශ කරන්න එපා. මම පැහැදිලිව එතුමන්ලාගෙන් ඒ ඉල්ලීම කරනවා.

එඩිතරව සිටි නිසා අපේ කථානායකතුමා අද ලංකාවාසී ජනතාවගේ චිතරක් නොවෙයි, ලෝකයේත් ප්‍රසාදයට පාත්‍ර වෙලා තිබෙනවා. අධිකරණයෙන් දුන් තීන්දුව අනුව සත්‍ය ජය ගෙන තිබෙනවා. ඒකයි මම ඉස්සෙල්ලා කිව්වේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් තනතුරටත්, නොබෙල් සාම ත්‍යාගයටත් කථානායකතුමා ඉතා සුදුසුයි කියලා. ප්‍රජාතන්ත්‍රවාදයේ මුරදේවතාවා විධියට එතුමා ක්‍රියා කරනවා.

මේ පාර්ලිමේන්තුවේ අපේ කණ්ඩායමේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ පක්ෂ කිහිපයක් ඉන්නවා. දෙමළ ජාතික සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු අපි ඔක්කෝම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නයි ක්‍රියා කරන්නේ. බලය ගැනීමට නොවෙයි, ඒ වෙනුවෙන් තමයි අපි කථා කරන්නේ. මහා මැතිවරණයක් ඉල්ලලා අද මරදානේත් රැස්වීමක් තියනවා; උද්ඝෝෂණ තියෙනවා. බංකොලොත් වූ, පිස්සු හැදිච්ච ඒ අයට මම පැහැදිලිව මේ කාරණය කියනවා. එදා 2015 රනිල් රජයක් පත් කළා වාගේ අපි නැවත නීත්‍යානුකූල රජයක් බිහි කරනවා. අධිකරණයෙනුත් පැහැදිලිව ප්‍රකාශ කළ පරිදි අපේ රජය නීති විරෝධී ලෙස ඉවත් කරලා තිබෙනවා. අපි නැවත නීත්‍යානුකූලව බලයට එනවා. අපට තව අවුරුදු එකහමාරක් තිබෙනවා. ඒ අවුරුදු එකහමාර තුළ අපි රටවැසි ජනතාවගේ, තරුණ - තරුණියන්ගේ ඒ පොදු පැතුම් ඉෂ්ට කරන්න මේ රට සංවර්ධනය කරා ගෙන යනවා. මම කියනවා, මේ සුළු කාලය තුළ අපි කැප වෙලා මේ රට ලෝකයේ ආදර්ශවත් රටක් බවට පත් කරනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
භය නැත්නම්, ජනාධිපති මැතිවරණයත්, පාර්ලිමේන්තු මැතිවරණයත් දෙකම එකට තියන්න. අපේ බලය අපි පෙන්වන්නම්. සාගත යුගයක් ඉදිරියේ එනවා. ඒ සාගත යුගය 1970-73ට වඩා භයානකයි. රටවැසි ජනතාව ඒක තේරුම් ගන්න. කන්න නැතුව, ජීවත් වෙන්න බැරි, සල්ලි කොළවල වටිනාකමක් නැති රටක් බවට පත් වෙනවා. ඒ සාපය ඒ අයට වදීවි. ඒ සාපයෙන් ගොඩ එන්න තිබෙන එකම විධිය අපේ කණ්ඩායමට නැවත බලය දීමයි කියන එක මම ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා.

[අ.භා. 12.57]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ව්‍යවස්ථාදායකය තුළින් මේ රට ඉතාම ස්ථාවර තත්ත්වයකට පත් කරන්න ඕනෑය කියන අදහස ඇතුව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාවට කරුණු කිහිපයක් එකතු කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ ස්තුතිය ඔබතුමාට පුද කරනවා. ඒ වාගේම ගරු කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

මීට මොහොතකට කලින් ගරු වජිර අබේවර්ධන මැතිතුමාත් මේ කාරණය ප්‍රකාශ කළා. අභියාචනාධිකරණයෙන් ලබා දුන් නියෝගයක් තිබෙන අවස්ථාවක, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරලා ඒ පිළිබඳව අධිකරණමය ක්‍රියාදාමයක් තිබෙන අවස්ථාවක තමයි අපි මේ කථා කරන්නේ. මේ වෙලාව, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය කියන උත්තරීතර ආයතන තුන, ව්‍යවස්ථාව අනුව රටක වැඩ කටයුතු කළ යුතු වෙලාවක් .

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවන් අවස්ථාවක අපට අද එකම බලාපොරොත්තුව බවට පත් වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තුව විතරයි. අද විධායකය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අධිකරණය ඉතාමත් සාධාරණ ලෙස ව්‍යවස්ථාදායකය කරන ලද කාර්යන් පිළිබඳ සාක්ෂාත් කරමින් ඒවා ඉදිරියට ගෙන යන්න

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අවශ්‍ය ශක්තිය ලබා දෙනවා. අද අපට පිහිටක් වෙන්නේ පාර්ලිමේන්තුවයි. අද කවුරුත් කථා කරනවා, පාර්ලිමේන්තු මැතිවරණයක් ඕනෑ කියලා. පාර්ලිමේන්තු මැතිවරණයක් ඕනෑ කියන අයට මම මේ කාරණය ගැනත් කියන්න කැමැතියි. යළිත් වතාවක් පාර්ලිමේන්තු මැතිවරණයක් තියලා, එක්සත් ජාතික පෙරමුණ පාර්ලිමේන්තුවේ බහුතරය අරගෙන රනිල් වික්‍රමසිංහ මැතිතුමාව අගමැති කරන්න කියලා නැවත ඉල්ලුවොත්; ජනාධිපතිතුමා "එයාට මම දෙන්නේ නැහැ" කියලා එදාටත් ප්‍රකාශ කළොත් ඇති වන තත්ත්වය මොකක්ද? මේ රටේ ඇති වී තිබෙන අර්බුදය තවදුරටත් ඉදිරියට ගෙන යනවාද කියන එක ගැන අපි ඉතාමත් පැහැදිලිව තීන්දු-තීරණ ගත යුතුව තිබෙනවා

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරන, ව්‍යවස්ථාව කඩ නොකරන, විශේෂයෙන්ම අධිකරණයෙන් දෙන නියෝගවලට පිටුනොපා ඒ අනුව කටයුතු කරන්න පුළුවන් නායකයෙක් මේ රටේ ජනාධිපති කරවීම තමයි ප්‍රධානම දේ බවට පත් වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිවරණයක් ඕනෑ නම් ලබන ජනවාරි මාසයේ 8 වෙනිදා වෙනකොට ජනාධිපතිවරණය කැඳවන්න පුළුවන් අවස්ථාව එනවා. ව්‍යවස්ථාදායක අර්බුදයක් හදලා; එය නිර්මාණය කරලා, ව්‍යවස්ථාදායකයට චණ්ඩිකම් කරන ජනාධිපතිවරයෙක් නොවෙයි, අලුත් ජනාධිපතිවරයෙක් පත් කරන්නට අවශ්‍ය වටපිටාව හදන්න නම් අපි වහාම ජනාධිපතිවරණයක් පවත්වන්න ඕනෑ. එම ජනාධිපතිවරයා ව්‍යවස්ථාව නොකඩන කෙනෙක් විය යුතුයි. ඒ, ජනාධිපතිවරයා මේ රටේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායන් ආරක්ෂා කරන කෙනෙක් විය යුතුයි. ඒ, ජනාධිපතිවරයා මේ රටේ බහුතරයකගේ -මන්ත්‍රීවරු 225 දෙනාගේ- තීන්දු තීරණ, ගරු කථානායකතුමා විසින් ප්‍රකාශයට පත් කරන, යම් යම් තීන්දු තීරණ ක්‍රියාත්මක කරන, ඒවාට අවනත වෙන ජනාධිපතිවරයෙක් වෙන්නට ඕනෑ. ජනාධිපතිතුමනි, එදා -2015 ජනවාරි 8 වෙනිදා- ඔබතුමා හැට දෙලක්ෂයක් ජනතාවගේ ඡන්ද අරගෙන එක්සත් ජාතික පක්ෂයේ කරපිටින් බලයට ආවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක්, සියයට 95ක් ඔබතුමාට ඡන්දය දීලා ඔබතුමාව බලයට පත් කළා. ඔබතුමා අද ඒ ඉණිමහට පයින් ගහලා, අකෘතඥ ලෙස කටයුතු කර තිබෙනවා. "පාර්ලිමේන්තුවේ 225 දෙනාම අත්සන් කළත් රනිල්ට අගමැතිකම දෙන්නේ නැහැ"යි කියපු ජනාධිපතිවරයා ඉවත් කිරීම සඳහා ජනතාව හෙට-අනිද්දා වෙනකොට පාරට බහිනවා. "අපට ජනාධිපතිවරණයක් අවශ්‍යයි" කියලා ලක්ෂ ගණනින් පෙත්සම් අත්සන් කරන්න අපි ලැහැස්ති කරනවා. මේ ගැන විවිධ අය කථා කරනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට අපි ගරු කරනවා. අපි ඡන්දයට බය නැහැ, අපි ලැහැස්තියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ජනතාව - උතුරු නැගෙනහිර ජනතාව- ඡන්දය දීලා අවුරුදු 5කට ඔබතුමාව මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය කාරක සභාපතිවරයෙක් හැටියට පත්කර තිබෙනවා. ඒ, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරලා, අවුරුදු හතරහමාරකට පසුවයි පාර්ලිමේන්තුව විසුරුවන්නට ඕනෑ කියන කාරණය පැත්තකට දමලා, ඒකට පයින් ගහලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කරමින් තමයි ජනාධිපතිතුමා මේ වැඩ කටයුත්ත කළේ. ඔක්තෝබර් 26 වෙනිදා වෙනකොට මේ රටේ ඉතාමත් සාධාරණ, යුක්ති සහගත සමාජයක් තිබුණා. යම් යම් අලකලංචි තිබුණා වෙන්නට පුළුවන්. රටක උද්ඝෝෂණ, විරෝධතා නොයෙක් දේවල් ඇති වෙනවා. ඒකාබද්ධ විපක්ෂය නොයෙක් බයිලා ගහනවා. එතුමන්ලා පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටියත්, පාර්ලිමේන්තුවේ කටයුතු කඩාකප්පල් කළා. ආණ්ඩු පක්ෂයට ආවත්, අද වන විට අඩුම ගණනේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය පැත්තේ වාඩි වෙන්න බැරි තත්ත්වයකට පත්වෙලා අවසානයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවට කැඳවනවාය කියන්නේ හරියට මස් කඩයකට හරකෙක් දක්කා ගෙන යනවා වාගෙයි. මස් කඩයකට හරකෙක් දක්කා ගෙන යන්න බැහැ. ඌට ඉවෙන් දැනෙනවා, "මේ ගෙනයන්නේ මාව මරන්න"යි කියලා. දැන් එතුමන්ලාව පාර්ලිමේන්තුවට ගෙනෙන එකත් මරන්න ගෙන එනවා වාගේයි. අදත් විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්න හිටියා. ඒක ගෙනාවොත් ඒ අයගේ සායම් ඔක්කෝම යන බව දන්නවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ වැදගත් අවස්ථාවේ දී කථා කරන්න බොහෝ දේවල් හදවතට නැගුණත් ඒවා වචනයට නහන්න පුළුවන්කමක් නැහැ. ඒ තරම් දැඩි සංවේදීතාවක් තිබෙනවා.

මේ වෙනකොට මේ රටේ දෙකෝටි දසලක්ෂයක් ජනතාව අතරින් දහහතර ලක්ෂයක් සමෘද්ධිය ගන්න බැරි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. දහහතර ලක්ෂයකට ආසන්න රජයේ, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට පඩි ගෙවන්න බැරි තත්ත්වයක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් මේ රටේ දුක් විඳින අහිංසක ජනතාවගේ දරුවන් වෙනුවෙන් ගෙනා නිල ඇඳුම් ටික දෙන්න පුළුවන්කමක් නැති වෙලා තිබෙනවා. නිවාඩු කාලය ආරම්භ වෙලා නොවැම්බර් මාසයේ දරුවෝ පාසලෙන් ගෙදර යනකොට නිල ඇඳුම් සඳහා වන රෙදි කැල්ල, නැත්නම් වවුචරය අරගෙන ගිය යුගය අවසන් කරලා, ලබන අවුරුද්දේ ඔවුන් අලුත් පන්තියට එනකොට පරණ ඇඳුම් ටික ඇඳගෙන එන තැනට පත් කරන්න තරම් මේ ආණ්ඩුව බංකොලොත් තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රට සම්පූර්ණයෙන් අකාර්යක්ෂම වෙලා. රාජ්‍ය ක්ෂේත්‍රය තුළ නිලාධාරීන් වැඩ නොකරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි දන්නවා, "ගම්පෙරළිය" තුළින් හැම ආසනයකටම රුපියල් ලක්ෂ 2,000 බැගින් ගෙනාවා, නොයෙක් විධියේ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළා. ඒ වාගේම නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටට විශාල වශයෙන් ආයෝජන ආවා කියලා අපි දන්නවා.

මම ඊයේ එක්තරා සංචාරක හෝටලයකට ගියා. ඒ හෝටලයේ reservations සියයට 95ක් කැන්සල් කරලා. මේ රටට සංචාරකයින් ලක්ෂ 35ක් එන්න හිටියා. මේ රටේ අපනයන ආර්ථිකය ගොඩනංවන්න ඕනෑ කියලා, මේ රටේ සංචාරක ව්‍යාපාරය තුළින් දේශීය ආයෝජන ඇති කරන්න කියලා කටයුතු කරපු රට අද සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටිලා. ගරු වජිර අබේවර්ධන මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට පසුගිය අවුරුදු තුනයි මාස තුනට ගාල්ල නගරය තුළ තරු පහේ හෝටල් තුනක් හදන්න ශක්තියක් ලැබුණේ අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පෙරමුණු රජය සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව දැක්වූ වැදගත් ප්‍රමුඛතාව නිසයි. ඒ විතරක් නොවෙයි, අද ඉතාමත් කනගාටුදායක සිද්ධියක් මම දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන්වූ කාලය දැන් අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
අධිකරණයෙන් *quo warranto* එකක් දීලා තිබියදී, මහින්ද රාජපක්ෂ මහත්මයා නැවත අගමැති කරන්න කියලා කරාපිටිය රෝහලේ ප්‍රධාන මේට්‍රන්වරිය පෙත්සමක් අත්සන් කරගෙන

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

යනවා, එක්තරා හිමිනමක් කටයුතු කරන වෘත්තීය සමිතියකින්. අපි කථා කරලා අද ඒක නතර කළා. කාර්යාලවල දැන් කෙරෙන්නේ මොකක්ද කියලා බලන්න. මහින්ද රාජපක්ෂ නැවත අගමැති කරන්න කියලා පෙත්සම් අත්සන් කරනවා. අභියාචනාධිකරණයේ, විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ සඳහා වන නඩුවක් තිබියදී අද ඇතැම් පෙලඹවීම් කරන්න කටයුතු කරනවා. මෙවැනි තත්ත්වයන් අපි හෙළා දකිනවා.

මේ පාර්ලිමේන්තුවට යම් වග කීමක් තිබෙනවා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරමින් ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා වගේ, ඔක්තෝබර් 26වැනි දින සිට මේ දක්වා මාස එකහමාරකට ආසන්න කාලයක් මේ රටේ සිදු කළ අයථා ගෙවීම්, ඒ වාගේම මුල්‍යමය වංචාකාරී සිදුවීම්, අයථා පත්වීම්, ඒ වාගේම බොහෝ සේවකයින් දොට්ට දැමීම් පිළිබඳව පාර්ලිමේන්තුව මඟින් කාරක සභාවක් පත් කරලා පුළුල් පරීක්ෂණයක් කරලා ඒ තුළින් වැරදිකරුවන්ට දඬුවම් කළ යුතුයි. නැවත මේ වගේ සිද්ධියක් ඇති වුණු වෙලාවක; මේ වගේ සංක්‍රාන්ති වෙලාවක; නොනගතය වෙලාවක ඒ අයට ඕනෑ විධියට රටේ සම්පත් මංකොල්ල කන්න, රටේ සම්පත් ඉතාමත් ව්‍යාකූල තත්ත්වයට පත් කරන්න ඉඩ දෙන්න බැහැ. එම නිසා පාර්ලිමේන්තු මැතිවරණය නොවෙයි, වෙනත් මැතිවරණයක් නොවෙයි, වහාම මේ රටේ ජනාධිපතිවරණයක් කැඳවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරන, එය කඩනොකරන, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ආරක්ෂා කරන කවුරු හෝ ජනාධිපතිවරයෙක් පත්කර ගැනීම සඳහා කටයුතු කරන්නය කියලා අපි ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.1.06]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ එක්සත් ජාතික පෙරමුණට බහුතරයක් තිබෙනවා කියලා අපි ඔප්පු කරලා තිබෙනවා. ඒ වාගේම මෙම ප්‍රජාතන්ත්‍රවාදී සටන තුළ අනෙක් පක්ෂවල එකතු වීමත් සමඟ අති බහුතරයක් තිබෙනවා. ඒ වාගේම අද රට තුළ තිබෙන එකමුතුභාවය නිසා ජාතිවාදය අවුස්සන්න යම් කිසි වෑයමක් තිබෙනවා කියලා පෙනෙනවා. මොකද, ද්‍රවිඩ පක්ෂත් මේ ප්‍රජාතන්ත්‍රවාදී සටන තුළ සිටීම නිසා. මේ වගේ බාල දේශපාලනයක් තමයි මේ රට තුළ ඔවුන් සිදු කරන්නේ. ද්‍රවිඩ පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු ත්‍රස්තවාදීන් කියන අදහස තමයි ඔවුන් වක්‍රව ඉදිරිපත් කරන්න හදන්නේ. ඒක අපි සම්පූර්ණයෙන්ම හෙළා දකින්න අවශ්‍යයි. මේ රටේ ඉපදුණු සෑම කෙනෙකුටම එක හා සමාන අයිතියක් මේ රට තුළ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ගිය සතියේ ස්වර්ණවාහිනියේ "රතු ඉර" දේශපාලන සාකච්ඡාවේ ඉන්නකොට, මම එතැන හිටපු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට "මන්ත්‍රීතුමා" කියලා තමයි ආමන්ත්‍රණය කළේ. මොකද, ආණ්ඩුවක් නැහැයි කියන තීරණය පාර්ලිමේන්තුව තුළ සම්මත වුණු නිසා.

ඒ අවස්ථාවේදී ඔහු මා දෙසට හැරිලා, "ඔබත් ත්‍රස්තවාදියෙක්" කියලා කිව්වා. ඒ ඇයි කියලා මම ඇහුවා. "මොකද, ඔබතුමා මේ ආණ්ඩුව පිළිගන්නේ නැහැ, මට මන්ත්‍රීතුමා කියා සඳහන් කරනවා නේ" කියලා එතුමා කිව්වා. නමුත්, -ඇත්තටම ආණ්ඩුවක් නැහැ.- ආණ්ඩුවක ස්වභාවය පොරවා ගෙන ක්‍රියා කරන්න යන මන්ත්‍රීවරුන්ට ඇමතිවරුන් හැටියට ක්‍රියා කිරීමෙන් වළකින්න කියා ඊට දවස් දෙකකට පසුව මේ රටේ උසස්ම අධිකරණය තීරණය කළ බව අපි දන්නවා. ඒ සාකච්ඡාව යනකොට කිව්වේ, "නැහැ, නැහැ, ඔබතුමන්ලා ත්‍රස්තවාදීන්ට උදව් කරන්න හදනවා" කියායි. නමුත් ඇත්ත කථාව මොකක්ද? මේ වාගේ අසත්‍ය දේවල් ජනතාව අතරේ ව්‍යාප්ත කරන්න හදන එක මේ රටට බොහොම අවාසියි.

එල්ටීටීඊ සංවිධානය තිබෙන කාලයේ ඇත්තටම එම සංවිධානයට මුදල් දුන්නේ කවුද? ජනාධිපතිවරණයට කලින්; මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂක වෙලා සිටි අවස්ථාවේදී මුදල් දුන් ආකාරය ගැන අපට දැන් මතක් වෙනවා; උතුරේ සිටි, හය ලක්ෂයකට වැඩි ඡන්ද දායකයන් සංඛ්‍යාවකගේ ඡන්ද වරම භාවිත කිරීම වැළැක්වීමට කටයුතු කළ ආකාරය අපට මතක් වෙනවා. එහි කොටස් දෙකක් තිබුණා. පළමුවැනි කොටස වුණේ, යම්කිසි මුදලක් දීලා කෙසේ හෝ ඡන්ද වර්ජනයක් කිරීමයි. දෙවැනි කොටස වුණේ, මැතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ යමක් උතුරට කරගෙන යන්න එල්ටීටීඊ එකට මුදල් ලබා දීමයි.

හිටපු මන්ත්‍රී ටිරාන් අලස් මහතාගේ නිවසට 2010 ජනවාරි මාසයේ 22වන දා grenade එකකින් ගහපු ආකාරය මට මතකයි. ඒ අවස්ථාවේ ඔහු මාධ්‍යයට කථා කළා. මාධ්‍යය එය පටිගත කරලා, රට වටේටම එය අහන්න සැලැස්වූවා. ටිරාන් අලස් මැතිතුමා ප්‍රසිද්ධියේ කියා තිබෙන දේයි මම මේ වාර්තාවලින් අරගෙන කියවන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඔහු ඒ අවස්ථාවේදී මාධ්‍යයට කියා තිබෙන දේවල් මම දැන් කියන්නම්.

"එම්ල් කාන්තන් කියන පුද්ගලයා මම දැන හඳුනාගත්තේ 2002 වර්ෂයේ ඔහු පුනරුත්ථාපන අමාත්‍යාංශයේ සේවය කළ කාලයේදී. ඒ කාලයේ මට මතකයි, දවසක් මටත් නොකියාම මංගල සමරවීර ඇමතිතුමා මාව දමා තිබුණා, ඡන්ද ව්‍යාපාරය කරන කමිටුවක සම්බන්ධීකාරක හැටියට. මම ඕකට අරලියගහ මන්දිරයට ගිය වෙලාවේ එවකට අගමැති මහින්ද රාජපක්ෂ මට පැත්තකට අඬගහලා මගෙන් ඇහුවා, 'ඔයා අඳුරනවා නේ, ඒ පැත්තේ අය. මට කොහොම හරි එල්ටීටීඊ සංවිධානය සමඟ සාකච්ඡා කරන්න ඕනෑ, කවුරුත් ඉන්නවාද, මේක කරලා දෙන්න පුළුවන්ද?' කියා"

ටිරාන් අලස් මැතිතුමාගෙන් මේක අහන්නේ මහින්ද රාජපක්ෂයි.

'එම්ල් කාන්තන් කියලා කෙනෙක්ව මම දන්නවා. එයා ඒ පැත්තේ එක් කෙනෙක්. හැබැයි, එයා දැන් කොළඹ ව්‍යාපාර කරගෙන ඉන්නේ. මට ඕනෑ නම් ඔහුව මුණ ගස්සලා දෙන්න පුළුවන්. මම දන්නවා ඔහුට ඒ පැත්තේ සියලුදෙනා සමඟ සම්බන්ධකම් තිබෙන බව' යනුවෙන් මම ඒ වෙලාවේ කිව්වාය කියා ටිරාන් අලස් මැතිතුමා කියනවා. ඒ කියන්නේ, ටිරාන් අලස් මැතිතුමා මේ ත්‍රස්තවාදයට සම්බන්ධ නැහැ. ඔහු ව්‍යාපාරිකයෙක්. ඔහු ඒ වනකොට එම්ල් කාන්තන්ව හඳුනනවා. "ඕනෑ නම් එම්ල් කාන්තන්ව හඳුන්වා දෙන්න පුළුවන්" කියා ඔහු ඒ අවස්ථාවේ කියා තිබෙනවා.

ඊළඟට ඔහු කියන්නේ මොනවාද?

"එම්ල් කාන්තන්ට මම දවසක් කථා කරලා කිව්වා, 'මෙන්න මේ බැසිල් රාජපක්ෂ මුණ ගැසෙන්න ඕනෑ, අගමැති මහින්ද රාජපක්ෂ වෙනුවෙන්, පුළුවන්ද?' කියා. එසේ කිව්වාම, දවසක්

යොදාගෙන මගේ කාර්යාලයේදී බැසිල් රාජපක්ෂ ඇවිල්ලා එමිල් කාන්තන්ව මුණ ගැහුණා. එදා ඉඳලා දිගටම බැසිල් රාජපක්ෂයි, එමිල් කාන්තනුයි අතරේ සාකච්ඡා පැවතුණා, 'එල්ටීටීඊ සංවිධානය කොහොමද මහින්ද රාජපක්ෂගේ ඡන්ද ව්‍යාපාරයට උදවු කරන්නේ' කියලා...."

දැන් මේ දේවල් කියවන්න මට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. මොකද, මේවා අතීතයේ සිද්ධ වුණු දේවල්. නමුත් මේවා කියවන්න වෙලා තිබෙන්නේ, ඒ වාගේ දේවල් කරන නිසායි.

ඔහු තවදුරටත් මේ ගැන කියනවා.

"අන්තිමට නොවැම්බර් මාසයට කිට්ටු වෙනකොට බැසිල් රාජපක්ෂ මහතා දවසක් මගේ ඉදිරිපිටදී එමිල් කාන්තන්ට මෙහෙම කිව්වා, 'අගමැතිතුමා කියනවා, අපේ සම්බන්ධය තහවුරු කිරීමට අපි කැමැතියි, ඒ පැත්තේ මොනවා හරි වැඩ කරලා දෙන්න. මොනවාද අවශ්‍ය' කියලා. එතකොට ඔහුත් පිළිතුරු දෙනවා. 'ඒක මම දන්නේ නැහැ. මම අහලා කියන්නම්' කියලා ඔහු සඳහන් කරනවා. 'අපි ඉල්ලා සිටින්නේ පුළුවන් නම් කොහොම හරි උතුරු-නැඟෙනහිර ඡන්දය වර්ජනය කරලා දෙන්න කියලායි' " .

"උතුරු-නැඟෙනහිර ඡන්දය වර්ජනය කරලා දෙන්න" කියන ඉල්ලීම කරනවා! "එහෙම ඡන්ද වර්ජනය කළොත් දකුණේ ඡන්දයෙන් අනිවාර්යයෙන්ම මහින්ද රාජපක්ෂට ජනාධිපති වෙන්නට පුළුවන්" කියලා ඒ අවස්ථාවේදී සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Eran Wickramaratne, you have two more minutes.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කරුණාකර මට ඊට වඩා තව ටිකක් වෙලාව ලබාදෙන්න. මම මේ කරුණු කියලා, ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මෙන්න අහගන්න, එතැනදී කියපු තවත් දේවල්.

"බැසිල් ඔයා එදා ඇහුවා නේද, අපට මොනවාද ඕනෑ කියලා? අපට බෝට්ටු අවශ්‍යයි කියලා තිබෙනවා. ඒ වෙනුවෙන් මොනවා හරි උදව්වක් කරන්න පුළුවන්ද?"

"ඒකට කීයක් යනවාද?" කියා එතකොට අහනවා. "ඒකට මිලියන 180ක් යනවා" කියනවා. "නැහැ, ඒකට කිසි ප්‍රශ්නයක් නැහැ, අපි ඒ මුදල දෙන්නම්" කියලා සඳහන් කරනවා.

ඊට පස්සේ ඔහු මොකක්ද කියන්නේ?

"බැසිල් ආවේ ලොකු travelling bags කීපයක් අරගෙන. Bagsවල ගෙනැල්ලා...."

මේ අපි කියන දේවල් නොවෙයි. මේවා කියන්නේ එක පැත්තේ එකට වැඩ කරපු මිනිසුන්; ඡන්දයේදී එකට වැඩ කරපු මිනිසුන් කියපු දේවල් මේ. මේවා අපි හදලා කියන දේවල් නොවෙයි. රටේ බොරු මත ගොඩනඟන්න හදනකොට අපට මේවා කියන්න වනවා. අද මම මේ කියන සියලු දේවල් තිබෙන්නේ ඒ වාර්තාවේයි.

"මගෙන් ප්‍රශ්න කළේ එමිල් කාන්තන්ගේ ගෙවල් හදලා දුන්න නිසාද? ඒවා මේ වෙලාවේ කියනවා, 2007දී ත්‍රස්ත විමර්ශන ඒකකයට මම දුන් කට උත්තරවල මම දැන් කියන හැම දෙයක්ම ලියැවිලා තිබෙනවා; ත්‍රස්ත විමර්ශන අංශයේ හැම දෙයක්ම ලියැවිලා තිබෙනවා. මම මේක අද කියන්නේ, මාව ඝාතනය කරන්න හදන නිසායි. මම සියලුදෙනාටම දැන ගන්න මේ දේවල් කියනවා" කියාත් ඒ අවස්ථාවේදී ඔහු කියනවා.

"අන්තිමට දුන්නේ මිලියන 180ක්, අපේ ලංකාවට ළඟම තිබෙන රටවලින් තානාපති කාර්යාල හරහා ඡන්ද කටයුතුවලට ඩොලර්වලින් යම්කිසි ගණනකුත්, -ඩොලර් නෝට්ටු ගණනකුත්- ලබා දුන්නා. සිංගප්පූරුවේ ලොකු ආයතනයක් තිබෙනවා, ඒ ගොල්ලන් වෙනුවෙන් ගොඩක් වැඩ කරන ආයතනයක්. ඒ අයගේ සල්ලි -ඩොලර්- රුපියල් බවට transfer කරලා, රුපියල්වලින් මිලියන 180ක් ගෙනැත් භාර දුන්නේ, බැසිල් රාජපක්ෂ" කියාත් ඔහු තවදුරටත් සඳහන් කරනවා.

මේ වාර්තාවේ හුඟක් දේවල් තිබෙනවා. වෙලාව නැති නිසා ඒ සියල්ලක්ම කියන්න අපහසුයි. නමුත් මම මේවා කියන්නේ, ත්‍රස්තවාදීන්ට සල්ලි දුන්නේ කවුද කියන එක පෙන්වන්නයි. බොරු දේවල් ප්‍රචාර කරන්න වෑයම් කරනකොට අපිට මේවා කියන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඡන්දය දිනුවාට පස්සේ නිවාස යෝජනා ක්‍රමයකුත් ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබුණා. ඡන්දයට කලින් මේවා පොරොන්දු වෙලා, මුදල් දීලා, දෙවැනි කොටසට ඇවිල්ලා, ඊට පස්සේ ඒකටත් මුදල් දීලා, ඒක වහ ගන්න එවකට ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂගේ අත්සනින් යුතුව 2006 අගෝස්තු මාසයේ 02වන දා Cabinet Paper එකක් ඉදිරිපත් කරනවා. Nation Jayalanka Housing Programme එකේ පළමු අදියර, 437 ඒ, 3වන පටුමඟ, තිරුනාවට්කුලම්, තාණ්ඩික්කුලම්, වවුනියාව කියන ස්ථානයේ තිබෙන B & K Holdings (Pvt) Limited එකට දෙනවා. එම සමාගම ලියා පදිංචි කර තිබෙන්නේ ඊට මාසයකට විතර කලිනුයි. මෙවැනි විශාල යෝජනා බොරු කොම්පැනිවලට දෙනවාද?

ත්‍රිකුණාමලයේ නිවාස 400කුත්, දෙවනුව මඩකලපුවේ නිවාස 400කුත් ගොඩ නඟන්න දීලා තිබෙනවා. මේකේ ඒ ගැන විස්තර තිබෙනවා. ඊට පස්සේ කියනවා, අනෙක් දිස්ත්‍රික්කවල තවත් නිවාස 400ක් ගොඩ නඟමු කියා. නිවාස 1,200ක් ගොඩ නඟන්න රුපියල් මිලියන 757කට වැඩිය දීලා තිබෙනවා. ඊට පස්සේ මේක කැබිනට් මණ්ඩලයට දමා සම්මත කර ගන්නවා. ඊට පස්සේ RADA - Reconstruction and Development Agency - එකට කියනවා, Board Paper එකක් දමා ඒ Board Paper එක අනුමත කරන්න. මොනවාද මේ කරන්න හදන්නේ? වැරදි ලෙස කරන දේ මේ ගොල්ලන් නීත්‍යානුකූල කරන්න හදනවා. RADA එකට ආපුවාම RADA එකේ ඒ අධ්‍යක්ෂවරු මේක ප්‍රශ්න කරන්නේ නැහැ. ඒ නිසා මම කියන්න ඕනෑ, සාලිය වික්‍රමසූරිය වාගේ අහිංසක මිනිස්සුන්ටත් අපේ රජය කාලයේ හිර හාරයේ සිටින්න වුණේ මේ වාගේ දූෂිත වැඩ කරපු නිසා තමයි කියා. ඇයි, ඒ වෙලාවේ ඒ අය මේවා ප්‍රශ්න කළේ නැහැ. ඒ නිසා ඒ අයට මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට පස්සේ මේ ගරු සභාවේ 2007 සැප්තැම්බර් මාසයේ 20වැනි දා දීර්ඝ සාකච්ඡාවක් තිබුණා. ඒක මම කෙටියෙන් කියා මගේ කථාව අවසන් කරන්නම්. 2007 සැප්තැම්බර් මාසයේ 20වැනි දා මේ ගරු සභාවේ පැවැති දීර්ඝ සාකච්ඡාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙලා තිබෙනවා. ඒ සාකච්ඡාවේදී ඉස්සෙල්ලාම ගරු මංගල සමරවීර මැතිතුමා කථා කරමින් මෙසේ කියා තිබෙනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

"යාපනයේ දිස්ත්‍රික්කයේ ඡන්දදායකයන් ලක්ෂ 7ක් හිටියා. නමුත්, උතුරේ ඡන්ද වර්ජනය නිසා ඡන්ද පාවිච්චි කළේ 8,524යි. වන්නි දිස්ත්‍රික්කයේත් ඒ වාගේම තිබුණා. අපි මේක පොඩ්ඩක් බලමු 1999 තිබුණු ඡන්දය එක්ක. එතකොට අපට පෙනෙනවා සියයට 70ක් ඡන්ද දැම්මා කියා. ඒ සියයට 70න්, සියයට 70ක් රනිල් වික්‍රමසිංහ අපේක්ෂකයාට ආවේ. සියයට 25යි මහින්ද රාජපක්ෂට ගියේ." කියා.

ඊට පස්සේ ඔහු මෙතැනදී මෙහෙම කියනවා. එය 2007 සැප්තැම්බර් මාසයේ 20වැනි දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 496හි සඳහන් වෙනවා:

"ගරු කථානායකතුමනි, ඒ නිසා මෙතැනින් පැහැදිලිවම පෙනෙනවා, විශේෂයෙන්ම උතුරුකරයේ සංවිධානාත්මක ඡන්ද වර්ජනයක් දියත් කර තිබුණු බව."

තවදුරටත් එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 499හි මෙහෙම සඳහන් වෙනවා:

"පළමු වන සාකච්ඡාවට මම, අපේ බැසිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, විරාන් අලස් මහතා, මෙතුමා තමයි සහභාගි වුණේ. ඊට පස්සේ අප දන්නවා, - අප නම් ඡන්දය වෙනුවෙන් රට වටේ ගියා."

ඊට පස්සේ මොනවාද වුණේ කියන එක ගැන මෙතැන ඔහු සඳහන් කර කියනවා. ඒ ගොල්ලන් ගියේ සියලුම දෙනා එකතු කරගන්න. ඊට පස්සේ ඡන්ද වර්ජනයකට ගිහිල්ලා තිබෙනවා කියා කියනවා. ඒ වාගේම, මේ සාකච්ඡාව තුළදී ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා මෙවැනි ප්‍රකාශයක් කර තිබෙනවා. ඒකත් මම මේ ගරු සභාවට කියන්නට අවශ්‍යයි. එතුමා මෙහෙම කියනවා. එය එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 528හි මෙහෙම සඳහන් වෙනවා:

"රට ඉදිරියේ බොහොම පැහැදිලි ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමති ධුරයක් දරූ අමාත්‍යවරයෙක්, ඒ අමාත්‍ය ධුරය විතරක් නොවෙයි, සම්පූර්ණයෙන් ම ඒ ආණ්ඩුව මෙහෙය වීමේ කටයුතුවල තීරණාත්මක වැඩ කොටසක් ඉටු කළ ඇමතිවරයෙක් අද රජයට චෝදනාවක් ඉදිරිපත් කර තිබෙනවා. රජය පාර්ශ්වයෙන් එදා ජනාධිපතිවරණ අවස්ථාවේ දී එල්ටීටීඊ සංවිධානය සමඟ රහස් ගිවිසුමක් අත්සන් කළාය කියන චෝදනාවයි, ඒ. ඒක සරල නැහැ. ඒක ඉතාම බරපතළයි. මේ රටේ අනාගතය පිළිබඳව, රටේ අනාගතය කොයි දිසාවට ද ගමන් කරන්නේ කියන එක පිළිබඳව සිතා බලනකොට එහෙම තත්ත්වයක් ඇති වුණා නම් ඉතාමත්ම බරපතළ තත්ත්වයක්. ඒ පිළිබඳව සොයා බලන්නට විශේෂ කාරක සභාවක් පත් කරන්නය කියා තමයි මේ යෝජනාව ඉදිරිපත් වෙලා තිබුණේ."

එතුමා මුලින් "ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමති ධුරයක් දරූ අමාත්‍යවරයෙක්," කියලා කිව්වේ මංගල සමරවීර මැතිතුමාටයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් එතුමාගේ කථාවේදීම සඳහන් කරනවා, මේ මම කියපු කරුණු ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ටිකත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. එදා ගරු සභාවේදී ශ්‍රීපති සූරියආරච්චි මැතිතුමා තමයි මේ විවාදයේ අවසාන කථාව කළේ. එතුමාගේ කථාවෙන් උපුටා ගත් පොඩි කොටසක් මම කියන්න කැමැතියි. කාලය නැති නිසා මම බොහොම කෙටියෙන් කියන්නම්. එතුමා මෙහෙම ප්‍රකාශ කර තිබෙනවා. එය එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 568හි මෙහෙම සඳහන් වෙනවා:

"එහෙම භයියක් තිබ්ලා, ඒ වෙලාවේම ඒ සාකච්ඡාවෙන් අයින් වෙලා නැතිටලා එළියට ආවා. නැතිටලා ආවාට පසුව - [බාධා කිරීමක්] ඊට පසුව නැවත දින දා ගෙන මේ කටයුතු නැවත දිගට ගෙන ගියේ මේ බැසිල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේම පිරිස."

ඊට පස්සේ ශ්‍රීපති සූරියආරච්චි මන්ත්‍රීතුමා ඒ කථාව අවසන් කරනකොට මෙහෙම කියනවා. එය එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 580හි මෙහෙම සඳහන් වෙනවා:

"ගරු මංගල සමරවීර මන්ත්‍රීතුමා උදෑසන කථාවේ දී ප්‍රකාශ කළා වාගේ ම ඡන්දයට ඉස්සෙල්ලා රුපියල් මිලියන 200ක් - සියය සියය ගණනේ - එල්ටීටීඊ එකට මුලින් ම දුන්නා. එහෙම දුන්නා නම්, එය එල්ටීටීඊ සංවිධානයට ප්‍රතිලාභයක් නොවෙයි ද?"

මම මේක කියන්න හේතුව මේකයි. මේ වෙලාවේදී "අරයා සල්ලි දුන්නා. මෙයා සල්ලි දුන්නා." කියා ජාතිවාදී ප්‍රශ්න අවුස්සන්න එපා. එදා ජාතිවාදී ප්‍රශ්න අවුස්සලා උතුරේ අයගේ ඒ ඡන්ද වර්ජනය කර, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා පැරැද්දුවේ ඔය වැරදි විධියටයි. සල්ලි දීලා තමයි පැරැද්දුවේ. නමුත්, මේ වාගේ කථාවල් කියා බේරෙන්නට බැහැ. එතුමන්ලා අදත් හදන්නේ ඕකම කරන්නයි. අද මේ රට එකතු කර අපි යායුතු ගමනක් තිබෙනවා. අද කියනවා, "අත් අඩංගුවේ ඉන්න අයව නිදහස් කරන්න යනවා." කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යුද්ධය ඉවර වෙලා දශකයක් විතර වෙනවා. අපි සම්පූර්ණයෙන්ම එකඟයි. ජනතා විමුක්ති පෙරමුණ ඒක කිව්වා. අපිත් ඒක සමඟ එකඟයි. ඔය හිර භාරයේ ඉන්න අයට නඩු දමන්න ඕනෑ. නඩු දමන්න ඕනෑ. නැත්නම්, ඒ අයව නිදහස් කරන්න ඕනෑ. ඒක ජාතිවාදය නොවෙයි. ඒක තමයි සාධාරණත්වය කියන එකත් කියන්න අවශ්‍ය වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලබා දුන් කාල වේලාව වෙනුවෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[පි.ප. 1.22]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

உயர் சபைக்குத் தலைமைதாங்குகின்ற கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடந்த ஒக்ரோபர் மாதம் 26ஆம் திகதி நடைபெற்ற நிகழ்வு காரணமாக ஏற்பட்ட இழுபறியான நிலைமைகள் பற்றியும் அதனால் ஏற்பட்ட கௌரவக் குறைவுகள் மற்றும் எமது நாட்டுக்கு ஏற்பட்ட அல்லது எமது பாராளுமன்றத்திற்கு ஏற்பட்ட இழுக்குப் பற்றியும் நாங்கள் இப்போது பேசிக் கொண்டிருக்கின்றோம். கடந்த ஒக்ரோபர் மாதம் 26ஆம் திகதி யாரும் எதிர்பார்க்காத விதத்தில் புதிதாக பிரதமர் ஒருவர் நியமிக்கப்பட்டார். அதேபோன்று, பாராளுமன்றம் நவம்பர் மாதம் 16ஆந் திகதி வரை ஒத்திவைக்கப்பட்டது. அதன் பின்னர், புதிதாக நியமிக்கப்பட்ட அந்தப் பிரதமர் அறுதிப் பெரும்பான்மைப் பலத்தினைப் பெறுவதற்காகச் சில தவறான வழிமுறைகளில் - பணம், பதவிகள் மூலமாக ஏனைய கட்சிகளில் இருக்கின்றவர்களைச் சம்பந்தப்பட்டவர்கள் தங்கள் பக்கம் ஈர்ப்பதற்கான செயற்பாடுகள் நடைபெற்றுக் கொண்டிருந்தன. மாற்றுக் கட்சியில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் தரகர்கள் மூலமாக விலை பேசப்பட்டார்கள்; அவர்களுக்குப் பதவிகள் கொடுப்பதாகக் கூடச் சொல்லப்பட்டது. எது எப்படியாக இருந்தாலும், எமது தமிழ் தேசியக் கூட்டமைப்பைப் பொறுத்தமட்டில் நாங்கள் ஒருநாளும் இந்தப் பணத்திற்கோ பதவிகளுக்கோ அடிபணிந்து போகின்றவர்கள் அல்லர் என்ற அடிப்படையில் எமது கட்சியிலிருந்து எவரும் அங்கு செல்ல முடியாதிருந்தாலும்கூட, ஒருவர் அந்தப் பேரம் பேசலுக்குட்பட்டுச் சென்றுவிட்டார். இன்று அவரது கதி என்னவென்பதைப் பற்றி அவரே சிந்தித்து, உணர வேண்டியவராக இருக்கின்றார்.

ஒரு நல்லாட்சியின் தலைவராக ஜனாதிபதி அவர்களைப் பார்க்க வேண்டும்; அவரது ஆட்சிக் காலத்தின்போது

இங்கிருக்கின்ற தேசிய இனப் பிரச்சினை தீர்க்கப்பட வேண்டும் என்ற அடிப்படையில் எமது வடக்கு, கிழக்குப் பிரதேசத்திலுள்ள மக்கள் அங்குள்ள ஒவ்வொரு மாவட்டத்திலிருந்தும் 80%, 85%, 90% என்ற சதவீதத்தில் வாக்குகளை அளித்து அவரைத் தெரிவு செய்தார்கள். அவர் எளிமையானவர், நீதியானவர், நியாயமானவர், சர்வதிகாரத்திற்கு எதிரானவர் என்றெல்லாம் எமது மக்கள் அவரைப் பற்றிப் பேசிக் கொண்டிருந்தார்கள். சர்வதேச ரீதியாகக்கூட அவரை ஏற்றுக்கொண்டார்கள். அதாவது நோபல் பரிசு பெறக்கூடிய, சமாதானத்தை நிலைநாட்டக் கூடிய, இலங்கையின் இனப் பிரச்சினையைத் தீர்க்கக்கூடிய ஒரு தலைவர் என்று எல்லாம் அவரைப் பற்றிப் பேசப்பட்டது. ஆனால், அவருக்கு இன்று என்ன நடந்ததென்று தெரிய வில்லை. எவரும் எதிர்பார்க்காத விதத்தில் 225 பாராளுமன்ற உறுப்பினர்களின் தலைவிதியை தனியொருவராக இருந்து தீர்மானிக்கக் கூடியதொரு நிலைமைக்கு அவர் வந்துள்ளார். சுருக்கமாகச் சொன்னால், 5 ஆண்டுகளுக்கென்று மக்கள் ஆணையைப் பெற்றிருக்கின்ற இந்தப் பாராளுமன்றத்தினைத் திடீரென்று இடைநடுவில் கலைத்து விடுவதற்கான ஒரு கட்டளையைக்கூட அவர் விடுத்திருந்தார். இதன் மூலமாக அவர் எமது மக்கள் மத்தியில் அவருக்கிருந்த அபிப் பிராயத்தினை, அபிமானத்தினைத் தானாகவே குறைத்திருக் கின்றார். எனவே, பாராளுமன்ற வரலாற்றில் கறைபடிந்த ஒரு நிகழ்வினைப் பதிவு செய்யாமல், தயவுசெய்து ஜனநாயகத்துக்கு மதிப்பளித்துச் செயற்பட வேண்டுமென்று நாங்கள் ஜனாதிபதி அவர்களிடம் உருக்கமாக, விநயமாக இப்போதும்கூட கேட்டுக் கொள்கின்றோம்.

கடந்த காலத்தில் அவருடைய பதவியேற்பு வைபவம் வெறும் 5,000 ரூபாய் செலவில்தான் மேற்கொள்ளப்பட்டதாகச் சொல்லப்பட்டது. அதற்காக அவரை மக்கள் பாராட்டினார்கள். அவ்வாறான அபிப்பிராயத்தை, அபிமானத்தைப் பெற்றிருந்த ஜனாதிபதி அவர்கள் இன்று திடீரென்று சர்வதிகாரப் போக்கில் தனது ஆணையை விடுத்திருப்பது போன்று தெரிகின்றது. "225 பாராளுமன்ற உறுப்பினர்களும் இவர்தான் பிரதமர் என்று சொன்னாலும் அந்தக் குறிப்பிட்ட நபரை நான் நியமிக்கமாட்டேன்" என்று அவர் கூறுவதை, ஒரு வகையில் 225 பாராளுமன்ற உறுப்பினர்களின் கருத்தினையும் புறம்தள்ளுகின்ற அல்லது நிராகரிக்கின்ற அல்லது அவர்களுடைய கௌரவத்தைக் குறைக்கின்ற ஒரு செயற்பாடாகத்தான் எங்களால் மதிப்பீடு செய்யக்கூடியதாக இருக்கின்றது. இன்றைய நிலையில் பாராளுமன்றத்தில் ஏற்பட்டிருக்கின்ற இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்காக ஜனாதிபதி அவர்கள் தாமதமாக முடிகளை எடுத்துக் கொண்டிருக்கின்றார். 24 மணித்தியாலயத்துக்குள் நல்லதொரு முடிவினை எடுப்பதாகச் சொன்னவர், இப்போது ஒரு கிழமைக்குள் முடிவைப் பெற்றுத்தருவதாகச் சொல்லிக் கொண்டிருக்கிறார். இந்தக் கருத்துக்கள் மக்கள் மத்தியில் ஏமாற்றத்தை ஏற்படுத்துவதாக இருக்கின்றன. இது வரவு செலவுத் திட்டம் விவாதிக்கப்படுகின்ற காலமாக இருக்கின்றது; பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கு 'கம்பெரலிய' திட்டத்தின் மூலமாக அபிவிருத்திகளைக் கொண்டு செல்லக்கூடிய காலகட்டமாகவும் இருக்கின்றது. 'சிவ பூஜையில் கரடி புகுந்தது போல' என்று தமிழில் ஒரு பழமொழி இருக்கின்றது. அதேபோன்று, திடீரென்று எவரும் எதிர்பார்க்காத விதத்தில் இந்தச் செயற்பாடுகள் மேற்கொள்ளப் பட்டிருக்கின்றன.

ஐக்கிய தேசியக் கட்சி, தமிழ்த் தேசியக் கூட்டமைப்பு, JVP, ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ், அகில இலங்கை மக்கள் காங்கிரஸ், தமிழ் முற்போக்குக் கூட்டணி போன்ற கட்சிகள் உயிராபத்துக்களின் மத்தியிலும்கூட அவருக்காகக் கடுமையாக உழைத்து, 2015ஆம் ஆண்டு ஜனவரி மாதம் 08 ஆம் திகதி அவருக்கு வெற்றிவாகையைப் பெற்றுக் கொடுத்திருந்தன. ஆனால், இன்று அவர் அந்தக் கட்சிகள் சார்ந்த தலைவர்கள் எவருடனும் கலந்தாலோசிக்காமல், அவருக்கெதிராக யார் யாரெல்லாம் செயற்பட்டார்களோ, அவரை யார் யாரெல்லாம் நிராகரித்தார்களோ, அவர்களுக்குத் திடீரென்று பதவிகளைக் கொடுத்து அலங்கரித்திருக்கின்ற செயற்பாடு என்பது ஒரு தலைகீழான மாற்றமாக இருக்கின்றது.

இன்றைய நிலையில் மக்கள் மத்தியில் ஒரு பதற்ற நிலை, பீதியான நிலை நிலவுகின்றது. மட்டக்களப்பில் வவுணதீவுப் பிரதேசத்தை எடுத்துக் கொண்டால், அந்தப் பிரதேசத்தில் மக்கள் சுமூகமாக, அந்நியோன்யமாக இயல்பான வாழ்க்கை வாழ்ந்து கொண்டிருக்கின்றபோது, திடீரென்று இரண்டு பொலிசார் சுட்டுக் கொல்லப்பட்டிருக்கின்றார்கள். இந்த நிகழ்வு எதனால் நடைபெற்றிருக்கின்றது? என்ற கேள்வி எங்கள் மத்தியிலிருக்கின்றது. கடந்த காலத்தில் பொலிசார் மத்தியிலும் அதிரடிப்படையினர் மத்தியிலும் மக்கள் மத்தியில் ஒரு நல்லுறவான செயற்பாடு இருந்துவந்தது. இவ்வாறு அமைதியாக, இயல்பு நிலையிலிருந்த சூழல் அன்று திடீரென்று எவரும் எதிர்பாராத விதத்தில் குழப்பப்பட்டிருக்கின்றது. திரை மறைவில் யாராவது சூழ்ச்சிகள் செய்து இந்த அமைதியான சூழலைக் குழப்பியிருக்கின்றார்கள். மீண்டும் தமிழ் மக்களுக்குத் தொல்லையைத் தருவதற்கான ஒரு திட்டமிட்ட சதி என்ற வகையில் மக்கள் இதனைப் பார்த்துக் கொண்டிருக்கின்றார்கள். உண்மையில் அந்தப் பொலிசார் சுட்டுக் கொல்லப்பட்டமையை நாங்கள் வேதனையோடு பார்க்கின்றோம். அவர்கள் சுட்டுக் கொல்லப்பட்டமை துரதிருஷ்டவசமான நிகழ்வாகும். அப்படியான நிகழ்வு நடந்திருக்கக் கூடாது. அப்படியான நிகழ்வில் ஈடுபட்டவர்கள் யாராக இருந்தாலும், அவர்கள் சட்டத்தின் முன்னிலையில் நிறுத்தப்பட வேண்டும்; அவர்களுக்குச் சட்டப்படியான தண்டனைகள் வழங்கப்பட வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். புனர்வாழ்வு பெற்ற முன்னாள் புலி உறுப்பினர்கள் பலரும் தற்போது கைதுசெய்யப்படு கின்றார்கள். கடந்த காலங்களிலும் மாவீரர் தினம் கொண்டாடப்பட்டது. அந்தவேளையில்கூட இப்படியான நிகழ்வுகள் நடக்கவில்லை. ஆனால், இன்று ஜனாதிபதி அவர்களால் அமைக்கப்பட்டுள்ள இந்த அரசாங்கத்தின் காலத்தில் இப்படியான துரதிருஷ்டவசமான, சதித்தனமான செயற்பாடுகள் நடைபெற்றிருக்கின்றன. இப்போது பலரும் கைது செய்யப்படுகின்றார்கள்; அமைதியாக இருந்த சூழல் ஒரு பதற்றமான சூழலாக மாற்றப்பட்டிருக்கின்றது. எனவே, இந்தச் சூழலை மீண்டும் ஒரு சுமுகமான நிலைக்குக் கொண்டு வருவதற்காக, ஜனநாயகத்துக்கு மதிப்பளித்து ஜனநாயக அடிப்படையில் பாராளுமன்றத்தில் அதிகமான உறுப்பினர்கள் யாரைப் பிரதமராகத் தெரிவு செய்ய விரும்புகின்றார்களோ அவருக்குப் பிரதமர் பதவியைக் கொடுப்பதன் மூலமாக மீண்டும் அவர் செய்த தவறைத் திருத்திக்கொள்ள வேண்டும் என்று இந்த இடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

உண்மையில் மக்கள் தற்போது ஒரு பதற்றமான நிலையில் இருக்கின்றார்கள். 'கம்பெரலிய' திட்டம் இடைநிறுத்தப்பட்ட நிலைபோன்று காணப்படுகின்றது. வரவு செலவுத்திட்ட நிகழ்வுகள்கூட இடைநிறுத்தப்பட்ட ஒரு நிலைமை காணப்படுகின்றது. நாங்கள் எல்லாவற்றுக்கும் நீதிமன்றம் சென்றுதான் நீதித்துறையிடம் தீர்ப்புக்களைப் பெறவேண்டிய நிலைமையிருக்கின்றது. எது எப்படியாக இருந்தாலும், எமது நீதித்துறை சர்வதேச ரீதியாக, சர்வதேச சமூகத்தினால்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு துறையாக இருப்பது எங்களுக்குக் கௌரவமளிக்கின்றது. எனவே, நீதித்துறையாவது எங்களுக்கு நீதியைத் தரும் என்ற நம்பிக்கையோடு எனது உரையினை நிறைவு செய்கின்றேன். நன்றி.

[අ.භා.1.30]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතියි.

වෛද්‍ය නලින් ද ජයතිස්ස මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙන මේ යෝජනාව මම අනුමත කරනවා. ආර්ථිකය ගැන කතා කළොත් සුමානයක් කතා කරන්න පුළුවන් අවස්ථාවක් තමයි මේ තිබෙන්නේ. නමුත් බොහොම කෙටියෙන් කරුණු දෙකක් හෙළි දරව් කිරීමටයි මට අවශ්‍ය වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වර්ෂය අවසන් වෙන්න අද සිට දවස් 25ක් තිබෙනවා. ඒ අතර වැඩ කරන දවස් 16ක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ වැඩ කරන දවස් බැලුවොත්, අපට තිබෙන්නේ දවස් 4යි. 2018 වර්ෂයට වෙන් වූ අය වැය අවසන් වූ පසු 2019 ජනවාරි මාසයේ පළමුවන දා පාන්දර 12.01 සිට මේ රටේ පාවිච්චි කරන්න යන හැම සතයක්ම මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරන්න අවශ්‍යයි. අද මේ රටේ බැරෑරුම් තත්ත්වයක් තිබෙනවා. රට අරාජිකයි. අගමැතිතුමකු බලහත්කාරයෙන් පැත්තකට දාලා තවත් අගමැතිකෙනකු පත් කරලා, ඒකත් උසාවියෙන් ප්‍රතික්ෂේප කර තිබෙන අවස්ථාවක කැබිනට් මණ්ඩලයක් නැත. ඒ නිසා මේ ඉතිරි දවස් 16 තුළ, ඉදිරි වර්ෂයට මුදල් වැය කරන්න අපට පුළුවන් වන්නේ කොයි ආකාරයටද කියන ප්‍රශ්නය ඇති වෙනවා. ඒ නිසා මා මේ අවස්ථාවේදී අවධාරණය කරන්නේ, කරුණාකර මෙය මූලික කරුණක් ලෙස සලකා ගෙන අප අතුරු සම්මත ගිණුමක් -Vote on Account- සම්මත කිරීම අත්‍යවශ්‍ය වන බවයි. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත්, කථානායකතුමාත් මේ අවස්ථාවේදී මේ ගැන සලකා බලා අපේ ජනාධිපති දැනුවත් කරන්න; පාර්ලිමේන්තුවේ අප සියලු දෙනාම කැඳවා, දැනුවත් කරන්න, කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ කියන එක ගැන. මොකද, මෙය බොහොම බැරෑරුම්. නිදහස ලැබූ දා සිට කවදාවත් මේ වාගේ අවස්ථාවක් උද්ගත වී නැති අවස්ථාවකයි අප මේ ගැන කතා කරන්නේ. ඒ නිසා මේ කෙටි කාලය තුළ මේ ප්‍රශ්නය විසඳන්නේ කොහොමද කියන එක ගැන එලෙස මෙම සභාව දැනුවත් කරන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා, තවත් කරුණක් ගැන කියන්න. සැබෑ බහුතරයක් තිබෙන කණ්ඩායමක් බලහත්කාරයෙන් විපක්ෂයට දාලා බහුතරයක් නොමැති, විපක්ෂයේ සිටිය යුතු කණ්ඩායමක් අවජාතක ආණ්ඩුවක් වශයෙන් පත් කළා. මේ ව්‍යාජ ආණ්ඩුවට ලෝකයේ තිබෙන පාර්ලිමේන්තු අතරින් ගිනස් වාර්තාවකට යන්න පුළුවන් වී තිබෙන අවස්ථාවකයි අප මේ කතා කරන්නේ. මේ ව්‍යාජ ආණ්ඩුව බහුතරය නැතිව පාර්ලිමේන්තුව වර්ජනය කරන මේ අවස්ථාව, ලෝකයේ එවන් සිද්ධියක් වූ පළමු වතාව කියායි මා හිතන්නේ. එය ගිනස් පොතට ඇතුළත් කිරීමට පාර්ලිමේන්තුවෙන් ඒ ගැන දැනුවත් කරන්න ඕනෑ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

This is a situation where we, who have the majority, has been pushed to the Opposition and an Opposition, who should be in the Opposition, is brought into Government and for the first time, a Government that is supposed to be in Government- a fraudulent Government - is basically revolting and boycotting Parliament. I think this is the first time such a thing is happening and we should allow this to be recorded in the Guinness Book of Records.

Now keeping that aside, today the Moody's, Standard and Poor's, Fitch Ratings - all of them - have downgraded Sri Lanka. So I think it is incumbent on all of us to get together and ensure that we protect the economy of this country and that the benefit goes to the people, rather than this political mayhem that is taking place.

I do not want to take more time. I thank you very much for giving me this opportunity and I am sure, Sir, before too long we will have a legitimate Government under the Hon. Ranil Wickremesinghe and we will be able to give the benefits to the people.

Thank you, Sir.

[අ.භා. 1.34]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම ගැන.

අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කළා, මේ ව්‍යවස්ථානුකූල නොවන තීන්දු තීරණ ගැනීම නිසා රටට අත් වී තිබෙන ඉරණම පිළිබඳව. වර්තමානය වන කොට මේ රටට අගමැතිවරයෙක් නැහැ; ඇමති මණ්ඩලයක් නැහැ. අද ඒ තත්ත්වය උදා වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඇමතිකම්, අගමැතිකම කියන සියල්ලම ජනාධිපතිතුමාගේ අතට අරගෙන ඒකාධිපති පාලනයක් සිදු වන මොහොතක්, මේ. නමුත් අප 2015 ජනවාරි 08වන දා බලයට ආවේ ඒ ඒකාධිපති ව්‍යරුව පලවා හැරලා, ප්‍රජාතන්ත්‍රවාදී යහ පාලන සමාජයක් මේ රටේ ගොඩ නඟනවා කියලායි. නමුත්, අද මේ සිදු වෙලා තිබෙන තත්ත්වය නිසා අපටත් ලජ්ජාවක් ඇති වුණා. කොහොම වුණත්, ලෝකයේ රටවල දේශපාලන ඉතිහාසයත් සමඟ බැලුවාම, අද මේ රටේ තිබෙන තත්ත්වය, අපේ රට ලෝක දේශපාලන ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කරන අවස්ථාවක් ලෙස මා දකිනවා. මේ නිසාම අපේ රටේ ආර්ථික වර්ධනය, අපේ රටේ සංහිඳියාව, අපේ රටට පැවැති පිළිගැනීම ආදි සියලු දේම අද අපට අහිමි වෙමින් පවතිනවා. මේක හරිම සංවේදී අවස්ථාවක්, අපි රටේ සිටියදී සිදු වුණ. අප මේ රට බාර ගන්නා විට අපි විදේශීය වශයෙන් අපකීර්තියට පත්ව සිටියා. මිලේච්ඡ ජාතියක්, ගෝත්‍රික ජාතියක් වෙසෙන රටක සිටින ජනතාවක් වශයෙන් තමයි අපව හඳුන්වා තිබුණේ. අප ටිකෙන් ටික, බොහොම අමාරුවෙන් මේ රට ලෝකයේ පිළිගන්නා රටක් බවට පත් කළා. අපි දන්නවා, එදා තිබුණේ රාජ්‍ය සේවකයන් ගස්වල බඳින ඇමතිවරුන් සිටි රටක්; රාජ්‍ය තාන්ත්‍රිකයකු රටට ආවාම පාරේ නිදා ගන්නා ඇමතිවරුන් සිටි රටක් බව.

මේ රටට රාජ්‍ය තාන්ත්‍රික කාන්තාවක් ආවාම, කසාද බඳින්න අහන ඇමතිලා සිටි රටකයි අපි ජීවත් වුණේ. විදේශීය යුවළක් ආවාම ඒ පිරිමියා මරලා, කාන්තාව දූෂණය කරපු ප්‍රාදේශීය සභා සභාපතිවරු හිටපු රටක තමයි අපි ජීවත් වුණේ. නමුත් ක්‍රම ක්‍රමයෙන් අපි මේ රට යහපත් රටක් විධියට, නැවතත් ඉන්දියන් සාගරයේ මුතු ඇටය විධියට පරිවර්තනය කරමින් සිටියදී තමයි මේ කළු පැල්ලම අපේ රටේ දේශපාලනයට එකතු වුණේ. ඇයි, දේශපාලනයට මේ කළු පැල්ලම එකතු වුණේ? රටක ව්‍යවස්ථාවක් තිබෙනවා. ඒ ව්‍යවස්ථාව තුළ කටයුතු නොකිරීම නිසා තමයි මේ කළු පැල්ලම අපේ රටට ඇති වුණේ. මේක කළු පැල්ලමක් විධියට ඉතිහාසයට එකතු වුණා විතරක් නොවෙයි, රටේ ආර්ථිකයට බලපෑවා. වර්තමානය වන විට අපට ඩොලර් විශාල සංඛ්‍යාවක් අවශ්‍යයි. වැඩිම ණය ප්‍රමාණය ගෙවන්න තිබෙන්නේ 2019 වසරේදීයි. විශාල ණය ප්‍රමාණයක් විදේශයට ගෙවන්න තිබෙනවා. අපි කොහොමද, මේකට සල්ලි හොයා ගන්නේ? අපි එය සැලසුම් කරලා තිබුණා. මොකද, මේ කාලය කියන්නේ මේ රටට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණෙන කාලය. අපි සංචාරකයන්ගේ පාරාදීසයක් බවට මේ රට පත් කිරීමෙන් අවසානයේ අපට ලැබුණු තීන්දුව තමයි ලෝකයේ සංචාරකයන් සඳහා හොඳම රටක් විධියට මේ රට නම් කිරීම. එසේ නම් කරලා දවස් තුනක් යන්න හම්බ වුණේ නැහැ, මේ හිතුවක්කාරී ක්‍රියාකාරකම් නිසා සංචාරකයන්ට අවදානම් රටක් විධියට මේ රට නම් වුණා. ඒ නිසා මම කියනවා, අතිගරු ජනාධිපතිතුමනි, දැන්වත් ඔබතුමා හිතන්න ඕනෑ කියලා. එක වැරැද්දක් වහන්න තව වැරැද්දක් කරලා, ඒ වැරැදි දෙක වහන්න ඊට වඩා තව ලොකු වැරැද්දක් කරලා, ඒ විධියට වැරදි පුරවා ගන්නවා. මේ වැරැදි නිසා තමුන්ට විතරක් නොවෙයි, මුළු රටේම ජනතාවට වන්දි ගෙවන්න සිදුවෙලා තිබෙනවා. මේ වන්දි ගෙවීම තිබෙන්නේ වර්තමානයට විතරක් නොවෙයි, -අද රටට වෙලා තිබෙන වින්නැහිය විතරක් නොවෙයි- මේ ගත් තීන්දු තීරණ, වැරදි ක්‍රියාකාරකම් නිසා අනාගතයේදීත් රටේ ජනතාවට වන්දි ගෙවන්න සිදුවෙනවා. ඒ නිසා දැන්වත් නිවැරදි තීරණයක් ගන්න.

බහුතරයක් නැති අගමැතිවරයෙක් පත් කරලා ඔබතුමා පළමුවෙනි වැරැද්ද කළා. ව්‍යවස්ථාවේ පැහැදිලිව තිබෙනවා, පාර්ලිමේන්තුව තුළ බහුතර මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත ඇති මන්ත්‍රීවරයා අගමැතිවරයා වශයෙන් නම් කළ යුතුය කියලා. ඒක වැරැද්දුවා. ඒ වැරැද්දුව එකෙන් මොකද වුණේ? එදා ඒ නම් කරපු ඒ අගමැතිවරයාටත්, ඇමති මණ්ඩලයටත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මුහුණ දෙන්න බැහැ. ඇයි? ඒ අයට බහුතරයක් නැහැ. කිසිම අණ පනතක් pass කර ගන්න විධියක් නැහැ. ඊට පස්සේ මේ කට්ටිය canteen එකේ කුරුමානම් අල්ල අල්ලා ඉඳලා අන්තිමට විශ්වාස භංග යෝජනාවෙන් පරාද වුණා. කථානායකතුමා ප්‍රකාශ කළා, නීත්‍යානුකූලව විශ්වාස භංග යෝජනාව ගෙනාවා; විශ්වාස භංග යෝජනාව පරාදයි; ඒ නිසා දැන් මේ පාර්ලිමේන්තුව තුළ අගමැතිවරයෙක් හෝ ඇමතිවරු හෝ නියෝජ්‍ය ඇමතිවරු හෝ රාජ්‍ය ඇමතිවරු හෝ නැහැයි කියලා. එදා ඒක පිළිගන්නේ නැතුව, ඒකට පිළියමක් හොයන්නේ නැතුව පාර්ලිමේන්තුව වර්ජනය කළා. මේ තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදීව පෙන්වලා දුන්නු කථානායකතුමාට උසුළු විසුළු කරලා, අවමන් කරලා, ගරහලා, හැමදේම කරලා කථානායකතුමාගේ තීන්දුව විහිළුවට ලක් කරන්න උත්සාහ කළා. නමුත් අවසානයේ අධිකරණයට යන්න සිද්ධ වුණා. "කථානායකතුමා දුන්නු තීන්දුව නිවැරදියි. එම නිසා පාර්ලිමේන්තුවේ අගමැතිවරයෙක්, ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් නැහැ" කියන කාරණය අධිකරණය පිළිගත්තා. දැන් මොකද කරන්නේ? දැන් කියනවා, "උසාවිය කියන දේත් අපි පිළිගන්නේ නැහැ; ගිහිල්ලා appeal කරනවා" කියලා. මම කියනවා, දෙයියන්ගේ නාමයෙන් මේ රට විනාශ කරන්නේ නැතුව, දවසෙන් දවස කාලය යවමින් මේ රටේ සම්පූර්ණ ආර්ථිකය, මේ රටේ සංහිඳියාව, මේ රටේ අපි ආපු ගමන් මග විනාශ කරන්නේ නැතුව, මේ පාර්ලිමේන්තුවේ බහුතරයේ කැමැත්ත තිබෙන, රටේ නීතිය අනුව බහුතරයේ කැමැත්ත තිබෙන පුද්ගලයා අගමැතිවරයා කරලා පෙන්වන්න කියලා. ඒකට කල් ගන්න එපා කියලා මම කියනවා. පාර්ලිමේන්තුවේ බහුතරය කාටද තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් මන්ත්‍රීවරු 123ක් අත්සන් කරලා ජනාධිපතිතුමාගේ අතට දීලා තිබෙනවා. බහුතරය තිබෙන පුද්ගලයා වන රනිල් වික්‍රමසිංහ මහත්තයාට මේ අගමැතිකම භාර දෙන්න කියලා අපි ඉල්ලීම් කරලා තිබෙනවා. එහෙම නම් කල් යවන්නේ නැතුව, මේ රට අරාජික වෙන්න දෙන්නේ නැතුව කටයුතු කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලනවා. ඒ වාගේ වැරදි කීයක් කළාද? අගමැතිවරයෙක් නෙරපා හැරීම ව්‍යවස්ථාවේ කොහොමද තිබෙන්නේ? අගමැතිවරයෙක් පත් කිරීම ව්‍යවස්ථාවේ කොහොමද තිබෙන්නේ? විශ්වාස භංග යෝජනාවකට මුහුණ දුන්නාම කටයුතු කළ ආකාරය ව්‍යවස්ථාවේ කොහොමද තිබෙන්නේ? ජනාධිපතිවරයා සතු බලතල කොහොමද තිබෙන්නේ? මේ සියලු දේම සඳහන් ව්‍යවස්ථාව අර රට කජු ඔතන්න ගත් පොතක් වාගේ සලකා ගණන් ගන්නේ නැතුව තමන් ඒකාධිපති විධියට තීන්දු තීරණ ගැනීම තුළ තමයි අපේ රටට අද මේ ඉරණම අත්වෙලා තිබෙන්නේ.

එදා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, අපි වැඩ කරගෙන ආපු ආණ්ඩුව ඉවත් කළා. හැබැයි, ව්‍යවස්ථානුකූලව. එදා මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. අවුරුදු එකහමාරක් විතර වෙනකොට අපි ඉවත් කළා, ව්‍යවස්ථානුකූලව.

මේ ආණ්ඩුව අයින් කරන්නට ජනාධිපතිතුමාට ඕනෑ නම්, බලය අල්ලා ගන්න මහින්ද රාජපක්ෂ මහත්මයාට ඕනෑ නම් කරන්න තිබුණේ එකම දෙයයි. පසුගිය 14වෙනි දා විශ්වාස භංගත්වය පිළිබඳ යෝජනාවට ඡන්දය තිබුණා. ඒ අවස්ථාවේ බහුතරය පෙන්වා ඒ යෝජනාව පරාජය කළා නම් නීත්‍යානුකූලව ආණ්ඩුව හැදෙන්නට තිබුණා. නමුත්, මේවා ශත පහකට ගණන් ගන්නේ නැතිව එදා වාගේම තමුන්ගේ ඒකාධිපති බලය පාවිච්චි කරලා ඒකාධිපති වියරුවෙන්, කොහොම හරි අගමැතිකම ගන්නවා කියන වියරුවෙන් වැරදි පාරෙන්, කුස්සිය පැත්තෙන් ඇවිල්ලා අගමැතිකම ගන්න ගිය නිසා අද රටට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. මේ වැරැද්දෙන් වන්දි ගෙවන්නේ ජනාධිපතිතුමා විතරක් නොවෙයි, මේ වැරැද්දෙන් වන්දි ගෙවන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයායි, ඔය ඇමති මණ්ඩලයයි කියා ගත්ත කට්ටියයි විතරක් නොවෙයි, මේ වැරැද්දෙන් වන්දි ගෙවන්නේ අපි විතරක් නොවෙයි, මේ වැරැද්දෙන් මුළු රටේම වර්තමාන ජනතාව වාගේම නූපන් දරුවාත් වන්දි ගෙවනවා. ඒ අයටත් මෙය ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා.

ගමේ මරණාධාර සමිතියක් ගත්තත්, කොම්පැනියක් ගත්තත්, පාර්ලිමේන්තුව ගත්තත්, රටක් ගත්තත් ඒ හැම එකකටම ව්‍යවස්ථාවක් තිබෙනවා. ව්‍යවස්ථාවට අනුකූලව වැඩ කටයුතු නොකිරීම නිසා අද මේ ප්‍රශ්නය උද්ගතවෙලා තිබෙනවා. එම නිසා මම විශේෂයෙන් මේ කාරණය කියනවා. රට ආර්ථික වශයෙන් අගාධයට යවන්නට එපා. රට ගොඩ නැඟෙමින් පවතිනවා. රට විශාල ණය කන්දකට හිරවෙලා තිබෙනවා. මේ ණය ගෙවන්නේ රටේ ජනතාවයි. ඒ සඳහා විවිධ වැඩසටහන් තිබුණා. පසුගිය මාස එකහමාරට රටේ ප්‍රගතියක් තිබෙනවාද, රටේ ඇති වුණු ආර්ථික ප්‍රගතිය මොකක්ද කියලා ආපස්ස හැරිලා බලලා, අදවත් මේ වැරැද්ද නිවැරදි කරන්න. ආර්ථිකය දවසින් දවස කඩාගෙන වැටෙන රටකයි අද අපට ඉන්න සිද්ධවෙලා තිබෙන්නේ කියන කාරණය ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 1.43]

ගරු වී.එස්. රාධකිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

சபைக்குத் தலைமைதாங்குகின்ற கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இந்த நாட்டினுடைய எதிர்காலம் பற்றி இந்தச் சபையிலே பேசப்பட்டுக் கொண்டிருக்கின்றது. இன்று நாட்டிலே ஏற்பட்டிருக்கும் அசாதாரண அரசியல் சூழ்நிலைக்கு மத்தியிலே ஒரு சில வார்த்தைகளைக் கூறுவதற்கு விரும்புகின்றேன். 2015ஆம் ஆண்டிற்கு முதல் இந்த நாட்டிலே ஒரு மோசமான ஆட்சி நிலவியதை எங்களால் அவதானிக்கக் கூடியதாக இருந்தது. அப்போது ஊழல், சிறுபான்மையினருக்கு நெருக்கடி போன்ற பல்வேறு துன்பங்களை அனுபவித்த மக்கள், இந்த நாட்டில் ஒரு நல்லாட்சி ஏற்பட வேண்டும் என்பதற்காக 2015ஆம் ஆண்டு கௌரவ மைத்திரிபால சிறிசேன அவர்களை இந்த நாட்டினுடைய ஜனாதிபதியாக்கினார்கள். அதேநேரத்தில், கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களை இந்த நாட்டினுடைய பிரதம மந்திரியாக்கினார்கள். இந்த நல்லாட்சி நன்றாக நடைபெற்றுக்கொண்டிருந்தவேளையிலே, துரதிருஷ்டவசமாக ஜனாதிபதி அவர்கள் இந்த நாட்டினுடைய ஆட்சியை மாற்றுவதற்கு முயற்சி செய்திருக்கின்றார். அவர் நேர்மையான முறையிலே ஆட்சியை மாற்றியிருந்தால், அதை நாங்கள் வரவேற்றிருப்போம். நாங்களும் பாராளுமன்றத் தேர்தலுக்குப் போய் அந்த ஆட்சி மாற்றத்தை உருவாக்கியிருக்கலாம். ஆனால், 2015ஆம் ஆண்டுக்கு முதல் யார் ஊழலைச் செய்தார்களோ, யார் சிறுபான்மையினருக்கு நெருக்கடி கொடுத்தார்களோ, அவர்களையே எந்த விதமான முன்னறிவித்தலுமின்றி மீண்டும் ஆட்சிக்குக் கொண்டு வந்திருப்பதானது ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு விடயமல்ல. 2015ஆம் ஆண்டு வடக்கு, கிழக்கிலே, மலையகத்திலே உள்ள தமிழ், முஸ்லிம் மக்களில் அதிகமானோர் அந்தப் புதிய அரசாங்கத்தை வரவேற்று வாக்களித்தார்கள். அவ்வாறு வாக்களித்த மக்களுக்குச் செய்த நன்றிக்கடனா இது? என்று நாங்கள் கேட்கக்கூடிய ஒரு சூழ்நிலை இன்று ஏற்பட்டிருக்கின்றது. இந்த நாட்டிலே ஊழல் செய்வதற்கு மீண்டுமொரு சந்தர்ப்பம் உருவாக்கிக் கொடுக்கப் பட்டிருக்கின்றது என்பது பற்றிச் சிந்தித்துப் பார்க்கின்றபோது மிகவும் வெட்கமாக இருக்கின்றது.

இன்றைய இந்தச் சூழ்நிலையிலே இலங்கையினுடைய பொருளாதாரம் வீழ்ச்சியடைந்திருக்கின்றது; கல்வி நிலைமை பாதிக்கப்பட்டிருக்கின்றது; சுகாதார நிலைமை பாதிக்கப் பட்டிருக்கின்றது; இந்த நாட்டுக்கு வருகின்ற சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கை குறைந்து சுற்றுலாத்துறை நலிவடைந்திருக்கின்றது. நுவரெலியா மாவட்டத்தினுடைய மக்கள் பிரதிநிதியென்ற முறையிலே நான் ஒன்றைக் கூறுகின்றேன். அதாவது, நுவரெலியா மாவட்டத்திலேயிருக் கின்ற அதிகமானோர் சுற்றுலாத்துறையில் அதிக அக்கறையோடு இருக்கின்றார்கள். ஆனால், இன்று இந்தச் சுற்றுலாத்துறை மிக மிக வீழ்ச்சியடைந்திருக்கின்றது. நான் சீதா எலிய கோவிலின் தர்மகர்த்தாவாக இருக்கின்றேன். அந்தக் கோவிலுக்கு ஒரு நாள் காலையிலே 500 - 1,000 வரையில் பிறநாட்டு மக்கள் வந்து போவதை அவதானிக்கக் கூடியதாக இருந்தது. ஆனால், கடந்த ஒரு மாதமாக அங்கு 100 பேருக்கு மேல் வரவில்லை என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட வேண்டும். அங்கு இப்படியாக இருந்தால், இலங்கையிலே இருக்கின்ற அனைத்துச் சுற்றுலா இடங்களிலும் நிலைமை எவ்வாறிருக்கும் என்பதை நாங்கள் புரிந்துகொள்ள வேண்டும். இதனால் நேரடியாகவோ, மறைமுகமாகவோ வேலைவாய்ப்புகள் இல்லாமற் போயிருப்பதையும் நாட்டுக்கு வருகின்ற அந்நியச் செலவாணி வருமானம் மிக மிகக் குறைந்திருப்பதையும் எங்களால் காணக்கூடியதாக இருக்கின்றது. இதனால் இந்த நாட்டு மக்கள் மிகவும் கஷ்டமான சூழ்நிலையை அனுபவித்து வருகின்றார்கள். எனவே, இத்துறையினை மீண்டும் கட்டியெழுப்புவதற்கு நடவடிக்கை எடுக்கவேண்டும்.

இன்று மிகவும் மோசமான சூழ்நிலையிலே வாழுகின்ற மலையக மக்களுடைய பிரச்சினைகளைப் பற்றி நாங்கள் சற்றுச் சிந்திக்க வேண்டும். 2015ஆம் ஆண்டு இன்னோர் ஆட்சியை உருவாக்குவதற்காகச் சில தொழிற்சங்கங்கள் மலையக மக்களுக்கு 1,000 ரூபாய் சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதாக அறிவித்தன. அன்று அவர்களால் அந்த ஆட்சியைக் கொண்டுவர முடியாத சூழ்நிலையிலும், 1,000 ரூபாய் சம்பளத்தை வாங்கித் தருவதாக இன்றும் சொல்லிக்கொண்டு மலையக மக்களுடைய பிரச்சினையைப் பூதாகரமான பிரச்சினையாக உருவாக்கி வருவதையும் எங்களால் காணக்கூடியதாக இருக்கின்றது. மலையக மக்களுக்கு 1,000 ரூபாய் சம்பளம் தேவை என்பதை நாங்கள் மறுக்கவில்லை. கட்டாயம் அவர்களுக்கு 1,000 ரூபாய் சம்பளம் கொடுக்கவே வேண்டும். ஆனால், அதை எப்படிப் பெற்றுக்கொள்வது? அதை அரசாங்கம் கொடுக்குமா? அதைத் தனியார் கம்பனிகள் மூலமாக எவ்வாறு பெற்றுக்கொள்வது? என்பதைப் பற்றி நாங்கள் புரிந்துகொள்ள வேண்டும்.

இன்று கூட்டு ஒப்பந்தத்திலே கையொப்பமிடுகின்ற ஒரு சில தொழிற்சங்கங்கள் மற்றைய தொழிற்சங்கங்களோடு எந்தவிதமான பேச்சுவார்த்தையையும் மேற்கொள்ளாமல் தோட்டச் செயற்பாடுகளை முடக்கி வருகின்றன. இதன் காரணமாக இன்று அந்த மக்கள் பல்வேறு துன்பங்களை அனுபவித்துக் கொண்டிருப்பதை எங்களால் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. இன்று தோட்டத் தொழிலாளர்கள் 500 ரூபாய் அடிப்படைச் சம்பளத்தில் தங்களுடைய பிள்ளைகளைப் படிக்க வைப்பதற்கு மற்றும் அவர்களுக்கு அப்பியாசப் புத்தகங்கள், school bags, சப்பாத்து போன்றவற்றை வாங்குவதற்குப் போதிய வருமானம் இல்லாமல் தத்தளிக்கின்றார்கள். இந்த நேரத்திலே, குறித்த போராட்டம் ஆரம்பிக்கப்பட்டிருப்பதன் காரணமாக அவர்களுடைய பொருளாதாரம் மிகவும் வீழ்ச்சி அடையக்கூடிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. இன்று இந்தத் தொழிற்சங்கங்கள் தங்களுடைய அரசியல் இலாபத்துக்காக அந்த மக்களை அடகு வைத்து, அவர்களைத் துர்ப்பாக்கிய சூழ்நிலைக்குள் தள்ளுகின்ற ஒரு நிலைமை உருவாகி இருக்கின்றது. இந்த நிலைமையை மாற்றி, அந்த மக்களுக்கு 1,000 ரூபாய் அடிப்படைச் சம்பளத்தை அல்லது அதற்கு ஈடான சலுகைகளைப் பெற்றுக்கொடுக்கக்கூடிய வகையிலே நாங்கள் எல்லோரும் ஒன்று சேர்ந்து செயற்படவேண்டும் என நான் இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த நாட்களிலே இந்தச் சபையிலே கௌரவ சபாநாயகர் கரு ஜயசூரிய அவர்கள் மேற்கொண்ட செயற்பாடுகள் பற்றி இன்று சில ஊடகங்கள் பல்வேறு முறைகளில் விமர்சித்து இருந்தாலும்கூட, அவருடைய செயற்பாடு மிகத் திறமையானது என்பதை நான் இந்த நேரத்திலே தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். உலகத்திலே ஏனைய நாடுகளில் இருக்கின்ற

පාරාලුමන්ත්‍රණයකින් ඉවත් කිරීමට ඉඩ ඇති බවට ඔවුන් ඉදිරිපත් කළ යෝජනාවේ හරය වන්නේ, දැනට රටේ මතු වී තිබෙන අස්ථාවරභාවය වෙනුවට නැවත දේශපාලන ස්ථාවරභාවය ඇතිකර ගැනීම සඳහා වග කිවයුතු සියලුදෙනාම පියවර ගත යුතුය කියන කාරණයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය පාලනය කියලා කියන්නේ නීතියත්, ආචාර ධර්මත් කියන අංශ දෙකම එකට එකතු කරගත් ඉතාම යහපත් සංහිතාවකටයි. අද, වර්තමානයේ මේ අර්බුදය ඇති වී තිබෙන්නේ, ඒ නීතිය සහ ආචාර ධර්ම කියන එකට එකතු විය යුතු සංහිතාව රටේ රාජ්‍ය නායකයා බිඳ දැමූ නිසායි. වර්තමාන අර්බුදය වෙන මොකක්වත් නොවෙයි, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න බැඳී සිටින රාජ්‍ය නායකයා, ජන රජයේ ජනාධිපතිවරයා ඇති කළ අර්බුදයක්. එය වෙන කවුරුවත් ඇති කළ අර්බුදයක් නොවෙයි. ඒ කාරණයට රටේ හිටපු ජනාධිපතිවරයා සහචරයකු හැටියට එකතු වීමත් නිසා ඇති වුණු අර්බුදයක්. එම නිසා මේ අර්බුදය ලිහීමේ සම්පූර්ණ වග කීම තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට කියලා මම මුලින්ම කියන්න කැමැතියි.

මේ අර්බුදය ලිහන එක ඉතාම සරල දෙයක්. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ජනාධිපති වූ දවසේ ඉඳලා මේ රටේ හැම තැනකදීම දේශනා කළ එක අදහසක් තිබෙනවා. ඒක තමයි "සරලභාවය". සරල වෙන්න, සරල වෙන්න; "Be simple." කියන එක තමයි එතුමා කිව්වේ. අපි පිළිගන්නවා ඒ අදහස. මේ අර්බුදය විසඳන්නත් සරල ක්‍රියා මාර්ගයක් තමයි තිබෙන්නේ කියා අපි ජනාධිපතිතුමාට කියනවා. සරල අංක ගණිතයට පුරුදු වෙන්න. සරල අංක ගණිතයට පුරුදු වෙන්න! මේ සභාවේ බහුතරය තිබෙන්නේ කාටද, ඔවුන්ට ආණ්ඩු බලය භාර දෙන්න. ඒ වාගේම තමයි, බහුතරය කැමති කෙනාට අග්‍රාමාත්‍ය ධුරය ලබා දෙන්න. ඒ සරල අංක ගණිතය අනුගමනය කරනවා නම්, මේ අර්බුදය සංකීර්ණ අර්බුදයක් නොවී විසඳා ගැනීමට අපට හැකියාවක් තිබෙනවා.

අගමැති ධුරය ලබා දෙන්නේ කාටද කියන කාරණාවේදී ජනාධිපතිතුමාගේ පෞද්ගලික රුචි, අරුචිකම් වැඩක් වන්නේ නැහැ. ඒක අද දවසේ වලංගු සාධකයක් නොවෙයි. ජනාධිපතිතුමා සම්ප්‍රදායයත්, නීතියත් ගරු කරමින් බහුතරයේ කැමැත්ත තිබෙන පුද්ගලයා මැනලා, තක්සේරු කර බලා ඔහුට අනිවාර්යයෙන්ම අග්‍රාමාත්‍ය ධුරය ලබා දිය යුතුයි. එක්සත් ජාතික පක්ෂයේ නායකයා කවුද, කින්ද මන්ද කියලා තෝරන එක ඒ පක්ෂයේ අයගේ වග කීමක් යුතුකමක් හා කාර්යයක් මිස, ජනාධිපතිතුමාගේ කටයුත්තක් නොවෙයි. මෙන්න මේ සරල අංක ගණිතය දෙස බලා, මේ අර්බුදය සංකීර්ණ නොකර මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියා අපි මේ වෙලාවේ කියනවා. එහෙම කරන්නේ නැති නිසා දැන් මේ රට වෙන සන්ධිස්ථානයකට ඇවිල්ලා තිබෙනවා. මේ රට ඒකාධිපතිවාදයට යනවාද, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට යනවාද කියන සන්ධිස්ථානයේ තමයි දැන් මේ ඉන්නේ. ජනාධිපතිතුමාත්, හිටපු ජනාධිපතිතුමාත්, එතුමාගේ මිරිස් කුඩු ප්‍රජාතන්ත්‍රවාදී කල්ලියත් දැන් මේ වෙලාවේ රටට යෝජනා කර තිබෙන්නේ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය එපා, ජන සම්මත ප්‍රජාතන්ත්‍රවාදය එපා, රාජාණ්ඩුවට, ඒකාධිපතිවාදයට, ෆැසිස්ට්වාදයට යන්න ඕනෑ කියලායි. ඒකාධිපති වියරුවකට රට ඇද දමන්නයි මේ සූදානම් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මැතිවරණ කථාවක් කියාගෙන යනවා. ඔක්තෝබර් මාසයේ 26 වැනි දා වෙන කොට මේ රටේ ජනතාව මැතිවරණයක් නොවෙයි ඉල්ලා තිබුණේ. මැතිවරණයක් ඉල්ලා සිටීම මේ පාර්ලිමේන්තුව සාධාරණීකරණය කරන්න වෙනවා. මැතිවරණ නොතියා පාර්ලිමේන්තුවේ ධුර කාලය දික් කරන්න මොකක් හෝ යෝජනාවක් ගෙනැත් තිබුණා නම්, "වහාම මැතිවරණයක් පවත්වනු" කියලා ජනතාව පාරට බස්සන්න තිබුණා. මේ ගොල්ලන්ගේ කුමන්ත්‍රණය අතේ පත්තු වුණාට පස්සේ, මේ පාර්ලිමේන්තුවට මුහුණ දෙන්න බැරි වුණාට පස්සේ, මැතිවරණයක් ඉල්ලා කෑ ගහනවා. මේකට -මේ ඝෝෂාවට- පිරිසක් එකතු වෙලා සිටිනවා. මම ඒ අයට අනතුරු අඟවනවා. හිට්ලර් ජර්මනියේ බලයට පත් වෙන කොට සමහර කොමියුනිස්ට්කාරයෝ, කොමියුනිස්ට්වාදියෝ කිව්වා, "හිට්ලර් සහෝදරයාට ඡන්දය දෙන්න" කියලා.

"Vote for Comrade Hitler." කියලායි පටන් ගත්තේ. හිට්ලර් බලයට ඇවිල්ලා ඒ කොමියුනිස්ට්කාරයන්ට තමයි ඉස්සෙල්ලාම පහර දුන්නේ. ඒකාධිපතිවාදය හැම වෙලාවේම එන්නේ ජනප්‍රියවාදයේ සළුපිළි ඇඳගෙන. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ජනප්‍රියවාදී සළුවෙන් වහගෙන -මොකක් හරි ජනප්‍රියතාවක් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් තිබෙනවා කියලා එතුමා හිතනවා නම්,- මේ රටේ ඒකාධිපතිවාදය රජ කරවන්නට, බිහි කරවන්නට වලි කන සියලුදෙනාට අපි මේ පාර්ලිමේන්තුවේ ඉඳලා අනතුරු ඟවනවා. මේ පාර්ලිමේන්තුවට මේ මන්ත්‍රීවරුන් 225දෙනාම ආවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නටයි. පසුගිය මැතිවරණයේදී හැම stage එකක් ගානේම ගිහිල්ලා කෑ ගැහුව, පොරොන්දු වුණ, ප්‍රතිඥා දුන්න විධියට පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු හැටියට ආවා නම්, ඔහු පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළ යුතුයි. අද ජනාධිපතිතුමා බිඳලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයයි. ඒකට එරෙහිව ජනතා අරගළයක්, පාර්ලිමේන්තු අරගළයක් ඇවිල්ලා තිබෙනවා. එය කෙමෙන් කෙමෙන් ජයග්‍රහණය කරා ඇදගෙන යනවා. මේ නැඟිටින මහජන මතයට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් කන් දෙන්න ඕනෑ කියන එක තමයි අපි අදහස් කරන්නේ. ඒ මතය ප්‍රතික්ෂේප කරන්නට, ප්‍රතික්ෂේප කරන්නට මේ රටේ තහවුරු වන්නේ ඒකාධිපති වියරුවක්.

අපි අහන්නේ මේකයි. මේ ඉල්ලන මහ මැතිවරණය පවත්වලා, ඒකෙන් පත් වන අගමැතිවරයාගේ මුහුණට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අකමැති නම්, එහෙම නැත්නම් එතුමා සමඟ

[අ.භා.1.50]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(මාණ්පුමිකු කරුණාරත්න පරණවිතාන)
(The Hon. Karunarathna Paranawithana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ හරය වන්නේ, දැනට රටේ මතු වී තිබෙන අස්ථාවරභාවය වෙනුවට නැවත දේශපාලන ස්ථාවරභාවය ඇතිකර ගැනීම සඳහා වග කිවයුතු සියලුදෙනාම පියවර ගත යුතුය කියන කාරණයයි.

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

පෞද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා නම් නැවත පාර්ලිමේන්තුව විසුරුවනවාද? නැවත පාර්ලිමේන්තුව එපා කියනවාද? මේක මහ විකාරයක්! පොඩි ළමයි බෝල සෙල්ලමක්වත් මේ විධියට කරන්නේ නැහැ. මොකක්ද පොඩි ළමයින්ගේ බෝල සෙල්ලම? මේ ජනාධිපතිතුමාට අනුව නම්, ජනාධිපතිතුමාම බෝල දානවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
හොඳයි.

ජනාධිපතිතුමාම "බැට්" කරනවා. ජනාධිපතිතුමාම උඩ පන්දුව අල්ලනවා. ජනාධිපතිතුමාම appeal කරනවා; ජනාධිපතිතුමාම තීන්දුව දෙනවා. ජනාධිපතිතුමාම හුරේ දමනවා. එතකොට මොකක්ද අපට පෙනෙන්නේ? Match එකක්ද? නැහැ. ඉතාමත්ම විසූකදස්සනයක්; විප්‍රකාරයක්. එම නිසා මේ විපරීතභාවයෙන් අත් මිදෙන්න කියලා යෝජනා කරමින්, මට තව විනාඩියක කාලයක් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

"ජනමාධ්‍ය" ගැන නැවත අප කියා සිටින්න ඕනෑ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මේ රටේ නීතිය උල්ලංඝනය කරලා තිබෙනවා; තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත උල්ලංඝනය කරලා තිබෙනවා; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කරලා තිබෙනවා. ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා අමාත්‍ය ධුරයේ සිටි කාලයේ දී, මම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට සිටි කාලයේ දී කථානායකතුමාත් එක්ක කථා කරලා, රාජ්‍ය මාධ්‍ය ආයතනවලට අපි ලබා දීපු නියෝගය තමයි පාර්ලිමේන්තු සභා වාර සජීවීව විකාශය කරන්න කියන එක. ඒ නියෝගය අවලංගු කළේ නැහැ. මේ රූනියා ආණ්ඩුවේ රූනියා ඇමති දයාසිරි ජයසේකරවත් එහෙම කිව්වේ නැහැ, ඒ ප්‍රධානීන්ට. ඒ ප්‍රධානීන් පාර්ලිමේන්තුවට කැඳවන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම ඉතාමත්ම තදින් ස්ථිර කරනවා, විජිත හේරත් මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය. ඊළඟ අය වැයෙන් අපි මේ පාර්ලිමේන්තුවට අදාළව වෙනම මාධ්‍ය ආයතනයක් පිහිටුවා ගැනීම සඳහා මුදල් වෙන් කරලා, පාර්ලිමේන්තුවේ විකාශන කටයුතු කරගෙන යන්න ඕනෑය කියන කාරණය. මේ ගෙන යන අරගළය වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අද ජනතාව වේගයෙන් සටන් බිමට ඇවිල්ලා තිබෙනවා. ඒ සියලු දෙනාටම මේ පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරන, මේ පැත්තේ සිටින මන්ත්‍රීවරුන්ගේ ගෞරවය, ප්‍රණාමය පුද කරන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. Next, the Hon. J.C. Alawathuwala.

[අ.භා. 1.59]

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මේ වැදගත් යෝජනාව ගැන අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ රටේ අරාජිකත්වයක් ඇති වෙලා අදට දින හතළිහක් වෙනවා. මේ වනකොට රටේ ආර්ථිකය, සමාජ ජීවිතය ඇතුළු හැම අංශයක්ම කඩා වැටිලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය තාන්ත්‍රික වශයෙනුත් අපේ රට ඉතාමත් පහළ මට්ටමකට ඇද වැටිලා තිබෙනවා. ඒ, වෙන කිසිම කාරණාවක් නිසා නොවෙයි, මේ රටේ විධායකය - ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- පසුගිය ඔක්තෝබර් මාසයේ 26 වැනිදා සිදු කළ අත්තනෝමතික ක්‍රියාවලිය නිසයි. ඔක්තෝබර් මාසයේ 26 වැනිදාත් පාර්ලිමේන්තුවේ රැස්වීම් තිබුණු දවසක්. එදාත් අපි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාවක් සම්මත කළා. එහෙම අවස්ථාවක තමයි නීති විරෝධී, ව්‍යවස්ථා විරෝධී, ප්‍රජාතන්ත්‍ර විරෝධී, සදාචාරාත්මක නොවන මේ ක්‍රියාවලිය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හදිසියේම ක්‍රියාත්මක කළේ. හොර රහසේම කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහත්මයා කැඳවලා, අගමැති හැටියට දිවුරුම් දුන්නා. මේ ක්‍රියාවලිය තුළ මේ අය බලාපොරොත්තු වුණු ආකාරයට පාර්ලිමේන්තුව තුළ බහුතරයක් හදා ගන්න බැරි වුණු අවස්ථාවේ එතැනින් එහාට ගිහිල්ලා පාර්ලිමේන්තුව කල් තැබුවා. එතැනිනුත් එහාට ගිහිල්ලා පාර්ලිමේන්තුව විසුරුවන්න හැදුවා. ඒ තුළ ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. අද මේ වනකොට රටේ ජන ජීවිතයට බලපාන ප්‍රශ්නයක් බවට එය පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම රටේ ආර්ථිකයට විශාල වශයෙන් හානි සිදු වෙලා තිබෙනවා. එක පැත්තකින් විතරක් නොවෙයි, සෑම අංශයකින්ම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ දී මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටතු, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉබේ ඇති වුණු සිද්ධියක් නොවෙයි. මෙය විධායකය විසින් ඇති කරන ලද සිද්ධියක්. මේ කාරණාව දිහා බැලුවාම අපට පෙනෙනවා, අද රටේ ඇති වෙලා තිබෙන මේ තත්ත්වයට, මේ සියල්ලට වග කියන්න ඕනෑ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත්, මහින්ද රාජපක්ෂ මහත්මයාත් බව.

මේ දෙපළගේ පෞද්ගලික දේශපාලන අරමුණු නිසා තමයි රට තුළ මෙවැනි අවුල් ජාලාවක් ඇති කර තිබෙන්නේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට නැවත වතාවක් තමන් ජනාධිපති වෙන්න තිබෙන ආශාව නිසාත්, ඒ වාගේම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට තිබෙන ප්‍රශ්න විසඳා ගැනීමේ අරමුණත් ඇතිව තමයි රට තුළ මෙම දේශපාලන අවුල් ජාලාව ඇති කර තිබෙන්නේ. අපි පැහැදිලිව කියන්නට ඕනෑ, මේ නිසා අද ක්ෂේත්‍ර ගණනාවක් කඩා වැටීමට ලක් වෙලා තිබෙන බව. අපි මීට ඉස්සෙල්ලාත් ඒ ගැන කථා කළා. මේ සිද්ධිය තුළ අද එම ක්ෂේත්‍ර එහෙම පිටින්ම කඩා වැටිලා තිබෙනවා. අපි උදාහරණයක් හැටියට ගත්තොත්, මේ කාල සීමාව තුළ සංචාරක ව්‍යාපාරය ඉතාමත් බැරෑරුම් තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මේ කාල සීමාව තමයි -නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාස තුළ- සංචාරකයන් වැඩියෙන්ම පැමිණෙන වකවානුව.

අද සංචාරකයන් සඳහා අපේ රටේ හෝටල්වල තිබුණු වෙන් කර ගැනීම්, එහෙම නැත්නම් bookings සියයට 75ක් අවලංගු කරලා තිබෙනවා. එය විශාල පාඩුවක්. සංචාරක ව්‍යාපාරය විතරක් නොවෙයි. ඊයේ දිනයේත්, මීට සති දෙකකට විතර කලිනුත් අපි දැක්කා, අපේ රටට ණය දෙන ශ්‍රේණිගත කිරීම්වලින් අපි පහළට දමලා තිබෙනවා. අපි "B plus" තිබුණු ස්ථානයෙන්, "B" දක්වා පහළට දාලා තිබෙනවා. මේක විශාල වශයෙන් අපේ රටට බලපානවා. ණය ගැනීමේ දීත් මේක බලපානවා. ඒ වාගේම ඉදිරි කාලයේ දී මේ ණය විශාල ප්‍රමාණයෙන් ගෙවන්න තිබෙනවා. ඒ හැම අංශයකින්ම අපට විශාල පාඩුවක් අද සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි කොටස් වෙළෙඳ පොළත් ඉතාමත් ශීඝ්‍රයෙන් පහළ වැටිලා තිබෙනවා. මාසයක් තරම් කෙටි කාලයක් තුළ කොටස් වෙළෙඳ පොළෙන් විදේශ මුදල් විශාල ප්‍රමාණයක් ඉවත් කරගෙන ගිහිල්ලා තිබෙනවා.

මේ කාරණාව රටේ ආර්ථිකයේ හැම අංශයකම අස්ථාවරභාවයට බලපාලා තිබෙනවා. ඒ වාගේම විදේශීය වශයෙන් ගත්තාම, අපේ රටට තිබුණු ස්ථානය නැති වෙලා තිබෙනවා. අපි ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන රටක් හැටියට මේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ, එහෙම නැත්නම් මේ මැතිවරණ ක්‍රමය තුළ දකුණු ආසියාවේ දීර්ඝ කාලයක් හොඳ නමක් දිනාගෙන තිබුණු රටක් හැටියට අද අපට විශාල කළු පැල්ලමක් ඇති වෙලා තිබෙනවා. මේ ව්‍යවස්ථා විරෝධී; ඒ වාගේම ප්‍රජාතන්ත්‍ර විරෝධී; ඒ වාගේම සදාචාර විරෝධී ක්‍රියාවලිය තුළ අපේ රටට ඉතාමත් අහිතකර තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ ගරු කථානායකතුමා මේ සම්බන්ධයෙන් ඉතාමත් ඍජුව, බහුතරයේ කැමැත්තට, ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. අද මේ වන විට අධිකරණය ස්වාධීනව කටයුතු කරලා තීන්දු-තීරණ ලබා දීලා තිබෙනවා. තව ඉස්සරහටත් ලබා දෙන්න තිබෙනවා.

අපි පැහැදිලිව කියනවා, විධායකය එහෙම නැත්නම් ජනාධිපතිවරයා තමන්ගේ ඒකාධිපති ස්වරූපයෙන්, එහෙම නැත්නම් මනඃකල්පිත ලෝකයක ඉඳලා කටයුතු කිරීම තුළ රටේ ජනතාවට සිදුවෙලා තිබෙන හානිය තවදුරටත් වැඩි කරන්න එපා කියලා. පාර්ලිමේන්තුව තුළ බහුතරය පැහැදිලිව පෙන්වා තිබෙනවා. ඒ, බහුතරයට ගරු කරමින් මේ රට පෙර තිබුණු - 26වැනි දා තිබුණු - තත්ත්වයට පත් කරන්න විධායකයට අවස්ථාව තිබෙනවා. අපි ඉතාමත් ගෞරවයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, තවදුරටත් මේ ප්‍රශ්නය ඉස්සරහට ඇදගෙන ගිහිල්ලා රටේ ජනතාව අමාරුවේ දමන්නේ නැතුව, රටේ ආර්ථිකය කඩා බිඳ දමන්නේ නැතුව, රටේ කීර්ති නාමයට හානි කරන්නේ නැතුව දැන්වත් මේ ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න කියලා. ව්‍යවස්ථානුකූලව පාර්ලිමේන්තුවේ බහුතරයේ කැමැත්තට අවස්ථාව ලබා දීලා කටයුතු කරන්න කියලා මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා.

[අ.භා. 2.06]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජනතා විමුක්ති පෙරමුණේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අද දිනයේ ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන මා යමක් සඳහන් කරන්න කැමැතියි. සමහර රටවල් විවිධ සොයා ගැනීම්, විවිධ පර්යේෂණ හා විවිධ දේවල් නිසා ලෝක ඉතිහාසයට එකතු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් දැන් ලෝක ඉතිහාසයට එකතු කරලා ඉවරයි. ඒ තමයි, පළමුවැනි වතාවට අගමැතිවරයෙක්, ඇමතිවරුන් හා නියෝජ්‍ය ඇමතිවරුන් නැතුව යන රටක් හැටියට. ඊළඟට, වැඩ තහනම් වෙච්ච අගමැතිවරයෙක් පත් වෙච්ච රටක් හැටියට මෙතුමා අපේ රට ලෝක ඉතිහාසයට එකතු කරලා තිබෙනවා.

එතුමා තමයි, ගිනස් පොතට ලංකාව එකතු කළ නායකයා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 නොවැම්බර් මාසයේ 21වන දා එතුමා අනාථයකු වාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට බැස්සාම, එතුමාව පිළි ගත්තේ අපේ එක්සත් ජාතික පක්ෂයයි. පොදු අපේක්ෂකයකු හැටියට එතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීම තුළින් අපි බලාපොරොත්තු වුණා, එදා තිබුණු රාජපක්ෂ ශාපයෙන් මේ රට ගලවා ගන්න; බේරා ගන්න. ඊට පසු මේ රටේ තිබුණු අයුක්තියට, අසාධාරණයට එරෙහිව නිර්පාක්ෂික ජනාධිපතිවරයකු හැටියට එතුමා සියලුදෙනාට සාධාරණය ඉෂ්ට කරාවි කියා අපි බලාපොරොත්තු වුණා. හැබැයි, එතුමා ඒ ගමන ගියේ නැහැ. එතුමා ඊයේ තිබුණු සම්මේලනයේදී කිව්වා, "රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කුණු දේශපාලනය" කියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා කුණු දේශපාලනය කළා නම් අද මෛත්‍රීපාල ඉන්නේ ඔතැන නොවෙයි, අඩි 6ක් පොළොව යටයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ සාධාරණ දේශපාලනයක් කළ නිසායි ඔය වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ජනාධිපති පුටුවේ වාඩි කරවන්න පුළුවන් වුණේ. ඒ නායකත්වය දීපු උපදෙස් නිසා තමයි එක්සත් ජාතික පක්ෂයේ අපි සියලුදෙනා එදා එතුමාව ජනාධිපති කරන්න මහන්සි වුණේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්සත් ජාතික පක්ෂයත් විනාශ කළාය, තමනුත් විනාශ කළාය කියා එතුමා කිව්වා. නැහැ. එතුමා විනාශ වෙන්නේ එතුමා

[ගරු අනුර සිඩනි ජයරත්න මහතා]

විහින් කර ගන්නා දේවල්වලිනුයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා නොවෙයි, එක්සත් ජාතික පක්ෂය විනාශ කළේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට ගැන හිතලා, එතුමාගේ පක්ෂයේ සියලුදෙනාගේම සහයෝගය අරගෙන ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පුද්ගලයා ජනාධිපති කළා. නමුත්, එතුමාට ඕනෑ වුණේ මොකක්ද? එතුමා ජනාධිපති වුණාට පස්සේ එතුමාගේ ඊළඟ පියවර වුණේ, ඊළඟ ජනාධිපතිවරණය ගැන හිතන එකයි. ඒ නිසායි එතැන ඉඳලා එක්සත් ජාතික පක්ෂයට අසාධාරණකම් කළේ. අවුරුදු තුනහමාරක් අපි මේ පාර්ලිමේන්තුවේ හිටියත් අපේ අය වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරන්න අපට බැරි වුණා. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඒ ගැන දන්නවා. මහවැලියේ, එතුමිය නියෝජනය කරන ප්‍රදේශයේ කොටසක් මොරගහකන්ද ව්‍යාපෘතියට යට වෙනකොට එතුමිය ඇවිල්ලා රැස්වීම්වලදී මොන තරම් දේවල් කථා කළාද කියා අපට මතකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අක්කර 1,000ක් මහවැලිය යටතට අරගෙන බෙදා දෙනවාය කියා අද දිනයේ පළවී ඇති "අද" පුවත් පත්හි මුල් පිටුවේ සඳහන් වෙලා තිබෙනවා. අද උදේ "දෙරණ" නාළිකාව මඟින් පත්තරවල විස්තර කියනකොට ඒක කිව්වා. මොකක්ද මේ කරන්නේ? අද මෛත්‍රීපාලගේ හිතවත් මිනිසුන්ට පොළොන්නරුවේ මහවැලි ඉඩම් බෙදනවා. මෛත්‍රීපාලගේ ඥාතීන්ට අක්කර පණහ, හැට බෙදනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ වාගේ කුණු දේශපාලනයක් කළේ නැහැ. අද පොළොන්නරුවේ හදන පාරවල්වල සම්පූර්ණ කොන්ත්‍රාත් ටික කරන්නේ කවුද? ත්‍රිවිධ හමුදාව යොදවා කරන ඉදිකිරීම්වලට භාණ්ඩ supply කරන්නේ කවුද? මෛත්‍රීපාල සිරිසේනගේ සහෝදරයෝයි. පොළොන්නරුවේ පාරවල් හදද්දී එක පාරකට එක සිරිසේන කෙනෙක් interlock ගල් ටික ගෙනෙනවා. තව පාරකට අනෙක් සිරිසේන interlock ගල් ටික ගෙනෙනවා. පාරවල් කාපට් කරන කොට තව සිරිසේන කෙනකුගේ interlock ගල් ගෙනෙනවා. එස්.බී. දිසානායක කියපු දේවල් මගේ මේ tab එකේ තිබෙනවා. මම ඒවා කියන්නම්. "මෛත්‍රීපාල සිරිසේනට ඉන්නවා, වැලි රජෙක්; සිරිසේනට ඉන්නවා ගල් රජෙක්; සිරිසේනට ඉන්නවා වී රජෙක්" කියලා එතුමා කිව්වා. අද එක සිරිසේන කෙනකු මේ රටේ අංක එකේ පොහොසතා වෙන්න හදනවා. ඒ සිරිසේන තමයි මේ කුමන්ත්‍රණයේ ඉන්න පළමුවැනි හවුල්කාරයා. ඒ නිසා අද මේ මනුෂ්‍යයා කථා කරන්නේ කටින්ද කියලා අපට හිතෙනවා.

ඊයේ උසාවි තීන්දු ගැන කථා කළ හැටි අපි දැක්කා. අපට මතකයි, එතුමා පාර්ලිමේන්තු වට රවුම් ළඟදි කිව්වා, "මේ අගමැතිවරයා පත් කළ එකට විරුද්ධ නම් උසාවි යන්න" කියා. අපි උසාවියට ගිය නිසා තහනම් නියෝගයක් දුන්නා. අද උසාවියට අපහාස කරනවා. ඒ තීන්දු, මහානායක හිමියෝ දේශනා කරන්න තිබුණු බණ විහාරාධිපති හිමිනමක් දේශනා කරනවා වාගෙයි කියලා සමහරු කියනවා ලු. සමහරු කියනවාලු ස්වාධීනයි කියලා; සමහර අය කියනවාලු මධ්‍යස්ථයි කියලා; සමහර අය කියනවාලු, ඒක පාර්ශ්විකයි කියලා. ඒක පාර්ශ්විකයි කියන්නේ සිරිසේනගේ කණ්ඩායමේ අයයි. මේ රටේ උසාවිය අද සාධාරණය ඉෂ්ට කර තිබෙනවා.

අද උසාවියේ නියෝගත් පිළිගන්නේ නැති විධියට කටයුතු කරමින් මේ ගොල්ලන් මේ රට අරගෙන යන්නේ කොතැනකටද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විනාශ කළා. එය විනාශ කරලා, මුළු ව්‍යවස්ථාවම විනාශ කළා. මන්ත්‍රීවරු 224දෙනකු මේ පාර්ලිමේන්තුවේදී සම්මත කළ ව්‍යවස්ථාව වෙනස් කළා. අපි එයට සාධාරණයක් ඉෂ්ට කරන්න ගියාම අද උසාවියට බලපෑම් කරනවා. ඉතින් මේ රට කොහාටද යන්නේ?

අද එතුමා පුදුමාකාර දේවල් කියනවා. උතුරේ ජනතාවගේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න යනකොට රනිල් වික්‍රමසිංහ ඒක නැවැත්වූවා ලු; අවුල් කළා ලු. එක්සත් ජාතික පක්ෂය තමයි උතුරේ ප්‍රශ්නයට විසඳුම් හෙව්වේ. අපි විසඳුම් හොයන්න යනකොට මොකක්ද කරන්නේ? මෛත්‍රීපාල සිරිසේන මෙතැනදි එකක් කියනවා; මහානායක හාමුදුරුවෝ හම්බ වුණාම අස්ගිරි පාර්ශ්වයට එක දෙයක් කියනවා; මල්වතු පාර්ශ්වයට තව දෙයක් කියනවා; බෙල්ලන්විල පන්සලට ගියාම තව දෙයක් කියනවා; ගැටඹේ විහාරයට ගියාම තවත් දෙයක් කියනවා. මේ විසඳුම්වලට තනිකරම හරහට හිටියේ වෙන කවුරුවත් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේනයි. අපි මේ දෙබිඩි පිළිවෙත පැහැදිලිව දැක්කා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා එතුමාගේ තීන්දුවලදී රනිල් වික්‍රමසිංහ නායකතුමා නොසෙල්වී සිටියා. එතුමාට ඕනෑ විධියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා නවා ගන්න හැදුවා. නමුත් අපේ නායකතුමා එතුමාට ඕනෑ විධියට නැවෙන්න ගියේ නැහැ. අද අපි කණ්ඩායමක් විධියට ඉන්නවා. "මේ රටේ ඊළඟ අගමැති වෙන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ මැතිතුමා විතරයි, වෙන කිසි කෙනෙකු නොවෙයි" කියා එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම ඊයේ තීන්දු කළා. මෛත්‍රීපාලට ඕනෑ විධියට එක්සත් ජාතික පක්ෂය නවන්න බැහැ. මෛත්‍රීපාල සිරිසේනට ඕනෑ වුණේ මේ පක්ෂය කඩලා, මේ රට විනාශ කළ මහින්ද රාජපක්ෂ කියන මනුස්සයාත් එක්ක එකතු වෙලා, ඊළඟ මැතිවරණයට ගිහිල්ලා මහින්ද රාජපක්ෂ අගමැති වෙන, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වෙන න්‍යාය පත්‍රයකට යන්නයි. ඒ න්‍යාය පත්‍රයට යෑම වෙනුවෙන් තමයි පසුගිය දවස්වල මේ සියලු විනාශයන් කළේ.

ඒ අය මේ පාර්ලිමේන්තුවේ මොකක්ද කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය පුටුවේ වාඩි වුණේ කවුද? ඔය පුටුවේ වාඩි වුණේ එතනෝල්කාරයෙක්. ඔය පුටුව උස්සා ගෙන ගියේ කවුද? පොලිස් නිලධාරීන්ට කම්මුල් පහරවල් ගැහුවා; මිරිස් කුඩු ගැහුවා. ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාට, විජිත හේරත් මැතිතුමාට මෙතැනදී මිරිස් කුඩු ගැහුවා; පොත්වලින් ගැහුවා. මේවා කළේ කවුද? මුළු රටම මේ දේවල් බලාගෙන හිටියා. ඒකත් සාධාරණයි කියා ඊයේ කිව්වා. ලෝකයේ පාර්ලිමේන්තුවල ඕනෑ තරම් මෙවැනි සිදුවීම් වෙලා තිබෙනවාය කියා ඊයේ එතුමාගේ කථාවේදී කිව්වා. ඒකත් සාධාරණීකරණය කරන්න හදනවා. ඒ මොකද? එතුමාගේ කණ්ඩායම කළා නම් ඒක හොඳයි. එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කණ්ඩායම ඒක කළා නම් නරකයි. අද මෛත්‍රීපාල සිරිසේන ඒ විධියටයි දකින්නේ. විධායක ජනාධිපති හැටියට තමන් මේ රටේ කරන සියලු දේවල් ජනතාව අනුමත කරන්න ඕනෑය කියා මෛත්‍රීපාල සිරිසේන විශ්වාස කරනවා. අපි එහෙම අනුමත කරන්නේ නැහැ. එහෙම අනුමත කරන පාලකයෝ හිටියා. එහෙම අනුමත කරන පාලකයන්ට; ඒ පාලනයට විරුද්ධව තමයි, අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ; මන්ත්‍රීවරු 224දෙනෙක් අත උස්සලා එය සම්මත කර ගත්තේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව අලුත් ව්‍යවස්ථාවක් ගෙනාවේ මේ රට හරි මහකට ගන්නයි. ඒ යහපත් ක්‍රියාමාර්ගය නිසා තමයි අද මේ රටේ උත්තරීතර අධිකරණය සාධාරණ තීන්දු දෙන්නේ.

අද මේ රටේ කොමිෂන් සභා ක්‍රියාත්මක වෙනවා. ඒවාටත් බලපෑම් ඇති වුණා. ඒවා ආරක්ෂා කර ගන්න නම්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කියන එක අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ඉල්ලීම කරනවා. මොන

අභියෝග ආවත් අපි මුදලට ගන්න බැහැ. අද මන්ත්‍රීවරු මුදලට ගන්න හදනවා. දැන් තව කල් ඉල්ලනවා. බහුතරය හදා ගන්න තව කාලයක් ඕනෑය කියා මහින්ද රාජපක්ෂ කියා තිබෙනවා. බහුතරය හදන්න මහින්ද රාජපක්ෂට පුළුවන්ද? කොහොමද එය පුළුවන් වන්නේ? එහෙම බහුතරය හදාගන්න නම්, ආයෙත් දරුවෝ හදන්න වෙනවා. නැත්නම් සල්ලිවලට ගන්න ඕනෑ. එහෙම රුපියල් ශතවලට අපේ මන්ත්‍රීවරු ඒ පැත්තට යන්නේ නැහැ. රුපියල් ශතවලට ගිය අය හිටියා. අපි එහෙම යන්නේ නැහැ. රුපියල් ශතවලට මන්ත්‍රීවරු විකිණෙනවාය කියා මෛත්‍රීපාල සිරිසේනම තමයි කිව්වේ. කවුද ඉස්සෙල්ලාම විකිණුණේ? කොයි පැත්තටද ගියේ? ඒ අයගේ පැත්තටයි ගියේ. එතකොට ඒ පැත්තට යනකොට කවුද මිල නියම කළේ? අපේ පළමු මන්ත්‍රීවරයා ගත්තේ කවුද? අපි අරලියගහ මන්දිරයේ ඉන්න කොට ඩඩ්ලි සිරිසේන ඇවිල්ලා ඒ අවට කැසිනෝ ගහන ගමන් හවස හෝටල්වල ඉඳගෙන "ඩීල්" දමනවා; පණිවුඩ එවනවා; අල්ලා ගන්නවා; මුදල් දෙන්නම් කියනවා. ඒ ඇයි?

ඩඩ්ලි සිරිසේනට වුවමනාව තිබුණේ අයියා ජනාධිපති කරගෙන, ඊළඟට ලංකාවේ අංක එකේ පොහොසතා හැටියට පත් වෙන්නයි. අංක එකේ ධන කුවේරයා හැටියට පත් වෙන්නයි. ඔහුගේ ඉලක්කය ඒකයි. මේවා ඔහු මේ රටට ආදරය ඇතිව කරන දේවල් නොවෙයි. ඒ ලණුව මහින්ද රාජපක්ෂත් කෑවා. ඒ ලණුව මෛත්‍රීපාල සිරිසේනත් කෑවා. අපිව මිලට ගන්න බැහැ. අපි රුපියල් ශතවලට යන්නේ නැහැ. අපි රුපියල් ශතවලට යන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව මාස තුනක් අපි මෙතැන හිටියත්, ඔය සිටින සංඛ්‍යාවෙන් එක් කෙනෙකු හෝ ඒ පැත්තට අඩු වෙනවා හැරුණුකොට අපේ මන්ත්‍රීවරු සිරිසේනගේවත්, මහින්දගේවත් ඔය රුපියල් ශතවලට යන්නේ නැහැ. ඒ කුණු සල්ලිවලට අපේ මන්ත්‍රීවරු යන්නේ නැහැ. ඒ නිසා අපි අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා -එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා- සමඟ කෙළින් හිටගෙන මේ අසාධාරණය වෙනුවෙන් සටන් කරලා, අපේ අයිතිය දිනා ගන්නවා. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව හෙට-අනිද්දා වනකොට පාරට බහිනවා. මොකද, මේ රටේ අය වැය ලේඛනය නැති වනකොට, අය වැය ලේඛනයෙන් මුදල් වෙන් වන්නේ නැති වනකොට, සහනාධාර අඩු වනකොට, රජයේ සේවකයන්ගේ පඩි කැපෙනකොට -පඩි නැති වනකොට- මේ රටේ ආණ්ඩුවක් නැතිව රටේ කාර්යාල දුවනකොට ඒ තත්ත්වය සිදු වනවා. අපි මොන තරම් හොඳ වැඩසටහන් ආරම්භ කළාද? "ගම්පෙරළිය" වැඩසටහන නතර වෙලා. 'Enterprise Sri Lanka' කියන වැඩසටහන ගෙනාවා. ඒ වැඩසටහන ගෙනැල්ලා, ගමේ සිටින දුප්පත්, අභිංසක ව්‍යවසායකයන්ට, ව්‍යාපෘති කරන අයට නැඟී හිටින්න පුළුවන් විධියේ ව්‍යාපෘතියක් කරගෙන ආවා. ඒ මුදල් ලැබුණා. ඒ වැඩසටහන් ක්‍රියාත්මක වනකොටම මෙන්න ජනාධිපතිවරයා නින්දෙන් ඇහැරිලා වාගේ කියනවා, "බැංකු තුනේ සිටින අධ්‍යක්ෂ මණ්ඩලයි, සභාපතිවරුයි අයින් වෙන්න." කියා. ඇයි, එහෙම කළේ? බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල සහ සභාපතිවරු අයින් කළේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක වුණා නම්, "Enterprise Sri Lanka" වැඩසටහන ක්‍රියාත්මක වුණා නම් ඒ වැඩසටහන් ජනතාව අතරට යනවා. ඒ වැඩසටහන් ජනතාව අතරට ගියා නම් එක්සත් ජාතික පක්ෂයට මේ රටේ ජනතාව සදාකල් ආදරය කරනවා. ඒ නිසා සියලු වැඩසටහන් කඩාකප්පල් කරලා, මේ රට විනාශය කරා අරගෙන ගියේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියන ඒ කුහක මිනිහා කියමින් මම නිහඬ වනවා. මට කථා කරන්න වේලාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා.2.20]

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මියැදෙන්න යනකොට, පාර්ලිමේන්තුව තුළ ප්‍රජාතන්ත්‍රවාදය මියැදෙන්න යනකොට ඒ වෙනුවෙන් සටන් කරමින්, අපේ රටේ ගෞරවය රැක ගත් කථානායකතුමාට ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ප්‍රණාමය පුද කර සිටින්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඡෝවියට් රුසියාව නිර්මාණය කරපු වී.අයි. ලෙනින් "රාජ්‍ය සහ විප්ලවය" කෘතියේ කියනවා, "මිනිසුන් අතින් වැරැදි සිදු වීම සාමාන්‍ය දෙයක්. එහෙත් සමාව දිය නොහැකි වරද වන්නේ කළ වරද පිළි නොගෙන එය නිවැරැදි බවට තර්ක කිරීමයි." කියා. අද අපේ රටේ සිදු වෙමින් පවතින්නේ මේ ප්‍රකාශය යථාර්ථයක් බවට පත් වන වටපිටාවක් රට තුළ නිර්මාණය වීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව අගමැතිවරයා ඉවත් කිරීම පළමුවැනි වරදයි. ඒ පළමුවැනි වරද නිවැරැදි කිරීමක් ලෙස අනීතික අගමැතිවරයෙකු සහ අමාත්‍ය මණ්ඩලයක් පත් කිරීම දෙවැනි වරදයි. තුන්වැනි වරද, දෙවැනි වරදට එරෙහිව ගරු සභාවට ගෙනා විශ්වාස භංගයට මුහුණ නොදී එම ඡන්ද විමසීම අඩාළ කිරීමට කටයුතු කිරීමයි. මෙසේ අවස්ථා ගණනාවක් වැරැදි කරනකොට වරදවල් ගණනාවක් එතුමාට එකතු වෙනවා. අපි බහුතරය කියන කියන විධියට පෙන්නුවත් එතුමා එය පිළිගන්නට ලෑස්ති වුණේ නැහැ. "නොකෙරෙන වෙදකමට කෝදුරු තෙල් හත් පටටයකුත් තව ටිකක් ඕනෑලු." කියා අපේ ගම්වල කථාවක් තිබෙනවා. අන්න ඒ කථාව දැන් සනාථ කර තිබෙනවා. ඊළඟට එතුමා කරපු වරද තමයි, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ජනාධිපතිවරයාට නැති බලතලයක් පාවිච්චි කරමින් ජනාධිපති ධුරය භාෂ්‍යයට ලක් කිරීමක් ඉතිහාසයේ කළා නම්, ඒ අතින් මේ සිරිසේන ජනාධිපතිතුමා වාර්තාවක් පිහිටුවලා තිබෙනවා කියන එක මම කියන්න ඕනෑ. වාසනාවකට අපි ගෙනාපු රජය අධිකරණයට ගෙන දුන්න ස්වාධීනත්වය තුළ ඒ පිළිබඳව නිවැරැදි තීන්දුවක් ලබා දීලා තිබෙනවා. පත් කළ අගමැති හා අමාත්‍ය මණ්ඩලය බලරහිත බවට ප්‍රකාශ කර තිබෙනවා. මම ඉහතින් සඳහන් කළේ මෙතෙක් සිදු වෙච්ච දේ සැකෙවිනුයි. බරපතළ වැරැදි කීපයක් කර තිබියදීත් එතුමා ඊයේ ප්‍රසිද්ධියේ කියනවා, "ඒවා සාමාන්‍ය දේවල්." කියා.

එහෙම නම් අපිට පැහැදිලියි, ජනාධිපතිතුමා ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මිරිස්කුඩු ප්‍රජාතන්ත්‍රවාදී මන්ත්‍රී කණ්ඩායම කළ වරද නිවැරදි බවට සමාජගත කිරීමේ අසාර්ථක ප්‍රයත්නයක නියැළී ඉන්නවාය කියලා. එහෙම නම් මේ සිද්ධ වෙන්නේ මොකක්ද? විධායකය මඟින් ව්‍යවස්ථාව යටපත් කිරීමයි. විධායකය කියන්නේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ වැදගත්ම ආයතනයයි. මහජන මන්ත්‍රීවරුන් නිශ්චිත කාල සීමාවකට පත් වෙන්නේ, ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාවට නංවන්නටයි. අද ජනාධිපතිතුමා ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී කණ්ඩායම මහජන නියෝජිතයන්ගේ බලය - ව්‍යවස්ථාදායකය- නොසලකා හරිමින් මැතිවරණයක් ගැන කථා කරනවා, හරියට හිට්ලර් වාගේ. හිට්ලර් ව්‍යවස්ථාදායකය පැත්තකට දමා, අධිකරණය නොසලකා හැරලා, "අපි ජනමතයකට යන්න ඕනෑ"ය කියායි කිව්වේ. නමුත් කථා කළේ නැහැ, මේ ජනමතය කොහොමද, ලබා ගන්නේ කියා. අපිට 225ක් එකතු වෙලා පාර්ලිමේන්තුව ඇතුළේ විසඳා ගන්න තිබෙන ප්‍රශ්නයේදී ඒ අය හැසිරිව්ව හැටි බලනකොට, එළියට බැහැලා අපි ජනමතයක් විමසන්නේ කොහොමද කියා අපට ලොකු සැකයක් තිබෙනවා.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

මැතිවරණයක් වැදගත්. නමුත් මැතිවරණයක් සිද්ධ වෙන්න ඕනෑ, ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන අනුවයි. එහෙම නැතුව මැතිවරණයක් සිද්ධ වෙන්න ඕනෑ, තමන්ගේ මනදොළ පිනවා ගන්නට නොවෙයි, එහෙම නැත්නම් ආඥාදායකත්වයෙන් නොවෙයි, එහෙම නැත්නම් පෞද්ගලික මති මතාන්තර, කෝන්තර පිරිමහගන්න නොවෙයි, වෛරී දේශපාලන හැඟීමකින් නොවෙයි. එහෙම නම් ඉහත කී කාරණා ඔය කියන විධියට කරන්න පුළුවන් වෙන්නේ, එක්කෝ මන්දමානසිකත්වයෙන් පිරිච්ච පිරිසකට; එහෙම නැත්නම් උන්මත්තකයෙකුට විතරයි කියන එකයි මගේ පෞද්ගලික මතය.

මට මතක් වෙනවා, මම කියවපු පොතක්. කැලිෆෝනියාවේ, බර්ක්ලී සරසවියේ මනෝ විද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩකර් කෙල්ටනර් මහතා වසර විස්සක අධ්‍යයනයකින් පසුව පොතක් ලියනවා, "බලය සමඟ මිනිසාගේ හැසිරීම" කියා. එම පොතේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා. "බලය ලබා ගැනීම සඳහා සංවේදිභාවය, සාමුහිකත්වය, විවෘතභාවය, සාධාරණත්වය, බෙදාහදා ගැනීම වැනි සාධනීය ලකුණු මත කටයුතු කරන්නා බලය ලැබීමෙන් පසු ආචාරශීලීත්වය අත්හරිනවා, ආත්මාර්ථකාමී ලෙස හා අයුක්තිසහගත ලෙස කටයුතු කරනවා." කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි අත් විඳින්නේ ඒකයි. හිට්ලර් ජර්මනියට ගිනි තිබ්බා වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-මහත්මයා මේ රට අරාජික කර තිබෙනවා. හරියට මොන්ටිසෝරි ළමයින් වාගේයි. "ඔයා ඉන්නවා නම්, මම එන්නේ නැහැ." කියනවා. අන්න ඒ වාගේ ප්‍රකාශ තමයි එතුමා කරන්නේ. රටක් කරනවා කියන්නේ, සෙල්ලම් ගෙයක් කරනවා වාගේ නොවෙයි. අද එතුමා පඳුරේ පහරපු මොකාදෝ වාගේ හත්පොළේ ගා ගෙන ඉන්නවා. එතුමාගේ හිතුවක්කාරී තීරණ මේ රට විනාශ කර තිබෙනවා. ඒවා ගැන මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමන්ලා පැහැදිලිව සඳහන් කළා, රටක් වශයෙන් අපි අද මුහුණ දීලා තිබෙන තත්ත්වය. රට පඹ ගාලක පැටලිලා තිබෙනවා. ඒ වාගේම එතුමා, අපි පුංචි කාලයේ ඉගෙන ගත්ත කොහොල්ලෑ බබාගේ කථාවේ, කොහොල්ලෑ බබාගේ ඇලිච්ච නරියා වාගේ වෙලා තිබෙනවා. ඒ නිසා අපි එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ. 225ක් අත්සන් කළත්, එතුමාගේ ස්ථාවරයේ ඉන්නවා කියනවා නම්, තමන්ට හරියන කෙනා එනතුරු අගමැතිකම දෙන්නේ නැහැ කියනවා නම්, ඒක තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොයි වගන්තියේද කියා අපි අහනවා. ඒකේ තිබෙන්නේ බහුතරය පෙන්වන කෙනාට අගමැතිකම ලබා දිය යුතුයි කියායි. විවාහයක් කර ගන්න කවුරුහරි හොයනවා නම්, තමන්ට කැමැති කෙනා හම්බවෙනතුරු හිටියාට කමක් නැහැ. මේක ඊට වඩා එහා ගියපු සිදුවීමක් කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඊළඟට, මම මේ වෙලාවේ තවත් කාරණයක් මතක් කරනවා. රටක සිවිවැනි ආණ්ඩුව ලෙස ක්‍රියා කරන්නේ ජනමාධ්‍ය කියා අපි හඳුන්වනවා. ඒ නිසා ඒ ගැන ප්‍රකාශයක් කරන්න ඕනෑ. රටක සිවිවැනි ආණ්ඩුව කියා සලකන ජනමාධ්‍යයේ ඇතැම් ආයතන වර්තමානයේ ක්‍රියා කරන ආකාරය බොහොම ශෝචනීයයි කියා කියන්න ඕනෑ. ජනමාධ්‍ය අයිතිකරුවන්ගේ පරමාර්ථය කුමක් වුණත්, ජනමාධ්‍ය කරන මාධ්‍යවේදීන් රටේ පුරවැසියන් ලෙස තමන්ගේ හෘදය සාක්ෂිය ක්‍රියා කරන ආකාරය විමසා බලන්න කියා මම මේ වෙලාවේ මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් ඉල්ලා සිටිනවා. ඔබ හසුරුවන පැන, ඔබගේ මයික්‍රෆෝනය නිවැරදිව, නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකළහොත්, යළිත් වතාවක් නිවැරදි කළ නොහැකි වරදක් රටට සිද්ධ වෙනවා නොඅනුමානයි.

ජෝන් රස්කින් වරෙක කියනවා, "නිවැරදි තොරතුරු නොලබන සමාජයක් කවදා හෝ කාගේ හෝ වහලුන් බවට පත් වෙනවා නොඅනුමානයි" කියලා. ඔබ, පෞද්ගලිකත්වයෙන්, ද්වේශ සහගතව, අත්තනෝමතිකව ක්‍රියා කරන පිරිසකගේ; තමන් කළ දේ, තමන් වගකිව යුතු දූෂිත පාලන සමයක් නීතිය හමුවේ යටපත් කරන්නට උත්සාහ දරන පිරිසකගේ මනදොළ පුරවන්නට මාධ්‍ය හසුරවනවා නම්, ඔබ සිදු කරන්නේ මේ රටේ ජනතාව පතුලක් නොමැති අගාධයකට අරගෙන යාම පමණක් නොව, නොදැනුවත්වම ඒකාධිපති, ආඥාදායකත්වයක වහලුන් බවට පත් වීමයි කියන එක මේ රටේ සමස්ත ජනමාධ්‍යයට මම මේ වේලාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනාධිපතිතුමා යැයි පත් කර ගත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් මම අවසාන වශයෙන් බොහොම ගෞරවයෙන් මෙසේ ඉල්ලීමක් කරනවා. අපි 2015 වර්ෂයේ ජනවාරි මාසයේ ඔබතුමාට මේ තනතුර ලබා දුන්නේ මේ රටේ සංහිඳියාව ඇති කිරීමට මිස, මේ රට ගිනි තියන්නට නොවෙයි කියන එක මම මතක් කරනවා. මොකද, එතුමාගේ කටින්ම ප්‍රකාශ කර තිබුණා, "මම මේක ගිනි තියනවා" කියලා. ඒක වගකිව යුතු ජනාධිපතිවරයෙකුගෙන් කියවිය යුතු ප්‍රකාශයක් නොවෙයි.

ඔබතුමාට මේ තනතුර ඔරොත්තු නොදෙන්නේ නම්, ඔබතුමා ප්‍රකාශ කරන හැටියට, පොළොන්නරුවේ තිබෙන ඉඩම් කැබැල්ල වගා කරගෙන, තමන්ගේ ගෞරවයත්, රටේ ගෞරවයත් රැක දී ගෙදර යන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 2.29]

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது எமது நாட்டில் அரசியல் ரீதியாகவும் பொருளாதார ரீதியாகவும் பல தளம்பல்கள் ஏற்பட்டுக்கொண்டிருக்கின்றன. இவ்வாறானதொரு நிலையிலே, இந்தப் பாராளுமன்றத்தில் பாராளுமன்ற ஜனநாயகத்தைப் பாதுகாப்பதற்கு எங்களது கௌரவ சபாநாயகர் அவர்கள் மிகவும் கரிசனையாகச் செயற்பட்டிருக்கின்றார்; செயற்பட்டுக்கொண்டிருக்கின்றார். அவருக்குப் பல அச்சுறுத்தல்கள், பல நெருக்கடிகள் வந்தபோதும்கூட, நீதி, நியாயம், தர்மம் என்பவற்றைக் கடைபிடித்து அவர் பாராளுமன்றத்தைச் சிறந்த முறையில் நடாத்தி வருவதையிட்டு, நான் அவருக்கு இந்த இடத்தில் எனது கௌரவமான நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாட்டிலே கடந்த ஐப்பசி மாதம் 26ஆம் திகதிக்குப் பின் பாரிய தளம்பல் நிலை காணப்படுகிறது. இன்று மக்கள் பாராளுமன்றத்தையும் சனாதிபதியையும் விமர்சிக்கின்ற நிலைமை அதிகரித்துக்கொண்டிருக்கின்றது. இது பொருத்தமான செயற்பாடு அல்ல. உண்மையிலேயே இந்த நாட்டில் நிறைவேற்றுத்துறையாக சனாதிபதி இருப்பதோடு, சட்டத்துறையாகப் பாராளுமன்றமும் நீதித்துறையாக நீதிமன்றங்களும் இருக்கின்றன. இவற்றுள் ஒன்று இன்னொன்றைக்

கட்டுப்படுத்தக் கூடாது. ஒன்றின் சுயமான செயற்பாட்டில் இன்னொன்று தலையிட முற்படுமாக இருந்தால், அது பாரிய விளைவை ஏற்படுத்தும். கடந்த ஐப்பசி மாதம் 26ஆம் திகதிக்குப் பின் மாண்புமிகு சனாதிபதியினால் இந்த நாட்டில் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளை உற்றுநோக்கினால், அவை உண்மையிலே அரசியலமைப்புக்கு முரணாக இருப்பதை நாங்கள் காணலாம். அவர் தீடீரென இவ்வாறான செயற்பாடுகளை மேற்கொண்டிருக்கிறார். நாங்கள் கடந்த காலத்தில் சனாதிபதியைச் சந்தித்தபோது அவரைப் பற்றிப் பெருமையாகப் பேசிக்கொண்டோம்; அவரது நடவடிக்கை களைப் பற்றிப் பெருமையாகப் பேசினோம்; மக்களும் அவ்வாறு சொன்னார்கள். ஆனால், இப்போது மக்கள் வித்தியாசமாகப் பேச ஆரம்பித்திருக்கின்றார்கள். அதேபோல, நாங்களும் வித்தியாசமாக எண்ணவேண்டிய சூழல் உருவாகி இருக்கின்றது. தொடர்ச்சியாக ஒரு பெரிய சதி முயற்சியினுள் சனாதிபதி இருந்துகொண்டிருக்கின்றார் என்ற செய்தி மக்கள் மத்தியிலும் எங்கள் மத்தியிலும் ஊடுருவிக் கொண்டிருக் கின்றது.

குறிப்பாக, "225 பாராளுமன்ற உறுப்பினர்களும் சொன்னாலும்கூட, அவர்கள்மூலம் தெரிவாகின்ற ஒருவரைப் பிரதமராக நியமிக்கமாட்டேன்" என்று ஜனாதிபதி அவர்கள் உறுதியாகக் கூறுவதாகவிருந்தால், அவர் அரசியலமைப்பை முற்றாக மீறுகிறார் என்பதுதான் உண்மை. அரசியலமைப் பைப் பாதுகாப்பதில், அதை நடைமுறைப்படுத்துவதில் அவருடைய பங்கு முக்கியமானது. ஆனால், அவர் அதனைத் தவற விட்டிருக்கின்றார். அதனை நாங்கள் ஒவ்வொரு நடவடிக்கையிலும் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இதனைப் பார்க்கும்போது இன்னுமொன்றைச் சந்தேகிக்கத் தோன்றுகின்றது. அதாவது அவர் ராஜபக்ஷ குழுவினரின் பிடிக்குள் ஏதோவொரு விதத்தில் இறுகியிருக்கிறாரா? என்ற கேள்வி எழுகின்றது; அவர் ஏன் தொடர்ந்து அவ்வாறு தன்னுடைய செயற்பாடுகளை மாற்றாமல் ஒரே முடிவில் இருந்துகொண்டிருக்கின்றார் என்ற சந்தேகம் வலுப்பெறு கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ராஜபக்ஷ ஆட்சி வேண்டாம் என்பதைத்தான் எங்கள் மக்கள் விரும்பினார்கள். மைத்திரிபால சிறிசேன ஜனாதிபதி அவர்கள் ஜனாதிபதி வேட்பாளராக வந்தபோது, அவர் தமிழ் மக்களுக்குப் பொருத்தமானவர் என்று அவரை விரும்பி அவரைத் தெரிவதற்கு அந்த மக்கள் வாக்களிக்கவில்லை; சரத் பொன்சேகா யுத்தத்தில் ஈடுபட்டவர். எனவே, அவரை ஆட்சிக்குக் கொண்டுவந்தால் தமிழ் மக்களுக்கு நியாயம் கிடைக்குமென்று அவரை முற்றுமுழுதாக விரும்பி அந்த மக்கள் அவரை ஏற்கவில்லை. ஆனால், மஹிந்த ராஜபக்ஷ ஆட்சிக்கு வரக்கூடாது என்பதற்காகத்தான் ஜனாதிபதித் தேர்தல்களிலே எங்களுடைய மக்கள் மைத்திரிபால சிறிசேனவுக்கு வாக்களித்தார்கள்; சரத்பொன்சேகாவுக்கு வாக்களித்தார்கள். மைத்திரிபால சிறிசேன அவர்கள் ஜனாதிபதியாக வந்த பின்பு, தமிழ் மக்களுக்கு நியாயமான செயற்பாடுகளைச் செய்வதாக எடுத்துக்கூறிச் சில விடயங்களைக் கையாண்டார். அதனை நாங்கள் வரவேற்றோம். ஆனால், அவர் தற்போது செய்கின்ற விடயங்களைப் பார்க்கின்றபோது மிகவும் வேதனைய டைகின்றோம். பிழைவிடுவது மனித இயல்பு! ஆனால், அதனைத் திருத்திக்கொள்ள வேண்டும். தொடர்ச்சியாகப் பிழையை விட்டுக்கொண்டிருப்பது பொருத்தமற்ற செயற்பாடாகும்.

மஹிந்த ராஜபக்ஷ ஆட்சிக் காலத்திலே, அவரது சகோதரர்களும் சேர்ந்து 'கிறிஸ் மனிதனை'க் கொண்டுவந்து வடக்கு, கிழக்கு மக்களை அச்சுறுத்தினார்கள். இன்று திடீரென எங்களது ஜனாதிபதியினால் போலியான பிரதமர் மற்றும் அமைச்சரவை உருவாக்கப்பட்ட பின் மட்டக்களப்பு மாவட்டத்திலே மீண்டுமோர் அச்சுறுத்தல் ஏற்பட்டிருக் கின்றது. அதாவது ஐக்கிய தேசியக் கட்சியும் அதனோடு சேர்ந்திருக்கின்ற கட்சிகளும் இணைந்து பிரதமராகத் தீர்மானிக்கின்ற ஒருவரை நாங்கள் ஏற்கத் தயார் என்று கடிதம் எழுதி, ஜனாதிபதியோடு கதைத்து, எங்களது குறித்த அறிக்கை வெளியான மறுநாளே மட்டக்களப்பில் பாரிய அச்சுறுத்தல் ஏற்படுத்தப்பட்டிருக்கின்றது. அதாவது மட்டக்களப்பு, வவுணதீவுப் பிரதேசத்திலே இரண்டு பொலிஸார் துப்பாக்கிப் பிரயோகத்திற்கு ஆளாகியிருக்கிறார்கள். அந்தப் பொலிஸார் மீது துப்பாக்கிப் பிரயோகம் செய்து அவர்களைக் கொலை செய்த முயற்சியை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். அது நியாமற்ற, காட்டுமிராண்டித்தனமான செயல் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். மக்கள் நிம்மதியாக வாழ்ந்து கொண்டிருந்த காலகட்டத்தில் இவ்வாறான செயற்பாடுகள் நடைபெறுவதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. இன்று மட்டக்களப்பிலே பதற்றமான ஒரு நிலைமை நிலவுகின்றது. அதற்குச் சில நாட்களுக்கு முன்பு நடைபெற்ற மாவீரர் தின நிகழ்வு சம்பந்தப்பட்ட சில விடயங்களைப் பொலிஸார் தடை செய்தார்கள் என்ற வகையிலே அந்த நிகழ்வின் ஏற்பாட்டாளர் களாக இருந்த முன்னாள் போராளிகளுக்கும் பொலிஸாருக்கு மிடையே சில வாக்குவாதங்கள் ஏற்பட்டதை மையமாகக் கொண்டு, அந்த முன்னாள் போராளிகள்தான் இதனைச் செய்திருப்பார்கள் என்ற சந்தேகத்தின் பேரிலே, இன்று சில கைதுகளும் அதனோடு தொடர்புபட்ட சில தேடுதல்களும் நடைபெறுவதனால், மனதளவிலும் உடலளவிலும் பெரிதும் பாதிக்கப்பட்டிருக்கின்ற முன்னாள் போராளிகளின் குடும்பத்தினரும் அதேபோன்று புனர்வாழ்வளிக்கப்பட்ட போராளிகளும் பயந்த நிலையில் இன்று அந்த மண்ணிலே வாழ்ந்துகொண்டிருக்கிறார்கள்.

அண்மையிலே வட்டக்கச்சியைச் சேர்ந்த முன்னாள் போராளியொருவர் கிளிநொச்சியிலே பொலிஸாரிடம் சரணடைந்தார் என்ற செய்தி வந்தது. சந்தேகத்தின் பேரிலே அவர் தேடப்படும்போது அவர் சரணடைந்திருக்கிறார். அதேபோன்று மட்டக்களப்பிலும் இருவர் கைது செய்யப்பட்டிருக்கிறார்கள்; விசாரணை நடைபெறுகின்றது. விசாரணை நடைபெற வேண்டும்; உரிய குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட்டு சட்டத்தின் முன் நிறுத்தப்பட வேண்டும். அதை நாங்கள் வரவேற்கின்றோம். ஆனால், முன்பு பாதிக்கப்பட்டு, துன்பத்தை அனுபவித்து மீண்டும் இயல்பு வாழ்க்கைக்கு வந்திருக்கின்ற முன்னாள் போராளிகள் தொடர்ந்து பாதிக்கப்படுவதற்கு நாங்கள் அனுமதிக்க முடியாது. ஆகையால், இந்த விடயத்தில் மிகவும் கரிசனையாகச் செயற்பட வேண்டும். மட்டக்களப்பு மக்களுக்கு ஏற்படுத்தப்பட்டிருக்கின்ற அந்த அச்சுறுத்தலிலிருந்து அந்த மக்கள் மீள வேண்டும். கௌரவ சபாநாயகர் அவர்கள் அதற்கேற்ற ஏற்பாடுகளை மேற்கொள்ள வேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன். அத்தோடு இந்த வேண்டுகோளை நான் ஜனாதிபதி அவர்களுக்கும் விடுக்க விரும்புகின்றேன்.

திடீரென வந்த போலி அரசாங்கத்தின் தலைவர் மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டிலே எல்லாப் பதவிகளையும் அனுபவித்திருக்கின்றார் என்பது உங்களுக்குத் தெரியும். அவர் ஏன் பிரதமராக இருந்துகொண்டு இந்தத் தேர்தலை நடாத்த வேண்டுமென்று எதிர்பார்க்கின்றார்? பிரதமராக இருக்கும் போது பாராளுமன்றம் கலைக்கப்பட்டுத் தேர்தல் வந்தால், பல ஊழல்களைச் செய்து அதன்மூலம் திரும்பவும் ஆட்சிக்கு

[ගරු සීතාදේවි යෝගේශ්වරන් මහතා]

වරලාම් එන්පතුතාන් අවරතුම් අවරතු කුලුක්කළිනතුම් එණ්ණමාක ඉරුක්කින්රතු. අන්ත අටිප්පටෙයිල්තාන් අවර්කළ් තුටිත්තක් කොණ්ටිරුක්කින්රාර්කළ්. ආනාල්, අවර්කළ් සෙය්ත ඌළල්කළ් පර්රි එල්ලෝරුක්කුම් තෙරියුම්. ඉක්කිය තේසියක් කට්සියින් තලෛවරාන රණිල් වික්කිරමසිංක අවර්කළුටෙය අරසාංකම් ආට්සික්කු වන්තපෝතු අවර්කළෛක් කෛතු සෙය්තු උළ්ළේ පෝටාත පාවත්තෛත්තාන් ඉප්පෝතු අවර් අනුපවිත්තුක් කොණ්ටිරුක්කින්රාර්. අතෛච් සෙය්තිරුක්ක වේණ්ටුම්. අතාවතු රාජපක්ෂ කුළුවිනරෛ උළ්ළේ පෝට්ටිරුක්ක වේණ්ටුම්. අප්පෝතුතාන් ඉන්ත නාට්ටිලේ නිම්මතියාක අරසියලෛ නටාත්තක්කූටියතාක ඉරුන්තිරුක්කුම්. එන්න කට්ටළෛ වන්තාලුම් අතනෛ මීරිච් සෙයර්පටුකින්ර විතමාක ඉප්පෝතු තිරුම්පවුම් සම්පන්තප්පට්ටවර්කළින් නටවටික්කෛ ඉරුන්තු කොණ්ටිරුක්කින්රතු. ආකවේ, ඉතිල් මාර්රම් වේණ්ටුම්. කෛරව උරුප්පිනර් මහින්ත රාජපක්ෂ අවර්කළ් තේර්තලෛ එතිර්පාර්ක්කින්රාර්. අවරුක්කු එන්තත් තේර්තල් වේණ්ටුම්? මාකාණ සපෛත් තේර්තල් වේණ්ටුම්. විරෛවාක නීංකළ් පාරාළුමන්ර උරුප්පිනර් පතවියෛ විටුත්තු, මාකාණ සපෛත් තේර්තලිල් තෝර්රි, මාකාණ සපෛ උරුප්පිනරාක වාරුංකළ්! අතන් පින්නර් පිරතේස සපෛත් තේර්තල් වරුම්පෝතු අතිලේයුම් පෝට්ටියිට්ටු පිරතේස සපෛ උරුප්පිනරාක වාරුංකළ්! ඉලංකෛයිල් එල්ලාත් තේර්තල්කළිලුම් පෝට්ටියිට්ට පෙරුමෛ උංකළුක්කුක් කිටෛක්කුම්. අන්තච් සෙයර්පාටුකළෛච් සෙය්තු, සකල පතවිකළෛයුම් වකිත්තු, නීංකළ් අතර්කාක 'කින්නස්' පුත්තකත්තිලෝ ඉලංකෛයින් වරලාර්රිලෝ ඉටත්තෛප් පිටියුංකළ්, නීංකළ් අට්ටූළියත්තෛච් සෙය්තු ඉටත්තෛප් පිටියාතීර්කළ් එන්රු කේට්ටුක්කොළ්ළ විරුම්පුකිරේන්.

එංකළතු නාට්ටින් ජනාතිපති අවර්කළ් ඉනියාවතු සින්තික්ක වේණ්ටුම්. "225 උරුප්පිනර්කළුම් සොන්නාලුම් රණිල් වික්කිරමසිංක අවර්කළෛප් පිරතමරාක නියමික්කමාට්ටේන්" එන්රු අවර් කූරුවතු අරසියලමෛප්පුක්කු මුරණානතු. අතේපෝන්රු, සෙයලාළර්කළුක්කු අමෛච්සර් පොරුප්පුක්කළෛ වළංකි අවර්කළෛ අන්ත අමෛච්සර්කළාකත් තංකළතු කටමෛකළෛ මේර්කොළ්ළ වෛප්පතුම් අරසියල මෛප්පුක්කු මුරණානතු. තොටර්ච්චියාක අරසියලමෛප්පුක්කු මුරණාන සෙයර්පාටුකළෛච් සෙය්යක්කූටාතෙන්පතෛ අවර් පුරින්තුකොළ්ළ වේණ්ටුම්. එංකළතු තලෛවර් අවරෝටු පේසුම්පෝතු අළකාකප් පල විටයංකළෛච් සොන්නාර්. අතාවතු ඉංකු කොණ්ටු වරප්පට්ට කුරිත්ත අත්තනෛ විටයංකළින්පෝතුම් නාංකළ් එතර්කාක උංකළුක්කු එතිරාක නටවටික්කෛ එටුත්තෝම් එන්පතු පර්රිච් සොන්නාර්. අතේනේරම් මුර්රුමුළුතාක අරසියලමෛප්පු මීරප්පටුකින්රතු එන්පතු පර්රික් කූරිනාර්. අප්පෝතු තලෛයෛ ආට්ටියවර් තිරුම්පවුම් පිෆෛකළෛ විටුවතෛ එංකළාල් අනුමතික්ක මුටියාතු. නියායත්තෛප් පුරින්තුකොළ්ළ වේණ්ටුම්. විසේටමාක, ඉන්ත නාට්ටිලේ පෞත්ත තර්මත්තෛප් පාතුකාක්කින්ර පෞත්ත මතත් තලෛවර්කළිටම් ඉන්ත උයර් සපෛයිලේ නාන් ඔරු වේණ්ටුකෝළ් විටුක්කින්රේන්. අතාවතු, ඉංකු අතර්මම් තලෛ තූක්කික් කොණ්ටිරුක්කින්රතු; තර්මම් තලෛ කුනින්තු කොණ්ටිරුක්කින්රතු. රාජපක්ෂ කුටුම්පත්තිනරුම් අවරතු අටියාට්කළුම් අතර්මත්තෛ මේර්කොණ්ටු වරුකින්රාර්කළ්. ආකවේ, තර්මත්තෛ නිලෛ නාට්ට වේණ්ටුම්. පෞත්ත මතත් තලෛවර්කළ් උටනටියාක ජනාතිපති අවර්කළෛ අමෛත්තු, අරසියලමෛප්පුක්කු මුරණාන වකෛයිල් සෙයර්පටාතවාරු එටුත්තුක් කූරි, අරසියලමෛප්පින්පටි පාරාළුමන්රත්තිල් නම්පික්කෛ පෙරක්කූටිය ඔරුවරෛ උටනටියාකප් පිරතමරාක නියමිත්තු, ඉන්තප් පාරාළුමන්රම් සුයමාක ඉයංකවුම් අත්තනෛ අනුකූලංකළුම් මක්කළුක්කුක් කිටෛප්පතර්කුම් වළිවකුක්ක වේණ්ටුමෙන්රු ඉන්ත උයර් සපෛයිලේ නාන් කේට්ටුක්කොළ්කින්රේන්.

නාන් ඉන්තච් සපෛයිලේ ඉන්නුම් ඔන්රෛක් කූර විරුම්පුකිරේන්. අතාවතු, එංකළ් නාකතීපප් පකුතියිලේ කුලෝතරන්, මකෝතරන් එන්කින්ර ඉරුවරුක්කු ඉටෛයිල් මාණික්ක ආසනත්තුක්කාකච් සණ්ටෛ ඒර්පට්ටතාකවුම් අවර්කළතු පිරච්සිනෛයෛත් තීර්ත්තු වෛප්පතර්කාක ඉන්ත නාට්ටුක්කු ඉරණ්ටාවතු තටවෛ කෞතම පුත්තර් වරුකෛ තන්තාර් එන්රුම් මකාවම්සත්තිල් කාට්ටප්පටුවතාක අරිකින්රේන්. කෞතම පුත්තර් අව්වාරු ඉන්ත නාට්ටුක්කු වරුකෛ තන්තු සමාතානත්තෛ ඒර්පටුත්ති වෛත්තාර්. ආකවේ, අවර්කළින් වාරිසුකළ් - අවර්කළ් මූලම් පෝතනෛයෛ මේර්කොළ්කින්රවර්කළ් - පෞත්ත උයර් තර්මත්තෛප් පෝතිප්පවර්කළ් තයවුසෙය්තු එංකළ් නාට්ටින් ජනාතිපති අවර්කළුක්කු අන්තත් තර්මත්තෛච් සරියාක උපතේසිත්තු, පාරාළුමන්රත්තින් කෞරවත්තෛප් පාතුකාප්පතර්කුම් පාරළුමන්රත්තිල් නම්පික්කෛයෛප් පෙරුම් ඔරුවරෛප් පිරතමරාක නියමිප්පතර්කුම් පාරාළුමන්රච් සෙයර්පාටුකළ් තංකුතතෛයින්රි නතෛපෙරුවතර්කුම් උතව වේණ්ටුමෙන්රු අන්ත පෞත්ත පෙරුමක්කළෛ ඉන්ත උයර් සපෛයිලේ කේට්ටුක්කොණ්ටු, නාන් ඕර් ඉන්තුවාක ඉරුන්තු ඉන්ත වේණ්ටුකෝළෛ නාන් විටුක්කින්රේන් එන්පතෛක් කුරිප්පිට්ටු විතෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 2.41]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු ඉෂාක් රහූමාන්)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට, අපට මහා විශාල කරදරයක් ඇති වෙලා තිබෙන යුගයක, අපට අද මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මම විශේෂයෙන් ස්තුති කරනවා.

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ගැන විවේචන කරන්නේ නැතිව හොඳ පිළිවෙළට කථා කර මම මේ කාරණා ඔබතුමාට කියන්නට බලාපොරොත්තු වෙනවා. ගරු ජනාධිපතිතුමනි, මගේ අතේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව -2015 වර්ෂයේ සම්මත කර ගත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය- ඔබතුමා උල්ලංඝනය කරලා ඉවරයි. ගරු ජනාධිපතිතුමනි, මේ ශ්‍රී ලංකාවේ සෞඳි රටේ, කුවේට් රටේ, ඩුබායි රටේ, කටාර් රටේ වාගේ රජවරුන්ගේ පාලනයක් තිබෙනවාය කියා ඔබතුමා හිතනවාද? මේ රට එහෙම රාජධානියක් වශයෙන් තිබෙනවාද? තාත්තාගෙන් පස්සේ පුතාට, ඒ පුතාගෙන් පස්සේ ඊළඟ පුතාට යන විධියට රජවරුන්ගේ පාලනයක් මේ රටේ තිබෙනවාද? ගරු ජනාධිපතිතුමනි, 1948දී අපේ රටට නිදහස ලැබුණාට පස්සේ, 1978 වර්ෂයේ සම්මත කර ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ඔබතුමා ජනාධිපති වුණාට පස්සේ දහනව වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා අපි සම්මත කළා. ඒ ව්‍යවස්ථාව අනුව මන්ත්‍රීවරුන් 225 දෙනෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒ මන්ත්‍රීවරුන් 225 දෙනා අත්සන් කර දුන්නත් මම අගමැති ධුරය ලබා දෙන්නේ නැහැ කියන කථාව තවම ඔබතුමා කීම ගැන අපට මහා විශාල කනගාටුවක් ඇති වී තිබෙනවා.

පසුගිය දා ඔබතුමා පත් කළ කැබිනට් මණ්ඩලය -අගමැති, ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන්, රාජ්‍ය ඇමතිවරුන්-

සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කථානායකතුමා ඉදිරියේ නීත්‍යානුකූල විධියට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඒ විශ්වාස භංග යෝජනාව ගෙනා වෙලාවේ ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා හිටියේ ලංකාවේ ද නැත්නම් ලෝකයේ වෙන කොහේවත් ද කියා හිතාගන්නට බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එදා දවසේදී පාර්ලිමේන්තුවේ කථානායකතුමාට ඔබතුමාගේ කණ්ඩායම මහා විශාල ප්‍රශ්නයක් ඇති කළා. පොලීසියේ මහත්මයකුට - රටේ නීතියේ ආධිපත්‍යය රකින, සාමය ආරක්ෂා කරන, ඔබතුමාව ආරක්ෂා කරන අයට- කනට පහරක් දීපු එක ඔබතුමා අමතක කළාද? ඒ වාගේම ආගම්වලට සම්බන්ධ, භක්තියෙන් සලකන ධම්මපදය, කුරානය, බයිබලය, භගවත් ගීතාව වැනි වටිනා පොත්පත්වලින්, මොන්ටිසෝරි ළමයින් බෝල පාවිච්චි කරනවා වාගේ සභාවට පහර එල්ල කරපු එක ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා බැලුවේ නැද්ද? ඔබතුමා කිව්වා, "මට මේ විශ්වාස භංග යෝජනාව විශ්වාස කරන්නට බැහැ; මට පිළිගන්නට බැහැ"කියා.

ගරු ජනාධිපතිතුමනි, එතැනින් පස්සේ දෙවතාවක් අපි මන්ත්‍රීවරු 123 දෙනෙක් ඡන්දය දුන්නා. ඊළඟ දවසේ මන්ත්‍රීවරු 122 දෙනෙක් ඡන්දය දුන්නා. ඊළඟට අපි නැවත වතාවක් උසාවියට ගියා. උසාවිය නීත්‍යානුකූලව කටයුතු කළා. අද කැබිනට් මණ්ඩලයක් නැහැ; අමාත්‍යාංශත් නැහැ. අද ලංකාව නන්නත්තාර වෙලා තිබෙනවා. මගේ ආදරණීය රටේ ඉන්න හැට දෙලක්ෂයක් ජනතාව එදා 2015දී ඔබතුමාටයි, රනිල් වික්‍රමසිංහ මහතාටයි ඡන්දය දුන්නේ මෙවැනි දෙයක් ඇති කරන්නටද කියා ඔබතුමන්ලාගෙන් මම අහනවා.

2015දී මම දේශපානඥයෙක් නොවෙයි, ව්‍යාපාරිකයෙක්. එදා හැම වේදිකාවකම කරපු කථා මම අහගෙන හිටියා. ඔබතුමාට කරපු විවේචන මම අහගෙන හිටියා. ඔබතුමාට චෝදනා කරපු අයත් එක්ක අද ඔබතුමා එකට ඉන්න හැටි අපි දකිනවා. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔබතුමාට ඉස්සරහට යන්න දුන්නේ නැහැ ලු.

ගරු ජනාධිපතිතුමනි, 1978 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් පස්සේ ප්‍රේමදාස මැතිතුමා, විජේතුංග මැතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් පසු ඔබතුමා ජනාධිපති ධුරයට පත් වුණා. ඔබතුමා කියනවා, මේ අවුරුදු තුන හමාර තුළදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමායි, එතුමාගේ අමාත්‍ය මණ්ඩලයයි මට වැඩ කරන්න දුන්නේ නැහැ කියලා. ඒක අපට ලජ්ජා වෙන්න කාරණයක්. මේක විහිලුවක් ජනාධිපතිතුමනි. ඔබතුමා නැවත වතාවක් මේ වාගේ අඩු පාඩු තියන්න එපා. ඔබතුමාට තවමත් කල් තිබෙනවා. ඔබතුමා කියනවා, ඊළඟ ආණ්ඩුව හදන්න තීරණයක් ගන්න මට තව සතියක් ඕනෑ කියලා.

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා එකක් තේරුම් ගන්න. අද ඩොලරය රුපියල් 183යි. මම මේ රටේ ජනතාවට කියනවා, ඔබලාට හෙන ගහලා ගියත් මා ඇතුළු 225දෙනාට - ජනාධිපතිතුමාත් එක්ක 226දෙනාට- ගානක් නැහැ කියලා. ඒක ගණන් ගත්තා නම්, තේරුම් ගත්තා නම් ජනාධිපතිතුමා අඩියක් ඉදිරියට ගනියි, එහෙම නැත්නම් අඩියක් පස්සට ගනියි. මේ 225දෙනා, ඔබතුමාත් එක්ක 226දෙනා අද වෙනකම් බල තන්හාවෙන් තමයි කටයුතු කරන්නේ. අදට මේ ප්‍රශ්නයට හරියටම දවස් 41ක් වෙනවා. මේ රටේ ආර්ථිකය විනාශයි; සමාජය විනාශයි; සියලු දේ විනාශයි. ලංකාවේ ගන්න දෙයක් නැහැ. මෙහෙම තියෙද්දී ඔබතුමා කිසිම දෙයක් හිතන්නේ නැතිව වැඩ කටයුතු කරනවා.

ජනාධිපතිතුමනි, බොහොම කනගාටුයි. ඔබතුමා ජනාධිපති වුණාට පස්සේ ලියපු ලියවිල්ල තමයි; ව්‍යවස්ථාව තමයි මගේ අතේ තිබෙන්නේ. මේක සම්මත කළේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදීවත්, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදීවත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමියගේ කාලයේදීවත් නොවෙයි. ඔබතුමා ජනාධිපති වුණාට පස්සේ, ඔබතුමාගේ පාලන කාලයේ සම්මත කරපු ලියවිල්ල අතේ තියාගෙන තමයි මම මේ කථා කරන්නේ.

පසුගිය දවස්වල උසාවියෙන් තීන්දුව දුන්නා අමාත්‍ය මණ්ඩලය -කැබිනට් අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු- ඔක්කෝම ඉවරයි කියලා. දැන් ඒ ඔක්කෝම ඉවරයි. පාර්ලිමේන්තුවට ඒ කවුරුත් එන්නේත් නැහැ. ඇයි ඒ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් 123 දෙනෙක් අඩු කළොත් කීයද කියලා, පොඩි ළමයිනුත් -මොන්ටිසෝරි දරුවනුත්- කියනවා. හැබැයි, ජනාධිපතිතුමනි, ඔබතුමාට ඒ තරම් කණ්ඩායමත් නැහැ. උපරිමයෙන් 80ක්, 85ක් වාගේ කණ්ඩායමක් තමයි අපට දකින්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (3) ව්‍යවස්ථාවෙන් කියන්නේ මොකක්ද? ඒ අනුව දැන් අමාත්‍ය මණ්ඩලයට කිසිම බලයක් නැහැ. බලතල නැති ලේකම්වරුන් තමයි දැන් අමාත්‍යාංශවල ඉන්නේ. ලේකම්වරුනි, මා ඔබතුමන්ලාට දෙයක් කියන්න කැමතියි. ඔබතුමන්ලා වැඩ කරන්නේ රටේ නීතිය ආධිපත්‍ය ඇති කරන්නයි. හැබැයි, කනගාටුව තමයි, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයට වෙන් කරපු මුදල්වලින් මිලියන ගණනක් හිටපු අමාත්‍යාංශ ලේකම්තුමා කප්පාදු කරලා වෙන වෙන යෝජනාවලට දීලා තිබෙන එක. ගරු ලේකම්තුමනි, ඔබතුමන්ලාට මම කියන්නම්. මම මොන්ටිසෝරි දරුවෙකුගේ පොතක් අතේ තියාගෙන නොවෙයි කථා කරන්නේ. අපේ අතිගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ ලියවිල්ලක් ගැනයි මම කථා කරන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාවේ අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් ගැන සඳහන් වනවා. උසාවියෙන් අවලංගු කළාට පසුව කිසිම අමාත්‍යාංශයක තනතුරු නැහැ. පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු හොරකම් කරනවා, අල්ලස් ගන්නවා, කොමිෂන් ගන්නවා, පාතාලයට සම්බන්ධ වෙනවා, මිනීමරු චෝදනාවලට සම්බන්ධ වෙනවා කියලා කියනවා. ඔවුන්ට ජම්පර් ඇන්දුවාට කමක් නැහැ. හැබැයි, ලේකම්වරුනි, ඔබතුමන්ලා මේ රටේ නීතිය හා සාමය ඇති කරන්න ඕනෑ. ඔබතුමන්ලා අධ්‍යාපනය සම්බන්ධයෙන් කරන කර්තව්‍ය හරියට කරන්න. 2015 මහ මැතිවරණයෙන් පස්සේ අපේ සීනිතම්බි යෝහේස්වරන් මන්ත්‍රීතුමා කිව්වා, මේ අග්‍රාමාත්‍යතුමාත්, ජනාධිපතිතුමාත් මේ රටේ පසුගිය කාලයේ කරපු සියලු දේවල් එළියට දැම්මා කියලා. මම එකක් කියන්නම්. පරණ හොරු හිටියා නම් ඒ අයත් හොරු තමයි. යහ පාලන ආණ්ඩුවේ -අපි පත් කරපු ආණ්ඩුවේ- හොරු හිටියා නම් ඒ අයත් හොරු තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැරදි කරපු හැම කෙනාටම ජම්පරය අන්දවන්න. නැත්නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාට ගමට යන්න බැහැ. ගමේ ජනතාව කියනවා, අන්න හොඳ හොරෙක් එනවා, හොඳ කොමිෂන් කාරයෙක් එනවා, මිනීමරුවෙක් එනවා, පාතාලයත් එක්ක සම්බන්ධ වෙච්ච කෙනෙක් එනවා කියලා. මේ තනතුරු මුදල්වලට පාවා දීපු යුගයක් තිබුණා. මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික් ජනතාව මා පත් කළේ උත්තරීතර පාර්ලිමේන්තුවටයි. මම මුදල්වලට තනතුරුවලට යන්නේ නැහැ. මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 3යි මාස තුනක් වැඩ කළා. මා කල්පනා කළා මගේ ජනතාව මුදල්වලට පාවා දීලා යනවාද, තනතුරුවලට පාවා දීලා යනවාද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කාලය අවසානයි.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මන්ත්‍රීකම මුදල්වලට පාවා දුන්නෙත් නැහැ, තනතුරුවලට පාවා දුන්නෙත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,ඔබතුමාත් -ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා- අපේ මන්ත්‍රීතුමන්ලාත් එහෙම නැහැ. මා ඒ ගැන සතුටු වෙනවා. ඇමතිකම් දෙන්නම් කිව්වා. කෝටි-ප්‍රකෝටි ගණනක් මුදල් දෙන්නම් කිව්වා. ඔබතුමා ගියේ නැහැ. මම ඒ නිසා කියනවා, අපේ පාර්ලිමේන්තුවේ "යූඑන්එෆ්" කණ්ඩායම මුදල්වලට බාල්දු වෙන කණ්ඩායමක් නොවෙයි කියලා. ඒ වාගේම තනතුරුවලට බාල්දු වන කණ්ඩායමකුත් නොවෙයි. අපි කෙළින් ඉන්න කණ්ඩායමක්. අපි වෙනමොනවාටවත් නොවෙයි ඉන්නේ. අපි ඉන්නේ අගමැති රනිල් වික්‍රමසිංහ බෙරන්න නොවෙයි, ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමට විරුද්ධව අපේ ප්‍රතිපත්තිය අනුවයි.

මේ රටේ බහුතරය තිබෙන්නේ අගමැති රනිල් වික්‍රමසිංහට තමයි. කවුරු මොනවා කිව්වත්, කාටවත් ඒක නැහැ, බැහැ කියන්න බැහැ. එදා ලංකාවේ ආදරණීය ජනතාව ඡන්දය දුන්නේ, මෛත්‍රීපාල සිරිසේන මේ රටේ ජනාධිපති; රනිල් වික්‍රමසිංහ අගමැති කියලායි. අද කොහොමද ඒකට නැහැ, බැහැ කියන්නේ? ඒ නිසා ගරු ජනාධිපතිතුමනි, ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ නැතිව හරි වැඩ පිළිවෙළකට යන්න ඔබතුමාට දැනුත් අවස්ථාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එකක් කියලා කථාව නවත්වන්නම්. පොලීසියේ නිලධාරි මහත්වරු පසුගිය දවස් 41ක් පැය 24ම -රෑත් එක්කම- ඩියුටි. පැය 24ම ඩියුටි කරන ඒ අයට ඔබතුමන්ලා සහනයක් කරන්නේ නැහැ. මම ඇතුළු දේශපාලනඥයන් 225 දෙනෙක් ඉන්නවා. ඒ අයගේ සැප ජීවිත බලන්න. මේ පොලිස් නිලධාරීන් දවස් 41ක් තිස්සේ රෑ-දවල් නැතුව දුක් විඳිනවා. ඒ අයට සහනයක් කරලා දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමාට කියලා ඒ අයට 'ඕටී-බටා' ලබා දෙන්න. ඒ අය පිනට වැඩ කරන්න ආවේ නැහැ. රාජකාරි කරන්න ඇවිල්ලා කම්මුල් පහරවල් කන අය තමයි ඒ අය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ශ්‍රීළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා.2.55]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ජනතා විමුක්ති පෙරමුණේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාවේදී අදහස් දක්වන්න මටත් අවස්ථාවක් ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ රටේ ඇති වෙලා තිබෙන දේශපාලන හා සමාජ අස්ථාවරත්වය පිළිබඳව අද අපේ රටම, අපේ රටේ සියලු ජාතීන් කථා වෙනවා; මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ කවදාද කියන බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ වාගේම, මේ රටට ආදරය කරන, මේ ජාතියට ආදරය කරන පිරිසක් මේ සිද්ධිය නිර්මාණය වුණේ කොහොමද, ඒ නිසා ඇති වූ කරුණු කාරණා නිසා මේ රටේ කඩාගෙන වැටීම, මේ ජාතිය ජාත්‍යන්තරය ඉදිරියේ හෑල්ලුවට ලක් වීම පිළිබඳව ලොකු වේදනාවකින් ඉන්නවා. සුනාමිය වාගේ ස්වාභාවික උවදුරක් ඇවිල්ලා මේ ඉරණම අත්වුණා නම්, මේ ආර්ථිකය කඩාගෙන වැටුණා නම් රටේ සියලු ජනතාව එකතු වෙලා යම් විකල්පයක් හොයයි. නමුත් අද මේ රටට මේ ඉරණම අත්වෙලා තිබෙන්නේ, මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත් වුණ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ පෞද්ගලික අවශ්‍යතාවක්, පෞද්ගලික අරමුණක් හා පෞද්ගලික සිහිනයක් යථාර්ථයක් බවට පත් කර ගන්න යෑම නිසායි. ඒ නිසා අද මුළු රටම අගාධයට තල්ලු වෙලා තිබෙනවා. මේ රටේ විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකය තුළ තිබෙන්න ඕනෑ සම්බන්ධතාව පිළිබඳව, විධායකය හොබවන රාජ්‍ය නායකයාට, මේ රටේ ජනාධිපතිවරයාට අඹ මල් රොනකවත් අවබෝධයක් නොමැති වීම ගැන මේ පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරුන් වන අප කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මේ රටේ ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කළාය කියන එක, පක්ෂ පාට භේදයකින් තොරව මේ රටේ සියලු ජනතාව කථා කරනවා. මම ඒ ගැන වැඩි දුර කථා කරන්නේ නැහැ. මොකද, එතුමා ඒ ගත්තා වූ ක්‍රියා මාර්ග පිළිබඳව මම මේ කථා කරන මොහොතේත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින නිසා. අපේ රටේ සාමාන්‍ය ජනතාව ඇතුළු සියලුදෙනාම අද අධිකරණය ගැන බලාපොරොත්තුවෙන් සිටිනවා. මොකද, එවකට අගවිනිසුරුවරයා විධියට හිටපු සරත් එන්. සිල්වා කෙළසා දමපු මේ රටේ උත්තරීතර අධිකරණය ගැන අද අපට භක්තිමත් බලාපොරොත්තුවක් තියන්න පුළුවන් වෙලා තිබෙන නිසා. යම් අය කකුලෙන් අදිද්දී අමාරුවෙන් හෝ ස්වාධීන අධිකරණ පද්ධතියක් මේ රටේ ස්ථාපිත කරන්න මේ යහ පාලන රජයට හැකි වීම මේ රටේ අහිංසක සාමාන්‍ය ජනතාව ලබපු භාග්‍යයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පක්ෂ සම්මේලනයේදී සිරිසේන ජනාධිපතිතුමා ප්‍රකාශයක් කර තිබෙනවා, "සතියක් ඇතුළත මම මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් දෙනවා" කියලා. අපට නම් ඒ වචන පිළිගන්න බැහැ. මොකද හේතුව? පසුගිය ඔක්තෝබර් 26වැනි දා ඉඳලා එතුමාගේ ක්‍රියා කලාපය ගත්තාම, එතුමාගේ ප්‍රකාශ ගත්තාම, එතුමා ජාතිය ආමන්ත්‍රණය කරපු වාර ගණන ගත්තාම මේ රටේ සියලු ජනතාවට ඒවා විහිළුවක් වෙලා ඉවරයි.

එතුමා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ සහෝදර මන්ත්‍රීවරුත් කර කියාගන්න දෙයක් නැතිව අපිත් එක්ක කථා කරනවා. ඒ නිසා අපට එතුමාගේ ඔය සතිය ගැන විශ්වාසයක් නැහැ. මේ රට මෙතැනින් එහාට තල්ලු වෙලා ගිහින් එතුමා කවදා හරි නීතිය ඉදිරියට ගිහිල්ලා, එතුමා මේකේ චූදිතයෙක් වෙලා, තවත් සාමාන්‍ය පුරවැසියෙක් විධියට මේ ප්‍රශ්නයට අනාගතයේ දවසකදී සිරිසේන මහත්මයා උත්තර දෙයි. හැබැයි මේ රටට වෙන විනාශය, මේ ජාතියට වෙන විනාශය, තව අවුරුදු ගණනක් මේ රට ආර්ථික වශයෙන් කඩාගෙන වැටීමට වෙන විනාශයට වග කියන්න, සිරිසේන මහත්මයා හිරේ දාලා, සිරිසේන මහත්මයාට අනාගතයේ දවසක අධිකරණයෙන් ලැබෙන ඒ තීන්දුවට යටපත් වීමෙන් අපට සාධාරණීකරණය කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර ආයතනය නියෝජනය කරන්න අවුරුදු 5කට වරමක් අරගෙන ආපු අපට මෙහි වගකීමක් තිබෙන බව අපි විශ්වාස කරනවා. මේකේ ඉන්න කවුරු හරි පිස්සු නටනවා නම්, මේ ක්‍රියාදාමය තුළ ඒ පිස්සු නටන

පිස්සෙකුට අවස්ථාව දීලා ඇස් කන් පියාගෙන ඉන්න අයිතියක් අපට නැහැ. මේ රටේ ජනතාව ඒ වගකීම ලබා දීලා තිබෙන්නේ මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා අපටයි. මේ 225ටම අපේ රට ගැන වගකීමක් තිබෙනවා. අප සියලු දෙනා මේ රටේ ජනතාව නියෝජනය කරන්න ඇවිල්ලා ඉන්නවා නම්, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න කථා කරන්න ඇවිල්ලා ඉන්නවා නම්, අද මේ රටටම, ජාතියටම, මුළු මහත් ජනතාවටම සිදුවෙන මේ අපරාධය වෙනුවෙන් පෙනී සිටීමේ වගකීම අපට තිබෙනවා. අද ඒ වගකීම වෙනුවෙන් පෙනී සිටින්න ඉන්න අය වෙනම පාර්ශ්වයක් විධියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා, එක්කෝ canteen එකට වෙලා ඉඳලා යනවා. නැත්නම්, කොහේ හරි කඩපිලකට ගිහිල්ලා එක එක ප්‍රකාශ කරනවා. ඒ නිසා මේ රටේ සිටින ජනතාව තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. තමන්ගේ බලය සහ පැවැත්ම වෙනුවෙන් තීන්දු තීරණ ගන්න පිරිසක් මේ රටේ ජනතා පරමාධිපත්‍ය ආරක්ෂා කරන්න කථා කරනවා. මේ හාදයෝ මේ වචනයේ තේරුම දන්නේ නැහැ. තමන් ඡන්දය ඉල්ලා, තමන් බලාපොරොත්තු වෙන ආණ්ඩු බලය ලබා ගන්න බැරි වුණාම, ටික දවසක් ගිහිල්ලා ඡන්දයක් තියන එක ජනතා පරමාධිපත්‍ය කියලා විග්‍රහ කරනවා නම්, එක්කෝ ඒ අය දේශපාලනය දන්නේ නැහැ; එක්කෝ ඒ අය ඉගෙන ගෙන නැහැ; එක්කෝ ඒ අය මෙතැන වාඩි වෙන්න සුදුසු නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා පරමාධිපත්‍ය කියලා කියන්නේ අවුරුදු 5කට බලය දීලා, ඒක මේ උත්තරීතර ආයතනය තුළ සැබැවින්ම ක්‍රියාත්මක කරන්න ශක්තියක් දෙන එකටයි. එහෙම නැතිව, තමන්ගේ නඩු ටික කල් දමා ගන්න, තමන්ගේ නෝනාට තිබෙන නඩු ටික, පුතාට තිබෙන නඩු ටික කල් දමා ගන්න, මේ සිටින ආධුනික මන්ත්‍රීවරු ටික එකතු කරලා පාර්ලිමේන්තුවේ ඩෙගා නටන එකට නොවෙයි; මිරිස් කුඩු ගහන එකට නොවෙයි; මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආරක්ෂක නිලධාරින්ට තර්ජනය කරන එක නොවෙයි.

අද මේ රට අරගෙන යන්න තිබෙන නරකම දිසාවට අරගෙන ගිහිල්ලා ඉවරයි. තව සතියකින් උත්තර දුන්නත්, තව දවසකින් උත්තර දුන්නත්, සිරිසේන මහත්මයාත්, මහින්ද රාජපක්ෂ මහත්මයාත් මේ රටට, ජාතියට ඇති කරපු මේ ඛේදනීය තත්ත්වයට උත්තර දෙන්න මේ රටේ ජනතාව හිටගන්න ඕනෑ කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා. ඒක දේශපාලන භේදයකින් තොරව මේ රටේ ජනතාවගේ අයිතියක් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට ඉදිරි ගමනක් යන්න ආරම්භ කරපු වෙලාවක්. ඔක්තෝබර් මාසයේ 23වැනි දා, සංචාරක ක්ෂේත්‍රයේ හොඳම ගමනාන්තය විධියට Lonely Planet Website එකේ ඉහළින්ම ශ්‍රී ලංකාව නම් කරලා තිබුණු බව ඔබතුමාත් දන්නවා ඇති. නමුත්, අද වෙනකොට ඒක ඉතාමත්ම පහළට ගිහින් තිබෙනවා. අද කවුරුවත් අපේ රටට එන්නේ නැහැ. අද ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සංචාරක ක්ෂේත්‍රයේ අයට සම්මාන දීමේ උත්සවයක් තිබෙන බව මම දැක්කා. අද සියලුම සංචාරක ආයතන හිමි උදවිය ඒක වර්ජනය කරනවා. ඔවුන් ඒක වර්ජනය කළ යුතුයි. සංචාරක ක්ෂේත්‍රයට, hotel ක්ෂේත්‍රයට මේ අපරාධය කරපු මහත්මයාම අද මේකේ ප්‍රධානියා විධියට ඇවිල්ලා දෙන්නේ මොන සමරු තිළිණ ද? මේක මේ රටේ සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ මිනිස්සු හිතා ගන්නේ මොන ආකාරයටද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ වෙනුවෙන් ඉක්මන් විකල්පයක් අවශ්‍යයි. අපි විශ්වාස කරනවා, ගරු අධිකරණය මේ 7වැනි දා වන විට ඒ තීන්දුව අපට, රටේ ජනතාවට ලබා දෙයි කියලා. මේ රටේ ජනතාව අද වන විට ඒ තීන්දුව ලැබෙන තෙක් පෙළ ගැහිලා බලා ඉන්නවා, රට මොන දිසාවට ද යන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ අභිංසක මිනිස්සු වෙනුවෙන් පාර්ලිමේන්තුවට එන්න වරමක් ලැබුණු මම වාගේම, මේ රටේ අභිංසක මිනිස්සු නියෝජනය කරන්න පාර්ලිමේන්තුවට පැමිණි මේ 225 දෙනාගෙන් බහුතරයක් අද එක තැනකට එකතු වෙලා තිබෙනවා. අද එතැන දේශපාලනයක් නැහැ. එතැන රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති කරන්න කියලා කවුරුවත් කියන්නේ නැහැ. එතැන තිබෙන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කියන එකයි. මේ රට විනාශ කරන, මේ රටේ අයිතිය අපට නැති වෙන තැනට අරගෙන යන්න කටයුතු කරන මේ ජනාධිපතිවරයාගේ උන්මත්තක ක්‍රියාදාමය අනුමත කරන්නේ නැහැ කියන එක වෙනුවෙන් තමයි සියලු දෙනාම එතැනට එකතු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ දින කීපයෙන් පසුව තවදුරටත් අපට බලාගෙන ඉන්න බැහැ කියලා අපි සිරිසේන මහත්මයාට කියනවා. මේ රටේ ජනතාව අපෙන් විමසනවා, "මේකේ අවසානය එන්නේ කවදාද?" කියලා. අන්න ඒ අවසානය දකින්න මේ තිබෙන සදාචාරාත්මක ගමනින් ඔබ්බට ගිහිල්ලා සිරිසේන මහත්මයාත් එක්ක හිටගන්න වෙනවා. අන්න ඒ අවදානම් තැනට ජනාධිපතිතුමේ! ඔබ එන්න එපා කියන ආයාචනාත්මක ඉල්ලීම කරමින්, තරුණ මන්ත්‍රීවරයෙක් විධියට මේ රටට යහපතක් වෙන්න පුළුවන් හෙට දවසක් වෙනුවෙන් අපි සියලු දෙනාම එකට අත්වැල් බැඳ ගන්නවා කියමින් මගේ කෙටි වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි. The next speaker is Hon. Abdullah Mahrooff. ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු භේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දැන් ගරු භේෂා විතානගේ මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු භේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[பி.ப. 3.04]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற ஸ்திரமற்ற ஒரு தன்மையைப் பற்றி இன்று இந்தச் சபையிலே எடுத்துச் சொல்ல விரும்புகின்றேன். அதிமேதகு ஜனாதிபதி அவர்களுடைய முன்நடவடிக்கையின் காரணமாக இன்று இந்த நாடு ஸ்தம்பித்துப் போயிருக்கின்றது. அதிமேதகு ஜனாதிபதி அவர்கள் கடந்த ஒக்ரோபர் மாதம் 26ஆம் திகதிக்குப் பிறகு, ஐந்து Gazette பிரகடனங்களைச் செய்திருக்கின்றார். அவருடைய 50 வருட கால அரசியல் வாழ்வில் இந்த நாட்டினுடைய அரசியலமைப்புக்கு மாறாக அவர் எடுத்த நடவடிக்கைகள் காரணமாக ஓர் அரசாங்கம் இல்லாத, ஒரு பிரதம மந்திரி இல்லாத, ஓர் அமைச்சரவை இல்லாத நிலைமையில் இந்த நாடு நிர்வகிக்கப்படுகின்ற மிகக்கேவலமான ஒரு சூழ்நிலை இன்று இந்த நாட்டில் உருவாகி இருக்கின்றது. இன்று அந்த வர்த்தமானிப் பிரகடனங்களிலே இரண்டை நாங்கள் நீதிமன்றத்தில் கேள்விக்கு உட்படுத்தியிருக்கின்றோம். நீதிமன்றம் இந்த நாட்டினுடைய அரசியலமைப்புக்கு உத்தரவாதம் அளிப்பது போன்று அதனை ஏற்றுக்கொண்டு, எதிர்வரும் 7ஆம் மற்றும் 12ஆம் திகதிவரை அந்த வர்த்தமானிப் பிரகடனங்களைக் கேள்விக்குறியாக்கியிருக்கின்றது. அதேநேரம் இந்தச் சபையிலே கௌரவ சபாநாயகர் அவர்கள் ஒட்டுமொத்தப் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் ஒரு நம்பிக்கையை ஏற்படுத்தியிருக்கின்றார். GCE (O/L) பரீட்சைக்குத் தோற்றுகின்றவர்கள், உயர் வகுப்பு மாணவர்கள் மற்றும் ஏனைய கல்விசார் விடயங்களில் ஈடுபடுபவர்கள் மட்டுமல்ல, SLOS, SLEAS, SLAS போன்ற பரீட்சைகளுக்குச் செல்கின்றவர்களும்கூட இந்த நாட்டின் தத்துவங்கள் தொடர்பாக, அரசியல் யாப்புத் தொடர்பாக கேட்கப்படுகின்ற கேள்விகளுக்குச் சரியாகப் பதிலளிக்க முடியாத ஒரு நிலைமை இன்று ஏற்பட்டிருக்கின்றது.

1947ஆம் ஆண்டிலிருந்து 1972ஆம் ஆண்டு முதலாம் குடியரசு யாப்பு வரையான சோல்பரி அரசியல் யாப்பின்கீழ் உருவாக்கப்பட்ட யாப்புகளில் மகாதேசாதிபதிக்கு என்ன அதிகாரமிருகின்றது, பிரதம மந்திரிக்கு என்ன அதிகாரமிருக்கின்றது, பாராளுமன்றத்திற்கு என்ன அதிகாரமிருக்கின்றது என்ற விடயங்கள் எல்லாம் மிகத் தெளிவாகக் கூறப்பட்டிருந்தன. 1972ஆம் ஆண்டின் முதலாம் குடியரசு யாப்பின் பின்னர் 1977ஆம் ஆண்டு ஆட்சிக்கு வந்த ஜே.ஆர். ஜயவர்தன அவர்களின் 1978ஆம் ஆண்டின் யாப்பில் ஜனாதிபதி அவர்கள் எப்படி நியமிக்கப்படுகின்றார், பிரதம மந்திரி எப்படி நியமிக்கப்படுகின்றார், அமைச்சரவை அமைச்சர்கள் எப்படி நியமிக்கப்படுகின்றார்கள் என்பன எல்லாம் விரிவாகக் கூறப்பட்டிருக்கின்றது. 1978ஆம் ஆண்டின் யாப்புக்கு 2015ஆம் ஆண்டு மே மாதம் 15ஆம் திகதி கொண்டு வரப்பட்ட 19வது அரசியலமைப்புத் திருத்தம் வரைக்கும் நாட்டினுடைய ஜனாதிபதி, பிரதம மந்திரி, அமைச்சரவை எவ்வாறு நியமிக்கப்பட வேண்டும் என்பதுபற்றி மிகத் தெளிவாகக் கூறப்பட்டிருக்கின்றது.

நாட்டில் ஒரு நல்லிணக்க ஆட்சியை ஏற்படுத்துவதற்காக ஐக்கிய தேசியக் கட்சி, அகில இலங்கை மக்கள் காங்கிரஸ், ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ், ஜாதிக ஹெல உறுமய, தமிழ் முற்போக்குக் கூட்டணி ஆகியன ஒன்றிணைந்து ஐக்கிய தேசிய முன்னணியாக நின்று செயற்பட்டதன்மூலம் ஐம்பது வருட அரசியல் வாழ்வைக் கொண்டுள்ள எமது ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள், 62 இலட்சத்துக்கும் மேலான வாக்குகளைப் பெற்று ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்டார். நாட்டிலே இலஞ்சம், ஊழல் போன்றவற்றை ஒழித்து நீதியையும் சமாதானத்தையும் நிலைநாட்டி, நல்லிணக்க ஆட்சியையும் உண்டாக்கிச் சமூகங்களுக் கிடையில் நல்லுறவை ஏற்படுத்துவதற்காக உருவாக்கப்பட்ட இந்தத் தலைமைத்துவம், அந்த அத்தனை தலைவர்களையும் உதாசீனப்படுத்திவிட்டு, கடந்த ஒக்ரோபர் மாதம் 26ஆம் திகதி பதவியிலிருந்த கௌரவ பிரதம மந்திரி அவர்களைத் தன்னிச்சையாகவே பதவியிறக்கி, அமைச்சரவையைக் கலைத்து, அதன்பிறகு, இந்த நாட்டினுடைய மக்களால் அங்கீகரிக்கப்பட்ட சகல பாராளுமன்ற உறுப்பினர்களையும் பதவியிலிருந்து நீக்கி, இந்தச் சபையையும் எமது யாப்பையும் கேள்விக்குறியாக்கியிருக்கின்றது. ஆனால், இன்று அவர் நினைத்தால், இந்த நாட்டிலே மீண்டும் ஒரு நல்லாட்சியை - ஒக்ரோபர் 26ஆம் திகதிக்கு முன்னிருந்த ஆட்சியைச் சம்பந்தப் பட்டவர்களிடம் கௌரவமாக மீண்டும் ஒப்படைக்க முடியும்.

ஒக்டோபர் மாதம் 26ஆம் திகதிக்கு முன்னர் இருந்த ஆட்சியைக் கலைக்க முடியாது என்பதுபற்றி அரசியலமைப்புக் கான 19ஆவது திருத்தத்திலே 70(1) பிரிவிலே மிகத் தெளிவாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இன்று அரசிய லமைப்பின் 33(1), 33(2) பிரிவுகள் பற்றிக் கூறுகின்றார்கள். அதில் சனாதிபதியின் கடமைகள், தத்துவங்கள் மற்றும் பணிகள் தொடர்பாகக் கூறப்பட்டிருக்கின்றது. உச்ச நீதிமன்ற நீதியரசர்களை, அமைச்சர்களை, பிரதம மந்திரியை நியமித்தல் முதலிய விடயங்களும் மற்றும் குற்றவாளியை மன்னித்தல் என்பனவும் ஜனாதிபதிக்கான அதிகாரங்களாகும். 1978ஆம் ஆண்டு ஜே.ஆர். ஜயவர்தன அவர்களால் கொண்டுவரப்பட்ட அரசியல் யாப்பிலே, பாராளுமன்றத்துக்கு ஒரு வருடம் பூர்த்தியடைந்தால் அந்தப் பாராளுமன்றத்தைக் கலைப்பதற் கான அதிகாரம் சனாதிபதிக்கு இருக்கிறதென்று மிகத் தெளிவாகக் கூறப்பட்டிருக்கிறது. இந்தப் பாராளுமன்றத்துக்கு நான் மூன்றாவது முறையாகத் தெரிவுசெய்யப்பட்டு, இன்று இங்கு பேசிக்கொண்டிருக்கின்றேன். 2000ஆம் ஆண்டு, நான் ஆறு வருடங்கள் பாராளுமன்ற உறுப்பினராகப் பதவி வகிப்பதற்கே எனது மக்கள் ஆணை வழங்கியிருந்தார்கள். அன்று சந்திரிகா அம்மையார் அவர்களுடைய கட்சியைச் சேர்ந்த சிலர் கட்சி மாறியதன் காரணமாக அவருக்குப் பாராளுமன்றத்தில் பெரும்பான்மையைப் பெறமுடியாத நிலைமை உருவானது. அப்போது அவர் தனக்கிருந்த அதிகாரத்தைப் பயன்படுத்தி ஒரு வருட பூர்த்திக்குப் பின்பு குறித்த பாராளுமன்றத்தைக் கலைத்தார். அதில் பாதிக்கப் பட்டவர்களில் நானும் ஒருவன். அதாவது, எனக்கு மக்கள் ஆறு வருடங்களுக்கு ஆணை தந்தார்கள். ஆனால், நான் ஒரு வருடத்திலே வீட்டுக்குச் சென்றேன். 2001ஆம் ஆண்டு அதிகமான விருப்பு வாக்குகளைப் பெற்று மீண்டும் எனது மாவட்டத்திலிருந்து தெரிவாகிப் பாராளுமன்றத்துக்கு வந்தேன். இரண்டு வருடங்களும் மூன்று மாதங்களும் கழிந்த நிலையில் அம்மையார் அவர்கள் அந்தப் பாராளுமன்றத்தைக் கலைத்தார். அன்று ஆறு வருடங்கள் பாராளுமன்ற உறுப்பின ராகப் பதவி வகிப்பதற்குத்தான் மக்கள் வாக்களித்தார்கள். ஆனால், நான் அன்று இரண்டு வருடங்களும் இரண்டு மாதங்களும்தான் பாராளுமன்ற உறுப்பினராகப் பதவி வகிக்க முடிந்தது. ஏன், இதனை இங்கு கூறுகின்றேன் என்றால், 1978ஆம் ஆண்டு அரசியலமைப்பிலே, பாராளுமன்றத்துக்கு ஒரு வருடம் பூர்த்தியாகின்றபோது, அதைக் கலைப்பதற்கு சனாதிபதிக்கு அதிகாரம் உண்டு எனக் கூறப்பட்டிருக்கிறது;

ஜனாதிபதி அவர்கள் அது தொடர்பில் யாரிடமும் ஆலோசனை பெறவேண்டிய அவசியம் இல்லை. 2015ஆம் ஆண்டு, மே மாதம் 15ஆம் திகதிவரை – 19வது திருத்தத்துக்கு முன்னர் வரை இதே நிலைமைதான் இருந்தது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
Please give me two more minutes, Sir.

தற்போதைய அரசியலமைப்பின் 70(1) ஆம் உறுப்புரையிலே, 04 வருடங்களும் 06 மாதங்களும் பூர்த்தியாகும்வரை பாராளுமன்றத்தைக் கலைக்க முடியாது என்று தெளிவாகக் கூறப்பட்டிருக்கின்றது. அதற்கு மாறாக பாராளுமன்றத்தைக் கலைப்பதாக இருந்தால், அதற்கு ஆதரவாகப் பாராளுமன்றத்தின் 2/3 பெரும்பான்மை இருக்க வேண்டும். அதாவது ஒட்டுமொத்த 225 உறுப்பினர்களில் 150 உறுப்பினர்களின் ஆதரவுடன்தான் பாராளுமன்றத்தைக் கலைக்க முடியும் என்கின்ற தெளிவான அத்தாட்சி இருக்கின்றபோது இன்று எங்களுடைய ஜனாதிபதியவர்கள் பாராளுமன்றத்தைக் கலைத்து அசிங்கப்படுத்தியிருக்கின்றார். இந்த விடயம் இன்று உச்ச நீதிமன்றத்தில் கேள்விக்குட்படுத்தப்பட்டிருக்கின்றது. இதில் நீதிமன்றம் விதித்த இடைக்காலத் தடை உத்தரவு இந்த நாட்டு மக்களுக்கு ஒரு நம்பிக்கையை ஏற்படுத்தியிருக்கின்றது. 1978ஆம் ஆண்டு Constitution இலே ஜனாதிபதிக்கான அதிகாரம் என்ன? 1972ஆம் ஆண்டு அரசியல் யாப்பிலே ஜனாதிபதிக்கான அதிகாரம் என்ன? சோல்பரி அரசியல் யாப்பிலே பிரதம மந்திரிக்கான அதிகாரம் என்ன? என்ற கேள்விகளை எல்லாம் எதிர்காலத்திலே மாணவர்களிடம் கேட்கின்றபோது அவர்கள் அவற்றுக்குத் தெளிவாகவே பதிலளிக்க முடியாத அளவுக்கு இன்று நிலைமை காணப்படுகின்றது. இந்தச் சிக்கலிலிருந்து விடுபடுவதற்குப் பாராளுமன்றமோ அல்லது கௌரவ சபாநாயகர் அவர்களோ அல்லது நீதிமன்றமோ தீர்ப்பு வழங்கவேண்டிய அவசியமில்லை. ஜனாதிபதி அவர்கள் ஒட்டுமொத்தத்தில் ஒரு நல்ல முடிவை எடுக்க முடியும். ஆகவே, ஜனாதிபதி அவர்கள் ஒக்ரோபர் 26ஆந் திகதிக்கு முன்னர் உள்ள நிலைமைக்கு மீண்டும் இந்தப் பாராளுமன்றத்தைக் கொண்டு வர வேண்டும்; கௌரவ பிரதம மந்திரி ரணில் விக்கிரமசிங்க அவர்களிடம் ஆட்சியை ஒப்படைக்க வேண்டும்.

இந்தப் பாராளுமன்றத்தை இன்னும் ஒன்றரை வருட காலத்திற்குப் பின்னர் கலைப்பதற்கே இப்பொழுது ஜனாதிபதி அவர்களுக்கு அதிகாரம் இருக்கின்றது. அதாவது பாராளுமன்றத்தின் காலம் முடிவடைவதற்கு ஆறு மாதங்களுக்கு முன்னர் பாராளுமன்றத்தைக் கலைப்பதற்கு ஜனாதிபதி அவர்களுக்கு அதிகாரம் இருக்கின்றது. ஆனால், இதற்கு முன்னர் இருந்த ஜனாதிபதிகளுக்கு ஒரு வருடம் பூர்த்தியானவுடன் பாராளுமன்றத்தைக் கலைக்க அதிகார மிருந்தது. 19வது அரசியல் யாப்புத் திருத்தமானது சுயாதீன ஆணைக்குழுக்கள் பற்றி இந்த நாட்டிலே ஒரு நம்பிக்கையை ஏற்படுத்தி யிருக்கிறது. இன்று நாட்டுக்கு யாரும் துரோகம் செய்ய முடியாது. களவு, கொள்ளை போன்ற விடயங்கள் அத்தனைக்கும் நீதிமன்றத்திலே வகைசொல்ல வேண்டும். அன்று 18வது திருத்தத்தின்மூலமாக மஹிந்த ராஜபக்ஷ அவர்கள் தன்னிச்சையாக இயங்கியது போன்று 19வது திருத்தத்தின்மூலமாக எந்தவொரு ஜனாதிபதியாலும் தன்னிச்சையாக இயங்க முடியாது. 19வது திருத்தத்தைக் கடைப்பிடிக்காத பட்சத்தில் நாளை ஜனாதிபதி ஒரு பாராளுமன்றத் தேர்தலை நடத்திவிட்டு, இரண்டு - மூன்று மாதங்களிலே அந்தப் பாராளுமன்றத்தைக் கலைக்க முடியும். ஆகவே, நாட்டு மக்கள் உச்ச நீதிமன்றத்திலிருந்து சாதகமான தீர்ப்பினை எதிர்பார்க்கின்றார்கள். எனவே, ஜனாதிபதி அவர்கள் ஒக்ரோபர் 26இற்கு முன்னர் இருந்த அரசினை மீண்டும் கொண்டுவர வேண்டும். கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடைய தலைமையிலே அந்த அரசை நியமிக்க வேண்டும். அதற்கு இந்தப் பாராளுமன்றத்தில் 122 - 123 பேர் ஆதரவாக இருக்கின்றார்கள். ஆகவே, அவருக்குப் பிரதம மந்திரிப் பதவியைத் தர முடியாது என்று ஜனாதிபதி அவர்கள் கூற முடியாது; நாட்டு மக்களுடைய உரிமையை, இறைமையை மறுதலிக்க முடியாது. ஆகவே, 50 வருட அரசியல் வாழ்வைக் கொண்டுள்ள ஜனாதிபதி அவர்கள் இந்த விடயத்தில் சரியான தீர்ப்பை வழங்குவார் என்று எதிர்பார்த்து, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 3.15]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த நாட்டிலே ஏற்பட்டிருக்கக்கூடிய நிலைமை தொடர்பாக மக்கள் விடுதலை முன்னணியினால் முன்வைக்கப்பட்டிருக்கின்ற சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையிலே உரையாற்றுவதற்கு வாய்ப்பினைத் தந்தமைக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, கடந்த ஒரு மாத காலத்தினுள் ஏற்பட்டிருக்கக்கூடிய அசாதாரண சூழ்நிலையால் எமது நாடு பல வருடங்களுக்கு பின்தள்ளப்பட்டு, பொருளாதாரச் சீரழிவுக்கும் சிக்கலுக்கும் உள்ளாகியிருக்கின்றது. நான் மிக முக்கியமாக ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, இலங்கையினுடைய பெருந்தோட்டத்துறை நாட்டின் பொருளாதாரத்திலே கணிசமான பங்கினை வகிக்கின்றது. அதிலும் மலையகம் சார்ந்த பெருந்தோட்டத்துறை மக்களினது செயற்பாடு மிக முக்கியமானதாகும். அந்த வகையில் நாங்கள் குறிப்பாக தேயிலை வர்த்தகத்தைப் பற்றிக் குறிப்பிட வேண்டும்.

இந்த மக்களினுடைய நாளாந்தக் கூலியானது இரண்டு வருடங்களுக்கு ஒரு தடவை கைச்சாத்திடப்படுகின்ற கூட்டு ஒப்பந்தத்தின்மூலம் தீர்மானிக்கப்படுகின்றதென்பது உங்களுக்குத் தெரியும். அந்தக் கூட்டு ஒப்பந்தம் தீர்மானிக்கப் படுவதற்கான காலம் வந்து, கூட்டுப் பேரம் பேசல் இடம்பெற்றுக்கொண்டிருக்கின்றபோதே சூழ்ச்சியான முறையில் அரசாங்க மாற்றமானது இடம்பெற்றது. இந்தக் கூட்டு ஒப்பந்தத்திற்குரியவர்கள் அன்று ஓடோடிச் சென்று அந்த அரசாங்கத்திலே தங்களைப் பங்காளிகளாக்கிக் கொண்டார்கள். ஆனால், இன்று இந்த அரசாங்கம் போலியானது; சட்டத்திற்கு விரோதமானது; இலங்கையின் அரசியல் அமைப்பிற்கு முரணானது என்ற வகையில் உச்ச நீதிமன்றம் இடைக்காலத் தடையுத்தரவு விதித்திருக்கின்றது. ஆகவே, இந்த நாட்டிலே இன்று பிரதமர் இல்லை; அமைச்சரவை இல்லை; அதிகாரம்கொண்ட அமைச்சர்கள் இல்லை. அந்த வகையில் ஓர் அரசாங்கம் இல்லாத நிலைக்கு நாடு தள்ளப்பட்டிருக்கின்றது.

[ගරු වේලු කුමාර් මහතා]

இன்று இந்த மக்களுடைய சம்பளப் பிரச்சினையை மையமாகக் கொண்டு - அடிப்படைச் சம்பளம் 1,000 ரூபாயைப் பெற்றுக் கொள்வதை அடிப்படையாகக் கொண்டு குறித்த தொழிற்சங்கங்களானது மக்கள் மத்தியிலே ஒரு வேலை நிறுத்தப் போராட்டத்தைக் கட்டவிழ்த்துவிட்டிருக்கின்றது. அடிப்படைச் சம்பளமாக 1,000 ரூபாவைப் அவர்களுக்குப் பெற்றுக் கொடுக்க வேண்டும் என்பதில் நாங்களும் தெளிவாக இருக்கின்றோம். அதற்காகப் பெருந்தோட்டக் கம்பனிகளுக்கு மற்றும் அரசாங்கத்திற்கு அழுத்தங்கொடுக்கவும் மக்களோடு சேர்ந்து போராடவும் நாங்கள் தயாராக இருக்கின்றோம். அவ்வாறான போராட்டத்தை இவர்களுக்கு முன்னரே ஆரம்பித்து, அந்தப் பேரணியில் அழுத்தத்தையும் வெளிப்படுத்தி இருக்கின்றோம். நாட்டிலே இருக்கக்கூடிய அரசியல் சூழ்நிலைக்கேற்ப குறித்த செயற்பாட்டை மேற்கொள்ள வேண்டும். ஆனால், இன்று பிரதமர் இல்லாத, அமைச்சரவை இல்லாத, அரசொன்று இல்லாத நிலையிலே சம்பந்தப்பட்டவர்கள் எங்களுடைய மக்களைத் தொடர் வேலைநிறுத்தப் போராட்டத்திலே வீதிக்கு இறக்கியிருக் கின்றார்கள். இந்தச் செயற்பாடு யாருக்கு அழுத்தம் கொடுப்பதற்காக இடம்பெறுகின்றது என்று நான் கேட்க விரும்புகின்றேன். ஆகவே, வீணாக எங்களுடைய மக்களைப் பலிக்கடாவாக்கி உங்களுடைய சிறு தேவைகளை, உங்களுடைய சிறு அபிப்பிராயங்களை நீங்கள் நிறைவேற்றி கொள்ளப் பார்க்காதீர்கள் என்று அதில் சம்பந்தப் படுகின்றவர்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். குறிப்பாக, போலி அரசாங்கத்தோடு சேர்ந்து அமைச்சினைப் பெற்று, பின்னர் அதனை இழந்து, அரசியல் ரீதியாக வங்குரோத்து நிலையை அடைந்திருக்கக்கூடியவர்கள், அதனை இன்று மறைத்துக்கொள்வதற்காக "நாங்கள் அமைச்சுப் பதவியைத் துறப்போம்; பாராளுமன்றப் பதவியைத் துறப்போம்" என்று எல்லாம் வீரம் பேசி, இன்று துறப்பதற்கு எந்தப் பதவியும் இல்லாமல் நடுவீதியிலே வந்து நிற்கின்றபோது, மக்களை உங்களோடு சேர்த்து வீதிக்கு இறக்கி, பிழையாக வழிநடத்தி, பிழையான திசையிலே அவர்களைத் திருப்ப வேண்டாம் என்று நான் அவர்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இன்று நாங்கள் உரிய முறையில் 1,000 ரூபாய் அடிப்படைச் சம்பளம் என்ற இலக்கை நோக்கி நகரவேண்டிய தேவை இருக்கின்றது. அது எங்களுடைய சமுகத்தின் தேவையாக இருக்கின்றது. ஆனால், அந்தப் போராட்டத்தை ஆரம்பிப்பதற்குரிய காலம் இதுவல்ல என்பதை மீண்டும் வலியுறுத்திக் கூறுவதுடன், இன்னுமொரு விடயத்தையும் எடுத்துக்கூற விரும்புகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අද වතුකරයේ සිටින වතුකම්කරුවන්ගේ මූලික වේතනය පිළිබඳ ප්‍රශ්නය ගැන. පසු ගිය දවසක නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සී.බී. රත්නායක මැතිතුමාත්, බන්දුල ගුණවර්ධන මැතිතුමාත් ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ප්‍රකාශ කළා, පැවැති මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව, ඒ කැබිනට් අමාත්‍යවරුන්ගේ කටයුතු අද වනකොට තහනම් කර නැත්නම් වතු කම්කරුවන්ගේ රුපියල් 1,000ක වේතනය ලබා දෙන්න අපට හැකියාව තිබුණා කියන කතාව. 2004 ඉඳලා 2005 වන කල් ඔය කියන මහින්ද රාජපක්ෂ මේ රටේ අග්‍රාමාත්‍ය වෙලා සිටියා. 2005 ඉඳලා 2015 වන කල් ඔය කියන මහින්ද රාජපක්ෂ මේ රටේ ජනාධිපති වෙලා සිටියා. අවුරුදු 11ක් පමණ වූ ඒ කාල සීමාව තුළ එතුමා සමඟ තමයි, ඒ කැබිනට් එකේම තමයි ආරුමුගන් තොණ්ඩමන් ඇතුළු කණ්ඩායමත් සිටියේ. මම කියනවා, ඒ අවුරුදු 11 කාල සීමාව තුළ වතු කම්කරුවන් වෙනුවෙන් කර තිබෙන එක් ප්‍රගතිශීලි කටයුත්තක් හරි තිබෙනවා නම්, එය ඉදිරිපත් කරන්න කියා. දැන් ඇති වී තිබෙන මේ දේශපාලන අර්බුදය පාවිච්චි කරලා, තමන් මුහුණ දී තිබෙන ඒ අර්බුදය පාවිච්චි කරලා, වතු කම්කරුවන් පාරට ගෙන්වා ගෙන, ඒ අර්බුදයට වතු කම්කරුවන් ඇතුළත් කරගෙන මේ රට තුළ තිබෙන මේ ප්‍රශ්නය තව තවත් දීර්ඝ කරන්න එපා කියන එක මා විශේෂයෙන් කියන්න කැමැතියි. ඉදිරියේදී -තවත් දවසකින් දෙකකින්- අග්‍රාමාත්‍යතුමා හරියාකාරව පත් කරගෙන, හරියාකාරව කැබිනට්ටුව පත් කර ගත්තාට පසුව දමිළ ප්‍රගතිශීලි සන්ධානය හැටියට, වතු කම්කරුවන් නියෝජනය කරන නියෝජිතයන් හැටියට අපට කරන්න තිබෙන ප්‍රථම කාර්යය වන්නේ අපේ අග්‍රාමාත්‍යතුමාත්, අපේ ආණ්ඩුවත් එක්ක එකතු වෙලා අපේ ජනතාවට රුපියල් 1,000ක මූලික වේතනය ලබා දීම සඳහා වූ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑමයි. එය තමයි අපට කරන්න තිබෙන ප්‍රධානම කර්තව්‍යය, ප්‍රධානම දේ කියන එක අපි පැහැදිලිවම කියන්න කැමැතියි. අපේ අහිංසක ජනතාව - හැම දාම අහිංසකව තමන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කරන ජනතාව- මේ රට තුළ දැන් තිබෙන මේ දේශපාලන අර්බුදයට ඇතුළත් කරලා ඒ ජනතාව නොමඟ යවන්න එපා කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනාධිපතිවරයාට විශේෂයෙන්ම කියන්න ඕනෑ, අද වන කොට ඇති වී තිබෙන තත්ත්වය ගැන. අපි දන්නවා එතුමා ජනාධිපති පත්වීම ලබා ගන්නකොට, "මේක තමයි අවසන් වරට මා ජනාධිපති වන අවස්ථාව" කියා පළමුවෙන්ම ප්‍රකාශ කළ බව. ඒ වුණාට අද කරන මේ කුමන්ත්‍රණය සම්පූර්ණයෙන්ම එතුමා කරන්නේ දෙවන වරටත් මේ රටේ ජනාධිපති වන්නයි. ඒ හින්දා තමයි මේ ආර්ථිකය බිලි දීලා තිබෙන්නේ, මේ රට බිලි දීලා තිබෙන්නේ. අද ජාතිවාදය අවුස්සන වැඩ පිළිවෙළට අත හිත දෙන්නේ ඔය ජනාධිපතිතුමායි කියන එක මා කියන්න ඕනෑ. ඒ හින්දා අපි ජනාධිපතිතුමාට කියනවා, "මේ ටික අකුළා ගන්න. ඔබතුමා ආවේ මේ රටේ සහජීවනය ඇති කරන්නම් කියලායි. මේ රටේ සාමය ඇති කරන්නම් කියලායි. මේ රට සංවර්ධනය කරලා යහ පාලනය වෙත ගෙන යන්නම් කියලායි. ඒ වුණාට එහෙම පිටින්ම අනෙක් පැත්තට කරණම ගහලා අද වනකොට ජාතිවාදය අවුස්සන කණ්ඩායමේ මූලිකත්වය අරගෙන, ඒ පිරිසට නායකත්වයක් දෙන තත්ත්වයට ඔබතුමා පත් වෙලායි ඉන්නේ." කියා. මේ රටේ කාලයෙන් කාලයට ඇති කළ ඔය ජාතිවාදය හින්දා තමයි, බලය රැක ගැනීම සඳහා ජාතින් අතර ගැටුම් ඇති කළ හින්දා තමයි රට අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අපි ඔබතුමාට පැහැදිලිව කියනවා, "මෙය නතර කරන්න. මේ පාර්ලිමේන්තුවට අනුව කටයුතු කරන්න. නීතියට යටත් වෙලා, අපේ රටේ ව්‍යවස්ථාවට යටත් වෙලා, ව්‍යවස්ථාව අනුව කටයුතු කරන්න" කියා. "එසේ කටයුතු කරලා, ජනතාව ලබා දී තිබෙන ජනතාවගේ බලය හරියාකාරව පාවිච්චි කරලා මේ රජය අපට බාර දෙන්න කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. "අපට රජය බාර දීලා දැන්වත් හරි මාර්ගයට ඇවිත් රට බේරා ගන්න කටයුතු කරන්න." කියා අපි එතුමාට කියනවා. මේ තත්ත්වය තවදුරටත් ඉස්සරහට යනකොට, 'අන්තිමට ඔබතුමාට පොළොන්නරුවට නොවෙයි යන්න වෙන්නේ, හිර ගෙදරට තමයි යන්න වෙන්නේ.' කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.25]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඉඩ ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි. නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අද ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කීපයක් එක් කරන්න අවස්ථාව ලබා දීම ගැන සතුටු වෙනවා.

විශේෂයෙන්ම මේ නීති විරෝධී ආණ්ඩුවක් පත් කරලා, අද වෙන කොට සති පහක වාගේ කාලයක් තිස්සේ මේ රටේ දේශපාලන අස්ථාවරභාවයක් ජනාධිපතිවරයා විසින් ඇති කරලා තිබෙනවා. ඒ ඇති කිරීම මත විශේෂයෙන්ම රටේ ආර්ථිකයටත් ඒ වාගේම සමාජයේ ජන ජීවිතයටත් විශාල බලපෑමක් ඇති වෙලා තිබෙනවා. දේශපාලන අස්ථාවරභාවය දවස ගණනේ අද මේ සමාජය තුළ කථාබහට ලක් වෙනවා වාගේම මේ රටේ තිබෙන දේශපාලන අස්ථාවරභාවය ගැන ජාත්‍යන්තර වශයෙනුත් සියලු දෙනාම අවධානයෙන් ඉන්න කාලයක් බවට පත් වෙලා තිබෙනවා. මේ දෙසැම්බර් මාසය, ජනවාරි මාසය කියලා කියන්නේ සංචාරකයන් මේ රටට වැඩියෙන්ම පැමිණෙන කාලය. මේ කාලය තුළ මේ ඇති වුණු දේශපාලන අස්ථාවරය තුළ සංචාරක කර්මාන්තය විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. දකුණු පළාතේ, ඒ වාගේම කොළඹ නගරයේ තිබෙන තරු පහේ හෝටල්වල වෙන් කර ගෙන තිබුණු හෝටල් කාමර අවලංගු කිරීම දවස ගණනේ විශාල වශයෙන් වැඩිවෙමින් පවතිනවා. සංචාරක කර්මාන්තය හරහා ජීවත් වන බොහෝ දෙනෙකුටත්, ඒ තුළින් අතුරු ආදායම් ලැබූ, ඒ වාගේම අතුරු රස්සාවල් කරගෙන හිටපු සියලු දෙනාටත් අද ඒක බලපාලා තිබෙනවා.

ආයෝජකයන්ගේ පැමිණීම අඩුවීම, මේ රටේ තිබෙන කොටස් වෙළෙඳ පොළ කඩා වැටීම හා ආයෝජකයන් මේ රටෙන් මුදල් අරගෙන ඉවත් වීම වාගේ කාරණාවල් දවස ගණනේ වැඩි වී ගෙන යන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ සියලු දේවල් එසේ තිබියදීත් ජනාධිපතිතුමා ඉතාම මුරණ්ඩු ආකාරයට මේ ව්‍යවස්ථාවේ තමන්ට නොතිබුණු බලතල එතුමාම ආරෝපණය කරගෙන කටයුතු කරනවා. එතුමාගේ ඒ ක්‍රියා කලාපයෙහි වෙනසක් අපට පෙනෙන්න ලැබෙන්නේ නැහැ. මේ සති පහ දිහා බැලුවාම අපට ඒක පෙනෙනවා. අපි දන්නවා, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳව දැනට නඩු විභාගයක් පවතින බව. ඊළඟට, අභියාචනාධිකරණයේදී දැන් දවස් කිහිපයකට කලින් අගමැතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයට විරුද්ධව ඒ ලබා දීපු තීන්දුවත් වැදගත් වෙනවා. එය නීති විරෝධී පත් වීමක් නිසා ඔවුන්ට නැවත ඒ තනතුරුවල රැඳී සිටීමට කිසිදු ආකාරයේ නීතිමය අයිතියක් නැහැයි කියලා අභියාචනාධිකරණය ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ තුළ අද මේ රටේ කැබිනට් මණ්ඩලයක් නැහැ; අගමැතිවරයෙක් නැහැ; ආණ්ඩුවක් නැහැ; ජනාධිපතිවරයා විතරක් ඉන්නවා. ඒ කියන්නේ අද ඔළුව තිබෙනවා; කඳ නැහැ. ඔළුව විතරයි අපට තිබෙන්නේ. ඔළුව විතරක් තියාගෙන ජනාධිපතිතුමා දවසින් දවස නොයෙකුත් දේවල් කථා කරන ආකාරයක් අපට පෙනෙනවා.

ඊයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මේලනයේදී එතුමාගේ කථාව දිහා බැලුවාම අපට පෙනෙනවා, ඒ විශේෂ සම්මේලනය කැඳවලා තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනාගතය ගැන කථා කරන්නවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සංවිධානය කරන්නේ කොහොමද කියන එක ගැන කථා කරන්නවත් නොවෙයි; රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට ප්‍රහාර එල්ල කරන්න සහ එතුමා විවේචනය කරන්නට බව. ඒ ඇරෙන්න ඒ සම්මේලනයේදී මේ රටට වැදගත් දෙයක්, සමාජයට වැදගත් දෙයක්, මේ රටේ ආර්ථිකයට වැදගත් දෙයක් එහෙම නැත්නම් මේ රටේ අනාගත දු-දරුවන්ට වැදගත් දෙයක් ගැන ජනාධිපතිතුමාගේ කටින් එක වචනයක්වත් පිට වුණේ නැහැ. එතුමාගේ මුළු කථාව තුළම රනිල් වික්‍රමසිංහ ඉලක්ක කොටගෙන එතුමාට බැණ වැදීම හා එතුමාට දොස් නැඟීම හැර කිසිම හරයක් තිබුණේ නැහැ. පෞද්ගලික කෝන්තර පිරිමසා ගන්නා කථාවක් බවට එතුමාගේ කථාව පත් වෙලා තිබුණා.

1989 පාර්ලිමේන්තුවට පැමිණි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අවුරුදු 40කට වැඩි කාලයක් දේශපාලනයේ ඉඳලා, අන්තිමට මේ ජනාධිපති පුටුවට ගිහිල්ලා කරන කථාවල් දිහා බැලුවාම අපට තේරෙනවා, පොඩි ළමයි කථා කරන විධියට පෞද්ගලික දේවල් ඉස්මතු කරමින්, පෞද්ගලික කෝන්තර ඉස්මතු කරමින් කථා කරන බව. රනිල් වික්‍රමසිංහ මහත්තයා එක්ක ඒ තරම් තරහෙනුයි එතුමා කථා කළේ. හරියට එතුමා රනිල් වික්‍රමසිංහ මහත්තයා එක්ක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාගේ තමයි එතුමාගේ කථාවලින් අපට පෙනෙන්නේ. අපටත් ප්‍රශ්නයක් තිබෙනවා, අගමැතිතුමාගෙන් අහන්න ඕනෑ, එතුමා කසාද බැන්දේ මොන මෛත්‍රීවද කියලා. අගමැතිතුමාගෙන් අපි අහලා දැන ගන්න ආසයි, එතුමා කසාද බැන්දේ මොන මෛත්‍රීවද කියලා. මොකද, ඊයේ කථා කරපු මෛත්‍රී දිහා බැලුවාම එයාව කසාද බැඳගෙන හිටියා වාගේ තමයි ඊයේ කථා කළේ. ඒ කථාව තුළ දේශපාලන හරයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දන්නවා, මේ රටේ දේශපාලන සම්ප්‍රදායට අනුව, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායට අනුව, බහුතරයක විශ්වාසය දිනා ගන්න පුළුවන් පුද්ගලයා තමයි අගමැති වෙන්නේ කියන එක. එහෙම තමයි එක්දහස් නවසිය හතළිස් ගණන්වල ඉඳලා මේ රටේ දේශපාලන සම්ප්‍රදාය තුළ, පාර්ලිමේන්තු ක්‍රමය තුළ හැමදාම මතු වුණේ. පාර්ලිමේන්තුව තුළ වැඩි විශ්වාසයක් දිනා ගන්න පුළුවන් පුද්ගලයා තමයි අගමැති. මේ වාගේ අවස්ථාවන් කිහිපයක් ඉතිහාසයේ තිබෙනවා. 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය පාර්ලිමේන්තුවට ආවා, අගමැතිවරිය හැටියට. එදා එක්සත් ජාතික පක්ෂයේ නායක ඩී.බී. විජේතුංග මැතිතුමා තමයි මේ රටේ විධායක ජනාධිපතිවරයා වෙලා හිටියේ. එදා එක්සත් ජාතික පක්ෂයට පාර්ලිමේන්තුවේ එක ආසනයකින් තමයි ආණ්ඩුව පිහිටුවන්න බැරි වුණේ. නමුත් චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට පාර්ලිමේන්තුවේ වැඩි ආසන ගණනක් තිබුණු නිසා ඩී.බී. විජේතුංග මැතිතුමා එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය අගමැති විධියට පත් කළා. ඊළඟට, 2001 පාර්ලිමේන්තු මැතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයා පාර්ලිමේන්තුවේ වැඩි ආසන ගණනක් දිනා ගත්තා. අපි දන්නවා, චන්ද්‍රිකා මැතිනිය රනිල් වික්‍රමසිංහට කැමති නැහැ කියලා. එතුමිය කැමති නැති වුණත් පාර්ලිමේන්තුවේ බහුතරය එදා රනිල් වික්‍රමසිංහ මහත්තයා දිනා ගත් නිසා එතුමා අගමැතිවරයා හැටියට පත් කළා. මොකද, පාර්ලිමේන්තුවේ වැඩි බහුතරයක් තිබෙනවා. චන්ද්‍රිකා කැමති වුණේ නැහැ, රනිල් වික්‍රමසිංහ අගමැති කරන්න. නමුත් අගමැති නොකර බැහැ, පාර්ලිමේන්තුවේ බහුතරය එතුමාට තිබුණු නිසා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය අකැමැත්තෙන් එතුමා පත් කළා. ඊළඟට, 2004 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය එදා තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, පාර්ලිමේන්තුව, විසුරුවලා මහ මැතිවරණයකට ගියා. මහ මැතිවරණයකට ගියාම එක්සත් ජනතා නිදහස් සන්ධානය පාර්ලිමේන්තුවේ බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගත්තා. අපට මතකයි, එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මැතිනියගේ කැබිනට් එකේ මහින්ද රාජපක්ෂ මහත්තයා ඉඳගෙන පුවත්පත්වලට නොයෙකුත් වාර්තා දෙනවා කියලා චන්ද්‍රිකා මැතිනිය මහින්ද මහත්තයාට "රොයිටර්" කියලා නමකුත් දැම්ම බව. එදා චන්ද්‍රිකා එක්ක ලොකු ගැටුමක් මහින්ද රාජපක්ෂ මහත්තයාට තිබුණා. චන්ද්‍රිකා මැතිනිය එදා 2004දී අගමැති කරන්න හැදුවේ ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමාව. මොකද, මහින්ද රාජපක්ෂ මහත්තයාට එතුමිය කැමැති වෙලා හිටියේ නැහැ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතර මන්ත්‍රීවරු ගිහිල්ලා චන්ද්‍රිකා මැතිනියට කිව්වා, "අපි ඔක්කෝම ඉන්නේ මහින්ද රාජපක්ෂත් එක්ක; පාර්ලිමේන්තුවේ බහුතරය ඉන්නේ මහින්ද රාජපක්ෂත් එක්ක; ඒ නිසා ඔබතුමිය මහින්ද රාජපක්ෂව අගමැති කරන්න ඕනෑ" කියලා. අපි දැක්කා, එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය අකැමැත්තෙන් මහින්ද රාජපක්ෂව අගමැති කළ බව. අකැමැත්තෙන් අගමැති කළේ; කැමැත්තකින් නොවෙයි. ඒත් චන්ද්‍රිකා - මහින්ද ගැටුම තවම යනවා. අපි දකිනවා, ඒක ඉවර වෙන්නේ නැතුව තවම යන බව. මහින්ද රාජපක්ෂ මහත්තයා ජනාධිපති වුණාම චන්ද්‍රිකා මැතිනියට තිබුණු පහසුකම් සියල්ලම කපා හැරියා; එතුමියගේ ආරක්ෂාව නැති කළා. ඒ, ගැටුම තමයි. චන්ද්‍රිකා තවම මහින්දට කියනවා, 'හොරා' කියලා; තවම මහින්ද රාජපක්ෂව පිළිගන්නේ නැහැ. ඒ ගැටුම තව දිගටම යන ගැටුමක්. නමුත් එදා පාර්ලිමේන්තුව ඇතුළේ මහින්ද රාජපක්ෂ මහත්තයාට බහුතරය තිබුණු නිසා චන්ද්‍රිකා මැතිනිය අකැමැත්තෙන් හෝ එතුමාව අග්‍රාමාත්‍ය තනතුරට පත් කළා. එහෙම නම්, මේක තමයි ලංකාවේ දේශපාලන ඉතිහාසයට අනුව පාර්ලිමේන්තු බහුතර ප්‍රජාතන්ත්‍රවාදය තුළ බහුතරයේ කැමැත්ත අනුව කටයුතු කිරීම. මේ රටේ හිටපු හැම විධායක ජනාධිපතිවරයාම, හැම විධායක ජනාධිපතිතුමියම පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසයක් දිනා ගන්න පුළුවන් පුද්ගලයාව තමයි අගමැති කළේ. එහෙම තිබෙද්දී, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා හාත්පසින්ම වෙනස් කථාවක් කියනවා. මේ රටේ හිටපු හැම විධායක ජනාධිපතිවරයෙක්ම පාර්ලිමේන්තුවේ බහුතරය දිනා ගන්න පුළුවන් පුද්ගලයාව තමයි අගමැති හැටියට පත් කළේ. නමුත් සිරිසේන මහත්තයා කියනවා, "225ම කිව්වත් එතුමා පත් කරන්නේ නැහැ" කියලා. ඒක මාර කථාවක් නේ. 225ම කිව්වත්, එතුමා පිළිගන්නේ නැහැ ලු. ඒ කියන්නේ වෙන කෙනෙක් නැහැ. රනිල් වික්‍රමසිංහ පත් කරන්න කියලා 225ම කිව්වත් එතුමා පිළිගන්නේ නැහැ ලු. එහෙම නම්, කරන්න තිබෙන්නේ එක දෙයයි. පාර්ලිමේන්තුවේ බහුතරයත් එක්ක ජනාධිපතිවරයාට වැඩ කරන්න බැරි නම්, ජනාධිපතිවරයා ඉල්ලා අස්වෙන්න ඕනෑ. ජනාධිපතිතුමා ගෙදර යන්න ඕනෑ. ජනාධිපතිතුමා තමන්ගේ තනතුරෙන් ඉවත් වෙලා මේක කර ගන්න පුළුවන් කට්ටියකට භාරදීලා යන්න ඕනෑ. මොකද, පාර්ලිමේන්තුවේ අපි අස් වෙන්න අවශ්‍යතාවක් නැහැ. අපට පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙනවා. ඒ බහුතරයත් එක්ක වැඩ කරන්න සිරිසේන ජනාධිපතිතුමාට බැරි නම්, සිරිසේන ජනාධිපතිතුමා අස්වෙන්න ඕනෑ. ඒකයි දැන් කරන්න ඕනෑ වැඩේ. ඒකයි දැන් අපි කියන්න ඕනෑ.

මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන ලක්ෂණ හඳුනාගෙන මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නට සිරිසේන ජනාධිපතිවරයාට බැරි නම්, ජනතාවගේ ඡන්ද බලයෙන් පාර්ලිමේන්තුවට යවන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය යෝජනා කරන දේ පිළිගන්නට එතුමා අපොහොසත් වෙනවා නම්, ඒ ප්‍රජාතන්ත්‍රවාදයට යට වෙන්නට අකැමැතිව, ඒ ප්‍රජාතන්ත්‍රවාදය පිළිනොගෙන මුරණ්ඩුවෙලා දිගින් දිගටම තමන්ට නැති බලයක් ආරෝපණය කරගෙන වැඩ කරනවා නම් එතුමා තමයි මෙතැනින් අයින් වෙන්නට ඕනෑ. අපි අයින් වෙන්නට ඕනෑ නැහැ. අපි මොකටද අයින් වෙන්නේ? අපට අයින් වෙන්නට අවශ්‍යතාවක් නැහැ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අනුව අපි බහුතර කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. අපේ කැමැත්ත එතුමා පිළිගන්නට ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනා ගන්නට පුළුවන් කෙනාව තමයි ජනාධිපතිතුමා විසින් අගමැති හැටියට පත් කළ යුත්තේ කියලා. අපි යෝජනා කරන කෙනා පත් කිරීම ජනාධිපතිතුමාගේ වගකීමක්. එතුමාගේ වගකීම තමයි අපි යෝජනා කරන කෙනා පත් කිරීම. එහෙම නැතිව එතුමාට කැමැති කැමැති අය පත් කරන්න, එතුමාට ඕනෑ කෙනා පත් කරන්න පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඉඩක් නැහැ.

එතුමාට කැමැති කෙනා පත් කරලා තමයි අද වෙනකොට දවස් කිහිපයක්ම මේ පාර්ලිමේන්තුවට ඔවුන්ට එන්නට බැරිවෙලා තිබෙන්නේ. සිරිසේන මහත්මයාට ඕනෑ කෙනා තමයි පත් කළේ. ඒ පත් කළ කෙනා අද පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. ඇයි? බහුතරය නැහැ. බහුතරයට මුහුණ දෙන්න බැරිව, එතුමා කැමැත්තෙන් පත් කළ කෙනා පාර්ලිමේන්තුව මඟ හරිනවා; පාර්ලිමේන්තුව වර්ජනය කරනවා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ගේ බහුතරය පෙන්වා ගන්න බැරිව ඒගොල්ලන් පලා යනවා, ඒගොල්ලන් හැංගෙනවා. මාධ්‍ය ඉස්සරහට ගිහින් ලොකු "තව්සන්ඩ කථා" කියනවා; ලොකු දේවල් කියනවා. නමුත්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමුන්ගේ බහුතරය පෙන්වා ගන්න බැහැ. ඒ නිසා සිරිසේන මහත්මයා පත් කළ කෙනා අද හැංගිලා ඉන්නවා. ඒක සිරිසේන මහත්මයා තේරුම් ගන්නට ඕනෑ. සිරිසේන මහත්මයා ඒක තේරුම් ගන්නේ නැත්නම්, සිරිසේන මහත්මයා මේ පාර්ලිමේන්තුවේ බහුතර ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නේ නැත්නම්, ඒ බහුතර කණ්ඩායමත් එක්ක වැඩ කරන්නට ජනාධිපතිවරයා ලැහැස්ති නැත්නම් ජනාධිපතිතුමාට තිබෙන්නේ එක විකල්පයයි. ඒ තමයි, වහාම තමන්ගේ තනතුරෙන් ඉල්ලා අස්වෙලා ගෙදර යාම. වෙන විකල්පයක් නැහැ. බොහොම ස්තුතියි.

[අ.භා.3.37]

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතා විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළව රටේ ඇතිවෙලා තිබෙන අර්බුදය ගැන අදහස් දැක්වීමට මම බලාපොරොත්තු වෙනවා. වර්තමානයේ මේ ඇතිවෙලා තිබෙන්නේ කුමන්ත්‍රණයක් කිව්වොත් වඩාත් නිවැරදියි කියලා මම හිතනවා. අපේ ජීවිත කාලය තුළ කුමන්ත්‍රණ නොවෙයි, රාජ්‍ය විරෝධී අරගළ දැකලා තිබෙනවා. ඒ අරගළවලදී අපි දැක්ක දේවල් තිබෙනවා. ලේ සෙලවීම් වෙලා තිබෙනවා. අපේ ජීවිත කාලය තුළදී අරගළ ගණනාවක අත් දැකීම් අපට තිබෙනවා. හැබැයි, අපි දැක්කේ නැහැ හීතල කාමර ඇතුළේ ඉඳගෙන කරපු කුමන්ත්‍රණකාරී අරගළ. මේ අරගළත් සමඟ රටක් විධියට සමස්ත ලාංකීය ජනතාව ලොකු අපහසුතාවකට මුහුණ දීලා තිබෙන මොහොතක්, මේ.

මට මතකයි 2015 ජනාධිපතිවරණය වේලාවේ පොදු අපේක්ෂකයා විධියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් වුණාම අපේ ආසනවල ප්‍රචාරක රැස්වීමක් කරන්න පිටිටනියක්වත් දෙන්නේ නැති තත්ත්වයක් තිබුණේ. එවැනි තත්ත්වයක් යටතේ එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක් අපි එතුමාව ජනාධිපතිවරයා විධියට පත් කළේ බොහොම අමාරුවෙන්. එතුමා අද කිසිම හිරිකිතයක් නැතිව එතුමාට විරුද්ධව කැරැලි ගහපු අයත් එක්ක එකතුවෙලා ආණ්ඩු කරන්නට සූදානම් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් විධියට අපි එතුමාව පත් කරන විට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ජනතාවට දුන්නු ප්‍රධාන පොරොන්දුව තමයි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියන එක. ඊළඟට දුන්නු පොරොන්දුව තමයි දූෂණය නැති කරලා, හොරු අල්ලලා හිරගත කරනවා කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න පොරොන්දුවෙලා බලයට ආපු මහජන නියෝජිතවරු විධියට අපි ඒ සඳහා සූදානම් වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ ඉන්න විට ජනාධිපතිතුමා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ඇවිල්ලා, -මම හිතන්නේ ඒ ජනාධිපතිතුමාගේම අදහස් වෙන්නට ඇති, මේ ඒකාධිපති ස්වරූපය දිගටම ගෙනියන්න ඕනෑ නිසා වෙන්න ඇති- එදා මේ ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාට විරුද්ධ වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
"ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු මුහම්මදු ඉබ්‍රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹ்மான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. HESHA WITHANAGE left the Chair, and THE HON. MUJIBUR RAHUMAN took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කථා කරන්න.

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
ඊළඟට, අපි බලයට එද්දී දුන් පොරොන්දුවක් තමයි "හොරු අල්ලනවා" කිව්ව එක. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරු අල්ලන්න ආවේ අපි; ආණ්ඩුව පිහිටෙව්වේ අපි. අද අපේ ආණ්ඩුව හොරු අල්ලා ගත්තා. හොරු තමයි අද ආණ්ඩුව කරන්නේ. මේ වාගේ තේමා දෙකක් එක්ක යන ගමනක් තමයි අද තිබෙන්නේ. තමුන්නාන්සේලා දන්නා පරිදි ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වී තිබෙන මේ මොහොතේ, මේ ප්‍රශ්නය වර්තමානයේ ජීවත් වන අපට පමණක් නොවෙයි, උප නූපන් දරුවන්ට බලපාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ රටේ ආර්ථික අර්බුදය ගැන කථා කරන කොට ජනාධිපතිතුමා කියනවා, "ආර්ථික අර්බුදයක් නැහැ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික අර්බුදය ගැන කථා කරන කොට පසුගිය දවසක මම ලැබූ අත්දැකීමක් සඳහන් කරන්න කැමැතියි. පසුගිය දවසක මම අපේ ගමේ තිබෙන පොඩි කඩ පිලකට ගිහිල්ලා කථා කරන කොට ඔවුන් කිව්වේ, ඔක්තෝබර් 26 වෙනි දාට පසුව දවසින් දවස ඔවුන්ගේ ආදායම් තත්ත්වය අඩු වෙලා තිබෙනවා; ඔවුන්ගේ කඩවල්වල විකුණන්න තිබෙන එදිනෙදා කෑම ටික මිලදී ගන්න මිනිසුන් එන්නේ නැති තත්ත්වයක් තිබෙන නිසා ඒවා විකුණා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා කියායි. රටේ ආර්ථිකය දිනෙන් දිනම බිඳ වැටෙන බව තමයි ඔවුන් කිව්වේ. විධායකයේ සිට මේ සියලුම දෙනාට මේ රටේ ආර්ථිකය කඩා වැටෙන බව තේරෙන්නේ නැත්තේ ඇයි කියා කථා කිරීම අද විහිළුවට කාරණාවක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වයත් එක්ක ආර්ථිකය වැටෙන කොට දේශපාලන සදාචාරය ද පෙර නොවූ ලෙස සෝදාපාළුවට ලක් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා අපේ රටට ලැබෙන විදේශ ආධාර, විදේශ ණය මේ වන විටත් නතර වෙලා තිබෙන බව. ඒ වාගේම සමහර විදේශ රටවලින් සම්බාධක පනවනවා කියන එකත් මේ වෙන කොට අපට දැනුම් දී තිබෙනවා. ලාංකීය ජනතාව විධියට අපි වෙනත් විදේශ රටවල ආර්ථිකයත් එක්ක යන ගමනේදී ඔවුන්ගේ ආධාර සහ ණය මත යැපෙන රටක් විධියට ණය ආධාර නැතිව අපට ජීවත් වෙන්න බැහැ. ඒ නිසා සදාචාරසම්පන්නව තීරණ ගත යුතුයි. පෞද්ගලික මතිමතාන්තරවල සිටිමින් අදහස්; තීරණ අරගෙන මේ ව්‍යරුවත් එක්ක යන ගමනේදී මේ සම්බන්ධයෙන් නිවැරදි තීරණයක් නොගත්තොත් අපේ ජනතාව බොහොම අපහසුතාවට පත් වෙනවා.

ජනතාව විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනයෙන් කවදාවත් හම්බ කරගත්තේ නැති මහජන නියෝජිතයන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒ මහජන නියෝජිතවරුන් වාගේම අසරණ ජනතාවත් පීඩාවට පත් කරන මේ ව්‍යවස්ථා විරෝධී වැඩසටහන මම හෙළා දකිනවා. මේ රට ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කර බොහොම දුර ගමනක් පැමිණි රටක්. ඒ ප්‍රජාතන්ත්‍රවාදය සුරකින්න අපි සියලු දෙනාම බැඳී සිටිනවා. මේ අවස්ථාවේදී මේ දේවල් කිසි දෙයක් තේරෙන්නේ නැහැ වාගේ ඉඳගෙන, පොඩි ළමයින් වාගේ මේ විධායකයේ හැසිරීම අපේ රටට; ශ්‍රී ලාංකීය ජාතියට බොහොම ලොකු ගැටලුවක්. ඒ නිසා මම මේ අවස්ථාවේදී අපේ රටේ අනාගත දරුවන්ගේ නාමයෙන් ඉල්ලන්නේ, මේ පීඩාව තවදුරටත් කරගෙන යන්න ඉඩ දෙන්න එපාය කියායි. මෙය විසඳන්න පුළුවන් එකම පුද්ගලයා ජනාධිපතිතුමායි. ජනාධිපතිතුමාට එය තේරෙන්න ඕනෑ. පෞද්ගලික මතිමතාන්තර තිබුණත් ඒ සිතිවිලිවලට, මතිමතාන්තරවලට කොටු වෙන්නේ නැතිව එතුමා මේ සම්බන්ධයෙන් හොඳ තීන්දුවක්; තීරණයක් ගන්න ඕනෑ. අපේ දරුවන්ට ජීවත්වීමට තිබෙන්නේ මේ රට විතරයි. මේ රටේ ආර්ථිකය ඇද වැටුණොත් ඒ බලපෑම ඇති වන්නේ වර්තමානයට විතරක් නොවෙයි. අද මේ සිදු වී තිබෙන තත්ත්වය අනුව තව මාස ගණනක්, අවුරුදු ගණනක් යන තුරු ආර්ථික පසුබෑමකට අපි ලක් වෙන වකවානුවක් ඇති වී තිබෙන්නේ.

[ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී පාලකයන් වෙනස් කිරීම සිදු කළ යුත්තේ ව්‍යවස්ථානුකූලවයි. ඒ නිසා නිසි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය අනුගමනය කරමින් මේ ක්‍රියාවලිය සිද්ධ කරන්න ඕනෑ. එබැවින්, පුද්ගලයින්ගේ අභිමතාර්ථ, රුචි-අරුචිකම් අරමුණු කර නොගෙන, චත්මන් අර්බුදයට පිළියම් සෙවීම අපේ සදාචාරාත්මක අයිතියක්. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳන්න ගරු ජනාධිපතිතුමා මැදිහත් වෙන්න ඕනෑ. පක්ෂ, පාට භේදයකින් තොරව, ජාති ආගම් භේදයකින් තොරව අප සියලුදෙනාම මහජන නියෝජිතයන් විධියට නැවත නැවතත් එතුමාට කියන්නේ මේ කාරණයට මැදිහත් වෙන්නය කියන එකයි. රටක ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙනවාය කියන්නේ නරක පූර්වාදර්ශයක්. මේ නරක පූර්වාදර්ශය ඉදිරියට අරගෙන ගියොත්, රටේ අනාගතය බොහොම අවිනිශ්චිත ගමනකයි යන්නේ. ඒ නිසායි අද පක්ෂ, පාට භේදයකින් තොරව එකතු වෙලා අපි සියලුදෙනාම කටයුතු කළ යුතු වන්නේ. හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීම, ප්‍රතිපත්තිගරුකභාවය, බොරු නොකීම, කියන දේ කිරීම, කරන දේ කීම වැනි බුදුරජාණන් වහන්සේ වදාළ ඒ සියල්ලම පසෙකලා "බෞද්ධයෝ" යැයි කියමින් කථා කරන ඇතැම් මහජන නියෝජිතයන් ඇත්තටම බෞද්ධ ආගම රකිනවාද, අදහනවාද, එහෙම නැත්නම් සමාජයට පෙනෙන්න විතරක් බෞද්ධයන් ලෙස වැඩ කරනවාද කියන එක අද ගැටලුවක් වෙලා තිබෙනවා.

වෛද්‍යවරියක් විධියට මම ඔබතුමන්ලාට ප්‍රකාශ කරන්න කැමැතියි, අද මේ වන කොට රටේ බෙහෙත් වර්ග සියයක පමණ හිඟයක් තිබෙන බව. ඒ අතර අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග හැටගණනක් තිබෙන බව අපට දැන ගන්න ලැබුණා. පිළිකා රෝගවලදී සුදු රුධිරාණු අඩු වෙන කොට, ඒ සුදු රුධිරාණු මට්ටම නියතව තබා ගන්න ලබා දෙන බෙහෙත් පෞද්ගලිකව මිලදී ගන්න ගියොත් ලක්ෂ ගණනක් වැය වෙනවා. මේ වන කොට ඒ බෙහෙත්වල හිඟයක් තිබෙනවා. ඒ වාගේම, ජලභීතිකා රෝගය වැළැක්වීමට බල්ලන්ට දෙන බෙහෙත්වලත් හිඟයක් තිබෙනවා. අද බල්ලන්ට ජලභීතිකාව හැදිලා මිනිසුන් හපා කාලා මිනිසුන්ට පිස්සු හැදිලාද මේ වාගේ අත්තනෝමතික ක්‍රියාවල යෙදෙන්නේ කියන එක මට තේරෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න අප බැඳී ඉන්න බව විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. ඉදිරියේදී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න ජනාධිපතිතුමාගේ දෑස් හැරේවා යි ප්‍රාර්ථනා කරමින්, මේ වාගේ බොහොම අමාරු කාලයක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රකින්න අපට ශක්තිය, ධෛර්ය දුන්නු, පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය රැක දුන්නු අපේ ගරු කථානායකතුමාට මේ අවස්ථාවේදී මගේ ගෞරවය, ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලකී ජයවර්ධන මැතිතුමා.

[අ.භා.3.48]

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔක්තෝබර් 26 වැනි දා සිදු කළ ව්‍යවස්ථා විරෝධී, සදාචාර විරෝධී දේශපාලන ක්‍රියාවලිය නිසා වර්තමාන රට පත් වී තිබෙන තත්ත්වය ගැන ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඔක්තෝබර් 26වැනි දා ආරම්භ වුණු මේ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාව නිසා අපේ රට ආර්ථික, සමාජීය, දේශපාලනික හා ශාසනික වශයෙන් අද විශාල පරිහානියකට ලක් වෙලා තිබෙනවාය කියන එක අප අමුතුවෙන් කිව යුතු වන්නේ නැහැ. ආර්ථික වශයෙන් ගත්තොත්, අද අපේ රට විශාල පසුබෑමකට ලක් වෙමින් පවතිනවාය කියන එක කවුරුත් දන්නවා. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය කඩා වැටීම, රටට ණය දෙන අවස්ථා අඩු වීම වාගේම, මේ අර්බුදය තුළ ණය දෙන ආයතන, සමාගම් අද අපේ රට අඩුවෙන් ශ්‍රේණිගත කර තිබෙනවා. මෙවැන් ආකාරයට ආර්ථිකයට විශාල පහරක් එල්ල වී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඊළඟ අවුරුද්දට මුදල් වියදම් කරන්න සම්මත කර ගත් අය වැයක් නැති නිසා රජයේ සේවයට පඩි දෙන්න බැරි, සමෘද්ධිලාභීන්ට සමෘද්ධිය දෙන්න බැරි, පාසල් ළමුන්ට නිල ඇඳුම දෙන්න බැරි, පාසල් පොත් දෙන්න බැරි, ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය මතක් කළ ආකාරයට රෝගීන්ට බෙහෙත් දෙන්න බැරි තත්ත්වයක් අද උදා වෙමින් පවතිනවාය කියන එක අපි කියන්න ඕනෑ. මෙය විශාල පරිහානියක් බව අපි අමුතුවෙන් කිව යුතු නැහැ.

සමාජය වශයෙන් ගත්තත් අද සමාජය ඉතා භේද තත්ත්වයට පත්වෙලා තිබෙනවා. වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව අද සමාජය තුළ ප්‍රචලිත වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් රට තුළ ඇති වුණේ පසුගිය ඔක්තෝබර් 26 ආරම්භ වුණු ඒ ක්‍රියාවලිය නිසායි. බලය නැති පිරිසක් බලය ගන්නට කරන දැඟලිල්ල තුළ අද විශාල වශයෙන් සමාජ පරිහානියක් ඇති වෙලා තිබෙනවා. හෙට අනිද්දා වන කොට එක් එක් කෙනා වෛරයෙන්, ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන් පෙළෙමින් නොයෙකුත් ක්‍රියාවලට යොමු වීමට හැකි භයානක තත්ත්වයක් දකින්න තිබෙනවා.

ශාසනික වශයෙන් ගත්තත් අද විශාල පරිහානියක් ඇති වෙලා තිබෙනවා. අද සංඝයා වහන්සේලා විශාල පිරිසක් පාරට බැහැලා විවිධ දේවල් කරමින්, මේ ක්‍රියාව ඉතා වැදගත් ක්‍රියාවක් හැටියට හුවා දක්වන්න උත්සාහ කරනවා. ඒ ගැන අපි කනගාටුවට පත්වනවා. අද මේ රටේ සංඝයා වහන්සේලා පිළිබඳව අපට සතුටුවන්න පුළුවන් අවස්ථාත් තිබෙනවා. නමුත්, කනගාටුදායක සිදුවීම්ද සිදු වන බවත් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම දේශපාලන වශයෙන් සිදුවන මේ පරිහානිය මෑත කාලයේ සිදු වූ දෙයක් විධියට අපි දකිනවා.

1948දී මේ රටට නිදහස උදා කර දෙන්න පුරෝගාමී වූ පක්ෂය තමයි, එක්සත් ජාතික පක්ෂය. එක්සත් ජාතික පක්ෂයේ නායක මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා එදා නිදහස් සටනේ පළමු අංකයේ පුරෝගාමියකු ලෙස කටයුතු කළා. නිදහසින් පස්සේ වසර 70ක් මේ රටේ දේශපාලන ගමන්මහේ මෙවන් අවස්ථාවක්, මෙවන් සිදුවීමක් වූ පළමු අවස්ථාව විධියට දකින්න පුළුවන් වන්නේ මේ සිද්ධියයි. ඒ ගැන අපි කනගාටු වනවා. අපි පත් කරපු ජනාධිපතිවරයෙක් මෙවන් අවස්ථා ඇති කිරීම කනගාටුවට කාරණයක්. වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති කරන්නට පුරෝගාමී වුණේ එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානත්වයෙන් තමයි එතුමාට ඒ ජනාධිපතිකම ලැබුණේ. අපේ වර්තමාන නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමාට ඒ අවස්ථාව ලබා දුන්නා. අපේ නායකතුමා ගැන ඊයේ එතුමා කථා කළා. අපට බොහොම කනගාටුයි, එවන් නායකයෙක් මෙවන්

ආකාරයට කෘතවේදීත්වය නොහඳුනන පුද්ගලයකු විධියට කථා කිරීම ගැන. ඒ කථාව තුළින් වුණත් එතුමා පරිහානියට පත්වනවා. එතුමාගේ කථාව නිසා රිදුණේ අපේ නායකතුමාට නොවෙයි. ඒක ආපස්සට ඒ පැත්තට කැරකුණාය කියන එක අපි දකිනවා.

පසුගිය ඔක්තෝබර් 26 වෙනිදායින් පස්සේ ප්‍රජාතන්ත්‍රවාදයට විශාල තර්ජනයක් ඇති වුණා. විශේෂයෙන්ම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට විශාල තර්ජනයක් ඇති වුණා. නමුත්, පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය රකින්න වීරෝදාර අන්දමින් වර්තමාන කථානායක කරු ජයසූරිය මැතිතුමා කටයුතු කළා. ඒ සිද්ධිය වුණත් සමහර අය යම් යම් විධියට හෙළා දැක්කා. නමුත්, එතුමා නියම ප්‍රජාතන්ත්‍රවාදියකු විධියට මේ කාර්යයේදී ඉතාම හොඳ නායකත්වයක් අරගෙන පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න කටයුතු කළ බව මම මතක් කරන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන අපි ඒ ගැන ගොඩක් සතුටුවනවා. ආණ්ඩුව යැයි කියා ගන්නා පිරිස අද එතුමා හැල්ලුවට ලක් කරන්න කටයුතු කළත්, කවුද වැරදි, කවුද හරි කියන එක අද රටම දන්නවා. කථානායකතුමා නිවැරදි බව මුළු රටම අද පිළිගෙන තිබෙනවා. එම නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ජනතාවගේ උත්තමාචාරය එතුමාට පිරිනමන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මෙවන් නායකයෙකු අපට සිටීම විශාල සතුටක්. මෙවැනි නායකයන් නැති වුණා නම් තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මීට වඩා තර්ජනයක් ඇතිවන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙරේදා පත්තරයක තිබෙනවා මම දැක්කා, 'අස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදී රටක් ස්ථාවර කළ හැක්කේ මහ ඡන්දයකින් පමණයි' කියලා පස්සා දොරෙන් පත් වුණු අගමැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙන බව. එතුමා කියනවා, පරමාධිපත්‍ය බලය හිමිවන්නේ පාර්ලිමේන්තුවට නොව, ජනතාවටයි කියලා. ජනතාවට තමයි පරමාධිපත්‍ය තිබෙන්නේ කියන එක අපි දන්නවා. නමුත්, මේ රටේ සිටින දෙකෝටි දසලක්ෂයක ජනතාවට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ඉඩ නැහැ. ඒ දෙකෝටි දස ලක්ෂයේ ජනතාවගේ නියෝජිතයන් තමයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනා. මේ පාර්ලිමේන්තුව තමයි ඒ ජනතාවගේ පරමාධිපත්‍ය නියෝජනය කරන්නේ. මේ රටේ සිටින දෙකෝටි දසලක්ෂයක - මිලියන 21ක- ජනතාවගේ නියෝජිතයන් විධියට කටයුතු කරන්නේ මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කියන එක එතුමා දන්නේත් නැහැ. ඉතින්, මේ රටේ අගමැතිවරයා මේ පාර්ලිමේන්තුවට පරමාධිපත්‍ය නැහැයි කියන එක අපි පිළිගත යුතු නැහැ. එතුමා මේවා දැනගෙන කියනවාද, නොදැන කියනවාද දන්නේ නැහැ. ඒ ගැන අපි කනගාටු වනවා. දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයකු වන එතුමාට මෙවන් බොළඳ කථා කියලා මේ රටේ ජනතාව රවටන්න බැහැයි කියන එක අපි මතක් කරන්න ඕනෑ. මැතිවරණ දවසින් දවස, වර්ෂයෙන් වර්ෂය පවත්වන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අවුරුදු 06කට වරක් තමයි මැතිවරණයක් පවත්වන්න අවස්ථාව දීලා තිබුණේ. නමුත්, 2015දී අපි ඒ තත්ත්වය වෙනස් කළා. අවුරුදු 06කට තිබුණු පාර්ලිමේන්තුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අවුරුදු 05කට සීමා කරලා, අවුරුදු 05කට වරක් ආණ්ඩුව පත් කරන්න; මැතිවරණ පවත්වන්න අවස්ථාව ඇති කළා. ඒ අනුව, අවුරුදු 05කට වරක් මැතිවරණයක් එනවා. ඒ නිසා 2015 අගෝස්තුවේ පත් කරපු ආණ්ඩුව අවුරුදු 03ක් යනකොට විසුරුවන්න කිසිම කෙනෙකුට බලයක් නැහැ. ඒකට බලපෑමක් කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක සම්මතයකින් තමයි ඒ අවස්ථාව ඇති කරන්න පුළුවන්. නමුත්, ගැසට් නිවේදන නිකුත් කරමින් ආණ්ඩුව විසුරුවන්න වර්තමාන ජනාධිපතිතුමා ගත් තීන්දුව තුළ අද හිර වෙලා තිබෙනවා.

මේවා වැරදි වැඩ කියන එක අද අධිකරණය තීන්දු කරලා තිබෙනවා. මේ අධිකරණ තීන්දුත් ඒ අය පිළිගන්නේ නැහැ. ඒ අයට පක්ෂව තීන්දුව ලබා දුන්නොත් තමයි අධිකරණ තීරණ හරි වෙන්නේ. අනෙක් ඒවා ඔක්කොම වැරදියි කියනවා. ඒක තමයි ඒ අයගේ තිබෙන පුරුද්ද. ඒ වුණාට පසුගිය කාලයේ දී අධිකරණයෙන් වැඩ ගත්ත විධිය අපි දන්නවා; නඩුකාර උන්නාන්සේලාගෙන් වැඩ ගත් විධිය අපි දන්නවා; අධිකරණයේ විනිසුරුවරුන්ගෙන් වැඩ ගත් ආකාරය අපි දන්නවා. වැඩ ගන්න බැරි අවස්ථාවල අග්‍රවිනිශ්චයකාරතුමියත් එළවලා -අස් කරලා- දැම්මා කියන එක අපි දන්නවා. එවන් වකවානුවකින් මේ රට ගලවා ගන්න පුළුවන් වුණේ 2015 ජනාධිපතිවරණයෙන් පස්සේ කියන කාරණය අපි දන්නවා.

2015 අගෝස්තු 16 වැනිදා අපි ඇති කරපු ආණ්ඩුව තුළින් මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරලා, මේ රටට යම් සේවාවක් ඇති කළා කියන එක කවුරුත් අවිවාදයෙන් යුතුව පිළිගන්නවා. ඒවායේ ප්‍රතිඵල අපට අද ලැබෙමින් පවතිනවා. අද අධිකරණය වුණත් ස්වාධීනව කටයුතු කරනවා. අධිකරණය එලෙස ස්වාධීනව කටයුතු කරනකොට, අනෙක් කටයුතුත් ඒ ආකාරයෙන්ම සිදු වනවා. මම හිතන විධියට ව්‍යවස්ථාවේ ලියැවිලා තිබෙන දේවල් අධිකරණයට වුණත් වෙනස් කරන්න බැහැ. ඒවා සත්‍ය විධියට ප්‍රකාශ කරන්න ඕනෑ. සත්‍ය ජය ගන්නවා කියන එක ස්ථිරයි. ඒ නිසා ඒවා වෙනස් කරන්න කිසිම අයෙකුට අවස්ථාවක් නැහැ කියන එක අපි මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේම පසුගිය දවස්වල සිදු වුණු සිදුවීම් තුළින් මේ රට විශාල ලෙස හැල්ලුවට ලක් වුණා කියන එක අපි දන්නවා. මේ රටේ තරුණයන් දේශපාලනය පිළිබඳ තිබෙන උනන්දුව අත් හැරලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මැතිවරණවලදී ඡන්ද පොළට ඡන්දය දාන්න යන්න ඡන්දදායකයා සූදානම් නැති තත්ත්වයක් අද වන කොට උදාවෙලා තිබෙනවා. නමුත් වාසනාවකට මේ කරපු නිහීන ක්‍රියාවන්වලට එරෙහිව අද රටේ ජනතාවගෙන් විශාල පිරිසක් -බහුතරයක්- එක්සත් ජාතික පක්ෂයත් එක්ක හිට ගන්න සූදානම් කියා අපි දන්නවා. අද පාර්ලිමේන්තුව තුළ එක්සත් ජාතික පක්ෂය, මුස්ලිම් කොංග්‍රසය, සමස්ත ලංකා මහජන කොංග්‍රසය, ද්‍රවිඩ සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එකට අත්වැල් බැඳගෙන කටයුතු කරනවා. ඒ පිළිබඳවත් ඒ අයට යම් යම් මත තිබෙනවා. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, පොහොට්ටුවයි එකතු වුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොටසක් පොහොට්ටුව සමඟ එකතු වෙන්න සූදානම් නැහැ. ඊයේ ඒ අයගේ විශේෂ සමුළුවක් තිබුණා. ඒ විශේෂ සමුළුවේදී ජනාධිපතිතුමා ප්‍රකාශ කරනවා අපි දැක්කා, "අර්බුදය තව දවස් හතකින් විසඳනවා" කියලා. මේ රටේ අර්බුදයක් තිබෙනවා කියලා එතුමා පිළිගන්නවා. රටේ ජනාධිපතිතුමා අර්බුදයක් තිබෙනවා කියලා දන්නවා නම්, ඒ අර්බුදය ඉක්මනින් විසඳීම එතුමාගේ යුතුකමක්. ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමුළුවේදී කළ ප්‍රකාශයක් පිළිබඳව 2018 දෙසැම්බර් මස 5 වැනි දින "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

> "දේශපාලන අර්බුදය තවත් දවස් හතකින් අවසන් වන බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ (04) පැවසීය.
>
> මාතෘ භූමියේ හෙට දවස වෙනුවෙන් මෙම දේශපාලන නොසන්සුන්තාව අවසන් කරන බව කී ජනාධිපතිවරයා උදාවූ දේශපාලන කරුමය පින්කර කර විසඳා ගැනීමට හඳන මල් වට්ටියට අත ගසන්නැයි සියලු දේශපාලන පක්ෂවලින් ඉල්ලීමක් කරන බවද ප්‍රකාශ කළේය."

නමුත් එතුමාගේ ඉල්ලීමට මේ රටේ වෙනත් දේශපාලන පක්ෂ එකතු වෙන්නේ නැහැ කියන කාරණය අපි දන්නවා. ඒ නිසා එතුමාගේ යුතුකම වන්නේ බහුතරයක් තිබෙන කණ්ඩායමට මේ රට බාර දීමයි. අද සුළුතරයක් තිබෙන, ආණ්ඩුව යයි කියා

[ගරු ලකී ජයවර්ධන මහතා]

ගන්නා පිරිස -උසාවියෙන් තහනම් කරපු පිරිස- අද පාර්ලිමේන්තුව වර්ජනය කරනවා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කථා කරලා, ඒ ප්‍රශ්න විසඳා ගත්තොත් තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්නේ. එහෙම වුණොත් තමයි මේ රටේ දේශපාලනය කරන්න පුළුවන් වන්නේ. මේ රට ඉදිරියට ගෙන යන්නට පුළුවන් වන්නේ ඒ ආකාරයට කටයුතු කළොත් පමණයි. පාර්ලිමේන්තුව වර්ජනය කරලා, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යටවෙලා, ඒ තුළින් වාසි ගත්නට වැඩක් වෙන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ ආකාරයට ජනාධිපතිතුමා බලාපොරොත්තු වන දේවල් ඉෂ්ට වන්නේ නැහැ. "පාර්ලිමේන්තුවේ 225 දෙනාම අත්සන් කළත් අගමැතිකම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දෙන්නේ නැහැ" කියලා එතුමා කියනවා. එහෙම ඒවා කියන එක හොඳ නායකයෙකුගේ ලක්ෂණයක් නොවෙයි. යුක්තිගරුක මනුෂ්‍යයකු විධියට, යුක්තිය හඳුනන මිනිහෙකු විධියට බහුතරයට කන් දීලා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති විධියට පත් කරලා, මේ රට නැවත යථා තත්ත්වයට පත් කරන්න එතුමාට තවමත් අවස්ථාව තිබෙනවා කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. ඒ අවස්ථාව ඇති කරලා, මේ රට ඉදිරියට ගෙන යන්න උදව් කිරීම රටේ නායකයන්ගේ වගකීමක් කියන කාරණය අපි අමුතුවෙන් කිව යුතු වන්නේ නැහැ. නායකයන් ඒවා පිළිගන්න ඕනෑ. නැත්නම් මේ රට විශාල විනාශයකටයි යන්නේ. මේ විනාශය තුළ මේ රට දවසින් දවස කඩා වැටෙනවා. මේ කාරණය නිසා මේ රට ආපස්සට යනවා. අද මහින්ද රාජපක්ෂලා ජනතාවට සහන දෙන්න ලොකුවට කථා කරනවා. නමුත් 2005 බලයට පත් වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමාට 2015 වනතුරු දෙන්න බැරි වුණු සහන මේ මාස දෙකේ දෙන්න පුළුවන් වුණේ 2015 අපි ඇති කරපු එක්සත් ජාතික පක්ෂයේ යහ පාලනය තුළින් මේ රටේ ඇති කරපු ආර්ථික දියුණුව නිසා කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. ආර්ථිකය ගැන විවිධ දේවල් කථා කළත් ඒ අවස්ථා ඇති කළේ අපේ රජයක් යටතේ කියන එක අපි සතුටින් මතක් කරනවා. ඒ නිසා එවන් අවස්ථා අපි තවත් වර්ධනය කර ගන්න ඕනෑ. විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පසුගිය කාලයේ කරපු කටයුතු -ඇමති මණ්ඩලය සහ අගමැති පත් කරපු විධිය- ගැන අපි විශාල වශයෙන් කනගාටු වනවා. අගමැති තියා මරණාධාර සම්මතියක සභාපතිවරයෙකුවත් ඔය ආකාරයට පත් කරන්නේ නැහැ කියලා මම හිතනවා. ඉන්න සභාපතිතුමා හොරෙන් අස් කරන්නේ නැහැ.

ඒකට කල් දීලා, දින දීලා තමයි කරන්න ඕනෑ. මම හිතන විධියට ආණ්ඩුවක් කරනකොට, ආණ්ඩුවට කාලයක් අවශ්‍යයි. අවුරුදු පහක් ඇතුළේ එම සැලසුම් ඇතුව වැඩ කරනකොට, අවුරුදු තුනකින් ආණ්ඩුව විසිරෙව්වොත් මේ රටයි වැටෙන්නේ. ආණ්ඩුව වැටෙන්නේ නැහැ, රට වැටෙන්නේ. එවන් අවස්ථාවක් එතුමා නිර්මාණය කෙරුවා. අපි කනගාටු වෙනවා, ඡන්දය දීපු මිනිසුන් විධියට. 2015 අපි හංසයා ලකුණට ඡන්දය දුන්නා. අපි අපේ ජනතාවට කියලා එතුමාට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නා. උඩුව මැතිවරණ කොට්ඨාසයේ වැඩි ඡන්ද 13,000කින් අපි දිනවා දුන්නා. මහනුවර දිස්ත්‍රික්කයේ වැඩි ඡන්ද 85,000කින් අපි දිනවා දුන්නා. අපි කනගාටු වෙනවා, ඡන්දය දීපු අය විධියට. අපි ඡන්දය ඉල්ලපු ඒ ජනතාවගෙන් සමාව ඉල්ලනවා, මෙවන් නායකයෙක් ජනාධිපති කරන්නට අපි කටයුතු කිරීම පිළිබඳව. මේ රටට ආදරය කරන නායකයෝ සිටිනවා. නමුත් රටට වින කරන නායකයෝ රටට ඔබින්නේ නැහැ කියන එකයි අපේ මතය. ඒ නිසා මෙම අර්බුදකාරී තත්ත්වය නැති කරන්න එතුමා කටයුතු කළ යුතුයි කියන එක මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා දැක්කා, කැබිනට් මණ්ඩලය පත් කරපු විධිය. සාමාන්‍යයෙන් ආණ්ඩුවක් පත් වුණාට පස්සේ කැබිනට් මණ්ඩලය එක දවසින් පත් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න, මම කථාව අවසන් කරන්නම්. මේ ඇති වෙලා තිබෙන ව්‍යසනයෙන් රට ගලවා ගැනීමේ වගකීම, ඒ අවස්ථාව තවම විධායක ජනාධිපතිතුමාට තිබෙනවා. එතුමා මොන මතයක් දැරුවත්, අමනාපකම් තිබුණත් ඒවා ගැන හිතන්න අවශ්‍ය නැහැ. නායකයෙක් විධියට, ඒ වාගේම විධායක බලය තිබෙන ජනාධිපතිවරයෙක් විධියට ඒ කටයුත්තට නැඹුරුවෙන්න කියලා ඉල්ලා සිටිමින්, මේ ව්‍යසනය තුළින් රට ඉතා ඉක්මනින්ම මිදේවා, රටේ ජනතාවට සෙත සැලසේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 4.02]

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று ஜே.வி.பீ. இனால் முன்வைக்கப்பட்டிருக்கின்ற சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை தொடர்பாக என்னுடைய கருத்துக்களையும் பதிவுசெய்ய விரும்புகின்றேன். இலங்கையின் அரசியல் வரலாற்றிலே ஒரு காலமும் இல்லாத வகையிலே, ஓர் அரசியல் நெருக்கடிக்குள் இன்று எமது நாடு தள்ளப்பட்டிருக்கிறது. கடந்த ஒக்ரோபர் மாதம் 26ஆம் திகதிக்குப் பின்னரான அரசியல் நெருக்கடி நிலைமையானது, இன்று எமது நாட்டின் பிரஜைகளால் மாத்திரமன்றி, சர்வதேசம் பூராவும் பேசப்படுகின்ற ஒரு விடயமாக மாறி இருக்கின்றது. இதனை அரசியல் நெருக்கடி என்று சொல்வதைவிட அரசியல் சூழ்ச்சி அல்லது துரோகத்தனம் அல்லது சதி என்றெல்லாம் சொல்லக்கூடிய அளவுக்கு இன்று நிலைமை காணப்படுகின்றது. இன்று அரசியலில் நிர்க்கதியான, மோசமான நிலைமை தோன்றியது என்பதைவிட, அது தோற்றுவிக்கப்பட்டிருக்கின்றது என்று சொல்லலாம்.

இந்த நிலைமையினால் நாட்டினுடைய பொருளாதார மானது நாளுக்குநாள் மிக மோசமாகப் பாதிக்கப்பட்டுக் கொண்டு வருகின்றது. சர்வதேச நிதி உதவிகள், கடன் உதவிகள் எல்லாமே நிறுத்தப்பட்டிருக்கின்றன. உல்லாசப் பிரயாணத்துறையின் மூலமான வருமானம் இழக்கச் செய்யப்பட்டிருக்கின்றது; வழமையான அபிவிருத்திப் பணிகள் பாதிக்கப்பட்டிருக்கின்றன; பட்டதாரிகளுடைய வேலையில்லாப் பிரச்சினையைத் தீர்த்துவைப்பதற்காக எடுத்த முயற்சிகள் எல்லாமே கைவிடப்பட்டிருக்கின்றன. இவ்வாறு இந்த நாட்டினுடைய அரசியல் ஸ்திரத்தன்மையும் பொருளாதார நிலைமையும் மிக மோசமான நிலைமைக்குப் பின்தள்ளப் பட்டிருக்கின்ற ஒரு சூழலில், இதற்குத் தீர்வு காண முடியாத நிலைமையிலேதான் இன்று நாங்கள் எல்லோரும் பாராளுமன்றத்திலே பேசிக்கொண்டிருக்கின்றோம்; வாதப் பிரதிவாதங்களில் ஈடுபட்டுக்கொண்டிருக்கின்றோம்; நீதிமன்றங்களுக்கு அலைந்துகொண்டிருக்கின்றோம். நாட்டில்

ஏற்கனவே சட்டரீதியான அரசாங்கம் இருந்தும் இன்று அது முடக்கப்பட்டிருக்கின்றது; மௌனிக்கப்பட்டிருக்கின்றது. மக்களுடைய ஆணையின் மூலமாகப் பெறப்பட்ட அதிகாரம் அவர்களுடைய ஆணைக்கு விரோதமாகப் பிரயோகிக் கப்பட்டிருக்கின்றது.

மைத்திரிபால சிறிசேன அவர்களுடைய ஜனாதிபதிப் பதவி, அவர் பெற்றுக்கொண்ட 62 இலட்சம் வாக்குகள் என்பன அவருக்கே உரித்தானதல்ல என்பதை இந்த சபையிலே குறித்துக்கூற, மிகக் கண்டிப்பாக அவருக்கு நினைவூட்ட நான் கடமைப்பட்டிருக்கின்றேன். அவருக்கு அளிக்கப்பட்ட வாக்குகள் ஐக்கிய தேசியக் கட்சியினுடைய வாக்குகள்! மஹிந்த ராஜபக்ஷவுக்கு மீண்டும் அதிகாரம் வந்துவிடக்கூடாது என்பதற்காகத் திரண்டெழுந்த மக்கள் அளித்த வாக்குகள்! மீண்டும் மஹிந்த அரசாங்கம் வந்துவிட்டால் இந்த நாட்டிலே தாங்கள் சுதந்திரமாக வாழ முடியாது என்ற நிலைப்பாட்டிலே சிறுபான்மையின மக்கள் அளித்த வாக்குகள்! இந்த வாக்குகளைக் கொண்டு அதிகாரத்துக்கு வந்த மைத்திரிபால சிறிசேன அவர்கள் தான் விரும்புகின்ற விதத்திலே அரசியலமைப்பை மீறித் தன்னுடைய கடமைகளை ஆற்றுவதற்கு எந்த அதிகாரமும் எந்த ஆணையும் அவருக்குக் கிடையாது என்பதை நாங்கள் மிகத் துல்லியமாகச் சொல்லிவைக்க வேண்டிய அவசியமிருக்கின்றது.

ඒ විතරක් නොවෙයි, "පාර්ලිමේන්තුව කැඳවා උසාවියට අපහාස කළැයි කථානායකවරයාට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්" කියා "දිවයින" පුවත් පතේ සඳහන් කර තිබෙනවා. මා ඔබතුමාට මතක් කරන්න කැමැතියි, ඔබතුමාගේ තීන්දු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිළිගෙන තිබෙන බව. පසුගිය දිනවල ඔබතුමා ගත් සෑම පියවරක්ම අධිකරණයෙන් පිළිගෙන තිබෙනවා. ඔබතුමාගේ කටයුතු ගැන මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා වාසී ජනතාවගේත් ප්‍රණාමය ඔබතුමාට පුද කරනවා.

අනෙක් කාරණය මේකයි. ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා දුන් තීන්දුවක් අනුව, මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කිසිම තැනකදී අභියෝගයට ලක් කරන්න බැහැ. ඔබතුමා පාර්ලිමේන්තුව කැඳෙව්වාය කියා නඩුවක් පවරා තිබෙනවා, ගරු කථානායකතුමනි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ නීති රීති ගැන අවබෝධය ඇතිව මේ headlines දමන්න ඕනෑය කියන කාරණයයි මම පුවත්පත් වාර්තාකරුවන්ටත් කියන්නේ. පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ තුන්වන වගන්තිය යටතේ කථානායකතුමාගේ තීරණ ගැන -ඒ කියන්නේ, පාර්ලිමේන්තුව කැඳවීමේ තීරණය වුණත්- කිසිම තැනකදී, කිසිම අධිකරණයකින් ප්‍රශ්න කරන්න බැහැ.

අදත් -12වන දා- විවාදවලට සහභාගි වන්නේ නැහැය කියා බන්දුල ගුණවර්ධන මැතිතුමා කියා තිබුණා. එතුමන්ලා පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි නොවන්නේ එතුමන්ලාගේ නියම මන්ත්‍රී සංඛ්‍යාව රටට හෙළි වන නිසායි. අපි පසුගිය දවස්වල මේ කාරණය ගැන විමසිල්ලෙන් බැලුවා. අර මුල් දවසේ-දෙකේ

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

එතුමන්ලා මේ ගරු සභාවට ආවා. උපරිම වශයෙන් ඒ අයට හිටියේ 85දෙනායි. ඉතින් එතුමන්ලාගේ ඒ ගණන් හෙළිදරව් වන නිසා තමයි එතුමන්ලා දැන් එන්නේ නැත්තේ. ඔබතුමාගේ ක්‍රියාදාමය දියාරු කරලා ඔබතුමා හාස්‍යයට ලක් කරන්නයි මේ සමහර මාධ්‍යත්, "ආණ්ඩුව" යයි කියා ගන්නා අයත් උත්සාහ කරන්නේ. එම කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ප්‍රධාන වැඩ කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 - විශ්වාසය ප්‍රකාශ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

විශ්වාසය ප්‍රකාශ කිරීමේ යෝජනාව
நம்பிக்கையைத் தெரிவிக்கும் பிரேரணை
VOTE OF CONFIDENCE

[අ.භා. 1.05]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු රවි කරුණානායක මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා-

පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු රනිල් වික්‍රමසිංහ මහතා හට අග්‍රාමාත්‍යවරයා වශයෙන් ක්‍රියා කිරීමට පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති බවට මෙම සභාව යෝජනා සම්මත කරයි."

ගරු කථානායකතුමනි, එම යෝජනාව පිළිබඳව පුළුල් ලෙස අදහස් දක්වන්න මා දැන් බලාපොරොත්තු වෙනවා. අපේ මාතෘ භූමියේ ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයේ අඳුරුම යුගය පවතින අවස්ථාවක, ඉතාම තීරණාත්මක රැස්වීමකටයි ඔබතුමාත්, අප සියලුදෙනාත් අද මේ ඒක රාශි වී සිටින්නේ. අපේ රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මේ වසරේ ඔක්තෝබර් 26වන දා සිට පිට පිටම, කුමන්ත්‍රණකාරී අන්දමින් බරපතළ උල්ලංඝනය කිරීමකට ලක් වුණා. ඒ තුළින් ජනතා පරමාධිපත්‍යයට ඉමහත් හානියක් සිදු වුණා. අද වන විට මුළු රටම අකර්මණ්‍ය වෙලා තිබෙනවා; අඩපණ වෙලා තිබෙනවා. අද මේ රට එකම මඩ වළක එරිලා, එකම තැන පල්වෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. රටක් හැටියට අපි මේ තත්ත්වයට ප්‍රවේශ වුණේ කොහොමද?

පසුගිය ඔක්තෝබර් 26 වැනිදා අපේ රටේ පැවතුණු නීත්‍යානුකූල ආණ්ඩුව, නීත්‍යානුකූල අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ඇමති මණ්ඩලය නීති විරෝධීව, ව්‍යවස්ථා විරෝධීව බලහත්කාරයෙන් තනි මතයට ඉවත් කර, නීති විරෝධී අගමැතිවරයෙක් ප්‍රමුඛ ඇමති මණ්ඩලයක් සමඟ ඊනියා නිල නොවන ව්‍යවස්ථා විරෝධී ආණ්ඩුවක් පත් කළා. කෙටියෙන් කියනවා නම්, පාර්ලිමේන්තුවේ 113ක් සහ ඊට වැඩි සංඛ්‍යාවක මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත තිබුණු අගමැතිවරයා ඉවත් කර මන්ත්‍රීවරුන් 113ක් නියා 85ක 90කවත් කැමැත්තක් නොතිබුණු පුද්ගලයෙක් අගමැතිවරයා බවට පත් කර මේ මහා ව්‍යසනකාරී තත්ත්වය රටේ නිර්මාණය කළා.

ගරු කථානායකතුමනි, අගමැතිවරයෙක් ඉවත් කරනවා නම්, ඉවත් කරන, ඉවත් කෙරෙන අවස්ථා ප්‍රධාන වශයෙන් හතරක් තිබෙනවා. එක්කෝ අගමැතිවරයා ඉල්ලා අස්වන්නට ඕනෑ; නැත්නම් මන්ත්‍රීකම අහිමි වෙන්න ඕනෑ එහෙම නැත්නම් විශ්වාස භංග යෝජනාවකින් පරාජය වන්නට ඕනෑ; අය වැය දෙවතාවක් පරදින්නට ඕනෑ. මෙන්න මේ අවස්ථාවන් හතරේදී පමණයි, රටේ අගමැතිවරයෙක් ව්‍යවස්ථානුකූලව ඉවත් කරන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් අපි සියලු දෙනාත් දන්නවා හිතුවක්කාරකමට රට පැත්තක දමලා, රටේ ජනතාව පැත්තකට විසි කරලා මමත්වය රජ කරවමින් තමන් ගැන හිතලා බලහත්කාරී තීන්දුව ගැනීම තුළ අද මුළු රටම මහා අති භයංකාර තත්ත්වයකට ගෙන ඇවිල්ලා තිබෙන බව. ගරු කථානායකතුමනි, තිබුණු ආණ්ඩුව ඉවත් කරලා, හිටපු අගමැතිවරයා ඉවත් කරලා නීත්‍යානුකූල නොවන ආකාරයට, ව්‍යවස්ථා විරෝධීව නිල නොවන අලුත් අගමැතිවරයෙක්, ඇමති මණ්ඩලයක්, ආණ්ඩුවක් පත් කළා පමණක් නොවෙයි, බහුතරය 113ක් නැති නිසා 113ක බහුතරය හදා ගන්න වෙනමම පාර්ලිමේන්තුවට විරාමයකුත් දුන්නා. නමුත්, සිද්ධ වුණේ මොකක්ද? අපේ ප්‍රගතිශීලී ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන මන්ත්‍රී මණ්ඩලයට විවිධ වරදාන, වරප්‍රසාද, ප්‍රතිලාභ, සන්තෝසම්, සීනිබෝල ලබා දෙන්නටයි උත්සාහ කළේ. මෙම මන්ත්‍රී මණ්ඩලය තමන්ගේ ආත්මය පාවා දුන්නේ නැහැයි කියන එක මා මේ අවස්ථාවේදී සතුටින් ප්‍රකාශ කරනවා. ගරු කථානායකතුමනි, නීත්‍යානුකූල නොවන අගමැතිවරයෙක් ප්‍රමුඛ, ඇමති මණ්ඩලයක් ප්‍රමුඛ නිල නොවන ආණ්ඩුවක් පත් කර ගත්තා.

නමුත්, ප්‍රතිපක්ෂයේ අපි මොකක්ද කළේ? පාර්ලිමේන්තුව රැස් වුණු අවස්ථා ගණනාවකදීම අපි පෙන්වා දුන්නා, බහුතරය තිබෙන්නේ නිල නොවන ආණ්ඩුවට නොවෙයි; බහුතරය තිබෙන්නේ බලහත්කාරයෙන් ඉවත් කරපු අපේ පාර්ශ්වයට බව. විශ්වාස භංග යෝජනා දෙකකදී අපි එය ඔප්පු කළා. තේරීම් කමිටුවේ සංයුතිය පිළිබඳ ඡන්දයේදී අපේ මන්ත්‍රී සංඛ්‍යාව පෙන්වලා දුන්නා. නීත්‍යානුකූල නොවන අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ඒ කාර්යාලයේ මුදල් කප්පාදු කිරීමේ ඡන්දයේදී අපි 123ක් පෙන්නුවා. අර අනිත් ඡන්දවලදී බහුතරය පෙන්වනකොට කිව්වා නේ, කට හඬින් පමණක් ඡන්දය - voice vote එකකින් - බැහැ; ඉලෙක්ට්‍රොනික් ක්‍රමයට ඡන්දය ගන්න ඕනෑ කියලා. අපි ඉලෙක්ට්‍රොනික් ක්‍රමයටත් පෙන්නුවා, නැඟිටලාත් පෙන්නුවා, අත් ඔසවලාත් පෙන්නුවා. පෙන්වන්න පුළුවන් හැම ආකාරයටම අපි පෙන්නුවා.

නීත්‍යානුකූල නොවන ඇමති මණ්ඩලයේ මුදල් කප්පාදු යෝජනාවේ ප්‍රතිඵලය මොකක්ද? 122ක් අපේ පාර්ශ්වයට.

ගරු කථානායකතුමනි, දැන දැන ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා, දැන දැන නීතිය කඩලා, වැරැදියි කියන එක දැක දැක මේ අය ක්‍රමවේද දෙකක් උපයෝගි කර ගත්තා, කුමන්ත්‍රණකාරී ලෙස අපේ බහුතරය අහෝසි කරන්න. මොකක්ද, පළවෙනි ක්‍රමය? අපේ බහුතරය හොඳට දැක්කා; ඇස් දෙකට හොඳට පෙනුණා; කන්වලට හොඳට ඇහුණා. මේ රටේ පෙර පාසල් දරුවාගේ ඉඳලා වැඩිහිටියා දක්වා ලක්ෂ 220ක් වූ ජනතාව දැනගෙන හිටියා, අපට

බහුතරය කියලා. මේ නිසාම අපේ ප්‍රතිවාදීන් තැති ගැන්වුණා; ක්ලාන්ත දැම්මා; තුෂ්ණීම්භූත වුණා. ඒ අයට මතක් වුණා, ඒ අය පාලනය කරපු කාලයේ ඉතිහාසය, රාජ්‍ය මර්දනය, රාජ්‍ය භීෂණය, රාජ්‍ය ත්‍රස්තවාදය. ඒක කේන්ද්‍ර කරගෙන මේ සභා ගර්භය තුළ බිහිසුණු ප්‍රහාර එල්ල කළා; මිරිස් කුඩු ප්‍රහාර එල්ල කළා; මුළු රටම අගය කරන වීරෝදාර රණ විරුවන්ට, ආරක්ෂක නිලධාරීන්ට වදහිංසා දුන්නා. රූප රාමුවල තිබෙනවා, එක මන්ත්‍රීවරයෙක් කිසිම බියක් සැකයක් නැතුව ඒ රණ විරුවන් ළඟට ගිහිල්ලා කම්මුලට ගහනවා. ශාරීරික ප්‍රහාර එල්ල කළා.

ගරු කථානායකතුමනි, එහෙම ප්‍රහාර එල්ල කරලා මේ උත්තරීතර ආයතනයේ පහත මාලයේ කමිටු කාමරයකට ගිහිල්ලා ඒ අය ප්‍රවෘත්ති සාකච්ඡා හරහා ලොවට හුවා දක්වන්නට යෙදුණා, "අපි නිවැරදියි; අපි සුපිරිසිදුයි; අපි හැසිරෙන්නේ බ්‍රාහ්මණයින් වාගේයි" කියලා. නමුත් අපි හැමෝම දන්නවා, මේ සභා ගර්භය තුළ ඒ අය හැසිරුණේ වසලයින් වාගේ කියලා. මහා ලොකුවට කියනවා, බුද්ධ ධර්මයට ගරු කරනවා; බුද්ධ ධර්මය ආරක්ෂා කරනවා කියලා. නමුත්, ඒ අයට අමතක වුණා, උතුම් බුදු වදනක්. බුදුරජාණන් වහන්සේ වසල සූත්‍රයෙන් මෙන්න මේ විධියට දේශනා කරලා තිබෙනවා:

"න ජච්චා වසලෝ හොති - න ජච්චා හොති බ්‍රාහ්මණෝ

කම්මනා වසලෝ හොති - කම්මනා හොති බ්‍රාහ්මණෝ"

ඒ උතුම් බුදු වදන අපි නිර්වචනය කළොත්, "තමන් බ්‍රාහ්මණයෙක් ද, වසලයෙක් ද කියන එක තීන්දු වෙන්නේ උත්පත්තියෙන් නොව, ක්‍රියාවෙන්" කියන එකයි එහි ඇත්තේ. එසේයි ලොවුතුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. එතකොට පාර්ලිමේන්තු සභා ගර්භය තුළ හැසිරීම් රටාව තුළ කවුද බ්‍රාහ්මණයෝ, කවුද වසලයෝ කියන එකත් මුලු රටම දැනගත්තයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, දැන් වතාවන් ගණනාවක් අපි අපේ බහුතරය පෙන්නුවා; අපේ වැඩි ප්‍රමාණය පෙන්නුවා; මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 113 පන්නලාත් පෙන්නුවා.

හරි නම්, ඒ අයට තිබුණා, කෑදරකමට, පෙරේතකමට, අසීමිත ආශාවෙන්, බලලෝභිත්වයෙන් වල්මත් වෙලා සිටින්නේ නැතුව, ඉතිරි වුණු නම්බුවත් රැකගෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) ව්‍යවස්ථාව දිහා බලලා කටයුතු කරන්න. පුංචි හෝ නම්බුවක්, රටේ ගෞරවයක් තිබුණ කණ්ඩායමක් විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) ව්‍යවස්ථාවට ගරු කරලා, ඒ තනතුරුවලින් ඉවත් වෙලා ගිහිල්ලා, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහත්මා දේශපාලනයේ නාමයෙන් ඒ අයට කියන්න තිබුණා, "අපට බහුතරයක් නැහැ, අපි මේක පිළිගන්නවා, මේක තමයි යථාර්ථය, දැන් ඔබලා ආණඩුව භාර ගන්න" කියලා. නමුත් එසේ කළේ නැහැ. ඒ මොකද, ගරු කථානායකතුමනි? හරි - වැරදි, සරු - නිසරුභාවය ඒ අයට තේරුම් ගන්න බැරි වුණා. ලොවුතුරා බුදුරජාණන් වහන්සේ වදාළ, ධම්ම පදයට ඇතුළත් වූ ඒ වැදගත් ගාථාව, ඒ වැදගත් දේශනය මේ මහා ලොකු දේශප්‍රේමීන්ට අමතක වුණා. බහුතරයක් නොමැති නිසා අද ඒ අය මේ සභාව වර්ජනය කර සිටියත් අඩුම ගණනේ කොහේ හෝ කොනක ඉඳගෙන මගේ කථාව අහගෙන ඇති. මම ඒ අයට ධම්ම පදයේ මේ ගාථාව මතක් කරන්න කැමැතියි:

"අසාරෙ සාරමතිනො - සාරෙ චාසාරදස්සිනො

තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡාසංකප්පගොචරා"

තමා ඉදිරියේ තිබෙන දේ සරුයි කියා දැක දැක "නැහැ, ඒක සරු නැහැ. ඒක නිසරුයි." කියා තමන් කියනවා. තමන් ළඟ තිබෙන දේ නිසරුයි කියා දැක දැක, "නැහැ, මේක නිසරු නැහැ. මේක සරුයි" කියා කියනවා. හරි වැරැද්ද තෝරා බේරා ගන්නට බැහැ. සරු නිසරුභාවය තෝරා ගන්නට බැහැ. ඒ නිසා ඒ අය ප්‍රතිපත්තිගරුක දේශපාලනයක් අනුගමනය කිරීම සම්පූර්ණයෙන්ම -සහමුලින්- ප්‍රතික්ෂේප කළා.

ගරු කථානායකතුමනි, වැරැදි විධියට අගමැති ප්‍රමුඛ ආණ්ඩුව අස් කළා. නීති විරෝධීව පුද්ගලයකු සහ කණ්ඩායමක් පත් කළා. ඒ අයට 113ක මන්ත්‍රීවරුන් සංඛ්‍යාවකගේ කැමැත්තත් නැති කොට පාර්ලිමේන්තුවත් කල් දැම්මා, 113 හදාගන්න. ඒ ඔක්කෝම කර ගන්නට බැරිව ළතැවෙන මොහොතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා හිටිහැටියේම පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථා ටික කියවා නොවෙයි මේ තීන්දුව ගත්තේ. මමත් ඇත්තටම දැන ගන්න කැමැතියි, මොන නීති විශාරදයාද, මොන නීති කණ්ඩායමද, මේ පාර්ලිමේන්තුව විසුරුවීමේ උපදෙස් ලබා දුන්නේ කියා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33.(2) (ඇ), 62.(2), 70.(1) කියන ව්‍යවස්ථා දිහා බලන්නේ නැතිව ඒ වැරැදි තීන්දුව ගත්තා.

පාර්ලිමේන්තුව විසුරුවීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය තහනම් නියෝගයක් ලබා දීලා, ඒ නඩුව විභාග කරලා අවසන් කරලා දැන් මුළු රටම, මුළු ලෝකයම බලාගෙන ඉන්නවා, තීන්දුව ලබා දෙනතුරු. සදාචාරසම්පන්න දේශපාලන ගමනක් යන පුද්ගලයෙක් සහ කණ්ඩායමක් හැටියට අපි සියලු දෙනාම ඒ කාරණාව පිළිබඳව වැඩිදුර කථා කරන්නට යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කියන්නේ මොකක්ද? රටක තිබෙන උත්තරීතර නීතිය. මේ උත්තරීතර නීතිය රැක ගන්නට, ආරක්ෂා කරන්නට අපේ රටේ පුරවැසි පරපුරේ අපි සියලුම දෙනා බැඳී සිටිනවා. ඒක පුරවැසි වගකීමක්; ජනතා වගකීමක්; අපි සියලු දෙනාගේම වගකීමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැදගත්කම ගැන ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රවීණ ජනාධිපතිවරයෙක්ව සිටි ඒබ්‍රහම් ලින්කන් මැනිතුමා මෙලෙස ප්‍රකාශ කරලා තිබෙනවා.

"කොංග්‍රස් මණ්ඩලය හා අධිකරණය යන දෙඅංශයේ ම සැබෑ ස්වාමිවරුන් වන්නේ ජනතාව වන අප ය. එය එසේ වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිඳ දැමීමට හෝ විකෘති කිරීමට නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විකෘති කරන්නන්ගෙන් මැඩපැවැත්වීම පිණිසයි." තවද ලින්කන් ජනාධිපතිතුමා සඳහන් කර තිබෙනවා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කිසිදු කරුණක් විකෘති කිරීම සිදු නොකරන්න. එය එසේම පවත්වාගෙන යා යුතුයි. මක් නිසාද, එය අපගේ නිදහසේ එකම ආරක්ෂකයා වන බැවිනි." කියා.

Hon. Speaker, the events of the past six weeks have resulted in creating a constitutional crisis of immense and monumental proportions. The abominable and despicable acts of the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

have brought about an anarchical situation in our motherland. It has promoted chaos, uncertainty, helplessness in our society as a whole. In such a milieu, it should be the responsibility of all right-minded citizens to champion the cause of constitutionality, democracy,

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

justice and fairness. We on this side of the political aisle, shall - to use former President John F. Kennedy's words - "….pay any price, bear any burden, meet any hardship, support any friend, oppose any foe to assure the survival of liberty, constitutionalism and democracy."

Sir, it is most appropriate, at this particular juncture, for all of us to remind ourselves of two famous statements made by President Abraham Lincoln with regard to the importance of protecting the Constitution. He said:

"We the people are the rightful masters of both Congress and the courts, not to overthrow the Constitution but to overthrow the men who pervert the Constitution."

He also stated:

"Don't interfere with anything in the Constitution. That must be maintained, for it is the only safeguard of our liberties."

ගරු කථානායකතුමනි, රටේ ව්‍යවස්ථාවේ ඒ අදාළ ව්‍යවස්ථාවලට අනුව, මේ අනිඋතුම් වූ සභා ගර්භයේ උපරිම විශ්වාසය, වැඩිම විශ්වාසය තිබෙන්නේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටයි කියන කාරණය මා ප්‍රකාශ කර සිටිනවා. ඒක සත්‍යයක්. ඒක යථාර්ථයක්. ඒක අපට ප්‍රතික්ෂේප කරන්නට බැහැ. සත්‍ය ඉදිරියේ සත්‍යයට ගරු කරලා, ව්‍යවස්ථාව ඉදිරියේ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට ගරු කරලා, නියමිත ක්‍රමවේදයට, නීත්‍යානුකූලව, නිර්ව්‍යාජව ඒවා අනුගමනය කරන්නට අපි හැමෝම වග බලාගන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, නීත්‍යානුකූල රජයක් නොතිබීම තුළ අද අපි හැමෝම දන්නවා, අපේ රට අන්ත ප්‍රපාතයට වැටෙන බව.

ජනතාව ඉමහත් අසරණභාවයකට ලක් වෙලා තිබෙනවා, සංවර්ධනය ඇණ හිටලා තිබෙනවා, අපේ රටට ලැබෙන්න තිබුණු වටිනා විදේශ ආධාර සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. අද රට තුළ සාමාන්‍ය ජනතාවට ඉඩම් බෙදෙන්නේ නැහැ; ගෙවල් හැදෙන්නේ නැහැ; කෘෂිකර්මාන්ත සංවර්ධනය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වාගේම වාරිමාර්ග සංවර්ධනය ඇණ හිටලා. ධීවර ප්‍රජාවට සහන නැහැ. රාජ්‍ය සේවක ක්ෂේත්‍රය මුළුමනින්ම අසරණ වෙලා, මධ්‍යම පන්තිය අනාථ වෙලා. සැහැල්ලු රේල්ලු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රටට ලැබෙන්න තිබුණු ආධාර හකුළා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සහශ්‍ර අභියෝගතා ගිණුමෙන් - Millennium Challenge Account - ඇමෙරිකා එක්සත් ජනපදය රටේ සංවර්ධනය වෙනුවෙන් කැප කළ කෝටි ප්‍රකෝටි ගණන් ඩොලර් අපේ රටට අහිමි වෙලා තිබෙනවා. අද අපේ රට කොච්චර කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවාද කිව්වොත්, අපේ රටේ දුක් විඳින, අපේ රජයක් තුළ රැක ගත්තු පිළිකා රෝගීන්ටත් අද ඒ අත්‍යවශ්‍ය බෙහෙත් අහිමි වෙලා තිබෙනවා. අද ගම් උදාව නතර වෙලා; ගම් පෙරළිය නතර වෙලා. "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන සහමුලින්ම නතර කර තිබෙනවා.

ග්‍රාම රාජ්‍ය වැඩ පිළිවෙළ නතර වෙලා. රටේ ජනතාව වෙනුවෙන් රටේ සංවර්ධනයේ ඉහළම තලයේ තිබෙන ඒ මහා සංවර්ධන ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අද නතර වෙලා.

ගරු කථානායකතුමනි, මගේ පියාණන් මේ රටේ පාසල් දූ දරුවන් හතළිස්තුන් ලක්ෂයකට නිල ඇඳුම් ලබා දුන්නේ "දෙපැත්ත පත්තුවන විලක්කුවක්" හැටියට රට තිබුණු කාලයේදියි. දැන් මොන විලක්කුවක්වත් පත්තු වෙලා නැහැ. නමුත්, හතළිස්තුන් ලක්ෂයක්, හතළිස්හතර ලක්ෂයක් වන පාසල් දූ දරුවන්ට දැන් මහා ගින්දරක් පත්තු වෙලා තිබෙනවා. මොකද, කොයි තරම් දේශාභිමානී, දේශාලයෙන් පිරුණු, දේශානුරාගය වැක්කෙරෙන ආණ්ඩුවක් -නිල නොවන- පත් කර ගත්තාද කිව්වොත්, ඊ ළඟ අවුරුද්දේ පාසල් දරුවන්ට නිල ඇඳුම් ටික ලබා දෙන්න මේ රජය අපොහොසත් වෙලා තිබෙන නිසා. මම මේ අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉතාම ඕනෑකමින් හා කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. තව දුරටත් ඔබතුමා බලා සිටින්නට එපා. ඔක්තෝබර් 26 වෙනි දා සිට ගත්ත මේ ක්‍රියාමාර්ග ව්‍යවස්ථානුකූල නොවන බව, නීති විරෝධී බව මුළු රටම පිළිගෙන තිබෙනවා. ඒ නිසා, දැන්වත් අපේ මාතෘ භූමිය රැක ගන්නට; අපේ මාතෘ භූමිය ඇද වැටී තිබෙන මේ ප්‍රපාතයෙන් ගොඩ ගන්නට, මේ සභා ගර්භයේ වැඩිම විශ්වාසය තිබෙන; උපරිම විශ්වාසය තිබෙන රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අගමැතිතුමා බවට පත් කරන්නය කියලා මම මේ සභා ගර්භයේ සිට ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා ප්‍රමුඛ මේ මන්ත්‍රීවරුන් සියලු දෙනාටත්, විශේෂයෙන්ම අපේ රටේ ලක්ෂ 220කට අධික වූ ජනතාවටත් වැදගත් වන කරුණක් මේ අවස්ථාවේ දී ඉස්මතු කරන්නට මම කැමතියි.

ගරු කථානායකතුමනි, මේ වනවිට ඔබතුමාගේ ශක්තිය තුළ, මූලික අයිතිවාසිකම් පෙත්සම් පැනවීමේ ඒ ව්‍යවස්ථානුකූල බලය තුළ, ඒ වාගේම ස්වාධීන අධිකරණයේ පිහිට පැතීම තුළ අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, රටේ ජනතාවගේ දේශපාලන අයිතිය, පරමාධිපත්‍යය අප රැක ගනිමින් සිටිනවා. අපි මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කිරීම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදය හරහා තමයි ක්‍රියාත්මක කරන්නේ. රටක ජීවත් වන ජනතාවගේ දේශපාලන සහ සිවිල් අයිතීන් පිළිබඳ පූර්ණ විග්‍රහයක් මේ III වැනි පරිච්ඡේදයේ තිබෙනවා.

ඒවා කඩ නොකළ යුතු බවට ඉතාමත් ශක්තිමත්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ සඳහන් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විවිධ ව්‍යවස්ථා, විවිධ පරිච්ඡේද ගැඹුරින් අධ්‍යයනය කරනකොට මා දකින ඌනතාවක් තිබෙනවා. මා විශ්වාස කරනවා, ඉදිරි කාල වකවානුවේ දී සියලුම පාර්ශ්වයන්ගේ ආශීර්වාදය තුළ රට වෙනුවෙන්, දැය වෙනුවෙන්, මේ රටේ පුරවැසි පරපුර වෙනුවන් මේ අඩුපාඩුව, මේ ඌනතාව සංශෝධනයකට ලක් කරන්න ඕනෑය කියලා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වැනි පරිච්ඡේදය කෙරෙහි ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරන්න මා කැමැතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වැනි පරිච්ඡේදයේ සඳහන් වෙනවා, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූල ධර්ම සහ මූලික යුතුකම් පිළිබඳව. කොටින්ම කියනවා නම්, රජයක් ආණ්ඩු බලය අතට ගෙන රට පාලනය කරනකොට මහ ජනතාව වෙනුවෙන් කළ යුතු යුතුකම් සම්බන්ධයෙන් එහි සඳහන් වෙනවා. සරලව කියනවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ සඳහන් වෙන්නේ, රටක පුරවැසියන්ගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙනුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වැනි පරිච්ඡේදයේ සඳහන් වෙන්නේ, රටක ජනතාවගේ ආර්ථික සහ සමාජයීය අයිතිවාසිකම් සම්බන්ධයෙනුයි. හැබැයි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබෙන බරපතළ ඌනතාව වරදක් හැටියට මා දකිනවා. මොකක්ද? ජනතාවගේ ආර්ථික, සමාජයීය ජීවත් වීමේ අයිතිය, ශුභ සාධන අයිතිය සහ සහන අයිතියයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වැනි පරිච්ඡේදයේ 29වන ව්‍යවස්ථාවෙන් කියනවා, ඉහත සඳහන් වූ ආකාරයට ආණ්ඩුවක් ගෙන යා යුතු වුවත්, මේ අයිතීන් පිළිබඳව අධිකරණයට ගිහින් ඒවා අභියෝගයට ලක් කරන්නට බැහැයි කියලා.

ගරු කථානායකතුමනි, එහෙම නම් අපි මේ ජීවත් වෙන්නේ යල් පැන ගිය යුගයක, යල් පැන ගිය ව්‍යවස්ථාවක් තුළයි. අපට මතකයි, දෙවන ලෝක මහා සංග්‍රාමයේ ජයග්‍රහණයෙන් පසුව ඒ ජයග්‍රාහී රටවල් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව ප්‍රඥප්තියක් සම්මත කර ගත් බව.

එම ජයග්‍රාහී, බලවත් රටවල් එය සම්මත කර ගත්තේ මානව අයිතිවාසිකම් පිළිබඳව ඒ අය දැරූ අර්ථ කථනය අනුවයි. හැබැයි ගරු කථානායකතුමනි, එක්දහස්නවසිය පණස් ගණන්වල, හැට ගණන්වල මානව අයිතිවාසිකම් ගැන කථා කළ ඔය බලවත් රටවලට යටත් වෙලා සිටි රටවල් ක්‍රම ක්‍රමයෙන් නිදහස ලබනකොට ඔවුන් නොබැඳි රටවල සංවිධානය හැටියට නිර්මාණය වුණා. ඒ අය NAM - Non-Aligned Movement - කියලා තමයි කිව්වේ. තවත් සමහරෙක් 77 කණ්ඩායම - Group of 77 - කියා සඳහන් කළා. "මානව අයිතිවාසිකම් කියන්නේ සිවිල් අයිතියයි, දේශපාලන අයිතියයි පමණක් නොවෙයි, අපට ආර්ථික අයිතියක් තිබෙනවා; සමාජයීය අයිතියක් තිබෙනවා; බඩගින්නෙන් තොර ජීවිතයක්, සෞභාග්‍ය සම්පන්න ජන ජීවිතයක්, ශක්ති සම්පන්න පුරවැසි පරපුරක් බිහි කිරීම සඳහා වන අයිතියක් තිබෙනවා, පත් වන හැම රජයක්ම ඒ මානව අයිතීන් සුරක්ෂා කරන්න ඕනෑ" කියා ඒ අය කිව්වා. මට මතක හැටියට ඒ එක්දහස්නවසිය හැට ගණන්වල අග භාගයේයි. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට - UN Charter එකට - the International Covenant on Economic, Social and Cultural Rightsත් ඇතුළත් වුණා. දැන් UN Charter එක 1960 ගණන්වලින් ඉස්සරහට ගිහින් තිබෙනවා. නමුත්, අපේ රටේ ජනතාව සමාජයීය සහ ආර්ථික අයිතීන් වෙනුවෙන් අධිකරණයට ගිහින් අභියෝග කරන එක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගන්නේ නැහැ. "යථාර්ථවාදී කථාවක් නොවෙයි මේ කරන්නේ, එතකොට කොහොමද ආණ්ඩුවක් කරගෙන යන්නේ? මූලික අයිතිවාසිකම් නඩුවලට පෙනී සිටීමින් හැමදාම උසාවියේ ඉන්න වෙයි" කියා මෙහිදී නීති ක්ෂේත්‍රයේ සමහර ප්‍රවීණයන් කියන්න පුළුවන්. මම ඒ මතය දරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, බිහි වන හැම රජයකටම, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භයවන පරිච්ඡේදය හරහා නෛතික බැඳීමක් ඇති කරන්න ඕනෑ. තමන් රට පාලනය කරනකොට, තමන්ගේ රාජ්‍ය ප්‍රතිපත්ති දියත් කරන්න ඕනෑ තම තමන්ගේ ඕනෑ එපාකම්වලට නොවෙයි; තමන් නියෝජනය කරන පෙළැන්තියක්, කණ්ඩායමක් වෙනුවෙන් නොවෙයි; තමන් කැමැති ජන කොටඨාසයක් වෙනුවෙන් නොවෙයි කියන කාරණය අවධාරණය කරන්න ඕනෑ.

මේ රටේ ලක්ෂ 220ක ජනතාවට දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන් නම්, රජයක් තුළින් ක්‍රියාත්මක කෙරෙන ජනතාවාදී ක්‍රියාවල ඌනතාවක් තිබෙනවා නම් එතැනටත් අපි එම ඉඩ ප්‍රස්තාව සලසන්න ඕනෑ. එතකොට ඕනෑම ආණ්ඩුවකින් යම් යම් විෂමතා සිදු වෙනවා නම්, යම් යම් අඩු පාඩුකම්, ඌනතා සිදු වෙනවා නම්, ඒ සියල්ලම මහ හරවන්න අපට ඒක ශක්තියක් වෙනවා. තමන් කුමන පක්ෂයකින් පත් වුණත්, තමන්ගේ රාජ්‍ය ප්‍රතිපත්තියේ තිබෙන අඩු පාඩුකම්, අඩු ලුහුඬුකම් ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍රය වෙනුවෙන් අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන්න පුළුවන්ය කියන බිය සහ තැතිගැන්වීම තුළ, ඒ අයටත් සොඳුරු පාලකයන්; සැදැහැවත් පාලකයන් බවට පත් වෙන්න සිදු වෙනවා; ජනතාවාදී, ජනහිතකාමී, දේශ හිතෛෂී, සමාජ හිතෛෂී, ජාති හිතෛෂී, ජනතා හිතෛෂී පාලකයන් බවට පත් වෙන්න සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, දැන් මගේ කථාවේ අවසාන කොටසට ප්‍රවේශ වන්නට මා කැමතියි.

Sir, it is my fervent and sincere belief that during this shameful escapade you have acted in the most noble and bravest manner in protecting the Constitution and the rights of the Parliamentarians and the democratic masses in the country as a whole. You, honourable Sir, have acted as a bulwark against autocracy, authoritarianism and dictatorship.

I would like to salute you with a quotation from the late Martin Luther King. He stated, “The ultimate measure of a man is not where he stands in moments of comfort and convenience, but where he stands at times of challenge and controversy."

Hon. Speaker, I myself and all of us salute you!

ගරු කථානායකතුමනි, පසුගිය ඔක්තෝබර් 26වන දා සිට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් අප රට තුළ සිදු වුණු මේ දුර්දාන්ත ක්‍රියාදාමය තුළ, ප්‍රජාතන්ත්‍රවාදය සහ ව්‍යවස්ථාව සුරක්ෂා කිරීම වෙනුවෙන්, රටේ දේශපාලන නිදහස සහ ස්වෛරීත්වය, ජනතා අයිතිය වෙනුවෙන් ඔබතුමා මහා පවුරක් ලෙස කටයුතු කළ ආකාරය සදා අමරණීයයි; සැබැවින්ම නිර්මලයි. එම ක්‍රියාදාමය අතිවිශිෂ්ටයි; අතිශ්‍රේෂ්ඨයි. අපේ රටේ ඉතිහාස පොතේ මේ කාල වකවානුව පිළිබඳව ලියැවෙනකොට ඔබතුමාගේ ක්‍රියාකාරිත්වය, ඔබතුමාගේ නාමය රන් අකුරින් ලියැවෙනවා නොඅනුමානයි.

විශේෂයෙන්ම මාර්ටින් ලූතර් කිං මැතිතුමා කළ ප්‍රකාශයක් හරහා මගේ උපහාරය ඔබතුමාට පුද කරන්නට කැමැතියි. "මිනිසා මනිනු ලබන අවසන් මිමිම වනුයේ, සුවදායක සහ පහසු අවස්ථාවන්හි ඔහු සිටින ස්ථානය හෝ දරන ස්ථාවරය නොව අභියෝගාත්මක හා මතභේදාත්මක අවස්ථාවන්හි ඔහු සිටින ස්ථානය හා දරන ස්ථාවරයයි" කියා එතුමා ප්‍රකාශ කළා.

ගරු කථානායකතුමනි, අද සිදු වන මේ ඓතිහාසික ක්‍රියාදාමය තුළ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මෙම ගරු සභාවේ ඉහළම විශ්වාසය සහ උපරිම සහාය තිබෙන බව සනාථ වනවා නොඅනුමානයි, එය ස්ථිරයි. එය තහවුරු වනවාත් සමඟම අපේ මාතෘ භූමියේ නව සංවර්ධන ගමනක ආරම්භය සනිටුහන් වෙයි කියා අප විශ්වාස කරනවා. ඒ ගමන මේ රටේ සාමාන්‍ය ජනතාව රජ කරවන ගමනක්; මේ රටේ දුකෙන් පෙළෙන ජනතාව සැපතට පත් කරන ගමනක්; නැති බැරි, ඇති හැකි පරතරය ඉවත් කරන ගමනක්; දුප්පත් මනුස්සයාට සහන ලබාදෙන ගමනක්; මේ රටේ නිහඬ බහුතරය අසහනයෙන්, පීඩනයෙන් මුදා ගන්නා ගමනක්; නූපන් දරුවාගේ සිට ජන සමාජයේ සියලුදෙනා සුරක්ෂා කරන ගමනක්; ප්‍රකෝටිපතියන් සුපෝෂිතයන් බවට පත් කරනවා වෙනුවට, දුප්පත්, සාමාන්‍ය ගැමි සහ නාගරික ජනතාව සුඛිත මුදිත කරවන ගමනක්.

Sir, today is a historic day. It is a momentous occasion in our democratic political history; it is a day when democracy triumphs over tyranny, a day when dictatorship will be defeated and overcome by democracy and it is a day where freedom and liberty will conquer despotism, nepotism and autocracy. Sir, it will also be a day which heralds the dawn of a new beginning where the needs and aspirations of the poor and the downtrodden will be prioritized over that of the rich, where the silent majority will be politically, socially and economically empowered. This new beginning will create seamless prosperity for the Sri Lankans of all walks of life and to achieve this objective, we are all willing to sacrifice our lives.

I thank you.

[අ.භා.1.47]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කෙරෙහි විශ්වාසය ප්‍රකාශ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේ ස්ථිර කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, 1948 අප රට නිදහස ලබාගත් දින සිට අපේ රට වරින් වර විවිධ දේශපාලන අර්බුදයන්ට මුහුණ දී තිබෙනවා. එම කාලය තුළ අප රටේ රාජ්‍ය නායකයන් දෙපොළක් ඝාතනය කළා. ඒ වාගේම මා කුඩා දරුවෙක් හැටියට සිටියදී 1962 ඇති වූ හමුදා කුමන්ත්‍රණය මට තවමත් මතකයි. ඉන් පසුව 1971 සහ 1989 දකුණේ තරුණ කැරලි දෙකකට මුහුණ දෙන්න මේ රටට සිදු වුණා. ඒ වාගේම 1989 සිට අවුරුදු 26ක් තිස්සේ මහා විනාශකාරී යුද්ධයකට අපේ රට තල්ලු වුණා.

නමුත් ඇත්තවශයෙන්ම කියතොත් මේ කාලය පුරාම විවිධාකාරයේ අර්බුද තිබුණත්, ඔක්තෝබර් මාසයේ 26 වැනිදා රාත්‍රියේදී අපේ රට තල්ලු වුණු අර්බුදය තරම් භයානක ව්‍යවස්ථාදායක අර්බුදයක් මේ රට තුළ නිර්මාණය වුණේ නැහැ. මම හිතන්නේ ඉතිහාසය විසින් යම් කිසි දවසක ඔක්තෝබර් 26 වැනිදා ශ්‍රී ලංකාවේ කළු සිකුරාදා හැටියට නම් කරාවි. මොකද, මේ රටේ ව්‍යවස්ථාදායකය, ප්‍රජාතන්ත්‍ර විරෝධීව ව්‍යවස්ථා විරෝධීව බල මාරු කිරීමක් කරන්නට උත්සාහ කළා. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට නීත්‍යානුකූල අගමැතිවරයා ඒ වාගේම නීත්‍යානුකූල කැබිනට් මණ්ඩලය සම්පූර්ණයෙන්ම නීති විරෝධී ලෙස අයින් කළා. ඒ තත්ත්වය තුළ මුළු රටම මේ වෙනකොටත් විනාශයේ දොරකඩට ඇවිත් තිබෙනවා. ඒ සිද්ධිය වෙලත් සති භයක් වෙනවා. මේ කාලයේදී විශේෂයෙන්ම ඔබතුමා ව්‍යවස්ථාදායකයේ අයිතිවාසිකම් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දැවැන්ත සටනක් තනියම ඔය පුටුවේ ඉඳගෙන දියත් කළා. තවත් අවුරුදු දහස් ගණනාවක් යනතුරු මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ජනතාව ඔබතුමා කළ ඒ සේවය අමතක කරන්නේ නැහැ. ඒ වාගේම පක්ෂය දෙකඩ කරන්නට හැදුවා. අපේම නායකයන්ට අගමැතිකම දෙන්නට හැදුවා. ඔබතුමාට අගමැතිකම දෙන්නට හැදුවා. සජිත් ප්‍රේමදාස මැතිතුමාට අගමැතිකම දෙන්නට හැදුවා. අපේ මැති ඇමතිවරුන්ට කෝටි ගණන් දෙන්න හැදුවත් අද මුළු පක්ෂයම එකාමෙන් මෙතැනට එක් රැස්වෙලා ඉන්නේ, රනිල් වික්‍රමසිංහ මහතා ගැන විශ්වාසය පළ කරන්නත්, ඊටත් වඩා ප්‍රජාතන්ත්‍රවාදය ගැනත්, ව්‍යවස්ථානුකූල පාලනයක් ගැනත් අපේ විශ්වාසය පළ කරන්නයි. මම දැක්කා, අපේ ජනාධිපතිතුමා -අපේ කියා තවමත් කියන්න පුළුවන්. මොකද, අපි තමයි එතුමාට ඡන්දය අරගෙන දුන්නේ. මටත් අපේ කියන්න පුළුවන්. මොකද දකුණෙන් මම එතුමාට දිනවා දුන්නේ මාතර විතරයි. මාතර ආසනයක් දිනා ගත්තා.- ඔහුගේම සම්මේලනයට පසුගිය 4 වැනිදා ගිහින් කියනවා, "ආණ්ඩුවක් නැති එක සාමාන්‍ය දෙයක්." කියා.

ලංකාවට ආණ්ඩුවක් නැති එක අලුත් දෙයක් වුණාට, ලෝකයේ තවත් රටවල් ආණ්ඩු නැතිව තිබෙනවාලු. උදාහරණයක් හැටියට එතුමා පෙන්නුවේ ජර්මනිය. ජර්මනිය ආණ්ඩුවක් නැතිව මාස ගණනාවක් තිබුණා ලු. මේක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. ගරු කථානායකතුමනි, පසුගිය 2017 වසරේ ජර්මනියේ මහා මැතිවරණයක් පැවැත්වුවා. ජර්මනියේ මහා මැතිවරණයෙන් පසුව කිසිම පක්ෂයකට බහුතරයක් තිබුණේ නැහැ. අන්න ඒ නිසා ඒ අය මාස ගණනාවක් තිස්සේ බහුතරය ලබා ගැනීම සඳහා විවිධ පක්ෂ අතර සාකච්ඡා තිබුණ එක ඇත්ත ගරු මන්ත්‍රීවරුනි. නමුත් ගරු කථානායකතුමනි, ඒ හැම මොහොතකදීම ආණ්ඩුවක් තිබුණා. මොකද, 2018 මාර්තු මාසයේ ඒ අලුත් හවුල් ආණ්ඩුව දිවුරුම් දෙනතෙක් ඇන්ජලා මර්කල් සහ කැබිනට් මණ්ඩලය දිගින් දිගටම ඒ රටේ හිඩැසක් නැතිව පවත්වා ගෙන ආවා. අද ස්වීඩනයේ ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. ස්වීඩනයේ මහා මැතිවරණයෙන් පසුව තවමත් ස්ථාවර රජයක් නැති වුණත්, හිටපු අගමැතිවරයා සහ ඇමති මණ්ඩලය තවමත් ඒ රට පාලනය කරනවා. ඒ විතරක් නොවෙයි. අපේ ජනාධිපතිතුමා දන්නේ නැතිවද දන්නේ නැහැ, බොහෝ රටවල ව්‍යවස්ථාවේම ඒ ගැන සඳහන්ව තිබෙන බව. විශේෂයෙන්ම එතුමා කථා කළ ජර්මනියේ පවා එසේ තිබෙනවා. ඒ රටේ විනාඩියකටවත් නායකයෙක් නොසිටින්නට කටයුතු කරන්නේ නැහැ. ජර්මන් පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා නම්, ඒ විශ්වාස භංග යෝජනාවේ තිබෙන්න ඕනෑ විශ්වාස භංගය පැරදුණොත් ඒ වෙනුවට එන නායකයාගේ නම. ඒ හඳුන්වා දීලා තිබෙන්නේ, Selective No-confidence Motion කියන ක්‍රමයයි. ඒකෙන් පිළිගන්නවා, ඇත්තවශයෙන්ම කිසිම රටකට දවසක් නොවෙයි පැයක්වත් ආණ්ඩුවක් නැතිව නොතිබිය යුතුයි කියා. මොකද, පැයක් දෙකක් නොවෙයි මේ වන විට සති භයක් තිස්සේ ආණ්ඩුවක් නොමැතිවීමේ ඵලවිපාක දැනට අපට පෙනෙන්න පටන්ගෙන තිබෙනවා. නීත්‍යානුකූල අගමැති රනිල් වික්‍රමසිංහ මහතා බලහත්කාරයෙන් පළවා හැර කැලෑ නීතිය යටතේ නව අගමැතිවරයෙක් සහ කැබිනට් මණ්ඩලයක් පත් කිරීමට ගත්ත නීච ක්‍රියා මාර්ගය පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කළා.

මේවනකොට අධිකරණයෙනුත් තහනම් නියෝගයක් ලබා දී තිබෙනවා. මෙසේ නීත්‍යානුකූල නොවන අන්දමට බලයෙන් පහ කළේ, 2015දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත් සමඟම මේ රටේ අගමැතිවරයා හැටියට රනිල් වික්‍රමසිංහ මහතා ජනවරමක් ලබා ගත්තායින් පසුව.

මට මතකයි, ඒ වාගේම මෙතැන ඉන්න හැම කෙනෙකුටම මතක ඇති, එදා අපි ගමක් ගමක් ගානේ පෝස්ටර් ගැහුවේ "මෛත්‍රී ජනපති කරමු - රනිල් අගමැති කරමු" කියලායි. මෙන්න මේ සටන් පාඨයට තමයි ලක්ෂ 63ක ජනතාවක් තමන්ගේ ඡන්දය පාවිච්චි කළේ. ඇත්ත, ජනවාරි 08වැනි දා පැවැති ඡන්දයෙන් පසු අපි මේ පාර්ලිමේන්තුවට එනකොට එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රීවරු හිටියේ 48යි. කථානායක හැටියට හිටියේ, රාජපක්ෂ පවුලේ කෙනෙක්. ඒ, චමල් රාජපක්ෂ. හැබැයි ඒ කාලය තුළදී අපට මන්ත්‍රී ධුර 48ක් තිබුණත්, ඉදිරිපත් කළ හැම පනත් කෙටුම්පතකටම අපට තුනෙන් දෙකකට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා දී, ඒ හැම පනතකින්ම රනිල් වික්‍රමසිංහ මහතාගේ ආණ්ඩුවට මේ පාර්ලිමේන්තුවේදී විශ්වාසය පළ කළා. උදාහරණයක් හැටියට ගත්තොත් 2015 පෙබරවාරි මස 07වැනි දා, එවකට මුදල් ඇමති අපේ රවි කරුණානායක මහතා පත් වෙලා මාසයකටත් වඩා අඩු කාලයකින් "Mini Budget" එක ගෙනාවා. ඒ Budget එකෙන් සහන රාශියක් ජනතාවට දුන්නා. ඒ, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාගේ පළමුවැනි Budget එක. ඒ Budget එකේදී පක්ෂව ඡන්ද 164ක් ලැබුණා. ඒ කියන්නේ, තුනෙන් දෙකකටත් වඩා ඡන්ද 14ක් වැඩියි. ඒ වාගේම 2015 අප්‍රේල් මාසය වනකොට අපි පාර්ලිමේන්තුවට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් පැවැති ඡන්දයේදී ඊට පක්ෂව මේ පාර්ලිමේන්තුවේ 215දෙනෙක් ඡන්දය පාවිච්චි කළා විතරක් නොවෙයි, අර පැත්තේ හිටපු බොහෝ පිරිසක් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාගේ ඇමති මණ්ඩලයේ ඇමති ධුර භාර ගත්තා. මෙන්න මේ විධියට දිගින් දිගටම අපට ස්ථාවර, ශක්තිමත් රජයක් තිබුණා.

අපට මතකයි, අන්තිමට, මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවකුත් ගෙනාවා. ඒකත් කමක් නැහැ. මොකද, ඒක පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන නීත්‍යානුකූල ක්‍රමයක් අගමැතිවරයාව අයින් කරගන්න. නුල් සූත්තර දමා, ඉහළින්ම ඒක මෙතැනට ඉදිරිපත් කළා. නමුත් ඒ විශ්වාස භංගයටත් ඇත්ත වශයෙන්ම පක්ෂව ලැබුණේ ඡන්ද 76යි. විපක්ෂව එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා වෙනුවෙන් ඡන්ද 122ක් ලබා ගෙන අපි ඒ විශ්වාස භංගයත් පරාජයට පත් කළා.

මෙන්න මේ විධියට 2015 ජනවාරි මාසයේ 08 වැනි දා ඉඳලා 2018 ඔක්තෝබර් 26 -කළු සිකුරාදා- දක්වා දින 1,237ක් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට පුළුවන් වුණා, ආණ්ඩුව ඉතාම ශක්තිමත්ව, ස්ථාවරව පවත්වා ගෙන යන්නට. 2015 ජනවාරි මාසයේ 08 වැනි දා රාජපක්ෂලාගේ පවුල් පාලනය පමණක් නොව, ඔවුන්ගේ මැර බලය, මුදල් බලය පමණක් නොව, බලහත්කාරී මැතිවරණ යන්ත්‍රණයද පරාජයට පත් කරමින් ආරම්භ කළ ගමන අභියෝග රාශියක් මැද වුවද, රටට ජයග්‍රහණ රැසක් අත් කර දෙමින් ඉදිරියට ගෙන යාමට හැකි වුණා.

ඇත්ත වශයෙන්ම මම ඒ ගැන දීර්ඝ වශයෙන් කථා නොකළත්, 2015 ජනවාරි ඉඳලා 2018 ඔක්තෝබර් දක්වා මේ රටේ යහ පාලනය තවතවත් ශක්තිමත් කරන්නට, ස්ථාවර කරන්නට, ඒ වාගේම මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව තුළ සංහිඳියාව ඇති කරන්නට කටයුතු කරන්නට, ඒ වාගේම මේ රටේ ජනතාවගේ මානව අයිතීන් සහ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්නට අපි විවිධාකාරයේ නීති රීති සහ අලුත් යෝජනා ලබා දුන්නා. මොකද, මම දැක්කා ජනාධිපතිතුමා කියලා තිබුණා, මේ ආණ්ඩුව පටන් ගත්තායින් පසුව අපි යහ පාලනයේ මූලධර්මවලින් ඈත්වෙන්නට පටන් ගත්තාය කියලා. ඈත් වුණා නම්, ඈත් වුණේ අපි නොවෙයි. ඈත් වුණේ, වෙන අය. අපි ඈත් වෙනවා වෙනුවට, අභ්‍යන්තරව රජය තුළ සටන් කරලා විශේෂයෙන්ම උතුරේ ජනතාව වෙනුවෙන්, විශේෂයෙන්ම මේ රටේ වාර්ගික සමඟිය වෙනුවෙන්, ඒ වාගේම මේ රට තුළ ජාත්‍යන්තර පරීක්ෂණයක් වැළැක්වීමට පවා ගත්ත ක්‍රියාමාර්ග ඇතුළත් ලේඛනයක් මම මේ අවස්ථාවේදී මේ සභාවේ **සභාගත*** කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. මේ අවුරුදු තුනහමාර තුළ අප විසින් ක්‍රියාවට නැංවූ ලොකු කුඩා සෑම පියවරක් පිළිබඳවම මෙම ලේඛනවල සඳහන්ව තිබෙනවා.

ජාත්‍යන්තරව කොන් වෙච්ච ලංකාවක් අපි බාර ගත්තේ. මේ රටට ඒ කාලයේ ගෝත්‍රික නායකයන් එක්කෙනෙක් දෙන්නෙක් ආවා. එහෙම නැතුව කවුරුවත් ලංකාවට ආවෙත් නැහැ; ලංකාවේ අයට යන්න තිබුණෙත් නැහැ. නමුත්, එක්සත් ජාතික පෙරමුණේ ප්‍රතිපත්ති රාමුව නිසා, -මම නම් කියන්නේ අපේ විදේශ ප්‍රතිපත්තිය නිසා කියලා,- විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ මහපෙන්වීම යටතේ අපට ලෝකය දිනාගන්න බොහොම පහසු වුණා. සමහරු කියනවා, GSP Plus සහනය දිනා ගත්තේ ඔවුන් කියලා. මේ සහනය දිනා ගන්න එදා අගමැතිතුමාත්, විදේශ ඇමතිවරයා හැටියට මමත් කොයි තරම් මහන්සි වුණා ද කියලා ඒ අය දැනගෙන හිටියේවත් නැහැ. මේ රටේ ධීවරයන්ට පනවා තිබූ ධීවර තහංචි යුරෝපයෙන් අයින් කරගත්තේ අපියි. ඒක කළේ වෙන කවුරුවත් නොවෙයි. ඒ තහංචි සියල්ල අයින් කරගත්තේ අගමැතිවරයාගේ පෞද්ගලික මැදිහත්වීමෙන් කියන එක එවකට හිටපු විදේශ ඇමතිවරයා හැටියට මම හොඳට දන්නවා.

මට තවම මතකයි, අපි ජපානයේ G-7 සමුළුවට සහභාගි වුණ ආකාරය. ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමාට ඒ සමුළුවට ආරාධනාවක් තිබුණා. ඇත්ත වශයෙන්ම ඒ සමුළුව මට ජීවිතය තිබෙන තාක් කල් මතකයි. ඒ සමුළුව ගැන මට බොහොම ආඩම්බරයක් හිතෙනවා. මොකද, ඒ සමුළුවේදී අපේ ජනාධිපතිතුමා වේලාසනින් ගිහිල්ලා ඒ සාකච්ඡා කාමරයේ වාඩි වෙලා හිටියා. ඒ සමුළුව ආරම්භ කරන්න යනකොට ඒ කාමරයට පැමිණි ලෝකයේ හිටපු ප්‍රබලම රාජ්‍ය නායකයන් හත්දෙනා සිරිසේන ජනාධිපතිවරයා ළඟට ඇවිදගෙන ඇවිල්ලා, අතට අත දීලා තමයි තමන්ගේ ආසනයට ගිහිල්ලා වාඩි වුණේ. නමුත්, මෙතැනදී අපි වරද්දා ගන්න හොඳ නැහැ. ඒ අය අතට අත දුන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට නොවෙයි; ශ්‍රී ලංකාවේ යහ පාලනයටයි. බරක් ඔබාමා, ඇන්ජලා මර්කර්, ඩේවිඩ් කැමරන්, ජස්ටින් ට්‍රෑඩෝ මේ හැම කෙනෙක්ම එදා ඒ අතට අත දුන්නේ පුද්ගලයෙකුට නොවෙයි. එදා බරක් ඔබාමා ලංකාවට කිව්වේ "Good News Country", "ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත්ව පිහිටුවා තිබෙන රට" කියලායි.

අන්න ඒ නිසා තමයි, අපට ඒ හරහා සහන රාශියක් ලබා ගන්න පුළුවන් වුණේ; මම කියපු විධියට GSP Plus සහනය වැනි දේවල් ලබා ගන්න පුළුවන් වුණේ. එතෙක් ලෝකයේ මාධ්‍ය මර්දනයෙන් පස්වැනි තැනට තිබුණු රට, යළි වතාවක් ඉතාමත්ම නිදහස් මාධ්‍යයක් තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන රටක් හැටියට ලෝකයට පිළිගන්නට සිදු වුණා.

අපි භාර ගත්තු රට ගැනත් මම ඉතා කෙටියෙන් හෝ මතක් කරන්න ඕනෑ. 2013 වර්ෂයේ රජයේ ආදායම බිලියන 1,132ක් වූ අතර, ණය වාරික ගෙවීම එම වසරේදී රුපියල් බිලියන 1,163යි. අපේ ආදායමට වඩා ණය ගෙවන්න තිබෙන තත්ත්වයක තමයි අපි රට භාර ගත්තේ. රාජ්‍ය ණයවලින් සිදු කළ මහා පරිමාණ ඉදිකිරීම් නිසා පෞද්ගලික අංශයේ ආයෝජන වර්ධනය අඩාල වූ අතර, 2013 වන විට විදේශ ජංගම ගිණුමේ සියයට 3.4ක හිඟයක් පැවතුණා. ඒ වාගේම අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5.4ක් වුණා. මේ ද්විත්ව හිඟය නිසාත්, සෘජු විදේශ ආයෝජන අඩු වීම නිසාත් ආර්ථිකය අඩපණ වෙලායි තිබුණේ. අපනයන අංශය කඩා වැටෙමින් පැවති අතර, 2015 වර්ෂයෙන් පසුව අපේ රජයට ඒ සඳහා මැදිහත්වීමට සිදු වුණා. මේ කාරණය අපේ මලික් සමරවික්‍රම ඇමතිතුමා දන්නවා. 2017 වර්ෂය ලංකාවට වැඩිම අපනයනය සිදු කළ වර්ෂය හැටියට සඳහන් වෙනවා. 2014 වන විට රාජ්‍ය ආදායම් ශීර්ෂයෙන් අඩු වුණා. එය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 11.5ක්ව තිබූ අතර, කලාපයේ රටවල් අතුරින් අඩුම රාජ්‍ය ආදායම තිබෙන රට බවට ලංකාව පත් වෙලා තිබුණා. එහෙත් 2018 වන විට අපට රාජ්‍ය ආදායම සියයට 15.6කින් වැඩි කරන්නට හැකි වුණා.

මෙන්න මේ භයානකම තත්ත්වය තමයි එදත් මම පාර්ලිමේන්තුවේදී කිව්වේ. ගරු කථානායකතුමනි, අපට රාජපක්ෂ යුගයේ ණයත් ගෙවන්න තිබෙනවා. 2019 ජනවාරි මාසයේ 10වැනි දා ඩොලර් බිලියනයක ණයක් ගෙවන්න වෙනවා. මේ ණය ගෙවන්න නම් අපට පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වෙනවා. පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්නට නම් මේ රට තුළ නීත්‍යානුකූල ආණ්ඩුවක් තිබෙන්න ඕනෑ; නීත්‍යානුකූල අගමැතිවරයෙක් ඉන්න ඕනෑ; නීත්‍යානුකූල ඇමති මණ්ඩලයක් ඉන්න ඕනෑ. එසේ නැති වුණොත්, අපේ රටට තුර්කිය, ආර්ජන්ටිනාව, ග්‍රීසිය වැනි රටවල ඇති වූවා වාගේ තත්ත්වයක් ඇති වෙන එක නවත්වන්න බැහැ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මංගල සමරවීර මහතා]

මෙය, මේ කුමන්ත්‍රණය සිදු වෙච්ච දවසේ ඉඳන්ම මා කියන දේයි. මේවා ඇති කරපු ඒ කුමන්ත්‍රණකාරි කල්ලියේම කෙනෙක් - නිවාඩ් කබ්රාල්- "අද" පුවත් පතට කියනවා, "දේශපාලන අර්බුදය දීර්ඝ වුවහොත් ආර්ථිකයේ දැවැන්ත පරිහානියක්" කියා. මෙන්න මේකයි ඇත්ත තත්ත්වය. වසර 3ක් තිස්සේ අප මේ රට ගොඩ නඟන්නට ගත්තා වූ ක්‍රියා මාර්ග හැම එකක්ම මේ අය මාසයක් ඇතුළත ආපස්සට හරවා තිබෙනවා; බොරු පොරොන්දු දෙනවා; ජනතාව නොමඟ යවනවා. ළඟදී කියා තිබෙනවා, ගොවි මහත්වරුන්ට බදු සහන දෙනවා කියා. ගරු කථානායකතුමනි, මේ රටේ ගොවි ක්ෂේත්‍රයට ඒ අදාළ ආදායම් ලැබෙන්නේ සියයට 0.3කට විතරයි. එහෙම නම් මේ කියන ආදායම් බදු සහන ලබා දෙන්නේ ජනාධිපතිවරයාගේ සහෝදරයා -ඩඩ්ලි මහතා- ඇතුළු කණ්ඩායමටයි කියාත් මම මේ අවස්ථාවේ පැහැදිලිවම කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අප ඉදිරියට යන මොහොතක මේ අර්බුදය ඇති වුණා. ඒ අර්බුදය නිසා දැන් තවත් තත්ත්වයන් රාශියකට අපි මුහුණ දෙනවා. මා කලින් කියපු විධියට නීත්‍යානුකූල රජයක් නොමැති වීම නිසා ජනවාරි 10වන දා වන කොට ඩොලර් බිලියන 1,000 ගෙවීම් ගැන අපි සොයන්න ඕනෑ. ඊටත් වඩා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. නීත්‍යානුකූල රජයක් නොමැති නිසා දෙසැම්බර් මාසයේ 31වන දායින් පසුව මේ රටේ පඩි ගෙවන්න, pension ගෙවන්න, සමෘද්ධි සහනාධාර ගෙවන්න ක්‍රමයක් නැහැ.

විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුව සතුව තිබෙනවා. නමුත් මාස එකහමාරක් ගිහිල්ලා තිබියදීත් මේ වන කල් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පිළිගන්න පුළුවන් ආණ්ඩුවක් පිහිටුවා නැහැ; පාර්ලිමේන්තුවට පිළිගන්න පුළුවන් අගමැතිවරයකු පත් කරලා නැහැ. අන්න එහෙම නම් ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවට පිළිගන්න පුළුවන් අගමැතිවරයා වහාම පත් කරන්න ඕනෑ. ඒ අගමැතිවරයා කවුද කියා අද අපි මුළු ලෝකයටම නිසැකවම පෙන්වා තිබෙනවා.

එහෙම නම්, ඒ තුළින් වහාම අලුත් කැබිනට් මණ්ඩලයක් පිහිටුවලා, ඒ හරහා නත්තල උදාවෙන්න ඉස්සෙල්ලා අපි සියලු දෙනාම මේ පාර්ලිමේන්තුව තුළ Vote on Account එකක්, අඩුම ගණනේ ඊළඟ වසරේ පළමුවෙනි මාස දෙකටවත් සම්මත කරගන්න කටයුතු කරන්න ඕනෑ. ඉන් පසුව, 2019 වර්ෂයේ මුල් භාගයේදී අපට 2019 වර්ෂය සඳහා අය වැය ගෙන එන්නට පුළුවන්.

අපි තවදුරටත් ජනාධිපතිවරයාගෙන් ඉල්ලන්නේ මේ තත්ත්වය ව්‍යාකූල වෙන්නට නොදී කටයුතු කරන්න කියලායි. ගරු කථානායකතුමනි, අද මේ මුළු පාර්ලිමේන්තුවේම බහුතරය සංඛ්‍යාවෙන්ම පෙන්වන රනිල් වික්‍රමසිංහ මහතා අද සවස් වෙනකොට මේ රටේ අගමැතිවරයා වශයෙන් පත් කරන්න කියන ඉල්ලීම ඔබතුමා මේ රැස්වීමෙන් පසුව ජනාධිපතිවරයාට දැනුම් දෙයි කියා අපි විශ්වාස කරනවා. මොකද, මේ තිබෙන තත්ත්වය යටතේ ඉතාම බැරෑරුම් කාලයක් ඉදිරියට තිබෙන්නේ. ඉතාම බැරෑරුම් ආර්ථිකයක්, ඉතාම බැරෑරුම් ජාත්‍යන්තර පරිසරයක් තිබෙනකොට එයට මුහුණ දෙන්න පුළුවන්, අත්දැකීම් තිබෙන, පළපුරුද්ද තිබෙන එකම නායකයා හැටියට මම දකින්නේ රනිල් වික්‍රමසිංහ මහතායි. එහෙම නම් තවදුරටත් මේ රට පාවා දෙන්නේ නැතුව මෙතෙක් වෙච්ච වැරදි නිවැරදි කරලා, අපි රටක් හැටියට ඉදිරියට යමුයි කියා යෝජනා කරමින් මේ පාර්ලිමේන්තුවේ සියලු දෙනාම මේ විශ්වාසය පළ කරන යෝජනාවට ඡන්දය ලබා දෙන්න කියා නැවත වතාවක් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මංගල සමරවීර මැතිතුමනි, ස්තුතියි.

[2.12p.m.]

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)
கௌரவ சபாநாயகர் அவர்களே! மிக்க நன்றி.

Hon. Speaker, thank you very much for giving me time to make a small statement in this House, which is in turmoil.

Sir, the Illankai Tamil Arasu Kadchi - ITAK - desires to make a short statement on behalf of the Tamil National Alliance. I do so in my capacity as President and Member of Parliament of the ITAK. I **table*** the letter dated 29th November, 2018 signed and sent by 14 Members of Parliament of the Illankai Tamil Arasu Kadchi to His Excellency Maithripala Sirisena, President of the Democratic Socialist Republic of Sri Lanka and I request that the said letter be included in Hansard at the end of my statement. The said letter explains the stand of the Illankai Tamil Arasu Kadchi - ITAK - and is in all three languages.

I wish to state very clearly that we will not function as part of the Government and will continue to sit and function in the Opposition while we stand by the position stated by us in the said letter. Finally, Sir, I request that the Sinhala, Tamil and the English versions of the letter be included in Hansard.
Thank you very much.

**සභාමේසය මත තබන ලද ලිපිය:*
சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம்:
Letter tabled:

TNA
Tamil National Alliance
தமிழ்த் தேசியக் கூட்டமைப்பு

30, Martin Road, Jaffna, Sri Lanka

29th November 2018.

His Excellency Maithripala Sirisena
President of the Democratic Socialist Republic of Sri Lanka
Presidential Secretariat
Colombo -01

Your Excellency,

Appointment of a Prime Minister who commands the Confidence of Parliament

We write to you in regard to the above in the background of all that has happened since 26th of October.

The Hon Member of Parliament appointed as Prime Minister on the 26th of October has not been able to prove that he commands the confidence of Parliament though one month has lapsed since the said appointment and though Parliament has met several times during this period. On the other hand, Motions of No Confidence in the said Hon Member as Prime Minister have been passed in Parliament on 14th and 16th November. The voice votes taken in Parliament have been confirmed by 122 Members signing and transmitting to both your Excellency and the Hon Speaker statements to that effect.

The view of the majority of the Hon Members of Parliament on the issue of whether the said Hon Member commands the Confidence of Parliament to be the Prime Minister has been negative and has been demonstrated beyond doubt.

We wish to point out that,

1. The inability of the Hon Member to prove that Parliament has confidence in him as Hon Prime Minister, 2.the votes of No Confidence passed against the said Hon Member on the 14th and 16th November pertaining to his claim to be the Hon Prime Minister; have created a controversy in the Country as to whether the country is without a Prime Minister, a Cabinet of Ministers, and a lawfully constituted Government for more than a month.

We respectfully submit that this situation should not continue.

TNA
Tamil National Alliance
தமிழ்த் தேசியக் கூட்டமைப்பு

30, Martin Road, Jaffna, Sri Lanka

In the circumstances to ensure that an Hon Member of Parliament is able to command the confidence of Parliament as Prime Minister we the Members of Parliament of the Illankai Thamil Arasu Kadchi, will support the restoration of a Government headed by the U.N.F as it existed prior to 26th October/ the Appointment of a nominee of the U.N.F who in the opinion of Your Excellency is able to command the confidence of Parliament as Prime Minister.

We consider it our duty to communicate the above to you,

Yours Sincerely,

1. R.Sampanthan M.P
2. Mavai S Senathirajah M.P
3. M.A.Sumanthiran M.P
4. D.Sidhathan M.P
5. S.Shritharan M.P
6. E.Saravanapavan M.P
7. Selvam Adaikkalanathan M.P
8. I.Charles Nirmalanathan M.P
9. Shanthi Sriskandarasa M.P
10. S.Sivamohan M.P
11. Seenithamby Yoheswaran M.P
12. G.Srineshan M.P
13. K.Kodeeswaran M.P
14. K.Thurairatnesingam M.P

සිංහල පරිවර්තනය

2018 නොවැම්බර් 29 වැනි දින

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

පාර්ලිමේන්තුවේ විශ්වාසය සහිත අග්‍රාමාත්‍යවරයකු පත් කිරීම

ඔක්තෝබර් 26 වැනි දින සිට සිදු වූ සියලු සිදුවීම්වල පසුබිම තුළ ඉහත කාරණය සම්බන්ධයෙන් අපි ඔබතුමාට ලියමු.

ප්‍රශ්නගත පත්වීම ලබා දී මාසයක කාලයක් ඉක්ම ගියද, මෙම කාලපරිච්ඡේදය තුළ අවස්ථා කිහිපයකදීම පාර්ලිමේන්තුව රැස්වූව මුත්, ඔක්තෝබර් 26 වැනි දින අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුවේ විශ්වාසය නිබෙන බව ඔප්පු කිරීමට හැකියාව ලැබී නොමැත. අනෙක් අතට, අග්‍රාමාත්‍යවරයා වශයෙන් එකී ගරු මන්ත්‍රීවරයා පිළිබඳව විශ්වාසය නොමැති බවට යෝජනා පසුගිය නොවැම්බර් 14 හා 16 යන දිනවලදී පාර්ලිමේන්තුවේ සම්මත කරගනු ලැබ ඇත. හඬ අනුව පාර්ලිමේන්තුවේදී ගනු ලැබූ ඡන්ද, අත්සන් කිරීමෙන් සහ ඊට බලාත්මකභාවය ලබා දෙමින් ඔබතුමාට හා ගරු කථානායකවරයාට ප්‍රකාශනයන් යොමු කරමින් මන්ත්‍රීවරුන් 122 දෙනෙකු විසින් නහවුරු කරනු ලැබ ඇත.

අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමට ඉහත කී ගරු මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ විශ්වාසය දිනාගෙන නිබෙද යන ගැටලුව පිළිබඳව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයකගේ අදහස ඍණාත්මක වන අතර, ඒ බව සැකයකින් තොරව ප්‍රදර්ශනය වී ඇත.

1. ගරු අග්‍රාමාත්‍යවරයා වශයෙන්, පාර්ලිමේන්තුවට තමන් කෙරෙහි විශ්වාසය ඇති බව ඔප්පු කිරීම සම්බන්ධයෙන් අදාළ ගරු මන්ත්‍රීවරයාගේ නොහැකියාවත්, 2. ගරු අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කිරීම පිණිස වන එතුමාගේ හිමිකම සම්බන්ධයෙන් පසුගිය නොවැම්බර් 14 හා 16 යන දිනවලදී එකී ගරු මන්ත්‍රීවරයාට එරෙහිව විශ්වාස හංග යෝජනා සම්මත වීමත් මත, මාසයකට වැඩි කාලයක සිට අග්‍රාමාත්‍යවරයෙකු, අමාත්‍ය මණ්ඩලයක් සහ නීත්‍යානුකූලව සංස්ථාපිත ආණ්ඩුවක් රහිතව රට පවතියි ද යන්න සම්බන්ධයෙන් මතභේදයක් රට තුළ උද්ගත වී ඇති බව පෙන්වා දීමට අපි අදහස් කරමු.

මෙම තත්ත්වය තවදුරටත් නොපැවතිය යුතු බව අපි ගෞරවයෙන් සඳහන් කරමු.

කරුණු මෙසේ හෙයින්, අග්‍රාමාත්‍යවරයා වශයෙන් පාර්ලිමේන්තුවේ විශ්වාසය දිනාගැනීමට ගරු මන්ත්‍රීවරයෙකුට හැකියාව ඇති බව නහවුරු කිරීම පිණිස, ඔක්තෝබර් 26 වන දිනට පෙර පැවති පරිදි එක්සත් ජාතික පෙරමුණ විසින් නායකත්වය දරනු ලබන ආණ්ඩුවක් යළි ස්ථාපිත කිරීමට/ඔබතුමාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය දිනාගැනීමට හැකියාව ඇති, එක්සත් ජාතික පෙරමුණ විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයකු අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කිරීමට ඉලංගෙයි තමිල් අරසු කච්චිහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි සහාය පළ කරන්නෙමු.

ඉහත කාරණය ඔබතුමා වෙත දන්වා සිටීම අපගේ යුතුකම ලෙස අපි සලකමු.

මෙයට හිතවත්,

අත්සන් කළේ :

1. ආර්. සම්බන්දන්, පා.ම.
2. මාවෙයි එස්. සේනාධිරාජා, පා.ම.
3. එම්.ඒ. සුමන්තිරන්, පා.ම.
4. ඩී. සිද්ධාත්තන්, පා.ම.
5. එස්. ශ්‍රීදරන්, පා.ම.
6. ඊ. සරනවපවන්, පා.ම.
7. සෙල්වම් අඩෙයිකලනාදන්, පා.ම.
8. අයි. චාර්ල්ස් නිර්මලනාදන්, පා.ම.
9. ශාන්ති ශ්‍රීස්කන්ධරාසා, පා.ම.
10. එස්. සිවමෝහන්, පා.ම.
11. සීනිතම්බි යෝගේස්වරන්, පා.ම.
12. ජී. ශ්‍රීනේෂන්, පා.ම.
13. කේ. කෝඩීස්වරන්, පා.ම.
14. කේ. තුරෙයිරත්නසිංහම්, පා.ම.

TNA
Tamil National Alliance
தமிழ்த் தேசியக் கூட்டமைப்பு

30, Martin Road, Jaffna, Sri Lanka

29 நவம்பர் 2018

அதிமேதகு மைத்திரிபால சிறிசேன
ஜனாதிபதி - இலங்கை ஜனநாயக சோஷலிச குடியரசு
ஜனாதிபதி செயலகம்
கொழும்பு 01

அதிமேதகு ஜனாதிபதி அவர்கட்கு,

பாராளுமன்றத்தின் பெரும்பான்மை நம்பிக்கையை பெறக்கூடிய பிரதம மந்திரியின் நியமனம் தொடர்பாக

கடந்த ஒக்டோபர் 26ம் திகதியிலிருந்து நடந்த அனைத்து சம்பவங்களினதும் பின்னணியின் அடிப்படையில் மேற்குறித்த விடயம் தொடர்பில் நாங்கள் இதனை எழுதுகிறோம்.

கடந்த ஒக்டோபர் 26ம் திகதி பிரதம மந்திரியாக நியமிக்கப்பட்ட கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்கள், அவர் நியமிக்கப்பட்டு ஒரு மாதம் கடந்துள்ள நிலையிலும், இந்த காலப்பகுதியில் பல தடவைகள் பாராளுமன்றம் கூடியுள்ள போதிலும் அவரால் தனக்கு பாராளுமன்றத்தின் பெரும்பான்மை நம்பிக்கை உள்ளது என்பதனை நிரூபித்துக் காட்ட முடியாத ஒருவராகவே காணப்படுகின்றார். அதேவேளை குறித்த கௌரவ உறுப்பினர் மீது பிரதம மந்திரியாக இருப்பதற்கு எதிராக கொண்டுவரப்பட்ட நம்பிக்கை இல்லா தீர்மானங்கள் நவம்பர் 14ம் மற்றும் 16ம் திகதிகளில் நிறைவேற்றப்பட்டுள்ளன. குரல் அடிப்படையில் எடுக்கப்பட்ட வாக்குகள் 122 உறுப்பினர்களின் கையொப்பங்களோடு அதிமேதகு ஜனாதிபதி உங்களுக்கு அனுப்பிவைக்கப்பட்டதுமன்றி இது தொடர்பிலான கௌரவ சபாநாயகரின் அறிக்கைகளும் தங்களுக்கு அனுப்பி வைக்கப்பட்டுள்ளன.

[ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා]

TNA
Tamil National Alliance
தமிழ்த் தேசியக் கூட்டமைப்பு

30, Martin Road, Jaffna, Sri Lanka

குறித்த கௌரவ உறுப்பினர் பிரதம மந்திரியாக இருப்பதற்கு பாராளுமன்றத்தின் நம்பிக்கையை பெற்றுள்ளாரா என்ற வினாவிற்கு பெரும்பான்மையான கௌரவ பாராளுமன்ற உறுப்பினர்களின் கருத்து எதிராகவே உள்ளது மாத்திரமன்றி சந்தேகத்திற்கிட மில்லாமல் நிரூபிக்கப்பட்டுமுள்ளது.

எனவே பின்வருவனவற்றை நாம் சுட்டிக்காட்ட விரும்புகிறோம்.

1. குறித்த கௌரவ உறுப்பினர் அவர்களால், பிரதம மந்திரியாக தான் இருப்பதற்கு பாராளுமன்றத்தின் நம்பிக்கையினை பெற்றுள்ளார் என்பதனை நிரூபித்துக்காட்ட இயலாது போயுள்ளது. 2. குறித்த கௌரவ உறுப்பினர் பிரதம மந்திரியாக இருப்பதற்கு எதிராக நவம்பர் 14 மற்றும் 16ம் திகதிகளில் நிறைவேற்றப்பட்ட நம்பிக்கையில்லா தீர்மானங்களானது, இந்த நாட்டில் ஒரு பிரதம மந்திரியோ, அமைச்சரவையோ, சட்டபூர்வமாக நியமிக்கப்பட்ட அரசாங்கம் ஒன்றோ இருக்கின்றனவா என்ற முரண்பாட்டினை தோற்றுவித்துள்ளது.

இந்த நிலைமை தொடர்ந்தும் நீடிக்க முடியாது என்பதனை நாம் மிகவும் மரியாதையுடன் கூறிக்கொள்ள விரும்புகிறோம்.

குறிப்பிட்ட நிலையில் பாராளுமன்றத்தின் நம்பிக்கையை பெற்றுக்கொள்ளக்கூடிய ஒரு கௌரவ பாராளுமன்ற உறுப்பினர் பிரதம மந்திரியாக நியமிக்கப்படுவதனை உறுதி செய்யும் வகையில், இலங்கை தமிழரசுக் கட்சியை சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களாகிய நாம் கடந்த 26ம் திகதிக்கு முன்னர் இருந்த ஐ.தே.மு தலைமையிலான அரசாங்கத்தினை மீளமைப்பதற்கு ஆதரவளிப்போம் என்பதோடு, ஐ.தே முன்னணியினால் நியமிக்கப்பட்ட பாராளுமன்றத்தின் பெருன்பான்மையினை பெறக்கூடியவர் என நீங்கள் கருதும் நபரை பிரதம மந்திரியாக நியமிக்க வேண்டும் எனவும் தெரிவித்துக்கொள்ள விரும்புகிறோம்.

மேற்குறிப்பிட்ட விடயங்களை தங்களுக்கு தெரியப்படுத்துவது எமது கடமை எனக் கருதுகிறோம்.

நீங்கள் உண்மையுள்ள,

TNA
Tamil National Alliance
தமிழ்த் தேசியக் கூட்டமைப்பு

30, Martin Road, Jaffna, Sri Lanka

1. R.Sampanthan M.P
2. Mavai S Senathirajah M.P
3. M.A.Sumanthiran M.P
4. D.Sidhathan M.P
5. S.Shritharan M.P
6. E.Saravanapavan M.P
7. Selvam Adaikkalanathan M.P
8. I.Charles Nirmalanathan M.P
9. Shanthi Sriskandarasa M.P
10. S.Sivamohan M.P
11. Seenithamby Yoheswaran M.P
12. G.Srineshan M.P
13. K.Kodeeswaran M.P
14. K.Thurairatnesingam M.P

[අ.භා. 2.14]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍ය ධුරයට පත් කිරීම සඳහා විශ්වාසය පළ කිරීමේ යෝජනාවක්.

ගරු කථානායකතුමනි, පසුගිය අප්‍රේල් මාසයේ 04වෙනි දා රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍ය ධුරය දරන විට එතුමාට එරෙහි විශ්වාස භංග යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. ගරු කථානායකතුමනි, ඒ විශ්වාස භංග යෝජනාව ගෙනා අවස්ථාවේ, අග්‍රාමාත්‍ය ධුරය දැරූ අවුරුදු තුනකට අධික කාලය තුළ එතුමා කරන ලද කාර්යයන් සහ එතුමාගේ මැදිහත්වීම්වල ඍණාත්මක ප්‍රතිඵල අපි ඉතාම හොඳින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් ඒ විශ්වාස භංග යෝජනාවට සහාය පළ කළා. අද ඊට පරස්පර යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා; එතුමාට විශ්වාසය පළ කිරීමේ යෝජනාවක්. ගරු කථානායකතුමනි, විශ්වාසය පළ කිරීමේ මේ යෝජනාවේදීත් අපට කියන්නට තිබෙන්නේ පසුගිය අප්‍රේල් මාසයේ 04වෙනි දා විශ්වාස භංග යෝජනාවේදී අපි ඉදිරිපත් කරන ලද කරුණු කිසිවක් අඩු නැතිව තවදුරටත් වලංගු බව පමණයි. ඒ කරුණු තවදුරටත් වලංගුයි.

ගරු කථානායකතුමනි, එදාත් අපි පෙන්වා දෙනු ලැබුවා ආණ්ඩුවක පැවැත්ම, ආණ්ඩුවක අනාගතය රඳා පවතින්නේ පාර්ලිමේන්තුවේ ඔළුගෙඩි මතම නොවන බව. යම් ආණ්ඩුවක භාවිතාව ඇතුළේ, අග්‍රාමාත්‍යවරයකු ලෙසත්, කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන් ලෙසත් මොන තරම් ප්‍රමාණයකට ජනතාවගේ විශ්වාසය දිනා ගන්නට පුළුවන්ද කියන එක තමයි ආණ්ඩු පාලනයේදී තිබෙන වැදගත්ම සාධකය. හැබැයි, පසුගිය අවුරුදු තුනහමාර ඇතුළත මේ ආණ්ඩුවට එරෙහිව ඡන්ද විමසන අවස්ථා ගණනාවකදී -අය වැය ලේඛනයේදී, විශ්වාස භංගයේදී සහ තවත් අවස්ථාවලදී- පාර්ලිමේන්තුවේ ඔළුගෙඩිවලින් ආණ්ඩුවේ ස්ථාවරත්වය පෙන්වලා තිබෙනවා. හැබැයි, ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඔළුගෙඩිවලින් මොන තරම් විශ්වාසයක් දිනාගෙන තිබුණත් අපි ඉතා හොඳින් තේරුම් ගන්න ඕනෑ, ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ විශ්වාසය නම් හංග වී ඇති බව. ඒ මොකද, ගරු කථානායකතුමනි? මෑත කාලයේ ගත්තොත්, මෙම පාලනයේ ක්‍රියාවලිය ආරම්භ වෙන්නේ, 2015 ජනවාරි 08වෙනි දා. 2015 ජනවාරි මාසයේ 08වෙනි දා ජනතාව සුවිශේෂී බලාපොරොත්තු සහිත ජන වරමක් තමයි මේ ආණ්ඩුවට ලබා දුන්නේ. මීට පෙරත් අපි මේ පාර්ලිමේන්තුවේදී පවසා තිබෙනවා, එම ජන වරමේ සංයුතිය.

ගරු කථානායකතුමනි, මීට පෙර ආණ්ඩු පිහිටුවීමේදී ඒ ජන වරමේ ප්‍රබලතම සංයුතිය නියෝජනය කළේ, යම් පක්ෂයක මතය. අපේ රටේ ආණ්ඩු පෙරළිවලදී -1977දී වේවා, 1994දී වේවා- එම ආණ්ඩුව පිහිටුවා ගැනීම සඳහා ලබා දුන් ජන වරමේ වැඩිම පංගුවක් නියෝජනය කළා එම පක්ෂයේ සාමාජිකයා; එම පක්ෂයේ මතය. හැබැයි, 2015 ජනවාරි මාසයේ 08වෙනි දා පත් වූ ආණ්ඩුවේ විශේෂත්වයක් තිබුණා. ජනවාරි මාසයේ 08වෙනි දා පළවා හරින ලද පාලනයට එරෙහිව ගොඩ නඟන ලද නව පාලනයේ ජන වරම තිබුණේ යම් තනි පක්ෂයක භුක්තියට නොවෙයි. ඒ ජන වරමේ සංයුතිය විශාල ජනතා අපේක්ෂා නියෝජනය කළ සංයුතියක්. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, මිනිසුන්ගේ නිදහස පිළිබඳව, ආර්ථිකයේ සංවර්ධනය පිළිබඳව, වංචා, දූෂණවලට එරෙහි වීම පිළිබඳව, වංචා, දූෂණ නොකිරීම පිළිබඳව, අපේ රටේ සිද්ධ වූ ඝාතන, ඒ ඝාතනවලට එරෙහිවීම, එවැනි ඝාතන වැළැක්වීම, එම ඝාතකයන්ට දඬුවම් දීම වැනි විශාල දේශපාලන කරුණු ඉදිරියට ආපු ජන වරමක් තමයි 2015 ජනවාරි මාසයේ 08වෙනි දා ලද ජන වරම.

ගරු කථානායකතුමනි, කියන්න කනගාටුයි, ජනතාවගේ එම පොදු අපේක්ෂා යටපත් කරමින්, පක්ෂයක, නැත්නම් පක්ෂයක කිහිප දෙනෙකුගේ හෝ පක්ෂයක තනි අධිකාරියේ වුවමනා මත තමයි ඒ මුළු පාලන ක්‍රියාවලියම දිග හැරෙමින් තිබුණේ.

දැන් ගරු මංගල සමරවීර මන්ත්‍රීතුමා පසුගිය අවුරුදු තුනහමාරේ ක්‍රියා පටිපාටිය පිළිබඳව පාර්ලිමේන්තුවට ලියවිල්ලක් ඉදිරිපත් කළා. මම ඒක කියෙව්වේ නැහැ. හැබැයි, එහි අඩංගු වෙලා තිබෙන්නේ මොනවාද කියන එක සම්බන්ධව මට දළ අදහසක් තිබෙනවා. එහි අඩංගු විය යුතු බොහෝ කරුණුත් ලියැවිලා නැති බව අපි දන්නවා. ඒකේ ලියන්න ඕනෑ බොහෝ කරුණු ලියලා නැහැ. එතුමා ඒවා ලියලා නැහැ කියා මම හිතනවා. කවදා හරි ඒවා ලියන්නේ අපි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, ලියපු කරුණු ගැන නොවෙයි, ලියන්න අපේක්ෂා කළ කරුණු ගැන නොවෙයි, එතුමන්ලා අවධානය යොමු කළ යුතුව තිබුණේ. එතුමන්ලා අවධානය යොමු කළ යුතුව තිබුණේ, ඒ පොතට ඇතුළත් කරන්න බැරි වුණු කරුණු කොපමණ තිබෙනවාද කියන කාරණයටයි. ඒ කරුණුවලට වග කිවයුත්තා කවුද? ඒ කරුණු ඒ විධියට සිද්ධ වෙන්න ඉඩ දීමෙන් හෝ නිහඬව අනුමත කිරීමෙන් හෝ අත ඔසවා අනුමත කිරීමෙන් හෝ නොදැක්කා සේ සිටීමෙන් හෝ සිදු වූ දේවලට මුළු ආණ්ඩුවම වග කිවයුතුව තිබෙනවා. ඒ නිසා, ඒ කරුණුවල අඩංගු නොවුණු කරුණු පිළිබඳව තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වග කීම තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ආණ්ඩුවක් කරනකොට ඔක්කෝම නිෂේධ දේවල් කරන්න බැහැ. ආණ්ඩුවක් කරන කොට යම් යම් සාධනීය දේවල් කරන්න ඕනෑ. ඒක ආණ්ඩුවක මූලික වගකීම. හැබැයි, සාධනීය දේවල් කිරීම ආණ්ඩුවක වගකීම වාගේම, නිෂේධනීය දේවල් නොකර සිටීමේ වගකීමත් තිබෙනවා. ඒ නිසා සාධනීය දේ පමණක් කිරීමෙන් ඉතිහාසය සාධාරණ වෙන්නේ නැහැ. ඉතිහාසය සාධාරණ වෙන්නේ, නිෂේධ කළ යුතු දේත් නිශේධ කිරීමෙන්. ඒක කළාද? කළේ නැහැ.

ගරු කථානායකතුමනි, ඔක්තෝබර් මාසයේ 26 වැනි දා මෙවැනි කුමන්ත්‍රණයක් මේ ආකාරයෙන් පැමිණීම සඳහා අවශ්‍ය වන සමාජ පසුබිමත් අපි තේරුම් ගත යුතුව තිබෙනවා. අපි ඒ කරුණ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ ක්‍රියාදාමයත්, මහින්ද රාජපක්ෂ මහත්මයාට යළි බලය ලබා ගැනීමට තිබුණු වුවමනාවත් කියන තැනට ලඝු කළොත් වැරදියි. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එතුමාගේම වූ දේශපාලන වුවමනාවක් වෙනුවෙන් ඒ ක්‍රියාවලියට පය තැබූ බව අපි දන්නවා. ඒ වාගේම, මහින්ද රාජපක්ෂ මහත්මයා එතුමාගේම වුවමනාව මත එම ක්‍රියාවලියේ කොටස්කරුවෙකු වූ බවත් අප දන්නවා. හැබැයි, ඔක්තෝබර් මාසයේ 26 වැනි දා වූ එම දේශපාලන කුමන්ත්‍රණයේ මතුපිට කරළියේ නළුවන් දෙදෙනා ඒ දෙදෙනා බවට පත් වුණාට, ඒ දෙදෙනාට එම රංගනය කරන්න පුළුවන් වූ වේදිකාව කුමක්ද? ඒක ආණ්ඩුව තේරුම් ගත යුතුව තිබුණා. කවුද ඒ වේදිකාව? ඒ ප්‍රධාන රංගන ශිල්පීන් දෙදෙනාට එරෙහිව ලොකු මතයක් හදලා තිබෙනවා. ඒකට අපිත් දායක වෙලා තිබෙනවා. සමාජයේත් ඒ මතය ගොඩනැඟිලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත්, මහින්ද රාජපක්ෂ මහත්මයාත් විසින් කුමන්ත්‍රණකාරී ලෙස බලය පැහැර ගැනීම සඳහා කරන ලද රංගනය පිළිබඳව විවාදයක්, විවේචනයක් තිබෙනවා.

හැබැයි, එවැනි රංගනයක් කිරීම සඳහා අවශ්‍ය වන වේදිකා හැඩතල, පසුබිම නිර්මාණය කළේ කවුද? ගරු කථානායකතුමනි, කුමන්ත්‍රණකාරී ලෙස ආණ්ඩුවක් පැහැර ගැනීමේ එවැනි ක්‍රියාවලියකට අත තියන්නේ නිකම්ම නොවන බව අපි තේරුම්ගත යුතුව තිබෙනවා. මා මේ කරන්න හදන්නේ කිසිසේත්ම එම ක්‍රියාවලිය සාධාරණීකරණය කරන්න නොවෙයි. එම ක්‍රියාවලිය කුමන තත්ත්ව මත හෝ සිදු නොවිය යුතු, සිදු නොකළ යුතු ක්‍රියාවලියක්. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුවක් එළවා, එතුමාට ප්‍රතිපක්ෂ අපේක්ෂකයා අග්‍රාමාත්‍ය ධුරයේ වාඩි කරවාගෙන, එකට ආණ්ඩුවක් කිරීමට යන පසුබිමක් නිර්මාණය වුණේ කොහොමද? ඒක සාමාන්‍ය පසුබිමක් නොවෙයි. ගරු කථානායකතුමනි, කුමන්ත්‍රණයේ ප්‍රධාන පුද්ගලයන් දෙදෙනා එම දෙදෙනා වුණාට, එවැනි කුමන්ත්‍රණයක් දියත් කිරීම සඳහා අවශ්‍ය වන පසුබිමක් නිර්මාණය කළා. එම පසුබිම නිර්මාණය වුණේ ජනතාවගෙන් විතැන්වූ ආණ්ඩුවක් තිබීම නිසායි. ආණ්ඩුව ජනතාවගේ වුවමනාව නියෝජනය කරනවා වෙනුවට, තමන්ගේ සිතැඟි පරිදි ජීවත් වෙමින් කරන කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක, සර්වතෝභද්‍ර කරුණු බවට පත් කරගත් මානසිකත්වයෙන් කටයුතු කළා. ඒ මානසිකත්වය, සමාජ පසුබිම තමයි මෙවැනි විනාශකාරී කුමන්ත්‍රණයකට අවශ්‍ය වන පසුබිම නිර්මාණය කළේ. එහෙම නැතිව ගරු කථානායකතුමනි, ඔය නඩුවක් දැම්මාට, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එවැනි කෙනකු කියලා අප විශ්වාස කරන්නේ නැහැ. පසුව හිතෙනවා එහෙමද කියලාත්. කෙසේ වුවත්, මහින්ද රාජපක්ෂ මහත්මයාත් එහෙමම කුමන්ත්‍රණයක යෙදුණාද දන්නේ නැහැ. නමුත් ගරු කථානායකතුමනි, ඒ ක්‍රමන්ත්‍රණය ගැන යම් සමාජ මතයක් නිර්මාණය වෙමින් තිබුණා. ඒක පිළිගත යුතුයි. අපි කුමන්ත්‍රණය පසෙකින් තියමුකෝ. නමුත්, ඒ තත්ත්වය ඇති වුණේ කුමක් නිසාද?

ආණ්ඩුවේ පසුගිය අවුරුදු තුනහමාරක කාලපරිච්ඡේදය සමත් වුණේ නැහැ, එවැනි කුමන්ත්‍රණකාරී බල පැහැර ගැනීමකට එරෙහිව සමාජ, ජනතා විරෝධයක් ගොඩ නැඟීමට අවශ්‍ය සමාජ තත්ත්වයක් නිර්මාණය කරන්න. ඒ නිසා ඉතාම කැත පන්නයේ කුමන්ත්‍රණයක් වුණත් ඒක යම් ප්‍රමාණයකට පිළිගන්න සූදානම් මනෝභාවයක් සමාජය ඇතුළෙන් නිර්මාණය වුණා. අන්න ඒ සමාජභාවය නිර්මාණය කිරීමේ ප්‍රමුඛයා තමයි අග්‍රාමාත්‍යවරයා හැටියට ඒ වෙලාවේ කටයුතු කරපු රනිල් වික්‍රමසිංහ මහත්මයා. ඒක තේරුම් ගත යුතුව තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, "යළි එම පුටුව නිමි ඔහුටමය, එම පුටුවේ වාඩි කළ යුත්තේ ඔහුමය" කියන නිර්ණායකයකට ඒමට ජනතා විමුක්ති පෙරමුණ නම් කිසි සේත්ම සූදානම් නැති බව මෙම පාර්ලිමේන්තුවට අපි කියන්න කැමැතියි. එහෙනම් අපේ ප්‍රවේශය කුමක්ද?

ගරු කථානායකතුමනි, ඔක්තෝබර් මාසයේ 26 වැනි දා සිදු වීම පිළිබඳව අපේ විවේචනය සහ අපේ ප්‍රවේශය වී තිබෙන්නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒ පුටුවෙන් නැඟිටුවා මහින්ද රාජපක්ෂ මහත්මයා වාඩි කරවීම පිළිබඳව හෝ හෙට දිනයේ මහින්ද මහත්මයා නැඟිටුවා රනිල් වික්‍රමසිංහ මහත්මයා වාඩි කරවීම පිළිබඳ කාරණයක නොවෙයි.

අපි, මේ දෙදෙනාම ඔය පුටුවේ වාඩි වෙලා මේ රට පාලනය කරපු ආකාරය දැකපු දේශපාලන ව්‍යාපාරයක්; මේ දෙදෙනාම ඔය පුටුවෙන් නැඟිට සිටි අවස්ථා දැක තිබෙන දේශපාලන ව්‍යාපාරයක්. එම නිසා අපට තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා වාඩි වී සිටි පුටුවෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉවත් කොට මහින්ද රාජපක්ෂ මහත්මයා වාඩි කරවීම පිළිබඳව පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ඒක ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නයක්. ඒක අපට කිසිසේත්ම අදාළ නොවන ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, අපේ ප්‍රශ්නය බවට පත් වී තිබුණේ දෙදෙනෙකු එකතු වී ව්‍යවස්ථාවේත්, ජන වරමේත්, දේශපාලන සදාචාරයේත් කිසිදු නිර්ණායකයකට අයත් නොවන වර්ගයේ දේශපාලන කුමන්ත්‍රණයක් හරහා කුමන්ත්‍රණකාරී පාලන බලයක් පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නයයි. වෙන කිසිවක් නොවෙයි, ගරු

[ගරු අනුර දිසානායක මහතා]

කථානායකතුමනි. අපි ඔක්තෝබර් මාසයේ 26 වෙනිදාත් එක්ක ගැටෙන්නේ දේශපාලන කුමන්ත්‍රණයක් හරහා බලය අත් පත් කර ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් ලෙස පමණමයි. එතැනදි කිසිසේත්ම ඒ පුටුවේ මහින්ද රාජපක්ෂ මහත්මයා වාඩි වීම පිළිබඳව හෝ එම පුටුවෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා නැඟිටුවීම පිළිබඳව කාරණා අපට අදාළ නැහැ. ඒක අපට අදාළ නොවන ප්‍රශ්නයක්. මොකද, ඔය පුටුවේ වාඩි වෙලා ඔවුන් කරපු දේවල් ගැනත්, ඔය පුටුවෙන් ඉවත් වෙලා ඔවුන් කරන දේවල් ගැනත් අපි දන්නා නිසා. ගරු කථානායකතුමනි, එම නිසා ඒක අපේ සාකච්ඡාවට; අපේ දේශපාලනයට; අපට අදාළ කරුණක් බවට පත් වෙලා තිබුණේ නැහැ. මෙවැනි පත්තයේ දේශපාලන කුමන්ත්‍රණ හරහා බලය පැහැර ගැනීම මේ රටේ ආදර්ශයක් බවට පත්වනවා නම්; ඒවා හැම දාමත් සිදුවන දේවල් බවට පත්වනවා නම්, අපට අදාළ කරුණ බවට පත් වී තිබුණේ, එයයි. ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා සිද්ධිය මේ රටේ අනාගතයට ආදර්ශයක් බවට පත්වෙනවා නම්, ඒක මහා විනාශකාරී දේශපාලන ගමන් මහකින් කෙළවර විය හැකියි කියන එක පිළිබඳව ඉතාමත් නිරවුල් දේශපාලන අදහසක් නිසා තමයි අපි ඒ නිශ්චිත තැනට විරුද්ධ වන්නේ. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව යම් හැඟීමක් තිබෙන මේ රටේ සෑම පුරවැසියෙකුගේම වගකීම තමයි, එවැනි අවස්ථාවක් ආරම්භ වන තැනම පරාජය කරන එක. ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා කුමන්ත්‍රණයත් පරාජය කරන්න අපි අසමත් වන්නේ නම්, යළි යළිත් එවැනි වර්ගයේ කුමන්ත්‍රණයන් සිදුවීමේ ඉඩකඩ තිබෙන නිසා, අන්න ඒ දේශපාලන ප්‍රජාතාන්ත්‍රික බර පමණයි ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා දේශපාලන කුමන්ත්‍රණය පිළිබඳව අපේ ප්‍රවේශය තිබන්නේ, ගරු කථානායකතුමනි.

පාර්ලිමේන්තුව කල්තැබීම, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම, ඊට පස්සේ ඡන්දවලට දින නියම කිරීම, ඊට පස්සේ බලහත්කාරයෙන් ඇමති ධුර ගැනීම, බලහත්කාරයෙන් අග්‍රාමාත්‍ය ධුරය දැරීම, පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් සම්මත වෙලා තිබියදී "අගමැති - අගමැති" කියලා නන් දෙඩවීම, පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් සම්මත වෙලා තිබියදී ඇමතිවරු ගිහිල්ලා වැඩ කිරීම ආදී අනෙක් සියලු සිදුවීම් ඔක්තෝබර් 26 වෙනි දා කුමන්ත්‍රණයට යටින් තිබෙන දේවල්. ඒවා එම කුමන්ත්‍රණය සාර්ථක කර ගැනීම සඳහා දියත් කරන ලද කැත, ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී, අයුක්තිසහගත ක්‍රියාදාමයන්.

ඒකේ නිමිත්ත තමයි ඔක්තෝබර් මාසයේ 26 වැනිදා සිදු වීම. ඒ සිදු වීම අසාර්ථක වන කොට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එක් එක් පියවරයන් දියත් කරමින් තිබුණා. ව්‍යවස්ථාව තුළ තමන්ට පැවරී තිබෙන බලතල, ව්‍යවස්ථාවෙන් තමන්ට පවරා නැති, එහෙත් තමන්ට පවරා තිබෙනවා යැයි කියා ආරෝපණය කරගෙන තිබෙන බලතල, සමහර විට ව්‍යවස්ථාවේ තමන්ට නොතේරෙන හේතු, මේ කුමන්ත්‍රණය සාර්ථක කර ගැනීම සඳහා දියත් කරමින් තිබුණා. ඒ නිසා කුමන්ත්‍රණය සාර්ථක කර ගැනීම සඳහා ගනු ලබන හැම පියවරකටම අපි අපේ විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා ගනු ලබන හැම පියවරකටම අපි අපේ දායකත්වය ලබා දීලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ දී රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් අපි ගෙන එන්නේත්, එම විශ්වාස භංග යෝජනාවට සහාය ලබා දෙන්නේත් අන් කවරක්වත් නිසා නොවෙයි, කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට පැවරී තිබුණු වැඩ කොටස අනුවයි. අධිකරණයේ දී පාර්ශ්වකරුවන් ලෙස අප නඩුවට මැදිහත් වෙන්නේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා අධිකරණයට පැවරී තිබෙන වැඩ කොටසේ අපේ දායකත්වය මතයි. පාරේ උද්ඝෝෂණ, පාරේ රැස්වීම්, ජනතා ආමන්ත්‍රණය කිරීම්, ජනතාවට මතයන් ගෙන යෑම, යන මේ සියල්ල ගොඩ නැඟී තිබෙන්නේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා අපේ දායකත්වයේ කොටස මත සහ අපේ දේශපාලන ස්ථාවරත්වයේ කොටස මතයි.

ගරු කථානායකතුමනි, දේශපාලන ව්‍යාපාරයක් හැටියට යම් සිදුවීමක්, යම් දේශපාලන සංසිද්ධියක් පිළිබඳව අපි ස්ථාවරයක් ගන්නවා. ඒ ස්ථාවරයට විරුද්ධ වෙන්නේ කවුද, ඒ ස්ථාවරය අනුව පෙළ ගැහෙන්නේ කවුද කියන එක අපට අදාළ නැහැ. රට සහ ජනතාව ඉදිරියට තබමින් අපි ස්ථාවරයක් ගත්තොත් ඒ ස්ථාවරයට අනුව පෙළ ගැසෙන්නේ කවුද, ඒ ස්ථාවරයට විරුද්ධ වන්නේ කවුද කියන මුහුණු මත ඒ ස්ථාවරය එහේට මෙහේට වෙනස් කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි අපේ දේශපාලන ව්‍යාපාරය. ඒ දේශපාලන ස්ථාවරය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් ප්‍රජාතාන්ත්‍රික සීමාව තුළ ඕනෑම ක්‍රියා මාර්ගයක් ඉදිරියට ගෙන යෑම සඳහා ධෛර්යය සහ ශක්තිය තිබෙන දේශපාලන ව්‍යාපාරයක් තමයි අපේ දේශපාලන ව්‍යාපාරය. ඒ නිසා තමයි අපි මේ ක්‍රියාමාර්ග ගත්තේ.

ගරු කථානායකතුමනි, මේ කුමන්ත්‍රණය අවස්ථා ගණනාවකදී පරාජයට පත් වී තිබෙනවා. ඊළඟට ආණ්ඩුවක් හැදෙනවා නම් ඒ ආණ්ඩුව හැදෙන්නේ කාගෙන්ද? එලෙස හැදෙන ආණ්ඩුවක අග්‍රාමාත්‍යවරයෙකු සිටිය යුතුයි. කොහොමත් ආණ්ඩුවක අග්‍රාමාත්‍යවරයෙකු සිටිය යුතුයි. ඒ අග්‍රාමාත්‍යවරයා කවුද කියන එක අපට අදාළ නැහැ. ඒකයි මම කියන්නේ. අග්‍රාමාත්‍යවරයා විය යුත්තේ කවුද කියන එක අපට අදාළම නැහැ. මොකද, මේ කඳවුරේ මොන අගමැති වාඩි වුණත්, ඔවුන් මේ රටට කරලා තිබෙන විනාශය පිළිබඳව අපි දන්නවා. මේ රටට කරන්න හදන විනාශයත් අපි දන්නවා, ගරු කථානායකතුමනි. මේ ආර්ථික ගමනේදී තීරණාත්මක ලෙස ඔය කඳවුරේ කිසිවෙකුට ඔය පුටුවේ වාඩිවෙලා එය වෙනස් කරන්න බැරි බව අපි දන්නවා.

ගරු කථානායකතුමනි, ව්‍යාපාරයක් බවට පත් කරගෙන තිබෙන දේශපාලන සංස්කෘතිය, ලාභ ඉපයීමේ ප්‍රධානම මාධ්‍යය බවට පත් කර ගෙන තිබෙන දේශපාලනය, පුටුවේ වාඩි වෙච්ච දවසේ ඉඳලා මුදල් උපයන්නේ කෙසේද කියලා කල්පනා කරන දේශපාලන සංස්කෘතිය, ඔය පුටුවේ වාඩි වෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාද, ඔය පුටුවේ වාඩි වෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාද කියන එක මත වෙනස් වෙන්නේ නැති බවත් අපි දන්නවා. වෙන කවුරු හෝ අගමැති ලෙස පත් කිරීමට අපේක්ෂා කරගෙන ඉන්නවා නම්, එතුමා ඔය පුටුවේ වාඩි වුණත් ඔක වෙනස් නොවෙන බව අපි දන්නවා, ගරු කථානායකතුමනි. ඒ නිසා දේශපාලන සංස්කෘතියේ තීරණාත්මක වෙනසක් වෙන්නේ නැහැ; මේ ආර්ථික දේහයේ තීරණාත්මක වෙනසක් වෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. ඔය පුටුවේ, ඔය පත්තයේ කවුරු වාඩි වුණත් අපේ රටට නව ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්න අසමත් වන බව අපි දන්නවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම කොළඹ කේන්ද්‍ර කර ගත් සංවර්ධන ආර්ථික මොඩලයක් වෙනුවට අපේ රටේ ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වයත් එක්ක ගොඩ නැඟී තිබෙන ආර්ථික ක්‍රමවේදයකට අවතීර්ණ වෙන්න සූදානමක් නැති බවත් අපි දන්නවා. ඒ නිසා මොන නිර්ණායකයට යටත් කර බැලුවත්, ඔය පුටුවේ වාඩි වෙන්නේ කවුද කියන එක අපට අදාළ නැහැ, ගරු කථානායකතුමනි. ඒ සඳහා විවිධ ආකාරයේ ලේබල් ගහන්න පුළුවන්, විවිධ ආකාරයේ එකඟතාවන් ඇතිවන්න පුළුවන්. සමහර අය මේ මොහොතේ තමන්ට පක්ෂයි වාගේ දැනෙන නිසා ලෙන්ගතුකමක් පෙන්වන්න පුළුවන්. තව මොහොතකින් තමන්ට විරුද්ධයි වගේ දැනෙන නිසා

ප්‍රතිවිරෝධයක් දක්වන්න පුළුවන්. මේ මොහොතේ දක්වන ලෙන්ගතුකමත්, තව මොහොතකදී දක්වන ප්‍රතිවිරෝධයත් අලුයම ලූ කෙළ පිඬක් සේ තමයි අපි සලකන්නේ, ගරු කථානායකතුමනි. මා ඒක අනිවාර්යයෙන් කියනවා. අපි යම් දේශපාලන ස්ථාවරයක සිටිනවා. අපේ නිශ්චිත දේශපාලන ස්ථාවරය බවට පත්වී තිබුණේ මේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීමයි. මේ කුමන්ත්‍රණය පරාජයට පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේදීත්, අධිකරණයේදීත්, ඉන් පිටතදීත් ගත හැකි සෑම ක්‍රියාමාර්ගයකටම දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපේ දායකත්වය, අපේ මැදිහත්වීම අපි ලබා දීලා තිබෙනවා. හැබැයි මෙතැනින් එහාට ඔය පුටුවේ කවුරු වාඩි වුණත්, ඔහුගේ වගකීම තිබෙන්නේ කාටද යන්න අපට අදාළ වෙන්නේ නැහැ. විශේෂයෙන්ම හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔය පුටුවේ වාඩි වුණාය කියලා ඉදිරි අවුරුද්දේ දේශපාලනිකව අලුත් කිසිවක් සිදු නොවන බවත්, සිදු වෙනවා නම් සිදු විය හැකි වන්නේ තව තවත් නිෂේධීය කරුණු ඉදිරියට යෑම බවත් අපි ඉතා හොඳින් දන්නවා. ඒ නිසා මේ විශ්වාසය ප්‍රකාශ කිරීමේ යෝජනාව අපට අදාළ නොවන යෝජනාවක් බව ප්‍රකාශ කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු අනුර දිසානායක මැතිතුමනි.

මීළඟට, ගරු රවි කරුණානායක මැතිතුමා. මේ අවස්ථාවේ දී සභාවේ එහා කෙළවරේ සිටගෙන සාකච්ඡා කරන මන්ත්‍රීවරුන් එළියට ගිහින් සාකච්ඡා කරන්න. එහෙම නැත්නම් මේ සභාවට කරදරයක් වෙනවා.

ගරු රවි කරුණානායක මැතිතුමා, කථා කරන්න.

[අ.භා. 2.33]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි, ගරු කථානායකතුමනි. අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් එකතු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ ස්තුතිය පුද කරනවා. මේ අවස්ථාවේ දී මා මුලින්ම කිව යුතු දෙයක් තිබෙනවා. ව්‍යවස්ථානුකූලව කළ යුතු දෙයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් සිදු කර තිබෙන අවස්ථාවක ඒ සඳහා සාධාරණයක් කිරීමයි අපට අවශ්‍ය වන්නේ. රට පුරාම ගිහින්, "නීත්‍යානුකූලව අපේ රටේ අගමැති විය යුත්තේ රනිල් වික්‍රමසිංහ"යයි කියන්නට සිදු වන අවස්ථාවක් උදා වෙලා තිබෙනවා. ඔක්තෝබර් 26වැනි දා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ලොකු කළු පැල්ලමක් ඇති වුණා. එය නිවැරැදි කිරීමට තමයි අපි මේ අවස්ථාව උපයෝගී කර ගන්නේ. මා හිතන විධියට දේශපාලනය කරනකොට හැමදෙනාම වැරැදි කරනවා. අඳුරට ශාප කරන්නේ නැතුව එක පහනක් හෝ දල්වා අප සියලු දෙනාම අලෝකය සොයාගෙන ගිහින් විසඳුමක් ලබා ගැනීම තමයි අත්‍යවශ්‍ය වන්නේ. අප සිටින ස්ථාවරවලම සිටියොත් මේ රට අගාධයට යනවා මිසක් කිසිසේත්ම යථා තත්ත්වයට පත් වන්නේ නැති එක තමයි සිද්ධ වන්නේ.

ගරු කථානායකතුමනි, ඉතාමත් දරුණු අවස්ථාවක ඔබතුමා තුළ තිබුණු ඒ, දැවැන්ත ශක්තිය ගැන නැවත-නැවත මතක් කරන්න අවශ්‍යයි. ලෝකයේ සියලුදෙනාම අද ලංකාව දෙස බලාගෙන සිටිනවා. ප්‍රජාතන්ත්‍රවාදීව ලොකු ප්‍රශ්නයක් ඇති වී තිබෙන අවස්ථාවක ඒ අභියෝගයට ප්‍රජාතන්ත්‍රවාදීව උත්තර දීම සම්බන්ධයෙන් තමයි අද රටට කීර්ති නාමයක් ලැබී තිබෙන්නේ. මේ අවස්ථාවේ දී එක්සත් ජාතික පෙරමුණ -එක්සත් ජාතික පක්ෂය ඇතුළු පෙරමුණේ සියලුම පක්ෂ- එකමුතුව කටයුතු කිරීමේ දී ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් හා ජනතා විමුක්ති පෙරමුණෙන් අපට ලැබුණු ශක්තිය අපි අමතක කරන්නේ නැහැ. මේ අවස්ථාවේ නැවත රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද? මේ සභාවේ ඉන්න අපි හැමදෙනාම බැණ-බැණ ඉඳලා හරි යන්නේ නැහැ. රට ඉදිරියට ගෙන යා යුතුයි. එහෙම නොවුණොත් අපේ අහිංසක ජනතාවට තමයි ප්‍රශ්නයක් ඇති වන්නේ. ඒ නිසා අපි අලුතින් හිතන්න අවශ්‍යයි. රට අරාජික තත්ත්වයකට පත්වෙලා තිබෙන අවස්ථාවක්. ව්‍යවස්ථා විරෝධී මේ ප්‍රශ්නය ඇතිවෙලා අදට දවස් 49ක් ගතවෙලා තිබෙනවා. අද රටේ හරියාකාර ආණ්ඩුවක් නැහැ. රජයේ සේවකයන් බලාගෙන සිටිනවා, ඉදිරියට කටයුතු කරන්නේ කොහොමද කියලා. මා පසුව පෙන්වන්නම්, උද්ගත වෙලා තිබෙන වැදගත් බැරෑරුම් ප්‍රශ්න දෙක තුනක් පිළිබඳව. මේ අවස්ථාවේ දී මා වැඩි වෙලාවක් ගන්නේ නැහැ. පුළුවන් තරම් ඉක්මනට සමඟිය ඇති කරලා රට ඉදිරියට ගෙන යාමයි දැන් අවශ්‍යවෙලා තිබෙන්නේ.

මැතිවරණයක දී අපේ පක්ෂවල ස්ථාවරයන් ඉදිරිපත් කළාට පසුව ජනතාව අපට වරමක් දෙනවා. අපි ඒ ජනතා වරම ගන්නේ අවුරුදු 5ක කාලය තුළ රටට යම් දෙයක් කරන්නයි. නමුත් මේ දවස්වල පාර්ලිමේන්තුවට බලහත්කාරයෙන් අවජාතක ආණ්ඩුවක් පත් කරලා තිබෙනවා. ඒ අයට පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්වන්න බැරි වුණාම ඒ ගොල්ලන්ගේ ලේසිම සෙල්ලම තමයි මැතිවරණයකට යන්න ඕනෑය කියන එක. දැන් මේවා කියන්නේ කවුද? මැතිවරණයකට යන්න හැම දේශපාලන පක්ෂයක්ම සූදානම්. නමුත් මේ කටයුතු කරගෙන යන ආකාරය බලන්න. අපි උදාහරණයක් විධියට ගත්තොත්, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය තිබෙනකොට අයදුම්කරුවන් ඒ සඳහා සූදානම් වෙනවා.

ඊට පස්සේ, ඔවුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට ලියන්නේ අවුරුදු 2කින්. එම විභාගයට අවුරුදු 2ක් තියෙද්දි, මාස 6කින් විභාගය ඕනෑය කියා ඒක පවත්වන්න බැහැ නේ. ඒ සඳහා යම් කාලාන්තරයක් තිබෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. දැන් කවුද මේවා කියන්නේ? "මැතිවරණයක් පවත්වන්න ඕනෑ" කියා පොහොට්ටුවේ සියලුදෙනා මන්තරයක් වාගේ කියනවා. අවුරුදු 5ක් සඳහා ගත් ජන වරම බලහත්කාරයෙන් ගත්තාට පස්සේ, බහුතරයක් පෙන්වන්න බැරි වුණාම ඒ සඳහා උත්තරය මැතිවරණයක් පැවැත්වීමද? මේක ඒ අයට තේරෙන්නේ නැද්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයත් අපිත් එක්ක එකතු වෙලා ආණ්ඩු කළා නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න අයට මේක ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, පොහොට්ටුවට එල්ලුණු කට්ටියටත් ඕනෑ වෙලා තිබෙන්නේ ඡන්දයක්. පොහොට්ටුවත් එක්ක යන සෙසු පක්ෂවලට විතරයි ඒක අවශ්‍ය. එක් අයෙකුට විතරයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඇයි, මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ? මොනවාද මේ හංගන්න හදන්නේ? මෙන්න මේ කාරණා දෙස තමයි අපි විවෘතව බලන්න අවශ්‍ය වෙන්නේ.

බලන්න, ජී.එල්. පීරිස් මැතිතුමා තමයි පොහොට්ටුවේ සභාපතිතුමා වශයෙන් කටයුතු කරන්නේ. දින සියයේ වැඩ පිළිවෙළ හරහා අපි මේ පාර්ලිමේන්තුවට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට එතුමා ඉතාම අනගි කථාවක් කළා. "මේ අස්ථාවරභාවය නැති කරන්න තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ" කියන එක තමයි එතුමා ඒ කථාව තුළින් කිව්වේ. ස්ථිරවම අවුරුදු හතරහමාරක් පාර්ලිමේන්තුවට ඉදිරියට යන්න පුළුවන්ය කියන

[ගරු රවි කරුණානායක මහතා]

කාරණය මේ පාර්ලිමේන්තුවේදී කථා කරලා, පොහොට්ටුවට ගියාම ඒක අමතක කරනවා. අන්තිමට උසාවියට ඉදිරිපත් කිරීම සඳහා අපි ඒ කථාවම උපයෝගි කර ගත්තා. මෙන්න මේ වාගේ බොරු කරන අය තමයි පොහොට්ටුවේ කටයුතු කරන්නේ. කමක් නැහැ, අපි මේ සියල්ලම අවසන් කරමු. හැබැයි, ස්ථාවරභාවයක් ඇති කරන්න අවශ්‍යයි; එකමුතුභාවයක් ඇති කරන්න අවශ්‍යයි. ජනාධිපතිතුමාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත්, ගරු කථානායකතුමාත් එකතු වෙලා විශිෂ්ට ගණුයේ වැඩ පිළිවෙළක් ඇති කරලා, ඒ තුළ අපි සියලුදෙනාම ඒක රාශි වෙලා වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන එක තමයි දැන් අවශ්‍ය වෙන්නේ. මොකද, මහ මැතිවරණයක් පැවැත්වීම සඳහා නිල වශයෙන් තව අවුරුදු එකහමාරක් තිබෙනවා. ජනාධිපතිවරණයක් සඳහා තව අවුරුද්දකුත් මාසයක කාලයක් තිබෙනවා. පාර්ලිමේන්තුව මෙහෙම විහිළු කරනකොට ප්‍රජාතන්ත්‍රවාදය ඇති වෙන්නේ කොහොමද කියායි අභිංසක ජනතාව කල්පනා කරන්නේ. මේවා දැකලා පළාත් සභා වෙනත් විධියට කටයුතු කරනවා; ප්‍රාදේශීය සභා ඒවායේ තිබෙන සල්ලි ටික නාස්ති කරනවා. මෙන්න මේ විධියට තමයි නිදහසින් පසු අවුරුදු 71ක් තිස්සේ අපි විහිළු කරලා තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ කියන දේ අනිවාර්යයෙන්ම අපි පිළිගන්නවා. ඒ වාගේම, අද වුණත් හරි දෙය හරි මට්ටමෙන් පටන්ගෙන අපිට ඉදිරියට යන්න පුළුවන්. අපි අනිවාර්යයෙන්ම ආණ්ඩුවක් හදනවා, රනිල් වික්‍රමසිංහ අගමැති බවට පත් වෙනවා. ඒ තුළ වැරැදි නොවන විධියට කටයුතු කිරීමට අපි සූදානම්. අපි ඒ අභියෝගය භාර ගන්නවාය කියන එකත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමැතියි.

මේ අරාජික, අවජාතක ආණ්ඩුවට රජයේ නිලධාරීන් අද කොයි ආකාරයෙන්ද උදව් කරන්නේ කියන එකත් මේ අවස්ථාවේ පෙන්වන්න අවශ්‍යයි. ගරු කථානායකතුමනි, මේ රට නැවත ඉතාම භයානක ආර්ථික අර්බුදයකට තල්ලු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් මීට දවස් දෙකකට ඉස්සෙල්ලා ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුළින් ක්‍රියාත්මක කළා මට මතකයි. මොකක්ද වුණේ? දැන් පොහොට්ටුවේ සිටින අය අවුරුදු 5කට ඉස්සෙල්ලා මේ රට පාලනය කළ අවස්ථාවේ, රුපියලෙන් ගනුදෙනු කරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඩොලර්වලින් මිලියන 1,000ක් ගත්තා. 2012දී ඒ ඩොලර් මිලියන 1,000 ගත්තත්, අන්තිමට එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුවට තමයි 2016දී ඒකේ පව් ගෙවන්න වුණේ. ඩොලර්වලින් අරගෙන රුපියල්වලින් ගෙව්වාට පසු එයින් වුණු අලාභය රුපියල් බිලියන 12කට වඩා වැඩි වුණා. බැංකුවේ තැන්පත්කරුවන්ට, නැත්නම් ආණ්ඩුවට, එහෙමත් නැත්නම් මහ බැංකුවට තමයි ඒ බිලියන 12 ගෙවන්න වුණේ. අවසානයේදී බදු ගෙවන්නන්ගේ සල්ලි තමයි නැති වෙන්නේ. ආණ්ඩුවක් නැහැය, මුදල් ඇමතිවරයෙක් නැහැය, අගමැතිවරයෙක් නැහැය කියා උසාවියෙන් කිව්වාට පසු නැවතත් ඒ වාගේ තත්ත්වයක් තමයි ඇති වුණේ. පසුගිය සැප්තැම්බර් මාසයේ 25වන දා වන විට මේ රට සතුව ඇමෙරිකානු ඩොලර් බිලියන 9.8ක විදේශ සංචිත තිබුණා. ඒ කියන්නේ, මේ රට සතු විදේශ සංචිතවල වටිනාකම බිලියන 10කට ආසන්න වෙලා තිබුණා. ඔක්තෝබර් මාසයේ 26වන දා වෙනකොට ඒ ප්‍රමාණය යූඑස් ඩොලර් බිලියන 8.4 දක්වා අඩු වුණා. හැබැයි අද -මේ කථා කරන මොහොත- වන විට එය ඩොලර් බිලියන 6.9 දක්වා අඩු වෙලා තිබෙනවා. එම නිසා මහ බැංකුවේ අධිපති, නියෝජ්‍ය අධිපතිවරු දෙදෙනෙක් තුන්දෙනෙක්, මහ බැංකුවේ ලේකම් සහ තවත් දෙදෙනෙකු එකතු වෙලා ආණ්ඩුවක් නැතිව, කැබිනට් අනුමැතියක් නැතිව, මුදල් ඇමති විසින් යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නැතිව, ජාතික ඉතිරිකිරීමේ බැංකුවට තාවකාලික සභාපතිවරයෙක් පත් කරලා, ඒ තුළින් යූඑස් ඩොලර් මිලියන 750ක term financing facility එකක් ගන්න යන වැඩ පිළිවෙළක් ගැන තමයි දැන් කථා කරන්නේ. මේ කරන්න යන අපරාධය වහාම නවත්වන්නය කියා මම මේ අවස්ථාවේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා. ඒ වාගේම, ආණ්ඩුවක් නැති අවස්ථාවක, කැබිනට් අනුමැතියක් නැති අවස්ථාවක මේ වාගේ ක්‍රියාවක් කරන්නේ කොහොමද කියා ඒ සඳහා සම්බන්ධ වූ රජයේ සියලුම නිලධාරීන් පාර්ලිමේන්තුවට ගෙන්වලා අහන්නය කියා ගරු කථානායකතුමාගෙනුත් මම ඉල්ලා සිටිනවා.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව කියන්නේ ග්‍රාමීය ප්‍රදේශවල සිටින දුප්පත්, අභිංසක ජනතාව රුපියල් 10, 100, 1,000 එකතු කරලා, ඒවා අරගෙන ගිහින් තැන්පත් කරන තැනයි. ඒ ඉතිරිකිරීම් තුළින් තමයි ඔවුන් තමන්ගේ ජීවිතය ඉදිරියට ගෙන යන්නේ. එහෙම නම්, මොනවාද මේ වෙන්නේ? කලින් කළ අපරාධය නැවත කරන්න හදනවා. කොයි ආකාරයේ කුට ක්‍රියාවක්ද මේ කරන්න හදන්නේ? මහ බැංකුවෙන් මේකට අවසර දුන්නාද? මුදල් අමාත්‍යාංශයෙන් මේ සඳහා අවසර දුන්නේ කවුද?

අද අපේ රුපියල අවප්‍රමාණය වෙනවා. ඔක්තෝබර් මාසයේ 26වන දා සිට ඊයේ දක්වා කාලය තුළ එය රුපියල් 14කින් අවප්‍රමාණය වුණා. මේ අපරාධය වුණොත්, මෙහෙම රුපියල අවප්‍රමාණය වෙනකොට කවුද ඒ මිල ගෙවන්නේ? මහ බැංකුවද, මුදල් අමාත්‍යාංශයේ ලේකම්ද, නැත්නම් අභිංසක ජනතාවද? මේවා ගැන සොයා බලන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී කථානායකතුමාට බොහොම කාරුණිකව කියනවා. මෙහෙම කරන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද? ඒ යූඑස් ඩොලර් බිලියන 6.9ක සංචිත ප්‍රමාණයට -ඉංග්‍රීසි භාෂාවෙන් අපි මේකට hot money කියා කියනවා.- මේ මුදල එකතු කරලා, එය තාවකාලිකව පුම්බලා, "මෙන්න අපේ සංචිත මෙච්චර වැඩි වෙලා තිබෙනවා" කියන එක තමයි මේ පෙන්වන්න හදන්නේ. නමුත් මේ ලබන තාවකාලික තෘප්තිය වෙනුවෙන් ජනතාවට; බදු ගෙවන්නන්ට තමයි අනාගතයේදී වන්දි ගෙවන්න සිදු වෙන්නේ. ඒ නිසා මේක වහාම නවත්වන්න අවශ්‍යයි.

මේ අරාජික තත්ත්වය තුළ, විපක්ෂයේ හිටපු අය ආණ්ඩු පක්ෂයට ව්‍යාජ වශයෙන් ගිහිල්ලා හැසිරෙන ආකාරය මම මේ මොහොතේ පෙන්වා දෙන්නම්. රුපියල අවප්‍රමාණය වනකොට, "මේක රටේ ආර්ථිකය කඩා වැටීමක්, මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ මෙහෙමයි" කියා නොයෙක් දේවල් කිව්වා. පසුගිය ඔක්තෝබර් 26වන දා ඒ ගොල්ලන් ආණ්ඩුව ගත්තා නේ. ඒ අවස්ථාවේදී ඇමෙරිකානු ඩොලරය රුපියල් 169ටයි තිබුණේ. දැන් එය 183 දක්වා ඉහළට යනකොට, "ඇයි, මේක අතින් නවත්වන්නද, මොනවාද අපට කරන්න පුළුවන් වන්නේ?" කියා බන්දුල ගුණවර්ධන මහත්මයා අහනවා. මෙන්න මේ වාගේ විහිළු සපයන්නෝ තමයි අද ඒ පැත්තේ ඉන්නේ.

සිංගප්පූරුව සමඟ අත්සන් කළ Free Trade Agreement එක ගැන අද කථා කරනවා. ඒක වහාම අහෝසි කරන්න ඕනෑය කිව්වා. නමුත්, අන්තිමට මොකක්ද වුණේ? "ඒක සංශෝධනය කරන්න පුළුවන්, ඒවා එහෙම නවත්වන්න බැහැ" කියලා තමයි බන්දුල ගුණවර්ධන මහත්මයා දැන් කියන්නේ. ඊළඟට, අනුර ප්‍රියදර්ශන යාපා මහත්මයා කියනවා, -එතුමා හිටපු ඇමතිවරයා- දෙසැම්බර් මාසයේ 31වන දා රාත්‍රී 11.59ට මුදල් වියදම් කිරීමේ හැකියාව නැවතෙනවාය කියා. "විශේෂ ගිණුමක් තුළින් වියදම් කරන්න පුළුවන් වෙයි" කියා එතුමා නැවතත් අද පුවත් පත්වලට කියා තිබෙනවා. නැවත නැවත අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන මෙවැනි වැඩ පිළිවෙළවල් මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන එක, මෙවැනි අසත්‍ය දේවල් කියන එක අපි අනිවාර්යයෙන්ම නවත්වන්න අවශ්‍යයි. මොකද, පාර්ලිමේන්තුවේ බහුතරයකගේ සහාය ඇතිව අතුරු සම්මත ගිණුමක් අනුමත කළේ නැත්නම් ලබන අවුරුද්දේ ජනවාරි මාසයේ 01වන දා

උදාවනකොට -12.01 වනකොට- තඹ සතයක්වත් වියදම් කරන්න බැහැ. අතුරු සම්මත ගිණුමක් - Vote on Account - ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවේ බහුතරයකගේ සහායෙන් එය අනුමත කළේ නැත්නම්, මේ ප්‍රශ්නයට මේ අය වගකිව යුතු වෙනවා. අන්න ඒ කාරණය අපි මතක් කරන්න කැමැතියි.

අද චතුකරය සුමානයකට බිලියන 12ක පාඩුවක් ලබනවා. කවුද මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වග කියන්නේ? අපි වතු කම්කරුවන්ට රුපියල් 1,000ක් ලබා දෙනවාය කියා විපක්ෂයේ ඉන්නකොට සද්ද කරලා කියනවා. නමුත් ඒ වාගේ දේවල් වගකීමකින් යුතුව නේ කියන්න ඕනෑ. අපේ පලනි දිගම්බරම් මැතිතුමා, වී.එස්. රාධාකෘෂ්ණන් මැතිතුමා, මනෝ ගනේසන් මැතිතුමා, වඩිවේල් සුරේෂ් මැතිතුමා එහෙම කිව්වාද? නැහැ. අපේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා පත් වූ විගසම ආණ්ඩුවක් හැටියට අපිට මේවාට උත්තර සපයන්න පුළුවන්. විපක්ෂයේ ඉඳලා අද ඒ පැත්තට ගිහිල්ලා ඇති වුණු දෙයින් රටට පෙන්වන්න පුළුවන්, මොන වාගේ අරාජික තත්ත්වයක්ද, මොන වාගේ බංකොලොත්භාවයක්ද තිබෙන්නේ කියන එක. මේ දේවල් කියන්න මම මීට වඩා වෙලාව මිඩංගු කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ සිටින අපේ -පොහොට්ටුව හැර අනෙක් සියලුදෙනාම- සම්පූර්ණ විශ්වාසය ඒකමතිකව, රනිල් වික්‍රමසිංහ මැතිතුමාටයි. එතුමා තමයි රටට ඔබින්නේ, අගමැති තනතුර දරන්න පුළුවන් එතුමාටයි කියන විශ්වාසය තමයි අද අප සනාථ කරන්නේ. අද අපි සියලුදෙනාම ඒ සඳහා ඒකරාශී වෙනවා. මේ එකතු වුණා වාගේම, මේ යෝජනාවට ඡන්දය දෙන්න කියාත් මේ කථා කළ සියලුදෙනාගෙන්ම මම ඉල්ලා සිටිනවා. අපි මේ රට ඉදිරියට ගෙන යන්න ඕනෑ. අපි පසුගිය අවුරුදු තුනහමාර තුළ මේ රට පාලනය කළා. වැරදි සිදු වෙලා තියෙන්න පුළුවන්. අපි ඒවා අමතක කරමු. නැවත ඒ වැරදි සිදු නොවන විධියට අප සියලුදෙනාම ඒකරාශි වෙලා වැඩ කරනවාය කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 2.46]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පසුගිය ඔක්තෝබර් මාසයේ 26වන දා ආරම්භ වුණු මේ දේශපාලන අර්බුදය නිසා තමයි අපේ පක්ෂයේ නියෝජ්‍ය නායක, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට අද මේ වාගේ යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ. එදා පටන් දේශපාලනයේදී විකිණුණේ නැති, හෘදය සාක්ෂියට එකඟව, යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටි පිරිසක් මේ සභාවේ සිටියදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන පළමුවෙන්ම මම සන්තෝෂ වෙනවා.

ගරු කථානායකතුමනි, විවිධ වරදාන, වරප්‍රසාද, ඇමති පට්ටම් ලබා දී, ඒවා බැරි තැන තර්ජන යන මේ කිසිවක් ඉදිරියේ තමන්ගේ කශේරුකාව නමන්නේ නැති පිරිසක් තමයි අද මේ සභා ගර්භයේ සිටින්නේ කියා ඔවුන්ට ගෞරවයක් වශයෙන් මම ප්‍රකාශ කරන්න කැමතියි. හෘදය සාක්ෂියට එකඟව කටයුතු කළ පිරිස සංකේතවත් කරන පුද්ගලයා, ඒ ප්‍රධාන චරිතය ගරු කථානායකතුමා කියන එකත් අද ඔබතුමා අපට ඔප්පු කර තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, ඔබතුමා ප්‍රධාන තමන්ගේ ඡන්දදායකයාගේ අභිමානය රැක්ක මේ මන්ත්‍රී පිරිසට මාගේ උත්තමාචාරය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු කථානායකතුමනි, මීට පෙර මෙම ගරු සභාවේ නොවූ විරූ තත්ත්වයක් ඔක්තෝබර් 26වැනි දිනට පසුව පාර්ලිමේන්තුව තුළ අපට දිගින් දිගටම දකින්න ලැබුණා. ඒ අවස්ථාවේ තමන්ගේ රාජකාරිය හරි හැටියට ඉටු කළ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයටත්, විශේෂයෙන් පුටු ප්‍රහාර එල්ල කරද්දී, මිරිස් කුඩු ප්‍රහාර-විවිධ පහරදීම් එල්ල කරද්දී පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කටයුතු කරපු පොලීසිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුති කරන්නත් මම මේ අවස්ථාවේ අමතක කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අද අපේ මේ කථිකාවේ ප්‍රධාන නිමිත්ත තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා ලෙස ක්‍රියා කිරීමට මේ සභාවේ අපේ විශ්වාසය පළ කිරීම. මම මේ වේලාවේ එතුමන්ගේ අතීත ක්‍රියාකාරකම් හෝ එතුමන්ගේ අනාගත දර්ශනය ගැන කථා කිරීමට කාලය ගන්නේ නැහැ. ඒ සියල්ලම පසෙක ලා පසුගිය ඔක්තෝබර් 26වැනි දින සිට මේ අර්බුදය හමුවේ එතුමා ක්‍රියා කරපු ආකාරයම, එතුමා කෙරෙහි විශ්වාසය පළ කිරීමට ප්‍රමාණවත් හැටියටයි මම දකින්නේ කියා ඔබතුමාට මතක් කරන්න කැමතියි. මේ අර්බුදය හමුවේ එතුමා පෙන්නුවා, රනිල් වික්‍රමසිංහ කියන්නේ දියුණු ලෝකයේ, ශිෂ්ට සම්පන්න සමාජයේ, ශ්‍රී ලංකාවේ සිටින විශිෂ්ට ගණයේ ව්‍යක්තීයමය දේශපාලනඥයා කියා.

ගරු කථානායකතුමනි, ව්‍යක්තීයමය දේශපාලනඥයෙකුගේ න්‍යාය පත්‍රය සැකසෙන්නේ ඉතාම ශක්තිමත් දේශපාලන දර්ශනයක් මතයි. එවැනි දර්ශනයක් මත සකස් වුණු දේශපාලන න්‍යාය පත්‍රයක් එදිනෙදා ඇති වන යම් යම්, සුළු සුළු සිද්ධි මත, පුංචි පුංචි සිත් රිදවීම් මත හෝ සිත් පිනවීම් මත, එහෙම නැත්නම් සිල්ලර කාරණා මත වෙනස් වෙන එකක් නොවෙයි කියන එකත් අපි මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, අද අපි විශ්වාසය පළ කරන්නේ වැඩ පිළිවෙළක් තිබෙන නායකයෙකුටයි. එම වැඩ පිළිවෙළ ශක්තිමත්, නිවැරදි දර්ශනයකින් පොහොසත් වැඩ පිළිවෙළක්. එම නිසා ගෙවුණු මාස එක හමාරක කාලය තුළ රනිල් වික්‍රමසිංහ මැතිතුමා රටටත්, ලෝකයටත් ප්‍රකට කළ වැදගත්ම ගුණාංගය තමයි, මෑත කාලයේ ශ්‍රී ලංකාව තුළ පහළ වූ දුර්ලභ ගණයේ ව්‍යක්තීයමය දේශපාලනඥයා එතුමා බව. මේ අනපේක්ෂිත සිද්ධිය ආරම්භ වුණු මොහොතේ පටන් මේ දක්වා අපි එකිනෙකා තම තමන්ට ආවේණික ශෛලීන්ට අනුව ප්‍රතිචාර දක්වූවා. එතැනදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා හැසිරුණු පරිණත ආකාරය ගැන මේ වේලාවේ කල්පනා කරනකොට මට මතක් වෙන්නේ "නිසල දිය ගැඹුරුයි" කියන අපේ උපමාවයි. එතුමා මේ අවස්ථාවේ ඉවසිලිවන්තව, සංයමයෙන්, පරිණතභාවයක් ප්‍රදර්ශනය කළා. තමන් ව්‍යක්තීයමය දේශපාලනඥයෙක් කියන එක එතුමා රටටත්, ලෝකයටත් ප්‍රදර්ශනය කළා.

මම දීර්ඝ වේලාවක් කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ අග්‍රාමාත්‍යවරයා හැටියට එතුමාට විශ්වාසය පළ කරන්නයි මේ යෝජනාව ගෙනැත් තිබෙන්නේ. මේ අර්බුදය ඇති වුණාට පසුව පාර්ලිමේන්තුව තුළ ඇති වුණු සිද්ධීන් ගැන අපට කිසි ලෙසකින්වත් සතුටු වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මට මතකයි, එදා පාර්ලිමේන්තුව රැස් වුණු මුලින්ම දවසේ විපක්ෂය කටයුතු කරපු ආකාරය. එලෙස ක්‍රියා කරනකොට අපේ ගමේ කියමනක් මට මතක් වුණා. විශේෂයෙන් ගරු කථානායකතුමාත්, අපට නායකත්වය දුන්, අපි අද අග්‍රාමාත්‍ය තනතුරට විශ්වාසය පළ කරන මේ පරිණත නායකයාත් ක්‍රියා කළේ "වාට්ටුවේ ලෙඩ්ඩු කලබල වුණාට දොස්තර කලබල වෙන්නේ නැහැ." කියන කියමන අපට සනාථ කරමින්. එම නිසා මම මේ වේලාවේ බහුතරයක් විශ්වාසය එතුමාට පළ කරනවා පමණක් නොවෙයි, අපේ දේශපාලන රෝගවලට ප්‍රතිකාර කළ හැකි හොඳම විශේෂඥ වෛද්‍යවරයාත්, මේ ගරු සභාවේ සිටින පරිණතම දේශපාලනඥයාත් අපි අද විශ්වාසය පළ කරන රනිල් වික්‍රමසිංහ මැතිතුමායි කියන එක මම මතක් කරනවා. මේ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

යෝජනාව ඉදිරිපත් කළේත් අපේ පක්ෂයේ නියෝජ්‍ය නායකතුමා විසින්. අද අපි සීමිත පිරිසක් කථා කරන වේලාවේ මටත් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මෙතෙක් ක්‍රියා කළා වාගේම රට වෙනුවෙන් ජාතිය වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඉදිරියටත් ඉතාමත් තීරණාත්මක මොහොතක ක්‍රියා කරනවා ඇතැයි විශ්වාස කරනවා. අතිගරු ජනාධිපතිතුමාගේත්, ඔබතුමාගේත් අවධානය මේ යෝජනාව කෙරෙහි කඩිනමින්ම යොමු වේවා; රටේ ජනතාව බලාපොරොත්තු වන ඒ පරිවර්තනය ඉතා ඉක්මනින් ඇති කරන්නට අවස්ථාව ලැබෙවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි.

යෝජිත කථා අවසානයි. ඊළඟට ඇත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමයි. ඉලෙක්ට්‍රොනික් ක්‍රමයට නම්වලින් ඡන්දය ගන්න බලාපොරොත්තු වෙනවා. The Motion is now before the House.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
Divide!

බෙදුම් සීනුව නාද වී අවසන් වූණාට පසු -
පිරිවුමණි ඔලිත්තු ඔය්න්ත පින් -
At the conclusion of the division bells -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නිශ්ශබ්ද වෙන්න. ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව. ඡන්දය පාවිච්චි කිරීමට අපහසුතාවක් තිබෙනවා නම් කාර්ය මණ්ඩලය ඇවිත් උදව් කරාවි.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීම අවසන්.

ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ඉන්නවාද? Hon. Fowzie?

ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා
(මාණ්පුමිකු ඒ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Kabir Hashim?

ගරු කබීර් හාෂිම් මහතා
(මාණ්පුමිකු කබීර් හාෂීම්)
(The Hon. Kabir Hashim)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Is there anybody else?

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
වාක්කෙடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 115: විරුද්ධව 0: වැළකී සිටි 0 : යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 115; எதிராக 0; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 115: Noes 0: Abstain 0.

O 001. Mangala Samaraweera	Yes
O 002. Gamini Jayawickrama Perera	Yes
O 003. John Amaratunga	Yes
O 006. Dharmalingam Sithadthan	Yes
O 007. Mavai S. Senathirajah	Yes
O 008. Rajavarothiam Sampanthan	Yes
O 009. Ranil Wickremesinghe	Yes
O 010. Lakshman Kiriella	Yes
O 011. Gayantha Karunatileka	Yes
O 013. Rauff Hakeem	Yes
O 014. Rajitha Senaratne	Yes
O 015. Piyasena Gamage	Yes
O 016. Rishad Bathiudeen	Yes
O 018. Sajith Premadasa	Yes
O 019. Mano Ganesan	Yes
O 021. Selvam Adaikkalanathan	Yes
O 022. Malik Samarawickrama	Yes
O 026. K. Thurairetnasingam	Yes
O 027. Seeniththamby Yoheswaran	Yes
O 028. S. Shritharan	Yes
O 029. Tilak Marapana	Yes
O 030. Wajira Abeywardana	Yes
O 031. Ravi Karunanayake	Yes
O 032. Field Marshal Sarath Fonseka	Yes
O 033. Patali Champika Ranawaka	Yes
O 034. Navin Dissanayake	Yes
O 035. P. Harrison	Yes
O 036. R.M. Ranjith Madduma Bandara	Yes
O 037. Arjuna Ranatunga	Yes
O 038. Palany Thigambaram	Yes
O 039. Chandrani Bandara	Yes
O 040. Thalatha Atukorale	Yes
O 041. Akila Viraj Kariyawasam	Yes
O 042. D.M. Swaminathan	Yes

O 045. E. Saravanapavan	Yes
O 046. M.A. Sumanthiran	Yes
O 047. Kaveendiran Kodeeswaran	Yes
O 048. I. Charles Nirmalanathan	Yes
O 049. Abdul Haleem	Yes
O 050. Sagala Ratnayake	Yes
O 051. Harin Fernando	Yes
O 052. Daya Gamage	Yes
O 053. Ravindra Samaraweera	Yes
O 054. Vasantha Senanayake	Yes
O 055. Lucky Jayawardana	Yes
O 056. V.S. Radhakrishnan	Yes
O 057. Palitha Range Bandara	Yes
O 058. Dilip Wedaarachchi	Yes
O 059. Niroshan Perera	Yes
O 060. Ruwan Wijayawardene	Yes
O 061. A.D. Premadasa	Yes
O 062. Sujeewa Senasinghe	Yes
O 063. Wasantha Aluwihare	Yes
O 064. Vijayakala Maheswaran	Yes
O 065. Gnanamuthu Srineshan	Yes
O 066. Shanthi Sriskandarasa	Yes
O 067. S. Sivamohan	Yes
O 068. Eran Wickramaratne	Yes
O 069. Harsha De Silva	Yes
O 070. Ajith P. Perera	Yes
O 071. Ranjith Aluvihare	Yes
O 072. J.C. Alawathuwala	Yes
O 073. Vadivel Suresh	Yes
O 074. Ameer Ali Shihabdeen	Yes
O 075. Edward Gunasekara	Yes
O 076. Faizal Cassim	Yes
O 077. Anoma Gamage	Yes
O 078. Ranjan Ramanayake	Yes
O 079. Ashok Abeysinghe	Yes
O 080. H.M.M. Harees	Yes
O 081. Karunarathna Paranawithana	Yes
O 082. Palitha Kumara Thewarapperuma	Yes
O 083. Manusha Nanayakkara	Yes
O 084. Seyed Ali Zahir Moulana	Yes
O 085. Ajith Mannapperuma	Yes
O 086. Nalin Bandara Jayamaha	Yes
O 087. Buddhika Pathirana	Yes
O 088. M.S. Thowfeek	Yes
O 089. Abdullah Mahrooff	Yes
O 090. Sirinal de Mel	Yes
O 091. Anura Sidney Jayarathne	Yes
O 092. K.K. Piyadasa	Yes
O 093. Lakshman Ananda Wijemanne	Yes
O 094. A. A. Vijethunga	Yes
O 095. Hector Appuhamy	Yes
O 096. Sisira Kumara Abeysekara	Yes
O 097. Thushara Indunil Amarasena	Yes
O 098. A. Aravindh Kumar	Yes
O 099. Velu Kumar	Yes
O 100. Nalaka Prasad Colonne	Yes
O 101. Chandima Gamage	Yes
O 102. Kavinda Heshan Jayawardana	Yes
O 103. Mylvaganam Thilakarajah	Yes
O 104. Mayantha Dissanayake	Yes
O 105. Sujith Sanjaya Perera	Yes
O 106. Hirunika Premachandra	Yes
O 107. Bandula Lal Bandarigoda	Yes
O 108. M. Ibrahim Mohammad Mansoor	Yes
O 109. S.M. Marikkar	Yes
O 110. Imran Maharoof	Yes
O 111. Ashu Marasinghe	Yes
O 112. Ishak Rahuman	Yes
O 113. Mujibur Rahuman	Yes
O 114. Harshana Rajakaruna	Yes
O 115. Jayampathy Wickramaratne	Yes
O 116. Thusitha Wijemanna	Yes
G 021. Ananda Kumarasiri	Yes
G 109. Rohini Kumari Wijerathna	Yes
G 110. Chaminda Wijesiri	Yes
G 111. Hesha Withanage	Yes
G 112. Sandith Samarasinghe	Yes
G 113. Chathura Sandeepa Senaratne	Yes
G 114. Wijepala Hettiarachchi	Yes
G 115. Mohamadu Nazeer	Yes
G 116. S.M. Mohamed Ismail	Yes

Total Voting Results

Yes	115
No	00
Abstain	00

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 115ක්ද, නැතී සිට පක්ෂව ඡන්ද 2ක්ද වශයෙන් යෝජනාවට පක්ෂව ඡන්ද 117යි. ඒ අනුව යෝජනාව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන්නට කැමැතියි.

සභාව කල් තැබීම.

[අ.භා. 3.02]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව සම්මත කරන්නට, මෙම යෝජනාව විවාද කරන්නට සහභාගි වුණු ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මම මගේ ස්තුතිය පළමුව ප්‍රකාශ කරනවා.

මෙම යෝජනාව මම දකින්නේ, ඔක්තෝබර් 26 වැනිදා ඇති වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී ක්‍රියාදාමය, මගේ මිත්‍ර ගරු අනුර කුමාර මැතිතුමාගේ වචනවලින් කියනවා නම් "ඔක්තෝබර් 26 වැනිදා කුමන්ත්‍රණය" පරාජය කිරීමට ගත් වැදගත් පියවරක් හැටියටයි. ඒ ගැන කාගේවත් විවාදයක් තිබෙනවාය කියා මම හිතන්නේ නැහැ. පාර්ලිමේන්තුව ආරක්ෂා කරන්නට අපි සියලු දෙනාම කැප වෙලා තිබෙනවා.

මොකක්ද මේ ක්‍රමය? විශේෂයෙන්ම ඇමෙරිකාවේ හිටපු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් එදා කිව්වේ, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් කියන්නේ "Government of the people, by the people, for the people" කියායි. වැදගත්ම දෙය ජනතාව වෙනුවෙන්, ජනතාව විසින් ඇති කරන ආණ්ඩුවක් යන්නයි. ජනතාව විසින් ඇති කරන ආණ්ඩුවක් කියන්නේ, ජනතාවගේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඡන්දයෙන් පාර්ලිමේන්තුවක් තෝරලා, ඒ පාර්ලිමේන්තුවෙන් අගමැතිවරයෙක් තෝරා ගන්න එක මිසක් ජනාධිපති විසින් ඇති කරන ආණ්ඩුවක් නොවෙයි. අන්න ඒකයි වෙනස. ජනතාව විසින් ඇති කරන ආණ්ඩුවක්! ඒ මුල ධර්මයට අපි සියලු දෙනාම කැප වෙලා තිබෙනවා.

ජනතාව විසින් ආණ්ඩුව තෝරා ගැනීම ගැන අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි රටේ ප්‍රධානම නීතිය; ප්‍රමුඛ නීතිය. අපේ රට නීතියේ පරමාධිපත්‍යය පිළිගන්නා රටක්. එසේනම් නීතියේ ඒ පරමාධිපත්‍යය පිළිගෙන, ප්‍රමුඛ නීතිය වන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ක්‍රියත්මක කරන්නට ඕනෑ. අපේ දේශපාලන අදහස් කුමක් වුවත්, ඒ ව්‍යවස්ථාව අනුව ක්‍රියාත්මක කරන්නටයි කටයුතු කළ යුත්තේ. ඇත්තවශයෙන්ම පොහොට්ටුවට සහයෝගය දුන් අයත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහයෝගය දුන් අයත් සියල්ලම කියන්නේ, ව්‍යවස්ථාව කඩ කරන්නට බැහැ කියන එකයි.

ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරන්නට ඕනෑ, එහෙම නැත්නම් ඒක මහා කැත වැඩක් කියලා තමයි හැම කෙනාම වාගේ ප්‍රකාශ කරලා තිබෙන්නේ. අන්න ඒකයි අපේ සටන. ඒකයි අපි බොහෝ දෙනෙක් අධිකරණයට ගියේ. එහෙත් හැම අවස්ථාවකදීම මේ සභාව තුළ බලය ආරක්ෂා කරන්න 122ක් ක්‍රියා කරලා තිබෙනවා. ඒ සඳහා කථානායකතුමා හැටියට ඔබතුමා දුන්න නායකත්වය අපි විශේෂයෙන්ම අගය කරනවා. ඒ නායකත්වය නැතිව ඒ ආරක්ෂාව අපට ලැබෙන්නේ නැහැ.

2015දී අපි බලයට පැමිණි විට එදා ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වෙලා තිබුණු නිසා අපි ඒ අවස්ථාවේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා, පාර්ලිමේන්තුවේ බලතල වැඩි කරලා, ජනාධිපතිගේ බලතල සීමා කරලා, අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කරලා ස්වාධීන කොමිෂන් සභා ඇති කළා. සමහරු ඇහුවා, මේකෙන් වැඩක් තිබෙනවාද, ආණ්ඩුවකට යන වේගය අඩු වෙන්න පුළුවන්ද කියලා. ඇත්තවශයෙන්ම ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක කරන්න ඔබතුමාත් විශාල උත්සාහයක් ගත්තා. අපි සියලු දෙනාම පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න, පාර්ලිමේන්තුවේ බලය ආරක්ෂා කරන්න ක්‍රියා කළා. මම එකක් කියන්න කැමතියි, අපි ඇති කරපු රාමුව නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කිසිම බයක් නැතිව ඉදිරියට එන්න අද ජනතාවටත් පුළුවන්. එවැනි බයක් තිබුණ කාලයක් තිබුණා. අද එහෙම බයක් නැහැ. ඒක අපට කරන්න පුළුවන් වැඩ කටයුත්තක් හැටියට මම කියන්න කැමතියි. ආණ්ඩුවක් හැටියට අපේ අඩු පාඩුකම් තිබෙනවා. අපට කරන්න පුළුවන් වුණු ඒවා තිබුණා. අපට කරන්න බැරි වුණු ඒවා තිබුණා. රටේ ප්‍රධාන පක්ෂ දෙක එකතු වුණු නිසා, එකතු වෙලා වැඩ කරපු නිසා, විවිධ මත තිබුණු නිසා අපට වේගයෙන් යන්න බැරි වුණා. ඒ ගමන ඉතා හෙමින් සිරුවේ තමයි අපට යන්න සිදු වුණේ. කෙසේ හෝ අපි භාර ගත්තේ විශාල ණය බරක් තිබුණු රටක්; ණය ගෙවන්න බැරි වුණු රටක්. ඒ සඳහා අපට පියවර ගන්න සිදු වුණා. සමහර ඒවා අමාරු පියවර. අපට නියඟවලට මුහුණ දෙන්න සිදු වුණා; ගං වතුරට මුහුණ දෙන්න සිදු වුණා. අපේ රට අමාරු කාලයක ගියා. ඒ කාලයේ ජනතාවත් දුක් විඳලා කියලා පිළිගන්න ඕනෑ. එවැනි අවස්ථා තිබුණා. ඒ වාගේම එවැනි තත්ත්වයන් මැද අපට අවස්ථාව ලැබුණා, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස වෙනුවෙන් වැඩිපුර මුදල් ලබා දෙන්න. මම හිතන්නේ නැහැ, නිදහස් ලංකා ඉතිහාසයේම මේ වාගේ අංශවලට -අධ්‍යාපනයට, සෞඛ්‍යයට, නිවාසවලට- මෙතරම් මුදල් වියදම් කරපු ආණ්ඩුවක් තිබුණාය කියලා. අපි ඒ ගැන ආඩම්බර වෙන්න ඕනෑ. අපි ඇවිල්ලා තිබුණේ ඒ ප්‍රතිලාභ ජනතාවට ලබා දෙන අවස්ථාවටයි. අපි අලුත් සංවර්ධන යෝජනා ක්‍රම ඇති කරන්න; "ගම්පෙරළිය" වාගේ වැඩසටහන් ඇති කරන්න; විදේශ ආයෝජන ලබා ගෙන රැකියා ඇති කරන්න; අන්න, ඒ ස්ථානයට ඇවිල්ලා ජනතාවට සහන ලබා දෙන්නයි අපි ක්‍රියා කරමින් සිටියේ. මේ අර්බුදය නිසා අපේ ආර්ථිකය ආපහු පස්සට ගිහිල්ලා තිබෙනවා. මෙයින් ආර්ථිකයට විශාල හානියක් ඇති වෙලා තිබෙනවා. මම කියන්න කැමතියි, මේවා අපට හදන්න පුළුවන් කියලා. ඒ ශක්තිය අපට තිබෙනවා. අපි බඩු මිල අඩු කරනවා කියලා පොරොන්දු වෙලා ඇවිල්ලා මාසයක් ගිහිල්ලා බඩු මිල අඩු කරන්නේ නැතිව ඉන්නේ නැහැ. අපි බදු අඩු කරනවා කියලා ප්‍රකාශ කරලා මාසයක් ගිහිල්ලා බදු අඩු කරන්නේ නැතිව ඉන්නේ නැහැ. අපි කිව්වොත් ඒ කටයුත්ත කරනවා. මම කියන්න කැමතියි, ජනතාවට ක්‍රමානුකූලව සහනයක් ලබා දෙන්න අපට පුළුවන් වන බව. මේ ආර්ථික හානියටත් මුහුණ දීලා විශාල සංවර්ධන වැඩසටහනක් ඉදිරියට ගෙනයන්න අපි බලාපොරොත්තු වනවා.

මම මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු සියලු දෙනාටම විශාල ලෙස ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණා; බලපෑම්වලට මුහුණ දෙන්න සිදු වුණා. ඒවාට මුහුණ දීලා ඉදිරියට ඇවිල්ලා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම ගැන මම එතුමන්ලාට ස්තුතිවන්ත වනවා. මම මාවෙ සෝ.සේනාධිරාජා මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයට ඇහුම්කන් දුන්නා. උතුරේ ද්‍රවිඩ ජනතාව විඳින දුක ගැන අපි දන්නවා. අපේ සංවර්ධන ව්‍යාපාරයෙන් ඒවාටත් විසඳුම් ලබා දෙන්න අප ක්‍රියා කරනවා.

ප්‍රශ්නවලට නීත්‍යානුකූල විසඳුම් ලබා ගන්න ක්‍රියා කරනවා. මම එකක් කියන්න කැමැතියි. ඒ තමයි, අලුත් ව්‍යවස්ථාවක් සකස් කරන්න අපි ගන්නා පියවර තුළින් බෙදන්න බැරි, නොබෙදුණු, ඒකීය රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කර, මේ රටේ සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාවට පිළිගන්න පුළුවන් දේශපාලන විසඳුමක් ලබා දෙන්න අපි කැපවෙලා ඉන්නවා කියලා. පළාත් සභා ශක්තිමත් කිරීම ඇතුළු සියල්ලම අපේ වැඩසටහනේ තිබෙනවා. ඒ එක්කම විධායක ජනාධිපති ක්‍රමය නැති කිරීමටත් අපි කැප වෙලා ඉන්නවා.

අද අපි ඔක්කෝම මෙතැන ඉන්නේ සිංහල හැටියට නොවෙයි; දෙමළ හැටියට නොවෙයි; මුස්ලිම් හැටියට නොවෙයි; ශ්‍රී ලාංකිකයන් හැටියටයි; අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කරලා, අපේ පරමාධිපත්‍ය ආරක්ෂා කරන්නයි. මේ රටේ යුද්ධයක් පැවතුණා. ඒ නිසා අපේ යුතුකම තමයි, ද්‍රවිඩ ජනතාවත් එක්ක සාකච්ඡා කරලා හැම ජාතියකටම, හැම ආගමකටම සාධාරණය ඉටුවන අයුරින් අපේ ව්‍යවස්ථාවට අනුව දේශපාලන විසඳුමක් ලබා දෙන එක. අපේ ඒ ස්ථාවරය වෙනස් වෙන්නේ නැහැ කියලා මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මා යළිත් ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමනි.

සභාව කල් තැබීම. අද දින සභාව එකඟ වූ පරිදි, මෙම පාර්ලිමේන්තුව 2018 දෙසැම්බර් මස 18වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තබනු ලැබේ.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 3.10ට, 2018 දෙසැම්බර් 18වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பாராளுமன்றம் பி.ப. 3.10 மணிக்கு, 2018 டிசம்பர் 18, செய்வாய்க்கிழமை பி.ப. 1.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 3.10 p.m. until 1.00 p.m. on Tuesday, 18th December, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.